What is law? Article 170 of the Constitution defines what the law is. It reads as follows. "Law means any Act of Parliament and any law enacted by any legislature at any time prior to the commencement of the Constitution and includes Order in Council." Thus legislature can bring in legislation prescribing restrictions on information discussed in Article 14A of the Constitution. National Audit Bill intends to achieve the above purpose. In my view restrictions of this nature are permitted by Article 14A(2) of the Constitution and a Bill prescribing such restrictions cannot violate Article 14A of the Constitution. When I consider all the above matters, I am unable to agree with the contention of learned Counsel for the Petitioners. For the above reasons, I reject the above contention of learned Counsel for the Petitioners and hold that the Clause 9 of the Bill does not violate the Constitution.

Learned Counsel for the Petitioners next made submissions regarding the schedule of the Bill relating to Oath of Secrecy. The Oath of Secrecy described in the said schedule reads as follows.

"Oath of Secrecy

In terms of Section 9 of the National Audit Act No. ... of 2018.

I, ... being member of the Audit Service Commission/ an employee of the National Audit Office/Auditor General's Department/Combined Services, an expert person assisting in the discharge of the duties of the Auditor General as referred to in Section 8(a), do solemnly declare and affirm/swear that I shall maintain in utmost secrecy the information whatsoever which is given, stated, discussed or otherwise gathered in the performance of my duties and such information will not be disclosed, discussed or stated in any form whatever to any person in public or private, except-

(a) when required to do so by a Court of Law;

(b) when required by Parliament; or

(c) when specified under any written law, subject to section 9(b) of the National Audit Act No. .. 2018.

The obligations herein set out shall bind me during my term of office in the National Audit Office/Auditor General's Department/Combined Services and shall continue thereafter except in relation to any information that has come into public domain due to no breach of my obligations hereunder.

I append my signature to this oath on this ..... day of ..... Two Thousand ..... .

Signature"

Learned Counsel for the Petitioners stressed the following words in the Oath of Secrecy: "subject to section 9(b) of the National Audit Act No. .. 2018". He submitted that the above words would violate Article 14A(1) of the Constitution since Clause 9(b) of the Bill violates Article 14A(1) of the Constitution. But I have earlier held that Clause 9 of the Bill does not violate the Constitution. Therefore I am unable to agree with the above contention of learned Counsel for the Petitioners and I reject the same.

Learned Counsel for the Petitioners next made submissions regarding Clause 13 of the Bill. Clause 13 of the Bill reads as follows.

"The Auditor General shall report to Parliament on any audit carried out during any financial year and may make such report publicly available through the official website of the National Audit office and shall not publish the report if he has or intends to provide any report, information, document, book, record or computer generated transcript obtained in the course of the audit to the law enforcement authorities."

According to Clause 13 of the Bill, the Auditor General shall not publish the document mentioned therein if he intends to provide it to law enforcement authorities. Learned Counsel for the Petitioners submitted that the said Clause of the Bill therefore violates Article 14A(1) of the Constitution.

I now advert to this contention. Why does the Auditor General want to submit it to law enforcement authorities? If some fraud or offence has been disclosed in the said report, shouldn't he submit it to law enforcement authorities? The answer should obviously be in the affirmative. If such a report is published, person who is suspected to have committed the fraud would take steps to negate the allegation mentioned in the report before the law enforcement authorities start investigation. Thus publishing such a report would benefit the alleged offender. As I have pointed out earlier, legislature can bring in legislation prescribing restrictions on information regarding prevention of disorder or crimes. When I consider all the above matters, I hold the view that Clause 13 of the Bill would not violate any Article of the Constitution. For the above reasons, I reject the above contention of learned counsel for the petitioners

We have examined the provisions of the Bill and in our opinion they do not violate the Constitution.

For the reasons stated above, we make determination that the National Audit Bill is not inconsistent with the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

Sisira J de Abrew
Judge of the Supreme Court.

Priyantha Jayawardena PC
Judge of the Supreme Court.

L.T.B. Dehedeniya
Judge of the Supreme Court.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

[ගරු කථානායකතුමා]

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XIV හා XV කොටස්, තෙවැනි කාණ්ඩයේ VII කොටස හා නවවැනි කාණ්ඩයේ III කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE DELIMITATION COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017 වර්ෂයේ තෙවැනි කාර්තුව (2017.07.01 - 2017.09.30) සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියමයන් සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 ව්‍යවස්ථාවේ (2) ඡේදය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ වගන්ති යටතේ වරතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 19 දිනැති අංක 2024/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 23 එ සහ 23 ඒ වගන්ති යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(vi) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් සහ නියෝග කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂයේ හතරවැනි කාර්තුව දක්වා මූල්‍ය කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2017 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2018.03.01 සිට 2018.03.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සභාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.

එම වාර්තාව සහ පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) නියෝග සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 29 දිනැති අංක 2064/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත;

(iii) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත; සහ

(iv) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27.(2) යටතේ අසනු ලබන ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ඉරණතිවු දූපතේ අවතැන් වූ ජනතාව එම ප්‍රදේශයේම යළි පදිංචි කරවීම
இரணைதீவிலிருந்து இடம்பெயர்ந்த மக்களை அப்பகுதியிலேயே மீளக்குடியமர்த்தல்
RESETTLEMENT OF DISPLACED PEOPLE OF IRANAITIVU IN THE SAME AREA

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, பாதுகாப்பு அமைச்சர் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களிடம் இந்தக் கேள்வியைக் கேட்க அனுமதித்ததற்கு நன்றி!

கிளிநொச்சி மாவட்டத்தில் பூநகரி பிரதேச செயலாளர் பிரிவின்கீழ் அமைந்துள்ள இரணைதீவில் பூர்வீகமாக மூன்று தலைமுறைகளுக்கும் மேலாக வாழ்ந்திருந்த மக்கள் யுத்தம் காரணமாகக் கடந்த 1992ஆம் ஆண்டு இடம்பெயர்ந்தபோது சுமார் 230 குடும்பங்களைக் கொண்டிருந்தனர். இவ்வாறு இடம்பெயர்ந்த மக்கள், முள்ளிவாய்க்கால் வரை சென்று, பின்னர் வவுனியா செட்டிக்குளம் இடைத்தங்கல் முகாமில் தங்க வைக்கப்பட்டு, அவர்களது சொந்த நிலத்தில் மீள்குடியேற்றப்படுவதற்குப் பதிலாக இரணைமாதாநகர், மன்னார் ஓடத்தொடுவாய், நாச்சிக்குடா ஆகிய பகுதிகளில் குடியேற்றப்பட்டிருந்தனர். இந்நிலையில், இம்மக்களது வாழ்வாதாரத் தொழிலான கடற்றொழில் முயற்சிகளில் அவர்களால் சுதந்திரமாக ஈடுபட முடியாமையால், பொருளாதார ரீதியில் மிகவும் பாதிக்கப்பட்ட நிலையிலேயே வாழ்ந்து வந்தனர்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

இதன் பின்னர் இம்மக்களுக்கு இரணைதீவுக்குச் சென்று கடற்றொழிலில் ஈடுபட அனுமதி வழங்கப்பட்டிருந்தபோதிலும், அங்கு மீளக்குடியேறுவதற்கு அனுமதி வழங்கப்படவில்லை. இந்நிலையில், தங்களது தொழில் முயற்சிகளை மேற்கொள்வதற்காகவும் தங்களது கால்நடைகளை வளர்ப்பதற்காகவும் அங்கே தங்கியிருந்து செயற்படுவதற்குத் தங்களை இரணைதீவில் மீள்குடியேற்ற வேண்டுமென்ற கோரிக்கையை முன்வைத்துள்ளனர். தற்போது தமிழ் அரசியல்வாதிகள்மீது நம்பிக்கையிழந்துள்ள நிலையில் சுமார் 435 குடும்பங்களைக் கொண்டிருக்கின்ற இம்மக்களில் சிறுவர்கள், பெண்கள் உள்ளிட்ட சுமார் 400 பேர் வரையில் அடிப்படை வசதிகள் எதுவுமின்றித் தாமாக முன்வந்து மேற்படி தீவில் தங்கியிருக்கின்றனர்.

யாழ். மாவட்டத்தில் நெடுந்தீவு உட்பட அனைத்து தீவுப் பகுதிகளிலும் பாதுகாப்புக் கடமைகளில் கடற்படையினர் நிலைகொண்டுள்ள நிலையிலும் மக்கள் அங்கு மீளக்குடியமர்த் தப்பட்டு, பொது வாழ்க்கையில் நீண்ட காலமாக தங்களது தொழிற்றுறைகளை மேற்கொண்டு வருகின்றனர் என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அந்த வகையில், மனிதாபிமான ரீதியிலும் இம்மக்களது அடிப்படை உரிமைகள் ரீதியிலும் சிந்தித்து,

இரணைதீவில் தற்போது தங்கியுள்ள அப்பகுதி மக்களுக்கு அடிப்படை வசதிகளான குடிநீர், மலசலகூடங்கள், மருத்துவம் மற்றும் போக்குவரத்து ஏற்பாடுகளை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுத்து உதவ முடியுமா?

பாதுகாப்புக் கடமைகளுக்காகத் தேவைக்கேற்ப கடற் படையினரை நிலைகொள்ளச் செய்து, இரணைதீவிலிருந்து இடம்பெயர்ந்துள்ள மேற்படி சுமார் 435 குடும்பங்களையும் அப்பகுதியில் மீள்குடியேற்றுவதற்குச் சட்ட ரீதியிலான அனுமதி எப்போது வழங்கப்படும்?

மேற்படி எனது கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப்படக்கூடிய நடவடிக்கை தொடர்பான விளக்கத் தினையும் பாதுகாப்பு அமைச்சர் அவர்கள் வழங்குவார் என எதிர்பார்க்கின்றேன்.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27.(2) යටතේ, අසන ලද ප්‍රශ්නයට රජය වෙනුවෙන් මම පිළිතුරු සැපයීමට බලාපොරොත්තු වෙනවා.

ඉරණතිව් දූපතේ දැනට රැඳී සිටින මෙම ප්‍රදේශයට අයත් ජනතාවට මූලික පහසුකම් වන පානීය ජලය, වැසිකිළි, සෞඛ්‍ය හා ගමනාගමන පහසුකම් ලබා දීමට පියවර ගත හැකිද කියලා මේ ප්‍රශ්නයෙන් විමසා තිබෙනවා.

ඉරණතිව් ග්‍රාමයේ පාරම්පරිකව පදිංචිව සිටි පවුල් 190ක් 1992 වර්ෂයේ අවතැන් වී පැමිණ මේ දක්වා පූනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුලංගාවිල් ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් ඉරණයි මාතා නගරය, නාවිච්කුඩා හා පොන්නාවෙලි යන ගම්වල ජීවත් වෙයි.

අවතැන් වූ පවුල් හා එම අයගේ ඊළඟ පරම්පරාවට අයත් පවුල්ද ඇතුළුව දැනට පවුල් 392ක් එම ගම්වල ජීවත් වෙයි. නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය හරහා මෙම සියලු පවුල් සඳහා දැනට එම ප්‍රදේශවල විකල්ප ඉඩම් ලබා දී ඇති අතර, පවුල් 392න් පවුල් 297ක් සඳහා නිවාස ද ලබා දී ඇත. ඉරණතිව් ජනතාවට ධීවර කටයුතුවල නිරත වන කාලවලදී, මසුන් අස්වැන්න වැඩි කාලවලදී එහි පැමිණ, කිසිදු ස්ථිර ඉදි කිරීම් නොකර, ධීවර රැකියාවේ නිරත වීමට අවසර දී ඇත. දැනට ඉරණතිව් ප්‍රදේශයේ තාවකාලිකව 400ක පමණ ජනතාවක් රැඳී සිටින බව කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් විසින් 2018 මැයි 04වන දින වාර්තා කොට ඇත. ඒ අනුව, මෙලෙස තාවකාලිකව රැඳී සිටින ජනතාවගේ මූලික ජීවනෝපාය ප්‍රශ්නවලට ස්ථිර විසඳුම් ලබා දීම පිණිස නාවික හමුදාපති ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් සහ කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් යන අය සමඟ 2018 මැයි 15වන දින ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කර, එහි ගනු ලබන තීරණ මත, එම ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීමට නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඇත.

ආරක්ෂක රාජකාරි සඳහා අවශ්‍ය ප්‍රමාණයට නාවික හමුදාව රඳවා තබා ගනිමින් ඉරණතිව් දූපතින් අවතැන් වූ ඉහත සඳහන් 430ට ආසන්න පවුල් එම ප්‍රදේශය තුළ නැවත පදිංචි කරවීම සඳහා නීත්‍යානුකූල අනුමැතිය ලබා දෙන්නේ කවදාද කියා ඊළඟට විමසා තිබෙනවා.

ඉරණතිව් දූපතෙහි පදිංචිව සිටි සියලුම පුද්ගලයින් මේ වන විට වෙනත් ස්ථානවල නැවත පදිංචි කර ඇත. එසේම ඉරණතිව් දූපතෙහි ධීවර කටයුතු කර ගෙන යාම සඳහා කිසිදු අයුරකින් බාධා කිරීමක් නාවික හමුදාව විසින් සිදු කර නොමැත. 1992ට පෙර ඉරණතිව් දූපතෙහි පදිංචිව සිටි පවුල් සංඛ්‍යාව 190ක් -පුද්ගලයින් 434ක්- බව පූනකරි ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇත. ඉරණතිව් දූපතෙහි ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පරිහරණය කරන මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 6 පර්චස් 52ක් වේ. නාවික හමුදාව පරිහරණය කරන භූමියෙහි සිවිල් වැසියන් හට අයත්ව තිබූ ඉඩම් කොටස් අන්තර්ගතව නොමැත. මෙම රජයේ ඉඩම් ප්‍රමාණය ඉඩම් කොමසාරිස් ජනරාල් මහින් නාවික හමුදාවට පවරා ගැනීමට ක්‍රියා කරමින් පවතී. ඉරණතිව් දූපතෙහි රජයේ ඉඩම් සහ පුද්ගලයින් සතුව තිබූ ඉඩම් හඳුනා ගැනීම සඳහා මැනුම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා ඇති අතර, එසේ ඉඩම් මැන හඳුනා ගත් පසුව කලින් බලපත්‍ර හා දීමනා පත්‍ර මහින් ලබා දී තිබූ ඉඩම් කොටස් අදාළ පුද්ගලයන් හට නැවත ලබා දීමට ඇති හැකියාව පිළිබඳව සලකා බලනු ඇත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Thank you. පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු එස්. බී. දිසානායක මැතිතුමා.

ගරු එස්.බී. දිසානායක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க அவர்களினது சொந்த விளக்கம்
PERSONAL EXPLANATION BY HON. S.B. DISSANAYAKE

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, ඊයේ දින අපි, ගරු මන්ත්‍රීවරු 16 දෙනෙක් ආණ්ඩු පක්ෂයෙන්, විපක්ෂයට පැමිණි බව ඔබතුමා හොඳින්ම දන්නවා. ඉතා ඉක්මනින් අපට නියමිත ආසන සකස්

කර දීම පිළිබඳව පළමුවෙන්ම මම ඔබතුමාට ස්තුතිය පළ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මේ 16දෙනා හිටපු කැබිනට් අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු හා නියෝජ්‍ය අමාත්‍යවරු වෙනවා. මේ 16 දෙනා අතර ගරු නියෝජ්‍ය කථානායකතුමාත් ඉන්නවා. මේ අයගෙන් සමහර අය 1989 ඉඳලා පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ වාගේම සමහර අය 1994 ඉඳලා අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු හැටියට කටයුතු කළා. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටිමින්ම, අපේ හෘදය සාක්ෂියට අනුව රජයෙන් ඉවත් වෙලා විපක්ෂයේ ඉඳගත්තා. අපට ඒ සඳහා අපේ පක්ෂයෙන් ඉඩකඩ ලැබීම පිළිබඳව පක්ෂයේ සභාපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට අපගේ ගෞරවය පුද කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අපි විපක්ෂයට එන විට ඒකාබද්ධ විපක්ෂයේ නායකතුමා -ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා- අප බොහොම ගෞරවයෙන් පිළිගත්තා. ඒ වාගේම මහජන එක්සත් පෙරමුණේ නායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අපව ධෛර්යවත් කළා. ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මැතිතුමාටත්, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක වාසුදේව නානායක්කාර මැතිතුමාටත්, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ චන්ද්‍රසිරි ගජදීර මැතිතුමාටත්, පිවිතුරු හෙළ උරුමයේ උදය ගම්මන්පිල මැතිතුමාටත් අපි 16දෙනාගේම විශේෂ ගෞරවය පුද කරන්න කැමැතියි. ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමාත්, තොණ්ඩමන් මැතිතුමාත් අපව ඉතාම උණුසුම්ව පිළිගත්තා. ඒ දෙපළටත් අපි 16දෙනාගේ ගෞරවය පුද කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, විපක්ෂ නායක ගරු සම්පන්දන් මන්ත්‍රීතුමාත් ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ නායක ගරු අනුර දිසානායක විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් සමඟ අපි 16දෙනා ඉතා සහෝදරත්වයෙන්, මිත්‍රත්වයෙන් විපක්ෂයේ වග කීම ඉටු කිරීමට බලාපොරොත්තු වන බව මේ අවස්ථාවේදී ඔබතුමාට කියන්න කැමැතියි.

යහ පාලන රජයේ ගරු අගමැතිතුමා සමඟ, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ මැති ඇමතිවරුන් සමඟ අප 16දෙනාටම කිසිම පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම ඒ සියලුදෙනා අප සියලුදෙනා ගරු කරන අපේ මිත්‍රයෝයි. ගරු සභානායකතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු සියලුදෙනා අපි බෙහෙවින් ගරු කරන උදවියයි. රජය නියෝජනය කරන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක රවුෆ් හකීම් අමාත්‍යතුමා සහ එම මන්ත්‍රීවරුන්, සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමා ඇතුළු මන්ත්‍රීවරුන් සියලුදෙනා අපේ මිතුරෝයි. ඒ සියලුදෙනා සමඟ අපේ පෞද්ගලික ගැටලුවක් නැති බව නැවතත් කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අපි, පසු ගිය දා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දුන් අය. ඒ, ගරු අගමැතිතුමාට එරෙහිව ඉදිරිපත් කළ, විශ්වාස භංග යෝජනාවයි. අපි අපේ හෘදය සාක්ෂියට එකඟව එයට සහයෝගය දුන්නා. අපි එය ජයග්‍රහණය කරවන්නත් මහන්සි වුණා, ගරු කථානායකතුමනි. එතුමා මේ පාර්ලිමේන්තුවේ එතුමාට තිබෙන විශ්වාසය ඔප්පු කර පෙන්නුවා. ඒ නිසා එතුමාට ආණ්ඩුව කරගෙන යෑමට ඉඩ දීම අපේ යුතුකමක් හැටියට තිබෙනවා. ඒ නිසා අපි විපක්ෂයට පැමිණීම, අපි එතුමාට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස දැක්වූ සැලකිල්ලක් බවත් මතක් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මහ බැංකු බැඳුම්කර වංචාව සිදු වූ වෙලාවේ ඉඳලා අපේ පක්ෂයේ අප සියලුදෙනා ආණ්ඩුවේ ඉඳිමින්, ඊට සම්බන්ධ වංචනිකයන් නීතියේ රැහැනට හසු කර ගන්න ලොකු උත්සාහයක් ගත්තා. ඒ සඳහා ඒකාබද්ධ විපක්ෂය හා විපක්ෂයේ මන්ත්‍රීවරු වැඩි දෙනෙක් විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. අපේ පක්ෂයේ මන්ත්‍රීවර එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් මහින්ද අමරවීර මැතිතුමා අල්ලස් කොමිසමට මේ ගැන පැමිණිලි කළා. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි, අපේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ නායකත්වයෙන් විශේෂ කමිටුවක් පත් කරලා, ඒ පිළිබඳව සොයා බලා, "මේ ප්‍රශ්නය බරපතළයි, මේ පිළිබඳව වහාම ජනාධිපති කොමිසමක් පත් කරන්න" කියලා ජනාධිපතිතුමාට යෝජනා කළා. ඒ වාගේම අපේ මන්ත්‍රීවරු -ඇමතිවරු හැටියට සිටිමින්ම- "කෝප්" එකේදී මේ වංචාකාරයන් නීතියේ රැහැනට හසු කර ගන්න අවශ්‍ය සියලු කටයුතු කරන්න ජනතා විමුක්ති පෙරමුණටත්, ඒකාබද්ධ විපක්ෂයටත් ආධාර උපකාර කළා. ගරු කථානායකතුමනි, ඒ සියල්ල අතර අපේ මන්ත්‍රීවරු, ඇමතිවරු ශ්‍රී ලංකා මහ බැංකුව ළඟට ගිහිල්ලා බොහොම සාමකාමී විරෝධයක් පළ කරලා කිව්වා, "මේක මහා වංචාවක්, මේ වංචාකාරයන් අල්ලන්න" කියලා.

පසුගිය දා ඉදිරිපත් කළ ඒ විශ්වාස භංග යෝජනාවේ තිබුණු, ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ සියලු කරුණුවලට අපි පක්ෂයි. ඒ වාගේම පසුගිය තුන් අවුරුද්ද තුළ රටේ ආර්ථිකය කඩා වැටීම පිළිබඳව ඒ විශ්වාස භංග යෝජනාවේ තිබුණු කරුණුවලට අපි එකඟයි.

ඒ නිසා, ආණ්ඩුවේ ඇමතිවරු හැටියට හිටියත්, නියෝජ්‍ය ඇමතිවරු හැටියට හිටියත්, රාජ්‍ය ඇමතිවරු හැටියට හිටියත් මේ විශ්වාසභංග යෝජනාවට එරෙහි වෙන්න සදාචාරාත්මක යුතුකමක් අපට නැහැ කියලායි අපි හිතුවේ. ඒ නිසා අපි 16 දෙනෙක් ඒ වෙනුවෙන් එකතු වෙලා විශ්වාසභංග යෝජනාවට පක්ෂව ඡන්දය දුන්නා. ඒ වාගේම ගරු කථානායකතුමනි, අපේ පක්ෂයේ තවත් මන්ත්‍රීවරු කිහිපදෙනෙකුට මේ විශ්වාසභංග යෝජනාවට විරුද්ධව ඡන්දය දෙන්න වුවමනාවක් තිබුණු බව මම දන්නවා. නමුත්, පක්ෂයටත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපටත් පුළුවන්කම ලැබුණා, ඒ සියලුදෙනා ඡන්දය දීමෙන් වළක්වාලමින් ඒ විශ්වාසභංග යෝජනාවට යම් ආකාරයක වක්‍ර සහායක් ලබා දෙන්නට.

අද අපි විපක්ෂයට ඇවිල්ලා, විපක්ෂයේ සිටින දේශප්‍රේමී, ප්‍රගතිශීලී, මානව හිතවාදී, වමේ අපේ සහෝදර මන්ත්‍රීවරු සමඟ එකතු වුණේ ඉතාම සතුටින්. විපක්ෂයේ ඉඳගෙන මේ සියලු දෙනා එක්ක අත්වැල් බැඳගෙන, එක්සත් ජාතික පක්ෂයට එරෙහි ශක්තිමත් බලවේගයක් ගොඩනැඟීමට අපට යම් කාර්යභාරයක් කරන්න පුළුවන් කියලායි අපි හිතන්නේ. ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු -ජනතා නියෝජිතයන්- හැටියට එය මේ වෙලාවේ අපෙන් ඉටුවිය යුතු ශ්‍රේෂ්ඨ වගකීමක්.

ඒ නිසා අද අපි විපක්ෂයට ඇවිල්ලා ඔබතුමා ඉදිරියේ කථා කරන්නේ ඉතාම සතුටින්. අපි විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට කියන්න කැමතියි, යුක්ති සහගත සාධාරණ සටන් වෙනුවෙන් අපි ඔබතුමන්ලා සමඟ අත්වැල් බැඳගෙන එකට වැඩ කරන බව. ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්ටත්, අගමැතිතුමාටත් කියන්න කැමතියි, ඔබතුමන්ලා කරන හොඳ දේවල්වලට අපි විපක්ෂයේ ඉඳගෙන උදව් කරන්න කැමතියි කියලා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් තවත් එක් කාරණාවක් පිළිබඳව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරන්නම්. ගරු අගමැතිතුමා පසුගිය මැයි දින උත්සවයේ දී කියලා තිබුණා, "සමෘද්ධි මුදල් රුපියල් කෝටි 675ක මුදලක් අතුරුදන් වෙලා" තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, රුපියල් කෝටි

[ගරු එස්.බී. දිසානායක මහතා]

675ක මුදලක් නොවෙයි සත 675ක මුදලක් හෝ අතුරුදන් වෙලා තිබෙනවා නම් ඒකත් බරපතළ වරදක්. එම විෂය භාරව හිටපු ඇමතිවරයා හැටියට මා ඉතාම වගකීමෙන් කියන්න කැමැතියි, එවැනි දෙයක් සිදු වී තිබෙනවා නම් මා බොහොම කැමැත්තෙන් එහි වගකීම භාර ගන්නා බව. මේක කාගේවත් පිට මම පටවන්නේ නැහැ. මා අගමැතිතුමාට කාරුණිකව කියනවා, එවැනි ප්‍රශ්නයක් තිබෙනවා නම් වහාම ඒ ගැන පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය නීතිමය කටයුතු කරන්න කියලා. මම එහි වගකීම භාරගන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මෙම කාරණය පත්තරේ පළ වුණාම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට එය ලොකු ගැටලුවක් වුණා.

එම නිසා අගමැතිතුමාගේ චෝදනාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මැතිතුමා, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි ආර්. මනම්පේරි මැතිනිය, අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) රංජිත් උදයසිරි මැතිතුමා, ප්‍රධාන අභ්‍යන්තර විගණක ආර්.පී.පී. අබේකෝන් මහත්මිය, අධ්‍යක්ෂක (සමාජ ආරක්ෂණ හා සුබසාධන) එච්.කේ. රණවීර මහතා අත්සන් කරලා ප්‍රකාශයක් නිකුත් කරලා තිබෙනවා. අගමැතිතුමා එල්ල කළ එම චෝදනාව සම්පූර්ණයෙන්ම වැරැදි බව එහි සඳහන් වෙනවා. මා එම ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එම චෝදනාව සමෘද්ධි ව්‍යාපාරයටත්, හිටපු ඇමතිවරයා හැටියට මටත් එල්ල කළ බරපතළ චෝදනාවක්. ඒ පිළිබඳව සැබෑ තත්ත්වය මේ ගරු සභාවට ඉතා ඉක්මනින් ඉදිරිපත් කරන්න කියලා මම නැවතත් අගමැතිතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා. මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. අපට දැනගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මෙතුමන්ලා විපක්ෂය පැත්තට ගියා. නිලංග සුමතිපාල මහත්මයා එක්ක අපිට ප්‍රශ්නයක් නැහැ. නියෝජ්‍ය කථානායක ධුරය පුරප්පාඩු වෙලා තිබීම සම්බන්ධයෙන් ඔබතුමා අපට පොඩ්ඩක් පැහැදිලි කළොත් හොඳයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ජනාධිපතිතුමාගෙන් තමයි මට එම පණිවුඩය ලැබෙන්න ඕනෑ. නමුත් මට තවම ඒ පණිවුඩය ලැබිලා නැහැ. [බාධා කිරීම්] එතුමා අස් වීමේ ලිපිය බාර දුන්නා කියලා කිව්වා. නමුත් මට ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කිසිවක් කියන්න බැහැ.

ගරු එස්.බී. දිසානායක මහතා
(මාණ්පුමිකු එස්.බී. දිසානායක)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ දැනගැනීම සඳහා මම මේ කාරණය කියන්න කැමැතියි. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට කථානායක ධුරයේ හිටපු අය ඉන්නවා. නියෝජ්‍ය නායක හැටියට විපක්ෂයේ ඉඳගෙන නියෝජ්‍ය කථානායක ධුරය දරපු අය ඉතිහාසයේ සිටියා. දැනටත් නියෝජ්‍ය කාරක සභාපතිතුමා විපක්ෂයේ සිටිමින් නියෝජ්‍ය කාරක සභාපති ධුරය හොබවනවා. ඒ නිසා නිලංග සුමතිපාල මැතිතුමාට හා අපේ පක්ෂයට අවශ්‍ය නම්, එතුමා දිගටම නියෝජ්‍ය කථානායකතුමා හැටියට තබන්න පුළුවන් බව ඔබතුමාට කියන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් දැනුවත් කරලා අවශ්‍ය පියවර ගන්නම්. බොහොම ස්තුතියි.

මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

I

පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත
விசாரணை ஆணைக்குழுக்கள் (திருத்தம்) சட்டமூலம்
COMMISSIONS OF INQUIRY (AMENDMENT) BILL

"(393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මැයි 22 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளா தார அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 மே 22, செய்வாய்க்கிழமை, இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Tuesday, 22nd May, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

II

අල්ලස් (සංශෝධන) පනත් කෙටුම්පත

இலஞ்சம் (திருத்தம்) சட்டமூலம்

BRIBERY (AMENDMENT) BILL

"(26 වන අධිකාරය වූ) අල්ලස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මැයි 22 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளா தார அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 மே 22, செய்வாய்க்கிழமை, இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Tuesday, 22nd May, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

III

ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත

இலங்கை தேயிலைச் சபை (திருத்தம்) சட்டமூலம்

SRI LANKA TEA BOARD (AMENDMENT) BILL

"ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මැයි 22 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 மே 22, செய்வாய்க்கிழமை, இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Plantation Industries; to be read a Second time upon Tuesday, 22nd May, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

යෝජනා පිළිබඳ දැනුම්දීම, පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමා.

ප්‍රතිශෝධිත පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම

திருத்தப்பட்ட பாராளுமன்ற நிலையியற் கட்டளைகளின் அமுலாக்கம்

IMPLEMENTATION OF REVISED STANDING ORDERS OF PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That the Revised New Standing Orders of Parliament passed by Parliament on 07th March 2018, shall commence its operation from 15th April 2018 as per announcement made by the Speaker."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කිරීම

பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவையினது அமுலாக்கம்

IMPLEMENTATION OF CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the Code of Conduct for Members of Parliament approved by Parliament on 07th March 2018, shall commence its operation from 15th April 2018 as per announcement made by the Speaker."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කාරක සභා
குழுக்கள்
COMMITTEES

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order Nos. 101, 111 and 124 of the Parliament, Select Committees, Sectoral Oversight Committees and Committee on High Posts which are in operation at present, shall continue."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

තේරීම් කාරක සභාව
தெரிவுக் குழு
COMMITTEE OF SELECTION

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"In terms of Standing Order 114, the Committee of Selection shall consist of Mr. Speaker who shall be the Chair and Twelve (12) Members to serve during the current Session which shall include the Leaders of political parties or their nominees to be nominated by Parliament."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the under-mentioned Twelve (12) Members do serve on the Committee of Selection in addition to the Speaker who shall be the Chair during the current Session, in terms of the motion agreed to by Parliament this day:-

Hon. Rauff Hakeem
Hon. Lakshman Kiriella
Hon. Mahinda Samarasinghe
Hon. Risad Badhiutheen
Hon. Patali Champika Ranawaka
Hon. Mano Ganesan
Hon. Dinesh Gunawardena
Hon. Douglas Devananda
Hon. Vijitha Herath
Hon. Mavai S. Senathirajah
Hon. Dharmalingam Sithadthan
Hon. (Dr.) Nalinda Jayathissa"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

තේරීම් කාරක සභා රැස්වීම
தெரிவுக் குழுக் கூட்டம்
MEETING OF COMMITTEE OF SELECTION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තේරීම් කාරක සභාවේ රැස්වීමක් අද දින පස් වරු 2.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස සියලු ගරු සභික මන්ත්‍රීවරුන්ට මෙයින් දන්වා සිටිමි.

විද්‍යුත් ඡන්ද ක්‍රමය භාවිත කිරීමේදී ඇති වූ දෝෂ සහගත තත්ත්වය
இலத்திரனியல் வாக்கெடுப்பு முறைமையில் ஏற்பட்ட குழறுபடியான நிலைமை
PROBLEMATIC SITUATION ENCOUNTERED IN USE OF ELECTRONIC VOTING SYSTEM

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද ක්‍රමය භාවිත කිරීමේදී ඇති වූ දෝෂ සහගත තත්ත්වය පිළිබඳව සොයා බැලීමට මවිසින් පත් කරන ලද ස්වාධීන කමිටුවේ පරීක්ෂණ සහ නිර්දේශ සලකා බලා, ඊට අදාළ සමාගම විසින් නැවත වරක් එම පද්ධතිය යාවත්කාලීන කරන ලදී. ඒ අනුව අද පටන් ඡන්දය පාවිච්චි කිරීම සඳහා එම විද්‍යුත් පද්ධතිය සූදානම් කොට තිබෙන බව මම මෙම ගරු සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, විද්‍යුත් ඡන්ද ක්‍රමය භාවිත කිරීමේදී ඇති වූ දෝෂය සම්බන්ධයෙන් ඔබතුමා යම්කිසි පරීක්ෂණයක් කරලා, වාර්තාවක් ලබා ගත්තා. ඒ හා සම්බන්ධිත සිද්ධිය පිළිබඳව එම වාර්තාවේ කවර කරුණු අඩංගු වනවාද කියලා මේ ගරු සභාවට දන්වන්න පුළුවන්කමක් තිබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, සිදු වෙලා තිබෙන්නේ අංක එක හා දෙක දරන ආසනවලට ලබා දුන් connections වැරදීමයි. වෙන කිසිම වරදක් වෙලා නැහැ. ඒ ගැන අපිට සම්පූර්ණයෙන්ම සහතිකයක් තිබෙනවා. ඒ වාගේම most modern equipment අපට දැන් අලුතින්ම ලැබෙනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
වයර් දෙකක් මාරු වෙලාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, අංක එක දරන ආසනයේ වයර් එක අංක දෙක දරන ආසනයට දමලා, අංක දෙක දරන ආසනයේ වයර් එක අංක එක දරන ආසනයට දමලා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මේ ගොල්ලන්ගේ වයර් මාරු වෙලා!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අපි සෑහීමකට පත් වුණා. අද පක්ෂ නායක රැස්වීමේදී එයට එකඟත්වය ලැබුණා. අපරාදේ, නිකම් මුදල් නාස්ති කරන්න ඕනෑ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමා සඳහන් කළා, විද්‍යුත් ඡන්ද ක්‍රමය -වයර් මාරු වුණු ක්‍රමය- නැවත භාවිතයට ගන්නවාය කියලා. අපි හිටපු ආසන මේ වන විට වෙනස්වෙලායි තිබෙන්නේ. එතකොට ඒ පද්ධතියත් ඒ ආකාරයට සවි කර තිබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හදලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ ගැජට්-බැජට් ඔක්කොම සවි කරලාද තිබෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔක්කොම හදලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සහතිකයක් ඇතිව පටන් ගන්නේ ඒ නිසායි. බොහොම ස්තුතියි.

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා. අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනිවර කියවීම, කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනිවර කියවීම, දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනිවර කියවීම සහ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනිවර කියවීම.

ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමතිතුමිය.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
JUDICATURE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 1.41]

ගරු තලතා අතුකෝරල මහත්මිය (අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Justice and Prison Reforms)
ගරු කථානායකතුමනි, "අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න ඔබතුමාගේ අවසරය දෙන්න.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටිය" කියන ශීර්ෂය යටතේ ස්ථාවර නියෝග 50. (2) හි සඳහන් කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න මා කැමැතියි. ස්ථාවර නියෝග 50. (2) යටතේ මෙසේ සඳහන් වනවා:

[ගරු විමල් වීරවංශ මහතා]

"එවැනි සෑම පනත් කෙටුම්පතක්ම පළමුවැනි වර කියවීම නිම වූ වහා ම යෝජනාවක් නොමැතිව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාව විසින් පනත් කෙටුම්පතට සංශෝධන යෝජනා කරනු ලැබිය හැකිය. කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ආපසු වාර්තා කරන තෙක් හෝ පාර්ලිමේන්තුව විසින් එසේ වාර්තා කිරීමට ලබා දී ඇති කාලය ඉකුත් වන තෙක් පාර්ලිමේන්තුව විසින් ඒ පිළිබඳව කිසිදු පියවරක් ගනු නොලැබිය යුත්තේ ය."

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, පාර්ලිමේන්තුව prorogue කරලා, ඊයේ තමයි අලුත් සැසි වාරයක් හැටියට මේ පාර්ලිමේන්තුව රැස් වුණේ කියලා.

එතකොට න්‍යාය පත්‍රයේ එතෙක් තිබුණු සියලු කරුණු අභාවයට යනවා, අලුත් න්‍යාය පත්‍රයක් යටතේ මේ පාර්ලිමේන්තුව වැඩ කරන්න පටන් ගන්නවා. මගේ ප්‍රශ්නය මෙයයි. මෙම පනත් කෙටුම්පත ආංශික අධීක්ෂණ කාරක සභාවට ගෙන ගියේ නැහැ. මෙය ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාකච්ඡා කළ යුතුයි. මේක වැදගත් පනත් කෙටුම්පතක්; මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ ඉරණම තීරණය වන පනත් කෙටුම්පතක්; නීතියේ සාධාරණත්වය තීරණය කෙරෙන පනත් කෙටුම්පතක්. එම නිසා මෙම පනත් කෙටුම්පත ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාකච්ඡා කළ යුතුයි. එතැනදී මන්ත්‍රීවරුන් විසින් ලබා දෙන අදහස් උදහස් සැලකිල්ලට ගත යුතුයි. ඒ අනුව සංශෝධන විය යුතු නම් සංශෝධන කරගත යුතුයි. ඒ අවස්ථාව මහ හැරලා, මෙම පනත් කෙටුම්පත අද මේ පාර්ලිමේන්තුවේ විවාදයට ගෙන සම්මත කිරීමට යෑම රීතිවලට පටහැනියි. එම නිසා මේක වහාම නවත්වන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද එම වාර්තාව ඉදිරිපත් කළා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, වාර්තාව මන්ත්‍රීවරුන්ගේ මේස මත තබා තිබෙනවා. 2018.05.08වැනි දා සලකා බලන ලද පනත් කෙටුම්පත්; අධිකරණ සංවිධාන, අපරාධ නඩු විධාන සංග්‍රහය, දණ්ඩ නීති සංග්‍රහය යන ඒවායේ වාර්තා අපි ඉදිරිපත් කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
That point is covered. අනික් කාරණය මෙකයි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා මතු කළ ආකාරයට ආංශික අධීක්ෂණ කාරක සභාව ඊට බලපාන්නේ නැහැ. So, that is closed.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
එහෙම නම් මම කලින් ඉදිරිපත් කළ කාරණය පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල සඳහන් කර තිබෙන්නේ ඇයි?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ ආකාරයට එය ආංශික අධීක්ෂණ කාරක සභාවලට බලපාන්නේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ මේ කාරණයයි. මේක අලුත් පාර්ලිමේන්තු සැසි වාරයක්. ආංශික අධීක්ෂණ කාරක සභා අලුතින් පත් කරලාත් නැහැ. පරණ ආංශික අධීක්ෂණ කාරක සභා ගැන නොවෙයි මම මේ කියන්නේ. මෙම පනත් කෙටුම්පත විවාදයට ගන්නා අවස්ථාව වන විට ආංශික අධීක්ෂණ කාරක සභාවක් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද අපි මේ ගැන සාකච්ඡා කළා. පක්ෂ නියෝජිතයින් මුණ ගැහිලා සාකච්ඡා කරලා මේක අනුමත කර ගත්තා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ඒක වැරැදියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
We have accepted that. අලුත් පාර්ලිමේන්තු සැසි වාරයක් ආරම්භ වුණාට ආංශික අධීක්ෂණ කාරක සභා අහෝසි වෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි දැන් මෙතැනින් ඉස්සරහට යමු. ඒක පිළිගන්න. මේ පිළිබඳව සොයා බලා, දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා තමයි අපිත් කථා කරන්නේ. බොහොම ස්තුතියි. [බාධා කිරීමක්]- ඒක තමයි රීතිය.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
මීට කලින් අලුත් සැසි වාරයන් පටන් ගන්නකොට,-[බාධා කිරීමක්]-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක ආංශික අධීක්ෂණ කාරක සභාවලට බලපවත්වන්නේ නැහැ. හොඳයි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, පසුගිය සැසි වාරයේ බලපැවැත්වූ සියලුම කමිටු හා සියලුම ආංශික අධීක්ෂණ කාරක සභා මේ සැසි වාරයටත් වලංගු හැටියට ඔබතුමා ප්‍රකාශ කරනවා ද කියලා මම දැනගන්න කැමැතියි. දැන් ඒ රීතියට කරන්න බැහැ නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අද සවස 2.30 රැස්වීමක් තිබෙනවා. දැනට නීත්‍යානුකූලව ආංශික අධීක්ෂණ කාරක සභා වලංගුයි. ඒක අහෝසි වෙන්නේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එතකොට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, COPE එක, මේවා ගැන ස්ථාවරය මොකක්ද? හිතෙන හිතෙන විධියට මේවා කරන්න බැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 111(2)හි මෙහෙම සඳහන් වෙනවා:

"ආංශික අධීක්ෂණ කාරක සභා පාර්ලිමේන්තුවේ කාලය තුළ දී ක්‍රියාත්මක විය යුතු අතර, පාර්ලිමේන්තුවේ යම් කල් තැබීමක් හෝ වාරාවසාන කිරීමක් නොසලකා එහි විමර්ශන කටයුතු පවත්වාගෙන යනු ලැබිය යුත්තේ ය."

තවදුරටත් ස්ථාවර නියෝග 111(3)හි මෙහෙම සඳහන් වෙනවා:

"එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවට වෙන්කරනු ලැබිය යුතු විෂයයන් සහ කාර්යයන් තේරීම් කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය."

හොඳයි, බොහොම ස්තුතියි. -[බාධා කිරීමක්]-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ අනුව ගරු කථානායකතුමනි, සියලුම ආංශික අධීක්ෂණ කාරක සභා අඛණ්ඩව වලංගුව පවතිනවා කියලා ඔබතුමා ප්‍රකාශයක් කරනවා ද කියලයි මම අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සත්තකින්ම ඔව්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි මේ ප්‍රශ්නය මතු කරන තුරු තවම ඔබතුමා ඒ ප්‍රකාශය කළේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් ස්ථාවර නියෝගවල තිබෙනවා නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, ඔබතුමා ඒ ප්‍රකාශය කළ යුතුයි නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද න්‍යාය පත්‍රයේ 6වැනි Item එකේ ඒ පිළිබඳව සඳහන් කළා. ඒක අද කිව්වා. 6වැනි Item එකේ සඳහන්ව තිබෙනවා. මම හිතන විධියට ඒ වෙලාවේ ඔබතුමා මේ ගරු සභාවේ හිටියේ නැතුව ඇති. දැන් ගරු අධිකරණ ඇමතිතුමිය කථා කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, මම නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා. ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ සිද්ධ වෙන දේවල් ගැනවත් දන්නේ නැහැ. එතුමන්ලා දන්නේ එළියේ සිද්ධ වෙන දේවල් විතරයි. ඒ සම්බන්ධයෙන් මම බොහොම කනගාටු වෙනවා. කරුණාකරලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ ගැන බලන්න. මොකද හේතුව, ගරු කථානායකතුමනි,-[බාධා කිරීමක්]-

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මම සාධාරණ වෙලා ඔබතුමාට නැවත නැවත කථා කරන්න අවස්ථා කීපයකදීම ඉඩ දුන්නා. මේ කාරණය දැන් අවසානයි. කරුණාකරලා සාධාරණ වෙන්න. ඒ පිළිබඳව ස්ථාවර නියෝගවලත් තිබෙනවා. මම ඔබතුමාට කථා කරන්න අවසාන අවස්ථාව දෙන්නම්. ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ඉතාමත් සාධාරණව කාරණයක් පෙන්නුම් කරන්න මට අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෙන්වන්න. මම බොහොම සාධාරණයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, දැන් ඔබතුමා කියන විධියට ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තිබෙනවා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, සාකච්ඡා කරලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හැබැයි, ඒ සාකච්ඡා කරලා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට පෙරයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවත් එක්ක මේ පනත් කෙටුම්පතේ ස්වභාවය තවත් වෙනස් වෙනවා.

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසුවත් ආංශික අධීක්ෂණ කාරක සභාව තුළ සාකච්ඡා කළ යුතු නැද්ද? [බාධා කිරීම්] එහෙම නොවෙනවා නම්, ඔය ආංශික අධීක්ෂණ කාරක සභා තිබෙන්නේ කන්න ද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඊයේ සාකච්ඡා කළා. [බාධා කිරීම්] නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු අජිත් මාන්නප්පෙරුම මහතා. [බාධා කිරීම්]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අපි ඊයේ සාකච්ඡා කළා. මේ පනත් කෙටුම්පතට බය වෙන්නේ හොරු. [බාධා කිරීම්] හොරු තමයි මේ පනත එනවාට බය වෙන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් මෙතුමාට අවස්ථාව දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් point of Order ඉවරයි. ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමතිතුමිය.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) තලතා අත්තුකෝරල)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා. [බාධා කිරීම්] කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ නැහැ. ඒක පසුවට කල් තබනවා. මේ අවස්ථාවේදී දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත හා අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, විශේෂ ත්‍රිපුද්ගල අධිකරණ පිහිටුවීම සඳහා අවශ්‍ය පනත් කෙටුම්පත් සකස්කොට පෙබරවාරි මාසයේ 02 වෙනිදා ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළා. ඒ අනුව එය විවාද කරන්නට තිබුණේ මාර්තු මාසයේ 06 වෙනිදායි. නමුත් පාර්ශ්ව හතක් විසින් මෙය අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූලයි කියා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම් නිසා විවාදය කල් තියන්න සිදුවුණා. ඊට පසුව ශ්‍රේෂ්ඨාධිකරණය අපට දන්වා එවූ සියලු සංශෝධන සහිතව -ඒ වෙනස්කම් සහිතව- තමයි අද ඉදිරිපත් කරන්නේ. ඒ වාගේම සාපරාධී අපරාධයක වයස් සීමාව දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් ආකාරයට වයස අවුරුදු 8 සිට අවුරුදු 14 දක්වා වැඩි කිරීමත්, ඒ සඳහා අවශ්‍ය කරන විධිවිධාන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයට අනුව සංශෝධන කරන නිසාත් මේ පනත් කෙටුම්පත් තුනම අද ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මා පසුවට කථා කරන්න බලාපොරොත්තු වෙන අතර, මේ අවස්ථාවේදී අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා අවශ්‍ය ඉදිරිපත් කිරීම කරනවා ඇති.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිණා එඩුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
Sir, I went to the Supreme Court and challenged the Judicature (Amendment) Bill. The Determination of the Supreme Court read by you is in the Hansard of 03rd April, 2018.

මම නහන ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමාගේ තීරණයක් අපි බලාපොරොත්තු වෙනවා. මොකද, අධිකරණයේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංගයක්. එය වෙනසකට භාජනය වෙනවා නම් ජනමත විචාරණයකට යා යුතුය කියන දෙය එම වගන්තිවල අඩංගු කොටසක්. එම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වචනයක් හෝ වෙනස් කරනවා නම්, තුනෙන් දෙකක ඡන්දයක් අවශ්‍යයි. ප්‍රශ්නය ඒකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් කිසි වචනයක් වෙනස් කරනවා නම්, තුනෙන් දෙකක ඡන්දයක් අවශ්‍යයි. ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගේ නිවේදනයේම -Determination of the Supreme Court- මෙහෙම තිබෙනවා.
I quote:

> "The amending section 12A (2) of the Bill requires the Judicial Service Commission to nominate judges to the Permanent High Court at Bar. This is inconsistent with the article 154 (P) 2 of the Constitution and an amendment is required to be made to the Constitution to give effect to section-"

මෙහි කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්න කියලායි. දැන් ආණ්ඩුව හදන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්නය කියා ශ්‍රේෂ්ඨාධිකරණය දී තිබෙන නියෝගය ක්‍රියාත්මක කරනවා වෙනුවට මේ පනත් කෙටුම්පතේ වගන්ති තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ නොවෙයිනේ. ආණ්ඩුව ඉදිරිපත් කළ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතට ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරතුමාගේ බලතල ඔක්කොම උදුරා ගන්න හැදුවා. ගරු ඇමතිතුමා High Court පත් කරන්නට හැදුවා. දිනපතා නඩු අහලා; නීතිඥයන්ට නඩු අහන තැනින් සෙලවෙන්න බැරි විධියට වෙන උසාවියකට යන්නට බැහැ කියා නීතියක් ගෙනෙන්න හැදුවා. ඒවා තමයි ඔබතුමන්ලා ඉදිරිපත්

කළේ. කියවා බලන්න. මේවා තමයි තවම ඔබතුමා පනත් කෙටුම්පතේ ඉදිරිපත් කර තිබෙන්නේ. මම ගරු කථානායකතුමාගෙන් බරපතළ ප්‍රශ්නයක් අහනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අහන්න. අහන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ප්‍රශ්නයක් තමයි අහන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකි ක්‍රමයක් තිබෙනවා. ඒ ගැන මත භේදයක් නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයත් ඒක කියා තිබෙනවා.

නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම වක්‍ර ආකාරයකින් පනත් කෙටුම්පතකට ගෙනෙන සංශෝධන තුළින් කළ හැකිද කියන ප්‍රශ්නයයි ඔබතුමා හමුවේ තිබෙන්නේ. ඒ ගැන තීන්දුවක් ප්‍රකාශ කරන ලෙස ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ගැන දන්නවා. අපි ඒ අනුව කටයුතු කරනවා. ඒ අනුව අවශ්‍ය වගන්ති අපි සංශෝධනය කරනවා.

මේක පාර්ලිමේන්තුවේ හැම දාම වාගේ සිදුවන දෙයක්. හැම දාම මේ වාගේ දේවල් අහනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම නීති උපදෙස් ලබා ගත්තා. ඒ අනුව ඒ සහනිකය මට ආණ්ඩුවෙන් ලැබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමනි, ඔබතුමාට එක් අවස්ථාවක් ලබා දෙන්නම්.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මතු කළ ප්‍රශ්නය ඉතා වලංගු එකක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක හරි. ඒකට පිළිතුරක් දුන්නා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඒ කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය දීලා තිබෙන කරුණු දැක්වීම අනුව මේ තුළින් කරන්න යන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බලපාන සංශෝධනයක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ ගැන කියන්න අවස්ථාව දෙන්නම්.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඒ සංශෝධන ගේන්නේ නැහැයි කියලා කොහොමද කියන්නේ?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ කාරණය කියන්න අවස්ථාව දුන්නා.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - මින්වලු මற்றුම් පුදුප්පික්කත්තක්ක සක්ති ඉරාජාඞ්ක අමෙච්චර්)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
There is a point of Order being raised by the Hon. Ajith P. Perera.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමකු වන දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ 16වන පිටුවේ දෙවන ඡේදයේ මුල් කොටස කියෙව්වා. හැබැයි, එතුමා එහි අන්තිම වාක්‍ය කියෙව්වේ නැහැ.

එහි මෙසේ සඳහන් වනවා:

"However, if 12A (2) of the Bill is removed and Article 154P (2) remains as it is this inconsistency will cease."

ගරු කථානායකතුමනි, ඒ අනුව බොහොම පැහැදිලිව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ තිබෙන නිර්දේශයට අනුව නීතිපතිතුමා අදාළ සංශෝධනය කරලා තිබෙනවා. ඒ අනුව පළාත්බද මහාධිකරණයන්ට බලය ලැබෙන ආකාරයට; ඒ වාගේම ඒ පත් කිරීමේ බලය මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ක්‍රමයටම තබමින් තමයි මේ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ අනුව මේ කාරණය පිළිබඳව සියයට 100ක්ම ගරු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඒක සොයා බැලුවා.

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා.1.48]

ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த - நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு பிரதி அமைச்சர்)
(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Prison Reforms)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අද දවසේ දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන, ඒ වාගේම අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට සංශෝධන, ඒ වාගේම අධිකරණ සංවිධාන පනතට සංශෝධන ගෙන එනවා. පසුගිය කාල සීමාව තුළ මේ කාරණා සම්බන්ධයෙන් -විශේෂයෙන්ම අධිකරණ සංවිධාන පනතේ සංශෝධන සම්බන්ධයෙන්- පෙත්සම් ගණනාවක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වුණා. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව පිළිබඳව මම මුලින්ම වචනයක් කිව යුතුයි. ඒ අනුව මා 16වන පිටුවේ මේ කොටස කියවන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වනවා:

> "We determine that section 12A (1) of the Bill is inconsistent with the article 154P (3) (a) of the Constitution and an amendment is required to be made to the Constitution to give effect to the section 12 A (1) of the Bill. This requires the Bill to be passed by a two-third majority. However, if the jurisdiction is conferred on the High Court of Provinces under article 154P (3) (c) like in Act No. 10 of 1996 and Act No. 54 of 2006 this amending section will cease to be inconsistent."

මම හිතන විධියට මේ ආකාරයටම සංශෝධන තුනක් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් කරලා තිබෙනවා. එම නිසා, මේ විවාදය ඉදිරියට කරගෙන යාමට කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැයි කියලා මම හිතනවා.

විශේෂයෙන්ම පසුගිය කාල සීමාව තුළ වාගේම විවිධ රජයන් තිබුණු කාල සීමාවන් තුළ නඩු ප්‍රමාදය පිළිබඳව දිගින් දිගටම කථා කළා ගරු කථානායකතුමනි. නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙන ප්‍රශ්න පිළිබඳව බොහෝ දෙනෙක් කථා කළා. සමහර වේලාවට නඩුව ගොනු කරන දිනයේ සිට නඩුව අසන පළමුවන නඩු දිනය දක්වා මාස ගණනාවක් ගතවීමේ ක්‍රමවේදයක් අපේ රටේ පසුගිය කාලයේ ඇති වුණා. එයට හේතු වුණේ නඩු එකතුවීම, අධිකරණ පද්ධතිය තුළ තිබුණු ප්‍රශ්න රාශිය සහ භෞතික සම්පත් හිඟය ඇතුළු අනෙකුත් ප්‍රශ්නයි. අධිකරණ ක්ෂේත්‍රය ගැන කථා කරන විට අද තිබෙන බරපතළම විවේචනය කුමක්ද? බරපතළම විවේචනය තිබෙන්නේ නඩු කටයුතු ප්‍රමාදය පිළිබඳවයි. නඩු කටයුතු ප්‍රමාදය කියන්නේ යම්කිසි විශේෂ නඩුවක් හෝ සිද්ධි දාමයක් පමණක් නොවෙයි. අද බොහෝ වේලාවට ඉඩම් නඩුවක තීන්දුව, තීරණය ලැබෙන කොට පරම්පරා කිහිපයක් ගිහින්. එම නිසා නඩු කටයුතුවලට සහභාගි වෙන්නේ නැතිව අධිකරණ ක්‍රියාදාමය මහ හරින පිරිස අද අපේ රටේ වැඩි වෙලා තිබෙනවා. යුක්තිය පසිඳවාලීමේ ක්‍රියාදාමය කාර්යක්ෂම කිරීමේ වැඩකටයුත්ත අධිකරණ අමාත්‍යාංශයේ වගකීමක් වෙනවා. ඒ ක්‍රියාදාමය ඒ ආකාරයෙන් ඉදිරියට රැගෙන යාම සඳහා මේ සංශෝධන අත්‍යවශ්‍ය කාරණා බවට පත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද රටේ විවිධ මාතෘකා පිළිබඳව කථා වෙනවා. අපි තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ, මොන රජය යටතේ පැවතියත් මේ සමාජයට යම්කිසි අකටයුතුකමක් වෙනවා නම්, සමාජයේ ජනතාව අතර බරපතළ සාකච්ඡාවක් සිද්ධ වෙනවා නම්, මහ ජනතාවගේ අපේක්ෂා භංගත්වය තුරන් කිරීම සඳහා ජනතාවගේ විශ්වාසය වැඩි වැඩියෙන් දිනා ගන්නා වූ අධිකරණ ක්‍රමවේදයක් අපේ රටේ ස්ථාපිත කිරීම අපි සියලුදෙනාගේම වගකීමක් හැටියට සැලකිය යුතු බව.

මේ අධිකරණ සංවිධාන පනත් කෙටුම්පතට අදාළ සංශෝධන පිළිබඳව අපි කථා බහ කරන්නට පටන් ගත්තේ අද ඊයේ නොවෙයි. විශේෂයෙන් මම මතක් කරන්නට ඕනෑ, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105. (1) (ඇ) ව්‍යවස්ථාව යටතේ පිහිටුවීමට නියමිත මහාධිකරණය" යන සිරස්තලය යටතේ අපි 2017 නොවැම්බර් මස 05වෙනි දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ බව. 2017 නොවැම්බර් 07වෙනි දා මේ සඳහා අනුමැතිය ලැබුණා. එදා ඉඳලා මේ සම්බන්ධයෙන් නොයෙකුත් ගැඹුරු සාකච්ඡා වාගේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට තිබෙන අදාළත්වය ආදී කරුණු ගැන තර්ක විතර්ක රාශියක් අපේ රටේ ගොඩ නැඟුණා. එහෙම වටපිටාවක් ඇතුළේ තමයි අද අපට පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නට හැකියාව ලැබුණේ.

පනත් කෙටුම්පතේ තිබෙන සෑම කාරණයක් ගැනම මම අදහස් දක්වන්නට යන්නේ නැහැ. නමුත් පැහැදිලිව කියන්නට ඕනෑ, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවත් සමඟ ඇති කරන මේ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ තුළින් අපි අපේක්ෂා කරන මූලිකම අරමුණ වනුයේ අධිකරණයේ ස්වාධීනත්වය ඒ ආකාරයටම පවත්වාගෙන යාම බව. පසුගිය වසර දෙක, තුනක කාලය තුළ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව අපේ රටේ ජනතාවට ප්‍රසාදයකින් යුතුව කථා කරන්නට පුළුවන් තත්ත්වයක් අපි ඇති කරලා තිබෙනවා. ඒ තත්ත්වය ඉදිරියට ගෙනයාම තුළ පමණයි, මහ ජනතාවට අධිකරණ පද්ධතිය පිළිබඳව, නීතියේ ආධිපත්‍යය පිළිබඳව, මේ සියලු කරුණු කාරණා පිළිබඳව විශ්වාසයක් ඇති වන විධියට ඉදිරියට යන්නට පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මෙම කටයුත්තට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලබා ගත් පසුව මේ වැඩ කටයුතු ඉදිරියටම කරගෙන ගියා. ඒ යටතේ අවසාන වශයෙන් අද අපට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නට පුළුවන් වෙලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නට සූදානම් වන විට නීතිපතිවරයා හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යන දෙපළට පමණක් නඩු කටයුතු තීන්දු කිරීමේ හැකියාව තිබෙනවාද කියන සාධකය පිළිබඳව සමහර අය කථා බහ කළා.

ගරු කථානායකතුමනි, මෙම කටයුතු පිළිබඳ අවසන් තීන්දුව ගනු ලබන්නේ අග්‍රවිනිශ්චයකාරතුමා විසින් කියන කාරණය අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. මෙම අධිකරණ මොන විධියේ නඩු කටයුතු ගෙන යෑමටද, ඒ නඩු කටයුතු ඉදිරියට පවත්වා ගෙන යෑමට අවශ්‍ය කුමන වටපිටාවක් මේ තුළ නිර්මාණය කළ යුතුද කියන කාරණාව පිළිබඳ තීන්දු ගන්නේ අග්‍රවිනිශ්චයකාරතුමායි. ඒ ඔස්සේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ජනතා විශ්වාසය තවදුටත් පවත්වා ගැනීමට අපට පුළුවන්කම ලැබෙනවා. විශේෂයෙන්ම වරදක ස්වභාවය, බරපතළකම හා සංකීර්ණතාව, වරද සිදු කිරීමේ හා ඒ සම්බන්ධ අවස්ථානුගත කරුණු, අවස්ථාවෝචිත පරිදි චින්දිතයා හෝ රජය මත අපරාධයේ බලපෑම සහ යුක්තියේ යහපත පිණිස හෝ පොදු හෝ ජාතික අභිලාෂයේ ප්‍රමාණාත්මකභාවය යනාදී අරමුණුගත නිර්ණායක සැලකිල්ලට ගනිමින් තමයි ත්‍රිපුද්ගල මහාධිකරණවල මෙම නඩු කටයුතු අසන්නට අවශ්‍ය කරුණු කාරණා සියල්ල ඉෂ්ට සිද්ධ කරගෙන යන්නේ. ඒ වාගේම දින 28ක් ඇතුළත අභියාචනා කිරීමටත් අවස්ථාවක් තිබෙනවා. ඒ සඳහා වන අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කරන්නේත් අග්‍රවිනිශ්චයකාරතුමායි. එම නිසා අපට කිසි සැකයක් නැහැ. අපි සියලුදෙනා බලාපොරොත්තු වෙන වංචාව, දූෂණය පිටු දැකීම සඳහා, ඒ වාගේම බරපතළ මූල්‍ය වංචා මොන අවධියේ සිදු වුණත් ඒ සඳහා ජනතාව වෙනුවෙන් සාධාරණය ඉෂ්ට සිද්ධ කිරීම සඳහා අවශ්‍ය වටපිටාවක් තමයි අපි මේ ඔස්සේ සකස් කරගෙන යන්නේ.

අපරාධයක වගකීම දැරීමේ වයස් සීමාව අද වන විට ඉහළ නංවා තිබෙනවා. අපේ රටේ නීතිය අනුව අපරාධයක වගකීම දැරීමේ වයස් සීමාව අවුරුදු 8 වෙනවා. නමුත් බොහෝ රටවල ළමයින්ගේ මානසිකත්වය දෙස බලා එය වයස අවුරුදු 12 සිට 14 දක්වා සීමාවේ තබා තමයි එම කටයුත්ත කෙරෙන්නේ. එම නිසා මේ සම්බන්ධයෙනුත් අද සංශෝධනයක් ගෙන එනවා. අපි මේ පනත් කෙටුම්පත් සියල්ල සම්මත කර ගැනීම තුළින් අවසානයේ බලාපොරොත්තු වන්නේ ජනතා බලාපොරොත්තු ඉටු කිරීමයි. අපි සෑම දෙයක්ම කල්පනා කර බැලිය යුත්තේ ජනතාවගේ පැත්තේ සිටයි.

අද අධිකරණ ක්‍රියාදාමයකට සම්බන්ධ වූ විට නඩු විභාග සඳහා කල් ලබා ගැනීම නිසා විශාල වශයෙන් මුදල් වැය වීම සහ තවත් නොයෙකුත් ගැටලු පැන නඟින බව තමුන්නාන්සේලා දන්නවා. එම නිසා මහජනතාව වෙනුවෙන් දිනපතා නඩු ඇසීමේ ක්‍රමවේදය යළිත් ක්‍රියාත්මක කිරීම ඉෂ්ට සිද්ධ කර දීමේ වගකීම අපි සියලුදෙනාටම පැවරී තිබෙනවා. මේ අනුව නීතිඥ මහත්වරුන්ට නඩු කටයුතු සඳහා අනවශ්‍ය කාලයක් ලබා ගන්නට බැහැ. එම නිසා අවුරුදු ගණනාවක්, පරම්පරා ගණනාවක් ඉදිරියට ඇදෙන මේ නඩු ටික ඉක්මනින් අවසන් කිරීමට ජනතාව වෙනුවෙන් ඒ තීන්දුව ගන්න අපි බලාරොත්තු වෙනවා.

අධිකරණ ක්‍රියාදාමය කාර්යක්ෂම කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු අධිකරණ ක්ෂේත්‍රයේ තිබෙන අනෙකුත් ආයතනත් කාර්යක්ෂම කළ යුතුයි; නීතිපති දෙපාර්තමේන්තුව නීති ක්ෂේත්‍රයේ ආකර්ෂණීය තැනක් කළ යුතුයි. කවුරු කොහොම කිව්වත් අපි මේ පිළිබඳව ප්‍රායෝගිකව කල්පනා කර බැලිය යුතුයි. පසුගිය කාල සීමාව තුළ රජයේ නීතිඥ මහත්වරුන්ගේ චේතන සම්බන්ධයෙන් නිර්දේශ ක්‍රියාත්මක කර වැඩ කටයුතු රාශියක් කරගෙන ගියා. ඉදිරි කාලය තුළ රජයේ නීතිඥවරුන් විශාල සංඛ්‍යාවක් බඳවා ගැනීමට අවශ්‍ය වටපිටාව අපි සකස් කරගෙන යනවා.

අද රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ඵලදායිතාව සියයට 100ක් තරම් ආසන්න අගයක් අරගෙන තිබෙනවා. මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලාගේ සංඛ්‍යාව වැඩි කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යනවා. මේ සමස්ත ක්‍රියාදාමය ගොඩ නැඟීම තුළ පමණයි නඩු කටයුතු ප්‍රමාදය වැළක්වා ගැනීමට අපට අවස්ථාව තිබෙන්නේ. ඒ නිසා වැදගත් පනත් කෙටුම්පත් කිහිපයක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, ඒ සඳහා අනුමැතිය ලබා දේවි කියා අපි බලාපොරොත්තු වෙනවා. මේ මාස කිහිපය ඇතුළත මේ සම්බන්ධයෙන් නොයෙකුත් අදහස් ලබා දීලා, විශේෂයෙන් බරපතළම ප්‍රශ්නය බවට පත් වෙලා තිබුණු "මේ ක්‍රියාදාමයට දේශපාලන අත පෙවීමක් ඉදිරිපත් වේවිද?" කියන සැකය තුරන් කරන්නට අප සියලු දෙනාට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ තුළ රටේ ජනතාවගේ විශ්වාසය ගොඩ නඟා ගෙන ඉක්මනටම සියලු දෙනාගේම නඩු කටයුතු ටික විසඳා අවසාන කර, අධිකරණය කෙරෙහි ජනතාවගේ විශ්වාසය තව දුරටත් වැඩි දියුණු කරමුයි කියන කාරණාව මතක් කරමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මේ අවස්ථාවේදී කාරණයක් පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. "බී" නිවේදනය ඉදිරිපත් කිරීමේදී මා සඳහන් කළේ, "මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත." යනුවෙනුයි. ඒක ඒ අවස්ථාවේ නිවැරදිව ඇසුණාද කියා සැක සහිත නිසායි මා නැවත මතක් කළේ.

මීළඟට, ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා.

[2.00p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Sir, for the opportunity to say a few words in respect of the important Amendments that are being brought before this House today, particularly the Amendment that is being sought to be made to the Judicature Act, by which a Permanent High Court of Trial at Bar is to be established to try certain categories of cases which, in the interest of justice and in the present circumstances, require to be expeditiously concluded.

The law's delays have been the bane of our judicial system for so long. Therefore, even in the criminal justice system, the accused in very serious cases have often escaped due punishment making use of the law's delays and over a period of time, sometimes, it also results in them being pronounced "not guilty" due to unavailability of witnesses et cetera. If a trial happens 10 or 15 years after the incident, invariably even eyewitnesses, sometimes, are not among the living and documentary evidence also goes missing. These are our experiences when long delays happen in the process of the criminal justice system.

So, this Amendment that has been brought is timely because there is a clamour, an expectation in the country that certain types of offences, by which the country's economy has been weakened and certain categories of offences that have been committed with impunity, are not being taken up and pursued. Particularly, if crimes that have been committed by persons in political authority are not taken up in a timely manner, invariably they drag it until there is a change of regime and then, once they are back in the saddle, they ensure that the process is stultified permanently. So, this has been, I think, one of the biggest reasons why corruption at the highest levels in this country has never been effectively addressed. A Parliament term of five years or even six years, as we had previously, is not enough to conclude serious trials involving political bigwigs. Our country also has a history of changing regimes and when there is a change, a change of the guard, they escape permanently.

This Government came with a very specific mandate to address the issue of corruption, to deal with corrupt politicians in particular, bring them before the law and ensure that the due course of justice is followed. Unfortunately, three years after the change happened, there has been only one conviction, which has also been subject to an appeal. In our system, generally, we have two appeals. We can envisage the lapse of another decade or so before finality is reached even with regard to that one conviction.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
ගරු කථානායකතුමනි, මෙතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
No. I am not giving way, Sir.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
I just want to ask a question.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
If it is a point of Order that you are raising, I can allow you. But, otherwise, do not take his time.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I am not giving way. I am sorry.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
Just one small question.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I am not giving way. He does not understand -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
If it is a point of Order, I can allow you. But, otherwise, Hon.Sumanthiran can go ahead.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
Hon. Member, what I want to ask you is, do you not think that you all are taking over the power which had been given to the Provincial Councils?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Aeunsika Fernando, why do you not raise that when participating in the Debate? Go ahead, Hon. Sumanthiran.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
So, Sir, this is the history, as I said, of the criminal justice system, which had become ineffective due to these long delays.

I want to cite one or two examples. There are examples under the ordinary laws. But, even in cases filed under the Prevention of Terrorism Act, which is a special law under which prosecutions happen fast or are supposed to happen in a faster pace primarily because of the fact that confessions are used as admissible evidence, we find trials not concluding for 20 years. One good example is the case of the attempted murder of the former President Madam Chandrika Bandaranaike Kumaratunga. It took 17 long years for that case to conclude. So, even in respect of the first citizen of this country - when she was the President, an attempt was made on her life - for the State to prosecute the suspects, it took 17 years, to get a judgment even in the original court.

Here, I want to raise another issue. There was a couple, a Hindu priest and his wife, who were accused among the several accused in that case. The man was convicted and received sentences running consecutively for several hundreds of years. But, the wife was acquitted of all charges. After 17 years, she was acquitted and in all those 17 years, she was in remand. She, now, has to get treatment for mental health. This is just one example where even with regard to the so-called "victim", it took 17 long years for justice. But, with regard to the suspects also severe injustice was made. I cite this example because it is a poignant one to be able to point out that from all sides, people have suffered because of these long law's delays. So, it is not in the interest of anyone or in the interest of any orderly society for cases, particularly serious criminal cases, to drag on like this.

Now I must commend some of the petitioners who went before the Supreme Court challenging the provisions of this Bill. I must also disclose the fact that I appeared myself in this matter for certain interventions and supported the provisions of the Bill. Some of the petitioners raised a very important question, that it violated the Thirteenth Amendment. They raised the issue that after the Thirteenth Amendment to the Constitution, the original criminal jurisdiction in a particular province lay only with the Provincial High Court and not the High Court of Sri Lanka. That seems to be the case and I think the Supreme Court also has upheld that provision. So, all of those who challenged this Bill, thank you for strengthening devolution. All these years we thought there was no devolution of judicial power, but now you have gone to court and established that judicial power is also devolved under our Constitution. Be that as it may. That change is being made in the Committee Stage Amendments, that it will be before the Provincial High Court, because it is the Provincial High Court that has jurisdiction over original criminal matters. Until now, since 1987, when the Thirteenth Amendment was brought in, I do not think that this has been followed. They followed a system of judicial zones as a matter of administrative practice. But as a matter of constitutional position, this had not been followed. I hope, after this Determination, the Attorney General will now follow the principle that has been enunciated in this Determination and comply with what the Supreme Court has said even in respect of all other matters, not necessarily those that come under the Permanent High Court at Bar.

Then, the objections that were raised with regard to court not granting postponements and so on, have all been dealt with by the Supreme Court. These are not new provisions. These provisions are there or have been there even in respect of certain other matters. Although I am not a criminal practitioner, I know criminal practitioners know that in respect of jury trials, day-to-day trial is the

norm. Once the jury is constituted, you cannot be granting long dates - three months, four months et cetera - between dates. It has to happen day-to-day. In a sense day-to-day trials, particularly in criminal matters - it applies to civil matters also- is essential because even if it is one judge hearing the case or it is the jury that is trying the case or three judges as in the case of trials-at-bar, they should be in a position to remember all of the evidence sequentially being placed before them There is no point in having long intervals between trial dates, in between which they would have heard another hundred or two hundred cases, for it to be humanly possible to remember what a particular witness said on the previous date. A witness's evidence might actually spans several dates and it is not possible for even a legally trained judge to keep a track of or, remember the demeanor et cetera of a witness. They will have to go by proceedings. So, the whole point of a trial in open court, in public, a public hearing, would be lost if such is the case. But here is a provision that is being brought, not in all cases, but in certain instances, where the Permanent High Court at Bar will hear the cases day-to-day and no one will be the loser as a result because even an accused before that court can actually expect, if there are factors in his favour, for the judges to remember those factors when they write the judgment. It is so with the prosecution as well. No one should be able to rely on imperfect memory of those who hear the case; either judges or jury or whoever it maybe. A perfect memory as much as possible is essential before adjudication is made, I say, particularly in criminal matters. Repeatedly I am saying that, because it is in those matters that a person's personal liberty can be deprived by the sentence that is passed. That is a very serious matter, so care must be taken to ensure that every bit of evidence that is placed before court is seriously addressed, remembered, analyzed, dealt with and pronounced upon.

So, this is the system that is sought to be brought. Not just one judge but three judges - three legally trained minds - would be addressing that issue. According to the new Amendment that will be brought in, they will be appointed by the Chief Justice himself. So, there is complete independence in the manner of choosing who those judges would be in those Permanent High Court at Bar and instead of one judge you have three judges addressing their minds to the matter. So, I would say great care has been taken to ensure that justice is done, that the guilty is punished and also the innocent will not be punished, that all legal and factual matters can be dealt with fully before the court makes an adjudication in respect of these matters.

The other is shortening the time for appeals. There can be one appeal, but that is sufficient because when you have a matter that has been heard by three judges and a decision made, there will be no necessity for two appeals, and therefore, one appeal to the apex court is more than sufficient. Presently, when there has been a trial-at-bar, it is a bench of five Supreme Court judges who have to hear that appeal. So, you would have had three judges at the level of High Court and if there is an appeal, five judges at the highest level who heard the case before a final decision is made.

So, there is nothing to really complain about this institution that is being set up. It cannot be called "witch-hunt" by any means. It is designed in the best interest of disposing serious issues bringing the crimes before court and the courts to make an adjudication on that, but also all rights that accused before court have hitherto enjoyed will continue to be theirs. There is nothing that is being taken away in this special process. As for myself, I commend the move by the Hon. Minister of Justice for having brought in this important Amendment through which Permanent High Courts at Bar can be set up in every province or in certain provinces where that is required.

I also want to place on record the work that was done in this respect by the previous Minister of Justice who is here, the directions that he gave, and the Sectoral Oversight Committee which worked on this process and all Members in that Committee who gave off their time and had long discussions with the various institutions before this draft Bill was approved by that Committee. It is hoped that the beginning that we envisaged today with the establishment of this Permanent High Court at Bar, we will see a new chapter dawning in disposal of cases in the country dealing with serious crimes, particularly, in the area of corruption, bribery and other financial crimes and the impunity that has hitherto been enjoyed by various personalities of all political hues, will be brought to an end. We can all be proud that this Parliament brought in this mechanism and established this Permanent High Court at Bar which would render justice to all.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය සඳහා පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you can commence your speech.

[අ.භා 2.22]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "යුක්තිය ඉටු වීම පමණක් ප්‍රමාණවත් නැත. යුක්තිය ඉටු වන බව පෙනිය යුතුය" කියන එක යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ අතිශයින්ම වැදගත්

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

මූලධර්මයක් විධියට අපි දකිනවා. එම මූලධර්මය මේ පනත් කෙටුම්පත හරහා කුමන ආකාරයෙන් උල්ලංඝනය වන්නේද යන්න පිළිබඳව අපේ අවධානය අද යොමු කළ යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව බලයට ආවේ වංචාව, දූෂණය වැළැක්වීම පිළිබඳ මැතිවරණ ව්‍යාපාරයකින්. හොරු අල්ලනවාය කියලායි බලයට ආවේ. මේ ආණ්ඩුව බලයට එන්න විධායක ජනාධිපති ධුරය නැති කරනවා වාගේ දේවල් ගැන නොවෙයි කථා කළේ. "පසු ගිය ආණ්ඩුව දූෂිතයි, මේ දූෂිතයන්ගෙන් රට බේරලා යහ පාලනය ඇති කරනවා" කියන පොරොන්දුව තමයි ප්‍රධාන නියාමක බලවේගය බවට පත් කර ගත්තේ. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා වසර තුනහමාරක් යන කොට මොකද වුණේ? අධිවේගී මාර්ග ඉදි කිරීමේ දී සියයට 90ක්ම නිබුණේ කොමිස් කියලා ඒ දවස්වල කිව්වා. හැබැයි, මේ ආණ්ඩුව අධිවේගී මාර්ග ඉදිකරද්දී කලින් ආණ්ඩුවටත් වඩා පිරිවැය වැඩියි. හරි නම්, කලින් තිබුණු පිරිවැයෙන් සියයට 10කින් කරන්න එපා යැ.

වරාය හදද්දී, ගුවන් තොටුපොළවල් හදද්දී, විදුලි බලාගාර හදද්දී මහා දැවැන්ත ලෙස ඉහළ මිලක් පෙන්වා වංචාවල් සිදු කරලා තිබෙනවා කියලා කිව්වා. ඉන් පස්සේ ඒවා පිළිබඳව කිසිම සාකච්ඡාවක් මේ රටේ නැති වුණා. ඒක නිසා ජනතාව රවටවලා, බොරු කියලා ජනතාවගේ ඡන්දය සොරකම් කළාය කියන හැඟීම ජනතාවට ඇති වුණා. එදා අපි කිව්වේ ඇත්තය කියන එක කොහොම හරි ඔප්පු කරලා පෙන්නුවේ නැත්නම් පුංචි ඡන්දයෙන් ජනතාව දුන් කනේ පහර ඊළඟ මැතිවරණවලදී පොලු පහරක් බවට පත් වෙන බවට ආණ්ඩුවේ නායකයන්ට සක්සුදක් සේ පැහැදිලි වෙලා තිබෙනවා. ඒක නිසා තමයි කඩිමුඩියේ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

මා මිත්‍ර සුමන්තිරන් මන්ත්‍රීතුමාත් කථා කළා, දිනපතා නඩු ඇසීම පිළිබඳව. විශේෂයෙන්ම අපි මේ කාරණය කියන්න ඕනෑ. මේ උපලේඛනයේ පෙන්වනවා, වැරදි 68ක් පිළිබඳව. මේ වැරදි අතර සොරකම තිබෙනවා. හැබැයි, සොරකමට වඩා බලවත් වරදක් ලෙස දකින මංකොල්ලය නැහැ. මේ උපලේඛනයට සොරකම දාලා මංකොල්ලය නැත්තේ ඇයි? දේශපාලන පළිගැනීමේ උපාය මාර්ගයක් විධියට ගනිද්දී දේශපාලකයන්ට එල්ල කළ හැකි යැයි සිතන සියලුම වැරදි ටික එකතු කරලා තිබෙනවා. එවැනි වැරදි 68ක් තිබෙනවා. මේ රටේ වංචාව, දූෂණය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම්, බලය අයුතු ලෙස පාවිච්චි කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම්, එම නිශ්චිත කාරණා පමණක් ගත හැකිව තිබුණා. දේශපාලකයෙක් කොහෙන් හරි ගෑවෙන්න ඉඩක් තිබෙන සියලුම වැරදි ටික මේ උපලේඛනයට ඇතුළත් කරගෙන තිබෙනවා.

එතකොට මේ සියලුම නඩු අතරින් කාරණා 5ක් පමණක් පදනම් කරගෙන ත්‍රිපුද්ගල මහාධිකරණයට යොමු කරන්න මෙතුමන්ලා බලාපොරොත්තු වනවා. මුලින්ම ඒ බලය දීලා තිබුණේ, ආණ්ඩුවේ නියෝජිතයන්ගෙන් පමණක් සමන්විත වෙලා සිටි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් පත් කරන, පක්ෂග්‍රාහීත්වය පිළිබඳ අපකීර්තිමත් ඉතිහාසයක් තිබෙන නීතිපතිවරයාට සහ විධායකය විසින් සෘජුව පත් කරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාටයි. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මෙය අභියෝගයට ලක්වුණා. නීතිපතිවරයාගෙන් අග්‍රවිනිශ්චයකාරතුමාට ඉදිරිපත් කරලා, අග්‍රවිනිශ්චයකාරතුමා හරහා මේක යොමු කරන්න අපට පුළුවන් වුණා. හැබැයි, අග්‍රවිනිශ්චයකාරතුමාට ඉදිරිපත් කරද්දී නිර්ණායක 5ක් යටතේ තමයි මේක සලකා බැලෙන්නේ. ඒ නිර්ණායක 5 තමයි වරදක ස්වභාවය සහ අවස්ථානුගත කරුණු, වරදක බැරෑරුම්කම, වරදක සංකීර්ණ බව, වරදක් නිසා විත්දිතයා මත වන බලපෑම, වරදක් නිසා රජය මත වන බලපෑම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නීතිපතිතුමාට කරුණු දක්වා අගවිනිසුරුතුමාගේ එකඟතාව අරගෙන දේශපාලකයා පමණක් ඉලක්ක කරගත හැකියි. දැන් මේක අහන්නේ, පළාත්බද මහාධිකරණ විසින්. එතැනදීත් අගවිනිසුරුතුමාගේ එකඟතාව අරගෙන, මේක අහන්න ඕනෑ මොන මහාධිකරණයේද කියන එක තීරණය කරන්නේ විෂයභාර අමාත්‍යවරයායි. ඉතින් මේ නඩු අහන ත්‍රිපුද්ගල අධිකරණය පිහිටුවන්නේ මොන මහාධිකරණයේද කියන එක තීරණය කරන්නේ විෂයභාර අමාත්‍යවරයා වුණාම, අගවිනිසුරුතුමා ඉදිරියේ අනෙක් පාර්ශ්වයන්ට කරුණු දැක්වීමට අවස්ථාවක් නැති නිසා, අගවිනිසුරුතුමාගේ එකඟතාව එයට ලැබීම තමයි සාමාන්‍යයෙන් සිදු වෙන්න ඉඩ තිබෙන දේ. මා මෙය අපේ අධිකරණ ඇමතිතුමියට පෞද්ගලිකව කියන දෙයක් නොවෙයි. කවුරුන් ඇමති ධුරයේ සිටියත් ඇමතිවරයා යවන තීරණයට අගවිනිසුරුතුමාගේ එකඟතාව ලැබීමයි සාමාන්‍යයෙන් මෙහිදී සිද්ධ වෙන්න ඉඩ තිබෙන දේ.

ඊළඟට, මා කලින් සඳහන් කළ දිනපතා නඩු ඇසීම පිළිබඳ කාරණය ගැන සඳහන් කරන්න කැමැතියි. ඇයි, අපි මේකට විරුද්ධ වන්නේ? විශේෂයෙන්ම දේශපාලන පළිගැනීම් සඳහා ගොතන ලද නඩුවලදී මේ රටේ ඉන්න කීර්තිමත් නීතිඥයන්, සමහරවිට දවසට ලක්ෂ ගණනින් ගාස්තු අය කරන නීතිඥයන් මේ නඩුවල තිබෙන දේශපාලන ස්වභාවය දැකලා, අසාධාරණය දැකලා ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන්, පළාත් සභා මන්ත්‍රීවරුන් වෙනුවෙන් නොමිලයේ පෙනී සිටින්න ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නීතිඥවරු මුදල් ගෙවා රඳවා ගන්න අපට හැකියාවක් නැහැ. හැබැයි, නඩු අහන්නේ දිනපතාම නම, ඒ නීතිඥවරයාගේ ආදායම් මාර්ගය ලෙස ඉතිරි වෙලා තිබෙන්නේ මේ නඩුව විතරක් නම්, ඒ නීතිඥ මහත්වරුන් ලොකු ගාස්තු අය කරන අය නම් -ඒ අයගේ දරුවෝ විදේශගතව ඉගෙන ගන්නවා වෙන්න පුළුවන්, විවිධ සුපිරි වාහන පාවිච්චි කරනවා වෙන්න පුළුවන්, ඉහළ ජීවන රටාවකට හුරුවෙලා ඉන්නවා වෙන්න පුළුවන්.- දිනපතාම අහන නඩුවකට දීර්ඝ කාලයක් නොමිලයේ පෙනී සිටින්න එතුමන්ලාට හැකියාවක් ලැබෙන්නේ නැහැ. එතකොට මොකක්ද සිද්ධ වන්නේ? එහෙම නම් අකමැත්තෙන් වුණත් ඒ නීතිඥවරයාට තමන්ගේ සේවා දායකයාට කියන්න වෙනවා, "මට මේ නඩුව කරන්න බැහැ, වෙනත් කෙනෙක් සොයා ගන්න" කියලා. එතකොට තමන්ගේ ඉලක්කය වන, තමන්ට නිසරදයක් වෙලා තිබෙන ඒකාබද්ධ විපක්ෂයේ ක්‍රියාකාරින් සිරගත කිරීමට අවශ්‍ය පසු බිම පහසුවෙන් සකස් කර ගන්න ඒ හරහා මඟ පාදා ගන්න පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි ත්‍රිපුද්ගල අධිකරණයක් ගොඩනඟා ගැනීම සඳහා හදා ගත් පසු බිම අපි දැක්කා. පසු ගිය අවුරුදු තුන තුළම අපි දැක්කේ මොකක්ද? අපිට මතකයි, දින සියයේ ආණ්ඩුවේ නම් ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න මහත්තයා තමයි මුලින්ම එළියට ඇවිල්ලා කිව්වේ ඊළඟට අත් අඩංගුවට ගන්නේ කවුද කියලා. ඒ කියනවා වාගේම, ඊළඟට අත් අඩංගුවට ගැනීමත් සිද්ධ වෙනවා. ඊළඟට අත් අඩංගුවට ගන්න නියමිත එක්කෙනා රටට නිවේදනය කිරීමේ වගකීම රජයේ මාධ්‍ය ප්‍රකාශක රාජිත සේනාරත්න ඇමතිතුමා භාරගෙන තිබුණා. නීතිපති දෙපාර්තමේන්තුව, පොලීසිය අතිශයින්ම දේශපාලනීකරණය කරගෙන, දේශපාලනඥයන්ගේ බලපෑම් මත මේ ක්‍රියාවලිය සිදු වන බව හිටපු අධිකරණ ඇමතිතුමා වරක් විවෘතවම ප්‍රකාශ කළා. විවිධ දේශපාලන නායකයෝ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අත් අඩංගුවට ගන්න කියා බලපෑම් කර තිබුණා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාව මේ අවස්ථාවේ අත් අඩංගුවට නොගත්තොත් නැවත අවස්ථාවක් ලැබෙන්නේ නැහැය, ඇවන්ට් ගාර්ඩ් සිද්ධියේදී කෙසේ හෝ

කොටු කරන්න ඕනෑය කිව්වා. මෙන්න මේ පසු බිම මත තමයි මේ ත්‍රිපුද්ගල අධිකරණය එන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේ විශේෂයෙන් කියන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. එක්නැලිගොඩ නඩුවේ සැකකරුවන් විධියට රක්ෂිත බන්ධනාගාරගත කරගෙන සිටි හමුදා භටයන්, හමුදා නිලධාරීන් ගෙන්වා, 'එක්නැලිගොඩ අතුරුදහන් කළේ අපියි. එක්නැලිගොඩ අතුරුදහන් කරන්න අපට උපදෙස් දුන්නේ ගෝඨාභය රාජපක්ෂ හිටපු ආරක්ෂක ලේකම්තුමායි' කියා වහාම පොලීසියට ප්‍රකාශයක් කරන්න, එතකොට මේ ප්‍රශ්නයේදී ඔබ හිරේ වැටෙන්නේ නැතිව බේරා ගන්න අපි උදව් කරනවාය කියා ඔවුන්ට උපදෙස් දෙන්න යැයි දේශපාලන නායකත්වයෙන් යුද හමුදාවේ බුද්ධි අංශ අධ්‍යක්ෂවරයාට උපදෙස් ලැබී තිබෙන බවට හමුදාවේ ඉහළම නිලධාරියකුගෙන් අපට තොරතුරක් ලැබුණා. මම දන්නේ නැහැ, බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා මේ දෙය කළාද, නැද්ද කියා. නමුත් ඔහුට එවැනි උපදෙසක් ලැබී තිබෙනවා. මෙවැනි දෙයක් වීමේ සූදානමක් තිබෙනවාය කියා හමුදාවේ ඉහළම නිලධාරියෙක් මාව දැනුවත් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ අප මෑතකදී සම්මත කරපු නීතියක් අනුව නම් වින්දිතයන්ට වාගේම සාක්ෂිකරුවන්ටත් බලපෑම් කිරීම, සාක්ෂි විකෘති කරන්න උපදෙස් ලබා දීම සිර දඬුවම් ලැබිය හැකි වරදක්. අපට ලැබුණ තොරතුරු අනුව මේ වරද කරන්න යන්නේ රටේ ඉහළම හමුදා නිලධාරියෙක්. ඒ නිසා අපි මෙය අවස්ථාවක් කර ගන්නවා, මේ ආණ්ඩුවට ඇති වෙලා තිබෙන අලුත්ම භය වන "ගෝඨා" බයට ප්‍රතිකාර විධියට ආණ්ඩුව කරගෙන යන පිළියම් වෙනුවෙන් හමුදාවේ ගෞරවය, කීර්තිය විකුණන්න එපා කියා හමුදාවේ ඉහළ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් ත්‍රිපුද්ගල අධිකරණයක් නම්, නීතිපතිවරයාගේ ඉල්ලීම මත අග විනිසුරුතුමා එය පත් කරනවා; ඒ නඩුව අවසන් වුණාම ත්‍රිපුද්ගල අධිකරණය විසිර යනවා. නමුත් මේ අවස්ථාවේ මෙය ස්ථාවර අධිකරණයක් වනවා කියන්නේ, මෙය මේ ආණ්ඩුව කාලයෙන් අවසන් වන්නේ නැහැ කියන එකයි. උඩ දමන හැම දෙයක්ම බිම වැටෙනවා වාගේ, ඊළඟට බිහි වන ආණ්ඩු කාලවලත් මේ අධිකරණය පවතිනවා. අද මේ පනත් කෙටුම්පත වෙනුවෙන් අත ඔසවන මන්ත්‍රීවරුන්ට මේ අධිකරණයම පාරා වළල්ලක් වීමේ අවදානම තිබෙනවාය කියන අනතුරු ඇඟවීම අප මේ සභාවේදී කළ යුතුයි. මේ ආණ්ඩුව ඉතාම නීති විරෝධී ආකාරයෙන් මූල්‍ය අපරාධ විමර්ශන අංශය හදලා රටේ නීතිය ක්‍රියාත්මක කිරීම ජාත්‍යන්තරය ඉදිරියේ අපකීර්තියට පත් කළා වාගේ, නැවත වතාවක් මෙවැනි දේශපාලන අරමුණු ඇති නීති පාර්ලිමේන්තුව හරහාම සම්මත කරලා අපේ රටේ අධිකරණය හැල්ලුවට ලක් කරන්න එපා. තමුන්නාන්සේලා කරන මෙවැනි ක්‍රියා නිසා, මෙවැනි අධිකරණ පිහිටුවමින් අධිකරණයට දේශපාලනමය වශයෙන් අත පොවන්න තමුන්නාන්සේලා උත්සාහ කරන නිසා තමයි "ශ්‍රී ලංකාවේ අධිකරණය කෙරේ විශ්වාසය තැබිය නොහැකියි. ජාත්‍යන්තර අධිකරණ පැමිණ මේ රටේ නඩු ඇසිය යුතුයි" කියන තර්කය සාධාරණීකරණය කරන්න ජාත්‍යන්තරයට හැකි වන්නේ.

මා මිත්‍ර සුමන්තිරන් මන්ත්‍රීතුමා නම් මේ කාරණයට කැමැති ඇති. මොකද, එතුමන්ලා ජාත්‍යන්තර විනිසුරුවන් ලංකාවට ගෙන ආ යුතුයි කියන මතයේ ඉන්නා නිසා. නමුත් රටේ ස්වාධිපත්‍යයට ආදරය කරන පුද්ගලයින් විධියට අපි අධිකරණයේ ස්වාධීනත්වය රැක ගත්තොත් පමණයි, අග විනිසුරුතුමාට තිබෙන බලය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ලබා දීලා තිබෙන බලය- උදුරා ගන්න උත්සාහ නොකළොත් පමණයි අපේ රටේ ස්වාධීන අධිකරණයක් ඇති කරලා, අධිකරණය පිළිබඳ ගෞරවයක් ඇති කරලා, මේ ජාත්‍යන්තර පීඩනයෙන් බේරෙන්න පුළුවන් වෙන්නේ. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නීතිපතිවරයා ගැන, පොලිස්පතිවරයා ගැන, අධිකරණය පිළිබඳව මේ රටේ ජනතාවගේ විශ්වාසය නැති වුණාම, තමන්ට වරදක් වුණාම, පොලීසියට ගිහිල්ලා පැමිණිලි කරනවා වෙනුවට තමන් විසින් තමන්ට යුක්තිය ඉටු කර ගන්න ජනතාව උත්සාහ කරනවා. ඒ නිසා තමයි මිනී මැරීම්, වෙඩි තබා ගැනීම් ආදිය පිළිබඳව අද සමාජයේ නිරන්තරයෙන් අහන්න ලැබෙන්නේ. අද ජනතාව හිතනවා, තමන්ට යුක්තිය ඉටු කර ගැනීම සඳහා තිබෙන එකම මඟ පළිගැනීමයි කියලා. ඒ නිසා මෙවැනි දේශපාලන පළිගැනීම් සඳහා අධිකරණය යොදා ගැනීමට මේ සභාවේ සහයෝගය ලබා නොදිය යුතුයි. ඒ නිසා ඒ පාප කර්මයට දායක නොවන මෙන් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. Next, the Hon. Ajith P. Perera. You have ten minutes.

[අ.භා.2.34]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, what is your point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ බාධා කිරීම පිළිබඳව මම ඔබතුමාගෙන් සමාව ඉල්ලනවා. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. අනුරාධපුර, විජිතපුර සටන -දුටුගැමුණු මහ රජ්ජුරුවෝ සහ එළාර රජ්ජුරුවෝ අතර ඇති වුණු ඒ ඓතිහාසික සටන- පැවැති භූමිය ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් නීති විරෝධී ලෙස ඩෝසර් කරලා අද පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති සම්පත් විශාල ප්‍රමාණයකට හානි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේක ඉතාම තීරණාත්මක ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, continue your speech.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වැදගත් විවාදයේදී අදහස් දක්වන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

මා මුලින්ම කියන්න කැමැතියි, මේ රටේ බරපතළ අපරාධ විභාග කිරීම පිළිබඳව විශාල ප්‍රමාදයක් තිබෙන බව. ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව විසින්ම කරන ලද පරීක්ෂණයක් අනුව, වරද සිදු කළ දිනය සහ මහාධිකරණයේ අධි චෝදනාව ගොනු කිරීම දක්වා ගතවන කාලයේ සාමාන්‍ය අගය වසර 4.7යි; අධි චෝදනාව ගොනු කරන දිනයේ සිට සත්‍ය ලෙසම අදාළ නඩු විභාගය ආරම්භ වන දිනය දක්වා ගතවන කාලයේ සාමාන්‍ය අගය වසර 3.7යි; මහාධිකරණයේදී නඩුවේ සාක්ෂි විභාගය ආරම්භ කළ දිනයේ සිට නඩුවේ තීන්දුව ප්‍රකාශ කරන දිනය දක්වා ගතවන කාලයේ සාමාන්‍ය අගය වසර 1.8යි.

බරපතළ අපරාධ නඩුවක් මහාධිකරණයේ විභාග කරන්න වසර 10.2ක කාලයක් ගත වෙනවා. ඒ වාගේම, අභියාචනාධිකරණයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා අවස්ථා දෙකක් තිබෙනවා. සාමාන්‍ය වශයෙන් අභියාචනා අවස්ථා දෙකට වසර හතක කාලයක් ගත වෙනවා. ඒ අනුව, බරපතළ අපරාධ නඩුවක් මහාධිකරණයේ විභාග වෙලා අභියාචනා ක්‍රියාපටිපාටිය අවසන් වෙන්න වසර 17ක විතර කාලයක් ගත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, මිනී මැරීමට තැත් කිරීම්, ත්‍රස්තවාදයට එරෙහි වැරදි විතරක් නොවෙයි, විශේෂයෙන්ම පසුගිය කාලයේ විශේෂ සාකච්ඡාවට ලක් වුණු දූෂණය හා වෙනත් මූල්‍ය අපරාධ පිළිබඳව නඩු විභාග කිරීම සඳහාත් මෙවැනිම කාලයක් ගත වෙනවා. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ආරම්භ කරන අවස්ථාවේදී ඒක නීතිවිරෝධීයි කියලා ප්‍රශ්න කළ බව අපි දැක්කා. නමුත්, ඒ ආයතනය නීත්‍යනුකූලයි කියලා අවසානයේ ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පරීක්ෂණ සියයකට වැඩි ප්‍රමාණයක් අවසන් කරලා ඒ ගොනු නීතිපති දෙපාර්තමේන්තුවට යවන්න මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සමත් වීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගොනු 20කට ආසන්න ප්‍රමාණයක පරීක්ෂණ අවසන් කරලා තිබෙනවා. ඉතාම අභියෝගාත්මක කාලයක, ප්‍රමාණවත් තරම් සහයක්, උනන්දුවක් රජයෙන් නොලැබෙන අවස්ථාවල පවා වෘත්තීමය නිලධාරීන් හැටියට තමන්ගේ වගකීම් ඉටු කිරීම ගැන මේ රටේ පොලීසියට මම ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා පොලීසිය කෙරෙහි මගේ ඉමහත් ගෞරවය මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම, අපරාධ පිළිබඳ ඉතිරි පරීක්ෂණත් ඉක්මනින් අවසන් කරලා, ඒ පිළිබඳව අදාළ ගොනු නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතුවලට යොමු කිරීමට අවස්ථාව ලැබෙයි කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී තවත් ගැටලුවක් මතු වුණා. ඒ තමයි, බරපතළ මූල්‍ය දූෂණ පිළිබඳ පරීක්ෂණ කෙරුණත්, ඒ පිළිබඳව නීතිපතිතුමා විසින් ගොනු කරන ලද අධිචෝදනා 20කට ආසන්න ප්‍රමාණයක් තිබුණත්, ඒ ගොනු කළ සෑම නඩුවක්ම පාහේ ගොනු කළ දිනයේ ඉඳලා මාස හයෙන් හයට, මාස නවයකට, සමහර නඩු අවුරුද්දක කාලයකට කල් යෑම. ඒ වාගේම, මෙවැනි අධිචෝදනාවන්ට ලක් වී පාර්ලිමේන්තුවෙත් ඉන්න, මේ මොහොතේත් අපට පෙනෙන, මේ ගරු සභාවේ රැඳිලා ඉන්න සමහර මන්ත්‍රීවරු කයිවාරු ගහන්න පටන් ගත්තා, "අපට එරෙහිව කිසිවක් කරන්න බැහැ. මේ රටේ තිබෙන අධිකරණ පද්ධතිය ඒ තරම් හෙමින් තමයි වැඩ කරන්නේ. අපේ නීතීඥ මහත්වරු මාර්ගයෙන් අපි දින ඉල්ලනවා. ඒ දින නොදෙන්න හේතුවක් නැහැ. හැමෝටම දින දෙනවා නම් අපට දෙන්න බැරි මොකද? අපිත් සාමාන්‍ය විධියටම අධිකරණ පද්ධතියේ දින අරගෙන ඒ කාලය ගත කරනවා. තව අවුරුදු පහයි ගත කරන්න ඕනෑ; හතරයි ගත කරන්න ඕනෑ; තුනයි ගත කරන්න ඕනෑ." කියලා. සමහරු දැන් කියනවා, "තව අවුරුදු එකහමාරයි ගත කරන්න තිබෙන්නේ." කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නීතියේ ආධිපත්‍යය අපේක්ෂා කරන කිසිවෙක් මේ තත්ත්වය ප්‍රාර්ථනා කරන්නේ නැහැ.

විත්තිකාරයා දේශපාලනඥයෙක් වුණත් නැතත්, ඒ වාගේම චින්දිතයා රජය වුණත් නැතත්, මේ රටේ බරපතළ අපරාධ පිළිබඳ නඩු ඉක්මනින් විභාග කිරීම සඳහා වූ විශේෂිත කාර්ය පටිපාටියක අවශ්‍යතාව පැන නැඟුණා. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රශ්නය මතු වන්නේ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නයට විශේෂිත පිළිතුරු සොයන්නේ. ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට එම වාර්තාව 2017.09.20 වන දින ඉදිරිපත් කිරීම ගැන මා ස්තුතිවන්ත වනවා. මේ රටේ අධිකරණ පද්ධතිය තුළ තිබෙන වේගය වැඩි කරන්න, ගුණාත්මකභාවය වැඩි කරන්න, නීතිපති දෙපාර්තමේන්තුව මුහුණ දී තිබෙන ප්‍රශ්නවලට විසඳුම් සොයන්න ඒ වාගේම මේ රටේ යුක්තිය පසිඳලීම පිළිබඳව මතු වෙලා තිබෙන සාධාරණ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා උනන්දුවෙන් කටයුතු කරලා සාක්ෂි අනුව සලකා බලා නීතිපතිගේ මතය, පොලීසියේ මතය ඒ වාගේම අධිකරණ සේවා කොමිෂන් සභාවේ මතය, ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ මතය සලකා බලා තීරණවලට එළැඹීම ගැන ආංශික අධීක්ෂණ කාරක සභාවට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම ගරු තලතා අතුකෝරල මැතිනියටත්, එතුමියගේ අමාත්‍යාංශයටත් ස්තුතිවන්ත වනවා, ඒ නිර්දේශ අනුව කටයුතු කරලා මේ දක්වා මේ පනත් කෙටුම්පත රැගෙන ඒම පිළිබඳව. ඒ වාගේම ගරු ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වනවා, මේ හා සම්බන්ධ අවශ්‍ය කරන සෑම කාරණයකදීම නිසි අනුමැතියක් ලබා දීලා අවශ්‍ය පහසුකම් සපයා දීම ගැන. "යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ඉක්මන් කිරීමේ මෙම කාර්ය පටිපාටිය සඳහා අවශ්‍ය වන්නේ කොපමණ මුදල් ප්‍රමාණයක්ද, ඒ අවශ්‍ය වන මොහොතක ඉල්ලන තරමට එම මුදල් දෙන්නම්." කියලා පොරොන්දු වීම ගැන මුදල් ඇමතිතුමා වන ගරු මංගල සමරවීර මැතිතුමාටත්, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාටත් ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධිකරණ ක්‍රියාපටිපාටිය කඩිනම් කිරීම සඳහා දැනට මේ රජය ගෙන තිබෙන පියවර පිළිබඳව මට කියන්න අවශ්‍යයි. මුලින්ම මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 75යි තිබුණේ. පළමුව යෝජනා කරලා තිබුණේ මේ සංඛ්‍යාව 10කින් වැඩි කරන්න කියලායි.

නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිර්දේශය මත අපි මේ සංඛ්‍යාව 35කින් වැඩි කරලා තිබෙනවා. අද මහාධිකරණ විනිශ්චයකාරවරුන් වැඩිපුර 35 දෙනෙක් පත් කිරීමට අවශ්‍ය නීතිමය අවසරය ලබා ගෙන තිබෙනවා. මෙම මහාධිකරණ විනිශ්චයකාරවරුන්ට ඉක්මනින්ම පත්වීම් ලබා දීලා අවශ්‍ය කරන පරිසරය සකස් කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමා කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. සම්පූර්ණ සංඛ්‍යාව කෙසේ වෙතත් එයින් කොටසකටවත් පත්වීම් ලබා දුන්නොත් ඒ පියවර ඉක්මනින්ම ගන්න හැකියාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නීතිපති දෙපාර්තමේන්තුව ඉතා දුෂ්කරතාවන්ට මුහුණ දුන්නා. එක පැත්තකින් රජයේ අධි නීතීඥවරු ප්‍රමාණයත් සංඛ්‍යාවක් සිටියේ නැහැ. අපි ඔවුන්ට දොස් කිව්වාට ඔවුන්ටත් බොහෝ ප්‍රශ්න තිබෙනවා කියලා අපි දැනගෙන හිටියා.

රජයේ අධිනීතීඥවරුන්ගේ අනුමත cadre එක තිබුණේ 113යි. එය 213ක් දක්වා 100කින් වැඩි කරලා, ඒ සඳහා අවශ්‍ය පරිසරය සකස් කරන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ අලුත් බඳවා ගැනීම් ඉක්මන් කිරීමට කටයුතු කළත් එකවර 100ක් බඳවා ගන්න බැහැ. කොටස් වශයෙන් ඒ බඳවා ගැනීම කරලා, නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය ඒ පරිසරය ඉක්මනින්ම සකස් කර ගත යුතුව තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව මේ රටේ ඉතිහාසය පුරාම සැලකුණේ ඉතාම සුවිශේෂ දෙපාර්තමේන්තුවක් හැටියටයි. එය රජයේ දෙපාර්තමේන්තුවක් වශයෙන් කවදාවත් සැලකුවේ නැහැ. ස්වාධීන වශයෙන්, වෘත්තීයමය වශයෙන් වාගේම අවශ්‍ය කරන ශක්තිය වශයෙන් සැලකුවත් නීතිපති දෙපාර්තමේන්තුව කියන්නේ සුවිශේෂී දෙපාර්තමේන්තුවක්. නමුත් කාලයාගේ ඇවෑමෙන් නීතිපති දෙපාර්තමේන්තුව සාමාන්‍ය රාජ්‍ය දෙපාර්තමේන්තුවක් බවට පත් වෙලා තිබෙනවා. වරප්‍රසාද ලබා දීමේදීත් එවැනිම තත්ත්වයකට පත්වෙලා තිබුණා. "ඔවුන්ගේ තත්ත්වය උසස් කළ යුතුයි. වැටුප් සහ වරප්‍රසාද ඉහළ මට්ටමට අරගෙන ආ යුතුයි." කියලා අපි යෝජනා කළා. අද වනකොට මේ රජය ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් කටයුතු කරලා තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවට බැඳෙන රජයේ නීතීඥවරයෙකුගේ වෘත්තීයමය තත්ත්වය පවත්වා ගන්න පුළුවන්, ආත්ම ගරුත්වය සහ වෘත්තීයමය ගරුත්වය ආරක්ෂා කරන්න පුළුවන් මට්ටමකට අද වනකොට නීතිපති දෙපාර්තමේන්තුව පත්වෙලා තිබෙනවා. ඔවුන්ට වැටුප්, දීමනා සහ පහසුකම් ලබා දීම පිළිබඳව මම රජයට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න අවශ්‍යයි. අද දින අපේ ගම්මන්පිල මැතිතුමා දිනපතා නඩු විභාග කිරීම ගැන කිව්වා. එතුමාට සමහර විට මතක නැතිව ඇති, මීට කලින් මේ රටේ මහාධිකරණවල දිනපතා නඩු අහපු බව. ඒකට කිව්වේ, "ජූරි ක්‍රමය" කියලායි. "ජූරි ක්‍රමය" මත නඩුවක් විභාග කරනකොට නීතීඥ මහත්වරුන්ට දින ගන්න පුළුවන්කම ලැබුණේ නැහැ. නමුත් ජූරි ක්‍රමයෙන් ඉවත්වෙලා, 1988 අංක 11 දරන පනත හරහා ඒ පිළිබඳව අභිමතයක් දුන්නාට පස්සේ තමයි මහාධිකරණවල නඩු ප්‍රමාදයට පදනම වැටුණේ. ඒ වාගේම trial at bar ක්‍රමය අලුත් එකක් නොවෙයි. මහාධිකරණ විනිශ්චයකාරවරු තිදෙනෙකු නඩු විභාග කරන්න පටන් ගත්තාම දිනපතා නඩු ඇහුවා. ගම්මන්පිල මැතිතුමා කියන ආකාරයට දැන් මේකට තිබෙන එකම විවේචනය මොකක්ද? මේ චෝදනාවලට දේශපාලනඥයන් ලක් වෙලා ඉන්නවා. ඔවුන් හිතන්නේ දේශපාලනඥයන් විතරයි හොරකම් කරන්නේ කියලායි. දේශපාලනඥයන් නොවන නිලධාරීන් දූෂණ ක්‍රියාවල නිරත වෙනවා කියන එක අපි දන්නවා. ඇලෝසියස් රජයේ නිලධාරියෙක් නොවෙයි; ඇලෝසියස් පෞද්ගලික අංශයේ කෙනෙක්. අර්ජුන මහේන්ද්‍රන් දේශපාලනඥයෙකු නොවෙයි; ඔහු රජයේ නිලධාරියෙක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, your time is over.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි කීපයක් ලබා දෙන්න. ඒ වාගේම ඊයේ - පෙරේදා ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා හා සංස්ථා සභාපතිවරයෙකු අත් අඩංගුවට ගත්තා. ඔවුන් දේශපාලනඥයින් නොවෙයි. හැබැයි, ඔවුන් දේශපාලනඥයින්ට වඩා දූෂණ කටයුතුවල නිරත වෙච්ච පුද්ගලයින්. ඒ වාගේ තවත් පුද්ගලයින් ඉන්නවා. මේ චිත්තිකාරයන් දේශපාලනඥයන් වුණත් නැතත් ඔවුන්ට මේ කාරණය අදාළයි. නමුත් අපි දන්නවා, මේ ප්‍රවණතාව තිබෙන්නේ දේශපාලනඥයන් දෙසට කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "මේ දේශපාලනඥයන් දුප්පත් අය. ඒ ගොල්ලන්ට නීතීඥවරු අල්ලා ගන්න විධියක් නැහැ. ඒ අය වෙනුවෙන් නොමිලේ පෙනී සිටින නීතීඥ මහත්වරු ඉන්නවා. එහෙම මහත්වරු කීප දෙනායි ඉන්නේ." කියලායි දැන් අපේ ගම්මන්පිල මැතිතුමා කියන්නේ.

මේ විධියට trial at bar උසාවි කිහිපයක් සමාන්තරව පවත්වා ගෙන ගිහිල්ලා ඒවායේ එක දිගට නඩු විභාග කරන්න ගත්තොත්, අර උදව් කරන මහත්වරුන්ට තමන්ගේ දරුවන්ට උගන්වන්න සල්ලි නැති වෙයි, ඒ ගොල්ලන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැති වෙයි කියලායි එතුමා කියන්නේ. මේ තර්කය මොන විහිළුවක්ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? මේ රටේ දක්ෂ නීතීඥවරු ඕනෑ තරම් ඉන්නවා. මේ රටේ අවශ්‍ය තරම් දක්ෂ නීතීඥවරු ඉන්නවා. ඒ වාගේම මේ රටේ දිනපතා එක දිගට නඩු අහන එකට එරෙහිව ඉදිරිපත් කරන ඔය වාගේ ළඳරු තර්ක අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන් කියන්න අවශ්‍ය කාරණයක් තිබෙනවා. ඒ තමයි පක්ෂපාතීත්වය පිළිබඳ කාරණය. මේ පිළිබඳ තර්කය තමයි, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නැඟුණේ. ශ්‍රේෂ්ඨාධිකරණය එම තර්කවලට සවන් දීලා ඉතාම පැහැදිලිව නියමයක් කරලා තිබෙනවා. නීතිපතිතුමා හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මේවා යොමු කළාට පසුව අග්‍රවිනිශ්චයකාරතුමා අවසාන වශයෙන් පරීක්ෂා කර බලනවා. මේ අධි චෝදනා පත්‍ර ගොනු කිරීමේදී අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතේ 2 වන වගන්තියේ (7) උපවගන්තියේ සඳහන් (අ) වරදක ස්වභාවය සහ අවස්ථානුගත කරුණු; (ආ) වරදක බැරෑරුම්කම; (ඇ) වරදක සංකීර්ණ බව; (ඈ) වරදක් නිසා වින්දිතයා මත වන බලපෑම; හෝ (ඉ) වරදක් නිසා රජය මත වන බලපෑම කියන කාරණා ගැන නීතිපතිවරයා සෑහීමට පත් වෙලා තිබෙනවාද කියන කාරණය ගැන අග්‍රවිනිශ්චයකාරතුමා සලකා බලනවා. එහෙම සලකා බැලීමෙන් පසුව ඒ කාරණා පහෙන් එකක් හෝ කිහිපයක් තිබෙනවා නම්, එවැනි විටෙක අග්‍රවිනිශ්චයකාරතුමා විසින් trial at bar ක්‍රමයට පවත්වා ගෙන යෑම සඳහා ඉඩ දිය යුතුයි. මේක අලුත් දෙයක් නොවෙයි. දැනටත් මෙවැනිම විධිවිධාන තිබෙනවා. මෙතැන තිබෙන එකම පහසුකම දූෂණ විරෝධී නඩු සඳහාම විශේෂිත වූ අධිකරණ ඇති වීමයි. ඒ සඳහා පහසුකම් ලැබෙනවා. එක හා සමාන්තර උසාවි කිහිපයක් කටයුතු කරනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අද දින අනිවාර්යයෙන් මෙම පනත් කෙටුම්පත සම්මත කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙයි කියන එකයි මගේ විශ්වාසය වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එසේ සම්මත වීමෙන් පසුව ඉතාම ඉක්මනින් ගැසට් නිවේදනයක් නිකුත් කරලා අග්‍රවිනිශ්චයකාරතුමාගේත් අවසරය ලබා ගෙන අඛණ්ඩ ගණනේ බස්නාහිර පළාත සඳහා අධිකරණ තුනක් හෝ ඊට වැඩියෙන් ඇති කරන්න කියලා මම ගරු ඇමතිතුමියගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අනෙක් ප්‍රදේශවලත් ඉතා ඉක්මනින්ම අධිකරණ ඇති කරලා දූෂණ විරෝධී නඩු කටයුතු ඉක්මනින්ම අවසාන කිරීමට කටයුතු කරාවි කියලා මම බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඓතිහාසික වූ, වැදගත් වූ අවස්ථාවේදී මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ.භා.2.46]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වෙන වේලාවේ, මූලික වශයෙන්ම ජනතාවට ඉදිරිපත් කරපු පොරොන්දුව තමයි අල්ලස, දූෂණය නතර කරනවා කියන එක. එදා, 2015 පැවැති ජනාධිපතිවරණයේදීත්, ඉන් පසුව පැවැති මහ මැතිවරණයේදීත් ඔබතුමන්ලා හැම තැනකදීම සඳහන් කළේ වංචාවට, දූෂණයට තිත තබනවා; විවිධ ක්ෂේත්‍රවල හොරකම්, දූෂණවලට සම්බන්ධ අයට නීතිය ක්‍රියාත්මක කරනවා කියලායි.

අවුරුදු තුනක් ගත වුණා. නමුත්, ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලාට තවමත් බැරි වෙලා තිබෙනවා, මේ රටේ ජනතාව තුළ ඒ විශ්වාසය ඇති කරන්න. වංචාව හා දූෂණය නතර කරන්න, නීතිය ක්‍රියාත්මක කර හොරුන්ට දඬුවම් දෙන්න ඔබතුමන්ලාට තවමත් බැරි වෙලා තිබෙනවා. ඒ කිසිවක් ප්‍රායෝගිකව කරන්න පුළුවන් කියලා ඔබතුමන්ලා ඔප්පු කරලා නැහැ. අවුරුදු තුනක් ගත වෙලත් මේවා කර ගන්න බැරි වුණ තත්ත්වයක තමයි මේ ආණ්ඩුව ඉන්නේ. එම නිසා දැන් ජනතාවට ඒ පිළිබඳව තවදුරටත් විශ්වාසයක් නැහැ; විශ්වාසය බිඳ වැටිලා තිබෙන්නේ. විශ්වාසය බිඳ වැටිලා තිබෙන අවස්ථාවක තමයි මේ අලුත් අධිකරණ පද්ධතිය හඳුන්වා දීම සිද්ධ වෙන්නේ.

ඔබතුමන්ලා පසුගිය ජනවරම ලබාගත්ත වෙලාවේ සිවිල් සංවිධාන ඇතුළු මේ රටේ පුරවැසියා ඉල්ලා සිටියා, වංචාව හා දූෂණය නතර කරන්න නිවැරදි නීතිමය යන්ත්‍රණයක් ඇති කරන්න කියලා. ඒ සඳහා වෙනම අධිකරණයක් පිහිටුවන්න කියන එක ජනතාවගෙන්, සිවිල් සංවිධානවලින් ප්‍රබලව මතු වුණු ඉල්ලීමක්. එතැනදී ප්‍රධාන ප්‍රශ්නයක් මතු වුණා. ඒ තමයි පිහිටුවන්නේ වෙනම අධිකරණයක්ද, නැත්නම් විශේෂිත අධිකරණයක්ද කියන එක. විශේෂිත අධිකරණයක් පිහිටු වීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීමේ නීතිමය ගැටලුවක් මතු වුණා. ඒකත් එක්ක වෙනම අධිකරණයක් පිහිටු වීම පිළිබඳ සාකච්ඡාව ඇති වුණා. දැන් අවුරුදු තුනක් ගත වෙලා, බොහෝ ප්‍රමාද වෙලා තමයි මේ කටයුත්ත සිද්ධ වෙන්නේ. එදා මේක කර ගන්න ආණ්ඩුව අසමත් වුණාට පසු, පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කමිටුව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු අතර මේ පිළිබඳ සංවාදයක් ඇති වුණා. ඒ සංවාදයේ ප්‍රතිඵලයක් විධියට තමයි අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත අද මේ ඉදිරිපත් වෙන්නේ. පසුගිය වසරේ මැද භාගයේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සිටින සියලු පක්ෂ නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට අරගෙන එතැන සාකච්ඡාවට බඳුන් වුණු දෙයක් තමයි මේ පනත් කෙටුම්පත. එතැනදී හැමෝම කිව්වේ, දූෂණ හා වංචාවලට සම්බන්ධ දේශපාලනඥයන් පමණක් නොවන බවයි. දැන් ජනප්‍රිය මාතෘකාවක් බවට පත් වෙලා තිබෙන්නේ, හොරකම් හා දූෂණවලට සම්බන්ධ වෙච්ච දේශපාලනඥයන් පිළිබඳ මාතෘකාවයි. හැබැයි, අපි දන්නවා, අපේ රටේ, අපේ සමාජයේ දූෂණ හා වංචාවලට සම්බන්ධ වෙලා තිබෙන්නේ, හොරකම්වලට සම්බන්ධ වෙලා තිබෙන්නේ දේශපාලනඥයන් පමණක් නොවන බව. රජයේ නිලධාරීන් සහ සේවකයන්, ඒ වාගේම පොලීසියේ සමහර නිලධාරීන්, විවිධ ක්ෂේත්‍රවල නිලධාරීන් වංචා හා දූෂණවලට සම්බන්ධයි කියලා අද වන කොට ප්‍රායෝගිකව ඔප්පු වෙලා තිබෙනවා. එම නිසා හුදෙක් ජනප්‍රිය මාතෘකාව දේශපාලනඥයන් වුණාට, සමාජයක් වෙලාගෙන, සමාජයක් පුරාවට ගිලා බැස තිබෙන දෙයක් තමයි, වංචාව හා දූෂණය.

එය නතර කිරීම සඳහා වුණු නීතිමය යන්ත්‍රණයක් තමයි සමාජය ඉල්ලා සිටින්නේ. එය ජනතාවගේ ඉල්ලීමක්. ජනතාව එදා ඉඳලා කියපු දෙයක් තමයි, හොරුන්ට දඬුවම් දෙන්න කියන එක. මොකද, ජනතාවගේ පැත්තෙන් හැම දාම රූපවාහිනියෙන්, රේඩියෝ එකෙන්, පත්‍රවලින් ජනතාවට බලන්න, අහන්න, කියවන්න ලැබෙන්නේ, "අතැන හොරෙක්, මෙතැන හොරෙක්; අතැන වංචාවක්, මෙතැන වංචාවක්; වංචාව රුපියල් කෝටි 2යි, රුපියල් කෝටි 5යි, රුපියල් කෝටි 10යි" කියන ඒවායි. රුපියල් කෝටි ගණන්වල හොරකම්, දූෂණ ගැන තමයි ජනතාව හැම දාම අහන්නේ. දැන් ඒවා අහලා, අහලා ජනතාවට අප්‍රිය වෙලායි තිබෙන්නේ; එපා වෙලායි තිබෙන්නේ. දැන් ජනතාවට ඕනෑ වෙලා තිබෙන්නේ, මේ හොරකම්වල ප්‍රමාණය නොවෙයි; මේ හොරු අල්ලන ක්‍රමයක්; මේ හොරුන්ට දඬුවම් දෙන ක්‍රමයක්. ඒ නීතිමය ක්‍රියාමාර්ග නැතුව හොරකම නතර කරන්න බැහැ. ඒ නීතිමය ක්‍රියාමාර්ග තමයි ජනතාවගේ පැත්තෙන් ඉල්ලන්නේ. ඔබතුමන්ලා එවැනි පොරොන්දු දුන්නාට, ජනතාවට එහෙම කිව්වාට, මේ හොරකම් නතර කරන්න, හොරුන් අල්ලන්න, හොරුන්ට දඬුවම් දීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන්න පසුගිය අවුරුදු තුනේම ඔබතුමන්ලා අසමත් වුණා. අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේත් අලුතින් හොරකම් පටන් ගෙන තිබෙනවා. පසුගිය ඉතිහාසයේ වාගේම දේශපාලනඥයින්, නිලධාරීන්, ආණ්ඩුවට සම්බන්ධ විවිධ කොටස් නැවත හොරකම් කරන්න පටන් ගෙන තිබෙනවා; කෝටි ප්‍රකෝටි ප්‍රමාණයේ වංචා දූෂණවලට හවුල් වෙලා තිබෙනවා. ඒවා පිළිබඳව තමයි සමාජයේ නැවතත් සාකච්ඡාවක් ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා දැන් ජනතාවට මතුවෙලා තිබෙන ප්‍රශ්නයක් තමයි, "මේ ගෙනෙන අධිකරණ පද්ධතිය හරහා මෙය නවත්වන්න පුළුවන් වෙයිද?" කියන එක. ඒ සැකය ජනතාවට තිබෙනවා. මොකද, හොරකම් නතර කරනවාය කියලා ඔබතුමන්ලා ඔප්පු කළේ නැහැ. හොරු අල්ලනවාය කියලා ඔප්පු කළේ නැහැ. ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරනවාය කියලා ඔප්පු කරලා පෙන්වා නැහැ. ඒ නිසා මේ නීති ගෙනාවට දැන් ජනතාවගේ බිඳුණු හිත්, ඒ පලුදු වුණු විශ්වාසය නැවත ඇති කරන්න පුළුවන් තත්ත්වයක් නැහැ.

අද මේ පනත් කෙටුම්පත සම්මත කරලා හෙට පුළුවන්ද, මේ හොරු ටික අල්ලන්න; ලබන මාසය වන විට පුළුවන්ද, හොරුන්ට දඬුවම් දෙන්න; අවුරුද්දකින් පුළුවන්ද, හොරුන්ට දඬුවම් දෙන්න කියලා ජනතාව බලාගෙන ඉන්නවා. ජනතාවට තිබෙන ප්‍රශ්න ඒවායි. ජනතාවගේ පැත්තෙන් ජනතාව බලාගෙන් ඉන්නේ, මෙපමණ කල් බලාගෙන සිටියා වාගේ මේ පනත මඟින්වත් හොරෙක්, දෙන්නෙක් අල්ලයිද, නීතිය ක්‍රියාත්මක කරයිද කියන එකයි. අපි දකිනවා, ඇත්තටම දැන් ඒ විශ්වාසය බිඳ වැටිලායි තිබෙන්නේ කියලා. දැන් හොඳටම ප්‍රමාද වැඩියි. ඇත්තටම මේ නීති ගෙනෙන්න හොඳටම ප්‍රමාද වැඩියි. මෙය කළ යුතුව තිබුණේ මීට බොහෝ කාලයකට කලිනුයි. ඒ අවශ්‍ය වෙලාවේ, අවශ්‍ය මෙහොතේ එය කළේ නැහැ. අද ඒ හොරකම්වලට එරෙහිව නීතිය

ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නකොට "දේශපාලන පළිගැනීම් කරනවා" කියලා කියන්න හොරුන්ට පුළුවන් වෙලා තිබෙන්නේ ඒ නිසා තමයි. ඒ හොරකම් පිළිබඳව නිකම් කථා බහක් විතරක්, නිකම් පූර්වානම් කථා විතරක් මාධ්‍යවල කරනකොට, පාර්ලිමේන්තුවේ කරනකොට හොරකමට භාජන වුණු කෙනාට පුළුවන්කම ලැබෙනවා, "මෙය පළි ගැනීමක්. මෙය අපට එරෙහිව කරන හතුරුකමක්" කියලා කියන්න.

මේක ඒ තත්ත්වයට වර්ධනය වෙන්න ඔබතුමන්ලා ඉඩ හැරියා. ඒ තත්ත්වය වර්ධනය වුණාට පසුව තමයි දැන් මේ නීති ගෙනෙන්න කථා කරන්නේ. කෙසේ වෙතත්, මේ නීතිවලින් දැන් මේ රටේ දූෂණය, වංචාව මුළුමනින්ම නතර කරන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතුවත්, අපි නම් එහෙම හිතන්නේ නැහැ. මොකද, ඒක ඔබතුමන්ලා භාවිතාවෙන් ඔප්පු කරලා නැති නිසා. පසුගිය කාලයේ අපි දැක්කා, නීතිය ඉදිරියට ගෙන ආ යුතුව තිබෙන බොහෝ දේවල්, බොහෝ වංචා දූෂණ දේශපාලන 'ඩීල්' වලින් යට ගැහුව බව. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරිය ඒ තනතුරින් ඉවත් කළා. නීතිය හරියට ක්‍රියාත්මක කරන්න ගිය නිසායි එතුමියට ඒ තනතුරින් යන්න වුණේ. ඒක මුළු රටම දැක්කා. ඔබතුමන්ලා හොරුන්ට විරුද්ධව, දූෂණයට විරුද්ධව අවංකව කටයුතු කරනවාද නැද්ද කියන එක මනින ලිට්මස් පරීක්ෂාවක් තිබුණා. ඒ ලිට්මස් පරීක්ෂාවෙන් ඔබතුමන්ලා ෆේල්. ඒක කරන්න පටන් ගත්තාට පසුව දවස් දෙකක් තුනක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරියට ගෙදර යන්න වුණා. ඒක මුළු රටම දැක්කා. ඒක ප්‍රසිද්ධ රහසක්. එය කවුරුත් දන්නවා. ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරු දෙදෙනෙකුගේ, තුන්දෙනෙකුගේ දූෂණ චෝදනා පිළිබඳව උසාවියට නඩු දමන්න හදපු වෙලාවේයි ඒක වුණේ. එක් ඇමතිවරයෙකුගේ චෝදනාවලට අදාළව නඩුව දැම්මා. ඉතුරු දෙන්නා, තුන්දෙනා සම්බන්ධයෙන් ෆයිල් එක හැදුවා. ෆයිල් එක හදලා උසාවියට දමන්න කලින්, අන්න ආවා, බලපෑම්; අන්න ආවා, දේශපාලන මැදිහත්වීම. එතුමියට යන්න වුණා, ගෙදර. ඔබතුමන්ලා දැන් කියනවා, "දූෂණය, වංචාව නවත්වන්න අල්ලස් කොමිසමට නඩු දමන්න පුළුවන් පනතක් ගෙනෙනවා" කියලා. මේ පනතෙන් විතරක් ඒක කරන්න බැහැ. මොකද, ඔබතුමන්ලා ඒ දේශපාලන මැදිහත්වීම තවම නතර කරලා නැහැ. ඒක තවම ඒ විධියටම තිබෙනවා. ඒ නිසා විශ්වාසය ඇති කිරීම ප්‍රධාන කාරණයක්. මේ නීතියෙන් නිලධාරින්ට, ඒ ආයතනවලට යම් ප්‍රමාණයක භයියක් ලැබෙනවා, නීතිය ක්‍රියාත්මක කරන්න. හැබැයි, ඒ විතරක්ම බැහැ. එම අවස්ථාවල දේශපාලන තීන්දු තීරණ ගන්නවා නම්, දේශපාලන මැදිහත්වීම් කරනවා නම් අන්න ඒවා වහාම නතර වෙන්න ඕනෑ. පසුගිය කාලයේ නීතිය ඉදිරියට ගෙන ආ යුතු වංචා දූෂණ බොහොමයක් ඔබතුමන්ලා යට ගැහුවා; හැංගුවා; 'ඩීල්' වලින් වෙනස් කළා. ඒ නිසා තමයි අද පසුගිය කාලයේ චෝදනා තිබුණු ප්‍රධාන දේශපාලනඥයන් වන ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් කිසි කෙනෙකුට එරෙහිව ඇති චෝදනා නීතිය ඉදිරියේ හරියට විභාග වෙන්නේ නැත්තේ. ඒ ෆයිල් වෙනස් වන විධිය, ඒ ෆයිල් යට ගහන විධිය, ඒවා පස්සට අරගෙන වෙන වෙන ඒවායින් යටපත් කරන විධිය මේ රටේ ජනතාවට දැන් රහසක් නොවෙයි.

සමහර ඇමතිවරු සම්බන්ධයෙන් පරීක්ෂණ කරද්දී ආණ්ඩුවේ ඉහළ පුටුවලින් ඒ පරීක්ෂණ කරන ආයතනවල නිලධාරින්ට දුරකථනයෙන් කථා කරලා අසා තිබෙනවා, "තමුසෙලා ආණ්ඩුව පෙරළන්නද හදන්නේ" කියලා. ඒකෙන් මොකක්ද ඔප්පු කරන්නේ? එම පරීක්ෂණය කරන්න ඒ නිලධාරියාට ධෛර්යයක් දෙන්නේ නැහැ. ඒ නිලධාරියා අධෛර්යවත් කරනවා. ඒ නිලධාරියා කල්පනා කරනවා, "රටේ ආණ්ඩුවේ ප්‍රධානීන් දුරකථනයෙන් අපට එහෙම කථා කරනවා නම්, අපි මොකටද හොරු අල්ලන්න මැදිහත් වෙන්නේ; නිකම් අනවශ්‍ය දේකට නේ අපි මැදිහත් වෙන්නේ." කියලා. ඒ නිසා ඒ දේවල් නතර නොකර මේ නීති කොච්චර ගෙනාවත් වැඩක් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ පිහිටුවීම පිළිබඳව අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා වුණා. එතැනින් යම් යෝජනාවක් ඉදිරිපත් වුණා. ඒ මූලික කෙටුම්පතේ යම් යම් අඩු පාඩු තිබුණා. ඒ අඩු පාඩු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වෙච්ච වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නා, "මේ මේ වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අහවල් වගන්තිවලට අනුකූල වෙන්නේ නැහැ; ඒවාට පටහැනියි. ඒ නිසා ඒවා වහාම වෙනස් කළ යුතුයි." කියලා. ඒ අනුව නැවත ඊයේත් ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාකච්ඡා කරලායි අද පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා ඇත්තටම ගත්තොත් මේ පනත් කෙටුම්පත, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබිච්ච තීන්දුවත් සැලකිල්ලට අරගෙන සංශෝධන ඉදිරිපත් කරලා, ඊට පස්සේ ඉදිරිපත් වෙන පනත් කෙටුම්පතක්. තමන්ට ඕනෑ විධියට කොයි නඩුවද ඒ ඒ අධිකරණවලට ගෙනියන්න පුළුවන් කියලා තීරණය කරන්න, මේ පනත් කෙටුම්පතේ කිසිම තැනෙක විෂය භාර ඇමතිවරයාට බලයක් පැවරිලා තිබෙනවා මම දැක්කේ නැහැ. කොහේද එවැනි වගන්තියක් තිබෙන්නේ? මේ පනත් කෙටුම්පතේ කිසිම තැනක එහෙම එකක් නැහැ. එහෙම එකක් තිබුණා නම් සම්පූර්ණයෙන්ම අපි ඒකට විරුද්ධයි. මොකද, එහෙම වගන්තියක් තිබෙන්න බැහැ. ඇමතිවරයාට හෝ ඇමතිවරියට ඕනෑ විධියට, "අහවල් නඩුව ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට යන්න ඕනෑ; අහවල් නඩුව ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට යා යුතු නැහැ." කියලා තීරණය කරනවා නම් ඒක සම්පූර්ණයෙන්ම දේශපාලනිකයි. නමුත්, මේ පනත් කෙටුම්පතේ කොහේවත් එවැනි වගන්තියක් නැහැ. මේ පනත් කෙටුම්පතේ ඉතා පැහැදිලිව තිබෙනවා, "යම්කිසි අධිචෝදනාවක් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට යා යුතු ද, නැද්ද කියන එක තීරණය කරන්නේ අග්‍රවිනිශ්චයකාරවරයා" කියලා.

අග්‍රවිනිශ්චයකාරවරයා පත් වෙන්නේ ව්‍යවස්ථා සභාවෙන් සාපේක්ෂ ස්වාධීන යන්ත්‍රණයක් ඇතුළේ. අග්‍රවිනිශ්චයකාරවරයා ඍජුවම ජනාධිපතිවරයා විසින් පත් කරන තත්ත්වයක් යටතේ නම් මේක දේශපාලනික වෙන්න පුළුවන්. අපි ඒ ඉතිහාසය දැක තිබෙනවා. ජනාධිපතිවරයාට කැමැති කෙනෙක්ව අගවිනිසුරු පුටුවේ තියා ගන්නවා. ඊට පස්සේ අගවිනිසුරුවරයා තීරණය කරනවා, "කොයි නඩුව ද ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට යන්නේ; කොයි නඩුව ද යා යුතු නැත්තේ" කියලා. අන්න එතැනදී ජනාධිපතිවරයාට පුළුවන් අගවිනිසුරුවරයා හරහා තමන්ගේ දේශපාලන පළිගැනීම් කරන්න. නමුත්, මේ ඉදිරිපත් වෙච්ච පනත් කෙටුම්පතේ එහෙම එකක් නැහැ. මොකද, ස්වාධීන අධිකරණ සේවා කොමිසමක් ක්‍රියාත්මක වෙනවා. ඒ ආයතනය සියයට සියයක් ස්වාධීනයි කියලා මම කොහෙත්ම කියන්නේ නැහැ. සාපේක්ෂව ස්වාධීනයි. සියයට සියයක් ස්වාධීන ආයතන හදන්න තවම අපේ සමාජයේ සංස්කෘතිය දියුණු වෙලා මදි. නමුත්, ඒ සාපේක්ෂ තත්ත්වය යටතේ ස්වාධීන අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා වන අගවිනිසුරුවරයා තමයි තීරණය කරන්නේ මේ චෝදනාවලට අනුව ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට යා යුත්තේ කොයි නඩුව ද, නොයා යුත්තේ කොයි නඩුව ද කියන එක. ඒ නිසා එතැන දේශපාලන මැදිහත්වීමක් කරන්න බැහැ. එහෙම කරනවා නම්, ඒ කරන සිද්ධි, උදාහරණ පෙන්වා ඒවාට අදාළව විවේචන ඉදිරිපත් කරලා ඒවා වෙනස් කරගන්න පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු විධියට අපට අයිතියක් තිබෙනවා. මෙතැනදී විශේෂයෙන්ම 1994 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පිළිබඳ පනතත්, ඒ වාගේම 1979 අපරාධ නඩු විධාන සංග්‍රහය පනතටත් යටත්ව අධි චෝදනා ඉදිරිපත් කරන්න අග්‍රවිනිශ්චයකාරවරයාට නෛතික බලයක්

[ගරු විජිත හේරත් මහතා]

තිබෙනවා. අධිකරණ පිහිටුවීම සම්බන්ධයෙන් කොයි අධිකරණ බල ප්‍රදේශයේ ද මෙවැනි අධිකරණ පිහිටුවන්නේ කියන එක ඇමතිවරයායි තීරණය කරන්නේ. ඒක දැනුත් එහෙම තමයි. අධිකරණ බල ප්‍රදේශ අනුව අහවල් බල ප්‍රදේශයේ තවත් දිසා අධිකරණයක්, තවත් මහෙස්ත්‍රාත් අධිකරණයක්, පළාත්බද සිවිල් අභියාචනාධිකරණයක් පිහිටුවීම පිළිබඳව දැනටත් ගැසට් නිවේදනයක් මඟින් තීන්දු ගන්නේ අදාළ ඇමතිවරයායි. නමුත් මේ පනත් කෙටුම්පතේ ඉතා පැහැදිලිව තිබෙනවා, ඇමතිවරයා එසේ කරද්දී අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් විමසීමක් කරලා එය කළ යුතුයි කියලා. ඒ අනුව මෙතැනදී ඇමතිවරයාටත් තනි බලයක් දීලා නැහැ.

"අමාත්‍යවරයා විසින් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ පිහිටුවන ස්ථානය හෝ ස්ථාන නිශ්චිතව දැක්වීමේදී අධිකරණ සේවා කොමිෂන් සභාව විමසනු ලැබිය යුතු ය." කියා පනත් කෙටුම්පතේ සඳහන් වනවා. එතකොට ඇමතිවරයාටත් තනි අත්තනෝමතික බලයක් පවරා නැහැ. ඒ නිසා තනි පුද්ගලයෙකුට බලය පවරනවා වෙනුවට සාපේක්ෂව මෙහි යම්කිසි වෙනස්කමක් තිබෙනවා. ඒ නිසා නීතිය හරියට ක්‍රියාත්මක කරනවා නම්, මේ තිබෙන සංශෝධනවලින් ඒ ඉඩකඩ ලැබිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි දැක්කා මේ ස්ථිර ත්‍රිපුද්ගල අධිකරණයේ ඉදිරිපත් කරන නඩු පිළිබඳ තීන්දු ගැනීමේ බලය තිබෙන්නේ අගවිනිසුරුවරයාට බව. ඒ වාගේම අධිකරණ පිහිටුවන ප්‍රදේශ තීන්දු කිරීමේදී ඇමතිවරයා අධිකරණ සේවා කොමිෂන් සභාව විමසා ඒවා පිහිටුවන්න ඕනෑ. ඒ නිසා දේශපාලන මැදිහත්වීමක් කරන්න තිබෙන ඉඩ අවම කරලා තිබෙනවා. ඔබතුමන්ලා අවුරුදු තුනකට පස්සේ මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා, සම්මත කරලා මෙය ක්‍රියාත්මක කරනකොට අර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ බොහෝ වෙලාවට මේ විශේෂ අධිකරණයේ නඩු විභාග කරලා, චූදිතයෝ වැරදිකරුවන් බවට ඔප්පු කරලා ඒ වැරදිකරුවන්ට දඬුවම් දෙනකොට ඒ වරදකරුවන් බවට ඔබතුමන්ලා පත්වෙන්නත් ඉඩ තිබෙනවා. [බාධා කිරීමක්] ප්‍රශ්නයක් නැහැ. ඒක හොඳයි. ඒක වෙන්න ඕනෑ. ප්‍රමාද වෙලා හරි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ එක හොඳයි. මොකද, තව තිබෙන්නේ පුංචි කාලයයි. දේශපාලන අර්ථයෙන් ඇමතිවරු හෝ මන්ත්‍රීවරු හෝ චෝදනාවලට ලක්වෙලා තිබෙනවා නම්, මේ අධිකරණය හරහා දඬුවම් ලැබිය යුතුයි. ඒ නිසා ආණ්ඩුවේ කවුරු හරි කෙනෙක් මේ චෝදනාවලට ලක්වෙච්ච චූදිතයෙක් වෙනවා නම්, ඔහුට හෝ ඇයටත් මේ අධිකරණවලින්ම දඬුවම් දෙන්න ඕනෑ. ඒ නිසා තමයි මා මීට කලින් අවස්ථාවකදී මේ පිළිබඳව අදහස් දක්වද්දී ඉතා පැහැදිලිව කිව්වේ මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ නඩුව පළමුවෙනි නඩුව විධියට මේ පිහිටුවන ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ අහලා පෙන්වන්න කියලා. මොකද, ඒ සඳහා නෛතික බලය තිබෙනවා. එවැනි බැඳුම්කර පිළිබඳ චෝදනා ඉදිරිපත් කරන්න පුළුවන් කියලා මෙහි එක් එක් විෂය සඳහන් කරද්දී ඊට අවශ්‍ය කරන බලය පවරා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා තමන්ගේ විනිවිදභාවය පෙන්වන්න. මේ අධිකරණ පිහිටුවන්නේ දේශපාලන පළිගැනීමක් සඳහා නොවෙයි කියා පෙන්වන්න. මේ අධිකරණය, තමන්ගේ ආණ්ඩුව පැත්තෙන් වැරැද්දක් වුණත්, කොයි පැත්තෙන් වැරැද්දක් වුණත්, නිලධාරින්ගේ පැත්තෙන් වැරැද්දක් වුණත් ඒවාට දඬුවම් කිරීම සඳහා පිහිටුවන අධිකරණයක්; ඒකට කිසිම භේදයක් නැහැ කියන එක ඔප්පු කරලා පෙන්වන්න. එහෙම නැතිව පසුගිය කාලයේ විපක්ෂයට කරපු චෝදනා විතරක් විභාග කරන තත්ත්වයකට පත් වුණොත් අන්න එතැනදී තමයි මේක සෘජුවම දේශපාලන පළිගැනීම ඉලක්ක කරගෙන පිහිටුවූ අධිකරණයක් බවට තහවුරු වෙන්නේ. ඒ නිසා එය එහෙම නොවෙයි කියලා භාවිතයෙන් ඔප්පු කරන වගකීම තිබෙන්නේ ඔබතුමන්ලාටයි. ආණ්ඩුවේ ඇමතිවරු සම්බන්ධයෙන් අර පසුගිය කාලයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ files යට ගැහුවා වාගේ යට ගහන්නේ නැතුව, ඉස්සෙල්ලාම වර්තමාන ආණ්ඩුවේ ප්‍රධාන ඇමතිවරුන්ට, නිලධාරින්ට එල්ල වෙලා තිබෙන චෝදනා පිළිබඳ නඩු මේ අධිකරණයට ගෙනගිහින් පෙන්වන්න. එහෙම පෙන්නුවොත් ජනතාවට විශ්වාසයක් ඇති වෙනවා, මේ අධිකරණය දේශපාලන පළිගැනීම් සඳහා පිහිටුවූ අධිකරණයක් නොවෙයි ඇත්තටම වංචාව දූෂණය, අල්ලස නතර කරන්න පිහිටුවූ අධිකරණයක් කියලා. ඒ විශ්වාසය ඇති කිරීමේ වගකීම තිබෙන්නේ ඔබතුමන්ලාටයි. ඒක වචනයෙන් පමණක් කිව්වාට වැඩක් නැහැ. මේ අධිකරණ පිහිටුවූයේ දේශපාලන පළිගැනීම් සඳහා නොවෙයි කියා වචනයෙන් කිව්වාට වැඩක් නැහැ. ඒක එහෙම නොවෙයි කියලා භාවිතයෙන් ඔප්පු කර පෙන්වන්න. ඒ නිසා අපි ඉතා පැහැදිලිව තමුන්නාන්සේලාට අභියෝග කරනවා, පුළුවන් නම් දැනට චෝදනා ඉදිරිපත් වෙලා තිබෙන, ප්‍රධාන චෝදනා එල්ල වී ඇති ආණ්ඩුවේ චූදිතයන් පිළිබඳ නඩු කටයුතු මේ විශේෂ අධිකරණය හරහා ආරම්භ කර මේක දේශපාලන පළිගැනීමක් නොවෙයි කියලා පෙන්වන්න කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ පසුගිය කාලයේ ඇති වෙච්ච විවිධ සිදුවීම්, අදත් ඇති වෙන සිදුවීම් පිළිබඳව සමහර අවස්ථාවලදී අග්‍රාමාත්‍යවරයා විසින් මෙවැනි ත්‍රිපුද්ගල අධිකරණ පිහිටුවලා ඉක්මනින් නඩු අහලා තීන්දු තීරණ දීලා තිබෙනවා. ඒ අනුව ජනතාවට ඒ සිදුවීම් පිළිබඳ සාධාරණය ඉෂ්ට වුණා කියන හැඟීමක් තිබෙනවා. හැබැයි, තවමත් දේශපාලනඥයන්ට විරුද්ධව එල්ල වන චෝදනාවලට අදාළ නීතිමය ක්‍රියාමාර්ග අරගෙන ජනතාවට පෙන්වා නැහැ. පසුගිය ඉතිහාසය ගත්තොත් කොයි ඇමතිවරයා ද, කොයි දේශපාලනඥයා ද අල්ලස් හෝ දූෂණ චෝදනා යටතේ හිරදඬුවම් ලබලා දඬුවම් ලබලා තිබෙන්නේ? හැමදාම හොරකම් ගැන කථා කරනවා; වංචා ගැන කථා කරනවා.

නමුත් මිනිස්සු අහන ප්‍රශ්නයට උත්තරයක් නැහැ. ආණ්ඩුවේ ඉන්නකොට හොරකම් කරනවා; විපක්ෂය ඒ අයට චෝදනා නඟනවා. ඒ චෝදනා කරන අයත් ආණ්ඩුවට ඇවිත් ආපහු හොරකම් කරනවා; ඒ අයටත් චෝදනා නඟනවා. මේක චක්‍රය වාගේ කැරකෙනවා. හැබැයි, ඒ කාටවත් දඬුවම් ලැබෙන්නේ නැහැ; චූදිතයන් පෙනෙන්නේ නැහැ. ඒ නිසා දඬුවම් ගැන මිනිසුන්ගේ විශ්වාසය බිඳ වැටිලා. විපක්ෂයේ ඉන්නකොට හොරු ගැන කථා කරනවා. ආණ්ඩුවට ගියාම හොරකම් කරනවා. මිනිස්සුන් හොරුන්ටම ඡන්දය දෙනවා. "ඒ පැත්තත් එකයි. මේ පැත්තත් එකයි. කොහොමත් එකයි. වැඩක් නැහැනේ" කියන තැනට තමයි මිනිස්සු පත් වෙලා ඉන්නේ. මේ හොරකම් නතරවෙයි කියන විශ්වාසය ජනතාව තුළ ඇති වෙලා නැහැ. ඒ නිසා මේ උසාවි පිහිටුවීමට පමණක් සීමා වෙන්නේ නැතිව, දේශපාලන "ඩීල්" නතර කරලා, හොරුන් ආරක්ෂා කරන දේශපාලන "ගේම්" නතර කරලා කොහොමද මේ හොරකම් නතර කරන්නේ කියන එක භාවිතයෙන් පෙන්වන්න.

අපි ඉතාම පැහැදිලිව කියනවා දැන් මේ උසාවි පිහිටුවීම පරක්කු වැඩියි කියලා. දැන් අශ්වයා ඉස්තාලෙන් පැනලා ඉවරයි. දැන් ඉස්තාලය වහලා වැඩක් නැහැ. ජනතාව මේ දිහා බලාගෙන ඉන්නවා. මේ අධිකරණ පද්ධතිය පිහිටුවා හෝ මේ රටේ වංචා දූෂණවලට සම්බන්ධ වෙච්ච අයට දඬුවම් දීලා පෙන්වන්න. ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා මේ අධිකරණ පද්ධතිය හරහා ඇත්තටම දූෂණ වංචා නතර කරන්න අවංක උත්සාහයක් දරනවාද කියන එක ඔබතුමන්ලාගේ භාවිතය අනුවයි ජනතාව තීරණය කරන්නේ. ඒක වෙනවාද නැද්ද කියලා අපිත් බලාගෙන ඉන්නවා.

මේ පනත ආණ්ඩුවෙන් ගෙනෙනවාද, විපක්ෂයෙන් ගෙනෙනවාද කියන එක නොවෙයි වැදගත්. ආංශික අධීක්ෂණ කාරක සභාව නියෝජනය කරන සියලු පක්ෂවල මන්ත්‍රීවරුන්ගේ අදහස්වලින් හැදුණු පනත් කෙටුම්පතක් මේක. මේ පනත් කෙටුම්පතට ඒ කාටවත් විරුද්ධ වෙන්න බැරි වුණේ, හොරකමට, දූෂණයට පක්ෂ වෙන්න කාටවත් බැරි නිසා. හොරකමට, දූෂණයට එරෙහිවෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා කාටවත් භය වෙන්න දෙයක් මෙතැන නැහැ.

ඕනෑම අධිකරණයක් පිහිටුවලා -අධිකරණ සියයක් නොවෙයි, දහසක් පිහිටුවලා- ඒ අදාළ පුද්ගලයන් හොරු නොවෙයි කියලා ඔප්පු කර පෙන්වනවා නම් ප්‍රශ්නයක් නැහැනේ. එතකොට භය වෙන්න දෙයක් නැහැනේ. ඇත්තටම ගත්තොත් මේ හොරකම් පිළිබඳව චෝදනා ලබන චූදිතයන් තමයි මෙවැනි අධිකරණ ඉල්ලන්න ඕනෑ. ඒ අය තමයි කියන්න ඕනෑ, "මේ අධිකරණ පිහිටුවන්න, පිහිටුවලා මාසයෙන් දෙකෙන් අපේ නඩු අහලා ඉවර කරන්න, අපි හොරකම් කළාද නැද්ද කියලා පෙන්වන්න, ඒ ගැන නිකම් මාධ්‍යවල කිය කියා ඉන්න එපා"කියලා. අපි දැක්කා, කෝටි හැත්තෑපහක මුදලක් අතුරුදහන් වෙලා කියලා එස්.බී. දිසානායක හිටපු ඇමතිතුමා සම්බන්ධයෙන් කිව්වා. හරි පැහැදිලිව කිව්වේ, එස්. බී. දිසානායක ඇමතිතුමා කෝටි හැත්තෑපහක් ගහලා කියලායි. ඒක තමයි රටේ මාධ්‍යවලින් ප්‍රචාරය වෙච්ච පණිවුඩය. එතුමා එහෙම කළේ නැත්නම්, ඒ කාරණය අධිකරණයට ගෙන ගිහින් ඉක්මනින් තමන් නිර්දෝෂියි කියා ඔප්පු කරන්න එතුමාට අයිතියක් තිබෙනවා. දිනපතා නඩුව අහලා කෝටි හැත්තෑපහක් ගත්තේ නැහැ කියලා මාසයක් තුළදී ඔප්පු කරන්න පුළුවන් නම් එතුමාට හොඳයි නේ. එතුමා නිර්දෝෂියි කියලා රටටම ඔප්පු කරන්න පුළුවන්නේ. එහෙම නැත්නම් මොකද වෙන්නේ? කෝටි හැත්තෑපහක් ගත්තාය කියන කථාව තව අවුරුද්දක් විතර කිය කියා ඉන්න එකයි සිද්ධ වෙන්නේ. එතුමා ආණ්ඩුවෙන් එළියට ආපු ගමන්නේ කෝටි හැත්තෑපහේ කථාවත් එළියට එන්නේ. මෙච්චර කල් එස්.බී. දිසානායක ඇමතිතුම සමෘද්ධිය භාර අමාත්‍යවරයා හැටියට ආණ්ඩුවේ හිටියානේ. අගමැතිතුමා හෝ ආණ්ඩුවේ කවුරු හෝ කිව්වේ නැහැනේ එස්.බී. ඇමතිතුමා සමෘද්ධියෙන් කෝටි හැත්තෑපහක් ගහලා කියලා. එතුමා ආණ්ඩුවේ ඉන්නතුරු ඒක කිව්වේ නැහැ. එතුමා ආණ්ඩුවෙන් ගිය ගමන් කියනවා කෝටි හැත්තෑපහක් අතුරුදහන් ලු. මෙච්චර කල් ඒ ගැන මොකක්ද කළේ? එතැනදී තමයි දේශපාලන පළිගැනීම් කියන ප්‍රශ්නය එන්නේ. එතකොට තමයි මිනිසුන්ටත් ඒ ගැන සාධාරණය සැකයක් එන්නේ. එස්.බී. දිසානායක ඇමතිවරයා ඒ කෝටි හැත්තෑපහ ගෙදර ගෙන ගියේ නැත්නම්, ඒක එහෙම වුණේ නැත්නම් මේ ස්ථිර අධිකරණයට වහාම ඒ පැමිණිල්ල දාලා විභාග කරලා තමුන්ගේ නිවැරදි බව ඔප්පු කරලා පෙන්වන්න. ඒ මුදල ගත්තා නම් දඬුවම් ලැබෙයි. ගත්තේ නැත්නම් "ගත්තේ නැහැ " කියලා තහවුරු වෙයි. ඒ නිසා 'හොරු' කියලා නම් කරන කිසි කෙනෙකුට භය වෙන්න දෙයක් නැහැ. ඇත්තටම කියනවා නම්, හොරු කියා චෝදනා ලබන අය විසින් ඉල්ලා සිටින්න ඕනෑ අධිකරණයක් මේක. අහවලා අරක හොරකම් කළා, මේක හොරකම් කළා කියලා නිකම් මාධ්‍යවලින්, Facebook වලින් චෝදනා නහමින් ඉන්න එපා. අධිකරණයකට ඒ කරුණු ඉදිරිපත් ඔප්පු කර පෙන්වන්න ඕනෑ කියන තැනටයි අපි එන්න ඕනෑ. එම නිසා "මේ අධිකරණය එපා" කියන එක අපි නම් දකින්නේ ඒ හොරකම් ඔප්පුවෙයි කියන භයට කරන දෙයක් හැටියටයි. හොරකම් කළේ නැත්නම්, ඒ චෝදනාවලට ලක් වෙන්න භය නැත්නම් භය නැතිව කියන්න ඕනෑ මේ අධිකරණය පිහිටුවන්න කියලා. මේ අධිකරණය පිහිටුවා හොරකම් කරලා තිබෙනවාද නැද්ද කියලා ඔප්පු කර පෙන්වන්න කියන තැනටයි අපි එන්න ඕනෑ. එසේ නැතිව වෙන වංගු ගහලා, ව්‍යවස්ථාවේ ප්‍රශ්න, ස්ථාවර නියෝගවල ප්‍රශ්න - දන්නේ නැති ස්ථාවර නියෝග කියවන්න ගිහින් වරදවා ගන්න ප්‍රශ්න - මතු කරලා මේ කරුණ යටපත් කරන්න ඕනෑ නැහැ. මේ අධිකරණය පසුගිය කාලයේ කරපු හොරකම් පිළිබඳව විමර්ශනය කරන අධිකරණයක්. කෙනෙක් නිර්දෝෂී නම් ඒ අධිකරණයේදී ඔප්පු කරන්න පුළුවන් තමන් නිර්දෝෂියි කියලා. ඒ ගැන භය වෙන්න දෙයක් නැහැ. භය නිසා විරුද්ධ වෙනවා මිස, භය නැත්නම් මේ අධිකරණ පිහිටුවීමට පක්ෂ වෙන්න ඕනෑ. අපි කියනවා, ජනතා විමුක්ති පෙරමුණේ අපි මේ අධිකරණවලට භය නැහැයි කියලා. මොකද, අපි මේ රටේ ජනතාවගේ සම්පත් වංචා කරපු නැති, හොරකම් කරපු නැති, දූෂණ කරපු නැති පක්ෂයක් නිසා. දේශපාලනය තුළ පමණක් නොවෙයි, නිලධාරීන්ගේ පැත්තෙනුත් රටේ සියලු ක්ෂේත්‍ර පුරාම ඔඩු දුවලා තිබෙන මේ වංචා දූෂණ නතර කිරීම සඳහා මෙවැනි ශක්තිමත් නීතියක් වහාම ක්‍රියාත්මක කළ යුතුයි. එම නිසා මෙම අධිකරණ වහාම පිහිටුවිය යුතුයි කියන ස්ථාවරයේ හිඳිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.12]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් කීපය අතරින් විශේෂයෙන්ම අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මා මුලින්ම ගරු සභාවේ අවධානය යොමු කරවනවා.

අපේ රටේ මැතිවරණයක් එනකොට, ආණ්ඩුවක් වෙනස් වනකොට "දූෂණය" කියන මාතෘකාව නිරන්තරයෙන්ම මතුවනවා. ඒක ශ්‍රී ලංකාවේ විතරක් නොවෙයි, මේ ආසියානු කලාපයේම දේශපාලන සංස්කෘතියේ කොටසක් බවට පත්වෙලා තිබෙනවා. අපට මතකයි, 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට එනකොට ඉදිරිපත් කළ ප්‍රධානම තේමාව තමයි, 'දහහත් වසරක එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවේ හිටපු හොරු ටික ගෝල්ෆේස් එකට ගෙනැල්ලා එල්ලන්න පුළුවන් විධියට නීති ගෙනැල්ලා දඬුවම් දෙනවාය' කියන එක. ඔබතුමන්ලාට මතක ඇති, ඒ ආණ්ඩුව මුලින්ම ගෙනා පනත තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත. එදා අධිකරණ ඇමතිවරයා විධියට හිටපු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා අල්ලස් දෙපාර්තමේන්තුව අහෝසි කරලා, ඒ ආණ්ඩුවේ පළමුවන පනත විධියට ස්වාධීන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත ගෙනාවා. අපි දන්නවා, අල්ලස් දෙපාර්තමේන්තුව තිබෙන කාලයේ අපේ රටේ අල්ලස සම්බන්ධව ඉතා දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක වුණු බව. ඒ හරහා බොහෝ වැරදිකරුවන්ට දඬුවම් දුන්නා. මෙම කටයුත්ත ස්වාධීනව කරන්න ඕනෑය කියලා 1994 පත් වුණ ආණ්ඩුව ගෙනා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හිටපු විනිශ්චයකාරතුමන්ලා -විශ්‍රාම ගිය අය- අය පත් වුණා. ඒ අවුරුදු පහ ඇතුළත එම කොමිෂන් සභාවට එකම එක නඩුවක් ගොනු වුණා. ඒක තමයි, නුගේගොඩ ප්‍රදේශයේ පාසලකට ළමයෙකු ඇතුළත් කරන්න ගුරුවරයෙකුට පීරිසි කෝප්ප හයක් පගාවක් විධියට දීම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ අල්ලස් නඩුව. ඒ කොමිසම නඩත්තු කරන්න අපේ රටේ බදු ගෙවන ජනතාව රුපියල් කෝටි ගණනක් වියදම් කළා. නමුත් එහි එකම ප්‍රතිඵලය වුණේ එම නඩුවයි. ඒ නඩුවත් නිෂ්ප්‍රභ වුණා. සමහර වෙලාවට නීතිය පිළිබඳව, ක්‍රමවේදය පිළිබඳව හරි අධ්‍යයනයක් නොකර බොහොම හැඟීම්බරව මේ පාර්ලිමේන්තුවට ගෙනෙන නීති තුළින් අවශ්‍ය පරමාර්ථ ඉෂ්ට කර ගැනීමට බැරි වනවා. ඒ සඳහා හොඳම උදාහරණයක් මෑත

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

කාලයෙන් අපට ගන්න පුළුවන්. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අපි පුළුවන් තරම් කිව්වා, ඉදිරිපත් කරපු ඒ ක්‍රමවේදය මේ රටට ගැළපෙන්නේ නැහැ, පළාත් පාලන ආයතන මේ ක්‍රමයට ගෙන යන එක අසීරුයි කියලා. නමුත්, මේ පාර්ලිමේන්තුවේ අතිබහුතරයක් ඒ මතය පිළිගත්තේ නැති නිසා ඒ නීතිය සම්මත වුණා. ඒ නිසා අද පළාත් පාලන ආයතන කඩා වැටෙන තත්ත්වයට, පවත්වාගෙන යන්න බැරි තත්ත්වයට පත්වෙලා බල අරගළයක යෙදී සිටිනවා මිස, ජනතාවට සේවය කරන ආයතන බවට පත් වෙලා නැහැ. ඒ නිසා අපි නීතියක් ගෙනෙනකොට ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇතුව අධ්‍යයනය කරලායි ගෙනෙන්නට ඕනෑ.

දැන් අපේ අධිකරණ පද්ධතියේ යුක්තිය ඉටු කිරීමේ ප්‍රමාදයක් තිබෙනවාය කියන කාරණය කාටවත් රහසක් නොවෙයි. කවුරුත් ඒක ප්‍රතික්ෂේප කරන කාරණයකුත් නොවෙයි. මේක අද-ඊයේ ඇති වුණු තත්ත්වයක් නොවෙයි. මේ සම්බන්ධයෙන් 1960, 70 දශකයේ නීති සම්මන්ත්‍රණ තිබිලා තිබෙනවා. ඒවාට සම්බන්ධ පොත්පත් මුද්‍රණය වෙලා තිබෙනවා. ඒ නීති සම්මන්ත්‍රණවල මාතෘකාව විධියට තිබෙන්නේ නීතියේ ප්‍රමාදය නොහොත් "Laws Delays" කියන කාරණය. පසුගිය වසරේ නීතිඥ සංගමයෙන් සම්මන්ත්‍රණයක් පැවැත්වුවා. ඒකේ මාතෘකාව වුණේත්, "Laws Delays." යුක්තිය ඉටු කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම රජයකට වග කීමක් තිබෙනවා. ඒ තත්ත්වය නැති කරනවාය කිව්වොත්, ඒක අසත්‍යයක්. එහෙම කරන්න බැහැ. නමුත් රජයකට වග කීමක් තිබෙනවා ඒ තත්ත්වය අවම කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2012 වසරේ අපේ රටේ අධිකරණ පද්ධතියේ නඩු 632,000ක් තිබුණා. 2016 වසරේ එම සංඛ්‍යාව 745,000කට වැඩිවෙලා තිබෙනවා. මේ වැඩිවුණු නඩු ප්‍රමාණය අරගෙන බැලුවාම වැඩියෙන්ම නඩු තිබෙන්නේ, - මේ 745,000න් 539,000ක්ම තිබෙන්නේ - මහෙස්ත්‍රාත් අධිකරණවල. සියයට 80කට කිට්ටු ප්‍රතිශතයක් තිබෙන්නේ මහෙස්ත්‍රාත් අධිකරණවල. 2016 සංඛ්‍යා ලේඛන අනුව එම 539,000න් මෝටර් රථ ප්‍රවාහන පනත උල්ලංඝනය කිරීම පිළිබඳව නඩු 111,792ක් තිබෙනවා. ඒ කියන්නේ මහෙස්ත්‍රාත් අධිකරණයේ පවතින නඩු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 20ක්. අනෙක් පැත්තෙන් නීති විරෝධී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නඩු 72,000ක් මහේස්ත්‍රාත් අධිකරණයේ තිබෙනවා. ඒක නඩු ප්‍රතිශතයෙන් සියයට 13ක්.

2015 ජනවාරි 08වෙනි දා ආණ්ඩුවක් හැටියට බලයට එන විට අපට නීතිය පැත්තෙන් බරපතළ අභියෝග දෙකක් තිබුණා. එකක් තමයි, අපේ රටේ නීතියේ ආධිපත්‍ය බිඳවැටිලා තිබුණා. ඒක නැවත ගොඩ ගන්නට ඕනෑයි කියලා තමයි මේ රටේ බහුතරයක් ජනතාව එදා ඡන්දය පාවිච්චි කළේ. ඒක තමයි ජාත්‍යන්තරයෙන් අපට විරුද්ධව තිබුණු ලොකුම චෝදනාව. දෙවෙනි අභියෝගය තමයි අනෙකුත් සෑම ආණ්ඩුවකටම තිබුණා වාගේම යුක්තිය ඉටු කිරීම ප්‍රමාද වීම වැළැක්වීම සඳහා පියවර ගත යුතු වීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාවේ ඉන්නේ අධිකරණ නිලධාරීන් 303 දෙනායි. මේ 303 දෙනා මඟින් තමයි අපි සමස්ත දිවයින පුරා යුක්තිය ඉටු කිරීම සිද්ධ කරන්නේ. රජයක් හැටියට බලයට පත් වුණාට පසුව අපි මේවා පිළිබඳව අවධානය යොමු නොකළා නොවෙයි. මුලින්ම අධිකරණ සේවා කොමිෂන් සභාවත්, ගරු අගවිනිසුරුතුමාත් සමඟ අපි සාකච්ඡා කරලා අධිකරණවලට චක්‍රලේඛයක් මඟින් නියෝගයක් යැව්වා, "සෑම අධිකරණයකම උදය වරුවේ සහ සවස් වරුවේ යන දෙකේම නඩු විභාග කිරීම සිදු කළ යුතුයි" කියලා. ඊට අමතරව අපේ රටේ සිවිල් නඩු සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහය ගත්තත්, අපරාධ නඩු සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය ගත්තත් ප්‍රතිපාදන තිබෙන්නේ දිනපතා නඩු ඇසීමටයි. හැබැයි කාලයක් යන විට විනිශ්චයකාරවරුන් සහ නීතිඥවරුන් යන දොගොල්ලන්ම දිනපතා නඩු ඇසීම වෙනුවට මාස දෙක, තුන, හතර නඩු කල් දමමින් ගිහිල්ලා, ඒක අපේ රටේ නීති ක්‍රමයට සම්ප්‍රදායක් විධියට කාවැදිලා තිබෙනවා. මේ ක්‍රමය වළක්වා ගැනීමට පවතින නීතියේ ප්‍රතිපාදන ප්‍රමාණවත්ව තිබෙන නිසා තමයි අධිකරණ සේවා කොමිෂන් සභාව හරහා අපි චක්‍ර ලේඛ යවලා මහාධිකරණ ඇතුළු අනෙකුත් අධිකරණවලට කිව්වේ, උදේ සවස නඩු අහලා, ඒ වාගේම දිනපතා නඩු අහලා මේ නඩු ඉවර කරන්නට ඕනෑ කියලා. සමහර විනිශ්චයකාරවරුන් ඒ පිළිබඳව උනන්දුවෙන් කටයුතු කළා, සමහර විනිශ්චයකාරවරුන් ඒ පිළිබඳව දැඩි තැකීමක් කළේ නැහැ. දෙවනුව අපි අධිකරණ සේවා කොමිෂන් සභාව හරහා දිසා අධිකරණවලට සහ මහාධිකරණවලට නියෝගයක් යැව්වා, මහාධිකරණවල තිබෙන අවුරුදු 5කට වඩා පැරණි නඩු සියල්ල වසර 2ක් ඇතුළත සහ දිසා අධිකරණවල තිබෙන අවුරුදු 10කට වඩා පැරණි සිවිල් නඩු අවුරුද්දක් ඇතුළත අහලා ඉවර කරන්නට ඕනෑ කියලා. මේ ක්‍රමය තවත් කාර්යක්ෂම කරන්නට තමයි අපි සිවිල් නඩු විධාන සංග්‍රහය පනතට සංශෝධනයක් ගෙනාවේ. ඒ අනුව සෑම සිවිල් නඩුවක්ම විභාගය ආරම්භ කරන්නට පෙර අනිවාර්යයෙන්ම විනිශ්චයකාරතුමා ඉදිරියේ සමථකරණයකට යන්නට ඕනෑ. මාස කිහිපයකට කලින් තමයි අපි එය සම්මත කර ගත්තේ. එය ඉතාම සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ නඩු ප්‍රමාදය පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට දිගින් දිගටම චෝදනා එල්ල වුණා. ඒ සම්බන්ධයෙනුත් කියන්නට අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2005දී නීතිපති දෙපාර්තමේන්තුවට අලුතෙන් නීතිඥවරුන් 30 දෙනෙකු බඳවා ගැනීමට ඕනෑකම තිබුණා. අපි පුවත් පත් දැන්වීම් පළ කරලා අයදුම් පත් කැඳවුවාම ලැබුණේ අයදුම් පත් 11යි. ඇයි හේතුව? එදා තිබුණු එම වැටුප් තලයට අනුව අපේ රටේ නීතිඥවරුන් නීතිපති දෙපාර්තමේන්තුවට බැඳෙන්නට කැමැති වුණේ නැහැ. එම නිසා අපි -අමාත්‍ය මණ්ඩලය- තීරණයක් අරගෙන බොහොම අමාරුවෙන් රජයේ නීතිඥවරුන්ගේ වැටුපට දීමනාවක් එකතු කරලා, අවස්ථා දෙකකදී නීතිපති දෙපාර්තමේන්තුවට නීතිඥවරු 47දෙනෙක් බඳවා ගන්න හැකියාව ලැබුණා. නීතිපති දෙපාර්තමේන්තුව සහ විනිශ්චයකාරතුමන්ලා කරන්නේ ඉතාම වෙහෙසකර කාර්යයක්. ඒක පැය අටේ සේවයක් නොවෙයි. පැය 24ක සේවයක් හැටියට තමයි ඔවුන් කටයුතු කරන්නේ. නමුත් දීර්ඝ කාලයක් තිස්සේ ඒ අයට වැටුප් ප්‍රශ්නයක් තිබුණා. ඒවා පිළිබඳව ආමන්ත්‍රණය කරලා තිබුණේ නැහැ. අපි ඉතාම අසීරුවෙන් වසර දෙකක් වාගේ කාලයක් තිස්සේ උත්සාහ කරලා අධිකරණ ක්ෂේත්‍රයේ අධිකරණ නිලධාරීන්ගේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වැටුප ඔවුන් බලාපොරොත්තු වුණු මට්ටමට, සෑහීමට පත් වන පරිදි ලබා දීලා තිබෙනවා.

බොහෝ අය කියනවා නීතිපති දෙපාර්තමේන්තුව වැඩ කරන්නේම නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අපරාධ නඩු සම්බන්ධ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නම්. 2014 වසරේ ලැබුණු නඩු ගොනු සංඛ්‍යාව සහ අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව ගත්තාම, අවසන් කරලා තිබෙන්නේ සියයට 62යි. ඒ කියන්නේ සියයට 38ක් ඊළඟ අවුරුද්දට arrears විධියට එකතු වෙනවා. හැබැයි, 2015 වසරේදී සියයට 62, සියයට 65 දක්වා සියයට 3කින් වැඩි කළා. 2016 වසරේ දී සියයට 65 ප්‍රතිශතය සියයට 78 දක්වා සියයට 13ක ප්‍රතිශතයකින් වැඩි කළා. 2017 වසරේ මැයි මාසය වන විට නීතිපති දෙපාර්තමේන්තුවට

ලැබුණු නඩු ගොනු සංඛ්‍යාවත්, අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාවත් ගත්තාම, සියයට 105 දක්වා වැඩි වෙලා තිබෙනවා. අවුරුදු දෙකහමාරක් වාගේ කාලයක් තුළ නඩු අවසන් කිරීමේ වේගය - disposal rate එක- සියයට 62 සිට සියයට 105 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. අපි මේ ක්‍රමයට තව අවුරුදු දෙක, තුනක් ගියා නම්, මේ දෙපාර්තමේන්තුවේ අවුරුදු 19ක් තිස්සේ ගොඩ ගැහිලා තිබුණු අපරාධ නඩු ටික අවසන් කර ගන්න පුළුවන්කම තිබුණා.

නඩු ප්‍රමාදයට හේතුවන අනෙක් ආයතනය තමයි රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව. මීට අවුරුදු තුන හතරකට කලින් ඕනෑම අපරාධ අධිකරණයකට ගියාම දිනපතා නඩු සිය ගණනක් කල් ගියේ "රස පරීක්ෂක වාර්තාව නැත" කියලායි. නමුත් අද රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ආසියාවේ තිබෙන හොඳම දෙපාර්තමේන්තුවක් බවට පත් කරලා තිබෙනවා. අපට විද්‍යාගාර 10ක් තිබුණා. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ කාලයේ එම විද්‍යාගාර 10 උසස් මට්ටමකට ගෙනැවිත් ISO සහතික ලබා ගත් විද්‍යාගාර බවට පත් කරලා තිබෙනවා. ඊට අමතරව අපි කොරියානු රජයෙන් ඉල්ලීමක් කරලා, රුපියල් මිලියන 342ක් වියදම් කරලා අලුතෙන් විද්‍යාගාර දෙකක් ඇති කළා. මීට පෙර අපේ රටේ රජයේ ආයතනවල DNA පරීක්ෂණ කෙරුණේ නැහැ. පෞද්ගලික අංශයෙන් තමයි ජාන පරීක්ෂණ සිදු කළේ. එහෙම නැත්නම් විදේශ රටවලට යවන්න ඕනෑ. අද අපේ රසපරීක්ෂණ දෙපාර්තමේන්තුවට ජාන පරීක්ෂණ කරන රසායනාගාරයක් තිබෙනවා. ඒ එක්කම අංකිත චෝහාරික - digital forensic - විශ්ලේෂණය සඳහා ශ්‍රී ලංකාව තුළ රසායනාගාරයක් තිබුණේ නැහැ. අද digital forensic විද්‍යාගාරයක් තිබෙනවා. ඒ අනුව අද වන විට රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තා ලබා දීමේ වේගය සියයට සියයක් බවට පත් වෙලා තිබෙනවා.

මේ රටේ නීතියේ ආධිපත්‍ය පිළිබඳ ජනතාවගේ දැඩි අවධානයක් තිබුණු නිසා එදා අපි 47දෙනෙකුගේ ආණ්ඩුවක් විධියට -සුළුතර ආණ්ඩුවක් විධියට- වුණත් මේ ගරු සභාවේ සියලු දෙනාගේ සහයෝගය ඇතිව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරලා ස්වාධීන කොමිෂන් සභා පිහිටුවන්න අපට පුළුවන්කම ලැබුණා. අපි එවක් පටන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සාධාරණව සිදු කරන්න අණ පනත් ගණනාවක් සම්මත කරලා තිබෙනවා. අපි 2015 වසරේදී අපරාධයක විත්තිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය ඇති කළා. අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කළා.

2016 අංක 5 දරන කාලාවරෝධි විශේෂ විධිවිධාන පනත ගෙනාවා. යුද්ධය නිසා උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජීවත් වුණු ජනතාවගේ බොහෝ ඉඩකඩම් අහිමි වෙලා තිබුණු බව අපි දන්නවා. අපේ රටේ තිබෙන කාලාවරෝධි නීතිය අනුව කවුරු හරි දසවසරක් බලෙන් භුක්තියේ හිටියා නම්, ඔවුන්ට එම දේපළේ හිමිකම ලැබීමට වරප්‍රසාද තිබෙන බව අපේ රටේ නීතිය පිළිගත්තා. හැබැයි, ඒ කාලාවරෝධි නීතිය බැහැර කරමින් එම අසාධාරණය සිදුවූ ජනතාවට අවුරුදු 30කට පසුව වුණත්, දිසා අධිකරණයේ නඩුවක් පවරලා අයිනිය හිමි කර ගන්න පුළුවන් ආකාරයට අපි නීති සම්මත කළා. සමථ මණ්ඩල පනත සංශෝධනය කළා. අපේ රටේ වාර්ෂිකව ලක්ෂ දෙකහමාරක් විතර සමථ මණ්ඩලවලට එනවා.

ඒ ලක්ෂ දෙකහමාරේ මූල්‍ය වටිනාකම් සීමාව ලක්ෂ 5 කළ නිසා, අධිකරණයට සුළු සුළු කටයුතු වෙනුවෙන් කාලය වැය නොකර, ඒවා සමථ මණ්ඩලයේදී සමථකරණය කර ගැනීමට ඉඩ දීලා අධිකරණය අපි අවශ්‍ය කාරණාවලට යෙදෙව්වා. ඒ එක්කම නීති කොමිෂන් සභා පනත සම්මත කළා. අවලංගු කළ නොහැකි තැගි ඔප්පු අවලංගු කිරීම පිළිබඳ අධිකරණ තීන්දුවක් නිසා අපේ රටේ ඊට අදාළ නීතිය සම්පූර්ණයෙන්ම අවුල් වෙලා තිබුණා. අපි පනතක් ගෙනැල්ලා ඒක නිවැරදි කළා. ඊළඟට, අසාධාරණයක් සිදු වෙලා ඡන්දය ලියාපදිංචි කර ගන්න බැරි වුණු ලක්ෂයකට වැඩි පිරිසක් හිටියා. අපි විශේෂ පනතක් ගෙනැල්ලා ඒ අයගේ ඒ කාර්යය ඉටු කළා. ඒ අනුව, මේ පනත් මඟින් යුක්තිය ඉටු කිරීම වඩාත් ඉක්මන් කිරීම සඳහා අපි තව තවත් කටයුතු කළා. අධිකරණ අමාත්‍යාංශයත්, කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයත් එකතු වෙලා නීති පර්යේෂණ ඒකකයක් පිහිටුවා තිබෙනවා. අද වන විට එය සාර්ථකව ක්‍රියාත්මක වනවා. ඒ විතරක් නොවෙයි, ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයක් ආරම්භ කළා; ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබුවා; උතුරු නැගෙනහිර දෙ පළාතේ විශේෂ සමථ මණ්ඩල පිහිටුවනු ලැබුවා. වසර 30ක් වැනි කාලයක් තිස්සේ ඒ ජනතාවට අහිමි වුණු දේපොළවල හිමිකම් නැවත තහවුරු කර ගැනීම සඳහා එය ඉතා ප්‍රයෝජනවත් වනවා.

ඒ එක්කම මා සඳහන් කරන්න ඕනෑ, මේ ඉදිරිපත් කරපු පනත ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යෑම පිළිබඳව තර්ක විතර්ක ඇති වුණු බව. ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගියා. මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි, මේ පනත ඉදිරිපත් කරපු වෙලාවේ කාරණා දෙකක් සම්බන්ධව මමත් විරෝධය පළ කළ බව. ඒ විරෝධය පළ කළේ, මේ ගෙනෙන පනත හරහා සම්මත කරන නීතිය කොතරම් සර්ව සාධාරණ වුණත්, ඒ නීතිය හරහා ලැබෙන තීන්දුව කොතරම් සර්ව සාධාරණ වුණත්, ජනතාවට ඒකෙන් ලැබෙන පණිවිඩය "මෙය දේශපාලන බලපෑමක් මත එහෙම නැත්නම් දේශපාලන පළිගැනීමක් මත සිදුවන දෙයක්" ය කියන එක නම්, ඒක අපේ අධිකරණ පද්ධතියට බරපතළ හානියක් බවට පත් වන නිසයි. මොකද, රටේ අධිකරණ පද්ධතියයි, ජනතාවයි අතර ලිඛිත ගිවිසුමක් නැහැ. ඒ තුළ තිබෙන්නේ විශ්වාසයයි. පසුගිය කාලසීමාව තුළ නොයෙකුත් දේශපාලන කලබගෑනි සිදුවීම් තුළ, ව්‍යවස්ථාදායකය පිළිබඳව අපේ රටේ ජනතාව තුළ තිබුණු විශ්වාසය බොහෝ සෙයින් කඩා වැටිලා තිබුණා; විධායකය පිළිබඳව විශ්වාසය බිඳ වැටී තිබුණා. එහෙත් අපේ රටේ ජනතාව සෑහෙන මට්ටමකට අධිකරණය පිළිබඳව විශ්වාසය තබාගෙන සිටියා. ඒ විශ්වාසය තව දුරටත් ආරක්ෂා කිරීම අපේ වගකීමක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ පනතේ ඒ මුල් කෙටුම්පත සම්බන්ධව කරුණු ඉදිරිපත් කළේ, නීතිමය කරුණු හොඳින් සැලකිල්ලට භාජන කරලයි. අපේ රටේ මීට පෙර අල්ලස් පනත යටතේ විනිශ්චය අධිකාරියක් පිහිටුවනු ලැබුවා. ඒ විනිශ්චය අධිකාරිය යටතේ දඬුවම් දීමේ බලයක් ලැබිලා තිබුණා. නඩු විභාග කරලා දඬුවම් ලබා දෙන්න ඒ විනිශ්චය අධිකාරියට බලය දීලා තිබුණා. ඒ අවස්ථාවේදී විනිශ්චයකාරවරුන් පත් කිරීම සිදු කරනු ලැබුවේ අග විනිසුරුවරයා, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have only two more minutes.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි 10ක කාලයක් ලබා දෙන්න. අපි arrangement එක දාලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කවුරුන් හෝ වේලාව දෙනවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Sir, please give me ten more minutes. We will deduct that time from the others.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සම්බන්ධව නඩු ගණනාවක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ඒ යාම තුළ, ඒ සියලුම විනිශ්චය පර්ෂද අධිකාරිවලින් දීපු නඩු තීන්දු සියල්ල අහෝසි කළා. ඒ විනිශ්චය අධිකාරියත් නීතියෙන් වලංගු නැති බවට තීරණය කරනු ලැබුවා. ඒ නඩුවේදී එංගලන්තයේ Privy Council නඩු තීන්දුවක් සලකා බැලුවා. ඒකට බලපෑ කාරණයක් තිබෙනවා. එනම්, 1942දී ඉන්දියාවේ කලබලකාරී අවස්ථාවක්, හදිසි අවස්ථාවක් තිබුණා. 1942දී ඇති වුණු ඒ නොසන්සුන්කාරී තත්ත්වය තුළ, අපරාධකරුවන්ට දඬුවම් දීම සඳහා අපි ඉදිරිපත් කළ මෙහි මුල් පනත ආකාරයේම පනතක් ඉන්දියාවේ පාර්ලිමේන්තුව සම්මත කළා. ඒ අධිකරණය විසින් සැකකරුවන් වැරදිකරුවන් බවට පත් කරලා දඬුවම් දුන්නා. ඒ දඬුවමට එරෙහිව බ්‍රිතාන්‍ය රාජාධිකරණයට අභියාචනා කළාම, "Emperor vs Benoari Lal Sarma "කියන නඩු තීන්දුවේදී, "ඒ අධිකරණය නීත්‍යානුකූල නැහැ; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි" කියලා ඒ සියල්ල අහෝසි කර දැම්මා.

ඒ අනුව තමයි, විශේෂයෙන්ම අපි පිළිබඳව සැලකිලිමත් වුණේ. කුමන නඩුවද ත්‍රිපුද්ගල මහාධිකරණයට ගෙන යන්නේ කියා නීතිපතිතුමා සහ අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කළොත්, ඒ අනුව අධිකරණ ක්‍රමය පිළිබඳ මහ ජනතාවගේ විශ්වාසය බිඳ වැටෙනවා. අපි නීතිපතිතුමා කොච්චර ස්වාධීනයි කිව්වත්, අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් කොච්චර ස්වාධීනයි කිව්වත් ඒ ඒ කාල වකවානුවල ඔවුන්ටත් යම් යම් බලපෑම් අඩු වැඩි වශයෙන් තිබෙනවාය කියන එක ප්‍රතික්ෂේප කරන්න බැහැ. පසුගිය කාලයේ දේශපාලනයට සම්බන්ධ මිනීමැරුම් නඩු චූදිතයන්ට තිබුණා. සමහර නඩු අහලා ඉවරයි. සමහර නඩු බාගෙට අහලා තිබෙනවා. නීතිපතිවරයා මහාධිකරණයට ගිහිල්ලා අධි චෝදනා පත්‍ර ඉල්ලා අස් කර ගත් අවස්ථා අපේ රටේ අපි දැක්කා. ඒ නිසා මහ ජනතාවගේ විශ්වාසය ඇති කිරීමට නම් මේ සඳහා පිළිගත හැකි ක්‍රමවේදයක් විධියට අග විනිසුරුවරයා විසින් මේ තීරණය ගත යුතුය කියන මතයේයි අපි මුල ඉඳලාම සිටියේ.

ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සම් හේතුවෙන් දුන් නියෝගය අනුව සංශෝධනය වෙලා, ඒ අධිකරණවලට කුමන විනිශ්චයකාරවරුන්ද පත් කරන්නේ කියන බලය ශ්‍රේෂ්ඨාධිකරණයේ අග විනිසුරුතුමාට දැන් ලැබී තිබෙනවා. මේක විශේෂ අධිකරණයක් කිව්වාට, ඇත්තටම කියන්න තරම් විශේෂ කාරණයක් නැහැ. මේක අපේ රටේ තිබෙන ක්‍රමය. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 450 වගන්තිය සහ අධිකරණ සංවිධාන පනතේ 12 වන වගන්තියේ (2) වන උප වගන්තිය අනුව දැනටත් නීතිපතිවරයාට බලය තිබෙනවා, අහවල් නඩුව සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල විනිශ්චය ආසනයක් මට පත් කර දෙන්නය කියලා ඕනෑම අවස්ථාවක අග විනිසුරුතුමාගෙන් ඉල්ලන්න. අග විනිසුරුතුමා සෑහීමකට පත් වෙනවා නම්, එතුමා තීරණය කරන පරිදි විනිශ්චයකාරවරු තුන් දෙනෙක් පත් කරන්න එතුමාට බලය තිබෙනවා. මා දන්නා තරමට ඉතිහාසයේ කවදාවත් නීතිපතිවරයෙක් ත්‍රිපුද්ගල විනිශ්චය ආසනයක් පත් කරන්නය කියලා කළ ඉල්ලීමක් අද වන තෙක් ප්‍රතික්ෂේප කර නැහැ. ඒ නිසා මේ බලය නීතිපතිවරයාට දැනුත් තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
"ත්‍රිපුද්ගල මහාධිකරණයක්" කියලා මෙහි සඳහන් වෙනවා. ස්ථිර - permanent - [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඇත්තටම මෙහිදී තිබෙන්නේ එක වෙනසයි. පවතින නීතිය අනුව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 450වන වගන්තිය සහ අධිකරණ සංවිධාන පනතේ 12වන වගන්තිය අනුව, when there are some sensitive matters where the people have a lot of concerns about the case - [*Interruption.*] - and also if the Attorney-General is of the view that there are serious matters to be tried in a case, එතකොට ඒ වාගේ අවස්ථාවක ඉල්ලීමක් කිරීමේ අයිතිය තිබෙනවා. හැබැයි, ඒක permanent නැහැ. ඒ සඳහා නඩුවෙන් නඩුවට - case by case - අග විනිසුරුවරයා විසින් පත් කරන්න ඕනෑ. මෙතැන තිබෙන වෙනස තමයි මහාධිකරණ විනිශ්චයකාරවරු තුන්දෙනෙක් වෙනම අධිකරණයකට පත් කරන එක. ඒ පත් කිරීම කරන්නේ අග විනිසුරුවරයායි. ඒ අධිකරණයේ අහන්න ඕනෑ නඩුව කුමක්ද යන්න පිළිබඳව නැවතත් අග විනිසුරුතුමාගෙන් ඉල්ලීමක් කරලා, - [*Interruption.*] It is almost the same. ඒක නිසා තමයි මම කිව්වේ මේක විශේෂ කිව්වාට ලොකු විශේෂයක් නැහැය කියලා. ඇත්තටම මේ වාගේ පනත් කෙටුම්පතක් ගෙන ඒමේ අවශ්‍යතාව ඇති වන්නට හේතුව මම කියන්නම්. දැනට තිබෙන අපරාධ නඩු විධාන සංග්‍රහයේත් සිවිල් නඩු විධාන සංග්‍රහයේත් day-to-day hearings කියන එක; දිනපතා නඩු අහනවාය කියන එක ඉදිරියට කර ගෙන යන්නය කියා අධිකරණ සේවා කොමිසම මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලාට දුන්න නියෝගය පිළිපැද්දා නම් මෙහෙම ප්‍රශ්නයක් මතු වන්නේ නැහැ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම අනුව නීතිඥයෝ හැටියට අපි ඔය කාරණයට එකඟ වෙනවා. නීතිඥ සංගමයත් එකඟයි. දැන් තිබෙන ප්‍රශ්නය මෙකයි. ඔබතුමාම කිව්ව හැටියට මහෙස්ත්‍රාත් අධිකරණවල විතරක් නඩු 539,000ක් තිබෙනවා. එයින් traffic සම්බන්ධ නඩු එක්ලක්ෂ එකොළොස්දහස් ගණනක් තිබෙනවා. හැබැයි, දැන් මේ ගෙනෙන සංශෝධනය තුළින් මහාධිකරණයට ත්‍රිපුද්ගල විනිශ්චයකාර මණ්ඩලයක් ස්ථාවරව ස්ථාපනය කළාට පස්සේ ඒකට යොමු කළ යුතු නඩු මොනවාද කියන එකත් ඔබතුමා පැහැදිලි කළා. ඒකත් හරි. දැන් තිබෙන ප්‍රශ්නය මෙකයි. මහෙස්ත්‍රාත් අධිකරණවල තිබෙන අර නඩු එකකටවත් ඒක බලපාන්නේ නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්. ඒකට අදාළ නැහැ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හරි, හරි. දැන් මට clarify කර ගන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ මේකයි, ගරු ඇමතිතුමනි. මිනීමැරුම් නඩු, ස්ත්‍රී දූෂණ නඩු, highway robberies, bribery cases ආදී වශයෙන් නඩු විශාල ප්‍රමාණයක් මහාධිකරණවල ගොඩ ගැහිලා, දැනට දිග list එකක් තිබෙනවා.

ඔය කියන ත්‍රිපුද්ගල විනිශ්චයකාර මණ්ඩලය මොන නඩුද ඉස්සෙල්ලා ගන්නේ කියලා prioritize කරන්නේ කොහොමද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මහාධිකරණවල නඩු ගිය අවුරුද්ද අවසාන වනකොට 5,973ක් තිබුණා. ඒ කියන්නේ අපරාධ නඩු. සාමාන්‍යයෙන් කලින් කෙරුණේ කොහොමද කියලා ඔබතුමන්ලාට මතක ඇති. විද්‍යා දැරිය ඝාතන නඩුව, උඩතලවින්න ඝාතන නඩුව වැනි ඝාතන නඩු සම්බන්ධයෙන් අගවිනිසුරුතුමාගෙන් ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක් ඉල්ලුවාම ත්‍රිපුද්ගල විනිශ්චය ආසන දුන්නා. වෙනත් අධිකරණයක සේවය කරමින් ඉන්න විනිශ්චයකාරවරු තුන් දෙනෙක් මෙතැනට ගෙනැල්ලා පත් කළාම ඒ විනිශ්චයකාරවරු සාමාන්‍ය වශයෙන් කටයුතු කරන අධිකරණ ශාලා තුනේම නඩු ඇන හිටිනවා. අපි මේ පනත් කෙටුම්පත්වලින් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? අධිකරණ සංවිධාන පනතට අනුව මහාධිකරණ විනිශ්චයකාරවරු 75දෙනෙකුට වැතිරයි ඉඩකඩ තිබුණේ. දැන් ඒ ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. ඒක නිසා සාමාන්‍ය වශයෙන් නඩු ඇහෙන අධිකරණවලට බාධාවක් නොවන විධියට සුදුසු විනිශ්චයකාරවරුන් තිදෙනෙක් මේ අධිකරණවලට පත්වීම තුළින් අනෙකුත් නඩුවලට හානියක් වෙන්නේ නැහැ. ඒ විධියට තමයි දැන් සැලසුම් කරලා තිබෙන්නේ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු ඇමතිතුමනි, මම යොමු කරන ප්‍රශ්නය මේකයි. ඔය තිබෙන නඩු අතරත් ත්‍රිපුද්ගල විනිශ්චයකාර මණ්ඩලයට යොමු කළ හැකිව තිබෙන්නා වූ නඩු තිබෙනවා. මම අහන්නේ ඒ නඩු ටික අහලා ඉවර වෙලාද, ඊළඟ නඩු ගන්නේ කියන එකයි. එහෙම නැත්නම් ඒවා තියලා අලුත් ඒවා ගන්නවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මේ පනත් කෙටුම්පතේ තිබෙන විධියට මේක වෙනම අධිකරණයක් විධියට යනවා. අනෙකුත් අධිකරණ කටයුතු එසේම කෙරීගෙන යනවා. දැන් පවතින නීතිය යටතේ මෙන්න මේ වාගේ බරපතළ නඩු තිබෙනවා කියලා නීතිපතිතුමා අගවිනිසුරුතුමාගෙන් ඔය නඩු පිළිබඳව ඉල්ලීමක් කළා නම් ඇත්තටම මේ ප්‍රශ්නය අද මතු වෙන්නේත් නැහැ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

කලින් ඒවාටත් උත්තර දුන්නු නිසායි මම අහන්නේ. මම දන්නා තරමින් අපේ රටේ ඉතිහාසයේ trials at bars හතක් ගැන අහලා තිබෙනවා. ඔය හතේම චෝදනා පත්‍රය තිබුණේ capital punishment පිළිබඳවයි. මැතිව් පීරිස් නඩුව, පාර්ලිමේන්තු බෝම්බ නඩුව, විද්‍යා නඩුව, සෙව්වන්දි නඩුව, භාරත ලක්ෂ්මන් නඩුව ආදී නඩු තමයි ඒ යටතේ තිබුණේ. Penal Code එක අනුව, මේ Schedule එකේ තිබෙන ඒවා එකක්වත් capital punishment දෙන ඒවා නොවෙයි. දැන් මම අහන ප්‍රශ්නය මේකයි. බරපතළ නඩු මේකට යොමු කරනවා නම් ඔබතුමා කියපු විධියටම අපි එකඟ වෙනවා. එහෙම නම් අපි අවුරුදු 10, 15 ඇදි ඇදී එන මිනී මැරුම් නඩුවලින් පටන් ගන්න ඕනෑ. බරපතළ කියන ගණය අපි බලන්නේ මුදලින් නොවෙයි නේ. මුදල් මිලියන 11ක්ද, මිලියනයක්ද කියන ප්‍රශ්නයෙන් නොවෙයි ඒක බලන්නේ. ඒක බලන්නේ දඬුවමේ ප්‍රමාණය අනුව. දඬුවමේ ප්‍රමාණය අනුව capital punishmentවලට අයත් වන ඒවා ඉස්සෙල්ලා ගන්නවාද, එහෙම නැත්නම් අවුරුදු තුනක් දෙන්න පුළුවන් CBT එකක්, misappropriation එකක්, falsification එකක් ගන්නවාද කියන එකයි මම අහන්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

එතැනදී ඉල්ලීමක් කරන්න ඒ අභිමතය තිබෙන්නේ නීතිපතිතුමාටයි. ඒ ඉල්ලීම අනුව ඒකට ඉඩ දෙනවාද, නැද්ද කියන එක තීන්දු කරන්න තිබෙන්නේ අගවිනිසුරුතුමාට. ඒක තමයි මේ රටේ 1978 ඉඳලා අද දක්වා ක්‍රියාත්මක වුණු ක්‍රමවේදය. ශ්‍රේෂ්ඨාධිකරණයට ඔබතුමන්ලා ගිය නිසා ඒ ක්‍රමය අනුගමනය කරන්න කියලා තමයි ශ්‍රේෂ්ඨාධිකරණ Determination එකෙන් දීලා තිබෙන්නේ. ජනතාවගේ තිබුණු එක grievance එකක් තමයි, "සාම්ප්‍රදායිකව මේවා මිනීමැරුම් නඩුවලට විතරක් දාලා තිබෙනවා. නමුත් මිනීමැරුම් නඩු වාගේම රටේ ආර්ථිකයට, ජනතාවගේ භාණ්ඩාගාරයේ මුදලට විශාල වශයෙන් අලාභහානි කරපු, දූෂණ-වංචා කරපු නඩුත් බරපතළ විධියට සලකන්න ඕනෑ." කියන එක. එවැනි මතයක් මේ රට තුළ ගොඩ නැඟිලා තිබෙනවා. 1994 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගෙනාවේත් ඔය මතය උඩමයි. නමුත් මේ දක්වා ඒ පිළිබඳව නීතියේ විකාශයක් වෙච්ච නැති නිසා තමයි පාර්ලිමේන්තුවට මේ වාගේ නීතියක් ගෙනෙන්න සිදු වෙලා තිබෙන්නේ. සමහර වෙලාවට මේවා ක්‍රියාත්මක වෙනකොට පොඩි පොඩි අඩු-පාඩුකම් වෙන්න පුළුවන්. ඒවා හදා ගන්න වෙනවා. ත්‍රිපුද්ගල විනිශ්චය ආසනයක සම්පූර්ණයෙන්ම නඩුවක් අහන්න ලැහැස්ති වෙලා හිටියාම විනිශ්චයකාරවරයෙක් අසනීප වෙනවා. සමහර වෙලාවට සාක්ෂිකාරයා ඉස්පිරිතාලේ admit වෙනවා. ඒ වාගේ ප්‍රායෝගික ප්‍රශ්න තිබෙනවා. ඒවා වළක්වන්න කියලා "කෝකටත් තෙලය" වාගේ බෙහෙතක් නීතියෙන් ගෙනෙන්න බැහැ. එවැනි ප්‍රායෝගික ප්‍රශ්න තිබෙනවා. ඒක තමයි මම කිව්වේ, "නීතියේ ප්‍රමාදය ලෝකයේ කිසිම රටක් නැති කරගෙන නැහැ. අවම කර ගැනීමක් විතරයි කරලා තිබෙන්නේ." කියලා. ඇමෙරිකාවේත් එහෙම කරලා නැහැ. ඒ අනුව අපි විශ්වාස කරනවා, මේ ක්‍රමය තුළ රටට දෙන පණිවුඩය හරහා දූෂණයට, වංචාවට විරුද්ධව කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා. සමහර දේශපාලනඥයන් වෙන්න පුළුවන්, සමහර නිලධාරීන් වෙන්න පුළුවන්, මේ පණිවුඩයත් එක්ක ඒ දූෂණ, වංචා කරන්න පෙලඹෙන එක අවම වෙනවා. මෙය, එම තත්ත්වයන් අවම කර ගැනීම සඳහා ගත්තු පියවරයක්ය කියන කාරණය මතක් කරනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you very much. Next, the Hon. A.D. Susil Premajayantha. Before he starts, will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

[අ.භා. 3.42]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපරාධ නඩු ක්ෂේත්‍රය තුළ වැදගත් පනත් කෙටුම්පතක් කාලයකට පසුව සාකච්ඡාවට භාජනය වන අවස්ථාවක්, මෙය. 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 12වන වගන්තිය සංශෝධනය කරමින් යම් යම් වැරැදි සම්බන්ධයෙන් මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක් මඟින් නඩු ඇසීමට ප්‍රතිපාදන සැලසීම සඳහාත් ඒවාට යොමු කළ යුතු නඩු මොනවාදැයි විශේෂණය කිරීම පිණිසත් භය වන උපලේඛනය හැටියට උපලේඛනගත කරමින් සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. මේ සංශෝධනය අද මෙතැනට එන්න කලින් ඉදිරිපත් කරපු කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය අවස්ථාවේදී නීතිඥ සංගමය, තවත් විවිධ පාර්ශ්ව එය අභියෝගයට ලක් කළා. අභියෝගයට ලක් කිරීමේ හේතුව නිසා ශ්‍රේෂ්ඨාධිකරණය තම මතය ප්‍රකාශ කරමින් ඒ සඳහා විශේෂ බහුතර ඡන්දයක් කියන කාරණය සහ ඉන් අනතුරුව එය සංශෝධනය කළ යුත්තේ කෙසේද කියන කාරණය පිළිබඳව මහ පෙන්වීමක් කළා.

අපේ අධිකරණ අමාත්‍යතුමියවත්, ආණ්ඩු පක්ෂයවත් කිසිසේත්ම නොසිතිය යුතුයි, හොරු අල්ලන එකට විරුද්ධව අප කතා කරනවා කියා. අපි වෘත්තියෙන් නීතිඥයෝ. මා සෑහෙන කාලයක් නීතිඥ වෘත්තියේ යෙදුණේ නැහැ. නමුත් මම අවුරුදු 10ක් මහාධිකරණයේ නීතිඥ වෘත්තියේ යෙදුණු කෙනෙක්. මේ ගරු සභාවේ සිටින නීතිඥයන් අතරින් -අනෙක් අය ගැන මා දන්නේ නැහැ.- මම ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ දින 45ක නඩු විභාගයකදී විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටීමත්, එය ජයග්‍රහණය කිරීමත් දෛවෝපගත සිද්ධියක් හැටියට මම දකිනවා. ගරු අමාත්‍යතුමියනි, ඔබතුමියගේ හිටපු නායක ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මූලාසනය දරපු පාර්ලිමේන්තුවේ අංක 2 කමිටු කාමරයේදී ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් යැයි කියා ගන්නාවූ පිරිසක් විසින් එදා එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරයෙන් කීර්ති අබේවික්‍රම මැතිතුමා මිය ගිහින්, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා තුවාල වෙලා, තවත් සේවකයෙක් මිය ගියා. ඒ නඩුවට තමයි මා පෙනී සිටියේ. මේ තිබෙන ප්‍රතිපාදනත් එක්ක මෙතෙක් කාලයක් මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චයකාර මණ්ඩලයක් පිහිටුවූයේ ඇයි? ඒකට තිබෙන පරිසරය මොකක්ද? ඒ ප්‍රතිපාදන සලස්වා තිබුණේ මොනවාටද? මම කිව්වා, "කරුණු 7ක් තිබුණා." කියා. ඒවායෙන් 5ක් ගැන මා කිව්වා. ඒ හැම එකක්ම චෝදනා පත්‍රය අනුව- අර කී කාරණය සම්බන්ධයෙන් නම්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතත් එක්ක දණ්ඩ නීති සංග්‍රහය අදාළ වනවා. අනෙක් හැම එකක්ම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහය අදාළ වනවා**.** එතකොට capital punishment. ඒ කියන්නේ, දණ්ඩ නීති සංග්‍රහයේ 293, 294, 295 ආදියයි. එනම්, මිනි මැරුම් -murder-. ඒකට වැරැදිකාරයා වුණොත් දඬුවම, මරණ දඬුවමයි.

ඊට පසුව එන්න පුළුවන්, culpable homicide. ඒ විධියට අඩු වෙලා එන්න පුළුවන්; 20ට එන්න පුළුවන්. එහෙම වෙන්න පුළුවන්. මෙතෙක් අහපු -trial at bar- නඩු අතරින් capital punishment එකක් නැති කිසිම නඩුවක් තිබුණේ නැහැ. හැබැයි මේ සැරේ යෝජනාව මොකක්ද? හිටපු අධිකරණ අමාත්‍යතුමාගෙන් මා මේ ගැන ඇහුවේ ඒකයි. බරපතළ නඩු තිබෙනවා නේ. ගරු අමාත්‍යතුමියනි, මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා, මෙහි Schedule එක. Schedule එකේ කියා තිබෙන වැරැදි ටික මොනවාද කියා බලන්න. Schedule එකේ තිබෙන්නේ 454න් එහාටයි. මොනවාද ඒ? එකක් තමයි, Criminal Misappropriation. එනම්, සාපරාධී භාවදාෘ පරිහරණයයි. අනෙක, -CBT-Criminal Breach of Trust. එනම්, සාපරාධී විශ්වාසය කඩ කිරීමයි. අනෙක් ඒවා ලෙස කූට ලේඛන තැනීම හා ආනුෂංගික යන ඒවායි, රජයේ සේවකයකු හැටියට සොර බඩු ළඟ තබා ගැනීම, සොරකම ආදී ඒවායි දිගටම සඳහන්ව තිබෙන්නේ. ඒ වෙනුවෙන් දෙන්න පුළුවන් උපරිම දඬුවම මොකක්ද? එහි තිබෙනවා නේ Penal Code එකේ Section එක? දඬුවම් කාලය කොච්චරද?

අවුරුදු 3යි; අවුරුදු 6යි; වැඩියෙන්ම දීලා තිබෙනවා, රජයේ සේවකයන් සම්බන්ධයෙන් අවුරුදු 10ක්. දැන් මේ නඩු මහාධිකරණයේ- ඔවා විතරක් නොවෙයි. මිනී මැරුම් නඩු පවා අනියම් යටතේ ගන්න පුළුවන්. එහෙම අරගෙන අපරාධ නඩු විධාන සංග්‍රහය අනුව අත් හිටවූ සිර දඬුවම් ලබා ගත්ත නඩු කීයක් තිබෙනවාද? ඒ ගැන හොයා බැලුවාද? අත් හිටවූ සිර දඬුවම් ලබා ගත්ත නඩු කීයක් තිබෙනවාද? ඒ නිසා මම නම් කියන්නේ, මහා බරපතළයි කියලා රටට පෙන්වන්න ගියාට අපරාධ නීතිය අනුවත්, 1983 වසරේදී හඳුන්වා දීපු දණ්ඩ නීති සංග්‍රහය සහ ඉන් පසුව වුණු සංශෝධන අනුවත් ගත්තොත් එහෙම, මේ කිසි දෙයක් capital punishment එකකට කිට්ටු වෙන්නේවත් නැහැ කියලායි.

මහාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කරන එක හොඳයි. නීතිඥ සංගමය ඒකට විරුද්ධව උසාවි ගියේ, හොරු අල්ලනවාට විරුද්ධව නොවෙයි. එතුමන්ලා උසාවි ගියේ මූලධර්මයක් අනුව. මම දැක්කා, සමහරු කියනවා, -ඔබතුමිය නම් වෙන්න බැහැ. මොකද, ඔබතුමිය නීතිඥවරියක් නිසා.- නීතිඥ සංගමයත් දැන් දේශපාලනීකරණය වෙලාය කියලා. නැහැ, කවදාවත් එහෙම වුණේ නැහැ. ශිරානි බණ්ඩාරනායක මැතිනියට විරුද්ධව මේ පාර්ලිමේන්තුවට Impeachment එකක් ගෙනැල්ලා එතුමියව වැරදිකරු කළාට පසුව, 2015 ජනවාරි 8 වනදායින් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් -එදත් විපක්ෂයේ ඉඳගෙන මා කියපු කරුණු හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා.- නැවත වතාවක් අග්‍රවිනිශ්චයකාරවරයා ලෙස පත් කළා; හිටපු අග්‍රවිනිශ්චයකාරවරයා ගෙදර යැව්වා. ඒ දෙකම කළේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා. එතුමිය නිවැරදිකාරිය නම්, අදටත් එතුමිය අග්‍රවිනිශ්චයකාරවරිය වෙන්න ඕනෑ. ඇයි එතුමියව retire කළේ? තව වනතුරු ඒ සම්බන්ධයෙන් රටට උත්තර දීලා නැහැ. අන්න ඒක තමයි යහපාලන ආණ්ඩුවේ ඉහළම පුටුවේ හිටිය අග්‍රවිනිශ්චයකාරවරු සම්බන්ධයෙන් තිබුණු තත්ත්වය. අපි කියන්නේ, ඒක "හරි" කියන එක නොවෙයි. පාර්ලිමේන්තුවේ ක්‍රමවේදයක් තිබෙනවා. නෙවිල් සමරකෝන් මැතිතුමාට විරුද්ධව ගෙනාපු Impeachment එක අපි දැක්කා. Standing Orders හැදුවේ, ඇතුලත්මුදලි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, Subcommittee එක චෝදනා පත්‍රය දැම්මාට පස්සේ. එතුමා මහදී ඉල්ලා අස් වුණා. අපේ රටේ එහෙම ඉතිහාසයක් තිබෙනවා.

අධිකරණයට ගරු කරන්න ඕනෑ. අධිකරණයේ ගරුත්වය නැති කරන්නේ කවුද? දේශපාලනඥයෝ දැන් කොහේ හෝ ගිහිල්ලා කියනවා, "විනිශ්චයකාරවරුන්ගෙන් අති බහුතරයක් දූෂිතයින්, නීතිඥයන්ගෙන් අති බහුතරයක් දූෂිතයින්" කියලා. එහෙම නම් අද මේ රටේ කිසිම නීතිඥයෙකුට කිසිම නඩුවකට පෙනී ඉන්න බැහැ. නීතිපති දෙපාර්තමේන්තුව කරන්නේත්, private Bar එකේ නීතිඥවරු කරන්නේත්, නීතිඥයන් හැටියට නීති මූලධර්ම සහ නඩු තීන්දු සමඟ තමන්ගේ මතය ප්‍රකාශ කරන එක; කරුණු දක්වන එක. විනිශ්චයකාරතුමන්ලා තමයි තීන්දු කරන්නේ, අධිකරණයේ බිත්ති හතර ඇතුළත ඉදිරිපත් වන ලිඛිත සහ කථික සාක්ෂි අනුව වරද ඔප්පු වෙලා තිබෙනවාද, නැද්ද කියන කාරණය. දැන් මේ මහාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කිරීම තුළින් නඩු ප්‍රමාද වීම වළක්වන්න උත්සාහ දැරීම හොඳයි. මම අහන්නේ, capital punishment දෙන බරපතළ වැරදි තිබෙද්දී අපරාධ නීතිය, දණ්ඩ නීති සංග්‍රහය, මුදල්

විශුද්ධිකරණ පනත අනුව කොච්චරද, දඬුවම? Public Property Act යටතේකොච්චරද දඬුවම? මම කලින් කිව්වා වාගේ 454න් එහාට තිබෙනවා නේ, Sixth Schedule එක. එතකොට දැන් ප්‍රශ්නය තිබෙන්නේ, මෙතැන නීති මූලධර්ම යොදාගෙන තිබෙන්නේ කොහේද කියන එකයි. ගරු ඇමතිතුමියනි, ලෝකයේ කොහේවත් රටක CBT case එකකට ත්‍රිපුද්ගල විනිශ්චයකාර මණ්ඩල පත් කරලා තිබෙනවාය කියලා ඔබතුමිය අහලා තිබෙනවාද? පුළුවන් නම් ගෙනැල්ලා පෙන්වන්න. නැහැ. අපරාධ නඩුවක් ඔප්පු කිරීමේ මූලධර්ම දෙකක් තිබෙනවා. අපේ ජී.එල්. පීරිස් මැතිතුමාගේ -එතුමාගේ ගෝලයෙක් වන, Law Faculty එකේ හිටපු දයාසිරි ජයසේකර මැතිතුමාත් මේ සභාවේ ඉන්නවා- "General Principles of Criminal Liability in Sri Lanka" පොත Library එකේ තිබෙනවා; බලන්න. "*Actus reus*" and "*mens rea*" සලකා බැලුවාද? මෙතැනයි තිබෙන ප්‍රශ්නය. සමහර සිවිල් නඩු අපරාධ නඩු හැටියට ගෙනැල්ලා "බී" වාර්තාව ඉදිරිපත් කරනවා. ඉදිරිපත් කරලා, සැකකරුවන් මාස තුන-හතරක් රිමාන්ඩ් එකේ තියනවා; ඇප නැහැ. මහෙස්ත්‍රාත්ට ඇප දෙන්න බැහැ. මහාධිකරණයට යනවා, ඇප reject කරනවා. Appeal Court එකට යන්න ඕනෑ, ඇප ගන්න. එතකොට දඬුවම විඳලා ඉවරයි. FCID එකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ reserve කරලා තිබෙන judgment එකට දැන් අවුරුදු කීයක්ද? විශ්‍රාම ගිය හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා ඉස්සරහ තමයි නඩුව ඇහුවේ. පැත්තකින් තිබ්බා. Order එක reserve කළා; අද වෙනතුරුත් deliver කළේ නැහැ. ඇයි? මෙන්න මේවාට උත්තර දෙන්න. මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ සද්භාවයෙන් නම්, සියලුම අපරාධ නඩු, බරපතළ ගණයේ නඩු ත්‍රිපුද්ගල විනිශ්චයකාර මණ්ඩලයකට යොමු කිරීමට එකඟයි කියා මම කියනවා. අපි පෙනී සිටි සමහර මිනී මැරුම් නඩු තිබෙනවා, අවුරුදු 10, 12 පැරණි ඒවා. ඒවායේ සාක්ෂිකාරයෝ මැරිලා. නඩු පරදින්නේ නිකම් නොවෙයි. ඒවායේ සමහර සාක්ෂිකාරයෝ මැරිලා; අනෙක් සාක්ෂිකාරයෝ නැහැ. එවැනි කරුණු නිසායි නඩු පරදින්නේ.

පාර්ලිමේන්තු බෝම්බ නඩුවේ විත්තිකාරුවන් නිදහස් වුණේ ඇයි කියලා ගරු ඇමතිතුමිය දන්නවාද? ඒ නඩුවේ සාක්ෂි විභාගය අතරතුර අතුරු සාක්ෂි විභාගයක් - a *voir dire* - පැවැත්වුණා. ඒ මොකටද? ස්වේච්ඡාභාවය - voluntariness - පරීක්ෂණය කරන්න. PTA එක යටතේ, ASP and those above ස්වේච්ඡාවෙන්ද කළේ කියලා බලන්න. කවුද, statement එක record කළේ? ඒ, SSP Bennet Perera. ඒ කාලයේ භීෂණය තිබුණා නේ. නඩු විභාගය අතරතුර කවුරු හෝ එතුමාව මැරුවා. ඒ වෙනුවට සාක්ෂි දෙන්න ආවේ එතුමාගේ assistant, ASP. SSP Bennet Pereraගේ note book එකේ තිබුණා, statements 14ම record කළේ 9mm pistol එක මෙසය උඩ තියලායි කියලා. එතැනින් නඩුව ඉවරයි; voluntariness එක ඉවරයි. ඉතිරි පරිවේෂණීය සාක්ෂිවලින් නඩුව ඔප්පු කරන්න බැරි වුණා. ඒ නිසා විත්තිකාරයෝ නිදහස් වුණා. නිදහස් වෙලාත් අවුරුදු තුනක් detention ගහලා තිබුණා. ආණ්ඩුව පැත්තෙන් අපි මේ පැත්තට ආවා වාගේ ආපු ඇතුලත්මුදලි මැතිතුමා, එතුමාට තුවාල වෙන්න බෝම්බ ගහපු අයගේ FR case එක වෙනුවෙන් පෙනී ඉඳලා ඒ අය නිදහස් වුණා. මෙන්න මේකයි ඉතිහාසය. ඒක නිසා අපි මෙහිදී පැහැදිලිව කියනවා, මේ නීති සද්භාවයෙන් ගෙනෙනවා නම් අපි මේ වෙනුවෙන් සහය ලබා දීමට ලැහැස්තියි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනවධානය, නොසැලකිල්ල නිසා දවසකට මහ මහ ජීවිත කීයක් නැති වෙනවාද බලන්න? පෙරේදා සිදු වුණු සිද්ධිය දැක්කාද? අක්කයි මල්ලියි පාරේ ගියා. CCTV එකේ පෙනෙන විධියට පාර අයිනේ ගිය ළමයින්ගේ ඇහ උඩින් වාහනය ගියා. පොඩි ළමයා මැරුණා, අක්කා බේරුණා. ඒ වාගේ සිද්ධි කීයක් වෙනවාද? මේ විධියටම priority දීලා මේ වාගේම traffic law එක amend කරන්න ඕනෑ. Points ක්‍රමය licence එකට දමන්න ඕනෑ. බීලා රිය පදවන්න බැහැ. නමුත්, කීදෙනෙක් එහෙම රිය පදවනවාද? අධිකරණ ඇමතිතුමිය විධියට ඔබතුමියට මම යෝජනා කරනවා, හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සහ නීතිවේදීන්ගෙන් සමන්විත කොමිසමක් පත් කර, මොන නීතිද සංශෝධනය වෙන්න ඕනෑ කියන කාරණය prioritize කරන්න කියලා. එහෙම නැතිව සමාජයක් නීතිය, සාමය යටතට ගෙනෙන්න බැහැ. නීතිය සාමය "ෆේල්". එහෙම "ෆේල්" වෙන්න හේතුව, ශක්තිමත් නීතියක් අද නොමැතිවීම. Government Analyst's Department එක පසුගිය කාලයේ තිබුණේ කොහොමද? හෙරොයින් ග්‍රෑම් 5ක් අල්ලලා ඇරියාම, කිරලා මැනලා බලන කොට ශුද්ධ හෙරොයින් - diacetylmorphine - ග්‍රෑම් 2ට අඩුවෙන් වාර්තාව එන්නේ. ඇයි ඒ? ග්‍රෑම් 2ට අඩු වුණාම ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලැබෙන්නේ නැහැ නේ. ඉතිරි ටික සීනි කියනවා. හැබැයි, දැන් ඒක වෙන්නේ නැහැ නේ. ඇයි, එතුමා නියමාකාරයෙන් විද්‍යාගාර ටික හැදුවා.

ඊළඟට, ජාන තාක්ෂණය. අද ජාන තාක්ෂණයට නීතිය යොදා ගන්නවා. ඉදිරියට තවත් මේ ක්‍රම වැඩි වෙනවා. වැඩි වෙනවා නොවෙයි, තව අවුරුදු තිහකින් අපේ job එකත් නැති වෙනවා. ලෝකයේ තාක්ෂණ දියුණුවත් එක්ක නීතීඥයන්ට උසාවියේ නඩු කථා කරන්න යන්න ඕනෑ වෙන්නේ නැහැ. ඒ ගැන මම පසුව වෙලාවක කියන්නම්. මේ විධියට දියුණු වෙන සමාජය තාක්ෂණයත් සමඟ ගළපාගෙන යන්න නීති සංශෝධනය වෙන්න ඕනෑ.

මොකක්ද, මේ ආණ්ඩුව කළේ? අවුරුදු තුනක් තිස්සේ හොරු ඇල්ලුවා. දැන් කෝ, අල්ලපු හොරු? හොරු අල්ලන්න උසාවියට භාර දෙන්න යනවා. උසාවියේ වැඩේ හොරු අල්ලන එක නොවෙයි. හොරු අල්ලන්න ඕනෑ පොලීසිය. අදාළ reports ටික ඉදිරිපත් කළාම, අදාළ නීති ක්ෂේත්‍රවල අය උපදෙස් දීලා, අඩු පාඩු හදලා ඒවා ටික නිසි විධියට record කරලා ගන්න වෙනවා. පොලීසියේ ඉඳලා කී වතාවක් file එකක් නීතිපති දෙපාර්තමේන්තුවට යනවාද, ආපසු එනවාද? කියන්න බලන්න. ඒ තැන්වලට ගිය නිසා අපි දන්නවා නේ. Investigations කරලා එකවරම යවන්න බැරි ඇයි? කවුද supervise කරන්නේ? මම ඔබතුමියට යෝජනා කරනවා, සියලු මහාධිකරණ jurisdictionsවලට State Attorney කෙනෙක් පත් කරන්න කියලා. සියලු බරපතළ අපරාධ නඩු පළමුවෙනි පැමිණිල්ලේ ඉඳලා - day one ඉඳලා - monitor කරලා උපදෙස් දෙන්න. අන්න එතකොටයි නඩුවල හොරු වුණත්, මිනී මරුවෝ වුණත්, අපරාධකරුවෝ වුණත් නීතියේ රැහැනට හසු කර ගන්න පුළුවන් වෙන්නේ. එවිට technical pointsවලින් නඩුව crash වෙන්නේ නැහැ. ඒක නිසා හොරු අල්ලන වැඩේ උසාවියට භාර දෙන්න යන්න එපා. ඒ වෙනුවෙන් නීතිය හා සාමය අංශයේ තිබෙන පොලීසිය ශක්තිමත් කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙපමණයි. අපි මේ පනත් කෙටුම්පතට විරුද්ධ නැහැ. හැබැයි, නීතියේ මූලධර්ම, අපරාධ නීතියේ මූලධර්ම අනුගමනය කරන්න. අපි ස්තුතිවන්ත වෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ නියම මහ පෙන්වීමට. අපි ස්තුතිවන්ත වෙනවා, නීතීඥ සංගමයේ නියම මැදිහත්වීමට. ඇමතිතුමියගේ

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

උත්සාහය හොඳයි. මමත් දායක වුණා, නීතිපති දෙපාර්තමේන්තුවේ වැටුප් වැඩි කරන්න. එහෙම නැත්නම් නීතිපති දෙපාර්තමේන්තුවට බැඳෙන්නේ නැහැ. තවත් බඳවා ගන්න. මහාධිකරණ විනිසුරුවරු සංඛ්‍යාව වැඩි කරන්න. ඔබතුමිය ඊයේ press briefing එකේදී කිව්වා, මේකේ ඉස්සෙල්ලාම නඩු අහන්න "බැදුම්කරය ගෙනෙනවා" කියලා. කෝ චිත්තිකාරයා?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගෙනෙනවා කිව්වේ නැහැ. බැදුම්කරයත් ගෙනෙන්න පුළුවන් කියලා කිව්වේ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හරි. හරි. බැදුම්කරයත් ගෙනෙන්න පුළුවන්. There is a possibility. නමුත් පළමුවෙනි චිත්තිකාරයා කෝ? එහෙම නම් නඩු අහන්න වෙන්නේ *in absentia*. පළමුවෙනි චිත්තිකාරයාව අල්ලා දීමේ වගකීම තිබෙන්නෙත් ඔය පැත්තටයි. ඕක කියන්න ගිහිල්ලා තමයි ඔය පැත්තෙන් මේ පැත්තට අපට එන්න සිද්ධ වුණේ. ඔහොම ගියොත් තවත් අය එන්න පුළුවන්. ඒ නිසා මේ ටික හදා ගන්න. මම මීට වඩා කථා කරන්න යන්නේ නැහැ. මම ඔබතුමියට සුබ ප්‍රාර්ථනා කරනවා. තවත් නීති සංශෝධන ගෙනෙන්න, අපිත් සහයෝගය දෙන්නම්. මොකද, අපිත් උසාවි යනවා නේ. අපටත් හොඳයි. නඩුත් වැඩි වෙනවා. නඩු අහන එක ඉක්මන් වෙනකොට නඩු ගොඩයි. එතකොට අපේ කණිෂ්ඨයි නීතිඥයන්ටත් නඩු ලැබෙනවා. ඒක වෘත්තියට හොඳයි. හැබැයි, වෘත්තියට අපහාස කරන අය ගැනත් ඔබතුමිය තව සංශෝධනයක් ගෙනෙන්නයි කියා යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Douglas Devananda. You have 10 minutes.

[பி.ப. 3.58]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நீதித்துறை சார்ந்த திருத்தச் சட்டமூலங்கள் இரண்டாம் மதிப்பீட்டுக்காக இந்தச் சபையில் முன்வைக்கப்பட்டுள்ள நிலையில், அவை சார்ந்து எமது நாட்டின் சில நடைமுறைப் பிரச்சினைகள் தொடர்பில் எனது கருத்துக்களைத் தெரிவிக்க விரும்புகின்றேன். அதற்கான வாய்ப்பினை வழங்கியமையையிட்டு எனது நன்றியினையும் தெரிவித்துக்கொள்கின்றேன்.

பாரிய ஊழல், மோசடிகளைத் துரித கதியில் விசாரணை செய்யும் முகமாக சிறப்பு மேல் நீதிமன்றம் அமைப்பது தொடர்பிலான சட்டமூலத்திற்கு எதிராக ஏற்கெனவே உயர் நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ள அதேவேளை, அதனது சில சரத்துகள் அரசியல் யாப்புக்கு முரணான வகையில் அமையப்பெற்றிருப்பதால், இதனை நிறைவேற்றுவதற்கு நாடாளுமன்றத்தின் மூன்றில் இரண்டு பெரும்பான்மை அவசியமென உயர் நீதிமன்றம் கௌரவ சபாநாயகர் அவர்களுக்கு அறிவித்திருந்ததையும் நாம் அறிவோம்.

பொருளாதார ரீதியில் மட்டுமன்றி சமூக, கலாசார ரீதியிலும் பாரிய பின்னடைவினை நோக்கிச் செல்கின்ற இந்த நாட்டில், இத்தகைய வீழ்ச்சிக்கு முக்கிய காரணிகளில் ஒன்றாக விளங்குகின்ற ஊழல், மோசடிகள் தொடர்பில் உடனடியாக விசாரணைகள் மேற்கொள்ளப்பட்டு, குற்றவாளிகள் இனங்காணப்பட்டு, உரிய சட்ட நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டியதும் ஊழல், மோசடிகளால் பெறப்பட்டுள்ள இந்த நாட்டு மக்களது நிதியை, சொத்துக்களை, உடைமைகளை மீள அரசு கைப்பற்ற வேண்டியதும் அவசியமாகும் என்பதையே நாம் தொடர்ந்து வலியுறுத்தி வருகின்றோம். அந்த வகையில் மேற்படி சிறப்பு மேல் நீதிமன்றம் அமைக்கப்பட வேண்டியது அவசியம் என்கின்றபோதிலும், அது எமது அரசியல் யாப்புக்கு முரணாகாத வகையிலும் வெறுமனே அரசியல் பழிவாங்கல்களை நோக்கமாகக் கொள்ளாத வகையிலும் அமைய வேண்டுமென்பதை நான் வலியுறுத்திக் கூற விரும்புகின்றேன். 1971ஆம் ஆண்டில் எமது நாட்டில் ஏற்பட்ட கலவரத்தில் ஈடுபட்டவர்களுக்குத் தண்டனை பெற்றுக்கொடுக்கும் வகையில், அக்காலகட்டத்தில் விசேட சட்டமூலம் ஒன்று அங்கீகரிக்கப்பட்டு, வழக்கு விசாரணைகள் தொடர்ந்து நடைபெற்றதன் மூலம், சம்பந்தப்பட்டவர்களுக்கு தண்டனை வழங்கப்பட்டிருந்ததையும் இங்கு நான் மீள நினைவுபடுத்த விரும்புகின்றேன்.

Transparency International அமைப்பு வருடாந்தம் வெளியிடுகின்ற ஊழல் தொடர்பான புள்ளிவிபர அறிக்கையின்படி, ஊழல்கள் இடம்பெறுகின்ற 183 நாடுகளில் எமது நாடு கடந்த ஆண்டில் 38 புள்ளிகளைப் பெற்று 91 ஆவது இடத்தில் இருப்பதாக அறிய முடிகின்றது. இதில் ஆச்சரியமான, அதிசயமான விடயமொன்று தொடர்பில் அண்மையில் ஊடகங்களின் மூலமாக அறியக் கிடைத்தது. அதாவது, கடந்த 24 வருடங்களில் எமது நாட்டில் இலஞ்சம், ஊழல் தொடர்பில் ஏராளமான குற்றச்சாட்டுகள் பற்றிய முறைப்பாடுகள், இலஞ்சம் மற்றும் ஊழல் தொடர்பான குற்ற விசாரணை ஆணைக்குழுவுக்குக் கிடைத்திருந்தபோதிலும், அவற்றில் 75 வழக்குகள் மட்டுமே தொடுக்கப்பட்டன என்றும் இந்த 75 வழக்குகளிலும் நான்கு பேர் மாத்திரமே நீதிமன்றத் தீர்ப்பின்படி குற்றவாளிகளாகக் காணப்பட்டுள்ளனரெனவும் மேற்படி ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகம் தெரிவித்துள்ளதாக அச்செய்தி குறிப்பிடுகின்றது. இத்தகையதொரு நிலை எமது நாட்டில் நிலவுகின்ற சூழ்நிலையில், இந்த நாட்டில் இலஞ்சம், ஊழல், மோசடிகள் தொடர்பில் வெளிப்படுத்தப்பட்டு வருகின்ற கருத்துகள் யாவும் வெறும் அரசியல் பேசு பொருளாகவே பார்க்கப்பட வேண்டியுள்ளது.

வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், கடந்த காலங்களில் ஊழல், மோசடிகளில் ஈடுபட்டார்களென வடக்கு மாகாண முதலமைச்சரால் கூறப்பட்டு, நான்கு அமைச்சர்களுக்கு எதிராக முதலமைச்சரினால் நியமிக்கப்பட்ட விசாரணைக் குழுவின் மூலமாக விசாரணைகள் மேற்கொள்ளப்பட்டு, அந்த நான்கு அமைச்சர்களும் பதவி நீக்கம் செய்யப்பட்டார்கள். ஆனால், அவர்கள் மேற்கொண்டிருந்த ஊழல், மோசடிகள் எவை என்பது பற்றிய போதிய விபரங்கள் அவர்களைத் தெரிவு செய்துள்ள எமது மக்களுக்குத் தெளிவாக அறிவிக்கப்படவில்லை. அத்துடன், அவர்களுக்கு எதிராக எவ்விதமான சட்ட நடவடிக்கைகளும் எடுக்கப்படவில்லை. இத்தகையதொரு நிலையில், தற்போது புதிதாக நியமிக்கப்பட்டுள்ள வடக்கு மாகாண சபையின் அமைச்சர்களும் ஊழல், மோசடிகளில் ஈடுபட்டுள்ளனரென அண்மையில் தகவல்கள் வெளிவந்து கொண்டிருக்கின்றன.

ஊழல், மோசடிகளில் ஈடுபடுகின்றவர்களைச் சிலர் காப்பாற்ற முனைவதால், அதனூடாக இழக்கப்படுகின்ற எமது மக்களுக்குரிய நிதியானது, மீளப் பெற வழியற்ற நிலைமையை ஏற்படுத்திவிடுவதுடன், அத்தகைய ஊழல், மோசடிகளில் ஈடுபடுகின்றவர்கள் சட்டத்தின் பிடியிலிருந்து தப்பித்துக் கொள்வதற்கும் மீண்டும் மீண்டும் அப்பேர்வழிகள் அதே குற்றங்களைப் புரிவதற்கும் இதனை ஒரு வழிகாட்டலாகக் கொண்டு மேலும் பலரும் அதே குற்றச் செயல்களைப் புரிவதற்கும் வழியேற்படுத்திக் கொடுக்கிறது என்பதை மறந்துவிடக்கூடாது.

அண்மையில், பாரிய இலஞ்சக் குற்றச்சாட்டின் பேரில் இரு அதிகாரிகள் கைது செய்யப்பட்டனர். இந்த இருவரையும் பதவியிலிருந்து நீக்குமாறும் இவர்கள் தொடர்பிலான விசாரணைகளில் எவ்விதமான அழுத்தங்களும் எவராலும் கொடுக்கப்படக்கூடாது எனவும் மேதகு ஜனாதிபதி அவர்கள் பணிப்புரை வழங்கியிருந்தார். இது வரவேற்கத்தக்கதொரு விடயமாகும். இந்த இருவரில் ஒருவர் அரச மரக் கூட்டுத்தாபனத்தின் தலைவராகப் பதவி வகித்தவர். இவர் கைது செய்யப்பட்டதன் பின்னர் புதிதாக நியமிக்கப்பட்டுள்ள தலைவரும் ஏற்கெனவே நிதி மோசடியில் ஈடுபட்டவர் என்றொரு விடயம் ஊடகங்களில் வெளிவந்திருப்பதை அறிய முடிந்தது. எனவே, இது குறித்தும் உரிய கவனம் செலுத்தப்பட வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

தமிழ் அரசியல் கைதிகள் விடுதலை தொடர்பிலான சில விடயங்களையும் இங்கு மீண்டும் முன்வைக்கலாம் என நினைக்கின்றேன். "அரசியல் கைதிகள் என இந்த நாட்டில் எவருமே இல்லை" என ஏற்கெனவே நீதி அமைச்சரும் நாட்டின் தலைவரும் கூறியிருக்கின்றார்கள் என்பதை நான் நன்கு அறிவேன். எனவே, அவர்கள் அரசியல் கைதிகளா? அரசியல் அற்ற கைதிகளா? என்ற தலைப்பு அவசியமில்லை என்றே கருதுகின்றேன். அரசியல் கைதிகள் எனக் குறிப்பிடப் படுவதால்தான் அவர்களது விடுதலை தாமதமாகின்றது எனில், அந்தத் தலைப்புத் தேவையற்றது. இங்கு தலைப்பு முக்கியமல்ல. அவர்கள் தொடர்பில் நியாயமான ஏற்பாடுகள் அவசியமாகும் என்பதையே நான் வலியுறுத்த விரும்புகின்றேன். அந்தவகையில் இன்னும் 110 பேர் இதுவரையில் விடுவிக்கப்படாது பல்வேறு சிறைச்சாலைகளில் தடுத்துவைக்கப்பட்டுள்ளனர் என்றும் இவர்களில் 14 பேர்மீது இதுவரையில் குற்றப்பத்திரங்கள் தாக்கல் செயப்படவில்லை என்றும் 44 பேர்மீது குற்றப்பத்திரங்கள் தாக்கல் செய்யப்பட்டு வழக்குகள் தொடரப்பட்டிருப்பினும் அவ்வழக்குகள் இழுத் தடிப்புகளுக்கு உட்படுத்தப்பட்டு வருவதாகவும் 35 பேர் குற்றவாளிகளாக ஆக்கப்பட்டுள்ளதாகவும் தெரியவருகின்றது. இந்தக் கைதிகளின் நிலைமையானது, "எய்தவன் இருக்க, அம்பை நோக வைப்பது" போன்ற கதையாகவே இருக்கின்றது.

இந்த நிலையில், இறுதிக்கட்ட யுத்தத்தின்போதும் அதன் பின்னரும் காணாமல் போயுள்ளதாகக் கூறப்படுகின்ற பலர் தடுப்பு முகாம்களில் சுய நினைவின்றிக் காணப்படுவதாக அண்மையில் 'பூசா' தடுப்பு முகாமிலிருந்து விடுதலையாகி யுள்ள முன்னாள் இயக்க உறுப்பினரான நவரத்தினம் நிசாந்தன் என்பவர் கூறியதாகத் தமிழ் ஊடகங்களில் வெளிவந்த முன்பக்கச் செய்தி எமது மக்களிடையே பெரும் பரபரப்பை ஏற்படுத்தியிருந்தது. இதன் உண்மை நிலைமை என்ன? என்பதை அறிய விரும்புகின்றேன். அதேநேரம், நான் இங்கே குறிப்பிட்டுள்ள 14 கைதிகளுக்கு எதிராக, பல வருடங்கள் கழிந்துள்ள நிலையிலும் இதுவரையில் குற்றப் பத்திரங்கள் தாக்கல் செய்யப்படாதது ஏன்? என்பதை அறிவிக்க வேண்டும். மேலும், வழக்குகள் தாக்கல் செய்யப்பட்டுள்ள கைதிகளுக்கு ஏற்கெனவே உறுதியளித் திருந்தமைக்கு இணங்க அவ்வழக்குகள் விரைவாக விசாரிக்கப்படாமல், தொடர்ந்தும் அது பிற்போடப்பட்டு வருவதாகவும் கூறப்படுகின்றது. இந்த வழக்குகள் இவ்வாறு இழுத்தடிப்புகளுக்கு உட்படுத்தப்பட்டு வருவது ஏன்? என்பதையும் அறிய விரும்புகின்றேன்.

பல்வேறு பிரச்சினைகளைத் தொடர்ந்து சுமந்து கொண்ருக்கும் எமது மக்களின் மத்தியில், இவ்வாறான உணர்வுபூர்வமான பிரச்சினைகளைத் தீர்க்காமல், நீங்கள் கூறிக்கொண்டிருக்கின்ற இனங்களுக்கிடையே ஐக்கியம், தேசிய நல்லிணக்கம், ஒருமைப்பாடு என்பவையெல்லாம் ஒருபோதும் சாத்தியமாகாது என்பதையே நான் தொடர்ந்தும் வலியுறுத்தி வருகின்றேன். இந்த நாட்டில் நீங்கள் கூறுவதைப் போன்று இனங்களுக்கிடையே ஒற்றுமையோ, ஒருமைப்பாடோ, தேசிய நல்லிணக்கமோ ஏற்படவேண்டு மாயின், முதலில் புரையோடிப்போயிருக்கின்ற சில பழக்க வழக்கங்களை மாற்றுங்கள்! பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குங்கள்! மனிதாபிமான முறையில் ஓர் அரசியல் தீர்மானத்தை எடுத்து, தடுத்து வைத்திருக்கின்ற மேற்படி கைதிகளை, நிபந்தனையின்றி விடுதலை செய்வதற்கு முன்வாருங்கள்! இதற்குத் தயாராக இல்லையேல், விசேட நீதிமன்ற ஏற்பாடுகளை மேற்கொண்டு இந்த வழக்குகளை விசாரித்து அவற்றை ஒரு முடிவுக்குக் கொண்டுவாருங்கள்! இதனை ஓர் அரசியல் முதலீடாகத் தொடர்ந்து வைத்துக் கொண்டிருக்காதீர்கள்! எனக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், வவுனியா சிறைச்சாலையில் கைதிகளுக்குத் தொடர்ந்து பல்வேறு அநீதிகள், முறைகேடுகள் இழைக்கப் படுவதாகவும் அங்கு சட்டவிரோத செயற்பாடுகள் இடம்பெற்று வருவதாகவும் அண்மையில் வவுனியா நீதிமன்றத்தில் கைதியொருவர் பதில் நீதவான் அவர்கள் முன்னிலையில் தெரிவித்திருப்பதாகத் தமிழ் ஊடகங்கள் செய்திகளை வெளியிட்டிருந்தன. இவ்விடயம் தொடர்பிலும் ஆராய்ந்து பார்த்து, உரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும் எனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.4.08]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධිකීෂණ කාරක සභාවේ සභාපති අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාට වාගේම අනිකුත් සාමාජිකයන්ට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා, ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කරලා, මේ කාර්යය කඩිනම් කිරීම පිළිබඳව. ඒ වාගේම අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමති තලතා අතුකෝරල මැතිනිය මේ පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවට ඉක්මනින් ඉදිරිපත් කරන්නට ගත් වැයම සම්බන්ධයෙන් එතුමියටත් ස්තුතිවන්ත වනවා.

2017 නොවැම්බර් මාසයේ 05 වැනි දින අමාත්‍ය මණ්ඩල සන්දේශයට අනුමැතිය ලබාගෙන, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කරලා, එකවර විනිශ්චයාසනාරූඪ වන විනිශ්චයකාරවරයන් තිදෙනෙකුගෙන් සමන්විත

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මහාධිකරණයක් පිහිටුවා නඩු ඇසීම සඳහා තමයි මේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ. හොරකම් කරන, අල්ලස් සහ දූෂණ කටයුතුවල යෙදෙන පුද්ගලයන්ට -දේශපාලනඥයන් වෙන්න පුළුවන්, නිලධාරීන් වෙන්න පුළුවන්- අධිකරණ ක්‍රියා මාර්ගවලින් දඬුවම් ලබා දෙන්න ඕනෑය කියන අදහසක් මේ රටේ ඇතිවෙලා තිබෙනවා. ඒ අදහසට මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපි හැමෝම එකඟයි. ඒ නිසා මේ කාරණය බොහොම බරපතළ දෙයක් බව කියන්න අවශ්‍යයි.

මට ප්‍රථමයෙන් කථා කරපු සුසිල් ප්‍රේමජයන්ත හිටපු ඇමතිතුමා සඳහන් කළා, "මේකද බරපතළම දේ" කියලා. මිනී මැරීම් කරපු අය ඉන්නවා, ඒ අයගේ නඩු අහන්න හුහක් කල් යනවා. ඒ නිසා "මේ වාගේ දේවල්ද බරපතළ නැත්නම් ඒවාද බරපතළ" කියන කාරණය එතුමා මතු කළා. මනුෂ්‍යයෙකුගේ ජීවිතය නැති කරන එක මුදලකට සමාන කරන්න බැහැ කියලා මම පිළිගන්නවා. ඒ නඩුත් ප්‍රමාද වෙනවා නම් ඒවා කඩිනම් කරන්නත් අපි ක්‍රම සහ විධි හොයා ගන්න ඕනෑය කියා මම හිතනවා. ඒකට ක්‍රම සහ විධි හොයන අතරේදී, මේ කටයුත්තටත් අකුල් හෙළන්නේ නැතිව අපි සියලුදෙනාම සහයෝගය ලබා දීලා, අද අපි මේ නීතිය සම්මත කර ගන්නට ඕනෑ.

වැරැදි කළ දිනයේ සිට අධිචෝදනාව මහාධිකරණයට යොමු කිරීමට කාලයක් ගත වන බව අපි දන්නවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ බී. අලුවිහාරේ විනිසුරුතුමාගේ සභාපතිත්වයෙන් කරපු research එකක් අනුව කියනවා, ඒ කටයුත්ත සඳහා සාමාන්‍යයෙන් අවුරුදු හතරයි මාස හතක් විතර ගත වනවා කියලා. නඩුව ගොනු කළ දිනයේ සිට නඩුව ආරම්භ කිරීමට තව වසර තුනයි මාස හතක් යනවා ලු. නඩුවේ සාක්ෂි විභාග කිරීම ආරම්භ කර නිමකිරීමට තවත් වසරකුත් මාස අටක් ගත වනවා ලු. සාමාන්‍යයෙන් කිව්වොත් එවැනි නඩුවක් විභාග කර අවසන් කරන්න අවුරුදු 10කට වැඩි කාලයක් ගත වනවා. ඒ නඩුවේ නිමකිරීමට දුන්නාට පස්සේ අභියාචනාධිකරණයට යනවා නම් තව වසර 7ක් ගත වනවා. ඒක Appeal Court එක හරහා යන්නත් පුළුවන්. නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයටත් යන්න පුළුවන්. කොහොමටත් ඒ සඳහා අවුරුදු 7ක කාලයක් ගත වනවා. අවුරුදු 17ක්! මේ තමයි නඩුවක් සඳහා ගතවන සාමාන්‍ය කාලය. ඒ ගණන අවුරුදු 17ක් නම්, සාමාන්‍ය නඩුවක් සඳහා ගත වන්නේ එක්කෝ අවුරුදු 10යි නැත්නම් අවුරුදු 25යි. ඒ නිසා තමයි මේ අධිකරණ කටයුතු ශීඝ්‍රයෙන් කරන්න අදහස් කරන්නේ. අධිකරණ කටයුතු ශීඝ්‍ර කරන්න කියලා රට තුළ මතයක් ගොඩ නැඟිලා තිබෙන්නේ ඒ නිසායි. විශේෂයෙන්ම අල්ලස සහ දූෂණයට එරෙහිව ක්‍රියා කළ යුතුයි කියන මතය දිගින් දිගටම තිබෙනවා. එතුමා කථා කරනකොට කිව්වා, "මුදල් සම්බන්ධ කටයුතු දෙවැනි තැන ගන්න ඕනෑ" කියලා. ඒක මූලධර්මයක් හැටියට පිළිගන්න පුළුවන්.

ශ්‍රී ලන්කන් ගුවන් සේවාවට අයත් ගුවන් යානයකට lease එකක් කරනකොට, වෙළෙඳ පොළ අගය මාසයකට ඩොලර් ලක්ෂ දෙක හමාර නම්, අපි අන්තිමට ඒක ගන්නේ ඩොලර් ලක්ෂ හතරහමාරකට නම්, ඒ විධියට ගුවන් යානා අටක් ගන්නවා නම්, එහිදී ඩොලර් කෝටි දෙකක් රටට අහිමි වනවාය කියලා අදහසක් තිබෙනවා නම් එම අදහස ඔප්පු කරන්න ඕනෑ අධිකරණය හරහායි. එහෙම අදහසක් තිබෙනවා නම් අපි ඒ ගැන ශීඝ්‍රයෙන් හොයා බලන එක සුදුසු නැද්ද? මේ සමහර ගනුදෙනුවලට දැනටම අවුරුදු දහයක් විතර ගතවෙලා. මිග් ගුවන් යානා මිලදී ගැනීමේදී ඩොලර් මිලියන හයක් පෞද්ගලික සමාගමකට යවා තිබෙනවා. මේවා ගැන ශීඝ්‍රයෙන් හොයා බැලිය යුතු නැද්ද?

නිවාස හදනවාය කියලා RADA එක හරහා කොටි ත්‍රස්තවාදීන්ට මුදල් යැව්වා. කොටි ත්‍රස්තවාදීන්ට මුදල් යැව්වා. ඒවා ගැන ඉක්මනින් සොයා බැලීම් කරලා ඒ නඩු අවසන් කරන එක සාධාරණ නැද්ද කියලා මම අහනවා. සාමාන්‍යයෙන් අම්මා කෙනෙකුට, තාත්තා කෙනෙකුට තිබෙන බලාපොරොත්තුවක් තමයි තම දරුවා ආනන්දයට, නාලන්දයට, විශාඛාවට, දේවි බාලිකාවට හෝ වෙන හොඳ පාසලකට යවන එක. ඉතින් ඒ අයට ඒ අවස්ථාව අහිමි වෙන්නේ හොරකම නිසායි. ඒ අවස්ථාව අහිමි වෙන්නේ මේ විධියට මුදල් හොරා කෑම නිසායි. අපි මේ ගැන හිතන්න ඕනෑ. විශ්වවිද්‍යාලයට යන්න දරුවන් බලාගෙන ඉන්නවා. අවුරුද්දකට එක්ලක්ෂ තිස්දාහක් විතර විශ්වවිද්‍යාලයට යන්න විභාගය ගන්නවා. එයින් විසිපන්දාහක් පමණ විශ්වවිද්‍යාලයට බඳවා ගන්නවා. නමුත් ඒ වාගේ දෙගුණයක් පමණ විශ්වවිද්‍යාලයට යන්න බලාගෙන ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුප්පත් දරුවෙක් වෛද්‍ය පීඨයකට ඇතුළත් වෙන්න සමහර විට අවුරුදු 10ක සිහිනයක් තියාගෙන ඉන්නවා. ඒ දරුවාට පිටරටක පෞද්ගලික වෛද්‍ය පීඨයකට යන්නත් බැහැ. ඒ දරුවාට අපේ රටේ අවස්ථාවත් අහිමි වෙනවා. හුහක් වෙලාවට ඒ අවුරුදු 10ක සිහිනය එක ලකුණකින් ඒ දරුවාට අහිමි වෙනවා. ඒ නිසා තමයි අල්ලස, දූෂණය සම්බන්ධයෙන් අපි බොහොම තදින් ක්‍රියා කරන්න ඕනෑ වන්නේ.

විජිත හේරත් මන්ත්‍රීතුමා කථා කරන කොට කිව්වා, "ආණ්ඩුවක් ආවා, යහපාලනය කිව්වා, හොරු අල්ලනවා කිව්වා, හොරකම නතර කරනවා කිව්වා, නමුත් ඒ කිසිවක් සිද්ධ වුණේ නැහැ" කියලා. ඔව්, ප්‍රමාදයක් වෙලා තිබෙනවා. ඒක අපි ඔක්කෝම පිළිගන්න ඕනෑ. අපි අද මේ නීතිය ගෙනාවා වුණත් හොරකම නතර කරන්න බැහැ. මාත් ඒක පිළිගන්නවා. හොරා හොරාමයි. නමුත් හොරු අල්ලන එක අපට ඉක්මන් කරන්න පුළුවන්. අපි ඉන්නේ ඒක ඉක්මන් කළ යුතුමයි කියන මතයේ. ඒ නිසා තමයි අපි මේ පනත් කෙටුම්පත අද ඉදිරිපත් කරන්නේ.

මේ පනතින් සාධාරණයක් වෙයිද නැද්ද කියන එක ගැනත් අද කථා කළා. ඔව්, ඒක හරි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට ඒ පැත්තේ හිටියත් මේ පැත්තේ හිටියත් අපට ඒ ගැන සාධාරණ බියක් තිබෙනවා. මේ නීති පද්ධති උඩ, මේ උසාවි උඩ අන්තිමට බෙල්ල දෙන්න වෙන්නේ අපටයි. ඉතින් මන්ත්‍රීවරු අතර සාධාරණ බියක් තිබෙනවා; ඇමතිවරු අතර සාධාරණ බියක් තිබෙනවා. අද ඉන්න අයයි එදා හිටපු අයයි අතරේ සාධාරණ බියක් තිබෙනවා. නමුත්, ඇත්තටම මේ සාධාරණත්වය ගැන කථා කරන කොට අපි කථා කරන්නේ මන්ත්‍රීවරුන්ට වන සාධාරණය ගැනද, ඇමතිවරුන්ට වන සාධාරණයද? මේ රටේ පුරවැසියාට වන සාධාරණය ගැන අපි කථා කරන්නේ නැද්ද? අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරන්නේ පුරවැසියාට තිබෙන සාධාරණය ගැනයි. මේ නීති කටයුතුවල ප්‍රමාදයක් තිබෙන කොට පුරවැසියාට තමයි ඒකෙන් අසාධාරණයක් වෙන්නේ. ඒ නිසා ඒ ගැන අපි අනිවාර්යෙන්ම කථා කළ යුතුයි. මේ අධිකරණ ගැන තව දෙයක් කිව්වා. මේ ගැන තීරණය කරන්නේ නීතිපති ද, අග්‍රවිනිශ්චයකරුද?

නීතිපති තීරණය කරන්නේ ඒ නඩුව ඉල්ලීම පමණයි. නමුත් අග්‍ර විනිශ්චයකාරතුමා තමයි කොයි නඩුවද ගන්නේ කියන එක තීරණය කරන්නේ. Permanent High Court at Bar එකේදී බරපතළ දූෂණ සම්බන්ධව ප්‍රමුඛත්වය දෙන එක ගැන ඇහුවා. ඔව්, තාජුඩීන්ගේ නඩුව ඉක්මනට අහන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ලසන්ත වික්‍රමතුංගගේ නඩුව ඉක්මනට අහන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. [බාධා කිරීම්] ඒ නඩු අහන්න ඕනෑ වුණත්, අපි මේවා පස්සට දමන්න ඕනෑ නැහැ. අග්‍ර විනිශ්චයකාරතුමා තීරණය කළොත් මහ බැංකු බැඳුම්කර නඩුව අහන්න පුළුවන්. හෙට ඇහුවත් කමක් නැහැ. හෙට ඉඳලා මේ නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. අපි ඉන්නේ එතැනයි. හෙට ඉඳලාම මෙම නීතිය ක්‍රියාත්මක කරන්නට පුළුවන්. අග්‍ර විනිශ්චයකාරතුමාට තමයි එම අභිමතය පිළිබඳ බලය තිබෙන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාන්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුරයේ දුටුගැමුණු මහ රජ්ජුරුවන් සහ එළාර අතර අන්තිම සටන පැවැති විජිතපුරයේ තිබුණු නිධන් ටික හොරා කාලා තිබෙනවා. මෙම පනතින් මේ කියන විශේෂ අධිකරණය පිහිටෙව්වාට පසුව, ඒ නිධන් හොරු ටිකත් මේ උසාවියට ගෙනෙන්න පුළුවන්ද? මම ඒ ගැන දැන ගන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාන්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
ඒ විතරක් නොවෙයි. හිටපු ඇමතිවරුන්ට යම් බියක් තිබෙනවා නම්, අද ඉන්නා ඇමතිවරුන්ට යම් බියක් තිබෙනවා නම්, ඒ ගැන කලබල වෙන්න ඕනෑ නැහැ. මොකද, මේකේ අභියාචනයටත් අවස්ථාවක් තිබෙනවා. ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට විතරක් නොවෙයි, ඊට පසුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවට යන්නත් පුළුවන්. නඩු තීන්දුවට පසුව ඒ සඳහා කාලයක් දීලා තිබෙනවා. ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයෙහි පවත්වන ලද නඩු විභාගයකදී ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුවක් සම්බන්ධයෙන් එය ප්‍රකාශයට පත් කරන ලද දිනයේ සිට දින 28ක් ඇතුළත appeal කරන්න පුළුවන්. ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවත්වන ලද නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුවක්, දණ්ඩන නියමයක් හෝ ආඥාවක් සම්බන්ධයෙන් වන අභියාචනයක්, එකී නඩු තීන්දුව, දණ්ඩන නියමය හෝ ආඥාව ප්‍රකාශයට පත් කරන ලද දිනයේ සිට දින විසි අටක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ යුතු අතර අග්‍ර විනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන එකී අධිකරණයේ විනිශ්චයකාරවරයන් පස්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් යුත් විනිශ්චය පීඨයක් මඟින් විභාග කළ යුතුයි. විනිසුරුවරුන් පස් දෙනෙකුට නොඅඩු මඩුල්ලකට එය යොමු කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාන්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
මා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවසාන වශයෙන් මම කියන්නේ, නීතියෙන් විතරක් රට හදන්නට බැහැ. මට ප්‍රථමයෙන් කථා කළ මන්ත්‍රීවරුන් කිව්වා වාගේ, මෙහි කළමනාකරණයේත් ප්‍රශ්න තිබෙනවා. අපේ ගරු ඇමතිතුමිය මෙතැන සිටිනවා. කළමනාකරණය දියුණු කිරීම පිළිබඳව අද හුහාක් යෝජනා ඉදිරිපත් වුණා. ඒ නිසා එම කළමනාකරණයේ ප්‍රශ්නවලටත් අප යොමු විය යුතු බව සඳහන් කරමින් මා නිහඬ වෙනවා, ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාන්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා.4.19]

ගරු සිසිර ජයකොඩි මහතා
(මාණ්පුමිකු චිරිර ජයකොඩි)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් රාශියක් ඉදිරිපත් වුණු බව අප දන්නවා. විශේෂයෙන්ම නීති ක්ෂේත්‍රයේ නීතිඥ සංගමය ඇතුළු අපේ රටේ විවිධ පාර්ශ්වයන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉස්සරහා කරුණු දැක්වූවා. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් ලබා දීලා තිබෙනවා. විශේෂ බහුතර ඡන්දයකින් සම්මත විය යුතුයි කියන වගන්ති නියම කරලා තිබෙනවා.

අද සංශෝධන කිහිපයක් සභාගත වෙලා තිබෙනවා. නමුත් මේ පාර්ලිමේන්තුව පිළිබඳවත්, මේ සභාව පිළිබඳවත් අපට තිබෙන විශ්වාසය පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ තමයි ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපත් කරපු නියමයන්ට අනුව මෙම සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවාද කියන ගැටලුව. අපට ආචාර ධර්ම උගන්වන්න පොත් එවන මේ පාර්ලිමේන්තුව සදාචාර විරෝධී, නීති විරෝධී විධියට ඉතිහාසය තුළ පනත් කෙටුම්පත් සම්මත කරගෙන තිබෙනවා. රෑ දහය වෙනකම් විවාද කරලා යෝජනා සම්මත කරලා තිබෙනවා; ව්‍යවස්ථා සංශෝධනය කරලා තිබෙනවා. ඒ නිසා අපට ආචාර ධර්ම ඉගැන්වූවාට, ආචාරශීලීභාවයක් නැති පාර්ලිමේන්තුව තුළින් අවසාන මොහොතේ මොන සංශෝධන ඉදිරිපත් කරනවාද කියන ගැටලුව අපට තිබෙනවා. ඉතිහාසයේ ඒ දෙය කරලා තිබෙනවා. ඒ නිසා අපට ඒ ප්‍රශ්නය ඇති වෙනවා.

යම් පනතක, යම් ව්‍යවස්ථාවක, යම් සංශෝධනයක අර්ථ නිරූපණය කුමක්ද, පරමාර්ථය කුමක්ද කියන එක තීරණය කරද්දී, එම ව්‍යවස්ථා සම්පාදකයාගේ අරමුණ ඉතා වැදගත් වෙන බව අපි දන්නවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ කාල පරිච්ඡේදයේ රාජිත සේනාරත්න ඇමතිතුමා, ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු මේ අය ප්‍රකාශ කළේ, "ඒකාබද්ධ විපක්ෂයේ කට්ටිය තව සති කිහිපයකින්, මාස කිහිපයකින් හිර කූඩුවලට දක්කනවා" කියලායි. ඒ නිසා මේ ව්‍යවස්ථා සම්පාදනයේ පරමාර්ථය මේ පනත් කෙටුම්පතින් ඉදිරිපත්ව ඇති කරුණුද, එහෙම නැත්නම් මෙහි නිර්මාපකයන් විසින් ඉදිරිපත් කරන කරුණුද කියන සැකය අපට පවතිනවා.

අද මෙවැනි සංශෝධන ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබෙනවා, මෙම පනත් කෙටුම්පත තුනෙන් දෙකක බහුතර කැමැත්තෙන් තොරව අනුමත කරන්න පුළුවන්කමක් නැහැ කියලා. අද මේ ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයක් නැහැ. නිර්මාපකයින්ගේ සමහර අදහස් අද යටපත් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මේ සංශෝධන ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

[ගරු සිසිර ජයකොඩි මහතා]

අල්ලස් නඩුවක් සම්බන්ධයෙන් හෝ කුමන අපරාධයක් සම්බන්ධයෙන් හෝ කටයුතු කරන්න විශේෂ අධිකරණ පිහිටෙව්වාට කමක් නැහැ. නමුත්, ප්‍රමුඛතා ලැයිස්තුව නියම කරන්නේ කවර පටිපාටියක් මතද? අපි දන්නවා, අධිකරණ ඇමතිතුමියට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පැමිණිල්ලක් තිබෙන බව. මේ ආණ්ඩුවේ ප්‍රධාන ඇමතිවරු දහදෙනෙකුට විරුද්ධව අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි ඉදිරිපත් කළා. දැන් මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ නඩුව බොහොම ශීඝ්‍රයෙන් විභාග කරගෙන යනවා. අපි අහන ප්‍රශ්නය තමයි, මේ ගරු ඇමතිතුමියගෙන් ප්‍රකාශයක් ගන්නේ කවදාද? මේ ආණ්ඩුව නියෝජනය කරන ඇමතිවරුන්ට විරුද්ධව අපි ඉදිරිපත් කරපු පැමිණිලිවලට එම ඇමතිවරුන්ගෙන් ප්‍රකාශ ගන්නේ කවදාද? මේ රටේ මහ පොළොව නුහුලන අපරාධයක් සිද්ධ වුණා. ලංකා ඉතිහාසයේ ලොකුම අපරාධය; මහ බැංකු හොරකම. එයට අගමැතිවරයාගේ ඇති ඍජු සම්බන්ධතාව විශ්වාස භංග විවාදයේදී ප්‍රකාශ වුණා. ඒ හා සම්බන්ධ අධිකරණ කටයුතු ආරම්භ කරන්නේ කවදාද? ඒ සඳහා අනුගමනය කරන්නේ කුමන පටිපාටියක්ද? අනුගමනය කරන ක්‍රියා ධාරව මොකක්ද? ආණ්ඩුව නඩු ඉක්මන් කිරීමේ සැබෑ පරමාර්ථයකින් හා අවංක අරමුණකින් තොරව, දේශපාලන දඩයමක් බලාපොරොත්තුවෙන්ද මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ? මොකද, පසුගිය පෙබරවාරි මාසයේ පැවැති ඡන්දයෙන් ආණ්ඩුවේ පාර්ශ්ව දෙකම අන්ත පරාජයට පත් වුණු බව අපි දන්නවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ එක්සත් ජාතික පක්ෂය තිස්දෙවැනි වතාවටත් පැරදුණා. ආණ්ඩුවේ ප්‍රධානියා වූ ජනාධිපතිතුමා බරපතළ විධියට පරාජයට පත් වුණා. දැන් මේ පරාජයට පත් වෙච්ච ආණ්ඩුව දේශපාලන පළි ගැනීම් පමණක් ඉලක්ක කර ගනිමින්ද මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව යන්තුණ කීපයක් ඇති කළ බව අපි දන්නවා. එකක්, FCID එක. රට ගැන -දේශය ගැන- හැඟීමක් නැති දේශපාලනඥයන් අද ඉන්න පුළුවන්. මේ ආණ්ඩුව නියෝජනය කරන්නේ දේශ ද්‍රෝහී මැති ඇමතිවරු. එදා කොටි ත්‍රස්තවාදීන්ට විරුද්ධව මහ අරගළ ගෙන ගිය හමුදා බුද්ධි අංශයේ නායකයන්, පොලීසියේ ඉහළ නිලධාරීන් ඇතුළු ඒ සියලුම බලවේග අද පොලීසිය ලව්වාම අත්අඩංගුවට ගන්නවා. ඒ පොලිස් නිලධාරීතුමන්ලා ගැන ලජ්ජයි. දේශපාලනඥයන් දේශ ද්‍රෝහීන් වෙන්න පුළුවන්. නමුත්, ඒ දේශපාලනඥයන්ව සතුටු කරන්න එකම නිල ඇඳුම ඇඳගත්, එහා පැත්තේ සිටි තමන්ගේ නිලධාරියාව දං ගෙඩියට අරගෙන යනවා; දඩ බිමට අරගෙන යනවා. අද පොලීසියට සිද්ධ වෙලා තිබෙන්නේ ඒකයි; FCID එකට සිද්ධ වෙලා තිබෙන්නේ ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නඩු විසඳීම පමා වනවා නම් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න. ඒ වාගේම ඉක්මන් කළ යුතු නඩුවකුත් තිබෙන බව අපි මතක් කරනවා. ඒ තමයි පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිළිබඳ නඩුව. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඇතුළු කීප දෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් දෙකක් ඉදිරිපත් කළා. ඊළඟට, ඇල්ලේ ගුණවංශ නායක හාමුදුරුවෝ සහ මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා අභියාචනා අධිකරණයට පෙත්සම් ඉදිරිපත් කළා. අවුරුදු තුනක් වනවා. නඩුවේ තීන්දුව කෝ? ලජ්ජයි. අවුරුදු තුනක් තිස්සේ රටට කරපු දෙයක් නැහැ. රට විනාශ කළා. සියයට 7ක් තිබුණු සංවර්ධන වේගය සියයට 3.1 දක්වා අඩු කළා. රට කෑවා; රට විනාශ කළා. දේශපාලන වෛරය පදනම් කර ගත් වෛරක්කාරීන්ව සතුටු කරන්න කටයුතු කළා. ඇහ පුරාම තිබෙන වෛරය දිවෙන් ගෙන කටින් පිට කළා. ව්‍යවස්ථා සභාව නියෝජනය කරන්නේ එවැනි වෛරක්කාරයෝ. අද ඒ වෛරක්කාරයෝ තමයි නිලධාරීන්ව පත් කරන්නේ. අපි කොහොමද ඒ නිලධාරීන්ගෙන් සාධාරණයක්, යුක්තියක් බලාපොරොත්තු වෙන්නේ? ව්‍යවස්ථා සභාව පත් කරන්නේ 2015 ජනවාරි 08වැනි දා ක්‍රියාවලියට හවුල් වෙච්ච වෛරක්කාරයෝ නම්, ඒ අයගෙන් යුක්තියක් ඉටු වෙයිද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ ප්‍රධාන කාර්ය භාර්ය නිලධාරිතුමාව අත් අඩංගුවට අරගෙන තිබෙනවා. හැබැයි, අපි දැක්කා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු සිසිර ජයකොඩි මහතා
(මාණ්පුමිකු சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
විනාඩියෙන් අවසාන කරනවා. ඒ නිලධාරීන් දෙදෙනා මාංචු රහිතව ගමන් කරනවා, අද "ලංකාදීප" පත්‍රයේ පළ කර තිබෙනවා අපි දැක්කා. අපේ මහජන නියෝජිතයන්ව මාංචු දාලයි අරගෙන යන්නේ. ඒ නිලධාරීන් දෙදෙනා අරගෙන යන හැටි බලන්න. පළි ගැනීම්, වෛරය, ක්‍රෝධය විතරයි මේ අවුරුදු තුන තුළ මේ රටේ ඉතිරි කරලා තිබෙන්නේ, වෙන කිසිවක් නැහැ. දූෂ්ට කටින් පිටවන දූෂ්ට විස පමණයි තිබෙන්නේ. අවංක අරමුණක් මේ ආණ්ඩුවේ නැහැ. මේ ආණ්ඩුවේ අවංක අරමුණක් නැති නිසා මේ පනත් කෙටුම්පත පිළිබඳව බරපතළ සැකයක් අපට ඇති වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නඩු කඩිනම් කරන්න ඕනෑ. නමුත් මේ ආණ්ඩුව කිසිම දවසක මේ රටට හොඳ දෙයක් කළේ නැති නිසා මේ දූෂ්ට ආණ්ඩුව වෛරී චේතනාවෙන් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් පිළිබඳව අපට සැකයක් ඇති වනවාය කියා ප්‍රකාශ කරමින්, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි. Next, the Hon. (Dr.) Jayampathy Wickramaratne.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(මාණ්පුමිකු පාට්ටළි சම්පික රණවක්ක)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

[අ.භා. 4.28]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිඥවරයකු වශයෙන් මුල්ම කාලයේ මා කටයුතු කළේ අපරාධ අධිකරණවල පමණයි. ඒ නිසා අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා. ප්‍රමාදයකින් තොරව දිනපතා නඩු ඇසීම ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවෙයි. 1973 යුක්තිය පසිඳලීමේ පනත ක්‍රියාත්මක වන්නට කලින් සියලුම බරපතළ නඩු විභාග කළේ එක් එක් පළාත්වලයි; ඒවාට ඉංග්‍රීසියෙන් කිව්වේ "Assizes" කියලායි. එහිදී නඩු විභාග කරනු ලැබුවේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් හෝ විශේෂයෙන් පත් කරන ලද අපරාධ කොමසාරිස්වරුන් - Commissioners of Assize - විසිනුයි. එම නඩු හැම එකක්ම දිනපතා විභාග කළා. විශේෂ හේතුවක් -නීතිඥවරයකු අසනීප වුණොත්, එහෙම නැත්නම් සාක්ෂිකරුවකු සොයා ගන්නට බැරි වුණොත් - නිසා මිස ඒ බරපතළ නඩු කල් දමන පුරුද්දක් තිබුණේම නැහැ. හැම බරපතළ නඩුවක්ම දිනපතා විභාග කළා. 1973 යුක්තිය පසිඳලීමේ පනත යටතේ එම ප්‍රතිපත්තිය දිගටම රැගෙන ගියා. ලංකාව පුරා මහාධිකරණ 16ක් පිහිටෙව්වා. ඒ සෑම මහාධිකරණයකම සෑම බරපතළ නඩුවක්ම -මං කොල්ල නඩුවක් වේවා, ස්ත්‍රී දූෂණ නඩුවක් වේවා, මිනී මැරුම් නඩුවක් වේවා - ජූරි සභාවක් ඉදිරියේ දිනපතා විභාග කළා. මා දිවුරුම් දුන්නේ, යුක්තිය පසිඳලීමේ පනත යටතේයි. මා දිවුරුම් දුන් කාලයේ සියලුම නඩු දිනපතා විභාග කළේ ජූරි සභාවක් ඉදිරිපිටයි. නඩුවක් සඳහා දින නියම කිරීමේදී විනිශ්චයකාරවරු ප්‍රවේශම් වුණා. නඩුවක් සඳහා දින නියම කරන්න කලින් ඒ සම්බන්ධයෙන් නීතිඥවරුන් සමඟ සාකච්ඡා කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, අමතර පැහැදිලි කර ගැනීමක් සඳහායි මා මේ ප්‍රශ්නය අහන්නේ. "යුක්තිය පසිඳලීමේ පනත" වශයෙන් ඔබතුමා හඳුන්වන්නේ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනතද?

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

නැහැ. Administration of Justice Law. ඊලික්ස් ඩයස් බණ්ඩාරනායක ඇමතිතුමා ඉන්න කාලයේ අපරාධ නඩු විධාන සංග්‍රහය වෙනුවට යුක්තිය පසිඳලීමේ පනත ගෙනාවා. 1979 වර්තමාන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ගෙනෙන තුරු යුක්තිය පසිඳලීමේ පනත තමයි ක්‍රියාත්මක වුණේ. ඒ කාලයේ සියලුම නඩු දිනපතා විභාග කළා. ඕ.එස්.එම්. සෙනෙවිරත්න විනිශ්චයකාරතුමා තමයි මගේ පළමුවන මහාධිකරණ විනිශ්චයකාරතුමා. අවසානයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් තමයි එතුමා විශ්‍රාම ලැබුවේ. එතුමා හැම නඩුවක්ම විභාග කරන්න කලින් රජයේ නීතිඥවරයාගෙන් අහනවා, "මේ නඩුවට කොපමණ කල් ගත වෙයිද?" කියලා. එතුමා එහෙම assessment එකක් කරනවා. සමහර නඩු සඳහා සුමානයක් ගත වනවා. සමහර නඩු සඳහා සුමාන දෙකක් ගත වනවා. සමහර නඩු සඳහා සුමාන තුනක් ගත වනවා. ඊට පස්සේ එතුමා නීතිඥවරුන්ගෙන් අහනවා, "සාමාන්‍යයෙන් නඩු විභාගයට සුමාන තුනක් විතර යයි. ඔබ එකඟ වනවාද?" කියලා. අපි කියනවා, "ඔව්, සර්. මේ නඩුවට සුමාන තුනක් විතර ගතවෙයි" කියලා. ඊට පස්සේ එතුමා සාමාන්‍යයෙන් කිට්ටු දිනයක් නොවෙයි, ටිකක් දීර්ඝ දිනයක්, නමුත් පැහැදිලි දිනයක් දෙනවා, ඒ නඩු විභාග කරන්න. අපි අනිකුත් උසාවිවල නඩුවලටත් පෙනී සිටින නිසා අපි කෙසේ හෝ diary එක manage කර ගන්නවා. අපි සාමාන්‍යයෙන් කරන්නේ, ඒ සුමාන දෙකේ ඒ උසාවියේම තව නඩු කිහිපයකට දින නියම කර ගන්න එකයි.

එතකොට බැරිවෙලාවත් යම්කිසි හේතුවක් නිසා එක් නඩුවක් පටන් ගත්තේ නැත්නම් අනික් නඩුව පටන් ගන්න පුළුවන්. ඒ නිසා කවදාවත් නීතිඥවරුන්ගෙන් පැමිණිල්ලක් තිබුණේ නැහැ. පසුව නඩු වැඩි වෙන්න පටන් ගත්තාම එම ක්‍රමයේ වෙනසක් ඇති කළා. ඒ අනුව, දැනට ක්‍රියාත්මක වන අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ 1979දී non-jury trials පළමුවරට ක්‍රියාත්මක වුණා. ඒ කියන්නේ, ජූරි සභාවක් ඉදිරියේ නැතිව, විනිශ්චයකාරතුමා විතරක් අහන නඩු. ඉතාම බරපතළ නඩු ජූරි සභාවක් ඉදිරියේ ඇහුවා. අනික් නඩු ජූරි සභාවක් නොමැතිව ඇහුවා. මුල් කාලයේ non-jury නඩුත් දිනපතා ඇහුවා. එතකොට ජූරි සභාව තිබුණත්, ජූරි සභාව නොමැති වුණත් ඒ සියලුම නඩු දිගටම ඇහුවා. ඉන් පසුව විත්තිකාරයාට option එකක් දුන්නා, ජූරි සභාව ඉස්සරහ නඩුව අහනවාද, ජූරි සභාව නොමැතිව නඩුව අහනවාද කියා තෝරා ගන්න. ඒකෙන් තමයි මේ ප්‍රශ්න පැන නැහුණේ; මේ ලෙඩේ ආවේ. නොයෙකුත් හේතු නිසා, ජූරි සභාවක් නැතිව නඩු අහන්න බොහෝ නීතිඥවරු කැමැතියි. ඊට පස්සේ non-jury නඩුත්, jury නඩුත් කියන හැම එකක්ම අවසාන වශයෙන් non-jury නඩු බවට පත් වුණා. එතකොට ව්‍යතිරේකය rule එක බවට පත් වුණා. කලින් ව්‍යතිරේකය වුණා, පසුව ජූරි සභාව නැතුව නඩු අහන එක rule එක බවට පත් වුණා. අද ඉතාම කලාතුරකින් තමයි ජූරි සභාවක් සමඟ නඩුවක් ඇහෙන්නේ. පසු කාලයේ නඩු කල් යන පුරුද්දක් පටන් ගත්තා. නීතිඥවරු දින ඉල්ලන්න පටන් ගත්තා. විනිශ්චයකාරවරුත් දිනපතා නඩු අහන එක නවත්වලා නඩුවලට දින දෙන්න පටන් ගත්තා. ඒකෙන් තමයි මේ ලෙඩේ ඇති වුණේ. මම කියනවා මේක ලෙඩක් කියලා. ඊට පසුව තමයි මෙම නඩු දීර්ඝ කාලයක් ඇතට කල් යන්න පටන් ගත්තේ.

අද කලින් කථා කළ ගරු මන්ත්‍රීවරු නඩුවලට ගතවන කාල සීමාවන් පිළිබඳව කිව්වා. සාමාන්‍යයෙන් අපරාධය සිදුවෙලා මහාධිකරණයේ නඩුව පවරන්න අවුරුදු 7ක් යනවා නම්, නඩුව අහලා ඉවර කරන්න තව අවුරුදු දෙක තුනක් යනවා නම්, නඩුවේ අභියාචනය සලකා බලා අවසන් කරන්න තව අවුරුදු කිහිපයක් යනවා නම්, එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා තමයි අද මේ අධිකරණ සංවිධාන පනතට සංශෝධන ගෙනැත් බරපතළ නඩු පිළිබඳ විභාග කිරීම් බාධාවකින් තොරව, දිනෙන් දින කල් දමන්නට ඉඩ නියන්නේ නැතුව, දිනෙන් දින අහන්නට නැවත ක්‍රමයක් හදලා තිබෙන්නේ.

ඊළඟට, මම මේ කාරණය කියන්න ඕනෑ. විනිශ්චයකාරවරු තුන්දෙනෙක් ඉදිරිපිට තිබෙන නඩුද අසාමාන්‍ය නොවෙයි. මීට කලින් trials at bar තිබ්ලා තිබෙනවා. ඒ මිනී මැරුම්වලට විතරක් නොවෙයි, ඒක වැරැදියි. ඊලික්ස් ඩයස් බණ්ඩාරනායක ඇමතිතුමාගේ කාලයේ අමිර්තලිංගම් මහත්මයාට විරුද්ධව තිබුණු නඩුවක් විභාග කළේ trial at bar එකකයි. එතැනදී නීති ප්‍රශ්නයක් මතුවෙලා ඒ නඩුව අහක දැම්මා. එම නිසා දැන් තිබෙන විශේෂ තත්ත්වය සැලකිල්ලට ගෙන මෙම පනත් කෙටුම්පත ගෙනාවාම, එය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. මම කියන්න ඕනෑ, මෙම පනත් කෙටුම්පතට පක්ෂව නීතිඥවරයෙක් හැටියට මමත් ඉදිරිපත් වුණු බව. දින 4ක කාලයක් තුළ මෙම පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡාවක් ඇති වුණා; නඩු විභාගයක් පැවැත්වුණා; අපේ සමඟර තර්ක පිළිගත්තා; සමඟර තර්ක ප්‍රතික්ෂේප වුණා. සමඟර වගන්තිවලට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර කැමැත්ත අවශ්‍ය බවට ශ්‍රේෂ්ඨාධිකරණය දුන් පැහැදිලි නඩු තීන්දුවක් තිබෙනවා. කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණය කියා සිටියා, අභවල් ආකාරයට මෙය වෙනස් කළොත් තුනෙන් දෙකක බහුතර

[ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

කැමැත්ත අවශ්‍ය නැහැය කියලා. ඒ පිළිබඳව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව තුළ දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ සඳහා සම්බන්ධ වීමට ලැබීම පිළිබඳව එහි සාමාජිකයන්ට ආඩම්බර වෙන්න පුළුවන්. ඉන් පසු ඊයේ නීතිපතිවරයා එම ආංශික අධීක්ෂණ කාරක සභාවට ඇවිත් අපිට කරුණු ඉදිරිපත් කරලා කිව්වා, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යෝජනා කරන ලද සියලුම සංශෝධන පිළිගෙන තිබෙන බව. ඒ අනුව අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා.

මෙහිදී ඉතාම වැදගත් දෙයක් තිබෙනවා. අවසාන වශයෙන් අග්‍ර විනිශ්චයකාරවරයා තමයි trial at bar එකක් තියනවාද, නැද්ද කියා තීන්දු කරන්නේ. වරදේ ස්වභාවය හෝ අවස්ථානුගත කරුණු, වරදේ බැරෑරුම්කම, වරදේ සංකීර්ණභාවය, වරද නිසා චින්දිතයා මත වන බලපෑම හෝ එම වරද නිසා රජය මත වන බලපෑම යන කාරණා මත පමණක් තමයි ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චයකාර සභාවකට යොමු කළ හැක්කේ. එයද නීතිපතිවරයාගේ හෝ අල්ලස් කොමිසමේ තනි කැමැත්තට නොව, අග්‍ර විනිශ්චයකාරවරයාගේද අනුමැතිය ඇතිවයි කළ යුත්තේ.

අවසාන වශයෙන් අග්‍රවිනිශ්චයකාරතුමා තීන්දුව ගන්න නිසා මේ පිළිබඳව සැකයක් තියාගන්නට හේතුවක් නැහැ. මෙම පනත් කෙටුම්පත සමඟම තවත් පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා තිබෙනවා, අපරාධ නඩු විධාන සංග්‍රහයට සහ දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධනයක් හැටියට. ඒ අනුව වරදක් කළ අයෙකු බවට පිළිගැනීමට අවශ්‍ය අවම වයස් සීමාව ඉහළ දමා තිබෙනවා. දැන් තිබෙන්නේ අවුරුදු 8ක වයස් සීමාවක්. ඒක අවුරුදු 12 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක හොඳයි. මොකද, ඒක තමයි ජාත්‍යන්තර ප්‍රමිතිය. අපට කාලයක් හුහාක් ප්‍රශ්න තිබුණා, ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය -Convention on the Rights of the Child- අත්සන් කරලා තිබියදීත් ඇයි අපි විතරක් අවුරුදු 12 දක්වා වයස් සීමාව වැඩි කරන්නේ නැත්තේ කියලා. අපට හැමදාම ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න මතු වුණා. නමුත් අවසාන වශයෙන් අපි ජාත්‍යන්තර බැඳීම් අනුව කටයුතු කරමින් එයද වෙනස් කරලා තිබෙනවා. ඒ පිළිබඳව ද අපේ සතුට ප්‍රකාශ කරන්න ඕනෑ. විශේෂයෙන්ම අධිකරණ ඇමතිතුමියට අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ, නඩු ප්‍රමාදය වැළැක්වීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.38]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දැන් තිබෙන විධියට අපි විරුද්ධයි. දැන් මේක තමයි මේ විවාදයට භාජනය කරලා තිබෙන්නේ. දැන් මේක උඩ තමයි ඔබතුමා අපෙන් ඡන්දය විමසන්නේ. ඡන්දය විමසන අවස්ථාවේදී ආණ්ඩුව ගැන තුට්ටු භාගයක විශ්වාසයක් අපට නැති නිසා අපි මේ පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දෙනවා. ඉන් පසුව අපි බලනවා අපට එවලා තිබෙන සංශෝධන මේකට ඇතුළත් කරනවා ද, නැද්ද කියලා. මොකද, මේ ආණ්ඩුව වරක් ශ්‍රේෂ්ඨාධිකරණය වැළැක්වූ යම් කාරණයක් කාරක සභා අවස්ථාවේදී පනත් කෙටුම්පතට ඇතුළත් කළා. පළාත් සභා කල්දැමීමට හේතු වෙච්ච අවස්ථාව අපි කවුරුත් දන්නවා. එහෙම විශ්වාසයක් නැතුව වැඩ කරන්න බැහැ. මේ නඩු ඉක්මනට අහනවාට අපි එකඟ ද? ඔව්. චෝදනා ඉක්මනට ගොනු කරනවාට අපි එකඟ ද? ඔව්. ඒවා අරමුණු කරගෙන නම් මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ, එහෙම නම් අපට මේකත් එක්ක ප්‍රතිපත්තිමය මූලික ගැටුමක් නැහැ. නමුත්, අධිකරණයේ බලය අධිකරණයට අභිමි කරන ලෙස ගෙනැවිත් තිබීම ගැන තමයි අපේ විරුද්ධත්වය තිබෙන්නේ.

දැන් හොරු අල්ලන්න ඕනෑ කියලා අධිකරණ බලය පොලිස් බල්ලෙකුට දුන්නොත් මොකද වන්නේ? ඌට හොඳට ඉව තිබෙනවා. අධිකරණ බලය අධිකරණ පද්ධතියක් තුළ අධිකරණ සංවිධාන පනතක් යටතේ අපි මේ රටේ පිහිටුවා තිබෙනවා. ඒක කිසියම් ආකාරයකින් හානියකට ලක් වෙනකොට ඒ නිසා ඇති වෙන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට, මේ රටේ නිදහස් ජීවිතයට තර්ජනයක්. දැනුත් තමුන්නාන්සේලා ඇත්තටම අරමුණු කළේ ඔය නිදහසට තර්ජනය කිරීමයි. තමුන්නාන්සේලා පනත් කෙටුම්පත ගෙනාවේ විරුද්ධවාදීන් දඩයම් කිරීමටයි. ඒ ගැන මට නම් සැකයක් නැහැ. මේ චෝදනාවලට ඒ අය වැරදිකාරයෝ ද, නැද්ද, ඒ චෝදනා ඔවුන්ට විරුද්ධව ගෙන ඒම හරි ද, වැරදි ද කියන එක ගැන නොවෙයි මම කථා කරන්නේ. මේ පනත් කෙටුම්පත ගෙන ඒමේදී තමන්ගේ දේශපාලන විරුද්ධවාදීන් තමයි ඉලක්කය වී තිබෙන්නේ. ඒ නිසා තමයි තමුන්නාන්සේලා බැලුවේ අධිකරණයේ බලය පිටතට අදින්න. නමුත්, අන්තිමට තමුන්නාන්සේලාට ඒක කරන්න බැරි වුණා.

ව්‍යවස්ථාවට විරුද්ධව වගන්ති ඇතුළත් කරලා සම්මත කරන්න තුනෙන් දෙකේ බලයකුත් නැහැ; අනික් අතට තුනෙන් දෙකේ බලයක් නැතුව මේ පනත් කෙටුම්පත සම්මත වෙන්න නම්, අධිකරණයේ නියමයට අනුකූල වෙන විධියට මේ පනත් කෙටුම්පත නැවත හදා ගන්න ඕනෑ. අපරාධ නීතියේ තිබෙන ප්‍රධාන දෙයක් තමයි චේතනාව කියන එක.

තමුන්නාන්සේලා මොන චේතනාවෙන් ද මේක ගෙනාවේ? අපි කොහොමද ඒ කාරණය හොයා ගන්නේ? ඒ කාරණය අපි හොයාගන්නේ මේ නිසායි. තමුන්නාන්සේලා උපලේඛනයේ සඳහන් කරලා තිබෙන මේ චෝදනා, මේ වැරදි, මේ අපරාධ මේ රටේ තිබෙන බරපතළම අපරාධ නොවෙයි. බොහෝ විට ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් රාශියකට විරුද්ධව මේ වෙනකොට තමුන්නාන්සේලාගේ පැත්තෙන්, ආණ්ඩුව විසින් මෙහෙයවලා ගොනු කරපු චෝදනා ඇතුළත් වෙන වපසරිය තමයි මේ උපලේඛනයේ තිබෙන්නේ. එහෙම නැත්නම් තමුන්නාන්සේලාට ඇත්තටම මේ අධිකරණයේ කටයුතු ඉක්මන් කරන්න ඕනෑ, අධිකරණයේ ක්‍රියාදාමය කල්පමානොවී එදිනෙදා ඇහෙන්නට ඕනෑ, අධිකරණයේ බරපතළ ආකාරයකට නඩු

විභාගයක් කරන්න ඕනෑ, විනිශ්චයකාරවරුන් තුන්දෙනෙක් ඉන්නට ඕනෑ කියන කාරණාවලට අදාළව ඒ අධිකරණයට යොමුවිය යුතු වැරදි හෝ අපරාධ හැටියට පෙන්වලා තිබෙන දේවල් ඉතාම සාමාන්‍ය අපරාධ, වැරදි හැටියටයි අපට උපලේඛනය බැලුවාම පෙනෙන්නේ. එතකොට මෙන්න මේ කරුණු කාරණා මේ වැරදි, මේ අපරාධ ඇසුරෙන් තමයි අද ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරමින්, පැමිණිලි ඉදිරිපත් කරමින් ඒ අයව අධිකරණයන් ඉදිරියට ගෙන ගිහින් තිබෙන්නේ. නමුත් ඇත්තටම මේ වැඩපිළිවෙළ තුළ අධිකරණයේ වැඩ පමා වෙන්න පුළුවන්. ඇයි? තනියම අහන ඒවාට තුන්දෙනෙක් ඕනෑ. තුන්දෙනෙක් බැගින් දමා නඩු අහන්න ගියාම, ඒ නිසා වෙන වෙනම නඩු අහන අධිකරණ තුනක වැඩ එක අධිකරණයකට ලඝු වෙනවා. මේ විධියට නඩු අහන්න කල්පනා කරනවා නම්, අධිකරණ සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ.

විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ. ඒ සංඛ්‍යාවන් වැඩි කිරීමෙන් හා අධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමෙන් තමයි මෙය කළ හැකිව තිබුණේ. Trial at bar කථාව තමුන්නාන්සේලා ඇද ගෙන තිබුණේ වෙන එකක් නිසා නොවෙයි. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් සමහරෙකුට විරුද්ධව දැනට කරලා තිබෙන පැමිණිලි මහා බරපතළ නඩු හැටියට ත්‍රිපුද්ගල විනිශ්චය සභාවක් ඉදිරියට ගෙනෙන්නයි. ඒකයි මේක පිටුපස්සේ තිබුණු චේතනාව හැටියට මම අනුමාන කරන්නේ. මේ කරන්නේ අවංකව නඩු කටයුතු ඉක්මන් කර ගැනීමක් කියලා මට පිළිගන්න අමාරුයි.

එදිනෙදා නඩු අහන වැඩේට තමුන්නාන්සේලාට පනතක් ගෙනෙන්න ඕනෑ ඇයි කියලා මට නම් තේරෙන්නේ නැහැ. 1980 මහා වැඩ වර්ජනයෙන් පස්සේ අපි 14 දෙනෙකුට විරුද්ධව -එදා කොළඹ විරෝධතා දිනයක් තිබුණා.- මහෙස්ත්‍රාත් උසාවියේ නඩු කටයුත්තක් ආරම්භ කළා. කැරැලි ගැසීම, ආණ්ඩුවේ දේපළවලට අලාභ කිරීම කියන කරුණු සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් උසාවියක් වෙනම දමා එදිනෙදා නඩු අහුවා. එදා 1980දී වරාය මහෙස්ත්‍රාත් උසාවිය තමයි තිබුණේ.

වෙනම නඩුකාරතුමියක් ඒ නඩුව අහුවා. එදිනෙදාම අහුවා, දිනපතාම අපි උසාවි ගියා. ඉඳලා හිටලා තමයි කල්දැමීමක් වුණේ. එම නිසා මේකට නීති අණ පනත් ගෙනෙන්න දෙයක් නොවෙයි තිබෙන්නේ. ඒ නඩුව මහා බරපතළ නඩුවක් වුණා. ඒ නඩුවේ ලඝු නොවන නඩු විභාගය - non-summary proceedings - ඉක්මනින් කර ගන්න ඕනෑකම තිබෙනවාය කියා එදා මහෙස්ත්‍රාත් උසාවිය ඒ විධියට නඩු අහුවා. එහෙම නඩු අහලා අධිචෝදනා මත අප මහාධිකරණයට ගෙනාවා. මහාධිකරණය අප නිදහස් කළා, "චෝදනා පත්‍ර ගොනු කර තිබෙන හැටි වැරදියි" කියා.

මේ trial at bar නැත්නම් ත්‍රිපුද්ගල විනිශ්චය සභාවන් මගින් විමසිය යුතු නඩු මොනවාද කියන එක තමුන්නාන්සේලා අධිකරණ සංවිධාන පනතේ මේ සංශෝධන යටතේ පෙන්වා තිබෙනවා. මේ අධිකරණ පද්ධතිය හැදී තිබෙන්නේ මේ පාර්ලිමේන්තුව විසින් ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක කර වීමට අධිකරණයට දුන්නා වූ බලයක් හැටියට. මේ පාර්ලිමේන්තුවට ජනතා පරමාධිපත්‍යය පවරා තිබෙනවා. එය අධිකරණය මඟින් අධිකරණ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න අධිකරණයට පැවරී තිබෙනවා.

අපි කවුරුත් දන්නා විධියට, උසාවි පද්ධතිය ශ්‍රේෂ්ඨාධිකරණයේ සිට පහළට විහිදී තිබෙනවා. මහාධිකරණත් තිබෙනවා. විටින් විට යම් ආන්දෝලනාත්මක නඩු සම්බන්ධයෙන්; සමාජයේ ලොකු බලපෑමක් ඇති නඩු සම්බන්ධයෙන් trial at bar කියන ත්‍රිපුද්ගල විනිශ්චය සභා හැටියට ඒ සමහර නඩු ඇසීමට අග්‍රවිනිශ්චයකාරවරයා තීන්දු කරන අවස්ථාවල නීතිපතිතුමාගේ ඉල්ලීම අනුව මහාධිකරණවල එසේ ක්‍රියාත්මක වෙනවා. එම නිසා මේ ස්ථිර මහාධිකරණයක්, ත්‍රිපුද්ගල විනිශ්චය සභාවක් හැටියට නම් කර ක්‍රියාත්මක කරන්න යනවාය කියන එකේ තේරුම මම දන්නේ නැහැ. හිටපු අධිකරණ ඇමතිතුමා කථා කරන වෙලාවේත් මම ඇහුවා, "මේ 'ස්ථිර' කියන වචනය මෙතැනට දැමීමේ තේරුම මොකක්ද?" කියා. කුමන අවස්ථාවකදීද, ත්‍රිපුද්ගල විනිශ්චය සභාවක් තිබිය යුත්තේ කියා තීන්දු කරන්නේ අග්‍ර විනිශ්චයකාරතුමා නම්, එතුමා එසේ තීන්දු කරන්නේ ඒ අපරාධ හා වැරදි සම්බන්ධයෙන් නම්, ඒ නිසි අවස්ථාවල මේ ස්ථිර ත්‍රිපුද්ගල විනිශ්චය සභාවක් පිහිටුවනවාය කියන එකේ අර්ථය කුමක් ද? එහෙම වෙනම මහාධිකරණයක් හදන්න තමයි තමුන්නාන්සේලා සිතුවේ. එහෙම වෙනම මහාධිකරණයක් හදලා අද චෝදනාවලට ලක් වෙලා ඉන්න ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් සියලුදෙනාම ඒ විනිශ්චය සභාවට ඇද ගෙන එන්න. නමුත් ඒ ඉලක්කය වැරදිලා තිබෙනවා. මොකද, තමුන්නාන්සේලාට ඕනෑ හැටියට ඒවායේ අධිචෝදනා පත්‍ර දාන්න බැහැ; නීතිපතිතුමාට ඕනෑ හැටියට අධිචෝදනා පත්‍ර දාන්න බැහැ; අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂට ඕනෑ හැටියට අධිචෝදනා පත්‍ර දාන්න බැහැ. දැන් එසේ අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කරන්න පුළුවන් වන්නේ අග්‍ර විනිශ්චයාකරතුමාගේ නියමයක් අනුව විතරයි. එම නිසා තමුන්නාන්සේලාගේ ඉලක්කය වැරදුණා. තමුන්නාන්සේලා සිතුවේ, "මෙන්න, trial at bar. - ලොකු නඩු නේ, trial at bar එකේ අහන්නේ.- මෙන්න, ඒක පිහිටෙව්වා; මෙන්න, විනිශ්චයකාරවරු තුන් දෙනෙක් පත් කළා; මෙන්න, එක්කෙනා, එක්කෙනා ඒක ඉස්සරහට ඇද ගෙන එනවා" කියලා. ඒ ඉලක්කය අද පරාජය වෙලා තිබෙනවා. ඒ ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රඥාවට අපගේ ස්තුතිය පළ කළ යුතු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මා අවසාන වශයෙන් මෙම කරුණ කිව යුතුයි. අගමැතිතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අපි කරපු පැමිණිලි තිබෙනවා. අගමැතිතුමා මහ බැංකුවේ බැඳුම්කර හොරකමේ ප්‍රධානම පාර්ශ්වකරුවෙකු කියලා සාක්ෂි හා ලේඛන ඉදිරිපත් කරලා අපි එතැනට ඉදිරිපත් කළ පැමිණිල්ල ගැන අපෙන් ප්‍රකාශයක් ගත්තා. ඒ සම්බන්ධයෙන් වුණේ එච්චරම තමයි. එහෙම නම්, සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අපට කියන්න ඕනෑ, "දැන් මේ ගැන අපි විභාග කරන්නේ නැහැ"යි කියලා. අපි ඇමතිවරු 10දෙනෙකුට විරුද්ධව පැමිණිලි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ, එකම පැමිණිලිකරු නොවෙයි; වෙනත් වෙනත් අය. මම පැමිණිල්ලක් ඉදිරිපත් කළේ අගමැතිතුමාට විරුද්ධයි. නමුත්, මේ පැමිණිලි සම්බන්ධයෙන් මොකක්ද වන්නේ කියලා අපට නම් තවමත් කියලා නැහැ. එම නිසා මේ සම්බන්ධයෙන් අපට හිතාගන්න තිබෙන්නේ මොකක්ද? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අද මේ පැමිණිලි යටපත් කර තිබෙනවාය කියලායි අපට හිතාගන්න වෙන්නේ. අපි මේ පැමිණිලි ඉදිරිපත් කර තිබෙන්නේ අගමැතිතුමාට විරුද්ධව නිසා එහෙම නැත්නම් ඇමතිවරුන්ට විරුද්ධව නිසා ඒ පිළිබඳව විභාගයක් හෝ කරන්න බැරි නම්, මේවා අසත්‍ය පැමිණිලි නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඒ බව

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ප්‍රකාශයට පත් කරන්න ඕනෑ. එහෙම කළොත් එතැන ඉඳලා අපට ඊළඟ පියවරකට යන්න පුළුවන්. නමුත්, මේ කොමිෂන් සභාව එහෙම කියන්නේත් නැහැ. එම නිසා මම හිතනවා, මේ ආණ්ඩුව ගැහූ ගල වැරදුණා, දැන් ලජ්ජාවත් ගිල ගෙන, ශ්‍රේෂ්ඨාධිකරණය දුන් ඒ නියෝගයන්ට අනුකූලව මේ සංශෝධන ඇතුළත් කරලා තමුන්නාන්සේලා මීට ඉස්සෙල්ලා කරපු උපක්‍රම වාගේම මේ උපක්‍රමයත් වැරදිලා, දැන් පස්ස බිම ඇනිලා සිටින වෙලාවේවත් මේ සංශෝධන අපට දකින්න ලැබෙයි කියලා.

මම අවසාන වශයෙනුත් කියනවා, චෝදනා ගොනු කරනවාට, පැමිණිලි ගොනු කරනවාට අපි විරුද්ධ නැහැ, මේ දඩයමටයි අපි විරුද්ධ කියලා. මේ සියල්ලෝම කියන්නා වූ, අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉලක්ක කර ගත් චෝදනා සියල්ල වැරදි බව මා නැවතත් මතක් කරමින්, ඒ අනුව තමුන්නාන්සේලා හිතා ගත් ඒ කටයුත්ත කර ගන්න බැරි වීම ගැන අපේ සතුට පළ කරමින්, මේ කෙටුම්පත අද තිබෙන ආකාරය අනුව අපි ඊට විරුද්ධත්වය පළ කරන බව කියමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 4.54]

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය විසින් අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කිරීම ගැන අපි ඉතාම සතුටුවනවා, මේ රටේ ඉතාම වැදගත් ක්ෂේත්‍රයක කාලාන්තරයක් මුළුල්ලේ පරිණාමය වුණු ගැටලු ගණනාවකට කිසියම් ආකාරයක විසඳුමක් ලබා දීම මෙමඟින් බලාපොරොත්තු වන නිසා.

2015 ජනවාරි 8 වැනි දා මේ ජනාධිපතිතුමාටත්, ඒ වාගේම 2015 අගෝස්තු 17 වැනි දා එක්සත් ජාතික පෙරමුණටත්, මේ රටේ දැන උගත් ජනතාව ඡන්දය ලබා දීමේ ඉතාම වැදගත් සාධකයක් වුණේ රට පුරා ව්‍යාධියක් විධියට පැතිරී ගිහිල්ලා තිබුණු දූෂණයට කිසියම් ආකාරයක දඬුවම් ලබා දීමක් මඟින් ජනතාවට යුක්තිය ඉටු කිරීමත්, එවැනි දූෂණ නැවත ඇතිවීම වැළැක්වීමත්, අනාගතය සඳහා එවැනි තත්ත්වයන්ගෙන් තොර පිරිසිදු යහ පාලනයක් ඇති කර ගැනීමත් යන කරුණුයි. ඒ අනුව යම් යම් ක්‍රියාදාමයන් ආරම්භ වුණත්, ඒවා දේශපාලන බලපෑම් මත, ඇතැම් විට විමර්ශනයේ තිබෙන තාක්ෂණික දුර්වලතා මත, ඒ වාගේම අධිකරණ ක්‍රියාවලියේ තිබෙන යම් යම් ආවේණික දුර්වලතා මත ඉෂ්ටප්‍රාප්ත වුණේ නැහැ. ඒ නිසා ඒ ජනතාවගේ අපේක්ෂාවන් බිඳ වැටෙන තත්ත්වයකට දැන් පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ අනුව, අධිකරණ ක්‍රියාවලියේ තිබෙන දුර්වලතා වෙනස් කර ගන්න ගත් එක වැදගත් පියවරක් හැටියට අපි මේ පනත් කෙටුම්පත දකිනවා. මෙතැනදී දෝෂීන් කවුද කියලා හඳුනා ගන්නවා වෙනුවට මොන විධියේ දුර්වලතාද අපට තිබෙන්නේ කියන හඳුනා ගැනීමයි අපි කරන්න ඕනෑ. ඒ වාගේම වීරයින් හඳුනා ගන්නවා වෙනුවට, මොන විධියේ ක්‍රියාදාමයන් අනාගතයට යොදා ගන්නවාද, මොන විධියේ ව්‍යුහයන් හඳුන්වා දෙනවාද කියන එකයි අපි කරන්න ඕනෑ.

අපේ රටේ බොහෝ කාලයක් තිබුණු කෙටි මතයක් තමයි අධිකරණවලට විනිසුරුවරුන් පත් කිරීමේදී, අධිකරණ පිළිබඳ නීති තැනීමේදී දේශපාලන ඇඟිලි ගැසීම් එනවා; අධිකරණය ස්වාධීන නැහැ කියන එක. මේ රජය අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් කටයුතු කළා. පසුගිය කාලය තුළ ව්‍යවස්ථා සභාවේ යෝජනා විමර්ශනය මත ජනාධිපතිතුමා සිදු කළ විනිශ්චයකාරවරුන්ගේ පත් කිරීම් පිළිබඳව කිසිම විවේචනයක් එල්ල වෙලා නැහැ. ඒකෙන් පේනවා අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ විශ්වාසය දිනෙන් දින ශක්තිමත් කර ගන්නට අපට හැකි වී තිබෙන බව. අපි ඒ ගැන ආඩම්බර වෙනවා. නමුත්, අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා වූ පමණින්ම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ගැන සෑහීමකට පත් වීමේ හැකියාවක් අපට නැහැ. අධිකරණ අපක්ෂපාතී විය යුතුයි, අධිකරණ කාර්යක්ෂම විය යුතුයි.

මේ කාරණය සම්බන්ධයෙන් පසුගිය කාලයේ ජනතාවගෙන් අපට එල්ල වුණු චෝදනාවක් තමයි එකම චෝදනාව සම්බන්ධව නඩු පැවරුවාට පසුව ධනය බලය තිබෙන අයට ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් කඩ වුණා කියලා පහළ අධිකරණවලට බලපෑම් කරලා ඔවුන්ට යම් ආකාරයක නිදහසක්, යම් ආකාරයක ස්වාධීන තත්ත්වයක් ඇති කර ගැනීමට අවස්ථාව ඇති කළා; ධනය බලය නැති පිරිස්වලට වෙනත් ආකාරයකට ක්‍රියා කළා කියන එක. මේ නිසා ජනතාවගෙන් චෝදනාවක් එල්ල වුණා අධිකරණය අපක්ෂපාතී නැහැ, අධිකරණය පක්ෂපාතී කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ කාර්යක්ෂමතාව පිළිබඳව ආංශික අධික්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කළා. එහිදී පෙනී ගියා අපේ රටේ නඩු හත් ලක්ෂයකට අධික ප්‍රමාණයක් ගොඩ ගැහිලා තිබෙනවා කියලා. ඒ වාගේම සාමාන්‍යයෙන් නඩුවක් විභාග කරලා විසඳුමක් දෙන්නට අවුරුදු 17ක් වාගේ කාලයක් ගත වෙනවා කියලා පෙනී ගියා. එහෙම නම් එතැනදී යුක්තිය ඉටු වීමක් සිද්ධ වෙන්නේ නැහැ. ඉඩම් නඩුවකට අවුරුදු 30ක් ගත වෙනවා; පරම්පරාවක කාලයක් යනවා. ඒ අනුව යුක්තිය ඉටුවීමක් සිද්ධ වෙන්නේ නැහැ. "යුක්තිය ඉටු වීම පමා වීම කියන්නේ යුක්තිය ඉටු නොවීම" කියලා අධිකරණයේ පිළිගත් මූලධර්මයක් තිබෙනවා. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, අධිකරණයේ නඩු විමසීම කාර්යක්ෂම කර ගන්නට. ඒ සඳහා මේ රජය පියවර කිහිපයක් තැබුවා. එක පියවරක් තමයි මේ පනත් කෙටුම්පත ගෙන ඒම. එතැනදී දේශපාලන වශයෙන් විරුද්ධ පක්ෂවල අයට පමණක් නොවෙයි ආණ්ඩුවේ අයටත් දඬුවම් දෙන්නට අපි නිර්භයව ඉදිරිපත් වෙනවා කියන එක පසුගිය කාලයේ මේ රජය පැහැදිලිව ඔප්පු කරලා පෙන්වුවා. ඒ අනුව ඉදිරි කාලයේදී මහ බැංකු බැඳුම්කර සිද්ධිය වැනි සිදුවීම් සඳහාත් මේ අධිකරණ ක්‍රියාවලිය පරිහරණය කරන්නට මේ රජය ක්‍රියා කරන්නට ඕනෑ; ක්‍රියා කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණවලට විනිසුරුවරුන් සහ නීතිපති දෙපාර්තමේන්තුවට නීති නිලධාරීන් ආකර්ෂණය නොවන ආකාරයේ ඉතාම දුර්වල පඩිනඩි තත්ත්වයන් තමයි එම ක්ෂේත්‍රවල තිබුණේ. වැටුප් සහ අනෙකුත් පහසුකම් අතින් ආකර්ෂණීය ස්ථාන බවට එම ක්ෂේත්‍ර පත් කරන්නට අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම උසාවි සංකීර්ණ සහ අනෙකුත් භෞතික දියුණුව සඳහා, විශේෂයෙන්ම කොළඹ උසාවි සංකීර්ණය වැඩිදියුණු කිරීම සඳහා අද විශාල සංවර්ධන වැඩසටහනක් ඇති කරලා තිබෙනවා. අධිකරණ සේවා කොමිෂන් සභාව ඇතුළු ඒ සේවාවන්වලට රජය පැත්තෙන් දෙන්නට තිබෙන තල්ලුව, රජය

පැත්තෙන් කෙරෙන්නට ඕනෑ ආයෝජනය, රජය පැත්තෙන් ලබා දෙන්නට ඕනෑ ධෛර්යය ලබාදීලා තිබෙනවා. එම නිසා අපි ඉතාම පැහැදිලිව ආයාචනා කරනවා අපක්ෂපාතීව, කාර්යක්ෂමව, වේගයෙන් නඩු විභාග කරලා රටේ යුක්තිය ඉටු කරන්නය කියලා. මොකද, මේ රට යුක්තිය ඉටු නොවීමේ ප්‍රශ්නය මත ඇති වෙන්න ලේ වැගිරුණු රටක්. එම නිසා යුක්තිය ඉටු කිරීමේ කාර්යාවලිය වේගවත් කරන්නට කියලා අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ක්‍රියාදාමයේදී නීති අධ්‍යාපනයේ සිට යම්කිසි ප්‍රමිතියකට අනුකූලව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය කරන්නට ඕනෑ. දහනවවෙනි සියවසේ අග භාගයේදී මේ රටේ වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවුවා. අද ඒ කොළඹ වෛද්‍ය විද්‍යාලය අනුක්‍රමයෙන් විශ්වවිද්‍යාලයක් බවට පත් වෙලා, පීඨ ගණනාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම දහනවවෙනි සියවසේ අග භාගයේදී මරදානේ තාක්ෂණික විද්‍යාලයක් ඇති කළා. ඒවා අද අනුක්‍රමයෙන් ඉංජිනේරු පීඨ බවට පත් වෙලා, ඒ ආකාරයට දියුණු වෙලා තිබෙනවා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උසස් පෙළ "ඉසඩ්" ක්‍රමාංකය මත. නමුත් මේ නීති විද්‍යාලය දහනවවෙනි සියවසේ අග භාගයේ බිහි වුණත් ඒ ආකාරයේ පරිණාමයක් ජේන්නට නැහැ. නීති විද්‍යාලයකුත් තිබෙනවා, නීති පීඨයකුත් තිබෙනවා. ඒ පොදු ක්‍රියාදාමය, පොදු ප්‍රමිතිකරණය නීති අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වුණේ නැහැ. මේ නිසා අද ඇතිවෙලා තිබෙන තත්ත්වය මොකක්ද? සාමාන්‍ය පෙළ විභාගය ඉතාම තරගකාරීව අවසන් කරන අය ඇදී යන ප්‍රධාන ක්ෂේත්‍ර වන්නේ වෛද්‍ය ක්ෂේත්‍රය, ඉංජිනේරු ක්ෂේත්‍රය සහ ගණකාධිකරණ ක්ෂේත්‍රයයි.

නීති ක්ෂේත්‍රයට එවැනි ශක්තිමත් තරගකාරී පිරිස් ඇදී යන්නේ නැහැ. එම නිසා අද යම් ප්‍රමිතිකරණයක් අවශ්‍යයි. නීති විද්‍යාල, නීති පීඨ වාගේම පිළිගත් නීති උපාධි ලබා දෙන ආයතන තිස් ගණනක් තිබෙනවා. මේ සියල්ල වෙනුවට අපොස උසස් පෙළට නීති විෂයය ඇතුළත් කර ඒ නීති විෂයයත් සමඟ ප්‍රමිතිය Z-score පදනම මත අරගෙන නීති ක්ෂේත්‍රය අධ්‍යාපනික අතිනුත් සැලසුම් සහගත කිරීමේ අවශ්‍යතාවක් අද තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
විමර්ශන කටයුතු සම්බන්ධව බලන විට, අද හොංකොං වැනි රටවල දූෂණ විමර්ශන කටයුතු කරන්නේ පොලිස් නිලධාරීන් හෝ නීති නිලධාරීන් පමණක් නොවෙයි. ඉංජිනේරුවන්, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දැනුම තිබෙන අය, විශේෂයෙන් දේපළ ඇගැයීම පිළිබඳ හැකියාව තිබෙන අය යන මේ සියලු දෙනාගෙන්ම සමන්විත පිරිසක් විසින් තමයි විමර්ශන කටයුතු කෙරෙන්නේ. පසුගිය කාලයේ ලංකාවේ සිදු වුණු ප්‍රබල වංචාවන්, විශේෂයෙන් මහාමාර්ග ක්ෂේත්‍රයේ, විදුලිබල ක්ෂේත්‍රයේ, ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ සිදු වුණු සිදුවීම් මේ රටේ පොලීසියට, මේ රටේ නීතිපති දෙපාර්තමේන්තුවට, මේ රටේ විගණකාධිපති දෙපාර්තමේන්තුවට විසඳන්න පුළුවන් ඒවා නොවෙයි. ඒවා ඉතාම සූක්ෂ්ම, තාක්ෂණික බරපතළ අපරාධ; සුදු කරපටි අපරාධ. ඒවා විසඳන්න මේ නිලධාරීන්ට හැකියාව නැහැ. තාක්ෂණවේදීන් මේ විමර්ශන ක්‍රියාවලියට සම්බන්ධ නොකර ගන්නා තාක්කල් මෙයින් යුක්තිය ඉටු වෙන්නේ නැහැ. පසුගිය දා අල්ලස් කොමසාරිස් ජනරාල්තුමා කියා තිබුණා, පසුගිය අවුරුදු විසිහතරටම පුද්ගලයින් හතරදෙනාටයි දඬුවම් ලැබිලා තිබෙන්නේ කියලා. මේකට ප්‍රධාන හේතුවක් තමයි විමර්ශනය සඳහා අවශ්‍ය කරන ශක්තිමත් තාක්ෂණවේදීන් අද එතැන නොසිටීම. ඒ නිසා මේ නඩුවලින් ඉතා පහසුවෙන් ලිස්සා යෑමේ හැකියාව තිබෙනවා. අධිකරණ ඇමතිතුමියත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු පිරිසත් එකතු වෙලා මේ සඳහා විධිමත් ක්‍රියාදාමයක් -මේ පිළිබඳ ප්‍රතිසංවිධානයක්- ඉදිරියේදී දියත් කරන්න කියලා මම යෝජනා කරනවා.

අවසාන වශයෙන්, මම තව එක කරුණක් සඳහන් කරන්න කැමැතියි. අපේ ව්‍යවස්ථාවට අනුව අධිකරණ තැනීමේ බලය මේ පාර්ලිමේන්තුවට ලබා දී තිබෙනවා. අපේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා, විහාර දේවාලගම් පනත සහ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් විශේෂ අධිකරණ පිහිටුවීම පිළිබඳ ව්‍යවස්ථාවේ සඳහන් කරලා තිබෙනවා. නමුත් එවැන්නක් අද සිද්ධ වෙලා නැහැ. එම නිසා බෞද්ධ විහාරස්ථාන සහ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සඳහා විශේෂ අධිකරණ ක්‍රියාවලියක් හඳුන්වා දෙන්න, විශේෂ අධිකරණයක් පිහිටුවන්න කියලා මම අධිකරණ ඇමතිතුමියගෙන් ඉල්ලා සිටිනවා. මම හිතන්නේ නැහැ කවුරුවත් ඒකට විරුද්ධ වෙයි කියලා.

මේ ක්‍රියාවලිය එක පියවරක් විතරයි. මේක දේශපාලන පළිගැනීම්වලට යොදා ගන්න ආයුධයක් නොවෙයි. මේ නීති ක්ෂේත්‍රයට, යුක්තිය පසිඳලීමේ ක්ෂේත්‍රයට යම් ඉලක්ක ලබා දීලා, එම ඉලක්කවලට අනුකූලව කරන ඇගැයීම් ක්‍රියාවලියකින් තොරව මේ නීති ක්ෂේත්‍රයෙන් යුක්තිය ඉෂ්ට වෙන්නේ නැහැ. රජයේ සියලුම ආයතනවලට යම් කිසි ක්ෂේත්‍රයක් තිබෙනවා.

විදුලිබල මණ්ඩලයට විදුලිය ලබා දෙන්න තිබෙනවා; දුම්රිය දෙපාර්තමේන්තුවට දුම්රිය සේවය ලබා දෙන්න තිබෙනවා; ජල සම්පාදන මණ්ඩලයට ජලය ලබා දෙන්න තිබෙනවා. ඒ වාගේ නීති ක්ෂේත්‍රයට යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තිබෙනවා. ඒ සඳහා කළ යුත්තේ කල් මැරීම නොවෙයි; වහාම යුක්තිය ඉටු කර ජනතාව තුළ තෘප්තියක්, නීතිය පිළිබඳ විශ්වාසයක් ඇති කිරීමයි. ඒ සඳහා ඉදිරි පියවර ගනු ඇතැයි කියා උදක්ම බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. S. Viyalanderan. You have eight minutes.

[பி.ப. 5.05]

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்திலே குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம் தொடர்பான எனது கருத்தையும் பதிவு செய்ய வாய்ப்புத் தந்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

உண்மையிலே ஒரு நாடு அபிவிருத்திப் பாதையில் செல்கின்றதென்றால் அந்த நாட்டிலே மக்கள் சுதந்திரமாகத் தங்களது நாளாந்த நடவடிக்கைகளை - கருமங்களை மேற்கொள்வதற்கு வலுவான, ஒழுங்கமைக்கப்பட்ட ஒரு நீதித்துறைக் கட்டமைப்பு இருக்க வேண்டியது அவசியமானது. அந்த அடிப்படையிலே காலம் தாமதிக்காமல், காலத்தை

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

වීண්விரயம் செய்யாமல், காலத்தை இழுத்தடிக்காமல் வழக்குகளைக் கொண்டுநடத்துகின்ற வகையிலே இன்று நீதித்துறை திருத்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டிருக் கின்றது. உண்மையிலே வழக்குகள் தொடர்பான கால இழுத்தடிப்பானது, குற்றவாளிகள் தப்பித்துக்கொள்ளவும் அவர்கள் செல்வாக்கைப் பயன்படுத்தி அதிலிருந்து விடுபடவும் உதவுகின்றது. இதனால் அந்த வழக்குகள் தொடுக்கப்பட்ட காரணம் வேறு விதத்தில் மாற்றமடைகின்ற நிலைக்குத் தள்ளப்படுகின்றது. ஆகவே, என்னைப்பொறுத்தளவில், கால இழுத்தடிப்பு இல்லாமல், காலத்தை வீண்விரயம் செய்யாமல் வழக்குகளை விசாரிப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்வது சாலச்சிறந்ததென்று நான் நினைக்கின்றேன்.

2015 ஜனவரி 08ஆம் திகதி இந்த நாட்டு மக்கள் ஓர் ஆட்சி மாற்றத்தைக் கொண்டுவந்தார்கள். அந்தவகையில், இந்த நாட்டின் மேதகு ஜனாதிபதி உட்பட ஆட்சி மாற்றத்தை விரும்பிய அனைவரும் "ஊழலை ஒழிப்போம்!" என்றே கூறிவந்தார்கள். ஆனால், இன்று இந்த அரசாங்கம் 3 வருடங்களைக் கடந்து சென்றிருக்கின்றது. இந்த ஆட்சி மாற்றத்தின்மூலம் பதவிக்கு வந்த அரசாங்கத்தின் பதவிக் காலமும் முடிவடைகின்ற நிலை வந்திருக்கிறது. இந்த நிலையில் பாரிய ஊழல் புரிந்தவர்கள், அது சார்ந்த விடயங்களில் ஈடுபட்டவர்கள் மற்றும் குற்றச்செயல்களில் ஈடுபட்டவர்கள் எந்தளவுக்குச் சட்டத்தின்முன் நிறுத்தப் பட்டார்கள்? எந்தளவுக்குக் கைது செய்யப்பட்டிருக்கிறார்கள்? என்பது கேள்விக்குறியாகவே இருக் கின்றது.

கடந்த சில மாதங்களுக்கு முன்பு ஜனாதிபதி செயலகத்திலே மத்திய வங்கியில் இடம்பெற்ற ஊழல் தொடர்பாக நடைபெற்ற கூட்டத்தில், எங்களுடைய கட்சி சார்பாக நானும் கலந்து கொண்டேன். இந்த ஊழல் தொடர்பான அறிக்கையானது, 943க்கும் மேற்பட்ட பக்கங்களைக் கொண்டிருக்கின்றது. அந்த நேரத்திலிருந்த சட்ட மாஅதிபர் அவர்கள் பேசும்போது, "இரண்டு தசாப்தங்கள் தாண்டிய காலத்தில் தொடுக்கப்பட்ட கிட்டத்தட்ட 75 வழக்குகளிலே நான்கே நான்கு பேர்தான் சட்டத்தின்முன் நிறுத்தப்பட்டிருக்கிறார்கள்" என்று சொன்னார். இந்த வகையில் கால இழுத்தடிப்பு இடம்பெற்றால், சில வேளைகளில் இந்த அரசாங்கம் மாறி அடுத்த அரசாங்கம் வருகின்றபொழுது இந்த அரசாங்கம் மேற்கொண்ட நடவடிக்கைகளிலிருந்து சம்பந்தப் பட்டவர்கள் தப்பித்துக் கொள்வதற்கு வாய்ப்பிருக்கின்றது. அதேநேரம், புதிதாக வருகின்ற அரசாங்கம் முன்னைய அரசாங்கத்தில் இடம்பெற்ற ஊழல் தொடர்பான விடயங்களைப் பற்றிப் பேசும்பொழுது அடுத்த அரசாங்கம் வந்துவிடுகிறது. அரசாங்கங்கள் இவ்வாறு மாறிக்கொண்டிருக்கின்றனவே ஒழிய, உண்மையாகவே ஊழல் புரிந்தவர்கள் எந்தளவுக்குச் சட்டத்தின்முன் நிறுத்தப் பட்டிருக்கின்றார்கள் - கைது செய்யப்பட்டிருக்கிறார்கள் என்பது கேள்விக்குறியாகவே இருக்கின்றது. இன்று பாரிய ஊழல் புரிந்தவர்கள் தங்களுடைய அரசியல் செல்வாக்கால், பண பலத்தால் சுதந்திரமாக நடமாடுகின்ற நிலைமை இருக்கின்றது. அதேநேரம், இந்த நாட்டிலே சாதாரணமாக சிறு குற்றங்களைப் புரிந்தவர்கள் விரைவாகக் கைதுசெய்யப்படுகின்ற நிலைமை தொடர்ந்திருக்கின்றது. எமது நாட்டில் மத்திய வங்கியில் இடம்பெற்ற ஊழல் மோசடியானது, தென்னாசியாவிலே வங்கிகள் தொடர்பில் இடம்பெற்ற ஊழல் மோசடிகளில் மிகப் பெரியதாக இருக்கின்றது என்றுதான் நான் நினைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்தில் கடந்த 03 தசாப்த காலங்களில் எத்தனையோ தொழிற் சாலைகள் அழிக்கப்பட்டுத் தூர்ந்துபோயிருந்தன. யுத்தத்தினால் அழிவுக்குட்பட்ட அந்தப் பகுதியிலே ஒரு தொழிற்சாலையையாவது திறந்து தாருங்கள் என்று இந்த நல்லாட்சி அரசிடம் நாங்கள் கடந்த 03 வருடங்களாகப் பல கோரிக்கைகளை - பல விண்ணப்பங்களை முன்வைத்து வந்திருக்கின்றோம். அதேநேரம், நாங்கள் இந்த அரசினுடைய நடவடிக்கைகளுக்கும் அதன் ஒவ்வொரு வரவு செலவுத் திட்டத்திற்கும் ஆதரவு வழங்கிக்கொண்டிருக்கின்றோம். எனினும், அங்கு எந்தத் தொழிற்சாலையும் திறக்கப் படவில்லை. ஆனால், மத்திய வங்கி ஊழல் தொடர்பில் பேசப்படுகின்ற அர்ஜுன் மகேந்திரன் அவர்களுடைய மருமகனான அர்ஜுன் அலோசியஸ் அங்கே 450 கோடி ரூபாயில் 'எதனோல்' - சாராய factoryஐத் திறந்து, தொழில் வாய்ப்பு தரப்போவதாகக் கூறுகின்றார். அதனை நாங்கள் ஏற்றுக்கொள்ள முடியாது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

அதுமாத்திரமல்ல, இன்று பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு, 02 - 03 தசாப்த காலமாகத் தமது பிள்ளைகளைப் பார்க்காமல், மனைவியைப் பார்க்காமல், தாய், தகப்பனைப் பார்க்காமல் எத்தனையோ கைதிகள் சிறைகளிலே வாடிக்கொண்டிருக்கின்றார்கள். ஆகவே, இவ்வாறானவர்கள் தொடர்பான விடயத்திலும் இந்த அரசு கால இழுத்தடிப்பைச் செய்யாமல் வேகமாக நடவடிக்கை எடுக்க வேண்டும். அதேநேரம், குறிப்பிட்டவர்களைப் பழிவாங்கும் நோக்கத்துடன் திட்டமிட்டு இந்தச் சட்டத் திருத்தங்களைத் கொண்டுவரக்கூடாது; 03-04 தசாப்தங்களாக சிறையில் வாடுகின்ற அந்தக் கைதிகளை வேகமாக வெளியிலே கொண்டுவருவதற்கு ஏற்றவகையில் இருக்க வேண்டும்.

அதுமாத்திரமல்ல, இன்று இந்த நாட்டிலே இடம் பெறுகின்றதான குறிப்பாக, பெண் பிள்ளைகள் மீதான பாலியல் துஷ்பிரயோகங்கள் மற்றும் மிகக் கொடூரமான வன்புணர்வுகள், வன்முறைகள், அடாவடித்தனங்கள் என்பவற்றுக்கு எதிராகக் கடுமையான சட்டங்களைக் கொண்டுவந்து, அது தொடர்பான வழக்குகளையும் கால இழுத்தடிப்பு இல்லாமல், விரைவாக விசாரித்து, குற்றவாளிகளுக்கு மிகக் கடுமையான தண்டனைகளை வழங்கவேண்டும். அவ்வாறானவர்களுக்குத் தூக்குத் தண்டனை வரை தீர்ப்பு வழங்கப்பட வேண்டும். எனவே, மிக முக்கியமான இந்த விடயத்திலும் கவனம் செலுத்தவேண்டு மெனக் கேட்டுக்கொண்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයශේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක් වෙනි කර තිබෙනවා.

[අ.භා. 5.12]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු තුන හතරකට පස්සේ නැවතත් විපක්ෂයේ අසුන්ගෙන කථා කරන්න ලැබීම ගැන මා ඉතා සන්තෝෂ වනවා. මීට කලිනුත් 2004 ඉඳලා අවුරුදු ගණනාවක්ම අපි විපක්ෂයේ සිටිමින් වැඩ කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08වැනි දා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපතිතුමා බවට පත් වුණා. ඉන් පස්සේ එතුමා අපේ පක්ෂයේ නායකයා බවට පත් වුණා. 2015 අගෝස්තු මාසයේ 17වැනි දා පැවැති මැතිවරණයෙන් මේ රටේ කිසිම පක්ෂයකට රජයක් පිහිටුවීමේ බලය ලබා ගන්න බැරි වුණා. ඒ නිසා මෛත්‍රී පාලනයක් සඳහා වන ශක්තිමත් ස්ථාවර ආණ්ඩුවක් සාදා ගැනීම සඳහා මේ රටේ ප්‍රධාන පක්ෂ දෙක එකට එකතු කරන්න ජනාධිපතිතුමාට සිද්ධ වුණා. මේ පක්ෂ දෙක අවුරුදු 60ක් විතර මරා ගත්ත පක්ෂ දෙකක්; ගහ ගත්ත පක්ෂ දෙකක්; ප්‍රතිපත්තිමය වශයෙන් වෙනස් පක්ෂ දෙකක්. සමහර කාරණා පිළිබඳව දුන්නු පොරොන්දු අනුව එතුමාට සිද්ධ වුණා, මේ පක්ෂ දෙක එකට එකතු කරලා, මන්ත්‍රීවරුන් 47දෙනෙකු හිටපු එක්සත් ජාතික පක්ෂයෙන් අගමැතිවරයකු පත් කරලා, දින සියයක වැඩ පිළිවෙළක් ස්ථාපිත කරලා ඉදිරියට යන්න. ඒ ක්‍රියාදාමය තුළ එතුමා උත්සාහ කළා, එතුමා පොරොන්දු වූ පරිදි විශේෂයෙන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හෝ එහි බලතල අඩු කිරීම වාගේම, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අලුත් ක්‍රියාදාම ගණනාවක් ඉෂ්ට කරන්න. ඊට පස්සේ තමයි අගෝස්තු මාසයේ 17වැනි දා තිබුණු මැතිවරණයෙන් කිසිම පක්ෂයකට තනි බලයක් නැති, එකම පක්ෂයකටවත් ආසන 113ක් ලබා ගන්න බැරි තත්ත්වයක් ඇති වුණේ.

මා කියන්න කැමැතියි, ඒ කාලය තුළ ගෙනාපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පොරොන්දු වුණු කාරණා වෙනුවට -ඒ තිබුණු අස්ථාවර තත්ත්වය තුළ- අග්‍රාමාත්‍යවරයකු අයින් කරන්න ජනාධිපතිවරයාට තිබුණු බලය අහෝසි කරන තැනට, එහෙම නැත්නම් අරාජිකත්වය රජ කරන තැනට කටයුතු සිදු වුණා. ඒ නිසා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රට අරාජික කිරීම සඳහා ඇති කළ එක් ක්‍රියාදාමයක් විධියටයි මා දකින්නේ. එහි යම් යම් සාධනීය කාරණාත් තිබුණා. එතැනින් පස්සේ අගෝස්තු 21වැනි දා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් අතර ගිවිසුමක් අත්සන් කෙරුණා. කාරණා 10ක් පිළිබඳව ඒ ගිවිසුමේ සාකච්ඡා වෙලා තිබෙනවා. අපි අවුරුදු දෙකකටයි ඒ ගිවිසුම ගෙනාවේ. ඉදිරි අවුරුදු 3ක කාලයත් අපි ඒ ගිවිසුම සමඟම ඉස්සරහට යනවාද, නැද්ද කියන කාරණය තීරණය වෙන්නේ ඒ අවුරුදු 2ට පස්සේ ගන්නා වූ තීන්දු මතයි කියන කරුණ අපි සාකච්ඡා කළා. ඒ අනුව, විවිධ කාරණා පිළිබඳව අපි සාකච්ඡා කළා; අපි අමාත්‍ය ධුර භාරගෙන වැඩ කළා. අපට අවශ්‍ය වෙලා තිබුණා, අස්ථාවර වුණු රට නැවත ස්ථාවර තත්ත්වයට ගෙනෙන්න. හොඳ චේතනාවෙන් අපි ඒකට සහයෝගය දුන්නා. අවුරුදු දෙකක කාලයක් තුළ, ඒ බලාපොරොත්තු ඉටු කරන්න බැරි වුණාම පක්ෂයක් විධියට අපි යම් යම් තීන්දු තීරණවලට ඇවිල්ලා සිටියා, මේ ආණ්ඩුවෙන් අපි ඉවත් විය යුතුයි කියලා. ඒ අනුව, ඇති වුණු තත්ත්ව පිළිබඳව සාකච්ඡා කරලා තමයි කටයුතු කළේ. පසු ගිය අගෝස්තු 22 වැනි දා වන කොට ඒ ගිවිසුම අහෝසියි. අතිගරු ජනාධිපතිතුමා ඉල්ලීමක් කළා, දෙසැම්බර් වනතුරු තව මාස කීපයක් ඉවසන්න කියලා. අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු කළා. එතැනින් පසුව ඇති වුණු තත්ත්වය එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපට ප්‍රතිපත්තිමය වශයෙන් තව දුරටත් ඉස්සරහට යන්න බැහැයි කියන කාරණය තමයි අපි ඉදිරිපත් කළේ.

ඒ ගිවිසුමෙත් කාරණා විශාල ප්‍රමාණයක් තිබුණා. එයින් කාරණාවක්, දෙකක් ගැන මා කථා කරන්න කැමැතියි. එහි සඳහන් වුණා, ශක්තිමත් මධ්‍යම පන්තියක් බිහි කරන අතර සියලුදෙනාට සාධාරණ සමාජ ප්‍රතිලාභ ලබා දීම සහතික කිරීම, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයේ පදනම පුළුල් කෙරෙන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයක් පවත්වා ගෙන යා යුතුය; ආර්ථිකය තරගකාරී මට්ටමට ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කරන පියවර ගැනීම, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් දිරි ගැන්වීම කියන කාරණා.

ඒ විතරක් නොවෙයි, මනාප ක්‍රමය අහෝසි වන පරිදි සෑම මැතිවරණ කොට්ඨාසයකටම මන්ත්‍රීවරයකු හිමි වන, සියලු ජන කොටස් හා විවිධ දේශපාලන මතවලට සුදුසු නියෝජනයක් හිමිවන නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම කියන කාරණයත් තිබුණා. ඒ කියන්නේ, 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවත් කථා කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. දූෂණ මැඩ පැවැත්වීමේ ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීම වාගේ ක්‍රියාදාම ගණනාවක් පිළිබඳවත් එහි සඳහන් වුණා. ප්‍රධාන සංවර්ධන ප්‍රතිපත්ති සහ ක්‍රියාදාම අමාත්‍ය මණ්ඩලය මඟින් තීරණය කරනු ඇත යනාදී වශයෙන් කාරණා ගණනාවකට ප්‍රතිපත්තිමය වශයෙන් අපි එකඟ වුණා. හැබැයි, අපි දිගින් දිගටම දැක්කා, එක්සත් ජාතික පක්ෂයේ සියලු මන්ත්‍රීවරු, ඇමතිවරු නොවෙයි, යම් පුද්ගලයන් විසින් දිගින් දිගටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතවාදවලට, මන්ත්‍රීවරුන්ට විවිධ ප්‍රහාර එල්ල කරමින්, "මේක එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්, අපි ඒ ආණ්ඩුව ඇතුළේ ඉඳගෙන කුමන්ත්‍රණ කරනවා, යමක් ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ" කියලා මතවාදයක් රට ඇතුළේ පැතිරුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි අපේ ප්‍රතිපත්තිමය කාරණා මත මේවා සමඟ ඉදිරියට යන්නේ කොහොමද කියන එක තමයි අපට තිබුණු ප්‍රශ්නය වුණේ. නමුත් එය ඉෂ්ට වුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි. කාරණා විධියට ගත්තාම, "දින සියයකින් ශක්තිමත් රටක්" කියන රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් රට ශක්තිමත් කරන ක්‍රියාවලිය පටන් ගෙන දින 50ක් ගතවන කොට, මහ බැංකුව කොල්ලකෑමේ වැඩ පිළිවෙළකට ගියා. යම් සම්බන්ධතා විශාල සංඛ්‍යාවක් එක්ක ආණ්ඩුවේම; රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේම ඉතාම හිතෛෂී අර්ජුන් මහේන්ද්‍රන් කියන පුද්ගලයාව පිටරට ඉඳලා මෙහි ගෙන්වා, ඔහු විසින් කළ ක්‍රියාදාමයන් නිසා රට තුළ විශාල අර්බුදයක් ඇති වුණා. අදටත් එය ආර්ථික වශයෙන් රට අර්බුදයකට යන්න හේතුපාදක වෙලා තිබෙනවාය කියන එක අපි විශ්වාස කරනවා. ඒ අවස්ථාවේ අපේ පක්ෂය විධියට මහින්ද අමරවීර මැතිතුමා තවත් පිරිසක් එක්ක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා පැමිණිල්ලක් කළා. ඒකාබද්ධ විපක්ෂයේ අපේ සහෝදරවරු සියලු දෙනා මහ බැංකුව ඉදිරිපිටට ගිහිල්ලා උද්ඝෝෂණ කළා. ඊට අමතරව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි විශාල පිරිසක් එකතුවෙලා සාකච්ඡා කරලා තමයි මේ කොමිෂන් සභාව පත් කළේ. මේ කොමිෂන් සභාවේ තීන්දු තීරණ ක්‍රියාත්මක වීමට තිබෙද්දී ඒ සියල්ලම යටපත් කරන ක්‍රියාදාමයක් මේ තුළින් ඇති වුණා. ඒ නිසා අපට ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රශ්න ගණනාවක් ඇති වුණා. ඒ විතරක් නොවෙයි, මේ සම්බන්ධයෙන් විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන තැනට කටයුතු යෙදුණා. අපි සාකච්ඡා කළ කරුණුත්, මේ විශ්වාස භංග යෝජනාවේ අඩංගු කරුණුත්, මහ බැංකු බැඳුම්කර පිළිබඳව තිබෙන්නා වූ සියලු කාරණාත් අනුව හෘද සාක්ෂියට එකඟව ඒ ගෙනාපු විශ්වාස භංග යෝජනාවට විරුද්ධ වෙන්න කිසිදු කාරණයක් අප අතර තිබුණේ නැහැ. ඒ නිසා ඒකට පක්ෂව ඡන්දය දීලා, අපි අපේ අමාත්‍ය ධුරවලින් ඉල්ලා අස් වෙනවාය කියලා තීන්දුවක් ගත්තා. ඊයේ පෙරේදා එක ඇමතිවරයෙක් කියලා තිබුණා, එයා කියපු නිසා තමයි මේ සියලු

[ගරු දයාසිරි ජයසේකර මහතා]

දේවල් සිද්ධ වුණේ කියලා. එයා කියපු නිසා ගොඩක් දේවල් සිද්ධවෙලා තිබෙනවා. එයා හිතාගෙන ඉන්නේ එයා තමයි මේ ඔක්කොම කරන්නේ කියලා. එයා කිව්වාම ඉන්න හෝ එයා කිව්වාම යන්න හෝ නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතවාදයත් එක්කයි අපි වැඩ කරන්නේ කියන එක මම කියන්න කැමැතියි. "කෝකටත් තෙලය" විධියට හැම දෙයක්ම කියන එක්කෙනෙක් ඉන්නවා නේ. අන්න එයාටයි මම මේ කියන්නේ. පුද්ගලයෙක් විධියට මම ඒකට සූදානම් නැහැ. ඒ නිසා අපි මේ තීන්දුව අරගෙනයි එළියට ආවේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපේ මන්ත්‍රීවරු 16 දෙනා විපක්ෂයේ ඉඳගෙන වැඩ කරන්න තීන්දුවක් ගෙන තිබෙනවා. ඒ අනුව ඉදිරියට විපක්ෂයේ වැඩ කටයුතු කරනවා. ඒ වාගේම විපක්ෂයේ සිටින අපේ ආදරණීය සහෝදරවරුන් එක්ක එකතුවෙලා අපි ඉස්සරහට ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳව තීරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මතු කළ මේ කාරණා තුළ අපට භය නැතිව කථා කරන්න පුළුවන් කාරණා ගණනාවක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩි 12ක් තිබුණා.

එම කාරණා තමයි මට මූලික වශයෙන් කියන්න තිබෙන්නේ. කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසා මම ඊළඟට අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ගැනත් විනාඩියක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, මේක ගෙන ඒමේ පරමාර්ථය බලන්න. මේ පනත් කෙටුම්පත ගෙන එන්න කලින් සමහර ඇමතිවරු කිව්වා "ඒකාබද්ධ විපක්ෂයේ කට්ටිය තව සති දෙකයි ඉන්නේ. ඒ අයට හිරබත් කන්නයි වෙන්නේ, අපි බලා ගනිමු, මේ ගෙන එන අධිකරණ පනත් අනුව අපි ත්‍රී පුද්ගල උසාවි හැදුවාම මේ අය හිරේ දමනවා" කියලා. කොයි තරම් සාර්ථක පනත් කෙටුම්පතක් විධියට අද මෙය ඉදිරිපත් වුණත් පසු ගිය මාස හයක විතර කාලය තුළ කථා කළ දේවල් බැලුවාම, පත්තරවල තිබුණ ඒවා කියෙව්වාම, මේ පාර්ලිමේන්තුවේ කළ විවාද බැලුවාම මෙහි යටි අරමුණු මොනවාද කියලා පෙනෙනවා. ඒ නිසා තමයි අපි දිගින් දිගටම කිව්වේ මේ පනත් කෙටුම්පතේ - අපේ තලතා අතුකෝරල මැතිනිය අපි බොහොම ආදරය කරන කෙනෙක්.- භය වැනි උපලේඛනයට අතුළත් කළ යුතු මිනී මැරුම් පිළිබඳව ප්‍රශ්න ගණනාවක් අද ඇතිවෙලා තිබෙනවා. මරණ දඬුවම ක්‍රියාත්මක කරන්නේ නැතිව මිනිස්සු හිරේ ඉන්නවා. අපි ගිහිල්ලා බැලුවාම ඒ මිනිස්සු කියනවා "අපිව මරලා දමන්න සර්" කියලා. ඒ අයගේ අභියාචනා නඩු තවම අභියාචනා අධිකරණයේ තිබෙනවා. අවුරුදු නවයක් නඩුව අභියාචනාධිකරණයේ. අවුරුදු නවයක් හිර ගෙදර. ඒ නඩුව අභියාචනාධිකරණයෙන් ප්‍රතික්ෂේප වුණාම දෙන නඩු තීන්දුව අනුව තව අවුරුදු දහයක් පහළොවක් ඉන්න වෙනවා. ඒ නිසා මම ඔබතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ සංශෝධන පනත් කෙටුම්පතට මිනී මැරුම් සම්බන්ධව බරපතළ කාරණා ඇතුළත් කරන්න කියලා. මම අහන්න කැමැතියි, මේ ක්‍රියාදාමය තුළ මේ නඩු පිළිබඳව තිබෙන්නා වූ කාරණා අපි ගොනු කරන්නේ කොහොමද කියලා. ඉස්සරවෙලා ගන්නේ 2000 සිදු වුණු සිද්ධියකට අදාළ නඩුවද; නැත්නම් 2010 වුණු සිද්ධියකට අදාළ නඩුවද? 2012 වුණු සිද්ධියකට අදාළ නඩුවද?

කවුද මේක තීරණය කරන්නේ? මොකක්ද ක්‍රමවේදය? දිනය පිළිබඳව තීරණය කරනවාද? නැත්නම් නීතිපතිවරයාට හිතෙන හිතෙන විධියට වැඩ කරනවාද? නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට ඕනෑ විධියට වැඩ කරනවාද? මොකක්ද මේකේ ක්‍රියාදාමය? මෙන්න මෙතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ වැඩ පිළිවෙළ තුළ යම් නඩු ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා වන උත්සාහයක් තිබුණත් මිනීමැරීම්වලින් ඇති වෙලා තිබෙන තත්ත්වයන් පිළිබඳ කාරණය මේකට ඇතුළත් වෙලා නැහැ. ඒ නිසා එයත් ඇතුළත් කරන්න කියලා අපි ඉල්ලනවා. එතකොට අඩුම තරමේ මෙහි තිබෙන සැක සංකා කිහිපයකින් හරි මිදෙයි. ඒ විතරක් නොවෙයි. මේ අවශ්‍ය නඩු ටික ගන්නේ මොන විධියටද කියලා ක්‍රමවේදයක් සකස් කරන්න. ඒ වාගේම මම කියන්න කැමැතියි, අපේ විපයදාස රාජපක්ෂ මැතිතුමා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව තත්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපයදාස රාජපක්ෂ මැතිතුමා පැහැදිලිව කිව්වා, "No legal provisions in the Constitution for a special court." කියලා. මේ සම්බන්ධව කිසිම නීතිමය ප්‍රතිපාදනයක් මේ ව්‍යවස්ථාවේ නැහැ කියලා එතුමා පෙන්වලා දුන්නා. ඇත්තටම ඒ පෙන්වා දීමත් එක්ක තමයි, යම් පසු බැසීමක් ඇති කරලා අඩුම තරමේ ඊට පහළ තිබෙන නඩු සම්බන්ධවත් කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කර ගන්න හැකියාව ලැබුණේ. ඒක නිසා අපේ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාත් කිව්වා වාගේ මෙහි තිබෙන ද්වේෂ සහගතභාවය වැළැක්වීම සඳහා කළ යුතු වන්නේ බොහොම පැහැදිලිව නිර්ණායක සහිතව, මිනීමැරුම් චෝදනා සඳහා තිබෙන්නා වූ මිනී මැරීමට අදාළ කාරණාත් මේකට ඇතුළත් කිරීමයි. මෙය ඉෂ්ට කරන්න පුළුවන් නම් හොඳයි කියලයි මම හිතන්නේ. එහෙම වුණොත් මෙය ශක්තිමත් පනත් කෙටුම්පතක් බවට පත් වෙයි කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නවින් දිසානායක මැතිතුමා. ඔබතුමාට විනාඩි හතක් වෙන් කරලා තිබෙනවා.

[5.25p.m.]

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

Mr. Presiding Member, it is a very privileged occasion for me to speak on the Second Reading Debate of the Judicature (Amendment) Bill. Actually, this is not a new thing or a magic because this is the setting up of a special court to prosecute white-collar crimes. The Hon.

Dayasiri Jayasekara wanted the provisions for murder cases also to be included in this, but actually, only the provisions for white-collar crimes have been included in this. There are white-collar crimes which come under the Penal Code also like cheating offences, criminal breach of trust, cheating by falsification, theft, offences on money laundering and bribery. So these white-collar crimes that have been held up needed to be expedited for justice to take place.

Sir, as you know, one of the important tenets of law is how the legal process works very quickly. That is very important. The legal process has to move very fast; it cannot be held up for two, three years. Once a 'B' Report or an indictment is filed, there has to be a very quick legal process. Therefore, a Special High Court for Commercial Law was established about 15 years ago. I myself as a young lawyer started my practice mostly in the Commercial High Court of Sri Lanka in the Western Province. So, there is nothing new in this. Although the Opposition tries to make it out to be that the cases are going to be political cases, that is not the case, because ultimately the Attorney General will have to present the case to court with the evidence before him and of course, the person who is charged has a very equal right to defend himself.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ මෙපමණයි. මේ රටේ කිසිම දේශපාලන පළිගැනීමකට උසාවියකට ගිහින් සාර්ථක විසඳුමක් ලබාගන්න බොහෝ දුරට අමාරුයි. මම ඒක දැකලා තිබෙනවා. මගේ පියා ගැන කථා කරනකොට මට මේ කාරණය මතක් වෙනවා. එක්සත් ජාතික පක්ෂ රජයෙන් එතුමා අයින් වෙලා ගියාට පස්සේ, රැල්ෆ් බුල්ජන්ස් කියන පුද්ගලයා අතුරුදහන් කළාය කියා එවකට තිබුණු ප්‍රේමදාස ආණ්ඩුව එතුමාට ඉතාම සාවද්‍ය නඩුවක් ගෙනාවා. ඒක සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණයට ලක් වුණු තීරණයක්. අන්තිමට එතුමාට උසාවියට ගිහින් තමන්ගේ හොඳ නාමය ආරක්ෂා කර ගන්න සිද්ධ වුණා. නමුත් එතුමාට ඒ අවස්ථාව තිබුණා. එතුමාට හොඳ දක්ෂ නීතිඥ කණ්ඩායමක් හිටියා. රැල්ෆ් බුල්ජන්ස් කියන පුද්ගලයා ඉස්සුවාය කියා කිසිම සාක්ෂියක් තිබුණේ නැහැ. හැම දෙයක්ම දිහා දේශපාලන කෝණයකින්ම බලලා වැඩ කරන්න බැහැ.

Now, in this instance also, if the Government or any government wants to prosecute somebody, there has to be a certain body of evidence against that person. For example, if somebody is laundering money, he knows very clearly that he has to set up a system. Under the Prevention of Money Laundering Act, certain companies have to be established; dummy companies have to be established; those money has to be cleared through dummy companies and it has to come to certain banks. Then, you can trace it.

I still believe that the Attorney General's Department is a very good department and an independent department. So, it can make these decisions. Our Government is honestly not pressurizing the Attorney General's Department to prosecute people. What we want is that the legal process must move forward expeditiously and very quickly, if evidence is there. We find that the legal process is not fast enough to move forward in these matters. Actually, the legal process is very slow in Sri Lanka. It is very frustrating even for lawyers like us to work in this legal system, because it takes years for a case to be heard.

Now, some of these cases against politicians, particularly members of the Rajapaksa family, have come before Courts, then, they are delayed for another three months; they are laid by; again they are called and again they are delayed for another four months. So, that is what we are objecting to. It can be A, B, C, D or E. What we want is a very expeditious process where the law is properly adhered to and people are given the choice and the freedom to defend themselves.

Therefore, I welcome this Bill and hope that the Judicature (Amendment) Bill will be a historic Bill so that all these white-collar crimes - embezzlement, fraud, money laundering, cheating, corruption - in Sri Lanka can be looked into and cases can properly be prosecuted very quickly through the establishment of this Special Court.

I hope the Opposition also sees it in this light. It is not an act to make political victimization, because ultimately, at the end of the day, it is a court - in a court, there are two sides. The judge must be independent, the two opposing counsels must be strong and the judgements must be based on the evidence that is there. So, it is that procedure that is still in place. You cannot take that procedure away. So, I think on the long run, this will be a Special Court that will try, hear and determine the trials of the white-collar crimes which are rapidly increasing in our society. I think this is a good move and we, in the Government, welcome it and hope that the Judicature (Amendment) Bill will be passed today.

Thank you, very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.32]

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත ගැන මගේ අදහස් ඉදිරිපත් කරන්න විනාඩි 7ක කාලයක් වෙන් කිරීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වනවා. මෙවැනි පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන කොට අප ඇත්ත වශයෙන්ම යම්කිසි මට්ටමකට ප්‍රවේශම් වන්න ඕනෑ කියායි මා හිතන්නේ. මොකද, මේ වාගේ පනත් ඉදිරිපත් කර තිබෙන ආකාරය අපි අපේ ඉතිහාසය තුළින් දැක තිබෙනවා. මේ පනත්වල අරමුණ ඉෂ්ට වනවාද කියන එක තමයි මෙහි තිබෙන සැකය. මේ පනත් කෙටුම්පත ගැන කථා කළ ආණ්ඩු පක්ෂයේ හුඟක් අය දිහා බැලුවාම, ඒ අය ගැන කියන්න තිබෙන්නේ මොකක්ද? "හක්කෙ බුදු රැස් බොක්කෙ දඩ මස්" කියා අපේ පැත්තේ කථාවක් තිබෙනවා නේ. මේ ගැන කරුණු ඉදිරිපත් කළ අය දිහා බැලුවාම,

[ගරු තාරක බාලසූරිය මහතා]

ඒ අයත් ඒ වාගේ අය තමයි. ඇත්තටම මේ අයට සද්භාවයක් තිබෙනවා නම් මේ ආණ්ඩුව බලයට පත් වෙලා මාසයක් යන්න ඉස්සර වෙලා මහ බැංකු හොරකම කරනවාද කියන එක ගැන අප මෙහිදී ප්‍රශ්න කරන්න ඕනෑ. අපි ඉතිහාසයේත් මේ වාගේ දේවල් දැක තිබෙනවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට විරුද්ධව මේ වාගේ කමිටුවක් පත් කළා. ඉන් පසුව එතුමිය අධිකරණයට ගිහින්, එය නීති විරෝධියි කියා කිව්වාට පසුව අධිකරණය එය පිළිගත්තා; එතුමියට යම්කිසි සහනයක් දුන්නා. හැබැයි මේ පාර්ලිමේන්තුවම ඉන් පසුව මොකක්ද කළේ? අපේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් ඒ කමිටුවක සාමාජිකයකු හැටියට සිටියා. විමලරත්න නමැති ඒ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයාට විරුද්ධව මේ පාර්ලිමේන්තුවේ වෙනම නඩුවක් පවත්වාගෙන ගියා. ඒ විතරක් නොවෙයි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු හැටියට පත්ව සිටි කොලින් තෝමේ මහත්මයාට විරුද්ධවත් වෙනම නඩුවක් පවත්වාගෙන ගියා. එහෙම නම්, මේ පනත් කෙටුම්පතේ මොනවා තිබුණත් මෙහි අරමුණ ගැන යම්කිසි විධියක සැකයක් අපිට තිබෙනවා.

මට කලින් කථා කළ අපේ සුමන්තිරන් මන්ත්‍රීතුමාත්, තවත් මන්ත්‍රීවරුත් මෙහිදී පෙන්නුවා, දූෂණය තුරන් කරන්න අපි ඇත්ත වශයෙන්ම යම්කිසි විධියකට නීති ගෙනෙන්න ඕනෑය කියා. දූෂණය තුරන් කරන්න බැරි මූලික හේතුව තමයි impunity. එනම්, කවුරුන් හෝ යම් වැරැද්දක් කළොත් ඒ වරද කළ කෙනාට ඒ චෝදනාවෙන් කොහොම හරි නිදහස් වන්න හේතු කාරණා තිබීම. අද ලෝකයේ තිබෙන රටවල් දිහා බැලුවාම මමත් විශ්වාස කරනවා දූෂණය නැති රටවල් තමයි සංවර්ධනයෙන් යම්කිසි මට්ටමකට ඉදිරියට ගිහින් තිබෙන්නේ කියා. නමුත් මා හිතන්නේ අපි මෙහිදී ප්‍රවේශම් වන්න ඕනෑ කියායි. හුහක් වෙලාවට ඒ රටවල් දියුණු වෙලා තිබෙන ආකාරය දිහා බැලුවොත්, ඊට බලපාන මීටත් වඩා කාරණා -ඓතිහාසික කාරණා- තිබෙනවා. අවුරුදු 500ක් වාගේ අධිරාජ්‍යවාදය පැතිරූ රටවල් ඒ අවුරුදු 500ක කාලයේදී දියුණු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පිළිබඳව වැඩිදුර කථා කරන්න යන්නේ නැහැ. නමුත් ඕනෑම රටක් යහ පාලනය ස්ථාපිත කරන්න යම්කිසි විධියකට උත්සාහ කරන්න ඕනෑ. මොකද, ඒක තමයි හරි දේ වන්නේ. මෑතකදී අපි රූපවාහිනී ප්‍රවෘත්ති තුළින් දැක්කා, ජනාධිපතිතුමාගේ ලේකම්වරයකු රුපියල් කෝටි දෙකක පගාවක් ගන්න ගිහින් අත් අඩංගුවට ගන්නවා. ආයෝජකයකු අපේ රටට ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් ද මිලියන 110ක් ද කොහේද ගෙනෙන්න හදන අවස්ථාවක තමයි ඒ පගාව අරගෙන තිබෙන්නේ. මේ වාගේ නිලධාරීන්ගේ කටයුතු සාධාරණීකරණය කරන්න අපට කොහොමවත් බැහැ කියන මතයේ අපි සියලුදෙනා ඉන්නවාය කියන එක තමයි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය බලයට පත් වුණාට පසුව අපි දැක්කේ මොකක්ද? මේ රජය බලයට පත් වුණාට පසුව මේ පාර්ලිමේන්තුව යම්කිසි විධියකට විකෘති කළා. ඒ සම්ප්‍රදායයන් ඔක්කෝම කඩ කරනවා අපි දැක්කා. ඒ වාගේම, විපක්ෂ නායකකම - Leader of the Opposition - අපේ සම්පන්දන් මහත්මයාට දුන්නා. ඒ හරහා ව්‍යවස්ථාදායක සභාව යම්කිසි මට්ටමකින් විකෘති කරන්න පුළුවන් වුණා කියා අපි දැක්කා. ඒ වාගේම මේ රජය බලයට පත් වෙලා ප්‍රජාතන්ත්‍රවාදය යම්කිසි විධියකට විකෘති කරනවා අපි දැක්කා. මැතිවරණ කල් දැම්මා. ජනතා විමුක්ති පෙරමුණත් මැතිවරණ කල් දැමීමට පක්ෂව ඡන්දය දුන්නා. එදා ඔබතුමන්ලා කිව්වේ පළාත් සභා මැතිවරණය මාස 4කින් පවත්වනවා කියලායි. දැන් පළාත් සභා මැතිවරණය අවුරුදු දෙකහමාරකටවත් පවත්වන්න බැරි වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙය ඒ විකෘතියේම තවත් කොටසක් කියන එක තමයි මා තමුන්නාන්සේලාට පැහැදිලි කරන්න බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලයට පත් වූ මේ රජයේ තිබෙන මූලික අවශ්‍යතාව තමයි බලය බෙදා දීම. බලය බෙදා දෙන්න වුවමනාවක් තිබෙන නිසා, මෙය බලය බෙදා දෙන එකට විරුද්ධව සිටින නායකයන් අත් අඩංගුවට ගැනීම සඳහා වන යම්කිසි විධියක තවත් උපක්‍රමයක් කියන එක තමයි මා කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෑත ඉතිහාසය දිහා බලද්දී පෙනෙන්නට තිබෙන මේ විකෘතිය නිසා මේ වාගේ පනත් කෙටුම්පත් ගෙනෙන කොට අප යම්කිසි විධියකට ප්‍රවේශම් වන්න ඕනෑ කියායි මා හිතන්නේ. මේ කියන සද්භාවයෙන්ම මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්නේ නැහැ කියන එක තමයි අපි මෙහිදී විශ්වාස කරන්නේ.

ත්‍රිපුද්ගල විනිශ්චයකාරවරුන්ගේ මණ්ඩලයක් -trial at bar එකක්- පත් කරලා නඩු අහන එක සාධාරණද, නැද්ද කියන එක ගැනත් අපි මෙතැනදී ප්‍රශ්න කරන්න ඕනෑ.

රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා වාගේ අය අධිකරණය ගැන කථා කළා. අධිකරණයේ කොච්චර ස්වාධීනත්වයක් -independence- තිබෙනවාද කියන එක ගැන අපි මෙතැනදී ප්‍රශ්න කරන්න ඕනෑ. මෑතකදී අපි Facebook එකේ දැක්කා, කවුද නීතිඥවරියක් අධිකරණයේ පවතින දූෂණය ගැන පැයක් විතර කථා කළ බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ එච්චර දූෂණයක් තිබෙනවා නම්, ඒ පක්ෂයට කැමැති නීතිඥවරු තුන්දෙනෙක් පත් කරලා, ඒ නීතිඥවරු තුන්දෙනාට ඒ පක්ෂය කැමැති තීන්දුවක් දෙන්න බැරිද කියන එක අපි මෙතැනදී ප්‍රශ්න කරන්න ඕනෑ. අධිකරණය දූෂිතයි නම්, නීතිඥවරු තුන් දෙනෙක් පත් කරලා මේ වාගේ නඩු අහන එක සදාචාරාත්මක නැහැ කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත දිහා බැලුවත්, මෙතැන හේතු කිහිපයක් තිබෙනවා. මේක Permanent High Court at Bar එකක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105. (1) (c) හි මෙසේ සඳහන් වී තිබෙනවා:

> "the High Court of the Republic of Sri Lanka and such other Courts of First Instance, tribunals or such institutions as Parliament may from time to time ordain and establish."

මෙහි පැහැදිලිව කියා තිබෙනවා, "from time to time" කියලා. එතකොට Permanent High Court at Bar එකක් ඇති කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි කියන එකයි අපි මෙතැනදී කියන්නේ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී විශේෂයෙන්ම Commission to Investigate Allegations of Bribery of Corruption එකටත්, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුවටත් බලයක් දීලා තිබෙනවා, අග්‍රවිනිශ්චයකාරතුමාට මේවා ඉදිරිපත් කරන්න. අපි දන්නවා, Bribery Commission එකේ සභාපතිතුමා නම් Constitutional

Council එකෙන් තමයි පත් කරන්නේ. නමුත් Attorney General කියන්නේ executive position එකක්. ඒකට පත් කරන්නේ Constitutional Council එකෙන් නොවෙයි. මෙතැනදී ඇත්ත වශයෙන්ම සාධාරණයක් වෙනවාද කියන එක අපි ප්‍රශ්න කරන්න ඕනෑ. ඒ වාගේම මට ඉස්සර වෙලා කථා කළ මන්ත්‍රීවරයෙක්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු තාරක බාලසූරිය මහතා
(මාණ්පුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
මට තව විනාඩියක කාලයක් දෙන්න බැරිද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
විනාඩියක් දෙන්න බැහැ.

ගරු තාරක බාලසූරිය මහතා
(මාණ්පුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
මම විනාඩියෙන් කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
විනාඩියක් දෙන්න අපහසුයි. මොකද, කථිකයින් සියලු දෙනාම ඉන්නවා.

ගරු තාරක බාලසූරිය මහතා
(මාණ්පුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
හොඳයි, මම තත්පර තිහෙන් කථාව අවසන් කරන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමා තත්පර කිහිපයකින් කථාව අවසන් කළ යුතුයි.

ගරු තාරක බාලසූරිය මහතා
(මාණ්පුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
හොඳයි. තත්පර තිහෙන් අවසන් කරනවා.

මම කියන්නේ, මේ පනත් කෙටුම්පත අනුව ඇමතිවරයාට විශේෂ බලයක් දීලා තිබෙනවා, කොච්චර උසාවි ගණනක් දමන්න ඕනෑද කියන එක සම්බන්ධව. මම හිතන විධියට ඒක ඇමතිවරයාට තිබිය යුතු බලයක් නොවෙයි. ඇමතිවරයාට ආණ්ඩුව තිබෙන තුරු උසාවි ගණනක් පත් කරන්න පුළුවන්; ඉන් පසුව උසාවි ගණන අඩු කරන්න පුළුවන්. අපේ උදය ගම්මන්පිල මන්ත්‍රීතුමාත් සාධාරණ කාරණාවක් කිව්වා. මේ නඩු දිගටම අහනවා නම්, හොඳ නීතිඥවරු ඒවාට සහභාගි වෙයිද කියන එකත් අපි මෙතැනදී කල්පනා කරලා බලන්න ඕනෑ. සහභාගි වෙන්නේ නැත්නම්, ඒ චූදිතයාට සාධාරණයක් ඉෂ්ට වෙනවාද කියන එකත් අපි මෙතැනදී කල්පනා කරලා බලන්න ඕනෑ.

මම දකින විධියට පසුගිය පෙබරවාරි දහවනදායින් පසුව මේ ආණ්ඩුවට හොඳ කනේ පහරක් ලැබී තිබෙනවා. මේ ආණ්ඩුවේ එකම අරමුණ තමයි දේශපාලන ප්‍රතිවාදීන් හිරේ දමලා, ඒ උදවියගේ බලය බෙදා දෙන න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යන එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු කරුණාරත්න පරණවිතාන මහතා. ඔබතුමාට විනාඩි හතක කාලයක් වෙන් වී තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු නවීන් දිසානායක මහතා
(මාණ්පුමිකු නවීන් තිසානායක්ක)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මුජිබුර් රහුමාන් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 5.41]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - விஞ்ஞான, தொழில்நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Science, Technology, Research, Skills Development and Vocational Training and Kandyan Heritage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තලතා අතුකෝරල අධිකරණ අමාත්‍යතුමිය දෙවන වර කියැවීම සඳහා අද මේ සභාවට ඉදිරිපත් කළ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාදය පැවැත්වෙන මේ වෙලාවේ ඒ සංශෝධනය ඉදිරිපත් කරන්න මූලික වුණු ආංශික අධීක්ෂණ කාරක සභාවට ආරාධිත මන්ත්‍රීවරයෙක් හැටියට සහභාගි වෙලා, මේ කටයුත්තට මැදිහත් වූ කෙනෙක් හැටියට අද කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා. ඒ වාගේම අද මේ සභාවේදී මේ පනත් කෙටුම්පත සම්මත වෙනවාය කියන කාරණය අපි විශ්වාස කරනවා. ඒ කාරණය සම්බන්ධයෙනුත් අපට සතුටක් තිබෙනවා. නමුත් අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන එන්න විෂය වුණු කාරණා සම්බන්ධයෙන් ඇත්තටම අපට සතුටු වෙන්න, ආඩම්බර වෙන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි මේ රටේ තිබෙන්නේ. මේ රටේ ධන බලය තිබෙන, දේශපාලන බලය තිබෙන, පරිපාලන බලය තිබෙන

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

උදව්ය කරන රුදුරු මිනී මැරුම්, මජර, කෑදර හොරකම් තමයි මේ පනත් කෙටුම්පතෙන් මතු කරන්නේ. ඒවා ගොඩ ගැහිලා, ගොඩ ගැහිලා මේ රට ගඳ ගහන තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. මේ රටේ දේශපාලනයට, මේ රටේ රාජ්‍ය සේවයට කුමන හෝ කීර්තියක් අත් පත් වෙලා තිබුණා නම්, මෙන්න මේ අකටයුතුකම් නිසා; මෙන්න මේ දුර්ගන්ධ කටයුතු නිසා රටේ කීර්තිය විනාශ වෙලායි තිබෙන්නේ. දේශපාලනයට, පරිපාලනයට අත් වුණු ඒ අපකීර්තිය අද අධිකරණයටත් අත් වෙමින් තිබෙනවා. මහා පරිමාණ දූෂණ, වංචා, අපරාධවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නට අධිකරණය දක්වලා තිබෙන අකාර්යක්ෂමභාවය නිසා අධිකරණයටත් ඒ අපකීර්තිය ඇවිල්ලා තිබෙනවා. ඒක මේ පාර්ලිමේන්තුවේ කථාවලින් නොවෙයි කියන්නේ. මන්ත්‍රීවරයෙක් අද දින මතක් කළ ආකාරයට, නීතිඥ ප්‍රජාව ඇතුළෙන් පවා අද ඒ කාරණය මතු වෙමින් තිබෙනවා. එහෙම බැලුවාම, අද අපි එකිනෙකාට චෝදනා කරමින් බැණ අඩ ගසා ගන්නවා වෙනුවට, පුරවැසි සමාජයක් හැටියට මෙන්න මේ ඇති වෙලා තිබෙන අභාග්‍යසම්පන්න තත්ත්වයට අපි උත්තර හොයන්න ඕනෑ. මේ ගොඩ ගැහිලා තිබෙන මහා පරිමාණ අපරාධ පිළිබඳ චෝදනා, මහා පරිමාණ මුල්‍ය අපරාධ පිළිබඳ චෝදනා කඩිනමින් විභාග කර යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑය කියන කාරණය හුදෙක් ආණ්ඩු පක්ෂය ආසාවට ගෙනෙන අදහසක් නොවෙයි. මේක මේ රටේ ජනතාවගේ දැවෙන ඉල්ලීමක්. ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පත මේ විධියට ඉදිරිපත් වෙන්නේ. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වුණාට පසු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු පිරිසක් මෙයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් පෙත්සම් ඉදිරිපත් කළා. ඒ වාගේම, මේ කථා කරන මම ඇතුළුව තවත් මන්ත්‍රීවරු පිරිසකුත්, තවත් පුරවැසියන් පිරිසකුත් ඒවාට මැදිහත්කරුවෝ හැටියට උසාවියට ගියා. උසාවියට ගියාම මේ සම්බන්ධයෙන් උසාවියේදී ලොකු විවාදයක් ඇති වුණා; කරුණු ඉදිරිපත් කළා. මේ පනත් කෙටුම්පතෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වෙනවාද, මෙයින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමාට තිබුණු බලය කප්පාදු වෙනවාද, නීතිපතිවරයාට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අයුතු බලතල ලැබෙනවාද, විශේෂයෙන් කවුරු හෝ ඉලක්ක කර ගත් දඩයම් කිරීමක් මෙයින් කරන්න පුළුවන්ද යනාදී වශයෙන් කරුණු-කාරණා රාශියක් ඒ පෙත්සම් විභාගය තුළ සාකච්ඡා වුණා. ඒක එහෙම වීම ගැන අපි සතුටු වෙනවා. එහෙම සාකච්ඡා වෙලා අධිකරණයෙන් අපට කිසියම් මතයක් ඉදිරිපත් කළා, "මේ පනත් කෙටුම්පත සම්මත කරනවා නම් මෙන්න මේ ආකාරයට පාර්ලිමේන්තුවට සම්මත කර ගත හැකියි." කියලා. ඒ අනුව අපි ඒ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා කවුරුවත් භය වෙන්න ඕනෑ නැහැ. මේ ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනත් එක්ක තමයි මේ පනත් කෙටුම්පත අපි ඉදිරියට ගෙන යන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා, "ආණ්ඩුව බොහොම කූට, කපටි වැඩක් කරන්න ගියා. ඒක අධිකරණය වළක්වලා දැම්මා." කියලා. එහෙමනම්, මේ පනත් කෙටුම්පතට පක්ෂ වෙන්න. එහෙම භය වෙන්න කිසිම දෙයක් නැහැ. ආණ්ඩුව මොකක් හරි කූට, කපටි වැඩක් කරන්න ගියා නම්, ඒකත් අධිකරණය වළක්වා තිබෙනවා නම්, ඇයි මේකට විරුද්ධ වෙන්නේ? එහෙම විරුද්ධ වෙන්න කිසිම හේතුවක් නැහැ. මේකට සියලු දෙනාම පක්ෂ වෙන්න. තමුන්නාන්සේලා මේකට පක්ෂව අත ඔසවන වාරයක්, වාරයක් පාසාම ජනතාවගේ ගෞරවය මේකට ලැබෙනවාය කියන එක අප සඳහන් කරන්න කැමැතියි. හරි නම්, අද මේ පාර්ලිමේන්තුව මේ පනත් කෙටුම්පත ඒකමතිකව සම්මත කරන්න ඕනෑ. නමුත්, මෙහි සමහර තාක්ෂණික ගැටලු මතු වෙලා තිබෙනවා; ඉදිරියේදීත් මතු වෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම ගැටලු ගරු මන්ත්‍රීවරු පෙන්නුවා; අපේ සුසිල් ප්‍රේමජයන්ත හිටපු අමාත්‍යතුමාත් පෙන්වා දුන්නා. ඕනෑම නීතියක් සම්පාදනය කරනකොට එවැනි ගැටලු මතු වෙනවා.

අපේ අධිකරණ පද්ධතියේ ත්‍රිපුද්ගල මහාධිකරණය මේ තාක් තිබුණේ අධිකරණයේ ව්‍යතිරේකයක් හැටියට පමණයි. මින්පසුව මෙය ස්ථිර අධිකරණයක් බවට පත් වෙනවා. ඒ විධියට ස්ථිර අධිකරණයක් බවට පත් වෙන්නේ වෙනත් කරුණක් නිසා නොවෙයි, අපේ රටේ දේශපාලන බලය, ධන බලය, පරිපාලන බලය තිබෙන අය සිදුකර තිබෙන මහා පරිමාණ දූෂණ, වංචා, අකටයුතුකම්වල ඉමක්-කොනක් නැති නිසායි. එම නිසා ස්ථිරසාර තත්ත්වයට මෙය පත් වුණා. එසේ පත්ව තිබියදී පවා, පෙර සඳහන් කළ ආකාරයේ මහා පරිමාණ මිනී මැරුම්, මහා ආන්දෝලනාත්මක සිදුවීම් ඇති වෙනවා නම්, මේ අධිකරණය එසේම තිබියදී තවත් ත්‍රිපුද්ගල අධිකරණ පත් කිරීම සඳහා යෝජනා කරන්නට නීතිපතිවරයාට තිබෙන හැකියාවත්, එවැනි අධිකරණ පත් කරන්නට ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමාට තිබෙන හැකියාවත් මෙයින් අහෝසි වෙලා නැහැ. එහෙම බැලුවාම, අද මේ ඉදිරිපත් වෙලා තිබෙන පනත් කෙටුම්පත මඟින් විශේෂයෙන්ම මේ රටේ සිදු වී තිබෙන මහා පරිමාණ මූල්‍ය අපරාධ, විවිධ අක්‍රමිකතාවලට එරෙහිව කඩිනමින් යුක්තිය ඉෂ්ට කරන්නට යන්ත්‍රණයක් හැදෙනවාය කියන එක අපි මේ වෙලාවේ මතක් කරන්නට කැමැතියි කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා.5.48]

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර දෙකකට වැඩි කාලයක් ආණ්ඩු පක්ෂයේ ඉඳලා, මේ අවස්ථාවේදී විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ අවස්ථාවට සහභාගි වෙලා මේ පිළිබඳ වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම පිළිබඳ මා සතුටු වනවා.

විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළාට පසුව, මෙහි සංශෝධන නියමානුකූලව ක්‍රියාත්මක කරන්න එකඟ වෙලා තිබෙන නිසා මේකේ තිබුණු බර බොහෝ සැහැල්ලු වුණා කියලා මම හිතනවා. මේ පිළිබඳ අවිශ්වාසයක් ඇති වුණේ වෙන කිසිම කාරණයක් නිසා නොවෙයි, මේ විශේෂ අධිකරණ පිහිටුවීමේදී සමහර දේශපාලනඥයන් ජන මාධ්‍යයට ගිහිල්ලා ප්‍රකාශ කරන්න ගත්තා, "අපි විශේෂ අධිකරණ

පිහිටුවනවා. ඒ විශේෂ අධිකරණවලින් මේ මේ අය අත් අඩංගුවට ගන්න කටයුතු කරනවා. ඒ අයට ඒ චෝදනා ඉදිරිපත් කළාම ප්‍රමාද නොකර ක්‍රියාත්මක කරන්න පුළුවන්" කියලා. මෙම විශේෂ අධිකරණ පිහිටුවන්නත් කලින් ඔවුන් එලෙස ජන මාධ්‍යයට ප්‍රකාශ කළා. එතකොට ඉතිහාසයේ තිබුණු යම් යම් කාරණා නිසා මහජනතාව අතර නොව, දේශපාලනඥයන් අතරත් බියක් ඇති වුණා. මොකද, මේක දේශපාලන පළිගැනීම්වලට යොමු වෙන ආකාරයට ක්‍රියාත්මක කරනවා කියලා. පසුගිය කාලයේ මූල්‍ය අපරාධ අංශය ක්‍රියාත්මකවීමේදී සමහර අවස්ථාවලදී මේ රටේ රාජ්‍ය සේවකයන් ඉතාමත්ම අසීරු තත්ත්වයකට පත්වුණු බව අපි දැක්කා. රාජ්‍ය සේවකයන්ට දඩුවම් දෙන ක්‍රමවේදයක් ආයතන සංග්‍රහයේ තිබෙනවා. රාජ්‍ය සේවකයෙක් වරදක් කළා නම්, ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය තුළින් ක්‍රියාත්මක වනවා. නමුත් ආයතන සංග්‍රහය අනුව කිසිම පරීක්ෂණයක් නැතිව, හිටපු අග්‍රාමාත්‍ය ලේකම් එස්. අමරසේකර මහත්තයාව පුටුවේ වාඩි කරලා එතුමාගෙන් පොලිස් කොස්තාපල්වරයෙක් ප්‍රශ්න අහනවා. එතුමාට ආයතන සංග්‍රහය යටතේ කිසිම සිද්ධියකට කථා කළේ නැහැ. ගාමිණී සේදර සෙනරත් මහතා චෝදනාවට ලක් වූ අවස්ථාවේදී, පත්තරේ මුල් පිටුවේ ලොකු අකුරෙන් වැටුණා, ගාමිණී මේ වංචාව කළා කියලා. ඔහුට ඇප නොදී රිමාන්ඩ් භාරයේ හිටියාට පසුව අවසානයේ සඳහන් කරලා තිබෙනවා, "මේ වරද පොදු දේපළ පනත යටතට වැටෙන්නේ නැහැ" කියලා. මුලදි මෙවැනි දේවල් කළාම මේ රටේ රාජ්‍ය සේවය සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දේශපාලනඥයන් අත් අඩංගුවට ගන්න කලින්, "මේ දේශපාලනඥයන් ලබන සතියේ නොවෙයි, ඊළඟ සතියේ අත් අඩංගුවට ගන්නවා" කියලා ජන මාධ්‍යවලින් ප්‍රකාශ කළාම මේක දේශපාලන පළිගැනීම් කරන ක්‍රමවේදයක් බවට පත් වෙන නිසා ඒ ක්‍රමවේදය තුළ මේ බිය ඇති වෙලා තිබෙනවා. නීතිය සාධාරණව ක්‍රියාත්මක කරනවා නම්, කිසිම කෙනෙක් මේකට අකැමැති වෙන්නේ නැහැ කියලා මම හිතනවා. මොකද, දැන් සඳහන් කළ පරිදි මෙහි සඳහන් කරුණු හතළිස් ගණනකට, අත් අඩංගුවට අරගෙන, නඩු අහලා, දෙන්න පුළුවන් වන්නේ, අවුරුදු 3ක් හෝ තුනහමාරක දඩුවමක් පමණයි. මේ ගැන තිලක් මාරපන මැතිතුමා දන්නවා. නමුත් මිනීමැරුම් තිබෙනවා; මීට වඩා මේ රටේ විශාල ආන්දෝලනාත්මක සිද්ධීන් ඇති කළ කාරණා තිබෙනවා. ඒවා විභාග කරන්න. ඒවා කාලාන්තරයක් තිස්සේ -අවුරුදු 10ක්, 15ක්- තිබෙනවා. සමහර විට මරණ දඩුවම නොදී තිබෙනවා. හිරේ ඉන්න අය කියනවා, "අපට මරණ දඩුවම දෙන්න" කියලා. නමුත් ඒ කිසි දෙයකට මේ සංශෝධිත පනත අඩංගු වන්නේ නැහැ. මේක මේ සුළු කාරණා කිහිපයකට විතරක් සීමා වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සමාජය තුළ අපි මේ සම්බන්ධයෙන් කතිකාවතක් ඇති කරලා තිබෙනවා; බියක් ඇති වෙලා තිබෙනවා. මේ කාරණා නිසා මෙම ආණ්ඩුව පිහිටුවීමේ ඒ පරමාර්ථය සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. අන්න ඒ පරමාර්ථයට ගමන් කළොත් විතරයි ඉදිරි අවුරුදු එකහමාරක කාලයේදී හෝ මිනිසුන්ට තම සාධාරණ සිතුම් පැතුම් ඉටු වෙයි කියලා විශ්වාසයක් ඇති වන්නේ. එම නිසා ඒ අනුව ක්‍රියා කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ස්තූතියි.

මීළඟට, ගරු එස්.එම්. මරික්කාර් මහතා.

[අ.භා. 5.52]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනවාරි මාසයේ 8 වෙනිදා වෙනකොට මේ රටේ තිබුණු ඒකාධිපති, මිනීමරු, දූෂිත පාලනය එළවන්න, මේ රට භාර ගන්න විට ජනතාවට දුන්නු ප්‍රධාන ප්‍රතිඥාවක් තමයි මහජන මුදල් හොරා කාපු, මාධ්‍යවේදීන් මරපු, මාධ්‍ය ආයතන විනාශ කරපු, ඒ වාගේම තමන්ගේ පෞද්ගලික වුවමනාවන් මත මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය හසුරවපු පාලකයන් එළවා, ඔවුන්ට දඩුවම් දෙනවා කියන එක.

හැබැයි, මේ පාලනය ගෙන එන්න ඉදිරිපත් වුණු ජනතාව ගෙවී ගිය අවුරුදු තුන හමාර තුළම බලාගෙන හිටියා, "මොකක්ද වෙන්නේ?" කියලා. පළමුවැනි අවුරුද්දේ බලාගෙන හිටියා, "නඩු වැටෙනවාද, හිරේ යනවාද, මොකද වෙන්නේ?" කියලා. දෙවැනි අවුරුද්දේදී මිනිසුන් අහන්න ගත්තා, "ඔයගොල්ලන් බලයට ගෙනැල්ලා මෙච්චර දවස් වනවා. මොකද වුණේ? කෝ, තවම කිසිවක් නැහැ නේ?" කියලා. තුන්වැනි අවුරුද්ද වනකොට ජනතාව ඔවුන්ට ඒ පිළිබඳව තිබෙන විරෝධය පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලයෙන් පෙන්නුවා. සමහර අය දැන් වෙනත් අර්ථ කථන ලබා දෙනවා, "ඊළඟ ජනාධිපතිවරයා තමන්ගේ. ඊළඟ ආණ්ඩුව තමන්ගේ. ආණ්ඩුව ගත්තාම නඩු ටිකෙන් බේරෙන්න පුළුවන්" කියලා. විශේෂයෙන්ම අපි මෙම කාරණයත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. අද මේ සංශෝධනවලට විරුද්ධව කථා කරන්නේ කවුද? මේකට විරුද්ධව කථා කරන අයට කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා බැලුවාම තේරුම් ගන්න පුළුවන් වෙනවා, තමන් මේකට විරුද්ධ ඇයි කියලා. මේ, වෙන කිසිවක් නිසා නොවෙයි; ඊළඟ මාස 18 ඇතුළත ඉතා වේගයෙන් මේ නඩු ටික අහයි කියලායි.

දැනට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයෙන් විතරක් පරීක්ෂණ අවසන් වුණු ෆයිල් 89ක් නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. දැනට විමර්ශන 335ක් අවසන් කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාට භාර දීලා තිබෙනවා, බරපතළ වංචා විමර්ශන පිළිබඳ කොමිෂන් සභා වාර්තා 34ක්. හැබැයි, බැලුමකර සිද්ධියට තිබුණා වාගේ ප්‍රචාරණයක් - publicity එකක්- ඒවාට තිබුණේ නැහැ. මිනී මරපු හැටි, හොරකම් කරපු හැටි, ගිනි තියපු හැටි පිළිබඳව මේ වාර්තාවල සඳහන්වෙලා තිබෙනවා. මෙවැනි වැරැදි කරපු අයට දඩුවම් ලබා දීම තමයි ජනතාවගේ බලාපොරොත්තුව වන්නේ. මෙවැනි වැරැදි එක්සත් ජාතික පක්ෂයේ අය කළත් දඩුවම් ලබා දෙන්න ඕනෑ; කවර පක්ෂයෙන් කළත් ඔවුන්ට දඩුවම් ලබා දෙන්න ඕනෑ. ඒ නිසා තමයි අධිකරණ තුනක් පිහිටුවන්නේ.

අපි විශේෂයෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරන්න කැමැතියි. නැත්නම් මේක දේශපාලන පළිගැනීමක් සඳහා කළ දෙයක් කියලා සමහර අය කියනවා. මේ අධිකරණ තුනෙන් දෙකක ගිය ආණ්ඩුවේ හොරුන්ගේ වැරැදි පරීක්ෂා කරන ගමන්ම එක් අධිකරණයක අපේ ආණ්ඩුවේ හොරුන්ගේ වැරැදිත් පරීක්ෂා කරලා, ඒ අයටත් අපේ ආණ්ඩු කාලයේම දඩුවම් ලබා දෙන්න ඕනෑ කියන එක තමයි අපේ හැඟීම සහ මධ්‍යස්ථ මත දරන

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ජනතාවගේ බලාපොරොත්තුව. කවුරු හෝ උත්සාහ කරනවා නම් කියන්න, "මේ දේශපාලන පළිගැනීමක් කරන්න හදනවා, විරුද්ධ දේශපාලන මතධාරින්ව හිරේ දාන්න හදනවා" කියලා, එහෙම කරනවා නම් එය මේ model එකට නොවෙයි කරන්න ඕනෑ. එය කළ යුත්තේ වෙන model එකකට බව මම කියන්න ඕනෑ. මොකද, මේ ඉන්න මහාධිකරණ විනිශ්චයකාරවරුන්වම දාලා, අධිකරණ පද්ධතියේ තිබෙන රාමුවම පාවිච්චි කරලා, දිනපතා නඩු ඇසීම වේගවත් කිරීමේ යන්ත්‍රණයක් පමණයි මෙහි තිබෙන්නේ. නඩු ඇසීම වේගවත් කරන එකට භය වෙනවා නම්, තිබෙන නීති රාමුව තුළ ඒ කටයුතු සිදු වෙනවාටත් භය වෙනවා නම්, එලෙස භය වීම පිළිබඳව අපට වඩා හොඳින් දන්නේ ඔවුන්ගේ හෘදය සාක්ෂියයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක එක්සත් ජාතික පක්ෂයේ වුවමනාවටවත් එහෙම නැත්නම් තවත් පක්ෂයක වුවමනාවටවත් සිදු විය යුත්තක් නොවෙයි. මේ, රටේ පොදු මහ ජනතාව බලාපොරොත්තු වුණු දේයි. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා, යුක්තිය සහ සාධාරණත්වය ඉෂ්ට කරලා, ඒ යුක්තිය සහ සාධාරණත්වය ඉෂ්ට කරන බව ජනතාවට දැනෙන්න ඕනෑ කියන එක තමයි ජනවාරි මාසයේ 08 වැනිදා මේ රටේ ජනතාව දුන්නු වරමේ අර්ථය විය යුත්තේ. ජනතාව ලබා දුන්නු ඒ වරමේ අර්ථය අපේ ආණ්ඩුවට පසුගිය අවුරුදු තුනේදී හරියට ක්‍රියාත්මක කරන්න බැරි වුණා කියන කාරණය මම කනගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. අවුරුදු තුනක් ගිහිල්ලා හෝ මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා, මේ අයට දඬුවම් ලබා දීලා, ශ්‍රී ලංකා දේශපාලන පිටිටනිය ශුද්ධ පවිත්‍ර වනවා නම් අපි සතුටු වනවා. හොරකම් කරන, වංචා සහ දූෂණ කටයුතු කරන, මිනී මරන දේශපාලනඥයන් දේශපාලන පිටිටනියෙන් එළවා දැමීමේ රැල්ලක් - trend එකක්- ලෝකය පුරාම ක්‍රියාත්මක වන බව අපි දන්නවා. ඒක ලෝකයේ විශාල ප්‍රවණතාවක් බවට පත්වෙලා තිබෙනවා. ඒකෙන් මීදෙන්න ලංකාවටත් බැහැ. මෙය එහි ආරම්භයක් වෙන්න කියලා විශ්වාස කරන ගමන්ම ඒක යථාර්ථයක් බවට පත් වෙන්න කියලාත් අපි ප්‍රාර්ථනා කරනවා. පෙබරවාරි මාසයේ 10 වැනිදා ඡන්ද ප්‍රතිඵලය අනුව හීන මවන්න කෙනෙකුට අයිතිය තිබෙනවා, "අපේ අහවලා ජනාධිපති වෙනවා; අහවල් දවසේ අපේ ආණ්ඩුවක් හදනවා; 2020දී අපි ආණ්ඩුව පිහිටෙව්වාම 2050 වනතුරු එය තිබෙනවා" කියලා. එහෙම ආණ්ඩු පිහිටුවනවාය කියන එක ෂුවර් නම්, විශ්වාස නම් භය වෙන්න දෙයක් නැහැ. මොකද, අපේ ආණ්ඩුව කාලයේ වැරදි කරපු අයටත් ඒ ආණ්ඩුව ආවාම ඉක්මනටම නඩු අහලා, දඬුවම් ලබා දෙන්න පුළුවන් වේවි. එක්සත් ජාතික පක්ෂය වේවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වේවා, පොදුජන එක්සත් පෙරමුණ වේවා, මොන පක්ෂය වුණත්, දේශපාලනයට එන අය දේශපාලන බලය පාවිච්චි කරලා, කෝටි - ප්‍රකෝටිපතියන් වෙලා, මහජන මුදල් හොරා කන එකට විරුද්ධ වෙන්න ඕනෑ වාගේම ඔවුන්ට දඬුවම් ලබා දිය යුතුයි කියන එකයි ජනතාවගේ මතය වන්නේ. දේශපාලන පිටිය ක්‍රමානුකූලව වෙනස් වෙමින් පවතින විධිය අද අපිට පෙනෙනවා.

විශේෂයෙන්ම පසුගිය මැතිවරණයේදී තරුණ ප්‍රජාව ඡන්දය දුන් ආකාරය බලන්න. තාත්තා යූඇන්පී හින්දා පුතා තවදුරටත් යූඇන්පී වෙන්නේ නැහැ. අම්මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හින්දා පුතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්නේ නැහැ. මේ ලෝකයේ වෙන්නේ මොනවාද, ඒ දේවල් වෙන්නේ කොයි විධියටද කියන එක ඔවුන් හොඳට දන්නවා. තවදුරටත් මේ තරුණ සමාජය මුසාවෙන්, මුලාවෙන් මෝහනය කරන්න බැහැ. ඔවුන් තුළින් ආපු රැල්ලට සාධාරණය ඉෂ්ට කිරීම අපේ රජයේ වගකීමක්. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තා. ඒ වාගේම තව අණපනත් ගණනාවක් ගෙනාවා. මේ වාගේම තව පනත් කෙටුම්පතක් එන්න තිබෙනවා. ඒ තමයි National Audit Bill එක. ඒ පනත් කෙටුම්පතත් ගෙනැල්ලා ජනවාරි මාසයේ දුන් වරමට සාධාරණය ඉෂ්ට කරන්න මේ ආණ්ඩුව බැඳී ඉන්නවා කියන එක අපි කියන්න ඕනෑ.

මම මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ. අපිට මේ සාධාරණය ඉෂ්ට කරන්න බැරි වුණොත්, ලබන අවුරුද්දේ අපට විපක්ෂයට යන්න සිද්ධ වෙනවා කියන එකත් අප තේරුම් ගන්න ඕනෑ. මේ කෑ ගහන අයගේ මතවලට යට වෙලා, මේ කෑ ගහන අයගේ සද්දයට බය වෙලා මේවා නතර කරන්නේ නැතුව මේ අයට නිසි දඬුවම් දීලා, ඒ අය සුදුසු තැන්වලට යවන්න ඕනෑ. ඒ වාගේම අපේ ආණ්ඩුව ඇතුළේත් එහෙම ඉන්න අය ඒ සුදුසු තැන්වලට යැවීමට මේ ආණ්ඩුවට දුන් වරම රැක්කා කියන විශ්වාසය ජනතාව තබා ගන්නවා. එහෙම වුණොත් හීන මවන අයට හීන ලෝකය තුළම තව අවුරුදු පහක් ඉන්න වෙනවා කියන එකත් කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා.5.59]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අප සතුටු වෙන්න ඕනෑ කාරණයක් තමයි නඩු ඉක්මනින් අහන්න අධිකරණ පිහිටුවීමට ගත්ත තීන්දුව. අද සමස්ත රටම ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනා දිහා බලාගෙන ඉන්නේ වැරදි විධියකට. නමුත් ගරු ඇමතිතුමියනි, මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම හරහා ඉක්මනින් නඩු ඇසීමේ අවස්ථාව ලබා දෙන්නේ පසුගිය රජයේ හිටපු ජනාධිපතිතුමා වෙන්න පුළුවන්, ඇමතිවරුන් වෙන්න පුළුවන්, මන්ත්‍රීවරුන් වෙන්න පුළුවන්, ඒ වාගේම අපේ රජයේ ඉන්න ඇමතිවරුන් වෙන්න පුළුවන්, මන්ත්‍රීවරුන් වෙන්න පුළුවන්, වැරදි කෙරුවා නම්, ඉක්මනින්ම ඒ නඩු අසා, රටේ තිබෙන නීතිය අනුව ඒ අයට නියම විධියට වහාම දඬුවම ලබා දිය යුතුයි.

අපේ ලංකාව දිහා බැලුවාම අපේ උත්තරීතරම ආයතනය වන පාර්ලිමේන්තුවේදී සඳහන් කරන "ගරු" කියන වචනයත් අද මිනිසුන් අතර නැති වෙලා තිබෙනවා, එකිනෙකාට අපහාස කර ගන්නා නිසා. අද හොඳ අයටත් අපහාස කරනවා; නරක අයටත් අපහාස කරනවා. ඒ නිසා වහාම -ඉක්මනින්- මේ වැරදිකරුවන් නීතියට යටත් කරලා, ඒ අයට උපරිම දඬුවම් දීලා මෙතැනින් පසුව හෝ නියමාකාරයෙන් කටයුතු කළ යුතුයි. මේ යහ පාලන රජය රට භාර ගත්තේ සමස්ත රජයම වැරදි නොකරමින්, රටේම ආර්ථිකය හදලා "අපි හොඳම රටක් හදනවා" කියලායි. ගරු අගමැතිතුමනි, ඔබතුමා නිතරම සිංගප්පූරුව ගැන කථා කරනවා. එදා, සිංගප්පූරුවේ හිටපු අගමැතිවරයෙකු වූ ලී ක්වාන් යූ මැතිතුමා ඒ රටේ වැරදි කරපු සියලුම වැරදිකාරයින්ට -ජාතිවාදීන් හිටියා- පැය 48ක් ඇතුළතදී උපරිම දඬුවම ලබා දුන්නා. බලන්න, අද ඔබතුමා ලෝකයෙන්ම සිංගප්පූරුව අපිට උදාහරණයකට ගෙනැල්ලා තිබෙනවා. අපිට තව ඉතුරු වෙලා තිබෙන්නේ මාස 18යි. ඒ මාස 18 ඇතුළතදී අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් ලෝකයටම බලා ගන්න පුළුවන් රටක් විධියට, සිංගප්පූරුවක් වාගේ මේ රට හදාවි කියලා අපි බලාපොරොත්තු

වෙනවා. ඔබතුමන්ලා එම බලාපොරොත්තු ඉෂ්ට කරාවි කියලා සමස්ත රටම ඒ දිහා බලාගෙන ඉන්නා බව අපි මෙතැනදී කියන්න කැමැතියි.

මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුම දෙනා හොඳ අය තමයි. සමහර අය වැරදි කරන්න පුළුවන්. නමුත් ඔක්කෝටම ඒ මඩ පහර වැදෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මැති-ඇමතිවරුන්ට Facebook හරහා "හොරු" යැයි පවසන ආකාරය අපට අද දකින්න පුළුවන්. ඔවුන්ට පඩි ගෙවන්නේ ඇයි? ඔවුන්ට ඉන්ධන දෙන්නේ ඇයි කියා අහනවා. ඒ වාගේ දේවල් අහනවා. අපි නිවැරදි විධියට කටයුතු කෙරුවා නම්, අපි හරියට හිටියා නම්, ගම්වල සිටිමින් Facebook එකේ ලියන අයට ඒ විධියට අපට ඇඟිල්ල දිගු කරන්න බැහැ. ගරු අගමැතිතුමනි, පාර්ලිමේන්තුවට ඇවිල්ලා වැටුප් ගන්නේ නැතුව, ඉන්ධන දීමනා ගන්නේ නැතුව මහජන සේවකයෙකු වශයෙන් මහජනතාවට සේවය කරන්න මට ආශාවක් ඇති වුණා. නමුත් ඇවිල්ලා බලන කොට, ඔක්කෝගේම නම් කැත වෙලා තිබුණේ. ඒ නිසා මෙතැනින් හෝ මේ ගමන නිවැරදි කරලා හරි මාර්ගයට යමු කියන ගෞරවනීය ඉල්ලීම මා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දෙමළ භාෂාවෙනුත් වචන කිහිපයක් කථා කිරීමට බලාපොරොත්තු වනවා.

இதற்கு முன்னிருந்த ஆட்சியாளர்களையும் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களையும் அமைச்சர்களையும் போலவே இன்றைய நல்லாட்சியிலுள்ள அமைச்சர்களையும் பாராளுமன்ற உறுப்பினர்களையும் இந்த நாட்டிலுள்ள மக்கள் கள்வர்கள் - திருடர்கள் என்ற ரீதியில் மிக மோசமான கண்ணோட்டத்திலேயே பார்க்கின்றார்கள். அதாவது, இன்று உலகத்திலே உன்னதமாக, கௌரவமாக மதிக்கப்படுகின்ற பாராளுமன்ற உறுப்புரிமையைப் பற்றி இந்த நாட்டிலுள்ள மக்கள் மிக மோசமான ரீதியில் சிந்திக்கிறார்கள். அவர்களில் ஓரிருவர் செய்கின்ற தவறுக்காக 225 பேரும் அதனால் பாதிக்கப்படுகிறார்கள். இந்த நாடு மட்டுமல்ல, முழு உலகமே இவ்வாறுதான் பார்க்கின்றது. அதனால்தான் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்கள் மிக வேகமாக வழக்குகளை விசாரிப்பதற்கான அனுமதியை மிகவும் திறமையான ஓர் அமைச்சருக்கு வழங்கியிருக்கின்றார்.

கௌரவ அமைச்சர் அவர்களே! மூன்று வருட காலமாக நல்லாட்சி நடைபெற்று வருகின்றது. இன்னும் உள்ளதோ 18 மாதங்கள்! அதனால் காலம் தாமதிக்காமல் இந்த 18 மாதத்திற்குள்ளாவது தவறு செய்தவர்களை - அவர்கள் முன்னைய ஆட்சியில் இருந்தவர்களாக இருக்கலாம், இந்த ஆட்சியில் இருப்பவர்களாக இருக்கலாம் - சட்டத்தின் முன்நிறுத்தி அவர்களுக்குரிய தண்டனைகளை நீங்கள் பெற்றுக்கொடுக்க வேண்டும். இல்லாவிட்டால், நான் குறிப்பிட்டதுபோல் இலங்கையில் வாழ்கின்ற இரண்டு கோடிக்கு மேற்பட்ட மக்களும் இந்தப் பாராளுமன்றத்திலுள்ள 225 பேரையும் கள்வர்கள் - திருடர்கள், மிக மோசமானவர்கள் என்றுதான் பார்ப்பார்கள். அதைத் தவிர்க்கும் வகையில் எங்களுடைய நாட்டின் பிரதமர் அவர்கள் உங்களுக்கு தந்திருக்கின்ற மிக முக்கியமான பொறுப்பை நிச்சயமாக நீங்கள் நிறைவேற்றுவீர்கள் என்று எதிர்பார்க்கின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
அதன் மூலமாக இந்த நாட்டின் இறைமை பாதுகாக்கப்படும், இந்த நாட்டில் அமைதி பேணப்படும் என்று சொல்லி வாய்ப்பளித்த தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක් තිබෙනවා.

[අ.භා.6.05]

ගරු දිළුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කෙටි කාලයක් වෙන් වී තිබෙන නිසා මම හිතනවා විවාදයේදී ඉදිරිපත් වූ කරුණු සම්බන්ධව පමණක් සඳහන් කරන්න. ඒ අනුව, ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමා කියපු ආකාරයට මුල් පනත් කෙටුම්පතේ සඳහන් කරුණු සංශෝධනය කළාට පස්සේ එය සම්මත කර ගැනීම පිළිබඳව අපට ලොකු ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපට ප්‍රශ්නය තිබෙන්නේ, මෙය ක්‍රියාත්මක වන කොට කොහොම ක්‍රියාත්මක වෙයිද කියන කාරණයේදීයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසියේ බැරියර් එකක් ගිනි ගැනීම නිසා රුපියල් ලක්ෂ දෙකකින් පොදු දේපළවලට පාඩු වුණාය කියලා පසුගිය කාලයේ පොදු දේපළ පනත යටතේ මේ මගේ ළඟ ඉන්න ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු හය දෙනෙක් ඇප නැතුව රිමාන්ඩ් කරලා හිටියා. අපි එල්ටීටීඊ ත්‍රස්තවාදය මඩින්න ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හැදුවා. නමුත්, ඒ පනත ඉල්ලපු හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් ත්‍රස්තවාදීන් බවට පත් කරලා ඒ අය සිරගත කළ බව අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා කියපු ආකාරයට අපටත් මේ ගැන යම්කිසි සැකයක් තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේම ඇමතිවරයෙක් මැයි දිනයේදී ඔබතුමන්ලාගේ වේදිකාවේ කරපු කථාව නිසායි ඒ සැකය ඇතිවන්නේ. නමුත් මේ පනත් කෙටුම්පත ගෙනා ගරු ඇමතිතුමියගේ අරමුණ ඒක නොවෙන්න පුළුවන්. නමුත් එතුමාගේ අරමුණ ඉතාම පැහැදිලියි. සෞඛ්‍ය ඇමතිතුමා බොහොම පැහැදිලිව කිව්වා, "අපි නව පනත ගෙනැල්ලා ඔය විපක්ෂයේ කයිවාරු ගහන සියලුදෙනා ඇතුළට දැම්මාට පස්සේ ඡන්දය ඉල්ලන විධිය බලා ගනිමු" කියලා. මේ සංශෝධන ගැන අපට ප්‍රශ්නයක් නොතිබුණත් එවැනි දෙයක් ඇහුණාට පස්සේ මේ පනතට පක්ෂ වෙන්න පුළුවන්ද කියන එක ප්‍රශ්නයක්. හිත ඇතුළේ තිබෙන්නේ මොකක්ද, අවංකව කියන්නේ මොකක්ද කියන එක ගැන ඇත්තටම අපට ප්‍රශ්නයක් තිබෙන නිසා තමයි අපි මේ පනතට පක්ෂව ඡන්දය දෙන්නේ නැත්තේ කියන කාරණය පැහැදිලි කරන්න ඕනෑ.

අද මටත් උදා වෙලා තිබෙන තත්ත්වය බලන්න. පසුගිය කාලයේ මහනුවර සිද්ධියක් ඇති වුණා. ඒ වෙලාවේ ඒ හැම

[ගරු දිළුම අමුණුගම මහතා]

තැනකටම ගිහිල්ලා ඒ ගැටුම් සමථයකට පත් කරන්න අපි උත්සාහ කළා. ගරු රවුෆ් හකීම් ඇමතිතුමාද, රිසාඩ් බදියුදීන් ඇමතිතුමාද, දැන් මූලාසනයේ සිටින, මීට සුළු මොහොතකට පෙර සභාව ඇමතූ ඔබතුමාද සඳහන් කළ පරිදි, ඒ ගැටුම් සමථයකට පත් කරන්න අපි කටයුතු කළා. හැබැයි, හෙට දිනයේ ත්‍රස්තවාදී කටයුතු විමර්ශන කාර්යාලයට මට යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අරගළය වළක්වන්න කටයුතු කරපු නිසා දැන් මාත් ත්‍රස්තවාදියෙක් බවට පත් වෙලා තිබෙනවා. අපට නීති හදන්න පුළුවන්. හැබැයි, අපි මතක තබා ගන්න ඕනෑ ඒ නීති ක්‍රියාත්මක කරද්දී පොලීසිය සහ අතරමැදියන් කීප දෙනෙක් සිටින බව. දේශපාලනඥයන්ට මේ හරහා වැඩිපුර බලය පැවරෙනවා. එවැනි වැඩිපුර බලයක් පැවරුණොත් තීන්දු තීරණ ගන්නා පක්ෂය මොකක්ද, ආණ්ඩුවේ ඉන්නේ කවුද කියන එක නොවෙයි, ඒ හරහා පළි ගැනීම් සිද්ධ වෙන්න පුළුවන් කියන කාරණය අපි මතක තබා ගත යුතුයි.

මුලදී ඉදිරිපත් කළ පනත් කෙටුම්පතට අපි සියලු දෙනා විරුද්ධ වුණා. නමුත් දැන් ඉදිරිපත් කර තිබෙන සංශෝධන අනුව නඩු කටයුතු ඉක්මන් වීම පිළිබඳව අප කිසිවෙකුට ප්‍රශ්නයක් නැහැ. අප සියලුදෙනා දරන මතය ඒකයි. හැබැයි මේ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ පනත විතරක් නොවෙයි, පොදු දේපළ පනත වෙන්න පුළුවන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙන්න පුළුවන්, මූල්‍ය අපරාධ විමර්ශන පිළිබඳ කටයුතු වෙන්න පුළුවන්, මේවා අපට විරුද්ධව භාවිත වෙලා තිබෙන විධියත්, ඔබතුමන්ලාගේ ඉදිරි පෙළේ ඇමතිවරයාගේ ඒ කථාවත් නිසා තමයි මේ පනතට සහයෝගය දෙන්න හිත පහල වෙන්නේ නැත්තේ කියන කාරණය මතක් කරමින්, මට කථා කිරීමට කාලය වෙන් කර දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.6.09]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)

(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துமபண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)

(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08වැනි දා මේ රටේ හැට දෙලක්ෂයක් ජනතාව අපට ඡන්දය දුන්නේ මේ රටේ හොරකම්, අපරාධ අල්ලන්න කටයුතු කරන්න කියලායි. අපේ පොලීසියත්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයත් මේ වැරදි පිළිබඳව ස්වාධීන පරීක්ෂණ කරලා, දැන් කීපදෙනෙකුට -29කට පමණ- අධිකරණයේ නඩු පවරා තිබෙනවා. ඒ වාගේම එවැනි පරීක්ෂණ කරලා, ලිපි ගොනු විශාල ප්‍රමාණයක් නීතිපති උපදෙස් සඳහා යවා තිබෙනවා. කාගෙන්වත් පළි ගන්නවත්, කාටවත් ගහන්නවත්, දේශපාලන වාසි ගන්නවත් අපේ අය කටයුතු කරලා නැහැ.

අද මේ විශේෂ අධිකරණ පද්ධතිය පිහිටුවන්න කටයුතු කරන්නේ අධිකරණ කටයුතුවල තිබෙන ප්‍රමාදය නිසායි. අපට ඡන්දය දුන්නු හැට දෙලක්ෂයක ජනතාව අද අපට චෝදනා කරනවා, මේ කටයුතු ප්‍රමාද වනවාය කියලා. අපි දන්නවා, අපේ අධිකරණ ක්‍රියාවලිය තුළ විශේෂ ප්‍රමාදයක් තිබෙනවාය කියලා. මට මතකයි, මා හිටපු 1999 ජනාධිපතිවරණ වේදිකාවකට වෙඩි තියලා මගේ දෙදෙනකු ඝාතනය කිරීමේ නඩුව අවසන් වෙන්න අවුරුදු 13ක් ගත වුණු බව. එහෙම නම් මේ නඩු විභාග කඩිනම් කිරීම සඳහා කවුරුත් කටයුතු කරන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ 1971 කැරැල්ල සම්බන්ධව විභාග කරන්න අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව පත් කරලා බොහොම කෙටි කාලයකින් ඒ සම්බන්ධයෙන් තීන්දු දීලා අවශ්‍ය නීතිමය පියවර ගත්තා. 1978දී විශේෂ ජනාධිපති කොමිසමක් පත් කරලා එදා සිද්ධ වුණු වංචා දූෂණ සම්බන්ධයෙන් අවශ්‍ය තීන්දු ගත්තා. ඒ නිසා තමයි අධිකරණ ඇමතිතුමිය මේ විශේෂ අධිකරණ පිහිටුවීමේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු, හිටපු ඇමතිවරු, චෝදනාවලට ලක් වුණු අය මේ පනත් කෙටුම්පතට විරුද්ධ වුණා. තමුන්නාන්සේලාගේ නිර්දෝෂීභාවය බොහොම ඉක්මනට ඔප්පු කරන්න ඕනෑ නම්, මේ නඩු කටයුතු කඩිනම් වන එක තමුන්නාන්සේලාටත් හොඳයි. තමන් නිවැරැදි නම් මේ අධිකරණ පිහිටුවාගෙන තමුන්නාන්සේලාට ඉක්මනට නිදහස් වෙන්න පුළුවන්. ඒ වාගේම, වැරැදිකාරයන්ට ඉක්මනට දඬුවම් දෙන්න පුළුවන්. අපේ ආණ්ඩුව කාගෙන්වත් පළි ගන්නේවත්, කාටවත් අසාධාරණයක්වත් කරන්නේ නැහැ. අපේ අගමැතිතුමාට විරුද්ධව ඉදිරිපත් වුණු චෝදනා ප්‍රසිද්ධියේ විභාග කරන්න තරම් අපේ ආණ්ඩුව බොහොම ස්වාධීනව, ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේ ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියකු අත් අඩංගුවට ගන්න තබා අඩුම තරමේ ඒ කෙනෙකුට කිට්ටු වෙන්නවත් බැරි වුණා. මැති ඇමතිවරයකු නොවෙයි, අගමැතිවරයකු නොවෙයි, මන්ත්‍රීවරයකුගේ ගෝලයකුවත් පොලීසියෙන් අත් අඩංගුවට ගන්න බැරි තත්ත්වයක් තමයි තිබුණේ. නමුත් අද ඒ ස්වාධීනත්වය තිබෙනවා. අපේ රජයේ ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩලය සම්බන්ධව, ඒ වාගේම ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධව බොහොම ප්‍රසිද්ධියේ තමයි විභාග කරන්නේ. මා අහනවා, විපක්ෂයේ මැති ඇමතිවරු මේ අධිකරණ පිහිටුවනවාට භය වන්නේ ඇයි කියලා. අද නඩු 29කට වැඩි ප්‍රමාණයක් ගොනු කරලා අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. මේ කටයුතු ඉක්මන් කරන්නයි අපි මේ කටයුතු කරන්නේ.

මා ප්‍රකාශ කරන්න කැමැති නැහැ, මහ ජනතාවගේ මුදල් කෝටි ප්‍රකෝටි ගණන් වංචා කරපු ආකාරය. අපි ඒවා ගැන තීන්දු දෙන්නේ නැහැ. අපි කියන්නේ නැහැ, අසවලා ඒකට වැරැදිකාරයාය කියලා. මේ අධිකරණ පද්ධතියට ගිහින් ඒවා ගැන කථා කරන්න පුළුවන්. තමුන්නාන්සේලාගේ කාලයේදී තමයි අධිකරණය දූෂණය කළේ. අග්‍ර විනිශ්චයකාරවරිය පැය 24න් එළියට දමලා කිරි බත් කාපු යුගයක් තිබුණා. නමුත් අද ස්වාධීන අධිකරණ කොමිෂන් සභා පිහිටුවා අධිකරණයට ඒ බලය දීලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා මේ අධිකරණ පිහිටුවීම සම්බන්ධව කිසිම භයක් සැකයක් ඇති කර ගන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේලාගේ නිවැරැදිභාවය ඔප්පු කරන්න හොඳම අවස්ථාවක් ලැබිලා තිබෙනවා. හැට දෙලක්ෂයක් ජනතාව අපට ඡන්දය දුන්නු කාරණා ඉෂ්ට කරන්න අපට මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ නඩු සම්බන්ධයෙන් අද විශාල ලිපි ගොනු සංඛ්‍යාවක් තිබෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේ මොනවාද කළේ? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වහලා දැම්මා. එහි පැමිණිලි තුන්දහස් ගණනක් තිබුණා. ඒ පැමිණිලි එකක්වත් විභාග කළේ නැහැ. නීතිය වහලා දැම්මා. අද එහෙම නොවෙයි. අද අපේ රජය යටතේ මේ කටයුත්ත බොහොම සාධාරණව කරගෙන යනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මා කියනවා, සාධාරණව මේ පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය දෙන්න කියලා. තමුන්නාන්සේලා මේ පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය දෙන්නේ නැත්තේ, "අපි කරපු වැරැදි අහුවෙයි" කියලා තමුන්නාන්සේලාට පොඩි කුකුසක් ඇති නිසායි. අධිකරණ ඇමතිතුමිය විශාල කටයුත්තක් තමයි අද මේ කරන්නේ. මෙය, මේ රටේ ජනතාව ඉල්ලපු දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලසට, දූෂණයට, වංචාවට, අවනීතියට විරුද්ධව අද ලෝකය පුරා රැල්ලක් ඇති වෙමින් තිබෙනවා. දකුණු කොරියාවේ පසු ගිය මැතිවරණයේදී සියයට 39ක් ඡන්දය දීලා තිබෙනවා, අල්ලසට දූෂණයට විරුද්ධව. 2015 ජනවාරි 8වැනිදා මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව පෙරළුවේ අල්ලසට, දූෂණයට, අවනීතියට එරෙහිවයි. එහෙම නම් අද ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපට අවස්ථාව දෙන්න. ඒ විතරක් නොවෙයි, පසු ගිය දවස්වල විපක්ෂයේ මන්ත්‍රීවරු මේ පිළිබඳව පරීක්ෂණ කරන නිලධාරීන්ට තර්ජනය කරපු හැටි අපි දැක්කා. මොනවද මේ ගොල්ලෝ කිව්වේ? "අපි එනකල් බලාගෙන ඉන්න, පරීක්ෂණ කරන නිලධාරීන්ට අපි දඩුවම් දෙනවා" කිව්වා. ඒක නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. අපි තමුන්නාන්සේලාට කියනවා, නීතියට අවනත වෙන්න කියලා. අධිකරණය විසින් අපේ ස්වාධීනත්වය ආරක්ෂා කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, දැන් කාලය අවසන්.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි තමුන්නාන්සේලාට කියනවා, සත්‍යයට, අධිකරණයේ සාධාරණත්වයට මුහුණ දෙන්න කියලා. වැරැදිකාරයෝ ඇතුළට යවමු, එතකොට නිවැරදිකාරයෝ නිදහස් වෙයි කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තූතියි.

මීළඟට, ගරු තලතා අතුකෝරල අමාත්‍යතුමිය.

[අ.භා. 6.16]

ගරු තලතා අතුකෝරල මහත්මිය (අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Justice and Prison Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු අවශ්‍යතාවක් සහ බොහෝ උදවිය මහන්සි වුණු වැඩ කටයුත්තක් අවසන් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අවස්ථාව සලසා දීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අද ආණ්ඩු පක්ෂයෙනුත්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු මුජීබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MUJIBUR RAHUMAN *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, අද දවසේ ඉතාමත් වැදගත් සංශෝධන පනත් කෙටුම්පත් තුනක් ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ ආණ්ඩු පක්ෂයෙන් මෙන්ම විපක්ෂයෙනුත් ඉතාම වටිනා කියන අදහස් ප්‍රකාශ වුණා. ඒ සියලුම දෙනාට මගේ ස්තූතිය පුද කරනවා. සමහර අය නොයෙකුත් විධියට මෙම පනත් කෙටුම්පතේ අඩු පාඩුකම් සොයන්නට උත්සාහ කළා. ඒ වාගේම සමහර අය කුමක් හෝ හේතුවක් නිසා මේ පිළිබඳව භයක් ඇතිව කථා කළාද කියලා මම දන්නේ නැහැ. සමහර අය මෙහි නොතිබුණු කරුණු පිළිබඳවත් නොයෙකත් විධියේ අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම සමහර අය කිව්වා, අධිකරණ පිහිටුවන විට ඒක අනාගතයටත් බලපානවා කියාල. ඒ වාගේම සමහර අය කිව්වා, ගරු අගමැතිතුමාගේ ඉඳලා ඇමතිවරු ගණනාවකට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කර තිබෙනවා කියලා. මගේ නමත් කිව්වා. අපි දන්නවා, ගරු අගමැතිතුමා ඇතුළු අපේ මන්ත්‍රීවරු ගණනාවකට විරුද්ධව පැමිණිලි ඉදිරිපත් කරමින් ඒ දවස්වල "ටොප් ටෙන්" කියලා මාධ්‍ය ජවනිකාවක් කළා. ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා කිව්වා වගේ, අදාළ විධියට නීතිය ක්‍රියාත්මක කරන්න අද ඕනෑම කෙනෙකුට නිදහසක් තිබෙනවා. මොකද, අධිකරණය අද ස්වාධීනව කටයුතු කරනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ස්වාධීන කොමිෂන් සභා පහ ක්‍රියාතමක කරලා ඒවාට අවශ්‍ය ශක්තිය ලබා දෙන්න අද උපරිම වශයෙක් කටයුතු කර තිබෙනවා. අද අපිට නිරන්තරයෙන්ම ඇහෙන දෙයක් තමයි, අද පොලිස් නිලධාරියෙක්වත් මාරු කරන්න බැහැයි කියන එක. ඒකට හේතුව තමයි, එදා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අවශ්‍ය වෙනස්කම් කරපු එක. නමුත්, සමහර අය තවමත් මේවා පිළිගන්න කැමැති නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
හොඳයි, ගරු කථානායකතුමනි. මම කනගාටුවෙන් වුණත් කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඔබතුමාගේ සභාපතිත්වයෙන් පැවැත්වෙන ව්‍යවස්ථා සභාවේ කුහකයෝ ඉන්නවා කියලා කිව්වා. එතකොට දේශපාලන අධිකාරිය හැරුණාම ඒ.ටී. ආරියරත්න මහත්මයා, රාධිකා කුමාරස්වාමී මහත්මිය, ඒ වාගේම හිටපු නීතිපති ශිබ්ලි අසීස් වාගේ අය කුහකයෝද කියලා මම අහනවා. අද විපක්ෂයේ වාඩිවෙලා ඉන්න ජෝන් සෙනෙවිරත්න මහත්මයාත් එහි සාමාජිකයෙක්. ඒ වාගේම විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත් එහි සාමාජිකයෙක්. එදා ශිරාණි බණ්ඩාරනායක මැතිනියට කළා වාගේ, සරත් ෆොන්සේකා මැතිතුමාට කළා වාගේ එවැනි දේවල් කරන බලාපොරොත්තුවෙන් තමයි මේ හැම එක්කෙනාම වැඩ කරන්නේ කියලා සමහර අය භිතාගෙන ඉන්නවා.

අපි විශේෂයෙන්ම කියන්නට ඕනෑ, ජනතාව බදු ගෙවන මුදල් සම්බන්ධයෙන් වගකීමක් මේ පාර්ලිමේන්තුවට වාගේම අපි 225 දෙනාටම තිබෙනවා කියලා. ඒවා නාස්ති කළා නම්, ඒවායෙන් සොහොන් හැදුවා නම්, එහෙම නැත්නම් ඒවා වෙන වෙන දේවල්වලට පාවිච්චි කළා නම්, 300ක්, 400ක්, 500ක් පිරිස අරගෙන පිට රට යන්න ගියා නම්, ඒවායෙන් වෙනත් දේවල් කළා නම්, ඒ හැම එකක් ගැනම සොයා බැලීමේ අයිතිය තිබෙනවා වාගේම ඒවාට නීතිය ක්‍රියාත්මක කිරීමේ අයිතියත් තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමියගේ කථාවේදී කිව්වා 300ක්, 400ක්, 500ක් පිරිස අරගෙන රට යනවා කියලා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට එහෙම කියන එක සාධාරණ නැහැ කියලා මම හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order. Hon. (Mrs.) Thalatha Atukorale, you go ahead.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඒක අපි දන්නවා. ඔබතුමා වැදගත් විධියට ඔහොම වාඩිවෙලා හිටියා නම් හොඳයි කියලා මම හිතනවා. ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ වෙන කිසිම දේකට නොවෙයි. අධිකරණ සංවිධාන පනතට මේ වෙනස්කම් ගෙනැල්ලා, අද ස්ථිර ත්‍රිපුද්ගල අධිකරණ පිහිටුවන්නේ ගරු අග්‍රවිනිශ්චයාකාරතුමාගේ අනුමැතියෙන්. පෙත්සම් හතක් දාලා අධිකරණයට ගිහිල්ලා නවත්වන්න බැරිවෙච්ච එකක් තමයි අද ඒ අවශ්‍ය සංශෝධන කරලා අපි මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් අද රටේ ලොකු මතයක් ඇතිවෙලා තිබෙනවා. ඒ, මතය තමයි අපි හොරු ගැන කිව්වාට තවම හොරු ඇල්ලුවේ නැහැ කියන කාරණය. අද බැසිලිකර වංචාවක් ගැන චෝදනා කරන අයගෙන් මා අහන්න කැමැතියි, පවතින තමන්ගේම ආණ්ඩුවක චෝදනා ලබා තිබෙන අය ඉතිහාසයේ ඉඳලා තිබෙනවාද කියලා. අද ඒ සම්බන්ධයෙන් දෙන්නෙක් බන්ධනාගාරගත කරලා තිබෙනවා. අර්ජුන මහේන්ද්‍රන්ව ගෙන්වන්නේ නැත්තේ ඇයි කියලා අහන අයට අමතක වෙලා තිබෙනවා, උදයංග වීරතුංග ගිහිල්ලා ඩුබායි රටේ හැංගිලා ඉන්න බව. අර්ජුන මහේන්ද්‍රන්ටත් එක නීතිය, ඒ වාගේම උදයංග වීරතුංගටත් එකම නීතිය කියන එක අපි මතක් කරන්නට ඕනෑ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමිය, දැන් කථාව අවසාන කරන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඒ දවස්වල බොහොම අමාරුවෙන් එක්කෙනෙක් කථා කළා, ආනන්ද සෙනරත් ද, සේදර ද කියන කෙනෙකුගේ නඩුවක් ගැන. පුද්ගලයින්ගේ නඩු සම්බන්ධයෙන් අපට කිසි වගකීමක් හෝ අවශ්‍යතාවක් නැහැ. මේක කිසි කෙනෙකුගෙන් දේශපාලන වශයෙන් පළිගන්නවත්, කිසි කෙනෙකු ඉලක්ක කරගෙන හෝ ඉදිරිපත් කරන හෝ පිහිටුවන අධිකරණයක් නොවෙයි කියන එක මම වගකීමෙන් ප්‍රකාශ කරනවා.

නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ගරු සභාපති අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා සහ එහි සියලුම සාමාජිකයන් මේ සඳහා විශාල මහන්සියකින් පසුගිය කාලය පුරා වැඩ කළා. ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන් මේ පනත් කෙටුම්පතට විශාල දායකත්වයක් ලබා දෙමින් මේ සඳහා මහන්සි වුණා. ගොඩක් වෙලාවට කියන කියන දේවල් වෙනස් කරන්න, ආපසු හදන්න වෙහෙස වෙමින්, අධිකරණයට පෙත්සම් ඉදිරිපත් කරනකොට ඒවාට මුහුණ දෙමින් මේ හැම කටයුත්තකදීම සහයෝගය දැක්වූ ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වනවා. ඒ වාගේම කුහකකමට හරි අද දින අදහස් ප්‍රකාශ කරපු ඒ සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙනවා. මට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු කථානායකතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමිය.

අද දින පනත් කෙටුම්පත් තුනක් සම්බන්ධයෙන් අපට තීරණ ගන්න තිබෙන නිසා මම පළමුවෙන්ම සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා, තව විනාඩි කිහිපයක් අමතරව ලබා ගැනීම සඳහා. කාලවේලාව ලබාදෙන්න සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සභාව එකඟද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Divide!

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු-
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின்-
At the conclusion of the division bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ගරු මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව. The Voting is in progress.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසියම් මන්ත්‍රීවරයකුට තම ඡන්දය ප්‍රකාශ කිරීමට යම් අපහසුතාවක් තිබෙනවා නම්, කරුණාකර අත උස්සන්න. Anybody who finds it difficult, please raise your hand.

There seems to be a few of them: Hon. Gamini Lokuge, Hon. (Dr.) Bandula Gunawardane, Hon. Salinda Dissanayake, Hon. K. Thurairetnasingam and the Hon. D.M. Swaminathan. ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් රාජ්‍ය අමාත්‍යතුමාටත් ඡන්දය ප්‍රකාශ කිරීමට යම් අපහසුතාවක් තිබෙන බව පෙනී යනවා. Have the others voted? The names will appear on the digital screen. - [*Interruption.]* ගරු සාලින්ද දිසානායක මන්ත්‍රීතුමාටත් ඡන්දය ප්‍රකාශ කිරීමේ අපහසුතාවක් තිබෙන බව පෙනී යනවා. ඔබතුමා ඡන්දය දෙන්නේ මෙම කෙටුම්පතට පක්ෂවද, විරුද්ධවද?

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)
විරුද්ධව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා ඡන්දය දෙන්නේ විරුද්ධව. ගරු තුරෙයිරෙත්නසිංහම් මන්ත්‍රීතුමනි, are you for or against?

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
ஆம்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. D.M. Swaminathan, are you for or against this Bill?

ගරු ඩී.එම්. ස්වාමීනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
For.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා, are you for or against?

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා පක්ෂද, විරුද්ධද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
විරුද්ධයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The names have appeared. කරුණාකර ඔබතුමන්ලා දැන් ඩිජිටල් පුවරුවේ සඳහන් වන නම් ටික බලන්න.

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.

(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது)

(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද ඒමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 117: විරුද්ධව 50: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.

இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 117; எதிராக 50; சமூகமின்மை 0.

According to Electronic Voting, Parliament divided: Ayes 117: Noes 50: Abstain 0.

G 001. Sarath Amunugama	Yes
G 002. Mangala Samaraweera	Yes
G 003. Nimal Siripala de Silva	Yes
G 004. Gamini Jayawickrama Perera	Yes
G 005. John Amaratunga	Yes
G 006. Lakshman Kiriella	Yes
G 007. Ranil Wickremesinghe	Yes
G 009. Gayantha Karunatileka	Yes
G 011. Rajitha Senaratne	Yes
G 012. Rishad Bathiudeen	Yes
G 014. Sajith Premadasa	Yes
G 015. Malik Samarawickrama	Yes
G 017. Tilak Marapana	Yes
G 018. Mahinda Samarasinghe	Yes
G 019. Wajira Abeywardana	Yes
G 022. S.B. Nawinne	Yes
G 023. Field Marshal Sarath Fonseka	Yes
G 024. Patali Champika Ranawaka	Yes
G 025. Mahinda Amaraweera	Yes
G 026. Navin Dissanayake	Yes
G 028. Duminda Dissanayake	Yes
G 029. Wijith Wijayamuni Zoysa	Yes
G 030. P. Harrison	Yes
G 031. R.M. Ranjith Madduma Bandara	Yes
G 032. Wijeyadasa Rajapakshe	Yes
G 033. Arjuna Ranatunga	Yes
G 034. Palany Thigambaram	Yes
G 035. Chandrani Bandara	Yes
G 036. Thalatha Atukorale	Yes
G 037. Akila Viraj Kariyawasam	Yes
G 039. Abdul Haleem	Yes
G 040. Sagala Ratnayake	Yes

[ගරු කථානායකතුමා

G 041. Harin Fernando	Yes
G 042. Daya Gamage	Yes
G 043. Faiszer Musthapha	Yes
G 044. Ravindra Samaraweera	Yes
G 046. Piyasena Gamage	Yes
G 047. Lakshman Senewiratne	Yes
G 048. V.S. Radhakrishnan	Yes
G 051. Niroshan Perera	Yes
G 052. Ruwan Wijayawardene	Yes
G 054. Mohan Lal Grero	Yes
G 055. A.D. Premadasa	Yes
G 056. Vijayakala Maheswaran	Yes
G 059. Wasantha Aluwihare	Yes
G 060. Eran Wickramaratne	Yes
G 063. Ajith P. Perera	Yes
G 064. Weerakumara Dissanayake	Yes
G 065. Muthu Sivalingam	Yes
G 066. Ameer Ali Shihabdeen	Yes
G 067. Lasantha Alagiyawanna	Yes
G 068. Indika Bandaranayake	Yes
G 071. Dunesh Gankanda	Yes
G 072. Anoma Gamage	Yes
G 074. Ashok Abeysinghe	Yes
G 075. H.M.M. Harees	Yes
G 076. Karunarathna Paranawithana	Yes
G 077. H.R. Sarathie Dushmanth	Yes
G 078. Palitha Kumara Thewarapperuma	Yes
G 079. Manusha Nanayakkara	Yes
G 080. J.C. Alawathuwala	Yes
G 081. Seyed Ali Zahir Moulana	Yes
G 082. Lucky Jayawardana	Yes
G 083. Vadivel Suresh	Yes
G 084. Edward Gunasekara	Yes
G 085. M.S. Thowfeek	Yes
G 086. Ananda Kumarasiri	Yes
G 087. Ranjith Aluvihare	Yes
G 088. Abdullah Mahrooff	Yes
G 089. Sirinal de Mel	Yes
G 090. Anura Sidney Jayarathne	Yes
G 091. K.K. Piyadasa	Yes
G 092. Lakshman Ananda Wijemanne	Yes
G 093. A.A. Wijethunga	Yes
G 094. Buddhika Pathirana	Yes
G 095. Ajith Mannapperuma	Yes
G 096. Nalin Bandara Jayamaha	Yes
G 097. Hector Appuhamy	Yes
G 099. Thushara Indunil Amarasena	Yes
G 100. A. Aravindh Kumar	Yes
G 102. Ashoka Priyantha	Yes
G 104. Nalaka Prasad Colonne	Yes
G 105. Chandima Gamage	Yes
G 106. Kavinda Heshan Jayawa	Yes
G 107. Mylvaganam Thilakarajah	Yes
G 108. Ravi Karunanayake	Yes
G 110. Mohamed Navavi	Yes
G 111. Sujith Sanjaya Perera	Yes
G 112. Hirunika Premachandra	Yes
G 113. Bandula Lal Bandarigoda	Yes
G 114. M. Ibrahim Mohammad Mansoor	Yes
G 115. S.M. Marikkar	Yes
G 116. Imran Maharoof	Yes
O 007. Mavai S. Senathirajah	Yes
O 013. Dinesh Gunawardana	No
O 016. Wimal Weerawansa	No
O 017. Vasudeva Nanayakkara	No
O 021. Selvam Adaikkalanathan	Yes
O 025. Seeniththamby Yoheswaran	Yes
O 026. S. Shritharan	Yes
O 028. M.A. Sumanthiran	Yes
O 029. Gamini Lokuge	No
O 030. C.B. Ratnayake	No
O 031. Mahinda Yapa Abeywardena	No
O 032.Keheliya Rambukwella	No
O 033. Kumara Welgama	No
O 035. Johnston Fernando	No
O 036. Chandrasiri Gajadeera	No
O 038. A.D. Susil Premajayantha	No
O 044. I. Charles Nirmalanathan	Yes
O 045. S. Viyalanderan	Yes
O 046. Gnanamuthu Srineshan	Yes
O 047. Shanthi Sriskandarasa	Yes
O 048. S. Sivamohan	Yes
O 049.S.M. Chandrasena	No
O 050. Mahindananda Aluthgamage	No
O 051. Piyankara Jayaratne	No
O 052. Rohitha Abeygunawardana	No
O 053. Premalal Jayasekera	No
O 055. Duleep Wijesekara	No
O 056. S.C. Mutukumarana	No
O 057. Lakshman Yapa Abeywardene	No
O 058. Chandima Weerakkody	No
O 060. Susantha Punchinilame	No
O 062. Ishak Rahuman	Yes
O 063. Mujibur Rahuman	Yes
O 064. Harshana Rajakaruna	Yes
O 065. Arundika Fernando	No
O 066. Nimal Lanza	No
O 067. Wimalaweera Dissanayaka	No

O 068. Jayantha Samaraweera	No
O 069. P. Udayashantha Gunasekara	No
O 070. Dilum Amunugama	No
O 071. Mohan Priyadarshana De Silva	No
O 072. T. Ranjith De Zoysa	No
O 073. Ramesh Pathirana	No
O 074. Vijitha Berugoda	No
O 077. Thilanga Sumathipala	No
O 078. Sudarshini Fernandopulle	No
O 079. Lakshman Wasantha Perera	No
O 080. Tharanath Basnayake	No
O 081. Jayampathy Wickramaratne	Yes
O 082. Thusitha Wijemanna	Yes
O 083. Rohini Kumari Wijerathna	Yes
O 084. Chaminda Wijesiri	Yes
O 086. Janaka Wakkumbura	No
O 088.Thenuka Vidanagamage	No
O 089. Shehan Semasinghe	No
O 090. Kanaka Herath	No
O 091. Udaya Prabhath Gammanpila	No
O 092. D.V. Chanaka	No
O 093. Sisira Jayakody	No
O 095. Piyal Nishantha De Silva	No
O 096. Sanath Nishantha Perera	No
O 101. Heshan Withanage	Yes
O 103. Chathura Sandeepa Senaratne	Yes
O 104. Wijepala Hettiarachchi	Yes
O 105. Mohamadu Nazeer	Yes
O 109. S. Premarathna	No
O 110. Tharaka Balasuriya	No
O 111. K. Kader Masthan	Yes
O 116. Indika Anuruddha Herath	No
O 043. Kaveendiran Kodeeswaran	Yes
O 112. Prasanna Ranatunga	No
O 113. Prasanna Ranaweera	No
O 114. Angajan Ramanathan	Yes
O 115. Kanchana Wijesekara	No

Electronic Voting Results

YES	117
NO	50
ABSTAIN	00

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කළේ නැද්ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එතුමා ප්‍රමාද වෙලා ආවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීම අවසන් වූ පසු යම් මන්ත්‍රීවරයකු සභා ගර්භයට පැමිණියහොත් ස්ථාවර නියෝග අනුව නැවත ඡන්දය ප්‍රකාශ කිරීම අපහසු වනවා. [බාධා කිරීමක්] අපි දැන් ඔබතුමන්ලා සියලුදෙනාගේ ඡන්දය සටහන් කර ගෙන අවසන්.

Order, please! විද්‍යුත් ඡන්ද විමසීම අනුව මෙම පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 117යි; විරුද්ධව 50යි. නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමාගේ ඡන්දය ප්‍රකාශ කිරීමත් සටහන් වෙලා තිබෙනවා. ඒ අනුව පනතට පක්ෂව මුළු ඡන්ද සංඛ්‍යාව 119යි; විරුද්ධව 52යි.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු තලතා අතුකෝරල මහත්මිය]

තීරමානික්කප්පට්ටது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Thalatha Atukorale.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[The HON. SPEAKER in the Chair.]

1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය. - (1978 අංක 2 දරන පනතට 12අ, 12ආ සහ 12ඇ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම.)

வாசகம் 2. - (1978ஆம் ஆண்டின் 2ஆம் இலக்கச் சட்டத்தில் 12அ, 12ஆ மற்றும் 12இ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்.)

CLAUSE 2.- *(Insertion of new sections 12A, 12B and 12C in Act, No. 2 of 1978)*

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 11 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයට ඇතැම් වැරදි පිළිබඳව ඇති අධිකරණ බලය.

12.අ. (1) (අ) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවනු ලැබූ මහාධිකරණය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය ප්‍රකාරව, මේ පනතේ භය වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මූල්‍යමය සහ ආර්ථිකමය වැරදි සහ එවැනි යම් වරදක් සිදු කිරීමේ ක්‍රියාවලිය තුළදී කරනු ලබන වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට එරෙහිව අධිචෝදනා මත පවරනු ලබන අපරාධ නඩු, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ලිඛිත නීතියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට (මෙහි මින්මතු "ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය" යනුවෙන් සඳහන් කරනු ලබන) අග්‍ර විනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන එකවර විනිශ්චයාසනාරූඪ වන ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ විනිශ්චයකාර වරයන් තිදෙනෙකුගෙන් සමන්විතව, විභාග කිරීම, නඩු විභාග කිරීම සහ තීරණය කිරීම කළ යුතුය.

(ආ) අමාත්‍යවරයා විසින් අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් ඒ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ අධිකරණ සංඛ්‍යාව වැඩි කරනු ලැබිය හැකිය.' ";

(2) " 1 වන පිටුවේ, 22වන පේළියේ සිට 29 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(2) (අ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, -

(i) යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව ඇතුළත සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ සිදු කරන ලද; හෝ

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින්, ශ්‍රී ලංකාවේ දේශ සීමාවෙන් පිටත කිනම් ස්ථානයකදී වුව ද, නැතහොත් කවර වූ හෝ වර්ගයක යම් නැවක හෝ යම් ගුවන් යානයක නැතහොත් එබඳු යම් නැවක් හෝ ගුවන් යානයක් සම්බන්ධයෙන් සිදු කරන ලද,

(1) වන උපවගන්තියේ සඳහන් කර ඇති වරදක් සම්බන්ධයෙන් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතුය.

(ආ) භය වන උපලේඛනයේ සඳහන් කර ඇති වැරදි සම්බන්ධයෙන් වෙනත් යම් අධිකරණයකට ඇති අධිකරණ බලය අඛණ්ඩව බලාත්මකව පවතින බව, සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. ' ";

(3) " 2 වන පිටුවේ, 1 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(3) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ අධිකරණ බලය -

(අ) ඒ මහාධිකරණය, බස්නාහිර පළාත සඳහා පිහිටුවන ලද මහාධිකරණය නම්, කොළඹ දී සහ අවශ්‍ය වන විට අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින්, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන බස්නාහිර පළාත ඇතුළත වෙනත් යම් ස්ථානයක දී, පවත්වනු ලබන මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය; නැතහොත්

(ආ) ඒ මහාධිකරණය වෙනත් යම් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයක් නම්, අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින්, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ පළාත ඇතුළත යම් ස්ථානයක දී පවත්වනු ලබන මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(4) (අ) අවස්ථාවෝචිත පරිදි, නීතිපතිවරයා විසින් හෝ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විධානය මත අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් යම් වරදකට අදාළව,-

(i) එම වරදේ ස්වභාවය සහ අවස්ථානුගත කරුණු;

(ii) එම වරදේ බැරෑරුම්කම;

(iii) එම වරදේ සංකීර්ණ බව; සහ

(iv) ඒ වරද නිසා චින්දිතයා මත වන බලපෑම; හෝ

(v) ඒ වරද නිසා රජය මත වන බලපෑම,

සැලකිල්ලට ගෙන, ඒ වරද පිළිබඳ අපරාධ නඩු කටයුතු ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවරනු ලැබිය යුතු ද යන්න පිළිබඳ විධානයක් ලබා ගැනීම සඳහා, ඒ වරද සිදු කිරීමට අදාළ තොරතුරු අග්‍රවිනිශ්චයකාරවරයා වෙත යොමුකරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ තොරතුරු යොමු කිරීමේ දී ඒ ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නිර්ණායක එකක් හෝ කිහිපයක් සපුරා ඇති බව අග්‍රවිනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක දී, ඔහු විසින් තම අත්සන යටතේ වූ ආඥාවක් මඟින්, ඒ වරද සම්බන්ධයෙන් අපරාධ නඩු කටයුතු ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ පැවැත්විය යුතු බවට විධාන කළ හැකි ය.

(5) අග්‍ර විනිශ්චයකාරවරයා විසින් එසේ විධාන කරනු ලැබූ අවස්ථාවක දී, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ ඇති නඩු විභාගයක්-

(අ) නීතිපතිවරයා විසින් හෝ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විධානය මත අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන අධිචෝදනා පත්‍රයක් මත පවත්වනු ලැබිය යුතු ය;

(ආ) ඉක්මනින් පවත්වා අවසන් කරනු ලැබිය යුතුය; සහ

(ඇ) අධිකරණයේ මතය අනුව වාර්තා කරනු ලැබිය යුතු අසාමාන්‍ය අවස්ථානුගත කරුණු පවතින්නේ නම් මිස, එය ඉක්මනින් අවසන් වීමට වගබලා ගැනීම සඳහා දිනපතා විභාග කළ යුතු ය. ' ";

(4) "3 වන පිටුවේ, 10 වන සහ 11 වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'කිරීම නතර වන අවස්ථාවක දී, අග්‍ර විනිශ්චයකාරවරයා විසින්, එකී මරණය, ඉල්ලා අස්වීම,' ";

(5) "3 වන පිටුවේ, 26 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'අවස්ථාවක ද, එම අවස්ථාවේ සිට එම නඩු විභාගය, මේ පනතේ 48 වන වගන්තියේ අතුරු විධානයට යටත්ව, ' ";

(6) "3, වන පිටුවේ, 29 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළු ව) ඉවත් කරන්න;"

(7) "4 වන පිටුවේ, 1 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළු ව) ඉවත් කරන්න;"

(8) "5 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළු ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(7) ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු පැවරීමට'

(9) "5 වන පිටුවේ, '21 වන හා 22 වන පේළි ඉවත් කරන්න.' "

(10) "6 වන පිටුවේ, 12 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'12අ වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තිරුත්තங்கள් விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 3. - (முதன்மைச் சட்டவாக்கத்தின் 63ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 3.- *(Amendment of section 63 of the principal enactment)*

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 23 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" යන්නෙන්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අදහස් වේ; ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට භයවන උපලේඛනය එකතු කිරීම.)

வாசகம் 4. - (முதன்மைச் சட்டவாக்கத்தில் ஆறாம் அட்டவணையைச் சேர்த்தல்.)

CLAUSE 4.-(*Addition of the Sixth Schedule in the principal enactment*.)

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

" 11 වන පිටුවේ, 30 වන හා 31 වන පේළි ඉවත් කරන්න."
"12 වන පිටුවේ, 20 වන හා 21 වන පේළි ඉවත් කරන්න."

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමියගෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. එතුමිය විසින් ඉදිරිපත් කරනු ලැබූ මේ සංශෝධන සඳහා නීතිපතිතුමාගේ ලිඛිත අනුමැතිය ලැබිලා තිබෙනවාද?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔව්, නීතිපතිතුමාගේ සහතිකය ලැබී තිබෙනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවට ලිඛිතව ලැබී තිබෙනවාද?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔව්, තිබෙනවා.

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 4, as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 5 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

විනා විරුද්ධත්වයක් නොදක්වන ලදින්, එය එසේ සිදු විය.
අතිරේක මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලදී.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
PENAL CODE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විරුද්ධත්වයක් නොදක්වන ලදින්, එය එසේ සිදු විය.
අතිරේක මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලදී.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු තලතා අතුකෝරල මහත්මිය]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Thalatha Atukorale .]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[The HON SPEAKER *in the Chair.]*

1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1 முதல் 4 வரையான வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 4 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.

විනා විරුද්ධත්වයක් නොදක්වන ලදින්, එය එසේ සිදු විය.
අතිරේක මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලදී.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත රීට අනුකූලව දෙ වන වර කියවන ලදී.
විනා විවාදයකින් තොරව, ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' -[ගරු තලතා අතුකෝරල මහත්මිය]
තීරණය කරන ලදී.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Thalatha Atukorale .]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
කුලුවිල් ආරාය්පට්ටදු.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[The Hon. SPEAKER in the Chair.]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (1979 අංක 15 දරන පනතට 122අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.)
வாசகம் 2.- (1979ஆம் ஆண்டின் 15ஆம் இலக்கச் சட்டத்தில் 122அ என்னும் புதிய பிரிவினை உட்புகுத்துதல்.)
CLAUSE 2.-(*Insertion of new section 122A in the Act, No. 15 of 1979)*

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 13 වන පේළියේ සිට 24 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(අ) එම ළමයා විසින් කරන ලදැයි කියනු ලබන වරදේ ස්වභාවය සහ එහි ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින්, එම ළමයාගේ වගකීමේ ප්‍රමාණය කොපමණද යන්න;

සහ

(ආ) එම ළමයාට යම් චිකිත්සක ප්‍රතිකාර අවශ්‍ය වන්නේද යන්න,

ඒ කාරණය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාට තීරණය කිරීමට හැකි කරවන්නා වූ, ප්‍රමාණවත් පැසුණු බුද්ධියක් එම ළමයා ලබා තිබේ ද යන්න පිළිබඳ වූ වාර්තාවක් ලබා ගැනීම සඳහා, එම ළමයාගේ මව, පියා හෝ භාරකරුගේ කැමැත්ත ඇතිව, එම ළමයා (2) වන උප වගන්තියේ සඳහන් විශේෂඥයන්ගෙන් සමන්විත බහු විෂය කණ්ඩායමක් මඟින්' ";

(2) "1 වන පිටුවේ, 25 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

'(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති බහු විෂය කණ්ඩායමට-

(අ) අදාළ දිස්ත්‍රික්කයේ අධිකරණ වෛද්‍ය නිලධරයා;

(ආ) ළමා හෝ නව යොවුන් විය පිළිබඳ මනෝ වෛද්‍යවරයෙකු; සහ

(ඇ) මනෝ විද්‍යාඥයෙකු,

ඇතුළත් විය යුතුය.' ";

(3) "2 වන පිටුවේ, 3 වන හා 4 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අවස්ථාවක දී, එම බහු විෂය කණ්ඩායමට එම ළමයා පරීක්ෂා කිරීමට' ";

(4) "2 වන පිටුවේ, 8 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(4) අදාළ දිස්ත්‍රික්කයේ අධිකරණ වෛද්‍ය නිලධරයා නොමැති යම් අවස්ථාවක දී, වරද විමර්ශනය කරන පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති වාර්තාව ලබා ගැනීම සඳහා වෙනත් යම් දිස්ත්‍රික්කයක අධිකරණ වෛද්‍ය නිලධරයකුගෙන් සහාය ලබා ගත යුතු ය.' ";

(5) "2 වන පිටුවේ, 9 වන සහ 10 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(5) එම බහු විෂය කණ්ඩායම විසින් තම වාර්තාව පොලිස් ස්ථානය' ";

(6) "2 වන පිටුවේ,16 වන සහ 17 වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් එම වාර්තාව මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති ළමයා, ළමයින් පිළිබඳ මනෝ වෛද්‍යවරයකු සහ මනෝ විද්‍යාඥයකුගේ අධීක්ෂණය සහ ඇගයුම යටතේ, නියමිත ආකාරයට පුනරුත්ථාපනය කරනු ලැබිය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ඇම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ඇම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

චට්ටමූලම් තිරුත්තඞ්කළුටන් අරික්කෛ චෙය්යප්පට්ටතු.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

විනා විඩුක්කප්පට්ටු, ඒර්‍රුක්කොළ්ළප්පට්ටතු.
අතන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්‍රාම්මුරෛයාක මතිප්පිටප්පට්ටු නිරෛවේර්‍රප්පට්ටතු.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.54ට, 2018 මැයි 10 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් තියේය.


අතන්පඩි පි.ව. 6.54 මණික්කු පාරාළුමන්‍රම්, 2018 මේ 10, වියාළක්කිළමෛ මු.ව. 10.30 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටතු.

Parliament adjourned accordingly at 6.54 p.m. until 10.30 a.m. on Thursday, 10th May, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

260 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 260 - இல. 3
Volume 260 - No. 3

2018 මැයි 10වන බ්‍රහස්පතින්දා
2018 மே 10 , வியாழக்கிழமை
Thursday, 10th May, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට ආනුෂංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව

බ්‍රසීලයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයෙහි, නිව්යෝර්ක් නුවර, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා කාර්යාල මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් ස්ථානය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දරන ලද වියදම පිළිබඳ සොයා බලා වාර්තා කිරීම පිණිස වූ විශේෂ කාරක සභාව

කල් තැබීමේ යෝජනාව :

අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය විවෘත කරමින් අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද ප්‍රකාශය

பிரதான உள்ளடக்கம்

வெளிநாட்டிலுள்ள இலங்கையர்களுக்கு எதிர்வரும் தேர்தல்களில் வாக்களிப்பதற்கு வாய்ப்பளித்தல் மற்றும் அவற்றின் இடைநேர்விளைவான விடயங்களை ஆராய்ந்து அறிக்கையிடுவதற்கான தெரிகுழு

பிரேசில் நாட்டில் உள்ள இலங்கைத் தூதரகத்தின் அலுவலகம் மற்றும் ஐக்கிய அமெரிக்கா, நியூயோர்க்கிலுள்ள ஐக்கிய நாடுகளின் இலங்கைக்கான நிரந்தரப் பிரதிநிதியின் அலுவலகம் என்பவற்றைக் கொள்வனவு செய்வதற்காக இலங்கை மத்திய வங்கிக்கு ஏற்பட்ட செலவுகளை ஒவ்வொரு வளாகம் தொடர்பில் தனித்தனியாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கான தெரிகுழு

ஒத்திவைப்புப் பிரேரணை:

எட்டாவது பாராளுமன்றத்தின் இரண்டாவது கூட்டத்தொடரினை ஆரம்பித்துவைத்து அதியுத்தம ஜனாதிபதி அவர்கள் ஆற்றிய உரை

PRINCIPAL CONTENTS

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT ON THE POSSIBILITY OF ENABLING SRI LANKANS EMPLOYED OVERSEAS TO EXERCISE THEIR FRANCHISE IN FUTURE ELECTIONS AND MATTERS INCIDENTAL THERETO

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT ON THE EXPENSES INCURRED BY THE CENTRAL BANK OF SRI LANKA FOR THE PURCHASING OF THE OFFICE FOR THE SRI LANKAN EMBASSY IN BRAZIL AND THE OFFICE FOR THE PERMANENT REPRESENTATIVE OF SRI LANKA TO THE UNITED NATIONS, NEW YORK, USA, SEPARATELY IN RESPECT OF EACH PREMISES

ADJOURNMENT MOTION:

Address to Parliament by His Excellency President Opening the Second Session of Eighth Parliament

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 මැයි 10වන බුහස්පතින්දා
2018 மே 10, வியாழக்கிழமை
Thursday, 10th May, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරක සභා වාර්තා පිළිගැන්වීම. අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව, එම කාරක සභාවේ සභාපති ගරු වඩිවේල් සුරේෂ් මැතිතුමා විසින් පිළිගැන්වීම. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு
COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That notwithstanding the provisions of Standing Order No. 115 of Parliament, the Committee on Parliamentary Business shall consist of the Speaker as the Chair, the Deputy Speaker, the Deputy Chairman of Committees, the Leader of the House of Parliament, the Leader of the Opposition in Parliament, the Chief Government Whip, the Chief Opposition Whip and fifteen (15) other Members to be nominated by the Committee of Selection."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That notwithstanding the provisions of Standing Order No. 8 of the Parliament, the hours of sittings of Parliament on this day shall be 10.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m.. At 10.30 a.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට ආනුෂංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව
வெளிநாட்டிலுள்ள இலங்கையர்களுக்கு எதிர்வரும் தேர்தல்களில் வாக்களிப்பதற்கு வாய்ப்பளித்தல் மற்றும் அவற்றின் இடைநேர்விளைவான விடயங்களை ஆராய்ந்து அறிக்கையிடுவதற்கான தெரிகுழு
SELECT COMMITTEE TO LOOK INTO AND REPORT ON THE POSSIBILITY OF ENABLING SRI LANKANS EMPLOYED OVERSEAS TO EXERCISE THEIR FRANCHISE IN FUTURE ELECTIONS AND MATTERS INCIDENTAL THERETO

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That in terms of Standing Order No. 102, this Parliament do grant the Select Committee of Parliament to recommend and report on the possibility of enabling Sri Lankans employed overseas to exercise their franchise in future elections and matters incidental thereto appointed by the Hon. Speaker, on 17th November 2016, an extension of time till 20th November 2018 as the Committee is unable to report its findings to Parliament within the time limit granted by the motion agreed to by the Parliament on 06th April 2016."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

බ්‍රසීලයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයෙහි, නිව්යෝර්ක් නුවර, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා කාර්යාල මිල දී ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් ස්ථානය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දරන ලද වියදම පිළිබඳ සොයා බලා වාර්තා කිරීම පිණිස වූ විශේෂ කාරක සභාව

பிரேசில் நாட்டில் உள்ள இலங்கைத் தூதரகத்தின் அலுவலகம் மற்றும் ஐக்கிய அமெரிக்கா, நியூயோர்க்கிலுள்ள ஐக்கிய நாடுகளின் இலங்கைக்கான நிரந்தரப் பிரதிநிதியின் அலுவலகம் என்பவற்றைக் கொள்வனவு செய்வதற்காக இலங்கை மத்திய வங்கிக்கு ஏற்பட்ட செலவுகளை ஒவ்வொரு வளாகம் தொடர்பில் தனித்தனியாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கான தெரிகுழு

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT ON THE EXPENSES INCURRED BY THE CENTRAL BANK OF SRI LANKA FOR THE PURCHASING OF THE OFFICE FOR THE SRI LANKAN EMBASSY IN BRAZIL AND THE OFFICE FOR THE PERMANENT REPRESENTATIVE OF SRI LANKA TO THE UNITED NATIONS, NEW YORK, USA, SEPARATELY IN RESPECT OF EACH PREMISES

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That in terms of Standing Order No. 102 of Parliament, this Parliament do grant the Select Committee of Parliament to look into and report on the expenses incurred by the Central Bank of Sri Lanka for the purchasing of the Office for the Sri Lankan Embassy in Brazil and the Office for the Permanent Representative of Sri Lanka to the United Nations, New York, USA, separately in respect of each premises appointed by the Hon. Speaker, on 23rd May 2017, an extension of time till 05th December, 2018 as the Committee is unable to report its findings to Parliament within the time limit granted by the Motion agreed to by Parliament on 09th February 2017."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තැබීම.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තැබීමේ යෝජනාව, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය විවෘත කරමින් අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද ප්‍රකාශය

எட்டாவது பாராளுமன்றத்தின் இரண்டாவது கூட்டத்தொடரினை ஆரம்பித்துவைத்து அதியுத்தம ஜனாதிபதி அவர்கள் ஆற்றிய உரை

ADDRESS TO PARLIAMENT BY HIS EXCELLENCY PRESIDENT OPENING THE SECOND SESSION OF EIGHTH PARLIAMENT

[පූ.භා. 10.33]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පසු ගිය දා, එනම් 2018 මැයි මාසයේ 08 වැනිදා අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සැසිවාරය විවෘත කරමින් අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද ප්‍රකාශනය සම්බන්ධයෙන් වූ කල් තැබීමේ යෝජනාව මෙසේය:

"ශ්‍රී ලංකා අටවන පාර්ලිමේන්තුවෙහි දෙවන සැසිවාරය විවෘත කරමින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් කළ කථාව තුළින්,

1. වර්ෂ 2015, 2016, 2017 තෙවර්ෂයේදී ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය, කර්මාන්ත, සේවා අංශයන්හි ඇති වූ දරුණු පසු බැම නිසාවෙන් ඇති වූ ආර්ථික අපගමනයෙන් රට ගොඩ නැඟීමට අදාළ කිසිදු ඵලදායී වැඩ පිළිවෙළක් ප්‍රකාශ නොකළ හෙයින් ද;

2. මුදල් ක්ෂේත්‍රයේ මුදුන් මල්කඩ වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්වසනීයභාවයට හානි පැමිණවීමෙන් පසු සමස්ත මුදල් ක්‍රමය, බැංකු ක්‍රමය, ණය ක්‍රමය මුහුණ දෙමින් සිටින මූල්‍ය අර්බුදයෙන් ගොඩ ඒමට මහක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වූ බැවින් ද,

3. දෙරාජ්‍යයට ම වාසි දායක නොවන අයුරින්, ස්වදේශිකයන් වනසන, විජාතිකයන් සනසන ආකාරයට ක්‍රියාත්මක කිරීමට යත්න දරන ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳව අනුගමනය කරන ජාතික ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කිරීමට අපොහොසත් වී ඇති බැවින් ද,

4. උපනුපන් පරම්පරාවන්ට හිමි විය යුතු ජාතික සම්පත් විජාතීකරණය හෝ පෞද්ගලීකරණය තුළින් ගජ මිතුරු සමාජයක් බිහි කිරීම වැළැක්වීමට අදාළ ප්‍රකාශනයක් නොකළ හෙයින් ද,

5. රුපියලෙහි අගය දිගින් දිගටම කඩා වැටීම, අසීමිත බදු බර හා ප්‍රමාණවත් නොවන රාජ්‍ය මැදිහත් වීම් නිසාවෙන් දිනපතා ඉහළ යන ජීවන වියදමේ අර්බුදයට සහනදායී වැඩ පිළිවෙළක් ප්‍රකාශ නොකළ බැවින් ද,

6. දේශපාලනික පළිගැනීම්, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා පිළිවෙත්, රණවිරු දඩයම වැළැක්වීම පිළිබඳ කිසිදු සඳහනක් නොවූ බැවින් ද,

7. සභාග ආණ්ඩුව ජනතාවගේ දැවෙන ප්‍රශ්න කිසිවකටත් ඵලදායී විසඳුම් ලබා දීමට අපොහොසත් වී ඇති බැවින්ද, දිගටම පාලන හා ආණ්ඩු අර්බුදයට රට පත් වී ඇති බැවින්ද,

උක්ත ජනාධිපති ප්‍රකාශය පිළිබඳව පුරා දිනෙක පාර්ලිමේන්තු විවාදයක් ඉල්ලා සිටිමු."

ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂය ප්‍රධාන වශයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කරන්නට හේතු වුණේ මේ කාරණා නිසායි. අපේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ ජනාධිපතිවරු ගණනාවක් පාර්ලිමේන්තු සැසිවාර කල් තබා අලුත් සැසිවාර විවෘත කරලා තිබෙනවා. ඒ සෑම අලුත් සැසිවාරයක් විවෘත කිරීමේදී රටට අලුත් ප්‍රකාශයක්, ඵලදායී ප්‍රකාශයක් පාර්ලිමේන්තුව ඉදිරියට තබා තිබෙනවා. මේ වාරයේත් රට මුහුණ දෙන අර්බුදකාරී අවස්ථාවේදී විශ්වාසයෙන් හා සන්තුෂ්ටියෙන් ඉදිරියට ගමන් කළ හැකි ජාතියක් බවට පත් කිරීමට ජනාධිපතිතුමාගෙන් එවැනි ඵලදායී ප්‍රකාශයක් ලැබෙය කියන බලාපොරොත්තුව ජනතාවගේ යම් යම් කොටස් අතර තිබුණද, ඒ බලාපොරොත්තුව ඉටු කරන්නට අපොහොසත් වුණු බව මා පළමුවෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, රට තුළ ඵලදායී තත්ත්වයක් ඇති කර ගැනීමට බැරි වී තිබෙන බව ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට පැමිණ ඉදිරිපත් කරන ලද ප්‍රකාශයෙන් පැහැදිලි වන බව අප සඳහන් කරන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවට නිවාඩු දෙන්න පුළුවන්; අලුත් සැසි වාර විවෘත කරන්න පුළුවන්. පළමු වන වරට තමයි වත්මන් ජනාධිපතිතුමා එසේ පාර්ලිමේන්තු වාරය අවසන් කරලා, මේ පාර්ලිමේන්තු සැසි වාරය විවෘත කිරීමට පැමිණියේ. ඒ අවස්ථාව වන විට පාර්ලිමේන්තු කාලයෙන් අඩක් ගත වෙලා ඉවරයි; ජනාධිපතිතුමාගේ ධුර කාලයෙන් අඩකට වැඩි කාලයක් ගත වෙලා ඉවරයි; රටේ පාලන තන්ත්‍රය කඩා වැටිලා ඉවරයි. ඒ පිළිබඳව අලුත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබෙනවා. ආණ්ඩුවකට මඟ පෙන්වන්නේ ජනාධිපතිවරයෙකුගේ කථාවෙන්. ජනාධිපතිවරයාගේ ප්‍රකාශනය තමයි ආණ්ඩුවකට මඟ පෙන්වන්නේ; ආණ්ඩුව මෙහෙය වන්නේ; ආණ්ඩුවට අනුගමනය කරන්න සිදු වන්නේ. නමුත් මේ ආණ්ඩුව එවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමට අපොහොසත් වී තිබෙන බව ජනාධිපතිතුමාගේ කථාවෙන්ම ප්‍රකාශ වෙලා තිබෙනවා. විශ්වාසය වැදගත්, ගරු කථානායකතුමනි. රටක ජනතාවට හා පාර්ලිමේන්තුවට අවශ්‍ය වන්නේ විශ්වාසය; the confidence, the trust that we can build in our nation and in the international community.

Today we have lost this confidence. The Government has been brought to a virtual collapse, an anarchy and a bankruptcy - I am sorry to use these words, but that is the situation. That is why we have requested this Debate. At least the shortcomings that we could expose in His Excellency the President's Address to Parliament, which has to be followed by the Government and will be taken seriously by the Government.

The Government itself is in pieces today. Political cracks have emerged in the Government. Sixteen Ministers have resigned, crossed the Floor and joined the Opposition because the Government has failed. The UNP - SLFP coalition that the President is quoting - මේ සභාගය ගෙන යෑමේ අමාරුකම ඉගෙන ගන්න කියලායි ගරු ජනාධිපතිතුමා කියන්නේ.

මේ ගිවිසුම ගැන මේ පාර්ලිමේන්තුවේදී වාර ගණනාවක් මම ප්‍රශ්න කරලා තිබෙන බව මට මතකයි. ගරු කථානායකතුමාගෙන් අහලා තිබෙනවා. මේ ගිවිසුම පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ කාල සීමාව තුළ අවසන් වෙනවාය කිව්වා. ඉන්පසුව, එක්කෝ අලුත් ගිවිසුමකට පිවිසෙන්න ඕනෑ. අලුත් ගිවිසුමකට පිවිසෙනවා නම් පාර්ලිමේන්තුවට එය ඉදිරිපත් කළ යුතුයි. අලුත් ගිවිසුමකට පිවිසෙන්නේ නැත්නම්, ජාතික ආණ්ඩුව අවසන් වෙන්න ඕනෑ. ලංකාවේ දේශපාලන බලය මෙසේ උදුරා ගෙන ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා නම්, එය විහිළුවක්. අද සභාගයක් නැහැ; සභාගය ඉවරයි.

අග්‍රාමාත්‍යවරයා හැටියට එතුමාට ඕනෑනම් යූඑන්පී ආණ්ඩුවක් පවත්වා ගෙන යන්න පුළුවන්. නමුත්, මේ හවුල ඉවරයි කථානායකතුමනි. බුලත් කොළයේ මන්ත්‍රීවරු ගැන ඔබතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ නව සැසිවාරය විවෘත කරමින් ඉදිරිපත් කළ ප්‍රකාශනයේ කියනවා, මේ හවුල් ආණ්ඩු ගෙනයාම හරිම අමාරුයි කියලා හවුල් ආණ්ඩු සංකල්පය ගැන අවබෝධයක් නැති අයත් එක්ක කටයුතු කිරීමේදී ඇතිවන ගැටලු ගැන එතුමා කියනවා. ඒ කියන්නේ දැන් ආණ්ඩුව ගෙනයන්න බැරි තත්ත්වයක තිබෙනවා කියලා එතුමාත් පිළිගන්නවා. ප්‍රශ්නය, අපි නොවෙයි ආණ්ඩුව හැදුවේ. ප්‍රශ්නය, ආණ්ඩුව හදපු අයට ආණ්ඩුවක් ගෙන යන්න බැරි නම් රටේ ජනතාව අගාධයට දැමිය යුතු නැහැ; පාර්ලිමේන්තුව අගාධයකට දැමිය යුතු නැහැ; රට බංකොලොත් කළ යුතු නැහැ. ඇමතිකම් 10න්, 20න්, 30න් අවසන් කරනවා කිව්වා. ජනාධිපතිතුමා රටට දුන්නු පොරොන්දුව ඒකයි. රට රවටපු යහ පාලනයේ පොරොන්දුව ඒකයි. නමුත් අද යහ පාලන ආණ්ඩුවේ ඇමතිවරු සංඛ්‍යාව 30ක් නොවෙයි, 40ත් පහු කරලා 50ටත් ඇවිල්ලා. ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිවරුත් ඒකට එකතු කළොත් ඇමතිවරු 100කට වැඩියි. මේ ඇමතිවරු නඩත්තු කරන්නේ මොනවා කරන්නද? රුපියල වේගයෙන් බාල්දු වෙනවා. රුපියල බාල්දුවීමෙන් පසුගිය සතිය තුළ රුපියල් බිලියන 48කින් රටේ ණය බර වැඩි වුණා. මේ, මත්තල ගුවන් තොටුපොළ හදපු, කටුනායක අධිවේගී මාර්ගය හදපු සල්ලි හා සමාන මුදල් ප්‍රමාණයක්. එය එක සතියකදී ආණ්ඩුව අපේ රටට නැති කළා. මම දැන් බන්දුල ගුණවර්ධන මැතිතුමා එක්කත් කථා කළා; අනුර දිසානායක මැතිතුමා එක්කත් කථා කළා.

අපේ රටේ හිටපු මුදල් ඇමතිවරයකු වන රොනී ද මැල් මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ විවෘත ආර්ථික වැඩ පිළිවෙළ යටතේ විශාල කාර්ය භාරයක් සිදු කළා. එතුමා අපි ගරු කරන විශිෂ්ටයෙක්. එතුමා දක්ෂතාව හා අවබෝධය ඇතිව තමන් යටතේ තිබුණු මුදල් අමාත්‍යාංශය මෙහෙයවමින් ධනවාදී ආර්ථිකය ප්‍රාණවත් කළා; ධනවාදය ශක්තිමත් කළා. ගරු කථානායකතුමනි, එදා ඇමෙරිකන් ඩොලරයට අපේ රුපියල් 8ක් වශයෙන් තමයි වටිනාකම තිබුණේ. රොනී ද මැල් මැතිතුමා 1977 එතුමාගේ පළමුවැනි අය වැය ලේඛනයෙන් මේ ප්‍රමාණය රුපියල් 16 දක්වා වැඩි කළා. ඒ කියන්නේ ඇමෙරිකන් ඩොලරයට රුපියල් 8ක් වශයෙන් තිබුණු වටිනාකම රුපියල් 16 දක්වා වැඩි කළා; රුපියල සියයට සියයකින් අවප්‍රමාණය කළා.

ගරු කථානායකතුමනි, අද මේ කිසිවක් පාලනය කර ගන්න බැරිව දහලන ආණ්ඩුව ඇමෙරිකන් ඩොලරය රුපියල් 158 දක්වා ගෙනැල්ලා අවසානයි. එදා අපෙන් ආණ්ඩුව ගන්න කොට තිබුණු ගණන බලන විට රුපියල් 25කට වඩා වැඩි කර තිබෙනවා. හෙට මොනවා වෙයිද, අනිද්දා මොනවා වෙයිද කියලා කිසිම බලාපොරොත්තුවක් දෙන්න බැහැ. ඇමෙරිකානු ඩොලරයට රුපියලේ අනුපාතය වැඩි වනවා මිසක් අඩු වෙන්නේ නැහැ. ඒ නිසා පිට රටින් ගෙනෙන භාණ්ඩවල මිල වැඩි වනවා. නිෂ්පාදනය කරලා, වහාම -ක්ෂණිකව- විකුණන්න පුළුවන් දෙයක් අපිට නැහැ. ක්ෂණිකව නිෂ්පාදනය කරලා විකුණන්න දෙයක් තිබෙනවා නම් අපිට එයින් වාසියක් ගන්න පුළුවන්. එහෙම ක්ෂණිකව නිෂ්පාදනය කරලා, විකුණා වාසියක් ගත හැකි දෙයක් ජාත්‍යන්තර වෙළෙඳ පොළෙත් නැහැ. ආණ්ඩුව අද වනකොට විශාල මූල්‍ය අර්බුදයකට පත්වෙලා තිබෙනවා. මේ අවස්ථාව,

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

විදේශීය මූල්‍ය අර්බුදය උත්සන්නම වෙලා තිබෙන වෙලාවක්. ඒ අතරතුර මහ බැංකුවේ හොරකම කරපු මිනිසුන් ගැන කිසිම දෙයක් ආණ්ඩුවට කරගන්න බැරිවෙලා තිබෙනවා.

ගජ මිතුරන් ගැන ජනාධිපතිතුමාගේ මේ කථාවේ කියනවා. ගජ මිතුරන්ගෙන් ලොකුම ගජ මිතුරන් තමයි, මහ බැංකු හොරකමට සම්බන්ධ ගජ මිතුරන් ටික. ලෝකයේ මහ බැංකු තිබෙන්නේ රටකට එකක් වශයෙනුයි. රටකට එකක් වශයෙන් තිබෙන මහ බැංකුව තමයි රටේ මූල්‍ය ක්‍රමයට මහ පෙන්වන වග කිව යුත්තා. අපේ රටේ තිබෙන ඒ මහ බැංකුව වංචා කරලා තිබෙන බව අද ඔප්පු වෙලා තිබෙනවා. ජාතික ආර්ථිකයට හා මූල්‍ය ක්‍රමයට සිදු කළ මේ මහා අපරාධය ගැන ජනාධිපතිතුමාගේ කථාවේ කිසිම තැනක සඳහනක් නැහැ. පාර්ලිමේන්තුව තමයි මේ පිළිබඳව ප්‍රශ්නය අතට අරගෙන, මේ ගැන පරීක්ෂා කරන්න කියලා ඉල්ලීම කරලා මේ ගමන ආවේ. මම ඒ කාරණය විශේෂයෙන් සඳහන් කරනවා.

අපේ රටේ දැන් පළාත් තුනක පළාත් සභා ඡන්ද පවත්වන්නේ නැතුව ආණ්ඩුකාර පාලනයක් ගෙන යන බව සඳහන් කළ යුතුයි. සබරගමුව, උතුරු මැද සහ නැගෙනහිර පළාතේ ඡන්දය පැවැත්වූයේ නැහැ. පසුගිය සැප්තැම්බර් මාසයේ මැතිවරණ කොමිසම ඡන්දය ප්‍රකාශයට පත් කරන්න තිබියදී, ආණ්ඩුව හදිසියේ යෝජනාවක් ගෙනැල්ලා කාරක සභා අවස්ථාවේදී එය සම්මත කර ගත් හැටි බොහොම කනගාටුයි. ඒ වේලාවේත් කිව්වා, "මාර්තු මාසයේ 30වැනි දා වෙනකොට ඡන්දයකට ගමන් කරනවා" කියලා. දැන් අපි ජීවත් වෙන්නේ මැයි මාසයේ. ජනාධිපතිතුමා පාර්ලිමේන්තු සැසි වාරය විවෘත කරමින් කථා කළා. නමුත් ලංකාවේ ප්‍රධාන පළාත් තුනක ඡන්දය පැවැත්වීම ගැන කිසිම වචනයක් කථා කළේ නැහැ. ඒ අයට අද ඡන්දය නැහැ. ඒ නිසා වහාම ඡන්දය පවත්වන්න කියලා අපි ආණ්ඩුවට බල කරනවා. මගේ මිත්‍ර, විපක්ෂ නායක සම්පන්දන් මැතිතුමාත් මේ කාරණය සම්බන්ධයෙන් මා එක්ක එකඟ වෙයි. පසුගිය සැප්තැම්බර් මාසය වෙන කොට උතුරු මැද පළාත් සභාවේ කාලය ඉවරයි.

මධ්‍යම පළාත් සභාවේ කාලය ඉවරයි. වයඹ පළාත් සභාවේ කාලය ඉවරයි. එම පළාත් සභාවල ඡන්දය තියනවාද? එහෙම නැත්නම්, ලංකාවේ ඡන්ද නොතියා ජනාධිපතිතුමාගේ ආණ්ඩුකාර පාලනයෙන් ගමන් කරන පළාත් සභා ක්‍රමයක්ද අපට දායාද වෙන්නේ? මෙය උදවු වෙන්නේ නැහැ, නාස්තිය නවත්වන්න. මෙය උදවු වෙන්නේ නැහැ, අක්‍රමිකතා නවත්වන්න. මෙය උදවු වෙන්නේ නැහැ, සාධාරණ රාජ්‍ය පාලනයක් ගෙන යන්න. මේ කාරණාව අපි විශේෂයෙන් ජනාධිපතිතුමාට මතක් කරනවා. ආණ්ඩුවේ නායකයා ජනාධිපතිතුමා බව ප්‍රකාශ කරනවා නම්, දැන් ආණ්ඩුවට නියෝග කරලා මැතිවරණ කොමිසමට බලය දෙන්න ඡන්දය තියන්න කියලා. ඔබතුමා තමයි, "ඡන්දය තියන්න" කියලා ආණ්ඩුවට නියෝග කරන්න ඕනෑ. ඇයි, එය ඇන හිටලා තිබෙන්නේ?

ගරු කථානායකතුමනි, මැතිවරණ කොමිසම ඔබතුමාවත්, අපවත්, රටත් විවේචනයට ලක් කරනවා. කොමිසම ප්‍රසිද්ධියේම කියනවා, "පාර්ලිමේන්තුව, ඡන්දය පැවැත්වීමට අවහිර නොකර කරුණාකරලා ඒ සඳහා කටයුතු කරන්න" කියලා. එතකොට අවහිර කරන්නේ, පාර්ලිමේන්තුවයි. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ඔබතුමා. ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමයේ ජනතා අයිතිය හා ලංකාවේ ආර්ථිකය, දේශපාලනය සුරකින්න වාගේම, ආණ්ඩුකාරතුමාගේ තනි පාලන තන්ත්‍රය වෙනස් කර, පළාත් සභා හා පළාත් පාලන ආයතන රාශියේ පවතින මේ කනගාටුදායක තත්ත්වය නිවැරදි කිරීමට පාර්ලිමේන්තුවේ ප්‍රධානියා හැටියට ඔබතුමා වහා වහාම මැදිහත් වන්න කියලා ඒකාබද්ධ විපක්ෂය මේ අවස්ථාවේ බලකර කියා සිටිනවා.

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා සහ අනෙක් පක්ෂවල නායකයිනුත් කථා කරන්න සිටින නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. ගරු රවි කරුණානායක මැතිතුමා මුදල් ඇමති වශයෙන් සිටි කාලයේදී එතුමා රත්තරන් ආනයනය ලිහිල් කළා. රත්තරන් නිෂ්පාදනයට, රත්තරන් කර්මාන්තයට අලුතින් ආනයන බලපත්‍ර දුන්නා. නමුත් දැන් වාර්තා වනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන භාගයක්, half a billion US Dollars goes for import of gold. According to the records, nothing goes to the jewellery industry. Everything is being smuggled out. Who are those 50 people? ඔවුන්ගේ නම් සභාවට ඉදිරිපත් කරන්න. ජනාධිපතිතුමනි, දූෂණයට විරුද්ධයි, කර්මාන්ත නහා සිටුවීමට පක්ෂයි කියලා ඔබතුමාගේ කථාවේදී කිව්වා නම්, මෙන්න එවැනි තවත් කාරණයක්. මේ ගැන වහා කටයුතු කරන්න. ගරු කථානායකතුමනි, මේ කර්මාන්තය විතරක් නොවෙයි, දැන් කර්මාන්ත ගණනාවක් මේ විධියට වැසීගෙන යනවා. එවා කඩා වැටිලා; ගෙන යන්න බැහැ. එක පැත්තකින් ඒවාට ඇති බදු බර; අනික් පැත්තෙන් විවිධ නීති රීති.

ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කළ පරිදි ඇමතිවරුන් දුසිම් ගණන් වැඩි කළාට රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. ඇමතිවරුන් දුසිම් ගණන් අඩු කළොත් රටේ ප්‍රශ්න විසඳෙයි. එවැනි ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ගොඩ නැඟීමට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් තිබෙන ආණ්ඩුව අපොහොසත් වී තිබෙනවා. ඒ නිසා අපේ රටේ ජීවන වියදම වැඩි වෙනවා. දිනපතා වැඩි වන ජීවන වියදමට විසඳුමක් ආණ්ඩුවට නැහැ. බඩු මිල වැඩි වීමට විසඳුමක් ආණ්ඩුවට නැහැ. එයින් සිද්ධ වන්නේ මොකක්ද? ජනතාව දුගීභාවයට පත් වනවා. ජනතාවට ජීවත්වීමේ අමාරුකම් ඇති වෙනවා.

ජනාධිපතිතුමා ඉදිරිපත් කළ සංඛ්‍යාලේඛනවලින් එතුමා පිළිගන්නවා, ජනගහනයෙන් සියයට 25ක් සමෘද්ධියට සම්බන්ධයි කියලා. දුගීබවට, දුප්පත්කමට රට තුළ විසඳුමක් ඇතිවෙලා නැති බව මහ බැංකු වාර්තාවෙන් කියැවෙනවා. ආර්ථික වර්ධන වේගය සියයට 3.1 දක්වා බැහැලා කියලා මහ බැංකු වාර්තාව පිළිගන්නවා. ආර්ථික වර්ධන වේගය සියයට 3.1ට බසිමින් ආපස්සට ගමන් කරන මේ ආර්ථිකය, බංකොලොත්, අවුල්, කඩා වැටුණු ආර්ථිකයක් නොවෙයිද කියලා අපි ඔබතුමාගෙන් ප්‍රශ්න කරනවා ගරු කථානායකතුමනි.

ජනාධිපතිතුමාගේ කථාව පිළිබඳ විවාදය ගැන එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධානියෙක් ඊයේ මගෙන් අහනවා, "ඇයි දිනේෂ්, යෝජනාවක් ගෙනාවේ? කථා කරන්න තරම් දෙයක් ජනාධිපතිතුමා කිව්වේ නැහැනේ" කියලා. එක්සත් ජාතික පක්ෂයේ ලොකු එක්කෙනෙක් තමයි එහෙම කිව්වේ. එතුමා කථා කරන්න තරම් දෙයක් කිව්වේ නැහැ. ඒක ඇත්ත. ජනාධිපතිතුමා කොහොමද කථා කරන්නේ? යූඑන්පී මුදල් ඇමති, යූඑන්පී අගමැති, යූඑන්පී ඇමතිවරු තමයි මේ ආණ්ඩුව මෙහෙයවන්නේ. ඒ අය වග කියන්න ඕනෑ, මේ ආර්ථිකය කඩා වැටීම පිළිබඳව. දූෂණය, නාස්තිය, වංචාව දැන් ආණ්ඩුවම වෙළාගෙන තිබෙනවා. ආණ්ඩුව ඒකට වග කියන්න ඕනෑ. මේ ආණ්ඩුව ඒවාට විසඳුමක් දීමට බැරි ආණ්ඩුවක්. ජනතාව දුන් තීන්දුව මේ පාර්ලිමේන්තුවට තේරෙනවා නම් මෙහෙම වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ජනතාව තීන්දුවක් දුන්නා. පහුගිය පළාත් පාලන මැතිවරණයේදී මේ ඇමතිවරුන්ගේ ආසන පැරදුණා. මේ ඇමතිවරු දැන් ඉන්නේ තමන්ට පක්ෂ ඡන්ද දායකයන් නැති පැරදුණු ආසනවල. පසු ගිය පෙබරවාරි 10වැනි දා ජනතාව එතුමන්ලාගේ ආසන පරාජයට පත් කළා.

මෙක වලංගු නැති පාර්ලිමේන්තුවක්. ජනතාව තීරණයක් දීලා තිබෙනවා. ඒ තීරණය බලෙන් යටපත් කරන්න පුළුවන් කියලා හිතනවා. එවැනි සට්ටනයකයි අපි අද ඉන්නේ. ජනතාවත්, පාර්ලිමේන්තුවත් අතර තිබෙන මේ සට්ටනය තුළ ජනතාවගේ ජයග්‍රහණ දිගින් දිගටම වැඩි වන බව අපි -මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් යුත් ඒකාබද්ධ විපක්ෂය- ප්‍රකාශ කළා; ඒ වෙනුවෙන් කටයුතු කළා. එයට ජනතාව විශ්වාසය පළ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ අනාගතය දිහා බලන්න. ජනාධිපතිතුමා IMF ගිවිසුම ගැන කිසි දෙයක් හෙළිදරවු කරලා නැහැ. බන්දුල ගුණවර්ධන මැතිතුමා ඒ ගැන සඳහන් කරාවි. මේ 'IMF බෙහෙත් පෙත්ත' දුන්නු ස්පාඤ්ඤයට මොකද වුණේ? ණය ගත්තා, ගත්තා. අන්තිමට ආර්ථිකය කඩා වැටුණා. ග්‍රීසියත් එහෙමයි. ණය ගත්තා, ගත්තා. අවසානයේ ආර්ථිකය කඩා වැටුණා. ඒ රටවල අලුත් නිෂ්පාදනයක් සිද්ධ වුණේ නැහැ, අලුත් අපනයන ක්ෂේත්‍රයකට පිවිසෙන්න බැරි වුණා. කළ එකම දේ තමයි ගත්ත ණය ගෙවන්න ණය ගැනීම. මෙන්න මේ භයානක අනතුරට අපිත් පත් වෙලා ඉවරයි.

ඊළඟට, ඒ අය කියන්නේ මොකක්ද? රාජ්‍ය සේවය කප්පාදු කරන්න, රජයේ සහනාධාර කප්පාදු කරන්න, ලෝකයේ තිබෙන තත්ත්වයට භාණ්ඩ හා සේවා මිල වැඩි කරන්න කියලායි කියන්නේ. ලෝකයේ මිල පාලනය කරන්නේ බහු ජාතික සමාගම් කිහිපයක් විසින්. ඒ අයගේ ලාභය ඉපැයීම සඳහා සියලු දේවල්වල මිල වැඩි කරන්න කියලායි දැන් අපට කියන්නේ. ඒ තුළින් රටේ ප්‍රශ්න උග්‍ර වී භානිදායක තත්ත්වයකට පත් වෙනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම තව කාරණයක් කියන්න කැමැතියි. ගරු කථානායකතුමනි, අපේ රටේ විශ්‍රාමිකයන් වෙනුවෙන්, ඒ වාගේම අපේ වෘත්තිකයන් වෙනුවෙන්, සේවක අර්ථ සාධක අරමුදල ගොඩ නහන අපේ වැඩ කරන ජනතාව හා කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩ කරන ජනතාව වෙනුවෙන්, රටට සල්ලි උපයන විදේශ රටවල වැඩ කරන අපේ ජනතාව වෙනුවෙන් ජනාධිපතිතුමාගේ කථාවේ දී ආණ්ඩුවට කිසි නියෝගයක් කළේ නැහැ කියන කාරණය මම සඳහන් කරන්න කැමැතියි. දැන් ආණ්ඩුව කරලා තිබෙන්නේ මොකක්ද? මේ සියල්ලන්ගෙන්ම අලුතෙන් බදු අය කරලා තිබෙනවා. ඔවුන්ගේ ආදායමෙන්, ජීවිතයේ සන්ධ්‍යා සමයේ ජීවත්වෙන්න ඔවුන් අමාරුවෙන් ඉතුරුකරගෙන තිබෙන මුදලින් බදු අය කරන්න පටන් ගෙන තිබෙනවා. මේ බදු ඉවත් කරන්නට ඕනෑ. මේ විධියට හැම දෙනාටම බදු පැනවීමෙන් ආණ්ඩුව එක පැත්තකින් ආණ්ඩුවේ බංකොලොත්භාවය ප්‍රදර්ශනය කරනවා. පසුගිය අය වැය ලේඛනයක සඳහන් වුණා, වයස අවුරුදු 60ට වැඩි අයගේ ස්ථාවර තැන්පතු සඳහා වැඩි ප්‍රතිලාභ -වැඩි පොලියක් -දෙනවා කියලා. ඒ නිසා විශාල පිරිසක් අලුතෙන් මුදල් තැන්පත් කළා. ඒ සියලු දෙනාට දැන් බදු පනවා තිබෙනවා. ළමා ඉතිරි කිරීම් ගිණුම්වලටත් බදු පනවා තිබෙනවා. ආණ්ඩුවට අඛණ්ඩ ප්‍රතිපත්තියක් නැතිකම තමයි මෙයට හේතුව. මේ නිසා තමයි ගරු ජනාධිපතිතුමා කිව්වේ, තේරෙන්නේ නැති අයත් එක්ක මේ සභාග කරන්න බැහැ කියලා. එතුමා කළ කථාව මේ ප්‍රකාශනයේ තිබෙනවා. මෙවැනි හවුලක් ගෙනියන්න බැහැ. හවුල ගෙනියන්න බැරි බව දැන් රටම දන්නවා. මොකද, හවුලේ අය දෙගොල්ලන්ට බැණ ගන්නවා. ආණ්ඩුවක් නැති තත්ත්වයටයි දැන් රට ඇවිල්ලා තිබෙන්නේ. ඒ වාගේම ජනාධිපතිතුමා තමන්ගේ කථාවේ මෙන්න මේ විධියට කියනවා.

ගරු කථානායකතුමනි, මට වෙලාව නැති වුණත් මේ කාරණය ගැනත් සඳහන් කරන්නට ඕනෑ. ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුවද මේක කළේ? අපි කියනවා "නැත" කියලා. ජනාධිපතිතුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙනවා, "2015 ජනවාරි මස සිට ජූනි මස දක්වා පැවැති හත්වන පාර්ලිමේන්තුවේ සංයුතිය දෙස බැලීමේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයට ආසන 142ක් හිමි වී තිබුණු අතර, පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා නියෝජනය කරනු ලැබූ එක්සත් ජාතික පක්ෂයට තිබුණේ ආසන 47කි" කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව වර්තමාන අගමැතිතුමා පත් වුණේ කොහොමද? ජනාධිපතිතුමා මේ නොකියා කියන්නේ ඒකයි. හතළිස් හත් දෙනෙක් සිටින පක්ෂයේ කෙනෙක් අගමැති කළා, අග්‍රාමාත්‍යවරයෙක් සිටියදී; අග්‍රාමාත්‍ය දි.මු.ජයරත්න මැතිතුමා සිටියදී. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අභියෝග කළේ එදායි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අභියෝග කරමින් ආණ්ඩුව හිතුවක්කාර ලෙස අග්‍රාමාත්‍ය ධුරය ලබා ගෙන, මැති ඇමතිවරුන් දුසිම් ගණන් පත් කර ගනිමින් වැරැදි මාවතක ගමන් කළ නිසා තමයි මුළු රටටම අද මේ වැරැදි ආදර්ශය බල පා තිබෙන්නේ. එයින් ප්‍රාතිහාර්යයක් මවන්න බැරි වුණා. ආර්ථිකය පණ ගන්වන්නට බැරි වුණා. තරුණයන්ට රක්ෂා බිහි කරන්නට බැරි වුණා. අපේ අපනයන ක්ෂේත්‍රයට අලුත් විශ්වාසයක් දෙන්න බැරි වුණා. අපේ එදිනෙදා ආයෝජන, විශ්වාසය, යහපාලනය කඩා වැටුණා. මහ බැංකුව මහා අර්බුදයකට වැටුණා. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් යයි කියාගෙන ආපු ආණ්ඩුව සයිටම් ආයතනයේ පැත්ත අරගෙන ශිෂ්‍ය පරම්පරාවගේ නිදහස් වෛද්‍ය අධ්‍යාපනයට තර්ජනය කළා. මේ ආණ්ඩු කාලය තුළ ශීෂ්‍යයෝ කී දාහක් ගුටි කෑවා ද?

ගරු ජනාධිපතිතුමාගේ කථාව සම්බන්ධයෙන් අපි මේ විවාදය ඉල්ලුවේ මේ නිසායි. අද ආහාර නිෂ්පාදනය කඩා වැටිලා; වී ගොවිතැන කඩා වැටිලා; අපට පිට රටින් හාල් ගේන්න සිද්ධ වුණා. මේ අර්බුදකාරී තත්ත්වයෙන් අපි ගොඩ එන්න ඕනෑ.

මේ අවස්ථාවේදී මා තව එක කරුණක් කියන්න කැමැතියි.

I would like to quote from the "Sunday Island" of 6th May, 2018. It states, "Will President Sirisena heed Naseby's advise?" I will not go into the details.

Lord Nasebyට අතට අත දී ජනාධිපතිතුමා එතුමා හම්බ වුණා. ජනාධිපතිතුමාට Lord Naseby හම්බ වන්න සිද්ධ වුණේ ඇයි? Lord Naseby එංගලන්ත පාර්ලිමේන්තුවේදී නැඟිටලා කිව්වා, "එංගලන්තය කරන්නේ වැරදි වැඩක්. අසත්‍ය සංඛ්‍යා ලේඛන විශ්වාස කරලා ශ්‍රී ලංකාවට විරුද්ධව යෝජනාවක් ගෙනාවා" කියලා. එංගලන්තයේ රහස් ලිය කියවිලි විවෘත කර තිබෙන නිසා මේ සංඛ්‍යා ලේඛන අසත්‍ය ඒවා බව දැන් හෙළි වී තිබෙන රහසක් නිසා මේ ලිය කියවිලිවල තිබෙන ප්‍රමාණය අනුව මේ සංඛ්‍යා ලේඛන වැරැදියි කියනවා.

Then in the Midweek Review of "The Island" of Wednesday 9th May, 2018, Shamindra Ferdinando writes, I quote: "How UK manipulated RTI law to deny Lanka chance to counter war crimes allegations".

අපේ රටට තිබෙන ජාත්‍යන්තර තත්ත්වය, අපේ ජාතික නිදහස, අප රට රැකපු රණ විරුවන් සම්බන්ධයෙන් ජනාධිපතිතුමා ඉතාම බරපතළ මෙහෙයවීමක් කර තිබෙනවා.

ඒ වාගේම මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අපේ මහින්ද රාජපක්ෂ රජය උතුරු නැගෙනහිර ප්‍රදේශවල ත්‍රස්තවාදය පරාජය කළාට පසුව එම ප්‍රදේශවල ඡන්දය පවත්වලා, ඒ අයගේ පාලන තන්ත්‍රය ඒ අනුව සකස් කර ගැනීමට අවස්ථාව ලබා දුන්නා. එම ප්‍රදේශවල ජනතාව උන්හිටි තැන් නැවත ඔවුන්ට ලබාදීමට ආරම්භ කළ ඒ වැඩ පිළිවෙළ විසඳුම් මාර්ගයකට ගෙනෙන්න මේ ආණ්ඩුව තවම අපොහොසත් වෙලා තිබෙනවා. ඒ දෙමළ ජනතාව, මුස්ලිම් ජනතාව ඒ සඳහා විසඳුමක් බලාපොරොත්තුවෙන් ඉන්නවා. මා මිත්‍ර ගරු ෆයිසාල් කාසීම්

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මැතිතුමා මේ වෙලාවේ බොහොම කැමැත්තෙන් හිනා වෙනවා. ඔව්, ඔබතුමා හිනා වෙන්න, ඔබතුමා හොඳ නියෝජ්‍ය ඇමතිවරයෙක්. නමුත් අද ඔබතුමා නැහෙනහිර පළාතේ ජනතාවගේ ඡන්ද අයිතිය පාවා දීලා කට වහගෙන නිකම් ඉන්නවා. මුස්ලිම් ජනතාවගේ ඡන්දය නැති කරලා මාස හතයි. "ඡන්දය නොපවත්වන්නේ ඇයි?" කියා ඔබතුමන්ලා අහන්නේ නැහැ. ඔබතුමන්ලාට ඒ ගැන කථා කරන්න බැරිවෙලා තිබෙන්නේ ඔය අං තට්ටුව පළඳලා තිබෙන නිසායි. දේශපාලන අං තට්ටුව දමාගෙන, නැහෙනහිර පළාතේ පළාත් සභා ඡන්දය පවත්වන්නේ නැති පාවාදීමකට පරිවර්තනය වෙන්න එපා. එම ඡන්දය පවත්වන්න කියන්න. එම පළාතේ ඡන්දය පවත්වන්න කියා ඔබතුමන්ලා නැඟිටලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්න. ඒකයි ඔබතුමන්ලා ආණ්ඩුවට කිව යුත්තේ.

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ කථාව ආණ්ඩුවට මහ පෙන්වන කථාවක් වෙන්නේ නැහැ. මොකද, මේක මහ පෙන්වීමක් කළ හැකි ආණ්ඩුවක් නොවන බව ජනාධිපතිතුමාම පිළිගන්නවා. නමුත් මේ විවාදය කිරීමෙන් අපි බලාපොරොත්තු වෙන්නේ රට අලුත් විසඳුමකට යන්න ඕනෑය කියන කාරණය මතක් කිරීමයි.

අපි සියලුදෙනා එකතු වෙලා පාර්ලිමේන්තුව විසුරුවා හැරලා, අලුත් පාර්ලිමේන්තුවක් පත් කළොත් පමණයි එය කරන්න පුළුවන් වන්නේ.

ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෆයිසාල් කාසිම් නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා ඡන්දයට අපි දැන් අලුත් ක්‍රමයක් යටතේ වැඩ කරලා තිබෙනවා. Demarcation සිදු කර තිබෙනවා. දැන් සාකච්ඡා කරන්නයි තිබෙන්නේ. එච්චරයි. ඡන්දය පවත්වන්න කියා අපිත් ඉල්ලා තිබෙන්නේ. එහෙම කරන්න කියා මේ සභාවෙන් තමයි තීරණයක් අරගෙන තිබෙන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පසුගිය සැප්තැම්බර් මාසයේ තමයි ඡන්දය පවත්වන්න තිබුණේ. දැන් අපි ඉන්නේ මැයි මාසයේ, මම කලින් කිව්වා. ඔබතුමන්ලා හදිසියේ හැන්දෑවේ පනහට පනහ කියලා ඡන්ද ක්‍රමයක් හදා ගත්තා. රෑ මෙතැන ගනුදෙනුවක් කරගෙන ඡන්දය දුන්නා. අපි ඇත්ත කථා කරමුකෝ. ගනුදෙනුව කරලා, ඡන්දය දුන්නා. අද දක්වා පළාත් සභා ඡන්දය නැහැ. නිකම් ලජ්ජා වෙන්න එපා. ඇත්ත ඒක නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන වෙනම විවාද කරමු, ගරු මන්ත්‍රීතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පනහට පනහ කියලා නීතියක් කලින් තිබුණේ නැහැ නේ. ලජ්ජා වෙන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රය පණ ගන්වන්න පුළුවන් වන්නේ පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වලා, අලුත් පාර්ලිමේන්තුවක් පත් වීමෙන් පමණයි කියන කාරණය සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට යෝජනාව ස්ථිර කිරීම, ගරු ටී. රංජිත් ද සොයිසා මැතිතුමා.

[පූ.භා. 11.05]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සැසිවාරය විවෘත කරමින් කරන ලද ප්‍රකාශය පිළිබඳව අද දවසේ ඒකාබද්ධ විපක්ෂයේ -අපේ- ඉල්ලීම පරිදි පැවැත්වෙන සභාව කල් තැබීමේ අවස්ථාවේ විවාදයට ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරනු ලබමින්, ඉතාම කෙටියෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අවුරුදු තුනහමාරක් ගත වුණු මේ රජයට ඉතිරිවෙලා තිබෙන්නේ මාස දහහතක කාල පරිච්ඡේදයක් පමණයි. දෙකෝටි විසිලක්ෂයක් වුණු මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමටත්, ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කරන ලද ට්‍රිලියන තුනක් වුණු මහා ණය කන්දරාව ඉවත් කරලා, අගමැතිතුමා විසින් විවිධ අවස්ථාවල මේ ගරු සභාවට ප්‍රකාශ කළ ආකාරයට 2025 වන විට ණයෙන් තොර රටක් බිහි කිරීම සඳහාත්, ඉදිරි මාස දහහත තුළවත් රට නිවැරදි මහට ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ ප්‍රකාශනය -මේ කථාව- තුළ අන්තර්ගත වී තිබේද කියලා අපි බැලුවා. අපි ඒ පිළිබඳව ඉතා ඕනෑකමින් යුක්තව අවධානය යොමු කරමින් සිටියා. හැබැයි, මේ ඉදිරිපත් කළ ප්‍රකාශනය තුළ රට ඉදිරියට ගෙන යන ආකාරය පිළිබඳව, එතුමන් විසින් කියන ට්‍රිලියන තුනක් වූ මහා ණය කන්දරාව අවසන් කරන ආකාරය පිළිබඳව, එමෙන්ම රටේ ආර්ථිකය මහා විශාල ප්‍රසාරණයක් කරන ආකාරය පිළිබඳව, 2020න් පසුව රට ඉතාම නිවැරදි සංවර්ධිත

රටක් බවට පත් කිරීම පිළිබඳව වූ කිසිදු වැඩ පිළිවෙළක්, යෝජනාවක් හෝ අදහසක් මේ ප්‍රකාශනය තුළ ගැබ්වෙලා තිබුණේ නැහැයි කියන එක ඉතාම කනගාටුවෙන් නමුත් අපි අද දවසේ ප්‍රකාශ කරන්න ඕනෑ. මේ රටේ පවතින ඒ මහා ණය කන්ද අවසාන කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

මේ රජය බලය ගත්තේ, "රාජපක්ෂ රජය මහින් ගොඩ ගසන ලද ඒ ණය කන්ද අවසාන කිරීම සඳහා අපි අලුත් වැඩ පිළිවෙළක් සකස් කරනවා"ය කියලායි. බලය ගත්තා. අවුරුදු තුනහමාරක් ගිය තැන කියනවා, "දැන් තමයි විප්ලවීය වැඩ පිළිවෙළ ආරම්භ කරන්නේ, ඉදිරි මාස දහහත ඇතුළත අපි මේ රට නව තැනකට ගෙන එනවා." කියලා. නමුත් පසු ගිය අවුරුදු තුනහමාර තිස්සේ මේ ආණ්ඩුව කරපු කිසිම දෙයක් නැහැයි කියන එක රටේ ජනතාව ප්‍රායෝගිකව අත්විඳින දෙයක්. ණය ප්‍රශ්නයට කිසිදු විසඳුමක් ඉදිරිපත් කර නැහැ. ආණ්ඩුවේ තිබෙන එකම වැඩ පිළිවෙළ තමයි, රට ජාතිය සතු, මහා ජාතික දේපොළ, ජාතික සම්පත් එකින් එක, එකින් එක කුණුකොල්ලයට, තුට්ටු දෙකට විදේශීයකරණය කරන එක. ඒ සම්බන්ධව ජනාධිපතිතුමා කිසිදු වැඩ පිළිවෙළක් ඉදිරිපත් නොකිරීම තුළ ඒ ගෙන එන සල්ලි ටිකෙන් එදිනෙදා තමන්ගේ ආර්ථිකය දුවවන, "එදා වේල ටුවර්ස්" බස් එකක් බවට යහපාලන ආණ්ඩුව පත්වෙලා තිබෙන බව පෙනෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාවගෙන් අති බහුතරය කෘෂි කර්මාන්තය මත පදනම් වුණු, කෘෂිකාර්මික ආර්ථික රටාවක් තුළ ජීවත් වන ජනතාවක් නිසා, මේ රටේ ගොවියා පිළිබඳව යම් ආකාරයේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරාවිය කියා අපි බලාපොරොත්තු වුණා. යහපාලන ආණ්ඩුව ආවා. වියදම් කපා හරින්න කියලා, පොහොර සහනාධාරය කැපුවා.

හැබැයි, කාබනික පොහොර දෙනවා කිව්වා. ඔය කියන කාබනික පොහොර ගන්න, එක්කෝ ඩාලි පාරට යන්න ඕනෑ; නැත්නම් සිරිකොතට යන්න ඕනෑ. රටේ කොහේවත් කාබනික පොහොර නැහැ. එහෙම වැඩ පිළිවෙළක් ඇත්තේත් නැහැ. ඒ නිසා අද ගොවියා අතරමං වෙලා. රටේ කෘෂි කාර්මික නිෂ්පාදන බරපතළ විධියට කඩාගෙන වැටිලා. ගරු කථානායකතුමනි, 2014 වර්ෂය වෙනකොට සියයට 6.4ට තිබුණු ආර්ථික වර්ධනය, අවුරුදු තුනහමාරක් තිස්සේ කරපු ආණ්ඩුවේ කෙරුවාවත් එක්ක සියයට 3.1 දක්වා කඩා වැටිලා තිබෙනවා. මේවා බොරුයි කියන්න බැහැ. මහ බැංකු වාර්තාවේ තිබෙනවා, මේ රටේ ආර්ථිකය සියයට 3.1 දක්වා කඩාගෙන වැටිලා කියලා. ඊට වඩා ඛේදජනක තත්ත්වයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද හාල් කිලෝ එකක් රුපියල් 80ක් වෙනකොට, මොණරාගල වට්ටක්කා වගා කරන ගොවියා වට්ටක්කා කිලෝ 16ක් විකුණන්න ඕනෑ හාල් කිලෝ එකක් ගන්න. අද ගොවි ද්‍රව්‍යවලට කිසිම මිලක් නැහැ. අද ඒවා වන සතුන්ට කන්න ගෙනැත් දමනවා. අද ගොවියාට යන එනම් නැති වෙලා තිබෙනවා. රටේ නිෂ්පාදනවලට, ගොවි ද්‍රව්‍යවලට හරි මිලක් දෙන්න, ගබඩා පහසුකම් ඇති කරන්න, වෙළෙඳ පොළක් ඇති කරන්න අවුරුදු තුනහමාරක් යන තුරු මේ ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. අද ගොවියා වැටිලා තිබෙන ඛේදජනක තත්ත්වය පිළිබඳව ප්‍රකාශ කරන්න ඉතාම කනගාටුයි. ඒ වාගේම ආණ්ඩුවේ විවිධ පාර්ශ්වවලින් රසායනික ද්‍රව්‍යවලින් තොර කෘෂි ආර්ථිකයක් හදන්න කියලා කාබනික පොහොර ගෙනාවා. ඊළඟට ග්ලයිෆොසේට් කියලා ප්‍රශ්නයක් ඇති කෙරුවා. ඒකෙන් සිදු වුණේ සුද්දාගේ කාලයේ ඉඳන් පැවැති තේ, පොල් සහ රබර් ආර්ථිකය කඩා වැටීමයි. නුහුරු, නුපුරුදු, නොදන්නා කෘෂි විද්‍යාවක් හඳුන්වා දීමට යාම නිසා අද තේ අස්වැන්න පිට රටවලට ගන්නේ නැති මට්ටමකට රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ තත්ත්වයෙන් ගොඩ එන්නට ආර්ථිකය හරි මාවතට ගන්න බැරි මේ ආණ්ඩුව අද වෙනකොට ජනතාව මත දරා ගන්න බැරි අධික බදු බර පටවනවා. ආණ්ඩුව කිව්වේ කොහොමද? වැට් බද්ද සියයට 11.5 ඉඳලා සියයට 15 දක්වා වැඩි කරන්නේ කෙටි කාලයකට කියලා කිව්වා. අවුරුද්දක් යනකොට වැට් බද්ද අහෝසි කරනවා කියලා කිව්වා. වැට් බද්ද පනවලා දැනට කොච්චර කල් ගිහිල්ලා තිබෙනවාද? සියයට 15 වැට් බද්ද අහෝසි කිරීම සම්බන්ධව මුදල් ඇමතිවරයා වගේ වගක් නැහැ; අගමැතිතුමා වගේ වගක් නැහැ. කිසිවෙක් වැට් බද්ද ගැන කථා කරන්නේ නැහැ. ඒ වෙනුවට බැංකුවේ තැන්පත් කරලා තිබෙන ළමා ඉතිරිකිරීමේ ගිණුම්වලට සියයට පහක බද්දක් ගහනවා වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ගිණුම්වල මුදල්වලට බද්දක් ගහලා තිබෙනවා. රත්රන්වලට සියයට 15 බද්දක් ගහලා තිබෙනවා. අද රටේ සෑම අංශයකටම බදු පිට බදු ගහලා තිබෙනවා. රටේ ජනතාවගේ බදු, ණය සහ දඩ මත දුවන ආර්ථිකයක් නිර්මාණය කිරීමත් එක්ක රටේ ආර්ථිකය ඉතාම බරපතළ අගාධයකට ඇදගෙන ගිහිල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා විසින් එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා, "මතට තිත වැඩ පිළිවෙළ තුළ මද්‍යසාර භාවිතය අවම කිරීම සඳහා අපි පසු ගිය අවුරුදු තුනක කාලය තුළ පියවරක් ගත්තා." කියලා. අපි අහනවා, බියර් සඳහා තිබුණු බදු අඩු කරලා මිල අඩු කළේ මද්‍යසාර ප්‍රතිපත්තිය වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහාද කියලා.

අද බියර් පානය වේගයෙන් වැඩි වෙලා තිබෙන විට රටේ මද්‍යසාර භාවිතය අඩු වෙලා නැහැ. ඒ වාගේම නීති විරෝධී දුම්වැටි සඳහා බදු පැනවීම තුළ අද රටට හොරෙන් ගෙනෙන ඕනෑම සිගරට් තොගයකට බදු ගහලා වෙළඳ පොළට එවන නාස්තිකර ආර්ථික ප්‍රතිපත්තියට යෑම තුළ ජනාධිපතිතුමා කියපු "මතට තිත" වැඩසටහන කිසිම තැනක ක්‍රියාත්මක වන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම ස්තූතියි. ගරු කථානායකතුමනි, සමාරම්භක දේශනයේ 4වන පිටුවේ ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව කියනවා, "සර්වජන ඡන්ද බලය යථාර්ථයක් කරලීම උදෙසා 2017 නොවැම්බරයේදී, අප පළාත් පාලන ඡන්දය විමසීමේ පනත සංශෝධනය කොට සම්මත කර ගැනිණි." කියා. ගරු කථානායකතුමනි, එහෙම කරපු නිසාම, Westminster ක්‍රමයෙන් උරුම වූ සර්ව ජන ඡන්ද බලය අන්තිම හැල්ලුවට ලක් කරපු ආණ්ඩුව හැටියට මේ ආණ්ඩුව ඉතිහාසයට එකතු වෙනවා. අපේක්ෂකයන් ඡන්දය කරලා ඡන්දය දිනා ආවාට පසුව කාසිය උඩ දාලා, තුණ්ඩු ඇදලා, නෝනාද පොල්ලද කියා බලා ඇප cancel වෙච්ච, දශම ගණන් ඡන්දය ගත් මන්ත්‍රීවරුන් සභාපතිවරුන් හැටියට තෝරපු, ඡන්ද බලය බල්ලකු නොව බලු මයිලක් ගණනට ඇද දාපු ඉතාම තුට්ටු දෙකේ ඡන්ද ක්‍රමයක් හදා දුන් ආණ්ඩුව මෙයයි. මෙය ඉතාම නොහොබිනා ඡන්ද ක්‍රමයක්. අප විතරක් නොවෙයි එසේ කියන්නේ. එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම් කබීර් හෂීම් මහත්මයා කියනවා, "වහාම මේ ඡන්ද ක්‍රමය අහෝසි කළ යුතුයි." කියා. පොළොන්නරුවේ ඡන්ද ටිකත් නැති වුණාට පසුව ජනාධිපතිතුමා කියනවා, "මේ ඡන්ද ක්‍රමය හරි නැහැ. මෙය අහෝසි කළ යුතුයි." කියා. ඒකාබද්ධ

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

විපක්ෂය හැටියට අපිත් කියනවා, රටට නොගැළපෙන, බලය තහවුරු කර ගැනීම සඳහා ආණ්ඩුවේ මහා නීති උපදේශකයන් හරහා ගෙන ආ මේ වැරැදි ඡන්ද ක්‍රමය වහාම අහෝසි කර දමා සර්ව ජන ඡන්ද බලය වඩාත් යථාර්ථවත් වන ආකාරයේ ඡන්ද ක්‍රමයක් රට තුළ ස්ථාපිත කළ යුතුයි කියා. ඒ නිසා ජනාධිපතිතුමා මේ කරපු ප්‍රකාශත්, ඡන්දය සම්බන්ධව මෙහි ගැබ් වෙලා තිබෙන අදහසුත් එක්ක මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්පූර්ණ ව්‍යාජයක්, බොරුවක්, රට රැවටීමක් කියන එක අප ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මේ රටේ මැතිවරණ කල් දැමීම සඳහා 1982 වර්ෂයේදී ජනමත විචාරණයක් -ලාම්පු-කළගෙඩි ඡන්දය- පැවැත්වූවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ වැඩ පිළිවෙළට එකඟ නොවුණත් අපි ඉතා පැහැදිලිව කියනවා ඒ ජනමත විචාරණයේදී ආණ්ඩු පාර්ශ්වය පරාජය වූ සියලු මැතිවරණ කොට්ඨාසවලට එතුමා අතුරු මැතිවරණ කැඳවා මන්ත්‍රීවරුන් තෝරා ගන්න නැවත ජනතාවට අවස්ථාවක් දුන්නා කියා. අපිත් ආණ්ඩුවට අභියෝගයක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කතාවේ අවසාන මිනිත්තුවයි. කතාව අවසාන කරන්න. තවත් මිනිත්තුවක කාලයකුයි තිබෙන්නේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, අපි අවසාන වශයෙන් ආණ්ඩුවට අභියෝගයක් කරනවා. ආණ්ඩුව මේ මැතිවරණයේදී ආසන 122ක් පරාදයි. පුළුවන් නම් ඒ ආසන 122 තුළ අතුරු මැතිවරණ පවත්වන්න කියා අපි ආණ්ඩුවට අභියෝගයක් කරනවා. ඡන්ද පැරදුණාම ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා කළා වාගේ පුළුවන් නම් අතුරු මැතිවරණයක් සඳහා රට යොමු කරන්න කියන ඉල්ලීම කරන අතරම තවත් එක් කාරණයක් කියා මම කතාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ගරු ජනාධිපතිතුමා එතුමාගේ ප්‍රකාශය අවසන් කරලා තිබෙන්නේ, "...බුදුන් වහන්සේ පෙන්වා දුන් වජ්ජීන් මෙන් සමඟිය සහ සාකච්ඡාව පෙරදැරිව නම්, වජ්ජීන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයන් සැබෑ ලෙසම අපද අනුගමනය කළ යුතු වෙමු." යනුවෙනුයි. ජනාධිපතිතුමා වජ්ජීන් අනුමත කරනවා. අගමැතිතුමා ලිච්ඡවීන් අනුමත කරනවා. බණ කියනවා. එක් කෙනෙක්වත් සෝවාන් වෙන්නේ නැහැ. පසුගිය වසර තුනක කාල පරිච්ඡේදයේදී රට තුළ තනිකර අපායක් නිර්මාණය කරලා තිබෙනවා. ඒ අනුව ජනාධිපතිතුමාගේ ප්‍රකාශය තුළ බොහෝ ගැටලු සහගත තැන් තිබෙන නිසා ඒ ප්‍රකාශය සහ වැඩ පිළිවෙළ පිළිබඳව අපේ විරෝධය ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් වෙන් වී තිබෙනවා.

[පූ.භා. 11.16]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අටවන පාර්ලිමේන්තුවේ දෙවන සැසි වාරය විවෘත කරමින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ උත්තරීතර සභාවේ සිදු කළ කථාව සම්බන්ධයෙන් වන මේ කල් තැබීමේ විවාදයට එක් වෙමින් වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. ගරු කථානායකතුමනි, මේ සැසි වාරය විවෘත කරමින් එතුමා කළ ප්‍රකාශය විවිධ උදවිය විවිධ දෘෂ්ටි කෝණවලින් දකිනවා. විවිධ විධියට වැරදි අර්ථකථන කරමින්, රට නොමඟ යැවීමට උත්සාහ කරන බවක් අපට පෙනෙන්න තිබෙනවා. ගරු කථානායකතුමනි, සමහරු මේ කථාව සම්ප්‍රදායික රාජාසන කථාවක් හැටියට දකිනවා ඇති. තවත් සමහරු මේ කථාව දකින්නේ, රජයේ ඉදිරි දැක්ම පිළිබඳව කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් විධියටයි. ගරු කථානායකතුමනි, කවුරු කොයි විධියට දැක්කත් එතුමා කළ ඒ කථාව කිසි ලෙසකින්වත් රජෙකුගේ ලීලාවෙන් කළ කථාවක් නොවන බව නම් මා කියන්න කැමැතියි. පොදු මහජනතාවගේ සිතුම් පැතුම් හොඳින් හඳුනන, රට ගැන හිතන ජනතාවාදී නායකයෙකුගේ ඉදිරි දැක්මක් සහිත අවංක ප්‍රකාශයක් ලෙසයි අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශය අප දකින්නේ. රජයක් ලෙස මේ වන විට සිදු කළ ජනතාවාදී වැඩ පිළිවෙළ කිහිපයක් ගැන එතුමා එතුමාගේ කථාවේ සඳහන් කළා. සමහරු ඒ එකක්වත් මතක් කරන්නේවත් නැහැ. එහෙම දෙයක් වුණේ නැහැ කියලා බලෙන් අමතක කරන්න හදනවා. නමුත් එතුමා ඔය උත්තරීතර පුටුවේ ඉඳගෙන පැහැදිලිව සඳහන් කළා, ජනාධිපතිවරයා හැටියට පත් වුණාට පසුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කළ හැටි. අවුරුදු ගණනක් තිස්සේ සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න අපට බැරි වුණා. එතුමාගේ නායකත්වයෙන්, අගමැතිතුමා ඇතුළු අපේ රජය ඒක කළ හැටි එතුමා මතක් කළා. සමහරු මේවා බලෙන් අමතක කරන්න හදනවා. ලංකා ඉතිහාසයේ මොනම ආණ්ඩුවක්වත් නොකළ විධියට රාජ්‍ය සේවකයින්ගේ වැටුප එක විට රුපියල් දසදහසකින් වැඩි කළ හැටි එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වුණා.

කිසිම දෙයක් නොකළ ආණ්ඩුවක් හැටියට තමයි සමහරු අද බලෙන් පෙන්වන්න හදන්නේ. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කථා කරන කොට, පසුගිය කාලයේ පාලකයන්ට "නයාට අඳුකොළ" වාගේ තිබුණා. ගරු කථානායකතුමනි, ඔබතුමා විරුද්ධ පක්ෂයේ සිටි කාලයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙනැල්ලා විවිත් විට උත්සාහ කළා, තොරතුරු දැනගැනීමේ අයිතිය මේ රටේ ජනතාවට දෙන්න. ඒ වෙනුවෙන් ඔබතුමා සුවිශේෂ කාර්ය භාරයක් ඉෂ්ට කළා. ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ ආණ්ඩුවේ ඉඳගෙන මට භාග්‍යය ලැබුණා, ඒ ඓතිහාසික පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න. "ළහම පාසල හොඳම පාසල" කියන වැඩසටහන වාගේම, අද මේ රටේ හතළිස් ලක්ෂයකට අධික පාසල් දරුවෝ වෙනුවෙන් "සුරක්ෂා සිසු රක්ෂණය" ක්‍රියාත්මක කරනවා. ඒවා ගැන එතුමාගේ කථාවේදී පෙන්වා දුන්නා. අද කිසිවක් සිදු වුණේ නැති විධියට සමහරු බලෙන් අමතක කරලා කථා කරන්න හැදුවත්, එතුමා ඒ වැඩ පිළිවෙළ ගැනත් සඳහන් කළා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ රජයේ ප්‍රමුඛ මැතිවරණ පොරොන්දුවක් ඉෂ්ට කරමින් ඉඩම් ඔප්පු දශ ලක්ෂයක් ලබා දීමේ ජාතික වැඩ පිළිවෙළ ගැනත් එතුමාගේ ප්‍රතිපත්ති

ප්‍රකාශයේ සඳහන් කර තිබෙන අතර, අද වන විට එය ආරම්භ කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම, ජනාධිපතිතුමා බලයට පත් වෙන කොට අපි ජාත්‍යන්තරව හුදෙකලා වුණු රටක් හැටියටයි තිබුණේ. අපේ අල්ලපු රට වන ඉන්දියාවත් අහක බලා ගෙනයි හිටියේ. අපි බොහොම මිලේච්ඡ, ප්‍රජාතන්ත්‍රවාදයක් නැති රටක් හැටියට හංවඩු ගැහිලා තිබුණා. ජාත්‍යන්තර වශයෙන් අපේ රට හුදෙකලා වෙලා තිබුණු මොහොතක, ජාත්‍යන්තර පිළිගැනීමකට ලක් කරන්න ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට -අපේ ආණ්ඩුවට- පුළුවන්කමක් ලැබුණා. එතුමා ඒ පිළිබඳව ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කළා. GSP සහනය සහ මත්ස්‍ය තහනම ඉවත් කර ගත් ආකාරය වැනි කරුණු එතුමාගේ කථාවේ සඳහන් කරලා තිබෙනවා. අද මේවා මොනවාවත් නැති, කිසිවක් සිදු වුණේ නැති, කිසිම දෙයක් නැති ආණ්ඩුවක් හැටියට සමහරු පෙන්වන්න හැදුවත්, ඒවා යථාර්ථයක් වෙලා හමාරයි කියන එක අපි මේ විවාදයේදීත් මතක් කරන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, ඉදිරි කාලයේ සිදු කිරීමට අපේක්ෂා කරන ඉලක්කගත වැඩ පිළිවෙළ ගැනත් එම ප්‍රකාශයේ පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. ජනාධිපතිතුමාගේ ප්‍රකාශයේ තවත් වැදගත් දෙයක් තමයි, පවතින ඕනෑම දේශපාලන අභියෝගයක් හමුවේ ඒවාට සාර්ථකව මුහුණ දීමට එතුමාටත්, එතුමාගේ රජයටත් තිබෙන සුවිශේෂ හැකියාව පිළිබඳව කළ විග්‍රහය. අද කුමන අභියෝග ආවත්, ඒ සෑම දේකටම එතුමා ශක්තිමත්ව මුහුණ දෙනවා; රජය මුහුණ දෙනවා.

මීට සති කිහිපයකට පෙර අග්‍රාමාත්‍යවරයාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙන ආ බව අප දැක්කා. විශාල වැඩි ඡන්දයකින්, පහසුවෙන් ඒ විශ්වාසභංග යෝජනාව ජයග්‍රහණය කරලා, "මේ ස්ථාවර ආණ්ඩුවක්" කියන එක අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී පෙන්වලා දුන්නා.

ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයා රට භාර ගන්නා අවස්ථාවේ තිබුණු තත්ත්වය කොහොමද කියන එක බොහෝ දෙනෙකුට තවමත් මතකයි. අපි දන්නවා, ඉතාම අඳුරු අතීතයක් තිබුණු බව. එහෙම එකක් තිබුණාද කියලාවත් මතක නැති ආකාරයටයි අද සමහරු කථා කරන්නේ. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන කොට ඇමති මණ්ඩලය ගැන කථා කළා. නමුත්, අපි දැක්කා ලෝකයේ ලොකුම ඇමති මණ්ඩලය නඩත්තු කළේ පසුගිය ආණ්ඩුව කාලයේ කියන කාරණය. අද ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙලාත් ඒ සා විශාල ඇමති මණ්ඩලයක් අපි නඩත්තු කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, දේශපාලන වශයෙන් කථා කරන කොට, කිසිම දේශපාලන කුහකත්වයකින් තොරව අපි එදාත් කිව්වා; අදත් කියනවා, යුද්ධය අවසන් කිරීම සඳහා පසුගිය කාලයේ නිවැරැදි දේශපාලන නායකත්වයක් ලබා දුන්නාය කියන කාරණය. ඒ වාගේම, අපේ හිටපු යුද හමුදාපතිතුමා ඇතුළු රණ විරුවෝ ජීවිත පූජා කරලා, අත පය නැති කරගෙන විශාල කැපවීමක් ඒ වෙනුවෙන් කළා. ඒ අවස්ථාවේ මේ රටේ සියලුම ජනතාව එකට හිටියා.

පක්ෂ, පාට, ලොකු, පොඩි භේද නැතිව යුද්ධය අවසන් කිරීම සඳහා සම්පූර්ණයෙන් කැපවීමක් කළා. "බඩ ගැන හිතන්න එපා. රට ගැන හිතන්න" කියලා කිව්වාම, හැම පොඩි දරුවෙක්ම තමන්ගේ කැටේ පවා ගෙනියලා යුද්ධය වෙනුවෙන් වියදම් කරන්න දීලා ඒ කැපවීම කළා. ගරු කථානායකතුමනි, පසුගිය ආණ්ඩුවට තමයි යුද්ධය අවසන් වෙලා රට ගොඩනැඟීමේ ස්වර්ණමය අවස්ථාව උදා වුණේ. නමුත්, ඒ අවස්ථාව පැහැර හැරියා. ඒවා පයින් ගහලා දේශපාලන බල පුළුවන්කාරකම් පෙන්වලා පවුල් වශයෙන් වැජඹෙන විධිය තමයි කල්පනා කළේ. මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත් ගෙනැල්ලා, දිගටම පාලනයේ ඉන්න පුළුවන් විධිය තමයි කල්පනා කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඔබතුමාට හැමදාමත් කීකරු වුණා වාගේ මම අදත් කීකරු වෙලා මගේ කථාව අවසන් කරනවා.

ප්‍රජාතන්ත්‍රවාදය වළ පල්ලට දාලා නීතියේ ආධිපත්‍ය බිඳ දමමින් කටයුතු කරපු හැටි අපි අමතක කරන්න නරකයි. අද එහෙම තත්ත්වයක් නැහැ. අද, සුදු වෑන් එන්නේ නැහැ. අද, ජනාධිපතිවරයා විවේචනය කරන්න පුළුවන්; අගමැතිතුමා විවේචනය කරන්න පුළුවන්; ආණ්ඩුව විවේචනය කරන්න පුළුවන්; මාධ්‍යවේදීන්ට භය නැතිව දරු පවුලත් එක්ක ගෙදර නිදා ගන්න පුළුවන්. සුදු වෑන් ගෙවල්වලට එන්නේ නැහැ. අද ජනමාධ්‍ය නිදහස ඇති කරලා තිබෙනවා. අද ජනමාධ්‍යවේදීන් ඝාතනය වෙන්නේ නැහැ; පහරකෑම්වලට ලක් වෙන්නේ නැහැ. තර්ජනය නිසා මේ රට හැර යන්න ඔවුනට සිදු වෙන්නේ නැහැ. මාධ්‍ය ආයතන ගිනිබත් කරන්නේ නැහැ. මේවා අද පැහැදිලි ඇත්ත කියන එක මට භය නැතිව ප්‍රකාශ කරන්න පුළුවන්. ඒ නිසා මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය නිකම් පුස්සක් විධියට කථා කරලා කිව්වාට වැඩක් නැහැ. වර්තමාන ජනාධිපතිතුමා -අපේ ආණ්ඩුව- මේ තත්ත්වයට රට ගොඩනඟලා තිබෙනවා කියලා මම මතක් කරන්න කැමැතියි. මම කනගාටු වෙනවා, විරුද්ධ පක්ෂය මේවා හිතාමතා අමතක කරන්න යන එක ගැන. ගරු කථානායකතුමනි, එතුමා ඉතාමත්ම සම්බර කථාවක් කළේ. රජය පිළිබඳව යම් යම් විවේචන එල්ල වෙන තැන් පිළිබඳව පවා එතුමාගේ ප්‍රකාශනයේ අඩංගු කරලා තිබුණා.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව යටතේ කෘෂිකර්මය සම්බන්ධයෙන් මොකුත් වුණේ නැහැ කියලා සමහරු කිව්වා. පොහොර ගැන කථා කළා. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නව සැසිවාරය විවෘත කරමින් අතිගරු ජනාධිපතිතුමා කළ ප්‍රකාශනයේ මෙසේ සඳහන් වෙලා තිබෙනවා:

> "...උතුරු මැද පළාතේ වාරි පද්ධතීන් වැඩි දියුණු කරමින් කුඩා වැව් 800ක් ද, උතුරු පළාතේ කුඩා වැව් 1,400ක් ද, ඌව පළාතේ කුඩා වැව් 350ක් ද ප්‍රතිසංස්කරණය ආරම්භ කර ඇත. කුඩා වැව් 2,500කට වැඩි සංඛ්‍යාවක් එකවර ප්‍රතිසංස්කරණය කිරීමේ යෝධ ව්‍යාපෘතිය යටත් විජිත යුගයෙන් නිදහස් වූ පසු රජයක් මඟින් ආරම්භ කරනු ලබන පළමු දැවැන්ත වාරි ව්‍යාපෘතියකි...."

මම කිව්වා, අතිගරු ජනාධිපතිතුමා කළේ සම්බර කථාවක් කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා මට නියමිත කාලය අවසන් කියලා කියපු නිසා මම ඒ කරුණු ගැනත් සඳහන් කරලා මගේ කථාව අවසන් කරන්නම්.

එතුමා එම ප්‍රකාශයේදී තවදුරටත් මෙසේ සඳහන් කර තිබෙනවා:

> "මේ රජය පිළිබඳව විවිධ පාර්ශ්වයන්ගෙන් විවිධ විවේචන, චෝදනා එල්ල වෙනවා. ඒ සෑම විවේචනයක් සහ චෝදනාවක් ගැනම රජයක් විධියට අපි ඉතා නිහතමානීව සැලකිලිමත් වන අතර ම අප ඒ පිළිබඳව ස්වයං විවේචනයක ද නිරත වී සිටින බව ප්‍රකාශ කළ යුතුයි. නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්ගේ ස්වාධීනත්වය දැනටමත් අප තහවුරු කර තිබෙනවා. එහෙත්, තවමත් නිදැල්ලේ සිටින මහා පරිමාණ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

වංචනිකයින්ට එරෙහිව නිසි පියවර නොගැනීම සම්බන්ධයෙන් විවේචන තිබෙනවා.

දූෂණය මුලිනුපුටා දමා සියලු දූෂිතයින්ට නීතිය ක්‍රියාත්මක කිරීම අපේ ඒකාන්ත අරමුණයි. එය මේ රටේ පොදු මහ ජනතාවගේ ප්‍රාර්ථනයක්."

රජයට එල්ල වී තිබෙන විවේචන පිළිබඳව පවා එතුමා සඳහන් කරමින් සමබර කථාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා කියන කාරණය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, පොදු ජනතාවගේ හෘදය ස්පන්දනය දන්නා, පොදු ජනතාව අතරින් මතු වෙච්ච, පොලොන්නරුව වාගේ ප්‍රදේශයකින් බිහි වෙච්ච රාජ්‍ය නායකයෙකු හැටියට, එතුමා රජෙකුගේ විලාසයෙන් නොවෙයි මේ ගරු සභාවට මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ. ඒක තමයි එතුමාගේ තිබෙන වෙනස. ස්ථාවර ආණ්ඩුවක් හැටියට ජනාධිපතිතුමාගේත්, අග්‍රාමාත්‍යතුමාගේත් නායකත්වය යටතේ කටයුතු කරමින් ප්‍රජාතන්ත්‍රවාදය, නීතිය, සාමය සුරකින රටක් හැටියට ඉදිරි අවුරුදු කීපය තුළ ශක්තිමත්ව ගමන් කරන ආකාරයේ වැඩ පිළිවෙළක් තමයි එතුමා ඉදිරිපත් කරපු මේ විග්‍රහයට අනුව තිබෙන්නේ කියන කාරණය මා සඳහන් කරනවා. මා වෙත කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුති කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. Rajavarothiam Sampanthan, the Hon. Leader of the Opposition.

[11.24 a.m.]

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Thank you, Mr. Speaker. We are debating the Policy Statement made by His Excellency President Maithripala Sirisena in Parliament on the 08th of this month. This Adjournment Motion has been requested by the Leader of the Joint Opposition, the Hon. Dinesh Gunawardena and has been seconded also by an Hon. Member of the Joint Opposition.

One could see, Sir, that the main theme of their speeches was that this Government should cease to govern, which should also mean that they must be returned to governance or they must be enabled to govern the country. They have governed this country for a long time. They governed this country for ten years before the present Government came into power. When they gave up their Government, they were neck-deep in debt.

One of the biggest issues identified by the President as confronting the country is the foreign debt and the domestic debt. I will, in the course of my speech, Sir, address issues that need to be addressed to take the country forward, to take the country on a different path, to define for the country a different future. It would be my submission that merely changing Governments is not going to resolve problems. On the contrary, we must all come together and think in terms of what needs to be done for the country to move forward, for the country to prosper, for the country to be redeemed from its present position. Therefore, Sir, my speech will be on an entirely different basis.

කටන්ත කාලංකළිල් පල්වේරුපට්ට පිරේරණෛකළ් ඉන්තච් චපෛයිල් චමර්ප්පික්කප්පට්ටු නිරෛවේර්රප්පට්ටන. අක් කාලංකළිලේ ඉන්තච් චපෛයිලේ ජනාතිපතිකළ් එල්ලෝරුම් තංකළ් අතිකාරංකළෙ අතිකරික්ක නිනෛත්තපෝතෙල්ලාම් ඉන්තච් චපෛයුම් අතර්කු ඔත්තුළෛත්තතු. අන්තවකෛයිල්, 18වතු තිරුත්තත්තෙ - ඕර් අටිමෛච් චාචනත්තෙ නිරුවක්කූටිය අතිකාරම් මහින්ත රාජපක්ෂවුක්කුක් කිටෙත්තතු. ආනාල්, 19වතු තිරුත්තම් එන්පතු ඉන්ත නාට්ටිනුටෙය ජනාතිපතියිනතුම් චකල කට්සිකළිනතුම් 212 පාරාළුමන්ර උරුප්පිනර්කළතුම් ආතරවෛප් පෙර්රතු එන්රාල්, අංකු එන්තත් තිණිප්පුම් ඉරුක්කවිල්ලෙ. ඉතු ඔරු තලෛමෛත් තුවත්තුක්කුක් කිටෙත්ත මාපෙරුම් වෙර්රියාකුම්. ඉප්පටිප්පට්ට ඔරු තලෛමෛත්තුවත්තෛයේ නාංකළ් ඉප්පොළුතු කොණ්ටිරුක්කින්රෝම්. ජනාතිපතියුටෙය අතිකාරංකළ් චම්පන්තමාක ඔරු චට්ටමූලත්තෛක් කොණ්ටුවන්තු පාරාළුමන්ර්තත්තිනුටෙය පෙරුම්පාන්මෛ වාක්කුකළ් මූලමාක අල්ලතු චර්වජන වාක්කෙටුප්පින්මූලමාකක් කූට්ටවෝ කුරෛක්කවෝ මුටියුම් එන්ර නිලෛමෛ ඉරුක්කුම්පෝතු, එමදු ජනාතිපති අවර්කළ් තනතු තලෛමෛයිලේ පිරතම මන්තිරියින් උතවියෝටු - ඉරණ්ටු කට්සිකළුම් ඉණෛන්තු - ඉන්තප් පාරාළුමන්ර්තත්තිලේ ඉරුක්කින්ර ඒනෛය කට්සිකළින් ඔත්තුළෛප්පුටන් 19වතු තිරුත්තච් චට්ටත්තෛ නිරෛවේර්රි ජනාතිපතියිනුටෙය අතිකාරත්තෛක් කුරෛත්තිරුක්කින්රාර්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now. Your time is over.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
இந்த நேரத்திலே மேலும் சில விடயங்களைக் கூறுவதற்கு இரண்டு நிமிடம் தாருங்கள்!

எங்களுடைய ஜனாதிபதி அவர்கள் தன்னுடைய கொள்கை விளக்க உரையிலே தமிழ் மக்களின் சம உரிமைகளை அடிப்படையாகக் கொண்ட அபிலாஷைகளை ஏற்றுக்கொள்ளல், முஸ்லிம் மக்களின் நலன் மற்றும் சமூக, கலாசார தேவைகளை உறுதிசெய்தல், மலையகத் தமிழ் மக்களின் பொருளாதார, சமூக நிலையை மேம்படுத்தல், பெண்களை பலப்படுத்துதலும் அவர்களது நேரடிப் பங்களிப்பும், சமய நம்பிக்கைகள் எமது மதவுரிமைகள் பாதுகாக்கப்படும் வகையில் சகல சமய பெரியார்களையும் மத குருமாரையும் மகா சங்கத்தினரையும் பேண்தகு முறையில் போஷித்தல் என்றெல்லாம் பல விடயங்களைக் கூறினார். ஆனால், அண்மையிலே திருகோணமலையில் இடம்பெற்ற ஓர் சம்பவம் பற்றி எமது எதிர்க்கட்சித் தலைவர் அவர்கள் குறிப்பிடுகையில், முஸ்லிம் சமூகத்தினுடைய குறித்த மத, கலாசார விடயங்கள் கடந்த நான்கு வருடங்களுக்குள்ளேயே உருவாக்கப்பட்டுள்ளதாக, இன நல்லிணக்கத்தைச் சீர்குலைக்கின்ற விதத்தில் கூறியிருக்கின்றார். எவ்வாறாயினும் குறித்த கட்சித் தலைவர்களும் மற்றும் எதிர்க்கட்சித் தலைவரும் எமது பாரம்பரியத்தை மதிக்க வேண்டும்.

நான் தமிழ் ஆசிரியர்களால் கல்வி கற்பிக்கப்பட்டவன்; இந்துக் கல்லூரியிலே கல்வி கற்றவன். அக்காலத்தில் அந்தக் கல்லூரியில் இருந்த 4,600 மாணவர்களுக்கு மத்தியிலே, நான் ஐவேளைத் தொழுகையைத் தொழுவதற்கு அந்தக் கல்லூரியில் எனக்கு ஓர் அறையை ஒதுக்கித் தந்தார்கள். இன்று நாங்கள் சண்முகா வித்தியாலயத்திலே இருக்கின்ற 2,400 இந்து மாணவர்களை, ஆசிரியர்களை அவர்களுடைய கலாசார விழுமியங்களைவிட்டு விலகச் சொல்லவில்லை - 'பர்தா' அணியச் சொல்லவில்லை. அதேநேரம், எமது சமூகத்தின் மத, கலாசார விழுமியங்கள் பாதிக்கப்படும் வகையில் எமது ஆசிரியர்களின் 'பர்தா'வைக் கழற்றுமாறு கூறுவது எமது சமூகத்தை அவமானப்படுத்துவது போன்றதாகும். இதனை எங்களுடைய எதிர்க்கட்சித் தலைவர் அவர்கள் புரிந்து கொண்டு செயற்பட வேண்டும். எமது ஜனாதிபதி அவர்களுடைய கொள்கை விளக்க உரையிலும் பெண்களைப் பலப்படுத்துதல் மற்றும் மத அனுஷ்டானங்கள் பாதுகாக்கப் படுதல் என்பது பற்றிக் குறிப்பிடப்பட்டிருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

அந்த வகையில், ஜனாதிபதி அவர்களும் பிரதம மந்திரி அவர்களும் எமது மாவட்ட மக்களினுடைய உரிமையை, முஸ்லிம் சமுகத்தினுடைய எதிர்பார்ப்பை நிறைவேற்று வார்களென்ற நம்பிக்கையுடன் விடைபெறுகின்றேன். நன்றி. வஸ்ஸலாம்.

[பி.ப. 12.50]

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் கடந்த 8ஆம் திகதி நாடாளுமன்றத்தில் ஆற்றிய கொள்கை விளக்க உரை பற்றிய விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் முன்வைப்பதற்கு வாய்ப்பு அளித்தமை தொடர்பில் முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். 2015ஆம் ஆண்டு ஜனவரி மாதம் 08ஆம் திகதியிலிருந்து இந்த அரசு மேற்கொண்டிருந்த பணிகள் தொடர்பிலும், இன்னும் மேற்கொள்ளப்பட வேண்டிய பணிகள் தொடர்பிலும் அவரது உரை பல விடயங்களை உணர்த்தியிருந்தது. அரசியல் ரீதியிலான விமர்சனங்கள் என்ற ரீதியிலும் வெறும் அரசியலுக்கான விமர்சனங்கள் என்ற ரீதியிலும் பலரும் பலவிதமான கருத்துக்களை மேற்படி உரை தொடர்பில் முன்வைக்கக்கூடும். தாம் மேற்கொண்டுள்ளதாக ஜனாதிபதி அவர்கள் பல்வேறு விடயங்களை இந்த உரையின் மூலமாகச் சுட்டிக்காட்டியிருந்தபோதும், அந்த விடயங்கள் மக்கள் மத்தியில் நடைமுறை ரீதியில் செயற்படுத்தப்படுகின்றனவா என்பது தொடர்பில் அதிகாரிகளோ, அமைச்சர்களோ ஆராய்ந்து பார்க்கின்றார்களா? என்பது கேள்விக்குறியாகவே இருக்கின்றது.

எமது மக்களுக்காக அரசாங்கம் வகுக்கின்ற திட்டங்கள் வெறும் எழுத்து வடிவங்களிலோ, அரச திணைக்கள மட்டங்களிலே மாத்திரம் இருப்பதால் எவ்விதமான பயனும் இல்லை. அவை மக்கள் மத்திக்கு கொண்டுசெல்லப்பட்டு நடைமுறைப்படுத்தப்படல் வேண்டும். அவ்வாறு நடைமுறைப்படுத்தப் படுகின்றபோது அவற்றை மக்கள் உணர வேண்டும். மேலும், பல்வேறு விடயங்கள் எதிர்காலத்தில் மேற்கொள்ளப்பட வேண்டியதன் அவசியத்தையும் மேதகு ஜனாதிபதி அவர்களின் உரை சுட்டிக்காட்டுகின்றது. இந்த அனைத்து விடயங்களையும் முன்னெடுப்பதற்கு இந்த நாட்டின் ஸ்திரத்தன்மை பேணப்பட வேண்டியது அவசியமாகும். அது அரசியல் ரீதியாக இருக்கலாம் அல்லது சமூக, பொருளாதார ரீதியாக இருக்கலாம்! அந்த வகையில், "நிலையான நாட்டின் அடித்தளம் தேசிய நல்லிணக்கமே" என்பதை ஏற்றுக்கொள்கின்ற ஜனாதிபதி அவர்கள், "தேசிய நல்லிணக்கத்தை ஏற்படுத்தவேண்டுமாயின், சமத்துவத்தை அடிப்படையாகக் கொண்ட அரசியல் தீர்மானங்களை இயற்றத்தக்க கட்டமைப்பினை அறிமுகப்படுத்த வேண்டும்" என்றும், "அந்த நோக்கை வெற்றி கொள்வதற்கு தற்போது செயலில் இருந்து வருகின்ற மாகாண சபை முறைமையை மேலும் பலப்படுத்துவது காலத்தின் தேவையாகும்" என்றும் வலியுறுத்துகின்றார். மாகாண சபை முறைமை இந்த நாட்டில் அறிமுகமான காலத்திலிருந்தே இந்த வழிமுறையை நாங்கள் வலியுறுத்தி வருகின்றோம்.

அந்தவகையில், எமது நடைமுறைச் சாத்தியமான நிலைப்பாட்டினை ஏற்றுக்கொள்கின்ற ஜனாதிபதி அவர்களின் யதார்த்தமான நிலைப்பாட்டினை நாம் வரவேற்கின்றோம். மாகாண சபை முறைமையினை இன்றும்கூட அரவணைத்துக் கொண்டு, அதனை அனுபவித்துக்கொண்டிருக்கின்ற ஒரு சாரார், தங்களது சுய அரசியலுக்காக அதனை விமர்சித்து வருகின்றனரே அன்றி, இந்த முறைமையின் ஊடாக எமது மக்களுக்குரிய பணிகளை மேற்கொள்வதற்கு முன் வருவதில்லை என்பதே யதார்த்தமாகும். உண்மையில், மாகாண சபை முறைமையினை எதிர்ப்பவர்கள் மாகாண சபை முறைமைக்குள் வந்திருக்கக்கூடாது. அந்த முறைமைக்குள் வந்து குந்திக்கொண்டு மாகாண சபையின் அனைத்து வரப்பிரசாதங்களையும் அனுபவிப்பதோடு, மேலதிகமாக ஊழல், மோசடிகளையும் செய்துகொண்டு மாகாண சபையின் பயன்களை எமது மக்களை நோக்கி விடுவிக்காமல், தங்களுக்குள்ளேயே தடுத்து வைத்துக்கொண்டிருப்பதிலும் மேலதிக நிதிகளை மத்திய அரசின் திறைசேரிக்கே திருப்பி அனுப்பிக்கொண்டிருப்பதிலும் அக்கறை காட்டிக்கொண் டிருந்தால், மாகாண சபை முறைமையின்கீழ் எவ்விதமான பயனும் இல்லை என்றே எமது மக்கள் நம்புவார்கள்.

மாகாண சபை முறைமையானது 'வெள்ளை யானை' என ஒரு சாரார் கூறுகின்றனர். இவ்வாறு கூறப்படுகின்ற இந்த 'வெள்ளை யானை'யிலிருந்து, தான் எப்படி மக்களுக்குரிய பணிகளை மிகச் சிறந்த முறையில் ஆற்றினேன் என்பது பற்றி வடமேல் மாகாணத்தின் முதலமைச்சராக இருந்த தற்போதைய புத்த சாசன அமைச்சர் கௌரவ காமினி ஜயவிக்கிரம பெரேரா அவர்கள் மிக அற்புதமாகக் கூறியிருந்தார். ஆகவே, இது வெள்ளை யானையா? கறுப்பு யானையா? என்பது பார்ப்பவர்களது கண்களைப் பொறுத்தது. செயற்றிறன் அற்றவர்களின் பார்வைக்கு இது வெள்ளை யானையாகத் தெரியக்கூடும். மாகாண சபை முறைமையில் எதுவுமே இல்லை எனக் கூறிக்கொண்டு, தங்களுக்குரிய வாகனங்கள் முதற்கொண்டு அனைத்து சலுகைகளையும் மத்திய அரசிலிருந்து கேட்டுப் பெற்றுக்கொள்கின்ற மாகாண சபையின் ஆட்சியாளர்களால், மாகாணப் பௌதிக வளங்களை அபிவிருத்தி செய்து, மக்களது பயன்பாட்டுக்காக அவற்றை வழங்குவதற்கு மத்திய அரசின் நிதி உதவிகளைப் பெறத் துறைசார்ந்த தொடர் அமைச்சுக்களைத் தொடர்புகொள்ள முடியாதிருப்பதென்பது எமது மக்களின் துரதிஷ்டமே அன்றி, வேறு ஒன்றுமில்லை என்றே நான் கருதுகின்றேன்.

இன்று இந்த அரசு முகங்கொடுத்துள்ள தொடர் பிரச்சினைகள் குறித்து நாம் நன்றாக அறிவோம். பொருளாதாரப் பிரச்சினை என்பது இன்னும் எத்தனை காலத்திற்கு நெருக்கடி நிலையில் தொடருமோ தெரியாது. எந்தத் துறையில் பிரச்சினை இல்லை எனக் கூறவும் இயலாத வகையில், எல்லாத்துறைகளும் சார்ந்து பிரச்சினைகளுக்கு மேல் பிரச்சினைகளாகவே தொடரும் நிலையில் இந்த நாடு இருந்து வருகின்றது. இந்த நிலையில் அதிகாரப் பகிர்வுக்கான புதிய அரசியல் யாப்பு எந்தளவுக்குச் சாத்தியம் என்பதை எவராலும் கூற முடியாதுள்ளது. வெறுமனே அரசியலுக்காக இந்த வருட தைப்பொங்கலைக் கொண்டாடிக்கொண்டு, அடுத்த தைப்பொங்கலிலும் இந்த வருட சித்திரைப் புத்தாண்டைக் கொண்டாடிக்கொண்டு, அடுத்த சித்திரைப் புத்தாண்டிலும் இந்த வருட தீபாவளியைக் கொண்டாடிக் கொண்டு, அடுத்த வருட தீபாவளியிலும் எமது மக்களுக்கான

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

අරසියල් තීර්වු කිඩෙක්කුම් එන්රෝ, ඉන්ත වරුඩත්තිර්කුළ් අරසියල් තීර්වු කිඩෙක්කාවිට්ටාල් පයංකර විළෙවු ඒර්පඩුම් එන්රෝ, සර්වදේසම් අදනෛප් පාර්ත්තුක්කොළ්ළුම් එන්රෝ කූරි, එමදු මක්කළෛ ඒමාර්රික්කොණ්ඩු කාලංකඩත්ත මුඩියාදු.

"අළුදුම් පිළ්ළෛයෛ අවළේ පෙර වේණ්ඩුම්" එන්පදුපෝල අදිකාරප් පකිර්වු තොඩර්පිල් පුදියදෝර් අරසියල් යාප්පිනෛ වකුත්තුක්කොණ්ඩු, මක්කළ් අපිප්පිරාය වාක්කෙඩුප්පුක්කුප් පෝනාල් විළෙවු එන්නවාකුම්? එන්පදු කුරිත්තු යදාර්ත්තපූර්වමාකච් චින්දික්කින්රවර්කළ් නන්කු අරිවාර්කළ්. අදිකාරප් පකිර්වු කුරිත්ත නල්ලෙණ්ණක් කරුත්තුක්කළෛ ඉන්ත නාට්ටින් පෙරුම්පාන්මෛ මක්කළිඩම් සුමුකමාකක් කොණ්ඩුසෙල්වදිල් එන්දත් තරප්පිනරුම් ඉදුවරෛයිල් වලුවාන මුයර්සිකළෛ මේර්කොළ්ළවිල්ලෛ එන්රේ තෙරියවරුකින්රදු. එනවේ, තෙන්පකුදි මක්කළිල් පෙරුම්පාලානවර්කළෛක් කඩන්තකාලක් කසප්පුණර්වුකළිලිරුන්දුම් සන්දේකඞ්කළිලිරුන්දුම් මීට්ක මුඩියාදුළ්ළ නිලෛයේ තොඩර්කින්රදු. ඉන්ත නිලෛප්පාට්ටිනෛ මේලුම් උරම් පෝට්ටු වළර්ක්කින්ර කෛඞ්කරියඞ්කළෛප් පේරිනවාත, ඉනවාත සක්තිකළ් මිකවුම් තිට්ටමිට්ට වකෛයිල් මේර්කොණ්ඩු වරුකින්රන. ඉදර්කුත් තේවෛයාන සූළලෛත් තමිළ්ත් තරප්පු සුයලාප අරසියල්වාතිකළ් සිලරුම් වලින්දු උරුවාක්කි වරුකින්රනර්.

එමදු මක්කළුක්කාන අරසියල් අදිකාරප් පකිර්වු අවසියමාකුම් එන්ර නිලෛප්පාට්ටිල් නාම් තොඩර්න්තිරුක්කින්රෝම්. 13ආවදු තිරුත්තච් චට්ටත්තිල් කුරිප්පිඩප්පට්ටුළ්ළ - අදාවදු, තර්පෝදු මුළුමෛයාකච් චෙයර්පඩුත්තප්පඩාවිට්ටාලුම් - මුළුමෛයාන අදිකාරප් පකිර්වෛවිඩක් කූඩිය අදිකාරප් පකිර්වෛක් කොණ්ඩතාන ඕර් අරසියල් යාප්පු පුදිතාක නිරෛවේර්රප්පඩුමානාල්, අදනෛ නාම් ඒර්රුක්කොළ්වෝම්; අදර්කුත් තඩෛයාක නාම් ඔරුපෝදුම් ඉරුක්කප්පෝවදිල්ලෛ. නාම් 13ආවදු තිරුත්තච් චට්ටම් මුළුමෛයාකච් චෙයර්පඩුත්තප්පඩුවදෛ එමදු මක්කළුක්කුරිය අදිකාරප් පකිර්වුක්කාන ඕර් ආරම්පමාක වලියුරුත්තුකින්රෝමේ තවිර, ඉන්ත 13ආවදු තිරුත්තච් චට්ටත්තෛවිඩක් කූඩිය අදිකාරප් පකිර්විනෛක් කොණ්ඩ පුදිය අරසියල් යාප්පුක්කු එදිරානවර්කළ් අල්ලර් එන්පදෛ ඉංකු වලියුරුත්ත විරුම්පුකින්රේන්. එනිනුම්, අදර්කාකච් චාත්තියමර්ර වළිකළිල් මුයර්චිත්තුක්කොණ්ඩු කාලත්තෛක් කඩත්තුවදාල් එව්විදමාන පයනුම් එවරුක්කුම් කිට්ටප්පෝවදිල්ලෛ එන්පදෛයේ නාන් ඉංකු චුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්.

පුදියදෝර් අරසියල් යාප්පිනූඩාන අදිකාරප් පකිර්වු චාත්තියමා? චාත්තියමිල්ලෛයා? එන්පදු කුරිත්තු ඉප්පෝදු එවරාලුම් නිච්චයිත්තුක් කූරමුඩියාදු එන්රේ නාන් කරුදුකින්රේන්. නේර්මෛයාන මුරෛයිල් ඉදු චාත්තියමාකි යිරුක්ක වේණ්ඩුමානාල්, ඉන්ත අරසින් මුදල් 100 නාට්කළ් ආට්චික්කාලත්තිලේයේ ඉදනෛ නිරෛවේර්රියිරුක්ක වේණ්ඩුම්. ඉප්පෝදු එල්ලාමේ "ආරිය කඤ්චි, පළංකඤ්චිපෝල" ආකිවිට්ටන. එනවේ, අදිකාරප් පකිර්විනෛ නෝක්කියදාන පුදිය ඒර්පාඩුකළ් වරුම්වරෛයිල්, තර්පෝදු නාට්ටිල් නෛමුරෛයිලුළ්ළ එමදු අරසියල් යාප්පිල් ඉරුක්කින්ර 13ආවදු තිරුත්තච් චට්ටත්තිලුළ්ළ මාකාණ සපෛ මුරෛමෛයෛ මුළුමෛයාකච් චෙයර්පඩුත්ති, එමදු මක්කළින් අදිකාරප් පකිර්වුක්කු ඉදනෛ ඕර් ආරම්පමාකක්කොණ්ඩු, පඩිප්පඩියාක මුන්නෝක්කි නකරුංකළ්! එන්රේ කේට්ටුක්කොළ්කින්රේන්.

අදිකාරප් පකිර්වුක්කෙන්රේ ආරම්පික්කප්පට්ටදු මාකාණ සපෛ මුරෛමෛ එන්පදෛ ආළුම් දරප්පිනරුම් එදිර්දරප්පිනරුම් ආළුනර්කළුම් මාකාණ සපෛයිල් අමර්න්දිරුක්කින්ර මුදලමෛච්චර්කළ් උට්පද ඒනෛය උරුප්පිනර්කළුම් පුරින්දුකොළ්ළ වේණ්ඩුම්. අන්ත වකෛයිල්, මේදකු ජනාදිපදි අවර්කළ් කුරිප්පිට්ටදෛප්පෝන්රු වඩක්කු, කිළක්කු මක්කළ් පොරුමෛ ඉළන්දුදාන් ඉරුක්කින්රනර්. අවර්කළෛ නිරන්දරමාකච් චමරච්චප්පඩුත්තුවදර්කු අරසියල් වේලෛත්තිට්ටම් අවසියමාකුම්. අදර්කුත් තර්පෝදෛය නිලෛයිල් මාකාණ සපෛ මුරෛමෛයෛ මුළුමෛයාකච් චෙයර්පඩුත්ති, එමදු මක්කළින් අඩිප්පඩෛ, වාළ්වාදාර මර්රුම් අරසියල් රීදියිලාන පිරච්චිනෛකළෛත් තීර්ප්පදර්කාකත් තර්පෝදු නඩෛමුරෛයිල් ඉරුක්කින්ර වේලෛත්තිට්ටඞ්කළුක්කු මේලදිකමාක විසේඩ තිට්ටඞ්කළෛ වකුත්තු නඩෛමුරෛප්පඩුත්තුවදර්කුම් අදේපෝන්රු එමදු මක්කළින් උණර්වුපූර්වමාන පිරච්චිනෛකළෛත් තීර්ප්පදර්කුම් ඒර්පාඩුකළෛච් චෙය්තු, එමදු මක්කළින් මනඞ්කළෛ වෙට්රි කොළ්වදර්කු මුන්වාරුඞ්කළ්! එනක් කේට්ටුක්කොණ්ඩු, චන්දර්ප්පම් කොඩුත්තදර්කු මීණ්ඩුම් නන්රි කූරි, විඩෙපෙරුකින්රේන්. නන්රි!

[අ.භා. 1.00]

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවේ ඉදිරි දහඅට මාසයේ ප්‍රතිපත්තිය පිළිබඳව කරුණු 15කින් යුතු ප්‍රතිපත්ති මාලාවක් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළා. මේ රජය බලයට පත් වීමේදී -විශේෂයෙන්ම ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත්- මූලික තේමාව ලෙස ඉදිරිපත් කළේ ප්‍රජාතන්ත්‍රවාදී අවස්ථා පුළුල් කිරීමයි. ඒ වෙනුවෙන් ආණ්ඩුව යම් යම් දේශපාලන ප්‍රතිසංස්කරණ කළා. ස්වාධීන කොමිෂන් සභා ඇති කළා. විශේෂයෙන්ම සමාජයේ සියලුම කොටස් තමන්ගේ අදහස් ප්‍රකාශ කර ගැනීම සඳහා වුණු බලාත්මකකරණයකට ගන්න රජය නීතිමය වශයෙනුත්, සමාජමය වශයෙනුත් පියවර ගත්තා. නමුත් ආර්ථික ක්ෂේත්‍රයේ අපේ ඉදිරි මහ පිළිබඳව විවිධ පාර්ශ්ව අතර තිබෙන අපැහැදිලිතා නිසා අද ගැටලු රාශියක් පැන නැඟී තිබෙනවා. ඒ නිසා පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් ආණ්ඩුවේ පක්ෂවලට ජනතාව විසින් ලබා දුන් ප්‍රතිඵලයත් එක්ක, ඉදිරි කාලයේදී අප විසින් සාක්ෂාත් කර ගත යුතු ආර්ථික, සමාජ, පාරිසරික, දේශපාලනික ප්‍රතිපත්ති මාලාවක් කරුණු 47කින් යුක්තව මීට සති කිහිපයකට පෙර මම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. එයින් මම කියන්න අදහස් කළේ, ඒ දේශපාලන ප්‍රතිසංස්කරණවලට වැඩි අවධානයක් යොමු වෙලා, ආර්ථික සහ සමාජමය කාරණාවලට අඩු අවධානයක් හෝ නොතකා හැරීමක් නිසා ඇති වුණු ජනතාවගේ ඒ දේශපාලන ප්‍රශ්නය අප විසින් විසඳිය යුතුය කියන කාරණයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි එක දෙයක් වටහා ගන්න ඕනෑ. අපට ඉතාම ලස්සන, පිටතින් බැලුවාම ඉතාම සුන්දර ලෙස පෙනෙන ප්‍රතිපත්ති මාලාවන්, සැලසුම් සකස් කර ගන්න පුළුවන්. නමුත් ඒවා ක්‍රියාත්මක කරන්නේ කෙසේද, ඒවා

ක්‍රියාත්මක කිරීමෙන් අපට ආර්ථිකමය වශයෙන්, සමාජමය වශයෙන් ප්‍රතිඵල ලැබෙන්නේ කොහොමද, ඵලදායීතාව කොච්චරද කියන එක තමයි අප ඉදිරියේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය; ඒ වෙනුවෙන් ගත යුතු පියවර තමයි වැදගත්ම ක්‍රියා මාර්ගය. ඒ අනුව ප්‍රතිපත්තිවලට වඩා, අපි ඒවා ක්‍රියාත්මක කරන ආකාරයත්, ක්‍රියාත්මක කිරීමෙන් පසුව අපට ප්‍රතිඵල ලැබෙන ආකාරයත් පිළිබඳව අපි දැඩි ලෙස අවධානය යොමු කළ යුතුයි.

මේ ලෝකයේ වාණිජවාදය ආරම්භ වුණාට පස්සේ ඒ පිළිබඳව විධිමත් විග්‍රහයක් මුලින්ම කළේ ස්කොට් ජාතිකයකු වන ඇඩම් ස්මිත් විසිනුයි. ඔහු ආර්ථිකයේ වර්ධනය පිළිබඳවත්, ප්‍රාග්ධනයත්, ඒ වාගේම ශ්‍රමයේත්, තාක්ෂණයේත් තිබෙන වැදගත්කම අවධාරණය කළා. නමුත් අද ලෝකයේ අලුත් ප්‍රවණතාව අනුව අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ජනගහනයේ ස්වරූපය ආර්ථිකයේ සංවර්ධනයට දරන දායකත්වය ඉතාම බලවත්, ඉතාම වැදගත් කියා දැනිලා තිබෙනවා. ඒ නිසා තමයි, මේ රජය අධ්‍යාපනය, සෞඛ්‍ය හා ජනගහනයේ සමාජ ශුභ සාධනය දෙසට වැඩි බර තබන ප්‍රතිපත්තියක් අනුගමනය කළේ. පසුගිය 2004 - 2014 කාලයේ රුපියල් ට්‍රිලියන 2.4ක ප්‍රාග්ධන වියදමක් ඒ ආණ්ඩුව විසින් කළා. එම ආණ්ඩුව විසින් කළ ඒ ට්‍රිලියන 2.4ක ණය බර 2035 දක්වා අපි ගෙවිය යුතුයි. මේ ට්‍රිලියන 2.4න් ට්‍රිලියනයකටත් වඩා වැඩියෙන් වැය කළේ අධිවේගී මාර්ග සඳහායි. ඒ කියන්නේ මුළු ප්‍රාග්ධනයෙන් සියයට 42කට ආසන්න ප්‍රමාණයක් අපි මාර්ග සංවර්ධනය දෙසට යොමු කළා. පොදුවේ ගත්තාම ඒකේ වරදක් පෙනෙන්නේ නැහැ. නමුත් සෞඛ්‍යයට වියදම් කළේ සියයට 6යි. අධ්‍යාපනයට වියදම් කළේ සියයට 4යි. ඉතාම බලගතු විධියට අපි ප්‍රමුඛතා හඳුනා ගත්තොත්, අධ්‍යාපනයට කරන ආයෝජනය; සෞඛ්‍යයට කරන ආයෝජනය ආර්ථික සංවර්ධනයට පැහැදිලිව බලපාන බව අද පෙනී ගිහින් තිබෙනවා. ලෝක බැංකුවේ වාර්තාවලට අනුව අධිවේගී මාර්ගවලට වඩා අධ්‍යාපනයට කරන වියදම ආර්ථිකයට ප්‍රතිඵලදායකයි. එයින් ලැබෙන ඵලදායීතාව වැඩි බව දැන් ඔප්පු වෙලා තිබෙනවා. ඒ සඳහා මම උදාහරණයක් කියන්නම්. 1993 සිට 2005 දක්වා තිබෙන දත්ත අරගෙන බැලුවාම, ලංකාව අධ්‍යාපනයට වැය කළ මුදල් ප්‍රමාණය එක්ක සංසන්දනය කළාම, එහි rate of return එක සියයට 12.7ක් වැනි විශාල අගයක් බව පෙනී ගිහින් තිබෙනවා.

අධිවේගී මාර්ගවල ඵලදායීතාව - rate of return එක - ඍණ අගයක්. ගාල්ල - කොටාව අධිවේගී මාර්ගය තමයි අපට වියදම් අඩුම මාර්ගය. නමුත් අද ඒ වියදමින් 1/6යි ඒ අධිවේගී මාර්ගයේ ගමන් කරන වාහනවලින් අපට ලැබෙන්නේ. ජනතාවගේ වැටි එකෙන් සහ අනික් බදුවලින් තමයි ඉතිරි 5/6 ලබා ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අපි ලබාගෙන තිබෙන ජයග්‍රහණයක් තමයි ආයු කාලය. අද අපේ ආයු කාලය පළමුවන ලෝකයේ රටවල තත්ත්වයට පත් කරගෙන තිබෙනවා. මේ ආයු කාලය අවුරුදු 10කින් වැඩි කර ගන්න පුළුවන් නම්, දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට සියයට 1.5කින් දායක වන බව අන්තර්ජාතික සංඛ්‍යා ලේඛන අනුව පෙනී යනවා. ඒ නිසා රජයන් අනාගතයේ කටයුතු කරද්දී, ඇඟට කනට පෙනෙන වරාය, ගුවන් තොටුපොළ, බලාගාර, අධිවේගී මාර්ග වාගේම අධ්‍යාපනය, සෞඛ්‍යය, ඒ වාගේම ජනගහන ස්වරූපය - ජනගහන අස්වැන්න, එහෙම නැත්නම් demographic dividend එක - ජනතාවට ලැබෙන ආකාරයේ ප්‍රතිපත්ති දෙසට නැඹුරු විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විද්‍යාත්මක කැබිනට් මණ්ඩලයක් ගැන මේ දිනවල විශාල වශයෙන් සාකච්ඡා වුණා. ඇත්තටම මේ ලෝකයේ තිබෙනවා, ආණ්ඩුකරණ වර්ග තුනක්. එකක්, විද්‍යාත්මක වාස්තවික ආණ්ඩුකරණයයි. යම් යම් ක්ෂේත්‍ර හඳුනාගෙන, ඒ ක්ෂේත්‍රවලට යම් යම් ආයෝජන කළොත් ආර්ථිකයට කවර ප්‍රතිලාභයක් ලැබෙනවාද කියා විද්‍යානුකූලව නිගමනය කරලා, ඒ ක්ෂේත්‍රවලට ආයෝජනය කරන්න අපට පුළුවන්. ඒ වාගේම පැහැදිලි විද්‍යාත්මක විශ්ලේෂණයකින් පස්සේ කවර ක්ෂේත්‍රවලටද ආයෝජනය කරන්නේ කියා අපට නිගමනය කරන්න පුළුවන්. අධ්‍යාපනය ගත්තොත්, ප්‍රාථමික අධ්‍යාපනයට වියදම් කරනවාද, ද්විතීයික අධ්‍යාපනයට වියදම් කරනවාද, තෘතීයික අධ්‍යාපනයට වියදම් කරනවාද, එහෙම නැත්නම් කාර්මික අධ්‍යාපනයට වියදම් කරනවාද, එහෙමත් නැත්නම් පර්යේෂණවලට වියදම් කරනවාද? ලංකාවේ නම් වැඩිම ආර්ථික ප්‍රතිලාභය ලැබෙන්නේ පර්යේෂණ ක්ෂේත්‍රයට කරන ආයෝජනවලින් පමණයි. මෙය විද්‍යානුකූලව සොයා බලා, ඒ පැතිවලට ආයෝජන නියම කරන්න අපට පුළුවන්. එය තමයි විද්‍යානුකූල ආණ්ඩුකරණය.

අද මැලේසියාවේ නැවතත් බලයට පත් වුණා, අවුරුදු 92ක් වයසැති මහතීර් මොහොමඩ් මැතිතුමා. එතුමා මැලේසියාව විප්ලවකාරී පරිවර්තනයකට අනුව ගොඩ නහනකොට ජපානයෙන් ඉගෙන ගත් වැදගත්ම පාඩම තමයි මේ විද්‍යාත්මක ආණ්ඩුකරණය. අවුරුදු 22ක් දුගී බවේ පතුලට වැටී හිටපු මැලේසියාව එතුමා දියුණු රටක් බවට පරිවර්තනය කළා. එසේ කරන්නට පුළුවන් වුණේ, තෙල් හා ගෑස් නිසාම පමණක් නොවෙයි, විද්‍යානුකූල ආණ්ඩුකරණයේ ප්‍රතිපත්ති අනුගමනය කරපු නිසායි. එහෙම නැත්නම් ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයක් දියත් කරන්න අපිට පුළුවන්. මේ පාර්ලිමේන්තුව වාගේ රැස්වෙලා ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ බහුතරයේ කැමැත්ත මත සංවර්ධනයේ ප්‍රමුඛතා තීරණය කරන්න අපට පුළුවන්. බහුතරය කැමැති ප්‍රාථමික අධ්‍යාපනය දියුණු කරන්න නම්, ඒකෙන් ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභය නොසලකා ඒකට ආයෝජනය කරන්න ඕනෑ.

ඊළඟට, ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය. මේකත් ලෝකයේ රටවල් අනුගමනය කරන ආණ්ඩුකරණයක්. අපි උදාහරණයට මැලේසියාවම ගත්තොත්, මැලේසියාවේ මහතීර් මොහොමඩ්ගෙන් පස්සේ පත් වුණු අග්‍රාමාත්‍යවරයා අනුගමනය කළේ, ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයයි. සියලුම ඇමතිවරු, සියලුම මන්ත්‍රීවරුන් ශාලාවකට කැඳවා ඔවුන්ට ප්‍රමුඛතා හඳුනා ගන්න අවස්ථාව සලසා දුන්නා. ඒ ප්‍රමුඛතාවලට ආයෝජනය කිරීම සිද්ධ කළා. එතකොට ඒක ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයක්. නමුත්, මීට අමතරව, තුන්වැනි ආණ්ඩුකරණයකුත් තිබෙනවා. ඒක තමයි යන්නන් වාලේ කරන බොරු ෂෝක් ආණ්ඩුකරණය. ඒ ඒ අවස්ථාවල නායකයින්, ඒ ඒ අවස්ථාවලට අනුකූලව විවිධ පොරොන්දු ලබා දෙනවා. සහල් සේරු දෙක දෙනවායි කියනවා; ඇට අට දෙනවායි කියනවා; 2,500 දෙනවායි කියනවා; 350ට පොහොර දෙනවායි කියනවා; එහෙම නැත්නම් පොහොර නොමිලේ දෙනවායි කියනවා; පාසල් පොත් දෙනවායි කියනවා. මේ ආදී වශයෙන් ඒ ඒ අවස්ථාවේදී, ආර්ථික ප්‍රතිලාභය ගැන හිතන්නේ නැතිව, ජනතාවගේ සමාජමය ප්‍රතිලාභය ගැන කල්පනා කරන්නේ නැතිව, ඒ ඒ නායකයාට, ඒ ඒ අවස්ථාවේදී සිතෙන ආකාරයේ පොරොන්දු මත ගොඩ නැඟෙන බොරු ෂෝක් දේශපාලනය. ඒක තමයි අපට මේ අවුරුදු 70 ඇතුළත විශාල වශයෙන් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වුණු හේතුව. අපි කැමැති වුණත්, අකැමැති වුණත් මේ ගත වුණු අවුරුදු 70 විශ්ලේෂණය කර බැලුවාම, කිසියම් සැලසුම්සහගත ආකාරයකට ආණ්ඩු ක්‍රමයක් හා රාජ්‍යයක් මෙහෙයවන්න උත්සාහ දරා තිබෙන්නේ අවස්ථා දෙකකදී විතරයි. ඒ තමයි 1972 සිට 1975 දක්වා තිබුණු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව; ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා යටතේ, 1978 සිට 1982 දක්වා තිබුණු ආණ්ඩුව. මේ ආණ්ඩු දෙක ප්‍රතිපත්ති දෙකකයි ගමන් කළේ.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

එකක්, රජය මුල් කරගෙන, රජයේ ආයෝජනය මුල් කරගෙන, රාජ්‍ය ශක්තිමත් කරලා, ඒ හරහා ආර්ථිකය දියුණු කිරීමේ මාර්ගය. මේක වැරදියි කියලා කියන්න බැහැ. මොකද, සිංගප්පූරුව, තායිවානය වාගේම "ආසියානු කොටි" කියලා හඳුනා ගන්නා සෑම රාජ්‍යයක්ම නොදියුණු රටක ඉඳන් දියුණු රටක් බවට පරිවර්තනය වුණේ, මේ අනුගමනය කරපු ක්‍රියාමාර්ගය නිසයි.

අද ඇමෙරිකා එක්සත් ජනපදයේ ඩොනල්ඩ් ට්‍රම්ප් මැතිතුමාගේ ආරක්ෂණවාදය වෙනත් එකක් නොවෙයි, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ක්‍රමයම තමයි ඒ අනුගමනය කරගෙන යන්නේ. ඒක මේ රටේ අසාර්ථක වුණාට වෙනත් රටවල සාර්ථකව අවසන් කර තිබෙනවා. කවුරුන් හරි හෝ වැරදි වේවා, ඒ අවස්ථාවේ ඒ අත්හදා බැලීම කළා. ඊළඟට, ජයවර්ධන ජනාධිපතිතුමා ඇවිල්ලා රාජ්‍යයේ කටයුතු අවම කරලා පෞද්ගලික අංශය සහ අපනයන අභිමුඛ වන ආර්ථිකයක් සඳහා වන ක්‍රියා මාර්ගය 1978 ඉඳලා පටන් ගත්තා. මේ කලාපයේ එවැනි අත්දැකීමක් මුලින්ම ලබා ගත්ත රට අපේ රටයි. කොටින්ම අද චීනයේ තිබෙන ෂෙන්සෙන්, ගන්ෂු වැනි සියලු ප්‍රධාන ආර්ථික කලාපවලට අවශ්‍ය කරන blueprint එක, ප්‍රධාන සාධකය ලබා ගත්තේ කටුනායක නිදහස් වෙළෙඳ කලාපයෙනුයි. එදා, 1978දී ලංකාවට ආව නියෝජිත පිරිස -ඒ නියෝජිත පිරිසේ හිටපු ඉංජිනේරු මහත්වරුන්ගෙන් එක්කෙනකු චීනයේ ජනාධිපති වුණා. - එදා උපාලි විජයවර්ධන මහත්මයාත්, ලලිත් ඇතුලත්මුදලි මහත්මයාත් හමු වී ලබා ගත් සැලසුම තමයි, ඒ ෂෙන්සෙන් හා ගන්ෂුවල ක්‍රියාත්මක වුණේ.

අද ලෝකයේ කාර්මික නිෂ්පාදනයෙන් සියයට 33ක් මේ කාර්මික කලාපවලින් විතරක් ලැබෙනවා. කටුනායක, බියගම වාගේම අපේ අනෙකුත් ස්ථානවල ඇති කරපු නිදහස් වෙළෙඳ කලාපවලට මේ කටයුත්ත කර ගන්න පුළුවන් වුණාද කියා අප හිතා බලන්නට ඕනෑ. කෙසේ වෙතත් ඒ අවස්ථා දෙකේදී හැරෙන්නට අනෙකුත් කිසිම අවස්ථාවක අපි මේ විද්‍යානුකූල හෝ ප්‍රජාතන්ත්‍රීකරණය වෙන විධියේ ආණ්ඩුකරණයක් හෝ අය වැයකරණයක් වාගේම ආර්ථික ක්‍රියාවලියක් දියත් කර නැහැ. ඒ අවස්ථාවේදී හමුවන ප්‍රශ්නවලට අනුකූලව අපි ක්‍රියා කළා මිසක්, ඒ අවස්ථාවේදී නායකයින්ගේ අවශ්‍යතා වෙනුවෙන් දේශපාලන ප්‍රමුඛතා හදා ගත්තා මිසක් විද්‍යානුකූල ආණ්ඩුකරණයකට හෝ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයකට අපි ගමන් කළේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න. අප ඉදිරියේ තිබෙන ප්‍රශ්නය, මේ රට ඉදිරියට යන්නට නම් අපේ සාපේක්ෂ වාසිය මොකක්ද කියා අපි හඳුනා ගන්නට ඕනෑ කියන එකයි. අපි කියන්නේ "comparative advantage" කියන එකයි. අපේ සාපේක්ෂ වාසි දෙකක් තිබෙනවා. එකක් තමයි අපේ රටේ පිහිටීම. ඒ පිහිටීම මත, ඉන්දියානු සාගරය මැද අපේ රට පිහිටීම නිසා, ඒ වාගේම ආසියානු කලාපයේ ආර්ථිකමය බලවේගය නිසා -නැඟ එන ආර්ථික ක්‍රියාවලියක් ඇති වී තිබෙන නිසා ඩුබායි හා සිංගප්පූරුව අතරේ ප්‍රධාන ආර්ථික මර්මස්ථානය -වාණිජ මර්මස්ථානය- බවට පත්වීමේ හැකියාව තවමත් අපිට තිබෙනවා. 1950 වර්ෂයේදී කොළඹ වරාය තමයි ලෝකයේ පස්වෙනි වරාය වුණේ. අද එය විසිනව වන ස්ථානයේයි තිබෙන්නේ.

ඇත්තටම මේ වරාය, ගුවන් තොටුපොල, ඒ වාගේම වාණිජමය මධ්‍යස්ථානයක් හැටියට රට ගොඩනැඟීමේ ක්‍රියාවලිය එදා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවේ 2010 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වුණා. ඒ ප්‍රතිපත්ති ලේඛනය ලිව්වේ මමයි. අපි ඒ අවස්ථාවේදී මේ රට කේන්ද්‍රස්ථානයක් බවට පත් කරනවාය කිව්වේ, මේ සාපේක්ෂ වාසිය හඳුනා ගත් නිසායි. ඒක වුණත් අපි විධිමත්ව සැලසුමකට අනුව පක්ෂ භේදයෙන් තොරව තවම ක්‍රියාත්මක කර නැහැ.

දෙවෙනි කාරණය, අපේ උගත් ජනගහනයයි. අපිට තවදුරටත් ලාභ ශ්‍රමය නැහැ. හූහ දෙනෙක් අඬනවා, බංග්ලාදේශයට ආයෝජකයෝ යනවා; වියට්නාමයට ආයෝජකයෝ යනවාය ලංකාවට එන්නේ නැහැ කියා. ලංකාවේ කොච්චර ආයෝජන කලාප ඇති කළත් කිසිම ආයෝජකයෙක් ලංකාවට එන්නේ නැහැ. ඇයි? අපේ ශ්‍රම ගාස්තු වැඩියි; අපේ බලශක්ති ගාස්තු වැඩියි; අපේ පරිසර නීති සැරයි; අපේ ශ්‍රම නීති සැරයි. මේ රටේ අද අපිට විකුණන්නට පුළුවන්, අළෙවි කරන්නට පුළුවන් තරගකාරීව තිබෙන එකම දෙය තමයි බුද්ධිය. දැන් අපිට cheap labour කියන එක නැහැ. හැබැයි cheap brains තිබෙනවා. එම නිසා එයට අදාළ වෙච්ච කර්මාන්ත, එයට අදාළ වෙච්ච උපාය මාර්ගය දැන් අපි සකස් කර ගත යුතු වෙනවා. ඒක දිගු කාලීන ක්‍රියාවලියක් වුණත් ඒක තමයි මේ රටේ අනාගතයේ ආර්ථික උපාය මාර්ගය විය යුත්තේ. එම නිසා අතිගරු ජනාධිපතිතුමා මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළා.

මමත් කැබිනට් මණ්ඩලයට කෙටි කාලීන වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම ඒක ඉදිරි කාලයේදී ජනගත කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ සාධක මත පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, මේ රටේ දේශපාලනය ගැන උනන්දුවක් දක්වන අයටත්, රට ගැන උනන්දුවක් දක්වන අයටත් දැන් පක්ෂ, පාට භේදයෙන් තොරව ඉදිරිය බලා විද්‍යානුකූල ආණ්ඩු ක්‍රමයක්, අඩුම තරමින් ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයක් හදා ගැනීමට කාලය එළැඹ තිබෙනවා. පුද්ගලයෝ, පවුල් සහ ගජ මිතුරන්ට ඕනෑ ආකාරයට ආර්ථිකය මෙහෙයවන ක්‍රමවේදය වෙනුවට ජනතාවගේ අනාගතය යහපත් වන ක්‍රමවේදයක් සකස් කර ගැනීමට කාලය එළැඹිලා තිබෙන බව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.14]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය ආරම්භ කරමින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් කරන ලද ප්‍රකාශය විවාද කරන මේ අවස්ථාවේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මම මේ ප්‍රකාශනයේ 14වෙනි පිටුවට ඔබගේ අවධානය යොමු කරනවා. මෙහිදී ඉතා පැහැදිලිව ජනාධිපතිතුමා කියනවා, "සැබෑ ලෙසම ජනතාවාදී වැඩ පිළිවෙළක නිර්ණායක ලෙස හඳුනා ගත හැකි ප්‍රවිෂ්ටයන් 15ක් හඳුනා ගත හැකියි." කියලා. මම හිතනවා ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා ඒ ප්‍රවිෂ්ටයන් 15 සම්බන්ධයෙන් වෙන්නට ඇති කියන්නට ඇත්තේ කියලා. හැබැයි, මෙම ප්‍රවිෂ්ටයන් 15 සම්බන්ධයෙන් වර්ෂ 3ක් ආපස්සට

සමාලෝචනය කරලා බැලුවාම අපට ඉතා පැහැදිලිව පෙනී යනවා, අපේ රට දරුණු ආකාරයට ආපස්සට ගිහින් තිබෙන බව. මෙහිදී ජනතාවගේ ආර්ථික සමෘද්ධිය තහවුරු වීම සම්බන්ධයෙන් කථා කරනවා. අද මේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය අනුව මේ රටේ ජනතාව දැඩි අර්බුදයක තමයි ඉන්නේ. තමන්ට ලැබෙන ආදායම දවසින් දවස අඩු වෙනවා. තමන්ට ලැබෙන ආදායමෙන් තමන්ගේ දරු පවුලත් සමඟ එදා වෙල කාලා ජීවත් වෙන්නට බැරි පරිසරයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඊළඟට, දුගී භාවය දුරලීම ගැන කියනවා. මේ රටේ දුගී භාවය දවසින් දවස වැඩි වෙන ආකාරය අපට පෙනී යනවා. කොයි තරම් ආර්ථික පීඩනයක් මේ සමාජය තුළ තිබෙනවාද, මේ පීඩනය සම්බන්ධයෙන් අද කොතරම් අර්බුදයක් තිබෙනවාද කියා අපට පෙනී යනවා.

තරුණ තරුණියන්ට නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම තවත් ගැටලුවක් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ රජයේ ප්‍රධානම මානෘකාවක් බවට රැකියා දස ලක්ෂයේ පොරොන්දුව පත් වුණා. රැකියා දස ලක්ෂයක පොරොන්දුව තුළ බලයට ආපු ආණ්ඩුවක් අද වන විට මේ රටේ තරුණ තරුණියන් ඇතුළු රැකියා නියුක්තිකයන්ට රැකියා ලක්ෂ 4කට වඩා අහිමි කරලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ, වර්ෂ 3කටත් පසුව මේ රජයේ ප්‍රතිපත්තිය සකස් වෙන්නේ මේ ආකාරයට නම්, අපට ඔබතුමන්ලාගෙන් මීට වඩා හොඳ රජයක් බලාපොරොත්තු වෙන්නට බැහැ.

අද රජයේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් විවාදයක් ඇති වෙලා තිබෙන මේ මොහොතේ නිරෝෂන් පෙරේරා ඇමතිතුමායි, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජය කරන මන්ත්‍රීතුමායි විතරයි රජය නියෝජනය කරමින් මේ සභා ගර්භය තුළ ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනින් හැහෙන්නේ මොකක්ද කියලා බලන්න. මේ රජයේ මන්ත්‍රීවරු සභා ගර්භයට නොපැමිණීමෙන් ඔවුන්ට තිබෙන පීඩනයද මේ පිට කරන්නේ? මේ විවාද කරන්නේ ඔබගේ රජය සම්බන්ධයෙන් තිබෙන ප්‍රතිපත්තිය. 2015 වසරේ මහා ජනවරමක් අරගෙන මේ රට පාලනය කරන්න, මේ රට වෙනස් කරන්න කල්පනා කරපු මේ රජයේ ප්‍රතිපත්තිය විවාදයට ගන්න අවස්ථාවක රජයේ මැති ඇමතිවරුන් සභා ගර්භයට පැමිණ තමන්ගේ අදහස් ප්‍රකාශ නොකිරීමෙන්, "මේ ප්‍රතිපත්තිය වැරැදියි" කියලා මේ රටේ මහජනතාව කියූ අවස්ථාවක, ඔවුන් රජය නියෝජනය කරමින් එය අනුමත කරනවාද කියන ප්‍රශ්නය අපට අහන්න සිදු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගයන්ත කරුණාතිලක ඇමතිතුමා එතුමාගේ කථාවේදී අපේ රටේ ජාත්‍යන්තර සම්බන්ධතා සම්බන්ධයෙන් කථා කළා. වර්තමාන ආණ්ඩුව මොන තරම් දුරට ජාත්‍යන්තර සම්බන්ධතා ශක්තිමත් කර ගත්තාද කියලා එතුමා සඳහන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට අපේ රටට ආර්ථික වශයෙන් මර්මස්ථාන වන රටවල් කිහිපයක අපේ තානාපතිවරයෙක් හෝ මහ කොමසාරිස්වරයෙක් නැහැ. මාස නවයක සිට ඇමෙරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපතිවරයෙක් නැහැ. මේ වෙනකොට මහා බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකාව නියෝජනය කරන මහකොමසාරිස්වරයෙක් නැහැ. රුසියාව, බ්‍රසීලය, කෙන්යාව වැනි අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන ප්‍රධාන රටවල් පහකට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තානාපතිවරයෙක් හෝ මහ කොමසාරිස්වරයෙක් පත් කර ගන්න බැරි ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. හැබැයි, ආර්ථික වශයෙන් මේ රටවල් එක්ක ලෝකයේ අනෙක් සියලුම රටවල් ගනුදෙනු කරනවා; ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න උත්සාහ කරනවා. ඒ නිසා තමයි දවසින් දවස මේ ආර්ථිකය කඩා වැටෙන්නේ.

අද මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3.1යි. හොඳ නැහැයි කියපු මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ සියයට 8කට ආසන්නව තිබුණු ආර්ථික වර්ධන වේගය තමයි දැන් සියයට 3.1ට අඩු වෙලා තිබෙන්නේ. එතකොට මේ කඩා වැටීම අපට අරුම පුදුම කාරණයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම ගැන මේ ආණ්ඩුව කථා කරනවා. හැබැයි, මේ වෙනකොට විසුරුවා හැර මාස හතක් ගතවී තිබෙන පළාත් සභා තුනේ මැතිවරණ පවත්වන දිනයක් සම්බන්ධයෙන් අපට අවබෝධයක් ගන්න බැහැ. මැතිවරණයක් නැහැයි කියන අවබෝධය පමණයි අපට මේ වන කොට ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මොකද, ආණ්ඩු පාර්ශ්වයෙන් මේ මැතිවරණ ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. මේ ආණ්ඩුව රජයේ සම්මත වුණු අධිකරණ සංවිධාන (සංශෝධන) පනතේ කටයුතු ආරම්භ කරලා උත්සාහ කළේ දේශපාලන විරුද්ධවාදීන් සියලුදෙනා සිරගත කරලා, අධිකරණයට බලපෑම් කරලා තමන්ට රිසි ආකාරයට මේ රට විනාශ කිරීමේ ක්‍රමවේදයකට යන්නයි. ඒ නිසා රජය බලාපොරොත්තු වුණු ආකාරයට මේ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත රජයට සම්මත කර ගන්න බැරි වුණා. මේ ආණ්ඩුවට විරුද්ධව පාරට එන මේ රටේ දහස් ගණන් ජනතාව බන්ධනාගාරගත කරලා ඔවුන්ට දඬුවම් දීමේ ක්‍රමවේදයක් තමයි මේ රජය අනුගමනය කරන්න උත්සාහ කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබුණු කාලය ඉතා කෙටි නිස මේ කාරණා සම්බන්ධයෙන් මම ඉතාම කෙටියෙන් කථා කරනවා.

IMF එකෙන් ලැබුණු නියෝගය අනුව අද වෙන කොට ඉන්ධන මිල සූත්‍රය හදලා ඉවරයි. ඔබ කල්පනා කරන්න, මේ මොහොත වෙන කොටත් කී දාහක් තමන්ට එදා වෙල හොයා ගන්න බැරුව මේ රටේ කුසගින්නේ ඉන්නවාද කියලා. තමන්ගේ දරුවන් සමඟ එදා වෙල කන්න බැරුව කී දාහක් කුසගින්නේ ඉන්න මොහොතකද, මේ තෙල් මිලේ වැඩි වීම ගැන රජය ප්‍රකාශයට පත් කරන්නේ? රජය පසුගිය දවසේ ගෑස් මිල වැඩි කළා. මුළු ලෝකයේම මාස තුනක් ඇතුළත ගෑස් මිල අඩු වෙද්දී ලංකාවේ ගෑස් මිල වැඩි වෙනවා. ඒ වාගේම තමයි මේ තෙල් සම්බන්ධයෙන් තිබෙන ගැටලුවත්. තෙල් සම්බන්ධයෙන් මේ රජය වාසනාවන්ත වුණා. තමුන්නාන්සේලා රජය භාර ගත්තු වහාම ජාත්‍යන්තර වෙළෙඳ පොළේ තෙල් මිල දැවැන්ත විධියට අඩු වුණා. හැබැයි, ඒ අඩු වුණු මිලෙහි වාසිය මේ රටේ ජනතාවට ලබා දෙන්න මේ ආණ්ඩුවට පුළුවන් වුණේ නැහැ. මේ ආණ්ඩුව පරිපූරක ඇස්තමේන්තු ගෙනැල්ලා තමුන්නාන්සේලාගේ රජය ඇතුළේ තිබෙන අභ්‍යන්තර අර්බුද ටික විසඳා ගන්න, මැති ඇමතිවරුන්ව සන්තෝෂ කරන්න ඒ මිල අඩුවීම මත ඉතිරි වුණු මුදල් පාවිච්චි කළා. ඒ අය කථා කරලා, "අපි සතුටු නැහැ" කියලා කිව්වාම මොනවා හෝ දෙනවා. අදටත් එහෙම නේ වෙන්නේ. අදටත් එක්සත් ජාතික පක්ෂයේ අර්බුදය විසඳා ගන්න හදන්නේ තනතුරු දීලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද විනාශ වෙලා, ඒක ඇතුළෙත් අද අර්බුද තිබෙනවා. තනතුරු දීලා අර්බුද විසඳා ගත්තාට ජනතාවගේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ කියන කාරණය ඉතා හොඳින්ම තමුන්නාන්සේලා අපිත් එක්ක එකඟ වෙන කාරණයක් වෙයි.

අගමැතිතුමාට විරුද්ධව ගෙනා විශ්වාස භංග යෝජනාව ගැන කිහිප දෙනෙක් කථා කළා. හැබැයි, මේ රටම දන්නවා, මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළේ කොහොමද කියලා. අගමැතිතුමා විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කිරීම සම්බන්ධයෙන් විවාදයක් නැහැ. ඒක ජයග්‍රහණය කළා. හැබැයි, ජයග්‍රහණය කරපු ආකාරය සම්බන්ධයෙන් මේ රටේ ප්‍රශ්නයක් තිබෙනවා. රජය නියෝජනය කරන මැති-ඇමතිවරුන්ට දොළ පිදේනි දීලා තමයි අගමැතිවරයා ඔහුට විරුද්ධව ආපු විශ්වාස භංග

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

යෝජනාව ජයග්‍රහණය කළේ. එතකොට ඒක රටේ ජයග්‍රහණයක්ද; ඒක මහ ඉහළින් කථා කරන්න පුළුවන් ජයග්‍රහණයක්ද? මේ රටේ සමස්ත ජනතාව කියනවා, "මේ ආණ්ඩුව දුර්වලයි. මේ ආණ්ඩුව දුර්වල හින්දා මේ ආණ්ඩුව වෙනස් වෙන්න ඕනෑ" කියලා. ගෙදර යන්න කියලා ආණ්ඩුවට පණිවුඩයක් දුන්නා. ජනතාව දුන්නු පණිවුඩයට පයින් ගහලා බලහත්කාරයෙන් රාජ්‍ය පාලනය කරනවා නම් ඊළඟ අවස්ථාවේ මීට වඩා දරුණු ආකාරයට ජනතාව මේ රජයට පහර දෙයි කියන කාරණාව අපි ඉතාම හොඳින් මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ කෘෂි කර්මාන්තයට වෙලා තිබෙන අවාසනාවන්ත සිද්ධිය ගැන බලන්න. මේ රටේ කෘෂි කර්මාන්තය කවදාවත් නැති ආකාරයට බරපතළ ආකාරයට කඩා වැටෙන යුගයක තමයි අද අපි ඉන්නේ. මේ රජය ඒ ගැන කල්පනා කරන්න ඕනෑ. ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ආර්ථිකය සම්බන්ධ අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරයා. කරුණාකරලා මේ රටේ ජනතාවට සහනාධාර දෙන්න. මේ සහනාධාර දීමේ ක්‍රමවේදය වෙනස් කරන්න. Pushbike එකක් ගෙදරක තිබුණත් සහනාධාරයක් දෙන්නේ නැහැ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපේ ප්‍රදේශවල කන්න පහක් මේ වන කොට වගා කරලා නැහැ. අවුරුදු දෙකහමාරක් තිස්සේ සත පහක ආදායමක් නැහැ. අනෙක් පැත්තෙන් නියඟය. තවම වර්ෂාව නිවැරැදි ආකාරයෙන් ලැබෙන්නේ නැහැ. රජය පොහොර සහනාධාරය අයින් කරලා තිබෙනවා. කෘෂි කර්මාන්තයට දීපු අනෙකුත් සහනාධාර අයින් කරලා තිබෙනවා. එවැනි අවස්ථාවක කොහොමද, රජය බලාපොරොත්තු වෙන්නේ ජනතාව ජීවත් වෙයි කියලා. ඒ හින්දා කරුණාකරලා දේශපාලන භේදයකින් තොරව මේ රටේ දුක් විඳින අහිංසක ජනතාවට සහනාධාර ලබා දීමේ ක්‍රමවේදයක් හදන්න. එහෙම නැත්නම් මිලියන 22ක් වුණු ජනගහනය මීට වඩා ශීඝ්‍රව ඉදිරි කාල සීමාව තුළදී අඩු වෙයි. කන්න බොන්න විධියක් නැහැ. රජයට ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න බැහැ. මොකද, රජය අභ්‍යන්තර අර්බුද කෙරෙහි තමයි අවධානය යොමු කරන්නේ. කොහොමද බලයේ රැඳිලා ඉන්නේ කියන කාරණාව සම්බන්ධයෙන් තමයි අවධානය යොමු කරන්නේ. ආර්ථික වශයෙන් ඉදිරි මාස කිහිපයේ තවත් දරුණු තැනකට අපේ රට තල්ලු වෙලා යනවා. වර්තමාන ආණ්ඩුව මේ රට ණය උහුලක හිර කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසිම දෙයක් නොකර ආණ්ඩුව මේ වන කොට රුපියල් බිලියන 3,300ක් ණය අරගෙන තිබෙනවා. එහෙම ණය අරගත්තු ආණ්ඩුව පසුගිය ආණ්ඩුවට ඇඟිල්ල දික් කරනවා. ඒ නිසා මේ රටේ ඇති නැති පරතරයකින් තොරව ඇති කෙනායි, නැති කෙනායි මේ සියලුදෙනාම අද මේ රටේ ඉන්නේ කනගාටුවෙන්ය කියන කරුණ ඉතාම වග කීමෙන් අපි කියනවා. හෙට - අනිද්දා වනකොට තත්ත්වය මීට වඩා තවත් දරුණු වෙයි. IMF එකෙන් හදා දෙන ඔය කියන මිල සූත්‍රය මේ රටේ මුදල් අමාත්‍යාංශය ක්‍රියාත්මක කළාම මීට වඩා දරුණු තැනකට රට තල්ලු වෙලා යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වනකොටම මම මේ කියපු කාරණාව සිදු වෙලා තිබෙනවා. ඒ අනුව, අද මධ්‍යම රාත්‍රී 12 සිට තෙල් මිල වැඩි වෙනවා. [බාධා කිරීමක්] ඔබතුමන්ලා ජනතාව විහිළුවකට ගන්න එපා. අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා හැම දාම කරන්නේ ජනතාව විහිළුවකට ගන්න එක. ඒ තුළින් පෙන්නුම් කරන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කඩා වැටීමයි. අද මධ්‍යම රාත්‍රියේ සිට ඇමතිවරු සුර සැප විඳිද්දී ජනතාවට තව දුරටත් පටි තද කර ගන්න සිදු වෙයි. ඒ දේවල් සිදුවෙන තැනට රට තල්ලු කළේ මේ වර්තමාන යහ පාලන ආණ්ඩුවයි කියන එක මේ රටම දැන් පිළිගෙන අවසන්. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 1.26]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නව සැසිවාරය ආරම්භ කරමින් අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය විවාදයට ගන්නා අද දිනයේ මටත් ඒ සඳහා සහභාගි වන්න අවස්ථාවක් දීම ගැන ප්‍රථමයෙන්ම මා ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම මගේ මිත්‍ර, උගත් ශෙහාන් සේමසිංහ අපේ තරුණ මන්ත්‍රීතුමාට මට කියන්න තිබෙන්නේ මේකයි. එතුමා අද කථා කළේ එතුමාට පසුගිය ආණ්ඩුවේ බොහෝ දේවල් අමතක වෙලා වාගේයි. එතුමා අද තෙල් මිල ගැන මහා හඬින් කථා කරන කොට විශේෂයෙන්ම අපට මතකයි, එදා තෙල් මිල අඩු කරන්න කියලා සාධාරණ ලෙස හලාවත උද්ඝෝෂණය කරපු ධීවරයන්ට ඒ ආණ්ඩුවෙන් උත්තර දුන්නේ කොහොමද කියලා. එදා ඒ ධීවරයන්ට එතුමන්ලා උණ්ඩයෙන් උත්තර දුන්නා. පසුව අධිකරණ නියෝගයක් දුන්නා, තෙල් මිල අඩු කරන්න කියලා. ඒවා ශත පහකට ගණන් ගත්තේ නැතිව තෙල් මිල වැඩි කළේ කොයි විධියටද කියලා ජනතාවට තවමත් මතක තිබෙනවා කියලා අපි තරයේ විශ්වාස කරනවා. ඒ හින්දා 2015 ජනවාරි 08 වැනි දා මේ නව ආණ්ඩුව බලයට ඇවිල්ලා තමයි මේ රටේ ජනතාවට දැනෙන පරිදි තෙල් මිල අඩු කරලා දුන්නේ. ඒක ජනතාව තවමත් භුක්ති විඳිනවා. යම් යම් අවස්ථාවල ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩිවනවා. ඒ වැඩිවීමත් සමඟම අපටත් තෙල් මිලේ යම් යම් සංශෝධන කරන්න සිද්ධ වෙයි. නමුත්, එදා මහින්ද රාජපක්ෂ දුන් තෙල් මිල නම් ආයේමත් දෙන්න අපි කිසිසේත්ම බලාපොරොත්තු වන්නේ නැහැ කියන එක අපි මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා මතක් කළා, ඇතැම් රටවල්වලට තානාපතිවරුන් යවා නැහැ කියා. නමුත් අපට මතකයි, එදා මහින්ද රාජපක්ෂ රජය තානාපතිවරුන්ට කොහොමද සැලකුවේ කියා. එදා සජිත් වාස් ඛ්‍රිතාන්‍ය මහ කොමසාරිස් ක්‍රිස් නෝනිස්ට ගැහුවේ කැරකිලා වැටෙන්නයි. ඒ වාගේ සලකපු සිද්ධි අද ඇති වෙන්නේ නැහැ. අද ජාත්‍යන්තරයේ ශ්‍රී ලංකාවට හොඳ නමක් තිබෙනවා. අපේ රට එදා කොන් වූ රටක්. අද අභිමානයෙන් ඕනෑම තැනකට ගිහින් "ශ්‍රී ලංකාව" කියන නම කියා ඕනෑම දෙයක් කරගන්න පුළුවන් වාතාවරණයක් අපට හදා දුන්නේ වත්මන් රජයෙන් බව මම මතක් කර දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් එදා පැවතුණාය කියා කියැවුණා. මම නම් දන්නේ නැහැ කොහෙන්ද එය ආවේ කියා. අපට රජය භාර දෙන කොට, 2014 වර්ෂයේ අන්තිම කාර්තුවේ මහින්ද රාජපක්ෂ රජය යටතේ ආර්ථික වර්ධන වේගය තිබුණේ සියයට 5කට අඩුවෙන්. එදා ණය අරගෙන තමන්ගේ ගජ මිතුරු ආර්ථිකය මේ රටේ ව්‍යාප්ත කරලා, තමන්ගේ දේශපාලන මිතුරන් පෙහොසතුන් බවට පත් කරලා අනෙක් ජනතාව දුප්පතුන් කරපු ආර්ථික ක්‍රමය අපි වෙනස් කළා. එදා අපනයනය කඩාගෙන වැටිලා අපට ණය ගෙවා ගන්න බැරිව තිබුණු ආර්ථිකය බොහොම අමාරුවෙන් කළමනාකරණය කරලා ඉස්සරහට ගෙන ගිහින් වාර්තාගත අපනයනයක් අපි අද වන කොට මේ රටේ ස්ථාපිත කර තිබෙනවා.

අපි පිළිගන්නවා, රජයක් හැටියට අප පොරොන්දු වූ සියලු දෙයම අපට කරන්න බැරිව ගියා කියා. ඔව්, අපේ ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා කියපු ආකාරයට අප පොරොන්දු වූ පරිදි, අප සිතූ පරිදි දුප්පත්කම තුරන් කරන්න අපට බැරිව ගියා. එහෙම වුණේ මොකද? 2015 ජනවාරි 08වන දා යහ පාලන සංකල්පය විශ්වාස කරන්නේ නැති පුද්ගලයන් මේ ආණ්ඩුව තුළට රිංගාගෙන තිබුණා. එදා අපට විරුද්ධව වැඩ කළ, ජනාධිපතිතුමා පරද්දන්න වැඩ කළ එස්.බී. දිසානායක හිටපු ඇමතිතුමා මේ ආණ්ඩුවට රිංගාගෙන සමෘද්ධි ඇමතිකම අරගෙන කරපු හානිය අද වන කොට මුළු රටම දන්නවා. සමෘද්ධි අමාත්‍යාංශය "ඡන්ද මැසිමක්" කියා තමයි එදා මේ රටේ හැඳින්වූයේ. දුප්පත්කම තුරන් කරනවාට වඩා දුප්පත්කම ඇති කරලා ඒ දුප්පත්, අහිංසක මිනිසුන් දේශපාලන වශයෙන් සිර කරලා, දේශපාලන වශයෙන් සිර කරපු ඒ ජනතාවගේ ඡන්ද ටික කොල්ල කා ගෙන මැතිවරණ දිනීමේ ක්‍රමයක් තමයි සමෘද්ධි අමාත්‍යාංශය හරහා එදා එස්.බී. දිසානායක හිටපු ඇමතිවරයා ක්‍රියාත්මක කළේ. එදා එස්.බී. දිසානායක මැතිතුමා ක්‍රියාත්මක කරපු ඒ වැඩසටහන්වලින් කීදෙනකු දුප්පත්කමින් එළියට ආවාද කියා සංඛ්‍යා ලේඛනවලින්ම පෙනේවි. අපට පහු ගිය දා හම්බ වුණු රජ මාළිගා ඉදි කළේ කුමන දේවලින්ද, කුමන ව්‍යාපෘතිවලින්ද, කුමන සම්පත්වලින්ද කියන කාරණා අද එළියට ඇවිත් තිබෙනවා. අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, සමෘද්ධි අමාත්‍යාංශය කියන්නේ මේ රටේ ජනතාව දුගී දුප්පත්භාවයෙන් එළියට ගෙන යන්න ඕනෑ අමාත්‍යාංශයක් බව. එයින් ජනතාව තවත් දුප්පත් කරලා, ජනතාවට සොච්චමක් දීලා, ජනතාව ඒ තුළ තියාගෙන ඒ මඟින් දේශපාලන ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරනවා නම් අප එයට තරයේ විරුද්ධයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමෘද්ධි බැංකුව ගැනත් කියන්න ඕනෑ. සමෘද්ධි බැංකුවට මේ රටේ අනෙක් මූල්‍ය නීති අනුව ක්‍රියා කරන්න බැරි ඇයි? සමෘද්ධි බැංකුව කියන්නේ වෙනම විශේෂිත ස්ථානයක්ද? මේ රටේ අනෙක් සියලුම බැංකුවලට එක නීතියකුත්, සමෘද්ධි බැංකුවට වෙනත් නීතියකුත් තිබෙන්න බැහැ. ඒ පිළිබඳව පරීක්ෂණයක් කරලා ඒ වරදකාරයන් සියලුදෙනාට දඬුවම් කරන්න අපි ඉදිරියේදී ක්‍රියා කරනවා. විශේෂයෙන්ම අපි මතක් කරනවා, මේ අවුරුද්දේදී වෙන් කරපු මුදලට වඩා විශාල මුදලක් එතුමා ඒ පැත්තට පනින්න ඉස්සර වෙලා -දැන් වන කොට- සමෘද්ධි වැඩසටහන තුළින් වියදම් කර ගිහිල්ලායි තිබෙන්නේ කියා. අපි දන්නවා යම් යම් අරමුණු, අගමැති සිහින තියාගෙන මේ පැත්තේ ඉඳගෙන වැඩ කරලා, ඒවා හරි යන්නේ නැතිව ගියාම මේ පැත්තේ ඉන්න බැරි වන කොට පැනපු බව.

නමුත් අපි මතක් කරලා දෙනවා, අපි විපක්ෂයේ ඉන්නකොට සියලුම බලවේග එකතු කරගෙන, ඉතාම අමාරුවෙන්, අභියෝග සහිතව 2015 ජනවාරි 08වන දා මේ "යහපාලනය" කියන සංකල්පය ජයග්‍රහණය කරවීමට කටයුතු කළාය කියන කාරණය. සමහර අය ඒ සටනේ හිටියේ නැහැ. ඒ සටන දියත් කරනකොට සමහර අය හිටියේ අනෙක් පැත්තේ. නමුත් එදා ලැබූ ජයග්‍රහණයෙන් පසුව ඇමතිකම්, වරප්‍රසාද ගන්න මේ පැත්තට පැනලා, ඒක හරි යන්නේ නැති වෙනකොට ආයෙමත් අනෙක් පැත්තට ගියා. [බාධා කිරීමක්] තව ඉන්නවා? තව ඉන්නවා නම් ඒ අයට මම කියනවා, කරුණාකරලා යන්න කියලා. එච්චර තමයි මට කියන්න තිබෙන්නේ. තමන්ගේ හිතේ ඒ සංකල්ප නැත්නම්, ඒ ප්‍රතිපත්තිවලට එකඟ නැත්නම්, හුදෙක් කල් මරමින් ඉන්නවා නම්, තවත් ජනාධිපතිවරණයක් -ඡන්දයක්- ළං වෙනකල් ඉන්නවා නම්, එහෙම ඉන්නේ නැතුව කරුණාකරලා යන්න කියලා මම කියනවා. අපි මුහුණට මුහුණ සටන් කරමු. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් අපේ ප්‍රතිපත්ති වෙනස්. අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස ස්ථාපිත කරලා තිබෙනවා. එදා ඒකාධිපතිවාදයෙන් මේ රටේ සමාජය හිර කරගෙන, මිරිකාගෙන, ජනතාවට අදහසක්වත් ප්‍රකාශ කරන්න බැරුව හිටපු වෙලාවක තමයි අපි අලුත් පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කරලා, ඒ නිදහස ලබා දුන්නේ. ඒ කටයුත්තේදී අපි සාර්ථක වුණා. කාටවත් ඒකට "නැහැ" කියන්න බැහැ. ජාතීන් වශයෙන්, ආගම් වශයෙන් අපේ සමාජය බෙදීමකට ලක් කරලා, අපේ සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන්න විනාශකාරී දේවල් පතුරවමින් තිබුණු යුගයක තමයි අපි එදා ඒ සටන දියත් කළේ. ඒ නිසා අපි අපේ රටේ ආදරණීය ජනතාවට කියනවා, අපි අපේ සටනට හේතු වුණු ප්‍රධාන කරුණු ජයග්‍රහණය කළ බව. අපට තව බොහෝ කරුණු ඉදිරියට ගෙන යන්න තිබෙනවා. ඒ නිසා අපි ශක්තිමත් ලෙස අලුත් මාවතක ගමන් කරන්න ඕනෑ.

ආර්ථික වශයෙන් ගත්තාම අපට විශාල ණය බරකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ණය හරියාකාරව කළමනාකරණය කරලා, විශේෂයෙන්ම අපේ දුගී දුප්පත් ජනතාව මත ඒ බර පැටවෙන්නේ නැති විධියට තවදුරටත් වැඩසටහන් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන යෝජනාව මා මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම දුගී දුප්පත්භාවයෙන් පෙළෙන අපේ ජනතාව මුදා ගැනීම සඳහා අපි සමෘද්ධි වැඩසටහන වාගේ වැඩසටහන් අලුත් මුහුණුවරකින් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ වාගේම යටිතල පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍යය, ඒ වාගේම රැකී රක්ෂා වැනි ජනතාව අපේක්ෂා කරන ක්ෂේත්‍ර සංවර්ධනය කළ යුතුයි. රටේ ණය බර වැඩි කරන්නේ නැතුව, ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියා කළ යුතුයි.

අද ගෝලීය ආර්ථිකයක් තිබෙනවා. කුඩා රටක් හැටියට අපි ඒ ගෝලීය ආර්ථිකය සමඟ බද්ධ වෙන්න ඕනෑය කියන අදහසේ අප සියලුදෙනාම ඉන්නවා. නමුත් පුංචි රටක් හැටියට, ඉතාම අඩු ජනගහනයක් තිබෙන රටක් හැටියට අපි ඉතාම පරීක්ෂාකාරීව ගෝලීය ආර්ථිකයට බද්ධ විය යුතුයි. අපේ ආර්ථිකය විනාශ නොකර අපේ ආර්ථිකය කාර්යක්ෂම කරලා, ඒ කාර්යක්ෂමභාවය තුළින් තරගකාරිත්වය ඇති කරලා, ගෝලීය ආර්ථිකය තුළ අනෙක් රටවල් එක්ක තරග කරලා, ඉස්සරහට ගියොත්, අපට මේ රටට විශාල සම්පත් ප්‍රමාණයක් ගෙනෙන්න පුළුවන් වෙනවා. අපේ අපනයන තුළින්, ඒ වාගේම සේවා ආර්ථිකය තුළින්, නැත්නම් සංචාරක කර්මාන්තය තුළින් විශාල සම්පත් ප්‍රමාණයක් මේ රටට එනකොට, අපේ ජනතාව අපේක්ෂා කරන අන්දමට ඒ ආදායම අපේ ජනතාව අතර සාධාරණ ලෙස බෙදී යාමේ ක්‍රමයක් තිබෙන්න ඕනෑ. එතැන තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා වරද්දා ගත්තේ. එතුමාගේ වටේ උන්නු කිහිප දෙනෙකුට විතරයි මේ රටේ ආර්ථිකයෙන් ප්‍රයෝජන ගන්න පුළුවන් වුණේ. සංඛ්‍යා ලේඛන බැලුවොත් ඒ බව පෙනෙයි. එතුමාගේ වටේ හිටපු කිහිප දෙනෙකුට විතරයි මේ රටේ ආර්ථිකයෙන් පොහොසතුන් බවට පත් වෙලා කෝටි-ප්‍රකෝටිපතියන් බවට පත් වෙන්න පුළුවන් වුණේ. නමුත් මේ රටේ සමාජ සාධාරණයක් තිබෙන්න ඕනෑ. නිලධාරීන්ට,

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

දේශපාලනඥයින්ට යට වෙන්නේ නැතුව මේ රටේ ජනතාවට තමන්ගේ හැකියාවෙන්, තමන්ගේ උනන්දුවෙන්, තමන්ගේ මහන්සියෙන් මේ ආර්ථික ක්‍රමය තුළ ඉස්සරහට යන්න පුළුවන් තත්ත්වයක් අපි නිර්මාණය කරන්න ඕනෑ.

තවම ඒ තත්ත්වය නිර්මාණය වෙලා නැහැ. පසුගිය දිනවල නිලධාරීන් අල්ලස් ගන්න යන කොට අහු වුණා. ඒ වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක වුණා. මහ බැංකු සිද්ධියේදී නීතිය ක්‍රියාත්මක වුණා. නමුත්, පසුගිය මහින්ද රාජපක්ෂ රජය කාලයේ නීතිය එහෙම ක්‍රියාත්මක වුණාද කියලා අපි ජනතාවගෙන් ඉතාම ඕනෑකමින් අහනවා. ඒක තමයි මේ රජය සහ පසුගිය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය අතර තිබෙන වෙනස. අපි මේ රටට අලුත් මාර්ගයක් පෙන්වා දුන්නා.

විශේෂයෙන්ම, ක්‍රියාත්මක කිරීමේදී ඒවායේ අඩු පාඩු ඇති. නමුත්, අපි ඒ අඩු පාඩු හදාගෙන මේ මාර්ගයේ ඉදිරියට යන්න ඕනෑ. මේ මාර්ගයෙන් වෙනස් වෙලා නැවත ඒකාධිපතිවාදයකට අපි යනවා නම්, නැවත ගජමිතුරු ආර්ථිකයට යනවා නම්, නැවත අපේ දුප්පත් ජනතාව සමෘද්ධිය වැනි දේවල්වල හිර කර ගෙන, දේශපාලන හිරකරුවන් කරගෙන ඒ අයගේ ඡන්දය අරගෙන ඉස්සරහට යන රටක් අපට නැවත නිර්මාණය කරන්න බැහැ. නැවතත් ආගම්වාදී, ජාතිවාදී ගැටුම් ඇවිළිලා අපේ ගම් බිම් විනාශ වෙන, ලෝකයෙන් කොන් වන රටක් හැටියට අපට නැවතත් පිටුපසට යන්න බැහැ. ඒ නිසා මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා විපක්ෂයේ සියලු බලවේග එකතු විය යුතු බව අප මතක් කර දෙනවා. සමහර වෙලාවට යම් යම් ආර්ථික කාරණා, එහෙම නැත්නම් සමාජයීය කාරණා වශයෙන් අප අතර වෙනස්කම් තිබෙන්න පුළුවන්. සමහර වෙලාවට අපි එකම මූල ධර්මයක් අනුගමනය කළාට ඒවා ක්‍රියාත්මක කිරීමේදී වෙනස්කම් පෙනෙන්න පුළුවන්. නමුත්, අපි ඒ ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳාගෙන යෑම ඉතාම වැදගත්. මොකද, එහෙම නැති වුණොත්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම නැති වුණොත්, මේ රටේ ඒකාධිපතිවාදයක් නැවත එන එක වළක්වන්න බැහැ. මේ සංකල්පය අසාර්ථක කරගෙන, "ඒකාධිපතියෙකුත් කමක් නැහැ" කියන තත්ත්වයට අපි ජනතාව තල්ලු කරන්න හොඳ නැහැ. ඒ කරුණ විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, සියලු පක්ෂ නායකයන්ටත් මතක් කර දෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක්, මූලාසනය සඳහා ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

[අ.භා. 1.41]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ සැසි වාරය අවසන් කොට නව සැසි වාරය ආරම්භ කරමින් ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද කථාව -ප්‍රකාශය- පිළිබඳ විවාදය පැවැත්වෙන මේ වේලාවේ, ඒ පිළිබඳව අපගේ පාර්ශ්වයෙන් යම් කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම මට පෙර කථා කළ ගරු රාජ්‍ය අමාත්‍යතුමා තහනම් වචනය පාවිච්චි නොකොට ඉතා හොඳින් කථාව කරන්න දක්ෂ වුණාය කියන එක තමයි මට තේරෙන්නේ. එතුමා කිසිම තැනක ජනාධිපතිතුමාගේ ප්‍රකාශය පිළිබඳව හෝ "ප්‍රකාශය" කියන වචනය සඳහන් නොකොට, ඉතාම ප්‍රවේශමින් කථා කරන්න දක්ෂ වුණු බවක් තමයි පෙන්නුම් කළේ. ඒකම තමයි මේ ආණ්ඩුව මුහුණ දී තිබෙන අර්බුදයේ ප්‍රධානම ගති ලක්ෂණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි මාසයේ 08වැනි දා -ඒ මොහොතේදී- කිරීමට තිබුණු අපහසුම කාර්යය තමයි, ඒ පැවැති පාලනය බිඳ වැටීම. ඔවුන් සතුව අසීමිත ධනස්කන්ධයක් තිබුණා, අසීමිත මාධ්‍ය බලයක් තිබුණා, අසීමිත මැර කණ්ඩායම් සිටියා, තමන්ට අවශ්‍ය විධියට පොලීසිය, හමුදාව මැතිවරණ ව්‍යාපාරවලට යොදවමින් තිබුණා. ඒ විධියට මහා බියජනක දේශපාලන වාතාවරණයක් මතු වී තිබුණා. හැබැයි, ජනවාරි මාසයේ 08 වැනිදා දේශපාලනික වශයෙන් විනාශකාරී සහ මහා බලයක් සහිත ඒ බල කඳවුර මේ රටේ පුරවැසියන් ඉදිරියට ඇවිල්ලා බිඳ වැටිවුවා. එහෙම බිඳ වැටිවුවාට පසුව රට ඉදිරියට ගෙන යෑමේ සුක්කානම රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා අතටත්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා අතටත් පැවරුණා. හැබැයි, ඒ අභිශය අධිපතිවාදී දේශපාලනය පරාජයට පත් කළත් මේ රට යළි ගොඩ නහන්නට තමුන්නාන්සේලා අසමත් වී තිබෙනවා.

මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ප්‍රකාශනය අනුව පසුගිය අවුරුදු තුනේම ඉතිහාසය සම්පිණ්ඩනය කරලා ගත්තොත් ඉතා හොඳින් පෙන්නුම් කරලා තිබෙන්නේ, ඒ අවුරුදු තුන ඉතාම නිස්කාරණ ලෙස ගත වූ අවුරුදු තුනක් ලෙසයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අවස්ථාවල නිස්කාරණ ලෙස ගත වුණත් ඒ තිබෙන තත්ත්වය ඒ ආකාරයෙන්ම රැකෙනවා. හැබැයි, මේ නිස්කාරණ කාලය ගත වෙමින් තිබෙන්නේ තිබුණු තත්ත්වයත් තව තවත් අර්බුදයට පත් කරමින්. ඒ නිසා, පසුගිය අවුරුදු තුනක කාල පරිච්ඡේදය දෙස ඉතා හොඳින් බැලුවොත්, ජනතාවට දෙන ලද එකඟතා මුළුමනින්ම බිඳ වටිටන ලද, ඉතාම වේගයෙන් ජනතාවගේ අප්‍රසාදයට ලක් වූ ඉතා අසාර්ථකම පාලනය "මෛත්‍රී-රනිල් හවුල් පාලනය" බව පෙනෙනවා. මෑත ඉතිහාසයේ ලංකාවේ ගොඩනැඟුණු ආණ්ඩුවක් ඉතා කෙටි කාලයක් ඇතුළත මෙවැනි අප්‍රසාදයකට, ජනතාවගේ දෝෂාරෝපණයට ලක් වූ අවස්ථාවක් තිබුණේ නැහැ. ඒක මතක තබා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යවරයාත්, ජනාධිපතිවරයාත් සැබැවින්ම මේ රටේ ජනතාව එතුමන්ලාට ලබා දී තිබූ වගකීම මුළුමනින්ම අමතක කොට එතුමන්ලාගේ බල සුදුවකට අවතීර්ණ වුණා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ කථාවේදීත් කියනවා, 'අභ්‍යන්තර බල තරගයක් තිබුණා' ය කියලා. මේ බල තරගයට මොකක් වේවිද? අග්‍රාමාත්‍යවරයා හෝ ජනාධිපතිවරයා අතර, ජනාධිපතිවරයාගේ කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් සහ අග්‍රාමාත්‍යවරයාගේ කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් අතර බල ගැටුමක් තිබුණා. අද මෙතැන ප්‍රකාශ වුණා එස්.බී. දිසානායක මැතිතුමා සමෘද්ධි අමාත්‍යාංශය මෙහෙයවපු ආකාරය පිළිබඳව. හැබැයි, ඒක අද කියන්නේ එතුමා ආණ්ඩුවෙන් එළියට ආපු නිසා. නැත්නම් ඒක කියන්නේ නැහැ. ආණ්ඩුව ඇතුළේ තව ඕනෑ තරම් එවැනි අය ඉන්නවා. ඒත් කියන්නේ නැහැ. තමුන්නාන්සේලා කවදා හරි ඒ අය ගැන කට අරියි, ඒ ගොල්ලන් ආණ්ඩුවෙන් එළියට ආවාම. ඒක තමයි ඇත්ත කථාව.

තමුන්නාන්සේලා මේ අවුරුදු තුනම ගත කළේ, එකිනෙකා පරයා යන බල තරගයක් තුළයි. ඒ බල තරගයේ කිසි තැනෙක තිබුණේ නැහැ, ජන ජීවිතය ගොඩනැංවීමත්, ආර්ථිකය ඉදිරියට ගෙන යෑමත්, ජාතික සමඟිය ගොඩනැඟීමේ අරමුණුත්. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් තහවුරු කිරීමේ දිසාවට නොවෙයි තමුන්නාන්සේලාගේ බල තරගය තිබුණේ. තමුල්නාන්සේලාගේ බල තරගයේ මුඛ්‍ය පරමාර්ථය බවට පත් වී තිබුණේ එක් අයෙකු යට කොට තව අයෙකු වෙත බලය අත්පත් කර ගැනීම සඳහා දරන ප්‍රයත්නයයි. මේ අවුරුදු තුනේ කාල පරිච්ඡේදය ගත වුණේ ඒ ආකාරයෙන්මයි. හැබැයි, ඒ අවුරුදු තුන අවසන් වන විටදී සිදු වුණේ මොකක්ද? ඒ අවුරුදු තුන අවසන් වන විට බල තරගයේ යෙදුණු කඳවුරු දෙකම ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙලා, ඒ ඒ කඳවුරු ඇතුළේම අර්බුද නිර්මාණය වෙලා තිබෙනවා. මෑත කාලයේ එක්සත් ජාතික පක්ෂ අග්‍රාමාත්‍යවරයාත්, එතුමාගේ පක්ෂයත්, එතුමාගේ පක්ෂයේ කණ්ඩායමත් ආණ්ඩුවේ මන්ත්‍රීවරු කණ්ඩායමත් හැසිරෙන්නේ කුමක් වෙනුවෙන්ද? මේ මන්ත්‍රීවරු ගිහිල්ලා තමන්ගේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න විසඳනවාද? අමාත්‍යවරු ගිහිල්ලා අමාත්‍යාංශවල කටයුතු මෙහෙයවනවාද? නෑ.

අදත් තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය ඇතුළේ තමන්ගේ බලය තහවුරු කර ගැනීම වෙනුවෙන් දරන ප්‍රයත්නයක්. අමාත්‍ය ධුරයක් නැති මන්ත්‍රීවරයා නියෝජ්‍ය අමාත්‍ය ධුරයක් ලබා ගන්න, නියෝජ්‍ය අමාත්‍ය ධුරයක් ඇති කෙනා රාජ්‍ය අමාත්‍ය ධුරයක් ලබා ගන්න, රාජ්‍ය අමාත්‍ය ධුරයක් ඇති කෙනා අමාත්‍ය ධුරයක් ලබා ගන්න, උපනායකයා නියෝජ්‍ය නායකකම ලබා ගන්න, නියෝජ්‍ය නායකයා තනි නියෝජ්‍ය නායකකමක් තියා ගන්න, කොහේවත් නැති තනතුරු හදන්න තමයි තරග කරන්නේ. ඒවා ජනතාවගේ ප්‍රශ්නද? තමුන්නාන්සේලා මේ මුළු කාලයම වැය කරමින් තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය ඇතුළේ අර්බුද විසඳා ගැනීම වෙනුවෙන්. සමුළු පවත්වනවාද, සාකච්ඡා පවත්වනවාද, විවිධ ගනුදෙනු සිද්ධ වෙනවාද, අමාත්‍ය ධුර වෙනස් කරනවාද, නැවත අලුතෙන් අමාත්‍ය ධුර හදනවාද කියන ඒවා තමයි තමුන්නාන්සේලාට තිබෙන ප්‍රශ්න. නමුත් මේ එකක්වත් මේ රටේ ජනතාවගේ වුවමනාව පිළිබඳව හෝ ජනතාවගේ අවශ්‍යතා කේන්ද්‍ර කරගෙන ගොඩනැඟෙන සාකච්ඡා නොවෙයි. මේවා තමුන්නාන්සේලාගේ පක්ෂය තුළ තිබෙන අර්බුද. මේ බල තරගය විසින් කිසිවෙකුට ජයග්‍රහණ ගෙනැත් දුන්නේ නැහැ. එක පැත්තකින් එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසයේ ඇති වී තිබෙන දැවැන්තම අර්බුදයක් අද නිර්මාණය වී තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි ඒවා දැකලා තිබෙනවා. ඉස්සර ප්‍රේමදාස මහත්තයාට එරෙහිව කැරලි ගැහුවේ ලලිත්-ගාමිණී. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට එරෙහිව කැරලි ගැහුවේ මෛත්‍රීපාල සේනානායක සහ අනුර බණ්ඩාරනායක. නමුත් මේ රනිල් වික්‍රමසිංහ මහත්තයාට එරෙහිව කැරලි ගහන්නේ කවුද? කවුද ඒ? මම ඒ අයගේ නම් කියන්නේ නැහැ එතුමන්ලාත් මන්ත්‍රීතුමන්ලා නිසා. එයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි, තමුන්නාන්සේලාගේ පක්ෂය අතිශය දැවැන්ත අර්බුදයකට ලක් වෙලා තිබෙනවාය කියන එකයි. ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට ආණ්ඩු බලයක් හොබවන පක්ෂයක් තුළ අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පක්ෂවල අර්බුද මතු වෙලා තිබෙනවා. හැම වෙලාවකම ඒ අර්බුද මතු වෙන්නේ විපක්ෂයේ ඉන්න වෙලාවක.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ සිටියදී අර්බුද ගණනාවක් මතු වුණා. එතුමිය විපක්ෂයේ ඉන්න වෙලාවේ දී. එක්සත් ජාතික පක්ෂය පසුගිය කාලයේ විපක්ෂයේ ඉන්න වෙලාවේ අර්බුද ගණනාවක් මතු වුණා. හැබැයි, පළමුවැනි වතාවට ආණ්ඩුවක් ඇතුළේ පක්ෂයක් මෙහෙයවා ගන්න බැරි තරමට අර්බුද මතු වුණේ මොකද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගෙන් මේ පාලනය හොබවන කණ්ඩායම මොන තරම් දුරට ප්‍රතික්ෂේප වේවිද කියන කරුණ තමයි මේ අර්බුදයේ පතුලේ තිබෙන්නේ. ජනතාව එකඟ නම්, ජනතාවගේ කැමැත්ත තිබෙනවා නම්, ජනතාවගෙන් බහුතර ප්‍රමාණයක් තමුන්නාන්සේලාව අනුමත කරනවා නම් මේ ගැටුම් කිසිවක් පැන නඟින්නේ නැහැ. මේ ගැටුම්වලින් පෙන්නුම් කරන්නේ තමුන්නාන්සේලා අර්බුදයකට ලක්වී තිබෙන බවයි. තමුන්නාන්සේලාගේ පාර්ශ්වය විතරක් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ පාර්ශ්වයත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා තමන්ගේ කථාවේදී මේ පාර්ලිමේන්තු සැසි වාරය අවසන් කිරීමට තුඩු දුන් හේතුව මේ පාර්ලිමේන්තුවට කියයි කියලා මම විශේෂයෙන්ම බලාපොරොත්තු වුණා. එතුමා කියන්නේ නැත්නම්, අඩුම තරමින් දැන් මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂය පැත්තේ වාඩිවෙලා සිටින එක්කෙනා හෝ දෙදෙනාගෙන් කවුරු හෝ මේ පාර්ලිමේන්තුවට කියන්න, අප්‍රේල් මාසයේ 19 වැනිදා කැඳවන්න තිබුණු පාර්ලිමේන්තු රැස්වීම නතර කොට, සැසි වාරයත් අවසන් කොට, නව සැසි වාරයක් ආරම්භ කිරීමට හේතුව කුමක්ද කියලා. රටේ ජනතාව මේ කාරණය පිළිබඳව දැනගන්න ඕනෑ. මේ නිසා පාර්ලිමේන්තුවේ විශාල වැඩ කටයුතු ප්‍රමාණයක් අඩ පණ වී තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අක්‍රීය වී තිබෙනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව අක්‍රීය වී තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න අලුතින් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. පෙත්සම් යළි ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. බොහෝ කමිටු යළි ස්ථාපිත කළ යුතුව තිබෙනවා. පාර්ලිමේන්තුවේ දියත් වෙමින් තිබූ ක්‍රියාදාමය අඩ පණකොට පාර්ලිමේන්තු සැසි වාරය කල් දැමීමට හේතු වූ අරමුණ කුමක්ද කියලා ජනාධිපතිවරයා විසින් මේ සැසි වාරය අමතන අවස්ථාවේ පාර්ලිමේන්තුවට කිව යුතුව තිබුණා. නමුත් එතුමා කිව්වේ නැහැ.

[ගරු අනුර දිසානායක මහතා]

ඒ අන් කවරක්වත් නිසා නොවෙයි, තමන්ගේ පක්ෂය ඇතුළේ ඇති වී තිබෙන අර්බුදය නිසයි. මේ අර්බුදය තමයි එයට හේතු සාධක වුණේ. තමන් ලංකාවේ නැති වෙලාවක විශ්වාස භංග යෝජනාවට සහාය දුන් මන්ත්‍රී කණ්ඩායම කුමන තීරණයක් ගනීවිද කියන කාරණය මත තමයි මේ පාර්ලිමේන්තු සැසිවාරය කල් දැමුවේ.

මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මේ අවුරුදු තුනක බල තරගය තුළින් තමන්ගේ පක්ෂයේ බලයත්, එම පක්ෂය තුළ ජනතාවගේ ප්‍රසාදයත් දිනා ගැනීම සඳහා කරන ලද ව්‍යායාමයම අසාර්ථක වී තිබෙනවා. එම ව්‍යායාමය අසාර්ථක වීම නිසා තමයි එතුමා කථා කරන්න මොහොතකට පෙර ආණ්ඩු පක්ෂයේ සිටි 16 දෙනෙකු විපක්ෂය පැත්තට ඇවිල්ලා වාඩි වීම තුළින් පෙන්නුම් කළේ. තමුන්නාන්සේලාගේ කණ්ඩායම් දෙක මේ අවුරුදු තුන ඇතුළේ බල තරගයක යෙදීමේ ප්‍රතිඵලය නිසා දෙපැත්තම අතිශය විනාශකාරී දේශපාලන ඉරණමකට අද වනකොට මුහුණ දීලා තිබෙනවා.

තව දුරටත් ජාතික ආණ්ඩුවක් තියේවි කියලා මම හිතන්නේ නැහැ. ඒ කියන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයත්, එක්සත් ජාතික පක්ෂයත් එකතු වී ජාතික ආණ්ඩුවක් හදනවා ලු. ඒ අනුව තමයි අමාත්‍ය ධුර සංඛ්‍යාව වැඩි කොටගෙන තිබෙන්නේ. හැබැයි, එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 95ක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. දැන් ඔය පැත්තේ වාඩිවෙලා ඉන්නේ කී දෙනාද? එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 95ක් ඉන්නවා. නමුත් වාඩිවෙලා ඉන්නේ 23ක් හෝ 24ක්. ඒකත් හරියට හොයන්න බැහැ. සමහර අය තවම මැද. මොකද, මෑත කාලයේ දී මේ ඔක්කොම ඇවිල්ලා මේ ගරු සභාවේ වාඩිවෙලා ඉන්නවා අපි දැකලාත් නැහැ. ඒ නිසා මැද ඉන්නේ කවුද, කොනේ ඉන්නේ කවුද කියලා කියන්න අපි දන්නෙත් නැහැ. අවම වශයෙන් 23 දෙනෙකු විතර ඇති. 95න් 23 දෙනෙකු තියාගෙන තමුන්නාන්සේලා ජාතික ආණ්ඩුවක් තිබෙනවාය කියලා කියන්නේ කොහොමද? 95න් 23යි ඉන්නේ. 70ක් මේ පැත්තේ වාඩි වී සිටිනවා. දෙදෙනකු මැද ඉන්නවා. එතුමන්ලා කොයි වෙලාවේ, කොයි පැත්තේ වාඩි වේවිද දන්නේ නැහැ. දැන් තමුන්නාන්සේලා කියනවාද, මේක ජාතික ආණ්ඩුවක් කියලා? එක් පක්ෂයක 95න්, 23 දෙනෙකු හදා ගෙන ජාතික ආණ්ඩුවක් හදන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයෙන් 17 දෙනෙකු ගියා අපිට මතකයි. එක්සත් ජාතික පක්ෂයට ඒ වෙලාවේ හිටියේ 62යි. පසුව ඒ ප්‍රමාණය තවත් අඩු වුණා. 62න් 17 දෙනෙකු ගියාමත් ජාතික ආණ්ඩුවක් කියලා කියන්න තිබුණා නේ. 95න් 23 දෙනෙකු ඉන්න කොට ජාතික ආණ්ඩුවක් කියලා කියනවා නම්, 62න් 17ක් ගියපුවාම ජාතික ආණ්ඩුවක් කියලා නොකිව්වේ ඇයි? ඒ නිසා මේක ජාතික ආණ්ඩුවක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය හා පාර්ලිමේන්තුවේ යම් කණ්ඩායමක් එකතු වෙච්ච ආණ්ඩුවක්. ඒ නිසා ජාතික ආණ්ඩුව කියන සංකල්පයත් මේ අවුරුදු තුන වනකොට දැන් අවසන් වී තිබෙනවා. ඒ අනුව දේශපාලන අර්බුද ගණනාවක් මේ අවුරුදු තුන ඇතුළත නිර්මාණය කළා. දේශපාලන අර්බුදය විතරක් නොවෙයි මීට බලපාලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම 1977 අපේ රටට ඇතුළු කරන ලද මේ වැරැදි, කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්තිය අවුරුදු ගණනාවක් -අවුරුදු 40කට ආසන්න කාලයක්- දැන් ඇදගෙන ඇවිල්ලා තිබෙනවා. මේ අවුරුදු ගණනාව ඇතුළේ මෙහි තිබෙන අසාර්ථක භාවය ඉතා හොඳින් පෙන්නුම් කරන පාලනය බවට තමුන්නාන්සේලාගේ පාලනය පත් වී තිබෙනවා. ඒ නිසා රුපියලේ අගය කඩා වැටීම අද පාලනය කර ගන්න බැරි තත්ත්වයකට පත් වී තිබෙනවා. ජනතාවගේ සාමාන්‍ය ජීවිතය ගත කිරීමට සරිලන ආහාර වේලක් මිලදී ගැනීම සඳහා තිබෙන හැකියාව අඩු වෙමින් තිබෙනවා. විශාල ප්‍රමාණයකින් විරැකියාවක් නිර්මාණය වී තිබෙනවා. නිෂ්පාදන කඩා වැටෙමින් තිබෙනවා. ආනයන මත මුළු ආර්ථියක්ම රඳා පැවතෙමින් තිබෙනවා. අපනයන ඇකිළෙමින් තිබෙනවා. ආර්ථිකයේ ඉහළ ගත්තත්, ආර්ථිකය ජනතාවගේ ජීවිතයත් එක්ක සම්බන්ධ කරුණු ගත්තත් විශාල අර්බුදයක් නිර්මාණය කරමින් තිබෙනවා. තමුන්නාන්සේලා මේ අවුරුදු තුන තුළ ඒ අර්බුදයේ ශීඝ්‍රතාව වැඩි කළා හැරුණු කොට එය සමනය කිරීමට අසමත් වුණා.

මේ පාර්ලිමේන්තුවට තමුන්නාන්සේලා අය වැය ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා; ආර්ථික ප්‍රකාශන ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, අය වැය ලේඛන සහ ආර්ථික ප්‍රකාශන මේ අවුරුදු තුන වනකොට හිස්, බොල් ලියවිලි බවට පත් කරලා අවසානයි. ආර්ථික ක්ෂේත්‍රය තුළින් මේ රජය අත් පත් කර ගත් ජයග්‍රහණ සහ ආර්ථික ක්ෂේත්‍රයේ ගත යුතු අභියෝගයන් පිළිබඳව මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට කිසිම දැක්මක් නැහැ. එතුමා ආර්ථිකය පිළිබඳව මොනවාද කථා කළේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, වංචාව, දූෂණය, නාස්තිය පිළිබඳව කථා කරනවා නම්, මේක බැරෑරුම්ව කල්පනා කළ යුතු ප්‍රශ්නයක්. මේ රජය බලයට පත් වී අවුරුදු තුනක් ගත වුණාට පසුව ඉක්මනින් නඩු අහන්න අවශ්‍ය පනත් කෙටුම්පතක් ඊයේ දිනයේ දී සම්මත කර ගත්තා. බලයට පත් වෙලා අවුරුදු තුනක් ගත වුණාට පසුව තමයි නඩු ඉක්මන් කරන්න ඕනෑ කියලා කියන්නේ. අපි කියන්නේ අධිකරණයේ තිබෙන නඩු ගැන නොවෙයි. කොපමණ වංචනිකයන්, දූෂිතයන් ප්‍රමාණයක් අධිකරණයකටවත් ඉදිරිපත් නොකර තමුන්නාන්සේලා ආරක්ෂා කළාද? අදත් තමුන්නාන්සේලාගේ රැකවරණය යටතේ කොපමණ වංචනිකයන්, දූෂිතයන් ප්‍රමාණයක් සිටිනවාද? සමහර අය ව්‍යාපාරවල යෙදෙනවා; ආණ්ඩුවේ ගනුදෙනුවල යෙදෙනවා; ආණ්ඩුවේ නිලධාරීන් හැටියට කටයුතු කරනවා; ආණ්ඩුවේ වග කිව යුතු ස්ථානවල තනතුරු හොබවනවා. ඒ නිසා තමුන්නාන්සේලා වංචාව, දූෂණය පිළිබඳව සාධනීය කිසිදු පියවරක් ගන්න අසමත් වුණු රාජ්‍යයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වංචාව, දූෂණය පැතිරිලා තිබෙන ආකාරය අපි තේරුම් ගත යුතුයි. දැන් එක පැත්තකින් ඇමතිවරුන්ට චෝදනා එල්ල වෙනවා. තව පැත්තකින් අගමැතිවරයාට චෝදනා එල්ල වෙනවා. තවත් පැත්තකින් ජනාධිපතිවරයාටත් චෝදනා එල්ල වෙනවා. ඒ විතරක් නොවෙයි, රජයේ ඉහළම තනතුරු දරන උදවිය සිටිනවා. පරිපාලන සේවයේ ඉහළම නිලධාරියා තමයි ජනාධිපති ලේකම්වරයා. හැබැයි, ජනාධිපති ලේකම්වරයාත් අධිකරණයේ වැරැදිකරු බවට පත් වී සිර දඬුවම් ලබන්නට නියම වුණා. පසුව අභියාචනයක් ඉදිරිපත් කරලා දැන් එළියේ සිටින එක වෙනම දෙයක්. නමුත් අධිකරණයෙන් නිශ්චිත වශයෙන් මොහු වරදකරුවෙක් කරලා රිමාන්ඩ් ගත කළා. ඊළඟට, ජනාධිපතිවරුන්ගේ කාර්ය මණ්ඩල ප්‍රධානි කියන්නේ කවුද? පී. දිසානායක කියන්නේ හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ කාර්ය මණ්ඩල ප්‍රධානි. ගාමිණී සෙනරත් අද ඇප පිට ඉන්නවා. ඔහු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානි. මහානාම කියන්නේ වර්තමාන ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානි. ජනාධිපතිවරුන්ගේ කාර්ය මණ්ඩල ප්‍රධානීන්ලා මේ වංචාවේ, දූෂණයේ කෙළ පැමිණි කණ්ඩායමක් බවට පත් වී තිබෙනවා. ඒ නිසා වංචාව, දූෂණය තිබෙන්නේ රජ ගෙදර ඇතුළේ බව අපට පෙනී යනවා. කාර්ය මණ්ඩල ප්‍රධානිට කරන්න පුළුවන්

මොකක්ද? මහානාම කියන කාර්ය මණ්ඩල ප්‍රධානියාට පුළුවන්ද, "කන්තලේ සීනි කම්හලේ තිබෙන යකඩ දෙන්නම්" කියලා කියන්න? මම මේක පිළිගන්නේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානි, මහානාම කවුරු හෝ කෙනෙකුව ජනාධිපති ලේකම් කාර්යාලයේ රස්සාවකට දමා දෙන්නම් කියා පගාවක් ගත්තා නම් ඒක පිළිගන්න පුළුවන්. මොකද, එතුමාට ඒක කරන්න පුළුවන්. ජනාධිපති කාර්ය මණ්ඩලයේ වැඩ කරන කෙනෙකුට උසස්වීමක් අරගෙන දෙන්නම් කියලා මහානාම පගාවක් ගත්තා නම්, ඒක පිළිගන්න පුළුවන්. ඔහුට ඒක කරන්න පුළුවන්. හැබැයි, කන්තලේ සීනි කම්හලට අයිති යකඩ ටික දෙන්නම් කියලා පගාව ගන්න ඔහුට පුළුවන්ද? කාර්ය මණ්ඩල ප්‍රධානි කියන්නේ යකඩ වෙළෙන්දෙක්ද? නැහැ. "ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානි" කියන නාමය ඔහු ඒ බලය වෙනුවෙන් උපයෝගී කර ගන්නවා. ඒ බලය හරහා තමයි ජනාධිපතිවරයා හෝ අමාත්‍යවරයෙක් හරහා මේ තීන්දුව ගන්න ඕනෑ. කවුද, මේක ලබා දෙන්න කැබිනට් පත්‍රිකාව දමන්නේ? ගිවිසුම් අත්සන් කරන්නේ කවුද? කන්තලේ සීනි කම්හලේ යකඩ විකුණන්න කාර්ය මණ්ඩල ප්‍රධානිට අයිතියක් නැහැ. කවුද, ඒක කරන්න ඕනෑ? දැන් පරීක්ෂණය දියත් වෙන්න ඕනෑ එතැනට. පී. දිසානායකගෙන්, මහානාමගෙන් ප්‍රශ්න කරන්න ඕනෑකම තිබෙනවා. යකඩ ලබා දීම සඳහා රුපියල් මිලියන 100ක කප්පමක් ලබා ගැනීම සඳහා ඔවුන්ට ලබා දෙන සහතිකය ලබා දෙන්නේ කොහොමද? කවුද, දෙන්නේ? මහානාමට යකඩ දෙන්න බැහැ. පී. දිසානායකට යකඩ දෙන්න බැහැ. ඔහුට ඕනෑ නම් ලී ටිකක් දෙන්න තිබුණා, දැව සංස්ථාවෙන්. යකඩ දෙන්න බැහැ. අපි අහන්නේ එක දෙයයි. මේවායින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි. මේ දූෂණය අපේ රටේ ඉහළටම පැතිරිලා තිබෙනවා. අද මේ දූෂණයේ පැටලී තිබෙන්නේ රජ ගෙවල්. ඒක මතක තබා ගන්න. අපි දූෂිත රාජ්‍යයක් ගොඩ නහා, දූෂිත රජ වළල්ලක් ගොඩ නහා, දූෂිත රජ ගෙදරක් හදලා ජනතාවට කියනවා, "අපි දූෂිතයන්ට දඬුවම් දෙනවා" කියලා. ඒවා ජනතාවට පිළිගන්න කියලාද, කියන්නේ? තමුන්නාන්සේලාගෙන් මම අහන්නේ.

ඒ විතරක්ද? මහ බැංකු අධිපතිවරයා! මේ කවුද? ජනාධිපති ලේකම්වරුන්, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි, මහ බැංකුවේ අධිපති සිටිනවා. මහ බැංකුවේ අධිපතිවරයා එම තනතුරට පත් කිරීමේදී ප්‍රධානම වග කිව යුත්තා බවට පත් වී තිබෙන්නේ අග්‍රාමාත්‍යවරයා. එය කිසිසේත්ම සහවන්න බැරි කාරණයක්. එය, කැබිනට් මණ්ඩලයේ සාමූහික තීරණයක්. හැබැයි, ඒ සඳහා පොලඹවන්නේ අග්‍රාමාත්‍යවරයා; සහතික දෙන්නේ අගමැතිවරයා; නිර්දේශ කරන්නේ අගමැතිවරයා. හැබැයි, අද මහ බැංකු අධිපතිවරයා පැන ගිහින් තිබෙනවා. අගමැතිවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ සම්බන්ධව උත්තරයක් දුන්නේ නැහැ. එතුමා උත්තරයක් දෙන්න ඕනෑ. "මා විශ්වාස කරලා ගෙනා කෙනා, මා පත් කළ මහ බැංකු අධිපතිවරයා පැන ගිහින් තිබෙනවා. ඔහුට උසාවියෙන් වරෙන්තු නිකුත් කරලා තිබෙනවා, අත් අඩංගුවට ගන්න බැරිව ඉන්නවා" කියලා කියන්නේ නැත්තේ ඇයි? පිට්ටු ගිලලා වාගේ ඉන්නේ ඇයි? මතක තබා ගන්න, මේ දූෂණය එතැනටත් -අග්‍රාමාත්‍යවරයාටත්- සම්බන්ධයි. මහ බැංකු අධිපතිවරයා නිකම් සෙල්ලම් කළා නොවෙයි. එතුමා අග්‍රාමාත්‍යවරයා එක්ක ඉතාම හොඳින් කුලුපගව සිටිමින්, මිතුරුකමින් කටයුතු කරපු කෙනෙක්. ඒක අපි දන්නා දේශපාලනය.

ඒ විතරක්ද, තානාපතිවරුන්. මොන රටේ තානාපතිද? ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපතිවරයා. විශේෂයෙන්ම අපේ රට විවිධ ජාත්‍යන්තර වැටලීම්වලට ලක් වී තිබෙන වෙලාවක අපි ඇමෙරිකාවට යැවිය යුතුව තිබුණේ අපේ රාජ්‍ය තාන්ත්‍රික ක්ෂේත්‍රයේ සිටින උසස්ම හා දක්ෂතම නිලධාරියා.

නමුත් මොකක්ද වුණේ? ජාලිය වික්‍රමසූරියව ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපති විධියට පත් කළා. ඥාතියා! දැන් එයා කෝ? ඇමෙරිකාවේ තානාපති නිවස චික්කා කියලා පරීක්ෂණයක් කෙරෙනවා. ඇමෙරිකාවට ගිහින් තානාපති නිවාස චික්කේ ජාලිය වික්‍රමසූරියලා. දැන් අපි අහනවා, කෝ ඒ මිනිස්සු කියලා? හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා දැන් ඒකට සහතිකයක් දෙන්න ඕනෑ නේ. එතුමා විශ්වාසවන්තකමට තමාගේ ඥාතියාව ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපතිවරයා හැටියට පත් කළා. ඒ තානාපතිවරයා තානාපති නිවස චික්කුණලා, වංචාවක් කළාය කියා අහුවෙලා තිබෙනවා. ඒ ගැන හිටපු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිත් ප්‍රකාශයක් කරන්න ඕනෑ. එතුමා ප්‍රකාශයක් කරන්නේ නැහැ. ඒ ඇයි? ඒවා, ඒ ගොල්ලොත් සම්බන්ධ වුණු ගනුදෙනු. මා ළඟ දැන් ඒ Audit Report එක තිබෙනවා. මේ නිවස විකිණීම පිළිබඳව එහි ඉතා පැහැදිලිව කරුණු සඳහන් වී තිබෙනවා. හිටපු ජනාධිපතිවරයා ඒකට උත්තරයක් දෙන්න එපා යැ. තමන්ගේ ඥාතියා ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපතිවරයා ලෙස පත් කළාට පස්සේ, වංචාවක් සම්බන්ධයෙන් නඩු අහලා ඒ තානාපතිවරයාට වරෙන්තු නිකුත් කර තිබෙනවා. ඉතින් "මෙන්න තානාපතිවරයා, මෙන්න ඉන්න නැන" කියලා ඒ සම්බන්ධයෙන් කුමක් හෝ වග කීමක් දරන්න ඕනෑ නේ. ඒකයි පාලනයක් කියන්නේ. ඒ අයට නේ, පාලකයෝ කියන්නේ.

ඊළඟට, රුසියාවේ හිටපු තානාපතිවරයා ගැනත් මම කියන්න ඕනෑ. ඥාතිකම අනුව එයා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ මස්සිනාද කියලා නම් මම දන්නේ නැහැ. දැන් ඔහු කෝ? ඔහුට රතු වරෙන්තු නිකුත් කර තිබෙනවා. ජපානයට ගියාම ඔහු හම්බ වෙනවා; කොරියාවට ගියාම හම්බ වෙනවා; එකට පාටි දමනවා. එයා ඩුබායිවල හැංගිලා ඉන්නවා. අඩුම තරමේ හිටපු ජනාධිපතිතුමා කියන්න ඕනෑ නේ, "තමුසේ, මම පත් කරපු හාදයා, මෙහේ නඩුවක් තිබෙනවා, ඇවිල්ලා නඩුවට මුහුණ දෙනවා" කියලා. ඇයි, ඔහු හංගන්නේ? ඇයි, ආරක්ෂා කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තිබෙන්නේ මෙන්න මේ දූෂණයයි. හිටපු ජනාධිපතිවරයා, ඊට කලින් හිටපු ජනාධිපතිවරිය, දැන් ඉන්න ජනාධිපතිවරයා සහ දැන් ඉන්න අගමැතිවරයාගේ අනුහස් සහිතව තමයි මේ වංචා, දූෂණ ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ. නමුත්, මෛත්‍රීපාල සිරිසේන මහත්තයා මේ ගරු සභාවේ මූලාසනයේ වාඩි වෙලා කියනවා, "වංචාව, දූෂණය නතර කිරීම සඳහා ඉතාම දිගු සහ බරපතළ තීන්දු තීරණ අරගෙන තිබෙනවා" කියලා. මොන තීන්දු තීරණද? මේ ආණ්ඩුවේ හා මේ පාර්ලිමේන්තුවේ බහුතරයකටත් වංචා, දූෂණ පිළිබඳව හැඳි වත සහිතව කථා කරන්න බැරි බව මතක තබා ගන්න.

අපේ ගම්වල කථාවක් තිබෙනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි "බුලත් මල්ලට -ඒක වෙන වචනයකින් කියන්නේ.- හෙණ ගහපුවාම කිල්ලෝටේ බලන්නේවත් නැතුව විසි කරන්න" කියලා. තමුන්නාන්සේලා කිල්ලෝට. අන්න ඒක මතක තබා ගන්න. බුලත් හෙප්පුවට තමයි හෙණ ගහලා තියෙන්නේ. මේ වංචා, දූෂණ සිද්ධ වන්නේ රජ ගෙවල්වලයි. රජවරුන්ගේ අනුහස් සහ ආරක්ෂාව මතයි මේ වංචා, දූෂණ සිද්ධ වෙන්නේ. තමුන්නාන්සේලාට 2015 ජනවාරි මාසයේ 08වැනි දා ජන වරම ලැබුණේ, ශක්තිමත් ලෙස ගොඩනඟා තිබෙන අන්න ඒ තාප්පය බිඳින්නයි. හැබැයි, ඒ තාප්පය බිඳිනවා වෙනුවට තමුන්නාන්සේලාත් ගල් එකින් එක, එකින් එක තබමින් ඒ වංචා, දූෂණ තාප්පය බැන්දා. ඉතින්, මොකක්ද මේ මෙතැනට ඇවිල්ලා කරන ප්‍රකාශන? වංචා, දූෂණ නැති කිරීම පැත්තෙන් ගත්තත් තමුන්නාන්සේලාට මේ පාර්ලිමේන්තුවේ නව ගමනක් පිළිබඳ විශ්වාසයක් හදන්න බැහැ.

දැන් ගොඩක් අය අහනවා, ඊයේ සම්මත කළ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතට අපි ඡන්දය දුන්නේ

[ගරු අනුර දිසානායක මහතා]

නැත්තේ ඇයි කියලා. මොකටද ඡන්දය දෙන්නේ? අධිකරණයේ නඩු ඉක්මන් කළාට මේ දූෂිතයන්ට දඬුවම් ලැබෙයි කියා රටේ මිනිහෙක් හඳන්න ඕනෑද? දූෂණයේ යෙදෙන ආණ්ඩුවක්, දූෂිතයන් ආරක්ෂා කරන ආණ්ඩුවක් නීතියක් සම්මත කරලා කියනවා, "දැන් නම් ඉක්මනින් නඩු අහනවා" කියලා. ඒවා අසත්‍ය ප්‍රකාශ. අපි ඒ උගුල්වලට අහු වෙන්නේ නැහැ. දූෂිතයන්ට දඬුවම් ලබා දීම සඳහා තිබුණු සදාචාරාත්මක අයිතියත් අවුරුදු තුනක් යනකොට තමුන්නාන්සේලාගේ පාලනයෙන් ගිලිහිලා අවසන්. මේ අවුරුදු තුන ගත වෙන කොට දූෂිතයන්ට දඬුවම් ලබා දෙන්නවත් තමුන්නාන්සේලාට අයිතියක් නැති තත්ත්වයට පත් වී තිබෙනවා.

ඊළඟට, ජාතික සමගිය පිළිබඳ ප්‍රශ්නය. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කිව්වා, ඒ සම්බන්ධව ඉතාම දිගු පියවර ගන්න ඕනෑය කියලා. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සෑදීම සඳහා ඉතාම සද්භාවයෙන් කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින බව අපි දන්නවා. මම හිතන හැටියට එම කමිටුව හැත්තෑපස් වතාවකට වඩා රැස් වෙලා තිබෙනවා. ඒ ගැන මේ පාර්ලිමේන්තුවේ දින පහක් විවාද කර තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී ගති ලක්ෂණ ඇතුළත් වන, සියලු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන, අවශ්‍ය නම් නව ඡන්ද ක්‍රමයක්ද ඇතුළත් වන, මානව හිමිකම් සුරක්ෂිත වන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් -නව මූලික නීතියක්- අපේ රටේ සකස් කිරීම පිළිබඳව සාකච්ඡාවක් තිබුණා.

විශේෂයෙන්ම 2015 ජනවාරි මාසයේ 08වන දා දුන් ජනතාවගේ වරම තුළ නව ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් ශක්තිමත් කිරීම පිළිබඳව ඉතාම බලවත් ජනතා කැමැත්තක් නියෝජනය වුණා. හැබැයි තමුන්නාන්සේලා මේ අවුරුදු තුනක කාලය නිස්කාරණේ අපතේ යැව්වා. මොකක්ද කළේ? අඩුම තරමේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න ඕනෑ, "දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව සාකච්ඡාව ඉවරයි" කියලා. ඒ කටයුතු ඔහේ තිබෙනවා; පාවී-පාවී තිබෙනවා. එයට කාර්ය මණ්ඩල පත් කර තිබෙනවා; ආයතන පත් කර තිබෙනවා; නිලධාරීන් පත් කර තිබෙනවා; ඒවාට වියදම් දරනවා. නමුත් ඒ කටයුතු ඔහේ තිබෙනවා. තමුන්නාන්සේලාට අඩුම තරමේ මේ රටේ නව ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් පිළිබඳව, සියලු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත වීම පිළිබඳව, ජනතාවගේ මතය සාධාරණ ලෙස නියෝජනය වන මැතිවරණ ක්‍රමයක් පිළිබඳව අලුත් ආකල්පයක් සහිතවවත් වැඩ කටයුත්තක් මේ අවුරුදු තුන ඇතුළත නිමා කර ගන්න බැරි වෙලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ පැත්තෙන් ගත්තත්, ජනතාවගේ අයිතීන් පිළිබඳ පැත්තෙන් ගත්තත් අසාර්ථක වුණු පාලනයක් තමයි මේ කාලය ඇතුළත තමුන්නාන්සේලා කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පැත්ත විතරක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් ගත්තොත්, දැන් තමුන්නාන්සේලා කියනවා, මහා විශාල ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කරලා තිබෙනවාය, කථා කරන්න නිදහස තිබෙනවාය කියලා. මා කාරණයක් කියන්නද? අද කථා කිරීමේ නිදහස තිබෙන්නේ තමුන්නාන්සේලාට මොනවත් කර ගන්න බැරි නිසායි කියලා ඉතා හොඳින් දන්නවා. ශක්තිමත් පාලනයක් නැතුව ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව කටයුතු කරන්න තමුන්නාන්සේලාට බැරිවෙලා තිබෙනවා. මාධ්‍යය පිළිබඳව හෝ මාධ්‍යවේදීන් පිළිබඳව හෝ කථා කරන පුරවැසියන් පිළිබඳව හෝ බියජනක තත්ත්වයක් නැත්නම්, එසේ වෙලා තිබෙන්නේ අන් කවරක් නිසාවත් නොවෙයි. එය තමුන්නාන්සේලාගේ නොහැකියාවේ ගති ලක්ෂණයක් මිසක්, තමුන්නාන්සේලාගේ කැමැත්තේ ගති ලක්ෂණයක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදයට අතිශය විනාශකාරී තත්ත්වයක් නිර්මාණය කර දී තිබෙන විධායක ජනාධිපති ධුරය පිළිබඳ ප්‍රශ්නය තමයි මැතිවරණ වේදිකාවේ පටිට ගහපු කථාව. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා සෝභිත ස්වාමීන් වහන්සේ සමඟ වුණු එකඟතාවන්, සෝභිත ස්වාමීන් වහන්සේගේ දෙණ ඉදිරිපිට දෙන ලද එකඟතාවන්, එතුමා ජනාධිපති ධුරයට පත්වෙලා දළ දා මාලිගාවට ගිය විගස කරන ලද ප්‍රකාශයන්, ජනාධිපති ධුරයේ දිවුරුම් දෙන වෙලාවේදී කරන ලද ප්‍රකාශයන් හා ඉන් අනතුරුව අවස්ථා ගණනාවකදී කරන ලද ප්‍රකාශයන්හි තිබුණේ, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳ යෝජනාවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මෙය, මේ රටේ පැවැත්වෙන අවසන් විධායක ජනාධිපතිවරණයයි" කියා එක අවස්ථාවකදී එතුමා කිව්වා මට මතකයි. එතුමා මේ රටේ ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන අවසන් විධායක ජනාධිපතිවරයාය කිව්වා. ඒ කිව්වේ මොකක්ද? විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳව ඇත්ත වුවමනාවකින් කටයුතු කරනවාය කියන එකයි. නමුත් එහෙම කටයුතු කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිශය විනාශකාරී ඒකාධිපති වියරු මනසක් සහිත අය විධායක ජනාධිපති ධුරයට පත් වුණු නිසා මේ රටේ සිදු වුණු විනාශයන් අපි දැක තිබෙනවා. අතිශය විනාශකාරී වියරු මනසක් සහිත අයත් විධායක ජනාධිපති පුටුවේ වාඩි වුණා. ඒ තුළිනුත් විධායක ජනාධිපති ධුරයේ තිබෙන විසකුරුභාවය අපි අත් විඳලා තිබෙනවා.

පසුගිය පාලනය ගැන බැලුවොත්, රටේ ආර්ථිකයෙන් සියයට 52ක් එක පවුලක් යටතේ තබා ගන්නේ කොහොමද? රටේ ප්‍රධානතම ආයතනවල බලය එක පවුලක හිමිකාරිත්වයට ගෙනෙන්නේ කොහොමද? මේවා මහ ජනයාගේ දේපොළ ලෙස නොසලකා, තමන්ගේ පවුලේ පරවේණි භුක්තියට ආපු මහජන සම්පත් ලෙස සලකා, තමන්ට අවශ්‍ය පරිදි එක පවුලක් ඒවායින් දූ කෙළියේ යෙදුණේ කෙසේද? ජනාධිපතිවරයාගේ පුතා වූ පළියටම ඉතාමත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට පවා එතුමාට කොන්ද නවන්න සිද්ධ වුණේ කොහොමද? ඒ නිසා වියරු මනසක් සහිත කෙනෙකු විධායක ජනාධිපති පුටුවේ වාඩි වුණාම විය හැකි විනාශකාරී තත්ත්වය මේ සමාජය ඕනෑවටත් වඩා වැඩියෙන් අත් විඳලා තිබෙනවා. ඒ නිසාම තමයි, "විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම" කියන පටන් පාඨය පොදු සටන් පාඨයක් බවට පත් වුණේ. ඒ නිසාම තමයි 1989දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට තමන්ගේ මැතිවරණ ප්‍රකාශනය තුළට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාව ඇතුළත් කරන්න වෙන්නේ. ඒ නිසා තමයි 1994දී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳ යෝජනාව ගෙන එන්න සිද්ධ වෙන්නේ. ඒ නිසා තමයි 1999දී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය තමන්ගේ මැතිවරණ ප්‍රකාශනයට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳ යෝජනාව ගෙනෙන්නේ. ඒ නිසා තමයි 2000 දී සකස් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ වගන්ති ඇතුළත් වන්නේ. ඒ නිසා තමයි 2005දී විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳව මහින්ද රාජපක්ෂ මහත්මයා එකඟතාවකට එන්නේ. ඒ නිසා තමයි 2010දී මහින්ද රාජපක්ෂ මහත්මයා තමන්ගේ "මහින්ද චින්තන (2)" ප්‍රකාශනයට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාව ඇතුළත් කරන්නේ. ඒ නිසා තමයි 2015දී මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේත්, මහින්ද රාජපක්ෂ මහත්මයාගේත් දෙදෙනාගේම පොරොන්දුවක් බවට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පත් වන්නේ.

විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳව අවස්ථා ගණනාවකදී ඉතා පැහැදිලිව ජන වරම් ගණනාවක් ලැබී තිබුණා. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳව ජන වරම ලැබී තිබෙනවා. ඒ වාගේම වියරු මනසක් සහිත කෙනෙක් විධායක ජනාධිපති පුටුවේ වාඩි වුණාම, සමාජය අත්පත් කරගෙන තිබුණු විනාශය අපි දැකලා තිබෙනවා.

කිසිවක් කරගත නොහැකි, බලය පමණක් තිබෙන, අලුත් මහජන මතයක් නැති, බලය වෙනුවෙන් පමණක් කල්පනා කරන, අනෙක් කිසිවක් ගැන කල්පනා නොකරන ඔහේ පාවෙන මිනිසෙක් ඒ පුටුවේ වාඩි වුණාම මොකක්ද වෙන්නේ කියන එකත් දැන් පෙන්වලා තිබෙනවා. එහෙටත් නැති, මෙහෙටත් නැති උදවිය වාඩි වුණාම වෙන්නේ මොකක්ද කියන එකත් දැන් අත් විඳලා තිබෙනවා. විධායක ජනාධිපති ක්‍රමය පිහිටුවූ තැන ඉඳලා එහෙටත් නැති, මෙහෙටත් නැති කෙනෙක් වාඩි වීම දක්වා මේ රටට සිදු වී ඇති විනාශකාරී තත්ත්වය පිළිබඳව ඕනෑවටත් වඩා මේ සමාජය අත් විඳලා තිබෙනවා. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේදී වැදගත්ම සාධකයට තමුන්නාන්සේලා පසුගිය අවුරුදු තුන ඇතුළත අත තිබ්බේ නැහැ. තනි පුද්ගලයෙක් මත අසීමිත බලයක් නිර්මාණය වෙමින්, ඒ බලය හරහා තමන්ට කළ නොහැක්කක් නොමැත කියන මතයේ කටයුතු කිරීමේ මෙවලම ඉවත් කිරීම සඳහා තමුන්නාන්සේලා මොකක්ද කරමින් තිබෙන්නේ? කිසි දෙයක් කරන්නේ නැහැ. මොකක්ද කළේ? මුළු අවුරුදු තුනම දෙන්නට දෙන්නා හොරෙන් හොරගල් අහුළනවා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඊළඟ වතාවේ තමන්ට වාඩි වෙන්න පුළුවන් කියලා හිතලා හොරගල් අහුළනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඊළඟ වතාවේ තමන්ට වාඩි වෙන්න පුළුවන් කියලා හිතලා හොරගල් අහුළනවා. මේ අවුරුදු තුනම ගත වුණේ එහෙමයි. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා ජනතාවගේ ජනවරම අනුව කටයුතු කරනවා වෙනුවට, ඒ පුටුවේ තමන් වාඩි වීම සඳහා දෙන්නාට දෙන්නා හොරෙන් හොරගල් ඇහිළුවා. හැබැයි, පෙබරවාරි මාසයේ 10වෙනිදා මැතිවරණ ප්‍රතිඵලයෙන් පෙන්නුම් කර තිබෙනවා, මේ දෙදෙනාට යළි කවදාවත් ඒ පුටුවේ වාඩිවෙන්න බැරි බව. ඔන්න, අවුරුදු තුනක් ගියාට පස්සේ තත්ත්වය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හැබැයි, ඒ අවුරුදු තුන කටයුතු කළේ කොහොමද? පුටුවේ වාඩි වෙන්න බලාගෙන තමයි අවුරුදු තුනම කටයුතු කළේ. හැබැයි, අවුරුදු තුනක් යනකොට ඉදිරිපත් කර තිබෙන ශේෂ පත්‍රය මොකක්ද? මේ දෙදෙනාටම යළි ඒ පුටුවේ වාඩි වෙන්න බැරි බව සක් සුදක් සේ පැහැදිලියි. පසුගිය පෙබරවාරි මාසයේ 10වැනිදා මැතිවරණ ප්‍රතිඵලය ඉතා හොඳින් නිරීක්ෂණය කළොත්, ඒ පිළිබඳව අපි ලොකු විවාදවලට යන්න ඕනෑ නැහැ. ඒ දෙදෙනාගෙන් කෙනෙක් තව දුරටත් මේ පුටුවේ වාඩි වෙන්න පුළුවන් කියලා හිතාගෙන ඉන්නවා නම්, ඒ අයගේ මොළය පරීක්ෂා කිරීම සඳහා වන සායනයකට යවන්න පක්ෂ සාමාජිකයන්ට අයිතිය තිබෙනවා. මොකද, ඒක කරන්න බැහැ. දැන්වත් ඒක තේරුම් ගන්න. මොකද, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා වෙනුවට අවුරුදු තුනම කළේ, ඒකේ වාඩි වෙන්න බලාගෙන සිටීමයි. ඒක තමයි කටයුතු කළ ආකාරය. එම නිසා ඉතා හොඳින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන නිසි පියවරයන්, ක්‍රියාමාර්ග ආණ්ඩුව විසින් ගත යුතුව තිබුණා. නමුත් මම දැක්කා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ අවුරුදු තුනක කාල පරිච්ඡේදය ඇතුළත ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග හෝ ඉදිරි අවුරුදු එකහමාර තුළ ගනු ලබන ක්‍රියාමාර්ග කිසිවක් ඒ ප්‍රකාශයට ඇතුළත් වෙලා නැති බව. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් බැලුවත් ඉදිරි පියවරක් තැබීම සඳහා කිසිදු දැක්මක් නැති පාලනයක් හැටියට තමයි ගත වෙමින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සම්පිණ්ඩනය කරලා ගත්තොත්, ගත වෙමින් තිබුණු අවුරුදු තුන ඉතාමත් අසාර්ථක, ජනතාවගෙන් විතැන් වුණු, ජනතාවගේ අප්‍රසාදයට පත් වුණු, ජනතාව දෙන ලද එකඟතාවන් ඉටු කරන්න අසමත් වුණු, නිස්කාරණ ලෙස ගත වුණු කාල පරිච්ඡේදයක්. අඩුම තරමින් ඉතිරි අවුරුදු එකහමාරවත් යම් ප්‍රගතිගාමී පියවරකට තමුන්නාන්සේලා යා යුතුව තිබෙනවා. හැබැයි, ආර්ථිකය, ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය, වංචා දූෂණ පිළිබඳ ප්‍රශ්නවලදී තමුන්නාන්සේලාට කිසිදු ප්‍රගතිගාමී පියවරක් තියන්න බැහැ කියලා අපි ඉතා හොඳින් විශ්වාස කරනවා. මේ ආණ්ඩුව ලී කඳේ මැද වෙයෝ කාපු, පොත්තෙන් විතරක් තිබෙන ආණ්ඩුවක්. අරටුවක් නැති බොල් පාලනයක් මේක. ඒ නිසා මේ පාලනයට අපේ රටේ ඉදිරිය සඳහා වූ කිසිදු දැක්මක් සහ ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි බව ඉතා හොඳින් පසුගිය අවුරුදු තුන ඇතුළත පෙන්නුම් කරමින් තිබෙනවා. එහෙම නම් දැන් කරන්න තිබෙන්නේ කුමක්ද? පක්ෂයක් හැටියට අපි උත්සාහ කරමින් තිබෙනවා, අඩුම තරමින් ඉදිරි අවුරුදු එකහමාර ඇතුළත විය හැකි විනාශයන්,- අලුත් කිසිවක් තමුන්නාන්සේලාට කරන්න බැහැ. හිටපු අමාත්‍යවරයෙක් ප්‍රකාශ කළා, ජනතාවගේ ජීවිතය නංවන්න සමෘද්ධියට පුළුවන් කියලා. බොරු හොඳේ. ඒ කිසිවක් කරන්න බැහැ. ඒවා තව දුරටත් වචන විතරයි. සමහර අය හිතාගෙන ඉන්නවා, මේ රට හදන්න පුළුවන් කියලා. එක්සත් ජාතික පක්ෂයේ එන්න බලාගෙන ඉන්න නායකයෝ මේ රට හදන්න මරු කථා කියනවා, පාසල් නිල ඇඳුම වෙනුවට නිල ඇඳුම් දෙකක් දෙන්න ඕනෑ; සපත්තු කුට්ටම වෙනුවට සපත්තු කුට්ටම් දෙකක් දෙන්න ඕනෑ; ග්‍රාම නිලධාරි වසමකින් තමන්ගේ පාක්ෂිකයෙක් රස්සාවට ගන්න ඕනෑ; ඊට පස්සේ ඔහු ඡන්ද කරයි කියා. ඔය විධියටම තමයි මෙච්චර කල් රට පාලනය කළේ. ඒක අලුත් දෙයක් නොවෙයි. අඩුම තරමින් චින්තනයක් සහිත මිනිහෙක් අද තමුන්නාන්සේලාගේ පක්ෂය ඇතුළේ නැහැ. ඒ නිසා මොකක්ද හිතන්නේ? බෙදා දෙන එක තමයි දේශපාලනය කියන්නේ. එහෙම නේද? නිල ඇඳුම වෙනුවට නිල ඇඳුම් දෙකක් දුන්නොත් හරියයි, සපත්තු කුට්ටම වෙනුවට සපත්තු කුට්ටම් දෙකක් දෙමු, සමෘද්ධි දීමනාව රුපියල් 10,000ක් කරමු, ඊට පස්සේ හැම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකින්ම එක්සත් ජාතික පාක්ෂිකයෙකුට රස්සාවක් දෙමු, ලක්ෂයක් රස්සාවලට ගනිමු. මොනවද මේ කියන්නේ? රටක් හදන්නද එහෙම කියන්නේ? රටක් හැදීම පිළිබඳව කථා කළොත්, මේ විධියට තමයි තමුන්නාන්සේලා ඉතිහාසය පුරාම කටයුතු කළේ. වරාය පාඩු වෙන්නේ කුමක් නිසාද? ආණ්ඩුව මාරු වෙනකොටත් වරාය පුරවනවා. ඇමතිවරයා මාරු වෙනකොටත් වරාය පුරවනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාඩු වෙන්නේ කුමක් නිසාද? ඇමතිවරු මාරු වෙනකොටත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පුරවනවා, ආණ්ඩුව මාරු වෙනකොටත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පුරවනවා. මේ විධියට තමයි සිද්ධ වෙලා තිබෙන්නේ.

මට මතකයි එක දවසක් ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා කිව්වා, "1978 ආණ්ඩුව හදලා කැස්බෑවට ගිහිල්ලා බස් එක නවත්තලා 'පෙට්‍රෝලියම්, පෙට්‍රෝලියම්' කිව්වාම බස් එකට නැග්ගා." කියලා. ඔබතුමා මට දවසක් කිව්වා, "එහෙම ගිහිල්ලා තමයි රස්සාවලට දැම්මේ." කියලා. එච්චරයි. කැස්බෑවට ගිහිල්ලා බස් එක නැවැත්තුවා, "පෙට්‍රෝලියම්, පෙට්‍රෝලියම්" කියලා කිව්වාම පෙට්‍රෝලියම් උදවිය නැග්ගා; "වරාය, වරාය" කියලා කිව්වාම වරාය උදවිය නැග්ගා. එහෙම එක්කගෙන ගිහිල්ලා පිරෙව්වා. 1977දී එහෙම තමයි කළේ. [බාධා කිරීමක්] හොඳයි, මොකක් හරි. එහෙම තමයි කළේ. [බාධා කිරීමක්] ඒකමනේ දැනුත් කරන්න යෝජනා කරන්නේ. අලුත් දෙයක් යෝජනා කරනවාද? නැවත "පෙට්‍රෝලියම්, පෙට්‍රෝලියම්" කියලා පෙට්‍රෝලියම් එකට දමනවා, "වරාය, වරාය" කියලා වරායට පටවනවා. මේක තමයි සිද්ධ

[ගරු අනුර දිසානායක මහතා]

කරන්නේ. තමුන්නාන්සේලා රාජ්‍ය ආයතනත් කඩා වැටිටුවා. මුළු ආර්ථිකයත් කඩා වැටිටුවා. ජනතාවගේ ජන ජීවිතයත් ආපස්සට ඇදලා දමා තිබෙනවා.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඉදිරි අවුරුදු එකහමාර තුළත් තමුන්නාන්සේලාට ලැබෙන අමාත්‍ය ධුර, ලැබෙන වරදාන හා වරප්‍රසාද ආරක්ෂා කර ගනිමින් ඔහේ ගෙවිලා යන පාලනයක් ගෙන යනකොට ඉදිරි කිසිවක් සිදු නොවන බව නම් ඉතා හොඳින් පැහැදිලියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මෙම අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.14]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 2015 සැප්තැම්බර් මාසයේ පළමුවැනි දා ආරම්භ වූ අටවැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් 2018 අප්‍රේල් 12 දින අවසන් කළා. ඊළඟට, මැයි 08වැනිදා අටවැනි පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය ආරම්භ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්දෝ වැටෙයි, වැටෙයි බලමින් එළවාගේ පස්සෙන් නරියා ගියාලු. ඒ වාගේ පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය අවසන් කළාම විපක්ෂයට පුදුම විධියේ ජොලියක් ඇති වුණා, "දැන් ආණ්ඩුව ඉවරයි; රට අස්ථාවරයි; අගමැතිතුමායි, ජනාධිපතිතුමායි අතර ප්‍රශ්න; ඒකයි මේ වාරාවසාන කළේ." කියලා. ඒ අය විවිධ කථා කියමින් අපේ රටේ අපි ඇති කරපු නිදහස් මාධ්‍ය වාතාවරණය ප්‍රයෝජනයට ගනිමින් මේ රජයට -ආණ්ඩුවට- අවලාද, අපවාද නැඟුවා. නමුත්, අපි දන්නවා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් බුක්ති විඳලා නැති, ඒකාධිපති පාලනයකින් සැප සම්පත් ලබාපු මේ උදවිය මෙහෙම කථා කරන එක අමුත්තක් නොවෙයි කියන එක. ඒ අය ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මොකක්ද කියලාවත් දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසය අරගෙන බැලුවාම, විධායක ජනාධිපති ක්‍රමය එන්නටත් කලින් 1947 සිට 1978 දක්වා අවුරුදු 30කට ආසන්න කාලය තුළ තිස් වතාවක් නව පාර්ලිමේන්තු සැසිවාර පටන්ගෙන තිබෙනවා. ඒ කියන්නේ, අවුරුද්දකට එක වතාවක් බැගින් වාගේ නව සැසිවාර පටන්ගෙන තිබෙනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඒකට හේතුව මොකක්ද කියලා ඉතිහාසයට ගිහිල්ලා බලන්න ඕනෑ. පාර්ලිමේන්තු ඉතිහාසයේත් කටයුතු කරලා තිබෙන්නේ ඒ විධියටයි. තිස් වතාවක් සැසිවාර පවත්වා තිබෙනවා. සමහර අවස්ථාවල උත්සවාකාරයෙන් විවෘත කර තිබෙනවා. සමහර අවස්ථාවල උත්සව නොපවත්වා විවෘත කර තිබෙනවා. සමහර අවස්ථාවල -විධායක ජනාධිපති ක්‍රමය එන්න ඉස්සෙල්ලා- ආණ්ඩුව විශ්වාස භංග යෝජනාවලින් පැරදුණු අවස්ථාත් තිබුණා.

1978 නව ව්‍යවස්ථාව ආවාට පස්සේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පාලන කාලයේත්, ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ පාලන කාලයේත්, ඩී.බී. විජේතුංග මැතිතුමාගේ පාලන කාලයේත්, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ පාලන කාලයේත් සෑම වසරකම වාගේ පාර්ලිමේන්තුව වාරාවසාන කර අලුත් සැසි වාර පටන්ගෙන පාර්ලිමේන්තුවට අලුත් මුහුණුවරක් දීපු අවස්ථා තිබෙනවා. නමුත්, පාර්ලිමේන්තු ඉතිහාසයේ හත්වැනි පාර්ලිමේන්තුවේ -පසුගිය පාර්ලිමේන්තුවේ- මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලන කාලයේ අවසාන භාගයේ අවුරුදු පහක කාලයක් තුළ සැසිවාර අලුත් කරලා නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා එකදිගට සැසි වාරය පවත්වාගෙන ගොස් තිබෙනවා. ඉතිහාසයේ පාර්ලිමේන්තුව වාරාවසාන නොකර, එකදිගට සැසි වාරය පවත්වාගෙන ගොස් තිබෙන්නේ, පසුගිය පාර්ලිමේන්තු -හත්වැනි පාර්ලිමේන්තු- පාලන කාලය තුළයි.

විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා සතු ව්‍යවස්ථාදායක බලතල අනුව, පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමට හා නව සැසිවාර ආරම්භ කිරීමට බලය තිබෙනවා. ඒ බලය පාවිච්චි කරලා සියලු ජනාධිපතිවරු මේ කටයුත්ත කර තිබෙනවා. මේක රටට අලුත් දෙයක් නොවෙයි. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ, එදා හත්වැනි පාර්ලිමේන්තු පාලන කාලයේ -මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ පාලන කාලයේ- අවසාන කාලය තුළ මේ කාර්යය සිද්ධ නොවීමයි. එදා ඉතිහාසය වෙනස් කරමින් ඒකාධිපති විධියට පාර්ලිමේන්තුව එකදිගට අරගෙන ගියා. නමුත්, අද පාර්ලිමේන්තුව නව සැසිවාරයකට ආවාම, "පාර්ලිමේන්තුව වාරාවසාන කළේ ඇයි?" කියලා ප්‍රශ්න කරනවා. නමුත්, එදා එකදිගට පාර්ලිමේන්තුව අරගෙන යද්දී, "ඉතිහාසයේ පළමුවැනි වතාවට පාර්ලිමේන්තු සැසිවාර අවසන් නොකොට එකදිගට ඉදිරියට අරගෙන යන්නේ ඇයි, ජනාධිපතිතුමා මේ විධියට ඒකාධිපති ගමනක් යන්නේ ඇයි?" කියලා ප්‍රශ්න කරන්න ඔය විවේචකයින්ට, ඔය නායකයින්ට කොන්දක් තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහපත් රාජ්‍ය පවතින්නේ විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය කියන අංශ තුනෙහි සමබර දායකත්වය මතයි. නමුත්, පසුගිය රජය කාලයේ මොකක්ද කළේ? විධායකයේ උඩු රැවුල ගැන කථා කළා. "ප්‍රතාපවත් පෙනුමක් තිබෙන, උඩු රැවුලක් තිබෙන විධායකයක් තිබෙන්නේ." එහෙම නැත්නම් "හයේ හතරේ 'සයිස්' එකේ නායකයෙක් ඉන්නේ." කියමින් අධිකරණයත්, ව්‍යවස්ථාදායකයත් තුට්ටු දෙකකට ගණන් ගන්නේ නැති ඒකාධිපති විධායකයකුයි රට පාලනය කළේ.

තමුන්ට ඕනෑ විධියට නටවන්න පුළුවන් රූකඩයක් විධියටයි අධිකරණය පාවිච්චි කළේ. 'අත උස්සපන්" කියනකොට අත උස්සන්නත්, 'අත පහත් කරපන්" කියනකොට පහත් කරන්නත් පුළුවන් වුණු මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් පාර්ලිමේන්තුවක් විධියට තමයි ව්‍යවස්ථාදායකය සම්බන්ධයෙනුත් විධායක බලය පාවිච්චි කරමින් ගෙන ගියේ. විධායකය කොහොමද අධිකරණයට සැලකුවේ කියන එක ගැන කියන්න ඉතිහාසයේ ඕනෑ තරම් කරුණු තිබෙනවා. පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල්වල මිල අහස උසට නග්ගලා ඒවායෙන් කොමිස් ගහනකොට අධිකරණයට ගියා. පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් සඳහා මිල සූත්‍රයක් දාලා මිල පහත හෙළන්න කියලා අධිකරණයෙන් තීන්දුවක් දුන්නා. ඒ අධිකරණ තීන්දුවවත් ශතපහකට ගණන් ගන්නේ නැතුව තමයි පසුගිය විධායකය කටයුතු කළේ; මේ රට පාලනය කළේ. ඒ වාගේම අපි දැක්කා, අග්‍රවිනිශ්චයකාර ශිරාණි බණ්ඩාරනායක මැතිනිය අග්‍රවිනිශ්චයකාර තනතුරෙන් ඉවත් කළේ කොහොමද කියලා; විධායකය සහ ව්‍යවස්ථාදායකය මේ අධිකරණය වෙනුවෙන් කටයුතු කළේ කොහොමද, මෙහෙයවූයේ කොහොමද කියන එක අපි දැක්කා. එදා තිබුණු ඒ ඒකාධිපතිවාදය අපි

දැක්කා. නමුත් වර්තමානය වෙනකොට අපි ඒ ක්‍රමවේදය වෙනස් කරලා තිබෙනවා. අධිකරණය, ව්‍යවස්ථාදායකය සහ විධායකය සමබර කර ගෙන එකිනෙකාට ගරු කරමින්, එකිනෙකාගේ මත ඉවසමින්, එකිනෙකාට අවනත වෙමින් කටයුතු කරන යහ පාලන ප්‍රතිපත්තියක් අපි වර්තමානයේ දකිනවා.

පසුගිය දවස්වල අපි දැක්කා, අතිගරු ජනාධිපතිතුමා අධිකරණයෙන් අහනවා, "මගේ ධුර කාලය කොපමණද" කියලා. අධිකරණය ඒ සම්බන්ධව දුන් තීන්දුව ජනාධිපතිතුමා හිස නමා පිළිගත්තා, "ඒක තමයි මගේ ධුර කාලය" කියලා. එතුමා අධිකරණ තීන්දුවට හිස නැමුවා.

පසුගිය දවස්වල පාර්ලිමේන්තුවට අණ පනත් කීයක් ආවාද, අධිකරණ තීන්දු මත කීයක් නැවැත්තුවාද; සංශෝධනය කළාද? ඒ අවස්ථාවන්හිදී අධිකරණයට හිස නමනවා අපි දැක්කා. එහෙම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් අපි අරගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් කියනවා, අද සමබරතාවක් ඇතිව අපි මේ කටයුතු කරගෙන යන බව. විශේෂයෙන්ම විධායකය, ව්‍යවස්ථාදායකය අදහස් ක්‍රියාත්මක කරන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය අද අපි දකිනවා. බලන්න, අද මේ පාර්ලිමේන්තුව තුළ කී දෙනෙක් තම නිදහස් අදහස් ප්‍රකාශ කරනවාද? එදා මෙහෙම අදහස් ප්‍රකාශ කිරීමක් තිබුණාද? අද පෞද්ගලික ජනමාධ්‍යය විතරක් නොවෙයි, රාජ්‍ය ජනමාධ්‍යය සම්බන්ධයෙනුත් බලන්න, ආණ්ඩුවට විරුද්ධව කථා කරනවා පෙනේවි. මේ පාර්ලිමේන්තුව තුළ බැලුවොත්, විවිධ සමාජ මට්ටම් තිබෙන, විවිධ සංස්කෘතීන්වලට අයිති, විවිධ ඇදහිලි අදහන මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අයගේ හැම මතයකටම අද ගරු කරනවා. සමහර විට අපට දොස් කියනවා, මේ ආණ්ඩුවට කොන්ද පණ නැද්ද, මේ එක එක්කෙනාගෙන් බැණුම් අහන්නේ කියලා. මේවා බැණුම් නොවෙයි. ඒ අදහස් ඉදිරිපත් කරන්නත් ඒ අයට අවස්ථාව තිබෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙන් වූ වේලාව අවසන් වෙමිනුයි යන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම අවසාන කරන්නම්. මම කියනවා, වර්තමානය වෙනකොට හැමදෙනාගේම අදහස් අරගෙන කටයුතු කරනවා කියන කාරණය. අද ආර්ථික සංවර්ධනය අඩුයි කියලා කථා කළා. නමුත් අපි ඉතිහාසයේ දැක්කා, සංවර්ධනය කියන්නේ මොකක්ද කියලා. වෙඩි උණ්ඩය පාවිච්චි කරලා උද්ඝෝෂකයන් මරා දාලා කරන සංවර්ධනය, සංවර්ධනයක් ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්නම්, මට තව විනාඩියක් දෙන්න.

ණය ගන්නේ මොනවාද, කරන්නේ මොනවාද කියා පාර්ලිමේන්තුව දැනුවත් නොකර ඒකාධිපති විධියට කරපු සංවර්ධනය රටට මහා බරක් වෙලා තිබෙනවා කියන එකත් අපි දැක්කා. ඒ වාගේම මේ ප්‍රජාතන්ත්‍රවාදය තුළ අපි දකිනවා, මේ රටේ ඉන්න හොරු වීර පුරන්අප්පුලා වාගේ උසාවි ඉස්සරහට ගිහින් කථා කරන අන්දම. මේ රටේ ඉන්න දූෂකයන් ශාන්තවරුන් විධියට කථා කරනවා අපි දැක්කා. මේ රටේ ඉන්න මිනීමරුවන් ආගමික නායකයන් විධියට ගිහිල්ලා කථා කරනවා අපි දැක්කා; ඒ වාගේ රහපානවා අපි දැක්කා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කථාව අවසාන කරන්න. අද කාලය ඉතාම සීමාසහිතයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
විශේෂයෙන්ම මම මේ රටේ ජනතාවට ආයාචනය කරනවා, මේ වෙලා තිබෙන්නේ මොකක්ද කියා දකින්න දැස් කඩතුරා හැර බලන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 2.23]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දා ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ ගරු සභාවට අවුත් කරනු ලැබූ ප්‍රකාශනය පිළිබඳ අප තුළත්, විවිධ පාර්ශ්ව තුළත් අලුත් වෙනසක් සඳහා වන කිසියම් අදහසක් ඇති වෙතැයි කියන අපේක්ෂාවක් ගොඩනැඟිලා තිබුණා. ඊට ප්‍රධාන හේතුව තමයි පළාත් පාලන මැතිවරණයට පෙරාතුව එතුමා විසින් රටේ ජනතාව අමතමින් ඉතා පැහැදිලිව ප්‍රකාශයක් කිරීම, 2015, 2016 සහ 2017 කියන වර්ෂ තුන තුළදී රටේ ආර්ථිකය කළමනාකරණය කිරීමේ කටයුත්ත කළේ එක්සත් ජාතික පක්ෂය බවට.

එක්සත් ජාතික පක්ෂයට මෙය කළ නොහැකි වීම තුළින් රටේ කෘෂි කර්මාන්තය කඩා වැටිලා, කර්මාන්ත කඩා වැටිලා, සේවා අංශය කඩා වැටිලා ආර්ථිකය සම්පූර්ණයෙන්ම නැතිවන තත්ත්වයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය පූර්ණ වගඋත්තරකරුවෙකු වන බව එතුමා පැහැදිලිව රටට ප්‍රකාශ කළා පමණක් නොවෙයි, මේ මැතිවරණයෙන් පසුව ආර්ථිකයේ ගොඩ ගන්න නොහැකි වුණු කොටස ගොඩ ගැනීම සඳහා එතුමා විසින් නව වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන බවත් ප්‍රකාශ කළා. එසේ ප්‍රකාශ කරලා ඒ අනුව එතුමා යම් යම් පියවරත් ගත්තා.

මේ අවස්ථාවේදී මම කැමැතියි, 2018.04.07 වන දින "ලංකාදීප" පුවත් පතේ 6 වන පිටුවේ සඳහන් අජන්ත කුමාර

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

අගලකඩ ශූරින් විසින් ලියන ලද ලිපියක කොටසක් කියවන්න. එහි මෙසේ සඳහන් වනවා:

"ආර්ථික කළමනාකරණ කමිටුව අහෝසි කළා.

අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ආර්ථික කළමනාකරණ කමිටුව අහෝසි කළ බව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඊයේ (06) පැවසීය.

එම කමිටුවේ කටයුතු සියල්ල අමාත්‍ය මණ්ඩලය මඟින් සිදු කෙරෙන බවද ජනාධිපතිවරයා කොළඹ කොටුව ජනාධිපති මන්දිරයේදී පුවත්පත් කතුවරුන් හා මාධ්‍ය ආයතන ප්‍රධානීන් සමඟ ඊයේ පැවැති සාකච්ඡාවේදී ප්‍රකාශ කළේය.

මීට පෙර, කැබිනට් මණ්ඩලයත්, ආර්ථික කළමනාකරණ කමිටුවත් ආයතන දෙකක් ලෙස කටයුතු කළ බව කී ජනාධිපතිවරයා දැන් එය අහෝසි කර ඇති නිසා එකට වැඩකටයුතු සිදු කෙරෙන බවද කීවේය."

එම නිසා ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව මේ ආර්ථිකය කළමනාකරණය කර ගත නොහැකි වීමේ තත්ත්වය සඳහා වන එක බාධකයක් ලෙස සලකා කළමනාකරණ කමිටුව අහෝසි කළා කිව්වා. මෙම කටයුතු සිදු කරන්නේ කැබිනට් මණ්ඩලය විසින් ගන්නා තීරණ මතයි කියලාත් එතුමා කිව්වා. මේ වනකොට මේ රටේ නිමැවුම වැටිලා; සේවා නියුක්තිය වැටිලා; ජනයාගේ ආදායම වැටිලා; මිල මට්ටම් ඉහළ ගිහිල්ලා; පොලී අනුපාතය ඉහළ ගිහිල්ලා; සංචිත කඩා වැටිලා; රුපියල මස්තබාල්දු වෙලා; ණය බර වැඩි වෙලා; ඉතා විශාල ආර්ථික මර්මස්ථාන සියල්ල හසුරුවා ගත නොහැකි තත්ත්වයකට පත් වෙලා මේ රට හිර වෙලා තිබෙනවා. මම හිතන විධියට ඒ හිර වීම සඳහා ප්‍රධාන වගඋත්තරකරුවෙකු තමයි, හැම දාම හිතුවක්කාරී ලෙස තමන්ගේ අභිමතය පරිද්දෙන් ප්‍රතිපත්ති තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්න උත්සාහ දරපු හිටපු මුදල් අමාත්‍යවරයා. එතුමා විසින් එක්සත් ජාතික පක්ෂයේ රජයන් ක්‍රියාත්මක නොකරන ඉතා වැරදිසහගත සමහර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නිසා ඇති වුණු අර්බුදය කරණ කොටගෙන දැවැන්ත ගෙවුම් ශේෂ අර්බුදයක් 2015 දී නිර්මාණය වුණා. ඒ අනුව වක්කඩ කැඩුවා වාගේ විදේශ විනිමය අපේ රටින් පිටට ගලාගෙන යන්න පටන් ගත්තා. නමුත්, රට ඇතුළට එන විදේශ විනිමය එලෙසින් වැඩි වුණේ නැහැ. ජාත්‍යන්තර සංචිතය අඩු වුණා, විදේශ ණය බර වැඩි වුණා. මේ, ඉතාම වාසිදායක තත්ත්වයන් රාශියක් නිර්මාණය වෙලා තිබුණු රටක්. යුද්ධයක් නැහැ, ලෝක ඛනිජ තෙල් අර්බුදයක් නැහැ, ලෝක ආහාර අර්බුදයක් නැහැ, ලෝක මූල්‍ය අර්බුදයක් නැහැ, ලෝකයේ ඉතාම ශුභදායක වාතාවරණයක් තිබුණු ඉතාම විශිෂ්ට ලෙස කළමනාකරණය කරනු ලැබූ ආර්ථිකයක් තමයි මෙලෙස විනාශ මුඛයට ඇදගෙන ගියේ.

එහෙම වෙනකොට 2016 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මැදිහත් වෙලා අපේ රටත් එක්ක ගිවිසුමක් ගැහුවා. ඒ අනුව, අවුරුදු තුනකට ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් දෙන්න නම්, මෙන්න මේ මෙන්න මේ කොන්දේසි ඉෂ්ට කරන්න ඕනෑය කියලා කිව්වා. ඒ අනුව, රජයේ ආදායම වැඩි කරන්න ඕනෑ; බදු පනත වෙනස් කරලා බදු වැඩි කරන්න ඕනෑ; රජයේ වියදම් අඩු කරන්න ඕනෑ; 2020 වන විට අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 3කට ගෙනෙන්න ඕනෑ; විනිමය අනුපාතය නිදහසේ තීරණය වන්න දෙන්න ඕනෑ; රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම කරන්න ඕනෑ; නම්‍ය විනිමය අනුපාත ප්‍රතිපත්තිය හඳුන්වා දෙන්න ඕනෑ. එවකට පැවැති රජය මේ කොන්දේසි ටිකට අත්සන් කළා. ඒ අනුව, ඔවුන් විටින් විට නියම කරනු ලැබූ ආකාරයට කටයුතු කළේ නැත්නම් වාරිකය නිදහස් කරන්නේ නැහැ. එක වරකට වාරිකය වශයෙන් දෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 169යි. ඔවුන් නියම කරන පරිදි කටයුතු කළේ නැත්නම් ඒ ඩොලර් මිලියන 169 දෙන්නේත් නැහැ. මෙලෙස විකාරරූපී ලෙස ආර්ථිකය කළමනාකරණය කිරීම නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම අපව හිර කළා. හිර කළාට පසුව අවසාන වතාවේ පස්වන වාරිකය නිදහස් කරන්න නම්, තවත් කොන්දේසියක් නියම කළා. මම මේ පිළිබඳව මීට කලිනුත් කිව්වා. තෙල් මිල සම්බන්ධයෙන් පැහැදිලි ලෙස මිල සූත්‍රයක් ක්‍රියාත්මක කරන්නම ඕනෑය කිව්වා. එසේ කළේ නැත්නම් ඊළඟ වාරිකය නිකුත් කරන්නේ නැහැයි කිව්වා. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි, රජයයි අතර ගැටුමක් ඇති වුණා. එහි ප්‍රතිඵලය වුණේ අද මධ්‍යම රාත්‍රී 12 සිට පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 20කින්, ඩීසල් ලීටරයක මිල රුපියල් 14කින්, භූමිතෙල් ලීටරයක මිල රුපියල් 57කින් වැඩි කළ බවයි කියලා මේ ගරු සභාවට මම මතක් කරන්න කැමැතියි.

මේක තමයි ඇත්ත, මේක තමයි මහ පොළොවේ යථාර්ථය. ආණ්ඩුවට කියන්නට බැහැ, මොන මොන මිල සූත්‍රද කියලා. පෙට්‍රල් මිල වැඩි වෙනවා, ඩීසල් මිල වැඩි වෙනවා, භූමිතෙල් මිල රුපියල් 57කින් වැඩි වෙනවා කියලා ආණ්ඩුවට කියන්නට බැහැ. නමුත් ආණ්ඩුවට නොකියා ඉන්නටත් බැහැ. මොකද, ඒක කිව්වේ නැත්නම් ණය මුදලේ පස්වෙනි වාරිකය හම්බ වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා රට හිර කරලා තිබෙන තැන පිළිබඳව අඩුම තරමින් අවබෝධයක් ලබා ගන්නට හොඳම උදාහරණය තමයි මෙය. මම මීට සති තුන හතරක ඉඳන් ආර්ථික පර්යේෂණ ඒකකයේදී මේ ගැන කිව්වා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ආපු සමීක්ෂණ කණ්ඩායම, -නිරීක්ෂණ කණ්ඩායම- ඉතා පැහැදිලිව රජයට කිව්වා මේ පිරිවැය පැහැදිලිව විද්‍යාමාන වන ආකාරයට ඛනිජ තෙල් පිළිබඳව සූත්‍රයක් හදන්නේ නැත්නම් අපි ඊළඟ වාරිකය නිකුත් කරන්නේ නැහැයි කියලා. ඒ තත්ත්වයට රට හිර කරලා, රට ගෙන යන්න බැරි තත්ත්වයට ඇද දමලා තිබෙනවා. කොවිවර මන්ත්‍රීවරුන් අකැමැති වුණත්, ඇමති මණ්ඩලය අකැමැති වුණත්, ජනාධිපතිතුමා අකැමැති වුණත්, කැබිනට් මණ්ඩලය අකැමැති වුණත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරියේ දණ ගහලා අද ඉඳන් පෙට්‍රල් ලීටරය රුපියල් 20කින්, ඩීසල් ලීටරය රුපියල් 14කින් සහ භූමිතෙල් ලීටරය රුපියල් 57කින් මිල වැඩි කරනවා.

පසුගිය 08වෙනි දා ජනාධිපතිතුමා එතුමාගේ ප්‍රකාශයේ සඳහන් නොකළත්, මහින්ද රාජපක්ෂ යුගයේ හදලා තිබුණු රට මේ අවුරුදු තුනේ කඩා වැටුණු ආකාරය පිළිබඳව දත්ත කිහිපයක් හැන්සාඩ් වාර්තාවට ඇතුළු වීම සඳහා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමැතියි. 2014 ආර්ථික වර්ධන වේගය සියයට 7.5යි. 2017 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අලුත්ම වාර්තාව අනුව රටේ සමස්ත නිමැවුමේ වර්ධන වේගය සියයට 3.1යි. මේ වර්ෂයේ ස්ථාවර මිලට ගණනය කළ දළ ජාතික නිෂ්පාදනය ඉකුත් වර්ෂයේ ස්ථාවර මිලට ගණනය කළ දළ ජාතික නිෂ්පාදනය සමඟ සාපේක්ෂව සැසඳීමේදී සලකා බලනු ලබන වර්ෂයේදී ජාතික නිෂ්පාදනයේ ඇති වුණු ප්‍රතිශතික වෙනස තමයි මේ සියයට 3.1 කියන්නේ. සියයට 7.5ක්ව තිබුණු රටේ දියුණුව, වර්ධනය, ප්‍රගතිය, ඉස්සරහාට යාම සියයට 3.1 දක්වා මන්දගාමීවෙලා පහත වැටිලා තිබෙනවා.

එදා මහින්ද රාජපක්ෂ යුගයේ කෘෂිකාර්මික අංශයේ වර්ධන වේගය සියයට 4.6යි. ගිය අවුරුද්දේ කෘෂිකාර්මික අංශයේ වර්ධන වේගය -0.8යි. පොහොර සහනාධාරය නැති කරලා, ගොවීන්ට වතුර දෙන්නේ නැතිව, ගොවීන්ට පොහොර දෙන්නේ නැතිව, වගා කරන්නට ඉඩ දෙන්නේ නැතිව, ගොවීන්ට මිලක් ගෙවන්නේ නැතිව, හදන දේ ගිය වියදමට ගන්නේ නැති වුණාම සමස්ත රටේ අතිමහත් බහුතර කෘෂි කර්මාන්තය වැටිලා තිබෙනවා -0.8 දක්වා. සුළු පරිමාණ කර්මාන්තකරුවන් නොසලකා හැරලා තිබෙනවා.

මහින්ද යුගයේ සියයට 4.7කින් කර්මාන්ත අංශය වර්ධනය වුණා. වක්කඩ කැඩුවා වාගේ පිට රටින් භාණ්ඩ ගෙනැල්ලා ඒ කර්මාන්තකරුවන්ගේ ජීවන උපාය සම්පූර්ණයෙන් නැති කළාට පස්සේ, 2017 වර්ෂයේ කර්මාන්ත අංශය වර්ධනය වෙලා තිබෙන්නේ සියයට 3.9කින් පමණයි.

බැංකු, රක්ෂණය, ප්‍රවාහනය, ගබඩාකරණය, සිල්ලර වෙළෙඳාම, තොග වෙළෙඳාම ඇතුළු සේවා අංශය සියයට 4.8කින් එදා වර්ධනය වුණත් අද වර්ධනය වෙලා තිබෙන්නේ සියයට 3.2කින්. එතකොට කෘෂි අංශයේ වර්ධනය අඩු වෙලා, කර්මාන්ත අංශයේ වර්ධනය අඩු වෙලා, සේවා අංශයේ වර්ධනය අඩු වෙලා. 2014දී දළ ජාතික ආදායම සියයට 5.1යි, 2017 වර්ෂයේ එය සියයට 3.1යි.

ඒක පුද්ගල ආදායම තිබුණේ ඇමෙරිකානු ඩොලර් 3,734ට. දැන් එය 3,956යි. එදා ඒක පුද්ගල ආදායම හැමදාම වැඩි වුණේ ඇමෙරිකානු ඩොලර් සිය ගණන්වලින්. එහි වැඩි වීමේ වේගය අද වන විට ඉතා විශාල ලෙස අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම එදා විරැකියාවේ අනුපාතය සියයට 4.3යි. අද එය සියයට 4.2යි. ඒ අඩු වීම වෙලා තිබෙන්නේ රක්ෂා අවස්ථා ජනිත වීම නිසා නොවෙයි. රටේ ශ්‍රම බලකාය වැඩි වීම නිසායි. විරැකියාවෙන් පෙළෙන සංඛ්‍යාව, ශ්‍රම බලකායෙන් බෙදලා සියයෙන් වැඩි කරලා තමයි විරැකියාවේ අනුපාතය, සේවා වියුක්ත අනුපාතය සොයා ගන්නේ. සේවා වියුක්තිය සියයට 4.2ට අඩු වුණාට අද රැකියා විරහිත උපාධිධාරින්ට නැවත වතාවක් කඳුළු ගෑස් ගහනවා; ජල ප්‍රහාර එල්ල කරනවා. රැකියා විරහිත උපාධිධාරින් ලක්ෂ ගණනක් නැවත වතාවක් පාරට බැහැලා "රක්ෂාවක් දියවු" කියන තත්ත්වයට පත් කරලා තිබෙනවා. එදා අපි රජය භාර ගන්නා විටත් එවැනි තත්ත්වයක් තිබුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු 3ක කාලයක් ඉතිරිව තිබෙනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මට තව විනාඩි 5ක කාලයක් ලබා දෙන්න, ගරු මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය සීමා සහිතයි. මිනිත්තු 3කින් කථාව අවසන් කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවා විවේකයත් විවාදය සඳහා ලබා ගත් නිසා මට තව මිනිත්තු 5ක කාලයක් ලබා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා හැකි ඉක්මනින් කථාව අවසන් කරන්න. ඔබතුමාට තව මිනිත්තු 3යි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඊළඟට, කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගැන බලන්න. එදා බඩු මිල වැඩි වුණේ සියයට 3.3කින්. 2017දී එය සියයට 6.6යි. ඊළඟට, තොග අළෙවි මිල දර්ශකය ගැන බලන්න. මහින්ද යුගයේ වැඩි වුණේ සියයට 3.2කින්. අද එය සියයට 17යි.

එදා දළ ජාතික නිෂ්පාදන අවධමනය සියයට 2.9යි. අද සියයට 8.3යි. මෙහෙම මිල වැඩි වීම නිසා මුදල් වැටුප වැඩි වුණත්, ඒ මුදල් වැටුපෙන් මිලදී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය අඩු වුණා. එහෙම නැත්නම් මූර්ත වැටුප අඩු වුණා. දැන් බලන්න, අලුත් මහ බැංකු වාර්තාවට අනුව පඩි පාලක සභා කර්මාන්තවල සේවකයන්ගේ මූර්ත වැටුප 2014 වසරේදී සියයට 3.7කින් වැඩි වුණා. 2017 වර්ෂයේ සතයක්වත් වැඩි වෙලා නැහැ. මහින්ද රාජපක්ෂ යුගයේදී රාජ්‍ය සේවකයන්ගේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 10.5කින් වැඩි වුණා. මේ අවුරුද්දේ බින්දුවයි. සතයකින්වත් වැඩි වෙලා නැහැ. ඊළඟට, ජාත්‍යන්තර වෙළෙඳාමේ වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් 8,287 සිට 9,616ට වැඩි වෙලා තිබෙනවා. ජංගම ගිණුමේ හිඟය ඇමෙරිකානු ඩොලර් 11,130 සිට 11,360ට වැඩි වෙලා තිබෙනවා. එදා ජාත්‍යන්තර නිල සංචිත ප්‍රමාණය 8.2ක් තිබුණා. අද 7.9යි. තවම එදා තිබුණු සංචිත මට්ටමට ගෙනෙන්න බැරි වුණා. එදා දළ විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව -විදේශ වත්කම්වල ආනයන හැකියාව- 5.1ක් වුණා. අවුරුදු 3කට පසුව 2017 වසරේ තිබෙන්නේ 4.6යි. එදා විදේශ ණය තිබුණේ බිලියන 43යි. දැන් බිලියන 52යි. එදා විදේශ ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 57යි. අද සියයට 59.5යි. එදා විදේශ ණය සේවා අනුපාතය සියයට 21.4යි. අද එය සියයට 23.9ට වැඩි වෙලා තිබෙනවා. එදා ඇමෙරිකානු ඩොලරයකට රුපියල් 131ක් ගෙව්වා. 2017 වර්ෂයේ රුපියල් 157ක් ගෙවනවා. එදා SDR -Special Drawing Rights- සඳහා රුපියල් 198ක් ගෙව්වා. දැන් රුපියල් 211ක් ගෙවනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මහින්ද රාජපක්ෂ යුගයේදී, රටේ යුද්ධය නිම කරලා, ලෝක බනිජ තෙල් අර්බුදයට, ලෝක ආහාර අර්බුදයට, ලෝක මූල්‍ය අර්බුදයට මුහුණ දීලා මේ රට පහළ මැදි ආදායම් ලබන රටක් බවට උස්සලා මුළු රටම වැඩ බිමක් කරලා තිබුණා. අද මේ රට මුඩු බිමක් කරලා තිබෙනවා. මේ වන විට රටට අහිතකර, පළිගැනීමේ චේතනාවෙන් යුත් මර්දන යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරනවා මිසක්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
රටේ ජනතාවට වගතුවක් කරන්න තමුන්නාන්සේලාට පුළුවන්කමක් නැති බව මොනවට පැහැදිලි වෙනවා. අද ජනාධිපතිතුමාගේ ප්‍රකාශය රකින්නවත් එක්සත් ජාතික පක්ෂයේ පිරිසක් නොමැති වීමෙන් එය මොනවට පැහැදිලි වන බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. M.A. Sumanthiran. You have 20 minutes.

[2.37p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you Hon. Presiding Member for the opportunity to say a few words at this Adjournment Debate on the Inaugural Address made by His Excellency the President at the inauguration of the Second Session of the Eighth Parliament on the 08th of May; just two days ago.

Let me also add my own disappointment at the Address made by His Excellency the President at this Inaugural Session and say why many people in this country feel that sense of disappointment. President Maithripala Sirisena was elected by the people of this country - by all the peoples of this country - on the 08th of January, 2015 on a rather challenging but a clear mandate. We all wished that he would be equal to the task and various political parties joined hands in supporting him to achieve what he set out and what the people of this country had mandated him to do. There has been progress. One must not grudge that and I would even go as far as to say "significant progress" in certain areas, particularly in the area of democratic governance and transparency. Most of all, to usher in an environment free of fear of abduction and various other oppressive measures, there has been significant progress; but the mandate that was handed to the President and later in August, 2015 to the National Government, was far more ambitious than that. Ambitious it may have been, but it was also achievable because as I said earlier, different peoples who inhabit this island, not only of different ethnic, language and religious backgrounds but also different political philosophies, joined hands together and identified those important aspects that had to be dealt with if this country was to move forward; and fundamental to that was to have a new Constitution for this country. I say "fundamental" because that is a fundamental law of this country, the foundational law, the social contract upon which the peoples of this country agree to live together as a country. It is as basic as that. Within a few months of the new National Government taking office, the President himself addressed Parliament on the 09th of January, 2016 on completion of one year as President and if one were to compare the Speech he made that day, here, in this House, with the Inaugural Address made two days ago, one sees a glaring gap, a huge chasm. On that day, he was very clear as to the path that this new Government should trod - not just the Government, but all in this House - because that was a Resolution to appoint a Constitutional Assembly that would draft a Constitution for this country.

That Resolution, as was stated earlier by the Hon. Leader of the Opposition today, was adopted unanimously without a Division by this House on the 09th of March, 2016. There has rarely been such consensus. Even in the Nineteenth Amendment to the Constitution, one Member voted against that Bill. In the Seventeenth Amendment to the Constitution, one Member abstained, but in the Resolution that was adopted by this Parliament to appoint a Constitutional Assembly, there was no one who even called for a Division. It was adopted unanimously.

Such was the degree of consensus that this House had to which the President gave leadership and there has been, as we all know, a Steering Committee headed by the Prime Minister, there have been several Subcommittees and those reports have been placed before the Constitutional Assembly. Unfortunately though, after five days of intense debate on the Interim Report in September and October last year, nothing has happened thereafter. The primary purpose for which a National Government was formed is not even referred to specifically in the President's Inaugural Address and that is the basis, the main reason, for our disappointment.

There have been some translation errors also, I believe, because what the President said in his address in Sinhala, "දේශපාලනික තීන්දු" has been translated into English as "political agreements" rather than "political solutions" and in Tamil too as "அரசியல் தீர்மானங்கள்" instead of "அரசியல் தீர்வு". But, that is just a minor detail. The most important work that has been going on parallely with Parliament where there is a Constitutional Assembly consisting of all Members of Parliament has not even been referred to and that is a very serious issue. The President did refer to post-war reconciliation efforts, but even there, there are glaring errors and I will only cite one. In his Address he said, "85 per cent of private land has been returned to the owners." He said that on the 8th of May. On the 9th of May in "Daily FT", the Security Forces Commander Jaffna, Major General Dharshana Hettiarachchi, has said that nearly 75 per cent of military-held lands have been released to owners. A huge gap of 10 per cent! He does not even say that 75 per cent has been returned, he says, "nearly 75 per cent" and the President says the previous day, "85 per cent has been released." As far as we, who represent those people, who are representatives from those areas, know nowhere near even 75 per cent of private lands has been returned. So, one sees the seriousness with which some of these statistics have been put out and that again adds to the disappointment.

இந்த எட்டாவது பாராளுமன்றத்தின் இரண்டாவது கூட்டத்தொடரை ஆரம்பித்துவைத்து மேதகு ஜனாதிபதி அவர்கள் ஆற்றிய உரை சம்பந்தமான ஒத்திவைப்புவேளைப் பிரேரணையிலே இப்பொழுது நாம் உரையாற்றிக் கொண்டிருக்கின்றோம். இந்தப் பாராளுமன்றத்தின்மூலம் ஒரு தேசிய அரசாங்கம் அமைக்கப்பட்டு, அதிலே முக்கியமான ஒரு விடயமாக இடம்பெற்றுக்கொண்டிருக்கின்ற புதிய அரசியல் யாப்புக்கான வரைவு சம்பந்தமான முயற்சிகள் தொடர்பில் மேதகு ஜனாதிபதி அவர்கள் தன்னுடைய உரையில் குறிப்பிடாதது மிகுந்த ஏமாற்றத்தையளிக்கின்றது. ஆனால், ஜனாதிபதி அவர்கள் அதனைக் குறிப்பிடாததன் காரணமாக அது தோற்றுப்போன விடயம் என்றோ அல்லது அது இனி நடைபெறாது என்றோ எவரும் அதனைக் கைவிட்டுவிட

முடியாது. ஏனென்றால், அது ஒரு தனி மனிதனுடைய அபிலாஷையல்ல; அவருடைய தேர்தல் விஞ்ஞாபனத்தை ஏற்றுக்கொண்டு வாக்களித்த அனைத்து மக்களும் அதனைச் செய்யுமாறு அவரைப் பணித்திருக்கின்றார்கள். இன்று காலை கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்கள் சுட்டிக்காட்டியதைப் போன்று மேதகு ஜனாதிபதி அவர்களுக்கெதிராகப் போட்டியிட்ட முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களும் தன்னுடைய தேர்தல் விஞ்ஞாபனத்திலே "புதிய அரசியலமைப்பை உருவாக்குவேன்" என்று சொல்லியிருக் கின்றார். ஆகவே, இந்த நாட்டிலுள்ள வாக்களிக்கின்ற மக்களிலே 90 சதவீதத்திற்கு மேற்பட்டவர்கள் புதிய அரசியல் யாப்புக்கான ஆணையைக் கொடுத்திருக்கின்றார்கள்.

இந்த முழுப் பாராளுமன்றமும் ஒன்றுசேர்ந்து ஓர் அரசியலமைப்புப் பேரவையை உருவாக்கி, அது எப்படியான செயலிலே இறங்க வேண்டும் என்பதைச் சுட்டிக்காட்டி, ஒரு தீர்மானத்தை நிறைவேற்றியதனூடாக அதற்கான பல முயற்சிகள் இதுவரைக்கும் நடந்திருக்கின்றன. ஆகையினால், இந்த அங்குரார்ப்பண உரையிலே அது தெளிவாகச் சுட்டிக்காட்டப்படாத ஒரு காரணத்தினால் அதனைக் கைவிடப்பட்டதாகக் கருதப்போவதில்லை என்பதைத் தெளிவாக இந்தச் சபைக்கும் நாட்டுக்கும் நாங்கள் சொல்லிவைக்கக் கடமைப்பட்டிருக்கின்றோம். அனைத்து மக்களும் சேர்ந்து செய்கின்ற மிகப் பிரதானமான இந்தப் பணியை நாங்கள் தொடர்ந்து முன்னெடுப்போம். மேதகு ஜனாதிபதி அவர்களும் இந்த ஆணையைப் பெற்றவராக, இனியிருக்கின்ற சொற்ப காலத்தில் அதற்குத் தலைமைதாங்கி அதனை நடத்தவேண்டும். அது அவருடைய பாரிய கடமை. அந்தக் கடமையிலிருந்து அவர் தவற முடியாது என்பதையும் நாங்கள் சுட்டிக்காட்ட விரும்புகின்றோம்.

இந்த முயற்சிக்குத் தேவையான அனைத்து ஒத்துழைப்பையும் இதுவரைக்கும் நாங்கள் வழங்கிய அதே வேகத்திலேயே தொடர்ச்சியாகவும் முழுமையாகவும் கொடுப்போம். ஆனால், அரசாங்கம் இதனை முன்னெடுக்கத் தயங்கினால், அரசாங்கம் அதனைச் செய்துமுடிப்பதற்கான முழு அழுத்தத்தையும் நாங்கள் நிச்சயமாகப் பிரயோகிப்போம். ஏனென்றால், இது வெறுமனே தமிழ் மக்களுக்கான ஓர் அரசியல் தீர்வு மட்டுமல்ல, அவர்களுக்கு அத்தியாவசிய மானதுமான ஒரு விடயம்! சுதந்திரம் கிடைத்ததிலிருந்து 70 வருடங்களாகத் தேசிய வாழ்க்கையிலிருந்து புறக்கணிக்கப் பட்டு வெளியேற்றப்பட்டிருக்கின்ற இந்த மக்கள் நாட்டிலே ஒரு புதிய சமூக ஒப்பந்தத்தின் அடிப்படையிலே ஒன்றாக வாழுவோமென்று முன்வருகின்றபோது, சம்பந்தப் பட்டவர்கள் அதனைப் புறந்தள்ளுகின்ற வகையிலே செயற்பட்டால், வேறு பல பிரதிபலன்கள் ஏற்படக்கூடும். எனவே, இது இந்த நாட்டிலே வாழுகின்ற சிங்கள மக்களுக்கும் முஸ்லிம் மக்களுக்கும் மற்றும் ஏனைய எல்லா மக்களுக்கும் நாட்டின் சுபிட்சத்திற்காக மிகவும் அடிப்படையானதும் அத்தியாவசிய மானதுமான ஒரு தேவையாக இருக்கின்றது. இந்தச் செயற்பாட்டை இந்தப் பாராளுமன்றம் இன்று எடுத்துச் செல்லுகின்றது. மேதகு ஜனாதிபதி அவர்கள் தன்னுடைய கொள்கை விளக்க உரையிலே இதனைப் பற்றிக் குறிப்பிடாமல் - இதனுடைய முக்கியத்துவத்தைப் பற்றிச் சொல்லாமல்விட்டது ஒரு பாரிய குறைபாடாக இருந்தாலும் கூட, அந்த செயற்பாடு தொடர்ந்தும் மேற்கொள்ளப்பட வேண்டும்; அந்தச் செயற்பாடு நடைபெறும்; அதனை நாங்கள் நடைபெறச் செய்வோம்! என்பதை உறுதியாகச்சொல்லி, என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன்.

நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.51]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාර්ලිමේන්තු සැසිවාරය කල් තැබුවාට පසුව අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හැටියට මැයි මාසයේ 08වැනි දා කළ කථාව පිළිබඳව පවත්වන විවාදයේදී කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ එම ප්‍රකාශය තුළ එක තැනක සඳහන් වුණා, "මෙම රජය පිහිටුවීමේදී, අප හමුවේ ජාතික අභියෝග ගණනාවක් තිබුණි. පළමුවැන්න වූයේ ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍ය යළි ස්ථාපිත කිරීමයි. දෙවැන්න නම් ජාතීන් අතර විශ්වාසය හා සමගිය තහවුරු කිරීමයි" කියලා. ඒ අනුව 2015 ජනවාරි 08වැනි දා අතිගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණයෙන් පසුව පත් වුණු යහ පාලන ආණ්ඩුවේ අප සියලුදෙනාම මූලික වශයෙන් මේ රටේ නීතියේ ආධිපත්‍ය ඇති කිරීම සහ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම පිළිබඳව අභියෝගයට ලක් වෙලා තිබුණා. එම අභියෝගවලට මුහුණ දෙන්න පුළුවන් හැකියාව, ශක්තිය එදා අපට තිබුණා. නමුත් දෙවැනි කාරණය විධියට, අතිගරු ජනාධිපතිතුමාත් සඳහන් කළ ආකාරයට "ජාතීන් අතර විශ්වාසය හා සමගිය තහවුරු කිරීම" කියන කාරණයේ දී පසුගිය අවුරුදු දෙකහමාර තුළ අපට එය ඉටු කර ගන්න බැරිවෙලා තිබෙනවා.

මේ රටේ ජනතාවට විශාල බලාපොරොත්තු දීලා තමයි අපි මේ රජය ගොඩනැඟුවේ. පසුගිය කාලයේ ඒකාබද්ධ විපක්ෂය නැත්නම් එදා ආණ්ඩුවේ සිටි උදවිය මේ රට තුළ ජාතිවාදය, ආගම්වාදය අවුස්සාගෙන පැසිස්ට්වාදී පාලනයක් හරහා නැවත මේ රට වර්ගවාදී ගැටුම්වලට තල්ලු කරලා, මේ රට ආපස්සට ගෙන යන්න; මිලේච්ඡත්වයට ගෙන යන්න යම් උත්සාහයක් දැරුවා. එදා, 2015 ජනවාරි 08වැනි දා මේ රටේ ඉන්න සියලු ජන කොටස් එකතුවෙලා මේ රටේ ජාතිවාදය ප්‍රතික්ෂේප කළා; පවුල්වාදය ප්‍රතික්ෂේප කළා; ඒකාධිපතිවාදය ප්‍රතික්ෂේප කළා. ඒවා ප්‍රතික්ෂේප කරලා තමයි අපි සියලුදෙනාම එකතුවෙලා යහපාලන ආණ්ඩුව ගොඩනැඟුවේ. අපි මේ ආණ්ඩුව ගොඩනැඟුවාට පසුව ගත වූ අවුරුදු දෙකහමාර දෙස ආපසු හැරිලා බලනකොට අපට ඒ තරම් සන්තෝෂ වන්න පුළුවන් දේවල් සිදුවෙලා නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් යම් ප්‍රමාණයකට, යම් යම් ප්‍රතිසංස්කරණ කරන්න පුළුවන් වුණත් මේ රටේ ජාතික සමඟිය, සමානතාව තහවුරු කිරීම පැත්තෙන් අපි අසමත් වුණු ආණ්ඩුවක්ය කියන එක කියන්න ඕනෑ. අපට ඒක කරන්න බැරිවෙලා තිබෙනවා. ඒක කරන්න බැරි වුණු නිසා තමයි, එදා මාර්තු මාසයේ නුවර, දිගන ප්‍රදේශයේ ජාතිවාදී කලබල ඇති කරලා විශාල විනාශයක් කරන්න උත්සාහ කළේ.

මේ රටේ නැවත ජාතිවාදී ගිනිදැල් අවුස්සන කාල පරිච්ඡේදයකට අපි මුහුණ දුන්නා. නමුත් අපි මන්ත්‍රීවරු හැටියට රජය තුළ ඉඳගෙන මේ කාරණාව ගැන අතිගරු ජනාධිපතිතුමාව දැනුවත් කළා. අපි ආණ්ඩුව දැනුවත් කළා. "අපි පරාජය කළ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ජාතිවාදී, ආගම්වාදී හොල්මන් නැවත මේ සමාජය තුළ හිස ඔසවන්න පටන් ගෙන තිබෙනවා, ඒකට ඉඩ දෙන්න එපා, ඒක නවත්වන්න. ඒක ඉස්සරහට ගියොත් නැවත මේ රට විශාල අර්බුදයකට ලක් වෙනවා" යි කියන පණිවුඩය ආණ්ඩුව තුළ ඉඳගෙන අපි ලබා දුන්නා. නමුත් ඒක හරියට "බීරි අලින්ට වීණා වාදනය කරනවා වාගේ " තමයි වුණේ. ඒ ගැන සැලකිල්ලක් තිබුණේ නැහැ. ඒ සැලකිල්ල නොතිබුණු නිසා තමයි එදා, ඒ දවස් තුන තුළ ජාතිවාදී, ආගම්වාදී සුළු පිරිසකට නීතිය අතට අරගෙන මේ රටේ විශාල කලබලයක් ඇති කරන්න, විශාල විනාශයක් කරන්න පුළුවන් වුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකයි තිබෙන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට විනාඩි අටක් තිබෙනවා කියලායි කිව්වේ.

අපේ ගරු රංජිත් මන්දුම බණ්ඩාර ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා නීතිය හා සාමය ඇමතිකම භාර ගත්තාට පස්සේ -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, සමාවන්න. ඔබතුමාට තව මිනිත්තු හතරක කාලයක් තිබෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නීතිය ක්‍රියාත්මක කරමින්, එම අසාධාරණයට ලක් වුණු ජනතාවට; පීඩාවට පත් වුණු ජනතාවට නීතිය පැත්තෙන් යම් සාධාරණයක් ඉෂ්ට කරන්න එතුමාට හයියක්; ශක්තියක් තිබුණ එක ගැන අපි සන්තෝෂ වෙනවා.

අද අපි නැවත විශාල අර්බුදයකට ලක්වෙලා තිබෙනවා. මේ යහපාලන ආණ්ඩුව පටන් ගන්නකොටම අපි පෙන්වා දුන්නා, මේවා නවත්වන්න නීති ගේන්න කියලා. Hate Speech Bill එක ගැන අපි කථා කළා. නමුත් අපට තවමත් ඒක ගේන්න බැරි වුණා. ඒක තවම කැබිනට් එකේ හිරවෙලා තිබෙනවාද, එහෙම නැත්නම් වෙනත් කොහේ හරි හිරවෙලා තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. අපි ඒ ගැන සාකච්ඡා කරනවා, හැමදාම පාර්ලිමේන්තුවේ ඒ ගැන කියනවා. නමුත් එම පනත් කෙටුම්පත තවම ගෙනැවිත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමානතාව මත මේ රටේ ජාතීන් අතර සමගිය, විවිධත්වය තුළ එකමුතුභාවය කියන එක ඇති කිරීම තමයි අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය.

ඒ විවිධත්වය තුළ අපිට එක්සත්කම හදා ගන්න බැරි නම්, ඒ විවිධත්වය තුළ අපිට සමගිය හදා ගන්න බැරි නම්, මම හිතන්නේ නැහැ අපිට ආර්ථික සංවර්ධනය ළඟා කර ගන්න පුළුවන් කියලා. සිංගප්පූරුව වෙන්න පුළුවන්, මැලේසියාව වෙන්න පුළුවන්, වෙනත් නොයෙකුත් රටවල් ගැන වෙන්න පුළුවන් අපි එක එක සිහින අපේ ඔළුවල තියාගෙන ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජීවත් වන ඒ විවිධ ජන කොටස් තුළ තිබෙන හැඟීම්, ඔවුන්ගේ සංස්කෘතිය, ඔවුන්ගේ අයිතිය, ඔවුන්ගේ භාෂා අයිතිය වැනි විවිධත්වයන් තුළ එක්සත්කම හදා ගන්න බැරි නම් අපට ඒ අරමුණු එකක්වත් ළඟට යන්න බැරි වන බව අපි මතක තියාගන්න ඕනෑ. අපි අවුරුදු 30ක යුද්ධයකට මුහුණ දුන් රටක්. ඒ යුද්ධයෙන් මේ රටේ ඉන්න සියලුදෙනාම විනාශ වුණා. උතුරු නැඟෙනහිර සිටින දරුවන් වෙන්න පුළුවන්, දකුණේ ඉන්න අපේ දරුවන් වෙන්න පුළුවන්, නැඟෙනහිර ඉන්න උදවිය වෙන්න පුළුවන්, ඒ සියලුදෙනාම අපේ රටේ ජනතාව; අපේ රටේ සම්පත්; අපේ රටට අයිති වෙලා තිබුණු දේවල්. මේ යුද්ධය නිසා අපේ රට විශාල බෙදවාචකයකට මුහුණ දුන්නා. 2009දී යුද්ධය අවසන් වෙලා, අලුත් යුගයකට යන්න ඕනෑය, අලුත් රටක් හදන්න ඕනෑය කියා අපි සියලුදෙනාම කථා කළා; අපි ඒ ගැන කල්පනා කළා. නමුත් ඒ ගමන අද නැවතිලා තිබෙන බව අපිට පෙනෙනවා.

අපි මේ ආණ්ඩුව තුළ ඉඳගෙන මේ ආණ්ඩුවේ ජනාධිපතිතුමාට මේ කාරණය කියනවා. සමානතාව ගැන, ජාතීන් අතර එකමුතුභාවය හදන එක ගැන වචනවලට සීමා කරලා දේශනා දීලා, නැත්නම් චිත්‍රපට හදලා, එහෙමත් නැත්නම් නාට්‍ය හදලා ජාතික සමඟිය හදන්න බැහැ. ඒක ක්‍රියාවෙන් පෙන්වන්න ඕනෑ. ජනාධිපතිතුමා ඊයේ පෙරේදා ආණ්ඩුකාරවරු නවදෙනෙක් පත් කළා. නමුත් ඒකට එකම මුස්ලිම් ජාතිකයෙකුවත් ඇතුළත් වුණේ නැහැ. ඇයි ඒ? මීට කලින් බාකීර් මාකාර් මැතිතුමා මේ රටේ ආණ්ඩුකාරවරයකු ලෙස කටයුතු කළා. අලවි මවුලානා මැතිතුමා ආණ්ඩුකාරවරයකු ලෙස කටයුතු කළා. නමුත් ඊයේ පෙරේදා පත් කළ ඒ ආණ්ඩුකාරවරු නවදෙනාට එකම මුස්ලිම් ජාතිකයෙකුවත් එකතු කරන්න එතුමාට අමතක වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒක තමයි අපිට ඕනෑ වෙලා තිබෙන්නේ. කථාවලින්, දේශනා දීමෙන්, එහෙම නැත්නම් වෙන වෙන දේවල් කියලා ජාතික සමඟිය හදන්න බැහැ. පහළ මට්ටමේ ජනතාවගේ සැබෑ ප්‍රශ්න හඳුනාගෙන, ඒ ජාතීන් මුහුණ දෙන ගැටලු හඳුනාගෙන, ඒ ප්‍රශ්න උඩ අපි විසඳුමකට යනවා නම් විතරයි අපිට මේ තිබෙන විවිධත්වය තුළ එක්සත්කම හදන්න පුළුවන් වන්නේ කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජීබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

[අ.භා. 2.59]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් අටවන පාර්ලිමේන්තුවේ දෙවන සැසි වාරය විවෘත කරමින් කරන ලද කථාව පිළිබඳව අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධ විවාදයේදී මගේ පෞද්ගලික අදහස් මෙන්ම, මා නියෝජනය කරන එක්සත් වාමාංශික පෙරමුණේ සහ ලංකා සමසමාජ පක්ෂයේ බහුතර කණ්ඩායමේ අදහස් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

අතිගරු ජනාධිපතිතුමා කළ කථාවේදී එතුමා පසුගිය අවුරුදු දෙකහමාර තුළ මෙම යහ පාලන රජය විසින් ලබා ගත් ජයග්‍රහණ පිළිබඳව සඳහන් කළා. 2015ට කලින් මෙන් නොව, අද ආණ්ඩුව විවේචනය කිරීමට, කථා කිරීමට රට තුළ නිදහස තිබෙනවා. හය නැතුව අගමැතිවරයා හෝ ජනාධිපතිවරයා හෝ විවේචනය කිරීමට නිදහස තිබෙනවා. අද මේ රටේ වඩා නිදහස් වාතාවරණක් තිබෙනවා. එය අප ලද ජයග්‍රහණයක්. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් අපි බලාපොරොත්තු වුණු යම් යම් වෙනස්කම් කරන්න අපිට පුළුවන් වුණා. එහෙත් එදා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තියා සරල බහුතරයක්වත් නැති තත්ත්වයක අපේ සියලු අරමුණු ඉෂ්ට කර ගන්න අපට පුළුවන් වුණේ නැහැ.

තොරතුරු දැනගැනීමේ අයිතිය අපි මූලික අයිතිවාසිකමක් හැටියට පිළිගත්තා පමණක් නොවෙයි, ටිකක් ප්‍රමාද වී හෝ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගත්තා. එම පනතේ විශේෂයෙන් සඳහන් කර තිබෙන ඒවා ඇරෙන්නට අනෙක් ඕනෑම තොරතුරක් ලබාගැනීමට ඕනෑම පුරවැසියකුට අයිතියක් තිබෙනවා. අද ස්වාධීන කොමිෂන් සභා පිහිටුවලා තිබෙනවා. ස්වාධීන කොමිෂන් සභා ස්වාධීනව කටයුතු කරන බව අපට පෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දේවල් අතරේ කනගාටුවෙන් යුතුව කිවයුතු කාරණයකුත් තිබෙනවා. "මේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත නිසා කිසිම දෙයක් කරන්න බැහැ, ඇමතිවරුන්ට තමන්ට ඕනෑ විධියට පෙට්ටල්වත් ගහන්න බැහැ, මේ පනත යටතේ පුරවැසියන් ඉල්ලීම් කරලා ඒ තොරතුරු හොයා ගන්නවා" කියා අපේ පැත්තෙන්ම කෙදිරිගෑම් ඇහෙනවා.

අන්න ඒ වාගේ කෙදිරිලිත් තිබෙනවා. ඒවාට තමයි එම පනත ගෙනාවේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ගෙනාවේ මේ රටේ මොකද වෙන්නේ කියා පුරවැසියන්ට දැනගන්නයි. ස්වාධීන කොමිෂන් සභාත් අගය කරන අතරේ, අපේ පැත්තෙන්ම සමහරවිට කෙදිරිය අපිට ඇහෙනවා, "අපිට ඕනෑ විධියට පොලිස් නිලධාරියෙක්වත් මාරු කරන්න බැහැ නේ, අද පොලිස් කොමිසමක් තිබෙනවා නේ" කියලා. ස්වාධීන පොලිස් කොමිසමක් ගෙනාවේ ඒකට තමයි. එහෙම නැතිව, දේශපාලනඥයන්ට ඕනෑ විධියට පොලිස් නිලධාරීන් මාරු කරන්න නොවෙයි. ඊට අදාළ රීතින්ට අනුකූලව ස්වාධීන කොමිසමක් අතින් ඒ කටයුතු කෙරෙන්නයි පොලිස් කොමිසම පත් කළේ. ඉතාම ඉහළ නිලධාරීන් -ජනාධිපති කාර්යාලයට සම්බන්ධ නිලධාරියකු ඇතුළු නිලධාරීන්- අත් අඩංගුවට ගන්නට පුළුවන් වී තිබෙන ආකාරය ඊයේ පෙරේදා අපි දැක්කේ අල්ලස් කොමිසම ස්වාධීන කොමිසමක් කළ නිසායි. ඒ පිළිබඳව මේ රටේ ජනතාව සතුටු වෙනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. අල්ලස් කොමිසමට හා එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු පිරිසට අපි ප්‍රශංසා කරනවා. ඒ වාගේ ජයග්‍රහණ තිබෙනවා. හැබැයි ඒ ජයග්‍රහණවත් ප්‍රමාණවත් ලෙස රටට සන්නිවේදනය කර තිබෙනවාද කියා ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 8වන දා අප දුන් පොරොන්දුව අනුව අද අප ඉදිරිපිට තිබෙන ප්‍රධාන කාර්යයක් තමයි, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම. ඒ පිළිබඳව මෙහෙයුම් කාරක සභාවේ අතුරු වාර්තාවක් තිබෙනවා. එතැනින් එහාට දැන් මාස ගණනක සිට අපි හිර වෙලා ඉන්නේ. මෙහෙයුම් කාරක සභාව ඉතාම ඉක්මනින් නැවත කැඳවනවාය කියා අපට අද දැනගන්න ලැබුණා. දැන් ඉතිරි කාර්යය සම්පූර්ණ කළ හැක්කේ ප්‍රධාන පක්ෂ දෙකටයි. කෙළින්ම කියනවා නම්, එක්සත් ජනතා නිදහස් සන්ධානයට; වඩා නිවැරදිව කියනවා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සහ එක්සත් ජාතික පක්ෂයටයි. මේ ප්‍රධාන පක්ෂ දෙකේ තීරණය මත තමයි අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනාගතය තීන්දු වන්නේ. ප්‍රධාන පක්ෂවල නායකත්වය අතේ තමයි ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ අනාගතය අද රැඳී තිබෙන්නේ. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කරන්න නම්, ඒ නායකත්වයන් ක්‍රියාශීලීව මැදිහත් වන්න ඕනෑ. කෙටියෙන් කියනවා නම්, වැඩේට බහින්න ඕනෑ; ඒ පිළිබඳව උණ තියෙන්න ඕනෑ. එහෙම නැතිව Steering Committee එකට ඕනෑ දෙයක් කර ගන්න දීලා, නැත්නම් පාර්ලිමේන්තුවට ඕනෑ එකක් කර ගන්න දීලා, එහෙමත් නැත්නම් පාර්ලිමේන්තුව තීරණය කරන ඕනෑම දෙයක් අපි පිළිගන්න ලැහැස්තියි කියා මේ කාරණාවෙන් ගැලවෙන්න බැහැ. ප්‍රධාන පක්ෂ දෙකේ නායකත්වයන් ක්‍රියාශීලීව මේ වැඩේට බහින්න ඕනෑ; තමන්ගේ පක්ෂ තමන්ගේ ස්ථාවරයන්ට ගන්න ඕනෑ. මේ පිළිබඳව 2015 ජනවාරි 8වන දා අපි ජනතාවට දුන් පොරොන්දු, ජනතාවගේ අපේක්ෂා අනුව කටයුතු ඉටු කිරීමට ක්‍රියාශීලීව කැප වෙන්න ඕනෑ. මමත් මේ කටයුත්තට සම්බන්ධ වී සිටින කෙනෙක් නිසා හුඟදෙනෙක් මගෙන් අහනවා, "කෝ කෙටුම්පතක් තිබෙනවා ද?" කියා. ප්‍රධාන පක්ෂ දෙකවත් එකඟ වෙන්නේ නැතිව කෙටුම්පතක් තිබෙන්නේ කොහොමද? අතුරු වාර්තාව හා අනුකමිටු වාර්තා හය මත කෙටුම්පතක් හදන්න අපිට පුළුවන්. එතකොට කියාවි, ජයම්පති වික්‍රමරත්න සහ සුමන්තිරන් එක්කාසු වෙලා වාර්තාවක් හැදුවාය කියා. අන්තවාදීන් දැනටමත් කියනවා කෙටුම්පතක් හැදුවාය කියා. අපිට කෙටුම්පතක් හදන්න බැහැ. අපිට අයිතියක් නැහැ, කෙටුම්පතක් හදන්න. ප්‍රධාන පක්ෂ

[ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

දෙක ඇතුළුව මෙහෙයුම් කාරක සභාවේ -Steering Committee එකේ- මූලික එකඟත්වයක් තිබෙන්න ඕනෑ, කෙටුම්පත හැදෙන්න. එම නිසා අද අවශ්‍ය වන්නේ ඒකයි. ඒකට නායකත්වය අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දහනව වන සංශෝධනය ගෙනාවේ තුනෙන් දෙකක බලයක් තබා සරල බහුතරයකුත් නැතිවයි. ආසන පණිවක් හැටක් තිබුණේ නැහැ; මන්ත්‍රීවරු පණිවක් හැටක් සිටියේ නැහැ. ඒත් විරුද්ධ පක්ෂයත් එකඟ කර ගෙන අපට එය ගෙන එන්න පුළුවන් වුණා. මොකද රටේ ජනතාව සහයෝගය දුන්නා. ජනතාවගෙන් ආපු පීඩනය -pressure එක- නිසා පාර්ලිමේන්තුවටත්, විරුද්ධ පක්ෂයේ අයටත් සිද්ධ වුණා, ඒ දෙස සුබදායක ලෙස බලන්න; ඊට දායකත්වය දෙන්න. එම නිසා අපට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගෙන එන්න පුළුවන් වුණා. අද, හැම අවුරුද්දකම අපි අය වැය ලේඛනය තුනෙන් දෙකක බලයකින් සම්මත කරනවා. නමුත් මේ නව ව්‍යවස්ථාව පිළිබඳව එකඟත්වයකට එන්න අපට තවම බැරි වෙලා තිබෙනවා. එම නිසා මේ පිළිබඳව අපි බොහොම තදින් කියන්න ඕනෑ. මා නියෝජනය කරන එක්සත් වාමාංශික පෙරමුණ වෙනුවෙන් මම බොහොම පැහැදිලිව කියනවා, කරුණාකර කැප වෙලා මේ වැඩේට බහින්නය කියා. ප්‍රධාන පක්ෂ දෙකට මේ පණිවුඩය දෙන්න ඕනෑ.

අද උතුරු, නැඟෙනහිර තත්ත්වය වෙනස් වෙමින් පවතිනවා. අන්තවාදී කොටස්වල ශක්තියේ වැඩි වීමක් දක්නට ලැබෙනවා. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අපි ඒ බව දැක්කා. පසුගිය මැයි දිනයේදී අන්තවාදී කොටස් යාපනයේ වඩා හොඳ "ෂෝ" එකක් දැම්මා. අපිට මේවා ගැන සතුටු වෙන්න බැහැ. විදේශගත අන්තවාදීන් තවම ක්‍රියාත්මක වෙමින් ඉන්නවා. එම නිසා ඒ අන්තවාදීන් තවත් ශක්තිමත් වන විධියට දකුණ ක්‍රියා නොකළ යුතුයි. මේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න ඕනෑ.

ඉඩම් ආපසු දෙන එක බොහොම හොඳයි. ඒකට අපි කවුරුත් පක්ෂයි. දෙමළ භාෂාවෙන් ජාතික ගීය ගායනා කරනවාටත් අපි පක්ෂයි. අපි ඒ ගැන බොහොම සතුටු වුණා. එදා නිදහස් දිනයේදී අපේ සමහර මන්ත්‍රීවරුන්ගේ ඇස්වලට කඳුළු ආවා. නමුත් ඉඩම් ආපසු දීලා, ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගායනා කරලා පමණක් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මෙයට දේශපාලන විසඳුමක් අවශ්‍යයි; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල විසඳුමක් අවශ්‍යයි. ජාතිවාදීන්ට උඩ ගෙඩි දීම පිළිබඳව අපි පසු ගිය ආණ්ඩුවට දොස් කිව්වා. ජනවාරි 08 වැනිදා වෙනසට සම්බන්ධ වූ අය බලාපොරොත්තු වුණා මේ ආණ්ඩුවෙන් ඒ ජාතිවාදය මැඩලයි කියා; උතුරේත් දකුණේත් දෙකේම අන්තවාදී කොටස්වලට විරුද්ධව පැහැදිලි පියවර, නිශ්චිත පියවර ගනීවි කියා. නමුත් එසේ පියවර ගෙන නැහැ. මීට කලින් කතාවේදී ඔබතුමා ද ඒ පිළිබඳව සඳහන් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට ඒ ගැන තිබෙන්නේ කනගාටුවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යවස්ථාවක් කියන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමත්, බලය බෙදා හැරීමත් විතරක් නොවෙයි, ඊට තවත් එහා යන වැදගත් කාරණා අපට ඉෂ්ට කරන්න තිබෙනවා. මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් අපට තිබෙන්න ඕනෑ. අපට තිබෙන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්වල පරාසය පුළුල් කරලා ආර්ථික අයිතිවාසිකම්, සමාජ අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, සංස්කෘතික අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම්, ආබාධිතයන්ගේ අයිතිවාසිකම්, පරිසරය පිළිබඳ ජනතාවගේ අයිතිවාසිකම් කියන සියල්ල ඇතුළත් අලුත් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් අපට තිබෙන්න ඕනෑ. මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කරන්න තිබෙනවා. අධිකරණය පිළිබඳ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. අද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව වැඩි කරගන්න බැරිව ඉන්නවා. ඒ අවශ්‍යතාව ගැන හැම කෙනාම කතා කරනවා. අලුත් ව්‍යවස්ථාවක් නැතිව ඒ අවශ්‍ය වෙනස්කම් කරගන්න බැරිව ඉන්නවා. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා වෙනස්කම් කරගන්න බැරිව ඉන්නවා. ව්‍යවස්ථාව කියන්නේ මේ කාරණා සියල්ල එකතු වූ ලියවිල්ලක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කරන්න යන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මූලික වශයෙන් සහයෝගය දෙන්න අපි තීරණය කර තිබෙනවා. නමුත් අපේ මූලික පරමාර්ථය ඒක නොවෙයි. සම්පූර්ණ ව්‍යවස්ථාවක් එනවා නම් අප වඩා කැමැතියි. මොකද, මේ මුළු රටෙම තිබෙන ප්‍රශ්න සමස්ත වශයෙන් ගන්න පුළුවන් වන්නේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකිනුයි. නමුත් එය එන්නේ නැත්නම් අනෙක් එක හෝ ඉෂ්ට කර ගන්න එක වෙනම කතන්දරයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා මේ කාරණය කිව යුතුයි. අපි දැන් කතා කළා. අපේ නායකයෝ කතා කරනවා; අපිත් කතා කරනවා; සැලසුම් හදනවා. ඒවා දැන් ඇති. දැන් කතාව නොවෙයි ඕනෑ. දැන් ජනතාව බලාපොරොත්තු වන්නේ ක්‍රියාවනුයි. දැන් කතා කළා ඇති. දැන් ක්‍රියාවන් අවශ්‍ය වනවා. පාර්ලිමේන්තුවේ දෙවන භාගයේදීවත්, ජනාධිපති ධුරයේ අවසාන අවුරුදු එකහමාරේදීවත් කතා ක්‍රියාවලට පරිවර්තනය කිරීම තමයි අවශ්‍ය වන්නේ. ජනතාව බලාපොරොත්තු වන්නේ එයයි. අපට ආපසු යන්න බැහැ. ඉදිරියට යනවා මිස ආපසු යන්න බැහැ. ජනවාරි 08 වෙනසට සම්බන්ධ වූ ජනතාවගේ බලාපොරොත්තුව එයයි. පසුගිය දවස්වල සිදු වූ පෙරළියෙන් පසු ප්‍රධාන පක්ෂ දෙකට දැන්- [බාධා කිරීමක්] වඩාත් ඕනෑකමින් එකඟත්වයකින් කටයුතු කරන්න පුළුවන් අවස්ථා තිබෙනවා. අපි කලින් දැක්කා, ගිලිහී ගිය එවැනි අවස්ථාත් තිබුණා කියා. විශේෂයෙන්ම ඇති වූ වෙනසට පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරුන් සියලුදෙනා එකඟ වෙලා පැහැදිලි ලෙස එක තත්ත්වයකට ඇවිත් තිබෙන මේ අවස්ථාවේ අපි බලාපොරොත්තු වෙනවා, ඔවුන් එකඟත්වයකින් වැඩ කරලා ජනවාරි 08වන දා ජනතාවගේ අභිලාෂයන් ඉදිරියට රැගෙන යාවි කියා. ඒ සඳහා ප්‍රධාන පක්ෂ දෙකට විශේෂයෙන් බල කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.10]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුව නැවත වාරයක් විවෘත කරලා කරපු කතාව පිළිබඳව කතා කරනකොට අපට එක කාරණාවක් මතක් වනවා. එතුමාම පිළිගෙන තිබෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් එකතු වෙලා කරපු සම්මුතිවාදී ආණ්ඩුව සාර්ථක වෙලා නැහැ කියන එක; ඒ බලාපොරොත්තු ඉෂ්ට වෙලා නැහැ කියන එක. මේ සියල්ල සිද්ධ වුණේ, මැතිවරණ කල් දමාගෙන ඉඳලා ඡන්දය පවත්වපු පෙබරවාරි 10වන දායින් පසුවයි.

ජනතාව දීපු උත්තරයෙන් තමයි ජනාධිපතිතුමාට, එක්සත් ජාතික පක්ෂයට, මේ රටේ අනෙක් සියලුම දේශපාලන පක්ෂවලට අපි දැන් කොහේද ඉන්නේ කියලා හිතන්න සිදු වුණේ. මගේ මිත්‍ර මන්ත්‍රීතුමා කථා කරනකොට මම හිතුවා, උතුරු නැගෙනහිර පළාතේ ත්‍රස්තවාදයක් මතු වෙලා කියලා එතුමාට දැන් මතක් වෙලා තිබෙන බව. ඇයි, එහෙම හිතුවේ? TNA එකට එක් නගර සභාවක විතරයි තනිවම බලය පිහිටුවා ගන්න පුළුවන් වුණේ. අනෙකුත් විවිධ දේශපාලන පක්ෂ අලුතෙන් ඇවිල්ලා, මේ යන මතයට විරුද්ධව ඒ පළාත්වල ඡන්දය ප්‍රකාශ කළා. වව්නියාව නගර සභාවේත් බලය ගියා. එතුමා හිතනවා, ජාතික ගීය දෙමළ භාෂාවෙන් කිව්වාම ඔක්කෝම හරි කියලා. අපි නම් ඒකට විරුද්ධයි. ඒ වාගේම අපේ පක්ෂයේ මැයි දින රැළියේදී දෙමළ ජාතික සහෝදරයෙක් කථා කළා. එතුමා අපට කිව්වා, "ජාතික ගීය mix කරලා කිව්වාට අපේ ප්‍රශ්නවලට උත්තරයක් හම්බ වෙන්නේ නැහැ. ආර්ථික නිදහසක් අපට ඕනෑ. අපේ මිනිසුන්ගේ ගොවිතැනට මුදලක් අපට ඕනෑ. අපේ මිනිසුන්ගේ ගමට හයියක් අපට ඕනෑ. අපේ පවුලට ආර්ථික ශක්තියක් අපට ඕනෑ. අද මේ රටේ නැති වෙලා තිබෙන්නේත් ඒකයි." කියලා. මම අහගෙන හිටියා, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරනකොට 2015 මැතිවරණයට පෙර කියපු කාරණා තමයි කිව්වේ. තමුන්නාන්සේලා කියපු ඒ ඔක්කෝම කාරණා මිනිස්සු ඇහුවා. අහලා තමුන්නාන්සේලාට බලය දුන්නා. තමුන්නාන්සේලාට දීපු ඒ බලය අද මහජනයා නැති කරලා තිබෙනවා. ඒ කථා කළ ඔක්කෝම මන්ත්‍රීවරු පසුගිය ප්‍රාදේශීය සභා මැතිවරණයේදී තමන්ගේ ආසනය පරාදයි. ඇයි, එහෙම වුණේ? තමුන්නාන්සේලා ඔය කියන දේ කියලා දිනුවා. ඒවා නොකළ නිසා අද තමුන්නාන්සේලා ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. දැන් බලන්න, අද මැලේසියාවේ මහතීර් මොහොමඩ් මැතිතුමා මැතිවරණය ජයග්‍රහණය කරලා අගමැති ලෙස පත් වෙනකොට වයස අවුරුදු 92යි. එහෙම නම් නුදුරු අනාගතයේදී මහින්ද රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කිරීමත් කාටවත් නවත්වන්න බැරි බව මා මේ සභාවේදී කියන්න කැමැතියි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු තවමත් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට දොස් කියනවා. ඒ ගොල්ලන් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා පරාජයට පත් කළා. පරාජයට පත් කරලා, ආණ්ඩුව පිහිටුවන්න උදව් කරලා, නඩු විභාග කරන්න අලුත් ක්‍රම හදලා, FCID එක හදලා, ඒකේ කැඳවුම්කරු වෙලා ක්‍රියා කළා. දැන් ඒ ගොල්ලන්ට කියන්න බැහැ, අපට ඒක කර ගන්න බැරි වුණාය කියලා. හැමදාම ඒ ගොල්ලන් කළේ, මොකක් හෝ පක්ෂයකට බලයට පත් වෙන්න මුක්කු ගහපු එක විතරයි. ඒක මේ රටේ මහජනයා දැනගෙනයි ඉන්නේ. අද මේ ආණ්ඩුවට කරන්න ඉතුරු වෙලා තිබෙන්නේ, විසුරුවා හරින එක විතරයි.

දැන් බලන්න, මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. අද පළාත් සභා තුනක් විසුරුවා හැරලා තිබෙනවා. මොකක්ද වෙලා තිබෙන්නේ? පළාත් සභා තුනේම ඡන්දය පවත්වන්නේ නැහැ. දැන් කොටියාස සීමා නිර්ණය කරලා තිබෙනවා. ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැහැ. 50:50 අනුපාතය අවශ්‍යයි කියලා පනත් කෙටුම්පතක් ගෙනාවා. එදා තමුන්නාන්සේලා කථානායකතුමාවත් අල්ලාගෙන රෑ දහය වනතුරු පාර්ලිමේන්තුව පවත්වලා, තුනෙන් දෙකේ ඡන්දයකින් ඒක සම්මත කර ගත්තා. දැන් ඒක ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි? අධිකරණය තීන්දු කරලා තිබෙනවා, කල් දමන්න එපා කියලා. ඒකට වක්‍ර ක්‍රමයක් පාවිච්චි කළා, මැතිවරණ කොට්ඨාස කඩන්න ඕනෑය කියලා. මෙතැනට ඇවිල්ලා පාර්ලිමේන්තුව රෑ නවය-දහය වනතුරු පවත්වලා, 50:50 අනුපාතයක් අවශ්‍යයි කියලා සම්මත කළා. දැන් මැතිවරණ දෙපාර්තමේන්තුව ආසන කඩලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක අපේ කමිටුවටත් ඉදිරිපත් කළා. අපි කමිටුවෙනුත් නිර්දේශ කරලා එව්වා. ඇයි, විභාග කරන්නේ නැත්තේ? ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවා කියලායි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. ජනතාවගේ පරමාධිපත්‍ය බලය ආරක්ෂා කරනවා කියලායි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. එහෙම නම් ඡන්දය පවත්වන්න එපායැ. ඇයි, ඡන්දය පවත්වන්නේ නැත්තේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කරලා තිබෙනවා, පළාත් සභා ඡන්දය පවත්වන විධිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කරලා තිබෙනවා, පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන විධිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කරලා තිබෙනවා, ජනාධිපතිවරණය පවත්වන විධිය. එහෙම නම් ඒ පළාත් සභා තුනේ මැතිවරණය කවදාද පවත්වන්නේ කියලා අපි ජනාධිපතිතුමාගෙනුත් අහනවා; අගමැතිතුමාගෙනුත් අහනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න කථා කරනවා.

අද මෙතුමන්ලා මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් ගැන කථා කරනවා. මට ප්‍රථමයෙන් කථා කළ මන්ත්‍රීතුමාගෙනුත් මම මේ කාරණය අහනවා. තමුන්නාන්සේලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන කථා කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන එක පරිච්ඡේදයක් තමයි, "පළාත් සභා" කියන්නේ. ඇයි පළාත් සභා මැතිවරණය කල් දමන්නේ? ඇයි ඒක පවත්වන්නේ නැත්තේ? ඇයි පාර්ලිමේන්තුවේ ඒ කාරණය ගන්නේ නැත්තේ? වක්‍ර ක්‍රමවලින් ඒවා කල් දමාගෙන ඉන්නවා. කවදා හෝ මැලේසියාවේ වුණු දේ තමයි ලංකාවේත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තෙල් මිල වැඩි කරනවා. තෙල් මිල වැඩි වන්නේ ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වූ නිසාය කියනවා. නමුත් ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වුණු කාලයක් තිබුණා. අපි පාර්ලිමේන්තුවේ කීප වතාවක් කිව්වා, "ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මේ රටේත් තෙල් මිල අඩු කරන්න. එහෙම නැත්නම්, අඩුම ගණනේ බද්දක් දමලා ඒ මුදල රජය හෝ ගන්න. ඉන්දියානු සමාගමට, ඉන්දියාවට ඒ වාසිය ගෙන යන්න දෙන්න එපා" කියලා. ඒ ගැන වචනයක් මේ ආර්ථික විශේෂඥයෝ කථා කළාද; අගමැතිතුමා කථා කළාද; ජනාධිපතිතුමා කථා කළාද? තෙල් මිල අඩු වුණු කාලයේ බිලියන 60ක විතර ඒ වාසිය IOC සමාගම ඉන්දියාවට අරගෙන ගියා. අද ආණ්ඩුව පාඩු විඳිනවා. එතකොට තෙල් මිල වැඩි කරනවා. තෙල් මිල වැඩි කාලයේත් මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙච්චර තෙල් මිල වැඩි කළේ නැහැ. ලෝක වෙළෙඳ පොළේ ඉහළම ගණනට එදා තෙල් මිල ඉහළ ගිහිල්ලා තිබුණා. අද මහින්ද රාජපක්ෂ මැතිතුමාට දොස් කියනවා. බලන්න; එදා highways හැදුවා. ඒ කාලයේ කිව්වා, ඒවායින් හොරකම් කළා කියලා. ඒවාට වියදම් කළ මුදල අද ගෙවලා ඉවරයි. ගල් අහුරු බලාගාර හදන්න පටන් ගත්තා. එතකොට විවිධ කතන්දර කිව්වා. අද ඒක ගෙවලා ඉවරයි; ඒකේ ආදායමින් ඒ මුදල හම්බ කරලා ඉවරයි. වරාය තිබුණා නම්, ඒකත් එහෙමයි. නමුත්, වරාය විකුණා ගත්තා. ඒ විතරක් නොවෙයි, අද සිංගප්පූරුව එක්ක ලංකාව සාම ගිවිසුමක් අත්සන් කරලා අපේ උගතුන්ට, බුද්ධිමතුන්ට රැකියා අහිමි වෙන තත්ත්වයට පත් කරලා තිබෙනවා. අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ඒකට භය වෙලා ඒ අයට රෑට නින්ද යන්නේ නැහැ. පරණ මුව හම ම මෙතැනට ගෙනැල්ලා තළනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

ඒ නිසා අපි තමුන්නාන්සේලාට කියන්නේ, අද තමුන්නාන්සේලා -ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය- මේ රට විනාශයට පත් කළ බවයි. අද රටේ ගොවියෙකුට ජීවත් වෙන්න පුළුවන්කමක් නැහැ; කම්කරුවෙකුට ජීවත් වෙන්න පුළුවන්කමක් නැහැ; රටේ මහ ජනයාට ජීවත් වෙන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, මේ සභාවට ඇවිල්ලා ඔබතුමන්ලා බොහොම අලංකාර කතන්දර කියනවා. ඔය එක්කෙනෙකුටවත් අද ගමට යන්න බැහැ. තමන්ගේ ආසන සියල්ලම පරාදයි. තමන්ගේ ආසන සියල්ලම පරාදයි! අද මොකද වෙලා තිබෙන්නේ? අපි හිතුවා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා - ජනාධිපතිතුමා- මේ සභාවට ආවාම මේවාට යම් කිසි ප්‍රතිකර්මයක් දෙන වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරයි කියලා. නමුත් පුස්සක් ඉදිරිපත් කරලා තමන්ගෙන් වෙච්ච අඩු පාඩු කිය කියා ගියා. මේ රටේ මහ ජනයාට ඕනෑ කරන්නේ තිබෙන මේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන වැඩ පිළිවෙළක්. මහ ජනයාගේ වුවමනාව ඒකයි. මොන ආණ්ඩුවක් පිහිටෙව්වත් ජනතාවට අවශ්‍ය වන්නේ සමෘද්ධිමත් ජීවිතයක් ගත කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක්. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒක ඇති කරලා තිබුණා. එදා මේ රටේ ගොවියෝ සන්තෝෂයෙන් හිටියා; වැඩ කරන පන්තිය සන්තෝෂයෙන් හිටියා; රටේ ජනතාව සන්තෝෂයෙන් හිටියා; ව්‍යාපාරිකයෝ සතුටින් හිටියා. අද ඒ සියලුමදෙනා අපහසුතාවට පත් වෙලා රට විනාශ වෙලා තිබෙනවාය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

අදුත්තු, கௌரவ சிறீநேசன் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருக்கின்றன.

[பி.ப. 3.20]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மேதகு ஜனாதிபதி அவர்களின் கொள்கை விளக்கவுரை பற்றி இன்று நடைபெறுகின்ற சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் அது தொடர்பான எங்களுடைய பார்வையை, விமர்சனத்தை எனக்கு ஒதுக்கப்பட்டுள்ள 10 நிமிட நேரத்துக்குள் சொல்லி முடிக்கவேண்டிய நிலையில் இருக்கின்றேன். மேதகு ஜனாதிபதி அவர்கள் ஆட்சிக்கு வந்த பின்னர் இரண்டு கொள்கை விளக்கவுரைகளை நிகழ்த்தி யிருக்கின்றார். முதலாவது கொள்கை விளக்கவுரையோடு தற்போதைய கொள்கை விளக்கவுரையை ஒப்பிட்டுப் பார்க்கின்றபோது தமிழ் மக்களும் ஏனைய சிறுபான்மை மக்களும் நம்பிக்கை இழந்தவர்களாகக் காணப்படுகின்றார்கள். குறிப்பாக, இலங்கை பல்லின சமூகங்களைக் கொண்ட ஒரு நாடு. இத்தகைய சமூகங்களைக் கொண்ட நாட்டினை ஆளக்கூடிய ஆளுமை, தலைமைத்துவம் இந்த நாட்டிலுள்ள தலைவர்களுக்கு இருக்கின்றதா? என்பதைப் பற்றி நாங்கள் கேள்வி கேட்க வேண்டிய நிலையில் இருக்கின்றோம்.

அந்தவகையில், ஜே.ஆர். ஜயவர்தன அவர்கள் ஜனாதிபதியாக இருந்திருக்கின்றார்; பிரேமதாச அவர்கள் ஜனாதிபதியாக இருந்திருக்கின்றார்; சந்திரிகா பண்டார நாயக்க குமாரதுங்க அவர்கள் ஜனாதிபதியாக இருந்திருக் கின்றார்; மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக இருந்திருக்கின்றார். தற்பொழுது மைத்திரிபால சிறிசேன அவர்கள் ஜனாதிபதியாக இருந்துகொண்டிருக்கிறார். இவர்களது தலைமைத்துவம், ஆளுமை என்பவற்றையிட்டு அதாவது, இவர்கள் 74 சதவீதமான மக்களின் வாக்கு வங்கியில் தங்கியிருக்கின்றார்களா? அல்லது இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினையைத் தீர்த்து, பல்லின மக்களை ஆளக்கூடிய அருகதையுள்ள, ஆளுமையுள்ள தலைவர்களாக இருந்திருக்கின்றார்களா? என்பதைப் பற்றி ஆராய்ந்து பார்த்தால், - ஏனைய தலைவர்கள் சில விடயங்களில் ஏதேதோ செய்ததாக அந்தந்தக் கட்சியைச் சேர்ந்தவர்கள், அந்தந்தக் கட்சியின் ஆதரவாளர்கள் குறிப்பிட்டாலும்கூட- புரையோடிப் போயிருக்கின்ற தேசிய இனப் பிரச்சினையைத் தீர்க்கின்ற விடயத்தில் ஆளுமையற்ற தலைவர்களாகத்தான் அவர்கள் இருந்திருக்கின்றார்கள் என்பது மறுக்க முடியாத, மறைக்க முடியாத உண்மையாகத் தெரிகிறது. புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினை யைத் தீர்ப்பதன்மூலமாக இந்த நாட்டில் சாந்தி, சமாதானத்தை ஏற்படுத்தி அனைத்து மக்களும் சமத்துவமாகவும் சமவுரிமையுடனும் வாழக்கூடிய சூழ்நிலையை அவர்கள் உருவாக்கியிருந்தால், அவர்களைப் பல்லின மக்களை ஆளக் கூடிய ஆளுமையுள்ள தலைவர்களாக நாங்கள் கருதியிருக்க முடியும்.

சிங்கப்பூரை ஆட்சி செய்த லீ குவான் யூ அவர்கள் பல்லின மக்களை ஆளக்கூடிய தகுதியுள்ள, ஆளுமையுள்ள ஒரு தலைவராக இருந்திருக்கின்றார்; யூகோசிலாவியாவை ஆட்சி செய்த மார்சல் ரீட்டோ அவர்கள் ஆளுமையுள்ள ஒரு தலைவராக இருந்து சகல இன மக்களையும் அரவணைத்து ஆட்சி செய்திருக்கின்றார். இந்தியாவை ஆட்சிசெய்த ஜவகர்லால் நேரு அவர்களும் பல்லின, பன்மத மக்களை இணைத்து ஆளுமை செய்யக்கூடிய - ஆளக்கூடிய தகுதியைப் பெற்றிருந்தார். ஆனால், எமது நாட்டிலிருக்கின்ற தலைவர் களை எடுத்துப் பார்க்கின்றபோது, அவர்கள் 74 சதவீதமான வாக்குவங்கியைத் தக்கவைத்துக்கொள்ள வேண்டும்; அது வற்றிவிடக்கூடாது என்பதில்தான் அக்கறை கொண்டவர் களாக இருக்கிறார்கள். முற்போக்கான சிந்தனையுள்ள சிங்களத் தலைவர்களும் இருக்கத்தான் செய்கிறார்கள். ஆனால், அவர்கள் தங்களுடைய நியாயமான கருத்தோடும் நீதியான பார்வையோடும் செல்லுகின்றபோது அவர்கள் புறக்கணிக்கப்பட்டுவிடுகிறார்கள்.

தற்போது எனக்கு முன்பு உரையாற்றிய கலாநிதி ஜயம்பதி விக்கிரமரத்ன அவர்கள் முற்போக்கான சிந்தனையின் அடிப்படையில் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினையைத் தீர்க்க வேண்டும் என்பதற்காகக் கடினமாக உழைத்துக்கொண்டிருக்கின்றார். அதன் விளைவாகச் சில விடயங்களில் முன்னேற்றம் காணப்பட்டிருக்கிறது. இருந் தாலும், தன்னுடைய பதவிக் காலத்தில் 3 வருடங்களை முடித்திருக்கின்ற எங்களுடைய ஜனாதிபதி அவர்களுக்கு இன்னும் 2 வருடங்கள்தான் எஞ்சியிருக்கின்றன. இந்த நிலையில், இந்த 2 வருட காலத்தில் அவர் எதைச் செய்யப்போகின்றார்? பழைய தலைவர்களைப் போன்று, பல்லின மக்களை ஆளக்கூடிய யோக்கியதை அல்லது ஆளுமையுள்ள தலைவராக இருக்கப்போகின்றாரா? என்ற கேள்வி இன்று எழுகின்றது.

உண்மையில் வடக்கு, கிழக்கிலுள்ள மக்கள் கடந்தகாலக் கொடுமையான ஆட்சியை அனுபவித்த பின்னர், ஒரே நாட்டுக்குள் - பிரிக்கப்படாத நாட்டுக்குள் தேசிய இனப்

பிரச்சினை தீர்க்கப்பட வேண்டும்; முறையான அதிகாரப் பகிர்வு மூலமாக சகல மக்களோடும் இணைந்து மகிழ்ச்சி கரமாக வாழவேண்டுமென்ற அடிப்படையில் ஜனாதிபதி அவர்களுக்கு வாக்களித்திருந்தார்கள். அந்த வகையில் வடக்கு, கிழக்குப் பகுதிகளில் 75 - 85வீதத்திற்கும் அதிகமான வாக்குகள்கூட ஜனாதிபதி அவர்களுக்கு அளிக்கப் பட்டிருந்தன. அதேபோன்றுதான் கடந்தகாலத்தில் சமாதான தேவதையாகப் பவனிவந்த சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க அவர்களுக்கும் வாக்களிக்கப்பட்டது. இலங்கை யின் வரலாற்றில் அவர் 62.28 வீதமான வாக்குகளைப் பெற்றிருந்தார். அவர் தேசிய இனப்பிரச்சினையைத் தீர்த்து ஆளுமையுள்ள, பல்லின மக்களை ஆளக்கூடிய ஒரு தலைவியாக இருப்பார் என்ற நம்பிக்கையில் வடக்கு, கிழக்கு மாகாணங்களில் அவருக்கு அதிகளவான - 85 - 90 வீதமான வாக்குகள் அளிக்கப்பட்டன. ஆனால், அந்த நம்பிக்கையும் நிறைவேறவில்லை. இன்றைய காலகட்டத்தில் எஞ்சியிருக் கின்ற இந்த 2 வருடங்களுக்குள் - 2 வருடங்களும் குறுகிவிட்டன - தற்போதைய ஜனாதிபதி அவர்கள் என்ன செய்யப்போகின்றார்? என்பதை நாங்கள் பார்த்துக் கொண்டிருக்கின்றோம். ஆனால், ஜனாதிபதி அவர்களின் உரையைப் பார்க்கின்றபோது நம்பிக்கையென்பது இறங்கு வரிசையாகக் குறைந்துகொண்டு செல்வதையே காணக் கூடியதாகவுள்ளது. அதாவது, அரசியல்சாசன சபையாக இந்தப் பாராளுமன்றம் ஆக்கப்பட்டதைப் பற்றியோ, வழி நடத்தல் குழு அமைக்கப்பட்டது பற்றியோ, உப குழுக்கள் அமைக்கப்பட்டது பற்றியோ அவற்றின் மூலமாகக் காணப்பட்ட முன்னேற்றங்களைப் பற்றியோ, எதிர்காலத்தில் என்ன செய்யப்போகிறோம் என்பதைப் பற்றியோ அவர் பேச விரும்பவில்லை. அந்த வகையில் இந்தப் பெரும்பான்மையின வாக்கு வங்கியில் தங்கிருந்தால்தான் இரண்டாம் தடவையும் தேர்தலில் போட்டியிடலாமென்ற எண்ணத்தில் அவர் மிதக்கின்றார்போன்று அவரது உரை அமைந்திருந்தது. உண்மையில் இன்று நாட்டிலே இருக்கின்ற சிறுபான்மைத் தமிழ்த் தேசிய இனத்தவர்களும் முஸ்லிம் இனத்தவர்களும் மலையக மக்களும் சமத்துவ உரிமையோடு, சம வாய்ப்போடு, அச்சமில்லாமல் - பீதியில்லாமல் அனைத்து மக்களோடும் இணைந்து அதிகாரப் பகிர்வைப்பெற்று வாழவேண்டு மென்றுதான் நினைக்கின்றார்கள்.

"நாட்டைப் பிரிக்கப் போகின்றார்கள்" என்று ஒரு காலத்தில் கூச்சல் போட்டார்கள்! இன்று பிரிக்கப்படாத நாட்டுக்குள் அதிகாரப் பகிர்வைப் பெற்றுக்கொண்டு தலைநிமிர்ந்து வாழ வேண்டும்; எங்களுடைய பிரதேசங்களில் அடக்குமுறைகளுக்கும் ஒடுக்குமுறைகளுக்கும் உட்படக் கூடாது என்ற அடிப்படையில்தான் தீர்வு கிடைக்குமென நாங்கள் நம்பியிருந்தோம்; குறித்த பேச்சுவார்த்தைகளிலும் கலந்திருந்தோம். இன்று எங்கள்மீது பலவிதமான விமர்சனங்கள் இருக்கின்றன. அதாவது இந்தத் தேசிய அரசாங்கத்தின் மூலமாக இனப்பிரச்சினையைத் தீர்க்க வேண்டுமென்பதற்காகப் பல விட்டுக்கொடுப்புக்களுக்கு மத்தியில், பல விமர்சனங்களுக்கு மத்தியில் பலவிதமான பேச்சுவார்த்தைகளில் இம்முறை நாங்கள் ஈடுபட்டிருந்தோம். ஆனால், இன்று அந்த நம்பிக்கை என்ற எண்ணக்கரு தகர்க்கப்படக்கூடிய ஒரு நிலைக்குத் தள்ளப்படுகின்றதா? என்று கேள்வி கேட்க வேண்டிய நிலையில் நாங்கள் இருக்கின்றோம். உண்மையில் பல் தேசிய மக்கள் வாழ்கின்ற ஒரு நாட்டில் சகல மக்களும் சமத்துவமாக வாழ்வதற்குரிய ஒரு நிலைப்பாட்டினை ஏற்படுத்த வேண்டியது ஆளுமையுள்ள தலைவர்களின் பொறுப்பு; அக்கறையுள்ள தலைவர்களின் பொறுப்பு. ஓர் இனத்தை ஆளுவதற்காக அவ்வினத்தின்மீது செல்வாக்கைச் செலுத்திக்கொண்டு, மற்றைய இனங்களை இரண்டாந்தரப் பிரஜைகளாக அல்லது அவர்களுடைய உரிமைகளை மறுத்தநிலையில், அவர்களுக்குப் பராக்குக் காட்டிக்கொண்டு ஆளுகின்ற தலைமைத்துவங்களை இந்த நாட்டில் பாரிய சாதனைகளைப் படைத்ததாக அவரவர் கட்சியைச் சார்ந்தவர்கள்தான் புகழ்ந்துகொண்டிருப்பார்களே யொழிய, நடுநிலைச் சிந்தனையுள்ளவர்கள், முற்போக்குச் சிந்தனையுள்ளவர்கள் அவர்களை முகஸ்துதிக்கேனும் பாராட்டுகின்ற நிலைமை ஒருபோதும் இருக்க முடியாது.

முன்னாள் ஜனாதிபதி ஜே.ஆர். ஜயவர்தன அவர்களைப் பொறுத்தமட்டில், அவர் தேர்தலில் 168 ஆசனங்களில் 140 ஆசனங்களைப் பெற்று, வரலாற்றில் இல்லாத ஆறில் ஐந்து பெரும்பான்மைப் பலத்தைக் கொண்டிருந்தார். அவர் ஏறத்தாழ பத்து ஆண்டுகள் ஆட்சி செய்திருந்தார். இந்த நிலையில் அவரால் இந்தத் தேசிய இனப்பிரச்சினையை மிகவும் இலகுகவாகத் தீர்த்திருக்க முடியும். ஆனால், அவருக்கும்கூட இந்த 74 சதவீதமான வாக்குகளின்மீதுதான் கண் இருந்ததே யொழிய, அவர் இந்தத் தேசிய இனப் பிரச்சினையைப் பற்றிச் சிந்திக்கவில்லை. அடுத்து வந்த ஜனாதிபதிகளும் அப்படித்தான் இருந்தார்கள். சந்திரிகா அம்மையாரைப் பொறுத்தமட்டில், அவர் முன்னேற்றகரமான ஓர் ஏற்பாட்டினைச் செய்திருந்தார். அதாவது, பிராந்திய சபைகள் என்ற ஒரு சபையினைக் கொண்டுவருவதற்கு ஓரளவுக்கு முயன்றிருந்தார். ஆனால், அவர் அதில் வெற்றி பெறவில்லை. கடந்த 2005ஆம் ஆண்டு முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் சிங்கள மக்கள் வாக்களித்து வெற்றி பெற்றாரென்று சொல்வதைவிட, வடக்கு, கிழக்குத் தமிழ் மக்கள் வாக்களிப்பில் கலந்துகொள்ளாத காரணத்தினால்தான் அவருக்கு வெற்றியடையக்கூடிய ஒரு வாய்ப்புக் கிடைத்தது. அப்படிப் பார்த்தால், அவருடைய வெற்றிக்கு வடக்கு, கிழக்கு மக்கள்தான் காரணமாக இருந்திருக்கிறார்கள். ஆனால், அந்த வெற்றியை ஏற்படுத்திக்கொடுத்த தமிழ் மக்களுக்கு கண்ணீரும் கம்பலையும் செந்நீரால் சிவந்த மண்ணும்தான் அவர் பரிசாகத் தந்திருந்தார். அந்த அடிப்படையில், மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் எதனைச் சாதித்திருக் கின்றார்? எதனைச் சாதிக்கவில்லை? என்பதைப் பற்றி ஒரு தடவை மதிப்பீடு செய்வதற்குரிய சந்தர்ப்பம் இன்னும் இரண்டு வருடங்களுக்குள்தான் இருக்கின்றது. இந்த நிலையில், அவரும் முன்னாள் ஜனாதிபதிகளைப்போன்று சிறுபான்மை மக்களின் வாக்குகளைப் பெற்று வெற்றி பெற்றதன் பின்னர் அவற்றையெல்லாம் மறந்துவிட்டுப் புதுக்கதைகள் சொல்லப் போகின்ற ஒரு தலைவராகத்தான் இருக்கப் போகிறாரா? என்று நாங்கள் எண்ணிப்பார்க்க வேண்டியிருக்கிறது.

இன்று காணாமல் ஆக்கப்பட்டவர்களின் கதை இருக்கின்றது; கைதிகளாக ஆக்கப்பட்டவர்களின் கதை இருக்கின்றது! அதேநேரம் காணிகள் அபகரிக்கப்பட்ட நிலையில் ஓரளவுக்கு விடுவிக்கப்பட்டாலும் 85 சதவீதமான காணிகளை விடுவித்திருப்பதாக ஜனாதிபதி அவர்கள் சொல்கிறார்; யாழ்ப்பாணத்திலிருக்கும் தரைப்படைத் தளபதி 75 சதவீதமான காணிகள் விடுவிக்கப்பட்டிருப்பதாகக் கூறியிருக்கிறார். இந்த இரண்டு புள்ளிவிபரங்களுக்கு மிடையில் வேறுபாடுகள் இருக்கின்றன என்றால் இந்தக் கணிப்பீட்டில் தப்பு- தவறு இருக்கின்றது என்பதுதான் உண்மை. ஆகவே, காணாமலாக்கப்பட்டவர்களுக்கு என்ன முடிவைச் சொல்லப் போகின்றோம்? கைதிகளாக்கப் பட்டவர்களுக்கு என்ன முடிவைச் சொல்லப் போகின்றோம்? இந்தக் காணிகள் எப்போது விடுவிக்கப்படப்போகின்றன?

[ගරුඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

අடுத்ததாக, ஆனந்தசுதாகரன் என்கின்ற ஒரு கைதி தொடர்பில் கூறவேண்டும். அவருடைய பிள்ளைகளுக்குத் தாயும் இல்லாத நிலையில் சிறையில் வாடுகின்ற அவரைப் பொதுமன்னிப்பின்கீழ் மேதகு ஜனாதிபதி அவர்கள் விடுவிப்பாரென்று எதிர்பார்த்தால், அதுவும் நடைபெறாதிருக் கின்றது. இந்த நிலையில் மேதகு ஜனாதிபதி அவர்கள் எதிர்வரும் இரண்டு வருடங்களுக்குள் தனது செயற்பாட்டில் திருத்தங்களை மேற்கொள்வாரா? அல்லது பழைய தலைவர்கள் சென்ற பாதையில்தான் செல்லவாரா? என்பதை நாங்கள் பொறுத்திருந்துதான் பார்க்க வேண்டும். அப்படிச் செல்வாரேயானால், அது "புதிய மொந்தையில் பழைய கள் வார்த்தது" போன்றுதான் இருக்கும். ஆகவே, மேதகு ஜனாதிபதி அவர்கள் இனியாவது சிந்தித்துச் செயற்பட வேண்டும் எனக்கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා.

ඊට පෙර, මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MUJIBUR RAHUMAN *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.31]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳව අවසාන මොහොතේදී හෝ වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වනවා. ඇත්තටම මම කනගාටු වෙනවා, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳ විවාදය ඉල්ලපු ඒකාබද්ධ විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මෙම පාර්ලිමේන්තු සභා ගැබ තුළ රැඳී නොසිටීම ගැන. ඒ අය කථා කරනවා; යනවා. ඒවාට පිළිතුරු අහන්න ලැහැස්ති නැහැ. පසුගිය කාලයේ අපේ ජාතික ආණ්ඩුවත් එක්ක එකතු වෙලා ඉඳලා 8වෙනි දා විපක්ෂයේ වාඩි වුණු අපේ හිටපු අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මැතිතුමාත්, හිටපු නියෝජ්‍ය අමාත්‍ය සුමේධා ජී. ජයසේන මැතිනියත් යන මේ දෙපළවත් අතිගරු ජනාධිපතිතුමාට තිබෙන හිතවත්කමකින් හෝ මේ අවස්ථාවේ රැඳී සිටීම ගැන මම සතුටු වෙනවා. මම හිතනවා, එතුමන්ලා මෙම විවාදයේදී කථා කරයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාම්භීර ලොකුගේ මැතිතුමා අද කථා කළේ නින්දෙන් අවදි වෙලා වාගෙයි. මොකද, එතුමාට අමතක වෙලා තිබෙනවා, 1978දී එක්සත් ජාතික පක්ෂ රජයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරන වෙලාවේ කොහොමද කළේ කියලා. එතුමන්ලා ඒ රජයේ ඉන්නකොට ඒවා ප්‍රජාතන්ත්‍රවාදියි. අද යම් කිසි විධියකින් සුළු අඩු පාඩුවක් තිබුණොත් ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මිත්‍ර ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා අද කථා කළා. එතුමා අර්ථ ශාස්ත්‍රය සම්බන්ධයෙන් හොඳ ගුරුවරයෙක්. මමත් එතුමාගේ සම්මන්ත්‍රණවලට ගිහිල්ලා අහගෙන ඉඳලා තිබෙනවා. එතුමාගේ theory එක හොඳයි. හැබැයි, practically හරියන්නේ නැහැ. එතුමාගේ න්‍යායාත්මක අවබෝධය සහ කියා දීම හොඳයි. හැබැයි, එතුමාට ප්‍රායෝගිකව යමක් කරන්න පුළුවන්කමක් නැහැ. එතුමා කොයි තරම් බංකොලොත් වුණාද කියලා කිව්වොත්, එතුමා අමාත්‍ය ධුරය දරන කාලයේ " 4 දෙනෙකු සිටින පවුලකට රුපියල් 2,500කින් ජීවත් වෙන්න පුළුවන්" කියලා පට්ටපල් බොරුවක් කියලා, ජනතාවගේ ඇස්වලට වැලි ගහලා ජනතාවට කොකා පෙන්වලා එදා පරාජයට පත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාම්භීර ලොකුගේ මැතිතුමා කිව්වා, මොන දේවල් කළත් 2020දී අපි එන්නේ මහින්ද රජපක්ෂ මැතිතුමාත් එක්කයි කියලා. මහින්ද රජපක්ෂ මැතිතුමා අගමැති තනතුරේද, එහෙමත් නැත්නම් විපක්ෂ නායක තනතුරේද කියලා කියන්න මම දන්නේ නැහැ. එනවා කියලා තමයි කියන්නේ. අප කියන්නෙත් එතුමා එනවා කියලා තමයි. දැනටත් එතුමා විරුද්ධ පක්ෂයේ වාඩි වෙලා ඉන්නවා. හැබැයි, ගාම්භීර ලොකුගේ මන්ත්‍රීතුමාට පේන කියන්න පුළුවන් බව අප දැන ගත්තේ අදයි. අපි ඒ සම්බන්ධයෙන් බලාගෙන ඉන්නවා. 2020දී, එතුමා හොඳ ජ්‍යෝතිෂඥයෙක් විධියට හෝ පේන කියන කෙනෙක් විධියට එතුමාට සම්මානයක් ලබා දෙන්න අපි ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ නිසා බොරු කියන්නට අවශ්‍ය නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කථා කරන විට බදු පැනවීම ගැන පට්ටපල් බොරු ටිකක් කිව්වා. මම දන්නේ නැහැ, එතුමා පුවත් පතක්වත් කියවනවා ද කියලා. පසුගිය කාලයේම මුදල් අමාත්‍යාංශය සහ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් පුවත් පත්වල පළ කරපු දැන්වීම් මගේ ළඟ තිබෙනවා. මේවා

ටිකක් කියවලා එන්න කියලා මම රංජිත් ද සොයිසා මැතිතුමාට කියනවා. එතුමා මේ වෙලාවේ සභාවේ නැති වුණාට මට කරන්න දෙයක් නැහැ. මේවා හැන්සාඩ් වාර්තාවල තියේවි. මේ එක පුවත් පත් දැන්වීමක පැහැදිලිවම තිබෙනවා, "මැද පෙරදිග සේවක සේවිකාවන් එවන මුදල්වලට බද්දක් නැහැ" කියලා. හැබැයි, එතුමා අද කථා කරන විට කිව්වා, මේ බදු තිබෙනවා කියා. තවත් පත්තරයක සඳහන් වෙලා තිබෙනවා, " ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් ලක්ෂ 15 දක්වා වාර්ෂික පොලී ආදායම් දැන් බදුවලින් නිදහස්" කියලා. එතුමාට පුළුවන් නම් මේ පත්තර ටික අරගෙන කියවන්න කියලා මම කියනවා. ඒ වාගේම තවත් පත්තරයක පැහැදිලිව සඳහන් වෙනවා, "රුපියල් ලක්ෂය දක්වා වැටුප් ලබන ඔබ PAYE Taxවලින් නිදහස්" කියලා. තමන් එදිනෙදා බලන පුවත් පත්වල මේ තරම් දේවල් සුද්ධ සිංහලෙන් සඳහන් කරලා තිබෙද්දි, ඒවා කියවන්නේ නැතිව පාර්ලිමේන්තුවට ඇවිල්ලා බබ්බු වාගේ කථා කිරීම ගැන මම කනගාටු වනවා.

අපේ ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා කිව්වා, අතිගරු ජනාධිපතිතුමා පසුගිය 8වෙනි දා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කළ කථාවේදී පිළිගත්තා ලු "සම්මුතිවාදී ආණ්ඩුව අසාර්ථකයි" කියලා. කොහේද, එහෙම සඳහන් වෙලා තිබෙන්නේ? ඒ ගැන මට කියන්න. සියල්ලම සියයට සියයක් සාර්ථක වෙන්නේ නැහැ. පසුගිය ආණ්ඩු කාලයේ කරපුවා සියයට සියයක්ම සාර්ථක වුණේ නැහැ. සියයට 50ක්, සියයට 60ක් සමහර වෙලාවට කෙරෙයි. අපි කරපුවාත් සියයට 20ක්, 30ක් විතර අඩු වෙන්න පුළුවන්. හැබැයි, සියල්ල කිරීමේ ඉලක්කයකට අපට යන්න පුළුවන්කමක් නැහැ. ඒක මොන ආණ්ඩුවකටවත් පුළුවන්කමක් නැහැ. එහෙම නැත්නම්, මහින්ද රාජපක්ෂ මහත්තයා සියයට සියයක් මේ රටේ ජනතාවට සේවාවක් කළා නම්, එතුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පැරදුණේ ඇයි? එතුමන්ලා රට සංවර්ධනය කළා කියලා කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ සමහර අය අද තෙල් මිල ගැන කථා කරනවා. 2014 අවුරුද්දේ තිබුණාට වඩා තවමත් තෙල් මිල අඩුයි; ගෑස් මිල අඩුයි; භූමිතෙල් මිල අඩුයි; පෙට්‍රල් මිල අඩුයි; ඩීසල් මිල අඩුයි. Ceylon Petroleum Corporation එකෙන් නිකුත් කරපු සංඛ්‍යාලේඛන මගේ ළඟ තිබෙනවා. එතුමාට ඕනෑ නම් මට ඒ සංඛ්‍යාලේඛන ටික ලබා දෙන්න පුළුවන්. මම ඒ සංඛ්‍යා ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ සංඛ්‍යාලේඛන ගැන කියන්න ගියොත් මට ලැබී තිබෙන විනාඩි දහයම අවසන් වෙනවා. ඒකට මම කැමති නැහැ. ජනාධිපතිතුමා, අගමැතිතුමා එක්ක එකතුවෙලා මේ ආණ්ඩුව ඉදිරියට ගෙනයන්නට විශාල කැප කිරීමක් කළ බව අපි පැහැදිලිවම කියනවා. නයි-මුගටි වෛරයෙන් හිටපු එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන පක්ෂ දෙකට මීට පෙර ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට තමයි මුහුණ දෙන්න සිද්ධ වුණේ. දයාසිරි ජයසේකර මැතිතුමන්ලා දන්නවා, ඡන්දයක් අවසන් වනකොට ගෙවල් කීයක් ගිනි තිබ්බාද, මිනී මැරුම් කොච්චර සිද්ධ වුණාද, දේපළ කොච්චර විනාශ වුණාද කියලා. නමුත් මේ දෙපළට පින්සිද්ධ වෙන්න පසුගිය මැතිවරණ දෙක තුනේදීම එවැනි කිසිම අලාභයක් සිද්ධ වුණේ නැති බව අපි දන්නවා. හැමෝටම ඉතාම සුභදව ජීවත් වෙන්න පුළුවන්කමක් ලැබුණා. මේ ආණ්ඩුවේ යහ පාලනය පිළිබඳව කියන්න ඒකම මදිද?

ඒ විතරක් නොවෙයි, අපි දින සියයේ වැඩ පිළිවෙළ තුළ මේ රටට මොන තරම් විශාල සේවයක් ඉෂ්ට කරලා තිබුණාද? දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, සින්නක්කරයට ජනාධිපතිකම ලියාගෙන කටයුතු කරන්න තමයි එදා හිටපු මහින්ද රාජපක්ෂ මහත්තයා ක්‍රියා කළේ කියන එක අපි දන්නවා. නමුත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඒ තත්ත්වය වෙනස් කරලා තමන්ගේ ධුර කාලය -බලය- අවුරුද්දකින් අඩු කර ගත්තා. මෙතුමා හැර තමන්ගේ බලය අඩු කර ගත්ත ජනාධිපතිවරයෙකු මේ රටේ ඉතිහාසයේ කවදාවත් ඉඳලා නැහැ. අවුරුදු දෙක, තුන නොවෙයි, ජීවිතාන්තය දක්වා -මරණය වනතුරුත්, ලෙඩ ඇදේ ඉඳගෙනත්- ඒ ජනාධිපතිකම කරන්න තමයි ඔවුන් යම්කිසි විධියකින් කුරුමානම් ඇල්ලුවේ; පිඹුරුපත් හැදුවේ.

අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිව එතුමාගේ ප්‍රකාශනයේදී මෙහෙම කියනවා:

> "2015 ජනවාරි 08 දින මාගේ නායකත්වය යටතේ පිහිටුවනු ලැබූ ආණ්ඩුවේ ධුර කාලය තුළ, ක්‍රියාත්මක වූ 7 වැනි පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගත් ජනතාවාදී අණපනත් කිහිපයක් තිබේ."

දුම්කොළ හා මද්‍යසාර ජාතික අධිකාරය පිහිටුවීම කොච්චර වැදගත්ද කියලා එතුමා එම ප්‍රකාශයේදී කිව්වා. මත් ද්‍රව්‍ය නිවාරණය කරන්න ජාතික වැඩ සැලැස්මක් හැම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක කරලා, ඒක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ න්‍යාය පත්‍රයට දාලා, හැමදාම පසු විපරමක් කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ මේ ආණ්ඩුව විසින් කියන කාරණය මම කියන්න ඕනෑ. ඒ එක්කම, රාජිත සේනාරත්න මැතිතුමා, ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ උපදෙස් මත 2015 මාර්තු මස සම්මත කරනු ලැබූ ජාතික ඖෂධ පනත තුළින් ප්‍රාතිහාර්යයක් කළා. බෙහෙත් වර්ග 47ක මිල ගණන් අඩු කරලා, 'ස්ටෙන්ට්'වල මිල ගණන් අඩු කළා. අක්ෂි කාච ඇතුළු සමහර උපකරණ නොමිලේ ලබා දුන්නා. දුක් විඳලා, මැරෙන්න ලෑස්තිවෙලා -මරණ සහතිකය ලියලා තියලා- ඉස්පිරිතාලයට යන අහිංසක මිනිසුන් නැවත ප්‍රකෘති තත්ත්වයට ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළේ අපේ ආණ්ඩුව තුළින් පමණයි. ඒක අද සමහරුන්ට තේරෙන්නේ නැහැ. ඒ වෙනුවෙන් රුපියලක්වත් වියදම් නොකරපු, බෙහෙත් පෙත්තක මිල අඩු නොකරපු අයට මේ පිළිබඳව අවබෝධයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බෙහෙත් පෙත්තක, -පැනඩෝල් පෙත්තක, ඇස්ප්‍රින් පෙත්තක- මිල අඩු කර ගන්න පුළුවන්කමක් නැතිව හිටපු ඒ අයට අද මෙතැන ඒ ගැන කථා කරන්න පුළුවන්කමක් නැහැ.

ඒ විතරක් නොවෙයි, ජනාධිපතිතුමා මේ රටේ කොමිෂන් සභා කීපයක් පත් කළා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව වාගේම විගණන සේවා කොමිෂන් සභාව එතුමා විසින් පත් කළා. ඒ එක්කම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කළා. මේවා වැඩ නොවෙයිද කියලා මම අහනවා.

පසුගිය අවුරුදු 20ක්, 24ක් මේ රට පාලනය කළේ කවුද? 1994 ඉඳලා අවුරුදු 17ක්, 18ක් -වැඩි වාර ගණනක්- මේ රට පාලනය කළේ කවුද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කණ්ඩායම -වාමාංශික අය- තමයි වැඩි වාර ගණනක් මේ රට පාලනය කළේ. අද කෑ ගහන ඒ අයට අවුරුදු 20 ගණනක් නිස්සේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ගෙනෙන්න බැරි වුණා. ජාතික විගණන පනත ගෙනෙන්න බැරි වුණා. අතිගරු ජනාධිපතිතුමා විසින් ආංශික අධීක්ෂණ කාරක සභා පිහිටෙව්වා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

අපි ඊයේ ඡන්ද 119කින් සම්මත කර ගත්ත අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරුවරුන්ගෙන් සමන්විත අධිකරණ තුනක් නිර්මාණය කරන්න පුළුවන් හයියක් ලැබුණේ මේ ආණ්ඩුවට පින්සිද්ධ වෙන්නයි. "බළලා මල්ලෙන් එළියට පැන්නා" වාගේ කථාවක් ඒ තුළින් ඔප්පු කරලා තිබෙනවා. ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙනකොටම ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපෑලක් දමලා ඒ පනත් කෙටුම්පත ගෙන ඒම නවත්වන්න කුරුමානම් ඇල්ලුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් අපි අවශ්‍ය සංශෝධන ගෙනැල්ලා නැවත ඒ පනත් කෙටුම්පත ගෙනාවාම ඒ පනස්දෙදෙනාම ලජ්ජා නැතිව ඊට විරුද්ධ වුණා. ඒ අය රෙදි ඇඳගෙනද එයට විරුද්ධ වුණේ? ඒ අයට ලජ්ජාවක් තිබෙනවාද? මෙතැන ඉන්න ඒ අයගේ නම් කියන්න මම කැමති නැහැ. ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න අය ඇත්තටම කණ්ණාඩියක් ළඟට ගිහිල්ලා බලන්න. එතකොට, මේ පනත් කෙටුම්පත ගෙනාවේ මට නේද කියලා හැඟීමක් ඇති වෙනවා ඇති. අපි ඒ වාගේ අණ පනත් ගෙනාවා. යකඩ බට හොරු, කැරම් බෝඩ් හොරු විතරක් නොවෙයි, මුදල් වාගේම පොදු දේපළ අයථා විධියට පාවිච්චි කරපු අය වැරැදිකාරයන් වන වට පිටාව ඒ අණ පනත්වලින් හැදුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මේ අය කුරුමානම් ඇල්ලුවේ, පිඹුරුපත් හැදුවේ මේ අවුරුදු පහ යන කල් මෙවා කරගන්න බැරිවෙයි කියලායි. ඒකයි හිතුවේ. නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයන් වන අපි ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ ඉඳලා සමහර වෙලාවට දිනපතා රැස්වෙලා, මහන්සි වෙලා මේ පනත් කෙටුම්පත ගෙනාවා. අද ඒක යථාර්ථයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ ගැන මම සතුටු වනවා. ඒ නිසා දැන් භූමිතෙල් ගෑවුණු ගැරඬි වාගේ ටික ටික දහලනවා. දැන් කර කියා ගන්න දෙයක් නැහැ. මේ පනත් කෙටුම්පතට ඡන්දය විමසීමේදී එතුමන්ලාට පක්ෂව 52යි හිටියේ. එතැනදීත් කිසි දෙයක් කරන්නට බැරි වුණා. දැන් අපි දන්නවා අපේ ආණ්ඩුව ශක්තිමත් වෙලා තිබෙන බව. පසුගිය අවුරුදු තුනහමාරක කාලය තිස්සේ මේ ආණ්ඩුවේ කකුලෙන් ඇද්ද කණ්ඩායම දැන් අනෙක් පැත්තට ගිහිල්ලා වාඩි වෙලා ඉන්නවා. ලජ්ජා නැතිව අද කොහොමද ජනාධිපතිතුමාගේ ප්‍රකාශයට පක්ෂව තමුන්නාන්සේලා කථා කරන්නේ?

ජනාධිපතිතුමාගේ ප්‍රකාශයට පක්ෂව අද කථා කරන්න පුළුවන්කමක් තිබෙනවාද? ලජ්ජා නැතිව, "වැඩ කෙරුණේ නැහැ" කියලා ආණ්ඩුවෙන් එළියට ගිහින්, ජනාධිපතිවරයාගේ අනුකම්පාව ගන්න අද මෙතැනට ඇවිත් කථා කරන්න සූදානම් වෙලා තිබෙනවා. ඒවා හොඳ නැහැ නේ. මේ කරපු ක්‍රියාදාමවලට අබමල් රේණුවක තරමින් හෝ තමුන්නාන්සේලාත් දායක වුණා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න දයාසිරි ජයසේකර මැතිතුමා දායක වුණා; එස්.බී. දිසානායක මැතිතුමා දායක වුණා. මේ රටේ මාර්ග සංවර්ධනය කරනකොට ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා එක්ක අපේ ඩිලාන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමාත් දායක වුණා. අපි ඔබතුමන්ලාගේ ඒ සේවය අගය කරනවා. හැබැයි, එළියට ගිහින්, "මේ ආණ්ඩුවත් එක්ක අපට දීග කන්න බැහැ. අපි එළියට බහිනවා" කිව්වොත් ඒ ගැන කනගාටු වෙන්න ඕනෑ. එහෙම නම්, අවුරුදු තුනහමාරක් ඉන්නේ නැතිව ආණ්ඩුව ඇවිත් මාස හයෙන් ගෙදර යන්න ඕනෑ. ආණ්ඩුව ඇවිත් මාස හයෙන් එළියට යන්න ඕනෑ. නමුත් ඒ විධියට එතුමන්ලා කටයුතු කළේ නැහැ. ඒ අය අවුරුදු තුනහමාරක් සියල්ල භුක්ති විඳලා, රැකියා ටික දීලා, ඒ සියලු දේවල්වලින් සතුටු වෙලා අවසානයේ හිතුවා, "2020 මේ ආණ්ඩුව ඉවරයි. අපි අනෙක් පැත්තට ගිහින් වාඩි වෙලා, ජැක් එකක් ගහගෙන, බොරුවට දුම්මල ටිකක් ඇල්ලුවාම දෙවියෝ බලලා අපට ඒ අයත් එක්ක එකතු වෙන්න පුළුවන්" කියලා. වැරදුනේ එතැනයි. මේ වාගේ තුට්ටු දෙකේ වැඩ, සිල්ලර වැඩ කරන්න සූදානම් වෙන්න එපා. මහින්ද අමරවීර මහත්මයලා වාගේ කොන්ද කෙළින් තියාගෙන ඉන්න. තමන්ගේ පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම්, ඒකත් එක්ක ආණ්ඩුව හැදුවා නම්, ජනාධිපතිතුමා එක්ක ඒ ගමන ගියා නම් මැරෙනතෙක් එතුමාත් එක්ක ඉන්නවාය කියන ප්‍රතිපත්තියේ ඉන්න ඕනෑ. ඒකට තමයි ප්‍රතිපත්තිය කියන්නේ. එතැනට, මෙතැනට පැන පැන ගෙම්බෝ වාගේ කටයුතු කරනවා නම් ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරණා ගොඩක් කියන්න තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය කාල පරිච්ඡේදය තුළ කරපු සේවාව පිළිබඳව ඔබතුමා දන්නවා. අපේ ගාමිණී ලොකුගේ මැතිතුමා කියනවා, තෙල් මිල වැඩි වීම ගැන. තෙල් මිල අඩු වීම, වැඩි වීම කාලීනව සිද්ධ වන දෙයක්.

මම ඒ ගණන් කිව්වා. 1994දී එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව තමුන්නාන්සේලාට භාර දෙනකොට, මා මිත්‍ර මහින්ද අමරවීර මැතිතුමන්ලා සහ අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියේ. එදා තෙල් මිල කීයද, අද තෙල් මිල කීයද කියලා ගණන් බැලුවොත් කොහොමද? එහෙම තමයි ආර්ථිකයක හැටි. 2001දී එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ලා, මූලාසනයේ සිටින තමුන්නාන්සේලා ආණ්ඩුව භාර ගන්නකොට, මේ රටේ තිබුණේ ඍණ ආර්ථිකයක්. හැබැයි, ඒක ධන කළේ රනිල් වික්‍රමසිංහ මහත්මයා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය පැවැති කාලයේ විශේෂයෙන්ම කරුණාඅම්මාන්ලා වාගේ අය එල්ටීටීඊ සංවිධානයෙන් කඩලා-බිඳලා, යුද්ධය දිනුමට අවශ්‍ය පසුබිම සකස් කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. තමුන්නාන්සේලා ඒ බව දන්නවා. ඒ වාගේ හොඳ දේවල් කළා. නමුත් අවාසනාවන්ත විධියටත් යම් යම් සිදුවීම් වුණා. අපි ඡන්දයෙන් පැරදුණා; අවුරුදු 17ක් විතර දුක් වින්දා. එදා, 2013දී විතර කිව්වේ නැහැ, මහින්ද රාජපක්ෂ මහත්මයා කවදාවත් පරදියි කියලා. හැබැයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2013දී විතර කිව්වා, "මම 2015දී ආණ්ඩුවක් ගන්නවා" කියලා. මට කියන්න තිබෙන්නේ ඒකයි. අපට අංජනම් බලා 2020 මැතිවරණ ප්‍රතිඵලය කියන්න පුළුවන්කමක් තිබෙනවා නම්, විපක්ෂයේ සිටින කිසි කෙනෙක් මේ ස්ථානවල ඉන්නේ නැහැ කියලා මා හිතනවා. එහෙම නම් ඔක්කෝම ගිහින් ආණ්ඩු පක්ෂයේ වාඩිවෙයි. දෛවෝපගතව යම් යම් සිදුවීම් වෙනවා. හැබැයි, අපි 2015දී බලයට එනකොට, ලෝකයේ තිබුණු තත්ත්වය, රට පිළිබඳව තිබුණු තත්ත්වය මොකක්ද කියලා කාටවත් අමතක කරන්න බැහැ. එදා කිව්වේ, මහින්ද රාජපක්ෂ මහත්මයා විදුලි පුටුවේ වාඩි කරවනවා කියලායි. එතුමාට අත්වෙන්නේ ඒ ඉරණමයි කිව්වා. ඒ විතරක් නොවෙයි, මේ රට ඉදිරියට ගෙනයන්න දෙන්නේ නැහැ, රට ඉවරයි කියලා ඩයස්පෝරාව කිව්වා.

ඉතාම අකාරුණික තත්ත්වයකට මේ රට ලක්වෙලා තිබුණා. කළු පැල්ලම් සහිත, ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට අපේ රට පත් වුණා. නමුත් මොකක්ද ඇති වුණු වෙනස? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති හැටියට, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති හැටියට ඇවිල්ලා ලෝකයත් එක්ක සම්බන්ධතා ඇති කර ගත්තා. එදා තිබුණු තත්ත්වය මොකක්ද කියලා ධීවර ඇමතිතුමා දන්නවා. එදා මත්ස්‍ය තහනම පනවා තිබුණේ කොහොමද? ඒ තහනම ඉවත්කර ගන්න මොන තරම් මහන්සි වුණාද? ඒකට ජනාධිපතිතුමා මොන තරම් මහන්සි වුණාද, අගමැතිතුමා මොන තරම් මහන්සි වුණාද? ලෝකයේ රටවලට ගිහිල්ලා, යුරෝපා හවුලත් එක්ක සාකච්ඡා කරලා මත්ස්‍ය තහනම ඉවත් කළා. ඒ නිසා අද මත්ස්‍ය අපනයනය වැඩි කරන්න පුළුවන් තත්ත්වයකට, ඒ තුළින් වරප්‍රසාද ගන්න පුළුවන් තත්ත්වයකට රට පත් කරලා තිබෙනවා.

අද කර්මාන්ත ගැන කථා කරනවා. මහින්ද රාජපක්ෂ පාලන කාලය තුළ රැකියා 50ක් දෙන්න පුළුවන් විධියට හදපු කර්මාන්තශාලාවක් තිබෙනවා නම් කරුණාකරලා මට කියන්න. එකක්වත් හදලා නැහැ. ඉතින් ආර්ථිකය, කර්මාන්ත ක්ෂේත්‍රය වැඩිදියුණු වෙන්නේ කොහොමද? කෘෂිකර්මාන්තය හැමදාම කඩා වැටෙනවා. 2017 හෝ මේ කාල සීමාවේ නොවෙයි, 2014ට ඉස්සෙල්ලා 1993 ඉඳලා ගණන් හදා බැලුවොත්, කෘෂිකර්මාන්තය හැමදාම කඩා වැටුණු බව අපට පෙනෙනවා. ඒක වෙනස් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්, ආකල්ප වෙනස් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න කිසිම ආණ්ඩුවකට බැරි වුණා. ඒ නිසා අපි ඒවා හදන්න ඕනෑ. ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, අලුතින් පත් වී සිටින කෘෂිකර්ම ඇමතිවරයා හැටියට තමුන්නාන්සේට ඒ සම්බන්ධව ලොකු වග කීමක් තිබෙනවාය කියලා මා විශ්වාස කරනවා. පොහොර සහනාධාරය දීම පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ඒ පිළිබඳ නොයෙක් මතවාද තිබුණා. හැබැයි, පොහොර සහනාධාරය දෙන්න අපහසු වුණත්, අමාරුකම් තිබුණත් අපි එය නැවත ලබා දෙන්න කටයුතු කළා. ඒ නිසා අපට ඉතාම පැහැබර අනාගතයක් පිළිබඳ විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා හිතන්න එපා, මේක මෙතැනින් පණ යන ආණ්ඩුවක් කියලා.

පසුගිය දා විශ්වාස භංග යෝජනාව ගෙනා වේලාවේ තමුන්නාන්සේලා අපට "ඉන්ජෙක්ෂන්" ගහලා, "ඡන්ද 113ක් ගන්නවා, අතනින් ගන්නවා, මෙතැනින් ගන්නවා, අහඹරුවාදා වෙනකොට මහින්ද රාජපක්ෂ අගමැති වෙනවා" කියමින් සිහින මැව්වා. නමුත් අන්තිමට ඒ විශ්වාස භංග යෝජනාව තුළින් ඒ අයම භංගත්වයට පත් වෙලා අද අතර මං වෙලා, නන්නත්තාර වෙලා ඉන්නවාය කියලා මා හිතනවා.

මේ පවතින තත්ත්වය තුළින් ඉදිරියට යෑම සඳහා අපට විශාල වැඩ පිළිවෙළක් තිබෙනවාය කියලා අපි පැහැදිලිව කියනවා. අපි සමෘද්ධි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. අපි උපාධිධාරීන් 20,000කට ආසන්න පිරිසකට හෙට-අනිද්දා වෙනකොට රැකියා ලබා දෙනවා.

ඒ විතරක් නොවෙයි, ඉදිරියේදී මේ රටේ ද්‍රවිඩ ජනතාවත් එක්ක, මුස්ලිම් ජනතාවත් එක්ක සහජීවනයෙන් යුතුව ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් නිර්මාණය කිරීමේ හැකියාව තිබෙන්නේත් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ අපිත් එක්ක එකතුවෙලා සිටින අපේ මහින්ද අමරවීර මැතිතුමා ඇතුළු 23දෙනා එක්කයි කියලා අපි විශ්වාස කරනවා. ජනාධිපතිතුමා යම් යම් ප්‍රකාශ කරන කොට, "දැන් රනිල්-මෛත්‍රී දිගය ඉවරයි; දැන් හරි; අපිට යන්න කාලය ඇවිල්ලා" කියලා ආණ්ඩුවෙන් ගිය අය හිතුවා. නමුත් රට ගැන හිතපු අපි කිසි ලෙසකින්වත් එහෙම පටු අදහස් දරාගෙන කැඩිලා-බිඳිලා වෙන් වෙන්න සූදානම් නැහැ කියන එක මතක තබා ගන්න.

අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. ජනාධිපතිතුමා කළ කථාව සම්බන්ධව මම සතුටු වෙනවා. මේ රටේ අපට තිබුණු විශාල අභියෝග ජය ගන්නට අපට පුළුවන්කමක් ලැබුණා. විශේෂයෙන්ම බලන්න, අද මොන තරම් විනිවිදභාවයක් මේ රටේ තිබෙනවාද කියලා.

හෙට-අනිද්දා වෙනකොට ත්‍රිපුද්ගල මහාධිකරණ තුනක් ස්ථාපිත වෙනවා. ඒ තුළින් නොයෙක් විධියේ බරපතළ අපරාධ, දූෂණ සම්බන්ධව තිබෙන ලිපි ගොනු ටික -ලිපිගොනු 33ක්-34ක් පමණ තිබෙනවා.- අරගෙන නඩු පවරනවා. තවම -හැම දාම- ඇප දීදී, ඇප ගනිමින් සිටින බොහෝ දෙනෙකුට නැවත උසාවියට ගිහිල්ලා ඒ චෝදනාවලට උත්තර බඳින්න වෙනවා.

ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ පොදු දේපළ විනාශ කළා. මේ රටේ මිනිස්සු හරි හම්බ කරලා රජයට ගෙවපු බදු මුදලෙන් ලබා ගත් ජාතික සම්පත් පසුගිය රජයේ යම් යම් ක්‍රියාකාරකම් තුළින් ඒ අයගේ බුදලයක් ලෙස තබා ගත්තා. රජයේ සම්පත් අවභාවිත කිරීම සම්බන්ධයෙන් පොදු දේපළ පනත යටතේ එම නඩු ටික විභාග කරන කොට ඒකාබද්ධ විපක්ෂයේ කී දෙනෙකු ඉතුරු වෙයිද දන්නේ නැහැ. ඒ අයට දෙවි හාමුදුරුවන්ගේ පිහිටයි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සරහට ගත් පය පසුපසට තැබූ හිටපු රාජ්‍ය ඇමැති මගේ මිත්‍ර ඩිලාන් පෙරේරා මැතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාට නැවත ජනාධිපතිතුමා එක්ක එකතු වෙලා 2020දී විශේෂයෙන්ම යහ පාලනයක් යටතේ ජාතික ආණ්ඩුවක් හැටියට ඉදිරියට යන්න ශක්තිය ලැබෙනු ඇතැයි මා විශ්වාසය කරනවා. එය එසේ සිදු වේවා යැයි ප්‍රාර්ථනා කරනවා. ජනාධිපතිතුමාට හිතවත්කමින් ඉන්නවා නම්, ඉන්න කියලා අපි එතුමන්ලාට කියනවා. ඒක තමුන්නාන්සේලාට ආශීර්වාදයක්. කුමන්ත්‍රණවලට හා නොයෙකුත් බොරු බේගල්වලට යට වෙලා අපි යන මේ ගමන නවත්වන්න, අපේ අනාගතය විනාශ කර ගන්න අපි ලෑස්ති නැහැ. සිදු වෙච්ච වැරැදි නිවැරදි කරගෙන, යහ පාලන රජයක් යටතේ ඉතා යහපත් ගමනක් යන්නට අපි බලාපොරොත්තු වනවා. ඒ සියලු කාරණා මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

[අ.භා. 3.51]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව කෙරෙන විවාදයේදී මටත් අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා. මම කථාව පටන් ගන්න මේ අවස්ථාව වනකොට වෙලාව පස් වරු 3.50යි. ඒ නිසා මට නියමිත පරිදි වෙලාව දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ඉතා හොඳින් පටන් ගන්නයි මා සිතා සිටියේ. නමුත් විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කරපු කථාවෙන් පස්සේ මම කල්පනා කළා මුලින්ම මෙය කිව යුතුයි කියා. එදා එතුමාත් විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ දී කකුලක් ඉස්සරහට තියලා, ආපහු කකුල පස්සට ගත්ත කෙනෙක්. මම ඒ ගැන ඊට වැඩිය කියන්න යන්නේ නැහැ. නමුත් එතුමා කිව්වා, ගෙම්බෝ වාගේ එහාට මෙහාට පනිනවා කියලා. එතුමාත් ගෙඹි පවුලේම කෙනෙක් තමයි. මොකද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඳලා එතුමා ගිහිල්ලා අද එක්සත් ජාතික පක්ෂය රකිමින් ඉන්නවා. අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත්, පොඩ්ඩක් කල්පනා කරලා බලන්න වෙයි. [බාධා කිරීමක්] නැහැ. මට වෙලාව නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමාට බාධා කළේ නැහැ. [බාධා කිරීමක්] මම බාධා කළේ නැහැ. ඔබතුමා කියපු දේවල් අපි අහගෙන හිටියා. වාඩිවෙන්න. ඔබතුමා කියන දේ අහන්න විධියක් නැහැ. අපි නිවැරදිව වැඩ කරලා තිබෙන බව මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි. [බාධා කිරීමක්] විනයක් ඇතිව කටයුතු

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කරන්න. පොඩ්ඩක් ඉඳ ගන්න. [බාධා කිරීමක්] මේ තරම් කඩේ යන්න ඕනෑ නැහැ. පක්ෂයේම ඉඳගෙන එදා විශ්වාස භංගයට පක්ෂව ඡන්දය දෙන්න හිටපු තව එක්කෙනෙක් තමයි මේ. දැන් ගුණ කථන කරනවා. මහ ලොකුවට රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ගුණයි, ආණ්ඩුවේ ගුණයි, මහින්ද අමරවීර මහත්තයාගේ ගුණයි ගායනා කරනවා. මේ ගොල්ලෝ එහෙම තමයි. ගුණ ගායනා කරන්න පටන් ගත්තාම එහෙමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලාට රිදෙනවා. කියන කොට හරියට වදිනවා. එතකොට රිදෙනවා, ඒකයි ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ බොහොම පැහැදිලිව කියනවා, ජනවාරි 08 එතුමාට දැවැන්ත අභියෝගයක් තිබුණා කියලා. ඒ අභියෝගය මොකක්ද කියා අපි දන්නවා. 2015 ජනවාරි 08වැනි දා පැවැති මැතිවරණයේදී අපිත් වැඩ කරපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පරාජයට පත් වෙලා ඒ ආණ්ඩුව පෙරළුනාම, විපක්ෂයේ 142ක් සහ ආණ්ඩු පක්ෂයේ 47දෙනෙක් ඉන්න අවස්ථාවක තමයි එතුමා මේ ක්‍රියාවලිය සම්මත කර ගන්න පාර්ලිමේන්තුවට එන්නේ. මම විශ්වාස කරන හැටියට පාර්ලිමේන්තුවේ බලයක් නැතුව පත් වෙච්ච ලංකාවේ පළමුවැනි ජනාධිපතිවරයා. එතුමා ඒ විධියට පත් වුණා. ඩී.බී. විජේතුංග මැතිතුමා කාලයක් හිටියා. හැබැයි, එතුමාගේ කාලයේ විපක්ෂයට වැඩි නියෝජනයක් තිබුණේ නැහැ. නමුත් මම කියන්න කැමැතියි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට විශාල අභියෝගයක් තිබුණු බව. ඒක තමයි, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම. ඒ වාගේම තව විශාල වැඩ කොටසක් එතුමාට කරන්න තිබුණා. ඒ සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න එතුමා අවංකව පියවර ගත්තා. ඒ නිසා තමයි එතුමා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. අපි කල්පනා කළා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කටයුතු කරයි කියලා. ඒ සඳහා තුනෙන් දෙකක බලයක් වාගේම, ජනමත විචාරණයකට යෑම අවශ්‍ය බව කවුරුත් නොදන්නවා නොවෙයි. හැබැයි, තුනෙන් දෙකේ බලය ගන්න අවශ්‍ය ක්‍රියාදාමය ක්‍රියාත්මක වනකොට රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ එක්සත් ජාතික පක්ෂයේ සමහර අය- මම එක්සත් ජාතික පක්ෂයේ හැම කෙනාටම දෝෂාරෝපණය කරන්න සූදානම් නැහැ.- කල්පනා කළා තමන් බලයට ගෙනාපු ජනාධිපතිවරයාගේ තටු ටික කපලා, නිකම්ම නිකම් ජනාධිපතිවරයෙක් විධියට එතුමාව තියලා, විධායක අගමැති විධියට පාර්ලිමේන්තුව පාලනය කරන්න; ජනාධිපතිවරයාව පාලනය කරන්න. ඒ අරමුණ වෙනුවෙන් තමයි ඒ ගොල්ලෝ තමන්ගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ.

තමන්ට ජයග්‍රහණය කරන්න නොහැකි නිසා ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන්න පිටින් අශ්වයකු ගෙනැවිත් ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන ගියේ ඒ නිසායි. හැබැයි ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබුණු ක්‍රියාදාමය තුළ එය ක්‍රියාත්මක කරන්න වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීම සහ පත් කිරීම පිළිබඳ තිබෙන කාරණා බලන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46.(2) (අ) හා (ආ) අනුව ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවුවහොත් හෝ මිස වෙනත් කිසිම විධියකට අගමැතිවරයා අස් කරන්න බැහැ. මේ ව්‍යවස්ථාව ගෙනාවේ ඒ ක්‍රියාදාමය තුළයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, අග්‍රාමාත්‍යවරයකුට පිස්සු හැදුණත් එතුමා ඉවත් කරන්න බැරි තැනකට දැන් පත්වෙලායි තිබෙන්නේ.

එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන මා කියන්න කැමැතියි. ජනාධිපතිතුමා මේ කාරණය බොහොම පැහැදිලිව කියනවා. මේ කාරණය කියවා බලන්න, විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි. නව සැසි වාරය විවෘත කරමින් ජනාධිපතිතුමා 2018.05.08 වන දින කළ කථාවේ 20 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "ජාතික ආණ්ඩුව සැදුම්ලත් වන්නේ එකිනෙකින් වෙනස් දෘෂ්ටීන්ගෙන් යුතු දේශපාලන පක්ෂවලිනි. එම පක්ෂ ක්‍රියාත්මක විය යුත්තේ බුදුන් වහන්සේ පෙන්වා දුන් පරිදි, වජ්ජීන් මෙන් සමගිය සහ සාකච්ඡාව පෙරදැරිව නම්, වජ්ජීන් අනුගමනය කරන ලද ක්‍රියා මාර්ගයන් සැබෑ ලෙසම අප ද අනුගමනය කළ යුතු වෙමු. ජනාධිපතිවරයා ලෙස පසුගිය තෙවසර තුළ මා ක්‍රියාත්මක වූයේ එකී ධර්මතා පදනම් කොට ගෙනය. එය රටේ ද සමස්ත ජනතාවගේ ද ජයග්‍රහණයට හේතුවන බව මම තරයේ විශ්වාස කරමි."

තවදුරටත් ජනාධිපතිතුමා කියනවා, මේ ආණ්ඩුව ගෙන යන්න එකතු වුණු පක්ෂ දෙක නයි-මුගටි වාගේ මරා ගන්නේ නැතිව කරුණාකරලා මේ කටයුත්ත කරන්න කියලා. පසුගිය අවුරුදු තුනේ එහෙම කළාද? අපේ ආර්ථික ප්‍රතිපත්ති මොනවාද? අපි දන්නවා, බණ්ඩාරනායක මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගැන. එතුමාගේ ප්‍රතිපත්ති තමයි, ලිබරල්වාදී ජාතිකවාදය, බහුත්වවාදය, ජනප්‍රියවාදය සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය. මේවා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මූලික කාරණා බවට පත් වෙලා තිබුණේ. අපි ඒ ක්‍රියාදාමය තමයි ඉදිරියට ගෙන ගියේ.

මේ රටේ ජාතික සම්පත් විකුණනවාට අපි විරුද්ධයි. අපේ පක්ෂය, ජාතික සම්පත් ආරක්ෂා කරගෙන වැඩ කරන්න ඕනෑ පක්ෂයක්. එක්සත් ජාතික පක්ෂය විවිධ කාලවල, විවිධ අදහස් මත විවිධාකාරයෙන් වෙනස් කළා. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ කෘෂිකර්මය මුල් කර ගත් ආර්ථික ක්‍රමයක් තමයි තිබුණේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ රජය විසින් නායකත්වය දුන් ආර්ථික ක්‍රමවේදයක් රොනී ද මැල් මැතිතුමන්ලාත් එක්ක ඇති කළා. නවීකරණය පිළිබඳ අදහස් ඒ තුළ ගැබ් වුණා. ඊළඟට ආර්. ප්‍රේමදාස මැතිතුමා සමානාත්මතාව මත පදනම් වූ ආර්ථික වර්ධනයක් කරා ගෙන ගිය වැඩ පිළිවෙළක් තමයි ගෙන ගියේ. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා මැතිවරණයට කලින් -මමත් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන කාලයේ - සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය - social market economy - පටන් ගත්තා. ඒක තමයි අපේ පරමාර්ථය විධියට පත් වෙලා තිබුණේ. අපි මේ ගැන දිගින් දිගටම කථා කළා. මේ සම්බන්ධයෙන් නිරෝෂන් පෙරේරා මැතිතුමාට මතක ඇති. හැබැයි එතුමා අද ඇවිල්ලා මොකක්ද කරන්නේ? අද රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද? නව ලිබරල් ධනවාදී ආර්ථික ක්‍රමයක්, ජාතික සම්පත් නැවත පෞද්ගලීකරණ ක්‍රියාදාමය, තොරතුරු වෙනස් කරලා මේ රටේ විවිධ ක්‍රියාමාර්ග ගැනීම හා නිදහස් වෙළෙඳ ආර්ථිකය පිළිබඳව සිද්ධාන්ත තමයි අද ඒ ගොල්ලන්ගේ ක්‍රියාදාමය බවට පත්වෙලා තිබෙන්නේ.

විජයපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට මේ කාරණය තේරුණේ නැති වුණාට ඒ කරුණු මත කැබිනට් මණ්ඩලය තුළදී අපට විශාල වශයෙන් ගැටීම් ගණනාවක් ඇති වුණා. කැබිනට් මණ්ඩලය තුළ කථා කරනකොට ඒ ක්‍රියාදාමයට විරුද්ධව සමහර කාරණා පිළිබඳව අපි දිගින් දිගටම කථා කළා. මේ රටේ රාජ්‍ය ආයතනවල ගිණුම් පවත්වාගෙන යන්නේ රාජ්‍ය බැංකුවලයි. මේ සිද්ධියට අදාළ දිනවල විශාල ප්‍රශ්නයක් ඇති වුණා. ඒ ප්‍රශ්නය තමයි, රාජ්‍ය බැංකුවල සියලුදෙනාම වැඩ වර්ජනය කළා. ඒ සම්බන්ධයෙන් පසුව දා ගෙනාපු වැඩ පිළිවෙළ මොකක්ද? රාජ්‍ය බැංකුවල නිලධාරීන්, රාජ්‍ය සේවකයන්, බැංකු සේවකයන් තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පාරට බැස්සාම පසුව දා උදේ කැබිනට්

පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා. ඒ කැබිනට් පත්‍රිකාවේ තිබෙන්නේ මොකක්ද? ඒ කැබිනට් පත්‍රිකාවේ තිබෙන්නේ, රාජ්‍ය බැංකුවල තිබෙන රාජ්‍ය අංශයේ ආයතනවල සියලුම ගිණුම් පෞද්ගලික බැංකුවලට හරවන්න ඕනෑය කියන එකයි. මේ රටේ රාජ්‍ය බැංකු ආරක්ෂා කරන්න මුළු ඉතිහාසය පුරාම ගෙන ගිය වැඩ පිළිවෙළ විනාශ කරන වැඩ පිළිවෙළකට ගියා. එදා අතිගරු ජනාධිපතිතුමා සිටියේ නැත්නම්, එදා කැබිනට් මණ්ඩලය තුළ අපි කථා කළේ නැත්නම්, මේ රටේ රාජ්‍ය බැංකුවල තිබුණු රාජ්‍ය ආයතනවල සියලුම ගනුදෙනු පෞද්ගලික බැංකුවලට හරවන්නයි හැදුවේ.

ඒක රාජ්‍ය බැංකු කඩා වට්ටන වැඩ පිළිවෙළක්. මේක තමයි මේ ගොල්ලන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය. ඒකයි මම කිව්වේ, ඒ දේවල් පිළිබඳව දේශපාලනමය වශයෙන්, ආර්ථිකමය වශයෙන් පක්ෂයක් විධියට අපට ප්‍රශ්න ගණනාවක් තිබුණු බව. මේ පක්ෂ දෙක එකට එකතුවෙලා මේ ආණ්ඩුව හදලා අපේ ජනාධිපතිතුමා බොහොම මධ්‍යස්ථව වැඩ කටයුතු ටික කරගෙන යනකොට මොකක්ද කළේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට කඩන්න ඒ අයට ඕනෑ වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට කඩලා ඒකෙන් ගත්ත මහා සන්තෝෂය -සන්තුෂ්ටිය- මත ඒ ගොල්ලෝ කල්පනා කළා, ඊළඟ මහ මැතිවරණවලදී, ඊළඟ පළාත් පාලන මැතිවරණවලදී දෙගොල්ලෝ දෙකට බෙදෙනවා, බෙදුණාම අපට දිනන්න පුළුවන්ය කියලා. ඒක තමයි ඔවුන්ගේ ක්‍රියාදාමය. ඒකයි අපි කියන්නේ, මේ එකතු වීම පාවිච්චි කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනාශ කිරීමේ ක්‍රියාවලියට අවශ්‍ය කරන කටයුතු ටික කරන්න කියලා. එක පැත්තකින් ඒක සිද්ධ වුණා. හැබැයි, අවසාන ප්‍රතිඵලය වුණේ මොකක්ද? පළාත් පාලන මැතිවරණයට ඉස්සෙල්ලා සමහර පළාත් සභා මන්ත්‍රීවරු ඉල්ලා අස්වෙලා පළාත් පාලන මැතිවරණයට ඉල්ලුවා. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී සේනක දමයන්ත මැතිතුමා ඉල්ලා අස්වෙලා මොරටුව නගර සභාවට ඉල්ලුවා. ඒ මොකද? ඔවුන් හිතුවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට බෙදුණාම දිනන්න පුළුවන් කියලා. මොකද වුණේ? අවසාන වශයෙන් ජයග්‍රහණය කළේ පොදුජන පෙරමුණයි. අපට මොකක්ද වුණේ? තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ තුළින් ප්‍රධාන පක්ෂ දෙකේ එකතුමුතුකම විනාශ කරන්න තමයි කටයුතු කළේ. ඒ ගැන අවබෝධයක් ඇතිවයි අපි කටයුතු කළේ. ඒවා ගැන අවබෝධයක් නැතුව නොවෙයි, අපි මේක ඇතුළේ දේශපාලනය කරන්නේ.

අනික් කාරණය ගැනත් මම තමුන්නාන්සේලාට කියන්නම්. විශේෂයෙන් බලන්න, අද ලෝකයේ මොකද වෙන්නේ කියලා. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අපේ ඡන්ද ප්‍රතිඵලය මොකක්ද? ඡන්ද ව්‍යාපාරය පැවැති කාලයේ මම දැක්කා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගිහින් කියනවා, ලංකාව තුළ යුරෝපීය මොඩලය ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවාය කියලා. යුරෝපීය මොඩලය අද ලෝකයේ කඩාගෙන වැටෙන එකක්. අද යුරෝපීය මොඩලය පරාජය වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා, චෙක් ජනරජයට මොකද වුණේ කියලා. චීනයට, රුසියාවට පක්ෂපාති ජනාධිපතිවරයෙක් තමයි චෙක් රාජ්‍යයේ පත් වුණේ. යුරෝපීය මොඩලය ගෙනාපු නිසා අද ග්‍රීසිය ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා තිබෙන්නේ. බලන්න, මැලේසියාවේ හිටපු අග්‍රාමාත්‍ය මහතීර් මොහමඩ් මැතිතුමා අද නැවත අගමැති ධුරයට පත් වුණේ ඇයි? ආසියානු ක්‍රියාදාමය, තමන්ගේ රට ඇතුළේ තිබෙන ජාතිකවාදය, ඒ වාගේම තමන්ගේ රට ඇතුළේ තිබෙන ආර්ථික ක්‍රමෝපායන් ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙල තුළ තමයි ඔහු ජයග්‍රහණය කළේ. අන්න එවැනි ජයග්‍රහණ තමයි අද මුළු ලෝකයේම මැතිවරණ ප්‍රතිඵල ලෙස තිබෙන්නේ. හැබැයි, ඒ සියලු කාරණා ඇස් දෙකෙන් දැක දැක මේ රට යුරෝපීය මොඩලයකට අරගෙන යන වැඩ පිළිවෙළක් තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ වැඩ පිළිවෙළ බවට පත්වෙලා තිබුණේ.

ඒ විතරක් නොවෙයි, මේ ආර්ථික ක්‍රමවේදය තුළ අද අපේ තෙල් ටැංකි ටික ඉන්දියාවට භාර දෙන්න වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. සුමන්තිරන් මන්ත්‍රීතුමා ගිහින් කරපු කථා ගෙනැත් පරීක්ෂා කළාම අපට පෙනෙනවා, ඔවුන් පැහැදිලිව කියන්නේ තමිල්නාඩු මොඩලයේ සංවර්ධන ක්‍රියාදාමයත් එකට එකතු කරගෙන ඉදිරියට යන්න ඕනෑය කියන එක බව. එම නිසා මේ ආර්ථික ක්‍රමවේදය තුළ අද මේ රට කල්පනා කරන්නේ, ඊළඟට කොහොමද මත්තල විකුණන්නේ, ඊළඟට කොහොමද කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය විකුණන්නේ, ඊළඟට කොහොමද ඉන්දියානු තෙල් අධිකාරිය ඇති කරලා තෙල් ටැංකි ටික ඉන්දියාවට විකුණන්නේ කියන එකයි. ඒවා මත තමයි මේ ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට ඒවාට අත උස්සන්න අපට බැරි නිසායි අපි එළියට බැස්සේ. එහෙම නැතුව වෙන ප්‍රශ්නයක් නිසා නොවෙයි. ජනතාවගේ අවධානය, ජනතාවගේ ගෞරවය අපට අවශ්‍ය වෙලා තිබෙනවා. අවශ්‍ය නම් අපිට තව දුරටත් ආණ්ඩුව ඇතුළේ ඉන්න තිබුණා. කිසි ගැටලුවක් නැහැ. මීට කලින් කථා කළ විජේපාල හෙට්ටිආරච්චි මහත්තයෝ, ඒක නොවෙයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ඒක තේරුම් ගැනීමට ඇති නොහැකියාව පිළිබඳව අපි කනගාටු වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මතවාදය සහ එක්සත් ජාතික පක්ෂ මතවාදය අතර ඇති වුණු යම් නොගැළපීමක් තිබුණා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලිව්ඡවී පාලනය ගැන මහා කථා කියන කෙනෙක්. මම මේ එතුමාටම චෝදනා කරනවා නොවෙයි. නමුත්, එක්සත් ජාතික පක්ෂයේ පසු පෙළ සමහර මන්ත්‍රීවරු කල්පනා කළේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එහෙම පිටින්ම එක එක්කෙනාගේ වැඩ පිළිවෙළවල් තුළ හිරවෙලා ඉන්න අය විධියටයි. එහෙමත් නැත්නම් අපි ඒ අයගේ ආණ්ඩුවේ ඉන්න කොටස්කාරයෝ විධියට, නැත්නම් අතු විධියට -ශාඛාවක් විධියට- තමයි ඒ ගොල්ලෝ කල්පනා කළේ. ඒක නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. ඒ නිසා අපට තවදුරටත් එහෙම ඉඳගෙන කථා කරන්න බැහැ. "පිං ඇමතිවරු" කියලා ඒ කාලයේ කිව්වා. පුළුවන් නම් දැන් ඒ කථාව ආපහු කියන්න කියලා අපි කියනවා. එහෙම නම් පිං ඇමතිවරු දැනුත් ආණ්ඩුව ඇතුළේ ඉන්නවා. මේ වෙලාවේ අපි ඒකත් මතක් කරන්න ඕනෑ. ඒ නිසා අවුස්සගන්න එපා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කථාව පිළිබඳව කථා කරගෙන ආවා නම්, අපට ඒ ගැන කථා කරන්න පුළුවන්.

ඊළඟට, ගිය සතියේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කිව්වා, මේ රටේ සමෘද්ධි බැංකු ටිකේ තිබෙන මුදල් ටික, එහෙම නැත්නම් එහි පාලනය සම්පූර්ණයෙන් මහ බැංකුව යටතට ගන්නවාය කියලා. එතුමාගේ යටතේම තිබෙන ආයතනයක් වන මහ බැංකුව දවස් 50න් භූමියට සමතලා කරලා දැන් කියනවා, සමෘද්ධි බැංකු ටිකත් ගන්නවාය කියලා. මතක තියා ගන්න, මේ රටේ ලක්ෂ 15ක් පමණ අභිංසක මිනිස්සු එකතු කරලා තිබෙන මුදල් ටික තමයි මේ සමෘද්ධි බැංකුවල තිබෙන්නේ. බිලියන 140ක් -කෝටි 14,000ක මුදලක් - එතැන තිබෙනවා. අද ආණ්ඩුවට සල්ලි නැතිවයි ඉන්නේ. ගිය මාසයේ මිලියන 5,000ක් බැංකුවලින් අරගෙනයි මිනිස්සුන්ගේ පඩිය ගෙව්වේ. අද මේ ආර්ථික ක්‍රමය ඒ තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. පිළිගන්න, මේ ආර්ථික ක්‍රමයට තව දුරටත් යන්න බැරි බව. ඒක පැහැදිලිව අද ඔප්පු වෙලා ඉවරයි. ඒ නිසා අද අලුත් ආර්ථික ක්‍රමවේදයක් හදන්න වන තත්ත්වයකුයි තිබෙන්නේ.

එදා ගරු රවි කරුණානායක මැතිතුමා -එතුමා අපේ මිත්‍රයෙක්. - මේ ආණ්ඩුවේ පළමුවැනි අවුරුදු දෙක තුළ රටේ ආර්ථිකය විනාශයෙන් විනාශයට ගෙන ගියා. දැන් එතුමා කියනවා, ඒක දින සියයෙන් ආපසු හදන්න පුළුවන්ය කියලා. මට නම් තේරෙන්නේ නැහැ, කොහොමද එහෙම කරන්නේ කියලා. දින සියයෙන් හදන්න පුළුවන් ආර්ථිකයක් දැන් ඉතිරි වෙලා නැහැ. මොකද, එතුමා ගෙනාපු ප්‍රශ්න ගණනාවක් මේක ඇතුළේ තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළමුවැනි අය වැයේ ඉඳලාම ඇති වුණු තත්ත්වය බලන්න. මම ගිය සතියේත් පාර්ලිමේන්තුවේදී මේ ගැන කිව්වා. අපේ ආනයන බිලෙන් ඩොලර් මිලියන 849ක් රත්‍රන් ආනයනය කරපුවා. ඒ රත්‍රන්වලින් ලංකාවේ කර්මාන්ත හැදිලා තිබෙනවාද කියා කවුරුන් හෝ දැන් මට කියන්න. එක කර්මාන්තශාලාවක්වත් පටන්ගෙන නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, රත්‍රන් කිලෝ 14,000ක් මේ අවුරුද්ද ඇතුළත ලංකාවට ගෙනැත් තිබෙනවා. ඒ සියල්ල ආපසු ඉන්දියාවට ගිහිල්ලා තිබෙනවා. මා දැක්කා, අද උදේත් කවුරුන් හෝ කිව්වා, රත්‍රන්වල මිල වැඩි වෙලාය කියලා. ඒ රත්‍රන් සම්පූර්ණයෙන් හොර ජාවාරම් - smuggling - සඳහා ලංකාවට ගෙනෙන කොටයි සියයට සියයක් tax එක අඩු කළේ. මා දන්නේ නැහැ, ඒක කවුරුන් කළාද කියලා. නමුත්, රවි කරුණානායක මැතිතුමා කියා තිබුණා, "මගේ කාලයේදී මම සියයට සියයක් tax එක අඩු කළා, දැන් ආයෙත් සියයට 15ක tax එකක් පනවලා තිබෙන නිසා ප්‍රශ්නයක් තිබෙනවා" කියලා. මේක ඇතුළේම ඉන්න සමහර අය, සමහර නීති ගෙනැල්ලායි මේ සොරකම් ටික ක්‍රියාත්මක කළේ. මට වේලාව තිබුණා නම් මේ ගැන වැඩිදුර කථා කරන්න තිබුණා. දැන් කාල වේලාව මදි. මේ සමහර ක්‍රියාදාමයන්වලදී මම දිගින් දිගටම විරුද්ධ වුණා. මම කැබිනට් මණ්ඩලයේ ඉඳගෙන මධ්‍යම අධිවේගී මාර්ගයට විරුද්ධ වුණේ ඇයි? ඒ වෙන හේතුවක් නිසා නොවෙයි. මම කිව්වා, "මේකට ඩොලර් මිලියන 900ක් යනවා" කියලා. නමුත්, අපට 2020දීවත් මේ මධ්‍යම අධිවේගී මාර්ගය බලන්න හම්බ වෙන්නේ නැහැ. ඒ වුණත්, ආණ්ඩුවක් විධියට කරගෙන යන වැඩ පිළිවෙළේදී ගම්මානවල ඉන්න අපේ අභිංසක මන්ත්‍රීවරුන්ට ගම ඇතුළේ වැඩ කරන්න මේ ඩොලර් මිලියන 900 දෙන්න තිබුණා. ඒක දුන්නේ නැහැ. ඒක දෙන්නේ නැතිව, කොමිස් කුට්ටිවලට දැවැන්ත ව්‍යාපෘති දියත් කිරීමේ වැඩ පිළිවෙළ පටන් ගත්ත නිසා තමයි මේ කරදරය, මේ විනාශය සිද්ධ වෙමින් තිබෙන්නේ. ඒ නිසා මතක තියා ගන්න, අපි සටන් කෙරුවේ අපේ පක්ෂයේ ප්‍රතිපත්ති මතයි; තින්දු මතයි කියන එක. අපි මේ ආණ්ඩුවත් එක්ක එකට එකතු වෙලා ඉන්නවා නම්, මේ පක්ෂ දෙක එකට යනවා නම්, මේ පක්ෂ දෙකට ගෞරවනීය ලෙස එක විධියට සලකන්න ඕනෑ. නැතිව, අපි ඉස්සරහින් තණකොළ කවද්දී පිටුපසින් එන පිරිසක් කිරි දොවන්න හදනවා නම් එහෙම කරන්න දෙන්න බැහැ. අපි මේ තීරණය ගත්තේ අන්න ඒ ක්‍රියාදාමය තුළයි කියන එක මා බොහොම පැහැදිලිව තමුන්නාන්සේලාට කියන්න කැමැතියි.

විශ්වාස භංග යෝජනාවට පක්ෂව අපි ඡන්දය ලබා දුන්නා. ඒ ගැන මා අදත් සන්තෝෂ වනවා. මගේ හෘදය සාක්ෂියට එකඟව ඒ ක්‍රියාදාමය ගත්ත එක ගැන මා සන්තෝෂ වනවා. අපේ මන්ත්‍රීවරුන් 23දෙනකු අදත් -නවමත්- ආණ්ඩුවත් එක්ක ඉන්නවා. අපි ඉතාම සුහදව ඒ අය එක්ක කටයුතු කරනවා. විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට තේරුණේ නැති වුණාට අපිව අන්දවන්න හම්බ වෙන්නේ නැහැ. අපි අවශ්‍ය කරන කටයුතු ටික වෙලාවට කරනවා වාගේම ඒ අයත් අවශ්‍ය කරන කටයුතු ටික වෙලාවට කරාවි. 2020 දක්වා මේ ආණ්ඩුවට යන්න බැහැය කියන එක මතක තියා ගන්න. ඒ තත්ත්වයට දැන් පත් වෙලා ඉවරයි. ඊළඟට තිබෙන පළාත් සභා මැතිවරණවලදී, ජනාධිපතිවරණයේදී ඒ තත්ත්වය බලන්න පුළුවන්. අද එක්සත් ජාතික පක්ෂය ඇතුළේ තිබෙන්නේ පිපිරීම්. ඒක ඇතුළේ පසු පෙළ මන්ත්‍රීවරුන් විසිදෙනකුට වැඩි පිරිසක් අද රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගි වන එක රැස්වීමකටවත් යන්නේ නැහැ. අද එහි අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ඉවරයි. අපි ඒ මන්ත්‍රීකම දාලා භය නැතිව එතැනින් එළියට ආවේ එක්සත් ජාතික පක්ෂයේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය හදන්න බැරි නිසායි. මොකද, තව දුරටත් එක්සත් ජාතික පක්ෂය ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් නැහැ. අද ඒකේ නායකයන් එක් කෙනෙකුටවත් ඉස්සරහට එන්න බැරි තත්ත්වයක් ඇති කරලායි තිබෙන්නේ. ඒ නිසා පක්ෂයේ අභ්‍යන්තර අර්බුදය බේරා ගන්න බැරිව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට බෙදලා මේ අර්බුදය විසඳන්න හම්බ වෙන්නේ නැහැ.

අද අතිගරු ජනාධිපතිතුමාව පාවිච්චි කරලා, එතුමාව දෙකේ කොළයට දාලා සමහර මන්ත්‍රීවරු කථා කරනවා. අද එක්සත් ජාතික පක්ෂය බලයේ ඉන්නවා නම් බලයේ ඉන්නේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නිසා මිසක, මතක තියා ගන්න එක්සත් ජාතික පක්ෂය නිසා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බලයේ ඉන්නවා නොවෙයි කියන කාරණය. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ එතුමා උත්සාහ කරලා තිබෙනවා, එතුමා ගත් ක්‍රියාමාර්ග ගැන සඳහන් කරන්න. එතුමා ක්‍රියාමාර්ග ගණනාවක් ගත්තා. හොඳ වැඩ ගණනාවක් මෙහි තිබෙනවා. එතුමාට අනාගතයේ තව ක්‍රියාමාර්ග ගණනාවක් ගන්න තිබෙනවා. ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ක්‍රියාවලිය අද බටහිරට අවශ්‍ය කරන විධියට, බටහිරට ගැති පිරිසට වුවමනා කර තිබෙන විධියට කරලා රට අරාජික කිරීමේ ක්‍රියාවලියක් තුළින් රට බෙදීමේ ක්‍රියාවලියට යන අලුත් වැඩපිළිවෙළක් සකස් කරන ක්‍රියාදාමය තමයි මේ තිබෙන්නේ. ඒ නිසා මම හිතනවා, මේ ක්‍රියාමාර්ග ගැන හොඳට අවබෝධ කරගෙන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ක්‍රියා කරයි කියලා. ඔබතුමන්ලා ගෙනයන ක්‍රියාදාමයට අපට දෙන්න පුළුවන් හයියක්, ශක්තියක් තිබෙනවා නම් අපි ඒක දෙනවා. හැබැයි, අපට රටක් විධියට තවදුරටත් මේ රට අනාථභාවයට පත් කෙරෙන වැඩපිළිවෙළට අත උස්සන්න බැහැයි කියන කාරණයත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා.4.10]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

ජනාධිපතිතුමා මැයි මාසයේ 8වැනිදා පාර්ලිමේන්තුවේ කරපු කථාව සම්බන්ධයෙන් ඒකාබද්ධ විපක්ෂයෙන් විවාදයක් ඉල්ලුවා. හැබැයි, ඒ විවාදය ඉල්ලපු කවුරුවත් දැන් මේ ගරු සභාවේ නැහැ. හැබැයි, දිනක ආණ්ඩුවෙන් ඉවත් වෙලා විපක්ෂයට ගිය මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා. ඒ උදවියවත් රැඳී සිටීම ගැන අපි සතුටු වෙනවා. මීට පෙර කථා කරපු ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා, "මේ රටේ ආර්ථිකය බිඳ වැටිලා." කියලා. මේ රටේ වාර්ෂික අය වැය දළ වශයෙන් බිලියන 3,000ත් 4,000ත් අතර

ප්‍රමාණයකයි තිබෙන්නේ. 2015 අපි මේ රට භාර ගත්තාට පස්සේ ඊට කලින් ගත් ණය වෙනුවෙන් බිලියන 808ක් ගෙවලා තිබෙනවා. 2016දී එය බිලියන 741යි; 2017දී බිලියන 895යි. 2018දී බිලියන 1,150යි. ඒ වාගේම 2019දී බිලියන 1,160ක් ගෙවන්න තිබෙනවා. මේ ප්‍රමාණය සාමාන්‍යයෙන් අය වැයෙන් තුනෙන් එකකටත් වැඩියි. එහෙම තමයි පසුගිය කාලයේ ණය අරගෙන තිබුණේ. එහෙම වැටිච්ච ආර්ථිකයක් එක්ක තමයි අපි රට භාර ගත්තේ. ඒ වාගේම මේ රටේ කර්මාන්ත බිඳ වැටිලා තිබෙනවා කිව්වා. ආර්ථික ශක්තිය නැති වෙලා තිබෙනවා කිව්වා. නමුත් මතක් කරන්නට ඕනෑ, 2016 වරාය අධිකාරියේ ආදායම - 2017 අය වැයට පෙර- මිලියන 1,100ක් තිබුණු එක 2017දී මිලියන 13,200ක් වෙලා තිබෙන බව. මිලියන 12,000කින් ආදායම වැඩි වෙලා තිබෙනවා. එහෙම තත්ත්වයක් උඩ තමයි ආර්ථිකය වැටෙනවා කියලා මේ කතන්දර හදන්නේ. අපනයන ආදායම බිලියන 15.1ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. එය ඉතිහාසය තුළ වූ වැඩිම අපනයන ආදායමයි. ඒ වාගේම කර්මාන්තශාලා වැටිලා කියනවා; කර්මාන්තශාලා වහලා කියනවා; කර්මාන්තශාලා ආරම්භ වෙන්නේ නැහැ කියනවා. හැබැයි, එහෙම නම් අපනයන ආදායම ඉහළ ගියේ කොහොමද කියන එක ගැන ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ නිසා ඔය බේගල් ඇද බෑවාට, කට තිබුණු පළියට කෑ ගැහුවාට සංඛ්‍යා ලේඛන අරගෙන බැලුවාම එහෙම තත්ත්වයක් නැහැ කියන එක විශේෂයෙන් මතක් කරනවා. ඊළඟට, මේ රටේ යහ පාලන ආණ්ඩුව ආවාට පස්සේ ක්‍රියාත්මක කරපු ව්‍යාපෘති අතරින් "ළඟම පාසල- හොඳම පාසල" ව්‍යාපෘතිය තිබෙනවා. ඒ වාගේම සුරක්ෂා රක්ෂණාවරණය දරුවන් ලක්ෂ 45කට ලබා දෙනවා. අපි මේ රට භාර ගන්නකොට පාසල්වල පානීය ජලය විතරක් නොවෙයි, දරුවන්ට මුත්‍රා කරන්න වැසිකිළි පහසුකම්වත් තිබුණේ නැහැ. සියයට 10කට බොන්න පානීය ජලය තිබුණේ නැහැ. ඒ වාගේ ආර්ථිකයක් එක්ක තමයි අපි මේ රට භාර ගත්තේ. හැබැයි, හදපු අධිවේග මාර්ග ගැන, වරායවල් ගැන මම කියන්න යන්නේ නැහැ. ඒ වාගේම ගුවන්තොටුපොළවල් ගැන මම කියන්න යන්නේ නැහැ. මේ වෙනකොට වී වේලන පාරවල් ගැන කථා කරන්න යන්නේ නැහැ. එහෙම තමයි සංවර්ධනය කරලා තිබුණේ. අත්‍යවශ්‍ය දේවල්වලට අවධානය යොමු වෙලා තිබුණේ නැහැ. උතුරු මැද පළාත ගත්තාම එහි වකුගඩු රෝගීන් ඉහවහා ගිහිල්ලායි තිබුණේ. මොකද, ඔවුන්ට පානීය ජලය තිබුණේ නැහැ. මේ වෙනකොට විශේෂ වැඩපිළිවෙළක් හරහා ඔවුන්ට පානීය ජලය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

හිටපු නිවාස ඇමතිවරයෙක්, ඒකාබද්ධ විපක්ෂයේ වර්තමාන මන්ත්‍රීවරයෙක් ඊයේ ප්‍රශ්නයක් මතු කළා, ගම්උදා භූමියක් ගැන. අවුරුදු 5කට වැඩි කාලයක් නිවාස අමාත්‍යාංශය භාරව ඉඳලා එතුමාට ගම්මාන 10ක් හදා ගන්න බැරි වුණා. මේ වෙනකොට ගම්මාන 700ක් අපි හදලා තිබෙනවා. මේ වෙනකොට නිවාස 17,500ක් හදලා තිබෙනවා.

සංවර්ධනය කරපු ඒ වාගේ රටක ඉඳගෙන තමයි මේ වාගේ අපවාද නහන්නේ. පසුගිය කාලයේ යහපාලන ආණ්ඩුව මේ රට භාර ගන්නකොට විදුලිබලය ගැන ලොකු ප්‍රශ්නයක් තිබුණා. සූර්යබල සංග්‍රාමය හරහා මෙගාවොට් 150ක් ප්‍රධාන පද්ධතියට ලබා දී තිබෙනවා. පසුගිය කාලයේ මේවා ක්‍රියාත්මක කරන්නට බැරිවුණා. සූර්යබලය කියන එක මේ රටට අරහන් වෙලා තිබුණේ. ඒ වාගේම biomass මේ රටට අරහන්. සුළං බලාගාර මේ රටට අරහන්. මොකද, විදුලිබල මණ්ඩලය සහ ඒ ආයතන අතර මාෆියාවක් ක්‍රියාත්මක වුණා. ඒ උදවිය තමයි තීරණය කරන්නේ පෞද්ගලික අංශයෙන් විදුලිය කොච්චර මිලදී ගැනීම් කරනවා ද කියා. පසුගිය කාලයේ මේ රටේ විදුලිබලය සැපයුවේ එහෙමයි. ඒ වාගේම දුගී පවුල් දෙලක්ෂ හැත්තෑපන්දහසකට යහපාලන ආණ්ඩුව ආවාට පස්සේ විදුලිය ලබා දී තිබෙනවා. ඒ වාගේම ඊයේ ගෙන එනු ලැබූ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත ගැන කියන්නට ඕනෑ. මේ පනත ඒ අයට නයාට අඳුකොළ වාගෙයි. බොහොම අරහන්. මේකට විරුද්ධව දිගින් දිගටම කථා කළා. පසුගිය කාලයේ සොරකම් කළ උදවියයි මේවාට යන්න වෙන්නේ. ඒ කාලයේ සොරකම් කළ අය විතරක් නොවෙයි. ඉදිරියට එන අයත් ඒ වාගේ කටයුතු කළොත් ඒ අයටත් යන්න වෙනවා කියා අපි කියනවා. එම නිසා අධිකරණයට අත ගහන්නේ නැතිව බොහොම ස්වාධීනව තමයි මේ කටයුතු සංවිධානය කර තිබෙන්නේ.

දිගින් දිගටම කථා කළ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු මැලේසියාවේ මහතීර් මොහොමඩ් මැතිතුමා ගැන කථා කළා. එතුමන්ලාට මතක් කර දෙන්නට ඕනෑ, මහතීර් මොහොමඩ් මැතිතුමා වයස අවුරුදු 92ක් වෙලාත් බලයේ රැඳී සිටින්නේ සොරකම් කරලා නොවෙයි, ඒ රටට කළ සංවර්ධනය නිසාය කියා. පසුගිය කාලයේ සංවර්ධනය කරනවාය කියා වැඩිපුරම කළේ සොරකම්. ව්‍යාපෘති හැදුවා. ව්‍යාපෘතිය එන්න ඉස්සෙල්ලා තමන්ගේ කොමිස් එකේ ගණන හදනවා. එදා මේවා පැමිණිලි කරන්නට තැනක් තිබුණේ නැහැ. මේවාට අධිකරණ ක්‍රියාමාර්ග ගන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. නඩුවලට අවසාන තීන්දුව දුන්නේ අධිකරණය නොවෙයි. වෙනත් දේශපාලන බලපෑමක් හරහායි තීන්දු දුන්නේ. අද එහෙම නැහැ. අද ඉහළම තනතුරේ සිට පහළම -සාමාන්‍ය ජනතාව දක්වා- අයට උසාවියට ගිහින් සාධාරණය ඉෂ්ට කර ගන්නට මේ ආණ්ඩුව කටයුතු කර තිබෙනවා. එම නිසා මහතීර් මොහොමඩ් වෙන්න ඔය රාජපක්ෂ රෙජිමයේ කිසිවෙකුටත් හැකියාව නැති බව විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

සමහර මන්ත්‍රීවරු බලාගාර ගැන කථා කළා. නොරොච්චෝලේ බලාගාරය ගැන කථා කළා. අධිවේගී මාර්ග ගැන කථා කළා. මේ ඔක්කොම ණය ගෙවලාලු තියෙන්නේ. එහෙම ගෙව්වා නම් රාජපක්ෂ මහත්මයා දෙදහස් පහළොවේ වර්ෂයේදී ගෙදර යන්න ඕනෑ ද? එහෙම ණය ගෙවා නැහැ. අපි ආණ්ඩුව ගත්තාට පස්සේයි ඒ ණය ගෙවා තිබෙන්නේ. ඒ ණය ගෙවන්නට පටන් ගත්තේත් යහපාලන ආණ්ඩුව බිහිවුණාට පස්සේයි. ඒ ණය ගෙවමින් තමයි මේ යහපාලන ආණ්ඩුව ඉදිරි සංවර්ධන වැඩකටයුතුත් කර ගෙන යන්නේ කියන එක මතක් කර දෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ හූහක් කතන්දර කිව්වා. මහ බැංකු කතන්දරය කිව්වා. මම මතක් කර දෙන්නට ඕනෑ, මහ බැංකුවට වෙච්ච පාඩුවට වැඩි මුදලක් අද ඇප වශයෙන් රඳවා ගෙන තිබෙන බව. ඒ මුදල් අධිකරණය රඳවා ගෙන තිබෙනවා. සැකකරුවන් සඳහා නීතිය ක්‍රියාත්මක වෙනවා. නමුත් පසුගිය කාලයේ එහෙම වුණේ නැහැ කියන එක මතක් කර දෙන්නට ඕනෑ. අද මේ යහපාලන ආණ්ඩුවේ වැඩ කටයුතු සියයට සියයක්ම ක්‍රියාත්මක කරනවා වාගේම, යහපාලන ආණ්ඩුව ඇතුළේ ඉන්න ඇමතිවරුන්ටත් යම් යම් අවස්ථාවල ඇමතිකම් දාලා යන්නට සිද්ධ වුණා. මේ ආණ්ඩුව අපි හැදුවේ ඔය කවුරු කවුරුත් කියන විධියට මැතිවරණ ප්‍රතිඵල එළිදැක්වූවාට පස්සේ නොවෙයි. මැතිවරණයට ඉස්සෙල්ලාත්, දින 100 ආණ්ඩුව කාලයේත් ඉදිරියට මේ රටේ ගොඩ නහන්නේ යහපාලන ආණ්ඩුවක්, නැත්නම් සම්මුතිවාදී ආණ්ඩුවක් -පක්ෂ දෙකක් එකතුවන ආණ්ඩුවක්- කියා කලින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් සඳහන් කර තිබුණා. ඒ අනුවයි මේ ආණ්ඩුව නිර්මාණය වුණේ. එම නිසා මැතිවරණයේ ප්‍රතිඵලය බලා තනි පක්ෂයකට ආණ්ඩුවක් පිහිටුවන්නට බැරි නිසා, මේ ආණ්ඩුව හැදුවාය කියා කවුරුවත් කියනවා නම් ඒක පට්ටපල් බොරුවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ සාධාරණත්වය ක්‍රියාත්මක වෙනවා. සමහර මන්ත්‍රීවරු ආණ්ඩුවෙන් එළියට බැස්සේ ඇයි කියා විවිධ හේතු කිව්වා. සම්මුතියක් විධියට වාගේම

[ගරු වන්දිම ගමගේ මහතා]

තමන් අතර තිබෙන අන්‍යෝන්‍ය අවබෝධය සහ බැඳීම තුළ ආණ්ඩුවක් ඇතුළේ මේ වාගේ හැසිරීම් රටාවක් අපි කවදාවත් දැක නැති බව අපි කියන්නට ඕනෑ. ආණ්ඩුවක් ඇතුළේ ඉඳගෙන එක පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වයට ප්‍රසිද්ධියේ බණින ක්‍රමවේදයක් මීට කලින් තිබුණේ නැහැ. රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ එහෙම සිද්ධ වුණා නම් අපි දන්නවා මොකද වෙන්නේ කියා. එහෙම වුණේ නැහැ. සමහර අවස්ථාවලදී එහෙම කථා කරන්නට ආපු උදවියට සැලකුවේ කොහොමද කියන එකත් අපි දන්නවා. මේ ස්ථානයේ ඒවා ප්‍රකාශ කරන්න මම කැමැති නැහැ.

විශේෂයෙන්ම අගමැතිතුමාට එරෙහි විශ්වාස භංගය ගැන අද කියවුණා. එතුමා විශ්වාස භංගය ජයග්‍රහණය කළා. ඒ විශ්වාස භංගය ජයග්‍රහණය කිරීම තුළම ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. විශ්වාස භංගයක් ගෙනැල්ලා ඒ තුළින් පළාත් පාලන මැතිවරණයේදී ලබා ගත් ජයග්‍රහණය නැති කළා කියලා කියනවා. ඒ පළාත් පාලන මැතිවරණයේදී ඡන්දය ඉල්ලුවේ කවුද? ඡන්ද ඉල්ලුවේ ඒ පළාත් පාලන ආයතන තුන්සිය හතළිහේ අපේක්ෂකයෝ නොවෙයි; රාජපක්ෂ මහත්තයාමයි. අද තමුන්නාන්සේලා හැමෝම දන්නවා, අත පය නැති අය, අසනීප වෙලා ඇඳේ සිටින මිනිස්සු පළාත් පාලන ආයතනවලට පත් වෙලා සිටින බව. මිනිස්සු ඡන්දය දුන්නේ අපේක්ෂකයා දිහා බලා නොවෙයි, රාජපක්ෂ මහත්තයා දිහා බලායි. මොකද, මේ පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලයත් එක්ක රාජපක්ෂ මහත්තයාට හානියක් කරනවා; එතුමා හිරේට දමනවා කියලා ගෙනාපු මතය නිසා තමයි මිනිස්සු එතුමාට ඡන්දය දුන්නේ. අන්න ඒ විධියට මිනිසුන්ගේ අනුකම්පාව ගෙන තමයි පසුගිය මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් වුණේ. හැබැයි, මම මේ කරුණ පැහැදිලිව කියන්න ඕනෑ. මැතිවරණ කොමිසම හරහා මැතිවරණ කොමිසමේ සභාපතිවරයාට අපේ රජය සම්පූර්ණ බලය දීලා තිබුණා, මැතිවරණය නිසියාකාරව පවත්වන්න. පසුගිය කාලයේ වාගේ ප්‍රතිඵල වෙනස් කරන මැතිවරණ අපි පැවැත්වූයේ නැහැ. පසුගිය කාලයේ වාගේ මැතිවරණවලදී නීතිවිරෝධී කටයුතු කළේ නැහැ. ඒ වාගේම සිල් රෙදි , කැරම් බෝඩ් ආදී බඩු භාණ්ඩ බෙදීම අපි කළේ නැහැ. සමහර අය විපක්ෂයේ ඉඳගෙනත් ඒ කටයුත්ත ගජරාමෙට පසුගිය පළාත් පාලන මැතිවරණය තුළත් සිද්ධ කළාය කියලා ප්‍රකාශ කරමින් මා නිහඬවනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ස්තුතියි. The next speaker is the Hon. Kaveendiran Kodeeswaran.

ඊට ප්‍රථමයෙන් කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු එඩිවඩි ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මහින්ද சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩිවඩි ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විදුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩිවඩි ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[ப.ப. 4.21]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(මාණ්පුමිකු කවීන්දිරන් கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஜனாதிபதி அவர்களின் கொள்கை விளக்க உரை சம்பந்தமான இன்றைய ஒத்திவைப்புவேளை விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காகத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். உண்மையிலே, ஜனாதிபதி அவர்களின் கொள்கை விளக்க உரையைத் தமிழ் பேசுகின்ற மக்கள் மிகவும் ஆவலாக எதிர்பார்த்திருந்தார்கள். சிறுபான்மை மக்களின் வாக்குகளைக் கொண்டும் தெரிவான ஜனாதிபதி அவர்கள், "இந்த நாட்டிலே சிறுபான்மை யினருக்குப் பிரச்சினை இருக்கின்றது; அதற்கான தீர்வை வழங்கவேண்டும்" என்ற கோட்பாட்டுடன் பதவிக்கு வந்தவர். ஆனால், தமிழர்களுக்காக அல்லது தமிழ் பேசும் மக்களுக்காக வழங்கப்படவிருக்கின்ற தீர்வுத் திட்டங்கள் சம்பந்தமாகத் தனது கொள்கை விளக்க உரையிலே எந்தவித கருத்தையும் வெளியிடாமையையிட்டுத் தமிழ் மக்கள் மிகவும் மன வேதனையடைந்திருக்கின்றார்கள். இந்த வகையில் கடந்த காலத்தில் இருந்த ஜனாதிபதிகள், பிரதமர்கள் மற்றும் தலைவர்கள் எப்படி மக்களை ஏமாற்றினார்களோ, அப்படி இந்த ஜனாதிபதியும் ஏமாற்றுகின்றார் என்ற ஒரு நிலைப் பாட்டை தமிழ் பேசும் மக்கள் எடுத்திருக்கிறார்கள்.

தேர்தலுக்குப் பின்னர் உருவான புதிய பாராளுமன்றத்தில் பல உப குழுக்கள் உருவாக்கப்பட்டு, அவற்றினூடாகப் பல அறிக்கைகளும் வெளியிடப்பட்டன. மேலும், அரசியலமைப்புச் சபையாகவும் இந்தப் பாராளுமன்றம் இயங்கியது. ஆனால், இந்தக் குழுக்களின் அறிக்கைகள் சம்பந்தமான எந்தவொரு விடயத்தையோ மற்றும் அவற்றின் முன்னேற்றகரமான செயற் பாடுகளையோ ஜனாதிபதி அவர்கள் வெளியிடவில்லை. அந்த அறிக்கைகளின்மூலம் என்ன நடக்கவிருக்கின்றது என்ற விடயத்தை வெளியிடாமையையிட்டு எமது மக்கள் மிகவும் மன வேதனை அடைகின்றார்கள். உண்மையிலே, ஐக்கிய தேசியக் கட்சியாக இருக்கலாம் அல்லது ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியாக இருக்கலாம் இந்த இரண்டு பெரும்பான்மைக் கட்சிகளும் தமிழ் மக்களுக்கான ஒரு தீர்வுத் திட்டம் வேண்டுமென்று சொல்லிவந்த அதேநேரம், பாராளுமன்றத் திலுள்ள அனைத்து உறுப்பினர்களும் "சிறுபான்மை மக்களுக்குப் பிரச்சினை இருக்கின்றது; அவர்களுக்கான தீர்வு வழங்கவேண்டும்" என்ற நிலைப்பாட்டில் பேசி வந்திருக்கின்றார்கள். ஆனாலும், வாய்ப்பேச்சளவில்தான் இந்தத் தீர்வுத் திட்டம் தொடர்பில் தங்களது கருத்துக்களை வெளியிட்டார்களே ஒழிய, வேறெதுவுமில்லை. பாதிக்கப்பட்ட எமது மக்களுக்கான தீர்வுத் திட்டத்தை வழங்கவேண்டுமென்ற உள்ளார்ந்த ரீதியான எண்ணப்பாடு அவர்களிடம் இல்லாமை மிகவும் மனவேதனைக்குரிய விடயமாக இருக்கின்றது. எனவே, இந்தப் பாராளுமன்றத்தில் உண்மையை வெளிக் கொண்டு வரவேண்டிய ஒரு நிலைப்பாடு இருக்கின்றது. இந்த நாட்டு மக்களுக்கு அல்லது எமது சிறுபான்மைச் சமூகங்களான தமிழ், முஸ்லிம் மக்களுக்கு அப்படி உண்மையை வெளிப்படுத்த வேண்டிய ஒரு காலகட்டத்திலே நாங்கள் இருக்கின்றோம்.

ஒரு சிறந்த ஆட்சி முறையான சமஷ்டி ஆட்சி இந்த நாட்டிலே நிறுவப்பட வேண்டும். ஒற்றையாட்சி என்பது நீக்கப்பட்டு, சமஷ்டி முறையிலான ஆட்சி இருக்குமென்றால், இந்த நாடு எந்தவித பிரச்சினையும் இல்லாமல் செழிப்பான ஒரு நாடாக, பொருளாதாரத்தைச் சிறந்த கட்டமைப்புடன் கொண்டுசெல்லக்கூடியதாக மாற்றமடையும். அந்த வகையிலே, இந்தப் பாராளுமன்றத்தில் ஒரு தனிநபர் சட்டமூலம் கொண்டுவரப்பட வேண்டிய அவசியம் இருக்கின்றது. அதாவது, இந்த நாட்டில் சமஷ்டி முறையிலான ஆட்சியைக் கொண்டுவந்து, வடக்கு, கிழக்குப் பிராந்தியங்களை ஒன்றிணைத்து, அந்தப் பிராந்தியங்களுக்குக் கூடுதலான அதிகாரங்களைக் கொடுக்கவேண்டிய ஒரு நிலைப்பாடு இருக்கின்றது. அப்படி அதிகாரங்கள் கொடுக்கப்படுகின்றபொழுதுதான் இந்த நாடு எதிர்காலத்தை வழிநடத்தக்கூடிய, சுபிட்சமான ஒரு நாடாக மாறும் என்பதில் எந்தவித ஐயப்பாடும் இல்லை. அந்த வகையிலே இந்தப் பாராளுமன்றத்திலே தனிநபர் சட்டமூலம் கொண்டுவரப் பட்டால், யார் இந்தத் தீர்வுத் திட்டங்களுக்கு ஆதரவாக இருக்கின்றார்கள்? யார் எதிராக இருக்கின்றார்கள்? யார் போலியாகக் கத்துகின்றார்கள்? உண்மையில் சிறுபான்மை மக்களுக்குத் தீர்வுத்திட்டம் வழங்க வேண்டுமென்ற மனநிலையோடு யார் இருக்கின்றார்கள்? என்ற விடயங்களை எமது மக்களுக்கு வெளிப்படுத்தக்கூடியதாக இருக்கும். எனவே, அவ்வாறான தனிநபர் சட்டமூலத்தை இந்தப் பாராளுமன்றத்திலே கொண்டுவர வேண்டிய கடப்பாடு எங்களுக்கு இருக்கின்றது. அதாவது, வருகின்ற மாகாண சபைத் தேர்தலுக்கு முன்னர் வடக்கு, கிழக்கிலே இருக்கின்ற மக்களுக்கான தீர்வுத் திட்டம் இந்தப் பாராளுமன்றத்தினூடாக வழங்கப்பட வேண்டும். இல்லையேல், தனிநபர் சட்டமூலத்தை இந்தப் பாராளுமன்றத்திலே கொண்டுவர வேண்டியிருக்கும். அந்தத் தீர்வுத் திட்டங்களுக்கு எதிராக இருக்கின்ற - தமிழ் மக்களுக்கு எதிராக இருக்கின்ற, சிறுபான்மை மக்களுக்கு எதிராக இருக்கின்ற - நபர்களை அதன்மூலமாக நாங்கள் தோலுரித்துக் காட்டவேண்டும். அதாவது, அந்தக் கறுப்பு ஆடுகளை வெளிக்கொண்டுவர வேண்டிய கடமைப்பாடு எங்களுக்கு இருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
Please give me one more minute, Sir.

மேதகு ஜனாதிபதி அவர்கள் தனது கொள்கை விளக்க உரையிலே, 85 வீதமான காணிகள் விடுவிக்கப்பட்டதாகச் சொல்லியிருந்தார். ஆனால், வடக்கு மாகாணக் கட்டளைத் தளபதி, 75 வீதமான காணிகள்தான் விடுவிக்கப்பட்டன என்று சொல்லுகின்றார். ஆகவே, இரண்டு பேரின் கருத்துக் களுக்கும் முரண்பாடு காணப்படுகின்றது. அதுமட்டுமல்ல, கிழக்கு மாகாணத்திலே இருக்கின்ற பல காணிகள் இப்போதும் வன இலாகாவின்கீழ் இருக்கின்றன. இன்று எமது தமிழ் மக்களுக்கான காணிகள், விவசாய நிலங்கள், ஏனைய நிலங்கள் அனைத்தும் வன இலாகாவினால் பிடிக்கப்பட்டிருக் கின்றன; இன்னமும் விடுவிக்கப்படவில்லை. அவை விடுவிக்கப்பட வேண்டிய அவசியமிருக்கின்றது. அந்த வகையிலே ஜனாதிபதி அவர்கள் தனது நிலைப்பாட்டிலிருந்து மாறக்கூடாது. அதாவது, 2015ஆம் ஆண்டு ஜனவரி 8ஆம் திகதி ஜனாதிபதியாகத் தெரிவானபொழுது, "தமிழ் மக்களுக்கான தீர்வை வழங்கவேண்டும்" என அவர் கொண்டிருந்த நிலைப்பாட்டிலிருந்து மாறக்கூடாது; அந்த நிலைப்பாட்டுடன் எமது மக்களுக்கான தீர்வை எட்டும்வரை அவர் ஓயக்கூடாது; பெரும்பான்மையினத்தவரின் வாக்குகளைப் பெறவேண்டும் என்பதற்காக தனது நியாயமான நிலைப்பாட்டிலிருந்து மாறக்கூடாது என்பதனைக் கூறி, எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

[අ.භා. 4.29]

ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු සැසි වාර අත්හිටුවලා නැවත වරක් පටන් ගන්නා අවස්ථාවේදී සම්ප්‍රදායක් හැටියට රටේ ජනාධිපතිවරයා එතුමාගේ ප්‍රකාශයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. අටවෙනි පාර්ලිමේන්තුවේ දෙවැනි සැසිවාරය ආරම්භ කිරීමත් සමඟ පසුගිය 08වෙනි දා ඒ ඉදිරිපත් කිරීම මේ පාර්ලිමේන්තුවේදී සිද්ධ වුණා. අපේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් දිහා බැලුවාම, ජනතාව කටයුතු කරන ආකාරය දිහා බලුවාම අපට පේනවා රට වෙනුවෙන් යම්කිසි වැඩක් කළාම ඒ වෙලාවේ සමහරු ඒක ප්‍රශංසාවට ලක් කරනවා, හැබැයි ටික කාලයක් ගියාට පස්සේ ඒක අමතක කරනවා කියන එක. ඒක තමයි අපි දැකලා තිබෙන සම්ප්‍රදාය. ඒ නිසා අපටත් සිද්ධ වෙනවා මෙවැනි අවස්ථා ප්‍රයෝජනයට අරගෙන ජනතාවට මතක් කරලා දෙන්න, පසුගිය අවුරුදු තුනහමාරක් වාගේ කාලයක් ඇතුළත රටේ ජනාධිපතිවරයා හැටියට, රජයේ ප්‍රධානියා හැටියට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා රට වෙනුවෙන් කළ සේවය පිළිබඳව.

මම විශේෂයෙන් සඳහන් කරන්නට කැමැතියි, 2015 ජනවාරි 08වෙනි දා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා රටේ ජනාධිපතිවරයා හැටියට පත් වීමත් සමඟම එතුමාට නොයෙකුත් අභියෝග භාර ගන්නට සිද්ධ වුණු බව. ඒ අභියෝග අතර ප්‍රධානම අභියෝගයක් හැටියට අපි ඒ වෙලාවේ දැක්කේ 2015 මාර්තු මාසයේ ජිනීවා මානව හිමිකම් කවුන්සලයට ඉදිරිපත් කරන්නට නියමිතව තිබුණු වාර්තාව පිළිබඳව අපි මොන වාගේ ක්‍රියාමාර්ගයක් ගත යුතුද කියන එකයි.

යුද්ධය ඉවර වීමත් සමඟ අපට ජාත්‍යන්තරයේ විශාල අභියෝගවලට මුහුණ පාන්නට සිදු වුණා. අපි ඒ කාලයේ නිරන්තරයෙන්ම ජිනීවා ගිහින් මානව හිමිකම් කවුන්සලයට සහභාගි වුණා; සම්බන්ධ වුණා. මම අවුරුදු 10කට කිට්ටු කාලයක් අපේ කණ්ඩායමේ නායකත්වය දැරුවා. අපට යුද්ධය කරන කාලයේත්, යුද්ධය අවසන් වුණාට පසුවත් නොයෙකුත් දෝෂාරෝපණවලට, නොයෙකුත් විවේචනවලට, අසත්‍ය චෝදනාවලට රට වෙනුවෙන් මුහුණ දෙන්නට සිද්ධ වුණා. අපට මතකයි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එවකට සිටි මහලේකම් බැන් කි මූන් මහත්මයා ජාත්‍යන්තර බලපෑම් මත විශේෂඥ කමිටුවක් පත් කරලා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාවක් කොහොමද ලබා ගත්තේ කියලා. ඒ විශේෂඥ කමිටුවේ ප්‍රධාන චරිත දෙක තමයි දරුස්මාන් සහ යස්මින් සූකා. මේ දෙන්නා අදත් ශ්‍රී ලංකාව පිළිබඳ නොයෙකුත් වැරදි මත ඉදිරිපත් කරනවා; වැරදි චෝදනා ඉදිරිපත් කරනවා කියන එක මම මතක් කරලා දෙන්න කැමැතියි.

[ගරු මහින්ද සමරසිංහ මහතා]

මේ දෙපළයි, තව විශේෂඥයෙකුයි එකතු වෙලා වාර්තාවක් හැදුවා. මේ වාර්තාව හදන්න ඔවුන් ලංකාවට ආවේ නැහැ. නිව්යෝක් නගරයේ ඉඳලා email හරහා, fax හරහා ජාත්‍යන්තරයේ ඒ ගොල්ලන් තෝරා ගත් අයගෙන් ලිපි ලබා ගෙන මේ වාර්තාව හදලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයාට භාර දුන්නා. අපි දන්නවා, ඒ වාර්තාවෙන් මොන වාගේ චෝදනා අපට එල්ල වුණාද කියලා. ඒවා අසත්‍ය චෝදනා. වැරදි සංඛ්‍යා ලේඛන පදනම් කර ගෙන අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කළාය කියලා, හිතා මතා සිවිල් ජනතාව ඝාතනය කළා කියලා, ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට හිරිහැර, කරදර කළා කියලා, ලිංගික අතවර කළා කියලා මේ වාර්තාවට කරුණු ඇතුළු කරලා තිබුණා. මම නැවත වරක් මතක් කරන්න කැමැතියි, මේ වාර්තාව හැදුවේ ලංකාවට ඇවිල්ලා නොවෙයි, නිව්යෝක් නගරයේ ඉඳලාය කියන කරුණ. මේ වාර්තාව බැන් කි මූන් මහත්මයාට ඉදිරිපත් කළාට පස්සේ ජාත්‍යන්තර බලපෑම් කරපු අය, මේ දේශපාලන න්‍යාය පත්‍රය ජාත්‍යන්තරයේ ඉඳලා ක්‍රියාත්මක කරන්න නායකත්වය දුන් අය තැත් කළා, මේ වාර්තාව ජිනීවා මානව හිමිකම් කවුන්සලයට පස්ස දොරෙන් ගේන්න. මොකද, ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ සාමාජික රටවල් 47ක් ඉන්නවා. ඒ 47 එකතු වෙලා ගත් තීරණයකට අදාළ වාර්තාවක් පමණයි නිල වශයෙන් මානව හිමිකම් කවුන්සලයට ගේන්න පුළුවන් වන්නේ. මේ ගොල්ලන් බැලුවා, ඒක මානව හිමිකම් කවුන්සලය තුළින් ආ යෝජනාවක් නොවන නිසා පස්ස දොරෙන් කොහොම හරි මානව හිමිකම් කවුන්සලයට මේ වාර්තාව ගෙනැල්ලා අංකයක් එක්ක ඒ සාමාජික රටවලට මේ වාර්තාව බෙදා හැරලා මානව හිමිකම් කවුන්සලය තුළ නිල වශයෙන් මේ වාර්තාව අනුමත කර ගන්න. අපි ඒකට මුහුණ දුන්නා. අපි ඒක නැවැත්වූවා. මේ වාගේ දේවල් එක්ක තමයි සමහර බලවත් රටවල් ඝාතකීඝා කරන්න පටන් ගත්තේ අපි ශ්‍රී ලංකා රජයට පාඩමක් උගන්වන්න ඕනෑ, ශ්‍රී ලංකා රජය දණ ගස්වන්න ඕනෑ, අපට වුවමනා විධියට මේ රට පාලනය කිරීම ඒ හරහා අපි කළ යුතුයි කියලා. ඒ අනුව සංවිධානාත්මකව මේ ගොල්ලන් අපට එරෙහිව පැනවිය යුතු ආර්ථික සම්බාධක ගැන කථා කරන්න පටන් ගත්තා.

මේ පසුබිමත් එක්ක තමයි අවුරුදු දෙකකට කලින් ඡන්දයකට ගියේ. ජනාධිපතිවරණය පවත්වන්න තීරණය කළේ මේ පසුබිමත් එක්ක. එදා අපි ලංකාවේ කේන්දරය දිහා නොවෙයි බැලුවේ. ජිනීවා කේන්දරය දිහායි අපි බැලුවේ. මොකද, ලංකාවට ආර්ථික සම්බාධක පැනෙව්වා නම් ජනතාව පාරට බහිනවා. යුද්ධය ජයග්‍රහණය කළත්, ජනතාවගේ බඩට පහරක් වැදුණාම ජනතාව නතර කරගන්න බැරි වෙනවා. ඒකට බය වෙලා තමයි අවුරුදු දෙකකට කලින් ජනාධිපතිවරණයකට ගියේ. ඒක තමයි ඇත්ත තත්ත්වය.

2015 වසරේ ජනවාරි 08වැනි දින මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මේ අභියෝගය භාර ගන්න සිද්ධ වුණා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් සම්බන්ධ කරගෙන එතුමා වහාම ක්‍රියාත්මක වුණා. ඒ අනුව, සංහිඳියාවට යන ගමන ක්‍රියාත්මක කරලා ජාත්‍යන්තරයට ප්‍රතිඵල පෙන්වන්න ජිනීවා මානව හිමිකම් කවුන්සිලයෙන් අවුරුද්දක් කල් ඉල්ලා ගන්න එතුමා සමත් වුණා; එතුමාගේ රජය සමත් වුණා. එතුමා රාජ්‍ය නායකයන්ට, මේ රටේ තානාපති අංශවලට කථා කරලා කිව්වා, "2015 වසරේ මාර්තු මාසයේ මේ ගැන සාකච්ඡා කරන එක, මේ විධියේ වාර්තාවක් සම්මත කර ගන්න එක අසාධාරණයි. සංහිඳියාවට යන ගමන ක්‍රියාත්මක කරලා ප්‍රතිඵල පෙන්වන්න අපට අවස්ථාවක් දෙන්න. අපි බලයට ඇවිත් මාස දෙකෙන් ඒක කරන්න බැහැ. ඒ කටයුත්ත සඳහා අපට අවුරුදු කිහිපයක් ගතවෙයි. ඒ නිසා මේ වාර්තාව සාකච්ඡාවට ගන්න එපා" කියලා. ජාත්‍යන්තරය එතුමා කරපු ඉල්ලීම සලකා බලා, ඒ ඉල්ලීම පිළිගෙන, ඒ වාර්තාව 2015 මාර්තු මාසයේ ජිනීවා කවුන්සිලයට ඉදිරිපත් කළේ නැහැ. ඒ කටයුත්ත අවුරුද්දකින් කල් දැම්මා. ඒ අවුරුද්දක කාලය තුළදී සංහිඳියාවට යන ගමන සාර්ථකව ක්‍රියාත්මක කරන්න මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නායකත්වය දුන්නා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා තව පැත්තකින් ඒකට ශක්තිය දුන්නා. ඇත්ත වශයෙන්ම ඒ අනුව තමයි අපට ක්‍රමානුකූලව ජාත්‍යන්තරයේ පිළිගැනීමක් ලබා ගන්න පුළුවන්කම ලැබුණේ. සමහර අය මෙතැන නැතිවලා කිව්වා, "මොකවත් කළේ නැහැ. අවුරුදු තුනහමාරක් තුළ මොනවාද කළේ කියලා අපට පෙන්වන්න" කියලා. 2014 ජනවාරි අටවැනි දා වූ විප්ලවයත් සමඟ ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ රණවිරුවන් මෙතෙක් ආරක්ෂා කළා වාගේ ඉදිරියටත් ආරක්ෂා කරන්න අපි සමත් වෙනවාය කියන එක මේ රටේ ජනතාවට පෙන්වන්න ඒ කරුණම ඇති කියලා මා කියන්න කැමැතියි. අපි නිකම් හිටියේ නැහැ. ලොකු ආර්ථික විනාශයක් ඇති වෙන්න ගිය අවස්ථාවෙන් මිදිලා, ජාත්‍යන්තරයේ සහයෝගය ඇතිව අපි දැන් ගමනක් යන්න පටන් අරගෙන තිබෙනවා කියලා මේ රටේ ජනතාවට පෙන්නුම් කරන්න ඒ කරුණම ඇති. ජාත්‍යන්තරයෙන් අපේ රටට ලකුණු ලැබෙන්නේ අපි කරන කථාවට නොවෙයි. ජාත්‍යන්තරයෙන් අපට ලකුණු ලැබෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සැසිවාරයට ගිහින් රාජ්‍ය නායකයන් හමුවෙලා, අතට අත දීලා, කරට අත දාගෙන, පින්තූර ගන්නවාට නොවෙයි. ඒවාට ලකුණු ලැබෙන්නේ නැහැ. ඒවා තාවකාලිකයි. ඒවා ඒ වේලාවේ සිදු වෙන දේවල්. අපට ලකුණු ලැබෙන්නේ යම් කිසි වැඩ කොටසක් කළොත් පමණයි. ඒ කටයුතු වාර්තා කරන්න තානාපති කාර්යාල සතියකට වතාවක් කටයුතු කරනවා. අපේ රටේ දේශපාලන වාර්තා ඒ අයගේ රටවල අගනුවරට යවනවා. පවතින රජය මොන ආකාරයෙන්ද සංහිඳියාවට යන ගමන ශක්තිමත් කරන්න කටයුතු කරන්නේ කියලා ඒ අය විග්‍රහ කරනවා. ඒ අයට බොරු කරන්න බැහැ. අපි කරපු දේවල් අනුව තමයි ඒ වාර්තා පිළියෙල කරන්නේ.

ඒ කළ දේවල් නිසාම, ඒ හැසිරීම නිසාම ශ්‍රී ලංකාව අද ජාත්‍යන්තරය තුළ විශාල පිළිගැනීමකට ලක්වෙලා තිබෙනවා. අපි කොන්වෙලා හිටපු අවස්ථාවෙන් වෙන්වෙලා, එතැනින් ඉවත්වෙලා අද මුළු ජාත්‍යන්තරය තුළින්ම අපට විශාල පිළිගැනීමක් ලැබී තිබෙනවා. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය කරගන්න අපි සමත්වෙලා තිබෙනවාය කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි.

මේ අතරතුර තමයි, ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ රටවල් 47ම එකතුවෙලා මේ සංහිඳියාවට යන ගමන, වගවීම මොන ආකාරයෙන්ද ක්‍රියාත්මක විය යුත්තේ කියන එක පදනම් කරගෙන යෝජනාවක් සම්මත කර ගත්තේ. ඒ යෝජනාවේ එක වගන්තියක් තිබුණා, 'ස්වාධීන අධිකරණයක් නැති නිසා ජාත්‍යන්තර විනිසුරුවරු ලංකාවට ගෙන්වා ගන්න ඕනෑ' කියලා. මේ වගන්තිය ජනාධිපතිතුමාගේ අවධානයට යොමු වෙනවාත් එක්කම, එතුමා විවෘත ප්‍රකාශයක් කළා. එතැනින් නැවතුණේත් නැහැ, එතුමා ජාත්‍යන්තරයටත් ගිහිල්ලා ඒක කිව්වා. එතුමා කිව්වා "ජාත්‍යන්තර විනිසුරුවරු ලංකාවට ගෙනැල්ලා යුද්ධය කළ ආකාරය ගැන පරීක්ෂණයක් පවත්වන්න අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, අපේ රටේ නීති රීතිවල කිසිසේත්ම ඉඩකඩක් නැහැ"යි කියලා. ඊටත් වඩා ඔබ්බට ගිහිල්ලා එතුමා කිව්වා, "දරුණුම ත්‍රස්තවාදයකින් මේ රට බේරා ගන්න අපේ රණ විරුවෝ ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළා, කිසිම අවස්ථාවක අපේ හමුදාවල ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ සිවිල් ජනතාව ඉලක්ක කර ගෙන යුද්ධයක් කරන්න, ඒ නිසා මම මේ පුටුවේ ඉන්නතෙක් කවදාවත් රණවිරුවෝ පාවා දෙන්නේ නැහැ"යි කියලා. එතුමා

සෘජුව ඒ ප්‍රකාශය කළා. එහිදී එතුමා හිතුවේ නැහැ, එතුමාට තිබෙන ජාත්‍යන්තර පිළිගැනීම ගැන. එහිදී එතුමා හිතුවේ නැහැ, මේ ප්‍රකාශය කළොත් බටහිර රටවලින් එතුමාට ලැබුණු ලකුණු කැපෙයි කියලා. අපට නිදහස ලබා දෙන්න ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ ඒ රණවිරුවන් වෙනුවෙන් රටේ නායකයා හැටියට එතුමා බොහොම එඩිතර, නිර්භීත ප්‍රකාශයක් කළා. එතකොට ඒකට ලකුණු දෙන්නේ නැද්ද මේ රටේ ජනතාව? අගමැතිතුමාත් ඒ වාගේම ප්‍රකාශයක් කළා. ඒ තිබුණු අභියෝග එක්ක මේවා තමයි අපේ රජය පසුගිය අවුරුදු තුනහමාර තුළ කරලා පෙන්වලා තිබෙන්නේ.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න තීරණය කළාට පස්සේ ජනාධිපතිවරයාගේ අත්සනින්ම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, බලතල රාශියක් ඉවත් කරන්න එතුමා සූදානම් කියලා. කැබිනට් මණ්ඩලය ඒකට ඒකමතිකව අනුමැතිය දුන්නා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126වන ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කරන්න ඕනෑම පුරවැසියකුට අවස්ථාව තිබෙනවා. ඒ අනුව, ඒ සංශෝධනය ඉදිරිපත් වෙනකොට ඒ ගැන පැහැදිලි කරගන්න ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, මේ බලතල සියල්ලම ඉවත් කරන්න බැහැ, යෝජනා කර තිබෙන විධියට ඒ සියලු බලතල ඉවත් කරන්න බැහැ, සමහර බලතල ඉවත් කරනවා නම් තුනෙන් දෙකේ බලයක් විතරක් මදි ජනමත විචාරණයකටත් යන්න සිද්ධ වෙනවා කියලා. එහෙම කිව්වාට පස්සේ, දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා තුනෙන් දෙකේ ඡන්දයෙන් ඉවත් කරගන්න පුළුවන් ජනාධිපති සතු බලතල ඉවත් කර ගත්තා. මෑත ඉතිහාසය තුළ මම නම් අහලා නැහැ, කිසිම ජනාධිපතිවරයෙක්, නැත්නම් රටක නායකයෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමන්ට ලබාදී තිබෙන බලතල අඩු කරගන්න පියවර ගන්න ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණාය කියලා. කිසිම නායකයෙක් එහෙම කළේ නැහැ. ඒවාට තමයි ජාත්‍යන්තරය අපේ රටට ලකුණු දුන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට මේ පාර්ලිමේන්තුවේ තිබුණු සංයුතිය ඔබතුමා දන්නවා; පාර්ලිමේන්තුව දන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි බහුතරය තිබුණේ. ජනාධිපතිතුමා මතක් කර දුන්නා, ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 47යි හිටියේ කියන කාරණය. එතකොට, දහනව වන සංශෝධනය සම්මත කරගන්න තුනෙන් දෙකේ බලය ගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලුදෙනාගේ ඡන්ද ලබා ගන්න සිද්ධ වුණා.

ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා, පැය 72ක් රැඳිලා හැම මන්ත්‍රීවරයෙකුටම කථා කරලා හැම මන්ත්‍රීවරයෙකුගේම සහයෝගය ලබා ගන්න සෘජුව කටයුතු කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු 147න් එක්කෙනයි විරුද්ධව ඡන්දය දුන්නේ. ඒ, සරත් වීරසේකර මන්ත්‍රීතුමා. අනෙක් සියලුම දෙනා ඡන්දය දුන්නා. ඒ නිසා තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක ප්‍රජාතන්ත්‍රවාදය තවත් ශක්තිමත් වුණා. නීතියේ ආධිපත්‍යය තව දුරටත් ශක්තිමත් වුණා; ස්ථාවර වුණා. ස්වාධීන කොමිෂන් සභා බිහි වුණා. මේවාට ලකුණු දුන්නා. මේවා ක්‍රියාවන්. මේවා වචනවලට සීමා නොවුණු දේවල්. කරලා පෙන්වූවා, කොහොමද යහ පාලනය ස්ථාපිත කරන්නේ කියලා; ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නේ කියලා. මේවා සමහරුන්ට අමතකයි. අද වෙන කොට අහනවා, මොකක්ද කළේ කියලා. මේවා තමයි පසුගිය අවුරුදු තුනහමාරක කාලය තුළදී කරලා තිබෙන්නේ. බැඳුම්කර කොමිසම පිළිබඳව රටේ කථිකාවක් ඇති වුණු අවස්ථාවේදී ජනාධිපතිතුමා ස්වාධීන කොමිසමක් පත් කළා, ව්‍යවස්ථාවෙන් එතුමාට පැවරිලා තිබෙන බලතල ප්‍රයෝජනයට අරගෙන. ඒ වෙලාවේ සමහරු කිව්වා, "මේක කුණු ටික කාපට එක යටට අතු ගාලා දැමීමක්. මේකෙන් මොකක්වත් වෙන්නේ නැහැ. මේක වංචාව වහන්න කරපු දෙයක්; කල් ගන්න කරපු දෙයක්" කියලා. අන්තිමට මොකක්ද වුණේ?

රටේ අගමැතිවරයා පවා බැඳුම්කර කොමිසමට ගිහිල්ලා ස්වේච්ඡාවෙන් සාක්ෂි දුන්නා. රටේ අගමැතිවරයාට යන්න එපා කියලා ජනාධිපතිතුමා කිව්වේ නැහැ. ජනාධිපතිතුමා ආරක්ෂාව දුන්නේ නැහැ. අගමැතිවරයා ආරක්ෂාවක් ඉල්ලුවේත් නැහැ. අගමැතිවරයා ස්වේච්ඡාවෙන් ගිහිල්ලා සාක්ෂි දුන්නා. ඇමතිවරයෙක් ඉල්ලා අස් වුණා, තමන්ගේ නම පිරිසිදු කර ගන්න කල්. එතුමා හිතුවා, "මම මේ අමාත්‍යාංශයේ හිටියොත් සමහරු කියයි, මම මේ පරීක්ෂණවලට බලපෑමක් කළා කියලා. ඒක නිසා මම අයින් වෙනවා" කියලා ස්වේච්ඡාවෙන් අයින් වුණා. වාර්තාව දිහා බැලුවාම එම බැඳුම්කර ගනුදෙනුවේ කටයුතුවලට එතුමාගේ සම්බන්ධයක් නැහැ. මොකක් හරි චෝදනාවක්. ඒක වෙනම දෙයක්. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ තවත් ප්‍රබල ඇමතිවරු දෙදෙනෙක් සාක්ෂි දුන්නා. එක්සත් ජාතික පක්ෂයේ සභාපති හා එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා ස්වේච්ඡාවෙන් ගිහිල්ලා සාක්ෂි දුන්නා. එතුමන්ලා හැංගුණේ නැහැ. එතුමන්ලා ජනාධිපතිවරයාගේ සහයෝගය ලබා ගන්න ගියේ නැහැ, මේකෙන් ගැලවෙන්න ඕනෑ කියලා. භය නැතුව ගිහිල්ලා සාක්ෂි දුන්නා. ඒකයි යහ පාලනය කියන්නේ; ඒකයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ; ඒකයි විනිවිදභාවය කියන්නේ. ඉතින් මේවා අමතක වීම තමයි ප්‍රශ්නය. එම බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ ප්‍රධාන දෙන්නා අද රිමාන්ඩ් භාරයේ සිටිනවා. මැයි 24වැනි දා වන කල් තවදුරටත් රිමාන්ඩ් කරන්න තීරණය කළා කියලා අදත් එස්එම්එස් එකක් තිබුණා මම දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිබුණු තත්ත්වයට වඩා අද අධිකරණය ස්වාධීනයි. අගවිනිසුරුවරයාව අයින් කරන්න බලපෑම් කරන්නේ නැහැ. ජනාධිපතිවරයාට ධුරයේ ඉන්න තිබෙන්නේ අවුරුදු පහද, භයද කියන එක ජනාධිපතිවරයාම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අර්ථකථනයක් ඉල්ලපු අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ස්වාධීනව බලලා කිව්වා, අවුරුදු පහයි කියලා. ජනාධිපතිවරයා ඒකට හිස නැමුවා; ඒක භාර ගත්තා. ඒක නොවෙයිද ප්‍රජාතන්ත්‍රවාදය? නීතිය ස්වාධීනව ක්‍රියාත්මක වෙනවා කියන එකට හොඳම උදාහරණය ඒක නොවෙයිද? මේ විධියට වැඩ කරන කොට ජාත්‍යන්තරයෙන් විශාල වශයෙන් අපට ප්‍රසාදයක් ඇති වෙනවා. ඒක රටට හොඳයි. මේවා තමයි ඇත්ත වශයෙන්ම පසුගිය වකවානුවේ අපි කළේ.

අපි දන්නවා, අතුරුදහන් වූවන්ගේ කාර්යාලය ස්ථාපිත කරන්න කියලා ජිනීවා මානව හිමිකම් කවුන්සල යෝජනාවෙත් තිබෙනවා. අපි ඒකට එකඟ වුණා. දැන් ඒ කාර්යාලය ස්ථාපිත කරලා තිබෙනවා. ඒ කාර්යාලයේ කොමසාරිස්වරුන්ගේ නම් තෝරා ගත්තේ ජනාධිපතිවරයා නොවෙයි. එම නම් තෝරා ගත්තේ ව්‍යවස්ථා සභාව. ව්‍යවස්ථා සභාව ස්වාධීනව කටයුතු කරනවා. ව්‍යවස්ථා සභාව නම් ටික තෝරාගෙන එව්වාම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට එම කොමසාරිස්වරුන් පත් කිරීම ප්‍රමාද කරන්න පුළුවන් වන්නේ සති දෙකක් පමණයි. සති දෙක ඉවර වුණු හැටියේ ව්‍යවස්ථා සභාවෙන් එවලා තිබෙන නම්වලට අදාළ කොමසාරිස්වරුන් පත් කරනවා. ඒක තමයි වෙනස.

මේවා කලින් කතා කරලා, සැලසුම් කරලා කරපු දේවල්. අද ඒවා ස්වාධීනව ක්‍රියාත්මක වෙනවා. අපට ඒවාට ලකුණු ලැබී තිබෙනවා. මේ වන කොට අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය ක්‍රියාත්මක වන්න පටන් ගෙන තිබෙනවා. මේ වන කොට උතුරේ ඊට අදාළ සාක්ෂි ගන්න පටන් ගෙන තිබෙනවා. මට පෙර කතා

[ගරු මහින්ද සමරසිංහ මහතා]

කරපු අපේ කෝඩීස්වරන් මන්ත්‍රීතුමා ප්‍රශ්න කරනවා මම අහගෙන සිටියා. එතුමා ඇහුවා, "ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කළා. එහි දෙමළ ජනතාව වෙනුවෙන් කරන්න යෝජනා කළේ මොකක්ද?" කියලා. ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ 18වන පිටුව කෙරෙහි මා එතුමාගේ අවධානය යොමු කරවනවා. එතුමා මෙය කියවන්න ඕනෑ. ජනාධිපතිතුමා එහි මෙසේ කියා තිබෙනවා:

"ස්ථාවර රටක පදනම ජාතික සංහිඳියාවයි. සැබෑ ජාතික සංහිඳියාව ඇති කරලීම සඳහා සමානාත්මතාව පදනම් කරගත් දේශපාලනික තීන්දු තීරණ ගැනීමේ ව්‍යුහයන් හඳුන්වාදීම වැදගත් වන්නේය. එම අරමුණු ජයගැනීම උදෙසා දැනට ක්‍රියාත්මක පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීම අද දවසේ අවශ්‍යතාවක් යැයි මම විශ්වාස කරමි. කුමන විවේචන තිබුණ ද උතුරු නැගෙනහිර ජනතාවගේ නොසන්සුන්තාව ස්ථිර වශයෙන් සමනය කිරීම සඳහා එදා මෙදාතුර ජනතාවගේ කැමැත්ත හා එකඟත්වය මත කිසියම් දේශපාලන වැඩපිළිවෙළකට අවතීර්ණ විය යුතුය...."

එතුමා ඒ පිළිබඳව තවදුරටත් විග්‍රහ කරනවා. කරුණාකර මේවා කියවා ඇවිත් මෙතැන කතා කරන්න. හිතන්න එපා, ජනාධිපතිතුමා තමුන්නාන්සේලාව අමතක කළා කියලා. අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව පත් කර තිබෙනවා. මමත් එම කමිටුවේ අනු කමිටුවක් වන මූලික අයිතිවාසිකම් පිළිබඳව අනුකාරක සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කළා. අපේ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. එම වාර්තාව හරහා ජනතාවගේ අයිතිවාසිකම් තවත් ශක්මත් කරන්න අපි ප්‍රගතිශීලි යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. කලින් මූලික අයිතිවාසිකම් ගැන කතා කරන කොට දේශපාලන අයිතිවාසිකම් ගැන පමණයි අපි කථා කළේ. ආර්ථික, සමාජ අයිතිවාසිකම් පිළිබඳවත් යෝජනා ව්‍යවස්ථාවට ඇතුළත් වන්න ඕනෑ කියලා අපි දැන් යෝජනා කර තිබෙනවා. ඒ වාර්තාව හරහා මේ වාගේ බොහොම ප්‍රගතිශීලි, දුරදර්ශී යෝජනා ගණනාවක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉදිරිපත් කරපු මේ අදහස ඒ වැඩ පිළිවෙළ හරහා ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. අපි පුළුල් සංහිඳියාවක් ගැන කතා කරනවා. හැබැයි, යම්කිසි දේශපාලන විසඳුමක් වෙනුවෙන් අප පියවර ගන්නවා නම් ඒ දේශපාලන විසඳුම උතුරටත් නැගෙනහිරටත් පමණක් සීමා වන්න බැරි බව මතක තියාගන්න.

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. උතුරේ සහ නැගෙනහිර ජනතාව වාගේම, දකුණේ ජනතාවත් එම විසඳුම පිළිගන්න ඕනෑ. එතකොට තමයි පවතින දේශපාලන විසඳුමකට අපට යන්න පුළුවන් වන්නේ. ජනාධිපතිතුමාට ආත්ම ශක්තියක් තිබුණා, එතුමාගේ ප්‍රකාශය කරන අවස්ථාවේ දී උතුරේ සහ නැගෙනහිර දෙමළ සහ මුස්ලිම් ජනතාව පිළිබඳවත් අදහස් ඉදිරිපත් කරන්න. එතුමා එම ජනතාව අමතක කරලා නැහැ; අපි ඒ ජනතාව අමතක කරලා නැහැ. අපට ඕනෑ මේ රටේ පවතින සාමයක් ක්‍රියාත්මක කරන්නයි. ඒ අයගේත් දේශපාලන බලාපොරොත්තු තිබෙනවා. අපි එම දේශපාලන බලාපොරොත්තුවලට විසඳුම් දෙන්න ඕනෑ. හැබැයි එම විසඳුම් දෙන්න ඕනෑ ඒකීය රාමුවක් තුළයි. විපක්ෂ නායක සම්පන්දන් මැතිතුමා -ටීඑන්ඒ නායකයා - ගැන කතා කරන කොට කියන්නට ඕනෑ, එතුමා අන්තවාදියකු නොවන බව. එතුමා එක්ක වැඩ කරන බොහෝ දෙනා අන්තවාදීන් නොවෙයි. ඒ අය මධ්‍යස්ථව හිතන අය. ඒ අය මේ රටේ ඒකීයභාවය පිළිගන්න සූදානම් අය.

එතුමන්ලා මේ රටේ ස්වාධීනත්වය, භෞමික අඛණ්ඩතාව පිළිගන්න සූදානම් අයයි. අපට ඒ අය අත් හරින්න බැහැ. අපි ඒ අය ශක්තිමත් කරන්න ඕනෑ. "අපි රජයත් එක්ක සහයෝගයෙන් වැඩ කරලා මේ මේ දේවල් ලබා ගෙන තිබෙනවා" කියලා ඒ අයට තමන්ගේ ජනතාවට ගිහින් කියන්න අපි අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒකේ වැරැද්දක් නැහැ. අපිට ඒකෙන් මිදෙන්න බැහැ.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන රාමුව තුළ අපිට තව බොහෝ දේවල් කරන්න පුළුවන්. මම මගේ දේශපාලන ජීවිතය පටන් ගත්තේ, 1988 වසරේදී, පළමුවන පළාත් සභාවේ ඇමතිවරයෙක් හැටියටයි. මම බොහොම ආඩම්බරයෙන් කියන්න කැමැතියි, වරදරාජා පෙරුමාල් නොවෙයි, මමයි මේ රටේ පළමුවන ප්‍රඥප්තිය ගෙනාවේ කියලා. තමුන්නාන්සේලාත් මේවා දැන ගන්න ඕනෑ. අපි බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය බිහි කළා. ඊට පස්සේ අනෙක් පළාත් සභා ඒ දේවල් "කොපි" කළා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරියට අධ්‍යයනය කරලා, ඒ නීති රීති ගෙනෙන්න ඒ කාලයේ අපි ලොකු සටනක් කළා. මූලාසනයේ සිටින අපේ ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. එතුමාත් මා සමඟ කාලයක් පළාත් සභාවේ හිටියා. පළාත් සභා ඉතිහාසයේ පළමුවන ගැසට් පත්‍රය නිකුත් කළේ මමයි. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට route permits දෙන්න පුළුවන් වන විධියට ප්‍රඥප්තියක් හදලා, අපි ආදායම් මාර්ගයක් හොයලා දුන්නා. ඒක තමයි ඔවුන්ගේ පළමුවන ආදායම් මාර්ගය වුණේ. ඒ හරහා අද පළාත් සභාව විශාල මුදලක් ලබා ගන්නවා. අපි නිකම් හිටියේ නැහැ. අපි අද මේ පළාත් සභා ක්‍රමය තව දුරටත් ශක්තිමත් කරන්න ඕනෑය කියා කියන්නේ, අත්දැකීම් ඇතුවයි; ඒ පිළිබඳව කටයුතු කළ අය විධියටයි. අපි මේ දේවල් ගැන හදවතිනුයි කථා කරන්නේ. මගේ වාර්තාව අභියෝගයට ලක් කරන්න කාටවත් බැහැ. වරදරාජා පෙරුමාල්ලා කොඩිය ඔසවලා එතැන කෑ ගැහුවාට, පළාත් සභාවේ මහ ඇමතිවරයා හැටියට මොකක්ද කළේ? කිසිම දෙයක් කළේ නැහැ; මධ්‍යම රජයත් එක්ක හැප්පුණා විතරයි. අපි ඒ අවස්ථාවේදී පෙන්නුවා, පළාත් සභාවෙන් නීත්‍යානුකූලව බලතල ගන්නේ කොහොමද කියලා. තව හුඟක් දේවල් කරන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you have only three more minutes.

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
Hon. Saravanapavan, do you want to clarify something?

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

While speaking you said that the Hon. Kaveendiran Kodeeswaran has not read the Address made by His Excellency the President properly. But I have read it properly. So, I just want to clarify this. We are not opposing that the Buddhism being the first religion or whatever it is. But, as far as the Sinhala culture is concerned, the President spoke very well and very clearly that he is giving priority to Sinhala culture. Then, what about our culture, Muslim culture, et cetera?

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

I can tell you very clearly His Excellency the President believes that Sri Lanka is a multicultural, multilingual, multi-ethnic and multireligious society. I know the President's thoughts on this - that diversity is our greatest strength. It is through protecting and nurturing this diversity, the President is talking about cultivating national unity in this country. So, do not ever question the *bona fides* of the President. I am not saying that you are questioning, but I am clarifying this. I am reiterating the fact that today we have a President who respects the diversity of this country. So, when someone who respects the diversity talks about culture, he also talks about the special cultural and religious peculiarities and the habits that are there in the North, East and all over the country. Those have to be protected and nurtured. So, let me assure you that that is the President's thinking.

What I was actually addressing was about the Hon. Kaveendiran Kodeeswaran's statement; he said that there was nothing mentioned about the North and the East. That is why I read that paragraph. The very fact that the President is talking about strengthening the Provincial Council system and a political solution is, in itself, a demonstration of his commitment.

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

We have already had a feeling like that in that matter.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

මම කථාව අවසන් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊට පෙර, තව කරුණු දෙකක් මම මතක් කරන්න ඕනෑ.

මහ බැංකුවේ හිටපු අධිපතිතුමා ඉවත් කරලා, අලුත් අධිපතිවරයෙක් පත් කළේත් අතිගරු ජනාධිපතිතුමා ගරු අගමැතිතුමා සමඟ සාකච්ඡා කරලායි. අද ඒ මහ බැංකු අධිපතිවරයා බොහොම හොඳට වැඩ කරගෙන යන බවත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙපමණයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි බොහෝ දේවල් කර තිබෙනවා. තවත් දේවල් කරන්න තිබෙනවා. විශේෂයෙන්ම මේ රටේ පුළුල් සංහිඳියාවක් ස්ථාපිත කරන්න දේශපාලන වුවමනාවකින් වැඩ කරන ජනාධිපතිවරයෙක් අද පත්වෙලා ඉන්නවාය කියන එක මම මතක් කර දෙන්න කැමැතියි. මේ දේශපාලන වුවමනාව තිබෙනවා නම්, ඒක ක්‍රියාත්මක කරනකොට බොහෝ ප්‍රශ්නවලට අපට උත්තර දෙන්නත්, ඉදිරියේදී විසඳුම් ලබා දෙන්නත් පුළුවන් කියා මා හිතනවා. මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රකාශය අපි බොහොම ඉහළ මට්ටමින් පිළිගන්නවා. එතුමා ගෙන යන මේ සාධාරණ වැඩ පිළිවෙළ, ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළ තව දුරටත් ශක්තිමත් කරන්න අපි සියලුදෙනාම රජය පැත්තෙන් අත්වැල් බැඳගෙන කටයුතු කරනවාය කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. I. Charles Nirmalanathan. You have only five minutes.

[ප.ව. 5.03]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! ஜனாதிபதியின் கொள்கை விளக்கவுரை தொடர்பாகத் தற்பொழுது நடைபெற்றுக்கொண்டிருக்கின்ற சபை ஒத்தி வைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு பேச என்னையும் அனுமதித்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். கௌரவ அமைச்சர் மஹிந்த சமரசிங்க அவர்கள் பேசிய பின்னர் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்திருக்கிறது. அவர் கூறிய பல விடயங்கள் தொடர்பாக என்னுடைய கருத்தைக் கூற விரும்புகின்றேன். மேதகு ஜனாதிபதி அவர்கள், "அரசியல் தீர்வு காலத்தின் தேவை" எனக் குறிப்பிட்டதாக அவர் சொன்னார். காலத்தின் தேவை என்பது, அரச தலைவர்கள், ஜனாதிபதிகள், பிரதமர்கள் உட்பட அரசியல் கட்சித் தலைவர்கள் கூறுகின்ற ஒரு விடயமாகவே இருக்கின்றது. அதாவது, கடந்த 60 - 70 வருடங்களாக காலத்துக்குக் காலம் "அரசியல் தீர்வு காலத்தின் கட்டாயம்" என்று கூறுவது அரச தலைவர்களின் வழக்கமாக இருந்துவருகின்றது. ஆனால், தற்போதைய ஜனாதிபதி அவர்கள் ஜனாதிபதி பதவிக்குப் போட்டியிட்டபோது, இந்த நாட்டில் நீண்ட காலமாக எங்களுடைய மக்களுக்கு ஏற்பட்ட இழப்புகளை நிவர்த்தி செய்வதற்கான ஓர் அரசியல் தீர்வை அவர் பெற்றுக்கொடுப்பார் என்ற நம்பிக்கையில் அவருக்கு வாக்களித்த எமது மக்களுக்கு இந்தக் கொள்கை விளக்கவுரையானது மிகப் பெரிய ஏமாற்றமாகவே அமைந்திருக்கின்றது என்பதை கௌரவ அமைச்சர் அவர்களுக்குத் தெரிவிக்க விரும்புகின்றேன்.

மேதகு ஜனாதிபதி அவர்களின் உரையானது ஒரு மாவட்ட அரசாங்க அதிபரின் உரைபோன்றுதான் இருந்தது. இந்த மாவட்டத்தில், இன்ன இன்ன விடயங்கள் செய்யப்பட்டிருக் கின்றன; அதாவது, குளங்கள் புனரமைக்கப்பட்டிருக்கின்றன; வீதிகள் அமைக்கப்பட்டிருக்கின்றன போன்ற கருத்துக்களைக் கொண்ட கூற்றுகளாக இருந்தனவேயொழிய, அது மக்களு டைய எதிர்பார்ப்பை நிறைவேற்றுகின்ற, மக்களுடைய சிந்தனையைக் கருத்தில் எடுக்கின்ற, மக்களுடைய பிரச்சினைகளைத் தீர்க்கின்ற ஒரு கொள்கை விளக்க

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

உரையாக இருக்கவில்லை என்பதைக் கௌரவ அமைச்சர் மஹிந்த சமரசிங்க அவர்கள் விளங்கிக்கொள்ள வேண்டும். அந்தவகையில், மேதகு ஜனாதிபதி அவர்களுடைய கொள்கை விளக்க உரையானது, எங்களுடைய மக்களுக்கு மிகவும் ஏமாற்றமாகவே அமைந்திருக்கிறது. அரசியல் தீர்வு வருமா? வராதா? என்று சந்தேகத்திற்கிடமான முறையில் எங்களுடைய மக்கள் ஏங்கிக்கொண்டிருந்த நேரத்தில், "அது தன்னுடைய ஆட்சிக்காலத்தில் வராது" என்று சொல்வதைப்போல்தான் மேதகு ஜனாதிபதி அவர்களின் கொள்கை விளக்க உரை அமைந்திருக்கிறது என்பதை அமைச்சர்களும் மேதகு ஜனாதிபதி அவர்களும் விளங்கிக்கொள்ள வேண்டும்.

ஆனால், இதே பாராளுமன்றத்தில் மேதகு ஜனாதிபதி அவர்கள் இதற்கு முன்பு உரையாற்றும்போது மிகவும் தெளிவான முறையில் உரையாற்றியிருந்தார். அதாவது, "வடக்கில் ஒற்றையாட்சியென்றால் பயப்படுகிறார்கள்; தெற்கில் சமஷ்டியென்றால் பயப்படுகிறார்கள்; ஆகவே, இந்த மக்கள் மத்தியிலே இருக்கின்ற அச்சத்தைப் போக்கி, இலங்கையிலிருக்கின்ற எல்லா மக்களும் சம உரிமையுடன் வாழக்கூடிய வகையில் ஆட்சிமுறை மாற்றத்தைக் கொண்டுவர வேண்டும்" என்று மிகத் தெளிவாகப் பேசிய ஜனாதிபதி அவர்கள், தற்பொழுது அதற்கு முக்கியத்துவம் கொடுக்காமல் - அதை ஒரு விடயமாகவே கருதாமல் - வேறு பல விடயங்களைக் கூறியதற்குப் பிறகு "மாகாண சபைகளைப் பலப்படுத்துவது" என்ற ஒரு சொற்றொடரை மட்டும் பிரயோகித்திருக்கிறார். அந்தவகையில், தனது பொறுப்பில் இருந்து தப்பிக்கின்ற வகையிலேயே அவரது உரை அமைந்திருந்தது. "எனது ஆட்சிக் காலத்தில் நான் இந்த அரசியல் தீர்வை மக்களுக்குப் பெற்றுக் கொடுப்பேன்" என்ற ஓர் உறுதிமொழியை அவர் வழங்கியிருந்தால், அது மக்களுடைய சிந்தனைக்கு ஏற்றவாறு அமைந்திருக்கும். அதை அவரால் செயற்படுத்த முடியாமல் போனாலும் பரவாயில்லை. ஆனால், அவர் அதைப்பற்றிச் சற்றுக்கூட சிந்திக்காமல், "மாகாண சபையைப் பலப்படுத்துவது" என்று கூறியதோடு தன்னுடைய உரையை முடித்துவிட்டார். அதாவது, அதற்கு முன்பு பல விடயங்களைக் கூறிய ஜனாதிபதி அவர்கள், இந்த விடயத்தைப் பற்றிக் கடைசியாகத் தொட்டும் தொடாமலும் பேசியிருக்கின்றார் என்பதை இந்தச் சபையிலுள்ள ஜனாதிபதிக்குச் சார்பானவர்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

அதேநேரத்தில், நீண்டகாலமாக எங்களுடைய மாவட்டங்களில் மேற்கொள்ளப்பட்டு வருகின்ற மக்கள் போராட்டங்கள், அந்த மக்களின் குரல்கள் மற்றும் அவர்களுடைய எழுத்துமூலக் கோரிக்கைகள், பகிரங்கக் கோரிக்கைகள் என எந்தவிதமான கோரிக்கைகளுக்கும் ஜனாதிபதி அவர்கள் பதில் கூறவில்லை. ஆனால், நீண்டகாலமாக எமது மக்களுடைய போராட்டங்களுக்குப் பதில் கூறாமல் இருந்துவருகின்ற ஜனாதிபதி அவர்கள், மஹாநாயக்க தேரர்கள் ஒரு கோரிக்கை விட்டால் அதற்கு அடுத்தநாளே அந்தக் கோரிக்கையை நிறைவேற்றி வருகின்றார். இப்படியான ஒரு சூழ்நிலைதான் இலங்கையில் இருக்கின்றது. இலங்கையில் முதன்மையான பிரச்சினையாக இருப்பது, ஓரினம் மதரீதியாக முன்னிலைப்படுத்தப்படுவதும் மற்றைய மதத்தவர்கள் அடக்கியாளப்பட வேண்டுமென்று நினைப்பதும்தான்! இலங்கையில் இந்த நிலைப்பாடு காலா காலமாகத் தொடர்கின்றது. மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் ஜனாதிபதியாக வருகின்ற போது அவரை மக்கள் வித்தியாசமாக எதிர்பார்த்தார்கள். ஆனால், அவரும் ஏனைய ஜனாதிபதிகளைப் போன்றுதான் இருக்கின்றாரென்பதை அவரது தற்போதைய செயற்பாட்டின்மூலம் காட்டியிருக்கிறார். ஆகவே, "அரசியல் தீர்வு காலத்தின் தேவை" என்று கூறுகின்ற ஜனாதிபதி அவர்கள், அதற்காக என்ன முயற்சிகளை எடுத்திருக்கிறார் என்றோ, என்ன முயற்சிகளை எடுக்கவிருக்கிறார் என்றோ தன்னுடைய கொள்கை விளக்க உரையில் எதுவும் கூறவில்லை என்பதை நான் மேதகு ஜனாதிபதி அவர்களுக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

அண்மையில் சச்சிதானந்தம் ஆனந்தசுதாகரனின் பிள்ளைகள் ஜனாதிபதி அவர்களை நேரடியாகச் சந்தித்துத் தங்களுடைய தந்தையை விடுதலை செய்யுமாறு கூறியிருந்தார்கள். ஜனாதிபதி அவர்கள் அரசியல் கைதிகளை விடுதலை செய்வதாகப் பலமுறை கூறியிருக்கிறார்; பத்து வருடங்களுக்கு மேலாகச் சிறையில் இருக்கின்றவர்களை விடுதலை செய்வதாக வாக்குறுதி அளித்திருந்தார். ஆனால், இன்று அந்த வாக்குறுதிகள் எல்லாம் காற்றோடு காற்றாகப் பறந்துவிட்டன.

இறுதியாக, மேதகு ஜனாதிபதி அவர்களுடைய இந்தக் கொள்கை விளக்க உரை எங்களுடைய மக்களுக்கு மிகவும் ஏமாற்றத்தையே தந்திருக்கின்றது. அவருடைய உரை ஒரு மாவட்ட அரசாங்க அதிபருடைய வேலைத்திட்டம் பற்றியது போலவே அமைந்திருந்தது. அதாவது, இந்த மாவட்டத்தில் இவ்வளவு இவ்வளவு வேலைத்திட்டங்கள் நடந்திருக்கின்றன என்பதைச் சுட்டிக்காட்டுவதுபோல் அவருடைய உரை அமைந்திருந்தது. "நான் இதைச் செய்தேன்! இதைச் செய்வேன்! எனக்கு வாக்களித்த எங்களுடைய மக்களை நிச்சயம் ஏமாற்றமாட்டேன்" என்று எந்தவிதமான ஓர் உறுதிமொழியும் கூறாமல், அவர் நாசூக்காகத் தப்பித்துக் கொள்ள முனைந்திருக்கின்றார் என்பதை இந்த நேரத்தில் தெரிவித்து, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

[අ.භා.5.11]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අගය කරනවා අද මේ නව සැසි වාරයේ පැවැත්වෙන විවාදය සම්බන්ධයෙන්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක්, මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ඒ. ඒ. විජේතුංග මහතා
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு எட்வட் குணசேகரஅவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව සැසි වාරයේ පැවැත්වෙන මේ විවාදයේදී වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඉතාමත්ම ස්තුතිවන්ත වනවා. මම හිතන විධියට අපි බලය ලබා ගෙන මාස 40ක් වෙනවා. මේ පක්ෂ දෙක එකට වැඩ කිරීම තුළ රටේ විතරක් නොවෙයි, ජාත්‍යන්තර මට්ටමෙන් ලංකාව දෙස සුබවාදීව බලන අවස්ථාවක් ඇති වෙලා තිබෙනවා. එවැනි සුබවාදී අවස්ථාවක් ලබා දී තිබෙන වේලාවක, මේ රට වෙනුවෙන් උපරිමයෙන් කළ යුතු කටයුත්ත අප විසින් කිරීමයි අවශ්‍ය වන්නේ. ඒ අතර, හොඳ වැඩ ගණනාවක් සිදු වෙලා තිබෙනවා වාගේම, අපි යම් දේවල් නිවැරැදි කරලා, අපට ඡන්දය ලබා දුන් ඡන්දදායකයන් ආරක්ෂා කර ගෙන ඉදිරියට ගමන් කරන්න අවශ්‍යයි කියන එකත් මම ඉතාමත් ඕනෑකමින් කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ප්‍රථමයෙන්ම කිව යුත්තේ, ප්‍රජාතන්ත්‍රවාදී ක්ෂේත්‍රයේ ජනතාවගේ ජීවත් වන අයිතිය උතුම් වන බවයි. භය නැතිව ජීවත් වීමේ වටපිටාව ඇති කිරීම ඒ ආකාරයෙන්ම වටිනවාය කියන එක අප සියලු දෙනාම දන්නා කාරණයක්. ඒ නිසා ප්‍රථමයෙන්ම මේ ආණ්ඩුව තුළ අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් එකතුවීම තුළින් මේ රටේ භය නැති කිරීම නව ආණ්ඩුවේ අප විසින් කර තිබෙන ලොකුම ආයෝජනය කියන එක මම ඉතාමත් නිර්භීතව කියන්න කැමැතියි.

අද රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කර තිබෙනවා. මීට පෙර ප්‍රජාතන්ත්‍රවාදය වළලා තිබුණු බව අප දන්නවා. ඒ මිනී පෙට්ටියේ අන්තිම ඇණය ගහන්න තිබුණු අවස්ථාවක් තමයි පෙනෙන්න තිබුණේ. නමුත්, නැවත පුළුල් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ වැඩ කටයුතු අපි දැන් පෙන්වලා තිබෙනවා. මම හිතන ආකාරයට මෙවැනි රටක ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම විශේෂ ලක්ෂණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවශ්‍ය ප්‍රමාණයටත් වඩා මාධ්‍ය නිදහස අප ලබා දීලා තිබෙනවාය කියන එක පෙනෙන්න තිබෙන තවත් කරුණක්. නමුත්, අප එය පාවිච්චි කරන්න අවශ්‍ය වන්නේ රටේ අභිවෘද්ධිය පිණිස මිස, එක්කෙනෙකුගේ, දෙදෙනෙකුගේ, තුන්දෙනෙකුගේ චරිත ඝාතනය කිරීමේ අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට නොවෙයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. මේ ක්ෂේත්‍රය තුළින් පුංචි ලංකාව ලෝකයට එක් කරන්න පුළුවන් අවස්ථාව ඇති වෙලා තිබෙනවාය කියා මම හිතනවා. එදා ලංකාව හුදෙකලාවේ ගමන් කළා. නමුත්, අද නැවත ලෝකය ලංකාව දෙස බලන්නේ, "මෙන්න, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන, ලෝකයේ ශිෂ්ට සම්පන්නව ජීවත් වෙන්න පුළුවන් අයිතිය ඇති කරන රටක්." ලෙසයි. එදා මානව අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා තිබුණු රටක් ලෙස සලකා තිබුණත්, අද ඒ ලේබලය ගලවලා ලංකාවේ නැවත ජීවත් වෙන්න පුළුවන් අයිතියක් ඇති වෙලා තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ශ්‍රී ලංකාවේ තිබෙන වැදගත්ම ශක්තිය වන්නේ අපේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සියලු දෙනාටම එකට ජීවත් වෙන්න පුළුවන් රැකවරණය ලබා දීමයි. පුංචි ලංකාවේ සාරවත්භාවය අනුව, අන්න ඒ බහු ආගම්, බහු ජාතීන්, බහු භාෂා කථා කරන්න පුළුවන් අයිතිය ස්ථාපිත කිරීම තමයි අවශ්‍ය වෙන්නේ. යම් අය අන්තවාදීව මේක පාවිච්චි කරලා, වැරදි විධියට ගෙන යන එක තමයි සිදු වී ඇති ලොකුම දේ කියා මම හිතන්නේ.

Sir, I may state at this particular moment that the biggest strength of Sri Lanka is the diversity of Sri Lankan culture and society. The industriousness of the Tamils, the business acumen of the Muslims and the large heartedness of the Sinhalese put together make a very strong social fabric and let us ensure that this is kept for posterity. Sir, what the Rt. Hon. D.S. Senanayake said in 1948 when we got Independence from the British stands to test even now. Whether we are strong enough to maintain the Independence we got from British is the question that needs to be debated.

මම හිතන විධියට අප සියලු දෙනාම ඒකරාශි වෙලා, ඒ තිබෙන එකමුතුභාවය රකින්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන්න අවශ්‍යයි. පාර්ලිමේන්තුවේ නව සැසි වාරය ආරම්භ කරන අවස්ථාවේ ජනාධිපතිතුමා කථා කරමින් එක් කරුණක් පෙන්වා දුන්නා. මේ රටේ දේශපාලන මතිමතාන්තර පැත්තකින් තියලා එකට ගමන් කරන්න තිබෙන අවස්ථාව තමයි අපි උපයෝගී කර ගන්න අවශ්‍ය වන්නේ. ඒක 2015 ජනවාරි මාසයේ 8 වැනිදා ඉඳලා කරපු දෙයක්. ඒ වෙනුවෙන් අපි රැකවරණය ලබා දී කටයුතු කිරීම අවශ්‍යයි. පොඩි පක්ෂ වුවත් කමක් නැහැ. මේ අවස්ථාවේදී මේ සඳහා අප ජාති, ආගම්, දේශපාලන භේද පැත්තකට දමා ජාතික පක්ෂ තුළ එක් රොක් වී කටයුතු කළ යුතුයි. අන්තවාදය පැත්තකට දමන්න ඕනෑය කියන එක මම නැවත මතක් කරන්න කැමැතියි. අපි රටේ ආර්ථිකය වෙනුවෙන් නොයෙක් නොයෙක් වැදගත් දේවල් කළා.

මට මතකයි, 2015 ජනවාරි මාසයේ 8 වැනි දා බලය අරගත් අවස්ථාවේ සිට අපි කරපු දේවල්. යම් අයට අද ඒවා අමතක වෙන්න පටන් ගෙන තිබෙනවා. අපි ඒ දින සියයේ වැඩ පිළිවෙළ තුළ මේ රටේ රජයේ සේවකයන්ට රුපියල් 10,000ක වැටුප් වැඩිවීමක් කළා. අපි ඒ කළේ ලෙහෙසි කාර්ය භාරයක් නොවෙයි. අපට අවශ්‍ය වන්නේ, රජයේ නිලධාරීන්ගේ ක්‍රය ශක්තිය, වැඩ කරන්න පුළුවන් හැකියාව, චිත්ත ශක්තිය ඇති කරලා, එහි ප්‍රතිඵලය මේ රටට උරා ගන්න පුළුවන් විධියේ තත්ත්වයක් ඇති කරන්නයි. ඒක ඒ ආකාරයෙන් වුණේ නැති වුණත්, මම තවමත්

[ගරු රවි කරුණානායක මහතා]

හිතන්නේ අද වුණත් අපට එකට වැඩ කරන්න ඒ අවස්ථාව තිබෙන බවයි. ඒ අවස්ථාව මහ හරින්න එපා කියලා ඒ රජයේ නිලධාරීන්ගෙන් අපි ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සියලුම පාසල් ළමයින් රක්ෂණය කරලා තිබෙනවා. මෙවා නව ක්‍රම විධියටයි ක්‍රියාත්මක කළේ. එදා, මා මුදල් ඇමති වශයෙන් කටයුතු කරන අවස්ථාවේදී එම රක්ෂණය අහිංසක, අසරණ දරුවන්ටයි දුන්නේ. රටක තිබෙන මුදල් නාස්ති කරන්නේ නැතිව, එම මුදල් ආයෝජනයක් කරන්න තමයි අපි එදා ඒ කටයුත්ත කළේ. අද ඒකේ එල දරන්න පටන් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ස්වාභාවික හානි හේතුවෙන් හැම අවුරුද්දකම රුපියල් බිලියන තුනක, හතරක - රුපියල් කෝටි 300ක, රුපියල් කෝටි 400ක- මුදලක් නාස්ති වෙනවා. ඒ නාස්තිය නවත්වලා, අපට පුළුවන් වුණා, ලෝකයේ ප්‍රථම වතාවට, ස්වාභාවික හානි රක්ෂණ ආවරණයක් ලබා දෙන්න. ඒක ඒ ආකාරයෙන්ම ඉදිරියටත් ගෙන යන්න අවශ්‍යයි. නමුත්, යම් අය මේ දෙස වෙනත් විධියකට බලලා එම රක්ෂණය ලබා දීම නවත්වා තිබෙන එක තමයි අපට අසතුටුදායක තත්ත්වයක්ව තිබෙන්නේ.

පොලීසියේ වැටුප් සංශෝධනය කළා. අවුරුදු දෙකක්, තුනක් රජයෙන් ගෙවපු නැති මුදල් සියල්ල ගෙවන්න පටන් ගෙන, 2015 අග වෙනකොට නැවත යථා තත්ත්වයට ආණ්ඩුව පත් කරන්න පුළුවන් වුණා. ඒ වාගේම තමයි පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගෑස්, සීනි, පරිප්පු, කිරි පිටි මේවායේ මිල අඩු වුණා. මෙම භාණ්ඩ සම්බන්ධයෙන් මිල අඩු වෙනකොට යම් යම් භාණ්ඩවල මිල වැඩි කළ යුතුයි කියලා යම් අවශ්‍යතා පෙන්වලා තිබෙනවා. නමුත්, මේකට අද මූලිකවම ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ, අපි කවුරුත් නිසා නොවෙයි. මෙය අපේ මිත්‍ර මංගල සමරවීර මැතිතුමාගේ කටයුත්තක් නොවෙයි. එය මහ බැංකුවේ ඉදිරි දැක්මක් නැතිව යන ගමනක ප්‍රතිවිපාකයක් ලෙසයි මම දකින්නේ. මහපොළ ශිෂ්‍යාධාරය අපි සියයට 100ක් වැඩි කළා. ඒ වාගේම තිබුණු ලොකුම ප්‍රශ්නයක් වූ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 10.2ක්ව තිබුණ ආදායම සියයට 15කට වැඩි කරන්න පුළුවන් හැකියාව තිබුණා. මේවා තුළින් තමයි රටේ ආර්ථිකය සවි ශක්තිමත් වෙලා, එදා දණ ගස්සපු ආර්ථිකය හරි ගස්සන්න අපට පුළුවන් වුණේ.

එදා වැටුණු ආර්ථිකය ඉතාමත් ඉක්මනින් නඟාසිටුවන්න අපට පුළුවන් වුණා. මේ තුළින් ආයෝජනය කරන්න පටන් ගන්න පුළුවන් වුණා. ප්‍රාග්ධන වියදම් හරියාකාරව ගෙවලා - මේක පුද්ගලයන් සතු සංවර්ධනයක් නොවෙයි, - රටේ අවශ්‍යතාව අනුව ප්‍රාග්ධන වියදම් වැඩි කරලා, පුනරාවර්තන වියදම් අඩු කරලා, මේ රට නිවැරදි මාර්ගයකට ගෙන යන්න පුළුවන් ආර්ථික ප්‍රතිපත්තියක් අපි අනුගමනය කළා. ඒක අද වෙනස් වෙන්න පටන් ගෙන තිබෙන්නේ, මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ කටයුතු කිරීමේ දී ඒ ගොල්ලන්ගේ අදහස් ගලා ගෙන යන ආකාරය අනුවයි. අද යම් විධියකින් මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය - fiscal policy - ක්‍රියාත්මක කරනවා වාගේම, ඒක අපේ මුදල් අමාත්‍යාංශය හරියාකාරව ගෙන ගිය නිසා අපට පෙනෙනවා, අද ආයෝජනය කරන්න පුළුවන් ශක්තියක් තිබෙනවා කියලා. නමුත් බලන්න, අද මහ බැංකුවේ කටයුතු තුළින් ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 158ට නැතහොත් forward exchange rate එක 160ට අවප්‍රමාණය කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේක තුළින් debt stock එක කීයද? මේ රට යූඑස් ඩොලර් බිලියන 4,300ක් පිටරටට ණයයි. අවප්‍රමාණය වන හැම රුපියලකටම රුපියල් බිලියන 45ක අනිසි වියදමක් රටට දරන්න වෙලා තිබෙනවා. මේ මාස තුන, හතර තුළ රුපියල් 5කින් 6කින් අවප්‍රමාණය වීම නිසා මේ රටේ අපේ බදු ගෙවන්නන්ට ගෙවන්නට සිදු වෙලා තිබෙනවා, නැත්නම් රජයේ වියදම රුපියල් බිලියන 200ක් නැත්නම් රුපියල් කෝටි 20,000ක් නිකරුණේ වැඩි වෙලා තිබෙනවා. මේ, කාලාද, බීලාද, වියදම් කරලාද? නැහැ. මේ, මහ බැංකුවේ තිබෙන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරලා හරියාකාරව රුපියල ශක්තිමත් කරන්නේ නැතිව කටයුතු කිරීමේ ප්‍රතිවිපාක. ඒ නිසා තමයි අද ඩීසල්, පෙට්‍රල්, ගෑස් මිල වැඩි කරන්න පටන් ගෙන තිබෙන්නේ. ලෝකයේ කිරි පිටි මිල අඩු වෙනවා. රුපියල අවප්‍රමාණය වීම නිසා කිරි පිටි මිල වැඩි කරන්නයි අපේ රටේ ඉල්ලලා තිබෙන්නේ. ඉතින් මේ වාගේ දේවල් නිසා රටේ දේශපාලන ස්ථාවරභාවයක් ඇති කරන්න අවශ්‍යයි. ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, "The operation was successful, but the patient died." කියලා. අවසානයේදී, අපේ දේශපාලන අරමුණ ක්‍රියාත්මක කරන්නයි අපට අත්‍යවශ්‍ය වන්නේ. නමුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ - IMF එකේ - අවශ්‍යතා ඉටු කරන්න ගිහිල්ලා එමඟින් දේශපාලන අස්ථාවරභාවයක් ඇති වෙනවා නම්, රටේ පාලනයට වන්නේ මොකක්ද?

බලන්න, අද අපේ විදේශීය සංචිත යූඑස් ඩොලර් බිලියන 9.7ක් තිබෙනවා. මීට මාසයකට ඉස්සෙල්ලා යූඑස් ඩොලර් බිලියන 2.5ක bond එකක් අපි අරගෙන තිබෙනවා. මේ bond එකට අපි සාමාන්‍යයෙන් සියයට 7ක පොලියක් ගෙවනවා. නමුත් එහි ඉතිරිකිරීමවලට, ආයෝජනයට, සියයට 2ක පොලියක් තමයි ලැබෙන්නේ. මෙලෙස වැඩිපුර මුදල් ලැබීම නිසා අපි සියයට 5ක් අපේ සංචිතය හදන්න ගෙවනවා. එක පැත්තකින් සියයට 2, සියයට 3 අතර ප්‍රමාණයක් ඉතිරි කිරීමවලට ගෙවනවා. අපි ණයක් වශයෙන් ගෙන එයට සියයට 7ක පොලියක් ගෙවනවා. ඒ අතරතුරේදී ඒ මුදල් රැකීම සම්බන්ධයෙන් සියයට 4ක, 5ක මුදලක් එකතු කරලා තිබෙන එක අපට දරා ගන්න පුළුවන්ද නැද්ද කියන ප්‍රශ්නය ඇති වෙනවා.

මේ අවස්ථාවේදී අපේ රටේ ආර්ථිකය ස්ථාවර කරන්න අවශ්‍යයි; අපේ රටේ ආයෝජනය වැඩි කරන්න අවශ්‍යයි. අපට මේවා කරන්න, ඉස්සෙල්ලාම පොලී ප්‍රමාණය අඩු කරන්න අවශ්‍යයි. මොකද, පොලිය අඩු වනකොට අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට නැඟිටින්න පුළුවන්. ඒගොල්ලන්ට රජයේ රක්ෂාවක් නොවෙයි අවශ්‍ය වෙන්නේ. ඒගොල්ලන් කියන්නේ, "කරුණාකරලා අපට කකුල් දෙකෙන් හිට ගන්න පුළුවන් ආර්ථික ප්‍රතිපත්තියක් ඇති කරන්න, අපට ණයක් ලබා ගන්න පුළුවන් වන විධියට කටයුතු කරන්න" කියලායි. රුපියල් ලක්ෂ 5ක් ගන්න අපි බැංකුවට ගියාම ඒකට වත්කම වශයෙන් රුපියල් ලක්ෂ 10ක් තිබෙනවාද කියලා අහනවා නම් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් බිහි වෙන්නේ කොහොමද? අපේ ආණ්ඩු දෙක එකතු කර ගිය අවුරුදු තුන හමාරක වැදගත් ගමන තුළ අපි ඇති කරන්න අවශ්‍ය වෙන්නේ මෙන්න මේ ප්‍රතිපත්තියයි.

බලන්න, දැන් මේ රටේ බනිජ තෙල් මිල වැඩි වෙනවා. බනිජ තෙල් මිල වැඩි වනකොට අපට ඒ ගැන නොබලා නිකරුණේ ඉන්නත් බැහැ. නමුත් එතැනදී අහිංසක ජනතාවට තාවකාලිකව බර පටවන්නේ නැතිව, බදු ප්‍රමාණය අඩු කළා නම් අපට මේ ගමන යන්න පුළුවන්ද කියන හැකියාව බලන්න තිබුණා. රුපියල අවප්‍රමාණය වෙන්න ඉඩ දීම නිසා තමයි අද මේ වාගේ බනිජ තෙල් මිල වැඩි කිරීමේ අවශ්‍යතාව ඇතිවෙලා තිබෙන්නේ.

අපට හැම දේම නිකම් දෙන්න බැහැ කියන මතයේ තමයි මම හැම අවස්ථාවේදීම ඉන්නේ. නමුත් දෙන්න පුළුවන් හැකියාව

තිබෙන අවස්ථාවේදී ඒ සංචිතය ඇති කරලා, දෙන්න බැරි අවස්ථාවක ඒවා ලබා දීම තමයි අවශ්‍ය වන්නේ. සමෘද්ධිලාභීන්ට නිකරුණේ හැම දේම දීම හෝ ඒ දෙන ප්‍රමාණය වැඩි කිරීම නොවෙයි කළ යුත්තේ. ඔවුන්ගේ දුප්පත්කම නැති කිරීමයි අපට අවශ්‍ය වෙන්නේ. යම් අය දේශපාලන මති මතාන්තර කියන කොට කියනවා, "අපි නිල ඇඳුම් නොමිලේ දෙනවා; සපත්තු කූටිටම් නොමිලේ දෙනවා" කියලා. ඒවා දේශපාලනඥයන්ට කරන්න පුළුවන් නම් රටක ආර්ථිකයක් ගෙනයන්න බැහැ නේ. එහෙම බලනකොට ඉස්සෙල්ලාම ගෙවල් ටික නොමිලේ දෙන්න අවශ්‍යයි. රටකට දරා ගන්න පුළුවන් වන විධියේ ආර්ථික ප්‍රතිපත්තියකුයි අපි ගෙනයන්න ඕනෑ.

අපේ අසීමිත ඉල්ලීම්වලට අපට තිබෙන්නේ සීමිත සම්පත් ප්‍රමාණයක්. මේ සීමිත සම්පත් ප්‍රමාණය අපේ අවශ්‍යතාව අනුව බෙදලා, ප්‍රමුඛත්වය අනුව වෙන් කිරීම තමයි අවශ්‍යව තිබෙන්නේ. ඒ නිසා අපි ඉස්සෙල්ලාම අපේ රුපියල ශක්තිමත් කරන්න අවශ්‍යයි. රුපියල ශක්තිමත් කරනවා වාගේම අපේ පොලී අනුපාතය අඩු කිරීමත් කළ යුතුයි. මේ රටේ හැම රුපියලක්ම අවප්‍රමාණය වනකොට, මම කලිනුත් කිව්වා වාගේ, රුපියල් බිලියන 40ක් -රුපියල් කෝටි 4,000ක්- ඒකට බලපානවා. රුපියල් 5කින් අවප්‍රමාණය වනවා කියන්නේ මේ අවුරුද්දේ රුපියල් බිලියන 200ක්. එනම් රුපියල් කෝටි 20,000ක ප්‍රශ්නයක් අපේ අය වැයට ඉදිරිපත් වෙනවා. එක ප්‍රතිශතයක් වැඩි වනවා කියන්නේ රුපියල් බිලියන 50ක වියදමක් අපේ අය වැයට එකතු වනවාය කියන එකයි. රුපියල් බිලියන 50ක් කියන්නේ, රුපියල් කෝටි 5,000ක්. සියයට 2ක, සියයට 3ක වැඩි වීමක් වනකොට ඒකත් නැවත දරා ගන්න බැරි අවස්ථාවක තමයි අපි දැන් සිටින්නේ. ණය බර තිබෙන රටක උද්ධමනය නවත්වනවා කියලා පොලී අනුපාතය වැඩි කරනකොට අන්තිමට නිකරුණේ දරා ගන්න බැරි වියදමක් තමයි ඇති වෙන්නේ. පසු පෙළ මන්ත්‍රීවරු වන අපට ගමට යන්න අවශ්‍යයි. එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතුවෙලා මේ ආණ්ඩුව හදලා තිබෙන්නේ ඉතාම අමාරුවෙනුයි. ඕනෑම කෙනෙකුට නිකරුණේ විවේචනය කරන්න පුළුවන්. නමුත් මේ විශ්වාසය රැකගෙන කටයුතු කරන්න තිබෙන අවස්ථාවකුයි දැන් අපට උදාවෙලා තිබෙන්නේ. ඡන්ද ගැන හිතලා කටයුතු කරන එක නොවෙයි අපට අවශ්‍ය වෙන්නේ. නමුත් විශ්වාසයෙන් යුතුව අපට ඡන්දය ලබා දුන්නු අය ආරක්ෂා කරමින් කටයුතු කිරීමයි අවශ්‍ය වෙන්නේ.

මේ අවස්ථාවේදී මම නැවතත් මේ කාරණය මතක් කරන්න කැමැතියි. මහ බැංකුව තිබෙන්නේ අපේ රටේ දේශපාලන අරමුණින් කටයුතු කරන්න නොවෙයි. අපේ ආණ්ඩුව නිර්භීතව කටයුතු කරන්නයි අවශ්‍යව තිබෙන්නේ. අපි තීන්දු ගන්නකොට ඉස්සෙල්ලාම ඡන්ද වේදිකාවල කියපු දේ නොවෙයි වැදගත් වෙන්නේ. රටට හොඳ මොකක්ද, ජනතාවට ඒ ප්‍රතිලාභය ගලා ගෙන යන්න පුළුවන් වැඩ කටයුත්ත අපි කරන්නේ කොහොමද කියන කාරණය අපි හඳුන්වා දෙන්න අවශ්‍යයි. අපේ රටේ ආර්ථික වර්ධනය වැඩි කරන්න, පොලී අනුපාතය අඩු කරන්න, මේ රටේ රුපියල ශක්තිමත් කරන්න, ණය බරතාවෙන් පෙළිලා තිබෙන රටක් එළියට ගන්න පුළුවන් එකම දේ තමයි මේ රටේ වැඩියෙන් ආයෝජනය කරලා, ඒ තුළින් රැකී රක්ෂා ඇති කරලා, රටට වාගේම ජනතාවට සල්ලි ලබා ගන්න පුළුවන් මාර්ගයක් ඇති කිරීම. ඒක තමයි දැන් අවශ්‍යතාව වෙලා තිබෙන්නේ. මිල උච්චාවචන ඇති වනවා. මාස දෙකෙන් දෙකට යම් විධියකින් ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වනකොට මෙහේ මිල වැඩි කරන්නත්, ඉන්ධන මිල අඩු වනකොට අඩු කරන්නත් කියලා අද වනකොට වැඩ පිළිවෙළක් සකසා තිබෙනවා.

නමුත් මට මේ අවස්ථාවේදී එක් කාරණයක් කියන්න තිබෙනවා. මම මේ පාර්ලිමේන්තුව අවුරුදු 25ක් නියෝජනය කරලා තිබෙනවා. ලංකාවේ ආර්ථිකය දිහා බලන්න, ඉන්ධන මිල වැඩි වන හැම අවස්ථාවකම මිල වැඩි කරනවා මිසක් ඉන්ධන මිල අඩු වන කොට මිල අඩු කරලා තිබෙන්නේ කොයි අවස්ථාවේද කියා. ඒ නිසා අපි ලංකාවේ ඇති කරන මේ ප්‍රතිපත්තිය තුළින් රටට ඔබින, ජනතාවට උදව්වු කරන්න පුළුවන් කටයුත්තක් කරන්න අවශ්‍යයි. මිල වැඩි වෙනකොට, වැඩි කරනවා; අඩු වෙනකොට, අඩු කරන්න ඕනෑය කිව්වත් මිල අඩු වෙනකොට, අඩු කරන්න පුළුවන් වන්නේ කොහොමද? අඩු නොකළොත් කරන්න පුළුවන් වන්නේ මොකක්ද? අපි ප්‍රායෝගිකව මේවා කරන්නේ කොහොමද කියන එක ගැන බලන්න ඕනෑ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇවිල්ලා වටිටෝරුව කිව්වාට පසුව, කියන්න දෙයක් නැති නිසා රජයේ නිලධාරීන් ලෙහෙසියට නිකම් කියනවා, "මේක තමයි කළ යුත්තේ" කියලා. නමුත් අපි දේශපාලනඥයන් වශයෙන් දැනගන්න අවශ්‍යයි, සුද්දන් කියන දෙයම රටට ගැළපෙන්නේ නැහැ කියන එක. අපි තීරණ ගන්න අවශ්‍ය රටට ඔබින්නේ මොකක්ද, ජනතාවට ඔබින්නේ මොකක්ද කියන එක ගැනයි. නැත්නම් අපිට වෙන්නේ මොකක්ද? අර කිව්වා වාගේ අපි සුද්දන්ට ඕනෑ විධියට කටයුතු කරලා අන්තිමට ඡන්දයෙන් ප්‍රශ්නයක් ඇති වුණාම තමයි "මේ අය කියපු එක නිසා අපට තමයි ප්‍රශ්නයක් ඇති වුණේ" කියලා හිතන්නේ. අපි හැම අවස්ථාවේදීම කටයුතු කරන්න අවශ්‍ය වන්නේ, රටේ ආර්ථික ප්‍රශ්නයක් ඇති නොවන විධියකට ජනතාව මුල් කොටගෙනයි. අපිම හිතලා කටයුතු කරනවා මිසක්, සුද්දෝ ඇවිල්ලා අපට කියනකම් ඉන්න අවශ්‍යතාවක් නැහැ කියන එකයි මා කියන්නේ.

අනෙක් කාරණය තමයි, මේ රටේ විනයක් ඇති කිරීම. අපි මේ රටේ විනයක් ඇති කරන්න අවශ්‍යයි. දැන් බලන්න, SAITM ප්‍රශ්නය. මේ සම්බන්ධයෙන් හැම දවසකම වාගේ විරෝධතා රැලි දකින්න තිබෙනවා. මම කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. හැම දවසේම සවස් වෙනකොට 100ක්-200ක්-300ක් කොහෙන් හරි ඇවිල්ලා, විරෝධතා ඇති කරලා මුළු රටම අවුල් කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අපේ රටේ දේශීය ආයෝජකයන් ඉන්නවා වාගේම, විදේශීය ආයෝජකයනුත් අපේ රටට එනවා. අර විධියට බෝඩ් ලෑලි අල්ලා ගෙන සිදු කරන විරෝධතා දකින කොට කවුද අපේ රටට ඇවිල්ලා ආයෝජන කරන්නේ? අපේ රටේ හැම අවුරුද්දකම 125,000ක් පමණ වන අහිංසක තරුණ-තරුණියන් ප්‍රමාණයක් රැකී රක්ෂා සොයා ගෙන එළියට -අපේ ආර්ථික ලෝකයට- එනවා. මේ අයට අවශ්‍ය රැකී රක්ෂා ඇති කරන්න නම්, අපේ ආර්ථිකය වර්ධනය වෙන්න අවශ්‍යයි. ආර්ථිකය වර්ධනය වෙන්න අවශ්‍ය නම්, දේශීය වශයෙන් ආයෝජන සිදු වෙන්න ඕනෑ වාගේම විදේශීය වශයෙනුත් ආයෝජන ගෙන්වා ගන්න අවශ්‍යයි. අපේ රටේ ඉතිරි කිරීම් තිබෙන්නේ සියයට 28-29ක ප්‍රමාණයක්. සාමාන්‍යයෙන් සියයට 8ක වර්ධනයක් ඇති කරන්න නම්, සියයට 40ක විතර ඉතිරි කිරීමක් අවශ්‍යයි. ඉතුරු සියයට 14, 15, 16 අවශ්‍ය නම්, පිට රට ආයෝජන තමයි මේ රටට ගෙනෙන්න අවශ්‍ය වෙන්නේ. නමුත් මේ විධියට බෝඩ් ලෑලි අල්ලාගෙන හැම තැනම විරෝධතා තිබෙන ආකාරය දකිනකොට, කවුද මේ රටට ඇවිල්ලා ආයෝජන කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි රටේ විනයක් ඇති කරමු කියලා මා කාරුණිකව ඉල්ලනවා. අපි දේශපාලන පැත්ත අල්ලාගෙන, බෝඩ් ලෑලි අල්ලාගෙන ඉඳීම නොවෙයි කළ යුත්තේ. අපි ඡන්දය ගැන හිතන්නේ නැතුව අපේ රට ගැන හිතන්න ඕනෑ. මේ රටට නිදහස ලැබී දැනට අවුරුදු 70ක් වෙනවා. අපිට නිදහස ලැබුණාට, අපට සැබෑ ආර්ථික නිදහසක් ලැබී තිබෙනවාද? මේ ප්‍රශ්නය තමයි අපි අහන්න අවශ්‍ය වන්නේ. හොඳම උදාහරණය තමයි SAITM එක. මේ ප්‍රශ්නය ගිය ආණ්ඩුව ඇති කළ දෙයක්. දැන් ඒ හිසරදය අපේ ආණ්ඩුවට ඇවිල්ලා තිබෙන්නේ. මොකක්ද, මේ කරන්නේ? මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් දෙන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි? මෙවැනි ප්‍රශ්නවලට විසඳුමක් ලබා දෙන එක තමයි අපි කළ යුත්තේ. හැම

[ගරු රවි කරුණානායක මහතා]

දවසේම මේ වාගේ විරෝධතා රැලි ඇති කරලා, මේ රටේ අස්ථාවරභාවයක් ඇති කරන්න හදන එකට අපි උත්තරයක් දෙන්න අවශ්‍යයි.

ඊළඟට, මේ රටේ පොලීසිය ගැන බලන්න. මම පාර්ලිමේන්තු එනකොට දැකපු දෙයක් තමයි මාර්ග බාධක - barricades - දෙපැත්තේම පේළියට නිකම් දමලා තිබෙන ආකාරය. මම මේක මාස දෙකක්-තුනක් විතර දැක්කා. මේ අයට කිසිම විනයක් තිබෙනවාද? විරෝධතාවක් නැති කාලයේ කරුණාකරලා මේවා වෙනත් තැනකට ගිහින් දමන්න. විනයක් නැතුව පොලීසිය මේ වාගේ කටයුතු කරනවා නම්, අපි කටයුතු කරන්නේ කොහොමද? කවුරු හෝ මේ රටේ පාර්ලිමේන්තුව බලන්න එනකොට, මේවා දැක්කාම ඔවුන්ට හිතෙන්නේ නිකම් සයිබීරියාවට එනවා වාගේ කියලායි. මේ තමයි රටේ අගනුවර. මම මේක කියන්නේ නිදසුනක් වශයෙන්. අපි යම්කිසි හැඟීමකින් කටයුතු කරන්න අවශ්‍යයි. පාර්ලිමේන්තුවට එන පාර දෙපැත්තේම barricades මාස තුනක් තිස්සේ තිබුණා. මම ජීවත් වෙන ප්‍රදේශය නිසා මා මෙය හැම දවසකම දකිනවා. හැමදාම දකිනකොට හිරිකිතයි. මෙන්න මේ වාගේ දෙයක්වත් අපට කරන්න බැරි නම්, අපට රටක් හදන්න පුළුවන් වන්නේ කොහොමද? ශ්‍රී ජයවර්ධනපුර, රටේ අගනුවර කියනවා. පාර්ලිමේන්තුවට ඇතුළු වෙන තැන barricades නිකම් දමා තිබෙනවා. මෙන්න මේ වාගේ දේවල් වෙනස් කිරීම තුළින් තමයි අපිට ප්‍රංචි ලංකාවත් වෙනස් කරන්න පුළුවන් වන්නේ.

අපි සිංගප්පූරුව දෙස බලනවා. අපි කියනවා, ඒ රටේ ශීඝ්‍ර සංවර්ධනයක් තිබෙනවා කියලා. ඒ රටේ හැම දෙයක් තුළින්ම බදු අය කරන නිසා තමයි රට සංවර්ධනය වෙලා, අතිරික්ත අය වැයක් ඇති කරලා තිබෙන්නේ. මලයාසියාව දිහා බලන්න. අද ඒ රටේ ඓතිහාසික දෙයක් සිදුවෙලා තිබෙනවා. අවුරුදු 93ක් වන අගමැති කෙනෙක් පත් වෙලා තිබෙනවා. එදා රට හදලා පැත්තකට ගිහිල්ලා සිටියත්, පසුව රට කාබාසිනියා වුණු නිසා නැවත - ඡන්දයක් තුළින්- අවුරුදු 93ක් වන වයස්ගතම අගමැතිවරයෙක් අද පත් වෙලා තිබෙනවා. ඒ රට සංවර්ධනය වෙලා තිබෙනවා. ඒ කොහොමද? කැපවීම තුළින්. තායිලන්තය, ඉන්දුනීසියාව දිහා බලන්න. වැඩිදුර යන්න අවශ්‍ය නැහැ, මේ ළඟ තිබෙන මාලදිවයින දෙස බලන්න. කොපමණ ප්‍රශ්න තිබුණත්, ඒ රට සංවර්ධනය කරලා තිබෙනවා. මේ රටට වාගේම ඒ රටටත් සංචාරකයෝ එනවා. මෙන්න මේවා ආදර්ශයට ගනිමින් ඒ තුළින් තමයි අපි ඉදිරියට ගමන් කරන්න අවශ්‍ය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එක දෙයක් කියන්න ඕනෑ. මේ රටේ සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 2,100ක් වෙනවා. ඒකෙන් හරියටම තුනෙන් එකක් වැය වෙන්නේ මේ රටේ රජයේ සේවකයන් ලක්ෂ 14කට අවශ්‍ය වැටුප් සහ විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් - pension - ටික ගෙවන්නයි.

ඉන් පසුව, අපි ගෙවිය යුතු ණය පොලී සහ ප්‍රාග්ධන වියදම ගෙව්වාම, මේ රට සංවර්ධනය කරන්න තරම් ආදායමක් ඉතුරු වෙන්නේ නැහැ. ඒ නිසා ලක්ෂ 14ක් වූ රාජ්‍ය සේවකයන් තුළ මීට වැඩිය කැපවීමක් හා උනන්දුවක් ඇති කරලා රට සංවර්ධනය කිරීම තමයි කළ යුතුව තිබෙන්නේ. ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් නායකත්වය යටතේ අද ප්‍රධාන පක්ෂ දෙක එකට එකතු වීම ඓතිහාසික අවස්ථාවක්. යහ පාලන ආණ්ඩුවක් යටතේ රට හදන මේ අවස්ථාවේදී වැඩියෙන්ම ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ, මේ ආණ්ඩුව හදන්න කැපවුණ අපි වාගේ කට්ටියට. නමුත්, අපි කැප වෙලා තිබෙන්නේ හෙට වෙනුවෙන් මිසක් ඊයේ සිදු වූ දේවල් ගැන කථා කරන්න නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පාර්ලිමේන්තුවේ දෙවැනි සැසිවාරය ආරම්භ කරමින් ජනාධිපතිතුමා කළ ප්‍රකාශය පිළිබඳව ඇති වෙලා තිබෙන මේ විවාදයෙන් අපි සියලුදෙනාටම නැවත සිතන්න අවස්ථාවක් ඇති වෙලා තිබෙනවා. අපේ රටේ යුද්ධයක් තිබුණා. අපි එය ජයග්‍රහණය කළා. රටේ සාමය ඇති කළ හැකි වන්නේ, එම හැඟීම ජනතාවගේ පපුවෙන් ඇති වීමෙන් මිසක් බලහත්කාරයෙන් තල්ලු කිරීමෙන් නොවෙයි. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ කියන සියලු ජාතීන් එකට එකතුව "මේක මගේ රට" කියලා සිතන්න පුළුවන් අවස්ථාව ආවාට පසුව තමයි මේ රටේ සැබෑ සංවර්ධනයක් ඇති වන්නේ; සැබෑ සාමයක් ඇති වන්නේ. මේ රටේ නාස්තිය, දූෂණය නැති කිරීමට අපට අවශ්‍යයි. එය කථාවෙන් විතරක් නොවෙයි, ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වන්න ඕනෑ. එවිට තමයි මේ පුංචි ලංකාව ලෝකයේ සංවර්ධිත රටක් බවට පත් කරන්න පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ ලබා දුන්න සීමිත කාලය මම උපයෝගී කර ගත්තේ මේ පක්ෂ දෙක එකතු වෙලා හදලා තිබෙන ආණ්ඩුවේ වටිනාකම පෙන්වන්නයි. යහ පාලනය තුළින් අපි මේ රට ගෙන ගියාට ජනතාවට මේකේ වටිනාකම තවම දැනිලා නැහැ. විවේචනය කරන්න ලෙහෙසියි. නමුත්, සාරවත්භාවය උරා ගන්න කල් යනවා. අපි මේ ස්ථාපිත කළ සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, මනුස්සත්වය අමතක වෙන්න ඉස්සෙල්ලා මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන්න අවශ්‍යයි. ඒ වාගේම අසාධාරණය නැති කරලා, සාධාරණීකරණයක් ඇති කළ යුතුයි. යහ පාලනය කියන්නේ, නිකම් දේශපාලනය කරන එක නොවෙයි. යහ පාලනය තුළින් මේ පුංචි ලංකාව සංවර්ධනය කරලා, රටේ සාරවත්භාවයක් ඇති කරලා, සියලු ජනතාවට සතුටින් ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් ඇති කළ යුතුයි. එය අපි සියලුදෙනා සතු කාර්ය භාරයක් ලෙස සලකා කටයුතු කරන්න ඕනෑ බව නැවත මතක් කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි කීයක් වෙන්ව තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා.5.33]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භ කරමින් අතිගරු ජනාධිපතිතුමා කරපු කථාව මම හිතන හැටියට අපි සංඝන්දනය කරන්න ඕනෑ එතුමා 2015 සැප්තැම්බර් මාසයේ 01වැනි දා මේ ගරු සභාවට ඇවිල්ලා කරපු ඒ ප්‍රකාශයත් සමඟයි. 2015 සැප්තැම්බර් මාසයේ 01වැනි දා එතුමා ඇවිල්ලා මේ ගරු සභාව අමතා කරපු ප්‍රකාශය තමයි, මේ රටේ අලුත් දේශපාලන පරිවර්තනීය යුගයක පරික්ෂණයේ ආරම්භය වුණේ. එතෙක් මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකට ආණ්ඩු කිරීමක් තිබුණේ නැහැ.

ජනාධිපතිතුමා 2015 සැප්තැම්බර් මාසයේ මේ පාර්ලිමේන්තුව අමතන කොට එතුමාගේ බලාපොරොත්තුව වුණේ මම හිතන හැටියට අවුරුදු දෙකකට පරීක්ෂණයක් හැටියට ප්‍රධාන පක්ෂ දෙක ආරම්භ කරන ඒ ආණ්ඩු කිරීම සාර්ථක භාවයට පත් කර ගන්නට අපි සියලුදෙනාම කටයුතු කරයි කියන එකයි. එම පරමාර්ථය ඇතුව එතුමා 2015 මෙම ගරු සභාව ඇමතුවත්, 2018 මැයි මාසයේ 08වැනි දා මේ ගරු සභාව අමතනකොට එතුමාට කියන්න සිදු වුණා, දේශපාලනික හා සමාජයීය මුහුකුරා ගිය බව අපි තවමත් ඇති කරගන්නට සමත් වී නැති බව. එදා එතුමා කළ කථාව ඇතුළත් පොත් පිංවේ 19වන පිටුවේ 2වන ඡේදය මම උපුටා දක්වනවා. එදා එතුමා මෙසේ කියනවා:

> "2015 දී මවිසින් නායකත්වය දුන් යුග පෙරළිය තවමත් සම්පූර්ණ වී නැත. එදා එය ශ්‍රී ලංකාවට නව අත්දැකීමක් විය. 2015 වසරේ අගෝස්තු මාසයේ සිට ජාතික ආණ්ඩුවක් පිහිටුවීමට කටයුතු කළද ඒ සඳහා අවශ්‍ය දේශපාලනික හා සමාජයීය මුහුකුරා ගිය බව අපි තවමත් ඇති කරගන්නට සමත් වී නැති බව පසුගිය වසර තුන තුළ දී ඇති වූ සිද්ධි දාමයන් මඟින් නැවත නැවතත් සිහිපත් කොට දෙයි..."

"2015දී පරිවර්තනීය යුගයක් මා ආරම්භ කරන්න හැදුවා. 2018 වනකොට ඒ පරිවර්තනීය යුගය තුළ ප්‍රධාන පක්ෂ දෙක එකතුවෙලා ඇති කර ගත් ඒ සම්මුතිවාදී ආණ්ඩුව ඉදිරියට ගෙන යන්නට අවශ්‍ය කරන දේශපාලන වශයෙන් මුහුකුරා ගිය බව, දේශපාලන වශයෙන් ඒ පිළිබඳව තිබෙන අත් දැකීම් සම්භාරය නැතිකම නිසා එය තවදුරටත් සාර්ථක කර ගන්න බැරි වනවා"යි කියන කාරණය තමයි එතුමා කියන්නේ. එය සාර්ථක කර ගන්න බැරි වුණු ඉඟියකුත් එතුමාගේ කථාවේ අවසාන පිටුවේ -20 වන පිටුවේ- 1 වන ඡේදයේ සඳහන් වනවා. නව සැසි වාරය විවෘත කරමින් ජනාධිපතිතුමා 2018.05.08 වන දින කළ කථාවේ 20 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "ජාතික ආණ්ඩුව සැදුමලත් වන්නේ එකිනෙකින් වෙනස් දෘෂ්ටීන්ගෙන් යුතු දේශපාලන පක්ෂවලිනි. එම පක්ෂ ක්‍රියාත්මක විය යුත්තේ බුදුන් වහන්සේ පෙන්වා දුන් පරිදි, වජ්ජීන් මෙන් සමගිය සහ සාකච්ඡාව පෙරදැරිව නම්, වජ්ජීන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සැබෑ ලෙසම අප ද අනුගමනය කළ යුතු වෙමු."

එතුමා කියන්නේ ඒකයි. එතුමා ජනාධිපතිවරයා හැටියට සාකච්ඡාමය ක්‍රියාදාම තුළින් ප්‍රශ්න විසඳා ගන්නට කටයුතු කළා. අනික් සියලුදෙනාම එහෙම කළා නම් අද මේ තත්ත්වය මීට වඩා වෙනස් වන්න පුළුවන් කියන එකයි එතුමාගේ කථාවේදී ප්‍රකාශ කර සිටියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙමළ ජාතික සන්ධානයේ අපේ ආදරණීය මිත්‍ර මන්ත්‍රීවරුන්ගේ කථාවලදී මොකක්ද කිව්වේ? එතුමන්ලා දිගින් දිගටම කියන්නේ, එතුමන්ලා බලාපොරොත්තු වුණු දේ ජනාධිපතිතුමාගේ ප්‍රකාශනය තුළ නැහැයි කියන කාරණයයි. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීතුමන්ලාට මා මේ කාරණය කියන්න ඕනෑ. එතුමන්ලා දන්නවා, ඩිලාන් පෙරේරාගේ දේශපාලනය මොකක්ද කියලා. එතුමන්ලා දන්නවා, එතුමන්ලාගේ ප්‍රශ්න වෙනුවෙන් මා පෙනී සිටින හැටි, ඉතිහාසය පුරා මා පෙනී සිටිය හැටි. මට "සිංහල කොටියා" කියද්දීත් තමුන්නාන්සේලාගේ ප්‍රශ්න වෙනුවෙන් මා පෙනී සිටියාය කියලා, විහාර මහා දේවී පාර්ක් එකේදී මට අතින් පයින් පහර දුන්නා. මා තමුන්නාන්සේලා වෙනුවෙන් පෙනී සිටියා. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීතුමන්ලාට මා කියන්න කැමැතියි, තමුන්නාන්සේලාගේ ප්‍රශ්න වෙනුවෙන් අපි වාගේ උදවිය එහෙම පෙනී සිටියදී, පසුගිය මාස දෙකහමාරක, මාස තුනක කාලය තුළ තමුන්නාන්සේලා ගත්ත සමහර තීන්දු තමුන්නාන්සේලාගේ අවාසියට බලපෑවාය කියලා. පසුගිය මාස දෙකහමාරක, මාස තුනක කාලය තුළ දෙමළ ජාතික සන්ධානය තුළ ක්‍රියාත්මක වුණේ, දෙමළ මිනිසුන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක්ද, එහෙම නැත්නම්, එක්සත් ජාතික පක්ෂයේ පුද්ගලයන් එක්කෙනකුගේ දෙදෙනකුගේ මන දොළ පුරවා ගැනීම සඳහා පෞද්ගලික න්‍යාය පත්‍රයකට අනුව සමහර අය දෙමළ ජාතික සන්ධානය මෙහෙයවීමක්ද? තමුන්නාන්සේලාගෙන් මා ඒ ප්‍රශ්නය අහන්නට ඕනෑ. තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ නායකත්වයෙන් අහන්න ඕනෑ, "අපේ පක්ෂය විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී හැසිරුණේ මේ රටේ දෙමළ ජාතින්ගේ අයිතිවාසිකම් දිනා ගන්නා වූ පක්ෂයක් හැටියටද, එහෙම නැත්නම්, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය මොන මොන වැඩ කළත්, මොන මොන වැඩ නොකළත් එතුමන්ලා ආරක්ෂා කරනවාය කියන පදනමින්ද" කියලා. තමුන්නාන්සේලාගේ පක්ෂයේ ප්‍රතිපත්ති පැත්තකට දමා, මුළු දෙමළ ජාතික සන්ධානයම එක්සත් ජාතික පක්ෂයට යට කරන්න උත්සාහ කරන එක්කෙනකු හෝ දෙදෙනකු තමුන්නාන්සේලාගේ පක්ෂය තුළ ඉන්නවා. ඒ උත්සාහයට දෙමළ ජාතික සන්ධානය හසු වීමේ ප්‍රතිඵලය තමයි අද තමුන්නාන්සේලා භුක්ති විඳින්නේ. පසුගිය මාස කිහිපය තුළ යම්කිසි විධියකින් තමුන්නාන්සේලාගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමේ ප්‍රමාදයක් තිබුණා නම්, ඒ ප්‍රමාදයට මේ පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලුදෙනාම අඩු වැඩි වශයෙන් වග කියනවා වාගේම, තමුන්නාන්සේලාත් ස්වයං විවේචනාත්මකව එයට වග කියන්න ඕනෑ බව ඉතාම ගරුත්වයෙන් සහ මිත්‍රශීලීව තමුන්නාන්සේලාට මා කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍ර මහින්ද සමරසිංහ මැතිතුමා, අද දිගින් දිගටම කියා සිටියේ, කියා සිටින්න උත්සාහ කළේ, සම්මුතිවාදී ආණ්ඩුව තුළ තව දුරටත් රැඳී ඉන්නට තිබෙන කාරණා මොනවාද කියන එකයි. එතුමා සියලු කාරණා කිව්වත්, එක් කාරණයක් අමතක කළා. පක්ෂයක් හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් පත් කරනු ලැබූ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ නායකත්වයෙන් යුත් කම්ටුව ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳව ඇති වූ ප්‍රශ්නයේදී ඉදිරිපත් කළ නිර්දේශ 13ක්ම අගමැතිතුමාට එරෙහිව ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාවේ කරුණු 15 තුළ තිබුණා. අපේ පක්ෂයේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් කම්ටුවෙන් ඉදිරිපත් කළ ඒ නිර්දේශ 13ම මහින්ද සමරසිංහ මැතිතුමාත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් දුමින්ද දිසානායක මැතිතුමාත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම් මහින්ද අමරවීර මැතිතුමාත් ඇතුළු සියලුදෙනාම පිළිගත්තා නම්, ඒ වාගේම ඒ නිර්දේශ 13ම විශ්වාස භංග යෝජනාවේ ඇතුළත් වී තිබුණා නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කොහොමද රෙදි ඇදගෙන ඒ විශ්වාස භංග යෝජනාවට විරුද්ධ වන්නේ?

අපට තිබුණේ හෘදය සාක්ෂියේ දේශපාලනය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා අපට සිද්ධ වුණා, පක්ෂයේ මධ්‍යම කාරක සභාව කරපු නිර්දේශ 13ක්ම තිබෙන්නා වූ එම විශ්වාස භංග යෝජනාවට පක්ෂ වෙන්න. ඒ නිසා අපි එයට පක්ෂ විය යුතුමයි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ඒකට විරුද්ධ වුණා. අද මේ විවාදයේදීත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ස්තුති කළේ, ඇගැයීමකට ලක් කළේ, විශ්වාස භංග යෝජනාවට විරුද්ධ වෙච්ච එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ට වඩා ඊට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය නොදී ගෙදරට වෙලා හිටපු අයටයි. මොකක්ද ඒකට හේතුව? ඒකට හේතුව මේකයි. ඒ අය හිතනවා, අගමැතිතුමා බේරා ගැනීමට කටයුතු කළේ විරුද්ධ වෙච්ච අයට වඩා පක්ෂව හෝ විපක්ෂව ඡන්දය නොදී ගෙදරට වෙලා හිටපු අයයි කියලා. ඇත්තටම බලනවා නම්, අපි 16දෙනා සම්මුතිවාදී ආණ්ඩුවේ ඉඳගෙන විශ්වාස භංග යෝජනාවට පක්ෂ වුණා. තව 23දෙනෙක් විරුද්ධ වුණේ නැහැ, ගෙදරට වෙලා සිටියා. විරුද්ධ වුණු 16දෙනාට වඩා ගෙදරට වෙලා හිටපු 23දෙනා

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

තමුන්නාන්සේලාට ලොකු වෙන්නේ ඇයි? සමහර අය හිතනවා, ඒ 23දෙනාගේ ක්‍රියාදාමය තමයි අගමැතිතුමා ආරක්ෂා කරන්න වැඩියෙන් හේතු වුණේ කියලා. ඒක තමයි අපි දිගින් දිගටම කියන්නේ.

විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කියන්න යෙදුණා, විශ්වාස භංග යෝජනාවෙන් අගමැතිතුමා සුවිශේෂී වූ ජයග්‍රහණයක් ලැබුවා කියලා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මෙතැන ඉන්නවා. එතුමන්ලා අපේ මිත්‍රයෝ. තමුන්නාන්සේලා හඳවතට තට්ටු කරලා ඒ විශ්වාස භංග යෝජනාවට ලැබුණු ඡන්ද ගණන් හදලා බලන්න. කථානායකතුමා අයින් වුණාම මන්ත්‍රීවරු 224යි. එයින් 122ක පිරිසක් විශ්වාස භංග යෝජනාවට විරුද්ධයි. එයිනුත් 16දෙනෙක් ටීඑන්ඒ එකේ. ඒ 16දෙනා අයින් කළාම ඉතිරි වෙන්නේ 106යි. විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්ද ලැබුණේ 76යි. නොපැමිණි 26යි. ඒ දෙක එකතු වුණාම 102යි. ටීඑන්ඒ එකේ ඡන්ද ලැබුණේ නැත්නම් විශ්වාස භංගයට විරුද්ධව ඡන්ද 106යි, පක්ෂව 102යි. ඒ කියන්නේ, එක්සත් ජාතික පක්ෂයෙන් තුන්දෙනෙක් විපක්ෂයට ආවා නම් අපේ ගණන හරි කියන එකයි. ඒ නිසා ටීඑන්ඒ එකේත් සහයෝගය අරගෙන ඒ ගණනත් පෙන්වලා, ගෙදර හිටපු සන්ධානයේ මන්ත්‍රීවරුන්ගේ ගණනත් පෙන්වමින් වැඩි උද්දාමයට පත් වෙන්න එපා. මොකද, ඒක උඩ බලාගෙන කෙළ ගසා ගැනීමක් වන නිසා. අපේ යෝජනාව වුණේ මෙයයි. ගණන් පෙන්වලා හෝ අපේ 23දෙනෙක් ගෙදර තියලා හෝ, ටීඑන්ඒ එක තමන්ගේ ජනතාවගේ අයිතිවාසිකම් පැත්තකට දාලා රනිල් වික්‍රමසිංහ මහත්මයා ආරක්ෂා කර ගැනීමට ඒ පක්ෂය මෙහෙයවන අයට මෙහෙයවන්න දීලා තමුන්නාන්සේලාත් එක්ක හිටගත්ත නිසා හෝ තමුන්නාන්සේලා දිනුම්නේ. අපි කියන්නේ, දිනුම් නම් ඇයි තවදුරටත් සම්මුතියක්? දැන් තමුන්නාන්සේලාට බලය තිබෙනවා. ටීඑන්ඒ එකේ මන්ත්‍රීවරුත් එක්ක 122ක් ඉන්නවා. එහෙම නම් තනියම ආණ්ඩු කරන්න බලය ගන්න කියලායි අපි කියන්නේ. එහෙම බලයක් තිබෙනවා නම්, යූඑන්පී මන්ත්‍රීවරුන්ගෙන්ම කැබිනට් මණ්ඩලයක් හදාගෙන ආණ්ඩුව කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරු 225දෙනෙක් ජනතාව විසින් පාර්ලිමේන්තුවට තෝරා එවා තිබෙන්නේ හෘදය සාක්ෂියට එකඟව දේශපාලනය කරන්නයි. හෘදය සාක්ෂියට විරුද්ධව දේශපාලනය කරනවා නම්, ඔවුන්ට ජනතාවගෙන් සමාවක් ලැබෙන්නේ නැහැ.

විශ්වාස භංග යෝජනාවට පක්ෂ වෙච්ච අය හෘදය සාක්ෂියට එකඟව ඡන්දය දුන්නා වාගේම, විරුද්ධව ඡන්දය දුන් අයත් ඒකට ඡන්දය දෙන්න ඇත්තේ හෘදය සාක්ෂියට එකඟවයි. පක්ෂව හෝ විරුද්ධව ඡන්දය දෙන්නේ නැතිව ගෙදරට වෙලා හිටපු අයත්, ගෙදර ඉඳගෙන ටීවී එක බලාගෙන ඉන්න ඇත්තේත් තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව වෙන්න ඇති. කෙසේ වෙතත්, අවසානයේ මේ විශ්වාස භංග යෝජනාව හරහා අපි ජනතාවට දුන් පණිවුඩයක් තිබුණා. ඒක තමයි ජනාධිපතිතුමා මේ ප්‍රකාශනයෙන් කියන්නේ. එතුමා මේ ප්‍රකාශනයෙන් කරුණු 16ක් කියනවා. සම්මුතිවාදී ආණ්ඩුවෙන් එළියට ආපු අපේ 16දෙනාගේ ක්‍රියාමාර්ගය හරියි කියනවා වාගේ දෙයක් තමයි ඒ කරුණු 16න්ම කියන්නේ.

මෙහි 13වැනි පිටුවේ එතුමා පැහැදිලිව මෙසේ කියා තිබෙනවා:

"සමස්ත ශ්‍රී ලංකාව අද දිනයේ ඉල්ලා සිටින්නේ සෞභාග්‍යයේ නිදහස අත්පත් කර ගැනීමයි. අල්ලසට, දූෂණයට, නාස්තියට එරෙහි වීමේ ජාතියක අනාගතය සඳහා වූ ආත්මාරක්ෂාවයි."

ඒක පළමුවැනි කාරණය. එතුමා කියනවා, "මේ ඉදිරි අවුරුදු එකහමාරේවත් අපි අල්ලසට, දූෂණයට, නාස්තියට එරෙහි වෙමු" කියලා. ඊළඟට, එතුමා සඳහන් කරන කරුණු 15ක් මෙහි 14 සහ 15වැනි පිටුවල සඳහන් වෙනවා. කලින් කියාපු කාරණාවත් එක්ක කරුණු 16යි. කරුණු 16ක් ඉස්මත්තට අරගෙන කියනවා, "අපි ඉස්සරහට යන්න ඕනෑ මෙන්න මේ කරුණු 16 මතයි" කියලා. හරියටම සම්මුතිවාදී ආණ්ඩුවේ ඉඳලා එළියට ආපු 16දෙනා මැයි 08වැනිදා පටන් ගත් අරගළයෙන් ඉදිරිපත් කරන කරණුවලට සමාන කරුණු සංඛ්‍යාවක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මැයි 08වැනිදා 16දෙනෙකු ආණ්ඩුවෙන් එළියට එනවා. අපි 16දෙනා එළියට එන්නෙත් මේ කරුණු 16 නිසාම තමයි. එතුමා මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ කියන්නෙත් ඒ කරුණු 16 ගැනම තමයි. මොකද, ඒ කරුණු 16 තවම ඉෂ්ට වෙලා නැති නිසා.

අද ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මැතිතුමා මේ සභාවේ විශාල අසත්‍යයක් ප්‍රකාශයක් කළා. එතුමා කිව්වා, "මේ රටේ ජාතික සහජීවනය ඇති කිරීම සඳහා, මේ රටේ ප්‍රධාන ප්‍රශ්නය විසඳීම සඳහා අලුත් ව්‍යවස්ථාවක හෝ ව්‍යවස්ථා සංශෝධනයක වුවමනාවක් තිබෙනවා; ඒ සඳහා පත් කළ මෙහෙයුම් කමිටු නිකරුණේ පත් කරලා වැඩක් නැහැ; ඒ ගැන නායකත්වය උනන්දු වෙන්නට ඕනෑයි" කියා. දෙයියනේ! ජයම්පති වික්‍රමරත්න මහත්මයා කොහෙද හිටියේ? එතුමා ගෙදර බුදියාගෙන හිටියාද? ඒ පත් කළ මෙහෙයුම් කමිටුව - Steering Committee- මාස ගණනක් රැස්වෙලා, උප කමිටු හදාගෙන කටයුතු කළා. ඊළඟට, ඒවා රැස්වෙලා සාකච්ඡා කරලා, ඒවායේ වාර්තා මෙහෙට ගෙනැල්ලා, සාකච්ඡා කරලා, විවාද කරලා, ප්‍රශ්න මතු වුණාම ජනාධිපතිතුමාත් මැදිහත් වෙලා කටයුතු කරන කොට එතුමා කොහෙද හිටියේ? නැහැ, එතුමාට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. එතුමාට තිබෙන ප්‍රශ්නය එතුමාගේ හිතේ තිබුණු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බැරි වීමයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන කොට ආණ්ඩුවේ හිටියේ යූඑන්පී එකේ අය 44දෙනායි. 160දෙනකු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අයයි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පැය 72ක් මේ පාර්ලිමේන්තුව තුළ සිටිමින් අර 44දෙනාට, 160දෙනා එකතු කරපු නිසා තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගන්න අපට පුළුවන් වුණේ. හැබැයි, ජයම්පති වික්‍රමරත්න මහත්මයාගේ ඔළුවේ තිබුණේ ඒක නොවෙයි. සම්මත වුණු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන නොවෙයි, ඔළුවේ තිබුණේ. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය සම්පූර්ණ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනයි එතුමාගේ ඔළුවේ තිබුණේ. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එහෙම පිටින්ම ගෙනෙන්න දුන්නේ නැහැ. කැල්ලයි ගෙනෙන්න දුන්නේ. ඉතිරි කැල්ලත් ගෙනෙනවා නම් ජනමත විචාරණයක් ඕනෑයි කිව්වා. ඒ ඉතිරි කැල්ලත් ගෙනාවා නම් අද තත්ත්වය කොහොම වේවිද? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් නැතිව කොටසක් පමණක් සම්මත කරලායි අද මේ තත්ත්වය තිබෙන්නේ. එම සංශෝධනයට අනුව අගමැතිතුමාගේ ධුරය හිස් වෙන්න නම්, එක්කෝ එතුමා ඉල්ලා අස් වෙන්න ඕනෑ; එහෙම නැත්නම් එතුමා මිය යන්න ඕනෑ. නැත්නම් එතුමාව කිසිම විධියකින් ඉවත් කරන්න බැහැ. ජනාධිපතිතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනෙන්න පුළුවන්.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ තිබුණු විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කළේ, විධායක ජනාධිපතිකම තනි බලයක් සහිත එකක් නිසයි. හැබැයි, ඒ තනි බලයක් සහිත එකත් දෝෂාභියෝගයකින් පරද්දන්න පුළුවන්. හැබැයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ මේ තිබෙන ව්‍යවස්ථාව අනුව අගමැතිතුමාව විශ්වාස භංගයකිනුත් ඉළඟවන්න බැහැ කියලායි, අගමැතිතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාව

உரிய இளைஞர்களுக்குக் கடன் வழங்கும்போது, இது கடன் என ஆலோசனை வழங்கப்பட்டதோடு, கடன் விண்ணப்பப்படிவம் இரண்டு பிணைதாரர்களின் பிணை களுடன் மேற்கொள்ளப்பட்டுள்ளன. வங்கி நிதி, கடன் வழங்குவதற்காகப் பயன்படுத்தப்பட்டதால் கடனைச் செலுத்தத் தவறியவர்களுக்காகச் சட்ட நடவடிக்கை மேற்கொள்ள வங்கி அதன் சட்டதிட்டங்களுக்கேற்ப நடவடிக்கை மேற்கொள்கின்றது. எவ்வாறாயினும் வறுமை மற்றும் குடும்பப் பொருளாதாரப் பற்றாக்குறைகள் காரணமாகக் கடனைச் செலுத்த முடியாத வட மாகாண நபர்களுக்காக, அரசு தலையிட்டு நிவாரணம் வழங்க எனது அமைச்சின்மூலம் தற்போது வேலைத்திட்டங்கள் அமுல்படுத்தப்படுகின்றன. இது தொடர்பாகப் பொதுத் திறைசேரியுடன் கலந்தாலோசித்துப் புனர்வாழ்வு பெற்று சமூகமயப்படுத்தப்பட்ட இளைஞர்களின் கடன் தொடர்பான பிரச்சினைகளைத் தீர்க்க உடனடியாக நடவடிக்கை எடுக்கப்படும் என்று தெரிவிக்கின்றேன்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)

(The Hon. Douglas Devananda)

இது அவர்களுக்கு நெருக்கடி கொடுப்பதுபோன்ற ஒரு நடவடிக்கையாதலால், தயவுசெய்து அதனை இடைநிறுத்தி, அது பற்றி நீங்கள் ஆராய்ந்த பிறகு உரிய நடவடிக்கை எடுக்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)

(The Hon. D.M. Swaminathan)

வங்கியொன்று சட்டத்தரணியின் ஊடாக அந்தக் கடிதத்தை அனுப்பியிருக்கிறது. அதற்கேற்ற நடவடிக்கையை உடனடி யாக நான் எடுப்பேன்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)

(The Hon. Douglas Devananda)

ஆரம்பத்தில் அரசியல் காரணங்களுக்காகச் சொல்லப் பட்டது, மானிய அடிப்படையில்தான் அந்தக் கடன் கொடுக்கப்படுவதாக. ஆகவே, தயவுசெய்து அமைச்சர் அவர்கள் இந்த விடயத்தை ஆராய்ந்து பார்க்க வேண்டும்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)

(The Hon. D.M. Swaminathan)

என்றாலும், இரண்டு பேர் அதற்குப் பிணை வழங்க வேண்டிய சந்தர்ப்ப சூழ்நிலை இருந்தது என்பது கடன் எடுத்தவர்களுக்குத் தெரியும். அதன் மூலமாகத்தான் அவர்கள் கடனைப் பெற்றார்கள். அதை நான் முழுமையாக ஏற்றுக் கொள்கின்றேன். அவர்களுக்கு என்னால் செய்ய முடியுமான கடமைகளை நான் செய்துவருகின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඊළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේ දී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම.

න්‍යාය පත්‍රයේ අංක 1 යටතේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත අද දිනයේ පිළිගන්වන්නේ නැති බවට මම දැනුවත් වෙලා තිබෙනවා. Hon. Chief Government Whip, do you want to inform that to the House?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අද දිනයේ එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අංක 2 යටතේ සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

I

කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත
கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலம்
SHOP AND OFFICE EMPLOYEES (REGULATION OF EMPLOYMENT AND REMUNERATION) (AMENDMENT) BILL

"(129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මැයි මස 22වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரின் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.
2018 மே 22, செவ்வாய்க்கிழமை, இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka, on behalf of the Minister of Labour and Trade Union Relations; to be read a Second time upon Tuesday, 22nd May, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

II

සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත
மகப்பேற்று நன்மைகள் (திருத்தம்) சட்டமூலம்
MATERNITY BENEFITS (AMENDMENT) BILL

"(140 වන අධිකාරය වූ) සූතිකාධාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මැයි මස 22වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரின் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.
2018 மே 22, செவ்வாய்க்கிழமை, இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka, on behalf of the Minister of Labour and Trade Union Relations; to be read a Second time upon Tuesday, 22nd May, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, යෝජනා පිළිබඳ දැනුම් දීම, පාර්ලිමේන්තුවේ සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That the Government Business shall have precedence this day."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනි වර කියවීම.

සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත

குடியியல் வான்செலவு (திருத்தம்) சட்டமூலம்

CIVIL AVIATION (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා.10.47]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

පළමුවෙන්ම, මම මෙහි පසුබිම පිළිබඳව මෙම ගරු සභාවට විස්තරයක් කරන්න කැමතියි. ඔබතුමා දන්නවා, ලංකාවේ තිබෙන ගුවන් තොටුපොළවල් පාලනය කළ යුතු වන්නේ සිවිල් ගුවන් සේවා පනතේ විධිවිධානයන් අනුවයි කියලා. මෙම සිවිල් ගුවන් සේවා පනත ක්‍රියාත්මක කර, එහි කටයුතු කරගෙන යන අතරතුර දී අපට මුහුණ පෑමට සිදු වූ විවිධ ගැටලු හා ප්‍රශ්න පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් පසු ඒ සඳහා පිළියම් සෙවීමට කරන එක් සංශෝධනයක් වශයෙන් තමයි මෙම සංශෝධනය අපි ගෙන එන්නේ. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, ඒ වාගේම මත්තල ගුවන් තොටුපොළ කියන මෙම ප්‍රධාන ගුවන් තොටුපොළවල් දෙක ගත්තොත්, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් **තොටුපොළට** මඟින් **විශාල** සංඛ්‍යාවක් පැමිණෙනවා. මඟින්ගේ පැමිණීම පසුගිය කාලය තුළ ඉතාම වැඩි වෙලා තිබෙනවා. 2015දී මිලියන 8.5ක් පමණ, 2016දී මිලියන 9.4ක් පමණ, 2017දී මිලියන 9.9ක් පමණ - ඒ කියන්නේ, මිලියන 10ක් පමණ- මඟින් පැමිණිලා තිබෙනවා.

මාස තුනක් අපේ ගුවන් ගමන් පථය වසා තැබීම නිසා පැමිණෙන ගුවන් යානා ප්‍රමාණය අඩු වුණත්, 2017දී මිලියන 9.919ක පමණ මගීන් පිරිසක් අපේ රටට පැමිණිලා තිබෙනවා. මේ නිසාම අපේ ගුවන් තොටුපොළ තුළ විශාල තදබදයකුත් ඇතිවෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් ගන්නා පියවර ගැන මම පසුව කියන්නම්. ඒ වාගේම ගුවන් මඟින් ගෙන එනු ලබන භාණ්ඩ ප්‍රමාණය 2015ට වඩා සියයට 12කින් 2016දීත්, 2016ට වඩා සියයට 11කින් 2017දීත් වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා ගුවන් ගමන් -Aircraft movement- ප්‍රමාණයත් සියයට 10.6කින් පමණ වැඩිවෙලා තිබෙන බව අපට පෙනෙනවා. මේ නිසා දැනට කටුනායක ගුවන් තොටුපොළේ යම් ආකාරයක තදබදයක් තිබෙනවා. මේ තදබදය සඳහා තිරසාර විසඳුමක් වශයෙන් අපි ජපානයේ ජයිකා ආයතනයෙන් second terminal ගොඩනැඟිල්ල සඳහා මුදල් ලබාගෙන අවශ්‍ය වැඩ කටයුතු කරගෙන ගියා, ගරු කථානායකතුමනි. නමුත් අපට ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ජපන් කොන්ත්‍රාත්කරුවන් විසින් අප වෙත ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත් මිල ගණන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 45ක් වැඩි වුණා. ඒකට ඉඩ දෙන්න අපට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ හේතුව නිසා අපේ රජයේ තිබෙන පාරදෘශ්‍යභාවය ප්‍රදර්ශනය කරමින්, එවැනි දෙයක් කරන්නේ නැතිව ඒ ටෙන්ඩරය cancel කරන්න සිද්ධ වුණා. දැන් අපි නැවත ඒ ටෙන්ඩරය කැඳවනවා. නමුත් ඒ terminal එක හදලා අවසන් වනතුරු අපට අවුරුදු හතරක්, පහක් බලාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. එයට තාවකාලික solution එකක් වශයෙන් අපි temporary terminal එකක් හදන්න කටයුතු කරනවා. තාවකාලික terminals ලෝකයේ බොහෝ ගුවන් තොටුපොළවල හදලා තිබෙනවා.

මම විශේෂ තාක්ෂණික කණ්ඩායමක් යවලා, ඒ ගුවන් තොටුපොළවල් පරීක්ෂා කරලා මාස හයක් ඇතුළතදී temporary terminal එකක් හදන්න -ස්ථිර එක හදනතෙක්- දැන් වැඩ කටයුතු කරගෙන යනවා. ඊට අවශ්‍ය ටෙන්ඩර් පටිපාටිය අපි ක්‍රියාත්මක කර තිබෙනවා. ජූනි මාසයේ 12 වැනි දා අපි ඒ ටෙන්ඩරය වහනවා. මේ අවුරුද්ද අග වෙනකොට ඒ temporary terminal එක හදලා මේ තිබෙන තදබදයට පිළිතුරු සපයන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

හැබැයි, මේ පහසුකම්වලින් ප්‍රයෝජනය ගන්නා විවිධ පිරිස් ඉන්නවා, ගරු කථානායකතුමනි. ගුවන් ටිකට් පතක් තිබෙන මගියෙකුට airport එකට ඇතුළු වෙන්න පුළුවන් බව ඔබතුමාත් දන්නවා. පිටරට ඉඳලා මගීන් එනවා නම්, ඔවුන්ගේ ඥාතීන්ට ටිකට් එකක් අරගෙන ගුවන් තොටුපොළට ඇතුළු වෙන්න පුළුවන්. මේ මුවාවෙන් තැරැව්කරුවන් විශාල පිරිසක් ගුවන් තොටුපොළට ඇතුළු වෙනවා. අපට මේක නවත්වන්න බැහැ. මොකද, ඒක ඒ අයගේ අයිතියක්. තමන්ගේ ඥාතියෙක් එනවා නම්, "මගේ ඥාතියෙක් එනවා" කියලා රුපියල් 100ක ටිකට් පතක් අරගෙන ඇතුළු වෙනවා. සමහරු එසේ ඇතුළු වෙලා, විවිධ තැරැව්කාර වැඩ කරනවා. කවුරු හරි පිටරට ඉඳලා එනකොට බලෙන්ම ඇවිල්ලා ඒ කෙනාගේ බෑග් එක අරගෙන ගිහින් ටැක්සියකට දමනවා; ඒ කෙනා ටැක්සියට නංවා ගන්නවා; මුදල් change කරලා දෙන්න කථා කරනවා. ඒ වාගේ දේවල් කරනවා. මේ තත්ත්වය ගුවන් තොටුපොළේ පරිපාලනයට විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, එසේ සංවිධානාත්මක වූ විශාල පිරිසක් ගුවන් තොටුපොළ එක්තරා ආකාරයකින් ආක්‍රමණය කරලා තිබෙන නිසා. මේ අය නවත්වන්න පුළුවන් කොහොමද? අපට මේ සඳහා අවශ්‍ය නීතියක් හරියාකාරව නැහැ. යම් පුද්ගලයෙක් ඒ විධියට නිදැල්ලේ යම් තැනක ගැවසෙනවා නම් පාදඩ ආඥාපනතට අනුව ඔහු අල්ලාගෙන අධිකරණයට ඉදිරිපත් කරන්න පොලීසියට පුළුවන්. නමුත් රුපියල් 500 තමයි ඒ කෙනෙකුට පනවන වැඩිම දඩය.

ඒ දඩය අය කිරීමෙන් පමණක් ඒ කටයුත්ත නතර වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේ පිළිබඳව විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කිරීම සඳහා මම ගුවන් තොටුපළ පොලිස් ස්ථානාධිපතිතුමාගෙන් වාර්තාවක් ඉල්ලුවා. ඒ තමයි, 2015.01.01 සිට 2018.05.10 දක්වා ගුවන් තොටුපළවල් තුළ නිදැල්ලේ රැඳී සිටීමේ වරදට අත්අඩංගුවට ගන්නා ලද තැනැත්තන්ගෙන් පෙර වැරදි 50කට වැඩි අයගේ සංඛ්‍යාව ඇතුළත් වාර්තාව. ඔප්පු කරන්න ගියොත් ඒ අයගේ වැරදි 100 ගණනක් එනවා. මේ අය 50 වතාවකට වඩා ඒ වැරැද්ද කර තිබෙනවා. ඒ අය එතැනට එනවා, දඩය ගෙවනවා යනවා; එනවා, දඩය ගෙවනවා යනවා. අනූ වුණාම රුපියල් පන්සියයේ දඩය ගෙවනවා. පසුව දා ආපහු එතැනට එනවා. ගරු කථානායකතුමනි, පොලිස් ස්ථානාධිපතිතුමා මා වෙත ලබා දුන් නාම ලේඛනය ඇතුළත් වාර්තාව මම **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමනි, පොලිස් ස්ථානාධිපතිතුමා එම වාර්තාවේ වැඩි දුරටත් මෙසේ කියා තිබෙනවා. මම එය උපුටා දක්වනවා:

"ඉහත නාම ලේඛනයේ නම් සඳහන් තැනැත්තන් නිරන්තරයෙන් ගුවන් තොටුපළ වෙත පැමිණ, ගුවන් තොටුපළ වෙත පැමිණෙන මගීන් වෙත ගොස් කුලී ගමන් සොයා ගැනීමත්, මගීන්ගේ බඩු බාහිරාදිය ඔවුන්ගේ ආරාධනයකින් තොරවම වාහන වෙත පටවා මුදල් ඉල්ලීමත් සිදු කරනු ලබයි. ඇතැම් අවස්ථාවල මෙම තැනැත්තන් විසින් ගුවන් තොටුපළ තුළදී විවිධ අපරාධ සිදු කළ බවටද පොලිස් ස්ථානය වෙත වාර්තා විය. ඒ අනුව මෙම ක්‍රියා පාලනය කිරීම සඳහා මෙම තැනැත්තන් නිරන්තරයෙන් අත් අඩංගුවට ගෙන පාඳඩ ආඥා පනතේ 03 (1)අ වගන්තිය යටතේ නඩු පවරනු ලබයි. එහිදී මෙම තැනැත්තන් හට රුපියල් 1,500ක රජයේ ගාස්තුවක් නියම කරනු ලබයි. එහෙත් මෙම අය නැවත නැවතත් ගුවන් තොටුපළ වෙත නිරන්තරයෙන් පැමිණීම සිදු කරයි. මොවුන්ට ඇති පෙර වැරදි සම්බන්ධයෙන් වුවද නීතිමය ප්‍රතිපාදන යටතේ ඉදිරි පියවර ගැනීමද අසීරු කරුණකි."

රුපියල් 1,500 කියන්නේ, වැඩිම ගාස්තුව. මහෙස්ත්‍රාත්තුමා රුපියල් 1,500ක රජයේ ගාස්තුවම නියම කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

පෙර වැරැදි තිබෙනවා නම් සාමාන්‍යයෙන් වෙනත් වැරැදි සඳහා ගත යුතු විශේෂ පියවර තිබෙනවා. නමුත් පාඳඩ ආඥා පනත යටතේ එවැනි පියවරක් ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සකස් කරලා නැහැ. ඒ නිසා අපි කල්පනා කළා, මෙය නවත්වන්න පුළුවන් කොහොමද කියලා. එසේ නැවැත්වීමට නම් විශේෂ නීතියක් සිවිල් ගුවන් සේවා පනත යටතේ ගෙනෙන්න ඕනෑ. ඒ නිසා තමයි සිවිල් ගුවන් සේවා පනතේ 18 වන වගන්තිය සංශෝධනය කරලා "18අ." වශයෙන් වගන්තියක් ඇතුළත් කරන්න අපි බලාපොරොත්තු වන්නේ. "18අ." වශයෙන් ඇතුළත් කරන වගන්තිය මෙසේයි:

"18අ.(1) ගගන යාත්‍රාංගනය තුළ රැඳී සිටීම සඳහා යථා පරිදි බලය පැවරීමක් නොමැතිව එකී පරිශ්‍රය ඇතුළත රැඳී සිටීමින් පැමිණෙන හෝ පිටව යන යම් ගුවන් මගියකුට තැරැව් කිරීමෙහි නියුතුව සිටින බවට 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සේවා සැපයුම්කරුවකුගේ ගුවන් සේවා ආරක්ෂක සේවා සපයන සේවා නියුක්තයකු විසින් හෝ රාජකාරියෙහි යෙදී සිටින පොලිස් නිලධරයකු විසින් සොයාගනු ලබන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, අවස්ථාවෝචිත පරිදි, එම තැනැත්තාව, පොලිස් නිලධරයා විසින් සිරභාරයට ගැනීම හෝ සේවා සැපයුම්කරුගේ ගුවන් සේවා ආරක්ෂක සේවා සපයන සේවා නියුක්තයකු විසින් අල්ලා පොලිස් නිලධරයකුට බාරදීම හෝ කරනු ලැබිය හැකි ය:"

ඒ අය අල්ලා පොලීසියට භාර දෙන්න අපි බලය දෙනවා.

තවදුරටත් එහි මෙසේ ඇතුළත් වනවා:

"එසේ වුව ද, පැමිණෙන හෝ පිටව යන යම් ගුවන් මගියකුට, එම ගුවන් මගියාගේ පවුලේ යම් සාමාජිකයකු විසින් හෝ මිතුරකු විසින් නැතහොත් තත්කාර්ය සඳහා සේවා සැපයුම්කරුවකු විසින් බලය පවරා ඇති ආගන්තුක සත්කාර ව්‍යාපාරයේ ආගන්තුක සත්කාර සේවා සහායකයකු හෝ නියෝජිතයකු හෝ අනුයෝජිතයකු විසින් ප්‍රවාහන පහසුකම් සැපයීම, නැවතීමේ පහසුකම් සැපයීම හෝ ගමන් මලු හෝ භාණ්ඩ යම් වාහනයකට පැටවීම හෝ ඉන් බැම වැනි යම් සේවා සැපයීමක් මගින් වරදක් සංයුක්ත නොවන්නේ ය."

එහෙම නැතිව ඒ අයගේ ආරාධනයක් අනුව ඥාතියකු හෝ මිතුරකු ඇවිල්ලා ඒ අයට උදව් වෙනවා නම්, ඔවුන් මේ වරදට හසු වෙන්නේ නැහැ. මේ වරදට හසු වෙන්නේ ආරාධනයක් නැතුව බලහත්කාරයෙන් හෝ යම් ආකාරයක බලපෑමක් කරමින් එවැනි වැඩ කටයුතු කරන පිටස්තර පුද්ගලයන් පමණයි.

ඊළඟට, මෙම පනත් කෙටුම්පතේ 18අ. (3) යටතේ මෙසේ සඳහන් වනවා:

"(3) 107 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකුට එරහිව නඩු කටයුත්තක් ආරම්භ කරනු ලැබිය හැකි අතර, එම තැනැත්තා වරදකරු කිරීමේ දී රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය."

"බන්ධනාගාරගත කිරීම" කියන වචන අපි මෙම වගන්තියට ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම දඩය රුපියල් විසිපන් දහස දක්වා වැඩි කිරීමටත් යෝජනා කරලා තිබෙනවා. ඒ තුළින් ගුවන් මඟින් සම්බන්ධයෙන් තැරැව්කරුවන් එවැනි ආකාරයට කටයුතු කිරීම වළක්වා ගැනීමට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. මොකද, නීතිය තුළින් තමයි අපට මේ කාර්ය කළ හැක්කේ. එම නිසා මෙම සංශෝධනය -amendment එක- තුළින් පොලීසියට බලය දීලා, එවැනි ආකාරයෙන් කටයුතු කරන තැරැව්කරුවන් එම ප්‍රදේශයේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කිරීම තුළින් මේ නීති විරෝධී ක්‍රියාවන් අඩු කර ගන්නට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. අපට කිසිම දෙයක් සියයට 100ක්ම සාර්ථක කරගන්න පුළුවන්කමක් නැහැ. නමුත්, මෙම නීති විරෝධී ක්‍රියාවන් සියයට 80ක්, 90ක් පමණ ප්‍රමාණයකින් අඩු කර ගැනීමට අපට පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, ඒ නිසා මෙම සංශෝධනයට විශේෂයෙන්ම ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය මම බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි. අද වන විට රත්මලාන ගුවන් තොටුපොළේ විශාල කොටසක් ගුවන් හමුදාව -Air Force එක- විසින් පරිහරණය කරනවා. ඒ නිසා රත්මලාන ගුවන් තොටුපොළ වැඩිදියුණු කිරීම අපහසු වෙලා තිබෙනවා. නමුත්, අපි ගුවන් හමුදාව සමඟ දීර්ඝ සාකච්ඡා වාර ගණනාවක් පැවැත්වීමෙන් පසුව අක්කර 25ක පමණ ප්‍රමාණයක් මුදා හැරීමට දැන් ඔවුන් එකඟ වෙලා තිබෙනවා. ඒ අනුව, ඔවුන්ට අවශ්‍ය අංගනයන් සාදා ගැනීම සඳහා ගුවන් සේවා අධිකාරියේ මුදල්වලින් රුපියල් මිලියන 725කට වැඩි මුදලක් Air Force එකට ගෙවනවා. ඔවුන්ගේ තිබෙන hangers වෙනත් තැනකට ගෙන ගොස් private jetsවලට එන්න ඉඩ පහසුකම් සැලසීම, Flying Schools වාගේ වෙනත් කාර්යයන් සඳහා ඉඩ පහසුකම් සැලසීම ඇතුළු ගුවන් තොටුපොළේ කරන රාජකාරි කටයුතු වැඩිදියුණු කිරීමට කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් දැන් මඩකලපුව ගුවන් තොටුපොළ අපි ඉතාම උසස් අන්දමින් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම මඩකලපුව, ත්‍රිකුණාමලය, පලාලි සඳහා දිනපතා ගුවන් සේවා ලබා දීම සඳහා අවශ්‍ය පසුබිම අපි සකස් කරලා තිබෙනවා. රත්මලානේ කරන මේ දියුණුවත් සමඟම අපට එම වැඩ කටයුතු වඩාත් සාර්ථකව ඉටු කර ගැනීමට පුළුවන් වෙයි කියා බලාපොරොත්තු වෙනවා.

දැන් අපේ ගුවන් මඟීන්ගේ පැමිණීම වැඩි වෙමින් තිබෙන නිසා ඉතා ඉක්මනින් දෙවන ධාවන පථයක් සකස් කිරීම පිළිබඳවත් අපේ අදහසක් තිබෙනවා. නමුත්, පුළුවන් තරම් දුරට එයින් ජනතාවට සිදු වන හානිය අවම වන අයුරින් සකස් කළ යුතු නිසා ඒ පිළිබඳව අපි විවිධ අධ්‍යයනයන්හි යෙදී සිටිනවා.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දෙවන ධාවන පථය කුමන ප්‍රදේශයකින් ආරම්භ කළ යුතුද කියන කාරණය පිළිබඳව පුළුල් සාකච්ඡා පවත්වලා, ඒ සඳහා ජනතාවගේ අදහසුත් අරගෙන කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ පිළිබඳව එච්චරම හදිස්සියක් නැහැ. නමුත් බණ්ඩාරනායක ගුවන් තොටුපොළේ අවුරුදු විස්සකින් ප්‍රතිසංස්කරණය නොකළ ධාවන පථය මාස තුනකදී

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ප්‍රතිසංස්කරණය කරන්න අපිට පුළුවන් වුණා. ඒ නිසා අපිට ඒ ධාවන පථයෙන් තවත් හුඟක් ප්‍රයෝජන ලබා ගැනීමට පුළුවන්කම තිබෙනවා. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයේ දියුණුවත් සමඟ මේ ගුවන් තොටුපොළවලට තිබෙන ඉල්ලුම ඉතා වැඩි වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. මම මේ අමාත්‍යාංශය භාරගත්තාට පසුව ගුවන් තොටුපොළවල ආදායම අපි ඉතා විශාල ප්‍රමාණයකින් වැඩි කර තිබෙනවා. ඉතාම පාරදෘශ්‍යභාවයකින් යුතුව, tender procedures අනුව අපි මේ වැඩකටයුතු කරලා ලැබිය යුතු ආදායම් ප්‍රමාණය අතිවිශාල වශයෙන් වැඩි කර තිබෙනවා. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, 2015දී අපේ aeronautical income එක වුණේ බිලියන 3.7ක් පමණ බව. 2016දී අපි එය බිලියන 4.3ක් දක්වා වැඩි කළා. 2017දී එය බිලියන 4.6 දක්වා වැඩි කළා. ඒ වාගේම non-aeronautical income එක 2015දී බිලියන 11 යි; 2016දී බිලියන 13යි; 2017දී බිලියන 15.8යි. අනික් financial income ගත්තත් ඒ විධියයි.

මේ විධියට බලනකොට 2015 වර්ෂයේදී අපේ Airport & Aviation Services (Sri Lanka) Limited එකේ සම්පූර්ණ ලාභය ලෙස තිබුණේ, මිලියන 816.8 යි. 2016 වර්ෂය වෙනකොට අපි පාරදෘශ්‍යභාවයකින් duty free shops දුන්නා. ඉස්සර කළේ, සියයට 24ක turnover එකක් ගන්න, duty free shops කැඳවලා දීමයි. මම ඒ ටික ඔක්කොම ටෙන්ඩර් කළා. දැන් සියයට 43ක් duty free shopsවලින් ලැබෙනවා. ඒ අනුව 2016 වර්ෂයේදී එහි ආදායම බිලියන 6.9ක් බවට පත් කර ගන්න පුළුවන් වුණා. 2017 වර්ෂයේදී අපේ profit එක බිලියන 10.3යි. එම නිසා අපි Airport & Aviation Services (Sri Lanka) Limited එක රජයට ආදායම් ලබා දෙන, ජනතාවට හෝ රජයට බරක් නොවන ආයතනයක් බවට පත් කර ගෙන තිබෙනවා. මේ ආකාරයෙන් ඉතාම සකසුරුවම්න් යුතුව පාලනය කර අවශ්‍ය ලාභ අපි ලබා ගත් නිසා, සේවක සුබසාධනය වෙනුවෙන් ගිය වර ලක්ෂයකට ආසන්න bonus එකකුත් දෙන්න අපිට පුළුවන් වුණා.

ගරු කථානායකතුමනි, ඉදිරි කාලය තුළදීත් මේ ක්ෂේත්‍රයේ දියුණුව සඳහා තවත් වැඩ කටයුතු රාශියක් ඉටු කරන බව කියන්න කැමතියි. එබැවින් මේ පනත් කෙටුම්පත සම්මත කරගන්න සියලුම මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලමින්, මගේ මූලික කරුණු ඉදිරිපත් කිරීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එඩුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඊළඟට බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

[ප.භා. 11.05]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, දෙවන වර කියවීම සඳහා අද දිනයේ ඉදිරිපත් කර තිබෙන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධ විවාදයේදී කරුණු කීපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. මගේ කථාව ආරම්භයේදීම කියන්න යන මේ කරුණ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ඇමතිවරයාට සෘජුවම සම්බන්ධ නැති වුණත්, මේ කරුණ ප්‍රවාහනයට බලපාන නිසා මුලින්ම මේ සම්බන්ධයෙන් කථා කරන්න ඕනෑය කියා මා හිතුවා. මා පසුව මෙම පනත් කෙටුම්පත ගැන කථා කරනවා.

ගරු කථානායකතුමනි, ඊයේ ආණ්ඩුවෙන් ඉන්ධන මිල වැඩි කළ බව ඔබතුමාත් දන්නවා ඇති. ආණ්ඩුව ඒ සම්බන්ධව තර්කයක් වශයෙන් ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩිවීම සහ රුපියල අවප්‍රමාණය වීම කියන කාරණා දෙක ඉදිරිපත් කරනවා. යම් ප්‍රමාණයකට එම කාරණා දෙකේ සත්‍යතාවක් තිබෙනවා. නමුත්, පෙට්‍රල් ඇතුළු හැම ඉන්ධන ලීටරයකින්ම ආණ්ඩුව විශාල පාඩුවක් ලබනවාය, ආණ්ඩුව මේ සියල්ල කරන්නේ එලෙස පාඩු ලබමින්ය කියා කැබිනට් ප්‍රකාශකතුමා කියනවා මා දැක්කා. මුදල් හා ජනමාධ්‍ය ඇමතිවරයාත් ඊට කිට්ටු අදහසක් කියා සිටියා.

ගරු කථානායකතුමනි, 2018 අප්‍රේල් 03වැනි දා COPE එකට අපි Ceylon Petroleum Corporation එක කැඳවූ අවස්ථාවේදී ඔවුන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ලේඛන මා සතුව තිබෙනවා. මම දැන් කියන්නේ ඒ වාර්තාවේ තිබෙන කරුණුයි. ඒ අනුව ගත්තොත්, ඔක්ටෙන් 92 පෙට්‍රල් ලීටරයක විකුණුම් මිල රුපියල් 117ක්. දැන් ඉන්ධන මිල වැඩි වුණාට පස්සේ ඒ මිල වෙනස්. මා මේ කියන්නේ එදා තිබුණු තත්ත්වයයි. ඔක්ටෙන් 92 පෙට්‍රල් ලීටරයක සැබෑ විකුණුම් මිල රුපියල් 117ක් වන්නේ මේ ආකාරයටයි. ගරු කථානායකතුමනි, ඒ කියන්නේ ඉන්ධන තොග කොළඹ වරායට ගෙනැත් එතැනින් සියලුම දේවල් කරලා කොළොන්නාවට ගෙනැත් බෙදා හැරීම දක්වා වන සියලු වියදම් එකතු වුණාට පස්සේ තමයි ඔක්ටෙන් 92 පෙට්‍රල් ලීටරයක සැබෑ විකුණුම් මිල රුපියල් 117ක් වෙන්නේ. නමුත්, ඔක්ටෙන් 92 පෙට්‍රල් ලීටරයකට වැය වන සැබෑ වියදම රුපියල් 72යි කියා මෙම වාර්තාවේ සඳහන් වනවා.

රුපියල් 117ට විකුණුපු හැම පෙට්‍රල් ලීටරයටම රුපියල් 27ක භාණ්ඩ බද්ද ගහනවා; රේගු බදු ලෙස රුපියල් 12ක් ගහනවා; ගුවන් සේවා බදු ලෙස රුපියල් 5.64ක් ගහනවා; ජාතිය ගොඩනැඟීමේ බද්ද සත 86ක් ගහනවා. ඒ බදු සියල්ල එකතු කළාම හැම පෙට්‍රල් ලීටරයකටම රුපියල් 45.50ක බද්දක් ආණ්ඩුව අය කරනවා. ඊයේ වනතුරු රුපියල් 128ට විකුණුපු ඔක්ටෙන් 95 පෙට්‍රල් -Super Petrol- ලීටරයක සැබෑ වියදම රුපියල් 83යි. Super Petrol ලීටරයකට මෙන්න මේ විධියට බදු එකතු වෙනවා. භාණ්ඩ බද්ද රුපියල් 27යි; රේගු බද්ද රුපියල් 12යි; ගුවන් සේවා බද්ද රුපියල් 5.80යි; ජාතිය ගොඩනැඟීමේ බද්ද සත 97යි. හැම Super Petrol ලීටරයකටම රුපියල් 45.77ක බද්දක් ගහනවා. ඒ කියන්නේ, විකුණුම් මිලෙන් සියයට 35ක්, -තුනෙන් පංගුවක්- බද්ද තිබෙන්නේ. දැන් අපට වඩාත්ම බලපාන එක තමයි ඩීසල්. මොකද, දැන් පෞද්ගලික බස් රථවලින් පවා මිල වැඩි කිරීම් ඉල්ලා සිටින්න පටන් අරගෙන තිබෙන බව අපි දැක්කා. Auto Diesel ලීටරයක සියලුම වියදම් ඇරියාට පස්සේ එහි සැබෑ මිල රුපියල් 72යි. හැබැයි, ඔබතුමන්ලා ඊයේ වනතුරු Auto Diesel ලීටරයක් විකුණුවේ රුපියල් 95ට. හැම ඩීසල් ලීටරයකින්ම අර විධියට රුපියල් 23.49ක බද්දක් එකතු කරනවා. ඒ කියන්නේ, හැම ඩීසල් ලීටරයක්ම ඔබතුමන්ලා දැන් විකුණන්නේ සියයට 24.7ක බදු එකතු කරලයි. Super Diesel පවා එහෙමයි. ආණ්ඩුව පසුගිය ආදායම් බදු පනත ගෙනැල්ලා එතැනත් ජනතාව මත බර පැටවීමක් කළා. ගරු කථානායකතුමනි, ආණ්ඩුව රාජ්‍ය අංශය සියයට 10ක්, 12ක් වාගේ ඉතා සුළු ප්‍රමාණයක් තමයි අද මෙහෙයවන්නේ. අනෙක් භාණ්ඩවල මිල පෞද්ගලික අංශයෙන් හිතූ මනාපයට වැඩි කරගෙන යනවා. ඒ නිසා දැන් හැම භාණ්ඩයකම මිල අතිවිශාල ලෙස වැඩි වෙලා තිබෙනවා. එවැනි

අවස්ථාවකදී ලෝක වෙළෙඳ පොළේ මිල වැඩිවීමේ තර්කයත්, රුපියල අවප්‍රමාණය වීමේ තර්කයත් පාවිච්චි කරලා ඔබතුමන්ලා ඉතා වැඩි ගණනකින් පෙට්‍රල් මිල වැඩි කරනකොට, ඩීසල් මිල වැඩි කරනකොට,- මාධ්‍ය ආයතනවලින් එන messagesවලින් මම දැක්කා,- ත්‍රී විලර් එකක ආරම්භක කිලෝමීටරය රුපියල් 10කින් වැඩි කිරීමට ත්‍රිරෝද රථ රියැදුරන්ගේ සංගමය කටයුතු කරමින් සිටින බව දැන ගන්න තිබෙනවා. ත්‍රී විලර් එකක ආරම්භක කිලෝමීටරයට දවල් වරුවට අය කරන්නේ රුපියල් 50යි. එතකොට ඒක රුපියල් 60 දක්වා වැඩි වෙනවා. තෙල් මිල වැඩිවීම නිසා පාන් රාත්තලට, බනිස් ගෙඩියට, බත් පාර්සලයට පවා අනිවාර්යයෙන්ම මේ වියදම එකතු වෙනවා. ආණ්ඩුව ලෝක වෙළෙඳ පොළයි, රුපියල අවප්‍රමාණයවීමයි කියන ප්‍රශ්නයට මුවාවෙලා තෙල් මිල වැඩි කරලා තිබෙනවා. අපේ මූලික තර්කය වන්නේ, ආණ්ඩුව තමන් අය කරගන්න බදු අඩු කරන්නේ නැතිව තෙල් මිල වැඩි කරලා තිබෙන එකයි. බදු බින්දුව කරන්න කියලා මම කියන්නේ නැහැ.

ආණ්ඩුව ගන්නේ ඒ තර්කය නේ. බදු නැතිව රට කරන්න කියලාද ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ කියලා නේ අනෙක් පැත්තට අහන්නේ. ඒ මෝඩ තර්කයට යන්නේ නැතිව, ජනතාව මත අතිවිශාල වශයෙන් බර පැටවී තිබෙන අවස්ථාවකදී ආණ්ඩුව අතට ගන්නා බදු ප්‍රමාණය යම් ප්‍රමාණයකට කෙටි කාලීනව කප්පාදු කරන්න ඔබතුමාට පුළුවන්. දැන් පෙට්‍රල් ලීටරයකින් රුපියල් 45ක බද්දක් ගන්නවා. මේ ගණන රුපියල් 35ක් කර ගත්තා කියලා භාණ්ඩාගාරය වහන්න වෙන්නේ නැහැ. එතකොට යම්කිසි සාධාරණ සුළු ප්‍රමාණයකින් තමයි පෙට්‍රල් මිල වැඩි වෙන්නේ. විශේෂයෙන්ම ඩීසල් මිල. පෙට්‍රල් මිල තමයි මෝටර්සයිකලයට බලපාන්නේ; ත්‍රී විලර් එකට බලපාන්නේ. ඔබතුමන්ලා ලෝක වෙළෙඳ පොළේ කථාව විතරක් පෙන්වලා ඉන්ධන මිල ඉතාම අසාධාරණ ලෙස වැඩි කරනවා. මේ කථාව ගැන කියන්නේ නැහැ. එම නිසා අපි පැහැදිලිවම ආණ්ඩුවට කියන්න කැමැතියි, ඉතාම අසාධාරණ බර පැටවීමක් ජනතාව මත සිදු කරනවා කියලා. මෙය ප්‍රවාහනයට සම්බන්ධ විෂයයක් නිසායි අද යම් ප්‍රමාණයකට මම මේ ගැන කථා කරන්නේ. ඒක මුලින්ම ආණ්ඩුවේ අවධානයට යොමු කරන්න අවශ්‍යයි. මොකද, ආණ්ඩුව තමන්ගේ වියදම් කිසිවක් කප්පාදු කරගෙන නැහැ. දැන් ජාතික ආණ්ඩුවක් නැහැ. ඇමති මණ්ඩලය, නියෝජ්‍ය ඇමති මණ්ඩලය සිටිය යුතු වන්නේ 70යි. හැබැයි, තමුන්නාන්සේලා අනුගණනක් තියාගෙන ඉන්නවා. දැන් කොහේද ජාතික ආණ්ඩුවක් තිබෙන්නේ? තමුන්නාන්සේලා අමු අමුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් ඇමති මණ්ඩල පවත්වා ගෙන යනවා. රටේ ජනාධිපතියි, අගමැතියි දෙදෙනා එකතු වෙලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා. ඒවා වියදම්. අපි මෙතැන ඒ සම්බන්ධව ප්‍රශ්න කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව තිබෙනවා සිටිය යුතු ඇමතිවරු සංඛ්‍යාව 70යි කියලා. හැබැයි, මම අද ඒක ඔප්පු කළා. අදාළ නැති නිසා මම එතුමාගේ නම දැන් කියන්නේ නැහැ. විෂයයන් දෙකක් හාර සමහර ඇමතිවරු ඉන්නවා. එක අමාත්‍යාංශයක කැබිනට් ඇමති, තවත් අමාත්‍යාංශයක රාජ්‍ය ඇමති. ඒ විෂයන් දෙකටම වෙනම පෞද්ගලික කාර්ය මණ්ඩලය ඉන්නවා. ඇමතිවරයා වැටුප් දෙකක් ගන්නේ නැති එක විතරයි. ඇමතිවරු දෙදෙනෙකුට අදාළ වන සියලුම වියදම් ටික ලැබෙනවා. තමුන්නාන්සේලා ඒ එකක්වත් අඩු කරන්නේ නැහැ. තමන් ලබා ගන්නා මහ විශාල බදු බර කිසිවක් අඩු කරන්නේ නැතිව ජනතාව මත පටවනවා.

මම අද දිනයේ විවාදයට ලක් වන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත ගැන යම්කිසි කරුණක් සඳහන් කරන්න කැමතියි. එම පනත් කෙටුම්පතේ අඩංගුව සම්බන්ධයෙන් විවාදයක් නැහැ. ඒකට එකඟයි. නමුත්, කටුනායක ගුවන් තොටුපළේ ගැටලු කියන කාරණය ඇමතිතුමාගේ අවධානයට යොමු වෙලා තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. තැරැව්කරුවන් සම්බන්ධ ගැටලු ඔබතුමා ඉදිරිපත් කළා. තව පොඩි පොඩි කරුණු කිහිපයක් මම සඳහන් කරන්න කැමතියි. මහා දැවැන්ත සිගරට් ජාවාරමක් කටුනායක ගුවන් තොටුපළ හරහා ක්‍රියාත්මක වෙනවා කියලා පසුගිය දවස්වල ජනමාධ්‍ය මඟිනුත් හෙළිදරව් කරලා තිබුණා. මොකද, ලංකාවේ සිගරට් මිල වැඩියි; එම නිසා සිගරට් ජාවාරමට ලංකාව පාවිච්චි වෙනවා කියා තොරතුරු හෙළි වෙලා තිබෙනවා.

එවැනි පුද්ගලයන් සාමාන්‍යයෙන් hand luggage එකක වුණත් මේවා අරගෙන ආවත් ඒ සඳහා ඔබතුමන්ලා ඉදිරිපත් කර තිබෙන දඩය බලන්න. මේ ලිපියේ ඒ ගැන ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා. මේවා ලොකු සමාගම්වලින්, ජාවාරම්කාර ආයතනවලින් තමයි කරන්නේ. ඒ එන තැරැව්කරුවන් සංඛ්‍යාව ගත්තොත් රුපියල් 25,000ක් කියන්නේ නිකම් ආප්ප කන සල්ලි. ආප්ප කන්න වියදම් කරන තරම් සල්ලි. මේවා මහා පරිමාණ ජාවාරම්කරුවෝ තමයි කරන්නේ. මම කියන්නේ මේක ටැක්සියකට මිනිහෙක් දමා ගන්න එක වාගේ දෙයක් නොවෙයි කියායි. දැන් ඔබතුමාම කිව්වා, "මෙතැන වැරැදි පණිහකට වඩා කරපු අය ඉන්නවා." කියලා. ඉන්දියන් ජාතිකයන් අතිවිශාල සංඛ්‍යාවක් ඉන්නවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala De Silva)

රේගුවෙන් පන්නන ඔය භාණ්ඩ පිළිබඳව ක්‍රියා කරන්න අපට බලයක් නැහැ. රේගුවෙන් අල්ලලා දඩ ගහන්න ඕනෑ. දඩ මුදල වැඩි කිරීම පිළිබඳව අපි කැබිනට් මණ්ඩලයේත් සාකච්ඡා කර තිබෙනවා. ඒක රේගුවට අයිති විෂයයක්.

ගරු බිමල් රත්නායක මහතා
(*மாண்புமிகு பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)

ඒක හරි ඇමතිතුමනි. නමුත් තැරැව්කරුවෝ ඔබතුමාගේ ගුවන් තොටුපොළේ තමයි ඉන්නේ. ඒ ගොල්ලන් ඒ business එක කරනවා. ඒ ගොල්ලන් plane එකේ යන්නේ නැහැ. Tickets ඔක්කොම තිබෙනවා. නමුත් ඒ ගොල්ලෝ යන්නේ නැහැ. ඒ ගොල්ලෝ ඇවිල්ලා පැය තුන හතර ඉඳලා ඩුබායි ඉඳලා එන මිනිස්සු එක්ක, වෙනත් අයත් එක්ක කලවම් වෙමින් මේවා පටවනවා. සමහර අය පටවනවා. සමහර අය එළියට පන්නනවා. ඒක මේ පුවත්පතේත් හෙළිදරව් කර තිබෙනවා. ගුවන් තොටුපොළේ නිලධාරීන්ගෙන් ඇහුවත්, ඒ අයත් දන්නවා. දඩ ගහන්න ඕනෑ රේගුවෙන්ද, නැද්ද කියන එක ගැන මට ලොකු අවබෝධයක් නැහැ. නමුත් සිගරට් ජාවාරම ඔබතුමාගේ ගුවන් තොටුපොළේ සිද්ධ වන විශාලතම ජාවාරම්වලින් එකක්. ඒකත් එක්ක බලා තමයි මම කියන්නේ ඔවුන් ලබා ගන්නා මහා විශාල ආදායම් ප්‍රමාණය එක්ක ගත්තාට පස්සේ මේ දඩය ඔවුන්ට නිකම් හිනා යන දඩයක් කියලා. තැරැව්කරුවන් මර්දනය කරන්න දඬුවම් කරන එක හොඳයි. ඒ නිසා ඔබතුමා ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත ගැන අපට විවේචනයක් නැහැ.

ගරු කථානායකතුමනි, මෙය ගුවන් තොටුපොළට සම්බන්ධ කාරණාවක් නිසා මම මේ කාරණයත් කියන්න කැමැතියි. පළමුවැනි කාරණය මේකයි. පසුගිය මාස දෙක ඇතුළත ගුවන් තොටුපොළ තුළ සුවිශාල උද්ඝෝෂණ ප්‍රමාණයක් ඇති වුණා. ගුවන් තොටුපොළේ කටයුතු පැය කිහිපයක් නතර වන මට්ටමට ගියා. එතැන එක ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේක රාජ්‍ය ආයතනයක් බව ඔබතුමා දන්නවා. සමහර ඇඟලුම් කර්මාන්තශාලා පාලනය කරන විධියට තමයි පසු ගිය කාලයේ සිට අපේ ගුවන් තොටුපොළත් පාලනය වන්නේ. ගරු කථානායකතුමනි, අපි දන්නවා, ඇඟලුම් කර්මාන්තශාලාවල

[ගරු බිමල් රත්නායක මහතා]

ඉහළ කළමනාකාරිත්වයට උපරිමව ගෙවන බව. ඒ ගොල්ලන්ගේ වැටුප් ගත්තොත්, සමහර බැංකුවල සභාපතිලාගේ වැටුපට වැඩියි, සමහර garmentsවල general managersලාගේ වැටුප; senior management එකේ වැටුප; සමහර factoryවල ඉන්න chief manager ගේ වැටුප. ඔවුන්ට උපරිමව ගෙවනවා. එහෙම ගෙවලා පහළ සේවකයන් ඉතා බරපතල විධියට, සමහර විට අයිතිකාරයාට වඩා තළා පෙළා වැඩ ගන්න glorified slavesලා ටිකක් හදනවා.

ගුවන් තොටුපොළේ වෙලා තිබෙන්නේත් ඒකමයි. ඉහළ කළමනාකරිත්වයට හොඳ වැටුපක් ගෙවනවා. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සහ මිහින් එයාර් ආයතන ගැන අපි COPE එකේදීත් ප්‍රශ්න කළා. ඒ ගැන මම ලොකු විවාදයක් ඇති කර ගන්න යන්නේ නැහැ, මේක වෙනම විෂයයක් නිසා. ගුවන් තොටුපොළ තුළ විශාල සේවක අසහනයක් තිබෙනවා. ඒක නිසා තමයි පසුගිය දවස්වල කටුනායක ගුවන් තොටුපොළ වැහෙන මට්ටමට ආවේ. ඒක වෘත්තීය සමිති ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය විසඳිලා තිබෙන්නේත් පහළ ශ්‍රේණි අයට වැටුප් වැඩිවීම් සහ විශේෂයෙන්ම උසස්වීම් ක්‍රම නැතුව. සමහර අයට විශ්‍රාම යන්න වෙන්නේත් ඒ තනතුරේම කියලා තමයි ඒ වෘත්තීය සමිති අපට කියන්නේ. ඒක නිසා අපි ඔබතුමාට කියනවා, garment factory ක්‍රමයට ගුවන් තොටුපොළ පාලනය කරන්න හදන්න එපා කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම garment factory ක්‍රමයට නොවෙයි අපි ඒ ආයතන පාලනය කරන්නේ. ගුවන් තොටුපොළේ සේවය කරන සාමාන්‍ය සේවකයෙකුගේ average පඩිය රුපියල් 70,000යි. සභාපතිතුමාගේ පඩිය රුපියල් 96,000යි. එහෙම විශාල පරතරයක් නැහැ. ඒ ගුවන් සේවා ක්ෂේත්‍රයේ විශේෂ expertise තිබෙන අය ගන්නවා නම් වැඩි වැටුපක් ගෙවන්න ඕනෑ. සිවිල් ගුවන් සේවා අධිකාරියට inspector කෙනෙක් ගන්න අපට බැහැ, මිලියන එකක් පඩි දෙන්නේ නැතුව. මොකද ඒකට pilot කෙනෙක්ම ගන්න ඕනෑ. ශ්‍රීලංකන් එයාලයින්ස් එකේ pilot කෙනෙකුට මිලියනයක් විතර ලැබෙනවා. ඒ වාගේ විශේෂිත රැකියා සඳහා අපට එහෙම ගන්න වෙනවා. ගුවන් සේවා අධිකාරියේ පල්ලෙහා තලයේ අයට සහනය සලසන තැනක් නැහැ. Strike එක ඇති වුණේ මේ කාරණය නිසයි. එක දවසින් වහාම bonus එක ලක්ෂයක් ඕනෑ කියලා ඉල්ලුවා. එක දවසයි අපට කාලය දුන්නේ. ඒක ඔබතුමාත් පිළිගන්න ඕනෑ. එක දවසක් ඇතුළත මුදල් පිළිබඳව අපට තීන්දු තීරණ ගන්න පුළුවන්කමක් නැහැ. නමුත් අපි ඒක ලබා දුන්නා. ඉතාම අසාධාරණ දෙයක් කළේ. ලංකාවේ ගුවන් තොටුපොළවල් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිරූපය විනාශ කළා. ඒක තමයි වෘත්තීය සමිති කළේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඉතාම පැහැදිලිව මම මේ කාරණය කියන්නේ, කාලයක් තිස්සේ මම දන්නා කරුණක් නිසායි. උසස් වීම් ක්‍රමවේදයක් නැතිකම පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. වැටුප 70,000 වෙන්න පුළුවන්. ඕක හැම වෙලාවේම සංසන්දනය කරන්න එපා. මිනිසුන්ට රුපියල් 70,000යි කිව්වාම ලොකුයි කියලා හිතෙන්න පුළුවන්. මොකද ගුරුවරයෙකුට හම්බ වෙන්නේත් රුපියල් 35,000ක්, 40,000ක් නිසා. නමුත් ඔබතුමාට මේ කාරණය කියන්න ඕනෑකම තිබෙනවා. එතැන තිබෙන ක්‍රමවේදය මම කලින් කිව්ව එක තමයි. මට ඕනෑතරම් උදාහරණ කියන්න පුළුවන්. ඔය ආයතන දෙකේම ඉහළ කළමනාකාරිත්වය ඉතා ඉහළ මට්ටමේ වරප්‍රසාද ගනිද්දී පහළ අයට ඉතාම අසාධාරණ ලෙසයි සලකන්නේ. කවුරුත් නැතුව, ඔය ආයතනය ගෙන යන්න බැහැ. සියලුදෙනාම අවශ්‍යයි. ඒක නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සේවක සේවිකාවන්ගේ උසස්වීම් පිළිබඳ ප්‍රශ්නයට මැදිහත් වෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ගුවන් තොටුපොළේ තිබෙන ජනතාවට බලපාන කුඩා අඩු පාඩුකම් ප්‍රමාණයක් කියන්නම්. මොකද ලොකු ඒවා කිව්වාට ගරු ඇමතිතුමාට විසඳන්න අමාරුයි. සාමාන්‍ය ජනතාව මුහුණ දෙන එක ප්‍රශ්නයක් වන්නේ මෙයයි. එය පුවත් පත්වල වාර්තා කරලා තිබෙනවා. පාර්ලිමේන්තු පුස්තකාලයෙන් ඉතා වටිනා තොරතුරු ප්‍රමාණයක් මට සොයලා දුන්නා. ඒවාත් එක්කයි මම මේ කාරණය කියන්නේ. විශේෂයෙන්ම සාමාන්‍ය මගීන්ට තිබෙන විශාල ප්‍රශ්නයක් තමයි ඔවුන්ට පාවිච්චි කරන්න තිබෙන වැසිකිළිවල - toiletsවල- වතුර නැතිකම. Bidet showers ගලවලා තිබෙන්නේ. මා ළඟ මේ පුවත් පත් වාර්තාව තිබෙනවා. "කරාම ගලවා ඇත" කියලා එතැන ගහලා තිබෙනවා.

ඒ නිසාම එහි එක සිද්ධියකුත් වුණා. පුවත් පත් එය වාර්තා කළා. දඹදිව යන්න පිටත් වුණු අම්මා කෙනකුට වැසිකිළි යන්න ඕනෑ වෙලා තිබෙනවා. අපේ රටේ මිනිස්සු පුරුදු වෙලා නැහැ, toilet papers පාවිච්චි කරන්න. ඔවුන් පුරුදු වෙලා ඉන්නේ වතුර පාවිච්චි කරන්නයි. වතුර නැති නිසා ඒ අම්මාට ඒ ස්ථානයේම වෙච්ච කරදරයක් ගැන වාර්තා වුණා. ඒකට හේතුව, තමුන්නාන්සේලා සාමාන්‍ය ජනතාවට යන්න තිබෙන වැසිකිළිවල වතුර පහසුකම් නැති කර තිබීමයි. මොකක්ද ඒ වැඩේ? එහෙම කරන්න ලජ්ජා නැද්ද? මා දැන් මේ කාරණය ගන්නේත් නැහැ, මෙය පොඩි දෙයක් නම්. පුවත් පත් වාර්තා කර තිබෙනවා ඒ කාරණය ගැන. ඊට පසුව මම එය පරීක්ෂා කළා. ඒක තමයි එහි තිබෙන තත්ත්වය. වතුර කපන්න හේතුව විධියට කියා තිබෙන්නේ, මිනිසුන් කකුල් සෝදනවා කියන එකයි. මිනිසුන්ගේ අයිතියක් නේ, කකුල් සොදා ගන්නා එක. මිනිසුන් එතැනට යන්නේ නාන්න නොවෙයි නේ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ලොකු කතා කිව්වාට වැඩක් නැහැ. එය, ඔබතුමාගේ අමාත්‍යාංශයට අයිති ආයතනයක්. එහි තිබෙන මේ ප්‍රශ්න ගැන බලන්න කියන්න. මොකද, ඒ අය ලංකාවේ මිනිස්සු; සාමාන්‍ය ජනතාව.

ගරු කථානායකතුමනි, ඊළඟ එක තමයි, Wi-Fi පහසුකම් නොමැති ප්‍රශ්නය. මමත් ඔය ගුවන් තොටුපළට ගියාම උත්සාහ කර තිබෙනවා, එහි Wi-Fi connection එක ලබා ගන්න. තමුන්නාන්සේලාගේ නොමිලේ Wi-Fi සේවාව කොහේවත් නැහැ. නමුත් ලෝකයේ තිබෙන දුර්වලම ගුවන් තොටුපළේත් දැන් Wi-Fi service එක තිබෙනවා. කටුනායක ගුවන් තොටුපළේ terminals දෙකටම තිබෙන්නේ Wi-Fi points 2යි. ගුවන් තොටුපළේ ලොක්කන් එහෙම හම්බ වුණාම දෙන්නේ "නවුසන්ඩ් ටෝක්ස්" තමයි. අග්‍රාමාත්‍යතුමාගේ කතාව, එය අහහරු ලෝකයට ගෙන යන්න වාගෙයි. නමුත් Wi-Fi points දෙකයි එහි තිබෙන්නේ. ඒවාටත් password එක ඉල්ලා ගන්න, boarding pass එක scan කර ගන්න පෝලිමේ ඉන්න ඕනෑ. ඒ නිසාම විදේශිකයන් ලංකාවට එන කොට, ලංකාවෙන් යන කොට පුදුමාකාර සනීපදායක හැඟීමක් තමයි ඔවුන්ට ඇති වන්නේ. දැන් නිකම් කෝපි කඩයකට ගියත් Wi-Fi password එකක් හම්බ වෙනවා. බිලෙහි ම සඳහන්ව තිබෙනවා, එය. ඒ පහසුකම් හඳුන්න. මේවා ඉතා ප්‍රාථමික දේවල්. මේවා අප කියන්න ඕනෑ දේවල් නොවෙයි. ගරු අමාත්‍යතුමනි, මේවා වෙනුවෙන් පඩි ගන්නා පිරිසක් සිටිනවා, ඔබතුමාගේ ආයතනයේ.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය මෙයයි. මෙය ගුවන් තොටුපළේ ප්‍රශ්නයක්ම නොවෙයි. නමුත් ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ ආයතනය යටතේ සිද්ධ වන දෙයක් නිසායි මා මෙය කියන්නේ. පසුගිය දවස්වල මාධ්‍යයත් වාර්තා කළා, විශේෂයෙන්ම SriLankan Airlines වල යන එන අයගේ බෑග් නැති වනවා කියා. බෑග් නැති වීම පිළිබඳව තිබෙන්නේ, යම්කිසි දුෂිත පිරිසක් ඒවා සොරකම් කරන ප්‍රශ්නය ද, එහෙම නැත්නම් නැති වුණු බෑග් සොයා දෙන්න උනන්දු වන්නේ නැති ප්‍රශ්නය ද කියන එක ගැන සොයා බලන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට SriLankan Airlines ආයතනය සම්බන්ධයෙන් සෘජුව වගකීමක් නැතත් එය ඔබතුමාගේ ආයතනයත් එක්ක සම්බන්ධ නිසා මා ඒ කරුණ ඔබතුමාට ඉදිරිපත් කරනවා.

තවත් කරුණක් ගැන කියන්න ඕනෑ. ඔබතුමා එය යම් ප්‍රමාණයකට කියන්න උත්සාහ කළා. පුවත් පතක් එය වාර්තා කර තිබෙනවා. එය, ඔබතුමාගේම හිතවත් දේශපාලන නායකයකුට සම්බන්ධ පුවත් පතක්, අප අසා තිබෙන විධියට. එය "සත්හඬ" පුවත් පතයි. එතුමන්ලා ඒ කාරණය වාර්තා කර තිබෙනවා. ඒ, වැඩි ඈතක නොවෙයි. එහි සඳහන් වනවා, "මිලියන 500ක අත යට ගනුදෙනුවට කටුනායක තීරු බදු සාජ්පු සංකීර්ණයේ ඒකාධිකාරය ඉන්දියාවට" කියා. මෙහි duty-free shop එකක් ටෙන්ඩර් කිරීම සම්බන්ධ ගැටලුව අපි දන්නවා. මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. නමුත් අවසානයේ වෙච්ච දේ මොකක්ද? එහි වූ ගනුදෙනු ගැන අපි දන්නේ නැහැ. සමහර විට මහානාම තවත් මහානාම කෙනකුට දුන්නාද කියා අපි දන්නේ නැහැ. නමුත් ඒ duty-free shop එක නීත්‍යානුකූලව නිසි වෙලාවට ලබා නොදීම නිසා ගුවන් තොටුපළට වෙච්ච පාඩුවට වග කියන්නේ කවුද? හොරකම පැත්තක තියන්න කෝ. හොරකම කවුරුන් හෝ කරලා ඇති. දැන් එය දීලා නේ. ඒ ටෙන්ඩර් එක හරි වෙලාවට නොදැමීම නිසා මාස 10කට ආසන්න කාලයක් එය වසා තිබුණා. අප කියන්නේ නැහැ, ටෙන්ඩර් එක අර සමාගමට දෙන්න, මේ සමාගමට දෙන්න කියා. කොහොමත් අපට එවැනි ප්‍රශ්නයක් නැහැ. නමුත් එය මාස 10කට වැඩි කාලයක් වසා තිබුණා. එයින් ආණ්ඩුවට, ගුවන් තොටුපළට එන්න තිබුණු ආදායම අහිමි වීම සම්බන්ධයෙන් කවුද වග කියන්නේ? එහෙම නම් හරිම පැහැදිලිව පෙනෙන දේ, මේවායේ වන දේ මොකක්ද, ගරු කථානායකතුමනි? මේ රටේ හොරකම් කරන්න දෙන්නේ නැති නම්, තමන්ට ඕනෑ කරන ගණන දෙන්නේ නැති නම් මොකක්ද කරන්නේ? ඒ ආයතනය හෝ බිඳ වට්ටනවා. අපි දැක්කා, එය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන්. සභාපතිවරයා ආයුර්වේද ඖෂධ සංස්ථාව සම්පූර්ණයෙන් -බින්දුවට - බැස්වුවා. සේවකයෝ වහල උඩ නැහලා උද්ඝෝෂණය කරලා ඔහු එළෙව්වා. එහෙත් ඔහු අයින් කළේ නැහැ. ඒ කියන්නේ, සංස්ථාව වැටුණත් තමන්ගේ මිනිහා තියා ගන්නවා කියන එකයි; මහ බැංකුව වැටුණත් තමන්ගේ මිනිහා තියාගන්නවා කියන එකයි. ඒකම තමයි මෙහිදී වුණේත්. තමන්ට හරියට කුට්ටිය, ගණන එන කල්ම දුන්නේ නැහැ. කාට හෝ කියන්න පුළුවන්, "කුට්ටිය ගත්තේ නැහැ" කියා. කුට්ටිය ගත්තේ නැති වුණාට මාස 10ක් මේ space එක නිකම් තිබුණා. එයින් අහිමි වූ ආදායම කොච්චරද කියලායි අප අහන්නේ? ඒ නිසා ගුවන් තොටුපොළ අධිකාරියේ ගුවන් තොටුපළ පාලනය සම්බන්ධයෙන් බරපතළ චෝදනාවක් මෙහි තිබෙනවා.

ඊළඟට, මම තවත් කාරණයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ගුවන් තොටුපොළ සංවර්ධනය කරනවා කියලා කියනවා. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඒ ගැන කියන්න, මට කථා කරන්න ලොකු වෙලාවක් නැති නිසා. ඔබතුමන්ලා දැන් මුල් ගලත් තියා තිබෙනවා. නමුත් ඒ ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු කාලයකින් ප්‍රමාද වෙලා තිබෙනවා. මගේ දැනීමේ හැටියට ගුවන් තොටුපොළ හදා තිබෙන්නේ ලක්ෂ හැටක -මිලියන හයක- වාගේ ජනතාවක් හසුරුවන්න හැකි පරිදියි. ඔබතුමා දැන් කිව්වා, මිලියන නවයයි දශම ගණනක්ද කොහේද පසුගිය අවුරුද්දේ ඇවිල්ලා තිබෙනවා කියලා. මේ අවුරුද්දේ එම ප්‍රමාණය මිලියන දහයක් දක්වා ඉහළ යයි. එතකොට අනිවාර්යයෙන්ම ගුවන් තොටුපොළ පුළුල් කිරීම අවශ්‍යයි. නමුත් පුළුල් කිරීමේදී එක පැත්තකින් ප්‍රමාදයක් තිබෙනවා. ඒ වාගේම ඒකට JICA එකෙන් දෙන ණය පිළිබඳව විශාල ගැටලුවකුත් තිබෙනවා. රුපියල් බිලියන 49ට ඇස්තමේන්තු කළ එකක් බිලියන 72ට ගිහිල්ලා තිබෙනවා කියලා පුවත් පත් වාර්තා කර තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ඒක නේ මම ඔබතුමාට මුලින්ම ඒ ප්‍රශ්නය ගැන පැහැදිලි කරලා දුන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මම මේ කරුණු ටික කියන්නම්. ඔබතුමාගේ කථාවේදී ඔබතුමා උත්තර දෙන්න. මොකද, පෙ.ව.11.30ට මට meeting එකක් තිබෙනවා.

මේ වංචාව සම්බන්ධ ප්‍රශ්නය එක කාරණයක්. මම ඒ වංචා ගැන අද ගොඩක් කථා කරන්න යන්නේ නැහැ. සමහර විට ඒක ජපානයෙන් ඉල්ලුවා වෙන්න පුළුවන්. ඉතාම අර්බුදයට ලක් වෙලා තිබෙන මහනුවර අධිවේගී මාර්ගයේ තුන්වන කොටස ඉදි කරන්න යන ජපන් සමාගමටම මේ කොන්ත්‍රාත් එකත් ලබා දෙන්න කියලා ජපානය කියනවා කියලා තමයි පුවත් පත් වාර්තා කරන්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ඒ ඉල්ලීම තමයි ප්‍රතික්ෂේප කළේ. කැබිනට් මණ්ඩලයෙන් ඒක අවලංගු කළා. ඔබතුමා ඒක අනෙක් පැත්තට හරවන්න එපා. හරි දෙයක් කළාම ඒකත් වැරදියි කියලා කියනවාද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැහැ. ඒක නොවෙයි මම කියන්නේ. ඔබතුමන්ලා අවලංගු කළා. මහනුවර අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් වුණේත් ඒක

[ගරු බිමල් රත්නායක මහතා]

නේ; අවලංගු කළා. මම ඇත්තටම මේ විවාදයට ගන්න බලාපොරොත්තු වෙන්නේ ඒක නොවෙයි. මට කියන්න ඕනෑකම තිබුණේ මේකයි. අර duty-free shop එකේ ප්‍රශ්නය ඇදුණේ ඇයි? කුට්ටිය පිළිබඳ ප්‍රශ්නය නිසා. කුට්ටිය පිළිබඳ ප්‍රශ්නය නැතත්, මාස දහයක් ආණ්ඩුවට ආදායම ලැබුණේ නැහැ. ඒක එක කාරණයක්. මම අද වංචා දූෂණ ගැන නොවෙයි කථා කරන්නේ. දැන් මේ project එකේ ප්‍රශ්නය නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? මෙහිදීත් වෙලා තිබෙන දෙය, terminal එක හැදෙන්නේ නැති එකයි. එතැන තිබෙන්නේත් කුට්ටිය පිළිබඳ ප්‍රශ්නය. ඒ කුට්ටියෙන් කොටසක් ජපානයටත් සම්බන්ධයි. අපි ඒක දන්නවා. ජපානය ඔය සමාගම් උස්සාගෙන දහලන්නේ නැහැ කියන එක ගැනත් අපට අවබෝධයක් තිබෙනවා. නමුත් දැන් මේ වැඩේ කෙරෙන්නේ නැහැ. මිලියන හයක් හසුරුවන්න පුළුවන් Airport එකට දැන් මිලියන දහයක් එනවා. ඒ නිසා ඉඩ නැහැ. Duty-free shop එක ප්‍රමාද වුණු හේතුව නිසාම තමයි මේක ප්‍රමාද වෙන්නේ කියන එකයි මට කියන්න ඕනෑකම තිබෙන්නේ. ඒ වෙනුවට මේක හදන්න කියන එක තමයි අපිත් ඔබතුමාට කියන්නේ. හදන්න එපා කියලා නොවෙයි කියන්නේ.

ඊළඟට, මම මේ ප්‍රශ්නයටත් ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. "මව්බිම" පුවත් පත වර්තා කරලා තිබෙනවා, 2017 වසරේදී සිදු වුණු දෙයක්. ඒ සඳහා අපි Auditor-Generalගෙන් විගණන වාර්තාවකුත් ලබා ගත්තා. මේක ඇත්තටම අවුරුදු දෙකකට කලින් සිදු වුණු දෙයක්. නමුත් මෙය හරියාකාරව අවධානයට ලක් වුණේ නැහැ. මේ පුවත් පතේ තිබෙන්නේ, "ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සමුළුවට කැබිනට් මණ්ඩලය අනුමත කළ රුපියල් මිලියන දෙකක මුදල ඉක්මවා වැඩිපුර මිලියන 7.8ක් වියදම් කළා" කියලායි. අපි දැනගන්න කැමැතියි, එහෙම වෙන්නේ කොහොමද කියලා. මොකද, ලොකු ලොකු තැන්වලින් ලොකු ලොකු විධියට නාස්ති වෙද්දී පොඩි පොඩි අයත් ඒ විධියට කරනවාද කියන එක ගැන මම දැනගන්න කැමැතියි.

අවසාන වශයෙන්, ඔබතුමාගේ මේ විෂයයට අදාළ නැතත් නිශ්චිත කරුණක් ගැන කියන්න මම කැමැතියි. මිනිසුන්ට licence එක ගන්න කලින් medical certificates ගන්න තිබෙන්නේ නුගේගොඩ ප්‍රදේශයේ පිහිටි ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයෙන්. එතැන අතිවිශාල තදබදයක් තිබෙනවා. ඇමතිතුමා මොන දවසක එතැනට ගියත් බලන්න පුළුවන්, එතැන මහා විශාල පෝලිමක් තිබෙන බව. ඒ නිසා ඒ ආයතනය පෞද්ගලීකරණය කරන්නේ නැතුව ඔබතුමා රටේ ස්ථාන කිහිපයක -කොළඹ සහ අනෙක් ප්‍රදේශවල- තවත් ආයතන කිහිපයක් වහාම ඇති කරන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

වේරහැර ප්‍රදේශයෙන් ඒ අයට අක්කරයක ඉඩමක් ලබා දෙන්න අපි ඊයේ තීන්දු කළා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔව්. දිගු කාලීන පිළිතුරක් විධියට ඒක හොඳ වෙයි, ගරු ඇමතිතුමනි. නමුත් එතැන building එක හදලා, ඒක වෙනකොට තව අවුරුදු දෙක-තුනක් ගත වෙයි. ඒ නිසා අපි කියන්නේ, -මම හිතන විධියට උඩහමුල්ල ඩිපෝවේ ඉඩ තිබෙනවා. මම දන්නේ නැහැ, ඒ වාගේ තැනක් හරි යනවාද කියලා. ඔබතුමන්ලාට මට වඩා අවබෝධයක් ඇති.- ප්‍රායෝගිකව තව මාසයකින් දෙකකින් පටන් ගන්න පුළුවන් තැන්වල ඒ කටයුත්ත පටන් ගන්න කියලායි. නැත්නම් මිනිස්සු මහා විශාල දුෂ්කරතාවකට මුහුණ දෙනවා. ඔය කරුණු ප්‍රමාණය තමයි මට කියන්න තිබෙන්නේ. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඒවාට පිළිතුරු ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.11.30]

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද පැවැත්වෙන මේ විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. ප්‍රමාද වී හෝ මෙවැනි සංශෝධන පනත් කෙටුම්පතක් මේ සභාවට ඉදිරිපත් කර, මේ වැරදි කරන අයට දඬුවම් ලබා දීම සඳහා නීතිය සකස් කිරීමට කටයුතු කිරීම ගැන අපේ නිමල් සිරිපාල ද සිල්වා ගරු ඇමතිතුමාටත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් මම විශේෂ ප්‍රශංසාවක් කරන්න කැමැතියි. දැන් ඇමතිතුමාම කිව්වා මේ අවුරුද්දේ වෙන කොට මිලියන 10ක සංචාරක පිරිසක් ගුවන් තොටුපොළෙන් එහා-මෙහා යනවාය කියලා. ඒ ඉදිරිපත් කළේ සම්පූර්ණ සංඛ්‍යාව. පසුගිය අවුරුද්දේ මිලියන 2.5ක පමණ සංචාරකයින් පිරිසක් එහා-මෙහා ගිහිල්ලා තිබෙනවා. මේ හැම කෙනෙකුටම මේ කරදරය තිබුණා. ගුවන් තොටුපොළ ඇතුළත සහ ගුවන් තොටුපොළ පිටත මේ තැරැව්කාරයන්ගෙන් සිදුවන හිරිහැරය අප්‍රමාණයි. අද ගුවන් තොටුපොළේ සිටින තැරැව්කාරයෝ වාහනවලට පොරකනවා. ඒ වාගේම, duty-free shopsවල ඉන්න සේවකයෝත් සංචාරකයින් රට ඇතුළට එන කොටම පැනලා සාප්පුවලට ඇද ගන්න හදනවා. ඒ නිසා, එතැනත් පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අයටත් දඬුවම් කරන්න ඕනෑ. ඒ නිසා, මේ නීතිය අපි බොහොම සතුටින් පිළිගන්නවා. නමුත්, මේ සඳහා නියමිත දඬුවම ප්‍රමාණවත් නැහැ කියන එකයි මගේ අදහස. රුපියල් 25,000ක් හෝ එහෙමත් නැත්නම් භය මාසයක සිරදඬුවම් ලබා දීම නොවෙයි කළ යුත්තේ. එය මීටත් වඩා වැඩි කළා නම් හොඳයි. මොකද, අද මේක ව්‍යාපාරයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමාම පෙන්නුවා, පනස්ථානයක් උසාවි ගිහින් දඩවලට යටත් වුණු මිනිස්සු ආපහු ඇවිල්ලා ඉන්නවාය කියලා. ඇත්තවශයෙන්ම, මේ කාරණය අපේ රටේ ප්‍රතිරූපයට විශාල ප්‍රශ්නයක්. කෙනෙක් ගුවන් තොටුපොළට ඇතුළු වෙන කොටම ඒ ගුවන් තොටුපොළේ නිලධාරීන් මෙවැනි කටයුතුවලට ඉඩ දෙනවා නම්, ඒ හේතුව නිසා ජාත්‍යන්තරය තුළ අපේ රටේ ප්‍රතිරූපයට විශාල හානියක් වෙන්න පුළුවන්. අද ඉදිරිපත් කරන මේ සංශෝධනය තුළින් ඒ කාරණය සෑහෙනවුරට මර්දනය කර ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රශ්නය ගැන කථා කරන අතරතුර, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා toilets ගැනත් කිව්වා. ඒවාත් අවශ්‍යයි. [බාධා කිරීමක්] ඒ කාරණය ගැන ගරු ඇමතිතුමා උත්තර දෙයි. ඒ කාරණය සඳහන් කිරීම ගැන එතුමන්ලාට ප්‍රශංසා කරන අතර, එය අකුරටම ක්‍රියාත්මක කිරීමට පොලිස් නිලධාරීන් දැනුවත් කරන්න ඕනෑ. මේ කාරණා වෙනුවෙන් නීති සම්පාදනය කිරීම පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නීති ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක විය යුතුයි.

Sir, I wish to make some submissions in English also with regard to certain issues that are pending in the civil aviation industry. The Hon. Minister has taken adequate steps, no doubt. I commend him for that. But, there are some more steps that need to be taken.

One is that the landing and parking charges are considered to be high, compared to what is offered in the other airports in the region. As a result of that, a number of airlines do not want to touch down in Sri Lanka because the cost is going up. Then, the ground handling services at the Airport are also a monopoly and as a result, these charges are bound to be on the high side. So, if the Hon. Minister can address those issues and bring our charges in line with those levied at the other airports in the region, it would be very good and would also encourage more aircraft to come in. That means, there would be more tourists coming to Sri Lanka.

Also, there is a lack of slots for aircraft during peak hours and on certain days. To solve that problem, the expansion of the Airport, as the Hon. Minister mentioned, needs to take place. The sooner you do it, the better it is and then, there will be a higher income to the country.

Then, we should also encourage budget airlines to operate, as in Malaysia, Thailand and Singapore, as they have highly benefited by such operations because today, all foreigners look for cheap rates in air travel. The budget airlines offer very cheap rates. Therefore, we can encourage more budget airlines to operate. For example, 112.6 million passengers had flown in budget airlines to Malaysia, 3.4 million passengers to Thailand and 11.1 million passengers to Singapore in 2015. All those are people who look out for cheap rates to travel. So, we can encourage them to operate and that is one way we can bring in a lot of tourists to the country and finally bring in more revenue.

At present, AirAsia, Flydubai, Airarabia, IndiGo and Malindo Air operates budget airlines to Sri Lanka. Now, what they ask for is to have a separate terminal for the budget airlines, which is very much needed, so that the facility would be greater and convenient both to the airlines and the passengers.

Then, I would like to propose a reduction in airport tax for charter flights. Now, the world over, the trend is for charter flights. They bring in large numbers of tourists. They come here, park the plane and after one week, that same group gets back in it. But, with regard to those flights, the problem is, the airport tax is a little heavy compared to what is found in other airports in the Asian region. So, my proposal is, consider and try to bring it down.

Then, there is a shortage of airport lounge facilities during peak hours. In 2010, there were only about 450,000 tourists who came to this country. Today, the number is over two million. I think the Hon. Minister has thought of providing some more accommodation facilities; you are trying to have a second terminal. Very unfortunately, there were tender problems. If, at least, the temporary terminal that the Hon. Minister spoke about is constructed swiftly, it would address the issue.

Then, there is also a shortage of check-in counters. If you go to the Airport in the night, you would see the long lines of people waiting to be checked in. Therefore, we have to have more counters within the Airport. I do not know whether the space would be a problem. However, I would urge the Hon. Minister to try and find a way of increasing the counters. The shortage of immigration officers is another matter.

Unless more Immigration Officers are recruited, the problem of shortage of counters will not be solved. I have been telling the Hon Minister in charge of the Department of Immigration and Emigration to hurry up with the recruitment. There are hundreds of officers being lined up, but so far they have not been brought into the Airport. I think, the Hon. Minister suggested to get temporary people to do the immigration duties.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
That was not allowed.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Even that was not allowed. If our country is going to be dependent on the tourism industry to earn foreign exchange, these matters have to be addressed. Otherwise, a tourist who comes to this country once, will not come back. I think the second runway that the Hon. Minister mentioned is most welcome, but there are problems.

Then, lack of space in arrival and departure lobbies is another matter. People are flocking to these places. Now the demand has exceeded the capacity for which the Airport was originally built. This is the crux of the matter. We never envisaged at that time that there would be so much of passengers coming and going. But now it has increased. We are far behind time when it comes to improving the airports. It should have been done some time ago. I think the Rajapaksa Regime should have, without spending on other matters, improved the airports. Unfortunately it was not done. The space between the immigration counters and the wall on the opposite side is not enough and when queues get longer there is congestion as a result. So, these are practical problems which cause a lot of inconveniences.

Then Sir, with regard to development and improvements to domestic airports, I think the Hon. Minister is on the job. He did open the Batticaloa Airport which is a great impetus to the tourism industry for, tourists who come and land at the Bandaranaike International Airport can now take a domestic flight and go direct to their destination. But that is not enough, we need more domestic airports in this country because people do not want to waste time on the roads. I think, we should have one airport in the central part of the country - in the hill country - if possible, and in the Northern part of the country and also in the Southern part of the country. The Ratmalana Airport, which the Hon. Minister mentioned should be expanded and brought under the control of the Civil Aviation Authority. There are many airlines coming from India with about 80 to 90 passengers and they could easily land at Ratmalana Airport without flying to Katunayake and getting it congested. I do not know why the Air Force is clinging

[ගරු ජෝන් අමරතුංග මහතා]

on to this domestic airport. There are other runways and there is infrastructure in all parts of the country. After all, there is no war in the country now. So, I do not know why the Air Force is not allowing the Hon. Minister to develop this domestic airport. I think His Excellency the President should take serious notice of it and facilitate the Hon. Minister in charge of Civil Aviation to open up domestic airports. We do not need long runways. Most of these domestic airlines can easily land on the runways that are there in other parts of Sri Lanka. So, this is something which is very important.

Sir, as in other airports, there has to be a method to fast track the formalities for Business and the First Class passengers for them to have a quick disposal or get out of the airport. We do not have that facility. That of course is a matter to be addressed by the Department of Immigration and Emigration. The Hon. Minster will certainly attend to that, if there is enough space. So, these are matters that come to our notice, the complaints that we get.

Regarding general training of the staff, courtesy towards the passengers should be improved. This is very important. What is the first impression that a foreigner who comes to this country gets if he is not well treated with a smile? That is what is most required.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
The Immigration Officers.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Particularly, the Immigration Officers are very cussed. Sir, you and I do not realize it because we go through the VIP Lounge. But those who come via the normal channel are really upset because sometimes, the Immigration Officers are not in their seats; a number of counters are empty or sometimes the Officer at the Immigration Counter is arrogant. Therefore, some form of courtesy training is necessary both for the Airport personnel as well as for the Immigration personnel.

Then, there is the question of touts as the Hon. Minister mentioned. It is a very important legislation that he has brought in. The problem of touts is there both within the Airport building and outside. Outside it is worst. I mean, there is a lot of pulling.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have only two minutes.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, give me more time. There are not many speakers today, so we have enough time. Anyway, I will finish my speech.

Then, we should also make available persons who could speak foreign languages at both Arrival and Departure Lounges. There are tourists who come from different parts of the world. We can deploy men and women who can speak foreign languages, particularly, German, French, Chinese, Japanese, Hindi, Spanish et cetera in order to facilitate the guests who are in need of information. From the tourists' point of view this is very important. In other countries, we find officers who can speak a particular language will be there when a flight arrives and if any inquiry is made, they are prepared to answer in that particular language. Many people who come here do not know English, particularly the Chinese; they do not know English at all. Even I have requested the travel agents to see whether they could find such people. We can get them permits and place them closer to the immigration counters in order to facilitate tourists. These are some of the ideas that we have.

The Sri Lankan Government today is very much dependent on tourism. We are looking forward to tourism as the second largest foreign exchange earner to this country. To do that, the first impression of the airport must be improved. I think the Hon. Minister is doing his very best, but he has his own limitations. We have to depend on foreign loans and aid for development and in such a situation, these things come up.

Finally, I would like to thank the President for taking a firm stand in order to clear the Mirissa and the Negombo beach problems, where the beach boys had encroached on the beach preventing the free movement of tourists. We also brought to the notice of the authorities concerned the harassment they had meted out. Coast Conservation authorities, I saw today in the newspapers, had finally decided to go to places like Mirissa, Negombo and Ahungalla in order to clear the obstacles that are there. It is very important. If not, a tourist who comes once will not come again. They are assaulted; they are harassed; their wealth is squandered. This type of things must be stopped. If you want to develop tourism, you must have regulations and proper management of the seafront and all other places of tourist interest.

I wish the Hon. Minister luck in order to implement these proposals. I am sure he will do his very best in the near future in order to facilitate tourism in this country. Thank you.

[පූ.භා.11.47]

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතට සංශෝධන ගෙන එන මේ අවස්ථාවේ මටත් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳ මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මෙම සංශෝධන ඉතාම වැදගත් වන නිසා, මෙම මාතෘකාවට එන්න කලින් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළව ගැටලු කිහිපයක් පිළිබඳව මා වවන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ මධ්‍යම රාත්‍රියේ සිට අපේ රටේ පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් මිල වැඩිවුණා. ඒ අයුරින් තෙල් මිල වැඩිවීමත් සමඟ අද සෑම අංශයක් තුළින්ම ජනතාව තවත් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. එක පැත්තකින් ප්‍රවාහන ගාස්තු වැඩි වනවා වාගේම, අනෙක් පැත්තෙන් භාණ්ඩ හා සේවාවන් සියල්ලකම මිල ගණන් මේ තුළින් වැඩි වෙලා තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වුණා නම්, ඒකට සමානුපාතිකව අපේ රටෙත් ඉන්ධන මිල වැඩි කරන්න සිදු වෙනවා. නමුත්, මේ වාගේ විශාල ප්‍රමාණයකින් මිල වැඩි කිරීම තමයි අද ගැටලුව වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2014 අවුරුද්ද ගත්තොත්, බොරතෙල් බැරලයක මිල ඩොලර් 140ක් දක්වා ඉහළ ගිය අවස්ථාත් තිබුණා. එහෙම තිබිලා තමයි 2015 ජනවාරි මාසයේ මේ රජය බලයට පත්වෙනවාත් එක්කම බොරතෙල් බැරලයක මිල සියයට 36කින් අඩු වුණේ. ඉතින් එහෙම අඩු වුණාම එම අඩු වන ප්‍රමාණයටම; අඩු වන ප්‍රතිශතයටම අපේ රටේ පෙට්‍රල් මිල, එහෙම නැත්නම් ඩීසල් මිල අඩු කළා නම් ඒක ඉතාම වැදගත් වෙනවා.

නමුත්, බොරතෙල් බැරලයක මිල සියයට 36කින් අඩු වෙන විට එදා නව රජයට ඉන්ධන මිල අඩු කරන්නට පුළුවන් වුණේ සියයට 20ක් 22ක් වාගේ ප්‍රමාණයකින් පමණයි. උදාහරණයක් හැටියට කියනවා නම් 2014දී බොරතෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 146ක් වුණාට, 2009දී තෙල් බැරලයක මිල තිබුණේ ඇමෙරිකානු ඩොලර් 85යි. එදා 2009 තෙල් බැරලය ඇමෙරිකන් ඩොලර් 85ට තිබෙන විට පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 115යි. 2018 අද වනවිට බොරතෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 75 වන විට පෙට්‍රල් ලීටරයක මිල තිබෙන්නට ඕනෑ රුපියල් 110ට. ඒක රුපියල් 110ට තිබුණා නම් සාධාරණයි. නමුත්, අද වන විට පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 137ක් බවට පත් වෙලා තිබෙනවා.

මේ රජය ණය ගැන කථා කළාට, තෙල් මිල අඩු වීමත් සමඟ වසර තුනක් ඇතුළතදී එක වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් බිලියන 2ක පමණ ඉතිරියක් කරන්නට රජයට හැකියාව ලැබිලා තිබෙනවා. මේ වසර තුන අවසන් වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක පමණ ඉතිරියක් සිදුවෙලා තිබෙනවා. නමුත්, ඒ ඉතිරියෙන් මොකක්ද මේ රටට වුණු සෙත? එහෙම නැත්නම් ඒ සෙත ජනතාවට ලබා දුන්නාද කියන එක තමයි අද වැදගත් වෙන්නේ. විශේෂයෙන්ම ඉන්ධන මිල වැඩි කිරීමට හේතුව වන්නේ, එක පැත්තකින් ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යාම සහ ඩොලරයේ මිල ඉහළ යාම, එහෙම නැත්නම් රුපියල අවප්‍රමාණය වීමයි. ඒක තමයි ඇත්ත කථාව. රුපියල බාල්දු වීම නිසා තමයි අද පෙට්‍රල් ලීටරයකට රුපියල් 137ක් පමණ ගෙවන්නට සිදු වෙලා තිබෙන්නේ.

ආණ්ඩුවේ සමහර නායකයන් ඊයේ මාධ්‍යයට අදහස් ප්‍රකාශ කරනවා මා දැක්කා. අදත් පෙට්‍රල් ලීටරයක මිල රාජපක්ෂලාගේ කාලයේ තිබුණාට වඩා අඩුයි කියලා කිව්වා. තවමත් රාජපක්ෂ කාලයේ තිබුණාට වඩා අඩු මිලකටයි පෙට්‍රල් ලීටරය ලබා දෙන්නේ කියලා කිව්වා. නමුත්, මා සඳහන් කළ ආකාරයට එදා බොරතෙල් බැරලයක මිල සහ අද බොරතෙල් බැරලයක මිල සංසන්දනය කළාම එහි වෙනසක් තිබෙනවා. ඕනෑම මී හරකෙකුට තේරෙන දෙයක් තමයි අද මේ ආණ්ඩුවේ සිටින නායකයන්ට තේරෙන්නේ නැත්තේ. සාමාන්‍ය පෙළ ගණිතය සමත් නම්, මෙය ඕනෑම කෙනෙකුට තේරුම් ගන්නට පුළුවන් කාරණයක්.

ප්‍රවාහන අමාත්‍යවරයා හැටියට ඔබතුමාට ඉදිරියේ දී මේ සම්බන්ධව කටයුතු කරන්නට සිදු වෙනවා. මොකද, ප්‍රවාහන ගාස්තු -බස් ගාස්තුව, දුම්රිය ගාස්තුව, ත්‍රී වීලර් ගාස්තුව- වැඩි වුණාම ඔබතුමාට ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී වැඩ කටයුතු රාශියක් කරන්නට සිදු වනවා කියන කාරණය අපි මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. එදා සාමාන්‍ය ජනතාවට, මධ්‍යම පන්තියට තමයි තෙල් මිල ටිකක් වැඩි වුණාම ඇහට දැනුණේ කියන එක අපි දැක්කා. නමුත් අපි ඊයේ දැක්කා, කොළඹ ප්‍රදේශයේ මධ්‍යම පන්තියේ අය පමණක් නොවෙයි, ඉහළ පන්තියේ අය පවා අද මේ ආකාරයට තෙල් මිල වැඩි වීම නිසා අපහසුතාවට පත්වෙලා සිටි ආකාරය. ඒ අනුව සෑම පන්තියක්ම මේ රජය විසින් අද අපහසුතාවට පත් කරලා තිබෙනවා. මේ ආණ්ඩුව ඇවිල්ලා මිල සූත්‍රයක් ගැන කථා කළා. නමුත් අද වනතුරු මිල සූත්‍රයක් ක්‍රියාත්මක කරලා නැහැ. අඩුම තරමින් තෙල් මිල තව ටිකක් අඩු කරලා දුන්නා නම්, මීට වඩා ගැටලු ප්‍රමාණය අඩු වෙන්න පුළුවන්කම තිබුණා.

කෙසේ වෙතත්, අද ඉදිරිපත් කර තිබෙන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත ඉතා වැදගත් වනවා. පසුගිය අය වැය විවාදයේදී ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරද්දි තැරැව්කරුවන්ගෙන් වන මේ අපහසුතාවන් පිළිබඳව මම කථා කළා. සංචාරකයන් වෙන්න පුළුවන්; සාමාන්‍ය මගීන් වෙන්න පුළුවන්; විශේෂයෙන්ම අපේ රටට වැඩිම විදේශ විනිමය ගෙන එන අරාබිකරයේ වැඩ කරන ගෘහ සේවිකාවන් ඇතුළු ශ්‍රමිකයන් වෙන්න පුළුවන්; ඒ සියලුදෙනාම මේ හේතුව නිසා නොයෙකුත් අපහසුතාවන්ට ලක් වෙනවා. ඒ නිසා අද දින මෙම සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන ඒම ඉතාම වැදගත් වනවා. ඒ වාගේම තව එක් කාරණයක් සම්බන්ධයෙන් අපි ඔබතුමාව දැනුවත් කරන්නට ඕනෑ. පසුගිය දවස්වල රූපවාහිනිය වාගේම සමාජ ජාලවලිනුත් අපි දැක්කා, තැරැව්කරුවන් වාගේම ආරක්ෂක සේවයේ යෙදී සිටින නිලධාරිනුත් සමහර වෙලාවට නොයෙකුත් ගැටලු ඇති කරපු අවස්ථා තිබුණා. හැම කෙනාම ගැන කියනවා නොවෙයි. ආරක්ෂක සේවා සපයන නිලධාරින්ට මේ පනත් කෙටුම්පත තුළින් බලය පවරා තිබෙනවා වාගේම, අනෙක් පැත්තෙන් තැරැව්කරුවන් blackmail කරන්නත් ඒ අයට පුළුවන්. Duty-free වෙළෙඳ සැල්වල වැඩ කරන අයට කියන්න පුළුවන්, "මුදලක් දුන්නේ නැත්නම් අපිට ඔයගොල්ලන්ව බොරුවට හෝ අත් අඩංගුවට ගන්න පුළුවන්" කියලා. ඒ නිසා එම කාරණය පිළිබඳවත් ඔබතුමන්ලා හොයලා බලන්න. සියලුදෙනාම නොවෙයි. නමුත් සමහර අය ඉන්නවා; නීතියට හසු වී නැති සමහර ආරක්ෂක නිලධාරින් ඉන්නවා. ඒ නිසා ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මෙම කටයුත්තට පොලීසිය සහ ආරක්ෂක නිලධාරින් වාගේම ගුවන් හමුදාවත් සම්බන්ධ කර ගත්තොත්, එය ඉතාම වැදගත්ය කියන කාරණයත් මම මේ අවස්ථාවේදී කියනවා.

ගරු ඇමතිතුමනි, අද සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කරමින් ඔබතුමා කළ කථාවේදී ඔබතුමන්ලා ලැබූ ලාභ පිළිබඳව සඳහන් කළා. අද වනවිට කටුනායක ගුවන් තොටුපොළින් විශාල ලාභයක් ලැබීම පිළිබඳව ඇත්තටම අපි සතුටු වෙනවා. එහි වැඩ කරන සියලුම නිලධාරින් -ආරක්ෂක සේවයේ යෙදී සිටින අය වෙන්න පුළුවන්, කළමනාකරණ සේවයේ යෙදී සිටින අය වෙන්න පුළුවන්- තමයි මෙසේ ලාභයක් ගෙන ඒම සඳහා කටයුතු කරන්නේ. මේ ආකාරයට ලාභය මොන තරම් ප්‍රතිශතයකින් වැඩි වුණත්, සෑම වර්ෂයකදීම ඔවුන්ට බෝනස් එක ලබා දෙන කාලය වෙනකොට, එහි සේවය කරන සියලුදෙනාටම එය ලබා ගැනීම සඳහා උද්ඝෝෂණය කරන්න වෙනවා. එහෙම නැත්නම්, "Airport එක වහනවා" කියන තැනට ආවාට පසුව තමයි ඒ ගොල්ලන්ගේ බෝනස් එක ලබා දෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා එසේ මහන්සි වෙමින් ගුවන් තොටුපොළ වෙනුවෙන් කටයුතු කරන ඒ සියලුදෙනාටම බෝනස් එක හරි වේලාවට ලබා දෙන්න කියාත් මා ඉල්ලීමක් කරනවා.

[ගරු කනක හේරත් මහතා]

ගරු ඇමතිතුමනි, ගුවන් පථය පිළිබඳවත් පසුගිය දිනවලදී මම පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. ලෝකයේ ලොකුම ගුවන් යානා වර්ගය වන ඒ-380 වර්ගයේ ගුවන් යානා ගොඩ බස්සන්න පුළුවන් වන ආකාරයට මෙම ගුවන් පථය සකස් කළාට, එහි පළලෙහි ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව තවදුරටත් සොයා බලන්න කියාත් මා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම සිවිල් ගුවන් සේවා අධිකාරිය පිළිබඳවත් මා කථා කරන්න ඕනෑ. මොකද, ඉදිරියේදී -මේ වර්ෂයේ ජූලි මාසයේදී- ICAO විගණනය පවත්වනවා. ඒකට සූදානම්ද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. මොකද, 2010 වර්ෂයේදී මෙම විගණනය සිදු කරනකොට, මා එහි සේවය කළා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපි කටයුතු කළ ආකාරය මා දන්නවා. නමුත් අපිට ලැබෙන ආරංචි අනුව අද වනවිට මේ සඳහා කිසිම සූදානමක් නැහැ කියන එක තමයි අපට හැඟී යන්නේ. 2010දී පැවැති විගණනයෙන් අපි ආසියාවේ හතරවැනි ස්ථානයට පැමිණියා; දකුණු ආසියාවේ පළමුවැනි ස්ථානයට පැමිණියා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන කියන්නම්. අපි එම විගණනයට සම්පූර්ණයෙන් සූදානම්. අදත් මෙතැනට එන්නේ නැතුව එම වැඩ කටයුතු කරන්න කියා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපතිතුමාට මම කිව්වා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ඒක හොඳයි. මොකද, තිබෙන ගැටලු නිසා එහෙම කරන එක හොඳයි. ඉදිරියේදී අපි ඒ ගැන බලමු. ජූලි මාසයෙන් පසුව ලැබෙන ප්‍රතිඵලයත් සමඟ අපිට ඒ පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්. නමුත් එම audit එකෙන් "ෆේල්" වුණොත්, ගැටලුවක් ඇති වෙනවා. ඒක තමයි ශ්‍රීලන්කන් ගුවන් සමාගමේත් වෙලා තිබෙන්නේ. EASA Part - 147 අනුමැතිය අපට නැති වුණේ ඒ නිසායි. අපි සියල්ලක්ම සූදානම් කියලා හිටියා. අවසානයේ audit එක "ෆේල්" වුණ නිසා තමයි අපිට එය නැති වුණේ. ඒකෙන් විශාල පාඩුවක් සිදු වුණා. ගරු ඇමතිතුමනි, එම නිසා මේ පිළිබඳව මීටත් වඩා හොඳින් සොයා බලා කටයුතු කරන්න කියන ඉල්ලීමත් මම ඔබතුමාගෙන් කරනවා.

ඊළඟට, සිවිල් ගුවන් සේවා අධිකාරිය ගැනයි මම කියන්නේ. සිවිල් ගුවන් සේවා අධිකාරිය කියන්නේ, Airport & Aviation Services (Sri Lanka) Limited එකටත් වඩා තාක්ෂණ නිලධාරින් සේවය කරන ස්ථානයක්. එහි සේවය කරන තාක්ෂණ නිලධාරින්ට හරියාකාරව පහසුකම් සලසා නොදීමත්, සුදුසුකම් අනුව උසස්වීම් ලබා නොදීමත් නිසා ඔවුන් බොහෝදෙනෙක් සේවය හැර යන්න පුළුවන්. ඒ පිළිබඳව සොයා බලන්න. එහි සේවය කරන තරුණ, ජව සම්පන්න හා සුදුසුකම් තිබෙන අය වෙනත් රටවලට යද්දි, විශ්‍රාම ගිය, අවුරුදු 60 - 70 පැනපු අපේ රටේ අය නැවතත් contract පදනම මත සේවයට ගන්නවා. ගරු ඇමතිතුමනි, එම නිසා ඒ පිළිබඳවත් සොයා බලන්න කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශයට අදාළ නැති වුණත් ශ්‍රීලන්කන් ගුවන් සමාගම පිළිබඳවත් මා සඳහන් කළ යුතුයි. ශ්‍රීලන්කන් ගුවන් සමාගම පිළිබඳව අපි නිතරම කථා කරනවා. එම ගුවන් සමාගම දිනෙන් දින පාඩුවෙන් පාඩුවටම යනවා. එහි පාඩුව එන්න එන්නම වැඩි වෙලා තිබෙන්නේ, ආයතනයේ විධිමත් කළමනාකරණයක් නොමැතිකම නිසායි. කරුණු හොයාගෙන යද්දි සමහර වෙලාවට ගුවන් යානා භාවිත කරන විධියත් වැරදියි කියලා දැන ගන්න ලැබුණා. ඒ කාරණය පිළිබඳවත් මේ ගරු සභාව දැනුවත් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෙටි ගුවන් ගමන් සඳහා ලොකු ගුවන් යානා යවනවා. දුර ගුවන් ගමන් සඳහා යවන්නේ පොඩි ගුවන් යානායි. ඒකෙන් ලොකු පාඩුවක් වෙනවා. තාක්ෂණික වශයෙනුත් ඒකෙන් ලොකු පාඩුවක් වෙනවා. මේ පිළිබඳවත් සොයා බලන්න කියා අපි අදාළ අමාත්‍යාවරයාගෙන් ඉල්ලා සිටිනවා. මේ ආයතනය පාඩු ලබනවා කියනවා. හැබැයි, පාඩුව තවත් වැඩි කරන්න අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරනවා; විශේෂයෙන්ම විධායක අධ්‍යක්ෂ - CEO - කටයුතු කරනවා. ඒ පිළිබඳවත් සොයා බැලිය යුතුයි.

පසුගිය කාලයේ කල්බදු ක්‍රමයට, එහෙම නැත්නම් wet lease ක්‍රමයට, පාකිස්තානු ගුවන් සමාගමට ගුවන් යානයක් ලබා දුන්නා. ඒ ගුවන් සමාගම අවුරුදු කීපයක් wet lease එක යටතේ එම ගුවන් යානය තියාගෙන නැවතත් අපිට එය ලබා දුන්නා. නමුත්, අපිට මුදල් ලබා දුන්නේ නැහැ. ඒකෙන් අපට බිලියන ගණනාවක පාඩුවක් වුණා. ඒ විධියටම නැවතත් අපේ ගුවන් යානා තුනක් තුර්කි ගුවන් සමාගමට ලබා දෙන්න කටයුතු කරනවා. මේ පිළිබඳවත් සොයා බලන්න කියා අපි විශේෂයෙන්ම අදාළ අමාත්‍යවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

අපේ මේ ගුවන් සේවාව තවදුරටත් දියුණු කර ගන්න අපිට හැකියාවක් තිබෙනවා. නමුත් ඒ සඳහා මේ රජය ගෙන යන වැඩ පිළිවෙළ සාර්ථක නැහැ. ඒ පිළිබඳ තව තවත් සොයා බලා කටයුතු කරන්නය කියා ඉල්ලීමක් කරමින්, මේ අවස්ථාවේදී මේ සංශෝධනය පිළිබඳව අපේ සතුට ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.02]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සිවිල් ගුවන් සේවා පනතට අද ගෙනෙන මේ සංශෝධනය ගැන අපට කීමට ඒ තරම් විශේෂ දෙයක් නැහැ. නමුත් මේ තැරැව්කාර රක්ෂාව - touting - මේ රටේ නොවිධිමත් ආර්ථිකයේ ඉතා බලවත් සාධකයක් බව නීතිඥ වෘත්තියේ කටයුතු කළ අයකු හැටියට ගරු ඇමතිතුමා දන්නවා. මේ තැරැව්කාරයෝ එක්තරා විධියක කාර්ය භාරයක් ඉටු කරනවා. මෙය මිනිසුන්ට කරදරයක් නොවන ආකාරයට සිදු කළ හැකි කටයුත්තක් හැටියට සංවිධානය කළ හැකි නම්, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Kanaka Herath to the Chair?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

I propose that the Hon. Kanaka Herath do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු කනක හේරත් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. KANAKA HERATH *took the Chair.*

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තැරැව්කාරකමින් ප්‍රතිලාභ විඳින්නට පුළුවන් අයට පහසුවක් ඇති වන ආකාරයට සංවිධානය කිරීමේ හැකියාව ගැනත් ගරු ඇමතිතුමා සලකා බැලිය යුතුයි කියායි මා හිතන්නේ. ඔවුන්ට බලපත්‍ර ලබා දීමත් නිසියාකාර කොන්දේසිවලට යටත්ව සිදු කළ හැකි වනවා නම් එහි ප්‍රයෝජනයක් තිබෙනවාය කියා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවන කාරණය මෙයයි. මත්තල ගුවන් තොටුපොළ ඉදි කිරීමත් සමඟ පසුගිය ආණ්ඩුවේ සැලැස්මක් තිබුණා. මත්තල ගුවන් තොටුපොළ සවුදි අරාබි ගුවන් සේවාවේ කේන්ද්‍රස්ථානයක් කර ගෙන මේ කලාපයේ ඔවුන්ගේ ගුවන් ගමන් සේවාවන් විහිදු වීම ගැන අදහසක් තිබුණා. එය කරණකොට ලැබෙන ආදායමින් මත්තල ගුවන් තොටුපොළට ගිය වියදම ගෙවා නිම කරන්න පුළුවන් වෙයි කියා බලාපොරොත්තුවකුත් තිබුණා. නමුත්, ඒ වැඩ පිළිවෙළ අත්හැර දමා තිබෙන්නේ මත්තල ගුවන් තොටුපොළ විකුණා දැමීම කියන අදහසත් එක්කයි. අගමැතිතුමාගේ ආර්ථික වැඩ සැලැස්ම අනුව එතුමා නිතරම කල්පනා කරන්නේ මේවා විකුණා දැමීම හා එයින් ක්ෂණිකව ආදායමක් ලබා ගැනීම ගැනයි. නමුත්, ගරු ඇමතිතුමනි, ඒ වෙනුවට අපේ අයිතිය රැක ගනිමින්, අපේ ගුවන් තොටුපොළවල් හා අපේ රටේ පිහිටීම ප්‍රයෝජනයට ගනිමින්, ගුවන් සේවා කර්මාන්තයේ යම් කේන්ද්‍රස්ථාන බවට අපේ රටේ ගුවන් මධ්‍යස්ථාන -ගුවන් තොටුපොළවල්- පත් කර ගැනීමට තිබෙන හැකියාව ගැන ඔබතුමා සලකා බැලීම වැදගත් වෙනවා, විකුණා දැමීමේ හැකියාව ගැන බලනවාට වඩා. දැන් කාරණා දෙකක් නිසා මත්තල ගුවන් තොටුපොළ ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හැටියට තිබීමේ වටිනාකම පෙනෙනවා. ඉන් එක කාරණයක් තමයි, මේ මෑතකදී ලෝකයේ ලොකුම ගුවන් යානය හදිසියේ ගොඩ බෑම සිද්ධ වුණේ මත්තල ගුවන් තොටුපොළට වීම. දැන් එවැනි අවස්ථා අපිට සැලකීමට ගන්න වෙන්නේ ඇයි? ලංකාවේ ගුවන් පථ -runways- හරහා විශාල ගුවන් යානා ගමන් කරන්න පටන් ගත්තේ මත්තල ගුවන් තොටුපොළ හැදුවාට පසුවයි. ඒ අනුව, හදිසියේ ගොඩ බෑමකට අවශ්‍ය වුණොත් ඒ සඳහා සුදුසු ස්ථානයක් ලංකාවේ තිබෙනවාය කියන විශ්වාසය උඩ ලංකාවට උඩින් මේ විශාල ගුවන් යානා දකුණු දිග ඉඳලා, ඕස්ට්‍රේලියාව පැත්තේ ඉඳලා ගමන් කරනවා කියලායි මට ලැබී තිබෙන තොරතුරු අනුව දැන ගන්න තිබෙන්නේ.

ඇත්තටම ලංකාවේ ගුවන් පථ -runways- හරහා ගමන් කිරීමට ලැබෙන අයිතිවාසිකම උඩ අපිට කොච්චර ආදායමක් ලැබුණාද කියා ඉලක්කම් වශයෙන් කියන්න මම දන්නේ නැහැ. නමුත් අපේ ගුවන් පථය ප්‍රයෝජනයට ගැනීමෙන් ලැබෙන ආදායමත් එක්ක බැලුවාම, මත්තල ගුවන් තොටුපොළ එයට විශාල සාධකයක් වී තිබෙන බව පෙනී යනවා.

ඇත්තටම අපේ ලංකාවේ පිහිටීම අනුව දකුණු පළාතේ සංචාරක කර්මාන්තයේ වර්ධනයත් එක්ක බැලුවාම, මත්තල ගුවන් තොටුපළට අයත් වන වැදගත් ස්ථානය, මත්තල ගුවන් තොටුපළෙහි තිබෙන වටිනාකම විශේෂඥයන්ගේ මතයන් අනුව නිගමනය කළ යුතුයි කියා මා හිතනවා. මත්තල ගුවන් තොටුපළෙහි ගුවන් කර්මාන්තයේ වටිනාකම තක්සේරු කිරීම සඳහා අපි ඊට ගැළපෙන දැනුම ඇති පුද්ගලයන් පත් කරලා අධ්‍යයනයක් කරලා බලන්නට ඕනෑ. බහුබූතයෝ ද්වේෂයෙන් යුතුව දේශපාලන බහුබූත කථා කීම උඩ සහ අපේ ගුවන් තොටුපළවල් වී ගබඩා බවට පත් කිරීමට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අගමැතිවරයෙක් ක්‍රියා කිරීම නිසා එහි වැදගත්කම පිළිබඳ සාකච්ඡාව සම්පූර්ණයෙන්ම නැති වී ගොස් තිබෙනවා. එම නිසා මේ පිළිබඳව නැවත සිතා බලන්න ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාට වග කීමක් තිබෙනවාය, හැකියාවක් තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා.

කටුනායක ගුවන් තොටුපළේ තිබෙන ලාභදායීතාව එන්න එන්නම වැඩි වෙනවා. ඒක ඉතාම හොඳ ලක්ෂණයක් වාගේම අපේ සතුටට කරුණක්. කටුනායක ගුවන් තොටුපළේ ආදායම වැඩිවීමත් එක්ක අපේ පසු ගිය ආණ්ඩුව කාලයේ වගකීම් දැරූ ඇමතිවරු ගුවන් තොටුපළ සේවකයින් සමඟ එකහත්වයකට ආවා, අවුරුදු තුනකට වරක් ඔවුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රතිශෝධනයක් කිරීමට සලකා බැලීමක් කරනවා කියලා. ඒ අනුව ක්‍රියා නොකිරීම නිසා තමයි එතැන යම් සේවක අර්බුදයක් මතු වුණේ. එම නිසා අපේ ආණ්ඩුව කාලයේ ඇති කරගත් යහපත් අදහස් ක්‍රියාත්මක කිරීම දිගටම -නොකඩවා- කිරීමෙන් සේවක අර්බුද ඇති වීම වළක්වා ගන්න අපට පුළුවන්ය කියන එක මා පෙන්වා දෙන්න කැමැතියි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ සිවිල් ගුවන් සේවා ප්‍රශ්නයට සම්බන්ධයක් තිබෙන නිසා පමණක් නොවෙයි, මිල වැඩිවීම් පිළිබඳ ප්‍රශ්නය ඊයේ මේ රටේ ප්‍රධානම ප්‍රවෘත්තිය බවට පත්වීම නිසා ඉන්ධන මිල පිළිබඳව මේ වෙලාවේ සාකච්ඡාවට ගැනුණා.

ඔබතුමන්ලාගේම හිටපු ඇමතිවරයා කියන හැටියට ඉන්ධන සඳහා මේ ආණ්ඩුවෙන් බදු සහනයක් ලැබෙනවා නම් මිල ගණන් වැඩි කරන්න වුවමනා වෙන්නේ නැහැ. ඒකටම තවත් කාරණයක් එකතු කරන්න මා කැමැතියි. අපේ ලංකා ඛනිජ තෙල් සංස්ථාව නැව්වලට තෙල් සැපයීම -bunkering - මණින් විශාල වශයෙන් විදේශ මුදල් ඉපයීමක් කළා. ඒ දවස්වල ලංකා ඛනිජ තෙල් සංස්ථාවට නැව්වලට තෙල් සැපයීමේ ඒකාධිකාරයක් තිබුණා. චන්ද්‍රිකා මැතිනිය බලයේ සිටි වෙලාවේ ඒ ඒකාධිකාරය කඩා බිඳ දමලා නැව් තෙල් සැපයීමේ කාර්යය කොම්පැනිකාරයන්ට පවරමින් වරායේ අක්කර හතක පමණ ප්‍රමාණයක් -කිසිම වටිනාකමක් ලබා ගන්නේ නැතුව- ඒ කොම්පැනිකාරයන්ගේ ප්‍රයෝජනයට ලබා දෙන්නට යෙදුණා. නැව් තෙල් සැපයුම ආපසු ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ගන්න පුළුවන් නම්, ලංකා ඛනිජ තෙල් සංස්ථාවට නිසඟයෙන්ම තිබෙන අයිතිය ලිහිසි තෙල්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කර්මාන්තයේදී පාවිච්චි කරනවා නම්, තෙල් මිල වැඩි කරන්න ඕනෑ නැහැ. අද ඒවා අපි කොම්පැනිකාරයන්ට දීලා තිබෙනවා. ඒවා තමයි පසුගිය කාලයේ අපි මේ රටේ අනුගමනය කරපු වැරදි ප්‍රතිපත්ති. ලිහිසි තෙල් කර්මාන්තයත්, නැව් තෙල් සැපයුම තුළින් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ලබාගත හැකි ආදායම අපි ලබා ගන්නවා නම්, තෙල් මිල වැඩි කිරීමක් කරන්න වුවමනා වෙන්නේ නැහැ.

ඊළඟට, මම තවත් කාරණයක් කියන්න කැමතියි. අපේ සිරිමාවෝ මැතිනියගේ ආණ්ඩුව කාලයේ -අපේ ආණ්ඩුව කාලයේ - Mobil, Caltex, Shell කියන විදේශ සමාගම් සතුව ලංකාවේ තෙල් බෙදා හැරීමේ කර්මාන්තය තිබුණා. ලංකා ඛනිජ තෙල් සංස්ථාව පිහිටුවීමත් සමඟ ඒ තෙල් බෙදා හැරීමේ කටයුත්ත - කාර්යය- එම ආයතනය යටතට ගත්තා. එය මහ ලොකු ප්‍රාග්ධනයක ප්‍රශ්නයක් එන එකක් නොවෙයි. ඒ වාගේම තෙල් බෙදා හැරීමේ කාර්යය සඳහා ඒ තරම් විශාල තාක්ෂණික දැනුමක ප්‍රශ්නයකුත් නැහැ. ඒ නිසා ඒ කර්මාන්තය ජනසතු කළා. ජනසතු කරලා ලංකාවේ තෙල් බෙදා හැරීමේ කර්මාන්තය ඛනිජ තෙල් සංස්ථාව යටතට ගත්තා.

තෙල් බෙදා හැරීම මඟින් ලොකු ආදායමක් ලැබුවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව Lanka Indian Oil Company එකට තෙල් බෙදා හැරීමේ කොටසක් බාර කළා. ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ අයිතියත් එසේ කොම්පැනි ක්‍රමයකට හරවලා Lanka Indian Oil Company එකට දුන්නා. මට ඉන්දියාව එක්ක විරෝධයක් නැහැ. මම කියන්නේ, ලංකාවේ අපට තිබුණු ආදායම් මාර්ගයක් අපි ඉන්දියන් කොම්පැනියකට දුන්නා කියන එකයි. අපේ ලංකා ඛනිජ තෙල් සංස්ථාවට තිබුණු ආදායම අහිමි කර ගත්තේ නැත්නම්, තෙල් මිල ඉහළ ගියත් ආණ්ඩුව යම් ආකාරයකට ඒ වියදම දරා ගනිමින් ඇත්තටම සාධාරණ මිලකට තෙල් සපයන්න පුළුවන්. එහෙම දරා ගන්න පුළුවන් වන්නේ ආණ්ඩුව ආදායම් ලබනවා නම් පමණයි. ලංකා ඛනිජ තෙල් සංස්ථාවට තිබුණු ආදායම් අපි ආරක්ෂා කළා නම්, තෙල් මිල වැඩි වෙන වෙලාවක වුණත් මහ ජනයාට බරක් නොවන ආකාරයට තෙල් මිල නියාමනය කිරීමට අපට පුළුවන්කමක් තිබුණා. ඒ සියලුම හැකියාවන් නැතිවී යන ආකාරයට, අපේ ආදායම් මාර්ග අපට අහිමි වන ආකාරයට, ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ ආදායම නැති වන ආකාරයට පසුගිය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ක්‍රියා කිරීම නිසා අපට විශාල හානියක් වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලයේ සිදු කරපු හානියෙන් අපට ගැලවෙන්නට තවත් පියවර කීපයක්ම ඉදිරියට තබන්න වෙලා තිබෙනවා. අනාගතය සම්බන්ධයෙන් ක්‍රියා කරන විධිය ගැන අපට කල්පනා කරන්න වෙනවා. මේ කරුණත් මතක් කරමින් මගේ කථාව අවසන් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2015 වාර්ෂික වාර්තාව පමණයි තවමත් අපේ පාර්ලිමේන්තුවේ පුස්තකාලයේ තිබෙන්නේ. 2015න් පසුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව තවමත් අපේ පුස්තකාලයට ඇවිත් නැහැ. ඒ නිසා ඔබතුමා 2016 ගැන, 2017 ගැන සිවිල් ගුවන් සේවා අධිකාරිය සම්බන්ධයෙන් දුන්නාවූ තොරතුරු අපට දැනගන්න විධියක් නැහැ. 2015 වර්ෂයේදී විය යුතුයි කියා විගණකාධිපතිතුමා ඉදිරිපත් කරපු නිරීක්ෂණ 4ක් තිබෙනවා. පසුගිය වසරවල වාර්ෂික වාර්තා තවමත් ඇවිත් නැති නිසා ඒ නිරීක්ෂණ අනුව සිවිල් ගුවන් සේවා අධිකාරිය කටයුතු කර තිබෙනවා ද කියන එක අපට දැනගන්න තවමත් විධියක් නැහැ. එසේ කියමින් මගේ වචන ස්වල්පය මෙතැනින් අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.16]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී විෂය භාර ගරු අමාත්‍යතුමාත් සභාගර්භයේ සිටින නිසා මේ අමාත්‍යාංශය සහ ගුවන් සේවා ක්ෂේත්‍රයේ අද ඇතිවෙලා තිබෙන තත්ත්වයන් පිළිබඳව යම්කිසි පැහැදිලි කිරීමක් කිරීමේ අවශ්‍යතාව පැන නැඟිලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත් අවුරුදු ගණනාවක් තිස්සේ -දීර්ඝ කාලයක් තිස්සේ- අපේ රටේ ගුවන් නියමුවන්ගේ ප්‍රධාන අවශ්‍යතාවක් වෙලා තිබුණු දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළ අද වන විට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා නිර්මාණය කරලා තිබෙනවා. අපේ පසුගිය ආණ්ඩුව මේ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ නිර්මාණය කිරීමේදී එවක විපක්ෂයට එහි වටිනාකම තේරුණේ නැහැ. ඉන් පසුව ඔවුන් ආණ්ඩු බලය ගත්තාට පස්සේදීත් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ වී ගබඩා කරලා එහි වටිනාකම තේරුම් ගන්නේ නැතිව ක්‍රියා කරපු ආකාරය අපි දැක්කා. නමුත්, අද වන විට වර්තමාන අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සහ ඒ සියලු දෙනා එහි වටිනාකම තේරුම් අරගෙන තිබෙනවා කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේත් මේ ක්ෂේත්‍රයේ හිටපු කෙනෙක්. අවුරුදු ගණනාවක් තිස්සේ ගුවන් නියමුවන් අමතර ඉන්ධන අරගෙන ගියා. ඉන්දියාව තමයි අපට තිබෙන ළඟම රට. හදිසි අවශ්‍යතාවක් ඇති වෙලා ගුවන් යානයක් ඉන්දියාවේ ගුවන් තොටුපළකට ගොඩ බස්සන්න වුණොත් දැවැන්ත වියදමක් දරන්න වෙනවා. මොකක් හෝ හදිසි අවශ්‍යතාවක් ඇති වුණොත් අපට දෙවැනි ගුවන් තොටුපළක් තිබුණේ නැහැ. ඉන්දියාවේ තමයි අපට ළඟම ගුවන් තොටුපළක් තිබෙන්නේ. එහි ගුවන් යානයක් ගොඩ බැස්සවීමට යාමේදී විශාල මුදලක් වැය වෙනවා. එම නිසා මත්තල ගුවන් තොටුපළ ගුවන් ගමන් ක්ෂේත්‍රයට දැවැන්ත වටිනාකමක් එකතු කරලා තිබෙනවා, විශේෂයෙන් සිවිල් ගුවන් සේවා සැපයීමට. ඒ වාගේම මේ රටේ සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න නම් සෑම අභ්‍යන්තර ගුවන් තොටුපළක්ම විශාල වශයෙන් දියුණු කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සම්බන්ධයෙන් අද ඇති කර තිබෙන සංශෝධනවල වටිනාකමක් තිබෙනවා. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ නැවත වතාවක් සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරන්න, එහෙම නැත්නම් ගුවන් තොටුපළ විධිමත් කරන්න අවශ්‍යයි. අද එතැන සමහර වේලාවට වෙළෙඳ පොළක් වාගෙයි.

ගරු අමාත්‍යතුමනි, ගුවන් ගමනක් යන විට හෝ විදේශ රටකට ගොස් ආපසු එන විට මගීන් දැඩි ලෙස අපහසුතාවට පත් වෙනවා. ලංකාවට එනකොට අපට මුලින්ම හමුවන ආගමන විගමන දෙපාර්මේන්තුවේ නිලධාරින් රටට එන සංචාරකයින්ට හෝ මගීන්ට සුබ පතන්නේවත් නැහැ. තමන්ගේ භාණ්ඩ ටික නිදහස් කර ගන්න ගියාමත් විශාල තදබදයක් තිබෙනවා. ඒ දේවල් ප්‍රතිසංස්කරණය වෙන්න ඕනෑ. ඒ වාගේම ගුවන් තොටුපළ විධිමත් වෙන්න ඕනෑ කියලායි මම හිතන්නේ. ඒ සම්බන්ධව මේ පනතේ වටිනාකමක් තිබෙනවා. අපි එම ක්ෂේත්‍රය ගැන උනන්දුවක් දක්වන අය හැටියටයි මෙහෙම කියන්නේ.

ශ්‍රීලන්කන් ගුවන් සේවය ගැන කථා කළොත්, සමහර අය අද කියනවා, එමිරේට්ස් ගුවන් සේවය තිබුණා නම් හොඳයි කියලා. නමුත් එමිරේට්ස් ගුවන් සේවය මොකක්ද කළේ කියලා අපි දන්නවා. වත්කම් විකුණ විකුණා තමන්ගේ ලාභය පෙන්නුවා. අපි කියන්නේ අපේ රටේ මේ ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති අය එකතු කරගෙන ශ්‍රීලන්කන් ගුවන් සේවය හරියාකාරව පවත්වා ගෙන යන්න පුළුවන් කියලායි. ඒකට රජයේ මැදිහත් වීම අවශ්‍යයි.

ශ්‍රීලන්කන් ගුවන් සේවයේ අයථා කටයුතු විමර්ශනය කිරීමට මෙම රජය විසින් පත් කරන ලද කොමිසමේ වාර්තාව වන වැලිඅමුණ වාර්තාවේ නම් සඳහන් නිලධාරින් තවමත් ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ඉන්නවා. ශ්‍රීලන්කන් ගුවන් සේවයේ මානව සම්පත් කළමනාකරු ප්‍රදීප් කැකුණාවල, ශ්‍රීලන්කන් ගුවන් සේවයේ CEO වන තමුන්නාන්සේලාගේ චරිත රත්වත්තේ මහත්මයාගේ සහෝදරයා මේ ගුවන් සේවයට දැවැන්ත විනාශයක් කරලා තිබෙනවා කියලා මම හිතනවා. දැන් අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් නම් පත් කරලා තිබෙනවා. අඩුම ගණනේ මේ අයව ඉවත් කරලා මේ ගුවන් සේවය යථාවත් කිරීමට වැඩ කටයුතු කරන්න ඕනෑ කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් හැටියට අපි මේ කාරණය ගැනත් ලජ්ජා වෙනවා. ඊයේ නැවත වතාවක් මේ රටේ තෙල් මිල වැඩි කරනවා අපි දැක්කා. ඊයේ මුදල් ඇමතිතුමා කිව්වා, තෙල් මිල වැඩි කරලා ගන්න මුදලින් සංවර්ධන කටයුතු කරනවා කියලා. ඒ, ගුවන් සේවා වෙන්න පුළුවන්, ග්‍රාමීය සංවර්ධනය වෙන්න පුළුවන්. වැඩියෙන්ම කිව්වේ ග්‍රාමීය සංවර්ධනය ගැනයි. ග්‍රාමීය සංවර්ධන කටයුතු කරන්න මේ බිලියන 58ක මුදලක් යොදවනවා කියලා කිව්වා. ග්‍රාමීය සංවර්ධනය කරන්න ඉස්සෙල්ලා, පාරවල් හදන්න ඉස්සෙල්ලා මිනිසුන්ට කන්න දෙන්න ඕනෑ. මේ රටේ මිනිස්සු පුදුම දුකක් විඳින්නේ. අද වන විට මිනිස්සු වේලක් කාලා, වේල් දෙකක් බඩගින්නේ ඉන්න තත්ත්වයට ඇවිත් තිබෙනවා. මිනිසුන්ට ජීවත් වෙන්න පුදුම අමාරුකමක් ඇති වෙලා තිබෙන්නේ. අද සාමාන්‍ය දුප්පත් ගොවි, කම්කරු, ධීවර ජනතාව පමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍ය මධ්‍යම පාන්තිකයාත් අන්තිම පහළට වැටිලා තිබෙනවා. රජයේ සේවකයා පහළට වැටිලා තිබෙනවා. ප්‍රවාහන ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. ප්‍රවාහන කටයුතු සඳහා වැය යන වියදම වැඩියි. මිනිසුන්ට පුදුම අමාරුවක් තිබෙන්නේ.

ඊළඟට, බැංකු ක්ෂේත්‍රය ගැන බලමු. බැංකු ගැන කථා කරනකොට අපි ලජ්ජා වෙන්න ඕනෑ. අපේ රටේ බැංකු හොඳම ව්‍යාපාරික ආයතන දහය අතර ඉන්නවා. වැඩියම සල්ලි හම්බ කරලා, එහෙම නැත්නම් business කරලා, ආර්ථිකයේ ශක්තිමත්ම ආයතන හැටියට ගත්තාම අපේ රටේ බැංකු තමයි ඉදිරියෙන්ම ඉන්නේ. ලෝකයේ අනෙක් රටවල බැංකු එහෙම නැහැ. බැංකු කියන්නේ සේවා සපයන ආයතන. හැබැයි, ලංකාවේ බැංකු ලාභ උපයන, සම්පූර්ණයෙන්ම ජනතාව මත, එහෙම නැත්නම් තමන්ගේ ගනුදෙනුකරුවන් පිට මර්දනය ක්‍රියාත්මක කර - මම ඒකට කියන්නේ මර්දනය කියලා, - ඒ අයට බලපෑම් කරලා ලොකු ලාභ උපයාගෙන දැවැන්ත පිරිසක් අමාරුවේ දමා, සුළු පිරිසක් පෝෂණය කරන ආයතන බවට පත් වෙලා තිබෙනවා.

දැන් බලමු, CRIB එක ගැන. මම හිතනවා, අපි පාර්ලිමේන්තුවට CRIB එකේ වාර්තාවක් කැඳවන්නට ඕනෑ කියලා. CRIB එකේ වාර්තාවක් ගත්තොත්, ඒකේ රටේ ජනතාවගෙන් විශාල පිරිසක් ඉන්නවා. සමහර වෙලාවට ගත් ණය මුදල ගෙවා ගන්න බැහැ, සමහරක් වෙලාවට ණය මුදලක ඇපයට අත්සන් කරලා. අද බැංකු ණය සඳහා අය කරන පොලිය අධිකයි. අද සාමාන්‍යයෙන් TOD එකක පොලිය සියයට 27ක්. කොහොමද, ව්‍යාපාරයක් කරගෙන යන්නේ? ව්‍යාපාරයක් කර ගන්න බැහැ. ඇත්තටම ව්‍යාපාරිකයෝ සම්පූර්ණයෙන් වැටිලා. ව්‍යාපාරිකයෝ වැටෙන කොට ඒ අයගේ සේවකයෝ වැටෙනවා. අද සම්පූර්ණයෙන්ම රට වැටිලා තිබෙන්නේ.

ඊයේ ඉන්ධන මිල වැඩි වීම ගැන රූපවාහිනියට කථා කළ කාන්තාවක් කිව්වා, "විපක්ෂයට ගහන්නට ඕනෑ" කියලා. ඇයි? විපක්ෂයට ගහන්න ඕනෑ ලු, පාර්ලිමේන්තුව තුළදී පොලු අරගෙන ආණ්ඩු පක්ෂයේ කට්ටිය එළවන්නේ නැති හින්දා. දැන් අපටත් චෝදනාව ඇවිල්ලා තිබෙන්නේ, ඇයි අපි මේ ආණ්ඩුව එළවන්න මීට වඩා වැඩ පිළිවෙළක් කරන්නේ නැත්තේ කියලා. ඒ කියන්නේ, මිනිසුන්ට මේ ආණ්ඩුව එච්චරට එපා වෙලා තිබෙනවාය කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා අපේ ආණ්ඩුවේත් හිටියා. අපි දන්නවා, ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිල ඉහළ යන විට ඒ ඉහළ යන මිලත් සමඟ අපට තෙල් මිල වැඩි කරන්නට සිද්ධ වුණු බව. සමහර වෙලාවට IMF එක වෙන්න පුළුවන්, ලෝක බැංකුව වෙන්න පුළුවන්, මේ රටට බලපෑම් කරන ඒ වාගේ කුමන හෝ ආයතනයක් සමඟ වෙන්න පුළුවන් අපි යම්කිසි පාලනයක් ඇතිව මේ වැඩේ කළා. අද එහෙම නැහැ. ඒගොල්ලෝ කිව්වාම, "ඉන්ධනවලට මිල සූත්‍රයක් දාන්නට ඕනෑ, එහෙම නැත්නම් ඉන්ධන මිල මේ විධියට වැඩි කරන්නට ඕනෑ" කියලා, තමුන්නාන්සේලා ආණ්ඩුවක් හැටියට කිසිම කථාවක්, කිසිම වැඩ පිළිවෙළක් නැතිව මිල වැඩි කරනවා. අද වෙලා තිබෙන්නේ ඒකයි.

ඊයේ රෑ ඉඳලා ත්‍රී වීලර් ගමන් ගාස්තුව වැඩි වුණා. කවුද මේ ත්‍රී වීලර්වල යන්නේ? ත්‍රී වීලර්වල යන්නේ අන්තිම දුප්පත් මිනිසුන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රවාහනය සඳහා ත්‍රී වීලර් එක පාවිච්චි කරන්නේ අන්තිම දුප්පත් මිනිසුන්. අද ඒ ගාස්තුව වැඩි වෙලා තිබෙනවා.

දැන් මොනවාද රජය කියන්නේ? මම අහගෙන හිටියා ඊයේ කියනවා,"භූමිතෙල්වල මිල වැඩි කරන්න එක හේතුවක් තමයි, private buessවලට භූමිතෙල් ගහන එක" කියලා. Private busesවලට භූමිතෙල් ගහගෙන යන්නේ ඒ මිනිසුන්ට මුදල් අපහසුතා නිසා. පෙට්‍රල් වාහනවලට භූමිතෙල් ගහගෙන යන්නේ ආසාවට නොවෙයි. තමන්ගේ වාහනයට සරිලන ඉන්ධන ගහන්නේ නැතිව ලාභදායක ඉන්ධනයක් විධියට මිනිසුන් භූමිතෙල් ගහන්නේ තමන්ගේ වාහනයට ආදරය නැතිකම නිසා නොවෙයි, ඒ මිනිසුන්ට මුදල් අපහසුතාව නිසා. අද කියනවා, ඒක නිසා තමයි භූමිතෙල් මිල වැඩි කරලා තිබෙන්නේ කියලා.

ඊළඟට කියනවා, සමෘද්ධි ලාභීන්ට සහ ධීවරයින්ට භූමිතෙල් සහනාධාර දෙනවා කියලා. සමෘද්ධි විෂය භාරව හිටපු අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

වාඩිවෙලා ඉන්නවා. ගරු එස්.බී. දිසානායක මැතිතුමනි, අද වන විට භූමිතෙල් පාවිච්චි කරන සමෘද්ධි ලාභීන් කී දෙනාද ඉන්නේ? අද දුප්පත් මිනිස්සු තමන්ගේ ව්‍යාපාරික කටයුතු සහ තමන්ගේ එදිනෙදා කටයුතු සඳහා භූමිතෙල් පාවිච්චි කරනවා. සමෘද්ධි ලාභීන්ට විතරක් භූමිතෙල් සහනාධාරය දුන්නත්, ඒ ප්‍රමාණය ඉතාම අතලොස්සක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවරයින්ට භූමිතෙල් සහනාධාරය ලැබුණාට වැඩක් නැහැ, ඒ සහනාධාරය ලබා ගන්න සමහර වේලාවට ධීවරයන්ට පහසුකම් සලසලා නැහැ. භූමිතෙල් තිබෙන "ෂෙඩ්" තිබෙන්නේ සමහර ධීවර වරායවල විතරයි. පුත්තලම් දිස්ත්‍රික්කයේ එකම ධීවර වරායක්වත් නැහැ. ධීවරයෝ ගිහිල්ලා කොහෙන් භූමිතෙල් ගන්නද? ධීවරයින්ට භූමිතෙල් අවශ්‍යයි. ධීවරයන්ට ඔය කියන භූමිතෙල් සහනාධාරය පහසුවෙන් ගන්නට බැහැ. අද මේ විධියට බොරු තර්ක ගෙනැල්ලා ඉන්ධන මිල වැඩි කරලා තිබෙනවා. ඉන්ධන මිල වැඩි කරලා, ඊළඟට මුදල් ඇමතිවරයා ඇවිල්ලා කියන්නේ මොකක්ද? මම දැක්කා ඊයේ රාජිත සේනාරත්න කියනවා, "මේක ග්‍රාමීය සංවර්ධනයට" කියලා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කථා කරනවා. මේ විධියට ගියොත් නම් මේවා කරන අයට ශාප වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ මිනිස්සු පුදුම දුකක් විඳින්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාවේ එකඟතාව ඇතිව දිවා ආහාර විවේකයත් මේ විවාදයට ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම ක්ෂේත්‍රයක්ම අද කඩා වැටීමට ලක් වෙලා.

මම හිතනවා, ගරු ඇමතිතුමා අඩුම ගණනේ සිවිල් ගුවන් සේවා අංශයවත් ආරක්ෂා කරයි කියලා. තමුන්නාන්සේට දැන් ශ්‍රීලන්කන් ගුවන් සේවය අයිති නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට සිවිල් ගුවන් සේවා අංශය අයිතියි. ගරු ඇමතිතුමනි, අද වනකොට අපේ ගුවන් නියමුවෝ විශාල වශයෙන් මේ රට හැර දමා යනවා. ඒ, ඇයි? දැන් ඔවුන්ටත් tax එකක් ගහලා තිබෙනවා. දෙමව්පියන් තම ගෙවල් දොරවල් පවා උගසට තබා විශාල මුදලක් වියදම් කරලා තමන්ගේ දරුවා ගුවන් නියමුවෙකු කරන්න පුහුණු කරවනවා. හැබැයි, මේ ක්ෂේත්‍රය දියුණු වන්නේ නැත්නම් ගුවන් නියමුවන්ට හිමි තැන නැතිවනවා. එම නිසා අනිවාර්යයෙන්ම මේ ක්ෂේත්‍රය දියුණු වන්න ඕනෑ. අද වනකොට මේ විධියට රටේ හැම ක්ෂේත්‍රයක්ම කඩා වැටිලා. මේ යහ පාලන ආණ්ඩුව දැන් ගන්නේ අවසාන හුස්ම ටිකයි. එම නිසා අඩුම ගණනේ මේ වෙලාවේවත් ජනතාවගේ පැත්තෙන් කල්පනා කරලා වැඩ කරන්න ඕනෑ. එහෙම කළේ නැත්නම් මේ රටේ ජනතාව තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට ඉතිහාසයේ ලොකුම පාඩම උගන්වනවා. එම නිසා තමුන්නාන්සේලාට අපි කියන්නේ ජනතාවගේ සිතැඟි පරිදි; ජනතාවගේ පැත්තෙන් සිතා වැඩ කරන්න කියලායි. දැන් ජනතාවට ජීවත්වන්න පුදුම අපහසුතාවක් තිබෙන්නේ. බෝම්බයක් ගසා මුළු පාර්ලිමේන්තුවම විනාශ කරන්න ඕනෑය කියලායි තරුණ පිරිස Facebook එකේ දමන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ කැරැල්ලක් ළඟ එනවා. ඒ වාගේම කන්න අඳින්න නැතිව දරිද්‍රතාවෙන් පෙළෙන මිනිස්සු හෙට-අනිද්දා වනකොට පාරට බහිනවා. මේ ආණ්ඩුව එළවන්නේ නැහැයි කියලා විපක්ෂයටත් දැන් ඒ බලපෑම ඇවිල්ලා තිබෙනවා.

එක පැත්තකින් බැංකු සම්පූර්ණයෙන්ම ජනතාවගේ බෙල්ල මිරිකලා තිබෙන්නේ. බැංකුවකින් ණයක් ගත්තාම පුදුම විධියට එම බැංකු මිනිස්සු පිටුපස යනවා, ඒ ණය ආපසු අය කර ගන්න. බැංකුවකින් ණයක් ගත් යම් කෙනෙකුට ඒ ණය යථාවත් කර ගන්න කිසිම විධියක් නැහැ. සමහර වෙලාවට CRIB එකට නම ගියාට පස්සේ වෙන බැංකුවකින් ණයක් අරගෙන ඒ ණය ටික ගෙවා ඉවර කර ගන්න විධියක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම ගත්තාම මම හිතන්නේ ලොකු අවුලකට මේ රට පත්ව තිබෙනවා. අද මේ රට තුල් බෝලයක් වාගේ පැටලී තිබෙනවා. මේ මොන ක්ෂේත්‍රයකටවත් පොඩි පොඩි දේවල් කළත් වැඩක් නැහැ. අපි කියනවා, රජයක් හැටියට දැන්වත් මේ දේවල් ගැන කල්පනා කරන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

අද බලන්න, විපක්ෂයේ කාර්ය භාරය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිරපරාදේ ඇති වෙලා තිබෙන තත්ත්වය. සනත් නිශාන්ත මන්ත්‍රීතුමා පොලීසියකට ගිහිල්ලා අත්සන් කළේ නැහැයි කියලා දැන් එතුමාට ඇප දෙන්නේත් නැහැ. හරියට එතුමා ලොකු මිනී මැරුමක් කළා වාගේයි. එහෙම නැත්නම් එතුමා වෙනත් ලොකු චෝදනාවකට ලක් වෙලා වාගේයි. මා හිතන විධියට අධිකරණය මීට වඩා ස්වාධීන වන්න ඕනෑ. විපක්ෂයේ කාර්ය භාරය කරන සනත් නිශාන්ත වැනි මන්ත්‍රීවරු අද හිර ගෙවල්වල දමා තිබෙනවා. ආණ්ඩුව මීට වඩා ජනතාව ගැනත් කල්පනා කරන්න ඕනෑය කියන කාරණාව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට, ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 12.31]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ උගුරේ අමාරුවක් තිබෙන නිසා මම වැඩියෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථාවලදී ඇසූ ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඒවාට උත්තර ලබා දෙන්නටයි මම බලාපොරොත්තු වන්නේ.

ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථා කළේ අපේ රට ඉතියෝපියාවක් වෙලා කියලා වාගෙයි. [බාධා කිරීමක්] ඔබතුමාට මම ඒ ගැන කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සිංහල අවුරුදු දවස්වල -අප්‍රේල් 1වෙනි දා සිට අප්‍රේල් 13වැනි දා දක්වා- අපේ රටේ ජනතාව ලංකා බැංකුවේ ATM එකෙන් විතරක් රුපියල් බිලියන 36ක් -කෝටි 3,600ක්- අරගෙන තිබෙනවා; ATM එකෙන් රුපියල් බිලියන 16ක් -කෝටි 1,600ක්- තැන්පත් කර තිබෙනවා. ලංකා බැංකුවෙන් අප්‍රේල් 1වෙනි දා සිට අප්‍රේල් 13වැනි දා දක්වා විතරක් ATM එකෙන් කෙරුණු ගනු දෙනු රුපියල් බිලියන 52ක් -කෝටි 5200ක්- වෙනවා. එහෙම නම්, ඔබතුමා කියන විධියට අපේ රටේ ජනතාවට කන්න අඳින්න නැතිව ඉන්න වෙලා තිබෙනවාද කියා මම අහනවා. [බාධා කිරීමක්] මම ඒ ගැන ඊට වඩා කියන්න යන්නේ නැහැ. [බාධා කිරීමක්] නැහැ, ඊට වඩා මම ඒ ගැන කියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ වෙතත් අද 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතට සංශෝධනයක් ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව ගරු සභාවේ කථා කළ සියලුම මන්ත්‍රීතුමන්ලා ඒ සඳහා සහයෝගය දක්වමින් කථා කළා. සමහර ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා, මේ රුපියල් 25,000 දඩය මදි, ඒක වැඩි කරන්න කියා. සංශෝධනයක් ගෙනාවා නම් අපට ඒක වැඩි කරන්නත් තිබුණා.

මේ අවස්ථාවේදී අපේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ගරු සභාව තුළ සිටින නිසා එතුමා මතු කළ ප්‍රශ්න කිහිපයකට උත්තර දෙන්නත් මම බලාපොරොත්තු වෙනවා. එතුමා කිව්වා, අපේ රට වාගේ විසි ගුණයක් අපේ ගුවන් සීමාව තිබෙනවාය කියා. ඒ ගුවන් සීමාවේ පියාසර කරන ගුවන් යානාවලින් අපි ලබා ගන්නා මුදල කොපමණද කියා එතුමා ඇහුවා. සාමාන්‍යයෙන් දවසකට ගුවන් යානා 150ක් පමණ මේ ගුවන් සීමාව තුළ ගමන් කරනවා. අපි එක ගුවන් යානයකින් අය කරන්නේ ඩොලර් 250යි. ඩොලර් 250ක් එක ගුවන් යානයකින් අය කළාම ඩොලර් 250, 150න් වැඩි කළාම ඩොලර් තිස්හයදහස් ගණනක් වෙනවා. ඒක අවුරුද්දකට ඩොලර් මිලියන14ක් - 15ක් අතර පමණ වෙනවා. ඒක ලංකාවේ රුපියල්වලින් ගත්තාම රුපියල් බිලියන 2ක්- 2.5ක් පමණ වෙනවා. මම මේ ළඟදී තිබුණු රැස්වීමකදී යෝජනාවක් කළා. වෙනත් රටවල ගුවන් යානයේ බර සහ ගුවන් යානය ගමන් කරන කාලය අනුව අය කිරීම් කරනවා. ඉන්දියාව වාගේ රටවල් එහෙමයි කරන්නේ. එහෙම කළොත් අපට ඩොලර් 250ට වැඩි මුදලක් අය කර ගන්න පුළුවන් වෙයි. එතකොට, අපට ලැබෙන ඩොලර් මිලියන 14ක, 15ක මුදල වැඩි කර ගන්න පුළුවන් වෙයි.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ආසියා ශාන්තිකර ගුවන් සේවා අධ්‍යක්ෂවරුන්ගේ සම්මේලනය ගැන කිව්වා. එය තිබුණේ 2016 වර්ෂයේ. 2015 වර්ෂයේ තමයි ඒ පිළිබඳව සාකච්ඡා කළේ. රටවල් 34කින් 250 දෙනෙක් පැමිණෙන බව අපට ප්‍රකාශ කර තිබුණා. නමුත් 2016දී ඒ රටවල් 34න් 350 දෙනෙක් පැමිණියා. ඒ සමුළුව සඳහා ඇස්තමේන්තු කර තිබුණේ රුපියල් මිලියන 20යි. නමුත් රුපියල් මිලියන 20ට වඩා මිලියන 7ක් වියදම් වෙලා තිබෙනවා. ඒ කියන්නේ මිලියන 27ක්. එයිනුත් අපේ සිවිල් ගුවන් සේවා අධිකාරියට වියදම් වෙලා තිබෙන්නේ රුපියල් 2,72,632ක අමතර මුදලක් පමණයි. අනෙක් මුදල් අනුග්‍රාහකයන් විසින් අපට ලබා දී තිබෙනවා. ඒ නිසා සිවිල් ගුවන් සේවා අධිකාරියට අමතර මුදලක් විධියට වියදම් වෙලා තිබෙන්නේ රුපියල් 2,72,632ක් පමණයි. ඒ මිලියන හත වැඩිවීමට හේතුව තමයි 250දෙනෙක් සහභාගි වෙනවා කියලා, 350 දෙනෙක් සහභාගිවීම. ඒ නිසායි ඒ අමතර මුදල වියදම් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා Wi-Fi ගැන කථා කළා. අපි බලාපොරොත්තු වෙනවා, අපේ පරිගණක අංශයත් එක්ක සාකච්ඡා කරලා ඉදිරියේදී සමස්ත ගුවන් තොටුපොළ ප්‍රදේශයටම Wi-Fi අංකයක් ලබා දෙන්න. වෙනත් රටවල ගුවල් තොටුපොළවලට ගියාම Wi-Fi අංකයක් තුළින් තමන්ගේ පරිගණකයෙන් අවශ්‍ය කටයුතු කරගන්න පුළුවන්. ඉදිරියේදී කටුනායක ගුවන් තොටුපොළ තුළටත් අපි ඒ විධියට මුර පදයක් -password එකක්- ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම එතුමා වැසිකිළි පිළිබඳවත් ප්‍රකාශ කළා. අපේ රටේ තිබෙන ප්‍රශ්නයක් තමයි ඒක. අපේ රටට ඉන්දියාවෙන් විශාල පිරිසක් එනවා. ඒගොල්ලෝ සමහර වැසිකිළිවල රෙදි සෝදනවා; සමහර වැසිකිළිවල නානවා. පසුගිය කාලයේ එවැනි තත්ත්වයක් තිබුණා. අපේ ගුවන් තොටුපොළේ වැසිකිළි වර්ග දෙකක් තිබෙනවා, වියළි වැසිකිළි සහ තෙත වැසිකිළි යනුවෙන්; wet toilets and dry toilets. සමහර වැසිකිළි අපි ඒ විධියටයි හදලා තිබෙන්නේ. දැන් අපි අපේ ආරක්ෂක අංශයත් යොදවලා බලනවා ඒ විධියට අනිසි ලෙස පාවිච්චි කරනවාද කියලා. ඒ විධියට වැසිකිළි පද්ධති භාවිත කරන අය පිළිබඳව අපි ඉතාම සැලකිලිමත් වෙලා තිබෙනවා.

ඊළඟට, World Duty Free එක ගැනත් කථා කළා. ඒ ටෙන්ඩරය කැඳවන අවස්ථාවේ අදාළ අය ඒ ටෙන්ඩර් එකේ මූලික අවශ්‍යතා ඉෂ්ට කර තිබුණේ නැහැ. ඒ අය මූලික අවශ්‍යතා ඉෂ්ට කර තිබුණේ නැති නිසා දෙවැනි ඉල්ලුම්කරුට ඒ ටෙන්ඩරය ලබා දෙන්න සිද්ධ වුණා. කෙසේ වෙතත් ඔවුන් ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණයට ගියා. එහි ප්‍රතිඵලයක් ලෙස නැවත දෙවැනි වරට ටෙන්ඩර් ඉදිරිපත් කරද්දී ඔවුන්ට අනුබද්ධ සමාගමක් සමඟ එකතු වෙලා මූලික සුදුසුකම් සපුරා තිබුණ නිසා ඔවුන්ට එය ලබා දුන්නා. හැබැයි, නීතිමය තත්ත්වය තුළ ඒ කටයුතු කරන්න මාස කිහිපයක් ගියා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි එතැන විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණේ නැහැ. මුල් අවස්ථාවේ මූලික අවශ්‍යතා ඉෂ්ට කර තිබුණේ නැති නිසායි, අපට එසේ කිරීමට සිදු වුණේ.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

විශේෂයෙන්ම ගරු කනක හේරත් මන්ත්‍රීතුමා ආරක්ෂක නිලධාරීන් ගැනත් කථා කළා. සමහර ආරක්ෂක නිලධාරීන් සම්බන්ධයෙන් තමයි මේ ප්‍රශ්නය තිබෙනවාය කිව්වේ. අපි ඒ පිළිබඳවත් අනිවාර්යයෙන්ම සොයා බලන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

වර්තමාන අමාත්‍යතුමාගේ සහ වර්තමාන සභාපතිතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂමතාව නිසා විශේෂයෙන්ම සිවිල් ගුවන් සේවා අධිකාරියත්, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමත් අපේ රටේ ලාභ ලබන ආයතන බවට පත්වෙලා තිබෙනවා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
ආගමන විගමන නිලධාරීන් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වෙන්න ඕනෑ. අන්තිම නරක විධියට තමයි ඒ අය කටයුතු කරන්නේ. සංචාරකයන් එනකොට ඒ අය සුබ පතන්නේවත් නැහැ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, ආගමන විගමන නිලධාරීන් අපේ ගුවන් තොටුපොළේ නිලධාරීන් නොවෙයි. අපි ඒ අදාළ අමාත්‍යාංශත් එක්ක කථා කරලා ඒ පිළිබඳව විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්නම්. අපේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයත් එක්ක කථා කරලා අපි ඒ පිළිබඳ වැඩ පිළිවෙළක් සකස් කරන්නම්.

විශේෂයෙන්ම සිවිල් ගුවන් සේවා අධිකාරියත්, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමත් දැනට වර්ෂයක් පාසා ලාභාංශ රජයට ගෙවනවා. සාමාන්‍යයෙන් දවසකට 25,000ත් - 30,000ත් අතර මිනීන් ප්‍රමාණයක් සංසරණය වන ස්ථානයක් මේක. ඒ නිසා මේ කටයුතු හරිම ක්‍රමානුකූලව කරන්න ඕනෑ. දැනට ගුවන් තොටුපොළේ තාවකාලික පර්යන්ත ගොඩනැඟිල්ලක් සකස් කිරීමට කටයුතු කරනවා. ඒ සඳහා අඩුම තරමින් රුපියල් බිලියන 2ත් - 2.5ත් අතර ප්‍රමාණයක් වැය වෙයි. ඒ සඳහා අපි දැන් ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ජූලි මාසයේ අපි ඒ ගොඩනැඟිල්ල ඉදි කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදි කිරීම සඳහාත් ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

අපේ ඇමතිතුමාගේ නායකත්වය යටතේ, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය යටතේ අපි ගුවන් තොටුපොළේ ධාවන පථය නවීකරණය කළා. එයට "ඒ 380" ගුවන් යානයක් පැමිණියා. ගරු කනක හේරත් මන්ත්‍රීතුමා කිව්වා, ඒ ධාවන පථයේ තත්ත්වය පිළිබඳව. ඒ ධාවන පථයේ දෙපැත්තෙන් මීටර් 15 බැගින් වැඩි කරනවා මිස ධාවන පථය සම්පූර්ණයෙන්ම ගලවා ඉවත් කරන්න ගියොත් විශාල වැඩ කොටසක් කරන්න වෙනවා. එහෙම කරන්න ගියොත් අපට ගුවන් තොටුපොළ වසන්න සිද්ධ වෙනවා. ඒ නිසා මීටර් 45ක් පළල ධාවන පථය දෙපැත්තෙන් තව මීටර් 15 බැගින් වැඩි කිරීම තුළින් තමයි අපි "ඒ 380" ගුවන් යානා ගුවන් තොටුපොළට බස්සන්න බලාපොරොත්තු වුණේ. ගරු ඇමතිතුමාත් කිව්වා වාගේ දෙවැනි ධාවන පථයක අවශ්‍යතාව අපට තිබෙනවා. දැන් අපි ඒ සඳහා ක්‍රියා කරගෙන යනවා. හැබැයි, ජනතාවට අපහසුතා ඇති නොවන අන්දමට, ව්‍යාපාරිකයන්ට අපහසුතා ඇති නොවන අන්දමට අපේ කාලය තුළ අඩුම තරමින් ඒ දෙවැනි ධාවන පථයේ වැඩ පටන් ගැනීමටවත් බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ උගුරේ අමාරුවක් තිබෙන නිසා වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කෙසේ වෙතත් අද මේ සංශෝධනය තුළින් ඒ තැරැව්කරුවන්ට දඬුවම් ලබා දිය හැකියි. මීට කලින් නීතියක් තිබුණේ නැහැ, ඒ තැරැව්කරුවන්ට දඬුවම් දෙන්න. මේ නීතිය අද සම්මත වුණාට පසුව ඒ තැරැව්කරුවන්ට ඒ දඬුවම -රුපියල් 25,000ක් සහ මාස හයක සිර දඬුවමක් හෝ ඒ දෙකම- දෙන්න පුළුවන්. එසේ කිරීම තුළින් තැරැව්කරුවන්ගෙන් මගීන්ට සිදුවෙන හිරිහැරය අවම වනවා ඇතැයි කියා අපි බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින්, අද මේ සංශෝධනයට පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන් සහයෝගය දැක්වීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.40]

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සාකච්ඡාවට භාජන වන, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳව අදහසක් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

රටක ගෞරවය, ඒ වාගේම අනන්‍යතාව ආරක්ෂා වන, රැකෙන තැනක් තමයි ගුවන් තොටුපොළ කියන්නේ. ගුවන් තොටුපොළ රටේ අභිමානය, රටේ අනන්‍යතාව ලෝකයට රැගෙන යන තැනක්. බොහෝ වෙලාවට ගුවන් තොටුපොළ හරහා තමයි රාජ්‍ය තාන්ත්‍රිකයන්, -තානාපතිවරුන්- රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නායකයන් සහ සාමාන්‍ය සංචාරකයන් පැමිණෙන්නේ සහ ඒ අයගේ රටවලට ආපසු යන්නේ. ඒ වාගේ ස්ථානයකට රටේ ගෞරවය, අභිමානය රැකෙන විධියට අවශ්‍ය විධිවිධාන, පහසුකම් සපයන්න ඕනෑ.

හොඳ අත්දැකීම් තිබෙන පරිණත ඇමතිවරයකු වන ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට අපි මතු කරන මේ ගැටලු විසඳීමට හැකියාවක් තිබෙනවාය කියලා අපි හිතනවා. ආගමන විගමන නිලධාරීන් වෙනත් අමාත්‍යාංශයකට, වෙනත් රාජ්‍ය ආයතනයකට අයිති වුණත්, ඒ අය ගුවන් තොටුපොළේ සේවය කරනකොට ඒ අය තුළ තිබෙන ප්‍රියමනාප බව, ඒ අයගේ උණුසුම් පිළිගැනීම, අපේ රට පිළිබඳව, අපේ රටේ ආගන්තුක සත්කාරය පිළිබඳව ලෝකයට පණිවුඩයක් ගෙන යන්න පුළුවන් හොඳ අවස්ථාවක්.

තැරැව්කාරයන්ගෙන් සිද්ධ වන ඒ ගැහැට, අපහසුතා පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, ඒවා මැඩලන්න අවශ්‍ය නීතිමය පියවර ගැනීම පිළිබඳව අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළා. අපි ඒ වාගේ ගැහැටවලින් මේ ගුවන් තොටුපොළ මුදාගෙන, මේ රටට ආදායම් උපයන ස්ථානයක් වාගේම මේ රටේ අභිමානය

ලෝකයට ගෙන යන ස්ථානයක් විධියට ආරක්ෂා කර ගත යුතු වෙනවා. ඒ කරුණු ඉටුකර ගැනීම සඳහා අපි සියලුදෙනාම මේ පනත් කෙටුම්පත සම්මත කිරීමට සහයෝගය දෙනවා.

ඒ එක්කම, විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්නට ඕනෑ. ගුවන් ගමන්වලට පමණක් නොවෙයි, අභ්‍යන්තර ප්‍රවාහන කටයුතුවලටත් ඊයේ ඉඳලා වැඩි වුණු ඉන්ධන මිල බලපානවා. මංගල සමරවීර මුදල් අමාත්‍යතුමා ඊයේ සඳහන් කළා, "ඉන්ධන මිල වැඩිවීම හරහා රජයට බිලියන 58ක මුදලක් ලබාගෙන, ඒ බිලියන 58 තුළින් අගෝස්තු මාසයේ ඉඳලා ගම්පෙරළියක් සිද්ධ කරනවා" කියලා. හැබැයි, ඒ වචනයත් බොහොම භයානකයි. ගම්පෙරළිය කොහොම වුණත් ගමේ මිනිසුන්ගේ -ග්‍රාමීය ජනතාවගේ- ජීවන ගැටලුව නම් බොහොම බරපතළ පෙරළියකට මේ නිසා ලක්වෙයි කියලා අපි විශ්වාස කරනවා. අවසානයේ, එහි ප්‍රතිඵලය හැටියට අවුරුදු එකහමාරක් යනකොට ආණ්ඩුව පෙරළීමකටත් ලක් වෙන්න පුළුවන්. මුදල් අමාත්‍යතුමාගේ ඒ ප්‍රකාශයත් ඒ වාගේම ඉන්ධන මිල වැඩි කිරීමත් මේ රටේ සෑම සමාජ තීරුවකටම, සෑම සමාජ ස්තරයකටම බරපතළ විධියට බලපාන කාරණයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
දිනෙන් දින බඩු මිල ඉහළ යද්දී, දිනෙන් දින බදු බර ජනතාව මත පැටවෙද්දී, ඉන්ධන මිලත් වැඩි වීම නිසා වෙළෙඳ පොළේ තිබෙන සියලු භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යනවා. මේ නිසා උද්ධමනය අහස උසට යයි. මෙහි තිබෙන බරපතළ කාරණය මෙයයි. මුළු රටම වෙළාගත්ත මිනිසුන්ගේ දුක් අදෝනා අවසානයේ පුපුරලා, මහා ගින්නක් වෙලා ආණ්ඩුවම පෙරළියට පත්වෙයි කියන කාරණය මේ වෙලාවේ මුදල් අමාත්‍යතුමාට සිහිපත් කරනවා.

ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා. ඒ වාගේම අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාට මේ කටයුතු කරන්න අවශ්‍ය සහයෝගය විපක්ෂය විධියට අප ලබා දෙනවාය කියන පණිවුඩයත් ලබා දෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට පිළිතුරු කතාව, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා.

[අ.භා. 12.45]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණු කීපයක් පිළිබඳව ඉතා කෙටියෙන් පිළිතුරු ලබා දීමට සූදානම්. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා, Wi-Fi ප්‍රශ්නය ගැන මගේ අවධානය යොමු කරවීම පිළිබඳව. දැනට Wi-Fi පහසුකම airport එකේ departure lounge එකේ ස්ථාන තුනකත්, arrival lounge එකේ ස්ථාන තුනකත් තිබෙනවා. එය කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. ඇත්ත වශයෙන්ම මේ කාරණය මගේ නිලධාරීන් හෝ මට කියා තිබුණේ නැහැ. මම අද වහාම නියෝග කරනවා මාස තුනක් ඇතුළතදී ඒ airport එකේ සෑම point එකකටම Wi-Fi පහසුකම ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියා. මා හිතන්නේ එම ගරු මන්ත්‍රීතුමා airport එකේ හරියාකාරව ඇවිදලා නැහැ කියලායි. එතුමා ආයෙත් එහි ගියොත් තවත් ටිකක් ඇවිදින්න ඕනෑ. එතුමා කිව්වා, එහි තිබෙන්නේ dry toilet පමණයි, wet toilet නැහැ කියා. අප dry toilet වෙනම හදා තිබෙනවා; wet toilet වෙනම හදා තිබෙනවා. බොහෝ විට මක්කම වන්දනාව සඳහා යන හුඟක් අය මේ airport එකට එනවා. ඒ අය ආවාම කරන්නේ මොකක්ද? Bidet shower එක අරගෙන සමහර අය නානවා; සමහර අය කකුල් හෝදනවා. Airportවල එහෙම කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ. ඔක්කෝම wet toilets තිබුණා නම් අනෙක් අයට ඒවා එකක්වත් හරියට පාවිච්චි කරන්න ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම බටහිර රටවලින් විදේශ සංචාරකයන් ආවාම ඒ අයට ඕනෑ වන්නේ dry toilets. ඒ නිසා අපි ඒ දෙවිධියටම toilets හදලා තිබෙනවා. ඒ අවශ්‍යතාව අනුව අපි ඒවා සකස් කර දී තිබෙනවා. ඒකත් අපේ වැරැද්දක් හැටියටයි දකින්නේ. එය අප කරන සංවර්ධනයක් විධියට නොවෙයි, අපේ අඩු පාඩුවක් විධියටයි බිමල් රත්නායක මන්ත්‍රීතුමා කථා කළේ. ඒක ඉතින් එතුමන්ලාගේ ස්වභාවය නේ.

ඊළඟ කාරණය, 2015 වර්ෂය වන කොට duty-free shops නිකම් කැඳවා කතා කරලායි දුන්නේ කියන කාරණය මම මීට කලින් පෙන්වා දුන්නා. එහෙම දීලා සියයට 25යි turnover එකෙන් ගත්තේ. නමුත් මම ඒ ක්‍රමය වෙනස් කළා. ඒ වෙනස් කරපු එකත් වැරැදියි කියා දැන් කියනවා. එසේ වෙනස් කරලා දැන් tender procedure එකට ගියාට පසුව Procurement Guidelines එක අනුව ටෙන්ඩරයකින් යම් අසහනයකට පත් වුණාය කියා සිතන කෙනකුට Procurement Appeal Board එකට යන්න පුළුවන්. එතැනින් Supreme Court එකටත් යන්න පුළුවන්. සල්ලි තිබෙන අය මේ ඔක්කෝම අවස්ථා අරගෙන එය ප්‍රමාද කළා. එහෙම ප්‍රමාද කළාට අපේ ආදායමේ අඩුවක් වුණේ නැහැ. එක duty-free shop එකට duty-free shops දෙකෙන්ම විකුණන ප්‍රමාණයේ sale එකක් ආවා. ඒ නිසා සියයට 25ක් ගත් එක සියයට 43ක් අරගෙන ආදායම වැඩි කර ගැනීමට අපට පුළුවන් වුණා. ඉතින් ඒකත් වැරැද්දක් හැටියටයි දක්වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජපානයෙන් අපට ණය මුදලක් දුන්නා. එම ණය මුදල් දෙන කොට contractorගේ ගණන engineer's estimate එකට වඩා සියයට 47කින් වැඩියි. මා ඇමතිතුමා නිසා මම එය අවලංගු කළා. ඉතින්, ඒකත් වැරැදිද? ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ ඒ ටෙන්ඩර් එක අවලංගු කරපු එකත් වැරැදියි කියලාද? ටෙන්ඩරය දුන්නා නම් කියන්න තිබුණා, "ඔන්න, ගතමනාවක් අරගෙන ටෙන්ඩර් එක දුන්නා" කියා. මම ඉතාම පාරිදෘශ්‍යභාවයකින් යුතුව මේ පිළිබඳව ජපන් නානාපනිතුමාටත් කිව්වා, "මට මේක කරන්න බැහැ, මෙහි ගණන වැඩියි, ඒ නිසා නැවත ටෙන්ඩර් කරන්න ඕනෑ" කියා. ඒක කළා. එතකොට කල් යනවා. Terminal එකක් හදන්න, අපේ අතේ සල්ලි බිලියන 49ක් තිබෙනවා නම් අවුරුද්දකින් දෙකකින් එය කරන්න අපට පුළුවන්. නමුත් රට රටවල ගිහින් ණයට මුදල් අරගෙන එය කරන්න ගියාම මේ ප්‍රශ්නය ඇති වනවා. ඒ නිසා තමයි මම temporary terminal එකක් මාස හයක් ඇතුළතදී හදලා මේ තිබෙන තදබදය නැති කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළවල් යෙදුවේ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට මේ airport එකේ සිදු වන හොර මැරකම් පිළිබඳව කිව්වා. සිගරැට් අල්ලන්න අපට බලයක් නැහැ. ඒක Sri Lanka Customs කරන්න ඕනෑ. ඒකට වැඩි දඩයක් ගෙනෙන්න ඕනෑ නම් මුදල් අමාත්‍යතුමා ඒ දඩය වැඩි කරන්න ඕනෑ. Civil Aviation Act එක යටතේ එම දඩ මුදල වැඩි කරන්න මට පුළුවන්කමක් නැහැ. රේගු ආඥාපනත යටතේයි එම දඩ මුදල් වැඩි කරන්න ඕනෑ. නමුත් මුළු airport එකම ආවරණය වන පරිදි CCTV cameras සවි කළේ මා ඇමතිවරයා වශයෙන් පත් වුණාට පසුවයි.

දැන් ඒක central point එකකට ගෙනැල්ලා, ඒ සිදු වන දේවල් බලා, ඒවා පොලීසියට ලබා දීලා, අපි ඒ වැඩ කටයුතු කරනවා.

ඊළඟට, ආගමන හා විගමන නිලධාරීන් මට අයිති වෙන්නේ නැහැ. Customs Officersලා මට අයිති වෙන්නේ නැහැ. ඒ අයගේ ආචාරශීලීභාවය, ඒ අයගේ කැප කිරීම පිළිබඳව, ඒක ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නයක්. ආගමන හා විගමන counters විසිපහක් තිබෙනවා නම්, සමහර වෙලාවට දොළහකයි කට්ටිය ඉන්නේ. මම ඒ පිළිබඳව කැබිනට් මණ්ඩලයේදී දහ-දොළොස් වතාවක් කථා කළා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

ගරු ඇමතිතුමනි, ඔබතුමා CCTV cameras සවි කරපු එක ඉතාම වටිනවා. ආගමන හා විගමන counters උඩත් අනිවාර්යයෙන්ම CCTV cameras සවි වෙන්න ඕනෑ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ඒවා සවි කරන්න දෙන්නේ නැහැ නේ. සවි කළොත්, ඊට පසුව දවසේ strike එකක් නේ. ඔබතුමා දන්නවා නේ. මේ තිබෙන ව්‍යත්තීය සමිති ඒකාධිකාරය එක්ක අපි වැඩ කටයුතු කරන්නේ කොහොමද? ඒ නිසා අනෙක් ආයතනවල සහයෝගය අවශ්‍යයි. හුඟක් අය මට මේ පිළිබඳව කියා තිබෙනවා. එංගලන්තයේදී එහෙම Immigration Officer ළඟට ගියාම එතුමා, "Good morning, Sir! Good morning, Madam! How was your journey? Why are you coming here? How many days are you going to spend here?" කියලා, බොහොම සුභදව කථා කරනවා. අපේ අය එහෙම අහන්නේ නැහැ නේ. එතැනට එන අය ඔක්කෝම හතුරන් විධියට තමයි හුඟක් අය සලකන්නේ. ඉතින් ඒ අයට මේ පිළිබඳව විශේෂ පාඨමාලාවක් පැවැත්වුවත්, ඒ ආකල්පමය වෙනස ඇති කර ගන්න ඕනෑ. මම කිව්වා, Immigration Officersලා නැත්නම් මට භාර දෙන්න, ඔබතුමන්ලා Immigration Officersලා බඳවා ගන්නවා නම් මම අපේ Airport and Aviation Services (Sri Lanka) Limited එකේ ඉන්න අය පුහුණු කරලා මාස හයකට දමන්නම් කියලා. ඒකටත් කැමැති නැහැ. "බල්ලා පිදුරු කන්නෙත් නැහැ - කන ගොනාට දෙන්නෙත් නැහැ" කියලා කියමනක් තිබෙනවා නේ. ඒ වාගේ තමයි. මේ ව්‍යත්තීය සමිතිවල වැඩ පිළිවෙළ ඔක්කෝම ඒ අයගේ වාසිය සඳහා කරන දේවල් මිසක් රටේ වාසිය සඳහා කරන දේවල් නොවෙයි. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඉතින් මෙවැනි අභියෝග රාශියක් මැද තමයි අපි මේ airport එකේ වැඩ කටයුතු කරගෙන යන්නේ.

අනෙක් කාරණය මේකයි. මේ airport එකේ ආදායම වැඩි කර ගත්තේ එහි සිටින සේවකයන්ගේ කාර්යක්ෂමතාව මත පමණක් නොවෙයි. අපි නිසි විධියට ප්‍රතිපත්තිමය තීරණ ගත්තා. ප්‍රායෝගිකව, tender procedure එක අනුව වැඩ කටයුතු කරලා ආදායම වැඩි කර ගත්තා. බිමල් රත්නායක මැතිතුමා කිව්වා, ඒ අයට ලැබෙන්නේ බොහොම අඩු පඩියක් කියලා. අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා දන්නවා, airport එකේ අයගේ පඩි නඩි පිළිබඳව. ඒ අයට එහෙම අඩුපාඩුවක් වෙලා නැහැ. නමුත් ලැබෙන්න, ලැබෙන්න තවත් ගන්න ඕනෑ වෙනවා. ඉතින් ඒකයි තිබෙන ප්‍රශ්නය. ඒ වුණත් අපි ඒ අවශ්‍ය bonus එහෙම ලබා දුන්නා.

ඊළඟට, විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. Ground handling charges වැඩියි කියලා කියනවා. ඒක මට අයිති දෙයක් නොවෙයි. SriLankan Airlines ආයතනය තමයි ground handling කරන්නේ. ඒ නිසා මට ඒ charges අඩු, වැඩි කිරීමේ බලයක් නැහැ. නමුත් මම නිරතුරුවම ඒ අයගෙන් ඉල්ලීම් කරලා තිබෙනවා, ලෝකයේ අනෙක් airportsවල වාගේම යම් අඩු කිරීමක් කිරීම අත්‍යවශ්‍යයි කියලා. ඒ වාගේම දැන් අපි immigration counters සඳහා වැඩි වැඩියෙන් ඉඩකඩ ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. ඉදිරියේදී අපි ඇත්ත වශයෙන්ම temporary terminal එක හැදුවාට පස්සේ, relocation කළාට පස්සේ මේ තිබෙන හුඟක් ප්‍රශ්න විසඳා ගැනීමට අපට පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ඊළඟට, ගුවන් නියමුවන් ගැන කිව්වා. ඔබතුමන්ලා දන්නවා, Civil Aviation Authority එක වාගේ තැන්වල එම නිලධාරීන්ගේ සේවය දීර්ඝ කරන්න වෙලා තිබෙන්නේ, සේවයට ගන්න නිලධාරීන් නැති නිසා බව. මොකද, අපේ ආණ්ඩුවේ තිබෙන නීතිය අනුව පඩිය විධියට අපට වැඩියෙන්ම දෙන්න පුළුවන් වන්නේ රුපියල් අනූහයදහසක්, එහෙම නැත්නම් රුපියල් ලක්ෂයක් පමණයි. අද trained pilot කෙනෙක් inspectionsවලට එන්නේ නැහැ, රුපියල් ලක්ෂ දහයක පඩියක් නැතුව. ඉතින් රජයේ ආයතනවල එහෙම රුපියල් ලක්ෂ දහයක පඩියක් දෙන්න පුළුවන්කමක් නැහැ. මම බැලුවා, ලෝකයේ අනෙක් රටවල - ඉන්දියාවේ එහෙම- ඒ අයට ඊට වඩා විශාල මුදලක් ගෙවනවා. අනෙක් එක අපි ඒ සඳහා හුඟක් අය පුහුණු කළා. පුහුණු කළ අය මොකක්ද කළේ? පුහුණුව අවසන් වුණාට පසුව bond එක ගෙවලා පිට රට රැකියාවලට ගියා. අපි මේ තනතුරු සඳහා අවශ්‍ය පුද්ගලයින් ඒ විධියට සකස් කළා. සකස් කළාට පසුව ඒ ගොල්ලන් වැඩි වැටුපකට පිට රට රැකියාවලට ගියා. ඒක අපේ රටේ විතරක් නොවෙයි, තුන්වන ලෝකයේ රටවල තිබෙන ප්‍රශ්නයක්. ගුවන් සේවා ක්ෂේත්‍රයේත් අපට ඒ ප්‍රශ්නය තිබෙනවා. බොහොම අමාරුවෙන් තමයි අපි මේ කටයුතු manage කරගෙන යන්නේ. මොකද, අනෙකුත් ක්ෂේත්‍රවල වාගේම මේ ක්ෂේත්‍රයේත් බුද්ධි ගලනය විශාල වශයෙන්ම තිබෙනවා.

අපි දැන් National Civil Aviation Policy එක හදලා තිබෙනවා. ඒ වාගේම අපි දැන් domestic airports හදාගෙන යනවා. විශේෂයෙන්ම, රත්මලාන ගුවන් තොටුපොළ වඩාත් නවීකරණය කරලා, පෞද්ගලික අංශයේ ගුවන් යානා සඳහා ලබාදීමට අවශ්‍ය කටයුතු කර ගෙන යන බවත් ප්‍රකාශ කරමින්, මෙම විවාදයේදී අදහස් දැක්වූ සියලු මැති ඇමතිතුමන්ලාට සහ මන්ත්‍රීතුමන්ලාට මගේ ස්තුතිය පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

තීරණය කරන ලදී.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala De Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.

[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
*[*THE HON. PRESIDING MEMBER *in the Chair.]*

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1இலிருந்து 3வரையான வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ''පනත් කෙටුම්පත දැන් තුන්වන වර කිය විය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 12.56ට, 2018 මැයි 22වන අඟහරුවාදා අ.භා.1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 12.56 மணிக்கு பாராளுமன்றம், 2018 மே 22, செய்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 12.56 p.m. until 1.00 p.m. on Tuesday, 22nd May, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

260 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 260 - இல. 5
Volume 260 - No. 5

2018 මැයි 22වන අඟහරුවාදා
2018 மே 22, செவ்வாய்க்கிழமை
Tuesday, 22nd May, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කථානායකතුමාගේ සහතිකය

මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ක්‍රමෝපය සංවර්ධන ව්‍යාපෘති පනත:
නියම

කල්තැබීමේ යෝජනාව:
ධීවර ජනතාවට පෙර පැවති මිලටම ඉන්ධන සැපයීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
சபாநாயகரது சான்றுரை

நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

1990 சுவசெரிய மன்றம் சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

காணி (பராதீனப்படுத்தல் மீதான மட்டுப் பாடுகள்) (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்:
கட்டளைகள்

ஒத்திவைப்புப் பிரேரணை:
மீனவர்களுக்கு முன்னைய விலையில் எரிபொருள் வழங்கல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENT:
Speaker's Certificate

PERFORMANCE REPORT OF FINANCE COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

1990 SUWASERIYA FOUNDATION BILL:
Read the First time

LAND (RESTRICTIONS ON ALIENATION) (AMENDMENT) BILL:
Read the First time

STRATEGIC DEVELOPMENT PROJECTS ACT:
Orders

ADJOURNMENT MOTION:
Provision of Fuel at Previous Price for Fisherfolk

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 මැයි 22වන අඟහරුවාදා
2018 மே 22, செவ்வாய்க்கிழமை
Tuesday, 22nd May, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.

කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2018 මැයි 15 වැනි දින අධිකරණ සංවිධාන (සංශෝධන) සහ 2018 මැයි 21 වැනි දින දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන), අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) සහ සිවිල් ගුවන් සේවා (සංශෝධන) නැමැති පනත් කෙටුම්පත්වල ම'විසින් සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

II

සභාපති නාමාවලිය
தவிசாளர் குழாம்
CHAIRMAN'S PANEL

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ අංක 140 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව 8 වෙනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය තුළ සේවය කිරීම පිණිස මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සභාපති නාමාවලියට ඇතුළත් කිරීමට මවිසින් නම් කර තිබෙන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු පියංකර ජයරත්න මහතා
ගරු ලකී ජයවර්ධන මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා
ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු කනක හේරත් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF FINANCE COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නිවේදන ඉදිරිපත් කරමි.

(i) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32(1) වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 03/2018 දරන සුරාබදු නිවේදනය);

(ii) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 04/2018 දරන සුරාබදු නිවේදනය);

(iii) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 2 සහ 22 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 23 දිනැති අංක 2055/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදන

(අංක 05/2018 සහ 06/2018 දරන සුරාබදු නිවේදන); සහ

(iv) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 පෙබරවාරි 21 දිනැති අංක 2059/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 07/2018 දරන සුරාබදු නිවේදනය)

එම නිවේදන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගරසංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කඡු සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

2016 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධනය සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ නියෝග;

(ii) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ වගන්ති යටතේ වූ නියමය; සහ

(iii) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ද වගන්තිය යටතේ වූ නියමයන් පහක් සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ඒකාබද්ධ විපක්ෂයේ 54දෙනෙකුගෙන් සමන්විත මන්ත්‍රී කණ්ඩායම විසින් හදිසි ජාතික වැදගත්කමකින් යුක්ත කාරණයක් පිළිබඳව සාකච්ඡා කරන්නයි පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 19. (1) යටතේ මෙම ඉල්ලීම ඔබතුමා වෙත ඉල්ලීමක් කළේ. ගරු කථානායකතුමනි, මම යළිත් ඉල්ලා සිටින්නේ, අපගේ අයිතිවාසිකම් ප්‍රතික්ෂේප නොකර මෙම විවාදය සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසයි. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු 54දෙනෙකු හා එයට සහයෝගය දෙන තවත් මන්ත්‍රීවරු 16දෙනෙකුගෙන් සමන්විතව, එනම් මන්ත්‍රීවරු 70දෙනෙකු අද මෙලෙස විවාදයක් ඉල්ලා සිටිනවා.

1. රට පුරා ඇද හැලුණු හා තවමත් පවතින අධික වර්ෂාව නිසා රත්නපුර, කළුතර, ගාල්ල, මාතර ප්‍රදේශවල සහ උඩ හා මධ්‍යම පළාත්වල නාය යෑම් තත්ත්වයක් දැනට ප්‍රකාශයට පත් කර ඇති අතර, ඒ තුළින් සිදුවිය හැකි ජීවිත සහ දේපොළ හානි වළක්වා ගෙන ජන ජීවිතය කඩාකප්පල් නොවී පවත්වා ගෙන යෑම සඳහා එම පළාත්වල ජනතාවට දැඩි ආරක්ෂාවක් සහ සහන ලබා දිය යුතු බවට කරුණු සාකච්ඡා කිරීම සඳහාත්,

2. රජය හදිසියේ වැඩි කරන ලද ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් හා කිරි පිටි ඇතුළු ආහාර ද්‍රව්‍යවල මිල සහ බස් ගාස්තු, ත්‍රිරෝද ගාස්තු යනාදිය නිසා ජන ජීවිතයට හා රටේ ආර්ථිකයට මතු වී ඇති පීඩනයට සහන ලබා දිය යුතු බවට සාකච්ඡා කිරීම සඳහාත් පාර්ලිමේන්තු විවාදයක් ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටිමු.

මේ විවාදය අද දිනයේ සිදු කළ යුතු බව අප යෝජනා කරනවා ගරු කථානායකතුමනි.

අද මුළු රටෙම අර්බුදකාරී තත්ත්වයක් තිබෙනවා. පාර්ලිමේන්තුවේම ඉන්ධන ගාස්තු සියයට 40කින් නඟිනවා. මේ සම්බන්ධයෙන් විවාද කිරීම අපට තිබෙන අයිතියක්. ඒ වාගේම අධික වර්ෂාව නිසා නාය යෑමේ තත්ත්වයක් තිබෙනවා. ලංකාවේ හැම ගෙයක්-දොරක්ම මේ ප්‍රශ්නයට මුහුණ දෙනවා. මෙය හදිසි තත්ත්වයක්. ජනතාවට ගෙවල්-දොරවල් නැතිවෙලා, ආහාර-පාන නැතිවෙලා තිබෙනවා. මෙය අර්බුදකාරී ජාතික ව්‍යසනයක් නිසා අපේ මන්ත්‍රී කණ්ඩායම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ විවාදය ලබා දෙන ලෙසයි. ස්ථාවර නියෝග 19. (1) යටතේ අපේ මන්ත්‍රී කණ්ඩායම මේ විවාදය ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. අද ඔබතුමා කළ මේ යෝජනාව සම්බන්ධයෙන් සභානායකතුමා පැහැදිලි කරයි. ඊට පස්සේ මා පැහැදිලි කරන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග ඇති කළේ ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්නයි. අපේ මන්ත්‍රී කණ්ඩායමේ විසිදෙනකු මේ අවස්ථාවේ අසුන්වලින් නැඟිටලා ඉන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉන්ධන මිල ගැන කිව්වා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉන්ධන මිල තවම 2015 වර්ෂයේ පැවති මිලට වඩා අඩුයි. [බාධා කිරීම්] අද දවසේ කටයුතුවලට - [බාධා කිරීම්] අද මේ නියමයන් සම්මත කරලා දෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි මේක හෙට සම්මත කරලා දෙන්නම්. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දැන් මේ නියමයන් සම්මත කරලා දෙන්න. පස් වරු 2.00ට පසුව අපි ඔබතුමන්ලාට විවාදයක් දෙන්නම්. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, අද දවසේ අපට තවත් වැඩ කටයුතු තිබෙනවා. පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි දවසේ කටයුතු සම්මත කරලා දෙනවා නම්, අපි මේ විවාදයට සූදානම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. එහෙම නම් කරුණාකරලා මට මේ පිළිබඳව පැහැදිලි කරන්න අවස්ථාවක් ලබා දෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා වාඩිවෙන්න.

මේ පිළිබඳ අද දින පක්ෂ නායක රැස්වීමේදී දීර්ඝ ලෙස සාකච්ඡා කළා. විශේෂයෙන්ම පෙට්‍රල් මිල වැඩිවීම සම්බන්ධයෙන් ඊයේ දිනයේ ජනතා විමුක්ති පෙරමුණෙන් අපට ලිඛිත ඉල්ලීමක් පළමුවෙන්ම ලැබුණා. ඊට පසුව, පෙට්‍රල් මිල වැඩිවීම සම්බන්ධයෙන් සහ ගංවතුර ප්‍රශ්නය සම්බන්ධයෙන් වන කරුණු දෙකක් පිළිබඳව ඉල්ලීම් අද උදේත්, ඊයේ හැන්දෑවේත් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. හෙට පරිසරය සම්බන්ධයෙන් විවාද කරන නිසා හෙට දවසේම ගංවතුර පිළිබඳව කථා කරන්න පුළුවන්. කලින් ඉල්ලූ පරිදි අද දින ජනතා විමුක්ති පෙරමුණට අවස්ථාව ලබාදී තිබෙනවා. ඒ නිසා තමයි

[ගරු කථානායකතුමා]

ඔබතුමන්ලාගේ ඉල්ලීම පිළිගන්න බැහැ කියලා ප්‍රකාශ කළේ. ඒ අනුව කටයුතු කරමු කියා මම යෝජනා කරනවා. ඒ නිසා තමයි මට ඒක පිළිගන්න බැහැ කියලා සඳහන් කළේ. මොකද, පක්ෂ නායක රැස්වීමේදී ඔබතුමාගේ ඉල්ලීමට ගරු කරමින් අපි එකඟතාවකට ආවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී මෙතුමා කැමති වුණා, මෙතුමාගේ ප්‍රකාශය කරන්න අවස්ථාව දීලා පසුව විවාදය ලබාගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අනුව මම අවස්ථාව දුන්නා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි ස්ථාවර නියෝග ඇති කරලා තිබෙන්නේ මොකටද ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, හරි, මට තේරෙනවා ගරු මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා පොරොන්දු වුණා, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුව කටයුතු කරනවා කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අනුව තමයි මම කටයුතු කරන්නේ. [බාධා කිරීමක්]

අද මේ ගැන සාකච්ඡා කළා නේ. අද ඔක්කෝම සාකච්ඡා කරලා එතුමාත් එකඟ වුණා. එතුමාට අවස්ථාව ලබා දෙන්න කිව්වා, මේක පැහැදිලි කරන්න. ඒ විතරක් නොවෙයි. හෙට දවස පුරාම මේ ගැන කථා කරන්න පුළුවන්. පෙට්‍රල් මිල සම්බන්ධයෙන් කථා කරන්න ජනතා විමුක්ති පෙරමුණ කලින් ඉල්ලූ පරිදි, අවස්ථාව දුන්නා. ඒ නිසායි මට -[බාධා කිරීම්]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order, Hon. (Dr.) Bandula Gunawardane?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමට වඩා වැදගත් වෙන්නේ මේ ගරු සභාවයි. මේ අවස්ථාවේ අපි -මන්ත්‍රීවරුන්- 21දෙනකු නැඟිටලා ඉන්නවා. අපි ඉල්ලා සිටිනවා, ස්ථාවර නියෝග 19.(1) යටතේ ඉදිරිපත් කරන යෝජනාවට පක්ෂ ද, විපක්ෂ ද කියලා ඡන්ද විමසීමක් කරන්න කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සභාවේ අනුමැතිය ගන්න. අපට සභාවේ අනුමැතිය වැඩියි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද උදේ සාකච්ඡාව අනුව, මේ ගැන අද කථා කරන්න එකඟත්වය පළ කරන්න බැහැ කියලා මම කිව්වා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එයට එකඟ වුණා. ඔබතුමාට අවශ්‍ය වුණේ මේ යෝජනාව පාර්ලිමේන්තුවේ කියවලා ඉන් අනතුරුව, දවසේ වැඩ කටයුතු කරගෙන යන්නයි. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂ නායක රැස්වීමේදී වුණු එකඟතාවට පටහැනිව එතුමා ක්‍රියා කරනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එකඟත්වය ලබා නොදීමට හේතු මම සඳහන් කළා. අද පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කළ පරිදියි එකඟ නොවුණේ. දැන් මම ඒක වෙනස් කරන්නේ කොහොමද? [බාධා කිරීම්] ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 19.**(1)** අනුව යෝජනාව ඉදිරිපත් කළාට පස්සේ ඔබතුමාට පුළුවන් ඒක ඉදිරිපත් කරනවාද, නැද්ද කියන එක පෙන්වා දෙන්න. එසේ නොවෙනවා නම්, මා දන්නා විධියට ඔබතුමාට විශේෂ කරුණක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඡන්ද විමසීමකට යා යුතු නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උදේ සාකච්ඡා කළ පරිදි තමයි මම ක්‍රියා කළේ. [බාධා කිරීම්] ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ඔබතුමා පක්ෂ නායක රැස්වීමේදී ගත් තීන්දුව අපට දැනුම් දුන්නා. නමුත් පක්ෂ නායක කණ්ඩායමට වඩා මේ ගරු සභාව උත්තරීතරයි. මේ සභාවේ මන්ත්‍රීවරු විසිදෙනෙක් නැගී සිටියාට පසු, පක්ෂ නායක කණ්ඩායමේ තීන්දුව එලෙසම පවත්වා ගැනීමේ අවශ්‍යතාවක් පවතින්නේ නැහැ. ඒ නිසා ඔබතුමා

තින්දුවක් ගන්නා මෙන් අපි ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්] ස්ථාවර නියෝග අනුවයි අපි කියන්නේ. දැන් මේ සභාවේ මන්ත්‍රීවරු විසිදෙනෙකුට වඩා නැගිටලා ඉන්නවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කාරණය මම අද උදේ, -[බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Leader of the House?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, according to Standing Order No. 19(2) (a), I quote:

"written notice of such motion is given to the Speaker before the commencement of the sitting …."

So, you have to give written notice.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක දුන්නා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Have they given written notice to you, Sir?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උදේ දුන්නා. ඉල්ලීමක් කළා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉල්ලීමක් නොවෙයි, ලිඛිතව කළාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. ලිඛිත ඉල්ලීමක් කළා. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කී දෙනෙක් points of Order මතු කරනවාද? [බාධා කිරීම්] මේ කාරණය මා පැහැදිලි කරන්න අවශ්‍යයි. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න. අපි මේ ගැන පැය ගණනක් ,- [බාධා කිරීම්] Order, please! පොඩ්ඩක් කන් යොමු කරන්න. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඔබතුමාට බලය තිබෙනවා, මේක ප්‍රතික්ෂේප කරන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උදේ සාකච්ඡා කර, ඒ අනුව තමයි මම ප්‍රතික්ෂේප කළේ; උදේ පක්ෂ නායක රැස්වීමේ කළ සාකච්ඡාවේදී ගත් තීරණය අනුවයි ඒක ප්‍රතික්ෂේප කළේ.

ඊට පස්සේ ආපසු ඒක වෙනස් කරන්න අයිතියක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එක කියන්න. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අද පක්ෂ නායක රැස්වීමට එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරන කිසිම නායකයෙක් සම්බන්ධ වුණේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සම්බන්ධ වුණා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සම්බන්ධ වුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපේ කවුරුවත් සහභාගි වී තිබුණේ නැහැ ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උදේ ඇවිත් හිටියා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. ඇවිත් හිටියේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සරත් අමුණුගම මැතිතුමා ආවා. මා ළඟ ඉඳගෙන හිටියා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇවිත් සිටියේ නැහැ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා - සභානායකතුමා- කියන විධියට අපි යම් සහයෝගයක් දෙන්නම්. සහයෝගය දීලා අපි විවාදය කරමු. එතකොට ඉවරයි. ඇයි මේ ගැන රණ්ඩු කර ගන්නේ? එතුමා ඉල්ලනවා නේ ඒ නියමයන් සම්මත කර දෙන්න කියා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දවසේ වැඩ කටයුතු කර ගෙන යන්න, මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උදේ ඒ ඉල්ලීම ලැබුණාට පස්සේ පක්ෂ නායකයින්ගේත් අදහස් විමසලා තමයි මම සාධාරණව කිව්වේ අද allow කරන්න බැහැ කියා. So, it was rejected. බහුතරයක් එකඟ වුණා, හෙට මේ ගැන විවාද කරන්න. අද ඩීසල් සහ පෙට්‍රල් මිල සම්බන්ධව කල් තැබීමේ විවාදයක් තිබෙනවා. වැඩි වෙලාවක් ඒ සඳහා දෙන්නත් සභානායකතුමා එකඟ වුණා. පැය එක, පැය දෙක දක්වා වැඩි කරන්නත් එතුමා එකඟ වුණා. [බාධා කිරීමක්] එම නිසා තමයි අවස්ථාව දෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා point of Order එක කියන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ අතීත සම්ප්‍රදායන් දිහා ටිකක් හැරී බලා, ඔබතුමා මේ ගැන තීරණයක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්ප්‍රදායන් අනුව තමයි මම ක්‍රියා කළේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හදිසි තත්ත්වයක්, ගංවතුරක්, ජන ජීවිතයේ හැම අංගයකටම බලපාන තෙල්වල මිල වැඩි වීම වාගේ හදිසි තත්ත්වයක් ඇති වුණාම -[බාධා කිරීමක්]

රටේ මේ වාගේ අවස්ථාවක් ඇති වුණාම අපි විවාදයක් ඉල්ලනවා. අපි ඒ විවාදය ඉල්ලුවාම, කථානායකතුමා හැටියට ඔබතුමා ඒ විවාදය ලබා දීම පැත්තේයි ඉන්න ඕනෑ. පක්ෂ නායකවරුන්ගේ සාකච්ඡාව අහිභවා, මෙම ස්ථාවර නියෝගය යටතේ ඔබතුමාගෙන් ඒ විවාදය ඉල්ලා සිටීමේ අයිතියක් හා බලයක් අපට තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව, මේ මන්ත්‍රීවරු විසිදෙනාගේ පැත්තේ ඉන්න ඔබතුමාටත් වගකීමක් තිබෙනවා. මා දන්නේ නැහැ, ඔබතුමා කවුරුද ආරක්ෂා කරන්නේ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට කිසි කෙනෙක් ආරක්ෂා කරන්න හේතුවක් නැහැ. මම මේ සම්බන්ධයෙන් සෑම පක්ෂයකම නියෝජිතයන් සමඟ අද සාකච්ඡා කළා. පක්ෂ නායක රැස්වීමට සෑම පක්ෂයකම නියෝජිතයන් පැමිණ සිටියා. ඒ අයගේ අදහස් විමසා, ඒ අනුව තමයි මා මේ ක්‍රියාමාර්ගය ගන්නේ. මා දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් ඒ කරුණු පැහැදිලි කළා. එතුමා අවසර ඉල්ලුවා, අද මේ ගැන පාර්ලිමේන්තුවේ සඳහන් කරන්න. ජනතා විමුක්ති පෙරමුණ අද සභාව කල්තැබීමේ යෝජනාවක් ගෙනාවා. ඒක මා පිළිගත්තා. ඒ විධියට, හෙටත් යෝජනාවක් දෙන්න ඔබතුමන්ලාට පුළුවන්. හෙට දවස පුරාම ඒ ගැන කථා කරන්න පුළුවන් කියලා සභානායකතුමාත් සඳහන් කළා. අද දිනට නියමිත කටයුතුවලට බාධා නොවන ආකාරයට, ඔබතුමන්ලා සඳහන් කරන ජාතික වැදගත්කමකින් යුත් කරුණුත් ප්‍රධාන කටයුතුවලින් පසුව විවාදයට ගන්න පුළුවන්. ඒ සඳහා පැය දෙකක්, තුනක් වැඩිපුර දෙන්න පුළුවන්. ගරු සභානායකතුමනි, මෙතුමන්ලාට මේ සඳහා මීට අමතර වෙලාවක් දෙන්න පුළුවන්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 19. (2) (ඇ)හි මෙසේ සඳහන් වනවා:

"... එසේ වුවද, කථානායකවරයා, ස්වකීය එකඟත්වය ලබා දීම ප්‍රතික්ෂේප කළහොත්..."

ගරු කථානායකතුමනි, ඔබතුමා මේ යෝජනාව ප්‍රතික්ෂේප කරන්න. ඒ සඳහා ඔබතුමාට බලය තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දැන් එය ප්‍රතික්ෂේප කළා නේ? [බාධා කිරීම්]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, අපට මේ සම්බන්ධයෙන් 'බෙදීමක්' අවශ්‍යයි. මේ පාර්ලිමේන්තුවේ බහුතර අදහසට ඉඩ දෙන්න. ඒ ඉඩ ලබා ගැනීම සඳහා ඔබතුමා අපට 'බෙදීමක්' දෙන්න. [බාධා කිරීම්]

ඔබතුමා කාටවත් පක්ෂග්‍රාහී වෙන්න එපා. බොහොම පැහැදිලිව කියනවා, අපට 'බෙදීමක්' දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කාටවත් පක්ෂග්‍රාහී වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේදී මා ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මේ සභාවට එනතෙක් ද දැන් ඉන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එක දවසක් ඡන්දය විමසන්න රාත්‍රී 7 වෙනකම් සභාව තියාගෙන හිටියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පරණ ඒවා අවුස්සන්න එපා, ගරු මන්ත්‍රීතුමා. කරුණු දැනගෙන කථා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අද දිනට නියමිත ප්‍රධාන කටයුතුවලට අපි දැන් යමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක සැරයක් reject කළාට පස්සේ මට නැවත අවසර දෙන්න බැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ සභාවට පුළුවන් ඕනෑම යෝජනාවක් සම්බන්ධයෙන් කථානායකතුමාගේ අනුමැතිය පතන්න. අද අපේ බහුතර මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම වන්නේ, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ කිරි පිටිවල මිල වැඩි වීම නිසා ඇතිවෙලා තිබෙන ප්‍රශ්නය ගැන කථා කරන්න ඉඩ දෙන්න කියන එකයි. ඒ ඉල්ලීමට සභාව විරුද්ධයි නම් ඡන්දයක් විමසලා ඒක පෙන්වන්න. සභාවේ වැඩි දෙනෙක් කැමැතියි මේ ප්‍රශ්නය විවාද කරන්න. අපි ඉල්ලන්නේ එච්චරයි. ගංවතුරට යට වෙච්ච මිනිස්සු ගැන කථා කරන්න අපට දැන් ඉඩ දෙන්න. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඇයි ඔබතුමන්ලා ඒකට විරුද්ධ? මේ රටේ ජනතාව දුකට වැටිලා තිබෙන වෙලාවක ඒ සම්බන්ධයෙන් කථා කරන්න ඇයි ඔබතුමන්ලා ඉඩ නොදෙන්නේ? පුදුම කථාවක් නේ මේක.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තමුන්නාන්සේලා අද දින න්‍යාය පත්‍රයේ කටයුතු කරගෙන යන්න එකඟ වුණා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, තමුන්නාන්සේලා මේ විවාදයට විරුද්ධ වෙන්නේ ඇයි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ යෝජනාව ප්‍රතික්ෂේප කළාට පස්සේ නැවත අනුමැතියක් දෙන්න මට බලයක් නැහැ. මම ඒ යෝජනාව ප්‍රතික්ෂේප කළා. Now, I cannot allow that to be taken up. ඒක කරන්න බැහැ. ස්ථාවර නියෝග අනුව,- [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපි ඉතාම සාධාරණ ඉල්ලීමක් තමයි ඔබතුමාගෙන් ඉල්ලන්නේ.මේ පාර්ලිමේන්තුවේ දැනට සිටින මන්ත්‍රීවරු සංඛ්‍යාවෙන් බහුතරයක් නැඟී සිට ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, "අපට මේ විවාදය කරගෙන යන්න ඉඩ දෙන්න" කියලා. ඔබතුමා ඒ ගැන ගත්ත තීරණය නැවත වෙනස් කරන්න බැහැ කියලා නේ කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග අනුව ඒක කරන්න බැරි නිසායි කියන්නේ. පුළුවන් කමක් තිබෙනවා නම් මම කියනවා. බහුතර මතය-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්ථානය පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුවට පැමිණ සිටින මන්ත්‍රීවරුන්ගෙන් බහුතරය නැඟිටලා, "රටේ වැදගත් ප්‍රශ්නයක් ගැන යම් විවාදයක් කරන්න අපට අවස්ථාව දෙන්න" කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා නම්, ඒ ඉල්ලීම සභාවට ඉදිරිපත් කරලා ඒ ගැන විවාදයක් කරනවාද නැද්ද කියලා තීන්දුවක් ගන්න සභාවට ඉඩ දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග අනුව මට ඒක කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒකයි, මට තිබෙන ප්‍රශ්නය.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නමුත් ඔබතුමාට සභාවෙන් ඒ ගැන අහන්න අයිතියක් තිබෙනවා. ඔබතුමා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රතික්ෂේප කළාට පසුව ආපහු දෙන්න බැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පැන නැඟුණාම ඔබතුමා තීරණයක් දුන්නා. එහෙම නම් කරන්න තිබෙන්නේ ඒ තීරණය challenge කරන්නයි. ඒ ගැන නැවත ඡන්දයක් ඉල්ලන්න බැහැ. Hon. Speaker, you have given a ruling and now they want me to give you an opinion. You have given a Ruling and finished it. If they want to challenge the Ruling, they have to bring in a Motion and discuss it on another day. That is all. ඒ ගැන යෝජනාවක් ඉදිරිපත් කරලා අපි වෙන දවසක කථා කරමු.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Shall we appoint a Committee for that?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

යෝජනා කළොත් අපි Committee එකක් පත් කරන්නම්. ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා මගෙන් ඒකනේ අහන්නේ. මම ආවේ මෙතැන මොකක්ද වෙන්නේ කියලා බලන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එහෙම නම් මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, අද දවසට නියමිත වැඩ කටයුතු කරන්න අවසරය දෙන්න කියලා. අපට හෙට දවස පුරාම ගංවතුර ගැන විවාදය පවත්වන්නට පුළුවන්. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, අපේ ගරු අගමැතිතුමාත් මේ කාරණය පිළිබඳව මතක් කළා. ඒ නිසා අද අපට මේ ගංවතුර පිළිබඳව විවාද කරන්න ඉඩ දීලා, මේ නියමයන් ගැන හෙට විවාද කරන්න ඉඩ දෙන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේ රටේ ජනතාවට බලපාන වැදගත් කරුණක් ගැනයි අපි කථා කරන්න ඉල්ලන්නේ. ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා ඉදිරිපත් කිරීමට නියමිත නියමයන් ගැන අපට හෙට දිනයේ කථා කරන්න පුළුවන්. ඒක හෙට උදේ ඉර පායන විට එන ප්‍රශ්නයක් නොවෙයි නේ. නමුත්, මේ ගංවතුර කියන්නේ මේ රටේ මිනිසුන්ට ලොකු ප්‍රශ්නයක්; දැවෙන ප්‍රශ්නයක්. මේ රටේ මිනිසුන්ගේ ප්‍රශ්න ගැන පාර්ලිමේන්තුවේ අපි කථා කරන්නේ නැත්නම් කවුද කථා කරන්නේ? මේ රටේ අහිංසක ජනතාවගේ ප්‍රශ්නයක් ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්න අපට අයිතියක් තිබෙන්නට ඕනෑ. අන්න ඒක ගැනයි අපි මේ කියන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

මේ රටද, නියමයන්ද ලොකු?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, අද දින විවාදයට භාජනය කිරීමට බලාපොරොත්තු වන්නේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන්. ගරු ඇමතිතුමා වුණත් පිළිගන්නවා ඇති, මේ වන විට ඇති වී තිබෙන මේ මානෘකාවට වැඩිය බරපතළ ප්‍රශ්නයක් ගැන කථා කිරීමටයි අපි ඉල්ලන්නේ කියන එක. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පවා මෙයට එකඟයි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා එකඟයි; "ටීඑන්ඒ" එකේ මන්ත්‍රීතුමන්ලා පවා එකඟයි. සියලු දෙනාම එකඟයි, ගංවතුර ආපදා තත්ත්වය ගැන කථා කිරීමට. මොකද, විදේශ ආයෝජන ගැන කථා කළත් වැඩක් නැහැ. එක විදේශ ආයෝජකයකුවත් මේ රටට එන්නේ නැහැ. ඒක ගැන කථා කරලා වැඩක් නැහැ, ආයෝජනය කරන්න බල්ලෙක්වත් මේ රටට එන්නේ නැහැ.

ඊට වැඩිය ප්‍රශ්න මිනිසුන්ට තිබෙනවා. භූමිතෙල් මිල වැඩි වෙලා, කිරි පිටි මිල වැඩි වෙලා, බඩු මිල වැඩි වෙලා, ගංවතුර ඇවිල්ලා. ගරු කථානායකතුමනි, මේ විශේෂ කාරණයක් ගැන කථා කරන්නයි අවසර ඉල්ලන්නේ. එම නිසා මේ ගැන විවාදයක් දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඩීසල් මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු කථානායකතුමනි, "මේ රටට බල්ලෙක්වත් එන්නේ නැහැ"යි කියලා ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා අපහාස කළා. [බාධා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධයෙන් ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ නිසා ඒ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඉන්ධන මිල ඉහළ යාම නිසා ඇති වී තිබෙන මහජන පීඩාව පිළිබඳව අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් අපි කලින්ම ඉදිරිපත් කර තිබෙනවා. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ඔබතුමාට ඒක නිසි පරිදි භාර දී තිබෙනවා. අද දිනයට නියමිත සභාව කල් තබන අවස්ථාවේ විවාදයත් ජනතාවට සුවිශාල වශයෙන් බලපාන ප්‍රශ්නයක් පිළිබඳවයි. ඒ වාගේම ගංවතුර ප්‍රශ්නයත් ජනතාවට සුවිශාල ලෙස බලපාන ප්‍රශ්නයක්. අපි ඒක පිළිගන්නවා. ඒ නිසා පක්ෂ නායක රැස්වීමේ මේ පිළිබඳව කළ සාකච්ඡාවේ දී අපි ඉදිරිපත් කළ කාරණය තමයි, අද මේ පිළිබඳව විවාද කිරීමට අවස්ථාව ලබා දෙන්න කියන එක. මේ ප්‍රශ්න දෙකම වැදගත්. ගංවතුර හදිසියේ ඇති වුණු දෙයක්, අනෙක ආණ්ඩුව ගත් තීන්දුවක් මත ඇති වුණු දෙයක්. එම සාකච්ඡාවට ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් සම්බන්ධ වුණා. අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටියා, මේ ප්‍රශ්නය පිළිබඳව වැඩි කාලයක් විවාද කරන්නට අවශ්‍ය නිසා මෙම කල් තැබීමේ විවාදය සඳහා වැඩි පැය ගණනක් ලබා දෙන්න කියලා. මොකද, අපි ඉදිරිපත් කර තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවත් ජනතාවට ඍජුව බලපාන ප්‍රශ්නයක් නිසා. බඩු මිල ඉහළ යාමත් ඒකට සම්බන්ධයි. ඇත්තටම අපට අවශ්‍ය වන්නේ

ගංවතුර ආපදා තත්ත්වය පිළිබඳවත් යම්කිසි සාකච්ඡාවක් කරන්න නම්, මෙම කල් තැබීමේ විවාදය ඇතුළේම ඒක කරන්න පුළුවන් කියලා මා හිතනවා. මහජන පීඩාවක් සම්බන්ධයෙන් නේ, කථා කරන්නේ. ගරු සභානායකතුමා එකඟ වෙනවා නම්, අපර භාග 1.00ට පටන් ගන්නා විවාදය අපර භාග 4.00ට අවසන් කරලා, පැය තුනක්, හතරක් හෝ ඊට වැඩි කාලයක් හරි කමක් නැහැ, ජනතා විමුක්ති පෙරමුණේ ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන Adjournment Motion එක විවාදයට ගන්න. එම Adjournment Motion එක පිළිබඳ විවාදයේ දී ආපදා කළමනාකරණ ඇමතිතුමා හරි කවුරු හරි ඒ සම්බන්ධයෙන් වග කිවයුතු ඇමතිවරයකු ආවාම, ගංවතුර පිළිබඳ ප්‍රශ්නය ගැනත් කථා කරන්න පුළුවන්; අපි ඉදිරිපත් කර තිබෙන තෙල් මිල ඉහළ යාම පිළිබඳ ප්‍රශ්නය ගැනත් කථා කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එකඟයි. ඒ විධියට කරගෙන යමු. බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පස් වරු 4.00 වෙන කල් අද දිනට නියමිත කටයුතු කරගෙන යමු. ඊට පස්සේ Adjournment Motion එක ගනිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අද ඒ විධියට කරගෙන යමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගැසට් පත්‍රයේ පළ කරන ලද BOI එක සම්බන්ධ නියමයන් දෙක අද විවාදයට නොගෙන ඉදිමු. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කියපු අදහස ගැන යමක් කියන්න ඕනෑ. මේ අමාත්‍යාංශය යටතේ අපිට දැන් බරපතළ ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. චීනය පවා කියනවා, ඒ අය ගිවිසුමෙන් රැවටිටුවා කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
එය අසත්‍යයක්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
චිනය අසත්‍යයක් කියලා නැහැ. තමුන්නාන්සේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අසත්‍ය ප්‍රකාශ කළා. චීනය රැවටිටුවා. දැන්, චීනය දූපතක් ඉල්ලනවා. [බාධා කිරීමක්] හරි, ඒක නිසා මේ නියමයන් දෙක පිළිබඳව හෙට දිනයේ විවාද කරන්න අපි සූදානම්. අපට අවස්ථාවක් දෙන්න, ගංවතුර ආපදා තත්ත්වය සහ ඉන්ධන අර්බුදය පිළිබඳව අද මුළු දවසේම විවාද කරන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේ කලබල නොවී ඉන්න. තමුන්නාන්සේ චීනයත් රැවැටිටුවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දවසේ න්‍යාය පත්‍රය හදන්නේ ආණ්ඩු පක්ෂයෙන්. විපක්ෂයෙන් නොවෙයි. [බාධා කිරීම්] න්‍යාය පත්‍රය හදන්නේ ආණ්ඩුව. විපක්ෂය නොවෙයි. [බාධා කිරීම්] න්‍යාය පත්‍රය හදන්නේ අපි. [බාධා කිරීම්] අපි හදන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මිනිස්සු වතුරට යට වෙනවා. මොකද ඒක ගැන කථා කරන්න දෙන්න බැරි? ඇයි, මෙහෙම හැසිරෙන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ වැඩත් කරලා, මෙතුමන්ලා කියන වැඩේත් කරමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අද මිනිස්සු ගංවතුරට යට වෙලා.

තමුන්නාන්සේලාගේ වැඩ නිසා ගං වතුරට හසු වෙච්ච ඒ මිනිස්සු අද කන්න නැතිව ඉන්නවා. ඒ මිනිසුන්ට කෑම ටික දී ගන්න බැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි පස් වරු 4.00 වනතුරු අද දිනට නියමිත විවාදය කරගෙන ගිහින්, ඊට පසුව Adjournment Motion එක ගනිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, එතකොට පැය 3ක් තිබෙනවා නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අද සම්පූර්ණ වෙලාවම අපේ විවාදයට ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දැන් අපි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වූ නියමයන්ට අදාළ විවාදය පටන් ගනිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පස් වරු 4.00 වනතුරු ඒ පිළිබඳ විවාදය ගෙන යමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්, පස් වරු 4.00 වනතුරු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ විධියට කටයුතු කරගෙන යමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පස් වරු 4.00 වනතුරු මෙම විවාදය පවත්වාගෙන ගිහින්, ඊට පසුව මෙතුමන්ලා කියන විවාදය ගනිමු. පස් වරු 6.30 නොවෙයි, ඕනෑ නම් පස් වරු 7.30 වනතුරු ඒ විවාදය කරගෙන යමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
7.30 දක්වා ගෙන යන්න බැහැ; වහිනවා. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාට ගෙදර යන්න හදිස්සියද? [බාධා කිරීම්] ගෙදර යන්න හදිස්සිය. විවාද ඉල්ලනවා. ගෙදර යන්නත් හදිස්සියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ප්‍රධාන වැඩ කටයුතුවලට යමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා එකඟයි, අදට නියමිත විවාදය නොගෙන ඉන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් කිව්වා නේ. දැන් කිව්වා, විවාදය නොගෙන ඉන්න - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can debate the Orders of the Day till 04.00 p.m. and move the Adjournment Motion after that. We can extend the time if needed. ගරු සභානායකතුමා ලෑස්තියි, තවත් පැයක් ලබාදෙන්න. එහෙම නම්, අද ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කරමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පස් වරු 4.00 දක්වා විවාද කරලා, ඊට පසුව එම විවාදය කල් දමනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. There will be a Vote.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
There will be a Vote.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දවසේ න්‍යාය පත්‍රය හදන්නේ ආණ්ඩුවයි. එතුමන්ලා තවම එය දන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපේ අමාත්‍යතුමා කියන ඒ ගැසට් පත්‍රය මේ ගරු සභාවේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ ගැසට් පත්‍රය අපේ table එක උඩ නැහැ. ගරු අමාත්‍යතුමනි, ඉතින් අප කොහොමද මේ නියමයන් පිළිබඳව විවාද කරන්නේ? ගරු කථානායකතුමනි, ඒ ගැසට් පත්‍රය නැහැ, මේ ගරු සභාවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම check කරලා බලන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එය මේ ගරු සභාවේ නැහැ. මෙහි නොමැති ගැසට් පත්‍රයක ඇති නියමයන් ගැන අපි කොහොමද විවාද කරන්නේ?

ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමනි, එය අපිට ඉදිරිපත් කර නැහැ. ගැසට් පත්‍රය නැතිව අපි ඒ ගැන සාකච්ඡා කරන්නේ කොහොමද? ඔබතුමන්ලා තීන්දු කරනවාය කියා කිව්වාට, කෝ තීන්දු?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳව check කරලා බලනතුරු පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමනි, අද නොවෙයි, කලින් දිනයක මෙම ගැසට් පත්‍රය ඉදිරිපත් කර තිබෙනවා. ඕනෑ නම් ඔබතුමාට අද එහි පිටපතක් ලබාදෙන්න පුළුවන්. It has already been presented before.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ කවදාද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පසුගිය මාර්තු 20වන දා එම ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඕනෑ නම් අද නැවතත් ඒකේ පිටපතක් ලබා දෙන්න පුළුවන්. [බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මාර්තු 20වන දා එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

දැන් අපි අද දිනට නියමිත කටයුතු ආරම්භ කරමු. වෙන කරන්න දෙයක් නැහැ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we will go on till 04.00 p.m. Then, you can move the Adjournment Motion and we will go on till 07.30 p.m.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can argue for several hours.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
There will be about three hours.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මෙම විවාදය සම්බන්ධයෙන් පස් වරු 4.00ට ඡන්දය ගන්නවාය කියා අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල සභානායකතුමා කියනවා. නමුත්, ඡන්දය ගන්නේ හයහමාරට කියායි ඔබතුමා announce කර තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, හරි. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. ඡන්දය කලින් ගන්න බැහැ. අපේ මන්ත්‍රීතුමන්ලා එන්න එපා යැ. කොහොමද කලින් ඡන්දය ගන්නේ? You cannot shift the time of voting without the consent of the House. එහෙම නම් House එකේ consent එක ගන්න; you should get the consent of the House.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Then, we can have the Vote at 06.30 p.m. - [*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You cannot change the time of voting without the consent of the House. How can you change the time of voting like that? නිකම් විහිළු වැඩ නේ කරන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we will allow them after 04.00 p.m.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
So, you conclude at 04.00 p.m. and have the Adjournment Motion.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we will have the Vote at 04.00 p.m.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You know that you can adjourn the Debate without a Vote. We will agree on that.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආණ්ඩුවේ වැඩ කඩාකප්පල් කරන්න එපා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි ඒවා කඩාකප්පල් කරන්නේ නැහැ. අපේ මන්ත්‍රීතුමන්ලාට ගංවතුර ගැන කථා කරන්න දෙන්න, ගරු සභානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකත් ජාතික වැදගත්කමින් යුත් ප්‍රශ්නයක්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ කාරණයේ ජාතික වැදගත්කමක් තිබෙනවා, ගරු කථානායකතුමනි. පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, කිරි පිටි ගැනත් අපි කථා කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේ කාරණා දෙකම ගැන විවාද කරමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි මේ දේවල් ගැන කථා කරන්න ඕනෑ. මෙතුමන්ලාට දැන් ඒවා ගැන කථා කරන්න මතක නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩුවේ න්‍යාය පත්‍රයත්, තමුන්නාන්සේලාගේ කාරණාත් ගැන මේ විධියට කරමු කියා අපි සාධාරණව සාකච්ඡා කරලායි තිබෙන්නේ. එහෙම නැති වුණොත්, අපිට තව පැය ගණනක් නාස්ති කරන්න සිදු වෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාට මහ ජනයාගේ දුක දැනෙනවා නේද, ගරු කථානායකතුමනි?

பொருளாதார ரீதியான தந்திரோபாயமான செயற் றிட்டங்களை வகுக்கின்றபோது SWOT analysis என்கின்ற பகுப்பாய்வு செய்யப்படுவது எங்களுக்குத் தெரியும். SWOT என்பது ஒரு குறியீடாக இருக்கின்றது. அதாவது ஒரு செயற்றிட்டத்தை மேற்கொள்வதற்கு முன்பு அது குறித்து ஆய்வுகள் செய்யப்பட வேண்டும். அதாவது அதில் என்ன பலம் - strength இருக்கின்றது, என்ன பலவீனங்கள் - weakness இருக்கின்றன என்பதைப் பற்றிப் பார்க்க வேண்டும். அதேநேரம் Opportunity என்று சொல்லப்படுகின்ற

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

සන්දර්ප්පත්තைப் பயன்படுத்துகின்ற தன்மை இருக்க வேண்டும். இதனைவிட குறித்த திட்டத்தை நடைமுறைப்படுத்துகின்ற போது ஏற்படக்கூடிய Threat அல்லது challenges என்று சொல்லப்படுகின்ற சவால்கள் என்னவென்பது பற்றியும் ஆராய்ந்துகொள்ள வேண்டும். அநேகமான கருத்திட்டங்கள் அல்லது செயற்றிட்டங்கள்மீது உண்மையில் விஞ்ஞான ரீதியான ஆய்வுகள் மேற்கொள்ளப்படுவது மிகவும் முக்கிய மானது.

வளர்ச்சியடைந்த நாடுகளில் ஒரு செயற்றிட்டத்தினை அமுல்படுத்துவதற்கு அல்லது திட்டமிடுவதற்கு முன்பாக அது குறித்துப் பல்வேறுபட்ட ஆய்வுகள் செய்யப்படுகின்றன. குறிப்பாக பௌதிக வளங்களைப் பற்றிப் பார்க்கப்படுகின்றது. அதாவது, நில வளம் இருக்கின்றதா? நீர் வளம் இருக்கின்றதா? கனிய வளங்கள் இருக்கின்றனவா என்பதைப் பற்றியெல்லாம் ஆய்வு செய்கின்ற அதேவேளை, அங்கிருக்கின்ற மக்கள் குறித்த செயற்றிட்டத்தினை அங்கீகரிக்கக்கூடிய மனப் பாங்குடன் இருக்கின்றார்களா? என்ற விடயமும் ஆய்வுக்குட்படுத்தப்பட வேண்டியுள்ளது. அந்தச் செயற் றிட்டங்கள் பயனுறுதிவாய்ந்த, தந்திரோபாயமானதாக இருந்தாலும் மக்கள் மத்தியில் சென்று அது சம்பந்தமாக ஆய்வுகள் செய்யாமல் அவற்றை நடைமுறைக்குக் கொண்டுவரும் நிலையில், மக்கள் அதிருப்தியடைந்து எதிர்ப்பைக் காட்டுகின்றபோது அவற்றினை நடைமுறைப் படுத்துவதென்பது கடினமான விடயமாக அமைந்து விடுகின்றது. இத்தகைய தந்திரோபாயமான செயற் றிட்டங்களை, திட்டமிடப்பட்டு மக்களுக்குத் தெரியாமல் 'பரசூட்' மூலமாகக் குண்டுகளை இறக்குவதுபோன்று மக்கள் மத்தியில் கொண்டுசெல்கின்றபோது மக்கள் அது சம்பந்தமாக எதிர்ப்புக்களைத் தெரிவித்துக் கொடி பிடிக்கின்ற அல்லது ஆர்ப்பாட்டம் செய்கின்ற நிலைமைகளையும் கடந்த காலத்தில் நாங்கள் பார்த்திருக்கின்றோம்.

ஒரு செயற்றிட்டத்தினை மேற்கொள்ளும்போது சூழலியல் சம்பந்தமாகவும் முழுமையாக ஆய்வு செய்யப்பட வேண்டும். ஒரு செயற்றிட்டத்தினை positive side, negative side என இரண்டு விதமாகப் பார்க்க முடியும். அந்த வகையில் அதன் அமுலாக்கத்தில் நேர்கணியமாக என்ன நன்மைகள் இருக்கின்றன? எதிர்கணியமாக ஏற்படக்கூடிய தீமைகள் எவை? என்பன பற்றியெல்லாம் ஆய்வு செய்துகொள்ள வேண்டும். அவ்வாறு ஆய்வுசெய்து, நேர்கணியமான தன்மையை - positive வழிமுறைகளை அதிகரிப்பதோடு, negative எனப்படும் எதிர்கணியமாக இருக்கின்ற தீமைகளை எவ்வாறு கட்டுப்படுத்தலாம் அல்லது குறைக்கலாம் என்பது பற்றி எல்லாம் நாங்கள் சிந்தித்தாக வேண்டும். இலங்கையில் கருத்திட்டங்களை - தந்திரோபாய செயற்றிட்டங்களை மேற்கொள்கின்றபோது, அறிவியல் பூர்வமாக அதாவது விஞ்ஞான பூர்வமாக - scientific என்று சொல்வார்கள் - அவற்றை எந்தளவுக்கு ஆய்வுசெய்து பார்த்திருக்கின்றோம்; அலசிப் பார்த்திருக்கின்றோம் என்பது பற்றி ஆராய்வது மிக முக்கியமாகும். கடந்த காலத்தில் மேற்கொள்ளப்பட்ட செயற்றிட்டங்களில் சில வெற்றியளிக்காமல், தோல்வியடைந் திருக்கின்றன. மக்களின் ஒத்துழைப்பைப் பெற்றுக் கொள்ளாமை, சரியான ஆய்வுகளைச் செய்யாமை போன்ற காரணங்களினால்தான் அதுதொடர்பில் பல தோல்விகளைச் சந்தித்திக்க நேரிட்டது. சிலவேளைகளில், கோடிக்கணக்கான முதலீடுகளை இழந்துநிற்கின்ற தன்மையும் இருக்கின்றது.

கடந்த காலத்தில் யுத்தம் காரணமாகப் பல தொழிற் சாலைகள் முழுமையாக மூடப்பட்டுக் காணப்பட்டன. நான் மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்து கின்றவன் என்ற வகையில் குறிப்பாக எனக்கு ஒரு விடயத்தைக் குறிப்பிட முடியும். அதாவது அங்கு sustainable என்று சொல்லக்கூடிய விதத்தில், ஐக்கிய தேசியக் கட்சியின் ஆட்சிக்காலத்தில் ஒரு காகித ஆலை தொடர்ச்சியாக இயங்கி வந்தது. ஜீ.ஜீ. பொன்னம்பலம் அவர்கள் கைத்தொழில், விஞ்ஞான விவகார அமைச்சராக இருந்தபோது, மட்டக்களப்பைச் சேர்ந்த ஐக்கிய தேசியக் கட்சிப் பிரமுகரான நல்லையா என்பவரின் முயற்சியின் காரணமாகவே அந்தக் காகித ஆலை அமையப்பெற்றது என்று நான் நினைக் கின்றேன். உண்மையில் நிலையானதோர் அபிவிருத்தியைக் கொண்டுசெல்லக்கூடிய விதத்தில், அங்கு நெல் அறுவடையின் பின்னர் பெறப்படுகின்ற வைக்கோலைப் பயன்படுத்தி அந்தத் தொழிற்சாலை இயங்கிவந்தது. அதேநேரம் அதற்குப் போதியளவு பௌதிக வளங்கள் கிடைக்கக்கூடியதாகவும் இருந்தது. அந்த வகையில் அது நிலையானதாகவும் நிறைய வருமானங்களை ஈட்டித்தரக்கூடியதாகவும் இருந்தது. ஆனால், இன்று அந்தத் தொழிற்சாலை தோல்வியில் முடிந்ததற்குக் காரணம், அதன் நிர்வாகப் பொறிமுறையுடன் தொடர்புடைய விடயமாகும்.

அநேகமாக எமது நாட்டில் ஒரு முதலீட்டுத் திட்டத்தைத் தொடங்குவதற்கு முன்பு அது குறித்துத் தரகுப் பணம் வாங்குகின்ற செயற்பாடு நடைமுறையில் காணப்படுகின்றது. இதனை commission என்று சொல்வார்கள். இந்த வகையில் அங்கு ஊழல், மோசடிகள் நடக்கக்கூடிய நிலைமைகள் காணப்படுகின்றன. இந்தச் செயற்பாடானது, "சுண்டங்காய் காற்பணம் சுமை கூலி முக்காற்பணம்" என்று தமிழில் சொல்லப்படும் கூற்றுக்கமைவாகக் காணப்படுகின்றது. அதாவது, கிடைக்கின்ற வருவாயைவிட, செலவுகள் அதிகரிக்கின்ற தன்மை காணப்படுகின்றது. அப்படியானால் குறித்த செயற்றிட்டம் தந்திரோபாயமானதாக அமையாமல், ஓர் அரசியல் நோக்கம் கொண்டதாக - சிலரது அபிவிருத்தியை அடிப்படையாகக் கொண்டதாக அமைவதற்கு வாய்ப்புகள் இருக்கின்றன.

வளர்ச்சியடைந்த - அபிவிருத்தியடைந்த நாடுகளின் உற்பத்தித் திறனை மையமாக வைத்துப் புள்ளிவிபர ரீதியாகப் பார்த்தால், கடந்த காலத்தில் ஜப்பான் நாட்டின் productivity - உற்பத்தித் திறனானது ஏறத்தாழ 60ஆக இருப்பதைக் காணலாம். இது, நான் சில ஆண்டுகளுக்கு முன்னர் வாசித்த ஒரு புள்ளிவிபரமாகும். சிலவேளைகளில் தற்பொழுது அது 60ஐயும் தாண்டியிருக்கலாம். இதற்கான formula - சூத்திரம், வெளியீட்டினை உள்ளீட்டினால் வகுக்கும்போது - outputஐ inputஇனால் வகுக்கும்போது - உற்பத்தித் திறன் கிடைக்கின்றது என்பதாகும். இலங்கையின் productivity யானது, 1.6 ஆக இருக்கின்றது. இதனடிப்படையில் யப்பான் எங்களைவிட எவ்வளவு தூரம் முன்னிலையில் இருக்கின்றது என்பதைப் பாருங்கள்! இதற்குக் காரணம் அந்த நாட்டில் செயற்றிட்டங்கள் - கருத்திட்டங்கள் தந்திரோபாயமாக வகுக்கப்பட்டிருப்பதோடு, வீண்விரயம் இல்லாமல், ஊழல் மோசடிகள் இல்லாமல் முன்னெடுத்துச் செல்லப்படுகின்ற மையாகும்.

அண்மையில் ஊடகங்கள் மூலமாக நாங்கள் ஒரு விடயத்தை அறியக்கூடியதாக இருந்தது. அதாவது, ஜனாதிபதி செயலகத்தில் பணியாற்றிய ஒரு முக்கிய புள்ளி, குறித்த ஒரு செயல்திட்டம் - அது கந்தளாய் சீனித் தொழிற்சாலை என்று நினைக்கின்றேன் - நடைமுறைப்படுத்தப்படுவதற்கு முன்பாகவே அது குறித்துக் கோடிக்கணக்கான ரூபாயைப் பேரம்பேசி, இலஞ்சம் பெற்ற சம்பவமாகும். இவ்வாறான

செயற்பாடுகள் இலங்கையில் காணப்படுகின்ற வரைக்கும் தந்திரோபாயமான செயல்திட்டங்களை அல்லது கருத் திட்டங்களை நடைமுறைப்படுத்துவது என்பது கடினமானதாக இருக்கும். ஆகவே, முதலீடுகளைச் செய்கின்றவர்கள் மத்தியில் "சம்பந்தப்பட்டவர்களுக்கு எதையாவது கொடுத்துவிட்டால், அவர்கள் எவரும் குறித்த விடயத்தில் தடையாக இருக்கமாட்டார்கள்" என்கின்ற ஒரு நிலைப்பாடு காணப் படுவதால், கையூட்டுப் பெறுகின்ற தன்மை, தரகுப் பணத்தைப் பெற்றுக்கொள்கின்ற தன்மை, மோசடிகளைச் செய்கின்ற தன்மை என்பன காணப்படுகின்றன. இவ்வாறான மோசடித் தன்மையான செயற்பாடுகள் உடனடியாகக் கண்டறியப்பட்டு, உரிய நடவடிக்கை எடுக்கப்பட்டு, உரியவர்கள் கைது செய்யப்பட்டமை உண்மையில் வரவேற்கத்தக்க விடயமாக இருக்கின்றது.

இது நல்லாட்சி அரசுக்கு ஒரு சான்றாகக்கூட அமைந்திருக்கின்றது. ஆகவே, முக்கியமான பொறுப்புக்களில் வகிபாகங்களைப் பெற்றிருக்கின்றவர்கள் மிகவும் கவனமாகச் செயற்பட வேண்டும். அவர்கள் பொறுப்புணர்ச்சி மிக்கவர்களாக இருக்க வேண்டும். பட்டங்கள், பதவிகள் அல்லது அவர்களுடைய அனுபவங்களைவிட, அவர்கள் யோக்கியதை உள்ளவர்களாக இருக்கின்றபோதுதான் இந்த மோசடித் தன்மைகளையும் கையூட்டுத் தன்மைகளையும் குறைக்கக்கூடியதாக இருக்கும். சிலவேளைகளில் வெளியிலே அபிவிருத்தி என்பது மிகவும் படாடோபமாக முன்கொண்டு செல்லப்பட்டாலும், அதனை ஆழமாக அலசி ஆராய்ந்து பார்க்கின்றபோது, அந்த அபிவிருத்தியில் ஒரு பகுதி ஏதோ ஒரு விதத்தில் விரயம் செய்யப்படுவதை அல்லது தனிப்பட்ட தேவைகளுக்காக முடக்கப்படுவதைப் பார்க்கக்கூடிய ஒரு நிலைமை காணப்படுகின்றது. எனவே, தந்திரோபாயமான அபிவிருத்தி எனும்போது, முக்கியமாக அந்த அபிவிருத்தித் திட்டமானது நாட்டில் பயனுறுதி மிக்கதாக, நிலையானதாக நிலைத்து நிற்கக்கூடியதாக, மக்களுக்குப் பயன்தரக்கூடியதாக, நாட்டுக்கு வருவாயினை ஈட்டித்தரக்கூடியதாக, நாட்டில் குழப்பமடையாத ஒரு சூழ்நிலையில் அது தொடர்ந்து இருக்கக்கூடியதாக இருக்க வேண்டும். சிலவேளைகளில் நாட்டில் குழப்பம் ஏற்பட்டாலும், அந்தத் தந்திரோபாயமான கருத்திட்டம் என்பது நிலையான தாக இருக்கவேண்டும்.

வெளிநாட்டு முதலீட்டாளர்கள் இலங்கைக்கு வந்து முதலீடுகளைச் செய்வதற்கு விரும்புகின்றார்கள். ஆனால், இந்த நிலையான தன்மை - ஸ்திரத்தன்மை நாட்டில் தொடர்ந்து இருக்குமா? இன்று தாங்கள் செய்கின்ற முதலீடுகளைத் தொடர்ந்தும் தக்கவைத்துக்கொள்கின்ற ஒரு நிலைமை இருக்குமா? என்கின்ற கேள்விகளின் மத்தியில் அவர்கள் சிலவேளைகளில் தமது முதலீடுகளைச் செய்வதற்குப் பின்னடித்துவிடுகின்றார்கள். தந்திரோபாயமான கருத்திட்டம் தொடர்பில் இன்னுமொரு விடயத்தையும் சொல்வார்கள். அதாவது, தந்திரோபாயமான ஒரு கருத்திட்டத்தை முன்கொண்டு செல்கின்றபோது, "the Five Ws and H" என்பதைக் கவனிக்க வேண்டும் என்பதாகும். "The Five Ws and H" என்று சொல்கின்றபோது, யார் முதலீடு செய்வது? எங்கே முதலீடு செய்வது? அதனை எப்படி முதலீடு செய்வது? என்ன காரணத்திற்காக முதலீட்டைச் செய்யவேண்டும்? என்கின்ற விடயங்களெல்லாம் முறையாகப் பகுப்பாய்வு செய்யப்பட வேண்டும். ஆனால், சில கருத்திட்டங்கள் அரசியல் நோக்கத்திற்காக, அரசியல் தேவைக்காக, ஒரு குறிப்பிட்ட பிரிவினரின் நன்மைக்காகச் செய்யப்படுகின்றன. சில வேளைகளில் அதனைச் செய்வதன் மூலமாகக் குறிப்பிட்ட நபர்களுக்குச் சில வரப்பிரசாதங்கள் கிடைக்கக்கூடிய ஒரு நிலைமை காணப்படுகின்றது. இவ்வாறான விடயங்களை யெல்லாம் அடிப்படையாகக்கொண்டு செய்யப்படுகின்ற கருத்திட்டங்கள் தந்திரோபாயமான கருத்திட்டங்களாக அமையாது. அந்த வகையில் சம்பந்தப்பட்டவர்கள் சுயநல அடிப்படையில் தாங்கள் உழைத்துக்கொள்வதற்குச் செய்கின்ற கருத்திட்டங்களாக அவை அமையுமே ஒழிய, நாட்டுக்கும் மக்களுக்கும் உரிய கருத்திட்டங்களாக அமைவதற்கு வாய்ப்பில்லை. எனவேதான், இந்தக் கருத்திட்டங்களைச் செய்து வெற்றி பெற்றவர்கள் அவற்றை "successful story" என்று அல்லது "best practice" என்று சொல்வார்கள். இவ்வாறு கருத்திட்டங்களைச் செய்து வெற்றிபெற்ற நாடுகளை நாங்கள் ஒரு முன்னுதாரணமாகக் கொண்டு, அவர்களுடைய அனுபவங் களையும் பகிர்ந்து இந்தத் தந்திரோபாயக் கருத்திட்டங்களை முன்னெடுக்க வேண்டுமே ஒழிய, அதற்கு மாறாக அரசியல் தேவைக்காக, அரசியல் நோக்கத்திற்காக அவசர அவசரமாகக் கருத்திட்டங்களை முன்னெடுக்கக் கூடாது. அவ்வாறு செய்கின்ற கருத்திட்டங்கள் உண்மையில் தந்திரோபாயமான கருத்திட்டங்கள் அல்லாமல், இடைநடுவில் அப்படியே வழக்கொழிந்து போகின்ற அல்லது அப்படியே மூடப்படுகின்ற திட்டங்களாக அமையும்.

உதாரணமாக, கிழக்கு மாகாணத்திலுள்ள மட்டக்களப்பு மாவட்டத்தில், யுத்தத்திற்கு முன்னர் அங்கு 5 தொழிற் சாலைகள் இயங்கிக்கொண்டிருந்தன. இன்று அந்த 5 தொழிற்சாலைகளும் மூடப்பட்ட நிலையில் காணப்படு கின்றன. எனவே, நாங்கள் அடிக்கடி இந்தப் பாராளு மன்றத்தில் சொல்கின்ற ஒரு விடயம், ஒரு நல்லாட்சி அரசின் நல்ல சாட்சியங்களாக இருக்கவேண்டுமாக இருந்தால், பாரபட்சம் பாராது சேவையாற்ற வேண்டும் என்பதாகும். எங்களுடைய கௌரவ அமைச்சர் லக்ஷ்மன் கிரிஎல்ல அவர்கள் உண்மையில் நல்லாட்சி என்கின்ற விடயத்தில் சகல பாராளுமன்ற உறுப்பினர்களையும் சமமாக - சமத்துவமாகக் கருத்திற்கொண்டு, அபிவிருத்தி சம்பந்தமான விடயங்களுக் காக நிதிகளை ஒதுக்குகின்றார். பாதை அபிவிருத்திகளாக இருக்கட்டும் அல்லது தொழில்வாய்ப்புக்களாக இருக்கட்டும் அவர் அனைவரையும் சமமாக நடத்துகின்றார். அவர் எதிர்க்கட்சியில் உள்ளவர்களுக்குக்கூட, பல நன்மைகளைச் செய்திருப்பது பாராட்டத்தக்க விடயம் என்பதை இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இந்தத் தந்திரோபாயமான கருத்திட்டங்களை நாங்கள் உண்மையில் விஞ்ஞானபூர்வமாகப் பார்க்கவேண்டும். விஞ்ஞானபூர்வம் என்பது ஒரு நடுநிலையாக அமைந்திருக்கும். பக்கச்சார்பற்றதாக அமைந்திருக்கும். ஓர் ஆய்வு அடிப் படையில் முடிவுகளைத் தேடுகின்ற ஒரு விடயமாக அமைந்திருக்கும். ஆனால், அதனைவிடுத்து அவசர அவசர மாக மூடிய ஓர் அறைக்குள் எடுக்கப்படுகின்ற முடிவுகளை அப்படியே கொண்டுசென்று எங்காவது நடைமுறைப்படுத்த வேண்டுமென்று சொல்கின்றபோது, அவை ஒரு வகையில் தோல்வியடைந்த திட்டங்களாக அமைகின்றன.

கடந்த காலங்களில் மக்கள் மத்தியில் சென்று ஆய்வுகள் செய்யாமல், மக்களின் சம்மதத்தைப் பெறாமல் மேற்கொள்ளப் பட்ட பல தந்திரோபாயக் கருத்திட்டங்கள் - அவற்றைத் தந்திரோபாயக் கருத்திட்டங்கள் என்று சொல்வதைவிட அவசர அவசரமாக மேற்கொள்ளப்பட்ட கருத்திட்டங்கள் என்று சொன்னால் பொருத்தமானதாக இருக்கும் - வெற்றிபெறாமல் கருவிலேயே சிதைந்துபோன நிலைமைகளை எங்களால் பார்க்கக்கூடியதாக இருந்தது. ஆனால், இந்தக் கருத் திட்டங்களை நடைமுறைப்படுத்துவதற்குக் குறித்த பகுதியில் இருக்கின்ற மக்களும் அரசியல்வாதிகளும் பக்கபலமாக

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

இருக்கவில்லை - துணையாக இருக்கவில்லை என்று கடைசியில் மக்களின் பக்கமும் அரசியல்வாதிகளின் பக்கமும் குறைகளை அல்லது தோல்விக்கான காரணங்களைச் சொல்லிக்கொள்ளுகின்ற அரசியல் நோக்கம் கொண்ட ஒரு நியாயப்படுத்தலை - justification ஐச் செய்துவிடுவார்கள். அப்படியில்லாமல் உண்மையில் குறிப்பிட்ட பகுதியில் இருக்கின்ற மக்கள் எந்தளவுக்கு அந்தக் கருத்திட்டங்களை ஏற்றுக்கொண்டிருக்கிறார்கள் என்ற விடயத்தை ஒரு முன்வைத்தல் - presentation மூலமாக முறையாக அவர்களுக்கு விளங்கப்படுத்தப்பட வேண்டும். அதுமட்டுமல்லாமல், எந்தெந்த இடங்களிலெல்லாம் வெற்றிகரமாக இந்தக் கருத் திட்டங்கள் முன்னெடுக்கப்பட்டு அந்த மக்கள் பயனடைந் திருக்கிறார்கள் என்ற விடயம், கள விஜயம் - கள தரிசிப்பு மூலமாக அவர்களுக்கு விளங்கப்படுத்தப்பட வேண்டும். அவ்வாறில்லாமல் மேற்கொள்ளப்படுகின்ற எந்தவொரு கருத்திட்டத்தையும் நாங்கள் தந்திரோபாயமான கருத்திட்ட மாகக் கொள்ளமுடியாது. அதுமட்டுமல்ல, அங்கிருக்கின்ற வளங்கள் - பௌதிக வளம், நிதி வளம், மனித வளம் - முறையாக ஆய்வு செய்யப்படவேண்டிய ஒரு நிலைமை யிருக்கின்றது. இதைவிட, முறையான தகவல்கள் - information இல்லாமல் செய்யப்படுகின்ற அல்லது நடைமுறைப்படுத்து கின்ற செயற்பாடுகள்கூட வெற்றியளிக்காமல் போவதுண்டு.

எமது நாடு சுதந்திரமடைந்த காலத்திலிருந்து அதனை நாங்கள் ஒரு வளர்முக நாடு என்றும் அபிவிருத்தியடைந்து வருகின்ற நாடு என்றும் சொல்லிக்கொண்டிருக்கின்றோம். மாறாக, இந்த நாட்டை ஓர் அபிவிருத்தியடைந்த நாடாக மாற்றுவதற்கு இந்தத் தந்திரோபாயமான கருத்திட்டங்கள்- செயல்திட்டங்கள் முக்கியமாக அமையவேண்டும். இந்தத் தந்திரோபாயமான செயற்றிட்டங்கள் எங்களுக்கு வெற்றி யளிப்பதாக இருந்தால், இந்தக் கருத்திட்டங்களை ஆய்வு அடிப்படையில், விஞ்ஞானபூர்வமாக முன்கொண்டு செல்லவேண்டும். அதுமட்டுமல்லாமல் அந்தக் கருத்திட்டங் களுக்காகச் செலவு செய்கின்ற பணம் முழுக்க முழுக்க வீண்விரயம் செய்யப்படக்கூடாது; தனிப்பட்ட சுகநலன்களுக் காகச் செலவழிக்கப்படக்கூடாது என்பதும் மிக முக்கியமான விடயமாக இருக்கின்றது. எனவேதான் தந்திரோபாயமான கருத்திட்டத்தின்மூலமாக மாவட்டங்கள்தோறும் இந்தச் செயற்பாடுகள் அந்தந்தச் சூழ்நிலைக்கு ஏற்றவிதத்தில் கொண்டுசெல்லப்பட வேண்டும். குறித்த சூழ்நிலையை அனுசரிக்காத, அங்கிருக்கின்ற மக்களால் ஏற்றுக்கொள்ளப் படாத சில கருத்திட்டங்கள் நிச்சயமாகத் தந்திரோபாயத்திற்கு அப்பாற்பட்ட செயற்பாடுகளாகத்தான் அமையும் என்பதை நாங்கள் இந்த இடத்தில் பார்க்க வேண்டும்.

மேலும், உற்பத்தி பற்றிய விடயத்தில் input, output, outcome, impact என்ற எண்ணக்கருக்கள் காணப்படுகின்றன. உண்மையில் input என்று சொல்லுகின்றபோது, அது நாங்கள் அபிவிருத்திக்காகப் பயன்படுத்துகின்ற உள்ளீடுகளைக் குறித்து நிற்கின்றது. இதன்மூலமாக எங்களுக்குக் கிடைக்கின்ற இலாபங்கள் வெளியீடுகளாக வருகின்றன. அந்த வெளியீடுகள் தொடர்ந்து எங்களுக்கு நன்மையளிக்கின்றபோது அதனை outcome என்ற விதத்தில் பார்க்கின்றோம். இது நிலையானதாகத் தொடர்ந்து இருக்கின்றதா? என்பது impact என்ற எண்ணக்கரு மூலமாகப் பரீட்சித்துப் பார்க்கப் படுகின்றது. எனவே, நான் சொல்கின்ற விடயம் என்ன வென்றால், நமது நாட்டில் பல செயற்றிட்டங்கள்- கருத்திட்டங்கள் பரீட்சார்த்தமான முறையில் மேற்கொள்ளப் பட்ட போதிலும், அவை அநேகமாகத் தோல்வியில் முடிந்தவையாகத்தான் காணப்படுகின்றன. அவற்றில் நட்டத்தில் இயங்குகின்ற கருத்திட்டங்கள்கூட காணப்படு கின்றன. மாறாக, வினைத்திறன் மிக்கதாகவும் விளைதிறன் மிக்கதாகவும் நிலைபேறாக இருக்கக்கூடியதாகவும் மக்களுக்கும் நாட்டுக்கும் நன்மையளிக்கக்கூடியதாகவும் அமைந்திருக்கக்கூடிய விதத்தில் இந்தக் கருத்திட்டங்களை நாங்கள் திட்டமிட்டுச் செயற்படுத்த வேண்டும். இதன்போது பக்கச்சார்பு, அரசியல் நோக்கம் இல்லாமல் மிகவும் கண்ணியமாக இவற்றை நடைமுறைப்படுத்த வேண்டும்.

எனவே, நீங்கள் நடைமுறைப்படுத்துகின்ற செயற் றிட்டங்கள் மூலமாக மூடப்பட்ட தொழிற்சாலைகளை உயிர்ப்புடன் செயற்படுத்தி, அங்குள்ள மனிதவளங்கள் தொழில்வாய்ப்புகளைப் பெறக்கூடியதாகவும் அதன்மூலமாகக் கிடைக்கும் வருவாயில் அவர்களது வாழ்வாதாரத்தைக் கட்டியெழுப்பக்கூடிய விதத்திலும் அவற்றினை மாற்றிய மைக்க வேண்டும் என்று கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

நன்றி. Hon. Niroshan Perera, please. You have 11 minutes.

[අ.භා. 2.35]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව පටන් ගන්න ප්‍රථමයෙන්, මේ දිනවල රට පුරා ඇති වී තිබෙන ගංවතුර තත්ත්වයෙන් පීඩා විඳින ජනතාව වෙනුවෙන් අපගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. රජයක් හැටියට අපි අපේ හමුදාව සක්‍රියව මේ සඳහා යොදවා, ඒ ආපදා තත්ත්වය අවම කරලා, ජනතාවට සහන ලබාදීමට කටයුතු කරගෙන යනවා.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් දෙකක් ගැන අද දින අපි විවාද කරනවා. සංවර්ධනය පැත්තෙන් අද ශ්‍රී ලංකාව ඉතාම තීරණාත්මක සන්ධිස්ථානයක පවතින බව අපි කියන්න ඕනෑ. ශක්තිමත් ආර්ථිකයක් තුළින් බලගතු රටක් නිර්මාණය කිරීම සඳහා අද වනකොට අපි ඉදිරිපත් කර තිබෙන සැලැස්ම ඔස්සේ අපේ රටේ ජනතාවට ඉතාම හොඳ, ශක්තිමත් ආර්ථිකයක් සහ හොඳ සමාජයක් බිහි කිරීමේ අධිෂ්ඨානයෙන් යුතුව අපි කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම 1977දී එක්සත් ජාතික පක්ෂ රජය විසින් විවෘත ආර්ථික සංකල්පය මේ රටට හඳුන්වා දීලා එය ක්‍රියාත්මක කළා. අපනයනය පදනම් කරගෙන ආර්ථිකය වර්ධනය කිරීමේ එම සංකල්පය බොහෝ රටවල් අනුගමනය කරන්න ඉස්සෙල්ලා තමයි, 1977දී අපි ඒක මේ රටට හඳුන්වා දුන්නේ. නමුත්, අද වනකොට කොමියුනිස්ට් සහ සමාජවාදී රටවල් ඇතුළු බොහෝ රටවල් මේ විවෘත ආර්ථික සංකල්පය පිළිගෙන, ඒ ගොල්ලන්ගේ ආර්ථිකය විවෘත කරමින් ගෝලීය ආර්ථිකයට සම්බන්ධ වෙලා, තරගකාරී ලෙස ඒ ගොල්ලන්ගේ ආර්ථික ක්‍රමවේදය ඉස්සරහට ගෙන යනවා.

යථාර්ථය තේරුම් ගන්න ඕනෑය කියන එකයි අපි හැම වෙලාවේම කියන්නේ. අපි රජයක් හැටියට තීන්දු, තීරණ

ගන්නවා. ලෝකයේ යථාර්ථය හොඳින් තේරුම් අරගෙනයි අපි ඒ තීන්දු, තීරණ ගන්නේ. අපිත් විපක්ෂයේ සිටියා. විපක්ෂයේ ඉන්නකොට යම් යම් දේවල් ගැන වාද විවාද කරන්න ඉතාම ලේසියි. නමුත්, ඒවා ක්‍රියාත්මක කිරීමේදී, ඒවාට මුහුණ දීමේදී, ගැටලු විසඳීමේදී තමයි යථාර්ථය හරියට පෙනෙන්නේ. ඒ නිසා අපි විශේෂයෙන් අනෙක් රටවලින් ආදර්ශ අරගෙන, ඒ රටවල් සංවර්ධනය වුණේ කොහොමද, ඒ රටවල් ශක්තිමත් ආර්ථික ක්‍රමවේද ගොඩ නැඟුවේ කොහොමද, ඒ රටවල තිබුණු වාර්ගික ගැටුම්, ආගමික ගැටුම් සමනය කරලා, එකම ජාතියක් හැටියට යහපත් සමාජයක් බිහි කිරීමට ඉස්සරහට ගියේ කොහොමද කියන එක අපි විමසා බැලිය යුතුයි. අපි සියලු දෙනාම ඒවා හිතට අරගෙන, පොදු සැලැස්මක් ඔස්සේ අපේ රට ඉස්සරහට ගෙන යන්න ඕනෑයි කියලා මා මේ අවස්ථාවේ දී මතක් කරනවා.

අප අතර ප්‍රතිපත්තිමය වශයෙන් වෙනස්කම් තිබුණත්, රටක් වශයෙන් ඉස්සරහට යන්න නම් සමාන ප්‍රතිපත්ති ඔස්සේ අවුරුදු 20ක, 30ක කාලයක් ශක්තිමත්ව, එක දිශාවකට ඒ රට ගමන් කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් වෙන්නේ, රටේ දේශපාලනික අස්ථාවරභාවය තුළින් ආර්ථික අස්ථාවරභාවය ඇති වෙලා ආර්ථික වශයෙනුත්, සමාජීය වශයෙනුත් ජනතාව බලාපොරොත්තු වුණු ප්‍රතිලාභ ඒ ජනතාවට අහිමි වීම පමණයි. විශේෂයෙන් 2005 - 2015 දක්වා කාලය තුළ අපේ අපනයන ආර්ථිකය කඩාගෙන වැටුණා. ඒ කාලයේ පැවැති රජය අපේ අපනයන කෙරෙහි වැඩි උනන්දුවක් දැක්වූවේ නැහැ. ඒ ගොල්ලන්ගේ වැරදි විදේශ ප්‍රතිපත්ති නිසා අපි එදා ජාත්‍යන්තරයේ කොන් වීම තුළ, එහි යම් යම් ඵලවිපාක සමාජීය වශයෙන් විතරක් නොවෙයි, ආර්ථික වශයෙනුත් අපට භුක්ති විඳීමට සිදු වුණා. යුරෝපා සංගමයේ GSP Plus සහනය නැති වීම තුළින් අපේ රටේ කර්මාන්තශාලා වැහිලා, අපේ ගම්වල සිටි විශාල පිරිසකට රැකියා අහිමි වෙලා, ආදායම් මාර්ග අහිමි වුණා පමණක් නොවෙයි, ඒ කර්මාන්තශාලා බංග්ලාදේශය, ඉන්දියාව ඇතුළු අනෙකුත් රටවලට ගිය යුගයක් අපට දැක ගන්න ලැබුණා.

එදා පැවැති රජයේ හිතුවක්කාර ප්‍රතිපත්ති නිසා අප යුරෝපා මත්ස්‍ය තහනමට ලක්වූවා. විශේෂයෙන්ම මේ රටේ මුහුදු සීමාවෙන් පිටත ජාත්‍යන්තර මුහුදු සීමාවේ අනවසරයෙන් මත්ස්‍යයින් අල්ලා ඒවා අපනයනය කිරීම හේතුවෙන් අපට තහංචි වැටීම නිසා විශාල පිරිසක් යැපුණු ධීවර කර්මාන්තයට එදා ලොකු බලපෑමක් ඇති වුණා. ඒ නිසා නැවතත් අපනයනය පදනම් වූ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා GSP Plus සහනය සහ යුරෝපා රටවලට මත්ස්‍ය අපනයනය කිරීමේ අවසරය ලබාගැනීමට පුළුවන් වීම අප ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙසයි අපි සලකන්නේ.

එදා ඒ රජය ක්‍රියාත්මක කරපු රාජ්‍ය යන්ත්‍රණය තුළ රජය ණය අරගෙන යටිතල පහසුකම් විතරක් සංවර්ධනය කරලා මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් කියන ඒ සංකල්පයෙන් අපි බැහැර වුණා. මේ රටේ ව්‍යාපාර වාගේම මේ රටේ ආදායම් උපයන මාර්ග ශක්තිමත් කරලා, විශේෂයෙන්ම ගෝලීය ආර්ථිකය තුළින් අපේ රටට විදේශ විනිමය ගෙනැල්ලා ඒ විදේශ විනිමය තුළින් අපේ රටේ ජනතාව ආර්ථික වශයෙන් ශක්තිමත් කරන සංකල්පයක් තමයි රජයක් විධියට අපි ඉදිරියට ගෙන යන්නේ. පසුගිය රජයෙන් ලබා දුන් යටිතල පහසුකම්වලින් විශේෂයෙන්ම හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපොළ වැනි දේවල්වලින් වුණේ අපේ රටේ ජනතාවට විශාල ණය බරක් ඉතිරිවීම පමණයි. ඒ රජය බලයට පත්වෙලා බලය භුක්ති වින්දත්, ඒ ගොල්ලන් කොච්චර පම්පෝරි ගැහුවත්, ඒ ව්‍යාපෘති විවෘත කරලා අවුරුදු ගණනාවක් වුවත් ඒ ව්‍යාපෘතිවලින් ආදායමක් ලබාගන්නට ඒ ගොල්ලන් අසමත් වුණා. විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ, එදා ණය අරගෙන හදපු හම්බන්තොට වරාය ගැන. අපි චීනයෙන් ආයෝජන ගෙනැල්ලා මේ වෙනකොට ඒ ණය බර අඩු කරලා තිබෙනවා. නැව් එන්නේ නැති, ආදායමක් නැති, විශාල පොලියක් සමඟ සුදු අලියෙක් බවට පත්වෙලා තිබුණු හම්බන්තොට වරාය අද ආසියාවේ විතරක් නොව ලෝකයේම කේන්ද්‍රස්ථානය බවට පත් කරන්න අපි කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම මේ වාගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් තමයි අපට යහපත් රටක් නිර්මාණය කර ගන්න පුළුවන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණයත් අපි විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
වෙලාව අවසාන වෙනවා. [බාධා කිරීමක්]

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
අවසාන කරන්නම්. ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම ගැන විවිධ අදහස් පළ වුණා. මේ ගිවිසුම තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ රැකියා උත්පාදනය මිසක් ඒ රැකියා වෙනත් රටවලට දීම නොවන බව පැහැදිලිව කියන්නට ඕනෑ. ඕනෑම වෘත්තියවේදීන්ගේ සංගමයකට අපි ආරාධනා කරනවා, යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම් අපිත් එක්ක ඇවිත් කථා කරන්නටය කියා. හුඟ දෙනෙක් ආවා. ඒ ගිවිසුමේ යම් දෙයක් තිබෙනවා නම් ඒ ගැන සාකච්ඡා කරන්නට පුළුවන්ය කියා අපි ආරාධනා කරනවා.

කැබිනට් මණ්ඩලයේ අනුමතියත් එක්ක තමයි මෙම ගිවිසුම ඉදිරියට ගිහින් තිබෙන්නේ. මේ අවුරුද්දේ ජනවාරි 16 වෙනිදා ඒ සඳහා කැබිනට් මණ්ඩලයෙන් අනුමතිය ලැබී තිබෙනවා. අපේ ආර්ථිකය ශක්තිමත් කරන්නට, අපේ අපනයනය ශක්තිමත් කරන්නට තමයි අපි මේ සියලු දෙයම කරන්නේ. අපේ අපනයනය ශක්තිමත් කරලා -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Sunil Handunnetti, what is your point of Order?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතුවයි මා මෙය මතු කරන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා සිංගප්පූරු ගිවිසුම ගැන සාකච්ඡා කරන්නත් කැමතියි; එකඟයි; ඕනෑම සංගමයකට ඇවිත් සාකච්ඡා කරන්නටත් පුළුවන්ය කියා. ඉංජිනේරුවරුන්ගේ වෘත්තීය සංගමයේ ප්‍රධාන සභාපතිවරයා ඒ වාගේම වෛද්‍යවරුන්ගේ වෘත්තීය සංගම් බොහොමයක් විරෝධය පළ කළා. ඔවුන්ගේ ඉල්ලීම තිබෙන්නේ ඔවුන් එක්ක සාකච්ඡා කළේ නැහැ කියන එක. එතකොට ඔබතුමන්ලා කථා කළේ කාත් එක්කද? ඔබතුමා කිව්වානේ අපි සාකච්ඡා කරලා කැබිනට් එකට ගෙනාවේ කියා. අපේ අදහස, කැබිනට් එකේ කථා කළාම නැවත කථා කරන්න දෙයක් නැහැ කියන එකයි. මේ ගැන සාකච්ඡා කළ එක සංගමයක නමක් මට ඔබතුමා කියන්න.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු මන්ත්‍රීතුමා මා කිව්ව දෙය ඔබතුමා අහගෙන ඉඳලා නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම හොඳට අහගෙන හිටියා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මම කිව්වේ, "යම් කිසි දෙයක් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපි සාකච්ඡා කරන්න ලැහැස්තියි." කියායි. [බාධා කිරීමක්] ඒක පටලවා ගන්න එපා. ගරු මන්ත්‍රීතුමා, මම කිව්වේ, "මොනවා හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම්, කථා කරන්න ලැහැස්තියි." කියා. ගරු අමාත්‍යතුමාත් කිව්වා," මොනවා හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි කථා කරන්නට ලැහැස්තියි" කියා. ඔබතුමන්ලා කියන්නේ සිංගප්පූරුකාරයෝ ඇවිත් මෙහෙ තිබෙන රක්ෂා ටික ගන්නවාය කියලානෙ. ඒ මිනිසුන්ට පිස්සු නැහැ, ඒ රට දාලා මෙහෙ ඇවිත්- [බාධා කිරීමක්] මේ රට දැනටමත් කාලා ඉවරයි. [බාධා කිරීමක්] කාලා තිබෙන මේ රටට ඒ මිනිස්සු සිංගප්පූරුව දාලා එන්නේ නැහැ. ඒ ගැන ඔබතුමන්ලා කලබල වෙන්න එපා. යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි කථා කරමුය කියායි කිව්වේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට පැහැදිලි කිරීමක් කර ගන්න අවශ්‍යයි. මේක කරන්න වෙන්නේ කොයි කාලයේද? මේ ගැන තිබෙන ප්‍රශ්න ටික ආපසු කථා කර කරන්න වෙන්නේ කොයි කාලයේද? Exit clause එකකුත් නැත්නම් අපි කොහොමද ඒක කරන්නේ?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඔබතුමන්ලාට සාකච්ඡාවක් අවශ්‍ය නම් ඕනෑ වෙලාවක අපට ඉදිරිපත් කරන්න. අපි ඒ අවස්ථාව ලබා දෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සාකච්ඡාව කරලා අවසාන වශයෙන් එන තීරණ ටික කොහොමද ක්‍රියාත්මක කරන්නේ?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඉස්සෙල්ලා ඔබතුමන්ලා ඉදිරිපත් කරන්න ඕනෑ නේ, ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක කොහොමද ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නේ?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඔබතුමන්ලාට සාකච්ඡාවක් අවශ්‍යයි නම් ඒ බව අපට කියන්න. අපි ඒක ලබා දෙන්නම්. අපට ප්‍රශ්නයක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කථා කරලා ක්‍රියාත්මක කරන්න දැන් බැහැ. මොකද, දැන් ඒක අත්සන් කරලා ඉවරයි. ඒක ඇතුළට දාපු ඒවා ආපහු එළියට ගන්න බැහැ.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා කරුණු ඉදිරිපත් කරන්නේ නැතිව කියන්න බැහැ නේ මොනවාද සාකච්ඡා කරන්නේ කියලා. ප්‍රශ්නයක් තිබෙනවා නම්, කරුණාකරලා ඒක අපට ඉදිරිපත් කරන්න. එවිට අපට පහසුයි.

ගරු මන්ත්‍රීතුමනි, වර්ෂයකට වතාවක් ඒක අපි සමාලෝචනය කරනවා කියලා ගරු අගමැතිතුමා දැන් කිව්වා. ඒ නිසා ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ වෙළඳ ගිවිසුම් තුළින් ශක්තිමත්ව ඉදිරියට යන්න අපි සියලුදෙනාම කටයුතු කරමුයි කියා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 2.47]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ඉදිරිපත් කරන නියමයන් පිළිබඳව යම් අදහස් දැක්වීමක් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

අද දිනයේ පාර්ලිමේන්තුව ආරම්භයේදී අපි දැක්කා, ගංවතුර ද, බඩු මිල ද, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගැනද අද විවාදය විය යුත්තේ කියන කාරණය ගැන අද සැලකිය යුතු කාලයක් ගත කළ බව. ඇත්තටම අපේ රටේ ගංවතුර හා නාය යෑම් පිළිබඳ අත් දැකීම් ගණනාවක් පසුගිය මෑත ඉතිහාසයේ අපට තිබෙනවා. ඒ ගැන මේ පාර්ලිමේන්තුව ඇතුළේ කොච්චර බෙරිහන් දුන්නත් වැඩක් නැහැ. ඒ විපතට පත් වෙන ජනතාවට සේවයක් සලසන්න, ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ නම්, මහජන නියෝජිතයන් හැටියට ඔබතුමන්ලාට පුළුවන් පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා ඕනෑ තරම් ඒ වෙනුවෙන් දායකත්වය දක්වන්න. ඒ එක් කාරණයක්. දෙවැනි කාරණය තමයි, අපි පාර්ලිමේන්තුවේ ඉඳගෙන කෑ ගහන මේ වෙලාවේත් ජනමාධ්‍ය සහ මාධ්‍ය ආයතන යම් යම් මෙහෙවරයන් විපතට පත්

අසරණ ජනතාව වෙනුවෙන් ආරම්භ කරලා තිබෙන බව කියන්න ඕනෑ. ඒක නිසා මෙවැනි කටයුතුවලදී ඉතා දුප්පත්ම, දුර්වලම ක්‍රියාකාරීත්වය තිබෙන්නේ රජයේයි. ආණ්ඩුවේ යන්ත්‍රණය තමයි සියල්ලට පසුව පැමිණෙන යන්ත්‍රණය. ඒක ඉතින් ගංවතුරට අහුවෙන එක ගැන වගේම ජනතාවත් දන්නවා. සහන සලසන්න ආණ්ඩුව එන්නේ පස්සේයි කියන එක, නාය යන තරමටම ජනතාවට ෂුවර්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති, ගියවර දකුණු පළාතේ ඇති වූ ගංවතුර සහ නාය යෑම්වලින් පස්සේ අගමැතිතුමා ඇවිල්ලා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීමක් තියලා ඇහුවා, "මේ ආපදා වෙනුවෙන් සල්ලි හෙලිකොප්ටර්වලින් ගෙනැල්ලා හැලුවේ නැත්තේ මොකද?" කියලා. ඒ තරම් දෙන්න බලාපොරොත්තුවෙන් තමයි හිටියේ. හැබැයි, කිසිවක් දුන්නේ නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන කෑ ගහන එක නොවෙයි මෙතුමන්ලාට කරන්න තිබෙන්නේ. අපි මෙවරත් ජනතාවගෙන් ඉල්ලන්න තිබෙන්නේ, "ගංවතුරෙන් සහ ආණ්ඩුවෙන් දෙකෙන්ම පරිස්සම් වෙන්න" කියලායි. ගංවතුරෙන් පරිස්සම් වෙනවා වාගේම ආණ්ඩුවේ බොරු පොරොන්දුවලිනුයි, බඩු බෙදන්න එන කට්ටියගෙනුයි, ආණ්ඩුවේ ආයතනවලින් දෙන ආධාර මලුවල තමන්ගේ නම ගහගෙන බෙදන කට්ටියගෙනුයි පරිස්සම් වෙන්න කියලා තමයි අපට ජනතාවගෙන් ඉල්ලන්න තිබෙන්නේ.

මොකද, ජනතාවට ඊට වඩා සහන දෙන, සත්කාරක වැඩ කරන ආයතන සහ සංවිධාන බොහොමයක් තිබෙන බව අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගැනත් මට එක ගැටලුවයි තිබෙන්නේ. මේ විවාදයට සම්බන්ධ වෙනකොටත් ඒක හෘදය සාක්ෂියේ ප්‍රශ්නයක් හැටියට තිබුණු දෙයක්. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පනත මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ගෙනැත් ක්‍රියාත්මක කරනකොට, ඒකට බරපතළම විවේචන ඉදිරිපත් කරපු කණ්ඩායමක් තමයි අපි. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයත් බරපතළ විවේචන ඉදිරිපත් කළා. එක්සත් ජාතික පක්ෂය මේ පැත්තේ ඉඳගෙන ඉදිරිපත් කරපු විවේචන තිබුණා. ඒ ව්‍යාපෘතිවල තිබුණු අසාර්ථකභාවය, ඒ ව්‍යාපෘතිවලින් ආයෝජකයන්ට දීපු සහන ගැන කිව්වා. මට මතකයි, ජේම්ස් පැකර් ගැන ගොඩක් කථා කළ බව. මේ පාර්ලිමේන්තුවේ ජේම්ස් පැකර්ගේ ව්‍යාපෘතිය ගැන කථා කළා.

ඊළඟට, මත්තල ගැන කථා කළා. ඒ වාගේ හුඟක් ව්‍යාපෘති තිබුණා. ඒ ව්‍යාපෘතිවල ආයෝජන සම්බන්ධයෙන් ලබා දුන් සහනවලට තිබුණු විවේචනය ගැන දැන් එක්සත් ජාතික පක්ෂයට තිබෙන්නේ මොන වාගේ අදහසක්ද? එක්සත් ජාතික පක්ෂය දැන් ඒ පනතම ක්‍රියාත්මක කරනකොට, ඒ විවේචන තමන්ගේ දේශපාලන දර්ශනය හැටියට පදනම් කර ගන්නේ නැද්ද? එහෙම නැත්නම් ඒක විපක්ෂයේ සිට ආණ්ඩුව පැත්තට ඉදිරිපත් කරපු හුදු විවේචනයක් විතරද? ඒකයි බේරා ගන්න ඕනෑ. එදා විවේචනය කරනකොට බැසිල් රාජපක්ෂගේ commission ගැනයි කථා කළේ. මම කියන්නේ ඒක වුණේ නැහැ කියලා නොවෙයි. ඒක වුණාද, නැද්ද කියලා ඔප්පු කර ගන්න බැරුව නේ තවම ඉන්නේ. දැන් ඊට වැඩිය සහන දෙනකොට මලික් සමරවික්‍රමට commission එන්නේ නැද්ද කියලායි අපට අහන්න තිබෙන්නේ. එච්චරයි.

මම උදාහරණයක් කියන්නම්. අපි අද සාකච්ඡා කරන්නේ 2014 ජූනි මස 16 දිනැති 1867/ 5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක කාලය දිගු කිරීමක් ගැනයි. 2014 ජූනි 16වැනි දින මේ ගැසට් පත්‍රය මුද්‍රණය කරනකොට විපක්ෂයේ හිටපු අය දැන් ඉන්නේ ආණ්ඩුව පැත්තේ. එදා ආණ්ඩුව පැත්තේ හිටපු අය දැන් ඉන්නේ විපක්ෂයේ, මේ පැත්තේ. එදා මේ ගැසට් නිවේදනය ගැන පාර්ලිමේන්තුවේ කථා කරද්දී විවේචනය කළේ කොහොමද? විවේචනයේ පදනම වුණේ මොකක්ද? මේ දෙන සහන වැරැදියි; මේවා හානිකරයි; මේවා බරපතළයි; මේකෙන් බැසිල්ලාට commission යනවා කියලා ඕවා නේ කිව්වේ. මමත් කිව්වා. අපි එහෙමයි කිව්වේ. මේ ක්‍රමෝපාය සංවර්ධන උපක්‍රමය රටට හානිකරයි; රටේ සම්පත් විකිණෙනවා; රට විනාශ වෙනවා කිව්වා. ඔබතුමන්ලා, අපි විවේචනය කළේ එහෙමයි. වෙනස වුණේ ඔබතුමන්ලා විපක්ෂයේ ඉඳලා ආණ්ඩුව පැත්තට ගියා. ආණ්ඩුවේ හිටපු අය ඒ පැත්තෙන් විපක්ෂය පැත්තට ආවා. මම මේ කියන්නේ 2014 වර්ෂයේ ජූනි මාසයේ 16වැනි දින කථා කළ, අද කථා කරන ගැසට් එකේ මව් ගැසට් එක ගැන කථා කළ දවස ගැනයි.

මව් ගැසට් එක ගැන කථා කරද්දී අපියි, ඔබතුමන්ලායි මේ පැත්තේ ඉඳගෙන ඒ ගැසට් එක විවේචනය කළා. ඒ විවේචනවල පදනම තමයි ජේම්ස් පැකර්ලාට, අර ආයෝජකයාට, මේ ආයෝජකයාට ඕන විධියට එන්න දෙනවා; එන්න පාර හදනවා. පාර හදලා අපේ රටේ ආර්ථිකය විනාශ කරනවා, දේශීය සම්පත් විකුණනවා, රට විකුණනවා, රට කනවා. බැසිල්ලා එහෙම කරන්නේ කොමිස්වලට කියලා කිව්වා. ඕක තමයි කිව්වේ. එතකොට දැන් මම අහන්නේ මෙයයි. ගරු ඇමතිතුමා දැන් කියනවා, ඒ ගිවිසුම අනුව තිබුණු කාලය දික් කරනවා කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
කරගෙන යන ගිවිසුමේ construction කරගෙන යන්නට ඕනෑ. දැන් මේක නවත්වන්නට බැහැ නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක හරි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඒක නිසා තමයි මේ ගිවිසුම දික් කරලා දෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අන්න හරි. මම අහන්නේ, දික් කරලා දෙනවා කියන කොටම ඒගොල්ල ගිවිසුම කඩ කරලා නේද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
දැන් බලන්න, Hyatt එකට යොදවලා තිබෙන්නේ ආණ්ඩුවේ මුදල්. ගිවිසුම කඩ කළා කියලා ඒක අහක දාන්නට බැහැ නේ. අපි සල්ලි වියදම් කරලා තිබෙනවානේ. වැඩේ ඉවර වෙලත් නැහැ. දැන් මම ඒකට හේතුත් මොනවාද කියලා කිව්වා. අනුරාධපුරයේ නටබුන් වාගේ මේක තියා ගන්නට බැහැ නේ. මේ ව්‍යාපෘති ඉවර කරන්නට ඕනෑ. ඒකයි මේ කරලා තිබෙන්නේ.

ඔබතුමාට කියන්නට ඕනෑ අනෙක් කාරණය තමයි, අපි කවුරුත් commission ගහන අය නොවෙයි කියන එක. අපට ඕනෑ තරම් සල්ලි තිබෙනවා. අපි මෙතැනට ඇවිල්ලා ඉන්නේ සල්ලි හොයාගෙන. මෙතැනට ඇවිල්ලා සල්ලි සොයා ගන්න නොවෙයි අපි ආවේ. ඉතින් කරුණාකරලා commission ගැන කථා කරන්නට එපා, අපේ ආණ්ඩුවත් එක්ක.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අනෙක් අයගේ commission තවම සොයලා නැති හින්දා-

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඒක අපේ වැඩක් නොවෙයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අනෙක් අයගේ commission ගැන සොයලා ඉවර නැහැ නේ. එදා අපි ඒ කළ විවේචනය විවේචනයක් විතරයි. තවම ඔප්පු වෙලා නැහැ. ඒක විවේචනයක් විතරයි. ඔබතුමන්ලා ඔප්පු කරලා නැහැ නේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඒක ඔප්පු කරන්නේ නීතිය අනුව. අපට කියන්නට බැහැ නේ, "මෙයා හොරා, අරයා හොරා" කියලා. ඒක පොලීසියෙනුයි, නීතිය අනුවයි කෙරෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කන්න ඕනෑ වුණාම කබරගොයා තලගොයා කර ගන්න නීතියක් නේ තිබෙන්නේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
නීතිය අනුව ඒක හොයයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමන්ලා නීතිය නවනවා, ඕනෑ ඕනෑ ආකාරයට.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අපි දේශපාලනයට ආවේ බොරු කරලාත් නොවෙයි; බොරු කරන්නත් නොවෙයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමන්ලා නීතිය නවනවා, ඕනෑ ඕනෑ විධියට. කන්න ඕනෑ වුණාම කබරගොයා තලගොයා වෙන විධියට නීතිය නවනවා. එම නිසා හැම තිස්සේම කබරයෝ බේරිලා යනවා; තලගොයි අහුවෙනවා. ඒ වාගේ නීතියක් තමයි අපේ රටේ තිබෙන්නේ. තලගොයා අහුවෙනවා. අහිංසක සතා අහුවෙනවා, කබරයා බේරෙනවා. [බාධා කිරීමක්] ඔව්, කිඹුලත් බේරෙනවා. ඇතුළේ හිටපු කට්ටිය කියනවා, කිඹුලත් බේරෙනවා කියලා. ඒ අය දන්නවා, කබරයා නොවෙයි කිඹුලා කියලා. [බාධා කිරීමක්] සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා කියනවා, කබරයෝ විතරක් නොවෙයි කිඹුල්ලුත් බේරනවා කියලා. ඒ දන්න කට්ටිය කියන්නේ. අපි දන්නේ නැහැ, කබරයාද, තලගොයාද, කිඹුලාද කියලා.

මම කියනවා, අපේ රටේ දේශපාලනඥයෝ වැඩියෙන්ම කොමිස් ගැහුවේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිවලින් කියලා. ඒක ඔබතුමා පිළිගන්නවාද, නැද්ද? ක්‍රමමෝපාය සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව පසුගිය ආණ්ඩුවට තිබෙන විවේචනයක් තමයි, වැඩිපුරම මේ හරහා කොමිස් මුදල් හුවමාරු වුණා කියන එක.

මේ පාර්ලිමේන්තුවේදී ඔබතුමන්ලාගේ කටින් ඒවා කථා කර තිබෙනවා. හැබැයි, විපක්ෂයේ ඉන්නකොට.

ඊළඟට, මම අහන ප්‍රශ්නය මේකයි. දැන් ඔබතුමා කියනවා "පටන් ගත්ත එක ඉවර කරන්න යනවා" කියලා. ඔබතුමන්ලා ඔය කියන පදනමින්ම "පටන් ගත්ත ඒවා ඉවර කරන්න යනවා" කියලා මේගොල්ලෝත් ඔය පැත්තට ගියාම කිව්වොත් මොකද වෙන්නේ? අපට ඊළඟට බලන්න වන චිත්‍රපටය ඒකයි. මේගොල්ලෝ මේ පැත්තෙන් ඔය පැත්තට ගියාම කියනවා " ඔව්, විවේචනයක් තිබුණා තමයි, අපිත් විවේචනය කළා තමයි, හැබැයි මේ පටන් ගත්ත ඒවා ඉවර කරන්න තිබෙනවා නේ" කියලා. එතකොට ආයෙත් ඒකම නේ, වෙන්නේ. මේ නාඩගම ගංවතුර වාගේම තමයි. මේ රටේ ජනතාව හැමදාම මේ නාඩගම බලාගෙන ඉන්නවා. අර "නුවරඑළියේ බල්ලෝ ගෙවල් හදනවා වාගේ" ගංවතුර එනකොට මිනිස්සු කල්පනා කරනවා, දැන් වෙනත් තැනක ගෙයක් හදා ගන්න ඕනෑ කියලා. වැස්ස පායනකොට ආයෙත් එතැනටම යනවා. ඒ වාගේ තමයි, මේ ක්‍රියාවලිය නතර වන්නේ නැහැ. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට විවේචනය කරනවා; ආණ්ඩුවට ගියාම ඒකම කරනවා. මේගොල්ලෝ විපක්ෂයේ ඉන්නකොට විවේචනය කරනවා; ආණ්ඩුවට ගියාම ඒකම කරනවා. ඒක තමයි කථාව.

ඊළඟට, ඔබතුමා ඉන්න නිසා මේ කාරණාව පැහැදිලි කර ගන්න ඕනෑ. දැන් කියනවා, සිංගප්පූරු ගිවිසුම කැබිනට් එක අනුමත කළාලු. ගිවිසුම අත්සන් කළා. දැන් විවේචනයක් තිබෙනවා. වෘත්තිකයෝ, ඉංජිනේරු සංගම්, දොස්තර මහත්වරු හැම දෙනාටම තමන්ගේ වෘත්තීයමයභාවය පිළිබඳ ප්‍රශ්නයක්; වෘත්තීයමයභාවය නැති වෙයිද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා කියනවා "සාකච්ඡා කරමු" කියලා. ජනාධිපති ලේකම්තුමා කියනවා "සාකච්ඡා කරමු" කියලා. කවදාද සාකච්ඡා කරන්නේ, කොහොමද ඒක ඉවර කරන්නේ?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මම කියන්නේ මේකයි. ඒගොල්ලන් එක්ක සාකච්ඡා කළා. නමුත් ඒගොල්ලන්ට තවම සැකයක් තිබෙනවා නම් අපට ඒක point out කළොත්, වැරැද්ද තිබෙන්නේ කොතැනද කියලා බලන්න පුළුවන්. කවුරුවත් එහෙම කියන්නේ නැහැ. හැම එක්කෙනාම කියනවා, "මේක වැරැදියි, මේක වැරැදියි" කියලා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා සාකච්ඡා කළේ කවුරු එක්කද කියලා, මට එක සංවිධානයක නමක් කියන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
කොච්චර තිබෙනවාද? UPM, engineers, architects -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Architects, engineers, දොස්තර -වෛද්‍ය- නීතිඥ කියනවා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
වෛද්‍යවරු මේකට සම්බන්ධ නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම නොවෙයි, සංවිධානයක නමක් කියන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මම දෙන්නම්. දැන් මගේ ළඟ නැහැ, සංවිධාන 16ක් විතර තිබුණා. Trade chambers ඔක්කොම.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, අපි දන්නා ඒවා තිබෙනවා නේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අනෙක, අපි දැනුත් කියලා තිබෙන්නේ වැරැද්දක් තිබෙනවා නම්, ඒක point out කරන්න කියලායි. එතකොට අපට බලා ගන්න පුළුවන්. එහෙම කියන්නේ නැතිව විවේචනය කරලා වැඩක් නැහැ නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම නම් ඔබතුමා එන සතියේ සිකුරාදාට ඔය කියන සංවිධානත් එක්ක සාකච්ඡාවක් කරන්න යොදා ගන්නවාද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
සිකුරාදාට මට බැහැ. එන සතියේ ඕනෑම දවසක එන්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා දිනයක් කියන්න, කවදාද පුළුවන් කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අපි ඊයේ පෙරේදාත් engineersලා, architectsලා හමු වුණා. ඒගොල්ලන් එක්ක අපි සාකච්ඡා කළා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමාගේ යහළුවෝ ටිකක් හමු වෙලා සාකච්ඡා කළොත් නම් කිසි ප්‍රශ්නයක් නැහැයි කියාවි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එහෙම නොවෙයි, අපි ඒගොල්ලොත් එක්ක සාකච්ඡා කළා. Engineersලා එක්ක ගිය සුමානේත් සාකච්ඡා කළා. Architectsලා එක්කත් ගිය සුමානේ සාකච්ඡා කළා. ඒගොල්ලන් කිව්වා, අපට දන්වන්නම් කියලා. දැන්වුවාට පසුව අපි නැවතත් සාකච්ඡා කරනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හංගන්න දෙයක් නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම දැක්කා, ඉරිදා පත්තරයක-

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
පත්තරවල තිබෙන ඒවා කියවලා වැඩක් නැහැ. පත්තරවල කොච්චර බොරු කියනවාද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පත්තරයේ තිබෙන ඒවා නොවෙයි. ඉංජිනේරු සංගමයේ සභාපතිතුමා පත්තරයට ලියලා තිබෙනවා, මේ ගැන සාකච්ඡා කළේ නැහැයි කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
සභාපතිනියක් ඉන්නේ. "සභාපතිතුමා" කියනවා නම් වැරැද්දක් වෙලා ඇති.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
"අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහලා වැඩක් නැහැ" වාගේ ඔබතුමන්ලා මේ ක්‍රියාවලියම කරලා, කැබිනට් මණ්ඩලයේ අනුමත කර අවසාන කරලා, ගිව්සුම් අත්සන් කළාට පස්සේ කියනවා, "මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම් සාකච්ඡා කරමු" කියලා. ඒ ක්‍රමයයි, අද මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් ගෙනෙන විධියයි දෙකම එක හා සමානයි. ඔබතුමන්ලා මේ කියන්නේ, "මේ ආණ්ඩුව වැරැදියට මේක කළා. කරන්න දෙයක් නැහැ. ඉවර කරන්න ඕනෑ" කියලා. ඊළඟ එකේත් කියන්නේ ඔහොම තමයි. ඒ වෙලාවේත් කියයි, "සිංගප්පුරුවත් එක්ක ගිව්සුම අත්සන් කළා. දැන් අත්සන් කරලා ඉවරයි. අඩු පාඩුවක් තිබෙනවා නම් ලබන අවුරුද්දේ මොනවා හරි කර ගනිමු" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවා නිකම් ආවාට ගියාට, යන ගමන්, "එහෙම නම් පස්සේ කථා කරලා මොනවා හරි කරමුකෝ" කියලා සරලව කියන්න පුළුවන්. හැබැයි, ඒවා අපේ රටේ ජනතාවගේ ජීවිතත් එක්ක ගැට ගැහුණු ඒවා; වෘත්තීන් එක්ක ගැට ගැහුණු ඒවා. අපි දන්නවා, මේ කිසිම වෘත්තීය සංවිධානයක්, වෘත්තියවේදීන් කවුරුවත් එකවර විරෝධතා මතු කරන්නේ නැහැ කියලා. ඔබතුමාගේ අමාත්‍යාංශය වුණත්, වෙන කිසිම අමාත්‍යාංශයක් වුණත් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන හැම පනත් කෙටුම්පතකටම කවුරුවත් විරුද්ධ වෙන්නේ නැහැ නේ. ඔන්න එහෙම නම් හිතා ගන්න පුළුවන්, මේක, ආණ්ඩුව ගෙනෙන හැම පනත් කෙටුම්පතකටම විරුද්ධ වීමක් කියලා. එහෙම නැහැ. ආයෝජන ප්‍රවර්ධනය කරන්න ගෙනෙන පනත් කෙටුම්පත් හැම එකකටම මේ රටේ වෘත්තීයවේදීන්, ජනමාධ්‍යයන් විරුද්ධ වෙලා නැහැ. මේ විරුද්ධතාව හැදිලා තිබෙන්නේ නිශ්චිත කාරණාවක් සම්බන්ධයෙන්. ඒක නිසා ඔබතුමාගේ අවධානය ඒකට යොමු කරවනවා. ඔබතුමා පොරොන්දු වෙන විධියට මේ සතියේ බැහැ. ඒ වෘත්තීය සංවිධානත් එක්ක සාකච්ඡාවක් කරන්න ලබන සතියේ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

හරි ඔබතුමා ලැහැස්ති නම්, අපිත් ලැහැස්තියි ඒකට සහභාගි වෙන්න; මොකක්ද මේ තිබෙන පරස්පරය කියලා පැහැදිලි කර ගන්න. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

[අ.භා. 3.00]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ගරු ඇමතිතුමාගේ විෂයයන් ගැන අදහස් කිහිපයක් පළ කරන්න බලාපොරොත්තු වෙනවා. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය කියන්නේ අපේ රටට ඉතාම තීරණාත්මක අමාත්‍යාංශයක්, ගරු ඇමතිතුමනි. ඒක අපේ රටේ ආර්ථික මර්මස්ථානය කිව්වොත් හරි. අපි වාගේ රටකට විදේශ ආයෝජන නැතුව ඉදිරියට යන්න බැහැ. ඒ බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති. ඒ නිසා විදේශ ආයෝජකයන් දිරි ගන්වන්න, විදේශ ආයෝජකයන්ට පහසුකම් ලබා දීලා, විදේශ ආයෝජන ගෙන්වන්න කටයුතු කිරීම තමයි ඔබතුමාගේ අමාත්‍යාංශය භරහා කෙරෙන්න ඕනෑ. 2015දී මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර දෙන කොට, 2014 වර්ෂයේ මේ රටට විදේශ ආයෝජන ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක් ඇවිත් තිබුණු බව ඔබතුමා දන්නවා. ඒ කාලයේ ආයෝජකයන්ට මේ රට කෙරෙහි විශ්වාසයක් තිබුණා; තමුන්නාන්සේලාගේ ආණ්ඩුව වාගේ දේශපාලන අස්ථාවරභාවයක් තිබුණේ නැහැ; තමුන්නාන්සේලා වාගේ දවසින් දවස ප්‍රතිපත්ති වෙනස් කළේ නැහැ. ඒ වාගේම ඒ කාලයේ ආයෝජකයන්ට සහන දුන්නා. ඒ නිසා විදේශ ආයෝජකයන් විශාල පිරිසක් ඒ කාලයේ මේ රටට ආවා. ඒ නිසා තමයි අපි මේ රටේ ආර්ථිකය හරියාකාරව ගෙන ගියේ, ගරු අමාත්‍යතුමනි. ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් ගැන කතා කරන කොට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කවුරුවත් දැන් මෙහි ඇවිත් සිටිනවාද කියා මා දන්නේ නැහැ. කාමරයේ නම් එහෙම කවුරුවත් - BOI එකෙන් ඇවිල්ලා සිටිනවා කියා- පෙනෙන්නේ නැහැ. ගරු අමාත්‍යතුමා, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අද ආයෝජකයන් එන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, වෙනත් රටවල විදේශ ආයෝජන ගෙන්වා ගන්න කොට විදේශ ආයෝජකයන්ට සහන දෙනවා. අපි ඒ කාලයේ විදේශීය ආයෝජකයන් එනකොට 100 per cent tax exemption එකක් දුන්නා. ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේ දන්නවා අපි කිසිම tax එකක් ගත්තේ නැහැ කියා. නමුත් දැන් තමුන්නාන්සේලා අලුතින් Corporate Tax එක ලෙස ගහනවා, සියයට 20ක්. ගරු අමාත්‍යතුමා, ඊට අමතරව සියයට 14ක Shareholder's Tax එකකුත් ගහනවා. තමුන්නාන්සේ දන්නවා, සමහර ආයෝජකයෝ මේ රටේ කර්මාන්ත කරන්න එන කොට ඒ කර්මාන්තවලට අවශ්‍ය ශ්‍රමිකයන් මේ රටේ නැති බව.

අපි හිතමු, කොම්පියුටර් ක්ෂේත්‍රය හා සම්බන්ධ මොකක් හෝ විෂයයකට අදාළ කර්මාන්තයක් ආරම්භ කරනවා කියා. ඒ සම්බන්ධ ශ්‍රමිකයෝ මේ රටේ නැහැ. පිට රටවලින් ගෙනෙන්නත් ඔබතුමන්ලා ඉඩ දෙන්නේ නැහැ. ආයෝජනය ගෙන එන්න කියනවා. නමුත් ශ්‍රමිකයෝ නැහැ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අපි ඉඩ දෙන්න ලැහැස්තියි, පිට රටවලින් ගෙනෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා ඉඩ දෙන්නේ නැහැ, ගරු අමාත්‍යතුමා. විදේශ ආයෝජකයන් තුන්දෙනකුගේ කාරණයි ඔබතුමාට මා මේ කියන්නේ. ඔබතුමා ලැහැස්තියි කියා කිව්වාට ඔබතුමාගේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එයට ලැහැස්ති නැහැ. මේ නිසා ගරු අමාත්‍යතුමා, ආයෝජකයන්ට මෙහෙම tax-

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අපේ BOI එකේ එක් එක් අංශවලට එහෙම දෙනවා. Construction industry එකේදි පිටින් ගෙනැවිත් තිබෙනවා. එවැනි අවශ්‍යතා තිබෙනවා නම් යම්කිසි ප්‍රමාණයක් ගෙනෙන්න අපි අවසර දෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු අමාත්‍යතුමනි, මා ඒ සමාගම ගැන කියන එක හොඳ නැහැ. එවැනි ආයෝජකයෝ කීප දෙනෙක් ඉන්නවා. ඒ අයට ඒ කර්මාන්ත ගෙන යන්න -[බාධා කිරීමක්] ඔබතුමා සොයා බලන්න, ආයෝජකයන් කැඳවා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මට තේරෙනවා. ඔබතුමා කියන එකට මම සම්පූර්ණයෙන්ම එකඟයි. එහෙම තිබෙනවා නම් අපි ඒ ගැන සොයා බලා අවශ්‍ය විධියට කටයුතු කරන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම ලැබෙනවා නම් ඉතාම හොඳයි. හැබැයි ගරු අමාත්‍යතුමා-

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
දැන් අපට තිබෙන ප්‍රශ්නය මෙකයි. මේකට විරුද්ධ වන්නේ කවුද? වෛද්‍යවරුන්, GMOA එක තමයි විරුද්ධ වන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, නැහැ. වෛද්‍යවරුන් ගෙන එන්න නොවෙයි. ගරු අමාත්‍යතුමා, වෛද්‍යවරුන් ගෙන එන්න ඕනෑ නැහැ, ලංකාවට. මා ඔබතුමාට කියන්නේ නැහැ-

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
නැහැ, නැහැ. කවුරු ගෙනාවත් ඒ අය විරුද්ධයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමන්ලාට තිබෙනවා නේ, GMOA භීතිකාවක්. ඒක මේකත් එක්ක පටලා ගන්න එපා. අපි GMOA එකට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා අත්සන් කරන්න යන ETCA එක අත්සන් කරන්න දුන්නා නම්, ඔබතුමාට GMOA එක හොඳයි. සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමට අත්සන් කරන්න දුන්නා නම් GMOA එක හොඳයි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
නැහැ, නැහැ. ඒක ඒ අයට බලපාන්නේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා කියන ඔක්කෝටම "එහෙයි!" කිව්වා නම්, GMOA එක හොඳයි. එහෙම හරි යන්නේ නැහැ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ඒක අවශ්‍ය නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම කියන්න එපා, අමාත්‍යතුමා. මේ රටට බෙහෙවින් ආදරය කරන, මේ රට වෙනුවෙන් කතා කරන ඒ වෘත්තිකයන්ට - GMOA එකට - ඔබතුමා එහෙම ගහන්න එපා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ඔබතුමා ඒ අයට ඒක කියන්න; ගිහිල්ලා තේරුම් කර දෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මට මගේ අවස්ථාව දෙන්න. ගරු අමාත්‍යතුමා, ඒ ක්ෂේත්‍ර සඳහා එන්න දෙනවා කියා ඔබතුමා කියනවා නම් මම ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. හැබැයි ගරු අමාත්‍යතුමා, ඔබතුමා මේකත් මතක තියාගන්න. මට කතා කරපු ඒ ආයෝජකයෝ කිව්වා, එතුමන්ලාගේ සියලු ආයෝජන ඩුබායිවලට ගෙන යනවා කියා. ඔබතුමන්ලා දන්නවා, ඩුබායිවල free trade zones හදා, 100 per cent tax exemptions දීලා, වීසා දීලා, ලාභ ලබන සියලු මුදල් වෙනත් රටවලට ගෙන යන්න අවස්ථා දීලා තිබෙන බව.

අපේ රටේ, එන ආයෝජකයින්ට බදු ගහනවා. ගරු ඇමතිතුමනි, එහෙම වුණාම ආයෝජකයින් එන්නේ නැහැ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
අලුත් Inland Revenue Act එක අනුව යම් කිසි ප්‍රමාණයක් ආයෝජනය කළාම, දෙගුණයක් ලාභ ලබන්න කලින් කිසි tax එකක් ගහන්නේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් ඔබතුමන්ලා Corporate Tax එක ගහන්නේ නැද්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
නැහැ,-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මම අහන්නේ, Corporate Tax එක ගහන්නේ නැද්ද කියලායි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
නැහැ, කවුරු හරි investor කෙනෙක්-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
"නැහැ" නොවෙයි. Corporate Tax එක ගහනවාද නැද්ද කියලා මට කියන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ඒ, ලාභ ලැබුවාට පස්සේ. තමන්ගේ ආයෝජනයේ ප්‍රමාණය-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
වෙන රටවල එහෙම නැහැ, ගරු ඇමතිතුමනි. ඉස්සර අපේ කාලයේ එහෙම බදු ගැහුවේ නැහැ. ඔබතුමන්ලා Shareholder's Tax ගහන්නේ නැද්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ඒ බද්ද ගහන්නේ, ආයෝජනය කළ ප්‍රමාණයට ලාභ ලැබුවාට පස්සේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ අපි Corporate Tax එක ගැහුවේ නැහැ; Shareholder's Tax එක ගැහුවේ නැහැ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
දැන් මේකත් ඒ වාගේ තමයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා බලන්න, වෙනත් රටවල ආයෝජකයින්ට දෙන සහන. තමුන්නාන්සේලා අපේ රටේ මිනිසුන්ට බදු ගැහුවා මදිවාට සුද්දන්ටත් බදු ගහන්න හදනවා. අපේ රටේ මිනිස්සු නම් යන්න රටක් නැති නිසා ඉන්නවා. ඒ මිනිසුන්ට යන්න රටක් තිබෙනවා. ඒ මිනිසුන්ට ආයෝජනය කරන්න රටක් තිබෙනවා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒක පැහැදිලි කරන්නම්. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. කවුරු හරි යම් ප්‍රමාණයක් ආයෝජනය කළොත්, දෙගුණයක් ලාභ ලැබුවාට පසුව තමයි Corporate Tax එක ගහන්නේ. ඒක තමයි අලුත් Inland Revenue Act එක යටතේ සිදුකරන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නය මේකයි. අපි අපේ කාලයේදී Corporate Tax එක ගැහුවේ නැහැ; Shareholder's Tax එක ගැහුවේ නැහැ. ආයෝජකයින් සියලු වියදම් කරලා කර්මාන්තය හදනවා නම්, සියලු ආයෝජන ගෙනෙනවා නම්, raw materials ගෙනෙනවා නම්, ඔබතුමන්ලා බදු ගහන්නේ ඇයි? අනෙක් රටවල ඒ tax ඔක්කෝම - [බාධා කිරීමක්] ඔබතුමා ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න. ඔබතුමන්ලාගේ පුරුද්ද බදු ගහන එක නේ. ඔබතුමන්ලා දන්නේ බදු ගහන්න විතරයි. බලන්න, 2015 වසරේදී අපි මේ රට භාර දෙනකොට රාජ්‍ය බදු ආදායම ට්‍රිලියන එකයි. 2018 වසර අග වන විට එය ට්‍රිලියන දෙකයි. මේ රටේ මිනිසුන්ට සියයට 100ක් බදු ගහලා. තමුන්නාන්සේලා දන්නේ බදු ගහන්න විතරයි. තමුන්නාන්සේලා දන්නේ මේ රටේ මිනිසුන්ට බර දෙන්න විතරයි. රටේ මිනිසුන්ට විතරක් නොවෙයි, තමුන්නාන්සේලා විදේශිකයින්ටත් බදු ගහනවා. ගරු ඇමතිතුමනි, එහෙම වුණාම විදේශ ආයෝජකයින් එන්නේ නැහැ. අපට ඔබතුමා එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. විදේශ ආයෝජකයින් එන්නේ නැති වුණාම මේ රට කඩා වැටෙනවා.

ගරු ඇමතිතුමනි, ඊළඟට ඔබතුමාට තවත් කාරණයක් කියන්න ඕනෑ. ඔබතුමා මේ පාර්ලිමේන්තුවට බොරු කියන්න එපා. ඔබතුමා මහනුවර රගර් ගහනවා වාගේ මේ පාර්ලිමේන්තුවට බොරු කියන්න එපා. ඒ බොරුව මොකක්ද කියලා මම ඔබතුමාට කියන්නම්.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
මම කවදාවත් මේ පාර්ලිමේන්තුවට බොරු කියලාත් නැහැ, බොරු කියන්න අවශ්‍යත් නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් ඔබතුමා පාර්ලිමේන්තුවට කියපු පළමුවන බොරුව මොකක්ද කියලා මම කියන්නයි යන්නේ; ඉඳගෙන අහගෙන ඉන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
හොඳයි, කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඉඳගෙන ඉන්න. අහගෙන ඉන්න. ඉඳගන්නකෝ. ඔළුව තලා ගන්නේ නැතුව ඉඳගන්න. ඔබතුමාගේ පළමුවන බොරුව මොකක්ද කියලා මම කියන්නම්. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ කිව්වා, තමුන්නාන්සේගේ කාලයේදී -2017 වසරේදී- තමයි මේ රටට වැඩිම විදේශ ආයෝජන ආවේ කියලා. තමුන්නාන්සේ කිව්වා, තමුන්නාන්සේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.7ක විදේශ ආයෝජන ගෙනාවාය කියලා. තමුන්නාන්සේ නැගිටලා මට කියන්න බලන්න, එහි breakdown එක. US Dollars 1.7 billionහි breakdown එක තමුන්නාන්සේ කියන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, Central Bank එකෙන් එය ඔප්පු කරලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
You give me the breakdown.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
I will give it to you. I do not know offhand.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
So, give me the breakdown. Why do you not tell me one by one? Tell me the -

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
I do not know offhand. I can give it to you later.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
Why can you not tell right now? You are the Minister.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
I will give it to you.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
You are the Minister, but you do not know anything.

ගරු මලික් සමරවික්රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I know everything but, I do not have everything in my hand.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
You know only to play rugger. That is all. You do not know about the foreign investments. This is the problem.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
We know how to bring in investments. You are just talking through your hat.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
I will tell you, I will give you the breakdown. You do not have the breakdown.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I will give you the breakdown in half- an-hour.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Why do you not give it now?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I will give it to you. I have to take it from my iPad.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා මීට පැය භාගයකට කලින් ඒ විස්තර ඉල්ලුවා. දැන් තමුන්නාන්සේ ළඟ ඒවා තිබෙනවාද? මම තමුන්නාන්සේට කියන්නම් breakdown එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා කියනවා යූඑස් ඩොලර් බිලියන 1.7ක විදේශ ආයෝජන ලංකාවට ගෙනාවා කියලා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා ගෙනැල්ලා තිබෙන්නේ යූ එස් ඩොලර් මිලියන 17යි. ඒක මතක තියා ගන්න. මේ යහ පාලන ආණ්ඩුව ගෙනැල්ලා තිබෙන්නේ මිලියන 17යි. තමුන්නාන්සේලාගේ යූ එස් ඩොලර් මිලියන 17හි breakdown එක මම කියන්නම්. තමුන්නාන්සේලා කියනවා වැඩිම විදේශ ආයෝජන ආවේ මේ ආණ්ඩුවට කියලා. ඔබතුමන්ලා කියනවා ඒක යූ එස් ඩොලර් බිලියන 1.7යි කියලා. තමුන්නාන්සේලාගේ breakdown එක මොකක්ද? මිලියන 292ක් හම්බන්තොට වරායට ලැබුණු පළමුවැනි වාරිකය. මිලියන 194ක් Colombo Port City එකේ සල්ලි. මිලියන 195ක් ෂැන්ග්‍රි-ලා සල්ලි. මිලියන සියයක් Mixed Development Project එකේ සල්ලි. මිලියන 85ක් ඩයලොග් එකේ සල්ලි. මිලියන 60ක් ශ්‍රී ලංකා ටෙලිකොම් සල්ලි. මිලියන 45ක් එයාර්ටෙල් එකේ සල්ලි. මිලියන 43ක් හැව්ලොක් සිටි එකේ සල්ලි. මිලියන 43ක් Havelock City phase II එකේ සල්ලි. මිලියන 37ක් යුනිලීවර් සල්ලි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සියල්ලටම අදාළ වන්නේ 2014ට කලින් අත්සන් කරපු ගිවිසුම්. මේවා 2014ට කලින් ආපු සල්ලි. මේ සියල්ල මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ආපු සල්ලි. මේවා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ අත්සන් කරපු ගිවිසුම්. මේවා ඒ කාලයේ වැඩ ආරම්භ කරපුවා. ෂැන්ග්‍රි-ලා හෝටලය ඔබතුමන්ලා නොවෙයි හැදුවේ. ඔබතුමන්ලා Colombo Port City හැදුවේ නැහැ. හම්බන්තොට වරාය හැදුවේ අපි. ගරු ඇමතිතුමා, ඇමතිකම අරගෙන තමුන්නාන්සේට විදේශ ආයෝජන වශයෙන් ගෙනෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ යූ එස් ඩොලර් මිලියන 17ක් - US Dollars 17 million - විතරයි. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, අනෙක් ඒවා අපේ කාලයේ ගෙනාපු සල්ලි; ෂැන්ග්‍රි-ලා එකේ සල්ලි, - [බාධා කිරීමක්]

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු මන්ත්‍රීතුමා, මේවා ආරම්භ වුණාට,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න මම කියන්නම්. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහගන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තමුන්නාන්සේ බොරු කියන්නේ. [බාධා කිරීමක්] එහෙම ගෙනැල්ලා නැහැ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු මන්ත්‍රීතුමා, අහගෙන ඉන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොරු කියන්න එපා, ගරු ඇමතිතුමා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මේ සල්ලි ආවේ ගිය අවුරුද්දේ. ඒකයි මම කිව්වේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ආ! එහෙම කියන්න. එහෙම කියන්න. අපේ කාලයේ කරපුවාට ගිය අවුරුද්දේ,- [බාධා කිරීමක්]

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Foreign investments කියන්නේ ඒකයි. ඔබතුමා ඒක දන්නේ නැතිව ඇති.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
But, those are not new investments. ගරු ඇමතිතුමනි, මේවා අලුත් ආයෝජන නොවෙයි. මේවා ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ,- [බාධා කිරීමක්]

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මේ ඔක්කෝම ආවේ ගිය අවුරුද්දේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා රටට කියන්නේ එහෙම නොවෙයි. [බාධා කිරීමක්] එහෙමනම් ඔබතුමා කියන්න, මේවා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ආයෝජනය කරලා, අපේ කාලයේ ආපු සල්ලි කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
පොඩ්ඩක් අහගෙන ඉන්න. මේ අවුරුද්දේ පළමුවැනි මාස හයේ බිලියන 2.7ක ආයෝජන සඳහා approvals දීලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොරු කියන්න එපා, ඇමතිතුමා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අපි බිලියන 2.7ක ආයෝජන සඳහා approvals දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවුරුද්දේ පළමුවැනි මාස හය තුළ -ජූනි මාසයේ අවසානය වෙන කොට- බිලියන 2.7ක ආයෝජන සඳහා approvals අපි දීලා තිබෙනවා. ඒ ගැන ගරු මන්ත්‍රීතුමා දැනගන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා තේරුම් ගන්න ඔබතුමා fail කියලා. ඔබතුමාගේ විභාගය අසමත් කියලා ඔබතුමා තේරුම් ගන්න. ගරු ඇමතිතුමා, බිලියන 1,710ක් ආපු investmentsවල විස්තර මම ඔබතුමාට කිව්වා. [බාධා කිරීමක්] මේ විෂයය ඔබතුමා පරාදයි කියලා පිළිගන්න. ඔබතුමා පරාදයි කියලා පිළිගන්න එපා යැ. [බාධා කිරීමක්]

ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා)
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication and Digital Infrastructure and Foreign Employment)
Sir, I rise to a point of Order.

දෙන්නාම විභාගය කළේ එකම ඉස්කෝලේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, හරි. ඒක අපි බලාගන්නම්. ඔබතුමා පොඩ්ඩක් ඉන්නකෝ. ඇමතිතුමා මගේ rugger team එකට ගැහුවා නාවලපිටියට ඇවිල්ලා. ඒක වෙනම දෙයක්. ඒක අපි පස්සේ බේරා ගනිමු. ඒක නොවෙයි ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, මට ඔබතුමා එක්ක පෞද්ගලික අමනාපයක් නැහැ. ඇමතිතුමනි, රටකට විදේශ ආයෝජන තිබෙන්න ඕනෑ; විදේශ ආයෝජන රටට ගෙනෙන්න ඕනෑ. අද මේ ආණ්ඩුව දේශපාලන වශයෙන් අස්ථාවර වෙලා. මේක තේරුම් ගන්න. තමුන්නාන්සේලා දවසින් දවස ප්‍රතිපත්ති වෙනස් කරනවා. එතකොට ආයෝජකයෝ එන්නේ නැහැ. අපි කියන්නේ මේකයි. මේ ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ මිස තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ නොවෙයි. ඒ නිසා අනුන්ගේ දරුවන්ට උප්පැන්න දෙන්න එපා. තමුන්නාන්සේ අනුන්ගේ දරුවන්ට උප්පැන්න දීලා, ආයෝජන පෙන්වන්න එපා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මෙතුමාට පැහැදිලිව කිව්වා, මේ අවුරුද්දේ පළමුවෙනි මාස හයේ යූ එස් ඩොලර් බිලියන 2.7ක ආයෝජන සඳහා approvals දීලා තිබෙනවා කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි. ඒ සල්ලි ඇවිල්ලා තිබෙනවාද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඉතින්, සල්ලි ලැබෙන්නේ projects පටන් ගත්තාම නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් ආණ්ඩුවට අවුරුදු තුනහමාරක් ගිහිල්ලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Projects පටන් ගත්තාම තමයි සල්ලි එන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Okay, tell me what the projects are.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I cannot tell you offhand. I will table the list.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Why do you want to table?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I am telling you the facts.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
You are the Minister but you do not know about the projects.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Wait! I will tell you. We have three LNG-based power plants, all Foreign Direct Investments.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අයියෝ! ගරු ඇමතිතුමා. මම ඔබතුමාට කියනවා, 2020 වෙනතෙක් ඔය ගෑස් ව්‍යාපෘතිය එන්නේ නැහැ; ආවොත් මම මේ මන්ත්‍රීකමේ ඉන්නේ නැහැ කියලා. ඔබතුමා බොරුවට ගිවිසුම් අත්සන් කරන්න එපා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඒවාට approval දෙන්න එපායැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
රටට බොරු කියන්න එපා ඇමතිතුමා. [බාධා කිරීමක්]

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
These are manufacturing projects. We have a rubber -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමාට කියක් හරි දෙනවා ඇති. ඒක වෙනම කාරණයක්. ඔබතුමා පොඩි පොඩි ගණන්වලට කථා කරන්න එපා. ඔබතුමා වැදගත් මනුෂ්‍යයෙක් නේ. ඔබතුමාට හොඳ අනාගතයක් තිබෙනවා නේ. ඔබතුමා බොරුවට කඩේ යන්න එපා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඔබතුමන්ලා වාගේ අපි කරන්නේ නැහැ. ඒවා කළේ ඔබතුමන්ලාගේ කාලයේ. අපට එහෙම කරන්න ඕනෑ නැහැ. අපට සල්ලි හම්බවෙන කාලය ඇවිල්ලා තිබෙන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ෂෙඩ්වලින් ගත්ත එක්කෙනා නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොන ෂෙඩ්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හොඳයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා හොඳට මතක තියා ගන්න. ආණ්ඩුවකට විදේශ ආයෝජන නැතිව යන්න බැහැ. මම මුල ඉඳලාම කිව්වේ ඒකයි. තමුන්නාන්සේලාට විදේශ ආයෝජන ඇවිල්ලා නැහැ. මගේ තර්කය ඒකයි. තමුන්නාන්සේ කියනවා, US Dollars 2.1 billionsවලට foreign investments ආවා කියලා. ගිවිසුම් අත්සන් කළා කියලාත් කියනවා. ගරු ඇමතිතුමා, තමුන්නාන්සේ අද මේ ගැසට් එකෙන් මොකක්ද කරන්න හදන්නේ? තමුන්නාන්සේ අත්සන් කරපු ගිවිසුම්වල කාලය දීර්ඝ කරන්න ඉල්ලනවා. ඒ කියන්නේ මොකක්ද? තමුන්නාන්සේ මේ ගැසට් එකෙන් තමුන්නාන්සේලාගේ projectsවල කාලය දීර්ඝ කරන්න ඉල්ලනවා. තමුන්නාන්සේලා 2015දී ගිවිසුම් කිහිපයක් අත්සන් කළා. ඒ එක ගිවිසුමකින්වත් සත පහක් රටට ඇවිල්ලා නැහැ. තමුන්නාන්සේ දැන් රට ඉදිරියේ ලජ්ජා වෙලා ගිවිසුම් ටික extend කරන්න හදනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඉන්දියාවත් එක්ක LNG project එක කරන්න හදනවා. ඔය LNG project එක කෙරෙන්නේ නැහැ ගරු ඇමතිතුමා. විදුලි ඉංජිනේරු මහත්වරු අපි හමුවුණා. ඒක ඇතුළේ තිබෙන "සීල්" එක අපි දන්නවා. ජනාධිපතිවරයා ඔය LNG project එක කරන්න දෙන්නේ නැහැ; Cabinet Paper එක නැවැත්තුවා. ඒ නිසා තමුන්නාන්සේලා ඒ සංඛ්‍යාලේඛන කියලා වැඩක් නැහැ.

ගරු ජෝන් අමරතුංග අමාත්‍යතුමනි, ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉන්න ජ්‍යෙෂ්ඨතම ඇමතිවරයෙක්. පොඩ්ඩක් අහන්නකෝ. හරිනම් නියෝජ්‍ය නායකකම දෙන්න තිබුණේ තමුන්නාන්සේට. තමුන්නාන්සේ කරපු "නෝට්" වැඩ නිසා ඒ තනතුර ලැබුණේ නැහැ. තමුන්නාන්සේට තමයි ඒ තනතුර දෙන්න තිබුණේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Please give me two more minutes. මගේ කථාව අවසන් කරන්නම්.

අපේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමනි, අද මගේ කථාව කරලා ගියාම FCID එකට කථා කරලා කියනවා, "මහින්දානන්දට පුළුවන්නම් තව නඩුවක් දාන්න" කියලා. ඒත් ප්‍රශ්නයක් නැහැ. එහෙම කිව්වත් කමක් නැහැ. පසුගිය කාලයේත් කැරම් බෝඩ් කේස් එකක් දාලා, මම FCID එකේ සිටිනකොට ඔබතුමන්ලාගේ ඇමතිවරයෙක් හතර වතාවක් කථා කරලා කිව්වා, "පොදු දේපළ පනත යටතේ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මහින්දානන්ද හිරේට දාන්න" කියලා. හැබැයි, අධිකරණයෙන් මට ඇප දුන්නා. දැන් තව නඩුවක් දාන්න කියලා FCID එකට call එකක් යනවා කියලා මම දන්නවා. මට විරුද්ධව නඩු 10ක් දැම්මත් කමක් නැහැ. හිර ගෙවල් 100කට දැම්මත් කමක් නැහැ. හැබැයි, මේ රටේ නීති වෙනස් කරන්න එපා ගරු ඇමතිතුමා. අපට විදේශ ආයෝජන නැතිව යන්න බැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, විදේශ ආයෝජන දිරි ගන්වන්න මීට වඩා සහන දෙන්න. BOI එකට එන විදේශකයෝ ආපහු යනවා. ඒ මිනිසුන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්නේ නැහැ. ඒ මිනිසුන්ගේ ප්‍රශ්න කථා කරන්නේ නැහැ. ගරු ඇමතිතුමා ඔබතුමා මේ ගැන බලන්න.

ගරු ඇමතිතුමා ඔබතුමාගෙන් මම තව එක ප්‍රශ්නයක් අහනවා. කෝ, ඔබතුමාගේ රාජ්‍ය අමාත්‍යතුමා? මට රාජ්‍ය අමාත්‍යතුමා පෙන්වන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
පිටරට ගිහිල්ලා ඊයේ ආවේ. එතුමාට අසනීපයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම අද උදේ එතුමාට කථා කරලා ඇහුවා, "එන්නේ නැද්ද?" කියලා. එතුමා දීපු උත්තරේ මට මේ සභාවේ කියන්න විධියක් නැහැ. ඔබතුමාගේ රාජ්‍ය ඇමතිතුමාත් අසතුටෙන් නම්, විදේශ ආයෝජකයෝ මොනවාද හිතන්නේ?

ඒ නිසා ඔබතුමාගේ රාජ්‍ය ඇමතිතුමා සතුටින් තියන්න ඇමතිතුමා. එතුමාට අමාත්‍යාංශයේදී බනිස් ගෙඩියක්, කෙසෙල් ගෙඩියක්වත් order කරගන්න විධියක් නැතිලු. ඒ මිනිස්සු තමයි මේ ආණ්ඩුව හැදුවේ. සුජීව සේනසිංහලා, හරින් ප්‍රනාන්දුලා තමයි මේ ආණ්ඩුව හැදුවේ. ඒ ගොල්ලෝ තමයි කෑ ගැහුවේ. ඒ ගොල්ලෝ කෑ ගහලා, ආණ්ඩුව හදලා අවශ්‍ය දේවල් ඔක්කෝම කළත් අද ඒ මිනිස්සුන්ට කවුරුත් නැහැ. අද ඒ මිනිස්සු වෙනුවෙන් කථා කරන්න කෙනෙක් නැහැ. අද විදේශ ආයෝජන සියල්ල කඩාගෙන වැටිලා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගෙන් අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, එක්කෝ ඔබතුමාගේ ඇමතිකම වෙන කාට හරි දෙන්න කියලා. මේ ආයෝජන වැඩ ටික කරන්න ඔබතුමා වෙන කාට හරි භාර දෙන්න. ඔබතුමා ඒ වාගේ වැඩ පිළිවෙළක්වත් හදන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මම තමයි ඉස්සෙල්ලාම ගැසට් කරලා යම් යම් වැඩ පිළිවෙළ සඳහා රාජ්‍ය ඇමතිතුමාට බලය දුන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ වුණාට එතුමා කියනවානේ කිසිම දෙයක් කරන්න බැහැ කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එතුමා කිව්වාට අපි දන්නේ නැහැනේ, ඔබතුමා මොනවා කියනවාද කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමා කිව්වානේ මොකුත් කරන්න බැහැ කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඔබතුමා බොරුනේ කියන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අර මාතර මන්ත්‍රීතුමා එළියේදී අපිත් එක්ක කථා කරන ගමන් බැන්නා, ඇමතිකමක් දෙන්නේ නැහැ කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඔබතුමා බොරුනේ කියන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එළියේදී බැන්නා, ඇමතිකමක් දෙන්නේ නැහැ කියලා. මෙතැනට ඇවිල්ලා ඔබතුමාට බොරු කියනවා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඔය බොරු කියන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ජීවිතේට මට ඇමතිකමක් දෙන්නේ නැහැ කියනවා. UNP එක කවදාවත් සලකන්නේ නැහැ කියනවා. ඇමතිකමක් දෙන්නේ නැහැ කිව්වා. ඔය පක්ෂයේ ඉන්නවාට ගාණක් දෙන්න ඕනෑ කියලා කිව්වා. මෙතැනට ඇවිල්ලා ඔබතුමාට ලණු දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.16]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කරනවා, අපේ නියෝජ්‍ය ඇමතිවරු අසතුටින් ඉන්නේ කියලා. නමුත් මම කියනවා, එදා මහින්ද රාජපක්ෂ පාලන කාලයේ ඇමතිවරු කට වහගෙන හිටියේ. මොකද, යූඑන්පීකාරයන්ට තමයි ඇමතිකම් ටික දීලා තිබුණේ. රටේ ප්‍රධාන ඇමතිකම් ටික දීලා තිබුණේ එක්සත්

ජාතික පක්ෂයේ ඉඳලා සැලුන් දොරෙන් ඔය පැත්තට ආපු කට්ටියට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බර ඇදපු කට්ටිය අපේ ඇමතිවරු යටතේ තමයි හිටියේ. අද ඔබතුමා ඒවා දන්නේ නැහැ වාගේ අපේ නියෝජ්‍ය ඇමතිතුමා ගැන කථා කරනවා. ඔබතුමා තව කිව්වා, ආයෝජන තියා බල්ලෙක්වත් ආවේ නැහැ කියලා. රජ මැදුරට පිට රටින් බල්ලෝ ගෙනාපු හැටි අපි දැක්කා.

බලු කෑමවල මිල අය වැයෙන් අඩු කරපු හැටිත් අපි දැක්කා. එදා අය වැයෙන් අඩු කළේ කිරි පිටිවල මිල නොවෙයි, බලු කෑමවල මිල. ඒ අතීතය අපට අමතක කරන්න බැහැ. [බාධා කිරීම්] ඒ නිසා අද ඉදිරිපත් කර තිබෙන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වූ නියමයන් දෙක ගැන කථා කරන්න කියලා මම කියනවා. ඔබතුමන්ලාට ආණ්ඩුව කරන්න අවුරුදු 10ක්, 12ක් දුන්නා. ඔබතුමන්ලා වැඩ බැරි ටාසන්ලා වාගේ වැඩ කළා. අවුරුදු 10න් ගෙදර ගියා. වැඩ බැරි ටාසන්ලා දැන් කෑ ගහනවා, එදා බලු පැටව් ටික වාගේ කට වහගෙන ඉඳලා. එදා ඒ කටවල් තිබුණාද? එදා කථා කරන්න තිබුණා නේ. එදා "අත උස්සපන්" කියනකොට අත උස්සනවා. "අත පහත් කරපන්" කියන කොට පහත් කරනවා. එහෙම තමයි එදා පාලනය කළේ. නමුත් අද කෑ ගහනවා.

මම මේ අවස්ථාවේ දී ගරු මූලාසනයෙන් ඉල්ලීමක් කරනවා. මේ අය මේ වටිනා පාර්ලිමේන්තුවේ හැසිරෙන්න දන්නේ නැහැ. ජනතා මුදල් වියදම් කරලා පවත්වාගෙන යන මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ එක් කෙනෙකු කියනවා, "ගැසට් එක දැක්කේ නැහැ" කියලා. තව කෙනෙකු කියනවා, "කමිටු වාර්තාව හරි නැහැ" කියලා. මේවා සොය සොයා දෙන්න ගියාම තව පැය ගණනක් ගත වනවා. ඔබතුමන්ලා ඒවා බලාගෙන එන්න. මෙතැනට ඇවිල්ලා බොරුවට කෑ ගහනවා මිසක් table එකට එන ලියකියවිලි මොනවාද කියලා බලලා නොවෙයි කථා කරන්නේ. ඔබතුමන්ලා අද දවසේ අපේ වටිනා කාලයෙන් ගොඩක් නාස්ති කළා. ඒකට හේතුව ඔබතුමන්ලාගේ දන්නේ නැතිකම නොවෙයි, කුහකකම. එදා මේ රට හදන්න බැරි විධියට අරාජික කරලා අද කථා කරන්න එනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද කථා කරන්නේ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන නියමයන් දෙකක් පිළිබඳවයි. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ක්‍රියාත්මක වෙච්ච සීනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම 2014 අප්‍රේල් 19 වැනිදාට පෙර ආරම්භ කිරීමට ගිවිසුමක් ඇති කර තිබුණේ පසු ගිය ආණ්ඩුව කාලයේ කියන කාරණය අපි පිළිගන්නවා. නමුත් පසු ගිය ආණ්ඩුව පිළිබඳව තිබෙන සැකසහිත බව නිසා මේ ගොල්ලන් මේක ක්‍රියාත්මක නොකර, අලුත් ආණ්ඩුව දිහා බලාගෙන ඉඳලා "දැන් තමයි මේක ක්‍රියාත්මක කරන්න හොඳම අවස්ථාව. ආයෝජකයන්ට පහසු රටක් තිබෙන්නේ දැන්" කියලා තමයි අලුතින් පටන් ගන්න හදන්නේ. දැන් තමයි අපි කාලය දීර්ඝ කරලා දෙන්නේ.

ඒ වාගේම 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2051/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් වෙන්නේ මොකක්ද? AVIC International Hotels Lanka Limited එක කොළඹ ආර්.ඒ. ද මැල් මාවතේ ඉදි කරන්න යන හෝටල් ව්‍යාපෘතියක්. නමුත් ඒකත් ඒ ආණ්ඩුවේ ගහපු ගිවිසුම් තමයි. නමුත් ඒ ආණ්ඩුවෙන් මේවා පිළිබඳව සද්ද නොකර හිටියා. මොකද, ඒ ආණ්ඩුවේ කප්පම්කාරයන් හිටියා. විදේශිකයෙකුට ඇවිල්ලා වැඩක් කරන්න පුළුවන් වාතාවරණයක් රටේ තිබුණේ නැහැ. එනමුත් අද අපි කාලය දිග් කරලා, ඒ ආයෝජන ටිකත් ශ්‍රී ලංකාවට ගෙන එන්න අවශ්‍ය කටයුතු කරනවා. මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම මෙම කාරණය ගැනත් මා කියන්න කැමැතියි.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මට වේලාව නැහැ.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ගරු මන්ත්‍රීතුමා, අත්තනගලු ඔය පිටාර ගලලා. මෙහේ කඹුරන්නේ නැතිව ගිහිල්ලා මිනිසුන්ට කෑම ටිකක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඒක point of Order එකක් වෙන්නේ කොහොමද? විදේශිකයන්ට මේ රටේ වැඩ කරන්න පුළුවන්, ආයෝජනය කරන්න පුළුවන්, යහපත් රටක් නිර්මාණය කරන්න අවශ්‍ය වාතාවරණයක් එදා පැවති රජයේ අග භාගයේදී තිබුණේ නැති බව මම මේ අවස්ථාවේදී කියනවා. ආයෝජකයන්ගෙන් කප්පම් ගන්න ගිහිල්ලා ඒ ආයෝජකයන් අපේ රටින් ගිය හැටි අපි ඒ කාලයේ දැක්කා. ඇමතිවරු බුදිය ගත්ත හැටි අපි දැක්කා. රාජ්‍ය තාන්ත්‍රික ලෝකය පිළිගත් බැන් කී මූන් වැනි නායකයන් මේ රටට ආවාම කැබිනට් ඇමතිවරු ගිහිල්ලා පාරේ බුදිය ගත්තා. එහෙම රටක් තිබියදී විදේශ ආයෝජකයන් මේ රටට ඒවිද? නවනීදන් පිල්ලේ කියන ලෝකයම පිළිගත් කාන්තාව මේ රටට ආවාම කැබිනට් ඇමතිවරකු ගිහිල්ලා කසාද බඳින්න ඇහුවා, විලිලජ්ජා නැතිව. "ශ්‍රී ලංකාව" කිව්වාම, අපටත් ලජ්ජා වන විධියේ රටක් තමයි එදා තිබුණේ. Channel 4 එකට එන්න කියලා වීසා දීලා, ගල් මුල්වලින් ගහලා එළෙව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම රටකට විදේශීය ආයෝජකයන් ඒවිද? විදේශිකයන්ගේ තිබෙන මේ භය නැති කරන්නේ කොහොමද කියන එකයි අදත් අපට තිබෙන ප්‍රශ්නය. අවුරුදු 10ක පාලන කාලය තුළ විදේශිකයන්ගේ මනසේ හොල්මන් කරපු අවතාර අදත් ඔවුන් තුළ හොල්මන් කරනවා. ඔවුන් තුළ තිබෙන ඒ භය නැති කරගන්නයි අපට අවශ්‍ය වන්නේ. අන්තිමට මේ රටට ආයෝජකයන් ආවේ නැහැ. ආයෝජකයන් කොහේද ආවේ? මේගොල්ලන් කළේ වැඩි පොලියට ණය අරගෙන වරායවල් හදපු එකයි. අපේ රටේ වරායක් හැදුවාට ප්‍රශ්නයක් නැහැ. වරාය අපේ රටේ ප්‍රමුඛස්ථානය වෙලා තිබුණේ නැහැ. නමුත් "හදපන් වරායක්, අපි සල්ලි දෙනවා. වෙන දේකට සල්ලි දෙන්නේ නැහැ" කියලා තමයි මේගොල්ලන්ට ඒ බැංකුව කිව්වේ. "අනේ! එහෙනම් කමක් නැහැ" කියලා වරාය හැදුවා. නැව් එන්නේ නැති වරායක් බවට පත් වුණු මේ වරාය අපි අද වනකොට ලෝකය පිළිගත් ආයතනයක් එක්ක එකතුවෙලා, ලෝකයම පිළිගත් වරායක් බවට පත් කරලා තිබෙනවා. " චික්කා, චික්කා" කියලා අපට කෑ ගැහුවාට අපි වරාය චික්කේ නැහැ. මේගොල්ලන් තමයි ඉඩම් චික්කේ. මේගොල්ලන්

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

තමයි හමුදා මූලස්ථානය තිබුණු භූමිය ෂැංග්‍රි-ලා හෝටලය ඉදිකිරීම සඳහා වික්කේ. නමුත් ලෝකය පිළිගත් රාජ්‍ය ආයතනයක් එක්ක එකතුවෙලා, ඒකාබද්ධ ගිවිසුමක් ඇති කරලා, ඒ වරාය අද ලෝකයේ හොඳ වරායක් බවට පත් කරන්න අපි උත්සාහ කරලා තිබෙනවා. එදා විදේශ ආයෝජන කියලා ගෙනාපු ණය එකතු කරලා බැලුවාම හදපු ව්‍යාපෘතිවල වටිනාකම ගත් ණයෙන් සියයට 10ක් විතර ඇති, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඉතුරු සල්ලිවලට වුණු දේ හොයා ගන්න තවම බැහැ. ඒ නිසා තමයි ජනතාව අවුරුදු 12ක් මේ රට පාලනය කරන්න බලය දීපු නායකයා ලෝකයට මුහුණ දෙන්න බැරුව, ගත්තු ණය ගෙවා ගන්න බැරුව අවුරුදු 10න් ගෙදර ගියේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර මිනිසුන් ණය ගෙවා ගන්න බැරි වුණාම වස බීලා සිය දිවි නසා ගත් ආකාරය අපි ඉතිහාසයේ දැක තිබෙනවා; ගෙල වැල ලාගෙන සිය දිවි නසා ගත් ආකාරය අපි දැක තිබෙනවා. සමහර මිනිසුන් ණය අරගෙන, අරගෙන කර ගන්න දෙයක් නැති වුණාම තමන්ගේ පවුලේ උදවිය තනි කර දමා පැන යනවා. ඔවුන් ආගිය අතක් නැති වෙනවා. මේ විධියට තමයි එදා හිටපු රාජ්‍ය නායකයාත් කටයුතු කළේ. මේ රටට ණය අරගෙන, අරගෙන කරකියා ගන්න දෙයක් නැති වුණාම එල්ලුම් ගහ පෙන්වා, ජීනීවාවල තිබෙන විදුලි පුටුවක් පෙන්වා, ජනතාව බය කරලා අවුරුදු 10න් පැනලා ගියා. අවුරුදු 10න් පැනලා ගිහින් ජනේලෙක එල්ලුණා. ඕක තමයි රටේ ඉතිහාසය දිහා බැලුවාම රටේ තිබුණු තත්ත්වය.

එදා එහෙම වුණාට, අද මේ අය කයිවාරු ගහන්නේ හරියට මැරිලා ඉපදිලා වාගේයි; මෙලෝ දෙයක් දන්නේ නැහැ වාගේයි; එදා ඉතිහාසය අමතක වෙලා වාගේයි. මතකද, ඔය කියන ආයෝජන ගැන? වරාය හැදුවාය කිව්වා. අපි වරාය බලන්න යනකොට, අපිට මොකද කළේ? අපිට ගහලා එළෙව්වා. පිස්තෝල අරගෙන ඇවිත් අපව බය කළා. අපිට වරාය ඇතුළට යන්න දුන්නේ නැහැ. අදත් අපි එම නඩුවලට පෙනී සිටිනවා. එදා, මත්තල ගුවන් තොටුපොළ බලන්න ගියාම අපට කළේ මොකක්ද? අඩන්තේට්ටම් කරලා, අපේ ෂර්ට්ස්වලින් ඇද දමා, පිස්තෝල පෙන්වා අපව එළෙව්වා. ඔය කියන ආයෝජන සද්භාවයෙන් කළ ඒවා නම්, ඇයි දෙයියනේ! එදා මහජන නියෝජිතයෙකුට එතැනට යන්න දුන්නේ නැත්තේ? සද්භාවයෙන් කරපු ආයෝජන නම්, මහජන නියෝජිතයෙකුට එතැනට යන්න දුන්නේ නැත්තේ ඇයි? එදා පාර්ලිමේන්තුව දැනුවත් නොකර හොර මගඩි කළා. නමුත් අද මේ පාර්ලිමේන්තුවේ දී ගරු ඇමතිවරයෙකුගෙන් ඕනෑම ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ගරු අගමැතිතුමාගෙන් අද ඕනෑ ප්‍රශ්නයක් අහන්න පුළුවන්. හැම දෙයක් ගැනම අද පාර්ලිමේන්තුව දැනුවත් කරනවා. එදා මේ කිසි දෙයක් ගැන දැනුවත් නොකර වැඩ කරලා, අන්තිමට අපි ඒවා බලන්න ගියාම පිස්තෝල පෙන්වා අපව එළෙව්වා. ඔන්න ඔය වාගේ තමයි විදේශ ණය අරගෙන මේ ගොල්ලන් රටේ ආයෝජනය කළේ කියන එක අමතක වෙලා කථා කිරීම ගැන විශේෂයෙන් මම කනගාටු වෙනවා.

අද වියත් මහක් ගැන කථා කරනවා. එදා වියතුන්ට කථා කරන්න ඉඩ දුන්නාද? එදා කළේ මොනවාද? ස්වාධීන කොමිෂන් සභා අවලංගු කර දැම්මා. උගත්, බුද්ධිමත් නිලධාරීන්ට කටයුතු කරන්න පුළුවන් අවස්ථාව රටේ තිබුණාද? එදා නොරොච්චෝලේ විදුලි බලාගාරය හදන කොට ඒකේ ඉංජිනේරුවෝ කිව්වා මට මතකයි, "අනේ machine එනවා, අපි දන්නේත් නැහැ. අපි මේවා order කළේත් නැහැ" කියලා. බැලුවාම ඉංජිනේරුවෝ නොවෙයි, දේශපාලනඥයෝ තමයි machine order කරලා තිබුණේ. එහෙම අය වියත් මහක් ගැන කථා කරනවා. එදා "විපත්" මහකට රට තල්ලු කරපු උදවිය අද වියත් මහක් ගැන කථා කරනවා. එදා නිලධාරීන් දැම්මේ පහළට.

එදා ශිරාණි බණ්ඩාරනායක මැතිනියව එළෙව්වේ කොහොමද? එක පැන් පාරෙන් ශිරාණි බණ්ඩාරනායක මැතිනියව එළෙව්වා. "හූ" කියලා, කෑ ගහලා රටේ අග්‍රවිනිශ්චයකාරවරිය පන්නා දැම්මා. අද වියත් මහක් ගැන කථා කරනවා. එදා ඒ වියත් අයට තීන්දු-තීරණ ගැනීමේ අවස්ථාව දුන්නාද? ඒ ගොල්ලන්ගේ තීන්දු නොවෙයි, ජනාධිපතිවරයාගේ ඒකාධිපති බලයෙන් තමයි වියතුන් පාලනය කළේ. එම අතීතය අමතක කරන්න එපා කියලා මම විශේෂයෙන් කියනවා.

අපි දන්නවා, මේ රටට ආයෝජන ගෙනාවේ නැති බව. ඩොලර් එක පාලනය කළේ කෘත්‍රිම විධියට. බලහත්කාරයෙන් ඩොලර් එක පාලනය කළේ. විදේශ ණය අරගෙන, බලහත්කාරයෙන් ඩොලර් එක පාලනය කළා. ලෝකයෙන් වැඩි පොලියට ණය අරගෙන රටේ ආර්ථික වර්ධනය, රටේ උද්ධමනය ගැන දර්ශක මවා පෙන්වපු රටක සම්පූර්ණ සිද්ධාන්තය තමයි අපට වෙනස් කරන්න සිද්ධ වුණේ.

එදා මේ රට ලෝකයේ ප්‍රචලිත වෙලා තිබුණේ -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එදා මේ රට ලෝකයේ ප්‍රචලිත වෙලා තිබුණේ සංචාරකයන්ගේ පාරාදීසයක් විධියට. නමුත් සංචාරකයන්ට මේ රටට එන්න පුළුවන්කම තිබුණාද? සංචාරකයන් සඳහා හෝටල් හැදුවාට, එම හෝටල්වලට විදේශිකයෝ ආවාද? මත්තල ගුවන් තොටුපොළක් හැදුවාට, විදේශිකයෝ ආවාද? ඇයි? ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදේශීය කාන්තාවකගේ ස්වාමියා මරා, ඇයව දූෂණය කළ යුගයක් නේද මේ රටේ තිබුණේ? ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ඉඳලා පාර්ලිමේන්තුවේ කැබිනට් ඇමතිවරයා දක්වා පරිපාලන බලය අතට අරගෙන ඒ විධියේ නොයෙකුත් අඩන්තේට්ටම් කරපු යුගයක විදේශිකයන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ රටක් තමයි එදා තිබුණේ. ආයෝජකයෝත් එහෙමයි. කර්මාන්තශාලා ඇති කරන්න ආයෝජකයන් ඒවිද? GSP සහනය නැති වුණා. යුරෝපය අපේ මත්ස්‍ය නිෂ්පාදන ගැනීම ප්‍රතික්ෂේප කළා. එතකොට කර්මාන්තශාලා මේ රටට එන්නේ කොහොමද? අද අපිට මේ රට ක්‍රම-ක්‍රමයෙන් හදන්න සිදු වෙලා තිබෙනවා. අපිට ක්‍රම-ක්‍රමයෙන් මේ රට වෙනස් කරන්න තිබෙනවා කියලා මා විශේෂයෙන්ම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ රටේ මෑත ඉතිහාසය දිහා බැලුවාම, සංචාරක ව්‍යාපාරවලින් වැඩිම ආදායම් ලබපු කාලය පසුගිය 2017 අවුරුද්ද කියන එකත් මම බය නැතුව කියන්න කැමැතියි. මා එය අභියෝගාත්මකව කියනවා. මේ අවුරුද්දේ ඊටත් වඩා සංචාරකයෝ එනවා. [බාධා කිරීමක්] මේ වචන ඇහෙනකොට මෙතුමන්ලාට ඉන්න බැහැ, කැක්කුමයි. සංචාරකයන්ගෙන් වැඩිම ආදායම ලැබිලා තිබෙන්නේ 2017 අවුරුද්දේය කියන එක අපි පෙන්වා තිබෙනවා. ඇයි? විදේශයන් අද මේ රට පිළිගන්නවා. යහපත් දේශයක් විධියට පිළිගන්නවා; මිත්‍රශීලී රටක් විධියට පිළිගන්නවා.

අධිකරණය, ව්‍යවස්ථාදායකය සහ විධායකය සර්ව සාධාරණ විධියට කටයුතු කරන රටක් විධියට විදේශය මේ රට පිළිගෙන තිබෙනවා.

එදා මේ රටේ සිටි පාලකයෝ ඒකාධිපතියන් විධියටයි කටයුතු කළේ. රටේ මනුෂ්‍යත්වය වචනවලට පමණක් සීමා වෙලා තිබුණා. සංචාරකයන් මෙරටට පැමිණියේ නැහැ. අපේ අපනයන ආදායම අඩුවෙලා තිබුණා. මෑත ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම වාර්තා වී තිබෙන්නේ 2017 වර්ෂයේදියි. එම ප්‍රමාණය යූඑස් ඩොලර් මිලියන 11,400යි. "අපි රස්සා දුන්නාද?" කියා මෙතුමන්ලා අහනවා; "රැකී රක්ෂා ලබාදීම අඩු වෙලා" කියා කෑ ගහනවා. අපි එතුමන්ලාගේ කාලයේ සිදු වුණු දේවල් ගැන කෑ ගහන්නේ නැති වුණාට, සංඛ්‍යා ලේඛනවලින් ඒ දේවල් පෙන්වනවා. අපි මේ රට භාර ගන්න කොට රටේ සේවා වියුක්තිය සියයට 4.4යි. 2017 වර්ෂය වනවිට එය සියයට 4.2ක් දක්වා පහත බැස තිබෙනවා. අපි අද රැකී රක්ෂා ප්‍රමාණය වැඩි කර තිබෙනවා.

ඊළඟට, අපේ විදේශ සංචිත ප්‍රමාණ අරගෙන බලමු. මෑත ඉතිහාසය දෙස බැලුවොත්, 2017 වර්ෂයේ සමස්ත විදේශ සංචිත ප්‍රමාණයේ විශේෂ අගයක්; වාර්තාගත අගයක් සටහන් වනවා. 2017 වර්ෂය වන විට අපේ ගෙවුම් ශේෂයේ අගය යූඑස් ඩොලර් මිලියන 2,068ක් දක්වා වැඩි කර තිබෙනවා. වර්තමානයේ අපේ රට තුළ මෙවැනි තත්ත්වයක් අපි ඇති කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මට තව විනාඩියක් ලබාදෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

2008 වර්ෂයේදී ගෙනා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත තුළින් අපේ රටට වැඩිහරියක්ම ආයෝජන ආවේ හෝටල් කර්මාන්තය සඳහායි. නමුත් එදා හෝටල් විදෙස් සංචාරකයන්ට හරිහැටි නොසලකපු නිසා විදේශිකයෝ අපේ රටට ආවේ නැහැ. එම නිසා අපේ අය ජේම්ස් පැකර්ලා වාගේ අය හරහා ලෝකයේ තිබෙන භයානක කැසිනෝ ව්‍යාපාර ලංකාවට ගෙනාවා. එහෙම ගෙනැත් කැසිනෝකාරයන්ගේ, ගණිකා වෘත්තියේ යෙදෙන්නන්ගේ, සල්ලාලයන්ගේ පාරාදීසයක් බවට මේ රට පත් කළා. නමුත් අපේ රටේ ජනතාවගේ වාසනාවකට 2015 ජනවාරි 08වැනි දා සිදුවුණු විප්ලවය තුළින් මේ රටේ පාලන බලය වෙනස් වුණා. නැත්නම් මේ වනවිට අපේ රටේ කැසිනෝකාරයෝ පිරිලා; සල්ලාලයෝ හා බේබද්දෝ පිරිලා. ඒ ඉතිහාසය අමතක කරලා අද මෙතුමන්ලා ශාන්තුවරයෝ වාගේ කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙපමණයි. අපි යන ගමන අපි යනවා. අපිට දැන් ප්‍රතිඵල ලැබී තිබෙනවා. අපි දැන් ණය ගෙවීමේ කටයුතු ක්‍රමානුකූලව හසුරුවාගෙන යනවා. මෙතුමන්ලා හැම දේටම කෑ ගහනවා. එදා ගිලන්රථ සේවය මේ රටට ගෙනෙන විට කෑ ගැහුවෙත් අද සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ගැන කෑ ගහනවා වාගේම තමයි. RAW සංවිධානයේ ඔත්තුකාරයෝ එනවාය කියා එදා කිව්වා. නමුත්, අද ෂෝක් එකට එම ගිලන්රථ සේවය පවත්වාගෙන යනවා. එදා වෛද්‍යවරු ඒ ගැන උද්ඝෝෂණ කළා. නමුත් අද බලන්න, එම සේවාව කොච්චර ප්‍රයෝජනවත්ද කියලා. ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම විතරක් නොවෙයි, අපි තව තවත් ගිවිසුම්ගත වෙලා ලෝකය සමඟ අත්වැල් බැඳගෙන, අපනයන ආදායම ඉහළ ගිය රටක්, රැකී රක්ෂා සුලබ රටක් බවට මේ රට පත් කරන බවට පොරොන්දු වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

Order, please! The next speaker is the Hon. Douglas Devananda. Before he starts, will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)
Sir, I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[பி.ப. 3.30]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் செயல்நுணுக்க அபிவிருத்திக் கருத் திட்டங்கள் சட்டத்தின்கீழான இரு கட்டளைகள் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்படுகின்ற நிலையில், இந்த விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் பதிவு செய்வதற்கு வாய்ப்பு வழங்கியமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்தச் சபையிலே அபிவிருத்தி உபாயமுறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரினால் இந்தக் கட்டளைகள் சமர்ப்பிக்கப்பட்டுள்ள நிலையில், இந்த நாட்டில் மிக அண்மைக்காலமாகப் பெரும் குழப்ப நிலையினைத் தோற்றுவித்துள்ள 'சிங்கப்பூர் வர்த்தக ஒப்பந்தம்' தொடர்பிலும் எனது கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன். இந்த ஒப்பந்தம் ஏற்படுத்தியுள்ள சந்தேகமானது இந்த நாட்டிலே

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

මරුත්துව අධිකාරිකள් மத்தியிலும் ஏற்பட்டதனால், கடந்த 17ஆம் திகதி மருத்துவர்கள் மேற்கொண்டிருந்த ஒரு நாள் பணிப் பகிஷ்கரிப்பு காரணமாக இந்த நாட்டிலே வடக்கு, கிழக்கு உட்பட்ட அனைத்துப் பகுதிகளிலுமுள்ள நோயாளர்கள் பெரும் சிரமங்களை அனுபவித்ததையும் அதனால் பாதிக்கப் பட்டதையும் எவராலும் மறந்துவிட முடியாது. நோயாளிகளின் தரப்பிலிருந்து சிந்திக்கின்ற எவருக்கும் இந்தப் பணிப் பகிஷ்கரிப்பினை மேற்கொண்டிருந்த மருத்துவர்கள்மீது கோபம் வரலாம். என்றாலும், எந்த ஒரு விடயம் தொடர்பிலும் உரிய அனைத்துத் தரப்பினருடனும் கலந்துரையாடாமல், இத்தகைய சந்தேகத்தை ஏற்படுத்திவிட்டு, அதனை அடிப்படையாகக்கொண்டு, ஒரு தரப்பினர் - அதுவும் மக்களது அன்றாட, அடிப்படை அதாவது மக்களது உயிருடன் சம்பந்தப்பட்ட தொழிற்துறை சார்ந்த தரப்பினர் - பணிப் பகிஷ்கரிப்பினை மேற்கொண்டால்தான், குறித்த தரப்புகளை அழைத்துப் பேச்சுவார்த்தை நடத்தப்படும் என்ற நிலைமையை நீங்கள் உருவாக்கி, அதனை ஒரு வழமையாகவே முன்னெடுத்து வருகின்ற நிலையில், இத்தகைய பணிப் பகிஷ்கரிப்புகள் இந்த நாட்டில் ஏற்படுவது தவிர்க்க முடியாததாகியுள்ளது என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

ஏற்கெனவே 'எட்கா' ஒப்பந்தம் காரணமாக நாட்டில் ஏற்பட்டிருந்த குழப்ப நிலைமையினையும், அதன் காரணமாக எமது மக்கள் சந்தித்திருந்த பல்வேறு பாதிப்புகள் குறித்தும் நாம் மறக்கவில்லை. அந்த நிலையிலிருந்து மீண்டுவரும் நிலையில், இப்போது இன்னொரு குழப்பத்தினையே இந்தச் சிங்கப்பூர் ஒப்பந்தம் இந்த நாட்டில் ஏற்படுத்தியிருக்கின்றது. இந்த ஒப்பந்தத்திற்கு எதிராக மருத்துவர்கள் பணிப் பகிஷ்கரிப்பில் ஈடுபட்டதன் பின்னர்தான், அது குறித்த தெளிவுபடுத்தல்களை நீங்கள் மேற்கொள்கின்றீர்கள். இந்த நிலையில், ஏன் இதனை முன்கூட்டியே செய்திருக்கக் கூடாது? என்ற கேள்வி எழுகின்றது.

இலங்கையிலிருந்து சிங்கப்பூருக்கு ஏற்றுமதி செய்யப்படு கின்ற பொருட்களுக்கென விசேட வரி விதிப்புகள் மேற்கொள்ளப்படாதிருக்கும் நிலையில், அந்த நாட்டுடன் விசேட வர்த்தக ஒப்பந்தமொன்றுக்குச் செல்லவேண்டிய பாரிய அழுத்தங்கள் என்ன? என்ற கேள்வியே இன்று பலராலும் முன்வைக்கப்படுகின்றது. அதேநேரம், மேற்படி ஒப்பந்தத் திற்குக் கிடைத்துள்ளதாகக் கூறப்படுகின்ற அமைச்சரவை அனுமதி தொடர்பிலும் சந்தேகங்கள் வெளியிடப்படுகின்றன. மேற்படி ஒப்பந்தம் காரணமாகப் பாதிக்கப்படக்கூடிய வர்களாகக் கூறப்படுகின்ற தொழில் துறைகள் சார்ந்த தொழிற்சங்கத்தினருக்கோ, கைத்தொழிலாளர்களுக்கோ ஒப்பந்தம் தொடர்பில் அறிவுறுத்தப்படவில்லை என்று தெரிவிக்கப்படுகின்றது. எனவே, இத்தகைய ஒப்பந்தங்கள் மேற்கொள்ளப்படுகின்றபோது, உரிய தரப்பினர் அனைவரும் அறிவுறுத்தப்பட வேண்டும் என்ற விடயத்தை நான் மீண்டும் இந்தச் சபையிலே வலியுறுத்த விரும்புகின்றேன்.

இந்த நாட்டைப் பொருளாதார வீழ்ச்சியிலிருந்து மீட்பதற்கு நீங்கள் முயல்வதாகக் கூறுகிறீர்கள். அதற்காக அவசரப்பட்டு, மென்மேலும் இழப்புகளை ஏற்படுத்தும் முயற்சிகளுக்குத் துணை போகாதீர்கள்! எனக் கேட்டுக்கொள்கின்றேன். இன்று இந்த நாட்டில் அபிவிருத்தி என்ற பெயரில் பல அமைச்சுக்கள் இருக்கின்றன. இவற்றில் எத்தனை அமைச்சுக்கள் செயற்பாட்டில் இருக்கின்றன? என்ற கேள்வி எமது மக்களிடையே இல்லாமல் இல்லை. வடக்கின் அபிவிருத்திக்கு என்றும் ஓர் அமைச்சு உருவாக்கப்பட்டுள்ளது. கிழக்கிற்கு தேவையில்லை என நினைத்துவிட்டீர்கள்போலும்! மேல் மாகாணத்திற்கும் தென்மாகாணத்திற்கும் வடமேல் மாகாணத்திற்கும் அபிவிருத்தி அமைச்சுக்களை ஏற்படுத்திய நீங்கள், ஏனைய மாகாணங்களில் அபிவிருத்தி தேவையில்லை என்று நினைத்தோ அல்லது ஏனைய மாகாணங்கள் அனைத்தும் முழுமையான அபிவிருத்திகளைக் கண்டுவிட்டன என நினைத்தோ, அவற்றுக்கென அபிவிருத்தி அமைச்சுக்கள் உருவாக்காமல் இருந்துவிட்டு, இப்போது வடக்கு மாகாணத்திற்கும் கண்டி மாவட்டத்திற்கும் உருவாக்கி யுள்ளீர்கள். இதனாலாவது ஏதேனும் செயற்பாடுகள் முன்னெடுக்கப்படுமா? என்ற கேள்வியும் எமது மக்கள் மத்தியில் இல்லாமல் இல்லை.

மத்திய அரசில் ஸ்திரத்தன்மை இன்னமும் ஏற்பட்டுள்ள தாகத் தெரியவில்லை. எமது மாகாணங்களைப் பொறுத்த வரையில், கிழக்கு மாகாணம் தேர்தலுக்காகத் தவம் கிடக்கின்றது. வடக்கு மாகாணம், எமது மக்களுக்குப் பயனாக ஒருபோதும் இருக்கப்போவதில்லை என்ற சாதனையை நிலைநாட்டி, உயிரிழந்த எமது மக்களை வைத்து, உயிருடன் உள்ள எமது மக்கள் மத்தியில் சுயலாப அரசியல் செய்து கொண்டிருக்கின்றது. உயிரிழந்த உறவுகளை அவர்கள்தம் உறவுகள் நினைவுகூர்வதற்கு யாருடைய அனுமதியும் தேவையில்லை. ஆனால், அதைச் சுயலாப அரசியலாக்கக் கூடாது என்பதே எமது நிலைப்பாடாகும். எமது மக்களை முள்ளிவாய்க்காலுக்குக் கொண்டு சென்றவர்கள், கொண்டு செல்லத் துணை போனவர்கள், கொல்லக் கொடுத்தவர்கள் இன்று அங்கு சென்று அரசியல் கண்ணீர் வடிப்பது வேதனைக்குரிய விடயமாகும்.

உறவுகளைப் பலி கொடுத்த வலியைச் சுமக்கும் மக்களில் நானும் ஒருவன். எனது உடன்பிறந்த ஒரு சகோதரனையும் ஒரு சகோதரியையும் மட்டுமல்லாது, என்னோடு தோளோடு தோள் நின்ற பல தோழர்களையும் நெருக்கமான உறவுகள் பலரையும் இந்த உரிமைப்போராட்டத்தில் பலி கொடுத்த இழப்பின் துயரங்களை நானும் அனுபவிப்பவன். அந்த அனுபவங்களுக்கு ஊடாகவே உரிமையை வெல்வதற்கான எமது பாதையை நாம் செப்பனிட்டுக்கொண்டவர்கள். பலியாகிப்போன அனைத்து உறவுகளுக்கும் அனைத்து இயக்கப் போராளிகளுக்கும் நாம் செலுத்தும் அஞ்சலி மரியாதை என்பது, இழப்புகளைச் சொல்லி அழுது கொண்டிருப்பதல்ல; இழப்புகளை வைத்து அரசியல் நடத்துவதும் அல்ல. மாறாக, உறவுகளைப் பறிகொடுத்து வலி சுமந்த எமது மக்களின் மனங்களை ஆற்றுப்படுத்த வேண்டும். தங்களது உயிரிழந்த உறவுகளைச் சுதந்திரமாக நினைவுகூர்வதற்கு ஒரு காலகட்டத்தில் தென்பகுதியால் விடுக்கப்பட்டிருந்த தடைகள், இடையூறுகள் தளர்ந்து, இன்று வடபகுதிச் சுயலாப அரசியல்வாதிகளால் அந்தத் தடைகள், இடையூறுகள் ஏற்படுத்தப்படுகின்ற நிலைமை உருவாகி யுள்ளது. வடக்கின் அரசியல்வாதிகள் நினைவுகூர்வதற்கு அழைத்தால் அவர்களது சகாக்கள் நான்கைந்து பேர் போவார்களே அன்றி, எமது மக்கள் போகமாட்டார்கள். எனவேதான், எமது மக்கள் போகின்ற இடங்களைப் பார்த்து வடக்கு அரசியல்வாதிகள் வலுக்கட்டாயமாக நுழைந்து, யதார்த்தபூர்வமற்ற வகையில், செயற்கைத்தனமாக எமது மக்களின் உணர்வுகளைத் தூண்ட முயற்சித்துக்கொண்டு, தங்களது சுயலாப அரசியலை முன்னெடுக்கப் பார்க்கின்றார்கள். இதனைத் தென்பகுதிச் சிங்கள மக்கள் புரிந்துகொள்ள வேண்டும். அந்த வகையில், தங்களது சுயலாப அரசியலுக்காகச் சாத்தியமற்ற விடயங்களை முன்வைத்து, அது குறித்துக் கதைத்துக் கதைத்தே இந்த

නාට්ඩින් අනෙත්තු මක්කළෙයුම් තිසෙ තිරුප්පි, තංකළතු ඉලක්කුකළෙ එට්ටිවිට මුනෙකින්ර අනෙත්තුත් තරප්පු ඉනවාත අරසියල්වාතිකළිනෙතුම් කුරුකිය නෝක්කංකළෙ එමතු මක්කළ් අනෙවරුම් නන්කු උණර්න්තුකොළ්ළ වේණ්ටුම් එනක් කේට්ටුක්කොළ්කින්රේන්.

ඉන්රු, අතිකළවිලාන වරි විතිප්පුක්කළ්, කටන්කළ්, කණ්ටපිඩි තණ්ටංකළ් විතිප්පු පෝන්රවර්රිනාලේයේ ඉන්ත නාට්ඩින් පොරුළාතාරම් ඔටික්කොණ්ටිරුප්පතාකප් පොතු මක්කළ් නම්පුකින්ර නිලෙයිල්, අතිකළවිලාන විලෙයේර්රංකළ් කාරණමාක මක්කළ් පෙරිතුම් පාතික්කප්පට්ටුළ්ළනර්. ඉන්නිලෙයිල්, වටක්කු මාකාණත්තිලේ ඉන්නමුම් තීර්ක්කප්පටාත එමතු මක්කළතු උණර්වුපූර්වමාන පිරච්චිනෙකළ් උළ්ළිට්ට අටිප්පටෙප් පිරච්චිනෙකළ් පලවුම් ඉරුක්කින්ර පෝතු, අරසියල් තීර්වු තොටර්පිල් කූටික්කූටික් කතෙත්තුක් කොණ්ටිරුක්කින්ර ඉව්වේළෙයිල්, තෙන්පකුතියිලේ කාලනිලෙච් සීර්කේටු කාරණමාකච් සුමාර් 23,000 පේර් වරෙයිල් පාතික්කප්පට්ටු, 8 පේර් අළවිල් උයිරිළන්තුළ්ළනර්. තෙන්පකුතියිලේ වෛරස් කාය්චල් කාරණමාක ඉතුවරෙයිල් සුමාර් 13 පේර් වරෙයිල් උයිරිළන්තුළ්ළ නිලෙයිල්, පිරච්චිනෙක්කු මේල් පිරච්චිනෙකළෙ එතිර්කොළ්ළ වේණ්ටිය නිලෙමෙක්කු එමතු නාට්ටු මක්කළ් තළ්ළප්පට්ටුළ්ළනර්.

වටක්කු, කිළක්කු මාකාණංකළෙප් පොරුත්තවරෙයිල්, මුප්පතාණ්ටු කාල යුත්තප් පාතිප්පුකළ් ඉන්නමුම් අවර්කළෙවිට්ටු මුළුමෙයාක අකලාත නිලෙයිල්, අන්රාට වාළ්වාතාරත්තිර්කේ අල්ලර්පටුකින්ර එමතු මක්කළුක්කු වෙරුම් උණර්වුකළෙත් තිණිත්තුත් තිසෙ තිරුප්පුවතර්කු මුයර්සිප්පෝර්, ඔරු වේළෙ උණවළිප්පතර්කාන වළියෙක් කාට්ටුවතාක ඉල්ලෙ එන්ර වේතනෙයේ තොටර්කින්රතු. ඉන්රු එමතු සාතාරණ මක්කළින් පිරතාන එරිපොරුළාන මණ්ණෙණ්ණෙයින් විලෙයෙ අතිකළවිල් උයර්ත්ති යතෝටු, උයර්ත්තිය විලෙයෙවිට මේලුම් අතිකරිත්ත විලෙයිල් එමතු පකුතිකළිලේ කුරිප්පාක, තීවකප් පකුතිකළිලේ අතු විර්පනෙ සෙය්යප්පටුකින්ර නිලෙමෙයුම් ඒර්පට්ටුළ්ළතු. ඉතු කුරිත්තුක් කවනම් සෙලුත්තප්පට වේණ්ටිය තේවෙයෙ ඉංකු උණර්ත්තුවතුටන්, කටර්පොළිලාළර්කළුක්කු මානිය විලෙයිල් මණ්ණෙණ්ණෙය් වළංකප්පටුවතුපෝල්, නීරිරෙක්කුම් ඉයන්තිරංකළෙප් පයන්පටුත්ති විවසායත් තුරෙයිලේ ඊටුපටුකින්ර මක්කළුක්කුම් අතේ මානිය විලෙයිල් වළංකප්පට වේණ්ටුම් එන්ර කෝරික්කෙයෙයුම් ඉංකු මුන්වෛක්ක විරුම්පුකින්රේන්.

එමතු පකුතිකළින් අපිවිරුත්තිකළ් පර්රිප් පේසප් පටුකින්රන. එළුත්තිලේ කාට්ටප්පටුකින්රන. ආනාල්, නටෙමුරෙච් සෙයර්පාටු එනප් පාර්ත්තාල්, එල්ලාමේ පූච්චියමාකවේ ඉරුක්කින්රන. එමතු පකුතිකළුක්කෙන කුරිප්පිටප්පටුකින්ර අපිවිරුත්තිකළ්, පල්වේරු කාරණංකළෙක් කාට්ටි අංකිරුන්තු තිරුප්පප්පටුකින්ර කාරියංකළුම් නිරෙයවේ නටන්තුකොණ්ටිරුක්කින්රන. උංකළුක්කු එතුවෙල්ලාම් සාතකමෝ, අතෙයෙල්ලාම් අංකු සෙය්ය මුයර්සික්කින්රීර්කළ්! එමතු මක්කළුක්කු එවෙයෙල්ලාම් සාතකමෝ, අවෛ තොටර්පිල් ඉළුත්තටිත්තු වරුකින්රීර්කළ්! අංකේ මාකාණ සපෙයෙක් කට්ටිප්පිටිත්තුක්කොණ්ටිරුප්පෝර් එමතු මක්කළුක්කුච් සාතකමානවර්රෙයෙල්ලාම් පුරන්තළ්ළි විට්ටු, වෙරුමනේ තීර්මානංකළෙ නිරෙවේර්රුවතිලේයේ අක්කරෙයාක ඉරුක්කින්රාර්කළ්. අන්රාටත් තේවෛකළ්, අපිවිරුත්තිකළ්, අරසියල් තීර්වු එන්ර අටිප්පටෙ නෝක්කිල් එමතු මක්කළතු තේවෛකළෙ උණර්න්තු අවර්රෙ නිරෙවේර්රික් කොටුත්තවර්කළ් නාංකළ්! ඉප්පෝතු ඉවෛ එතුවුමර්ර නිලෙයිල් එමතු මක්කළ් කෛවිටප්පට්ටුළ්ළනර්. පොරුළාතාර රීතියිල්, සමූක රීතියිල් මර්රුම් අරසියල් අතිකාර රීතියිල් ඒන්, මනිතාපිමාන රීතියිල්කූට කෛවිටප් පට්ටවර්කළාකවේ එමතු මක්කළ් ඉන්රු උළ්ළනර්. එනවේ, එමතු මක්කළෙ එන්ත රීතියිල් නීංකළ් අපිවිරුත්ති සෙය්යප් පෝකිරීර්කළ්? එන්ර කේළ්වියෙ මුන්වෛත්තු විටෙපෙරු කින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 3.42]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් විවාදයක් පැවැත්වෙන මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමා මේ ගරු සභාවේ නොසිටීම ගැන මා කනගාටු වනවා. මීට පෙර කථා කළ අපේ අෂිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාට මා බොහොම කරුණාවෙන් දැනුම් දෙන්න කැමැතියි, පුරා අවුරුදු 30ක් ඍෂු විදේශ ආයෝජන පිළිබඳව එක වචනයක්වත් කථා කරන්න අපට ඉඩ ප්‍රස්තාව තිබුණේ නැහැයි කියන එක. ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විවෘත වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය හඳුන්වා දීලා, ලංකාවේ නිදහස් වෙළෙඳ කලාප පිහිටුවා, විදේශ ධන ආයෝජන සඳහා ඉඩ ප්‍රස්තා ලබා දීලා, බදු සානුබල දිරි ගැන්වීම් සියල්ල දීලා, කිසි දවසක වාර්ෂික විදේශ ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 200කට වඩා වැඩි කර ගන්න බැරි වුණා. ඒ කාල පරිච්ඡේදය තුළ විවෘත ආර්ථිකය ඇති වීමෙන් පසු අපේක්ෂිත අරමුණු, ඉලක්ක කරා කිසිවකුට යන්න බැරි වුණා.

ඉන්දු-ලංකා ගිවිසුමෙන් පසු රටේ ඇති වුණු දැවැන්ත තත්ත්වය තුළ, ඉන්දියන් වඩුරු හමුදාව පැන්නීම හා සම්බන්ධිත ක්‍රියා මාර්ග තුළ අපේ රට මීනී කන්නන්ගේ දේශයක් බවට පත්වෙලා තිබුණා. ආයෝජකයන් මේ රටට එනවා තබා ආයෝජන ගැන හිතන්නවත් කෙනෙක් සිටියේ නැහැ. මහා භීෂණයක් තමයි රට ඇතුළේ තිබුණේ. තරුණයින් හා අනික් අයගේ ඔළු කපලා, බෙලි කපලා වැටවල්වල ගහලා මළ මීනී දහස් ගණනින් තිබුණු යුගයක් පැවැති බව එතුමාට අමතක වීම ගැන මට පුදුමයි.

ඊට පස්සේ එල්ටීටීඊ කුරිරු ත්‍රස්තවාදය වර්ධනය වුණා. මුහුදු වෙරළෙන් 2/3ක්, මහ පොළොවෙන් 1/3ක් පිළිබඳ ආධිපත්‍යය පිහිටුවා තිබුණේ එල්ටීටීඊය විසිනුයි. සිංගප්පූරුවේ විශාලත්වය වර්ග කිලෝමීටර 1,000යි. උතුරු නැඟෙනහිර දෙපළාතේ විශාලත්වය වර්ග කිලෝමීටර 18,800යි. සිංගප්පූරුව වැනි රටවල් 18ක භූමි ප්‍රමාණයක් අපට අහිමි වෙලායි තිබුණේ.

එදා 1989 ඉඳලා ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා -වර්තමාන සභානායකතුමා- අපි දන්නවා. බෞද්ධයින්ගේ මුදුන් මල් කඩ බඳු වූ ඓතිහාසික මහනුවර දළදා මාලිගාවට එදා ප්‍රහාර එල්ල වනකොට, මේ රටේ ගුවන් තොටුපොළට එල්ටීටීඊ කුරිරු ප්‍රහාරයන් එල්ල වනකොට සංචාරකයන් හෝ කිසිම විදේශ ආයෝජකයෙක් මේ රටට එන්න තබා හිතන්නවත් බැරි තත්ත්වයක් තමයි ලංකාවේ තිබුණේ. කොළඹ නගරයේ කිසිම හෝටලයක කාමරයක් ඩොලර් 25කටවත් දෙන්න බැරි වුණා. හෝටල් කාමර සුද්දන් නැතුව ඉකි බින්දා. මරාගෙන මැරෙන කොටි ත්‍රස්තවාදීන් රටේ මූල්‍ය කේන්ද්‍රස්ථානය වන ශ්‍රී ලංකා මහ බැංකුවට, කොළඹ මර්මස්ථානවලට බෝම්බ ගහනකොට, හමුදා

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

මූලස්ථානයට ඇවිල්ලා මරාගෙන මැරෙන කොටි පහර දෙනකොට භය හා සැකය අබ මල් රේණුවක්වත් තිබෙන විදේශ ආයෝජකයන් ලංකාව ගැන හිතුවේවත් නැහැ. මොන විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ඇති කළත්, කුරිරු කොටි ත්‍රස්තවාදය කරනකොටගෙන නිදහසින් පස්සේ අපේ රටේ කිසිම ආයෝජකයකුට කිසිම ඉඩකඩක් තිබුණේ නැහැ. 2009දී සේනාධිනායක මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ රණ විරුවන් සිය දහස් ගණනක් තමන්ගේ ජීවිත, ඇට, මස්, ලේ, නහර පූජා කරලා මේ මාතෘ භූමිය ත්‍රස්තවාදීන්ගෙන් නිදහස් කර ගැනීමෙන් පස්සේ තමයි ලංකාවේ ආර්ථිකය නැඟිටින්න පටන් ගත්තේ කියන එක අකැමැත්තෙන් වුණත් මේ සියලුදෙනාම පිළිගත යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරේ දුම්රිය මාර්ගය තිබුණේ නැහැ. ප්‍රභාකරන් ඒ රේල් පීලිවලින් බංකර් හදලා තිබුණා. ඒ ප්‍රදේශයේ විදුලිය තිබුණේ නැහැ. ඒ ප්‍රදේශයේ බැංකු තිබුණේ නැහැ. ඒ ප්‍රදේශයේ ලංකා බැංකුව, මහජන බැංකුව ඇතුළු කිසිම බැංකුවක් තිබුණේ නැහැ.

රක්ෂණය නැහැ, කෘෂි කාර්මික ක්ෂේත්‍රවල, කුඹුරුවල වැඩ කරන්නේ නැහැ. තර්ජිත ගම්මානවල මිනිස්සු වැඩ කළේත් නැහැ. ඒවා පිළිබඳව කිසිම සංඛ්‍යා ලේඛනයක්, දත්තයක් නැහැ. එම නිසා, ඒ කාලය තුළ දත්ත එකතු කරන්න ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට යන්න බැහැ. උසාවියක් නැහැ, නඩු ඇහුවේ ප්‍රභාකරන්. මේ සියල්ල අමතක වෙලා, මහින්ද රාජපක්ෂගේ රජය විතරයි තිබුණේ කියලා තමයි කථා කරන්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා හා ඒ රජය කරපු මහා ජාතික යුතුකම හා වගකීම නොවෙන්නට අද තමුන්නාන්සේලාට කිසිම විදේශ ආයෝජනයක් පිළිබඳව කථා කරන්න තියා හිතන්නවත් හම්බ වෙන්නේ නැති බව පැහැදිලිව අවබෝධ කරගන්නට ඕනෑ. එම නිසා වෙන කිසිවක් නොකළත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට කඩන්නේ නැතුව, බෙදන්නේ නැතුව, සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර් සියලු මිනිසුන්ට හා ආයෝජකයන්ට නිදහසේ රටේ ඉන්න හා ගමන් කරන්න ඉඩ ප්‍රස්ථා ලබා දීමේ පිංකමට ජාතියේ ප්‍රණාමය හිමි වෙන්නට ඕනෑය කියන එක අපි අවංකව කියන්නට ඕනෑ. ඒක තමයි ඇත්ත.

ඊට පස්සේ ලංකාවේ ආර්ථිකය ඉදිරියට ගියාද, පස්සට ගියාද කියලා මනින්න දර්ශක තිබෙනවා. රටේ සමස්ත නිමැවුම තිබෙනවා; ආදායම තිබෙනවා; සේවා නියුක්තිය තිබෙනවා; මිල මට්ටම තිබෙනවා; ගෙවුම් ශේෂය තිබෙනවා; ඉතුරුම් තිබෙනවා; ආයෝජනය තිබෙනවා. ඒවා පිළිබඳව දත්ත හදලා කියන්න බැහැ. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කියනවා වාගේ දත්ත හදලා පෙන්වන්න බැහැ. මොකද, මේ පාර්ලිමේන්තුව සම්මත කරපු "මුදල් නීති පනත" කියන නීතියට අනුව, රටේ ආර්ථික තත්ත්වය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක්, ජේ.ආර්. ජයවර්ධන මහතා ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවූ දවසේ ඉඳලා අද වෙනකල් හැම වසරකම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ ගරු සභාවට පිළිගන්වනවා. "ඒකේ තිබෙන ඉලක්කම් බොරු, ඒකේ ඉන්නේ පිස්සෝ" කියලා කියනවා නම්, පිස්සු ඩබල් වුණු කෙනෙකුට තමයි ඒ ආර්ථික දර්ශක කෘත්‍රිමව හැදුවා කියලා කියන්න පුළුවන්. පිස්සු පූසෙකුට විතරයි එහෙම කියන්න පුළුවන්. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉන්නේ, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පළමුවැනි පන්ති සාමර්ථයක් ලබලා, වෙනත් රටවලට ගිහිල්ලා master's degree එකක් කරලා, PhD එකක් කරලා, -

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
රුපියල් 2,500න් මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලා ගණන් හදන කොට පිස්සු පූසෙක් වෙන්නේ නැද්ද ගරු මන්ත්‍රීතුමා?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඔව්, ඒක මම දාපු Cabinet Paper එකක්.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
නැහැ, නැහැ. මම අහන්නේ, රුපියල් 2,500 ගණන් කරන කොට පිස්සු පූසෙක් ගණන් කරනවා වගේ ගණන් කිරීමක් වෙන්නේ නැද්ද කියලායි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නැහැ, එතකොට නැහැ. මගේ වෙලාවේ මෙතුමා කථා කරනවා. මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එක්ක,- මේවා කියන කොට මෙතුමන්ලාට අහගෙන ඉන්න බැහැ. ගරු රාජ්‍ය ඇමති සහෝදරයා, මහ බැංකු වාර්තාව අනුව අද සිද්ධ වෙලා තිබෙන්නේ, 2015, 2016 හා 2017 කියන වර්ෂ තුනේම රටේ නිමැවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජනය කියන සබඳ සකලමනාවන් ටික කඩා වැටිලා ඉවරයි. නැහැ කියලා කියන්න පුළුවන්ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
සංචිත වැඩිවෙලා තිබෙනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
සංචිත වැඩි කළේ කොහොමද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
8.2ට තිබුණු සංචිතය කාලා ඉවර කරලා, 131ට තිබුණු,-

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා හැමදාම සංචිත ගැන තමයි කථා කරමින් සිටියේ. දැන් සංචිත ගැන කථා කරන්නේ නැහැ. මොකද, සංචිත ප්‍රමාණය වැඩි වෙලා තිබෙන නිසා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මගේ වෙලාව. 8.2ට තිබුණු සංචිත, ඇමෙරිකානු ඩොලර් බිලියන 4කට වඩා පුච්චලා විනාශ කරලා, - [බාධා කිරීමක්] තමුන්නාන්සේලා තමයි පිච්චුවේ. පුළුවන් නම් "පිච්චුවේ නැහැ" කියලා කියන්න. පුච්චලා, අද වෙනකොට ජාත්‍යන්තර වෙළෙඳ පොළෙන් ගිනි පොලියට ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5ක් ලබාගෙන තමයි සංචිත වැඩි කරගෙන තිබෙන්නේ. ලංකා ඉතිහාසයේ කිසිම ආණ්ඩුවක් Sovereign Bond එකක් issue කරලා ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5ක් ගිනි පොලියට අරගෙන නැහැ. මේ ගොල්ලෝ තමයි ගත්තේ. ඒ බිලියන 2.5 දාලා කියනවා, "සංචිතය නැග්ගා" කියලා. ලංකා ඉතිහාසයේ ලොකුම ණය ප්‍රමාණය ගැනීම පිළිබඳව වාර්තාවක් පිහිටුවමින් තමයි මේක කරලා තිබෙන්නේ. ඒ පිළිබඳව නොවෙයි මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න බලාපොරොත්තු වෙන්නේ.

අත්සන් කර තිබෙන සිංගප්පූරු-ශ්‍රී ලංකා ගිවිසුම, 1815 දී සිදු වූ පාවා දීමටත් වඩා විශාල පාවා දීමක් කියන එක මේ රටේ වෛද්‍ය විශේෂඥයන්, ඉංජිනේරුවරුන්, ගණකාධිකාරිවරුන්, වාස්තු විද්‍යාඥයන්, විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන්, මහාචාර්යවරුන් සියලුදෙනා එක පයින් කරුණු සහිතව ඔප්පු කරලා මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගිහින් තිබෙනවා.

එසේ ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න හේතු වූ එක කරුණක් තමයි, ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමාත් සිංගප්පූරුවේ විදේශ අමාත්‍යතුමාත් අත්සන් කරපු පිටු දහස් ගණනකින් යුත් ගිවිසුමට නීත්‍යනුකූලව කැබිනට් අනුමැතිය ලබා දීලා නැති බව. අධිකරණයට ඉදිරිපත් වූ එක තර්කයක් ඒක. [බාධා කිරීමක්] උසාවිය ඉදිරියේ තිබෙන කාරණයට උසාවියට ගිහින් උත්තර බඳින්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය ලේකම් ඊ. එම්. එස්. බී. ඒකනායක මහතාගේ 2017.12.22 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත්තේ, ශ්‍රී ලංකා - සිංගප්පූර් නිදහස් වෙළෙඳ ගිවිසුම-

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා, point of Order එක මොකක්ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම නියමයන් සඳහා අපි කැබිනට් අනුමැතිය අරගෙන තිබෙන බව මගේ කථාවේදී මම පැහැදිලිව ප්‍රකාශ කළා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
සම කැබිනට් ප්‍රකාශක -

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඒක ඔබතුමාගේ මතය. රජයක් හැටියට අපි ප්‍රකාශ කරලා තිබෙනවා නේ, "අපි කැබිනට් අනුමැතිය අරගෙන තිබෙන්නේ" කියලා. ඔබතුමා කොහේ හෝ ගිහිල්ලා ඒ ගැන තර්ක කරන්න. අපි අනුමැතිය අරගෙන තිබෙන්නේ. අපට පැහැදිලිව අයිතියක් තිබෙනවා ඒක කියන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මට කථා කරන්න තිබෙන අයිතිය නැති කරනවා. මට කථා කරන්න තිබෙන අයිතිය දෙන්න ඕනෑ. [බාධා කිරීමක්] වාඩි වෙන්න. වාඩි වෙන්න. මට කථා කරන්න තිබෙන අයිතිය දෙන්න. මට කථා කරන්න තිබෙන අයිතිය නැති කරන්නේ කොහොමද? වාඩි වෙන්න. වැදගත් වෙන්න. තාත්තා කොච්චර වැදගත් මනුස්සයෙක්ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,—

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය ලේකම් ඊ.එම්.එස්.බී. ඒකනායක මහතාගේ 2017 -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මෙතුමා කිව්වා, කැබිනට් අනුමැතිය අරගෙන නැහැ කියලා. වැරදි මතයක් රටට යවන්න හදන්නේ. මම ඒකයි නිවැරදි කළේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ලියවිල්ල මම කියවන්නම්. ''අග්‍රාමාත්‍ය ලේකම් ඊ. එම්. එස්. බී. ඒකනායක මහතාගේ 2017.12.22 දිනැති ලිපියෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත්තේ, ශ්‍රී ලංකා - සිංගප්පූර් නිදහස් වෙළෙඳ ගිවිසුම අගමැති ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත 2018 ජනවාරි 23වැනි දිනට පෙර

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

කැබිනට් අනුමැතිය සඳහා යොමු කරන ලෙසයි. එය ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුවේ තීරණයක් ලෙස එහි තවදුරටත් සඳහන් කර තිබේ. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්වරිය විසින් 2017.12.22 දිනැති කැබිනට් සංදේශය කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. අතිගරු ජනාධිපතිතුමා ඇතුළු තවත් අමාත්‍යවරුන් 13දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණද ඒ සමඟ එම සංදේශයේ 2017 ජනවාරි 09වැනි දින පවත්වන ලද කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේ. එම දිනයේදී කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ හා අතිරේක ලේකම්වරයාගේ 2017 ජනවාරි 17 දිනැති යොමු අංක 17/2982/252/044 දරන ලිපියෙන් නීතිපතිතුමා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා ඇත.

එහි පිටපත් ගරු ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා අනෙකුත් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා විගණකාධිපති වෙත යවා ඇත. එම දිනයේදී කැබිනට් මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි කටයුතු කිරීමට සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීමට තීරණය කර තිබේ. එනම්,

1. පහත සඳහන් නිරීක්ෂණයන්හි, -අර ඇමතිවරුන් 13දෙනකු දීලා තිබෙන නිරීක්ෂණවල- අතිගරු ජනාධිපතිතුමාගේ, මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ, විදේශ කටයුතු ඇමතිතුමාගේ, කර්මාන්ත සංවර්ධන ඇමතිතුමාගේ, අධිකරණ ඇමතිතුමියගේ, විදේශ රැකියා ඇමතිතුමියගේ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගේ නිරීක්ෂණයන්හි අවධාරණය කර තිබෙන කාරණා සැලකිල්ලට ගෙන, කැබිනට් සන්දේශයට අමුණා ඇති ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුමේ කෙටුම්පත අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
2. එම කෙටුම්පතේ ගිවිසුම් බේරුම්කරණයට අදාළ කරුණු හා සම්බන්ධ විධිවිධාන නීතිපතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරමින් ඉහත 1හි සඳහන් පරිදි, සංශෝධනය කරන ලද කෙටුම්පත් ගිවිසුම සඳහා එතුමාගේ නිරීක්ෂණ ලබා ගැනීම පිණිස පියවර ගැනීම.
3. ඒ අනුව සකස් කරන ලද අවසන් කෙටුම්පත් ගිවිසුම සලකා බැලීම පිණිස ඇමතිතුමා මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

මෙම තීරණය අදාළ බලධාරීන්ට දැනුම් දීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වෙත බලය පවරා තිබේ. එම දැනුම් දීම 2018 ජනවාරි මස 17 දිනැති ලිපියෙන් දන්වා යවා ඇති අතර, එම ලිපිය ඇතැම් අමාත්‍යාංශ වෙත ලැබී තිබෙන්නේ, 2018 ජනවාරි මස 22 දිනයි.

ජනවාරි 17 දිනැති ලිපියෙනුයි දන්වා තිබෙන්නේ. හැබැයි, අමාත්‍යාංශවලට ලිපිය ලැබී තිබෙන්නේ ජනවාරි 22 දිනයි.

තවද, 2018 ජනවාරි මස 17 හා ජනවාරි මස 23 අතර කිසිදු අමාත්‍ය මණ්ඩල රැස්වීමක් පවත්වා නැහැ. එසේ තිබියදී, 2018 ජනවාරි මස 23වැනි දින මෙම ගිවිසුම අත්සන් කර තිබෙනවා. ජනවාරි මස 17 සහ 23 අතර කිසිදු කැබිනට් මණ්ඩල රැස්වීමක් පවත්වා නැහැ. ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි, කැබිනට් මණ්ඩල සාමාජිකයකු ලෙස ඔබතුමා එය දන්නවා ඇති. අර සංශෝධනත් එක්ක නැවත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නය කිව්වා. නමුත්, එහෙම ඉදිරිපත් කළේ නැහැ. ඉදිරිපත් නොකර, ජනවාරි මස 23වැනි දින ගිවිසුමට අත්සන් තබා ඇති අතර, ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා එයට අත්සන් කර තිබෙනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Niroshan Perera, what is your point of Order?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන විධියට අතිගරු ජනාධිපතිතුමාත්, ඒ සියලුම අමාත්‍යවරුනුත් මේ වනතුරු -මේ ගිවිසුම හොරෙන් අත්සන් කරනතුරු- කට පියා ගෙන ඉඳලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කියන්න හදන්නේ මොකක්ද කියලා මට තේරෙන්නේ නැහැ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඔබතුමා තේරුම් ගන්න උත්සාහ ගන්න කාලය මිඩංගු කරන්න එපා. මේ රටේ විවිධ විද්වතුන් මේ පිළිබඳව මේ වන විටත් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් 5ක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් යොමු කර තිබෙනවා. ඒවායේ-

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Niroshan Perera, what is your point of Order?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලාට අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ රටට එන විදේශ ආයෝජන නවත්වන්නයි. මේ රට ශක්තිමත්ව ඉදිරියට යනවාට මෙතුමන්ලා අකැමැතියි. කකුලෙන් අදිමින්, ජනතාවට නොයෙක් අසත්‍ය මත ප්‍රකාශ කරන්නේ ඒ නිසායි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඔබතුමාගේ මතය ඒක නම් එහෙම හිතාගෙන ඔබතුමා දැන් වාඩි වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව, තහවුරු වන්නේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා එම

ගිවිසුම අත්සන් කරන අවස්ථාව වන විට අමාත්‍ය මණ්ඩලය විසින් නියම කර තිබූ පරිදි, ගිවිසුම අවශ්‍ය පරිදි සංශෝධනය කර හෝ අදාළ සංශෝධන සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාසන ලබා ගෙන නොතිබූ බවයි. එබැවින්, මලික් සමරවික්‍රම අමාත්‍යවරයාට එම ගිවිසුම අත්සන් තැබීමට බලයක් නොතිබී ඇති අතර, එම දිනය වන විට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබූ ගිවිසුමක්ද නොතිබුණි. එසේම, එම අමාත්‍යාංශයේ ලේකම්වරිය වන චාන්දනී විජේවර්ධන මහත්මිය විසින්ද එම අමාත්‍යාංශයේ නියමය පරිදි ක්‍රියා කිරීම පැහැර හැර තිබේ. එබැවින්, 2018 ජනවාරි 23වැනි දින මලික් සමරවික්‍රම අමාත්‍යවරයා විසින් අත්සන් තබන ලද ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුමේ වලංගු භාවයක් නොමැත.

එසේ නිබියදී, 2018.04.19වන දින සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් චාන්දනී විජේවර්ධන මහත්මිය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිපියක් යවා එම ඊනියා ගිවිසුම 2018.05.01වන දින සිට බලාත්මක වන බවත්, එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බවත් සඳහන් කර තිබෙනවා. මෙසේ කිරීමට එම ලේකම්වරියට කිසිදු අයිතියක් නැහැ. මොකද, ඒ ලිපිය යැවිය යුත්තේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා මිස මේ ලේකම්වරිය විසින් නොවෙයි. ජනාධිපතිගේ නියමය ක්‍රියාත්මක කළාය කියලා හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග වැරදිකරු කරලා හිරේ දැම්මා. නමුත් කිසිදු බලයක් නැතුව මේ ලේකම්තුමිය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට කියනවා, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය නොලබපු ගිවිසුමක් ක්‍රියාත්මක කරන්න කියලා. එතුමිය ඒ පිළිබඳ වගකීම සම්පූර්ණයෙන් භාරගෙන ඇති කියා අපි විශ්වාස කරනවා. මම මේ උත්තරීතර සභාවේ හැන්සාඩ් වාර්තාවට ඒ කොටස ඇතුළත් කර තබනවා, ජාතියේ හා ජාතික ආර්ථිකයේ යහපත වෙනුවෙන්.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයා හා එතුමාගේ ලේකම්වරිය විසින් දිගින් දිගටම කැබිනට් මණ්ඩලයේ නියමයට පටහැනිව හා නීතියට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ එම අමාත්‍යවරයා ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 (2) අනු ව්‍යවස්ථාව යටතේ සමස්ත කැබිනට් මණ්ඩලය ද උත්තරීතර පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටී. තවද මේ වන විට අත්සන් කර ඇති ලෙස අදාළ අමාත්‍යාංශය විසින් ප්‍රසිද්ධ කර ඇති ඊනියා ගිවිසුමේ රේගු බදු පැනවීම ඇතුළු රාජ්‍ය මූල්‍යයට සෘජු හා වක්‍රව බලපාන කරුණු ද, එසේම ශ්‍රී ලංකාව තුළ ආයෝජනය සිදු කිරීම ආයෝජනයන් හා රජය අතර බෙරුම්කරණය යනාදිය සම්බන්ධයෙන් වන කාරණා බොහොමයක් අන්තර්ගත වේ. මෙකී නීතිමය වලංගුභාවයක් නොමැති ගිවිසුම ක්‍රියාත්මක වුවහොත් එය රාජ්‍ය මූල්‍යයට හා ශ්‍රී ලංකාව තුළ ආයෝජනයන්ට බලපෑමක් ඇති කරවන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව හා 157වන ව්‍යවස්ථාව අනුව ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබානොගෙන එවැනි ගිවිසුමකට අත්සන් කිරීමට හෝ එවැනි ගිවිසුමක් බලාත්මක කිරීමට නොහැකි ය. එබැවින් එම ගිවිසුම අනුව කටයුතු කිරීමට කිසිදු රාජ්‍ය නිලධාරියෙක් නීතියෙන් බැඳී නොසිටී. එහෙයින් 2018 ජනවාරි මස 23වෙනි දින අත්සන් තබා ඇති ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර ඊනියා නිදහස් වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකා රජයට හා ජනතාවට අහිතකර වගන්ති අන්තර්ගතකොට සකසා ඇති බැවින් ද, එම ගිවිසුම බලාත්මක කිරීම පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය හා ජනතා පරමාධිපත්‍ය බලයට ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද පටහැනි වන බැවින් මෙම ඊනියා ගිවිසුම බලාත්මක කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස අපි මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉතාම බරපතළ කරුණක්. අපේ රටේ ඉතිහාසයේ මෙවැනි ජනතා විරෝධ මත ගිවිසුම් රාශියක් අත්සන් කරලා තිබෙනවා. ලක්ෂ ගණන් මිනිසුන්ට වෙඩි තියලා මරද්දී ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කළා. ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමට වන්දි වශයෙන් 60,000කට අධික වටිනා තරුණ ජීවිත ප්‍රමාණයක් රටට අහිමි වුණා. ඒ නිසා කැබිනට් මණ්ඩල සංශෝධන හා කිසිදෙයක් නොසලකා හිතුවක්කාර ලෙස පුද්ගලයන් කීප දෙනෙකුගේ ජාවාරම්කාර වුවමනාවන් වෙනුවෙන් මෙවැනි බරපතළ ගිවිසුමක් අත්සන් කරලා බලාත්මක කරන්න යාම වහා නතර කරවීම සඳහා රටට ආදරය කරන සියලු දෙනාට මැදිහත් වෙන ලෙස අපි ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් ඉල්ලා සිටින්න කැමැතියි.

එදා ඩඩ්ලි සේනානායක මැතිතුමා අග්‍රාමාත්‍යවරයාව සිටියදී, ආර්.ජී. සේනානායක මැතිතුමා වෙළෙඳ අමාත්‍යවරයා ලෙස කටයුතු කරද්දී ලංකාවේ සහල් හිඟයක් ඇතිවෙලා තිබුණා. රබර් අළෙවි කර ගැනීමට නොහැකි තත්ත්වයක් තුළ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිමය විරෝධතා යටතේ ඉතා පුළුල් විවාදයක් වීන - ලංකා රබර් සහල් ගිවිසුම සම්බන්ධයෙන් ඇති වුණා. එහිදී එදා විපක්ෂයේ හිටපු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, ඒ වාගේම ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා, පීටර් කේනමන් මැතිතුමා, පිලිප් ගුණවර්ධන මැතිතුමා වැනි නායකයන් ඉතාමත් දීර්ඝ ලෙස මේ ගරු සභාවේ සාකච්ඡා කරලා, විරුද්ධ පක්ෂයේ එක් අයෙකුගේ විරෝධය මැද තමයි එදා වීන - ලංකා රබර් සහල් ගිවිසුම අත්සන් කළේ. ඒ ගිවිසුම අත්සන් කළේ අවුරුදු 5කටයි. සිංගප්පූරු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමේ එවැනි කාලයක් නැහැ. අපි තමුන්නාන්සේලා මැරිලා යනවා. මෙතැන විකාර කතා කර කර ඉඳලා අපායේ හෝ කොහේ හෝ ලෝකයකට යයි. ඒ ගියාට පස්සේ අවුරුදු තුන්දහසකදී හෝ, පන්දහසකදී හෝ,අවුරුදු දහදාහකදී හෝ මේ ගිවිසුම අවලංගු කරන්න බැහැ.

වීන - ලංකා රබර්-සහල් ගිවිසුම රාජ්‍යයන් දෙකටම වාසිදායක නිසා ආණ්ඩු වෙනස් වුණත් වෙනස් වෙන්නේ නැති විධියට අවුරුදු පහෙන් පහට -

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේදී මේ කාරණය පැහැදිලි කළා. අගමැතිතුමාත් පැහැදිලි කළා, වසරක් පාසා මේ ගිවිසුම සමාලෝචනය කරන්න පුළුවන් කියලා. මම දන්නේ නැහැ, මෙතුමා කොහෙන් මේ කරුණු හොයාගෙන එනවාද කියලා. එතුමා 'දෙදහස් පන්සීයේ කථාව' හදා ගෙන ආපු තැන්වලින්ම තමයි මේකත් හදාගෙන ඇවිත් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මේක මගේ කථා කිරීමේ අයිතිය නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මට පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේ අයිතිය තිබෙනවා.

එදා ඒ රබර්- සහල් ගිවිසුම අවුරුදු තිහක් තිබුණා, රාජ්‍යයන් දෙකටම වාසිදායක වන නිසා. නමුත් පිටු එක්දහස් ගණනක් තිබෙන මේ ගිවිසුමේ සමහර වගන්ති ඇතුළත් කරන්නේ 'CPC' කියලා. 87201CPC, 202, 203 යන ආදී වශයෙන් වගන්ති ඇතුළත් කර තිබෙනවා. එතකොට, ඒ CPC කියන්නේ මොනවාද? 1991 නිව්යෝර්ක් Central Product Classification කියන එක අනුව ජාත්‍යන්තර භාණ්ඩ වර්ගීකරණයට යන්න ඕනෑ.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ඒ වර්ගීකරණයට ගියාම තමයි මේ ගැන දැන ගන්න පුළුවන් වෙන්නේ. නමුත් මේ ගිවිසුම ඇතුළේ ඒවා නැහැ. මේ ගිවිසුමේ තිබෙන සේවා මොනවාද? ගොඩනැඟිලි ක්ෂේත්‍රයට අවශ්‍ය කම්කරුවන්, යන්ත්‍ර ක්‍රියාකරුවන් වාගේම, පරිගණක ක්‍රියාකරුවන්, හෙදියන්, රියැදුරන්, ගෘහ සේවකයන්, නිවාස බලා ගන්නා අය, අවශ්‍ය නම් සහකාරියකුත් manpower company එකක් හරහා ගෙනෙන්න පුළුවන්. නමුත් ඒවා තියෙන කෝඩ් එක මේ ගිවිසුමෙන් සොයා ගන්න බැහැ. ඒක සොයා ගන්න වෙන කෝඩ් එකකට යන්න ඕනෑ. වෙන කෝඩ් එකකට ගියාම තමයි අහුවෙන්නේ එතැන මොනවාද තියෙන්නේ කියලා. ඒ විධියට කොළේ හංගලා ගහලා තමයි සෙල්ලම් කරලා තිබෙන්නේ. මේ ගිවිසුම හරහා මේ රටේ කම්කරුවන්ගේ සිට වෘත්තියවේදීන් දක්වා සියලු සේවාවලට ලංකාවේ වෙළඳපොළ විවෘත කරනවා. මේක මහා පාවදීමක් වෙන්නේ අපේ රටේ ලක්ෂ ගණන් රක්ෂා නැති මිනිස්සු සිටියදී සිංගප්පූරුව හරහා පාකිස්ථානයෙන්, බංග්ලාදේශයෙන්, ඉන්දියාවෙන් සේවකයන් ගෙන්වා ගන්න පුළුවන් නිසායි. මේ ගිවිසුම රජයක් විසින් අවලංගු කරන්න තීරණය කළත්, ඒ සමාගමක් අවුරුදු දහයක් යනතුරු ලංකාවේ අවලංගු කරන්න බැහැ. ඒ විතරක් නොවෙයි. මේ ගිවිසුමේ හංගලා තිබෙනවා-

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට කියන්නට පුළුවන්ද, ඉන්දියාවේ, පාකිස්ථානයේ අය සිංගප්පූරුව හරහා අපේ රටට ඇවිත් හොරෙන් වැඩ කරන්න අනුමැතිය ගන්නේ කොහොමද කියලා. ඒක කියන්න කෝ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මම කියන්නම්. අහගෙන ඉන්න. GATS- General Agreement on Trade in Services එකේ තිබෙනවා modes හතරක්. ඒ හතරෙන් තුන්වන එකට අනුව තමයි සිංගප්පූරුවේ ලියාපදිංචි එවැනි සමාගමකට ලංකාවට ඇවිත් වැඩ කරන්න පුළුවන් කියන කරුණ තිබෙන්නේ. ඔබතුමා පිළිගන්න ඕනෑ, ලංකාවේ ඉන්න පුද්ගලයෝත් සිංගප්පූරුවේ සමාගම් ලියාපදිංචි කර තිබෙන බව. අර්ජුන් මහේන්ද්‍රන් ලංකාවට ඇවිල්ලා මොකද කළේ කියලා තමුන්නාන්සේ දන්නවානේ. එයාත් සිංගප්පූරු පුරවැසියා. අන්න ඒ ක්‍රමයට තමයි එන්නේ. අහගන්න. අපේ රටට ඇවිල්ලා සල්ලි කොළයට අත්සන් කරන්න අර්ජුන් මහේන්ද්‍රන්ට තමුන්නාන්සේලා භාර දුන්නා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමාගෙන් ඉතාම සරල ප්‍රශ්නයක් ඇහුවාම, එතුමා අර්ජුන් මහේන්ද්‍රන් දිහාවට ගියා. මම දන්නේ නැහැ එතුමා මොනවාද කියන්නේ කියලා. මගේ ප්‍රශ්නයට උත්තර දෙන්න එතුමාට බැරිව ගියා. ගරු ඇමතිතුමා පැහැදිලිවම කිව්වා, කොහොමද ඒ තත්ත්වය ඇති නොවෙන්නේ කියන එක. ඔබතුමා ඒ අවස්ථාවේ මෙතැන හිටියේ නැහැ නේ. ඒ නිසා කරන්න දෙයක් නැහැ. ඔබතුමා ඉතාම සරලව උත්තර දෙන්නකෝ මම අහන ප්‍රශ්නයට.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ පුද්ගලයෝත් සිංගප්පූරුවේ සමාගම් ලියාපදිංචි කර තිබෙනවා; නේපාලයේ අයත් ලියාපදිංචි කර තිබෙනවා. බුරුමයේ ඒ කටයුතු සම්පූර්ණයෙන් වහලා තිබෙන අවස්ථාවේදී, බුරුමයට Central Bank එකක් නැතිව තිබෙන අවස්ථාවේදී ඒ සියලු ගනුදෙනු කළේ සිංගප්පූරුව හරහා. සිංගප්පූරුවේ ඕනෑම සමාගමකට මේ ගිවිසුම හරහා ලංකාවට එන්න පුළුවන්. ලංකාවේ සමාගම්-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ඒ ගැන විග්‍රහයක් කරන්නද? Mode 1, Mode 2, Mode 3 and Mode 4 තිබෙනවා නේ. Mode 3 යටතේ සමාගමක් ලියාපදිංචි කර යම් කිසි පිරිසක් ගෙනෙන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා. දැනුත් ඒක කරන්න පුළුවන්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ. හැබැයි, සිංගප්පූරුවෙන් ඒ අය ගෙනෙනවා නම්, ඒ අය සිංගප්පූරුවේ පුරවැසියෝ හෝ residentsලා වෙන්න ඕනෑ. ඉන්දියාවේ ඉන්න, පාකිස්ථානයේ ඉන්න අය සිංගප්පූරුවට ගිහින්, සිංගප්පූරුවේ පුරවැසියෝ වෙලා, ආයෙත් ලංකාවට එන්නේ නැහැ.

සිංගප්පූරුවේ පුරවැසියෝ වුණාම, සිංගප්පූරුවේ වැඩ කරනවා. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මෙහි වෙනස තිබෙන්නේ එතැනයි. මේක ඔබතුමාත්, මාත් හොඳට දන්නා දෙයක්.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඔබතුමා පොඩ්ඩක් ඉන්න කෝ. (ආචාර්ය) හර්ෂ ද සිල්වා, මගේ උගත් මිත්‍රයා, ඒක වෙන්නේ මෙහෙමයි. සිංගප්පූරුවේ තිබෙන සමාගමක නියෝජිතයන්ට සිංගප්පූරුවේ නියෝජිත ආයතනයක් ලෙසත් මේ රටට එන්න පුළුවන්. HSBC බැංකුව ලංකාවට එන ක්‍රමය තිබෙන්නේ Mode 3 යටතේ නේ. ඒ විධියට ඒ සමාගම් අපේ රටට එනවා. ඒ විධියට ආවාම මොකද වෙන්නේ කියලා මෙහි එක තැනක තිබෙනවා. ඒකයි මම ඔබතුමාට කියන්නේ ගැඹුරට ගිහිල්ලා මේ ගැන බලන්න කියලා. ඒ විධියට ඇවිල්ලා ඔවුන්ට ලංකාව ඇතුළේ manpower company එකක් පටන් ගන්න පුළුවන්. වෙනත් අයගේ අවශ්‍යතා සඳහා එහෙම manpower company එකක් පටන් ගත්තාම, ඒකට nursesලා ඕනෑද, රියදුරන් ඕනෑද, කම්කරුවන් ඕනෑද, machine operatorsලා ඕනෑද, computer operatorsලා ඕනෑද, වඩු බාස් උන්නැහේලා ඕනෑද, electriciansලා ඕනෑද යනාදී වශයෙන් ඕනෑම කෙනෙකු ඒ සමාගමට අරගෙන තුන්වෙනි පාර්ශ්වයක් එක්ක ගිවිසුමකට එන්න පුළුවන්. ඒකට බලන්න ඕනෑ Mode 3 නොවෙයි. ඒකට බලන්න ඕනෑ, CPCවල 8701, 8702, 8703 කියන ටික. ඒක ඔබතුමා බලන්න. ඒ ටික තිබෙන්නේ Mode 3වලින් පස්සේයි. ඒ ටික තිබෙන්නේ Central Product Classification එක යටතේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කැමති නම් මෙතුමාට වෙලාව දෙන්න පුළුවන්.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
බැහැ, මගේ වෙලාව එතුමාට දෙන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය තිබෙන නිසා, ඔබතුමාට පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් එතුමාට වෙලාව දෙන්න පුළුවන්.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මට පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නැහැ. මේ සම්බන්ධයෙන් එතුමන්ලා පැහැදිලි කරන්න ඕනෑ. නමුත්, ඒ මගේ වෙලාවේදී නොවෙයි. සම්පූර්ණ දිනයක විවාදයක් පවත්වා විපක්ෂය වෙනුවෙන් අපි ඉදිරිපත් කරන කරුණුවලට රජය වශයෙන් එතුමන්ලා උත්තර බඳින්න ඕනෑ. ඒ, අපට නොවෙයි. රටට; මේ රටේ ජනතාවට.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා කරුණු පැහැදිලි කරයි. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා රට නොමඟ යවනවා. ඒ නිසා මේ කරුණු පැහැදිලි කරන්න එතුමාට අවස්ථාවක් දෙන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒක point of Order එකක් නොවෙයි. අපි මේ රට නොමඟ යවනවා නොවෙයි. මේ රටේ වෛද්‍යවරු සම්පූර්ණ දවසක වර්ජනයක් කළා. ඒ මොකද? මේ ආණ්ඩුවට කියන එක තේරෙන්නේ නැති නිසා; කියන එක අහන්නේ නැති නිසා; හිතුවක්කාරකමේ සීමාවේ ඉමක් කොනක් නැති නිසා. කැබිනට් ඇමතිවරු කිව්වා, සිංගප්පූරු ජාතිකයකු වන අර්ජුන් මහේන්ද්‍රන් ගෙනැල්ලා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට පත් කරන්න එපා කියලා. එහෙම කිව්වාද, නැද්ද? රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා, එතුමා එහෙම කිව්වා කියලා. ඒ, කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා. චම්පික රණවක ඇමතිතුමාත් කිව්වා, එතුමාත් එපා කිව්වා කියලා. අග්‍රාමාත්‍යතුමා කිව්වා, "මම වගකීම භාර ගන්නවා" කියලා. සිංගප්පූරු පුරවැසියකු ගෙනැල්ලා රටේ සමස්ත මුදල් ක්‍රමය, බැංකු ක්‍රමය, ණය ක්‍රමය භාර දීලා, මුදල් නෝට්ටුවට අත්සන් කරන්නත් ඉඩ දීලා කිව්වේ "අපි සියල්ල බලාගන්නම් මහා ප්‍රාතිහාර්යයක් වෙනවා" කියලායි. හිටපු මහ බැංකු අධිපති මහ දවල් මහ බැංකුව කොල්ල කාලා දැන් සිංගප්පූරුවට ගිහිල්ලා ඉන්නවා. සිංගප්පූරු පුරවැසියකු අත්සන් කරලා තිබෙන මේ මුදල් නෝට්ටු ලංකාවේ ජනතාව භාවිත කරන්නේ කොහොමද? රටින් පැනලා ගිය, ආපහු මෙරටට එන්නේ නැති මනුස්සයෙක් අත්සන් කරපු මුදල් නෝට්ටුවක් අරගෙන කඩේ යන මිනිස්සු ඉන්න ලෝකයේ එකම රට බවට ලංකාව පරිවර්තනය කළේ තමුන්නාන්සේලා නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අපේ මුදල් නෝට්ටුවලට අත්සන් කරලා තිබෙන්නේ මේ වාගේ වැඩ කරපු මහත්වරු. බෝම්බ ගහලාවත් කොටින්ට බිමට සමතලා කරන්න බැරි වුණු මහ බැංකුව සමතලා කළේ තමුන්නාන්සේලායි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනාධිපති වන්න ඇමෙරිකානු පුරවැසියෙකු එනවා. මෙතුමා ඒක දන්නේත් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන්නේ මා කියන එක එක කරුණට උත්තර හොයා ගෙන, චාන්දනී විජේවර්ධන නෝනා මහත්මියගෙනුත් කරුණු අරගෙන ඇවිල්ලා මෙතැන කියන්නයි. කැබිනට් මණ්ඩලයේ වූ සාකච්ඡා ගැන කියන්න දයාසිරි ජයසේකර හිටපු කැබිනට් ඇමතිතුමාත් එනවා. ඒ ටිකත් එක්ක තව දවස් දෙකකින් පමණ සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ගැන විවාදයක් කරමු. අධිකරණයේ තීන්දුව එන තෙක් අපි ඉඳිමු. ඒකට ලෑස්තිද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, එදා ඔබතුමා අර රුපියල් අර 2,500 ගණනය කළේ කොහොමද කියලා කිව්වොත් මම ඒ විවාදයට එනවා. එතකොට, ඒ විවාදයට මම එකඟ වනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ රුපියල් 2,500 කථාව සිංගප්පූරු ගිවිසුමට අදාළ නම්, මම ඔබතුමාගේ යෝජනාවට එකඟ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මේ ගරු සභාවේ නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමාගේ පියා වාගේ මිනිසුන් හිටියා නම් මොන තරම් හොඳද කියලා මට හිතෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න. ඔබතුමා වැඩිපුර විනාඩි තුනකුත් ගත්තා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
දැන් රුපියල් 2,500න් තමයි ගම්වල මිනිස්සු කන්නේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒක ගැනත් දවසක විවාදයක් තියන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න. අනික් කථිකයාගේ නම නොකියායි මම ඔබතුමාට කථාව අවසන් කරන්න කියන්නේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක විහිළු කරන අවස්ථාවක් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ඒක තමයි. ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1815 කන්ද උඩරට ගිවිසුමෙන් අපේ රට විදේශිකයන්ට යටත් වුණා. 1915දී ඩී.එස්. සේනානායක මැතිතුමා, එෆ්.ආර්. සේනානායක මැතිතුමා, ධර්මපාලතුමා ඇතුළු ජාතික විරයන් සිරගත කළා. ඊට අවුරුදු 100කට පස්සේ 2015දී නැවත වතාවක් මේ රට එක රටකට නොවෙයි ලෝකයේ සියලු රටවලටම පාවාදීලා මේ රට පරාදීන ආර්ථිකයක් තිබෙන රටක් බවට පත් කරලා තිබෙනවා. රට පාවා දෙන මේ සිංගප්පූරු ගිවිසුම අහෝසි කිරීම සඳහා ජාතියේ නාමයෙන් මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින්, ඒ සඳහා ප්‍රබුද්ධ විවාදයකට ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා වැනි අයට ආරාධනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා. 4.15]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඉස්කෝලේ යන කාලයේ උසස් පෙළට ආර්ථික විද්‍යාව ඉගෙන ගත්තේ අපේ හිතවත් ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන්. හැබැයි, එතුමා දැන් මේ කියන කථා ඇහුවාම පොඩි සැකයකුත් මතු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා අද කරපු කථාවේ දී මේ ගිවිසුමේ තිබෙන හුහාක් දේවල් ගැන කිව්වා. ඒවා සම්බන්ධයෙන් මීට කලින් කථා කරපු අපේ මන්ත්‍රීවරුත්, ඇමතිවරුත් උත්තර දීලා තිබෙනවා.

විශේෂයෙන්ම අපේ බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා මෙතැනදී පෙන්වන්න උත්සාහ දැරුවේ, අපේ රජය මේ ගිවිසුම්වලට යනකොට රටක් හැටියට අපට වෙන අවාසි හා ඒ අවාසි තුළ අපි මේ රටේ ජනතාව නොමඟ යවනවා කියන කාරණයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඇති වෙලා තිබෙන ගෝලීය ධනවාදය ඇතුළේ, ලිබරල් ආර්ථිකය ඇතුළේ ඕනෑම රටකට එක එක රටවල් එක්ක ගිවිසුම් හරහා තමයි ඉස්සරහට යන්න වෙන්නේ. කිසිම රටකට බැහැ, තමන්ගේ ආර්ථිකය කියලා සංවෘත ආර්ථිකයක් හදාගෙන ඉස්සරහට යන්න. එහෙම ගමනක් ගිය ලෝකයේ කිසිම රටක් නැහැ. ලෝකයේ එහෙම උත්සාහයන් දරපු රටවල් අන්තිමට විනාශය කරා ගමන් කරපු ආකාරය අපි දැක තිබෙනවා. සමහර රටවල් සංවෘත ආර්ථිකයක් හරහා ඉස්සරයට යන්න උත්සාහ කළා. ඉතිහාසය දෙස බැලුවාම එහෙම ඉස්සරහට ගිහිල්ලා ආර්ථිකය ජයග්‍රහණය කරපු රටක් අපට පෙනෙන්නේ නැහැ.

අද ලෝකයේ කඳවුරු දිහා බැලුවාම, සමාජවාදී ආර්ථිකයක් ගැන කථා කරන එවැනි කඳවුරු අද ලෝකයේ නැහැ. විශේෂයෙන්ම සෝවියට් රුසියාව ගත්තත්, චීනය ගත්තත් එහෙමයි. විශේෂයෙන්ම අපට වඩා විවෘත ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක කරන රටක් හැටියට අද චීනය පත් වෙලා තිබෙන බව අපට පෙනෙනවා. අපි චීනය දිහා බැලුවාම, අද ලෝකයේ තිබෙන අනෙකුත් රටවල්වලට වැඩිය තමන්ගේ රටට ආයෝජකයන් ගෙන්වා ගන්නේ කොහොමද, තමන්ගේ රටවල්වල ආයෝජකයන් දිරිගන්වන්නේ කොහොමද කියන කාරණා පෙරදැරි කරගෙන, විශේෂයෙන්ම තනි පක්ෂ පාලන ක්‍රමයක් යටතේ විශාල වශයෙන් ලෝකයට ආර්ථිකය විවෘත කරපු රටක් හැටියට අපි චීනය දකිනවා. ඒ වාගේම අපි සමාජවාදී කඳවුර ගැන කථා කළොත්, ඒ සමාජවාදී කඳවුර අද කඩා වැටිලා ඒවාට ඉස්සරහට යන්න විධියක් නැතිව ඒවා ලෝකය තුළ පාවෙන ආකාරය අද අපි දකිනවා. සරුංගලයක් යවලා ඒ සරුංගලයේ නූල කැඩුණාම ඒක පාවෙන ගතියක් තමයි අද සමාජවාදී රටවල්වල තිබෙන ආර්ථික තත්ත්වය අපට පෙනෙන්නේ. ඒක එහාටත් නැහැ, මෙහාටත් නැහැ. එකම තැන පල්වෙන ගතියක් අපි දකිනවා. එහෙම තත්ත්වයක් තිබියදී, ලෝකයේ ධනවාදී ක්‍රමය තුළ, මේ ගෝලීයකරණය උඩ අද අපි වගේ රටවලට ඉස්සරහට යන්න පුළුවන් කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. බන්දුල ගුණවර්ධන මැතිතුමන්ලා ආණ්ඩු කරන කාලයේත් මේ වාගේ

ගිවිසුම් තිබුණා. මා දන්නා විධියට නම්, විශේෂයෙන්ම ෂැංග්‍රි-ලා එක එක්ක අත්සන් කරපු ගිවිසුම කැබිනට් එකට ඉදිරිපත් කළේ නැහැ. මම ඒක ගැන සොයා බලද්දී, පසුගිය ආණ්ඩුවේ හිටපු ඇමතිවරුන්ගෙන් දැන ගන්නට ලැබුණේ, ෂැංග්‍රි-ලා එකේ ගිවිසුම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නේ නැතිව තමයි රාජපක්ෂ ආණ්ඩුව එදා එම ගිවිසුම අත්සන් කළේ කියන එකයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මම ගරු මන්ත්‍රීතුමාට ඒ කරුණ ගැන පමණක් කියන්න කැමැතියි. ඒක එක සමාගමක් එක්ක අත්සන් කරපු ගිවිසුමක්. මේ සිංගප්පූරු - ශ්‍රී ලංකා ගිවිසුම රාජ්‍යයන් දෙකක් අතර, එනම් රටවල් දෙකක් අතර අත්සන් කරපු ගිවිසුමක්. ෂැංග්‍රි-ලා එකත් එක්ක අත්සන් කරපු ගිවිසුම තනි ආයතනයක් එක්ක අත්සන් කරපු ගිවිසුමක්. ඒක කැබිනට් මණ්ඩලයට එන්න ඕනෑ නැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

කෙසේ වෙතත්, ඔබතුමා මෙතැනදී හුඟාක් දුරට කථා කළේ මේ ගිවිසුම කැබිනට් මණ්ඩලය නොදැනුවත්ව කරපු දෙයක් හැටියටයි.

මම එතැනදී මතු කිරීමට උත්සාහ කළේ, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේත් යම් යම් ගිවිසුම් අත්සන් කරනකොට කැබිනට් මණ්ඩලය නොදැනුවත්ව අත්සන් කළා කියන එකයි. මේ ගිවිසුම 2017.12.20 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබෙන බව මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඒ වාගේම 2018.01.02 හා 2018.01.09 යන දිනවල පැවැති අමාත්‍ය මණ්ඩල සාකච්ඡාවලදී සාකච්ඡාවට බඳුන් කළ අතර, නීතිපතිවරයාගේ නිරීක්ෂණය ලබා ගැනීමෙන් පසු ගිවිසුමේ අවසන් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර 2018.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයා ශ්‍රී ලංකා-සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබාගෙන තිබෙනවා. ඒ අනුව ඔබතුමා ඉදිරිපත් කළ කාරණා ඉතාම පරස්පර විරෝධී බව අපට පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ සිදු වන සංවර්ධනය දිහා බැලුවාම අපි ලෝකයත් සමඟ ගමන් කරන යුගයකයි ඉන්නේ. විශේෂයෙන්ම අපේ රට අවට තිබෙන සිංගප්පූරුව වෙන්න පුළුවන්; පාකිස්ථානය වෙන්න පුළුවන්; ඉන්දියාව වෙන්න පුළුවන්, ඒ රටවල් එකක්වත් අමතක කරලා අපට එහෙම ගමනක් යන්න බැහැ. අපි ඉන්දියාවට යාබඳව පිහිටා තිබෙන රටක්. ඉන්දියාව කියන්නේ විශාල වෙළෙඳ පොළක් තිබෙන රටක්. එවැනි විශාල වෙළෙඳ පොළක් තිබෙන රටක් එක්ක අපට ගනුදෙනු කරන්න බැරි නම්, ඒ රටත් එක්ක අපට එකට වැඩ කරන්න බැරි නම්, අපිත් එක්ක වැඩ කරන්න ඇමෙරිකාව හෝ යුරෝපා රටවල් හෝ ඉදිරියට එයි කියලා මම හිතන්නේ නැහැ. මොකද, ඒ හැම රටක්ම අපට වඩා කිට්ටුවෙන් ඉන්දියාව එක්ක වැඩ කරනවා. ඒ කවුරුවත් ඉන්දියාව තරහා කරගෙන අපිත් එක්ක වැඩ කරන්න එන්නේ නැහැ. එම නිසා අපි මේ ලෝකයේ යථාර්ථය තේරුම් අරගෙන ඉදිරියට යන්න ඕනෑ. ඉන්දියාව කියන්නේ අපට යාබදව පිහිටි, විශාල වෙළෙඳ පොළක් තිබෙන, මිලියන ගණනක ජනතාවක් ජීවත් වෙන, මේ මහද්වීපයේ තිබෙන ලොකුම රට. ලොකුම වෙළෙඳ පොළ. ඒ වෙළෙඳ පොළ අපි දිනා ගන්නේ කොහොමද කියන එක, රටක් හැටියට අපේ ආර්ථිකයත් එක්ක සම්බන්ධ කර ගන්නේ කොහොමද කියන එක අපට තිබෙන ලොකු අභියෝගයක්. ඉන්දියාව අතහැරලා අපේ රටේ ආර්ථිකය ගැන කථා කරන්න අපට පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. අපේ රටට යාබදව තිබෙන සිංගප්පූරුව, පාකිස්ථානය, බංග්ලාදේශය වැනි රටවල ආර්ථිකයන් සමඟ ඒකාබද්ධ වෙන්නේ නැතිව, ඒ රටවල් සමඟ එකට වැඩ කරන්නේ නැතිව ලංකාවේ ආර්ථිකය දියුණු කරන්න පුළුවන් කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ.

ඉන්දියාව කියලා කියන්නේ අපට යාබද රට. අපි යුරෝපා රටකට ගියාම ඒ ගොල්ලන් කියන්නේ අපි ඉන්දියන්කාරයෝ කියලායි. අපට කවුරුවත් ශ්‍රී ලාංකිකයෝ කියලා කියන්නේ නැහැ. අපිව දැක්ක ගමන් ඔවුන්ට සිහි වෙන්නේ ඉන්දියන්කාරයන්. මොකද, ඉන්දියාව එක්ක අපේ එහෙම සම්බන්ධකමක් තිබෙනවා. ඒ නිසා ඉන්දියාව අත හැරලා අපට ඉදිරියට යන්න පුළුවන්ද කියන එක ප්‍රශ්නයක්. ඉටිකා ගිවිසුම වෙන්න පුළුවන්; වෙනත් ගිවිසුමක් වෙන්න පුළුවන්, එම ගිවිසුම් කඩාකප්පල් කරලා අපට ඉදිරියට යන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිවිසුමක් අත්සන් කරනකොට ඒ ගිවිසුම්වල වාසි සහ අවාසි තිබෙනවා කියලා අපි දන්නවා. අපට අවශ්‍ය විධියට කවුරුවත් ගිවිසුම් අත්සන් කරන්න එන්නේ නැහැ. තමන්ට උපරිම වාසිය ගන්න පුළුවන් විධියට තමයි ඕනෑම රටක් ගිවිසුමකට එන්නේ. මම කවුරු හෝ සමඟ ගිවිසුමකට යනවා නම්, මගේ පෞද්ගලික වාසිය කොයි තරම් ප්‍රමාණයකට ලැබෙනවාද කියන තීන්දුව මත තමයි මම ගිවිසුමකට යන්නේ. එම නිසා ලංකාවට වාසි වෙන විධියට, ලංකාවට ගෙඩි පිටින් ලැබෙන විධියට, ලංකාව කියන ආකාරයට ඔක්කොම දේවල් කරන්න කිසිම රටක් ගිවිසුම් අත්සන් කරන්න එන්නේ නැහැ. එහෙම එන්නේ නැහැ. මොන ආණ්ඩුව තිබුණත් එන්නේ නැහැ. ඒ නිසා ගිවිසුමක් අත්සන් කරනකොට අපට යම් යම් වාසි තිබෙන්න පුළුවන්; යම් යම් අවාසි තිබෙන්නත් පුළුවන්. නමුත් අපට ලෝක ආර්ථිකයත් සමඟ ඉදිරියට යන්න අවශ්‍ය නම්, ගෝලීයකරණයත් සමඟ ඉදිරියට යන්න අවශ්‍ය නම්, අනිවාර්යෙන්ම ගිවිසුම් හරහා රටවල් සමඟ ආර්ථික සම්බන්ධකම් ඇති කර ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලය දිහා බැලුවාම 2013 වර්ෂයේ සෘජු විදේශ ආයෝජන හැටියට ඩොලර් මිලියන 1391ක් සහ 2014 වර්ෂයේ ඩොලර් මිලියන1616ක් ලැබී තිබෙන බව අපට පෙනෙනවා. 2015 වර්ෂයේ සෘජු විදේශ ආයෝජන ඩොලර් මිලියන 970ක් දක්වා අඩු වෙලා තිබෙනවා. 2016 වර්ෂයේ එය ඩොලර් මිලියන 801ක් බවට පත් වෙලා තිබෙනවා. 2017 වර්ෂයේදී ඩොලර් මිලියන 1710ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. 2018 වර්ෂයේ මෙම පළමුවැනි කාර්තුව සඳහා ඩොලර් මිලියන 493ක විදේශ ආයෝජන මෙරටට එන්න පුළුවන් කියන එක අද අපට පෙනෙන්නට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතන මේ රටට ආධාර දෙන්න පටන්ගෙන තිබෙනවා. මේ රටේ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ආර්ථිකය ගැන, මේ ආණ්ඩුව ගැන යම් විශ්වාසයක්, යම් තහවුරුවීමක් උඩ අපිට GSP Plus සහනය නැවත ලබාගන්න පුළුවන් වුණා. ඒ වාගේම අපිට පනවපු යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගන්න පුළුවන් වුණා. අපට GSP Plus සහනය නැවත ලැබීම තුළ ඉදිරි කාලයේදී අපේ අපනයන විශාල ලෙස ඉහළ යනවා. ඒ වාගේම මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීම තුළ අපිට ඒ අංශයේ අපනයන වැඩි කර ගැනීමටත් පුළුවන් වෙනවා.

අලුත් බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීම තුළ, මේ රටේ දිළිඳු ජනතාව මත සියයට 80ක බරක් තබා තිබුණු බදු ආදායම් ප්‍රතිපත්තිය වෙනස් කරලා එය සියයට 60ක් දක්වා පහළට ගෙන ඒමට අපිට හැකි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ හැම කාරණයක් ගැනම කථා කරලා ඒ දේවල් විසඳන්න හදන්නේ මේ රටේ දියුණුව සහ ආර්ථික සංවර්ධනය වෙනුවෙනුයි. නමුත් අපි එක කාරණයක් මතක තබා ගන්න ඕනෑ. මේ හැම දෙයකටම මූලික වෙලා තිබෙන්නේ අද තිබෙන දේශපාලන ප්‍රශ්නයයි. මොකක්ද අද තිබෙන දේශපාලන ප්‍රශ්නය? අපිට විසඳා ගන්න බැරි, තවමත් අපි මඟ හරිමින් සිටින අපේ රටේ ජාතික ප්‍රශ්නය මෙතැනදි වැදගත් සාධකයක් බවට, රටේ ආර්ථික දියුණුවට බලපාන ප්‍රධාන කාරණයක් බවට අද පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි පසුගිය කාලයේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන කථා කළා; මේ රටේ අලුත් දේවල් ආරම්භ කිරීම ගැන කථා කළා; ජාතික සමගිය ගැන කථා කළා; ජාතීන්ගේ එකමුතුව ගැන කථා කළා. ඒ දේවල් කරන්නේ නැතිව, මේ රටේ ආර්ථික සංවර්ධනය ඇති කරන්න, අපි මේ සභාවේ කථා කරන දේවල් ක්‍රියාත්මක කරන්න අපිට කවදාවත් පුළුවන් වෙයි කියා මම නම් විශ්වාස කරන්නේ නැහැ.

ලෝක ඉතිහාසය දිහා බැලුවාම මේ ගැන අපිට හුඟාක් උදාහරණ පෙනෙන්න තිබෙනවා. විශේෂයෙන්ම මේ ආර්ථික සහ සමාජීය ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන්න නම් සියලු ජන කොටස්වලට සමානව සලකන ප්‍රතිපත්තියක් අපි හඳුන්වා දෙන්න ඕනෑ. සියලු ජන කොටස් එකට ඉන්න, සියලු ජන කොටස්වලට බලය බෙදා හරින, සියලු ජන කොටස්වලට සමානව සලකන සාධාරණ සමාජ ප්‍රතිපත්තියක් උඩ තමයි මේ රටේ සංවර්ධනය සහ ඉදිරි ගමන තීරණය වෙන්නේ. බලන්න, මැලේසියාව කියන්නේ ඉතාම දරුණු ප්‍රශ්න තිබුණු රටක්; ජාතිවාදී කෝලාහල තිබුණු රටක්; ඉන්දියානු දෙමළ සම්භවය, චීන මැලේසියානු සම්භවය වැනි ජනවාර්ගික ප්‍රශ්න වාගේම තවත් විශාල ගැටලු තිබුණු රටක්. නමුත් මහතිර් මොහොමඩ් මැතිතුමා යුක්ති සහගත ලෙස, සාධාරණ ලෙස සියලුදෙනාටම සමානව සලකන අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩ නඟලා ඒ ප්‍රශ්නය විසඳූ නිසා අද මැලේසියාව මේ කලාපයේ තිබෙන දියුණුම රටක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි දකුණු අප්‍රිකාව ගැන බලමු. දකුණු අප්‍රිකාව කියන්නේ එදා සුදු ආණ්ඩුවක්; සුදු ජාතික බලයක් තිබුණු රටක්. එදා ඒ සුදු ජාතික ආණ්ඩුව විසින් ඒ රටේ කල්ලෝ පාලනය කළා. නෙල්සන් මැන්ඩෙලා කළ නිදහස් අරගළය - විප්ලවය- තුළින් දකුණු අප්‍රිකාවේ සුදු-කළු භේදය අමතක කරවලා, ඒ භේදය වෙනස් කරලා, ඒ භේදය නවත්වලා අලුතින් හිතන්න පුළුවන් රටක් ගොඩ නැඟූ නිසා ලෝකයේ වේගයෙන් දියුණු වන රටක් බවට අද දකුණු අප්‍රිකාව පත් වෙලා තිබෙනවා. අපි දකුණු අප්‍රිකාවේ තිබුණු තත්ත්වය ගැන දන්නවා. ඉතාම ගෝත්‍රිකවාදී, මිලේච්ඡ රටක් හැටියට තමයි ඒ රට තිබුණේ. නමුත් අද ඒ රටේ සිටින සුදු ජාතිකයන් සහ කළු ජාතිකයන් එකතුවෙලා තමන්ගේ රට ගොඩ නඟන, සංවර්ධනය කරන තත්ත්වයට පත්කර තිබෙනවා. ඒක කොහොමද වුණේ? ලෝකයේ තිබෙන හොඳම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දකුණු අප්‍රිකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි කියා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නෙල්සන් මැන්ඩෙලා මැතිතුමා බලයට ඒමත් සමඟ, ඇති කළ පරිවර්තනය තුළ ඒ රටේ සියලුදෙනාටම සමාන ලෙස සලකන, යුක්ති සහගත ලෙස සලකන අලුත් පාලන තන්ත්‍රයත් එක්ක මුළු රටේම ආර්ථික තත්ත්වය වෙනස් කරන්න පුළුවන් විධියේ පරිවර්තනයක් දකුණු අප්‍රිකාව තුළ ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙච්චර ආර්ථික වර්ධනයක් ඇති කරනවා; අපි මෙච්චර දේවල් ගේනවා; මෙච්චර ආයෝජන ගේනවා; 2025 වන විට මේ රට මේ තරම් දුරකට යනවාය කියා කෙස් පැලෙන තර්ක අපි මෙතැනදී කොයි තරම් ඉදිරිපත් කළත්, ඒ වෙනස අපේ රට තුළ ඇති කරන්න හැකි වෙයි කියා මම නම් විශ්වාස කරන්නේ නැහැ. මොකද, මූලික පදනමට, මූලික ලෙඩේට බෙහෙත් කළේ නැත්නම්, මූලික අවශ්‍යතාවට විසඳුම් දෙන්නේ නැත්නම් කොටස් කොටස් විතරක් අරගෙන මේ රට සංවර්ධනය කරන්න පුළුවන් වෙයි කියා හිතන්න බැහැ; එහෙම සිදුවෙලාත් නැහැ. ලෝක ඉතිහාසය දෙස බැලුවාම අපිට පෙනෙනවා, මැලේසියාව, සිංගප්පූරුව, දකුණු අප්‍රිකාව වාගේ හැම රටක්ම දියුණු වෙලා තිබෙන්නේ මූලිකව ඒ දේවල් කළ නිසා බව.

විශේෂයෙන්ම අපේ අල්ලපු රට වන ඉන්දියාව ගැන අපි දන්නවා. 1947 වන විට ඔවුන්ගේ ජාතික ප්‍රශ්නය විසඳා ගන්න එදා හිටපු නේරු මැතිතුමා ඇතුළු පාලකයන්ට යම්කිසි දුරකට හැකියාව ලැබුණා. ඉන්දියාව කියන්නේ, ජාතීන් විශාල සංඛ්‍යාවක් ජීවත් වන රටක්; ඔවුන් භාෂා ගණනාවක් කථා කරනවා. ඒ වාගේම සංස්කෘතික අතින් විවිධත්වයක් තිබෙන රටක්. 1947දී නිදහස ලැබුවාට පසුව නේරු මැතිතුමා ඇතුළු එදා හිටපු පාලකයන් යම්කිසි ප්‍රමාණයකට තමන්ගේ ජාතිකත්වයේ තිබෙන ගැටලු විසඳා ගැනීම උඩ, රට තුළ බලවත් අධිකරණයක් පිහිටුවීම උඩ අද වන විට ඉන්දියාව ආර්ථික වශයෙන් ශීඝ්‍ර සංවර්ධනයක් ලබා තිබෙනවා. අපිට එතැනට යන්න ඕනෑ නම්, අපි ඒ ගැන කථා කරනවා නම්, අනිවාර්යයෙන්ම අපේ මූලික පදනම, මූලික ප්‍රශ්නය විසඳා ගත යුතුයි කියායි මම නම් හිතන්නේ. එහෙම විසඳා ගන්නේ නැතිව, අපි සිහින දකින සිංගප්පූරුව, අපි සිහින දකින මැලේසියාව, අපි සිහින දකින යුරෝපයේ වෙනත් රටවල් එකකටවත් අපිට ළඟා වන්න බැහැ. මොකද, අපි තවම එක්දහස්නවසිය හතළිස් ගණන්වල, පණස් ගණන්වල කථා කරපු දේවල්ම කථා කර කර ඉන්න ජාතියක් බවට පත්වෙලා ඉන්නවා. අපිට අලුතින් හිතන්න බැරිවෙලා තිබෙනවා. අලුත් දේවල්, අලුත් සිතිවිලි අපේ සිත්වලට එන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් හැටියට මේ කාරණා ගැන සිතා බැලීම අද අපිට ඉතා වැදගත් වෙනවා. මොකද, අපි 2015 ජනවාරි 08වන දා බලය ලබා ගත්තේත් මෙන්න මේ බලාපොරොත්තු එක්කයි. මේ රටේ ජාතික ප්‍රශ්නය විසඳන්න, මේ රටේ සිටින සියලුම ජාතීන්ට ජීවත් වන්න පුළුවන් ආකාරයට, සියලුදෙනාටම පිළිගන්න පුළුවන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදා ගෙන ඉදිරියට යන්න, සමානාත්මතාව මත ජාතික ප්‍රශ්නය විසඳන්න, යුක්තිගරුක සමාජයක් ගොඩනඟන්න, සියලුදෙනාටම යුක්තිය ඉෂ්ට කළ හැකි, නීතියේ ආධිපත්‍යය ඉෂ්ට කරන බලවත් අධිකරණයක් ඇති කරන්න අපි බලාපොරොත්තු වුණා. මේ සියලු කාරණා එක්ක තමයි අපි 2015 ජනවාරි 08වන දා ජයග්‍රහණය ලබා ගත්තේ. ඒ ගමනේ අවසානය කරා යන්න අපිට තව කාලයක් තිබෙනවා. අපිට ලබා දී තිබෙන ඉදිරි කාලය තුළ අපි මේ ගමන නොගියොත්, අපිට මේ ගමන යන්න මූලිකව බලපාන මේ ගැටලු, මේ ගැටුම් නිරාකරණය කර නොගත්තොත් අපිට තවදුරටත් ඉස්සරහට යන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කථා කළ ආකාරයට, 2015 ජනවාරි 08වන දා මේ රටේ ජනතාවට ලබා දුන් පොරොන්දු

ඉදිරි කාලය තුළ ඉෂ්ට කරමින්, මේ රට අලුත් ගමනක් කරා මෙහෙයවන්න මේ රජයට ශක්තිය ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு எட்வட் குணசேகரஅவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

[අ.භා. 4.33]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක ක්‍රමෝපාය සංවර්ධනය පිළිබඳ ඉලක්ක මත ගෙන එන වැඩ පිළිවෙළකදී කවර ගිවිසුම් සකස් කළත්, රාජ්‍ය තාන්ත්‍රිකව කවර වාණිජ එකඟතාවලට ආවත්, නිශ්චිත කරුණු පිළිබඳව අවබෝධයක් ඇතිව රටේ පවතින ආර්ථික තත්ත්වය සහ සංවර්ධනය කළ යුතු ඉලක්ක මත උපාය මාර්ගික වැඩ පිළිවෙළක් නැත්නම් ඒවා එල දරන්නේ නැහැ.

රටේ ආර්ථිකය සංවර්ධනය කරන්න රටට හානි නොවන ඕනෑම එකඟතාවකට ජාත්‍යන්තර වශයෙන් එළඹෙන එකේ වරදක් තිබෙනවාය කියා මම නම් දකින්නේ නැහැ. ඒ ගැන අපිට ප්‍රශ්නයක් නැහැ.

ඇත්ත වශයෙන්ම ගෝලීය ආර්ථිකය තුළ අපට තනියම පවතින්න බැහැ. අනෙක් රටවල් සමඟ සම්බන්ධතා ඇතුව අපේ රටේ ආර්ථිකය පුළුල් කරන්න, ඒ තුළින් අපේ රටේ ආර්ථික වර්ධන වේගය වැඩි කරන්න ඉලක්කගත වැඩ පිළිවෙළක් රටට අවශ්‍යයි. ඒ ඉලක්කගත වැඩ පිළිවෙළ හදනකොට, ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් තුළ ඉඳගෙන ඒ ගිවිසුම්වලට එන්න ඕනෑ. මම දකිනවා, තවමත් එහෙම ප්‍රතිපත්තියක් අපට නැහැ කියලා. අපි තැනින් තැනින් එකතු කර ගන්නා වූ යම් අදහස් මත විවිධ රටවල් එක්ක එවැනි ගිවිසුම්වලට එනවා. ඇතැම් රටවල් ජාතික ආර්ථික ප්‍රතිපත්තීන් පදනම් කර ගෙන ඒ අයගේ ආර්ථිකය පිළිබඳ අනාගත සැලසුම් ඉදිරියට ගෙන යන්න මේ වාගේ ගිවිසුම්වලට ආවත්, අපි එහෙම ඉලක්කගත වැඩ පිළිවෙළක් ඔස්සේ නිවැරදි සංවාදයකින් යුතුව අපේ ආර්ථික මූලෝපායන් හඳුනා ගත්ත ආර්ථික වැඩ පිළිවෙළකට අනුරූපීව ගිවිසුම්වලට එනවා කියන එක අපට පෙනෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කවර අංශ දියුණු කළ යුතුද, අපි කවර අංශ ඉලක්ක කරගෙන මෙවැනි ගිවිසුම්වලට එළඹිය යුතුද, ඒ තුළින් අපේ ආර්ථික ධාරිතාව ඵලදායී විධියට වර්ධනය කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව පසු ගිය ඉතිහාසය පුරාම නිසි සැලසුම්කරණයක් අපට නොතිබුණු නිසා අපේ රට පස්සට වැටිලා තිබෙනවා. මේ වනකොට අපේ රටේ මධ්‍යම බැංකුව ඉදිරිපත් කරපු වාර්තාවේ තිබෙනවා, අද අපේ රටේ ආර්ථික වර්ධන වේගය 3.1කට පහළ වැටිලා කියලා. මේක පසු ගිය අවුරුදු 16 තුළ ඇති වෙච්ච අඩුම වර්ධන වේගය. ආර්ථික කඩා වැටීමත් එක්ක ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව අපේ රටේ රුපියල අවප්‍රමාණය වී මූල්‍ය ස්ථාවරභාවයක් නැති වෙනකොට ආයෝජන පරිසරයක් රටක ඇති වෙන්නේ නැහැ. ඒක නිසා රටක ආයෝජන පරිසරය ගොඩ නැඟීම ප්‍රධාන කාරණාවක්. මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. අපි කවර ගිවිසුම්වලට ආවත්, ඒ ගිවිසුම්වලට එළඹෙන රටවල් පමණක් නොවෙයි, ඒ ගිවිසුම් තුළින් ප්‍රාග්ධනය ආයෝජනය කරන ධනේශ්වර ව්‍යවසායකයෝ පවා කල්පනා කරනවා, අපි අයෝජනය කළාම ඒකෙන් අපට ප්‍රතිඵල ලබාගත හැකිද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට බරපතළ අර්බුද ගණනාවකට මුහුණ දෙනවා. එකක් තමයි, දිනෙන් දින පහළ වැටෙන ආර්ථික අර්බුදය. යහ පාලන රජය බලයට පත් වුණාට පස්සේ රටේ සම්පත් සංවර්ධනය කිරීමට නොහැකි වූවා වාගේම මහා ණය කන්දරාවකටද රට තල්ලු කර තිබෙනවා. මේක කාටවත් නැහැයි කියලා කියන්න පුළුවන් එකක් නොවෙයි. තමුන්නාන්සේලාගේම වාර්තාවල තමයි මේක සඳහන් වෙන්නේ. ණය ප්‍රමාණය ඉහළ යෑම ඩොලර් බිලියන 836 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. මෙහෙම ණය කන්දරාවකට මුහුණ දෙන රටක් ඇතුළේ එක පැත්තකින් අද ආර්ථික වශයෙන් කඩා වැටීමත් එක්ක විශාල දේශපාලන අර්බුදයක් මතු වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි ගොඩ නැඟූ ආණ්ඩුවේ අද සමඟරතාවක් නැහැ.

පසුගිය කාලයේ 16දෙනෙක් ආණ්ඩු පාර්ශ්වයෙන් විරුද්ධ පාර්ශ්වයට ආවා. මේ ආණ්ඩුව "බැලන්ස්" එකක් නැතුවයි යන්නේ. නිකම් හෙලෙන්තාඩු ආණ්ඩුවක්. බැලූ බැල්මට කොයි ජාමේ මේක බිඳ වැටෙනවාද කියන එක ගැන කාටවත් නිශ්චිතව කියන්න බැහැ. රටේ මිනිස්සුත් අපෙන් අහන්නේ, "ඝර්, හෙට මොකද වෙන්නේ? දැන් මොකක්ද වෙන්නේ?" කියලා. එහෙම අවිනිශ්චිත බවක් මේ ආණ්ඩුව ගැන තිබෙනවා. ව්‍යවස්ථානුකූල තත්ත්වයන් යටතේ ආණ්ඩුවට යම් දුරක් යන්න පුළුවන්. නමුත් රටේ ජනතාව ආණ්ඩුවත් එක්ක නැහැ. ලොකු ප්‍රතිවිරෝධයකට අද මුහුණ දෙනවා. ඒක නිසා සමාජ ගැටුම් මෙන්ම විවිධ සමාජ බලවේග ආණ්ඩුවට එරෙහිව පෙළ ගැහෙනවා.

බැලුවාම, හැම පාරක් පාරක් ගණනේ උද්ඝෝෂණ. සිහි බුද්ධිය තිබෙන මොන ආයෝජකයාද, මෙවැනි නොසන්සුන්කමක් තිබෙන, දේශපාලන ස්ථාවරභාවයක් නැති රටකට එන්නේ? කොයි වෙලාවේ මේ ආණ්ඩුව බරපතළ අර්බුදයකට යාවිද කියන සැකය තිබෙන තත්ත්වයක් යටතේ මේ රටට ආයෝජනය කරන්න යමකු එනවා කියා කල්පනා කරනවා නම්, ඇත්ත වශයෙන්ම එය නිකම් සිහිනයක් විතරයි. ඉදිරි කාලයේදීත් මේ රටේ ආර්ථික සංවර්ධනයේදී අපට තිබෙන සම්පත් -කලින් කරුණු ඉදිරිපත් කරපු අවස්ථාවේ කිව්වා වාගේ

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

සංවර්ධනය කරන්න ඕනෑ සම්පත්- හඳුනා ගෙන අපට අවශ්‍ය බුද්ධිමය දායකත්වය ලබා ගැනීම අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අමාත්‍යාංශ ගත්තාම, ලොකු සැලසුම්කරණයන් කරන්න පුළුවන් අය ඒ අමාත්‍යාංශවල ඉන්නවාද? අමාත්‍යාංශ ලේකම්වරයකු කියන්නේ, පරිපාලනය පිළිබඳ දක්ෂයෙක්. ඔහුට උගන්වන්නේ පරිපාලනයයි. විභාග සමත් කරලා රටේ පරිපාලනයට එකතු වුණාම ඔහු දන්නේ රටේ සංවර්ධනය ඇති කිරීම ගැන නොවෙයි. ආයතන සංග්‍රහයට අනුව, මූල්‍ය රෙගුලාසිවලට අනුව අමාත්‍යාංශය හසුරුවන හැටියි ඔහු දන්නේ. එය තමයි ඔහු දන්නේ. අමාත්‍යාංශයක් ඇතුළේ සිටින, තමන්ගේ වපසරිය තුළවත් හරියාකාර සැලසුමක් කරන්න පුළුවන් කෙනා කවුද? එවැනි ප්‍රබුද්ධත්වයක් තිබෙන්නේ කොහේද? රටක ආර්ථික සැලසුම්කරණය හරියාකාරව නැතිනම් මොකද වෙන්නේ? මේ ඇමතිවරුන් මහා විශේෂඥයෝ නොවෙයි නේ. අපිත් ඉතින් අමාත්‍ය ධුර දැරුවා නේ. එක් එක්කෙනාගේ දැනුමේ ප්‍රමාණය අනුව තමයි ඔවුන්ටත් යමක් කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජවාදී රටවල බිඳ වැටීම් තිබෙනවා කියා මෙහිදී කිව්වා. ඇත්ත වශයෙන්ම ඒ රටවල් ඇතුළේ නිසි ආර්ථික දැක්මක් ඇතිව, කළමනාකරණයක් ඇතිව, ජාතික හා ජාත්‍යන්තර තත්ත්වයන් නිසි ලෙස වටහා ගනිමින් කටයුතු කරන නිසා, නිසි ගමන් මහක යන නිසා ඒ රටවල් දියුණු වෙනවා; ආර්ථික ජයග්‍රහණ ලබනවා. ගරු අමාත්‍යතුමා මේ සංවාදයේදී කරුණු ඉදිරිපත් කළාට පසුවත් මම එතුමාගෙන් පෞද්ගලිකව ඇහුවා, අපේ රට සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට තිබෙන සැලසුම්කරණය මොකක්ද, විදේශ වෙළඳ පොළ ජයග්‍රහණය කරන්න අපට තිබෙන සම්පත් අප හඳුනාගෙන තිබෙනවාද කියා. ඒවා සංවර්ධනය කරන්නේ කොහොමද, ඒකට බුද්ධිමය දායකත්වය දෙන්නේ කොහොමද කියන එක පිළිබඳව මම එතුමාගෙන් ඇහුවා. එවැනි වැඩ පිළිවෙළක් නැහැ. ජාතික ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ජාතික ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළ සමස්තයක් හැටියට අධ්‍යයනය කරලා, ඒ නිශ්චිත කරුණු ඉස්සරහට ගෙන යෑම ඇමතිවරයාගේ වගකීමයි. එය ඔහුට භාර දෙන්න ඕනෑ. එහෙම නැතිව, ඒ ක්‍රියා දාමය සැලසුම් කරලා සකස් කරන විශේෂඥයන් නැහැ නේ. අපට පෙනෙනවා, ප්‍රතිපත්තිමය විධියට රටේ ආර්ථිකය ඉස්සරහට ගෙන යන්න නම් කරන්න ඕනෑ කුමක්ද කියා. දැනුම කේන්ද්‍රීය කරගත් බුද්ධිමය සැලසුමක් මත, රටේ ආර්ථිකය පිළිබඳ හරියාකාර දත්ත විග්‍රහයක් ඇතිව, රටේ සියලු සම්පත් පිළිබඳ අවබෝධයකින් හදා ගන්නා වූ ක්‍රමවේදයක් ඇතුළේ තමයි අපට ආර්ථික ජයග්‍රහණ කරා ඉස්සරහට ගමන් කරන්න පුළුවන්කම ලැබෙන්නේ. නමුත් එවැනි තත්ත්වයක් නැහැ. බලයට පත් වුණාට පසුව තිබෙන අවබෝධයේ ප්‍රමාණයට අපි වැඩ කරනවා. ලෝක තත්ත්වයන් පිළිබඳව, ලෝකයේ දියුණු වන සමාජවාදී රටවල් පිළිබඳව අධ්‍යයනයක් නැතිව, දියුණු ධනවාදී රටවල ගෙන යන ආර්ථික සංවර්ධන උපාය මාර්ග පිළිබඳ අධ්‍යයනයක් නැතිව පරණ ආර්ථික සැලසුමක් මත අපි ගමන් කරනවා. ඒක තමයි ලෝකය ප්‍රතික්ෂේප කරපු නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය වන්නේ. දැන් මෙතැනදී කිව්වා, "අපි ධනපති ආර්ථික සංවර්ධනයක යනවා." කියා. ඒක ඇත්ත වශයෙන්ම යල් පිනු, ලෝකය ප්‍රතික්ෂේප කරන ප්‍රතිපත්තියක්. ලෝකයේ ආර්ථික විශේෂඥයන් පවා කියනවා, "ඒක දැන් විකිණිලා ඉවරයි. නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියට තවදුරටත් යන්න බැහැ." කියා.

ඒ ප්‍රතිපත්තියට ගිය රටවල් ඇතුළේ දිළිඳුකම, ඇති නැති පරතරය වර්ධනය වීමත් එක්ක අද බරපතළ සමාජ ව්‍යසන මතු වෙලා තිබෙනවා. දුගීකම ඇති වෙනකොට, ඒවාට පිළිතුරු නැති වෙනකොට, ආර්ථික ජයග්‍රහණවල ප්‍රතිඵල සමාජයේ පහළ කොටස්වලට නොලැබෙනකොට ඇති වන සමාජ අසහනය ඇත්ත වශයෙන්ම රටක දේශපාලන අස්ථාවරභාවයට බරපතළ විධියට බලපානවා. ඒකට තමයි අද මේ ආණ්ඩුව මුහුණ දෙන්නේ. ඇත්ත වශයෙන්ම දේශපාලන අර්බුදය කියන්නේ, ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක්. මේ ආණ්ඩුව නිවැරදි ගමන් මහක ගියා නම්, ජනතාවට ආර්ථික ජයග්‍රහණ ලබා දුන්නා නම්, මේ මන්ත්‍රීවරුන්ට භය නැතුව ඉන්න තිබුණා. නමුත් පසුගිය කාලයේ කරපු වැරදි නිසා දැන් එළියට බැස්සත් ගල් ගහන තත්ත්වයක් තමයි තිබෙන්නේ. පසුගිය කාලයේ මේ රට ආර්ථික වශයෙන් ඉදිරියට ගෙන යන්න ගෙන ගිය සැලසුම් ආපස්සට හරවලා, ඇත්ත වශයෙන්ම ක්‍රම විරෝධී උපායික ආර්ථික ක්‍රමවේදයන් ඉස්සරහට ගෙන යන්න ගෙන ගිය සැලසුම්වල අසාර්ථකභාවය නිසා අද රට නරක තැනකට තල්ලු වෙලා තිබෙනවා. ඒකට ආණ්ඩුව දකින උත්තරය තමයි ඇමතිවරු මාරු කරලා, අමාත්‍යාංශවල පොඩි පොඩි වෙනස්කම් කිරීම. එහෙම කරලා, "අපි විද්‍යාත්මක ක්‍රමයකට යනවා"ය කියලා රටට කියලා, අවිද්‍යාත්මක ස්වරූපයකින් පවතින්න උත්සාහ කරනවා. ඒක තාවකාලිකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම අපේ රටේ බුද්ධිමතුන්, විශේෂඥයින් පිටරටවල ඉන්නවා. ආර්ථික විශේෂඥයින් වෙන රටවලින් සල්ලිවලටම ගෙනෙන්න ඕනෑ නැහැ. විවිධ ක්ෂේත්‍රවල අධ්‍යාපනය ලබලා, වෙන රටවලට ගිහිල්ලා ශිෂ්‍යත්ව ලබලා, දැනුමෙන් පිරුණු අයට අද ඒ රටවල පුරවැසිභාවය ලබා දීලා, සම්පත් දීලා, අද ඔවුන් ඒ රටවලට සේවය කරනවා. අපේ රටෙන්ම බිහි වුණු, අපේ රටේ දේශගුණය ගැන දන්න, අපේ රටේ මහ පොළොව ගැන දන්න, පස ගැන දන්න, පරිසරය ගැන දන්න, අපේ රටට ආදරය කරන ඒ අය ගෙනැල්ලා අපේ රටේ සංවර්ධනයට අවශ්‍ය ජාතික ආර්ථික සැලසුමකට ඔවුන්ගේ බුද්ධිමය දායකත්වය ගන්න එක උත්සාහයක්වත් ගත්තාද? එහෙම එකක් ඇත්තේ නැහැ. දන්න විධියට ඔහේ අරගෙන යනවා. දන්න විධියට ගෙන යනවා. ඉතින් දන්න විධියේ තරම මේක තමයි. කොයි විධියට ගියත් මීට ඉස්සරහට යන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රමෝපාය සංවර්ධනය රටකට අවශ්‍යයි. රටකට ක්‍රමෝපාය සංවර්ධනයක් ඕනෑ. ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වුණු සංවර්ධනයක් තිබෙන්න ඕනෑ. ඒකට අවශ්‍ය මානව සම්පත තිබෙන්න ඕනෑ; බුද්ධිමය දායකත්වය තිබෙන්න ඕනෑ. සැලසුම් හැදුවාට වැඩක් නැහැ, ඒ සැලසුම ක්‍රියාත්මක කිරීමේදී අපි ලබන්නේ පාඩුවක් නම්, එවැනි සැලසුම් අපට අවශ්‍ය වන්නේ නැහැ. ඒ නිසා ජාතික වශයෙන් අපට හිමි සියලු අංශ එක්තැන් කරලා, ශ්‍රම සම්පත, විශේෂඥ දැනුම, බුද්ධිමය දායකත්වය ආදී අපේ රටේ වටිනා සම්පත් සංවර්ධනය කරන්නේ කොහොමද කියන එක ගැන නිවැරදි වැඩ පිළිවෙළක් ඔස්සේයි අපි මේ ගිවිසුම් ඇති කර ගන්නට අවශ්‍ය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට අවසන් වශයෙන් මේ කාරණයත් කියනවා. ඔබතුමා මේ අවස්ථාවේ මූලාසනයේ සිටීම ගැන මා සතුටු වෙනවා. ඔබතුමාත්, මමත් තවත් පිරිසක් සමඟ ලාඕසයට ගියා. ඔබතුමාට මතක ඇති, අපි ගම්මානයකට ගියා. ඒක සිල්ක් රෙදි නිපදවන ගම්මානයක්. ඒක ඒ මිනිසුන්ගේ ආවේණික, සම්ප්‍රදායික කර්මාන්තයක්. සංචාරකයින් කොයි තරම් එතැනට ඇවිල්ලා හිටියාද? එහෙම ඒවා අපේ රටේ තිබෙනවාද? අපට විදේශ විනිමය උපයන්න, රටේ සාමාන්‍ය මිනිසුන්ගේ කුසලතා සංවර්ධනය කරලා ඇත්ත වශයෙන්ම ඒවා විදේශ වෙළෙඳ පොළට ගෙන යන්න පුළුවන්. ඒ

වාගේම සංචාරක ආකර්ෂණය ලබා ගන්න පුළුවන්. අපේ රටේ ඒ වාගේ සැලසුම් ක්‍රමයක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් අහනවා. විදේශිකයන්ට නොවෙයි, අපටවත් එහෙම එක ගමකට, එක වීථියකට, එක තැනකට ගිහිල්ලා මිනිසුන්ගේ කුසලතා නරඹන්න අවස්ථාවක් තිබෙනවාද? ඒ නිසායි මම කිව්වේ, සැලසුම්කරණයක් නැහැ, ලෝක අත් දැකීම් ගන්නේ නැහැ කියලා. අපි යනවා, ලෝකය බලනවා, ආපහු එනවා. අපි දන්නා විධියට අපේ වැඩ ටික කර ගෙන යනවා. ඒ නිසා ලෝකයෙන් උකහා ගත යුතු වන්නේ ණය විතරක් නොවෙයි. ඒ ණය ඵලදායී විධියට කොහොමද අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න යොදා ගන්නේ කියන පුළුල් අවබෝධයත් රටකට අවශ්‍යයි. එහෙම වුණොත් අපේ මේ ක්‍රමෝපාය ඉස්සරහට යයි. එහෙම නැති වුණොත්, මේ හදන ඒවා සියල්ලම පුස්සක් බවට පත් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලාංකීය සමාජයම එකතු කර ගෙන ජාති, ආගම්, කුල භේදවලින් තොරව අපි එක්සත් රටක් ඇතුළේ සියලුම ජන වර්ගවල දැනුම, බුද්ධිය හා ශ්‍රමය ඒක රාශී කර ගත් සංවර්ධන ඉලක්කයකට රට මෙහෙයවන්න ඕනෑය කියන ප්‍රකාශය කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

[අ.භා.4.50]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹ்மான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගන්නා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් සම්බන්ධව කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. අද සමස්ත රටේම ආර්ථිකයේ බොහොම පසුබෑමක් ඇති වුණු වෙලාවක මෙවැනි සංවර්ධන වැඩ පිළිවෙළක් ඉදිරිපත් වී තිබීම බොහොම සතුටට කාරණයක්. කවුරු මොනවා කිව්වත්, ආණ්ඩුවේ සිටින 225 දෙනාම රටේ ඉදිරි දැක්ම ගැන හිතන්නේ නැතිව තමන්ගේ වාසිය තකා කටයුතු කරන බවයි ඒ කථා කරන දේවලින් අපට දකින්නට තිබෙන්නේ. පැවති රජය හෝ දැනට පවතින රජය හෝ රටේ ආර්ථිකය වෙනුවෙන් යම් කිසි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළාම අපි සියලුම දෙනා ඒකට සහයෝගය දෙන්න ඕනෑ. එහෙම නැතිව, "ඒකේ අඩු පාඩු තිබෙනවා, මේකේ අඩු පාඩු තිබෙනවා, මේක හරි නැහැ" කියමින් කථා කර කර හිටියොත්, දේශපාලකයා හරහා අපේ රටේ ඉන්න ආදරණීය ජනතාව හැම දාම හිහන්නෝ විධියට තමයි පත් වෙන්නේ. ඒ ගැන අහන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද ලෝකයේ දියුණු වුණු රටවල් ගැන කථා කරනවා; සිංගප්පූරුව ගැන අපි කථා කරනවා. ඒ රටේ හිටපු අගමැති ලී ක්වාන් යූ මැතිතුමාට පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ හැම කෙනෙක්ම උදව් කරපු නිසා තමයි අද ලෝකයේම පිළිගන්නට පුළුවන් විධියට ඒ රට දියුණු තත්ත්වයක තිබෙන්නේ.

ඒ වාගේම මැලේසියාව ගැන අපි කථා කරනවා. මැලේසියාවේ නිදහසෙන් පස්සේ එකම ආණ්ඩු පක්ෂය තමයි ඒ රට පාලනය කළේ. ඒ ඉන්න සියලුම මැති-ඇමතිවරු ඒ රටේ ජනතාව විසින් පත් කරනු ලැබුවේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න ඕනෑය කියලායි. ඒ නිසාම ඒ මැති-ඇමතිවරු, ආර්ථික වශයෙන් ලෝකයේ ඉහළම රටක් විධියට සැලකිය හැකි ආකාරයට එරට පත් කළ යුතුය කියා රජයට විශ්වාසයෙන් වැඩ කටයුතු කළා. මෑතකදී ඒ රටේ හිටපු අගමැතිතුමාගේ විනය වැඩ පිළිවෙළ රටට ඔබින්නේ නැහැ කියලා, ලෝකයේම වයස්ගතම නායකයා වූ මහතිර් මොහොමඩ් මැතිතුමා මැතිවරණයෙන් නැවත වතාවක් දිනවලා ආර්ථිකය ඉදිරියට ගෙන යන්නට හැකි වැඩ පිළිවෙළක් හදා ගෙන යන බව අපට දකින්න ලැබුණා. ඒ වාගේම දකුණු අප්‍රිකානු නෙල්සන් මැන්ඩෙලා ගැන අපි කථා කරනවා. දකුණු අප්‍රිකාවේ ජනතාව සුද්දන්ට යටත් වෙලා, තමන්ගේ ජීවිත විතරක් නොවෙයි ආර්ථිකය යනාදී සියල්ලම නැති කරලා තිබුණත්, නිදහස ලැබුණාට පස්සේ සාර්ථකව ආර්ථිකය ඉදිරියට ගෙන ගිය හැටි අපි බලා ගෙන හිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී අපට එක් දෙයක් දකින්න තිබෙනවා. ඒ තමයි, ලෝකයේ දියුණු වුණු ඒ සෑම රටක්ම එකිනෙකාට අත දිගු කරමින් රටේ ආර්ථිකය විනාශ නොකර, අනෙක් රටවල් එක්ක සාම ගිවිසුම්, වෙළෙඳ ගිවිසුම් ඇති කරගෙන ඒ හරහා දියුණු වී තිබෙන බව.

එකම රටකටවත් තනිව දියුණු වෙන්න ශක්තියක් නැහැ. අද වන විට ලෝකයේ දියුණුවට පත්වෙලා තිබෙන රටවල් තමයි China, Singapore. අපි ළඟදී සිංගප්පූරුවත් එක්ක ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. එම ගිවිසුමේ වැරදි තිබුණා නම්, නිවැරදි කරලා ඉදිරියට අරගෙන යන්න ඕනෑ. ඒක රජයේ යුතුකමක්. ඒ වාගේම විපක්ෂයේ ඉන්න අයත් ඒකට ඇඟිල්ල දික් කර කර අපහාස කර කර ඉන්න එකේ තේරුමක් නැහැ. ඒක මේ රටේ ඉන්න ආදරණීය ජනතාවට කරන යුතුකමක් නොවෙයි. මේක වැරදියි, මේක නිවැරදි කරන්න, මේක හරිගස්සන්න, මේක වෙන්න ඕනෑ මෙහෙමයි කියලා නිවැරදි කළොත් විතරයි අපට රටක් විධියට ඉදිරියට යන්න පුළුවන් වන්නේ. එහෙම නැති වුණොත් අපි මොන කයිවාරු ගැහුවත්, කවුරු බලයට පත් කළත් වැඩක් වන්නේ නැහැ. අපේ පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනාම එකතු වෙලා, එදා සිංගප්පූරුවේ, මැලේසියාවේ, දකුණු අප්‍රිකාවේ නායකයන් කටයුතු කළ විධියට කටයුතු කිරීමට මේ රට පාලනය කරන නායකයාට අවස්ථාව දුන්නේ නැත්නම්, තව අවුරුදු කිහිපයකින් මේ රටේ ඉන්න ජනතාවට අපි ඉතිරි කරලා යන්නේ සෝමාලියාව, ටැන්සානියාව වාගේ රටක් කියලා මා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ සිටින සියලු දෙනාම හිතන්න ඕනෑ. මේ රටේ ඉන්න කෝටි දෙකහමාරක ජනතාව ඡන්දය දීලා අපව පත් කළේ මහා විශාල විශ්වාසයකින් යුතුවයි. මේ රට ඉදිරියට ගමන් කරලා, ලෝකයේ දියුණු රටවල් වන සිංගප්පූරුව විධියට, මැලේසියාව විධියට දියුණුව කරා ගෙනයන්න පුළුවන් කියලා හිතලා තමයි අපි දිහා බලලා ඡන්දය දුන්නේ. නමුත් ඒ ඡන්ද ටික අරගෙන අපි මොනවාද කරන්නේ? අපි එකාට එකා ප්‍රශ්න ඇති කරගෙන ආර්ථිකය විනාශ කරන එකයි අද අපට දකින්න පුළුවන් වන්නේ.

අතිගරු ජනාධිපතිතුමනි, ගරු අගමැතිතුමනි, ගරු කැබිනට් ඇමතිවරුනි, 2015 මහ මැතිවරණයේදී විශේෂ විධියට මේ රජය පත් කළේ මේ රටේ සමඟිය, සාමය ඇති කර ජාතිවාදී, ආගම්වාදී, අන්තවාදී නැති සමස්ත ලෝකය පිළිගත් රටක් විධියට ඉදිරියට අරගෙන යන්න ඕනෑ කියලායි. මෙතැනදී තවත් ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය අවුරුදු දෙක, තුන තුළදී ආර්ථික ප්‍රශ්නයක් ඇති වෙන්න පළමුවෙනි හේතුව තමයි පසුගිය රජය ජාතිවාදී, ආගම්වාදී, අන්තවාදී විධියට ප්‍රශ්න ඇති කිරීම. ඒ නිසා තමයි ඒ රජය අන්ත පරාජයකට පත් කරලා නැවත වතාවක් 2015 වසරේදී ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ සිංගප්පූරුව විධියට, මැලේසියාව වාගේ අපේ රටත් දියුණු කරන්න අපේම රජයක් පත් කළේ. අපේ රටේ සිටින ජාතිවාදීන් සියලු දෙනාම තුරන් කරලා ආර්ථික වශයෙන් ඉදිරියට යන්න පුළුවන් විධියටයි රටේ ඉන්න කෝටි දෙකහමාරක ආදරණීය ජනතාව වරම දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඉදිරියට යන්න පුළුවන් වන්නේ අපි නිවැරදිව ගමන් කළොත් පමණයි. එහෙම නැතිව කොච්චර සංවර්ධන වැඩ පිළිවෙළවල් ගෙනාවත් මේ රටේ ජාතිවාදයක්, ආගම්වාදයක්, අන්තවාදයක් තිබෙනවා නම්, සමඟියක් නැත්නම් ඉදිරියට යන්න බැහැ.

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට සම්බන්ධ නැති වුණත් මම තව දෙයක් කියන්නම්. අපේම ගොවි මහත්වරු කන්න හතරක් ගොවිතැන් කටයුතු කරන්න බැරිව පීඩනයට පත් වෙලා සිටින යුගයක් තමයි මේ. මම ළඟදී රාජාංගනයේ මළගෙවල් තුනකට ගියා. ඒ මළගෙවල් තුනේදීම ජනතාව කිව්වේ, "අපේ මන්ත්‍රීතුමනි, වපුරලා මාසයක් ඉවරයි. පසුගිය කාලයේ රුපියල් 3500ට පොහොර තිබුණා. සල්ලිත් තිබුණා. ඊට පසුව පොහොර නැති වුණා. අපි අලුතෙන් ඇමති කෙනෙක් පත් කළා. මෙදා හරි පොහොර හරියට ලැබෙයි කියලා හිතුවා. නමුත්, මාසයයක් ගිහිල්ලාත් තවම පොහොර ලැබුණේ නැහැ." කියලා. දැන් පොහොර මිටියක් රුපියල් 1500ට අඩු කරලා තිබෙනවා. සහනාධාරයක් විධියට පොහොර මිටියක් රුපියල් 500ට අඩු කරලා තිබෙනවා. නමුත්, ගොවි මහතුන්ට තවම පොහොර ලබාදීලා නැහැ. නිලධාරි මහත්වරුන්ගෙන් අහනකොට කියනවාලු, "ලබන මාසයේ 4වන දා එන්න" කියලා. අනේ! මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මාසයක් ඉවරයි.

ලබන මාසය වනකොට මාස දෙකක් ඉවරයි. කපන්න වෙන්නේ බොල් වී ගොයම තමයි. වී ගොයම කපන්න බැහැ. බොල් වී ගොයම තමයි කපන්න වෙන්නේ. ඒ නිසා ගරු ජනාධිපතිතුමාගෙන්, ගරු අගමැතිතුමාගෙන් සහ කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා මේ අවස්ථාවේදී ගෞරවනීය ඉල්ලීමක් කරනවා. හිටපු කෘෂිකර්ම ඇමතිතුමාට ඒ වැඩ පිළිවෙල කරන්න බැරි වුණා. ගරු මහින්ද අමරවීර මැතිතුමනි, ඔබතුමා ඒ වැඩ පිළිවෙල හරියට කරයි කියලා තමයි ඔබතුමාව කෘෂිකර්ම ඇමති හැටියට පත් කළේ. නමුත් ඔබතුමාටත් ඒ වැඩ පිළිවෙල තවම කරන්න බැරිවෙලා තිබෙනවා. මම දුකින් තමයි අද කථා කරන්නේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාවට විතරක් නොවෙයි, ලංකාවේ සිටින ගොවි මහත්වරුන්ට තවම රුපියල් 1,500ටවත් පොහොර ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මා ගෞරවනීය ඉල්ලීමක් කරනවා.

අපේ රට කෘෂිකාර්මික රටක්. මේ රට කෘෂිකර්මයෙන් ඉදිරියට ගෙන යන්න නම් ඒ වෙනුවෙන් අවශ්‍ය දේවල් කරන්න ඕනෑ. නමට විතරක් කෘෂිකාර්මික රටක් කියලා වැඩක් නැහැ. රටේ සංවර්ධනයක් කරනවා කියලා සිංගප්පූරුවත් එක්ක ගිවිසුම් ගහලා හරි යන්නේත් නැහැ. අපේ රටේ ගොවි මහත්වරුන්ට අත්‍යවශ්‍ය දේ තමයි පොහොර. පොහොර නැත්නම් ගොවි මහත්වරු ගොවිතැන් කටයුතු කරන්නේ කොහොමද? ගොවි ජනතාවට අවශ්‍ය දේවල් ඉක්මනින් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මා කරුණාවෙන් ඉල්ලනවා. මේ අවස්ථාවේදී මම දෙමළ භාෂාවෙනුත් වවන ස්වල්පයක් කථා කරන්න කැමැතියි.

නාන් පිරතිනිතිත්තුවප්පටුත්තුකින්ර අනුරාතපුරම් මාවට්ටත් තිලුළ්ළ රාජාංකනෙයිල් වාළ්කින්ර විවසායිකළ් විවසාය නටවටික්කෙකළෙ ආරම්පිත්තු තර්පොළුතු ඔරු මාතමාකි විට්ටතු. ආනාල්, ඉන්නමුම් අවර්කළුක්කුරිය පොහොර වළංකප්පටවිල්ලෙ. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරි යිටම් කේට්ටාල්, “වරුකින්ර මාතම් වාරුංකළ්, 500 රූපාය්ක්කු පොහොර තරුකින්රෝම්” එන්රු කූරුකින්රාර්. අණ්මෙයිල් රාජාංකනෙයිප් පකුතියිලේ මූන්රු මරණ වීටුකළුක්කුච් චෙන්රිරුන්තේන්. අන්නේරත්තිල්, අංකිරුන්ත කටෙකළුක්කුච් චෙන්රු පොහොර ඉරුක්කින්රතා එන්රු පාර්ත්තේන්. 500 රූපාය්ක්කු අල්ල, 1,500 රූපාය් කොටුත්තාලුම් අංකු වාංකුවතර්කු එන්තක් කටෙයිලුම් පොහොර ඉරුක්කවිල්ලෙ.

මේතකු ජනාතිපති අවර්කළේ! කෞරව පිරතමර් අවර්කළේ! කෞරව කමත්තොළිල් අමෙච්චර් අවර්කළේ! ඉන්රු අනුරාතපුරම් මාවට්ටත්තිලුළ්ළ විවසායිකළ් 4 පෝකංකළුම් විවසායම් චෙය්ය මුටියාමල් පාරිය නෙරුක්කටික්කුළ් තළ්ළප්පට්ටිරුක්කිරාර්කළ්. එනවේ, අවර්කළුක්කුරිය මානියත්තෙ වළංකුංකළ්! චෙන්ර 2 1/2 වරුට කාලත්තිලේ පොහොර කොටුක්කාමෙයාල් විවසායිකළ් 'පොළ්'ඉත්තාන් වීට්টුක්කුක් කොණ්ටුවන්තාර්කළ්. ඉම් මුරෙයුම් අතුපෝන්රුතාන් නටක්කුම්. ආතලාල්, මේතකු ජනාතිපති අවර්කළුම් කෞරව පිරතමර් අවර්කළුම් කෞරව කමත්තොළිල් අමෙච්චර් අවර්කළුම් ඉතර්කුරිය නටවටික් ක෈යෙ උටනටියාක එටුක්ක වේණ්ටුම්. ඉල්ලාවිට්ටාල්, ඉන්ත නාට්ටිලේ මීණ්ටුම් ඔරු පොරුළාතාරප් පින්නටෙවු ඒර්පටුම් එන්පතිල් එන්තවිතමාන සන්තේකමුම් ඉල්ලෙ.

ඉන්රු ඉන්ත නාට්ටිල් අපිවිරුත්ති ඒර්පටුත්තප්පට වේණ්ටුමෙන්රු සිංකප්පූරෝටු ඉණෙන්තු ඔර් ඔප්පන්තම් චෙය්යප්පට්ටුළ්ළතු. ආනාල්, ඉන්ත නාට්ටිලේ විවසායි කළුක්කු මික මුක්කියත්තුවමාන - අටිප්පටෙත් තේවෙයාන පොහොර වෛ වළංකාවිට්ටාල් ඉන්ත ඔප්පන්තම් ඔරුපෝතුම් සරිවරාතු! අතනාල් විවසායිකළුක්කු උටනටියාක පොහොර වෛ වළංක වේණ්ටුම්. අතුමට්ටුමල්ල, ඉනවාතම්, මතවාතම්, කුලවාතම් අට්ර රීතියිල් සිංකප්පූර්, මලේසියා පෝන්රු ඉන්ත නාට්ටෙ ඔර් ඔළුංකාන අමෙප්පුක්කුක් කොණ්ටුවන්තාල් මාත්තිරම්තාන් නාට්ටිලේ අපිවිරුත්තියෙ ඒර්පටුත්ත මුටියුම්. ඉන්ත නාට්ටෙච් සිංකප්පූර්, මලේසියා පෝන්රු ආක්කවේණ්ටුමෙන්පතුතාන් කෞරව පිරතමරුටෙය ආවල්! සිංකප්පූර් මක්කළ් තංකළුටෙය නාටු ඉලංකෙ පෝන්රු වරවේණ්ටුමෙන්රු අන්රු එතිර්පාර්ත්තාර්කළ්. ආනාල්, ඉන්රු කෞරව පිරතමර් අවර්කළුම් එංකළ් නාට්ටු මක්කළුම් සිංකප්පූර් පෝන්රු ඉලංකෙ උරුවාක්කප්පට වේණ්ටුමෙන්රු එතිර්පාර්ත්තුක්කොණ්ටිරුක්කිරාර්කළ්. ඉප්පටි යාන ඒර්පාටුකළෛච් චෙය්තාල් මට්ටුමේ, අන්ත ආවල් නිරෛවේරුම් එන්රු චොල්ලි, වාය්ප්පළිත්ත කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළුක්කු නන්රි කූරි, විටෛපෙරුකින්රේන්. වස්සලාම්.

[අ.භා. 5.03]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබෙන නියමයන් සම්බන්ධයෙන් විවාද කරන අද දවසේ ඒ සම්බන්ධයෙන් කථා කරන්න මටත් අවස්ථාවක් ලැබීම ගැන මම විශේෂයෙන්ම සන්තෝෂ වනවා. මේ විවාදයේදී මම කරුණු කීපයක් මතු කරන්න බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම සිංගප්පූරුව සමඟ ඇති කරගෙන තිබෙන නිදහස් හාණ්ඩ හා සේවා වෙළෙඳ ගිවිසුම පිළිබඳව මම කථා කරන්න කැමතියි. මෙය කැබිනට් මණ්ඩලය අනුමත කරලා නැහැ කියලා පාර්ලිමේන්තුවේ විශාල කතිකාවතක් ඇති වුණා. හැබැයි, කැබිනට් මණ්ඩලය මේ ගිවිසුම අනුමත කළා. මේ ගැන ඒ තරම් කථා කරන්න අවශ්‍ය වාතාවරණයක් අපිට සකස් වෙලා තිබුණේ නැහැ. මොකද, පළමුවැනි වතාවට ඉදිරිපත් වෙලා දෙවැනි දවසේ තමයි මෙය සාකච්ඡා කළේ. අපි ඒ සාකච්ඡාවේදී කරුණු කීපයක් මතු කළා. අපේ ගරු අමාත්‍යවරුන් කීප දෙනෙකු මේ සම්බන්ධව අදහස් මතු කළා. අපිත් මේ සම්බන්ධව විවිධ කාරණා ගණනාවක් මතු කළා. ඒ අවස්ථාවේදී අපිට විශාල වශයෙන් සාකච්ඡා කරන්න බැරි වුණත් මලික් සමරවික්‍රම මැතිතුමා අපිට කිව්වේ මෙය ඉතාම ඉක්මනින් අත්සන් කළ යුතු කාරණයක් බැවින් මේකට අනුමැතිය ලබා දෙන්න කියලායි. හැබැයි, ඒ අනුමැතිය ලබා දීමේදී කරුණු තුනක් ගැන කැබිනට් මණ්ඩලය සාකච්ඡා කළා. එක් කාරණයක්

තමයි, නීතිපති දෙපාර්තමේන්තුව නීතිපතිතුමාගේ අදහස්, යෝජනා සැලකිල්ලට භාජනය කරලා, එතුමා දීලා තිබෙන නිර්දේශ අනිවාර්යයෙන් මේ ගිවිසුමට අනුගත වීමේදී -ක්‍රියාත්මක කිරීමේදී- වැදගත් කොට සලකලා, ඒවා එයට ඇතුළත් කරන්න කියන කාරණය. දෙවනුව දේශීය කර්මාන්ත සහ දේශීය සේවාවන් -services- පිළිබඳව ඇතිවෙලා තිබෙන තත්ත්වයන් සැලකිල්ලට භාජනය කරන්න කියන කාරණය. එහිදී අපි බොහොම පැහැදිලිව කිව්වා, දේශීය කර්මාන්තවලට සහ දේශීය සේවාවන්වලට නරක ලෙස බලපාන කාරණා -adverse effects- සම්බන්ධයෙන් ගිවිසුම්ගත වීමේදී ප්‍රශ්න තිබෙනවා නම් ඒවා වැළැක්වීම සඳහා කරුණාකරලා පියවර ගන්න කියන කාරණය.

ඊළඟට, adverse effects නැති වන විධියට, නැත්නම් තර්ජනාත්මක විධියට ලංකාවට බලපාන කාරණා සම්බන්ධයෙන්, -ප්‍රශ්න තිබෙන ඒවා සම්බන්ධව- කැබිනට් මණ්ඩලය විධියට සාකච්ඡා කරලා, යම් නිර්දේශ ඉදිරිපත් කරන්න නැවත අපිට ඉඩ දෙන්න කියන කාරණය පිළිබඳවත් කිව්වා.

ඒවාට යටත්ව අතිගරු ජනාධිපතිතුමා විශේෂයෙන්ම කිව්වා, ආරක්ෂාව පිළිබඳව තිබෙන කරුණු සම්බන්ධව එතුමා දැඩි අවධානයක් යොමු කරනවා, ඒ සම්බන්ධව යම් ක්‍රියා මාර්ගයක් ගන්න කියලා. පැහැදිලිව මේ කාරණාවලට යටත්ව තමයි මේ ගිවිසුම අත්සන් කළේ. මෙය අපි සිංගප්පූරුව සමඟ අත්සන් කරපු පළමු වෙළෙඳ ගිවිසුම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, වෙළෙඳ ගිවිසුම් පිළිබඳව අපට කිසිම ක්‍රමවේදයක් නැතිකම. ලංකා ඉතිහාසයේ මේ වන තුරු වෙළෙඳ ගිවිසුම් අත්සන් කිරීමේ කිසිම ක්‍රමවේදයක්, ජාතික ප්‍රතිපත්තියක් අපට තිබුණේ නැහැ. අපි ඉන්දියාව එක්ක වෙළෙඳ ගිවිසුමක් අත්සන් කළා. ඒ වෙළෙඳ ගිවිසුම අපට අවාසියි. ඒ ගිවිසුමෙන් රටට බොහෝ අවාසි අත් වුණු බව අපි දැක්කා. හැබැයි, ඒ වෙළෙඳ ගිවිසුම පිළිබඳව අපට ආපහු කථා කරලා වෙනස් කරන්න බැරි තැනකට තල්ලු වෙලා තිබෙනවා. ඒ වැරැද්ද තියෙද්දි, අපි නැවත ඉන්දියාව එක්ක ETCA ගිවිසුම අත්සන් කරන්න යනවා. නිදහස ලබා ගත්ත දවසේ ඉඳලා මේ වන තුරු වෙළෙඳ ගිවිසුම් සම්බන්ධව අපට ජාතික ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. අපි රටේ අනාගතය ගැන හිතනවා නම්, පළමුව කළ යුත්තේ අදාළ අමාත්‍යාංශය මඟින් අපේ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය මොකක්ද කියලා වැඩ පිළිවෙළක් සකස් කිරීමයි. එය වෙළෙඳ ගිවිසුම් අත්සන් කිරීමේදී ඉතා වැදගත් වනවා. මම එය කියන්නේ, මේ ආණ්ඩුවට පමණක් නොවෙයි. රටේ ඊළඟට බලයට එන සියලු ආණ්ඩුවලට මෙය බලපානවා.

දෙවැනි කාරණය මෙයයි. මීට පෙර අපි අත්සන් කරපු වෙළෙඳ ගිවිසුම් ගැන මේ වන තුරු කිසිම ශක්‍යතා අධ්‍යයනයක් කරලා නැහැ. ඒ ගිවිසුම් අපි ඔහේ අත්සන් කළා. සමහර ඒවා අපට අවාසියි. ඒත්, අපි සද්ද නැතුව නිකම් ඉන්නවා. ඊළඟට තව ගිවිසුමක් අත්සන් කරනවා. එහි වාසි අවාසි ගැනත් අපි කල්පනා කරන්නේ නැහැ. ඉතිහාසයේ අත්සන් කරපු ගිවිසුම්වල තිබුණු හොඳ මොනවාද නරක මොනවාද කියලා අපි කල්පනා කරන්නේ නැහැ. දැන් මෙතැන ඇමතිතුමාත්, රාජ්‍ය ඇමතිතුමාත් නැති වුණත් මම කියන්න ඕනෑ, කරුණාකරලා මේ අදහස් ගැන කල්පනා කරලා අනාගතයේදී වෙළෙඳ ගිවිසුම් සම්බන්ධව කටයුතු කරන්න කියලා.

ඊළඟ කාරණය තමයි, රැකී රක්ෂා ක්ෂේත්‍ර ආරක්ෂණ ක්‍රමවේදයක් තිබිය යුතු වීම. අපේ සමහර රැකියා තිබෙනවා. ඒ අවස්ථා තිබෙන්නේ අපේ රටේ ශ්‍රමිකයන්ට විතරයි. හැබැයි, දැන් අපි ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් හරහා ඒ අවස්ථාත් විදේශ ශ්‍රමිකයන්ට ලබා දෙන තත්ත්වයක් ඇති කරනවා නම්, විදේශ වෙළෙඳ ගිවිසුම් අත්සන් කිරීමේ රටේ මූලික න්‍යාය බවට පත් වෙන්නේ ඒකද කියලා මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමැතියි. අපි විදේශ වෘත්තිකයන්ට, ශ්‍රමිකයන්ට විවෘත කළ යුතු සේවා මෙන්ම විවෘත නොකළ යුතු සේවා තිබෙනවා. ඒ මොනවාද? අපි විවෘත කළ යුතු, රටට වැදගත්වන සේවා මොනවාද? අපේ ශ්‍රමිකයන් ඉන්න, අපේ වෘත්තිකයන් ඉන්න, රටට වැදගත්වන, විවෘත නොකළ යුතු සේවා මොනවාද? අපි ඒ සම්බන්ධව මේ වන තුරු කිසිම අධ්‍යයනයක් කරලා නැහැ. ඒ නිසා මෙය අද ඉතා දැවැන්ත ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. අද අපේ රටේ ඉන්න වෘත්තිකයන් සියල්ලම එකතු වෙලා වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණක් හදන තැනකට මේ ආණ්ඩුව යටතේ පත් වුණා. මොකක්ද ඒකට හේතුව? ඒ වෘත්තිකයන් විශ්වාස කරනවා ඔවුන්ගේ වෘත්තිය ආරක්ෂා කරන්න ආණ්ඩුවක් විධියට මේ අය කටයුතු කරන්නේ නැහැ, රටක් විධියට කටයුතු කරන්නේ නැහැ කියලා. අපේ රට වෙනත් රටක් එක්ක ගිවිසුම් අත්සන් කරන්න පෙර, වෘත්තීයවේදීන්ගේ අදහස් ගන්නේ නැතුව එක එක ඇමතිවරු අත්තනෝමතික ලෙස කටයුතු කිරීම තුළ මේ රටේ වෘත්තිකයන් ලොකු අසහනයකට පත් වෙමින් සිටිනවා. තම වෘත්තිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් මේ ආණ්ඩුව යටතේ පළමු වතාවට වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණක් හදන්න ඔවුන්ට සිද්ධ වෙලා තිබෙනවා. අපට ඒ ගැන කනගාටුයි. ආණ්ඩුවක් තම රටේ වෘත්තිකයන් රකින්නේ නැත්නම් ඒ වෘත්තිකයන්ට සිද්ධ වෙලා තිබෙනවා, වෘත්තිය රැක ගැනීම වෙනුවෙන් උද්ඝෝෂණ කරන්න, පෙළපාළි යන්න අවශ්‍ය ඒ වැඩ පිළිවෙළට ශක්තිය දෙන්න පෙරමුණු හදා ගන්න.

පසුගිය දිනවල වෛද්‍යවරුන්ගේ සංගමය වැඩ වර්ජනයක් කළා. ඒ වැඩ වර්ජනය නිසා මේ රටේ අහිංසක, දුප්පත් මිනිසුන්ට අමාරුයි. මේ රටේ අහිංසක, දුප්පත් මිනිස්සු බෙහෙත් ටික ගන්න ගියාම රෝහලේ දොස්තර මහත්මයා නැහැ; විශේෂඥ වෛද්‍යවරයා නැහැ.

ඔවුන් තමන්ගේ වෘත්තීය ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. ආණ්ඩුව නිසා ඒ වෘත්තිකයන්ට මේ රටේ අහිංසක, දුප්පත් ජනතාව වෙනුවෙන් කරන්න දෙයක් නැහැ. වෘත්තිය බේරා ගැනීම සඳහා ඔවුන්ට වැඩ වර්ජනයක් කරන්න සිද්ධ වුණා. මෙයට වඟ කියන්න ඕනෑ කවුද? ආණ්ඩුවක් විධියට ඔවුන්ගේ අදහස් ටික අහලා, ඒවාට හොඳින් ඇහුම් කන් දීලා, ඔවුන්ගේ වෘත්තිය විනාශ නොවන විධියට කටයුතු කළා නම් අද මේ ප්‍රශ්නය ඇති වන්නේ නැහැ. අනික් පැත්තෙන්, මේ ගත්ත වෘත්තීය ක්‍රියාදාමය වැරැදියි කියා ආණ්ඩුව එක එක අය ලවා කථා කරවනවා. ඒ නිසා වෘත්තිකයන් ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුව ගන්නා වූ ක්‍රියා මාර්ග ගැන මේ රටේ වෘත්තිකයන්ට පැහැදිලි ප්‍රශ්නයක් තිබෙනවාය කියන එක මා කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙළෙඳ ගිවිසුම නිසා අපට විශාල අවාසි ගණනාවක් සිද්ධ වෙමින් තිබෙනවා. මේ ගිවිසුමේ 7වන ඡේදය අනුව, ශ්‍රී ලංකාවේ වෘත්තිකයන්ගේ සුරක්ෂිතභාවය ආරක්ෂා කරන්න කටයුතු කරලා නැහැ. හැබැයි, සිංගප්පූරුව ඔවුන්ගේ වෘත්තිකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා නියාමනය සඳහා දැනටමත් ක්‍රමවේදයක් සකස් කරලායි තිබෙන්නේ. ලංකාවේ එවැනි ක්‍රියා මාර්ගයක් නැති වීම තුළ වෘත්තීයවේදීන්, තාක්ෂණිකවේදීන් ඇතුළු පුහුණු නුපුහුණු ඕනෑම ශ්‍රමිකයකුට ශ්‍රී ලංකාවේ දොරටු විවෘත කරන්න අද කටයුතු කරලා තිබෙනවා. මේ තුළින් ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් ඇහුවාම අපේ හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා කිව්වා, මෙහි Mode 4 වහලායි තිබෙන්නේ කියලා. Mode 4 වහලා තිබුණාට, Mode 3

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඇරලායි තිබෙන්නේ. ගිවිසුමේ උපලේඛනයේ 87201, 87203, 87204, 87205 යටතේ manpower companiesවලට පවා ලංකාවට ඇවිල්ලා, ලංකාවට අවශ්‍ය කරන ශ්‍රමිකයන් පිරිස ලෝකයේ ඕනෑම රටකින් ගෙන්වා ගන්න පුළුවන් වාතාවරණයක් සකස් කරලා තිබෙනවාය කියන එක මා පැහැදිලිව කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. WTO වැඩ පිළිවෙළ යටතේ Domestic Regulations හදන්න දැන් අපට අයිතිවාසිකමක් නැහැ. ඒ නිසා අපි දැන් විශාල අර්බුදයකට ලක්වෙලා තිබෙනවා. සිංගප්පූරුවේ ඉන්න ඕනෑම කෙනකුට ලංකාවට ඇවිල්ලා ලංකාවේ වෘත්තියක් - රැකියාවක්- කිරීමේ අවස්ථාව මේ ගිවිසුම හරහා ස්ථාපිතවෙලා තිබෙනවා. අපි ජනවාරි 16 වන දා කැබිනට් මණ්ඩලය අත්සන් කළ adverse effects, එහෙම නැත්නම් ඉතාම භයානක ප්‍රතිඵල දෙන, වෙළෙඳාම සඳහා සහ වෘත්තිකයන් සඳහා වන ප්‍රශ්නය විසඳන්න අවශ්‍ය කටයුතු මේ ගිවිසුම තුළින් ඉටු වී තිබෙනවාද කියලා මා අහන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. මේ ගිවිසුමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ගණනාවක් -නඩු 7ක්- පවරා තිබෙනවා. මේ රටේ වෘත්තිකයන් කියනවා, "වෙන කරන්න දෙයක් නැහැ, අඩුම තරමින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් හෝ මේ ප්‍රශ්නය බේරා දෙන්න"යි කියලා. මලික් සමරවික්‍රම ඇමතිතුමාගෙන් ඇහුවාම, එතුමා කිව්වා, "නැහැ, කිසි ප්‍රශ්නයක් නැහැ. අපට ඒ සම්බන්ධයෙන් කථා කරන්න පුළුවන්" කියලා. ගිවිසුම සම්බන්ධයෙන් කථාකරන්න පුළුවන්. හැබැයි, ගිවිසුම වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ. ගිවිසුම ගැන කථා කරන්න පුළුවන්; සාකච්ඡා පවත්වන්න පුළුවන්. සාකච්ඡා පැවැත්වූවාට, මේ ගිවිසුමේ Chapter 17 - Article 17.12 හි බොහොම පැහැදිලිව තිබෙනවා, "මේ ගිවිසුම indefinite" කියලා. "Indefinite" කියන එකෙන් අදහස් කරන්නේ මොකක්ද? ඒකෙන් කියන්නේ මෙය සදාකාලික ගිවිසුමක් කියන එකයි. ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සදාකාලික නැහැ. ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ පාර්ලිමේන්තුවට වෙනස් කරන්න පුළුවන්. හැබැයි ලංකාවත්, සිංගප්පූරුවත් අතර ඇති කරගත්ත මේ ගිවිසුම කවදාවත් වෙනස් කරන්න බැරි තත්ත්වයට පත් කරලා ඉවරයි. මේ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න පුළුවන්. හැබැයි මේ ගිවිසුමෙන් ඉවත් වෙන්න, එළියට යන්න පුළුවන් Exit Clause එකක් නැහැ; Termination Clause එකක් නැහැ. හැබැයි ගිවිසුම ගැන සාකච්ඡා කරන්න පුළුවන්. ගරු අග්‍රාමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් කිව්වාලු. එතුමා ඇවිල්ලා කිව්වාලු, " We can discuss." කියලා. අපිත් දන්නවා, ඒ ගැන කථා කරන්න පුළුවන් කියලා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. ඒ ගැන කථා කරලා, අපේ අදහස් අනුව අපට මේ ගිවිසුම වෙනස් කරන්න පුළුවන්ද? බැහැ. අපට ගිවිසුම වෙනස් කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකයි මෙතැන තිබෙන ප්‍රධාන අර්බුදය. ඒ නිසා මේ සිංගප්පූරු ගිවිසුම සදාකාලික ගිවිසුමක් බවට පත් වනවා විතරක් නොවෙයි, රටට අවශ්‍ය කරන අවස්ථාවලදී අපට මෙයින් ඉවත් වෙන්න අයිතියකුත් නැහැ, සමහර කාරණා තහනම් කරන්න අයිතියකුත් නැහැ.

අපට සාකච්ඡා කරන්න පුළුවන්. සාකච්ඡා කරලා බැරි තැන මොකක්ද වෙලා තිබෙන්නේ? සාකච්ඡා කරලා බැරිම තැන මොකක්ද වෙන්නේ? ඊළඟ කාරණය අනුව අපට යන්න පුළුවන්, arbitrationවලට. අපට arbitrationවලට යන්න පුළුවන්. හැබැයි, arbitration තිබෙන්නේ අපේ ලංකාවේ නොවෙයි. Arbitration තිබෙන්නේ සිංගප්පූරුවේ. අපේ රටේ කිසිම තැනක අපි අත්සන් කරපු කිසිම ගිවිසුමක් නැහැ. මේ වෙලාවේ ගරු තිලක් මාරපන මැතිතුමා ඉන්නවා. ලංකාවෙන් පිටට ගිහිල්ලා මේ ගිවිසුම අත්සන් කිරීම පිළිබඳව කථා කරන කොට මෙහි තිබෙන සමහර කාරණා පිළිබඳව ඔබතුමාගේ අදහස් එදා ඔබතුමා කිව්වා. හැබැයි, අද මේක ඇතුළේ සිද්ධ වෙලා තිබෙන කාරණය මොකක්ද? Arbitrationවලට ගිහිල්ලා අපි අන්තිමට කොහේද නිරවෙන්නේ? අන්තිමට සිංගප්පූරුවට ගිහිල්ලා ඩොලර් මිලියන ගනන්, බිලියන ගණන් දීලා තමයි අපට මේ සම්බන්ධයෙන් තිබෙන සාකච්ඡාවලට, බේරුම්කරණවලට යන්න සිද්ධ වෙන්නේ. මේ ගිවිසුම මලික් සමරවික්‍රම මැතිතුමා අත්සන් කරන්න පුළුවන්, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒකට නායකත්වය දෙන්න පුළුවන්. නමුත්, අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයා තමයි සිංගප්පූරුවේ ඉඳලා අද මෙම ගිවිසුම ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ සකස් කරන පුද්ගලයා බවට පත්වෙලා තිබෙන්නේ. අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයා දැන් ලංකාවේ නැහැ. එතුමා උසාවිවලින් හොයනවා. හැබැයි, අද අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයාට job එකක් දීලා තිබෙනවා, සිංගප්පූරුවේ සිට ලංකාවේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් සිංගප්පූරු-ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුමේ ප්‍රධාන බලාධාරියා විධියට කටයුතු කිරීමට. එම job එක දීලා තිබෙනවා. වෙන මොකක්වත් දීලා නැහැ.

එදා ගරු අග්‍රාමාත්‍යතුමා කිව්වා, "ඔහු මට විශ්වාසයි. මම ඕනෑම වෙලාවක ගෙනැල්ලා භාර දෙන්න සූදානම්" කියලා. ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඔහුවට ලංකාවට අරගෙන එන්න. දැන් ඔහුට විරුද්ධව රතු වරෙන්තු නිකුත් කරලා තිබෙනවා; නිල් වරෙන්තු නිකුත් කරලා තිබෙනවා; විවිධ වර්ගයේ පාට පාට ඒවා නිකුත් කරලා තිබෙනවා. නමුත් තමන්ට විශ්වාස වූ අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයාව ලංකාවේ උසාවිය හමුවට පමුණුවන්න ගරු අග්‍රාමාත්‍යතුමා මේ වන තුරු කටයුතු කරලා තිබෙනවාද, නැද්ද කියලා මම අහන්න කැමැතියි. කවදාද එතුමාව උස්සාගෙන එන්නේ? එතුමාව උස්සාගෙන එන්නේ නැහැ. දැන් සිංගප්පූරුවේ office එකක් හදලා, අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයා තමයි සිංගප්පූරු- ශ්‍රී ලංකා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා, එහි ප්‍රධානියා විධියට කටයුතු කරන්නේ. මේක තමයි අද ඇතිවෙලා තිබෙන තත්ත්වය.

මම තවත් කාරණයක් කියන්න කැමැතියි. ආණ්ඩුවේ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ඇති උප ලේඛනය අරගෙන බැලුවාම, "This Annex is left empty intentionally." කියලා තමයි එහි 11-බී වගන්තියේ තිබෙන්නේ. එම පිටුව blank. අනාගතයේ ඒක හදන විධිය review කරලා පෙන්වන වැඩ පිළිවෙළ මේක තුළ නැහැ. අඩුම තරමින් review කරන ක්‍රියාදාමය පාර්ලිමේන්තුවට එන වැඩ පිළිවෙළක්වත් හදලා නැහැ. ඒ නිසා මේක නැවතත් review කරන්න බැරි තැනකට තල්ලු කරලායි තිබෙන්නේ කියලා මම කියනවා. ඒ විතරක් නොවෙයි, ඒ Chapter එක අරගෙන බලන්න. සියයට 20ක්ව තිබෙන Customs Duty එක සියයට බින්දුව දක්වා අඩු කරන්න විෂය භාර අමාත්‍යවරයාගේ තනි මතයට පුළුවන්. මේ ගිවිසුම ඇතුළේ සහල්, එළවළු ආදී ඕනෑම දෙයක්, මේ රටට වැදගත් වන ඕනෑම භාණ්ඩයක්, ඕනෑම වෙලාවක අඩු රේගු බද්දක් යටතේ ලංකාවට ආනයනය කරන්න පුළුවන්. උදාහරණයක් විධියට ගත්තොත්, ලංකාවට සහල්වල ප්‍රශ්නයක් තිබෙන වෙලාවක ඇමතිවරයාට පුළුවන් තමන්ට ඕනෑ විධියට රේගු බද්ධ සියයට බිංදුවයි කියලා ගහලා tax එකක් නැතුව ගෙන්වන්න.

ඒ විතරක් නොවෙයි, ඕනෑම භාණ්ඩයක් -ලංකාවේ නිෂ්පාදනය කරන භාණ්ඩයක් වුණත්- tax එක සියයට බිංදුවට අඩු කරලා ගෙන්වන්න අමාත්‍යවරයාට පුළුවන්. ගරු මලික් සමරවික්‍රම මැතිතුමා මෙතැන පොඩ්ඩක් ඉඳගෙන ඉන්නවා නම් මම කැමැතියි. මොකද හේතුව, මේක ඔබතුමා කියෙව්වොත් හොඳයි. මෙහි තිබෙන කාරණා කිහිපයක් පිළිබඳව මම කිව්වා. Chapter 17

එකේ තිබෙන කාරණය ගැනත් මම කිව්වා. "Indefinite" කියලා බොහොම පැහැදිලිව එහි සඳහන් කරලා තිබෙනවා. කරුණාකරලා Chapter 17 කියවලා බලන්න. Chapter 17 - Article 17.12 බොහොම පැහැදිලිව තිබෙනවා, මේ ගිවිසුම සදාකාලිකයි කියලා. මේකෙන් ඉවත් වෙන්න කිසිම ක්‍රමයක් නැහැ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු මන්ත්‍රීතුමා,-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ කාලයෙන් අඩු කරනවා නම්, කථා කරන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු මන්ත්‍රීතුමා, කැබිනට් මණ්ඩලය මේක approve කරන කොට ඔබතුමාත් කැබිනට් මණ්ඩලයේ සිටියා. ඒ වෙලාවේ ඔබතුමා ඔය කිසි දෙයක් කිව්වේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දැන් ඒ ගැනත් කිව්වා. ඔබතුමා මෙතැන හිටියේ නැහැ නේ. ඔබතුමා මෙතැන හිටියේ නැහැ. ගරු ඇමතිතුමනි, මම බොහොම පැහැදිලිව කිව්වා, "මමත් ඒ කැබිනට් මණ්ඩලය ඇතුළේ සිටියා, හැබැයි ඒක කැබිනට් එකට ගේනකොට ඒ පිළිබඳව සාකච්ඡා කරන්න ලැබුණේ නැහැ" කියලා. අපට කථා කරන්න ලැබුණේ නැහැ. ඔබතුමා කිව්වා, "මේක හදිසියේ දාන්නේ, ලබන 23වැනිදාට මේක අත්සන් කරන්න තිබෙනවා. කරුණාකරලා මේක approve කරලා දෙන්න" කියලා. මලික් සමරවික්‍රම ඇමතිතුමනි, මම ඔබතුමාට බොහොම ගරු කරනවා. හැබැයි, ප්‍රශ්නය ඒක නොවෙයි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එසේම මමත් ඔබතුමාට ගරු කරනවා. හැබැයි, මේ Cabinet Paper එක එදාට කලින් ලබා දුන්නා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලබා දුන්නේ නැහැ. මම ඔබතුමාට කියන්නම්, අවසානයේදී අපි කරුණු තුනක් ගැන කිව්වා.

පළමු කාරණය තමයි නීතිපතිතුමාගේ නිර්දේශ පිළිගන්නය කියන එක. දෙවනුව කිව්වා, adverse impacts on domestic industries and services සම්බන්ධව. දැන් මේක ආරක්ෂා වෙලා තිබෙන්නේ කොහෙද? ඊළඟට, ඔබතුමා Chpater 7 - Page 01 එකෙන් කාරණයක් අරගෙන කියනවා, Mode 4 එක වහලායි තියෙන්නේ කියලා. හැබැයි, Mode 3 එක open කරලයි තිබෙන්නේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
නැහැ. Open කරලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා උපලේඛනය අරගෙන බලන්න. 87201, 87203, 87204, 87205 -මේ ටික- open කරලයි තිබෙන්නේ. මම ඔබතුමාට බොහොම ගෞරවයෙන් මේක කියන්නේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
They are all investment-related only. We have not opened Mode 4. We have not done anything with regard to that at the moment.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Can you please go through this and tell me? We are very good friends. So, I do not want to have any bitter argument with you. But, what I am asking you is to go through this. Actually, I read the whole Agreement two or three days back because so many organizations accuse you and the Government. So, I just wanted to check all these things. So, as a lawyer by profession, that is why I am asking you to go through this and see what has happened. Please, take this very seriously. මම ඒකයි ඔබතුමාට කියන්නේ. ඔබතුමාගේ අවංකභාවය ගැන මට ප්‍රශ්නයක් නැහැ. නමුත්, මම කියන්නේ කරුණාකර මේවා ගැන බලන්න කියලායි. ඒ තුළ මොනවාද සිදුවෙලා තිබෙන්නේ කියලා අපට බලන්න පුළුවන්. ඊළඟට, මම කියන්න කැමැතියි - [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Let the Hon. Minister explain that.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
He explained.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Let him explain now.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
These are all investment-related only. There is nothing new. But, if you want further explanation, I can

[ගරු මලික් සමරවික්‍රම මහතා]

talk to you after this. But, what I want to tell you is that these are only investment-related. Persons can come here only for specialized jobs. But, for that also, the visas will have to be obtained. They cannot just come as and when they want.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
You have categorically said that you have closed Mode 4. But, when you take Mode 3, it is already opened and that is why there are many categories.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
No, we are not doing anything that is not being done at present.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
Okay. But, anyway, please go through this.

ඊළඟට, State Land සම්බන්ධව මම කියන්න කැමැතියි. සිංගප්පූරුවේ තිබෙන State Landවලින් සියයට 90ක් මේ ගිවිසුමට පිටින් තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, please go through ANNEX 7-B on Page 02. මෙහි බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා, සිංගප්පූරු රජයට අයත් නොවන ඉඩම් සම්බන්ධව. ඉතාම කුඩා අකුරෙන් සඳහන් කර තිබෙන සටහනක්. මේකේ සඳහන් වන විධියට State Land කිව්වාම, සියයට 90ක් එතැනින් ඉවත් වෙනවා. අපි පේළි 4කින් කියලා තිබෙන කාරණය ඒ ගොල්ලන් පිටු එකහමාරකින් කියලා තිබෙනවා, "මෙන්න මේ මේ දේවල් තමයි ඇතුළත් වෙන්නේ, අනෙක් ඒවා ඇතුළත් වෙන්නේ නැහැ" කියලා. මේක විශාල පොතක්. හැබැයි, මම ඒක හොඳට කියෙව්වා. ඒකයි මම කිව්වේ, මේකේ වැදගත් කාරණා ගණනාවක් තිබෙනවා කියලා. වෙනත් ආකාරයකින් විවේචනයක් කරන්න මට වුවමනාවක් නැහැ. මේවා ගැන අපි හොයා බලමු, සාකච්ඡා කරමු. මොකද, මෙවැනි වෙළෙඳ ගිවිසුමක් ඇති කරපු පළමුවැනි අවස්ථාවේ මම ඔබතුමාගෙන් ඉල්ලනවා, වහාම මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන්න කියලා. කරුණු හතරක් ගැන මම ඔබතුමාට දැන් කිව්වා. මේ වෙළෙඳ ගිවිසුම් ගැන ජාතික ප්‍රතිපත්තියක් හදන්න. ඒක තමයි කළ යුතු පළමු දේ. ඊළඟට, පරණ ගිවිසුම් ගැන ශක්‍යතා අධ්‍යයනයක් කරන්න. තුන්වැනි කාරණය විධියට මේ ක්ෂේත්‍ර විවෘත කළ යුත්තේ මොන කාරණාවලටද කියන එක සම්බන්ධයෙන් වෙනම සාකච්ඡා වටයක් තියන්න. අනාගතයේ ඔබතුමා තවත් වෙළෙඳ ගිවිසුම් ගණනාවක් අත්සන් කරන්න හදනවා. ඒ අත්සන් කරන කොට රටට වාසි සහගත තත්ත්වයන් ගන්න නම්, මේවා පිළිබඳව යම් අධ්‍යයනයක් කළ යුතුයි කියලයි මම විශ්වාස කරන්නේ. අපට අවාසි සහගත සමහර තැන් තිබෙනවා. මම නැහැයි කියන්නේ නැහැ. ඒ නිසා මෙවැනි කරුණු පිළිබඳව කරුණාකර අවධානය යොමු කරන්න. එහෙම නැති වුණොත් එක පැත්තකින් නොමඟ යැවීමක් සිදු වෙනවා වාගේම අනෙක් පැත්තෙන් රටට ආර්ථික ක්‍රමවේදයක් හදාගන්න තිබෙන ක්‍රියාදාමය කඩාකප්පල් වෙනවා. තුන්වැනි කාරණය විධියට මේකෙන් වෘත්තිකයන් දැඩි ලෙස පීඩාවට පත් වෙනවා. ඒ නිසා කරුණාකර මේ කාරණා පිළිබඳව තමන්ගේ අවධානය යොමු කළ යුතුයි කියන අදහස ගරු ඇමතිතුමාට මතක් කරමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඊට පෙර, මූලාසනය සඳහා ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
Sir, I propose that Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු ලක්කි ජයවර්තන අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, මාණ්පුමිකු (වෛත්තිය කලානිති)(තිරුමති) තුසිතා විජේමාන්න අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. (DR.) (MRS) THUSITHA WIJEMANNA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.26]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය, ගරු මලික් සමරවික්‍රම මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන් අපේ මිත්‍ර ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම සම්බන්ධව විවේචනය කළා. හැබැයි, ඒ ගිවිසුම අත්සන් කළ කැබිනට් මණ්ඩලයේ හිටපු සාමාජිකයකු විධියටයි එතුමා කථා කළේ. කෙසේ වෙතත්, එතුමා එහි තිබෙන අඩු පාඩු පෙන්වා දුන්නා.

හැබැයි, අපි දන්නා විධියට නම් ශ්‍රී ලංකා - සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම පිළිබඳව රටේ මතයක් ඇතිවෙලා තිබෙන්නේ වෘත්තිකයන් මේ රටට ගලා එනවාය කියන කාරණය මුල් කරගෙනයි. මෙන්න මේ කාරණය කෙරෙහි මම මේ ගරු සභාවේ යොමු කරවන්න කැමැතියි. සිංගප්පූරුවේ වෛද්‍යවරයකුගේ සාමාන්‍ය මාසික ආදායම රුපියල්වලින් ගත්තොත්, මිලියන දෙකකට වැඩි ප්‍රමාණයක් වෙනවා. ඉංජිනේරුවරයෙක් රුපියල් මිලියන 1.5කට වැඩි මාසික ආදායමක් ලබනවා. විශේෂඥ වෛද්‍යවරයෙක් channelling ගාස්තු විධියට එක රෝගියකුගෙන් සාමාන්‍යයෙන් රුපියල් දසදහසකට වැඩි මුදලක් ගන්නවා. අපේ වෘත්තිකයන්, වෛද්‍ය අංශ, වෛද්‍ය සංගම් කලබල වෙලා තිබෙන්නේ සිංගප්පූරුවේ සිටින වෛද්‍යවරු අපේ රටේ වැඩ කරයිද කියන ප්‍රශ්නය නිසාද කියා මට හිතෙනවා. හැබැයි, මම පැහැදිලිවම කියන්න ඕනෑ, සිංගප්පූරුවේ වෛද්‍යවරුන්ට රැකියා පිළිබඳ ප්‍රශ්නයක් නැති බව. සිංගප්පූරුවේ සිටින ඉංජිනේරුවන්ටත් රැකියා පිළිබඳ ප්‍රශ්නයක් නැහැ; වෘත්තිකයන්ටත් රැකියා පිළිබඳ ප්‍රශ්නයක් නැහැ; මෙහේ ඇවිත් වැඩ කරන්න සිංගප්පූරුවේ කම්කරුවොත් නැහැ. මොකද, එහේ පාරවල් ගණුනේ රැකියා නැති කම්කරුවෝ හෝ තාක්ෂණවේදීන් හෝ ශිල්පීන් ඉන්නා බවක් අපි නම් දකින්නේ නැහැ. වෙනත් රටවලින් ඇවිත් ඕනෑ තරම් පිරිස් සිංගප්පූරුවේ සේවය කරනවා. හැබැයි, සිංගප්පූරුව දියුණු රටක් නිසා අද රජයක් විධියට අපි බලාපොරොත්තු වෙන්නේ ඔවුන් මේ රට තුළ ආයෝජන ඇති කරයි කියන කාරණයයි. එම ආයෝජන ඇති කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කර ගන්නත්, එම ආයෝජන දිරිමත් කරන්න ඒ ආයෝජකයන්ට අවශ්‍ය පහසුකම් ලබාදීමේ අරමුණත් ඇතිව තමයි මේ ශ්‍රී ලංකා - සිංගප්පූරු වෙළඳ ගිවිසුම අත්සන් කළේ කියන එකයි මගේ දැනීමේ හැටියට මට කියන්න තිබෙන්නේ.

අවශ්‍යතා මත, ඕනෑ නම් වසරින් වසර -වසර අවසානයේදී- මේ ගිවිසුම වෙනස් කිරීමේ හැකියාව තිබෙනවාය කියා අපේ ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා පැහැදිලිවම කිව්වා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මන්ත්‍රීතුමනි, කොහේදීද එතුමා ඒක කිව්වේ කියා මට පොඩ්ඩක් කියනවාද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා පැහැදිලිවම ඒ බව කිව්වා. මම ඒක විශ්වාස කරනවා. ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා සාමාන්‍යයෙන් අසත්‍ය ප්‍රකාශ කරන කෙනෙක් නොවෙයි. ඒ නිසා මලික් සමරවික්‍රම ඇමතිතුමා කිව්වේ සත්‍යයක් කියා මම විශ්වාස කරනවා. අපි කොරහේ කිඹුල්ලු දකිනවා වාගේ, හැම දාම වෙළෙඳ ගිවිසුම්වලට භය වුණා. අපි ජාත්‍යන්තරය සමඟ, දියුණු රටවල් සමඟ සම්බන්ධ වෙලා කටයුතු කරද්දි නිතරම ඒවායේ වාසි පැත්ත තමයි බලන්න ඕනෑ. ඒවායේදී පොඩි පොඩි අවාසිසහගත තැන් තිබෙන්න පුළුවන්. නමුත් සමස්තයක් විධියට රටේ ආයෝජන වැඩිවීමට මේ ගිවිසුම පිටිවහලක් වෙනවාය කියන එක තමයි අපේ හැඟීම. මේ ගිවිසුම තුළින් සිංගප්පූරු ආයෝජන අපේ රටට ගලාගෙන එද්දී, රට තුළ ආර්ථික ශක්තිය වැඩි වෙද්දී, රැකියා වියුක්තියෙන් ඉන්න අපේ විශාල පිරිසකට ඒ රැකියා අවස්ථා උදාවෙන්න තිබෙන ඉඩකඩ වැඩියි. අද අපේ රටේ විශාල පිරිසක් වෙනත් රටවලට ගිහින් සේවය කරනවා.

අපේ ඉංජිනේරුවන්, තාක්ෂණවේදීන් විශාල ප්‍රමාණයක් මැදපෙරදිග රටවල වැඩ කරනවා; සිංගප්පූරුවේ, මැලේසියාවේ අපේ විශාල පිරිසක් වැඩ කරනවා. ඒ නිසා මේ ගිවිසුම හරහා අපේ රටට වෙනත් රටවලින් ශ්‍රමිකයන්, නැත්නම් තාක්ෂණවේදීන්, වෘත්තිකයන් ගලාඒමේ අවදානමක් තිබෙනවාය කියන කාරණය ගැන අපි කිසිසේත්ම බිය විය යුතු නැහැ.

අපේ ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා මැදිහත් වෙලා පටන් ගත් සුවසැරිය ambulance service එක ආරම්භ කරද්දිත් මේ වාගේම විශාල කාලගෝට්ටියක් ඇතිවුණු ආකාරය අපි දැක්කා. ඒ ගැන මේ පාර්ලිමේන්තුවෙත් කෑ ගැහුවා. ඔය අද කෑ ගහන GMOA එකත් ඒකට කෑ ගැහුවා. "ඔන්න ඉන්දියාවෙන් nursesලා ගේනවා; දොස්තරලා ගේනවා; driversලා ගේනවා; ඔත්තුකරුවෝ ගේනවා" කියා ඒ ගොල්ලෝ කිව්වා. හැබැයි, අද ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් විශාල පිරිසක් මේ සුවසැරිය ගිලන් රථ සේවයේ වැඩ කරනවා. ඒ විතරක් නොවෙයි, මේ ගිලන්රථ සේවය තුළින් රෝගීන්ට නොමිලයේ පහසුකම් සැලසෙනවා. ඒ නිසා, මේ හැම දෙයක් ගැනම අපි කල් ඇතුව පුරෝකථනය කරනවාට වඩා, මේ කටයුතු දිහා යම්කිසි අවධානයකින් බලාගෙන ඉඳලා, වෙන්නේ මොනවාද කියලා බලලා ඒවායේ අඩුපාඩු කියන එක තමයි හොඳම දේ කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි අද ජාත්‍යන්තරයට ආරාධනා කරන, ආයෝජකයන්ට ආරාධනා කරන, ආයෝජකයන්ට සුදුසු වටපිටාවක් සකස් කරන රටක් බවට පත්වී සිටිනවා. 2017දී අපේ ඍජු විදේශ ආයෝජන විශාල ප්‍රමාණයකින් වැඩිවෙලා තිබෙනවා.

2018- 2019 වසරවල මේ ප්‍රමාණ තවදුරටත් වැඩිවෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා එම අමාත්‍යාංශය තුළින් ඊට අවශ්‍ය පරිසරය නිර්මාණය කර තිබෙනවා. ඊට අවශ්‍ය ශක්තිය ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමන්ලා හිටපු කැබිනට් මණ්ඩලයෙන් ලබා දී තිබෙනවා. එම නිසා අර සාම්ප්‍රදායික විපක්ෂයේ කාර්ය භාරය ඉෂ්ට කරන්නේ නැතිව, මේ ගැන ධනාත්මක විවේචන ඉදිරිපත් කළා නම් හොඳයි කියන කාරණයයි අපිට කියන්න තිබෙන්නේ.

අපේ රජය අද සමාජ වෙළෙඳ ආර්ථිකය මත කටයුතු කරන රජයක්. ඊයේ පෙරේදා සිට අපි දැකපු දෙයක් තිබෙනවා. ඒකාබද්ධ විපක්ෂයේ යම් කණ්ඩායමකගේ ජනාධිපති අපේක්ෂකයා විධියට හඳුන්වන ගෝඨාභය රාජපක්ෂ මහත්මයලාත් මොකක්ද "මහක් " ය කියා එකක් කියාගෙන, මේ සමාජ, ආර්ථික වෙළෙඳ පොළ තවත් ආකාරයකින් රට තුළ ප්‍රතිනිර්මාණය කරනවා. එසේ නැත්නම් අපේ වැඩ පිළිවෙළ කාබන් කොපියක් විධියට ඉදිරිපත් කරනවා. මේවා දකිද්දී අපිට එක පැත්තකින් සතුටක් දැනෙනවා. තවත් පැත්තකින් මේ කථා කරන අයගේ පසුගිය පැටිකිරිය දකිනකොට මංගල සමරවීර ඇමතිතුමා කිව්වා වාගේ මේක, "වියත් මහක්" ද, නැත්නම් "විපත් මහක්" ද කියන සැකය ඇති වෙනවා. මට වෙලාවකට මේක, "කියත් මහ" ක්ද කියා දැනෙනවා. මොකද මිනී මෝරුන්ගේ කටේ තිබෙන්නේ කියත් වාගේ බොහොම තියුණු දත් සෙට් එකක්. මිනී මෝරු පාවිච්චි කර, කට්ටිය අතුරුදහන් කරපු - අස්ථානගත කරපු, - යුගයකුත් මේ රටේ තිබුණා. ඒ යුගයට ද මේ "වියත් මහ" ඔස්සේ "කියත් මහ" ගමන් කරන්නේ කියන ඒ විපත අපිට දැනෙනවා. ඒ වාගේම මේ "වියත් මහ" ඔස්සේ ඒකාබද්ධ විපක්ෂයේ ජනාධිපති අපේක්ෂක තරගයකුත් ඇවිත් තිබෙනවා. දැන් අපේ එක්සත් ජාතික පක්ෂය පැත්තේත් තරගයක් තිබෙනවා. හැබැයි, ඒ තරගය තිබෙන්නේ දක්ෂයින් අතරයි. හැබැයි ඒකාබද්ධ විපක්ෂය පැත්තේ තරගය තිබෙන්නේ එකම පවුලේ පිරිස අතරයි. දැන් මේක සොයා බලුවොත්, මේ

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

තරගය ඇතුළේ රාජපක්ෂ නම අගට යෙදෙන්නේ නැති කවුරුවත් නැහැ. එක්කෝ ජී. රාජපක්ෂ, නැත්නම් එන්. රාජපක්ෂ, එසේ නැත්නම් බී. රාජපක්ෂ, එසේ නැත්නම් එම්. රාජපක්ෂ, එසේ නැත්නම් සී. රාජපක්ෂ. මේ අය ගැන තමයි කථා වෙන්නේ. රාජපක්ෂ නාමයෙන් තොර ජනාධිපති අපේක්ෂකයෙක් ගැන ඒකාබද්ධ විපක්ෂයේ කථා වෙන්නේ නැහැ; නිර්මාණය වෙන්නේත් නැහැ. ඒකයි ඒ දේශපාලන පක්ෂයේ -පිලේ- ඇත්ත තත්ත්වය. මොකද, එයින් එහා කෙනෙකුට ඉඩක් කඩක් නැහැ. එක්සත් ජාතික පක්ෂය කියන්නේ ඊට එහා ගිය දැවැන්ත දේශපාලන ව්‍යාපාරයක්. ඒ ව්‍යාපාරය තුළ රනිල් වික්‍රමසිංහ වෙන්න පුළුවන්; සජිත් ප්‍රේමදාස වෙන්න පුළුවන්; නවීන් දිසානායක වෙන්න පුළුවන්; අකිල විරාජ් කාරියවසම් වෙන්න පුළුවන්; හරින් ප්‍රනාන්දු වෙන්න පුළුවන්; ඉරාන් වික්‍රමරත්න වෙන්න පුළුවන්; ඒ වාගේ තවත් අපේ නායකයෝ විශාල පිරිසක් පෙළ ගැසී ඉන්නවා. - රුවන් විජයවර්ධන රාජ්‍ය ඇමතිතුමාත් මෙතැන ඉස්සරහ ආසනයේ වාඩිවෙලා ඉන්නවා; බොහොම වාසනාවන්ත මුහුණක්. - අනාගතය ගැන කථා කරන්න අපිට නායකයෝ ඕනෑතරම් ඉන්නවා. ඒකාබද්ධ පිල වාගේ, "රාජපක්ෂවරුන්ගෙන් තොර නායකත්වයක් නැත" කියන එකක් එක්සත් ජාතික පක්ෂයට නැහැ. අපිට එහෙම එකක් නැහැ. එක්සත් ජාතික පක්ෂය නමක් මත පදනම් වූ පක්ෂයක් නොවෙයි. එම නිසා අපි පැහැදිලිව කියනවා, "ඒ අවශ්‍ය නායකත්ව පෙළ ගැස්මත් එක්ක අපි ඉදිරි අනාගතයේ මේ රට සංවර්ධන දිසාව කරා අනිවාර්යයෙන්ම අරගෙන යනවා" කියලා. එම නිසා "වියත් මහ" එක්සත් ජාතික පක්ෂයේ 2025 වැඩ පිළිවෙළ කොපි කළාට, ඒකට 2030 කියා දමාගෙන ඒ වැඩසටහන ක්‍රියාත්මක කළාට, ඒක සැබැවින්ම අපේ වැඩ පිළිවෙළේ කාබන් කොපියක් විධියට තමයි වෙනත් ආකාරයකින් ඉදිරිපත් කරන්නේ. හැබැයි මේක ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා පාවිච්චි කරන ස්ථානය ගැනත් අපි කියන්න ඕනෑ. රාජපක්ෂවරුන්ගේ කාලයේදී සින්නක්කරව චීනයට විකුණන ලද ෂැන්ග්‍රි-ලා හෝටලය ඇතුළේ ඉඳගෙන, ඒකෙන් නොමිලයේ පහසුකම් ටික ලබා ගෙන, ජාතිකත්වය ගැන කියනවා. හැබැයි සින්නක්කරව විකුණපු තැන ඉඳගෙනයි මේ කථා කරන්නේ. දකුණු අත පැත්තෙන් තිබෙන්නේ Port City එක.

සින්නක්කරව විකුණපු අපේ ඒ භූමිය දකුණු පැත්තෙන් තිබෙනවා. එතැන ඉඳගෙන "වියත් මහ" ගැන කථා කරනවා. "වියත් මහ" නිර්මාණකරුවෝ පිඹුරු පත් සකස් කර මේ ගොඩනැඟිල්ල - භූමිය - සින්නක්කරව විකුණා රටට අහිමි කරන්න කටයුතු කළ පිරිසක්. එම නිසා ඒ අයගේ ඇත්ත තත්ත්වය රටේ ඉන්න ජනතාව දන්නවාය කියන කාරණය අපි පැහැදිලිවම කියනවා. එම නිසා ජනතාව ගොනාට අන්දන්න, ජනතාවට වැරදි අවබෝධයක් ලබා දෙන්න කටයුතු කරනවා නම්, ජනතාව ඒක ක්ෂණයකින් අවබෝධ කර ගන්නවා. විශේෂයෙන් දේශීය ව්‍යාපාරිකයෝ නහාසිටුවන්න මේ රජය විශාල කාර්ය භාරයක් කරලා තිබෙනවා. මේ ආණ්ඩුව බදු වැඩි කළා කියලා සමහරු මතයක් ස්ථාපිත කරන්න හදනවා. හැබැයි, මෙපමණ කාලයක් මේ රටේ බදු ආදායමෙන් සියයට 80ක් සඳහා දායකත්වය දුන්නේ රටේ දුප්පත් ජනතාව. එලෙස සියයට 80ක දායකත්වයක් දුප්පත් ජනතාව ලබා දුන්නේ රටේ සමස්ත ජනතාවගෙන්. ව්‍යාපාරිකයින්ගෙන්, ධනවතුන්ගෙන් එකතු කෙරුවේ සියයට 20යි. අද මේ සියයට 80 සීමාව සියයට 60 දක්වා අරගෙන එද්දි මේ අය කෑ ගහනවා, "බදු වැඩි කරනවා - බදු වැඩි කරනවා." කියලා. හැබැයි, දුප්පත් මිනිසුන්ට සමහර විට මේක නොතේරෙනවා වෙන්න පුළුවන්. ඇත්ත කථාව, දුප්පතුන්ගෙන් එකතු කරන බදු ප්‍රමාණය අඩු කරලා ධනවතුන්ගෙන් එකතු කරන බදු ප්‍රමාණය වැඩි කරන්නයි අපි කටයුතු කරන්නේ.

මීට ටික වෙලාවකට කලින් මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කථා කරද්දි කිව්වා, "විදේශ ආයෝජනවලින් Super Gain Tax එක අය කරනවා." කියලා. පැහැදිලිවම මලික් සමරවික්‍රම ඇමතිතුමා කිව්වා, "ඒ කරපු ආයෝජනය වාගේ දෙගුණයක් ලාභ ලැබුවාට පස්සේ තමයි ඒ ගොල්ලන්ගෙන් ඒ බද්ද අය කරන්නේ." කියලා. මලික් සමරවික්‍රම ඇමතිතුමා එහෙම කියද්දිත්, ඒ විදේශ ආයෝජකයෝ සතුටු කරන්න ඕනෑ, එම නිසා ඒ අයගෙන් බදු අය කරන්න ඕනෑ නැහැයි කියන පදනමේ සිට මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කථා කළා. මේ දෙබිඩි පිළිවෙත අපට ප්‍රශ්නයක්. රටේ ජනතාව අවබෝධ කර ගන්නවා, මේ ගොල්ලන් කවුරු වෙනුවෙන්ද පෙනී සිටින්නේ කියන කාරණය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔව්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

පෙට්‍රෝලියම් බදු, දුම්කොළ බදු, ස්ප්‍රිතු බදු මේ ගිවිසුම්වලට ඇතුළත් වන්නේ නැහැ. එම නිසා මේ ගිවිසුම්වලින් රජයේ ආදායම් ආරක්ෂා වෙලා තිබෙනවා. එහෙම නම්, මේ ගොල්ලන් මේ කථා කරන්නේ මොන මොන කාරණා ඉස්මතු කරන්නද? ඒ වෙන මොකකටවත් නොවෙයි. රජය ආයෝජකයන් දිරිගන්වන්න, රටට වැඩි ආයෝජන ප්‍රමාණයක් ගෙනෙන්න කටයුතු කරද්දි ඒවාට අකුල් හෙළන්න, රට තුළ අස්ථාවරභාවයක් ඇති කරන්න මේ අය කටයුතු කරන ආකාරයක් තමයි පෙනෙන්නේ.

ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් ආශීර්වාදය යටතේ ගරු මලික් සමරවික්‍රම මැතිතුමා ක්‍රියාත්මක කරන සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම තුළින් රටේ ආයෝජන වැඩිවනවා; ආයෝජකයෝ දිරිමත් වනවාය කියන කාරණය අපි පැහැදිලිවම කියනවා. ඒ වාගේම මෙහි යම් අඩු පාඩුවක් තිබෙනවා නම්, ඉදිරියේදී ඒවා නිවැරදි කරන්න කටයුතු කරන්න පුළුවන් තත්ත්වය මත මේ ගිවිසුම අත්සන් කරලා තිබෙනවාය කියන කාරණයත් මතක් කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා හට කථා කරන්න අවස්ථාව උදා කර දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. S. Viyalanderan. You have ten minutes.

[பி.ப. 5.40]

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாட்டிலே பொருளாதார ரீதியான புதிய திட்டங்களையும் வர்த்தக உடன்படிக்கைகளையும் மேற்கொண்டு அதனூடாக நாட்டைக் கட்டியெழுப்புவது பற்றி நாங்கள் பேசிக் கொண்டிருக்கின்ற இந்தத் தறுவாயிலே, பொருளாதார

ரீதியாக வளமுள்ள ஒரு நாடாக மாற்றவேண்டுமானால் முதலாவதாக அரசியல் ரீதியிலான ஸ்திரத்தன்மை பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். எமது நாடு அரசியல் ரீதியாக காத்திரபூர்வமான, ஆரோக்கியமான ஸ்திரத்தன்மையைப் பேணுகின்றதா? என்பதைப் பற்றியும் சிந்திக்க வேண்டும். ஆனால், இன்று வெளிநாடுகளில் இருக்கின்ற முதலீட்டாளர்கள் தங்களுடைய முதலீடுகளை இலங்கையிலே முதலீடு செய்வதற்குத் தயங்குகின்ற நிலைமை தொடர்ச்சியாகக் காணப்படுகின்றது. இந்த நிலைமை மாற்றப்பட வேண்டுமானால், இந்த நாட்டிலே முதலாவதாக அரசியல் ரீதியிலான ஸ்திரத்தன்மை ஏற்படுத்தப்பட வேண்டும்; பேணப்பட வேண்டும். அவ்வாறான ஒரு நிலைமை உருவாகும்பொழுதுதான் இந்த நாட்டிலே சர்வதேச ரீதியிலான பல வர்த்தக உடன்படிக்கைகளை எங்களால் மேற்கொள்ள முடியும்; பல முதலீட்டாளர்களைக் கொண்டுவர முடியும்; பல திட்டங்களை, திட்ட முன்மொழிவுகளை அமுலாக்கம் செய்ய முடியும். இந்த நாட்டிலே மூன்று தசாப்தத்துக்கும் மேலாகப் புரையோடிக் காணப்படுகின்ற தேசிய இனப் பிரச்சினைக்கான ஒழுங்கமைக்கப்பட்ட ஒரு தீர்வு இதுவரை எட்டப்படாத நிலைமையிலே, அரசியலமைப்பு மாற்றத்திற்கூடாக அதற்கான தீர்க்கமானதொரு முடிவு எடுக்கப்பட வேண்டுமென்ற நிலையிலே, அதையெல்லாம் ஒருபக்கம் வைத்துவிட்டு இப்பொழுது பொருளாதார ரீதியிலான ஸ்திரம் பற்றிப் பேசப்படுகின்றது. தேசிய இனப் பிரச்சினைக்கு அவசிய மாகவும் அடிப்படையாகவும் தீர்வு காணப்பட வேண்டும் என்ற விடயம் மிக முக்கியமானது. அது இலங்கை அரசியலுடைய ஸ்திரத்தன்மையை மேலும் வலுவூட்டும்.

இன்று திட்டங்களை உருவாக்கும்பொழுது, அவற்றை அடிமட்டத்திலிருந்து சரியான முறையிலே ஆராய்ந்து நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் அவை எந்தவிதத்திலும் பாதிப்பைக் கொண்டுவராத வகையிலே, நாட்டினுடைய வளத்தைப் பாதிக்காத வகையிலே - அவை பௌதீக வளங்களாக இருக்கலாம்; மனித வளமாக இருக்கலாம் - உருவாக்கிக்கொள்ள வேண்டும். நாங்கள் தொழில்நுட்பம் பற்றிப் பேசலாம்; சர்வதேச ரீதியிலான உடன்படிக்கைகள் பற்றிப் பேசலாம். எங்களுடைய மனித வளமானது எந்தளவுக்குப் பயன்பாட்டுக்குள்ளாக்கப்படுகின்றது? என்று ஆராய்ந்து பார்க்க வேண்டும். அது அரசாங்கத்துறையிலோ, தனியார்துறையிலோ பயன்படுத்தப்படாத வகையிலே வீணாகிச் செல்கின்ற நிலைமையே காணப்படுகின்றது. இன்று இந்த நாட்டிலே எத்தனையோ இளைஞர், யுவதிகள் வேலைவாய்ப்பற்று இருக்கின்றார்கள். இந்த அரசு பதவிக்கு வரும்பொழுது பத்து இலட்சம் இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்பு வழங்குவதாகக் கூறியது; படித்த இளைஞர்களுக்கு சுயதொழில் கடன்களை வழங்குவதாகக் கூறியது. இன்று அது எந்தளவுக்கு நிறைவேற்றப் பட்டிருக்கின்றது? எந்த அடைவு மட்டத்தைப் பெற்றிருக்கின்றது? என்று நாங்கள் சிந்திக்க வேண்டும். இன்று உலகத்திலே ஜப்பான் போன்ற அபிவிருத்தியடைந்த பல நாடுகளை எடுத்துப் பார்த்தால், தமது மனித வளங்களை, பௌதிக வளங்களைச் சிறப்பான முறையிலே பயன்படுத்திய நாடுகள் அபிவிருத்தியிலே சிறப்பான முன்னேற்ற மடைந்திருப்பதைக் காணலாம். ஆகவே, எங்கள் நாட்டில் இருக்கின்ற மனித வளங்களைச் சிறந்த முறையில் பயன்படுத்த வேண்டும்.

இன்று ஒருசில முக்கியமான பிரச்சினைகள் குறித்து இந்த விவாதத்திற்கூடாக நான் பேச விரும்புகின்றேன். அண்மையிலே கிழக்கு மாகாணத்தில் வழங்கப்பட்டதான தொண்டர் ஆசிரியர் நியமனம் தொடர்பாக நாங்கள் பல தடவைகள் பேசியிருக்கின்றோம். அதேநேரம், அந்தத் தொண்டர் ஆசிரியர்களும் பல ஆர்ப்பாட்டங்களை மேற் கொண்டிருக்கிறார்கள். அதன் பிரகாரமாக, அண்மையில் கிழக்கு மாகாண சபையிலே நடந்த நேர்முகப் பரீட்சைமூலமாக 456 தொண்டர் ஆசிரியர்கள் தெரிவுசெய்யப்பட்டு அவர்களுக்கான நியமனம் வழங்கப்பட்டிருக்கின்றது. ஆனால், இந்த நேர்முகப் பரீட்சையின்போது பல்வேறுபட்ட பொய்யான ஆவணங்கள் சமர்ப்பிக்கப்பட்டு, பல குளறுபடிகளும் இடம்பெற்றிருக்கின்றன.

உண்மையிலே அந்தத் தொண்டர் ஆசிரியர்கள் 1999ஆம் ஆண்டிலிருந்து 2006ஆம் ஆண்டுவரை தொடர்ச்சியாக அதிகஷ்டப் பிரதேசங்களிலே சேவையாற்றியிருக்கின்றார்கள். அதாவது யுத்தம் நடந்துகொண்டிருந்த பகுதிகளிலுள்ள பாடசாலைகளுக்கு ஆசிரியர்கள் செல்ல முடியாத காலங்களிலே அந்தத் தொண்டராசிரியர்கள், தங்களுடைய உயிரைத் துச்சமாக மதித்துச் சேவை செய்திருக்கிறார்கள். அந்த வகையில், இவ்வாறான கஷ்டப் பிரதேசங்களிலுள்ள பாடசாலைகளில் இருக்கின்ற அதிபர்கள் அந்தப் பாடசாலை களுக்கு மூடுவிழா வைக்காமல் அந்தந்தக் கிராமங்களில் இருக்கின்ற படித்த பிள்ளைகளைக் கொண்டுதான் அங்கு கற்றல் சார்ந்த செயற்பாடுகளை மேற்கொண்டார்கள்.

அண்மையிலே கிழக்கு மாகாண சபையினால் நடத்தப்பட்ட தொண்டர் ஆசிரியர்களுக்கு நிரந்த நியமனம் வழங்குவதற்கான நேர்முகப் பரீட்சையில், 2005, 2006, 2007ஆகிய ஆண்டுகளில் கடமை புரிந்ததற்கான ஆவணங் களே பரிசீலிக்கப்பட்டன. ஒரு வகையில் இதனைத் திட்டமிட்ட ஒரு செயற்பாடாகவே நான் பார்க்கிறேன். திருகோணமலையில் யுத்தம் உக்கிரமாக நடந்துகொண்டிருந்த காலத்தில் கிளிவெட்டி, மூதூர், சம்பூர், கட்டைபறிச்சான், பள்ளிக்குடியிருப்பு, இலங்கைத்துறை முகத்துவாரம், வெருகல் மற்றும் மட்டக்களப்பிலுள்ள வாகரை, கட்டுமுறிவு, படுவான்கரைப் பகுதிகள் என்று பல கிராமங்களைச் சேர்ந்த மக்கள் அந்தப் பகுதிகளிலே யுத்தம் நடந்ததனால் இடம் பெயர்ந்தனர். திருகோணமலையிலிருந்து அரைவாசிக்கும் மேற்பட்டோர் மட்டக்களப்பை நோக்கி இடம்பெயர்ந்தனர். மட்டக்களப்பு மாவட்டத்திலே படுவான்கரையிலிருந்த மக்கள் முழுமையாக எழுவான்கரை - நகர்ப்புறத்தை நோக்கி இடம்பெயர்ந்தார்கள். இடம்பெயரும்பொழுது தங்களது உடைமைகளை விட்டுவிட்டுத்தான் அவர்கள் வந்தார்கள். அவர்களால் தங்களது ஆவணங்களைக்கூடக் கொண்டுசெல்ல முடியாமல் போனது. இதன்காரணமாக அதிகஷ்டப் பிரதேசங் களில் தொண்டர் ஆசிரியர்களாகக் கடமைபுரிந்தவர்களும் 2006, 2007ஆம் ஆண்டு காலப்பகுதியில் அகதி முகாம்களிலே இருந்தார்கள். ஆனால், குறித்த நேர்முகத் தேர்விலே 2005, 2006, 2007ஆம் ஆண்டு என்று மூன்று வருடங்கள் சம்பந்தப்பட்ட ஆவணங்கள் பரிசீலிக்கப்பட்டுள்ளன. அதே நேரம், தொண்டர் ஆசிரியர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவதற்காக உள்வாங்கப்பட்டிருக்கின்றவர்களில் 80 வீதமானவர்கள் நகர்ப்புறத்தைச் சேர்ந்தவர்கள். இவர்களுக்கு நியமனம் வழங்கவேண்டாம் என்று நாங்கள் கூறவில்லை. ஆனால், ஆசிரியர்கள் செல்ல முடியாத, ஆசிரியர்களின் தேவைப்பாடுள்ள கஷ்டப் பிரதேசங்களிலே, போக்குவரத்து வசதிகள் இல்லாத, பஸ் வண்டிகள்கூடச் செல்லமுடியாத சூழலில், சைக்கிளிலும் கால்நடையாகவும் சென்று பல துன்பதுயரங்களை அனுபவித்து - இராணுவத்தினரால்

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

කෙතුසෙය්‍යප්පට්ටු අඩිවාංකියවර්කළුම් අවර්කළිල් ඉරුක්කිරාර්කළ් - තංකළෙ අර්ප්පණිත්තුච් චෙය්‍යප්පට්ට තමිල් තොණ්ටර් ආසිරියර්කළ් ඉන්තත් තේර්විල් මුට්රුමුළුතාකප් පුරක්කණික්කප්පට්ටිරුක්කිරාර්කළ්.

අණ්මෙයිලේ කිළක්කු මාකාණ ආළුනර් අවර්කළ් ඉන්ත නේර්මුකත් තේර්වෛත් තිරුම්පවුම් නටත්තුවතාකක් කූරියිරුප්ප තාක නාංකළ් අරිකින්රෝම්. නාංකළ් කූරික්කොළ්කින්ර විටයම් එන්නවෙන්රාල්, කිළක්කු මාකාණත්තිලේ තොණ්ටර් ආසිරියර්කළුක්කු නිරන්තර නියමනම් වළංකප්පටුම්පොළුතු, කිළක්කු මාකාණත්තිල් පාතික්කප්පට්ට පිරතේසංකළිල් - කෂ්ටප් පිරතේසංකළිලේ තංකළතු උයිරෙයුම් තුච්චමාක මතිත්තුච් චේවෙයාට්රිය අත්තනෙ තමිල් තොණ්ටර් ආසිරියර්කළුම් අතිල් උළ්වාංකප්පටවේණ්ටුම් එන්පතාකුම්. අන්තච් චෙයර්පාටු උරිය මුරෙයිල් නටෙමුරෛප්පටුත්තප්පට වේණ්ටුම්. අව්වාරාන නටවටික්කෛකළ් මේර්කොළ්ළප්පටාත පට්චත්තිල් - කිළක්කු මාකාණත්තිලේ චම්පන්තප්පට්ට තමිල් තොණ්ටර් ආසිරියර්කළුක්කු නිරන්තර නියමනම් වළංකප්පටාත පට්චත්තිල් - නාංකළ් ජනනායක මයප්පටුත්තප්පට්ට පල්වේරු පෝරාට්ටංකළෙ මුන්නෙටුක්කත් තයංකප්පෝවතිල්ලෛ. පාතික්කප්පට්ටිරුක්කින්ර, වරුමෛක් කෝට්ටුක්කුක්කීළ් වාළු කින්ර, 40 - 42 වයතෛක් කටන්තිරුක්කින්ර, 10 - 15 වරුටංකළ් තංකළුටෙය වාළ්ක්කෛයෛත් තොණ්ටර් ආසිරියරාක අර්ප්පණිත්තිරුක්කින්ර අන්ත අප්පාවිත් තමිල්ත් තොණ්ටර් ආසිරියර්කළුක්කු නිරන්තර නියමනම් වළංකප්පටවේණ්ටුම්. කටන්ත කාලංකළිලේ අවර්කළ් පල පෝරාට්ටංකළෙ නටත්තියිරුක්කිරාර්කළ්. අවර්කළිල් කර්ප්පිණිත් තාය්මාරුම් කෛක්කුළන්තෛ උළ්ළවර්කළුම්කූට අටංකුකින්රාර්කළ්. අවර්කළෛප් පාර්ක්කින්රපොළුතු එංකළුක්කු අළුකෛ වරුකිරතු; තංකළුක්කු නියමනම් පෙට්රුත්තරුමාරු අවර්කළ් කාල්කළිලේ විළුන්තු අළුකිරාර්කළ්.

ඉව්වාරානතොරු නිලෛයිල්, වෙළිනාට්ටිලේ ඉරුක්කින්ර ඔරුවරුක්කුප් පතිලාක ඉන්නොරුවර් තිට්ටමිට්ටු කුරිත්ත නේර්මුකප්පරීට්සෛක්කුච් චෙන්රිරුක්කිරාර්. නේර්මුකප්පරීට්සෛක් කුරිය පෙයර් list ඉලේ චම්පන්තප්පට්ටවරුටෙය පෙයර් වන්තතුම්, අවර් වෙළිනාට්ටිලිරුන්තු වන්තිරුක්කින්රාර්. ආකවේ, කිළක්කු මාකාණත්තිල් කෂ්ටප් පිරතේසංකළිලේ වේලෛසෙය්ත තමිල් තොණ්ටර් ආසිරියර්කළෛ වේණ්ටු මෙන්රේ පුරක්කණික්කින්ර වකෛයිල් නටත්තප්පට්ට ඉන්ත නේර්මුකප්පරීට්සෛයානතු ඉරත්තුච් චෙය්‍යප්පට වේණ්ටුම් අල්ලතු කුරිත්ත තොණ්ටර් ආසිරියර්කළ් අනෛවරුම් අන්ත නියමනංකළිල් උළ්වාංකප්පට වේණ්ටුම් එන්ර විටයත්තෛ ඉන්ත උයිරිය සපෛයිලේ නාන් තෙරිවිත්තුක්කොළ්ළ විරුම්පුකින්රේන්. මේලුම්, ඉන්ත විටයත්තිල් පිරතමර් මට්රුම් කල්වි අමෙච්චර් ආකියෝර් උටනටියාකත් තලෛයිට්ටු, පල වරුටංකළාකත් තොළිලුක්කාකක් කාත්තිරුක්කින්ර - ඉතෛවිට්ටාල් ඉන්නොරු තොළිල් ඉල්ලෛ එන්ර නිලෛයිල් ඉරුක්කින්ර - තොණ්ටර් ආසිරියර්කළුක්කු නිරන්තර නියමනම් වළංක නටවටික්කෛ එටුක්කවේණ්ටුමෙනක් කේට්ටුක්කොණ්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

මීළහට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.51]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියම දෙකක් ඉදිරිපත් කරන අද දිනයේ ඒ සම්බන්ධයෙන් කථා කරන්න මා හට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම අද දවසේ මගේ කථාව ආරම්භ කරන්න පෙර මා මුලින්ම මලික් සමරවික්‍රම ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න බලාපොරොත්තු වනවා. ඇමතිතුමා නම් මේ අවස්ථාවේ මේ ගරු සභාවේ නැහැ. රාජ්‍ය ඇමතිතුමා නම් දැන් ගරු සභාවට ආවා. ඇමතිතුමා අපට දවල් ලබා දෙනවා යැයි කියූ ලේඛනය රාජ්‍ය ඇමතිතුමා අතේ හෝ එවා තිබෙනවා නම් හොඳයි. ඇමතිතුමා කිව්වා, ඍජු විදේශ ආයෝජන ඩොලර් බිලියන 1.7ක් ලැබුණා කියලා. ඒ ආයෝජනවල විස්තර ඇතුළත් වාර්තාව පැය භාගයකින් දෙනවා කියලා තමයි කැබිනට් ඇමතිතුමකු වන ගරු මලික් සමරවික්‍රම මැතිතුමා ප්‍රකාශ කළේ. මා හිතන්නේ එතුමා එලෙස ප්‍රකාශ කළේ දවල් දෙකට පමණ අද දින සභාවේ ප්‍රධාන කටයුතු පටන් ගත් මොහොතේම වාගේයි. හැබැයි, අපේ රටට එලෙස ආ ආයෝජන මොනවාද කියන එක ගැනවත්, ඒ ආයෝජකයෝ කවුද කියලාවත් සඳහන් කිසිම ලේඛනයක් මේ මොහොත දක්වාම අපට ලැබී නැහැ. එම නිසා මගේ කථාව අවසන් වෙද්දිවත් ඒ ලේඛනය ඉදිරිපත් කරනවා නම් හොඳයි කියලා මගේ කථාව ආරම්භ කරමින්, මගේ දැනුමේ හැටියට, මගේ දේශපාලනයේ හැටියට, රටේ ජනතාවගේ බලාපොරොත්තුවේ හැටියට මේ ගිවිසුම් මොනවාද කියන එක රට දැනගත යුතුයි කියලා මා හිතනවා.

රටත්, ජාතියත්, අද පාර්ලිමේන්තුවේ සිටින බහුතරයත් 'සංවර්ධනය' කියන දේ මොකක්ද කියලා හඳුනා ගත් කාල වකවානුව මහින්ද රාජපක්ෂ යුගයයි. එක්සත් ජාතික පක්ෂයේ සමහරුන්ට අද භීතියක් තිබුණාට, සමහරුන්ට නිදහසක් නැති වුණාට, යුද්ධය අවසන් වෙලා සංවර්ධනයක් කියන එක වෙන්නේ කොහොමද, සංවර්ධනය ගමට ලැබෙන්නේ කොහොමද, සංවර්ධනයේ ප්‍රතිලාභ ලබා ගන්නේ කොහොමද, ආයෝජකයෝ ගෙන්වන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණු කාල වකවානුවක්, වසරක් තිබුණා නම්, එහෙම නැත්නම් දශකයක් තිබුණා නම්, ඒ රාජපක්ෂ යුගය විතරයි.

සමහර අයට මේවා අහගෙන ඉන්න බැහැ. මේවා අහගෙන ඉද්දී සමහර අයගේ කනට නිකම් යගුල්වලින් අනිනවා වාගේ. ඒ භීතිය වැඩි වෙලා. මහින්ද රාජපක්ෂ යුගයේ අවශ්‍යතාව තිබුණේ රටේ ග්‍රාමීය කර්මාන්තකරුවා, ව්‍යවසායකයා, ව්‍යාපාරිකයා දියුණු කරලා, ශ්‍රී ලංකාව තුළ මෙවැනි ව්‍යාපාර තිබෙනවා කියලා පෙන්වමින් ලෝකයේ ආයෝජකයන්ට ඒ ව්‍යාපාරිකයා හොයාගෙන එන තැනට අපේ රට පත් කරන්නයි. ඒ නිසා තමයි හම්බන්තොට වරාය ඉදි කළේ. හම්බන්තොට වරාය චීනය දැක්කා; සිංගප්පූරුව දැක්කා. හම්බන්තොට වරායේ වටිනාකම, වැදගත්කම බටහිර රටවල් දැක්කා. හම්බන්තොට වරාය ඉදිවෙලා වසරකින්, දෙකකින් රටට ලැබෙන්න තිබිච්ච මහා ධනස්කන්ධයක් නැති කරන්න සිංගප්පූරුවත් මැදිහත් වුණා. සිංගප්පූරු වරාය කඩා වැටෙනවා සිංගප්පූරුව දැක්කා. ඒ නිසා තමයි සිංගප්පූරුව ලංකාවේ එවකට පැවැතිච්ච රාජපක්ෂ ආණ්ඩුව පරාජය කරන්න දැවැන්ත කාර්ය භාරයක් කළේ. ඒ කාර්ය භාරයට සිංගප්පූරුවෙන් මුදල් එව්වා. ඒ මුදල් ගෙවීම් කිරීම සඳහා මහ බැංකුවට අධිපති කෙනෙක් වර්තමාන අගමැතිවරයා පත් කර ගත්තා. ඒ තමුන්ගේ බොහෝම හිතවතෙක්; යාළුවෙක්; යන එන

ගමන් බිමන් හොඳට දන්න, හොඳට හඳුනන කෙනෙක්. ඒ මහ බැංකු අධිපතිවරයා ගැන අපි පුන පුනා කිව්වා. 2015 පෙබරවාරි මාසයේදී මහ බැංකු බැඳුම්කරේ සල්ලි කොල්ල කද්දී ඒ ගැන අපි මේ ආණ්ඩුවට කිව්වා. මහ බැංකු බැඳුම්කරය සම්බන්ධයෙන් මහ බැංකු අධිපතිවරයාට ඇහිල්ල දික් කරලා අපි මේ ආණ්ඩුවට කිව්වා, "විශාල හොරකමක්, වංචාවක් වෙලා තිබෙනවා" කියලා. අගමැතිතුමා එදා මහ බැංකු අධිපතිවරයා ආරක්ෂා කළා. දෙවැනි වර මහ බැංකු බැඳුම්කරේදී අපි කථා කරලා පෙන්නලා දුන්නාම, එදාත් ඔහුව ආරක්ෂා කළා. ජනාධිපතිවරයා හිටපු මහ බැංකු අධිපතිවරයා ආරක්ෂා කළා. ඒ වෙලාවේ තිබ්බිච්ච ආණ්ඩුව ජනාධිපතිවරයා විසිරෙව්වා; COPE වාර්තාව එද්දී විසිරෙව්වා. ඒ සිංගප්පූරු භීතිය තවම රටින් ගිහිල්ලා නැහැ. සිංගප්පූරුවේ පුරවැසිකම තිබෙන හිටපු මහ බැංකු අධිපතිවරයාගේ භීතිය තවම ශ්‍රී ලංකාවේ ජනතාවගේ සිත්සතන් තුළින් ගිහිල්ලා නැහැ. ඒ නිසා තමයි, අපට සියයට 100ක් බදු ගහන්න වෙන්නේ. ඒ නිසා තමයි, ඉන්ධන මිල වැඩි කරන්න වෙන්නේ. ඒ නිසා තමයි, පාරිභෝගික අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ලේ මිල වැඩි කරන්න වෙලා තිබෙන්නේ. මහ බැංකුව කොල්ල කාපු හිටපු මහ බැංකු අධිපතිවරයා දැන් සිංගප්පූරුවේ සුර සැප විඳිනවා. මලික් සමරවික්‍රම ඇමතිවරයා දැන් තව සිංගප්පූරු කෝලමක් ගෙනැල්ලා තිබෙනවා. සිංගප්පූරුවත් එක්ක මේ ගහන ගිවිසුමෙන් ETCA එකෙන් අපේ රටට එන්න බැරිව ගිය ඉන්දියානුවන් ලංකාවට එනවා. ඒක ගැන උදේ තර්ක විතර්ක ආවා. මම කැමැති නැහැ, ඒ ගැන කථා කරන්න. ඒක අවශ්‍ය නැහැ. නමුත්, ඔබතුමන්නාන්සේලාට මේ රට පාලනය කරන්න දීලා තිබෙන්නේ අවුරුදු 4ක, 5ක තාවකාලික කාලයක් විතරයි කියලා ඇයි මේ නායකයන්ට හිතෙන්නේ නැත්තේ? රටේ සින්නක්කර අයිතිය අගමැති රනිල් වික්‍රමසිංහටවත්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනටවත්, මේ කැබිනට් මණ්ඩලයේ ඉන්න කිසි කෙනෙකුටවත් දීලා නැහැ. මේක අවුරුදු 4ක නැත්නම් 5ක තාවකාලික අයිතියක් විතරයි. මේ අයිතිය තුළින් අද ඉපදෙන දරුවාගේත්, අනාගතයේ ඉපදෙන්න ඉන්න දරුවාගේත් ඉරණම තීන්දු කරනවා.

අනාගතයේ ඉපදෙන්න ඉන්න දරුවාගේ ඉරණම මේ අවුරුදු 4ක, 5ක තාවකාලික අයිතියෙන් තීන්දු කරනවා. "ඉන්දු-ලංකා" ගිවිසුම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය අත්සන් කරද්දී අපි කුඩායි. ඒ ශාපයේ පාපය අපි තවම ගෙවනවා. ඉන්දියාවෙන් යන්ත්‍ර සූත්‍ර එනවා. ඉන්දියාවෙන් මෝටර් රථ සහ යතුරු පැදි එනවා. ඒවාට අවශ්‍ය උපකරණ වන ඇණ මුරිච්චියේ ඉඳන්, ටයර් එකේ ඉඳන්, ට්‍යුබ් එකේ ඉඳන් හැම අමතර කොටසක්ම ඉන්දියාවෙන් එනවා. ඒකට දාන මුරිච්චියක් හදා ගන්න අපේ ලංකාවේ කිසි කෙනෙකුට බැහැ. ඒ ඉන්දියානු වාහනවලට අවශ්‍ය අමතර උපාංගයක් හදාගන්න තවම අපට බැහැ. අපේ නිෂ්පාදකයෙක් ආදේශකයක් විධියට යමක් හැදුවොත්, ඉන්දියාව ඊට වඩා අඩුවට ඒ භාණ්ඩ ලංකාවට එවලා ඒ ව්‍යාපාරය කඩා දානවා. එහෙම නම් අද ඇමතිවරු ඉන්න ඕනෑ ඇයි? ඇමතිවරු කටයුතු කරන්න ඕනෑ කෙසේද? ඔබතුමන්ලා මේ අවුරුදු 3 ගත කරපු කාලයේ හොඳකම නිසා තමයි ආණ්ඩුවේ හිටපු 20කට වැඩි ප්‍රමාණයක් මේ වෙද්දී ඒකාබද්ධ විපක්ෂය පැත්තේ ඇවිල්ලා වාඩි වෙලා ඉන්නේ. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ආසන සංවිධායකවරු අද කථා කරලා කියන්නේ, "කට නිහඬව තියාගෙන විපක්ෂයේ කටයුතු කරන්න ඉඩ දෙන්න" කියලයි. ඒ නිසා අද පාර්ලිමේන්තුවේ ජනප්‍රියම පක්ෂය බවට පත් වෙලා තිබෙන්නේ විපක්ෂයයි කියන එක කවුරුත් දැනගන්න ඕනෑ. අද ආණ්ඩුවට ජනප්‍රියත්වයක් නැහැ. අද ආණ්ඩුවේ ඇමතිවරුන්ට ජනප්‍රියත්වයක් නැහැ. අද ආණ්ඩුවේ අගමැතිවරයාට, ජනාධිපතිවරයාට ජනප්‍රියත්වයක් නැහැ. ඒ ජනප්‍රියත්වය ඇවිල්ලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ ඉන්න ඒකාබද්ධ විපක්ෂයට සහ සමස්ත පාර්ලිමේන්තුවේ විපක්ෂයටයි.

අද විපක්ෂයේ බලය වැඩි වෙලා. අද ඇතැමුන් කථා කරන්නේ එක පැත්තක් ගැන විතරයි. හැබැයි, අපි අද අහනවා, අල්ලාහ් දෙනවා, ආණ්ඩුව උතුරට දුන්න සංවර්ධනය කෝ කියලා. උතුරට රේල්ලුව ගෙනිච්චේ මහින්ද රාජපක්ෂ. උතුරට කාපට් පාර ගෙනිච්චේ මහින්ද රාජපක්ෂ. උතුරට විතරක් නොවෙයි. රටේ හතරදිග්භාගයට සංවර්ධනය ගෙනිච්චේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. ආදරණීය හිතවතුනි, මිත්‍රවරුනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු ඇමතිවරුනි, එතුමා ඒ කටයුත්ත කළේ නිකම් නොවෙයි; අද අපි දකින අරුණලු හෙට ඉපදෙන දරුවාටත් දකින්නයි. හම්බන්තොට වරාය දියුණු කරමින්, රටේ අනෙකුත් ව්‍යවසායකයන්, ව්‍යාපාරිකයන් දියුණු කරමින් ඒ කටයුත්ත කරන්නයි අවශ්‍යතාව තිබුණේ.

අපි අද දෙපැත්තට බෙදාගෙන, ගිවිසුමක එල්ලිලා තර්ක විතර්ක ගෙනාවත්, අපි මොකටද මේ වාගේ කාලකණ්ණි ගිවිසුම් ගෙනෙන්නේ? අපේ රටේ ඉන්න වෘත්තිකයෝ, අපේ රටේ ඉන්න ඉංජිනේරුවෝ, අපේ රටේ ඉන්න වෛද්‍යවරු පැහැදිලිවම කියනවා මේ ගිවිසුම් තුළින් ඒ අයගේ වෘත්තීන්වලට ඇති වන අනාරක්ෂිතභාවය පිළිබඳව. ඒ අයගේ වෘත්තීන්වලට ඇති වන අනාරක්ෂිතභාවය ගමේ සිටින අහිංසක දිළිඳු ජනතාවටත් දැනෙනවා. ඒ නිසා කිසියම් දෙයක් නිෂ්පාදනය කරලා, අළෙවි කරලා නිෂ්පාදන ආර්ථිකයක් හදන්න නායකයින්ගේ ඔළු ගෙඩිවලට මොළය පහළ වෙන්නේ නැතිව, මේ යන විධියට ගියොත් අර විස්ස, විසිපහ විතරක් නොවෙයි, තවත් කොටසක් ඇවිත් විපක්ෂයේ වාඩි වෙයි. අපි දන්නවා, දැන් ග්‍රෝඅභය භීතිකාවක් හැදිලා තිබෙනවා කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, එක්තරා වකවානුවක ඔබතුමාත් හොඳ ව්‍යවසායකයෙක්; හොඳ ව්‍යාපාරිකයෙක්. විදේශිකයන්ට පහසුකම් සපයන්න කලින් රටේ ව්‍යාපාරිකයන්ට, ව්‍යවසායකයන්ට අවස්ථාවක් දෙන්න ඕනෑ කියන එක ව්‍යාපාරිකයන් විධියට අපි දන්නා දෙයක්. ඔබතුමා අද පාර්ලිමේන්තුවේ මුලසුන දරද්දී, ඔබතුමා කථානායකවරයා විධියට කටයුතු කරද්දී මේ ආණ්ඩුව මෙවැනි කාලකණ්ණි පනත් ගෙනැත් අපේ රටේ තිබෙන සම්පත් විනාශ කරනවා නම්, සම්පත් ටික සූරාගෙන කනවා නම් ඉතා කනගාටුදායකයි. සුජීව සේනසිංහ මැතිතුමා පැයකට, දෙකකට පාර්ලිමේන්තුවට ආවේ එන්න බැරි නිසා වෙන්න ඇති කියලායි මම හිතන්නේ. මෙවැනි

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

ගිවිසුම්වලට අත්සන් කරනවාට කැමති නැති නිසාද දන්නේත් නැහැ. හැබැයි, අපේ විෂය භාර ඇමතිතුමා උදේ කථා කරද්දී කිව්වේ සුජීව සේනසිංහ මැතිතුමාට හොඳටම අසාධ්‍යයි, ඒ නිසා එන්න විධියක් නැහැ කියලායි. දැන් ඔබතුමා ආව නිසා අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමා මේ ගැන සුබවාදී තීන්දුවක් ගනියි කියලා.

ගෝඨාභය භීතිකාවකුත් දැන් ඇති වෙලා තිබෙනවා. රටට ආදරේ කරන නායකයින්ට ඉදිරියට එන්න ඉඩ දෙන්න. රාජපක්ෂවරුන්ගෙන් ගෝඨාභයද, බැසිල්ද, මහින්ද රාජපක්ෂද, නාමල් රාජපක්ෂද, චමල් රාජපක්ෂද කියන එක අපි තීන්දු කර ගන්නම්. තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ ඊළඟ නායකයා සජිත් ප්‍රේමදාස මහත්තයාද, අගමැතිතුමාමද, එහෙම නැත්නම් අර කියාපු කෙනෙක්ද කියලා බලන්න ඔබතුමන්ලාගේ කිල්ලෝටවල ඇඟිලි ඔබන්න අපි ආවේ නැහැ. ඔබතුමන්ලාගේ දේවල් කියන්න අපි ආවේ නැහැ. මේ ගජ මිතුරු හවුලෙන් රටට විනාශයක් තමයි සිදු වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] ඒක තමයි. පලනි දිගම්බරම් ඇමතිතුමනි, ඔබතුමා ගැනත් කියන්න ඕනෑ. "ආණ්ඩුවේ අගමැතිවරයාට කෙළවේගෙන එනවා. ජනාධිපතිවරයාට කෙළවේගෙන එනවා. මෙහෙම ගියොත් අපටත් කෙළ වෙනවා." කියලා ඔබතුමා ඊයේ පෙරේදා කියනවා අපි අහගෙන හිටියා. මේ හැම නායකයෙක්ම දකින දේවල්. ඔබතුමා කඳුකර ජනතාවට ද්‍රවිඩ නායකත්වය දෙද්දී, ඒ ජනතාවගේ පැත්තේ හිටගන්න ඕනෑ. ජනතාවගේ පැත්තේ හිටගන්න දේශපාලන නායකයන් මේ කිසිම කෝලමකට කැමති නැහැ. හැබැයි, වරදාන, වරප්‍රසාද එක්ක හිටගන්න අයට ඕනෑම දෙයක්. වෙන්නප්පුවේ මන්ත්‍රීතුමා රීති ප්‍රශ්න - points of Order - එකින් එකට දැම්මා. එහෙම දැම්මේ මොකටද? කාව රකින්නද? ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමනි, කවදාවත් නායකයින් රකින්න යන්න එපා. ගමේ ජනතාව රකින්න. ගමේ ජනතාව රැක්කොත් තමයි නායකත්වයට යන්න පුළුවන් වෙන්නේ. හැබැයි, නායකයින් රකින්න ගියොත්, නායකයින් රකින්න ගිය අයට සිද්ධ වෙන්නේ ගෙදරට වෙලා නායකයන්ට පහන් දල්ව දල්වා ඉන්නයි. මේ යටිතල පහසුකම් ගැන, මේ වෙළෙඳ ගිවිසුම් ගැන එහෙමයි කථා කළේ. ඒ ගජ මිතුරු පාලනය බොහොම භයානක පැත්තකට දැන් ගිහින් තිබෙන්නේ. ඒ නිසා දැන් රාජකීය විද්‍යාලයේ ආදී ශිෂ්‍යයන් පවා, රාජකීය - Royal- පාලනය ගැන -[බාධා කිරීමක්] ඒක තමයි.

රාජකීය විද්‍යාලයේ ආදී ශිෂ්‍යයන් පාසලට ආදරය කරන, රටට ආදරය කරන දක්ෂ අය. හැබැයි, අද පාර්ලිමේන්තුවේ ඉන්න රාජකීයෝ ටික එකතු වෙලා -[බාධා කිරීමක්] නැහැ, ආණ්ඩුව නියෝජනය කරන අය ගැන අපි කියන්නේ. [බාධා කිරීමක්] ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඒ ගොඩට යන්නට ඔබතුමාට chance එකක් නැහැ. ඒ රාජකීයෝ ගොඩේ ඉන්නේ වෙනම team එකක්. ඒ team එක ඒක බලාගනී. ඔබතුමා රාජකීයෙක් වුණාට ඔබතුමා ඒ team එකට ඇතුළු කර ගන්නේ නැහැ. රාජකීය පාලනය මේ විධියට අරගෙන ගියොත් රට බොහොම භයානක තැනකට යනවා.

ගරු කථානායකතුමනි, අපි දකින විධියට ගමේ ව්‍යවසායකයාට, ගමේ ව්‍යාපාරිකයාට අවස්ථාවක් දෙන්නට ඕනෑ. මහින්ද රාජපක්ෂ මැතිතුමා කිසිම දවසක මෙවැනි ජාත්‍යන්තර ගිවිසුම්වලට ගියේ නැහැ. එතුමා ඒ කිසිම -[බාධා කිරීමක්] මොකක්ද, ගරු ඇමතිතුමා?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ජාත්‍යන්තරය එතුමාව ගණුන් ගත්තේ නැහැ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඒක තමයි, ගණුන් ගත්තේ නැති නිසා. හැබැයි, එතුමාව ජාත්‍යන්තරය ගණුන් ගන්න ඕනෑ නැහැ, ලංකාවේ ජනතාව හොඳට ගණුන් ගත්තා. විදේශිකයෝ ගණුන් ගත්තේ නැති වුණාට ස්වදේශිකයෝ ගණුන් ගත්තා. ඔබතුමන්ලා සලකන්නේ විදේශිකයන්ට මිසක් ස්වදේශිකයන්ට නොවෙයි. එම නිසා ඔබතුමන්ලා විදේශ ආයෝජකයන්ට පඩුරු අල්ලනවා; ඔබතුමන්ලා විදේශ ආයෝජකයන්ට දොළපිදේනි දෙනවා. ඔබතුමන්ලා විදේශ ආයෝජකයන්ට මොනවා දුන්නත් ඔබතුමා මේ අමාත්‍යාංශය භාර ගත්ත දා ඉඳන් රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3.1ට ඇදලා දාලා තිබෙනවා. Volkswagen කර්මාන්තශාලාවට කියලා Senok Automobiles Private Limited එකට කුලියාපිටියෙන් අක්කර ගණනක් දීලා තිබෙනවා. ටයර් කර්මාන්තශාලාවට කියලා තව එකක් දීලා තිබෙනවා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, if you want to reply, I will give you time after his speech.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔබතුමා මේ කාරණාව සම්බන්ධයෙන් අපට පිළිතුරු දෙන්නට කලින් පැය භාගයකින් ගෙනත් දෙනවා කියපු අලුත් ආයෝජකයින්ගේ වාර්තාව කරුණාකරලා ඉදිරිපත් කරන්න. මම ඉල්ලා සිටිනවා, මෙන්න මේ ව්‍යාපාරය මෙන්න මේ ගමේ, මෙන්න මේ නගරයේ ආරම්භ වෙනවා කියලා විදේශ ආයෝජන 5ක් මට කියන්න කියලා. එහෙම නම් මම මේ කථාව මෙතැනින් අවසන් කරලා වාඩි වෙන්නම්. ඔබතුමා මට ආයෝජන අවස්ථා 5ක් කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසානද? ගරු ඇමතිතුමා, පැහැදිලි කරන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු කථානායකතුමනි,-

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මම කථාව අවසන් කරන්නම්. ඉන් පසුව එතුමාට අදහස් කියන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, එහෙම නම් අවසාන කථාවේදී පැහැදිලි කරන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු කථානායකතුමනි, අපට අවශ්‍ය කරන්නේ සිහින නොවෙයි. කථාවක් තිබෙනවා සිහින කෝටියක් තිබුණාට අතේ එක සතයක් නැහැ කියලා. ඔබතුමන්ලා එදා ඉඳලා "ලොරි ටෝක්", "නැව් ටෝක්" දුන්නාට ඔබතුමන්ලාට ප්‍රායෝගිකව කරන්නට බැරිව ගියා. මම කථාව අවසන් කරන්නම්. මම ඉල්ලා සිටින්නේ සිහින නොවෙයි, යථාර්ථයක් වුණු මිලියන මෙපමණ ප්‍රමාණයක ව්‍යාපෘතියක් ආයෝජන වශයෙන් රටට ආවා කියන එක ප්‍රකාශ කරන්න කියලායි. බොහොම ස්තුතියි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු කථානායකතුමනි, මම ප්‍රථමයෙන්ම මේ රටට පසුගිය මාස හතර තුළ ආව ආයෝජන පිළිබඳව කෙටියෙන් ඉදිරිපත් කරන්නට කැමැතියි. ඉස්සෙල්ලාම හම්බන්තොටට ඇමෙරිකානු ඩොලර් මිලියන 737ක LNG plant එකක් එනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න මම ඉදිරිපත් කරනතුරු, ඉන් පසුව කථා කරන්න. [බාධා කිරීමක්] එහෙම බැහැ. ඔබතුමා ඉල්ලා සිටි කරුණුනේ මම කියන්නේ. කොළඹට apartment complex එකක් එනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 89ක. ඒ වාගේම දකුණට ඇමෙරිකානු ඩොලර් මිලියන 72ක luxury resorts එනවා. Colombo suburbsවල apartment complexes සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 24යි. උතුරට මෙගාවොට් 10 wind power plants දෙකක් එනවා, ඒකට ඇමෙරිකානු ඩොලර් මිලියන 28යි. Manufacturing projects සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 12යි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෑ ගහන්නේ නැතිව. මොබිටෙල් ආයතනයෙන්-

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොරු එපා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
බොරු නොවෙයි, ගිහින් බලන්න. දන්නේ නැතිව කථා කරන්න එපා. කෑගහන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, පැහැදිලි කරන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
කොහේද ඉදිවෙන්නේ?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මේවා ඉදි වෙන්නේ කොළඹ, පංගුවක් ඒවා පිට පළාත්වල. [බාධා කිරීමක්] Mobitel, කොළඹ - ඇමෙරිකානු ඩොලර් මිලියන 80යි. රට වටේම Telecom සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 79යි. [බාධා කිරීමක්] Hutch සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 57යි. Agro-industries සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 28යි. ගිරිඋල්ලේ MAS Garments සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 21යි. [බාධා කිරීමක්] For tobacco for export, ඇමෙරිකානු ඩොලර් මිලියන 13යි. [බාධා කිරීමක්] Garment factories සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 7යි.

අනෙක් ඒවා ඩොලර් මිලියන 100යි. ඊට අමතරව ජූනි මාසයේ අන්තිම වෙන්න කලින් කෙරවළපිටියේ ඉදි කරන LNG plant දෙකක් සඳහා ඩොලර් බිලියනයයි; ඩොලර් මිලියන 1000යි. LNG terminal එකක් ඩොලර් මිලියන 100යි. හම්බන්තොට cement plant එකට ඩොලර් මිලියන 100යි. මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම කියන්න කැමැතියි- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Sir, I would like to inform that as per the Singapore - Sri Lanka Free Trade Agreement, no one can come to Sri Lanka. No Singaporean or anyone else can come to Sri Lanka except after investing in a project. If they invest in any project, only some specialists can come and work and that is only in that particular company. I want to make that very clear. That is the current regulation as well.
Thank you.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 16 දිනැති අංක 2062/47 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2017 දෙසැම්බර් 15 දිනැති අංක 2049/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ධීවර ජනතාවට පෙර පැවැති මිලට ඉන්ධන සැපයීම
மீனவர்களுக்கு முன்னைய விலையில் எரிபொருள் வழங்கல்
PROVISION OF FUEL AT PREVIOUS PRICE FOR FISHERFOLK

[අ.භා. 6.10]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"වත්මන් ආණ්ඩුව පසු ගිය දා ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් මේ රටේ ධීවර ප්‍රජාව, වතුකරයේ ජනතාව ඇතුළු සමස්ත ජනතාවම ඉමහත් පීඩාවට පත්ව ඇත. විශේෂයෙන්ම අතීශය වූ ගැටලු රැසක් සහිතව ධීවර කර්මාන්තයේ නියැළෙන ධීවර ජනතාවට ඉන්ධන මිල ඉහළ දැමීම දැරිය නොහැකි බරපතළ පීඩාවකි; ඉමහත් ගැටලුවකි. මෙමඟින් සිදු වනුයේ ධීවර ජනතාව ස්වකීය කර්මාන්තයේ රැදී නොසිට ඉවත්ව යෑමට ඉඩ ප්‍රස්ථාව ලබා දීමයි.

පසු ගිය ආණ්ඩු සමය තුළ ද මෙලෙස ඉන්ධන මිල ඉමළ දැමූ අවස්ථාවේ ඔවුනට සහනාධාර කූපන් ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. එය කිසිසේත්ම ධීවරයාගේ මූඛ්‍ය ප්‍රශ්නයට සැබෑ උත්තරයක් නොවීය.

වත්මන් ආණ්ඩුව ද එම ක්‍රමවේදයම අනුගමනය කරමින් සහනාධාර කූපන් පත් හා බැංකු ගිණුම්වලට මුදල් බැර කිරීමේ ක්‍රියාවලියක් යෝජනා කරනු ලබන අතර, එයද පෙර පැවැති තත්ත්වයටම සමානය. එය ධීවර ප්‍රජාවගේ ප්‍රශ්නයට සැබෑ උත්තරයක් නොවීය. එබැවින් තෙල් මිල වහා අඩු කරන ලෙසත්, නැතහොත් ධීවර ප්‍රජාවට පෙර පැවැති මිලටම ඔවුන්ගේ රැකියාවේ අවශ්‍යතාවට සරිලන සේ දිවයිනේ ඕනෑම ඉන්ධන පිරවුම්හළකින් ඉන්ධන ලබා ගැනීමට අවකාශ සලසන ලෙස මෙම පාර්ලිමේන්තුවට යෝජනා කර සිටී."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please!

මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)

ගරු කථානායකතුමනි, "මේ අවස්ථාවේ ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව විසින් පසු ගිය මැයි 10 වැනි දා මධ්‍යම රාත්‍රියේ සිට ඉන්ධන මිල ඉහළ දැම්මා. එය මේ රටේ සමස්ත ජනතාවට බරපතළ පීඩාවක්. ඒ කාරණය නිසා ධීවර ජනතාව, වතුකරයේ ජනතාව ඇතුළු මේ රටේ වැඩ කරන ජනතාව, දුක් විඳින ජනතාව ඉමහත් පීඩාවකට පත්ව සිටිනවා. පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 117 සිට 137 දක්වා රුපියල් 20කින්, ඩීසල් ලීටරයක මිල රුපියල් 95 සිට 109 දක්වා රුපියල් 14කින්, භූමිතෙල් ලීටරයක මිල රුපියල් 44 සිට 101 දක්වා රුපියල් 57කින් වැඩි කරන්නට ආණ්ඩුව කටයුතු කර තිබෙනවා. එය රටේ සියලු ක්ෂේත්‍රවලට බරපතළ විධියටම බලපා තිබෙනවා. මේ තත්ත්වය තුළ රටේ භාණ්ඩ හා සේවා ගාස්තු ඉහළ යෑම මොනම ආකාරයකින්වත් වළක්වා ගන්න ආණ්ඩුවට හැකියාවක් නැහැයි කියලා අපි විශ්වාස කරනවා.

මේ රටේ නිෂ්පාදන ආර්ථිකය නංවාලීමට කටයුතු කරන ධීවරයාට, කම්කරුවාට, වතු කම්කරුවාට, ගොවියාට -සමස්ත වැඩ කරන ජනතාවට- මේ ඉන්ධන මිල වැඩි වීම මොනම ආකාරයකින්වත් දරා ගන්න හැකියාවක් නැති වෙලා තිබෙනවා. මම විශ්වාස කරනවා, මේ නිසා සෑම ක්ෂේත්‍රයකම නිෂ්පාදනය කඩා වැටීමකට ලක් වෙනවාය කියලා. ඉන්ධන මිලේ මේ ඉහළ යෑම ධීවර කර්මාන්තයට ප්‍රබල විධියටම බලපානවා. ගොඩබිම ගමන් කරන වාහනවලට වඩා වැඩි ඉන්ධන ප්‍රමාණයක් ජලය මත ගමන් කරන යාත්‍රාවලට වැය වෙනවා. විද්‍යාත්මකව සලකා බැලුවොත් ජලය මතු පිට ගමන් කිරීමේදී ඝර්ෂණ බලය සහ වාත ප්‍රතිරෝධනය ඇති වෙනවා. ඒ නිසා ජලය මත යාත්‍රාවක් ඉදිරියට ගමන් කිරීමේදී විශාල බලයක් යොදවන්න සිද්ධ වෙනවා. ඒ සඳහා විශාල ඉන්ධන ප්‍රමාණයකුත් වැය කරන්න සිද්ධ වෙනවා. වැඩි බලයක් යෙදවීමට සිදුවන නිසා වැඩි ඉන්ධන දහනයක් සිද්ධ වෙනවා. ඒ නිසා ධීවර ජනතාවට විශාල ඉන්ධන වියදමක් දරන්න සිද්ධ වෙනවා. ඒක ධීවර ජනතාවට ඉතාම බරපතළ ගැටලුවක් බවට පත්වෙලා තිබෙනවා. ජාතික ආර්ථිකය ශක්තිමත් කරන, රටේ ජනතාවගේ ප්‍රෝටීන් ඌනතාව නැති කරන මේ ධීවර ප්‍රජාව ඉන්ධන මිල ඉහළ දැමීම නිසා බරපතළ විධියේ ගැටලුවකට මුහුණ දී තිබෙනවා. අව්වට, වැස්සට, මාරියාවට මුහුණ දෙමින් තමන්ගේ ජීවිතය පරදුවට තබමින් ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර ප්‍රජාවට මේ නිසා අද ඇති වෙලා තිබෙන්නේ කබලෙන් ලිපට වැටීමක් වාගේ තත්ත්වයක්.

මා විශේෂයෙන්ම ධීවර අමාත්‍යතුමාට සහ රාජ්‍ය අමාත්‍යතුමාට කියනවා, ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්න කියලා. ඉන්ධන මිල වැඩිවීම නිසා ධීවර කර්මාන්තයේ යෙදිලා ඉන්න තුන්ලක්ෂයක් වෙච්ච ජනතාවට මේ වෙනකොට දහසක් අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධවෙලා තිබෙනවා. ධීවර ආම්පන්න මිල ඉහළ යෑම, වරාය ගාස්තු ඉහළ යෑම, වරාය හා තොටුපොළ පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ඒවායේ පවතින ගැටලු ධීවර ජනතාවට බලපානවා. විටින් විට සිදුවන කාලගුණික විපර්යාස හේතුවෙන් ධීවරයා බරපතළ විධියේ ගැටලුවලට මුහුණ දෙනවා වාගේම, ඒ නිසා යම් යම් අවස්ථාවල ධීවරයාගේ ජීවිත විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා ඒ අයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු මතු වෙලා තිබෙනවා. අවිධිමත් රක්ෂණ ක්‍රමවේදය නිසා අදත් ධීවරයාගේ ජීවිතවලට නිසි ආරක්ෂාවක් ලැබිලා නැහැ. ඒ විතරක් නොවෙයි, නෙළා ගන්න මත්ස්‍ය අස්වැන්නට කිසිම ආකාරයක වටිනාකමක් ලැබෙන්නේත් නැහැ. අපේ දිලිප් වෙදආරච්චි රාජ්‍ය ඇමතිතුමාත් ඒක දන්නවා.

පසුගිය දවස්වල තංගල්ල, නිල්වැල්ල, කුඩාවැල්ල, ගන්දර, කෝට්ටගොඩ, දෙවුන්දර, බේරුවල කියන්නා වූ ඒ ප්‍රදේශවල බහුදින යාත්‍රාවලින් ගෙනාපු ඒ මත්ස්‍ය අස්වැන්න කුණු කොල්ලයට විකුණුවා. ඒවා කිසිම කෙනෙක් ගන්නේ නැති තත්ත්වයකටත් පත් වුණා. විජයමුණි සොයිසා ධීවර ඇමතිතුමනි, ඔබතුමාත් මේ තත්ත්වය තේරුම් ගන්න. විශේෂයෙන්ම "ලින්නා" කියන මාළු වර්ගයේ කිලෝ එක රුපියල් 30ට ගියා. ඒවා කවුරුවත් ගත්තේ නැහැ. ඒ අස්වැන්න මිලදී ගන්න ධීවර සංස්ථාවට, ධීවර අමාත්‍යාංශයට ක්‍රමවේදයක් නැහැ. අස්වැන්න වැඩි වුණාම ඒවා මිලදී ගන්න කෘෂිකර්ම අමාත්‍යාංශයට වැඩ පිළිවෙළක් නැති නිසා එළවලු මිල අඩු වෙනවා වාගේම, ධීවර අස්වැන්න වැඩි වුණාට පස්සේ ඒවා මිලදී ගන්න ධීවර අමාත්‍යාංශයට ක්‍රමවේදයක් නැති නිසා ඒවාත් අද කුණු කොල්ලයට විකිණෙනවා. ඒ නිසා ධීවරයා අකර්මන්‍ය වෙනවා; මන්දෝත්සාහී වෙනවා; රැකියාවට යන්නේ නැහැ. ධීවරයා රැකියාවට යන්නේ නැති තත්ත්වයක් තුළ තමුන්නාන්සේලා තෙල් මිලත් අත්තනෝමතිකව වැඩි කිරීම නිසා ඒ අයට බරපතළ විධියේ ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

මේ ඉන්ධන මිල ඉහළ දැමීම නිසා, විශේෂයෙන්ම භූමිතෙල් මිල සියයට 130කින් වැඩි වුණා. ඒක ධීවර කර්මාන්තයටම බරපතළ විධියට බලපා තිබෙනවා. මේ ධීවර කර්මාන්තයේ යෙදෙන වැඩි පිරිසක් සුළු පන්න ධීවරයන්. ඔවුන් තමයි භූමිතෙල් වැඩි වැඩියෙන් පාවිච්චි කරලා මත්ස්‍ය අස්වැන්න නෙළා ගන්න මැදිහත් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිටත එන්ජිම් සවි කළ යාත්‍රා - outboard motor engine boats- 24,000ක් අපේ රට පුරා වරායවල මුහුදු ආශ්‍රිත කර්මාන්තයේ යෙදෙනවා. ඊට අමතරව එන්ජින් සවි කළ සාම්ප්‍රදායික යාත්‍රා 4,000කට වැඩි ප්‍රමාණයක් ඉන්ධන භාවිත කරමින් අද එම කර්මාන්තයේ යෙදෙනවා. භූමි තෙල් මිල සියයට 130කින් වැඩි වීම නිසා ඒ යාත්‍රා හිමියන්ට, ධීවරයන්ට බරපතළ ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පිටත එන්ජින් සවි කළ යාත්‍රාවලට මත්ස්‍ය අස්වැන්න නෙළා ගෙන එන්න එක් දිනකට භූමිතෙල් ලීටර 25ක්, 30ක් පමණ වැය වනවා. සමහර ඒවාට භූමිතෙල් ලීටර 40ක් වැය වනවා. තවත් සමහර ඒවාට ලීටර 45ක් විතර වැය වනවා. භූමිතෙල් ලීටරයක මිල පෙරට වඩා රුපියල් 57කින් වැඩි වීම නිසා දළ වශයෙන් එක් දිනකට රුපියල් 1,500ක අමතර ගාස්තුවක් සුළු ධීවරයාට -පිටත එන්ජිම් සවි කළ යාත්‍රා හිමියාට- දැරීමට සිදු වනවා. මේ ප්‍රමාණය දළ වශයෙන් රුපියල් 2,500ක් දක්වා වැඩි වනවා. මෙය බරපතළ ගැටලුවක්. නෙළාගෙන එන අස්වැන්නට කිසිම ආකාරයක මිලක් නැති නිසා ඒ අයට කර්මාන්තය එපා වෙනවා. එම නිසා ඔවුන්ට කර්මාන්තයෙන් බැහැර වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, බහු දින යාත්‍රාවක් සාමාන්‍යයෙන් මාසයකට දින 15ක්, 20ක්, 25ක් රැකියාවේ යෙදෙන බව ඔබතුමන්ලා දෙදෙනාම දන්නවා ඇති. මේ ඉන්ධන මිල වැඩි වීම නිසා ඒ අයට අවම වශයෙන් රුපියල් 35,000ක අමතර ගාස්තුවක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. දළ වශයෙන් රුපියල් 640,000ක් විතර වැය වනවා. ලීටර 1,000 සිට 5,000ක් දක්වා ප්‍රමාණයක් මේ බහු දින යාත්‍රාවලට යොදන්න ඒ අයට සිද්ධ වනවා. ඒ අනුව රුපියල් 35,000ක 45,000ක වැඩි පිරිවැයක් දරන්න සිදු වීම නිසා අද ඒ අය ගැටලුවකට මුහුණ දී සිටිනවා. ඉන්ධන මිලෙහි වැඩි වීම ඉවසා ගන්න බැරි නිසාම තමයි නිල්වැල්ල, කුඩාවැල්ල, ගුරුපොකුණ, හලාවත, පුත්තලම ආදි ප්‍රදේශවල බහු දින යාත්‍රා හිමියන් පසු ගිය දිනවල දැඩි විධියේ සාධාරණ, යුක්තිසහගත උද්ඝෝෂණයක් කළේ. එම උද්ඝෝෂණය ඉතාම සාධාරණ, යුක්තිසහගත එකක් කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩීසල් ලීටරයක මිල රුපියල් 14කින් ඉහළ යෑම නිසා සිදු වී තිබෙන දේ අපි දන්නවා. සාමාන්‍ය බහු දින ධීවර යාත්‍රාවක මුහුදු ගමනකට දළ වශයෙන් ඩීසල් ලීටර 2,500ක, 3,000ක ප්‍රමාණයක් සඳහා රුපියල් ලක්ෂ 3 සිට ලක්ෂ 5 දක්වා ප්‍රමාණයක් වැය කරන්න සිද්ධ වනවා. ඩීසල් මිල වැඩි වීම නිසා එක් මුහුදු ගමනකට දළ වශයෙන් රුපියල් 35,000ක, 45,000ක අමතර මුදලක් වැය වනවා. ඉතාම ගැටලුකාරී තත්ත්වයක් තුළ අමාරුවෙන්, අපහසුවෙන් මුහුදු සීමා පැන ගිහින් ඒ අය අපේ රටට මත්ස්‍ය සම්පත් නෙළාගෙන ආවත්, ඒ නෙළා ගෙන එන සම්පත්වලට නිසි ආකාරයේ මිලක් නොමැති නිසා සමහර බෝට්ටු හිමියන් නැවත වතාවක් එම ගැනියන් මුහුදු යවන්නේ නැහැ. ගරු දිලිප් වෙදආරච්චි රාජ්‍ය අමාත්‍යතුමා ඒ ගැන හොඳ හැටි දන්නවා. ඒ තත්ත්වය තුළ ඉන්ධන මිල වැඩි වීම අද බරපතළ ගැටලුවක්. කරන්න වෙනත් දෙයක් නැතිව බෝට්ටු ගැටගසා දමලා, හූල්ලමින් අහස දිහා, මුහුදු දිහා බලාගෙන ඉන්න එම ධීවරයන්ට සිද්ධ වෙලා තිබෙනවා.

අපට ආරංචියක් ලැබී තිබෙනවා, දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව -යහ පාලන ආණ්ඩුව- එම බහු දින යාත්‍රා හිමියන්ගෙනුත් ආදායම් බදු අය කරන්න දැන් ආදායම් බදු ලිපි ගොනු සකස් කරමින් සිටිනවා කියලා. එහෙම වුණොත්, එය ඉතාම බේදනීය තත්ත්වයක්. ඒ වාගේම එය ආණ්ඩුවේ සෞඛ්‍යයටත් හිතකර නැහැ කියලා මා විශ්වාස කරනවා. එක් දින ධීවර යාත්‍රාවකට දිනකට රැකියාවේ යෙදෙන්න දළ වශයෙන් ඩීසල් ලීටර 40ක, 50ක ප්‍රමාණයක් වැය වනවා. ඊට අදාළ වියදම රුපියල් 7,000ක්, 8,000ක් පමණ වනවා. ඉන්ධන මිල වැඩි වීම නිසා වෙනදාට වඩා රුපියල් 1,500ක මුදලක් වැඩිපුර වැය කරන්න ඒ අයට සිදු වෙලා තිබෙනවා.

ධීවර කර්මාන්තයේ නියුතු කිමිදුම්කරුවනුත් මේ වන විට බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම පැනවුම් පන්න ක්‍රමය මඟින් ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින්ටත් දළ වශයෙන් භූමිතෙල් ලීටර 50-80 අතර ප්‍රමාණයක් තමන්ගේ රැකියාවට යොදවන්න සිදු වෙලා තිබෙනවා. එතකොට දිනකට රුපියල් 2,500-4,000ක් අතර ප්‍රමාණයක අතිරේක වැයක් දරන්න සිදු වෙලා තිබෙනවා. ඒ අනුව දළ වශයෙන් මාසයකට රුපියල් 50,000-80,000 අතර අතිරේක මුදලක් ඒ අයගේ රැකියාවට වැය වෙනවා. නමුත් ලැබෙන අස්වැන්න, ලැබෙන ඵල ප්‍රයෝජනය ඉතාම අඩුයි. ඒ අනුව ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් ධීවර

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

කර්මාන්තයේ යෙදෙන්නන් ඉතාම බරපතළ ප්‍රශ්න රාශියකට මුහුණ දීලා තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. පසුගිය දිනවල ධීවර ප්‍රජාව දිගින් දිගටම තමන්ගේ විරෝධය නැඟුවේ, දිගින් දිගටම ඒ අයට අසාධාරණයක් සිදු වුණු නිසයි. ඉන්ධන මිල ඉහළ ගිය මොහොතේ ඉඳලා සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය ධීවර කර්මාන්තයට අත් වෙලා තිබෙන ඉරණම සම්බන්ධයෙන් මාධ්‍ය මඟින් ප්‍රකාශ නිකුත් කළා; ඒ වාගේම පුවත්පත් සාකච්ඡා කිහිපයක් පැවැත්වූවා; රට පුරා උද්ඝෝෂණ කිහිපයක් දියත් කළා; ධීවරයාගේ දුක කියලා පෙන්සම්වලට අත්සන් කළා; ධීවර වරායවල, ධීවර තොටුපොළවල කළු කොඩි දමලා විරෝධය පළ කළා. ඒ වාගේම ධීවරයින් මුහුදු නොගොස්, කර්මාන්තයෙන් බැහැර වෙලා තමන්ගේ දුක් ගැනවිල්ල ඉතාම සාධාරණව ආණ්ඩුවට ඉදිරිපත් කළා. ඒ වාගේ අතිශය සාධාරණ, යුක්ති සහගත, සාමකාමී විරෝධතා දියත් කළා, ඉන්ධන මිල වැඩි වීම සම්බන්ධයෙන්.

මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ දීත් මේ විධියටම ඉන්ධන මිල වැඩි වීම නිසා ධීවරයා අතිශයින්ම ගැටලුකාරී තත්ත්වයකට පත් වුණා. 2012.02.11 වනදා රට පුරා ධීවර ප්‍රජාව තමන්ගේ බිරිඳ, තමන්ගේ දරුවන්, තමන්ගේ අසල්වැසියන් එක්ක පාරට බැහැලා, සාමකාමී විධියට තමන්ගේ දුක කිව්වා. නමුත් එදා රාජපක්ෂ ආණ්ඩුවෙන් මොකක්ද කළේ? හලාවත, එගොඩවැල්ලේදී ඇන්ටනි ප්‍රනාන්දු සහෝදරයා වෙඩි තබා ඝාතනය කළා. මට මතක හැටියට අපේ විජිත් විජයමුණි ද සොයිසා ඇමතිතුමාත් ඒ ආණ්ඩුවේ හිටියා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාටත් ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. ඒ වාගේම තවත් හතර දෙනෙක් සදාකාලික අබිබගාතයින් බවට පත් වුණා. ජේසුමරිය කිංස්ලි කියන්නේ ඒ හතරදෙනාගෙන් එක්කෙනෙක්. ඔහු Tamil සහෝදරයෙක්. ඔහු බෙල්ල වැලලාගෙන මැරුණා, ජීවත් වෙන්න ක්‍රමයක් නැති නිසා. "ධීවරයාගේ තාත්තා" කියලා පාරම්බාපු රාජපක්ෂ මහත්මයලා අන්න ඒ විධියට තමයි එදා ධීවර ජනතාවගේ අතිශය සාධාරණ, යුක්ති සහගත අරගළවලට උත්තර දුන්නේ. ඒ ආණ්ඩුවෙනුත් එදා තෙල් සහනාධාරය ලබා දුන්නා. එදාත් තෙල් සහනාධාරය දෙනකොට අපි කිව්වා, "ධීවරයන් කියන්නේ මොනම ආකාරයකින්වත් හිඟන්නන් නොවෙයි. ධීවරයින් කියන්නේ අනුන්ට අත පාලා ජීවත් වන අය නොවෙයි. ධීවරයන්ට අභිමානයක්, ඒ වාගේම ආත්ම ගරුත්වයක්, පෞරුෂයක් තිබෙනවා. ඒ නිසා සහනාධාර ප්‍රෝඩාව එපා, වහාම ඉන්ධන මිල අඩු කරන්න, ඉන්ධන මිල අඩු කරලා සහන සලසන්න" කියලා. නමුත් එදා ඒ දේ කළේ නැහැ. මේ වතාවේත් තමුන්නාන්සේලා ඒ විධියටම කරන්න උත්සාහ කරනවා. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, ඒ කටයුත්ත මොනම ආකාරයකින්වත් කරන්න එපා කියලා. මට මතක හැටියට නව වතාවකදී -අවස්ථා නවයකදී- වාරික ලබා දුන්නා. ලබා දීලා අවසානයේ දී නිකම්ම ලිස්සලා ගියා. ධීවර කර්මාන්තය නහා සිටුවීම වෙනුවෙන්, ධීවරයන් වෙනුවෙන් ඉතිහාසයේ පළමුවන වතාවට තමන්ගේ ජීවිතය පූජා කළ වර්ණකුලසූරිය ඇන්ටනි ප්‍රනාන්දු සහෝදරයාට; ඒ ධීවරයාට අවමානයක් කළේ. ඒ නිසා මේ මොහොතේත් අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. මෙන්න මේ තත්ත්වය තේරුම් ගන්න. රාජපක්ෂ මහත්මයලාගේ ආණ්ඩුව කළා වාගේ ක්‍රියා කරන්න එපා.

ධීවර ප්‍රජාවට කුපන් එපා; බැංකු ගිණුම් එපා; ඒවාට මුදල් දමන්න එපා; තෙල් මිල වහාම අඩු කරන්නය කියන ඉල්ලීම අපි කරනවා. එසේ කළ නොහැකි නම්, සියලු ධීවරයන්ට ඔවුන්ගේ රැකියාවට අවශ්‍ය ප්‍රමාණයට, පෙර පැවති මිලටම, ගැටලුවකින් තොරව ඕනෑම පිරවුම්හලකින් ඉන්ධන ලබා ගැනීමට අවකාශ සලසන්න. එහෙම කරන්න බැරි වුණොත්, මේ ආණ්ඩුවටත් පසුගිය රාජපක්ෂ ආණ්ඩුවට සිදුවුණු දෙයම වෙයි කියා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව පාසල් නිල ඇඳුම් වෙනුවෙන් වවුචර්පත් ලබා දුන්නා. පොහොර සහනාධාරය වෙනුවට ගොවීන්ට මුදල් ලබා දුන්නා. ඒකෙන් මොකක්ද වුණේ? නා ගත්තා; අනා ගත්තා; හත් පොළේ ගා ගත්තා. ඒ නිසා අපි ඉල්ලන්නේ, ධීවරයාගේ ගිණුම්වලට මුදල් බැර කරන්න අත කියන්න එපා කියායි. ඔබතුමන්ලා මෙවැනි කටයුත්තක් කරයි කියා අපි විශ්වාස කරන්නේ නැහැ. නමුත්, සහනාධාර කුපන් දෙනවාය කියා තිබෙනවා. ඒකත් කරන්න එපා. එහෙම කරනවා නම්, අඛණ්ඩව ඒවා ලබාදෙයි කියා අපි විශ්වාස කරනවා. ඒවා අතරමගදී නවත්වන්න උත්සාහ කරන්න එපා. ධීවර කර්මාන්තයේ යෙදෙන ලක්ෂ තුනක ධීවරයන් පිරිස සහ ලක්ෂ 15ක් වන යැපෙන ධීවරයින් පිරිස ගැන සැලකිල්ල යොමු කර, මේ වෙනුවෙන් ස්ථිරසාර -වෙනස් නොවන- ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නය කියා මේ මොහොතේ වත්මන් ආණ්ඩුවෙන් මා ඉල්ලා සිටිනවා.

අපේ ගරු ඇමතිතුමා සහ රාජ්‍ය ඇමතිතුමා කියන දෙපළගෙන්ම මා තවත් ඉල්ලීමක් කරනවා. තමන්ගේ රැකියාවේ නියැලීමට නොහැකිව මේ මොහොතේ ධීවරයන් තමන්ගේ ගෙවල්වලට වෙලා ඉන්නවා. තෙල් මිල ඉහළ යෑමේ බරපතළ ගැටලුව නිසා සුළුපන්න ධීවරයන් අද මහ මහට බැස තිබෙනවා; ඒ වාගේම සාම්ප්‍රදායික ධීවරයන් මහ මහට බැස තිබෙනවා; බහුදින යාත්‍රා ධීවරයන් තමන්ගේ දරු පවුල් සමඟ මහ මහට බැහැලා තිබෙනවා. ඒ නිසා මේ අයගේ අනාගත ඉරණම අනිවාර්යයෙන්ම තමුන්නාන්සේලා භාර ගන්න ඕනෑ. ධීවරයා වෙන කිසිම රැකියාවකට පුරුදු වෙලා නැහැ; ධීවරයා වෙනත් රැකියාවක් කරන්නේ නැහැ. ධීවරයාට කරන්න පුළුවන්කම තිබෙන්නේ මේ රැකියාව විතරයි. ඒ රැකියාව සුරක්ෂිත කිරීම පිණිස ඔබතුමන්ලා දෙදෙනා වග කීමකින් යුතුව කටයුතු කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ වෙනකොට දෛනික මත්ස්‍ය පරිභෝජනය දළ වශයෙන් ග්‍රෑම් 35යි කියා අපි දන්නවා. නමුත් ගරු ඇමතිවරුනි, ඉන්ධන මිල මේ විධියට ඉහළ යෑම සුළුපන්න ධීවරයා, සාම්ප්‍රදායිකපන්න ධීවරයා, මාදැල්පන්න ධීවරයා, බහුදින යාත්‍රා ධීවරයා වැනි ඒ සෑම ක්ෂේත්‍රයකම මත්ස්‍ය අස්වැන්න නෙළන ධීවරයාට බලපානවා වාගේම, නිෂ්පාදනය කඩා වැටීමටත් අනිවාර්යයෙන්ම එය පාදක වෙනවා. එහෙම වුණොත්, ග්‍රෑම් 35ක් වන දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 15 දක්වා පහළ බහින තත්ත්වය වළක්වන්න තමුන්නාන්සේලාට හැකියාවක් නැහැ. ඒ තත්ත්වය ඇති වෙන්න නොදී, වහාම ක්‍රියාත්මක වන පරිදි මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

[අ.භා. 6.32]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තෙල් මිල වැඩිවීම විශේෂයෙන් ධීවර ජනතාවට බලපා තිබෙන ආකාරයත්, ඒ නිසාම ධීවර ජනතාවට විධිමත්ව සහනාධාර ලබාදිය යුතුය කියාත් ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට පෙර මා මෙම කරුණ සඳහන් කරනවා. තෙල් මිල වැඩිවීම ජනතාවට බලපාන බරපතළ ප්‍රශ්නයක් නිසා, අද දවල් පැවති පක්ෂ නායක රැස්වීමේදී තීන්දුවක් ගත්තා, හවස හතරෙන් පස්සේ ඒ ගැන පැය තුනක පමණ විවාදයක් කරන්න. එතකොට අපිට පුළුවන් ජනතාවගේ පැත්තෙන් මේ ගැන කරුණු කියන්න. ආණ්ඩුවට අවස්ථාවක් ලැබෙනවා, තෙල් මිල වැඩි කරන්න හේතු වුණු කාරණා පැහැදිලි කරන්න. අද මේ පාර්ලිමේන්තුව පටන් ගත්තාට පස්සේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රමුඛ ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායමත්, අර දහසයේ කල්ලියත් මේ ගරු සභාව ඇතුළේ මහා ඝෝෂාවක් නැඟුවා, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් සම්බන්ධ විවාදය පැත්තකට දමලා, මේ තෙල් මිල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන සභාව කල් තැබීමේ අවස්ථාවේ යෝජනාවට අද වැඩි කාලයක් ගනිමු කියලා. පක්ෂ නායක රැස්වීමේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සිටින අවස්ථාවේදී ඒ වෙනුවෙන් ඇති වූ එකඟතාව අපි මතක් කළ වෙලාවේ එතුමා නැවතත් ප්‍රශ්නයක් මතු කළා; හයහමාර වෙනකල් විවාදය පවත්වන්න ඕනෑ, බෙදීමක් ඉල්ලුවොත් ඡන්ද විමසීමක් එනවා, ඡන්දය දෙන්න මන්ත්‍රීවරු එන්නේ ඒ වෙලාවටයි, ඒ නිසා එතෙක් විවාදය පවත්වන්න ඕනෑය කියා.

දැන් බෙදීමක් ඉල්ලුවාද? ඡන්දයක් පැවැත්වුවාද? එතකොට ඒකාබද්ධ විපක්ෂයේ සහ දහසයේ කල්ලියේ මන්ත්‍රීවරුන්ට ජනතාව ගැන කැක්කුම එන්නේ මේ පාර්ලිමේන්තු විවාදය රූපවාහිනියේ live පෙන්වන විට විතරද? මෙම විවාදය සවස 3.00ට කලින් ගත්තා නම් මහ ඝෝෂාවක් දමලා, සමහර විට සභාව මැද්දට පැනලා, සෙංකෝලයත් උස්සලා විරෝධය ප්‍රකාශ කරනවා. හැබැයි, සවස තුනෙන් පසුව විවාදය ගත්තොත් ජනතාව අදාළම නැහැ. මම හිතන විධියට ඊට වඩා ගෙදර ප්‍රශ්න ලොකු ඇති. ජනතාවට බලපා තිබෙන මේ තෙල් ප්‍රශ්නය ගැන කථා කරන්න; ධීවරයාගේ ප්‍රශ්න ගැන කථා කරන්න දැන් සභාව ඇතුළේ කවුරුත් නැහැ; එක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නැහැ. මේක නාඩගමක්. මේ ජනතාව වෙනුවෙන් පෙනී සිටීමක් නොවෙයි කියා පැහැදිලිවම පෙනෙනවා. තෙල් මිල වැඩිවීම ජනතාවට දැනෙන බරපතළ ප්‍රශ්නයක් කියා ඔවුන් හිතනවා නම්, අඩුම තරමේ එක වචනයක්, දෙකක් හෝ කථා කරන්න එක මන්ත්‍රී කෙනෙකුට හෝ මේ ගරු සභාවේ ඉන්න තිබුණා නේ. මොකද, කථානායකතුමා බොහොම පැහැදිලිව කිව්වා, "ජනතා විමුක්ති පෙරමුණ මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා, ඒකට සාධාරණ වෙලාවක් ලබා දෙන්න අපි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් සම්බන්ධ විවාදය කලින් අවසන් කරමු" කියලා. ඒකටත් බාධා කරලා, ඒකත් කඩාකප්පල් කරන්න හදලා, අවසානයේ ඡන්ද විමසීමකුත් නැතිව ඒ අය යන්න ගිහින්. ඒ නිසා, TV එක ඉස්සරහා රඟන රැඟිල්ලම නොවෙයි ඇත්ත දේශපාලනය කියන එක මේ රටේ ජනතාව තේරුම් ගත යුතුව තිබෙනවා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා)
(*மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்*)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

TV වීරයෝ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඔව්, TV වීරයෝ. මේ විවාදයත් TV එකේ live පෙන්නුවා නම් සමහර විට ඔවුන් මෙම සභාවේ ඉන්නත් ඉඩකඩ තිබුණා.

නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා අද තමන්ගේ කථාවේදී වැඩි අවධානයක් යොමු කළේ ධීවර ජනතාව පිළිබඳවයි. ධීවරයන්ට විතරක් නොවෙයි, මම හිතන විධියට තෙල් මිල වැඩිවීම නිසා බස් ගාස්තු සියයට 12.5කින් වැඩි කරන්න තමුන්නාන්සේලා අද උදේ කැබිනට් මණ්ඩලයේදී එකඟතාවකට ඇවිත් තිබෙනවා. දැනටමත් ත්‍රී රෝද රථ රියැදුරන් තමන්ගේ ගාස්තුව වැඩි කරලායි තිබෙන්නේ. හෙට අනිද්දා වනවිට දුම්රිය ගාස්තු වැඩි වෙනවා. බස් ගාස්තු, දුම්රිය ගාස්තු, ත්‍රීවීල් ගාස්තු කියන සියල්ල වැඩි වුණාට පසුව ප්ලේන් ටී එකේ, ආප්පයේ ඉඳලා, සියලුම භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යනවා. මේක ජනතාවට බරපතළ ලෙස බලපාන ප්‍රශ්නයක්. "ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල ඉහළ ගියා, ඒ නිසා තමයි තෙල් මිල වැඩි කළේ" කියා ආණ්ඩුව කියනවා. මේකට උත්තර දෙන්න ඕනෑ ඇත්තටම ධීවර ඇමතිවරු දෙපළ නොවෙයි. Petroleum Resources Development Ministry එක භාර අපේ නියෝජ්‍ය ඇමතිතුමිය මේ ගරු සභාවේ දැන් ඉන්නවා. එතුමිය උත්තර දුන්නොත් හොඳයි.

මම භූමිතෙල් ගැන කථා කරන්නේ නැතිව, ජනතාව වැඩිපුර පාවිච්චි කරන පෙට්‍රල් සහ ඩීසල් ගැන කථා කරන්නම්. මේ අවුරුද්දේ අප්‍රේල් මාසය වන විට වරායට පැමිණි ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 78.43යි. ඒකට රේගු බදු, වරාය හා ගුවන් සේවා ගාස්තු සියල්ල එකතු වුණාට පසුව ආණ්ඩුව අය කරන බද්ද රුපියල් 60.63ක් වෙනවා. ඒ කියන්නේ, පෙට්‍රල් ලීටරයක මිලෙන් සියයට 43.6ක් ආණ්ඩුව බදු ලෙස අය කරනවා. ඩීසල් ලීටරයක් වරායට එන්නේ රුපියල් 83.70ටයි. මම කලින් සඳහන් කළ බදු එකතු වුණාට පසුව ආණ්ඩුව ඩීසල් ලීටරයකට රුපියල් 32.14ක බද්දක් ගන්නවා. ඒ අනුව ඩීසල් ලීටරයක විකිණුම් මිලෙන් සියයට 29ක් ආණ්ඩුව අය කරන බද්දයි; පෙට්‍රල් ලීටරයක මිලෙනුත් සියයට 43.6ක් බදු ලෙස අය කරනවා. හැබැයි, දැන් ආණ්ඩුව කළේ බදු වැඩිකිරීමයි. කලින් ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයකට රේගු බද්ද ලෙස අය කළේ රුපියල් 12යි. දැන් ඒ මුදල රුපියල් 29.59යි. ආණ්ඩුව රේගු බද්ද දෙගුණයකින් වැඩි කර තිබෙනවා. ඒ කියන්නේ, ආණ්ඩුව පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 20කින් වැඩි කරනකොට එතැන රුපියල් 14ක්ම ආණ්ඩුව වැඩි කරපු බදුයි. මම අහන්නේ මේකයි. ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල ඉහළ දැමීම නිසා පෙට්‍රල් ලීටරය රුපියල් 20කින් ඉහළ දමනකොට පෙට්‍රල්වලට වැඩිවෙන්නේ රුපියල් 6යි. නමුත් ලෝක වෙළෙඳ පොළ පෙන්වලා ආණ්ඩුව රුපියල් 14කින් එය වැඩි කරනවා. එතකොට ප්‍රශ්නය තිබෙන්නේ ලෝක වෙළෙඳ පොළේද, නැත්නම් භාණ්ඩාගාරයේද? කලින් ඩීසල් ලීටරයකට

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

රුපියල් 4ක් වශයෙන් තිබුණු රේගු බද්ද ආණ්ඩුව රුපියල් 10.55 දක්වා -රුපියල් 7කට ආසන්න මිලකින්- වැඩි කළා. ඩීසල් ලීටරයක මිල රුපියල් 14කින් වැඩි කරනකොට, එයින් රුපියල් 7ක්ම ආණ්ඩුව වැඩි කරපු බදුයි.

ඒ කියන්නේ, ලෝක වෙළෙඳ පොළේ මිල ඉහළ ගියා නම් වැඩි කළේ රුපියල් 7යි. භාණ්ඩාගාරයට අලුතින් ගත් බද්ද රුපියල් 7යි. දැන් ප්‍රශ්නය තිබෙන්නේ කොතැනද? ප්‍රශ්නය තිබෙන්නේ ලෝක වෙළෙඳ පොළේද, භාණ්ඩාගාරයේද? තෙල් මිල වැඩි වුණේ තමුන්නාන්සේලා ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලය පෙන්වලා බදු වැඩි කරපු නිසයි. ජනතාවගේ පොකැට් එකට ගැහුවේ ලෝක වෙළෙඳ පොළේ ප්‍රශ්නයක් නිසා නොවෙයි. ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල වැඩි වනකොට තමුන්නාන්සේලාටත් මිල වැඩි කරන්න සිදු වන බව අපිත් පිළිගන්නවා. හැබැයි, රුපියල් 20කින් පෙට්‍රල්වල මිල වැඩි කරනකොට රුපියල් 14ක් ආණ්ඩුවේ බද්ද වැඩි කරගෙන තිබෙනවා. ඩීසල් ලීටරයකින් රුපියල් 7ක් බද්ද වැඩි කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, මේක ලෝක වෙළෙඳ පොළේ ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමියන්ලා ජනතාව මත ගහන බද්දේ තරම තමයි ජනතාවට වැදිලා තිබෙන්නේ. "බදු ගැහීම නිසා රුපියල් බිලියන 53ක වැඩිපුර ආදායමක් හොයන්න බලාපොරොත්තු වනවා. ඒ රුපියල් බිලියන 53 අපි ග්‍රාමීය සංවර්ධනයට යොදවන්නම්." කියලා මුදල් ඇමතිතුමා කියනවා මම දැක්කා. ඒ රුපියල් බිලියන 53 ග්‍රාමීය මාර්ග හදන්න යොදවන්නද, පාලම් හදන්න යොදවන්නද නැත්නම් තෙල් මිල අඩු කරන්න යොදවන්නද කියලා පාරට ගිහිල්ලා ජනතාවගෙන් ඇහුවොත් ඔවුන් කියයි, ඒ රුපියල් බිලියන 53 තෙල් මිල අඩු කරන්න යොදවන්න කියලා. මොකද පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් ලීටරයක මිල රුපියලකින්, රුපියල් දෙකකින් ඉහළ යනකොට බඩු මිල ඉහළ යන්නේ ඒකට සාපේක්ෂව මීසක් අනුපාතිකව නොවෙයි කියලා ඔබතුමිය දන්නවා. ඊට පස්සේ ඒවායේ මිල හැටහුටහමාරට නැහලා යනවා. ඒ සියලු බර පැටවෙන්නේ ජනතාව මතටයි. ඒ නිසා නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාවට අනුව ධීවරයන්ට සහන දෙන්න කියන අතරේම මම ඉල්ලන්නේ අසාධාරණ ලෙස වැඩි කරන ලද බදු ඉවත් කරන්න කියලායි. ආණ්ඩුවක් පවත්වාගෙන යන්න නම් බදු අය කරන්න වනවා. හැබැයි, තමුන්නාන්සේලා ලෝක වෙළෙඳ පොළක් සහ බොර තෙල් බැරලයක් පෙන්වලා ගහපු අසාධාරණ බද්ද ඉවත් කරලා, මේ සහනය ජනතාවට ලබා දෙන්න කියන ඉල්ලීම මා කරනවා. තෙල් මිල අඩු කළොත් එහෙම බොහෝ භාණ්ඩ හා සේවාවල මිල අඩු කරන්න පුළුවන්. ඒ ආකාරයට බොහෝ දේවල්වල මිල අඩු කරන්න පුළුවන්. මේ කාරණයට පිළිතුර බලාපොරොත්තු වන්නේ අපි ඇත්තටම අපේ ධීවර ඇමති දෙපළගෙන් නොවෙයි. ඊට ගරු නියෝජ්‍ය ඇමතිතුමිය උත්තර දෙයි කියලා මම බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට, ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ නියෝජ්‍ය ඇමතිතුමිය.

[අ.භා. 6.40]

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය (බනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (டாக்டர்) (திருமதி) அனோமா கமகே - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Anoma Gamage - Deputy Minister of Petroleum Resources Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්ධන මිල ඉහළ දැමීම නිසා ධීවර ජනතාව මුහුණ පා ඇති ගැටලුව සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ අපේ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් අද මෙම ගරු සභාවට ඉදිරිපත් කළා. එම යෝජනාව ස්ථිර කරමින් ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් ඉන්ධන මිල සම්බන්ධයෙන් කථා කිරීම පිළිබඳව මම සතුටු වනවා. මේ ප්‍රශ්නයට උත්තරයක් ලබා දෙන්න අවස්ථාවක් එනතුරු මමත් බලාගෙන හිටියා.

ඉස්සෙල්ලාම මම භූමිතෙල් කතන්දරය ගැන කියන්නම්. අපේ රජය බලයට පත් වුණාට පස්සේ භූමිතෙල් මිල අපි තුන් වතාවක් අඩු කළා. ජනතාවට අපි පොරොන්දුවක් ලබා දුන්නා ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් මිල අඩු කරනවා කියලා. අපි අවසානයේ භූමිතෙල් ලීටරයක මිල රුපියල් 44 දක්වා අඩු කළා. නමුත් අපි භූමිතෙල් ලීටරයක මිල රුපියල් 101 වනතුරු වැඩි කළේ ඇයි කියන කාරණයට බලපාන ලොකු හේතුවක් තිබෙනවා. භූමිතෙල් කලවම් කරලා පෙට්‍රල්, ඩීසල් වාහන ඔක්කොම ධාවනය කරන්න පටන් ගත්තා. ඒ සම්බන්ධයෙන් පසු ගිය කාල සීමාව ඇතුළත බොහෝ පැමිණිලි ලැබුණා වාගේම වැටලීම් ගොඩක් සිදු වුණා. අපේ පර්යන්තයෙන් එළියට යන වාහනවලටත් ඩීසල්, භූමිතෙල් කලවම් කළා. සමෘද්ධි ලාභීන්ට වාගේම ධීවර බෝට්ටුවලට අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් ඒවා නිකුත් වන බව අපිට තේරුණා. භූමිතෙල්වලට වර්ණකයක් දාලා තිබෙනවා. එහෙත් ඒක අල්ලන්න බැරිවයි අපි හිටියේ. කොහොම වුණත් භූමිතෙල් මිල වැඩි කිරීමට කලින් අපි සාමාන්‍යයෙන් දෛනිකව මෙට්‍රික් ටොන් 650ක් නිකුත් කළ බව ඔබතුමන්ලා විශ්වාස කරන්න.

ඊයේ දවසේ අපි නිකුත් කළේ මෙට්‍රික් ටොන් 150ත් - 200ත් අතර ප්‍රමාණයක්. වැසි සහිත කාලගුණය හේතුවෙන් බෝට්ටු යන්නේ නැති නිසා පොඩි වෙනසක් වෙලා ඇති. නමුත් මේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 250ක් කියලා මට හිතන්න පුළුවන්. මේ අවිධිමත් ක්‍රමය අපි ඉස්සෙල්ලාම නවත්වන්න ඕනෑ. ඒක එක් හේතුවක්. ඒ එක්කම මිනිසුන්ට සහ ධීවරයන්ට වන අලාභය - පාඩුව- ගැන, ධීවරයන්ට වන ප්‍රශ්න ගැන අපි කල්පනා කළේ නැතුවා නොවෙයි. මෙම කාරණය සම්බන්ධයෙන් ධීවර ඇමතිතුමන්ලා මුදල් ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා තිබෙනවාය කියා මා හිතනවා. නමුත් කූපන් ක්‍රමය අසාර්ථක බව අපි දන්නවා.

ඕනෑ කෙනෙකුට කූපන් දෙන්න පුළුවන්. මොනවා කළත් අපට කූපන් ක්‍රමය කළමනාකරණය කරන්න බැහැ. බෝට්ටු තිබෙන මිනිස්සුත් කූපන් ගන්නවා; නැති මිනිස්සුන්ටත් කූපන් දෙනවා. එම නිසා කූපන් ක්‍රමය ගැන එච්චර විශ්වාසයක් අපට නැහැ. අපි සමෘද්ධිය හෝ ඒ වාගේ යම්කිසි ක්‍රමවේදයකට ඒ අයට හිඟ මුදල් ලබා දීලා, බැංකුවක තැන්පත් කරලා, ඕනෑම petrol shed එකකින් තමන්ට අවශ්‍ය තෙල් ටික ගන්න පුළුවන් විධියට ක්‍රමවේදයක් හදන්න බලාපොරොත්තු වනවා. ධීවරයන්ට අසාධාරණයක් වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ. ධීවරයන්ට විතරක් නොවෙයි, ගොවිතැන් කටයුතු සඳහා යොදා ගන්නා ට්‍රැක්ටර් යනාදියටත් තෙල් අවශ්‍ය බව අපි දන්නවා. ඒ අයටත් මේ ක්‍රමවේදය හරහා සහනයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු

වනවා. ක්‍රමවේද හදලා කරන්න හිටියොත් අපට මේ කටයුත්ත කරන්න බැරි වනවා.

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කිව්වා, "පෙට්‍රල්, ඩීසල් මිල වැඩි කරනකොට රජයේ බද්ද වැඩි කරගෙන තිබෙනවා." කියලා. රජයේ බද්ද වැඩි කරලා තිබෙනවා. හැබැයි ඒක වෙලා තිබෙන්නේ, බොර තෙල් බැරලයේ මිල අඩු කිරීමත් එක්කම නොවෙයි. ඒකත් එක්කම බදු වැඩි කිරීමකුත් කරලා තිබෙනවා. ඒක මම පිළිගන්නවා. අපි ඩීසල්, භූමිතෙල්, පෙට්‍රල් මිල ගණන් අඩු කරපු වෙලාවේ කිසි කෙනෙක් ඒ සහනය පාරිභෝගික ජනතාවට ලබා දුන්නේ නැහැ නේ. කෑම-බීමවල මිල ගණන්ද, ප්‍රවාහන ගාස්තුද අඩු වුණේ නැහැ නේ. තෙල් මිල අඩු කළත් කිසිම කෙනෙක් ඒ ප්‍රතිලාභය ජනතාවට දෙන්නේ නැහැ. සාමාන්‍ය ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ, වැඩි කළාම ජනතාවගෙන් අය කර ගන්නා එකයි. එය අපේ රටේ විතරක් නොවෙයි, කොයි රටක වුණත් සිදු වන දෙයක්. අපි තෙල් මිල අඩු කිරීමේදී ඇත්තටම බදුත් අඩු කළා. බදු අඩු කරලා තමයි ඒ සහනය ජනතාවට දුන්නේ.

2015දී අපි ආණ්ඩුව භාර ගන්නකොට බොර තෙල් බැරලයේ මිල තිබුණේ ඩොලර් 58, 59 මට්ටමේ. එදා බොර තෙල් බැරලයේ වැඩිම මිල වෙලා තිබුණේ ඩොලර් 60යි. අද වනකොට ඩොලර් 78 මට්ටමට ඇවිල්ලා තිබෙනවා. ඊට සමානුපාතිකව අපි තෙල් මිල වැඩි කළා. අපේ මිල සූත්‍රය සියයට සියයක්ම නිවැරදියි, අපි එය හරියට ස්ථාපිත කරලා තිබෙනවා කියා මම කියන්නේ නැහැ. අපි යම්කිසි විධියකට ගණනය කරලා තමයි මේ ක්‍රමය හදන්නේ. හැබැයි, බොර තෙල් බැරලයේ මිල අඩු වුණාම අපි ඉන්ධන මිල අඩු කරනවා. මම බොරුවට කතන්දරයක් කියනවා නොවෙයි. බනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමතිතුමාත්, මමත් මේ ගැන දීර්ඝව මුදල් ඇමතිතුමා, අගමැතිතුමා හා ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කළා. තෙල් මිල වැඩි කරන්න අපිත් කැමැති නැහැ. අපිත් කැමැතියි අඩු කරන්න. මුලින්ම ඉන්දියානු තෙල් සමාගම මිල ගණන් වැඩි කළා. ඒ ගොල්ලෝ කිව්වා, "ඔයගොල්ලෝ වැඩි කළත් නැතත් අපි වැඩි කරනවා." කියලා. ඒ ගොල්ලෝ වැඩි කිරීමෙන් අපට තවත් පාඩු වුණා. මොකද, අපි අඩු මිලට දෙනකොට මිනිස්සු අපෙන් ඩීසල්, පෙට්‍රල් ගහන්න පටන් ගත්තා. අපි ඉන්ධන මිල ගණන් වැඩි කළේ, ඒ ගොල්ලෝ වැඩි කළ නිසා නොවෙයි. අපි වැඩි කළේ නැත්නම්, ඒක රටේ ආදායමට බලපානවා. ගොඩක් ආයතන අපට ණයයි. Ceylon Electricity Board එක අපිට සල්ලි ගෙවන්න තිබෙනවා. ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් එක අපිට සල්ලි ගෙවන්න තිබෙනවා. ඒ ගොල්ලන්ගෙන් අපට සල්ලි එන්න තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස මම කියන්න ඕනෑ, රුපියල අවප්‍රමාණයත් එක්ක අපි දැන් බඳු ගන්නේ term tendersවලට. දැන් spot tenders නැහැ. මේ මාසයේ ඉඳන් දැන් අපි ඒ ක්‍රමය ලෑස්ති කරලා තිබෙනවා. දැනට අපි term tendersවලට බඳු හය වතාවක් ගෙන්වලා තිබෙනවා. බදු වැඩි කළා තමයි. අඩු කළ බදු තමයි නැවත වැඩි වුණේ. බොර තෙල් බැරලයේ මිල වැඩි වීමත්, බදු වැඩි කිරීමත් කියන දෙකම සිද්ධ වුණා. නමුත්, මම එකක් කියන්න ඕනෑ. 2014 පැවැති මිලට වඩා අඩු මිලකටයි අපි තවමත් දීලා තිබෙන්නේ. අද හැම දෙයකම මිල ගණන් අරගෙන බැලුවොත් පසුගිය රජය කාලයේ -2014- තිබුණාට වඩා අඩු මිලක් තමයි පවතින්නේ. නමුත්, භූමිතෙල් මිලේ වෙච්ච වෙනස අපි දැන් හොයාගෙන තිබෙනවා. ඉදිරියේදී ධීවරයන්ට මෙන්ම ගොවිතැන් කරන අයටත් භූමිතෙල් සහනය දෙන්න අපට පුළුවන් වේවි කියා මා හිතනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ගරු දිලිප් වෙදආරච්චි රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 6.47]

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්ධන මිල ඉහළ දැමීම නිසා ධීවර ජනතාව මුහුණ පා ඇති ගැටලු සම්බන්ධව අපේ ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ මේ කල් තැබීමේ යෝජනාවට ගරු ඇමතිතුමාත් මමත් උත්තර ලබා දෙන්න කටයුතු කරනවා.

2015 ජනවාරි 08 වන දා අපි මේ රටේ යහ පාලන ආණ්ඩුව ඇති කරලා, අපේ රටේ සමස්ත ධීවර ජනතාවට, ග්‍රාමීය ජනතාවට සහ රටේ සමස්ත ජනතාවට ලංකා ඉතිහාසයේ කිසිම රජයකින් අඩු නොකරපු ආකාරයට පෙට්‍රල්, ඩීසල්, ලාම්පුතෙල් හා ගෑස් මිල අඩු කළ බව විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ඒ මිල අඩු කරලා දැන් අවුරුදු 3කට ආසන්න කාලයක් වෙනවා. එසේ ඉන්ධන මිල අඩු කිරීම තුළින් විශේෂයෙන්ම ධීවර ජනතාව විශාල සහනයක් ලැබුවා. ඉන්ධන මිල අඩු වීම නිසා තමන්ගේ පවුල්වල සෑම කටයුත්තක්ම කරදරයක් නැතුව කිරීමට අවස්ථාව උදා වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉන්ධන මිල වැඩි වීම නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාට පමණක් නොවෙයි, කැබිනට් ඇමති අපේ ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමාටත්, මටත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ධීවර ක්ෂේත්‍රයේ ධීවර කර්මාන්තයේ නියැලෙන ජනතාවත් එක්ක කටයුතු කරන පුද්ගලයන් හැටියට අපට මෙය විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ජනතාවත් සමඟ නිතර පාරේ බැහැලා යන, නිතරම වැල්ලට ගිහින් මිනිසුන් මුණ ගැහෙන මන්ත්‍රීවරුන් හැටියට අපට ඉන්ධන මිල වැඩි වීම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපේ කැබිනට් ඇමතිතුමා වැඩ භාර ගෙන දවසක් පමණක් ගත වනකොට සිදු වුණු පළමුවන දේ තමයි ඉන්ධන මිල වැඩි වීම. එතුමාගේ නායකත්වයෙන් යුතුව, මමත්, අපේ නියෝජ්‍ය ඇමතිතුමාත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, අධ්‍යක්ෂ ජනරාල්තුමාත්, නිලධාරිනුත්, මුළු දිවයිනේම ධීවර සංවිධානවල නියෝජිතයනුත් පාර්ලිමේන්තුවට කැඳවා, ඉන්ධන සහනාධාරය ලබා දෙන වැඩ පිළිවෙළ ගැන විශේෂ සාකච්ඡාවක් පවත්වා, එක් එක් අයගෙන් ඒ සම්බන්ධයෙන් කරුණු විමසුවා. එක් එක් කණ්ඩායම්, එක් එක් ආකාරයේ යෝජනා ඉදිරිපත් කළා. තවත් කණ්ඩායම් තවත් යෝජනා ඉදිරිපත් කළා. සමස්තයක් වශයෙන් මුළු රටේම ධීවර ජනතාවට එක හා සමානව ඉන්ධන ලබා දීම සුදුසු නැහැ. මා එය තේරුම් කරලා දුන්නා. එක් එක් ප්‍රදේශවල දුර ප්‍රමාණය වැඩියි; වෙනස්. දකුණු පළාතේ පොඩි බෝට්ටු හිමියන්ට ඉන්ධන ලීටර් 75කින්, ලීටර් 100කින් රක්ෂාව කරන්න පුළුවන්. හලාවත ප්‍රදේශයට ඉන්ධන ලීටර් 150ක් හෝ ලීටර් 200ක් පමණ අවශ්‍ය වෙනවා. තවත් ප්‍රදේශයකට තවත් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. ධීවර කර්මාන්තයේ යෙදෙන පොඩි බෝට්ටු හිමියන්ට රැකියාව කරගෙන එන්න ගොඩ ඉඳලා යන දුර ප්‍රමාණය එක් එක් ප්‍රදේශ අනුව වෙනස් වෙනවා. ඒ නිසා ඒ අනුව ඉන්ධන ලබා දීමේ වැඩ කටයුතු පිළිබඳව අපි සාකච්ඡා කළා. අපටත් අවශ්‍ය වන්නේ, ඉන්ධන මිල අඩු කරලා හෝ සහනාධාරයක් වශයෙන් හෝ උපරිම ඉන්ධන ප්‍රමාණය ධීවරයාට ලබා දෙන්නයි. ධීවරයා නිසා තමයි අපේ රටට විදේශ විනිමයක් උත්පාදනය වන්නේ. ධීවර කර්මාන්තයෙන් තමයි අපේ ජනතාව රටට මුදල් උත්පාදනය කරන්නේ. රටට ප්‍රශ්නයක් නොවී ජීවිකාව

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ගෙන යන්නේ අපේ ධීවර ජනතාවයි. අපි ඒ අය ගැන බලන්න ඕනෑ. කැබිනට් ඇමතිතුමාත්, මමත් ඒ අයට යෝජනා කළා, මේ ඉන්ධන ලබා දෙන්න ක්‍රමවත් විධියක් යෝජනා කරලා අපට ඉදිරිපත් කරන්නය කියලා. කැබිනට් ඇමතිතුමා තරයේම ඉල්ලීමක් කළා, හැම දිස්ත්‍රික්කයෙන්ම, හැම පළාතෙන්ම ආපු නියෝජිතයන් සමඟ නියෝජිත කණ්ඩායම් හැදිලා, අපේ ලේකම්තුමාත්, අධ්‍යක්ෂ ජනරාල්තුමාත්, අපේ නිලධාරි මණ්ඩලයත් සමඟ සාකච්ඡා කරලා තීරණයක් ගන්න කියලා. අපි ඒ උපදෙස් ලබා දීලා දැන් දින කිහිපයක් වෙනවා. මා හිතන හැටියට තවමත් එයට හරියාකාර විසඳුමක් ලැබුණේ නැහැ. එක් එක් යෝජනා ලැබෙනවා. දැන් පොඩි බෝට්ටු හිමියකුට රුපියල් 21,375ක ඉන්ධන සහනාධාරයක් දෙන්න තීරණය කරලා තිබෙනවා. දැනට පොඩි බෝට්ටු 24,850ක් ධීවර කර්මාන්තයේ නියැලෙනවා. එක බෝට්ටුවකට මාසයකට ඉන්ධන ලීටර් 375ක් සඳහා රුපියල් 21,375ක ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්න අපේ ගරු ඇමතිතුමාත්, අපි කවුරුත් සාකච්ඡා කරලා තීරණය කළා.

2012දී පොඩි බෝට්ටු හිමියාට ලබාදුන් තෙල් සහනාධාරය වුණේ මාසයකට රුපියල් 9,370යි. අපි 2018දී එක් බෝට්ටුවක් සඳහා රුපියල් 21,375ක තෙල් සහනාධාරයක් ලබාදෙන්න තීරණය කළා. තෙල්වල colour එක වෙනස් කරලා හෝ එම සහනාධාරය ලබාදෙන්න කියලා ඔවුන් ඉල්ලීමක් කළා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, දැන් ඇමෙරිකානු ඩොලරය ඉහළ ගිහින්, රුපියලේ වටිනාකම අඩුවෙලා තිබෙනවා. එදා ඩොලර් එක රුපියල් 130යි; අද රුපියල් 159යි. විශේෂයෙන්ම ඒ ගැන සැලකිලිමත් වෙන්න. ඒ විධියට බැලුවාම කලින් ලබාදුන් සහනාධාරයයි, දැන් ලබාදෙන සහනාධාරයයි අතර වෙනසක් නැහැ නේද ගරු රාජ්‍ය ඇමතිතුමනි? රුපියලේ අගය අඩුවීම නිසා එම ගණනේ වෙනසක් නැහැ. ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

අපි ඒ ගැන අවධානය යොමු කරන්නම්. ගරු ඇමතිතුමා සමඟත් සාකච්ඡා කරනවා. ඒ ආකාරයට තමයි අපි මේ සහනාධාරය ලබාදෙන්න කටයුතු කරන්නේ. ධීවරයින්ට සහ සෑම සමෘද්ධි හිමියෙකුටම මේ මුදලට තෙල් ටික ලබාදෙන්න කියලා තමයි ගරු ඇමතිතුමාත්, මමත් මුදල් ඇමතිතුමාගෙනුත්, ගරු අගමැතිතුමාගෙනුත්, ගරු ජනාධිපතිතුමාගෙනුත් ඉල්ලීමක් කළේ. ඔවුන්ට ලබාදෙන තෙල්වල වර්ණය වෙනස් කොට, අනිත් අයට ලබාදෙන තෙල් ඕනෑම ආකාරයකට ලබාදෙන්න කියලා තමයි අපි ඉල්ලීම කළේ. නමුත්, මුදල් අමාත්‍යාංශය සහ මුදල් ඇමතිතුමා සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කළේ නැහැ. අපේ ඇමතිතුමා අලුත් සංශෝධනයක් හදලා නැවත වතාවක් මෙය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න තීරණය කරලා තිබෙනවා. එතුමා එම වැඩ පිළිවෙළ ගැන ප්‍රකාශ කරයි.

අපි අවුරුදු 3ක් මේ සහනය ලබා දුන්නා. රාජපක්ෂ ආණ්ඩුව තිබුණු කාලයේ ලාම්පු තෙල් ලීටරයක් රුපියල් 106යි. අපි රුපියල් 44 ගණනේ අවුරුදු 3ක් ලබා දුන්නා. දැන් රුපියල් 101 දක්වා වැඩි කරලා තිබෙන්නේ රටේ ඇති වී තිබෙන ප්‍රශ්න නිසයි. ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාත් ප්‍රකාශ කළා. බදු වැඩි වෙනවා, බදු ගහනවා, රට ගෙනියන්න ඕනෑ වැනි වැඩ පිළිවෙල් නිසා භූමිතෙල් මිල වැඩිවෙන්න හේතුවක්. නමුත්, ධීවරයා කියන්නේ, සමෘද්ධිලාභියා කියන්නේ දුප්පත්, අහිංසක මිනිස්සු. ඒ මිනිසුන්ට අපි මේ සහනය ලබාදෙන්න ඕනෑ. ඔවුන් වෙත මෙතෙක් ලබාදුන් මුදලටම ලාම්පු තෙල් ලබාදෙන්න කියන යෝජනාව ගරු ඇමතිතුමාත්, මමත් හෙට ගරු මුදල් ඇමතිතුමාට ඉදිරිපත් කරනවා.

ගරු අමාත්‍යවරයෙක් ප්‍රකාශ කළා, ධීවර ආම්පන්නවල මිල ඉහළ ගිහින් තිබෙනවා කියලා. ඒ ගැන අපි සාකච්ඡා කරගෙන යනවා. ඒවාට බදු සහන ලබාදෙන්න ගරු ඇමතිතුමාත් මමත් සාකච්ඡා කරනවා. ධීවර ආම්පන්න බදුවලින් නිදහස් කරන්න අවශ්‍ය වැඩ කටයුතු අපි දැන් කරනවා. ඒ වාගේම වරාය ගාස්තු පිළිබඳවත් අපේ අවධානය යොමුවෙලා තිබෙනවා.

මත්ස්‍ය අස්වැන්න පිළිබඳව ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කථා කළා. මත්ස්‍ය අස්වැන්නෙන් සියයට 40ක්වත් අපට රැකගන්න බැහැ. ඒකයි ඇත්ත කථාව. විශාල cold rooms ගෙන්වලා, ඒවා උතුරේත්, දකුණේත් ස්ථාපිත කරලා, මාළු අස්වැන්න වැඩියෙන් ලැබෙන කාලයට ඒවා cold roomsවල ගබඩා කරලා, අවශ්‍ය කාලයට ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කිරීම පිළිබඳව මම ගරු ඇමතිතුමා සමඟ සාකච්ඡා කරමින් පවතිනවා. ඒ මහින් මුදල් උත්පාදනය කරන්නත් පුළුවන්. අපේ රටේ මාළු අස්වැන්න අපතේ නොයන විධියට වැඩ කටයුතු කරන්න අපි කටයුතු කරනවා.

මාළු අස්වැන්න අපතේ යන නිසා ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමාගේ යෝජනාවක් අනුව අපි අඩි 55 යාත්‍රා ගෙන්වලා, ධීවර කර්මාන්තයේ යෙදී සිටින අයට ඒවා සහන ක්‍රමයට ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. නමුත්, ඒවා ධීවරයින්ට නම් ගන්න ලැබෙන්නේ නැහැ. සල්ලි තිබෙන අයට පමණයි ගන්න ලැබෙන්නේ. එම යෝජනාව අසාර්ථකයි. අඩි 45, 50 වගේ බෝට්ටුවලට ගියා නම් ඒ වැඩ පිළිවෙළ සාර්ථක වෙනවා. නමුත් කරන්න දෙයක් නැහැ, එදා ගත් තීරණය අද ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමාත්, මමත් සාකච්ඡා කරලා ලබන අවුරුද්දේ ඉඳලා බහුදින යාත්‍රාවලින් සියලුම මාළු සුරක්ෂිතව රැගෙන ඒමට පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කර ඉදිරියට ගෙන යනවාය කියන එකත් ප්‍රකාශ කරනවා.

මම කථා කරන්න වැඩි කාල වේලාවක් ගන්නේ නැහැ. ගරු ඇමතිතුමා මේ පිළිබඳව කරුණු පැහැදිලි කරයි. ධීවරයින්ට මෙම සහනය ලබාදෙන්න අපි රුපියල් කෝටි 4,000ක මුදලක් දැනටමත් වෙන් කරගෙන තිබෙනවා. නිහාල් ගලප්පත්ති මැතිතුමනි, හෙට හෝ කමක් නැහැ ඔබතුමා අපේ අමාත්‍යාංශයට ඇවිල්ලා ධීවර දිස්ත්‍රික් නියෝජිතයින් සහ අපි සියලුදෙනාම එකතු වෙලා සාකච්ඡා කරලා මෙම සහනාධාර ලබාදීම සඳහා හැකි ඉක්මනින් ක්‍රමවේදයක් හදාගනිමු. මොකක් හෝ ඒකාබද්ධ තීරණයක් ගන්න ඔබතුමාත් අප හා එක්වෙන්න කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමා.

[අ.භා.6.58]

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා)

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ඇමතිවරයා හැටියට පත් වෙලා වැඩි කාලයක් ගියේ නැහැ, රටේ තෙල් මිල වැඩි වුණා. තෙල් මිල ඉහළ යාම හේතුවෙන් අපේ ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමන්ලා ජනතාව පාරට බැස්සුවා. ඊළඟට, කිරිවලට සල්ලි දුන්නේ නැහැ කියලා අනුරාධපුරයේ ජනතාව පාරට බැස්සුවා. "පුදන කොටම කාපි යකා" කියලා විශාල අර්බුදයකට මට මුහුණ දෙන්න සිදු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු සම්බන්ධයෙන් සහ තෙල් මිල වැඩි වීම සම්බන්ධයෙන් මම කථා කරන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේලා ඉතාම වැදගත් අදහස් ඉදිරිපත් කළා. අද දවසේ මෙම යෝජනාව ගෙන ඒම සහ ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාටත්, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. අපේ ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ නියෝජ්‍ය ඇමතිතුමියත්, මගේ අමාත්‍යාංශය භාර රාජ්‍ය ඇමතිතුමාත් මේ යෝජනාවට පිළිතුරු දුන්නා. අපි මේ රටේ ධීවර ජනතාවට විධිමත්ව සහන සලසන්නේ කොහොමද, ඔවුන්ගේ කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව පසු ගිය දවස්වල මමත්, මගේ අමාත්‍යාංශය භාර රාජ්‍ය ඇමතිතුමාත් එකතු වෙලා සාකච්ඡා කළා. ඒ විතරක් නොවෙයි. නෝර්වේ තානාපතිතුමා, ඕස්ට්‍රේලියාවේ තානාපතිතුමා, ඉන්දියාවේ තානාපතිතුමා සමහත් අපි මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. ධීවරයින් කියන්නේ ඉතාම අවංක පිරිසක්; අපි ආදරය කරන ජන කොටසක්. ඒ වාගේම ඔවුන් මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට යම් කිසි පංගුවක් නිෂ්පාදනය කරන, විදේශ විනිමය උපයන ඉතා වැදගත් සමාජ කණ්ඩායමක් හැටියටයි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මම අවබෝධ කරගෙන තිබෙන්නේ. තෙල් මිල වැඩි වුණු ගමන් මම කැබිනට් පත්‍රිකාවක් හදලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. එය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කරන්න තවත් කාලයක් ගත වන නිසා, ඒ කාර්යය නොකර, සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කිරීම තුළ, පිටත එන්ජිම සවි කරන ලද පාරම්පරික ධීවර යාත්‍රා සඳහා රුපියල් තිස්හතරකෝටි අනූතුන්ලක්ෂ හැත්තෑහතරදහස් තුන්සියහැත්තෑපහක මුදලකුත්, පිටත එන්ජිම සවි කරන ලද fibre glass යාත්‍රා සඳහා රුපියල් තුන්සියතිස්හය කෝටි අසූඅටලක්ෂ හයදහස් අටසිය හැත්තෑපහක මුදලකුත් අපට ලබා දෙන්න අනුමත කළා. හරියටම බැලුවොත්, එය රුපියල් බිලියන 4කට ආසන්න මුදලක්. අතිගරු ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, කැබිනට් මණ්ඩලයටත් මම ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ධීවර ජනතාවට වැඩි වුණු තෙල් මිල ප්‍රතිපූරණය කරන්න රජය ඒ මුදල වෙන් කර දුන්නායි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා. මුදල් ඇමතිවරයා හැටියට ගරු මංගල සමරවීර ඇමතිතුමාටත් ඒ සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.

අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ අපි මේ මුදල වෙන් කරලා මේ රටේ හැම ධීවර සංවිධානයක්ම කැඳෙව්වා. ඔවුන් එක්ක අපි ඉතාම සතුටු සාමීචියේ යෙදෙමින් සාකච්ඡා කළා. ඔවුන් හැම දෙනාටම අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව දීලා අපි ඇහුවා, "ඔබලාට මේ සහනාධාරය ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද?" කියා. නමුත්, කනගාටුවට කරුණක් තමයි ඒ ධීවර සංගම් සමඟ අපට එකඟතාවකට එන්න බැරි වීම. එකඟතාවට එන්න බැරි වුණු නිසා අපි කිව්වා, "එහෙනම් කමිටුවක් හැදිලා ඒ කමිටුවෙන් අපට යෝජනාවක් දෙන්න" කියලා. නමුත්, අද වනතුරු ඒ ලැබෙන යෝජනා පරස්පර විරෝධියි. එකඟතාවක් නැහැ; ඒකමතික භාවයක් නැහැ. රජයකට එක ක්‍රමයකට ඒක ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නැහැ.

මේ තත්ත්වය තුළ, අද දවසේත් මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. විශේෂයෙන් මීගමුව දිස්ත්‍රික් ධීවර සංවිධානය හැර, අනෙක් ධීවර සංවිධාන කැමැත්ත පළ කළා, බැංකු ගිණුමට මුදල් තැන්පත් කරදෙන එකට. නමුත්, මීගමුව දිස්ත්‍රික් ධීවර සංවිධානය මට ලිපියක් එවා තිබෙනවා. එම ලිපියෙහි සඳහන් වෙනවා, "ඉන්ධන මිල ඉහළ යාම සම්බන්ධයෙන් 2018/05/15 වන දින ගරු ඔබතුමා සමඟ පැවැති සාකච්ඡාවේදී අමාත්‍යාංශය මඟින් ධීවරයින්ට ඉන්ධන සහනාධාරය වශයෙන් භූමි තෙල් භාවිතා කරන ධීවරයින්ට බැංකු ගිණුමට මුදල් තැන්පත් කර දෙන බවට ධීවර සංවිධාන නියෝජිතයින්ව දැනුවත් කරන ලදී. නමුත්, ධීවර සංවිධාන නියෝජිතයින් එම යෝජනාවට කැමැත්ත පළ නොකළ අතර, පැවැති මිලටම යම් වර්ණකයක් යොදා ධීවර ප්‍රදේශවලට බෙදා හරින ලෙස ඉල්ලා සිටින ලදී." යනුවෙන්.

මේ ඉල්ලීම කළේ, මීගමුව දිස්ත්‍රික් ධීවර සංවිධානය විසිනුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද මේ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඊළඟට, මේ ධීවර සංවිධානය මොකක්ද කියා තිබෙන්නේ? මා මේක ඇතුළාන්තයේ තිබෙන තවත් කරුණු ගැන කථා කරන්නේ නැහැ. මීගමුව දිස්ත්‍රික් ධීවර සංවිධානය විසින් එවා තිබෙන 2018.05.21 දිනැති මෙම ලිපිය මම **සභාගත*** කරනවා.

එම ලිපියේ අවසානයේ තිබෙනවා, "එම නිසා ගරු ඇමතිතුමනි, පත් කරන ලද කමිටුව ඔබතුමා හා අදාළ ආයතන සමඟ තීරණයක් ගැනීමට ඉතා කඩිනමින් කැඳවන ලෙස ගෞරවයෙන් හා කාරුණිකව ඉල්ලා සිටිමු." යනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඔවුන්ට සාධාරණය සහ යුක්තිය ඉටුවෙන ආකාරයෙන් මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා නියම කළා, මංගල සමරවීර මුදල් ඇමතිතුමා සමඟ මේ කමිටුව නැවත සාකච්ඡා කරලා වාර්තා කරන්න කියලා. අද මම ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව ලබන අමාත්‍ය මණ්ඩල රැස්වීමට තමයි අරගන්න නියමිතව තිබුණේ. නමුත් මම විශේෂ කරුණු සම්බන්ධයෙන් කථා කරන අවස්ථාවේ මේ ගැන නැවත මතු කරලා අරගෙන සාකච්ඡා කළා. නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, අපි බලාපොරොත්තු වෙනවා, තවදුරටත් සාකච්ඡා කරලා ධීවරයින්ට අසාධාරණයක් නොවන ආකාරයෙන් කටයුතු කරන්න. ඒ වාගේම මම එක කාරණයක් මතක් කරනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා

(மாண்புமிகு நிஹால் கலப்பத்தி)

(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමනි, ධීවරයා බෝට්ටු තියාගෙන නිකම් ඉන්නේ නැහැ. ඒ ගොල්ලන්ගේ කර්මාන්තය ධීවර කර්මාන්තය නේ. ඔබතුමා ඒ ගැන දන්නවා. ඒ නිසා මේක කඩිනම් කරන්න. අපේ එකම ඉල්ලීම "පෙර පැවති මිලට ධීවරයාගේ අවශ්‍යතාවට සරිලන සේ" කියන එකයි. ඕනෑම "ෂෙඩ්" එකකින් ගන්න පුළුවන් විධියට කළා නම් ඇති.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

හැබැයි, ගරු මන්ත්‍රීතුමා, විද්‍යාත්මක ක්‍රමවේදයක් අවශ්‍යයි. සමහර විට මේ මුදල් ගියාම ඒ බෝට්ටුවේ අයිතිකරුවා දෙන්නේ නැහැ. අපට ධීවර මහත්වරු කිව්වා. [බාධා කිරීමක්] ධීවර කර්මාන්තය කරන කට්ටිය වෙනයි. කොටසට ධීවර කර්මාන්තය කරන අය ඉන්නවා. [බාධා කිරීමක්] දෙන්නේ නැහැ. තව කාරණයක් තිබෙනවා. සමහර ඒවා නමට register වෙලා තිබෙනවා. නමුත් කෙරෙන්නේ නැහැ. මේකට අපි නව තාක්ෂණය උපයෝගී කරගෙන ක්‍රමයක් හදන්න ඕනෑ.මම ඕස්ට්‍රේලියාවේ තානාපතිතුමාට කිව්වා, කරුණාකරලා Vessel Monitoring System එක අපේ හැම යාත්‍රාවකටම නොමිලයේ දෙන්න කියලා. අපේ ධීවරයාගේ ආරක්ෂාව වෙනුවෙන් ඒක දෙන්න කියලා. ඒක දුන්නොත් ධීවර යාත්‍රාවක් අතර මං වුණොත් කොහේද තිබෙන්නේ කියන කාරණය අපට බලාගන්න පුළුවන්. අපි බහුදින යාත්‍රාවලට සහ එක් දින යාත්‍රාවලට යම්කිසි අය කිරීමක් කරනවා. අපි ඕස්ට්‍රේලියාවෙන් සියලුම යාත්‍රාවලට ඉල්ලුවා, Vessel Monitoring System එක නොමිලයේ දෙන්න කියලා. එවැනි විද්‍යාත්මක ක්‍රම මඟින්, යාත්‍රා කොපමණ කිලෝමීටර ගණනක් යනවාද කියලා අපට හරියටම monitor කරන්න පුළුවන්. මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා කරුණාකර අපට උදව් කරන්න, ආධාර කරන්න කියලා අපි ඉල්ලුවා. ඔවුන් යම් එකඟතාවක් පළ කරලා තිබෙනවා. ඒ නිසා අපි ඒ ක්‍රමවලට ඉදිරියේදී ගමන් කරලා ධීවරයාගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න කටයුතු කරනවා.

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධයෙන් මම විශේෂයෙන් මතක් කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ ඔබතුමන්ලා අනුරාධපුරයේ කිරි ගොවීන් පාරට බැස්සුවා. දවස් පහලොවකට සැරයක් රුපියල් මිලියන හත්සියයක් අපි කිරිවලට දෙන්න ඕනෑ. අපි බලනකොට කිරි පැකට් 15 ලක්ෂයක් විනාශ වෙලා. කිරි මුට්ටිය ගඟේ ගිහිල්ලා. අලුතෙන් සවි කරපු යන්ත්‍ර සූත්‍රවලින් නියම රසය සහ සුවඳ එන්නේ නැහැ. හැබැයි, එක කාරණයක් මම මතක් කරනවා. අපේ හයිලන්ඩ් කිරි පිටි ඉතාම හොඳ තත්ත්වයේ තිබෙනවා. ඒවායේ සත්ත්ව තෙල් නැහැ; ශාක තෙල් නැහැ; පරමාණු නැහැ. නියම කිරි තිබෙන්නේ. අපේ සුරබි දෙනගේ කිරි, අපේ කිරි අම්මාගේ කිරි තිබෙන්නේ. එහෙම නැත්නම් අපේ කිරි ගොවියා නිෂ්පාදනය කරන කිරි තමයි තිබෙන්නේ. ඒවා ඉතාම පිරිසිදු කිරි. නමුත් අභාග්‍යයක මහත. ගරු නලින්ද ජයතිස්ස මැතිතුමනි, ඔබතුමා වෛද්‍යවරයෙක්. මේ කිරිවල සෙම තිබෙනවා කියලා සමහර දොස්තර මහත්වරු කියනවා. අපේ අම්මලාටත් දරුවන්ට දෙන්න කියා විජාතික සමාගම්වල විවිධ කිරිපිටි වර්ග නම් කරනවා. ඒවාට දීලා තිබෙන සහනාධාර බලන්න. අපි මේ කිරි කම්හල නවීකරණය කරලා, මේ රටේ පාසල් දරුවන්ට කිරි වීදුරුවක් දෙන්න පුළුවන් මට්ටමට ගේන්න පුළුවන් කියන කථාවත් මම ඔබතුමන්ලාට මතක් කරනවා. ඒ වාගේම කිරි ගොවියාට නියමිත වෙලාවට මුදල් දෙන්න අද මේ වෙනකොට කටයුතු කරනවා. අනුරාධපුරයේ කිරි ගොවියාට විතරක් නොවෙයි, සමස්ත කිරි ගොවියාට අපේ රජයෙන් -භාණ්ඩාගාරයෙන්- මුදල් වෙන් කරගෙන ඒ ගෙවීම් කරන්නත් අපි කටයුතු කරගෙන යනවා. ඒ නිසා මට මේ කාරණයට පුංචි කාලයක් දෙන්න. හත් දෙයියනේ! මේක අර පුදනකොටම කාපි යකා වාගේ එක පාරටම මම ඇමතිවරයා හැටියට පත්වුණු ගමන් ජනතා විමුක්ති පෙරමුණේ අපේ සහෝදරවරු මෙහෙම අරගළ කරන එක හොඳද කියලා මා කරුණාවෙන් අහනවා. අපි සාකච්ඡාවෙන්, සම්මන්ත්‍රණයෙන්, සම්මුතියෙන් මේ ප්‍රශ්න විසඳා ගනිමු. අඩු පාඩු ඇති. අපේ රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ අපි එකට වාඩි වෙමු; එකට සාකච්ඡා කරමු; එකට තීරණ ගනිමු.

මාත් අවුරුදු ගණනක් විපක්ෂය නියෝජනය කළ කෙනෙක්. සහෝදර නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමන්ලාත් සමඟ අපි හිටියා. ආණ්ඩු පාර්ශ්වයේ වුණත් විරුද්ධ පාර්ශ්වයේ වුණත් මේ පාර්ලිමේන්තුවෙන් ජනතාවට ලැබෙන වරප්‍රසාදවලදී අපි එකාමෙන් එකට නැඟිටලා, එකට හිටගෙන, එකට කථා කර, එක මතයක ඉඳගෙන කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා.

තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. අපි මේ ගැන පියතුමන්ලා සමඟත් කථා කළා. රොසයිරෝ පියතුමා සමඟ කථා කළා. ගරු කාවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා අපට ධීවර සංගම් නියෝජිතයන් සම්මුඛ කළා. අපි ඔවුන් සමඟත් සාකච්ඡා කළා. මම අපේ සහෝදර ධීවර ජනතාවට මේ ටිකත් කියනවා. තමුන්නාන්සේලා පාරට බහින්න. පාරට බැස්සාට කලකෝලාහල කරන්න එපා. අපෙන් වරදක් වෙලා තිබෙනවා නම්, අපෙන් අඩුපාඩුවක් වෙලා තිබෙනවා නම්, තමුන්නාන්සේලාට ඕනෑ නම් මගේ අමාත්‍යාංශය ඉස්සරහට ඇවිත් මට බණින්න. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයන්ටත් මම ඒක කියනවා. තමුන්නාන්සේලාටත් වීදි සටන් අවශ්‍යයි, පැවැත්ම සඳහා. ඕනෑම වීදි සටනක්, කියන්න තිබෙන දෙයක් මගේ අමාත්‍යාංශය ඉස්සරහට ඇවිත් කරන්න; කියන්න. මම ගල් ගහන්නේත් නැහැ, වෙඩි තියන්නේත් නැහැ, පොලිසිය යොදවා වතුර ගස්සන්නේත් නැහැ. අපි ඒවාට මුහුණ දෙන්න සූදානම් කියන කාරණයත් මතක් කරනවා. ඒ වාගේම අපි ධීවර ජනතාවටත් කියනවා කරුණාකර ඉවසිල්ලෙන් කටයුතු කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ගැන මම හොඳට දන්නවා. ඒ නිසා මම එතුමා ගැන වැඩිපුර කථා කරන්න යන්නේ නැහැ. එතුමා මගේ පරණ මිත්‍රයා. අපි දෙන්නාම 1989 වර්ෂයේදී තමයි පාර්ලිමේන්තුවට ආවේ. ඒ නිසා අපට මේ ප්‍රශ්න කථා කරගන්න පුළුවන්. ඔබතුමන්ලා මේ යෝජනාව ගෙන ඒම ගැන ස්තුතිවන්ත වෙනවා.

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ විවාදය අද රූපවාහිනියෙන් පෙන්වන්නේ නැති නිසා, ජනතාවගේ පැත්තෙන් කථා කරන්න, ජනතාව වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන්න, අදහස් ඉදිරිපත් කරන්න ඒකාබද්ධ විපක්ෂයේ නියෝජනයක් මේ අවස්ථාවේ නැහැ. ඔවුන්ට එවැනි අවශ්‍යතාවක් නැහැ. මේ රටේ ජනතාව මුළා කර ගෙන, ජනතාවගේ ඇහැට වැලි ගහලා ඡන්දය ලබාගෙන බලයට පත්වීම තමයි ඔවුන්ගේ එකම අරමුණ වෙලා තිබෙන්නේ කියන එකත් මේ අවස්ථාවේ මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ. භා. 7.10 ට, 2018 මැයි 23 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.


அதன்படி பி.ப. 7.10 மணிக்கு பாராளுமன்றம், 2018 மே 23, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.10 p.m. until 1.00 p.m. on Wednesday, 23rd May, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

260 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 260 - இல. 6
Volume 260 - No. 6

2018 මැයි 23වන බදාදා
2018 மே 23 , புதன்கிழமை
Wednesday, 23rd May, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

උතුරු ප්‍රදේශයේ වන විනාශය

සීමාසහිත ඊටීඅයි ෆිනෑන්ස් ආයතනයේ තැන්පත්කරුවන් මුහුණ දී ඇති අර්බුදය

ජාතික පාරිසරික පනත:

නියම

ජාතික පාරිසරික පනත:

නියෝග

කල් තැබීමේ යෝජනාව:

ගොවි නිෂ්පාදන සෘජුව මිලදී ගැනීමේ ක්‍රමවේදය

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

தனி அறிவித்தல் மூல வினா:

வடக்கில் இடம்பெறும் காடழிப்பு நடவடிக்கைகள்

வரையறுக்கப்பட்ட ஈரீஐ நிதி நிறுவன வைப்பாளர்கள் எதிர்நோக்கும் நெருக்கடி

தேசிய சூழல் சட்டம்:

கட்டளைகள்

தேசிய சூழல் சட்டம்:

ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:

விவசாய உற்பத்திகளை நேரடியாகக் கொள்வனவு செய்யும் முறைமை

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

QUESTION BY PRIVATE NOTICE:

Deforestation in the North

Crisis Faced by Depositors of ETI Finance Limited

NATIONAL ENVIRONMENT ACT:

Orders

NATIONAL ENVIRONMENT ACT:

Regulations

ADJOURNMENT MOTION:

Methodology for Direct Purchase of Farm Produce

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

***2018** මැයි 23වන බදාදා*
2018 மே 23 , புதன்கிழமை
Wednesday, 23rd May, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා]
මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய)
தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

තේරීම් කාරක සභා රැස්වීම
தெரிவுக்குழுக் கூட்டம்
MEETING OF COMMITTEE OF SELECTION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තේරීම් කාරක සභාවේ රැස්වීමක් අද දින පස් වරු 2.45ට මාගේ නිල කාමරයේදී පැවැත්වෙන බව දන්වනු කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ විශේෂ විගණන වාර්තාවේ දසවැනි කාණ්ඩයේ III, XI සහ XII කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2014/2015 හා 2015/2016 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2012 වර්ෂය සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා ව්‍යාපාර සහ වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(i) 2013 වර්ෂය සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2014 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්.

එම වාර්තා නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2015 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2013 සහ 2014 වර්ෂ සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා;

(ii) 2015 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2015 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව;

(iv) 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ වාර්ෂික වාර්තා; සහ

(v) ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education and Human Resources Development on the -

(i) Annual Performance Report of Ministry of Higher Education and Highways for the year 2016;

(ii) Annual Report of the Eastern University, Sri Lanka for the year 2014;

(iii) Annual Reports and Annual Accounts of the Postgraduate Institute of English of Open University of Sri Lanka for the years 2014 and 2015;

(iv) Annual Report of the Sri Lanka Institute of Advanced Technological Education for the year 2015;

(v) Annual Report of the University of Colombo for the year 2015;

(vi) Annual Report of the Postgraduate Institute of Pali and Buddhist Studies of University of Kelaniya for the year 2015; and

(vii) Annual Report of the Buddhist and Pali University of Sri Lanka for the year 2015 which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය. ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

උතුරු ප්‍රදේශයේ වන විනාශය
வடக்கில் இடம்பெறும் காடழிப்பு நடவடிக்கைகள்
DEFORESTATION IN THE NORTH

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, சுற்றாடல் அமைச்சர் மேதகு ஜனாதிபதி அவர்களிடம் இந்தக் கேள்வியைக் கேட்க அனுமதித்தமைக்கு நன்றி!

වඩක්කු මාකාණත්තිල් තොටර් වරට්චි කාරණමාක විවසායම්, නන්නීර් මීන්පිටි, කාල්නටෙ වළර්ප්පුප් පෝන්ර එමතු මක්කළින් මුක්කිය වාළ්වාතාරත් තුරෙකළ් තොටර් පාතිප්පුක්කළුක්කු උට්පට්ටු වරුවතුටන්, කාල්නටෙකළ් උට්පට එමතු මක්කළුම් කුටිනීර් මට්රුම් නීර්ත් තට්ටුප්පාටු කාරණමාකප් පාරිය පාතිප්පුක්කළුක්කුළ්ළාකි වරුකින්රනර්. ඉත්තකෙය වරට්චි නිලෙමෙක්කු මික මුක්කිය කාරණංකළිල් ඔන්රාක වඩක්කු මාකාණත්තිල් ඉටම්පෙට්රු වරුකින්ර චට්ටවිරෝත කාටලිප්පු නටවටික්කෙකළ් ඉනංකාට්ටප්පට්ටු වරුකින්රපෝතිලුම්, මේට්පටි චට්ටවිරෝත චෙයට්පාටුකළ් ඉතුවරෙයිල් තටුත්තු නිරුත්තප්පටවිල්ලෙ එන්පතු කුරිප්පිටත් තක්කතු.

වවුනියා පූවරචන්කුළම් චන්තියිලිරුන්තු වෙළ්ළාංකුළම් චන්තියෙ ඉණෙක්කින්ර පිරතාන වීතියිල් අමෙන්තුළ්ළ වවුනියා මාවට්ටත්තුක්කුට්පට්ට මටුක්කුළම්, වේලංකුළම්, මණ්කිණ්ටි, මට්රුම් මන්නාර් මාවට්ටත්තුක්කුට්පට්ට විළාත්තික්කුළම්, පරචන්කුළම්, වලෙඤන්කට්ටු, ඉරණෙ ඉලුප්පෙක්කුළම්, මුල්ලෙත්තීවු මාවට්ටත්තුක්කුට්පට්ට මූන්රු මුරිප්පු, වීරප්පරායර් කුළම්, පනංකාමම්, නට්ටාංකණ්ටල් පෝන්ර පිරතේචංකළිල් පල වරුටකාලප් පළෙමෙවාය්න්ත පෙරුමති මික්ක මරංකළ් අටර්න්තුළ්ළ වනප් පකුතිකළිල් චට්ටරෝත මරම් වෙට්ටල් චෙයට්පාටුකළ් නාළාන්තම් ඉටම්පෙට්රු වරුවතාකවේ තෙරියවරුකින්රතු. ඉත්තකෙය චෙයට්පාටුකළෙත් තටුත්තු නිරුත්ත වේණ්ටිය අරස අතිකාරිකළ් මේට්පටි චෙයට්පාටුකළුක්කුත් තුණෙ නිට්පතාකවුම් පොතුමක්කළ් කුට්රඤ්චාට්ටි වරුකින්රනර්.

මේට්පටි කාටලිප්පුච් චෙයට්පාටුකළෙ උටන් නිරුත්තුවතට්කුම් වඩක්කු මාකාණත්තිලුළ්ළ වනප් පකුතිකළෙ උරිය මුරෙයිල් පාතුකාප්පතට්කුම් උටන් නටවටික්කෙ එටුක්ක මුටියුමා?

ඉතුවරෙ චට්ටවිරෝත කාටලිප්පු නටවටික්කෙකළිල් ඊටුපට්ටුළ්ළවර්කළෙ ඉනංකණ්ටු, අවර්කළුක්කෙතිරාකච් චට්ට නටවටික්කෙ එටුප්පතට්කාන ඒට්පාටුකළෙ මුන්නෙටුක්ක මුටියුමා?

මේට්පටි එනතු කේල්විකළුක්කාන පතිල්කළෙයුම් එටුක්කප් පටක්කූටිය නටවටික්කෙකළ් තොටර්පාන විළක්කංකළෙයුම් සුට්රාටල් අමෙච්චර් අවර්කළ් වළංකුවාර් එන එතිර්පාර්ක්කින්රේන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අතිගරු ජනාධිපතිතුමාගෙන් විමසන ලද ප්‍රශ්නයට අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් සහ රජය වෙනුවෙන් පිළිතුරු දීමට මම බලාපොරොත්තු වෙනවා.

එතුමාගේ පළමුවන ප්‍රශ්නය වන්නේ, "උතුරු පළාතේ වනාන්තර විනාශ කිරීමේ කටයුතු වහාම නතර කිරීමටත්, උතුරු පළාත තුළ පිහිටා ඇති වනාන්තර ප්‍රදේශ නිසි පරිදි ආරක්ෂා කිරීමටත් වහාම කටයුතු කළ හැකිද?" කියන එකයි.

එයට පිළිතුර 'ඔව්'. උතුරේ සියලු වනාන්තර එළි කිරීම් නතර කිරීමට අදාළව චක්‍රලේඛ උපදෙස් මේ වන විට නිකුත් කර ඇත. තවද, රජයේ අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් දිස්ත්‍රික් කමිටුවේ අනුමැතිය සහිතව ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවතින ජාතික කමිටුවට ඉදිරිපත් කර එහි අනුමැතිය ලැබෙන්නේ නම් පමණක් නිදහස් කරනු ලැබේ. උතුරු ප්‍රදේශයේ වනාන්තරවල යම් එළි කිරීමක් සිදු වන්නේ ද යන්න ගුවනින් නිරීක්ෂණය කිරීමටත්, එවැනි තත්ත්වයක් සිදු වන්නේ නම් වහාම ඒ පිළිබඳව තොරතුරු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් දී ඇති අතර, ඒ අනුව ගුවන් හමුදාව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්ව වනාන්තර රැක ගැනීමට කටයුතු කරනවා. උතුරේ සියලු වනාන්තර ඉඩම් GPS තාක්ෂණය යොදා ගෙන රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර තිබෙනවා. මෙම ප්‍රදේශයේ වනාන්තර ආරක්ෂා කිරීමේ අරමුණින් විශේෂ හදිසි වැටලීම් ඒකකයක් ස්ථාපිත කරන්නත් කටයුතු කර තිබෙනවා.

එතුමා ඊළඟට අහනවා, "මෙතෙක් නීති විරෝධී ලෙස වනාන්තර විනාශ කිරීමේ යෙදී සිටින පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ හැකිද?" කියලා. එයට පිළිතුර, නීති විරෝධී වන අපරාධකරුවන්ට එරෙහිව නීතිමය කටයුතු කිරීම සඳහා වන සංරක්ෂණ ආඥා පනත මඟින් එම නිලධාරීන් වෙත නෛතික බලය ලබා දී ඇත. ඒ අනුව සියලු වන අපරාධ සම්බන්ධව නීතිමය කටයුතු කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හැකියාව තිබෙනවා. ඒ අනුව 2017 වසරේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අනාවරණය කර ගෙන පියවර ගෙන ඇති වන අපරාධ පිළිබඳ විස්තරයකුත් මේ සමඟ තිබෙනවා. වව්නියාව දිස්ත්‍රික්කයේ අනවසර අල්ලා ගැනීම් 40යි; අනවසර දැව හෙළීම් 57ක් තිබෙනවා. මන්නාරම දිස්ත්‍රික්කයේ අනවසර අල්ලා ගැනීම් 7යි; අනවසර දැව හෙළීම් 42යි. ඒක තමයි පිළිතුර.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
ඉන්දු තෙන්නිලංකෙ වෙළ්ළත්තිල් මූල්කියිරුක්කින්ර අතේනේරම්, වඩක්කු මාකාණත්තිල් කුටිනීරුක්කු මිකවුම් තට්ටුප්පාටු නිලවුවතනාල් මක්කළ් මිකවුම් කෂ්ටප් පටුකින්රාර්කළ්. ආනපටියිනාල්, තෙන්නිලංකෙයිල් උළ්ළ නතිකළෙ වඩක්කිර්කුත් තිරුප්පුකින්ර චෙයට්පාටු එව්වාරු ඉරුක්කින්රතු එන්පතෙ අරිය විරුම්පුකින්රේන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගංවතුර සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයත්, ඒ වාගේම දිසාපතිවරුන් හරහාත් යම් යම් පියවර ගෙන තිබෙනවා. ඔබතුමා දැන් ඉදිරිපත් කරපු කාරණයත් අපි අදාළ අමාත්‍යාංශයට යොමු කරලා කඩිනමින් විසඳන්න කියන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු චපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු අනුර දිසානායක මැතිතුමා.

II

සීමාසහිත ඊටීඅයි ෆිනෑන්ස් ආයතනයේ තැන්පත්කරුවන් මුහුණ දී ඇති අර්බුදය
වරෙයාබුක්කප්පට්ට ඊ‍ෆ්ජ නිති නිරුවන
වෛප්පාළර්කළ් එතිර්නෝක්කුම් නෙරුක්කටි
CRISIS FACED BY DEPOSITORS OF ETI FINANCE LIMITED

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. මම පාර්ලිමේන්තුවේදී පසුගිය සැසිවාරයේදී මේ පිළිබඳ ප්‍රශ්නය නැඟුවා. අලුත් සැසිවාරය නිසා මට නැවත ඊටීඅයි

[ගරු අනුර දිසානායක මහතා]

ආයතනය ගැන අහන්න සිදු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ ප්‍රකට මූල්‍ය ආයතනයක් වන ඊටීඅයි ෆිනෑන්ස් ආයතනයේ තැන්පත්කරුවන් අතර මතු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ලංකාවේ මෑතකාලීන මූල්‍ය ආයතනයන් ගණනාවක බිඳ වැටීම් සිදු වුණා. මේ තත්ත්වය හේතුවෙන් එම මූල්‍ය ආයතනයෙහි මුදල් තැන්පත් කළ විශාල පිරිසක් අසරණභාවයට පත් වුණා. තවත් විශාල පිරිසක් තමන්ගේ මුදල්වලට කුමක් සිදුවී දැයි බරපතළ අවිනිශ්චිතතාවකින් පසු වෙනවා.

ගරු සභානායකතුමා හොඳටම දන්නවා, ඊටීඅයි ආයතනය විතරක් නොවෙයි ආයතන ගණනාවක මේ ප්‍රශ්නය තිබෙන බව.

2002 වසරේ ප්‍රමුඛ ඉතිරිකිරීම් සහ සංවර්ධන බැංකුව කඩා වැටීම මෑත කාලීන මෙවැනි ප්‍රධාන ආයතනයන්හි බිඳ වැටීමේ ආරම්භය සටහන් කළා. 2008 වසරේ සක්විති පන්නයේ කූට මූල්‍ය ජාවාරම් බිඳ වැටීමෙන් අනතුරුව 2009 වසරේදී ගෝල්ඩන් කී ආයතනයෙන් ආරම්භ වී රුපියල් බිලියන 25කට වැඩි තැන්පතු තිබූ සෙලින්කෝ සමූහ ව්‍යාපාරය කඩා වැටුණා.

සෙලින්කෝ සමූහ ව්‍යාපාරය කඩා වැටෙද්දී ඊට අයත් Finance and Guarantee මූල්‍ය සමාගම ද අක්‍රිය තත්ත්වයට පත් වුණා. මෙම ආයතනවල තැන්පත්කරුවන්ට තමන්ගේ තැන්පතු මුදල් ලබා ගැනීමට නොහැකි වී විශාල අසාධාරණයක් සිදු වී තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ ආයතනයේ තැන්පත්කරුවන් 72කට ආසන්න ප්‍රමාණයක් දැන් මිය ගොස් තිබෙනවා. සමහර අය සිය දිවි හානි කරගෙන තිබෙනවා. ඔවුන් තමන් සතුව තිබූ එකම මුදල් ප්‍රමාණය තමයි මේ ආයතනවල දැම්මේ.

සැබැවින්ම තැන්පත්කරුවන් මෙම ආයතන කෙරෙහි විශ්වාසය තබා තිබුණේ මෙම මූල්‍ය ආයතන මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින ඒවා බවට වූ සහතිකය මතයි. මහ බැංකුව කියනවා, තමන්ගේ ලියා පදිංචි ආයතන තමන් -මූල්‍ය මණ්ඩලය- අධීක්ෂණය කරනවා කියා. එහෙත් පවතින තත්ත්වය අනුව මහ බැංකුවේ අධීක්ෂණය යටතේ වුවද ඒවා බිඳ වැටීම නතර වී නැතුවා පමණක් නොව බිඳ වැටීමෙන් අනතුරුව තැන්පත්කරුවන් අසරණ වීමද නතර වී නැහැ.

ජනමාධ්‍ය වාර්තා කළ ආසන්නතම සිදුවීම ETI Finance ආයතනයේ ඇති වී තිබෙන අර්බුදයයි. පසු ගිය ජනවාරි මුල් සතියේ ETI Finance හා Swarnamahal Financial Services සමාගම ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ දී ඇති බව පවසමින් මහ බැංකුව විසින් කළමනාකරණය පවරා ගනු ලැබුවා. මෙම සමාගම් දෙකෙහි තැන්පත්කරුවන් 35,300කගේ රුපියල් බිලියන 36ක මුදලක් තැන්පත්ව පවතිනවා. තැන්පත්කරුවන් 35,300දෙනෙක් ඉන්නවා; බිලියන 36ක් -කෝටි 3,600ක මුදලක්- තැන්පත්ව තිබෙනවා. පසු ගිය ජනවාරියේ සිට තැන්පත්කරුවන්ට මෙම මුදල් ආපසු ලබා ගත නොහැකි ලෙසට නතර කරනු ලැබුවා. විශාල පිරිසක් තම මුදල්වලට කුමක් සිදු වේද යන්න පිළිබඳව බියකින් සිටින අතරම දැඩි අසරණභාවයකට පත් වී සිටිනවා. ගරු කථානායකතුමනි, මේ රටේ පුරවැසියන්ගේ රුපියල් කෝටි 3,600ක මුදලක් තමයි මෙම ආයතනය කඩා වටිටා තිබෙන්නේ. දැනට මාස 6කට ආසන්න කාලයකට පසුව වුවද ඔවුනට මෙම මුදල් ලබා ගැනීමට හැකියාවක් නැහැ. මා මේ ප්‍රශ්නය ඔබතුමන්ලාගෙන් ජනවාරි මාසයේදීත් ඇහුවා.

තැන්පත්කරුවන් බොහෝ දෙනෙක් මුදල් තැන්පත් කළේ, අවශ්‍යතා ඇති වූ මොහොතක මුදල් ආපසු ගැනීමේ වුවමනාව ඇතිවයි. නමුත් ස්ථාවර තැන්පතුවල කල් පිරී ඇති කිසිවෙකුටත් මේ දක්වා එම මුදල් ලබා ගැනීමේ හැකියාවක් ලැබී නැහැ. මේ දක්වා ඔවුන්ට සිදු වී ඇත්තේ, කවදා හෝ මුදල් ගෙවනු ඇති බවට විශ්වාස කරමින් සිටීමටයි.

මේ තත්ත්වය තුළ ගරු ඇමතිතුමාගෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු අපේක්ෂා කරනවා.

1. ETI Finance හා Swarnamahal Financial Services යන සමාගම්වල තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සඳහා මහ බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?
2. මුදල් ඉල්ලා සිටින තැන්පත්කරුවන්ට මුදල් ගෙවා අවසන් කිරීම සඳහා වන කාල රාමුව කවරේද? ඒ කියන්නේ, මුදල් ඉල්ලන අයට මුදල් ලබා දීම පිළිබඳව මහ බැංකුව විසින් ETI Finance ආයතනයට මොකක් හරි සැලැස්මක්, කාල රාමුවක් ලබා දීලා තිබෙනවාද?
3. තැන්පත්කරුවන්ට එම මුදල් ගෙවීම සඳහා වන වැඩ පිළිවෙළ කුමක්ද?
4. ආයතනයේ වත්කම් විකිණීමට තීරණය කර තිබේද?

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහන්නේ හේතුවක් ඇතිවයි. අපට සමහර තොරතුරු ලැබී තිබෙනවා, වත්කම් විකුණලාත් ඉවරයි කියලා. හැබැයි තැන්පත්කරුවන්වත්, පොදු ජනතාවවත් වත්කම් විකුණලාද, නැද්ද කියා දන්නේ නැහැ. ඒ නිසා මහ බැංකුවෙන් විකුණන්න අවසර ලබා දීලා තිබෙනවාද, විකුණලා තිබෙනවාද කියා දැනගන්න කැමැතියි.

5. ETI Finance ආයතනය මිලදී ගන්නා ආයෝජකයා කවුද? එක්කෝ මිලදී ගන්නේ කවුද, එක්කෝ මිලදී ගත්තේ කවුද? ඔහුගේ ව්‍යාපාරික පසුබිම කුමක්ද?
6. රාජ්‍ය අධීක්ෂණය යටතේ ඇති මූල්‍ය ආයතන කඩා වැටීම පාලනය කිරීම සඳහා ආණ්ඩුව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ගරු කථානායකතුමනි, මා නැවතත් මේ කාරණය අවධාරණය කරනවා. මේ ETI Finance ආයතනයේ විතරක් නොවෙයි, මූල්‍ය සමාගම් විශාල සංඛ්‍යාවක තැන්පත්කරුවන් විශාල අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ආණ්ඩුව වහාම ඒ පිළිබඳ අවධානය යොමු කොට පිළිතුරු සොයා දිය යුතුයි කියන එකයි මගේ අදහස, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි වී ඇති හා එකී අධීක්ෂණයට යටත්ව ඇති බැංකු නොවන මූල්‍ය ආයතන සංඛ්‍යාව 49කි.

1. ETI Finance Limited හා Swarnamahal Financial Services PLC ඒ අතරට ගැනෙන බැංකු නොවන මූල්‍ය ආයතන දෙකකි. එම ආයතන දෙකම ඊඑෆ්පී සමූහ ව්‍යාපාරයට අයත් සමාගම් දෙකකි. ETI Finance Limited හා Swarnamahal Financial Services PLC නම් සඳහන් ආයතන මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර ලබා දෙන ලද මුදල් සමාගම් වන අතර, ප්‍රධාන වශයෙන් මහ ජනයාගේ තැන්පතු භාර ගැනීම්, ණය දීම් හා වෙනත් ව්‍යාපාර කටයුතුවල නිරතවීම එකී සමාගම්වල ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වේ.

ඒ අතර, ඊඒපී සමූහ ව්‍යාපාරයට අයත් Swarna Mahal Jewellers (Pvt.) Limited යන ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයකින් තොරව මහ ජන තැන්පතු භාර ගෙන ඇත. එසේම, බලපත්‍රලාභී මුදල් සමාගමක් වූ ETI Finance Limited ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් නොකළ දෙවැනි ගිණුම් වාර්තාවක් තබා ගෙන, එමඟින්ද මහ ජනයාගෙන් තැන්පතු භාර ගෙන ඇත.

2012 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද පරීක්ෂණවලදී මෙම කරුණු හෙළිදරව් විය. ETI Finance Limited ආයතනය විසින් භාරගත් මෙම හෙළි නොකළ තැන්පතු හා Swarna Mahal Jewellers (Pvt.) Limited ආයතනය මඟින් නීති විරෝධීව භාර ගෙන තිබූ තැන්පතු ETI Finance Limited ආයතනය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා මහ බැංකුවට යෝජනා කරන ලදී. එම යෝජනාව සලකා බැලූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, රුපියල් බිලියන 13.68ක් ලෙස ගණනය කරන ලද එම තැන්පතු ETI Finance Limited ආයතනයේ ගිණුම්වලට එක් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

එම වගකීම් ප්‍රමාණයට සාපේක්ෂව නව ප්‍රාග්ධනය යෙදවීම, ETI සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පෞද්ගලික වත්කම් සමාගම් වෙත මාරු කිරීම ඇතුළු තවත් නියෝග කිහිපයක් වර්ෂ 2015.09.14 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ETI Finance Limited ආයතනය වෙත නිකුත් කර ඇත. ඒ අනුව, EAP සමාගම් සමූහයට අයත් ඇතැම් වත්කම් ETI Finance Limited ආයතනයට පවරමින් මුදල් මණ්ඩලයේ විධානයන්ට යම්තාක් දුරට අනුකූල වුවත් එම සමාගමේ මූල්‍ය තත්ත්වය අපේක්ෂිත මට්ටමට වර්ධනය කිරීම සඳහා සාර්ථක පියවර කිසිවක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන නැත.

2012, 2014 සහ 2015 යන වර්ෂවල ප්‍රාග්ධනය යෙදවීම ඇතුළු ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන් බොහොමයකට අනුකූල වීමට ETI Finance Limited සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අපොහොසත් විය. මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම විධානයන්ට අනුකූලවීම සඳහා උපදෙස්, සිහි කැඳවීම් සහ අනතුරු ඇඟවීමේ ලිපි නොකඩවා සමාගම වෙත යවා ඇත.

මේ අතරතුර ETI Finance Limited ආයතනයේ සභාපති විසින් සමාගම ඉතා දුර්වල ද්‍රවශීලතා තත්ත්වයක හා තැන්පත්කරුවන්ගේ තැන්පතු ඉල්ලා සිටින විට ආපසු ගෙවීමට නොහැකි මට්ටමක පවතින බව මහ බැංකුවේ අධිපතිතුමන් වෙත 2017 මැයි මස 22 වෙනි දින ලිපියක් මඟින් දන්වා ඇත.

තවද, රජය සතු මූල්‍ය ආයතනයකට එහි කළමනාකාරිත්වය මාරු කරන ලෙස ද ඉල්ලා සිටින ලදී. මේ සඳහා සලකා බැලීම පිණිස පිළිගත් විගණන ආයතනයක් මාර්ගයෙන් ETI Finance Limited හි පරිපාලිත සමාගම්, උපපරිපාලිත සමාගම් හා ආයෝජන වත්කම් පිළිබඳ විගණනයක්ද සිදු කරන ලදී. ඉන් පසුව, රජයට අයත් මූල්‍ය ආයතනයක් ETI Finance Limited සමාගමේ කළමනාකරණ නියෝජිතයා ලෙස පත් කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා සාකච්ඡා වට කීපයක් පවත්වන ලදී. එහෙත් එම සාකච්ඡා අසාර්ථක විය. ඒ අනුව, මෙම සමාගමට තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීමේ හැකියාව නොමැති බැවින් 2018 ජනවාරි මාසයේ 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් නියෝග නිකුත් කර ඇත.

- ETI Finance Limited සහ Swarnamahal Financial Services ආයතනයේ කටයුතු අධීක්ෂණය සඳහා බැංකු හා මූල්‍ය කටයුතු පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති බැංකු ක්ෂේත්‍රයේ විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කිරීම.
- සියලු කල් පිරෙන තැන්පතු තවත් මාස හයකට අලුත් කිරීම සහ ගිවිසුම්වලට එළැඹ ඇති ආකාරයට පොලී මුදල් පමණක් ගෙවීම.
- සියලු ඉතිරි කිරීමේ තැන්පතුවලට අදාළ ආපසු ගැනීම් සඳහා ඉඩ ලබා දීම.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවදා ඉඳලාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
2018 ජනවාරි මාසයේ 02 වැනිදා සිට. ETI Finance Limited ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා විවිධ උපාය මාර්ගික ආයෝජකයන් සමඟ සාකච්ඡා පැවැත්වුවත් එම සාකච්ඡා අසාර්ථක විය. මෙම තත්ත්වය යටතේ 2017 වසරේදී ETI Finance Limited අර්බුදය නිරාකරණය කිරීම සඳහා එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එහි සැලැසුම වූයේ ආයතනයේ වත්කම් එනම්, පරිපාලිත සමාගම්, එහි උපපරිපාලිත සමාගම් සහ අනිකුත් ආයෝජන වත්කම් විකිණීම සහ ඒවා විකිණීමෙන් ලැබෙන මුදල් ආයතනයේ ද්‍රවශීලතා අවශ්‍යතා සහ ව්‍යාපාරික කටයුතු සඳහා යොදා ගැනීමත්ය.

එම වත්කම් අත්පත් කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ලංසුව වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 75ක පමණ වූ මුදල සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේද අනුමැතිය ලබා දී ඇත. එම මුදලින් කොටසක් ලෙස එක්සත් ජනපද ඩොලර් මිලියන 32ක් මේ වන විට ලැබී ඇත. මේ අතර, තැන්පත්කරුවන් සිය තැන්පතු ආපසු ගෙවන ලෙස ඉල්ලා උද්ඝෝෂණය කළ බැවින්, එකී මුදල් භාවිත කර තැන්පත්කරුවන් සඳහා ආරම්භයේදී ඔවුන්ගේ මුදල්වලින් සියයට 10ක් ආපසු ගෙවීමටත්, ඉදිරියේදී ලැබීමට නියමිත ඉතිරි මුදල වන එක්සත් ජනපද ඩොලර් මිලියන 43ක මුදල ලැබීමෙන් පසු තවත් සියයට 10ක් ගෙවීමටද මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ අනුව පළමු සියයට 10ක මුදල ගෙවීම 2008 ජූනි මස 05වැනි දින සිට ක්‍රියාත්මක කරන ලෙස ETI Finance Limited ආයතනයට දැනටමත් නියෝග කර ඇත.

Swarnamahal Financial Services PLC ආයතනය සම්බන්ධයෙන්ද ඉහත සඳහන් කරන ලද 2018 ජනවාරි 02 දින නිකුත් කරන ලද නියෝගය බලපැවැත්වේ. Swarnamahal Financial Services PLC ආයතනය ETI Finance Limited ආයතනයේ පරිපාලිත සමාගමක් වේ. ETI Finance Limited ආයතනයේ වත්කම් මිලදී ගන්නා ගැනුම්කරු Swarnamahal Financial Services PLC ආයතනයද මිලදී ගනු ඇත. ඒ අනුව, Swarnamahal Financial Services PLC ආයතනය මිලදී ගන්නා ගැනුම්කරුට එම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ව්‍යාපාරික සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. එම නිසා තැන්පතුවලින් සියයට 10ක් ආපසු ගෙවීම සඳහා ETI Finance Limited ආයතනය වෙත නිකුත් කරන ලද නියෝගය Swarnamahal Financial Services PLC ආයතනය වෙත නිකුත් කර නැත.

2. මුදල් ඉල්ලා සිටින තැන්පත්කරුවන්ට මුදල් ගෙවා අවසන් කිරීම සඳහා වන කාල රාමුව කවරේද?

පළමුවන සියයට 10 මුදල් ගෙවීම 2018 ජූනි මාසයේ 05 වන දා සිට ක්‍රියාත්මක කරන ලෙසට ETI සමාගමට දැනටමත් නියෝග කර ඇත. ආයතනයේ වත්කම් විකිණීමෙන් ලැබිය යුතු ඉතිරි මුදල් වන එක්සත් ජනපද ඩොලර් මිලියන 43 ලැබීමෙන් පසුව දෙවන සියයට 10

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මුදල් ගෙවීමට කටයුතු කරනු ඇත. එම දෙවන ගෙවීම 2018 ජුනි මස අවසානය වන විට ආරම්භ කිරීමට අපේක්ෂිතයි. වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල් සියලු තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවීමට ප්‍රමාණවත් නොවන බැවින් එයට පිළියම් ලෙස පහත ක්‍රියා මාර්ග ගෙන ඇත.

(අ) ETI ආයතනයේ අධ්‍යක්ෂවරුන්ට ඔවුන් දැනටමත් එකඟ වී ඇති පරිදි රුපියල් බිලියනයක් ජුනි මාසයේ 15 වන දිනට පෙර ආයතනයට ගෙවන ලෙස නියෝග කර ඇත.

(ආ) ඊට අමතරව ආයතනයේ ඍණ ශුද්ධ වත්කම් - negative net assets - ප්‍රමාණයට සමාන වන ප්‍රමාණයට පෞද්ගලික වත්කම් ව්‍යාපාරය තුළට ගෙන ඒම හෝ සුදුසු ආයෝජකයකු මාර්ගයෙන් එම මුදල ව්‍යාපාරයට ආයෝජනයක් ලෙස යෙදවීම සඳහා 2018 සැප්තැම්බර් 30 වන දින දක්වා කල් ලබා දී ඇත. මේ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් 2018 ජුනි 15 වන දිනට පෙර ලබා දෙන ලෙසද දන්වා ඇත.

(ඇ) ආයතනයේ අධ්‍යක්ෂවරුන්ගේ කිසිදු පෞද්ගලික වත්කමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ණ අනුමැතියෙන් තොරව විකිණීම හෝ මාරු කිරීම තහනම් කරමින් නියෝගයක් නිකුත් කර ඇත.

3. තැන්පත්කරුවන්ට එම මුදල් ගෙවීම සඳහා වන වැඩ පිළිවෙළ කුමක්ද?

2018 ජුනි 05 වන දින සිට ක්‍රියාත්මක කරන ලෙස නියෝග කරන ලද පරිදි. ආයතනයේ මුළු තැන්පත්වලින් සියයට 10ක් වාරික දෙකක් ලෙස ගෙවීම. දැනටමත් නියෝග කර ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මුදල් ලද පසු එහි ආයෝජකයකු විසින් නව ආයෝජන ලෙස මුදල් යෙදවීමෙන් පසු ඉතිරි මුදල් ගෙවීම සඳහා සැලැස්මක් සකස් කිරීම. එසේ ආයෝජකයකු සොයා ගත නොහැකි වුවහොත් පවතින නීති යටතේ ආයතනය ඈවර කිරීමට පියවර ගැනීමට සිදු වනු ඇත.

එසේ ඈවර කිරීමට සිදු වුවහොත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පතු රක්ෂණ ක්‍රමයට අදාළ රෙගුලාසිවලට අනුකූලව තැන්පත්කරුවන් සඳහා ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ දැනට පවතින රෙගුලාසි අනුව තැන්පත්කරුවන්ට රුපියල් ලක්ෂ 6ක උපරිමයක් දක්වා මුදල් ලබාදෙනු ඇත. මීට අමතරව, ආයතනයේ සිදු වී ඇති වංචාවන්ට වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව පවතින නීතිය යටතේ කටයුතු කරනු ඇත.

4. ආයතනයේ වත්කම් විකිණීමට තීරණය කර තිබේද?

ඔව්. (පළමු ප්‍රශ්නයේ දී මේ පිළිබඳව සවිස්තරාත්මකව කරුණු සඳහන් කරන ලදී.)

5. ETI Finance ආයතනය මිලදී ගන්නා ආයෝජකයා කවුද? ඔහුගේ ව්‍යාපාරික පසුබිම කුමක්ද?

ගැනුම්කරු විසින් මිලදී ගනු ලබන්නේ ETI Finance ආයතනය නොව, එම ආයතනයේ පරිපාලිත සමාගම, උප පරිපාලිත සමාගම් සහ ආයෝජන වත්කම්ය. මිලදී ගන්නා ආයතනය වන්නේ සිංගප්පූරුවේ ලියා පදිංචි කරන ලද Blue Summit Capital Management (PTE) Limited යන ආයතනයයි. ඔවුන්ගේ ව්‍යාපාරික පසුබිම ලෙස සඳහන් වන්නේ ආයෝජන කටයුතු සිදු කිරීමයි.

6. රාජ්‍ය අධීක්ෂණය යටතේ ඇති මූල්‍ය ආයතන කඩා වැටීම පාලනය කිරීම සඳහා ආණ්ඩුවට ඇති වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු කථානායකතුමනි, මා විසින් මේ දක්වා විස්තර කරනු ලැබුවේ මෙම ආයතනය සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ගයි. බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයට අයත් ආයතන පද්ධතිය අතිශයින් පුළුල්. එමෙන්ම finance සමාගම් නොවන විවිධ ගණයේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන දහස් ගණනක් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක වේ. අපගේ රජය ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කිරීම පිණිස පියවර රැසක් ගෙන තිබෙනවා. එයින් මේ ගරු සභාව විසින් සම්මත කරනු ලැබූ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පනත ඉතා වැදගත් වෙනවා. එය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන්නේද ශ්‍රී ලංකා මහ බැංකුවටයි. එය අතිශය සංකීර්ණ මෙන්ම පුළුල් කාර්යයකි.

මහජනතාවගේ තැන්පතු ලබා ගනිමින් විවිධ වර්ගවල ආයතන පවත්වා ගනිමින්, ණය දෙමින්, මහජනතාව සූරා කන අසංවිධිත මූල්‍ය පද්ධතියක් රට තුළ ක්‍රියාත්මක වෙනවා. අධික පොලී අය කරමින්, දැඩි කොන්දේසි යටතේ, මහජනතාව තළා පෙළා ක්‍රියාත්මක වන ආයතන රැසක් ශ්‍රී ලංකාව පුරා තිබෙනවා. පහසුව පිණිස මෙන්ම, එවැනි ආයතන ලබා දෙන නොයෙකුත් පොරොන්දුවලට රැවටී ණය ලබා ගත් පිරිස් ලොකු අමාරුකම්වලට වැටී තිබෙනවා. ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමා පසු ගිය මාසයේ දී උතුරු පළාතේ රාජකාරීවල නිරත වෙමින් ගත කළ දින දෙක තුනකදී එවැනි දුක්ඛිත කථා රාශියක් අසන්නට ලැබී තිබෙනවා.

විශේෂයෙන් උතුරු පළාත, උතුරුමැද පළාත වැනි නියඟයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ ප්‍රදේශවල ජනතාව මෙවැනි කළු කඩකාරයින්ගේ ගොදුරු බවට පාත්‍ර වී සිටිනවා. මේ සඳහා රජය ඉතා දැඩි උනන්දුවකින් කටයුතු කරන බව මේ ගරු සභාවට දන්වන්නට කැමැතියි. මෙවැනි දුක්ඛිත ඉරණමකට ගොදුරු වූ ජනතාව වෙනුවෙන් රජය විසින් අඩු පොලිය යටතේ ණය යෝජනා ක්‍රම රැසක් "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා තිබෙනවා. එයින් ණය අරමුදල් අවශ්‍ය වන ජනතාවට ව්‍යාපෘති වාර්තාවක් පදනම් කරගෙන සහන පොලියට ඇපකරුවන් නොමැතිව ණය ලබා දී, ඔවුන් ගිනි පොලිකරුවන්ට ගොදුරු වීම වැළැක්වීමට අපේක්ෂා කරනවා. මේ ණය යෝජනා ක්‍රම මේ මස අගදී ක්‍රියාත්මක කරන්නට අපේක්ෂිතයි.

එමෙන්ම බැංකුවලින් ණය ලබාගෙන ගෙවා ගැනීමට නොහැකිව සිටින, ගොවිතැන් කටයුතුවල හා නිෂ්පාදන කටයුතුවල නිරත, නියඟයෙන් පීඩා විඳින දිස්ත්‍රික්කවල ජනතාවට තවත් සහන ලබා දීමට රජය කටයුතු කරමින් සිටිනවා. මීට අමතරව, මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය සඳහා පවතින නීති රෙගුලාසි හා විධානයන් බලගැන්වීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනවා. බොහොම ස්තුතියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මේ මූල්‍ය සමාගම් කඩා වැටීම හේතුකොටගෙන එහි අයිතිකරුවන් හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි අයගේ ජීවිතවලට අබමල් රොනකින් හෝ හානියක් සිදුවී නැහැ. ඔවුන්ගේ සුඛවිහරණ සහිත ජීවිත ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යනවා. ලංකාවේ පමණක් නොවෙයි, විදේශීය වශයෙනුත් ඔවුන් දේපළ එක්රැස් කරගෙන තිබෙනවා. ඔවුන්ට සිංගප්පූරුවේ ගොඩක් දේපළ තිබෙනවා. මෙසේ දේපළ එක්රැස්කර ගනිමින් මහජනයාගේ දේපළ තමයි මේ නාස්ති කර තිබෙන්නේ. ඒ නිසා ඔවුන්ට දඬුවමක් ලබා දිය යුතුයි. නමුත් ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ සැලැස්ම ගත්තොත්, එතැන ඩොලර් මිලියන 75යි. ආසන්න වශයෙන් රුපියල් බිලියන

100යි. තැන්පතු සියල්ලම ගත්තොත්, එතැන රුපියල් බිලියන 360ක් තිබෙනවා. එතකොට ගරු කථානායකතුමනි, ඒ 75ම වික්කත් අපට හම්බවෙන්නේ රුපියල් බිලියන 100ක වාගේ ප්‍රමාණයක්. හැබැයි, රුපියල් බිලියන 360ක තැන්පතු තිබෙනවා. ඒ නිසා තව රුපියල් බිලියන 260ක අවශ්‍යතාව තිබෙනවා. එක් බිලියනයක් දෙන්න කියා මහ බැංකුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නියෝගයක් ලබාදී තිබෙනවා. එතකොට තව බිලියන 259ක හිඟයක් තිබෙනවා. අධ්‍යක්ෂ මණ්ඩලය සතුව තිබෙන පෞද්ගලික දේපළ විකිණීම සඳහා නියෝගයක් ගැනීමට සූදානම් වෙනවා. ඒ දේපළ වික්කත් බිලියන 10කට, 15කට වඩා හම්බ වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මහ බැංකුවේ රක්ෂණය යටතේ තැන්පතුකරුවෙකුට උපරිම වශයෙන් ලක්ෂ 6කට ආසන්න ප්‍රමාණයක් තමයි දෙන්නේ.

ගරු කථානායකතුමනි, මීගමුව ප්‍රදේශයේ මා දන්නා තැන්පතුකරුවෙක් ඉන්නවා. ඔහු සතුව තිබුණු එකම හෝටලය ලක්ෂ 500කට විකුණුවා. සති දෙකක ආයෝජනයක් සඳහා ඔහු පසුගිය දෙසැම්බර් මාසයේ ETI Finance ආයතනයේ එකී ලක්ෂ 500 තැන්පත් කළා. ඔහුට සියයට 10ක් හම්බ වෙනවා. එතකොට ලක්ෂ 50යි. තව සියයට 10ක් ලැබෙනවා. එතකොට ලක්ෂ 100යි.

ඊළඟට, ආණ්ඩුව රක්ෂණයෙන් දුන්නොත් ඒ ලක්ෂ 6ත් එක්ක මුළු මුදල ලක්ෂ 106යි. එතකොට ඔහුගේ ලක්ෂ 500ක තැන්පතු මුදලට ඔහුට ලැබෙන්නේ ලක්ෂ 106ක මුදලක් විතරයි. ගරු කථානායකතුමනි, මේ ආයතන පමණක් නොවෙයි, අපේ රටේ තිබෙන මූල්‍ය ආයතන -විශේෂයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන- අපේ ගම්වල මහජනයාගේ රුධිරය මුළුමනින්ම උරාගන්නා ආයතන බවට අද පත් වී තිබෙනවා.

එම නිසා මේ පිළිබඳව ආණ්ඩුව වැඩි අවධානයක් යොමු කළ යුතු වනවා. මේ ETI Finance ආයතනයට සම්බන්ධ නිලධාරීන් සමහර කාලවලදී මැතිවරණවලට ඉදිරිපත් වෙලා ඡන්දය ඉල්ලූ බවත් මා දන්නවා. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මෙම ආයතනයට සම්බන්ධ සමහර පුද්ගලයන් කොළඹ නගර සභාවට ඡන්දය ඉල්ලුවා.

ගරු කථානායකතුමනි, මහජනයාගේ දේපළ නාස්ති කළ කණ්ඩායම් තමයි දැන් මේ ඡන්දය ඉල්ලන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම නිසා මේ ETI Finance ආයතනය මේ තැන්පතුකරුවන්ගේ මුදල්වලට මුළුමනින්ම වග කිව යුතුයි කියා අපි තමුන්නාන්සේට කියනවා. ගරු කථානායකතුමනි, බැංකු පොතේ තිබෙන මුදල් පරිමාණයට එහා යන යම් අත්‍යවශ්‍ය මැදිහත්වීමක් ඒ පිළිබඳව තමුන්නාන්සේලා කළ යුතුයි කියන එක තමයි අපි අදහස් කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු රාජ්‍ය ඇමතිතුමා ඒ කාරණය සම්බන්ධයෙන් පිළිතුරක් දෙනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්, ගරු කථානායකතුමනි.

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ මුදල් ප්‍රමාණය මේකේ කොටසක් පමණයි. ඩොලර් මිලියන 75න් එන්නේ බිලියන 11.5ක් පමණයි. නමුත්, ඒ වාගේ තුන්ගුණයක තැන්පතු තිබෙනවා. ඒ කියන්නේ, බිලියන 33ක් පමණ තිබෙනවා. අපි ආයෝජකයන්ට මේ සම්බන්ධයෙන් කල් දීලා තිබෙනවා. ඔවුන් මේ සඳහා යම් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා, එම වැඩ පිළිවෙළ සාර්ථකව කර ගන්න පුළුවන් වුණොත්, කල් යත්ම එම තැන්පතුකරුවන්ට ඔවුන්ගේ තැන්පත් මුදල් සම්පූර්ණයෙන්ම ලබා ගන්න පුළුවන්. ඒක කර ගන්න බැරිම වුණොත් තමයි මේක liquidate කරන්න සිදුවන්නේ. ඒක වුණොත්, එතකොට අපට රක්ෂණය හරහා තවත් ඩොලර් බිලියන 9ක් පමණ ලැබෙනවා. ඒ වාගේම අපි අයිතිකරුවන්ගෙනුත් ඩොලර් බිලියනයක් එකතු කරනවා. මෙම ආයතනය තුළ තවත් සම්පත් - assets - තිබෙනවා. ඒවා විකිණීමෙනුත් තවත් ඩොලර් බිලියන දෙකක් පමණ එකතු වනවා. එහෙත් තවත් හිඟ මුදලක් තිබෙනවා. තැන්පතුකරුවන්ගේ මුදල් සියයට සියයක්ම ලැබෙයි කියා මට කියන්න බැහැ. නමුත්, මා හිතන විධියට සියයට 65 - 70 අතර මුදලක් ලැබෙයි. එහෙම වුණොත් තවත් සියයට 30ක, 35ක අඩු පාඩුවක් තිබෙනවා. එතකොට ඒ ඉතිරි මුදල සම්බන්ධයෙන් නඩු කියලා තීරණයක් ගන්න වෙයි.

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කියපු කාරණාවලට මම සම්පූර්ණයෙන්ම එකඟයි. මේවාට අයිතිකරුවන් වග කියන්න ඕනෑ. නමුත්, ඒ අය එක්ක නඩු කියලා ඒ මුදල් ලබා ගැනීමට කාලයක් ගත වන්න පුළුවන්. එතකොට, අනිකුත් පුරවැසියන්ගේ බදුවලින් අපි මේ තැන්පතුකරුවන්ට ඔවුන්ගේ මුදල් ගෙවනවාද, නැද්ද කියන එක පිළිබඳව අපිට තීරණයක් ගන්න වෙනවා. සාමාන්‍ය මතය වන්නේ, මේවා පෞද්ගලික සමාගම් නිසා අනිකුත් පුරවැසියන්ගේ බදුවලින් මේවාට ගෙවන එක සුදුසු නැහැ කියන එකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන ප්‍රශ්නය මොකක්ද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු රාජ්‍ය අමාත්‍යතුමාට මම කරුණු කීපයක් යොමු කරන්න කැමැතියි. දැන් මේ ප්‍රශ්නය නිසා තැන්පතුකරුවන් ඉතා විශාල පිරිසක් අසහනයට පත් වෙලා මේ සම්බන්ධයෙන් දිනපතා උද්ඝෝෂණ කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එය බේරා ගැනීම සඳහා පත් කළ ත්‍රිපුද්ගල බැංකු විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයන්ගේ නම් ටික ඔබතුමාට මේ ගරු සභාවට දන්වන්න පුළුවන්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. ඉන් එක් කෙනෙක් තමයි, එස්.එස්. රත්නායක මැතිතුමා. එතුමා මහ බැංකුවේ හිටපු උපඅධිපතිවරයෙක් - former Assistant Governor of the Central Bank.

දෙවැන්නා, පී.ඒ. ලයනල් මැතිතුමා, ලංකා බැංකුවේ Former DGM, Bank of Ceylon. තුන්වැන්නා, එච්.ඩබ්ලිව්. තිලකරත්න මැතිතුමා, Former AGM, Bank of Ceylon.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඊළඟට මම අහන්නේ පැහැදිලි කරගැනීමක් ගැනයි, ගරු කථානායකතුමනි. මොකද, මේක ඉතා වැදගත්කමකින් යුත් ජාතික ගැටලුවක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ නිසාම තමයි මම ඔබතුමාට මේ අවස්ථාව දුන්නේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමනි, දැනට මුදල් අමාත්‍යාංශයේ උපදේශකයෙක් ලෙස කටයුතු කරන මනෝ තිත්තවෙල මැතිතුමා මේ සමාගම මෙලෙසින් බංකොලොත් තත්ත්වයට පත් වෙන්න කලින් එකී සමාගමේ ප්‍රධාන මෙහෙයුම්කරුවෙක් ලෙස සිටිය බව ඔබතුමා පිළිගන්නවා ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්. එතුමා ඒ සමාගමේ හිටියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි විවාදයකට නොගිහින් අවශ්‍ය කරුණු පැහැදිලි කර ගනිමු.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
එතකොට ඒ සමාගමේ ඉඳලා ඒ සමාගම බංකොලොත් තත්ත්වයට පත් කරපු කෙනෙක් මුදල් අමාත්‍යාංශයේ උපදේශකයෙක් ලෙස පත් කරගෙන තිබෙන්නේ තමුන්නාන්සේලා මොන පදනමක් යටතේ ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔහුට එහෙම වගකීමක් තිබෙනවා ද කියලා මට ඇත්තටම කියන්න බැහැ. මොකද, මේ මූල්‍ය ආයතනයෙත්, අනෙක් ව්‍යාපාරවලත් අධ්‍යක්ෂ මණ්ඩලවල හුඟාක් අය ඉන්නවා. පසුගිය කාලයේ හිටපු මහ බැංකු අධිපතිවරයෙක් වන අජිත් නිවාඩ් කබ්‍රාල් මහතාට විරුද්ධව චෝදනා තිබුණා, ඔහු එක එක අක්‍රමිකතාවන් කරලා ඒ මුදල් pyramid schemes හරහා ගත්තා; ඒ මුදල් යොදවලා බැංකු පාලනය කරන්න ගියා කියලා. එවැනි චෝදනා තිබියදීත් ඔහුට මහ බැංකුවේ අධිපති ධූරය දෙනකොට ඒවා අපි ඉදිරිපත් කළත් එදා හිටපු ජනාධිපතිතුමා ඔහුව ඒ තනතුරට පත් කළා. ඒ නිසා කාටවත් මඩ ගහන්නේ නැතිව අපි ඒ ගැන හොයලා බලමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි ඒ සම්බන්ධව විවාදයකට යන්න අවශ්‍ය වන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ පැහැදිලි කිරීම කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට එක අවස්ථාවක් දුන්නා. ඒ වෙලාවේ ඔබතුමා පැහැදිලි කිරීමක් කළා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා. පළමුවැනි එක තමයි, සිංගප්පූරු ආයෝජන සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් ඔබතුමා ළඟ තිබෙනවා ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්, මා ළඟ තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එක ප්‍රශ්නයක් ඇසුවා. තවත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඒකත් අහලා මම අවසන් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඒකත් අහලා ඉවර කරන්න. [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, අපට දැන් මේ සම්බන්ධයෙන් විවාදයකට යන්න වෙලාවක් නැහැ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට තව එක අවස්ථාවක් දෙන්නම්. I allow you because this matter is very important.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මට ඒ අධ්‍යක්ෂවරුන්ගේ නම් ටික කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් විවාදයක් අපි දෙන්නම්. [බාධා කිරීමක්] ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙවැනි සිදුවීම් මූල්‍ය සමාගම් විශාල සංඛ්‍යාවක සිදුවී තිබෙන නිසා ලබන සතියේ එක් දින පාර්ලිමේන්තු විවාදයක් ලබා දෙන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මූල්‍ය සමාගම් කඩා වැටීම සහ ඒවායේ තැන්පත්කරුවන්ට සිදුවී තිබෙන විනාශය පිළිබඳව දවසක විවාදයක් ලබා දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි විවාදයක් ලබා දෙන්න සූදානම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි විවාදය ගනිමු.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න අපි - [බාධා කිරීමක්] ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමාට අවස්ථා තුනක්ම දුන්නා. මේක විවාදයක්. You have to be reasonable.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ වාගේ ප්‍රශ්න අහන එක -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි. වැදගත් දෙයක් නිසා ඒක පැහැදිලි කරලා, we will finish it.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, රූපවාහිනී සජීවී විකාශය සිදු කරන මේ වේලාවේ මේ ගොල්ලන් advertisements දමනවා. මේ ආණ්ඩුවේ හිටපු ඇමතිවරු. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැනින් ඉවරයි.

මීළඟට, මුදල් රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට පිළිතුරු ලබා දෙනවා. ඕමාර් සිරාජ් එම්. කන්දීල් මහත්මයා සහ සිංගප්පූරුවේ පදිංචි දොන් සිරිල් රොද්‍රිගු කියන මහත්මයා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අනෙක් කරුණු ඔක්කොම අපි විවාදයේදී ගනිමු. තව වේලාව දෙන්න අමාරුයි. ඔබතුමා දන්නවා නේ. පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරගෙන යන්න ඕනෑ. අමනාප වෙන්න එපා. දැන් මම කිව්වා නේ. දැන් රීති ප්‍රශ්න සියල්ලම ඉවරයි. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 7 දක්වා ජාතික පාරිසරික පනත යටතේ නියමයන් 6ක් සහ නියෝගයක් අනුමත කිරීමට නියමිතයි. ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move Item Nos. 1 to 7.

ජාතික පාරිසරික පනත : නියමය
தேசிய சூழல் சட்டம் : கட்டளை
NATIONAL ENVIRONMENT ACT : ORDER

1

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Order made by the President under Sections 24 C and 24 D of the National Environment Act, No. 47 of 1980 to be read with chapter (2) of Article 44 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka relating to Waratenna- Hakkinda Environment Area and published in the Gazette Extraordinary No. 2024/6 of 19th June 2017, which was presented on 09.05.2018, be approved."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විෂයය අංක 1 සිට 7 දක්වා නියමයන් 6ක් සහ නියෝගයක් සම්බන්ධයෙන් මම සභාව දැනුවත් කරන්න කැමැතියි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින විවාදයට - [බාධා කිරීමක්] මට ඇහෙනවා. ශීලාචාර විධියට හැසිරෙන්න. අද දින විවාදයට ගැනීමට නියමිත න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 7 දක්වා ජාතික පාරිසරික පනත යටතේ නියමයන් හයක් සහ නියෝගයක්, 2018 මැයි මස 09වැනි දින - [බාධා කිරීම්] Allow me to talk. කථා කරන්න අවස්ථාව දෙන්න. ගරු මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තුව ශීලාචාර ස්ථානයක්. පාර්ලිමේන්තුව විගඩමක් කර ගන්න එපා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ශීලාචාරව අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉස්සෙල්ලා මට කථා කරන්න අවස්ථාව දෙන්න; කථානායකට අවස්ථාව දෙන්න. ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා වාඩි වෙන්න. මම තුන්වැනි වතාවටයි කියන්නේ. පාර්ලිමේන්තුව විගඩමක් කර ගන්න එපා. මම සෑම මන්ත්‍රීවරයෙකුටම අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව දුන්නා. පළමු වටය, දෙවැනි වටය, තුන්වැනි වතාවට දුන්නා. මම කිව්වාට පස්සේ අවස්ථාව දෙන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි දවසක විවාදයක් දෙනවා. කලබල වෙන්න ඕනෑ නැහැ. දවසක විවාදයක් දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විෂය අංක 1 සිට 7 දක්වා ජාතික පාරිසරික පනත යටතේ නියමයන් හයක් සහ නියෝගයක් 2018 මැයි 9වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අදාළ ගැසට් පත්‍රයේ පිටපතක් භාෂාත්‍රයෙන්ම සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබන ලද බවත්, එකී නියමයන්ට අදාළ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාව 2018 මැයි මස 22වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බවත් දන්වනු කැමැත්තෙමි. මොකද, ඊයේත් මේ ගැන ප්‍රශ්නයක් ඇති වුණා.

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේ ප්‍රශ්නය ගැන කථා කරන්න නම් අවස්ථාව දෙන්න බැහැ. වෙන ප්‍රශ්නයක් ගැන නම් අවස්ථාව දෙන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, the Hon. Eran Wickramaratne will speak now.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නයට දෙන්න බැහැ. You cannot raise any more points of Order on financial institutions. මොකක්ද ප්‍රශ්නය?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ලයිකමොබයිල් කියන එල්ටිටීඊයට සම්බන්ධ මුදල් තිබෙන ආයතනයට තමයි ආණ්ඩුව මේ ආයතන විකුණන්න යන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයක් දෙනවා නේ. ඒ විවාදයේදී ගන්න. දැන් මේ ගැන කථා කරන්න බැහැ. [බාධා කිරීමක්]

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ඒ පිළිබඳ නොවෙයි. ඊයේ දවසේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු විශේෂ ලිපියක් ඔබතුමාට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මට ලැබුණා. ඊළඟ පක්ෂ නායක රැස්වීමේදී ඒ ගැන කථා කරනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අදට පළාත් සභා මැතිවරණ තුනක් කල් දමලා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ගැන තමයි. ඔබතුමා මට ඉදිරිපත් කළා. ඊළඟ පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කරලා මම පිළිතුරක් ලබා දෙන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මෙතුමා විවාදයක් දෙන්නම් කියලා කිව්වා, වෙනත් කාරණාවකට අදාළව. ගරු කථානායකතුමනි, මම කියන්නේ පළාත් සභා මැතිවරණ තුනක් අද වන විට මාස අටක් කල් ගත වෙලා තිබෙනවා. ගරු අගමැතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රතිඥාවක් දුන්නා, මාර්තු මාසයේ සීමා නිර්ණය කොමිෂන් සභා වාර්තාව මේ සභාවට ඉදිරිපත් කරලා, විවාද කරලා මැතිවරණය කඩිනමින් පවත්වනවා කියලා. අද සිට මාස හතරක් ඇතුළත තව මැතිවරණ තුනක් පැවැත්වීමට නියමිතයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු සභානායකතුමා, අපි ඒක එදාට සාකච්ඡා කරමු.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, සමාවෙන්න. මට විනාඩියක් දෙන්න. ෆයිසර් මුස්තාපා ඇමතිතුමා මාර්තු මාසයේ හයවැනි දින සීමා නිර්ණය කොමිෂන් සභා වාර්තාව සභාගත කළා. ඉන් පසුව ඔබතුමා දවස් දෙකක් න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා -මාර්තු මාසයේ 22වැනි දින සහ මැයි මස 22- මෙය විවාද කිරීම සඳහා නියම කරලා තිබුණා. ඒ අවස්ථා දෙකම මේ ආණ්ඩුව මහ හැරියා.

මැතිවරණ තුනක් මාස 8ක් කල් ගිහිල්ලා, තවත් සභා තුනක් විසිර යන්නට නියමිතව තිබියදී රටටම දැනෙන දේ තමයි ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය සභා මැතිවරණ වාගේම ආණ්ඩුව මැතිවරණ නොපවත්වා මහ හරින්නට හදනවා කියන එක. මෙක ජනතාවගේ පරමාධිපත්‍ය පිළිබඳව, මූලික අයිතිය පිළිබඳ කාරණාවක්. එම නිසා කරුණාකරලා තමුන්නාන්සේ මේ ගරු සභාව මෙහෙයවන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට තමයි උත්සාහ කරන්නේ. පොඩ්ඩක් මට පැහැදිලි කරන්න ඉඩ දෙන්න. මේ සම්බන්ධව මම පෙරේදාත් කථා කළා.

ගරු අග්‍රාමාත්‍යතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ තවත් සාකච්ඡා කරන්නට අවශ්‍යයි කිව්වා. ඒ සාකච්ඡාවෙන් පසුව අපි සභාව දැනුවත් කරන්නම්. ඊළඟ රැස්වීම් සතියේදී ඒ ගැන දැනුවත් කරන්නට අපට පුළුවන් වෙයි. ඔබතුමා වාගේම මමත් මේ ගැන සෑම විටම සාකච්ඡා කරනවා; ඊයේ රැස්වීමේදීත් සාකච්ඡා කළා. ඒ සඳහා ඉදිරියේදී අවස්ථාව ලබා දෙන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, ඔබතුමාටත්, මේ ගරු සභාවේ ඉන්න අපටත් චෝදනාවක් තිබෙනවානේ. ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කරද්දී 2017 ඔක්තෝබර් 09 වෙනි දා මේ ගරු සභාවේදී කියපු දේ කවුරුත් ගණන් ගත්තේ නැහැනේ. දැන් මේ සියලුදෙනාම කථා කරලා කියනවා මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්නට ඕනෑයි කියලා; අතිගරු ජනාධිපතිතුමා පවා කියනවා. නමුත් මේ ගරු සභාවේ සාකච්ඡාව පවත්වන වෙලාවේදී අපි කිව්වාම, කවුරුත් ඒක ප්‍රතික්ෂේප කළා. ඒ වාගේම සැප්තැම්බර් මාසයේ 20වෙනි දා පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත සාකච්ඡා කරද්දී, ඒක වුණු විධිය ඔබතුමා දන්නවා. ගරු කථානායකතුමනි, ඒක ඔය මූලාසනයටත් චෝදනාවක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එදා මම චෝදනාව පැහැදිලි කළා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

එදා අපි සියලුදෙනාම එකඟ වුණා, මැතිවරණය මාස 4කින් තියනවා කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නා මේ මැතිවරණය කල් දමන්නට බැහැ කියලා. දැන්, ඒ තීන්දුවෙන් පසුවත් මාස 8ක් ගතවෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අගමැතිතුමා විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සාකච්ඡා කරලා දැනුම් දෙයි. මම නිතරම මේ ගැන එතුමාට මතක් කරනවා. ඒකයි මම මේ කියන්නේ. ඒ ගැන අපටත් වගකීමක් තිබෙනවා. එම නිසා අපට අවස්ථාවක් දෙන්න. ගරු අගමැතිතුමා මේ සතිය තුළ තීරණයක් දෙයි. ඉන් පසුව ඉදිරිපත් කරලා ගරු සභානායකතුමා කිව්වා වාගේ අපි සාකච්ඡා කරමු. [බාධා කිරීමක්]

ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ලියමන ගැනත් මම ආණ්ඩු පක්ෂයට යෝජනා කළා. ඒ සම්බන්ධයෙන් පිළිතුරක් එවයි.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

පිළිතුරක් එවනවාද, මට ඒ ගැන සභාවේදී දැන ගන්නට පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, පිළිතුර එව්වාට පසුව පුළුවන්. [බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමාට පසුගිය මාස තුන තිස්සේම මම හැම පක්ෂ නායක රැස්වීමේදීම මේ කාරණය ඉදිරිපත් කරලා තිබෙනවා. හැමදාම ලැබෙන පිළිතුර තමයි, "අගමැතිතුමා තව කල් ඉල්ලනවා. තව කල් ඉල්ලනවා." කියන එක. ප්‍රශ්නය ඒක නොවෙයි. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව කිව්වා. මැතිවරණ කල් දමන්න හදපු වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය තීරණයක් එව්වා, ඡන්ද කල් දමන්න බැහැ කියලා. ජනමත විචාරණයකින් තොරව ඡන්දය කල් දමන්න බැහැ කියලා සබරගමුව පළාත් සභාව පිළිබඳව තීරණයක් එව්වා. ඒක ඔබතුමාම පාර්ලිමේන්තුවට කියෙව්වා. ආණ්ඩුව පාර්ලිමේන්තුවේ කවදාවත් පාවිච්චි නොකළ වක්‍ර ක්‍රමයක් පාවිච්චි කරමින්, පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී "කාන්තා නියෝජනය" ගැන සඳහන් කරමින් පළාත් සභා ඡන්ද ක්‍රමය වෙනස් කළා. මා කියන්නේ ඒක විතරක් නොවෙයි. දැන් මුළු රටම ඡන්දය ඉල්ලනවා. ඡන්දය පැවැත්වීම පාර්ලිමේන්තුව භාරයේ තමයි තිබෙන්නේ. ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකට භාජනය වෙනවා. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් පළාත් සභා. ප්‍රාදේශීය සභා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් නොවෙයි කියලා කියන්නට පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු නොකිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වෙනවා. එම නිසා අගමැතිතුමාගේ කථාව මේ කාරණාවට වලංගු නැහැ. ඔබතුමා කථානායකවරයා හැටියට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ පිළිබඳව අවසන් තීරණයක් ගන්න. එහෙම නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධව ඔබතුමායි චෝදනා ලබන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම දන්නවා, ඔබතුමා ඔය කාරණය කිහිප අවස්ථාවකදීම කිව්ව බව. මම මේ කාරණයේ බැරුරුමකම තේරුම් ගිහින් තමයි කිහිප අවස්ථාවකදීම ඒ ගැන කථා කළේ. මම ගරු සභානායකතුමාටත් කියලා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරවන්නම්. [බාධා කිරීමක්] ගරු විමල් වීරවංශ මැතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ප්‍රකාශයේදී කිව්වා, අග්‍රාමාත්‍යතුමාට ඔබතුමා මේ පිළිබඳව නිතර මතක් කරනවාය කියලා. එව්වර මතක් කරලාත් අගමැතිතුමාට මේක අමතක වන්නේ ඇයි, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පක්ෂ රැස්වීමකදී ගන්නා තීරණ. එතුමා කල් ඉල්ලුවා. එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සාකච්ඡා කරන්න ඕනෑ කිව්වා. ඒකයි තිබෙන්නේ. සාකච්ඡා කරලා අවසාන තීරණය ලැබුණේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ඔබතුමා උත්සාහය අත් නොහැර දිගටම මතක් කිරීමේ කාර්යය කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, නැහැ, මතක් කිරීම හැමදාම කරනවා. අපි විහිළුවක් කරන්න ඕනෑ නැහැ. ඒකේ බැරෑරුම්කම අපට තේරුම් ගිහිල්ලා තිබෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

[අ.භා. 1.49]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මැතිවරණ කල් දමන එකට එක්සත් ජාතික පක්ෂයත් එකඟ නැහැයි කියලා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

අද පරිසරය පිළිබඳව රෙගුලාසි පනවන මේ අවස්ථාවේදී 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24.(ඇ) සහ 24.(ඈ) වගන්ති යටතේ පාරිසරික වශයෙන් සුවිශේෂී වූ ප්‍රදේශ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ. ඒ අනුව මහනුවර, වරතැන්න - හක්කිඳ ප්‍රදේශයේ මහවැලි ගඟ අසල, එහි පිහිටි සියලුම දූපත් ඇතුළත්ව, හෙක්ටෙයාර 59.4ක් පමණ වූ ප්‍රදේශය, අංක 2024/6 දරන 2017.06.19 දිනැති රජයේ ගැසට් නිවේදනය මඟින් පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

ඇත්තටම මේ ප්‍රදේශයේ වැදගත්කම ගැන කථා කළොත් මෙය එකිනෙකට ආසන්නව පිහිටි, මහවැලි ගඟේ පළලම ස්ථානය සහ පටුම ස්ථානය ඇතුළත් අද්විතීය භූ ලක්ෂණ සහිත ප්‍රදේශයක් වෙනවා. ඒ වාගේම මහවැලි ගඟේ පළලම ස්ථානයේ දර්ශනීය දූපත් 20ක් පමණ පිහිටා තිබෙනවා. එහි අධිසංවේදී ගංගාශ්‍රිත පරිසර පද්ධතියක් වෙනවා. ඒ නිසා ඒක ආරක්ෂා කර ගත යුතුයි. එය ඉහළ ජෛව විවිධත්වයකින් යුක්ත ප්‍රදේශයක් වගේම දුලබ හා තර්ජනයට ලක් වූ ශාඛ හා සත්ව විශේෂයන්ගේ වාසස්ථානයක් වෙනවා. උඩරට අමරපුර නිකායේ වරාතැන්න සීමා මාලකයත් එතැන තමයි පිහිටා තිබෙන්නේ. එය පුරා විද්‍යාත්මක සහ සංස්කෘතිකමය වශයෙන් වැදගත් වන ස්ථානයක්. වසර 100කට වඩා පැරණි "ගල් ළිඳ" නම් සොරොව්වකුත් එතැන පිහිටා තිබෙනවා. එය දේශීය වෛද්‍ය කර්මය සඳහා අවශ්‍ය ඖෂධ පැළෑටි ප්‍රභවයකි; විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා අධ්‍යයන ක්ෂේත්‍රයකි; ප්‍රදේශවාසීන්ගේ ජල අවශ්‍යතාව සපුරන ජල ප්‍රභවයකි; සංචාරකයන් සහ කලාකරුවන් සඳහා සිසිල් දේශගුණයකින් යුත් රමණීය සහ අද්විතීය දර්ශන තලයකි. ජනතාවට විඩාව සංසිඳුවා ගැනීමට සුදුසු ස්ථානයක් ද වෙනවා.

මේ ස්ථානයට නොයෙකුත් තර්ජන තිබෙනවා. ඒ තර්ජනවලින් ජය ගන්න තමයි අපි මේ ස්ථානය රක්ෂිත ස්ථානයක් හැටියට නම් කර මේ අවස්ථාවේදී නීති පනවා තිබෙන්නේ. ගඟ රක්ෂිතයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගන්නවා; අනවසර ගොඩනැඟිලි තිබෙනවා. ගඟ රක්ෂිතය තුළ නිවාස හා වෙනත් ඉදිකිරීම් සිදු කරනවා. ගඟ රක්ෂිතය තුළ හා දූපත් තුළ සංචාරක කටයුතු සඳහා ඉදිකිරීම් සිදු කරනවා. අවට වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවල අහිතකර බලපෑම් මෙයට තිබෙනවා. අවට ප්‍රදේශය හා මහනුවර නගරයේ අපජලය ගඟ රක්ෂිතයට මුදා හරිනවා. අවිධිමත් කසළ බැහැර කිරීම් සිදු වෙනවා. අවට කැළිකසළ ඇළ මාර්ග ඔස්සේ ගංගා පරිසර පද්ධතියට එකතු වීම හා රැඳීම සිදු වෙනවා. ඒ නිසා ආක්‍රමණශීලී ශාක හා සත්ව විශේෂ ව්‍යාප්ත වීම සිදු වෙනවා. උදාහරණයක් හැටියට යෝධ නිදිකුම්බා, කටකළු බෝට්ටියා වැනි ශාක සහ ටැංකි සුද්දා වැනි මත්ස්‍යයන් ව්‍යාප්ත වෙනවා. ගඟ රක්ෂිතය තුළ හා දූපත්වල විදේශීය ශාක හා සත්ව විශේෂ ඇති කිරීම හා මුදා හැරීම සිදු වෙනවා. අවිධිමත් වැලි ගොඩ දැමීම, මසුන් මැරීම සඳහා පුපුරණ ද්‍රව්‍ය භාවිතය සිදු වෙනවා. ඩයිනමයිට් වාගේ පුපුරණ ද්‍රව්‍ය භාවිතයත් සිදු වෙනවා. මේ ප්‍රදේශය අපි ආරක්ෂා කළ යුතුයි. එම නිසා තමයි මෙම රෙගුලාසි ගෙනැවිත් තිබෙන්නේ.

ඒ වාගේම අද අපි ඉදිරිපත් කරනවා, පොලිතීන් කළමනාකරණය සඳහා වන නීති ක්‍රියාත්මක විය යුතුයි කියලා. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන අනුව 2006 ඔක්තෝබර් මාසයේ 10වැනි දින සිට ඒ තිබුණු ගැසට් එක අනුව එම රෙගුලාසිවලින් දේශීය භාවිතය සඳහා මයික්‍රෝන 20 හෝ ඊට අඩු ඝනකමකින් යුක්ත පොලිතීන් වර්ග නිෂ්පාදනය කිරීම හෝ විකිණීම තහනම් කිරීම සිදු කරලා තිබෙනවා. ඉතා අඩු ඝනකමින් යුත් පොලිතීන් වර්ග හෝ භාණ්ඩ භාවිත කිරීමෙන් පසු ඒවා බාහිර පරිසරයට නිකුත් කිරීම හේතුවෙන් විශාල පරිසර දූෂණයක් මේ රට තුළ ඇති වී තිබෙනවා. දිවයින තුළම පවතින මේ ද්‍රව්‍ය සාර්ථකව ප්‍රතිචක්‍රීකරණය කරන්න අපට අවස්ථාව ලැබිලා නැහැ. මේ වන විට අපි දළ වශයෙන් දිනකට ආහාර දවටන මිලියන දෙකක් හා ෂොපින් බෑග් වැනි සැහැල්ලු පොලිතීන් මලු මිලියන 1.5ක් පමණ භාවිත කරනවා කියලා වාර්තා වෙනවා. මේ ආහාර දවටන හා ෂොපින් බෑග් අවසානයේ අපද්‍රව්‍ය ලෙස පරිසරයට නිකුත් වීම හේතුවෙන් පරිසරයට, අපගේ සෞඛ්‍යයට විශාල බලපෑමක් ඇති වෙනවා.

විවිධාකාර පාරිසරික ගැටලු මෙන්ම ආර්ථිකමය හා සමාජයීය ගැටලුත් මේවා හේතු කරගෙන පැන නඟිනවා. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත මධ්‍යම පරිසර අධිකාරිය පොලිතීන් කළමනාකරණය සඳහා ක්‍රියාකාරී වැඩසටහනක් ඉදිරිපත් කර තිබෙනවා. පවතින නීති රාමුව ශක්තිමත් කිරීම සඳහා ජාතික පාරිසරික පනතේ පවතින ප්‍රතිපාදන අනුව රෙගුලාසි පනවා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා මෙය අවස්ථාවක් කර ගන්නවා, විශේෂයෙන්ම මධ්‍යම පරිසර අධිකාරියටත්, එහි සිටින නිලධාරීන්ටත් ස්තුති කරන්න. මේ වාගේ සැලැස්මක් ඉදිරිපත් කර තිබීම ගැනත්, ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට දරන වෑයම ගැනත් ඒ සියලු නිලධාරීන්ට අපි ස්තුතිවන්ත වනවා.

මෙම අරමුණ පෙරදැරි කරගෙන මධ්‍යම පරිසර අධිකාරිය පොලිතීන් කළමනාකරණය කිරීමට පළමු කැබිනට් පත්‍රිකාව 2016 ජූනි මාසයේ 02වන දින කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරලා එහි අනුමැතිය ලබා ගෙන තිබෙනවා. විශේෂඥ කමිටුවක් මඟින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීමට පෙර කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසට කැබිනට් මණ්ඩලය උපදෙස් ලබා දුන්නා. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවතින පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව 2017 සැප්තැම්බර් මාසයේ 01වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිතීන් කළමනාකරණය සඳහා නව රෙගුලාසි 6ක් ගැසට් කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබුවා. ඒ අනුව පොලිතීන්වලින් නිෂ්පාදිත "සිලි සිලි බෑග්" හෙවත් ෂොපින් බෑග්, ආහාර දවටන හා ආහාර රැගෙන යන රිජිෆෝම් පෙට්ටි හා පිඟන් මේ නව රෙගුලාසි හරහා තහනම් කිරීමට ලක් කර තිබෙනවා. එමෙන්ම පොලිතීන්, ප්ලාස්ටික්, රිජිෆෝම් ආදි දේවල් විවෘත භූමියේ පුළුස්සන්න -ගිනි තබන්න- බැහැ. විශේෂයෙන්ම විවිධාකාර උත්සව හා රැස්වීම්වලදී සැරසිලි සඳහා පොලිඑතලීන් සහ පොලිප්‍රොපලීන් භාවිත කිරීම තහනම් කර තිබෙනවා.

මා හිතන්නේ, මෙහිදී මන්ත්‍රීවරුන් හැටියට අප විශේෂයෙන්ම වගකීමක් ගන්න ඕනෑ කියායි. අපේ රැස්වීම්වල ඒවා භාවිත කිරීම සම්පූර්ණයෙන්ම තහනම්. මා හිතන්නේ අප එය ආදර්ශයෙන් පෙන්නුවොත් මහ ජනයාත් එය අනුගමනය කරාවි කියායි. එහෙම වුණොත් අපට මේ වැඩ පිළිවෙළ සියයට 100ක්ම ක්‍රියාත්මක

කරන්න පුළුවන් වෙවි කියා මම විශ්වාස කරනවා. සියලුම ආකාරයේ පොලිතීන්වල ඝනකම මයික්‍රෝන 20ට වැඩි විය යුතු බවට අදාළ අතිවිශේෂ ගැසට් පත්‍රය දැන් නිකුත් කර තිබෙනවා. ඒ වාගේම මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතීන් රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, ප්‍රදර්ශනය, නොමිලේ ලබා දීම හෝ භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙනවා.

වැඩි ඝනත්වයෙන් යුතු පොලිඑතිලින් මලු තහනම් කර තිබෙනවා. එහෙත් දිග, පළල හා උස පිළිවෙළින් මිලිමීටර 600, 260 හා 900 පරිමාවෙන් යුතු කසළ මලු සහ දිග සහ උස පිළිවෙළින් මිලිමීටර 400 සහ 500 වන රෙදිපිළි රැගෙන යන මලු මෙම නීතියට අදාළ කර නොමැත.

ගරු කථානායකතුමනි, ඒ වාගේම විවෘත භූමියේ ප්ලාස්ටික් පිලිස්සීම තහනම් කර තිබෙනවා. කිසිදු තැනක එය කරන්න බැහැ. එළිමහනේ පිලිස්සීම, පිලිස්සීමට සැලැස්වීම, ඉඩ දීම හෝ අවසර දීමත් නොකළ යුතුයි. ඒ වාගේම මම සඳහන් කළා, සැරසිලිවලටත් භාවිතා කරන්න බැහැ කියන කාරණය. මුළු දිවයිනම ආවරණය කරන පරිදි මේ රෙගුලාසි ක්‍රියාත්මක වෙනවා. එහෙත් කොතරම් තදින් නීතිය ක්‍රියාත්මක කළද, වර්තමානයේ තවදුරටත් යම් කිසි ප්‍රමාණයකට වෙළෙඳ පොළෙහි තහනම් පොලිතීන් භාණ්ඩ පවතින බව අප සියලු දෙනාම දැක තිබෙනවා. එබැවින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් තවදුරටත් හොඳින් නීතිය ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට බලය පැවරීමටත්, එම ආයතනයේ සෘජු සහයෝගය ලබා ගැනීමටත් දැන් කටයුතු කරගෙන යනවා. ඒ වාගේම වැඩි ඝනත්වයෙන් යුතු පොලිතීන් අමුද්‍රව්‍ය වෙනත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිත කරන බැවින් ආනයනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම ප්‍රායෝගිකව කළ නොහැක. එබැවින් අපි ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රේගුව හරහා ආනයනය පාලනය කරමින් වැඩි ඝනත්වයෙන් යුතු පොලිතීන් ආනයනය මනා අධීක්ෂණයට ලක් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා.

භාවිතයෙන් පසු ප්ලාස්ටික් පෙට් බෝතල්, යෝගට් කෝප්ප අක්‍රමවත් ලෙස පරිසරයට බැහැර කිරීම හේතුවෙන් විවිධ පරිසර ගැටලු, සෞඛ්‍ය ගැටලු ඇති වී තිබෙනවා. අද අපි දන්නවා, මේ රටේ හුඟක් තැන්වල ඩෙංගු රෝගය ව්‍යාප්ත වෙමින් පවතින බව. විශේෂයෙන්ම ඩෙංගු රෝගය ව්‍යාප්ත වන්නේ වර්ෂාවෙන් පසුවයි. මැයි-ජූනි කාලය තුළ තමයි විශේෂයෙන්ම අවධානය යොමු කළ යුත්තේ. මොකද, මේ කාලයේදී ඩෙංගු රෝගය ව්‍යාප්ත වෙලා මරණ සංඛ්‍යාව ඉහළ යනවා. ප්ලාස්ටික් කෝප්ප, යෝගට් කෝප්ප, පෙට් බෝතල් වැනි දේවල්වල තමයි ගොඩක් වෙලාවට වතුර රඳා පවතින්නේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය මේ වන විටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතුව නව ක්‍රමවේදයක් වන කළමනාකරණය උදෙසා නිෂ්පාදකයාගේ, වෙළෙන්දාගේ සහ පාරිභෝගිකයාගේ විස්තීර්ණය වූ වගකීමේ මූලධර්මය යන සංකල්පය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙනවා.

නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම සඳහා අපේ මුළු දිවයින තුළ පරිසරය ඔවුන්ට ජීවත් වීමට උචිත ලෙස ආරක්ෂා කර තවත් වැඩි දියුණු කළ යුතු බව මෙතැනදී අපි දකිනවා.

ගරු කථානායකතුමනි, මාස කිහිපයකට ප්‍රථමයෙන් One Planet සමුළුවට සහභාගි වීමට මට අවස්ථාව ලැබුණා. ඒ One Planet සමුළුවට ලෝකයේ සෑම රටක්ම නියෝජනය වුණා. ප්‍රංශ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ඒ සමුළුවට ලෝක බැංකුවේ ප්‍රධානියාත් සහභාගි වුණා. ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සමුළුවේ ප්‍රධානියා එතැන මුල් තැන -සභාපතිත්වය- ගත්තා. එහිදී පැහැදිලි වුණු එක දෙයක් තමයි, ශ්‍රී ලංකාව විශේෂයෙන්ම දේශගුණික විපර්යාසවලට අභියෝගාත්මකව මුහුණ දිය යුතු රටක් වශයෙන් තිබෙන බව. මේ Global Climate Risk Index එක දිහා බැලුවාම, ලෝකයේ රටවලින් දේශගුණ විපර්යාස පිළිබඳව ලංකාව හතරවැනි තැන සිටිනවා. මේක ලංකාවට විශාල අභියෝගයක්. අපි දන්නවා, ගෝලීය උෂ්ණත්වය ඉහළ ගොස් තිබෙන බව. අපේ රට ඒකට දායකත්වයක් දරලා නැහැ. අපේ පරිසරය බොහොම යහපත් පරිසරයක්. අපි තවදුරටත් ඒක ආරක්ෂා කරන්නට ඕනෑ. ගෝලීය උෂ්ණත්වය වැඩි කරන්න අපේ රටෙන් කිසිම දෙයක් එකතු කරලා නැහැ කියා කියන්න පුළුවන්. නමුත්, විශේෂයෙන්ම ඇමෙරිකාව, යුරෝපය වැනි සංවර්ධිත රටවල නිෂ්පාදන හේතුකොට ගෙන ගෝලීය උෂ්ණත්වය ඉහළ ගිහිල්ලා, අපේ රට වැනි දුපත්වලට විශාල ගැටලුවක්, ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ Global Climate Risk Index එක අනුව අපට වඩා වැඩියෙන් විපර්යාසවලට මුහුණ දීලා තිබෙන රටවල් තමයි, හයිටි, සිම්බාබ්වේ, ෆිජි දූපත්. ඉන් පසුව තමයි ශ්‍රී ලංකාව තිබෙන්නේ. ඒ අනුව හතරවැනි තැන තමයි අපට තිබෙන්නේ. මේක අපට විශාල අභියෝගයක් වෙලා තිබෙනවා. අපි මේකට කොහොමද මුහුණ දෙන්නේ කියන ප්‍රශ්නය දැන් අපට තිබෙනවා.

අපි දැනට කථා කරලා තිබෙන්නේ ආපදා කළමනාකාරිත්වය ගැනයි. ඒ සඳහා අපට අමාත්‍යාංශයක් තිබෙනවා. නමුත්, ආපදා කළමනාකාරිත්වය පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. දැන් බලන්නට ඕනෑ, මේ ආපදා අවදානම කොහොමද අපි අඩු කර ගන්නේ කියලා. මොකද, සෑම වසරකම පාහේ අපට මේ අවදානමට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. 2014ට ප්‍රථම ලෝකයේ මෙවැනි විපර්යාස සාමාන්‍යයෙන් අවුරුද්දකට ඇති වුණේ 40ක් පමණයි. 2014න් පසුව, 2015, 2016, 2017, 2018 වන විට 400ක් ඇති වේගෙන යනවා. ඒ නිසා ලංකාවට මේ අවදානමට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. මේ සඳහා විශාල ආයෝජනයක් අවශ්‍යයි.

පළමුවෙන්ම, we must reduce harmful emissions; පරිසරයට හානිදායක වායු පිටවීම වළක්වන්නට ඕනෑ. පිට කරන වායු අවම කර ගන්නට ඕනෑ. මේ සඳහා අපි වැඩි වග කීම ගන්නට ඕනෑ. යටිතල පහසුකම් දියුණු රටවල්, විශේෂයෙන් කාර්මික රටවල් මේ සඳහා වැඩියෙන් වග කීම ගන්නට ඕනෑ. අපේ රටේ අපි තදින් පරිසර නීතිය ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ වාගේම වාහනවලින් දූෂිත වායු පිටවීම වැළැක්වීමට අපි ප්‍රතිපත්ති සකස් කර ගන්නට ඕනෑ.

දෙවැනි කාරණය adaptation. ඒ කියන්නේ, මේ වෙනස් වීමට අපි මුහුණ දෙන්නේ කොහොමද කියන එකයි. උදාහරණයක් හැටියට ගත්තොත්, අනතුරුදායක ප්‍රදේශවල ජීවත්වෙන ජනතාව ඒ ප්‍රදේශවලම තබාගෙන ඉන්න එක සුදුසු නැහැ. පසුගිය දවස් කිහිපයේ සිට විශාල ජලගැලීමක් ඇති වේගෙන යනවා. මොකද වර්ෂාපතනය නිසා. වර්ෂාව ඇද වැටෙනවා. ඒකට අපි කවුරුවත් වග කියන්නට ඕනෑ නැහැ. එය ස්වභාව ධර්මයෙන් සිදු වෙන දෙයක්. නමුත් අපි ඒ සඳහා ලැහැස්ති වෙන්නට ඕනෑ. එය පාලනය කරන්නට අපිට සිදු වෙනවා. වර්ෂාපතනයෙන් හානි සිදුවේගෙන යන අයට, කාලගුණ විපර්යාසයට මුහුණ දෙන්නට සිදු වී තිබෙන ඒ දස දහස් ජනතාවට දැනටමත් අපේ රජයේ මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා සීමාවක් නොමැතිව මූල්‍ය සම්පත් වෙන් කර තිබෙනවාය කියා ඊයේ ප්‍රකාශ කළා. ඒ අයට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඒ වාගේම සමහරවිට නිවසට හානියක් වෙලා තිබෙනවා නම් ඒ නිවස සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන්න එතුමා මුදල් වෙන් කර තිබෙනවා. දැනටමත් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ සඳහා නියෝග දී තිබෙනවා විතරක් නොවෙයි, මුදල් අමාත්‍යාංශයෙන් ඒ තැන්වලට මුදල් යවා තිබෙනවා.

අපි දැන් කථා කරන්නේ මේ අවදානම කොහොමද අඩු කර ගන්නේ කියන එක ගැනයි. අනතුරුදායක ප්‍රදේශවල ජීවත්වෙන අය වෙනුවෙන් අපට මීට වඩා සැලැස්මක් තිබෙන්නට ඕනෑ.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

තුන්වැනිව, නීලහරිත ආයෝජන - green investments - අපි ඇති කළ යුතුයි. ජල කළමනාකරණය මෙයින් එකක්. අපි මෙම කටයුත්ත පටන් ගත්තේ 1977 වර්ෂයේයි. එදා අපේ රජය විශාල ලෙස ජල කළමනාකරණයට ඉදිරිපත් වුණා. ඊට පසුව අදත් මොරගහකන්ද වැනි විශාල ජල යෝජනා ක්‍රම ආරම්භ කරනවා. නමුත් අපි යොමු වන්නට ඕනෑ, අපේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමට. අපේ රජය මේ කුඩා වැව් විසි දෙදාහක් ප්‍රතිසංස්කරණය කිරීමට අගමැතිතුමාගේ මග පෙන්වීමෙන් කටයුතු කර තිබෙනවා.

මම අගමැතිතුමාගේ මහ පෙන්වීම අනුව ළඟදී ලෝක බැංකුවත් එක්ක වොෂින්ටන් නුවරදී සාකච්ඡා කළා. අපි මේ සඳහා මුදල් ඉල්ලුවා. විපර්යාසයක් හැටියටයි අපට ජලයෙන් මේ විපත් එන්නේ. නමුත් මේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය මඟින් මේ ජලය රඳවා ගන්න පුළුවන් නම් අපට මෙය ආශීර්වාදයක් කරගන්න පුළුවන්. එම නිසා අපි ඒ වැව් ප්‍රතිසංස්කරණය කරගත යුතුයි.

ඒ විතරක් නොවෙයි. අපි තායිලන්තයට කණ්ඩායමක් යවලා තිබෙනවා අධ්‍යයනයකට. තායිලන්තයේ විශේෂ ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා, වැව් උඩින් වලාකුළු යනවිට ඒ වලාකුළු බිඳින්න පුළුවන්. සමහර රටවල ඒ ක්‍රමය දැනටමත් ක්‍රියාත්මක කරනවා. මම කියන්නේ ආපදා කළමනාකාරිත්වයේදී අවදානම අඩු කිරීමේ වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. මේ සඳහා විශාල මුදලක් අවශ්‍ය වනවා. ඒ අවස්ථාවේදී හුඟක් රටවල් මේ සඳහා මුදල් දෙන්න පොරොන්දු වුණා.

ගරු කථානායකතුමනි, ඒ සඳහා වසරකට බිලියන 520ක් විතර අවශ්‍ය වනවා. ඒ වාගේම ලෝකයේ මිලියන 26ක විතර ජනතාවට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වෙනවා. අපේ රජය ජාතික රක්ෂණ භාරකාර අරමුදල හරහා ගිය වසරේ පමණක් - 2017දී- ජල ගැලීම්වලට මුහුණ දෙන්නට සිදු වුණු අය වෙනුවෙන් රුපියල් බිලියන හතරක් ලබා ගන්නට කටයුතු කර තිබෙනවා. අපි ඉදිරි කාලය දිහා බලන විට -ලබන වසර 15 තුළදී- මෙම ස්වාභාවික විපර්යාසවලට මුහුණ දෙන්න ඩොලර් බිලියන අනූදාහක් විතර ලෝකයට අවශ්‍ය වෙනවා.

අපේ පසුගිය අය වැය මේ සඳහා පටන් ගැන්මක් කළා. ඒ සඳහා මුදල් ඇමතිතුමා නීල හරිත අය වැයක් ඉදිරිපත් කළා. නීල හරිත උද්‍යාන හැදීම, වැව් ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු සෑම දෙයක්ම -නිෂ්පාදිත දේවල් පවා- නීල හරිත විය යුතුයි කිව්වා. අපේ මත්ස්‍ය සම්පත, මුහුදු සම්පත ආරක්ෂා කරන්නට අපි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ සඳහා ධීවර අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වීමට මුදල් වෙන් කරලා තිබෙනවා.

අපි සූර්යබල සංග්‍රාමයක් පටන්ගෙන තිබෙනවා. ඊයේ මම රූපවාහිනී වැඩසටහනක හිටියා. කවුද කෙනෙක් දුරකථනයෙන් ඇහුවා, " ඇයි අපේ රජය ගල් අහුරු බලාගාරවලට අනුමැතිය දීලා තිබෙන්නේ" කියලා. ඇමෙරිකාව ගත්තත්, යුරෝපය ගත්තත්, ජපානය ගත්තත් ගල් අහුරු බලාගාර වසා ගෙන වසා ගෙන යනවා. විදුලිය නිෂ්පාදනය කරන්න දැන් සූර්ය බලයයි, හුළං බලයයි, LNG වැනි ද්‍රව්‍ය තමයි භාවිත කරන්නේ. ඉතින් ඒ ප්‍රශ්නය අහපු එක සාමාන්‍ය දෙයක්. මහජනතාවට අදහසක් තිබෙනවා, පරිසරය ආරක්ෂා කළ යුතුයි කියලා.

අපට විශාල ගල් අහුරු බලාගාරයක් තිබෙනවා. අපි මොනවා කිව්වත්, නිලධාරීන් මොනවා කිව්වත්, විදුලිබල මණ්ඩලය මොනවා කිව්වත්, ඒ ප්‍රදේශවල ජීවත් වෙන, පුත්තලම දිස්ත්‍රික්කයේ ජීවත් වෙන, ජනතාව අපට කියනවා, ඒ ගල් අහුරු බලාගාරයෙන් පරිසර හානියක් සිදු වෙනවා කියලා. අපි සංවේදී වෙන්න ඕනෑ. අපට, කොළඹ ජීවත් වෙන අයට ඒ ගල් අහුරු බලාගාරයෙන් තිබෙන්නේ ප්‍රයෝජන විතරයි. අපට කිසිම පාඩුවක් නැතිව දිගටම පැය 24ක්ම ඒ හරහා විදුලිය ලැබෙනවා. අපට විදුලිය ලැබුණත් ඒ ප්‍රදේශවල -පුත්තලම දිස්ත්‍රික්කයේ- ජීවත්වන ජනතාවට ලොකු ගැටලුවක්, ප්‍රශ්නයක් තිබෙනවා මේ ගල් අහුරු බලාගාරය නිසා. ඒ හරහා ඒ අයගේ පරිසරය දූෂණය වෙනවා. ඒ නිසා අපි අහන්න ඕනෑ ප්‍රශ්නයක් තමයි, 'ඇයි ගල් අහුරු බලාගාර පවත්වාගෙන යන්නේ' කියලා. විදුලිබල මණ්ඩලයේ ඉන්න නිලධාරීන්, ඉංජිනේරුවරුන් මේ තත්ත්වයට වගකියන්න ඕනෑය කියලා මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. මොකද, ලංකාවේ විදුලිබල මණ්ඩලයට තිබෙන්නේ monopoly එකක්. සාමාන්‍යයෙන් වෙනත් රටවල වාගේ හුඟක් සැපයුම්කරුවන් හිටියා නම් අපට මේ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන්කම තිබුණා. ඒ නිසා විදුලි බල මණ්ඩලයට විශාල වගකීමක් තිබෙනවා. අපි මේ තීරණ ගන්න ඕනෑ අනාගත පරම්පරාව ගැන හිතලායි. ඒ නිසා පිරිසිදු ද්‍රව්‍ය පාවිච්චි කරලා විදුලිය නිෂ්පාදනය කළ යුතුයි.

ගරු කථානායකතුමනි, මට ලබා දුන් කාල වේලාව ගැන ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 2.11]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ජාතික පාරිසරික පනත යටතේ ගෙනෙන නියම සහ නියෝග හතක් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අවස්ථාවේ, පරිසරය සම්බන්ධව මතුවෙලා තිබෙන රටේ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්න කීපයක් ගැන ආණ්ඩුවේ සහ මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න මාත් සූදානම්. මා හිතන හැටියට ඉදිරිපත් කර තිබෙන මේ නියම පිළිබඳව අපට විශේෂ විවාදයක් නැහැ. නමුත් මේ නියමවලින් සමහර ඒවා මේ ආකාරයෙන්ම ඉදිරිපත් නොවුණත්, වෙනත් ආකාරයෙන් මීට පෙර ඉදිරිපත් කරලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, shopping bags තහනම වාගේ ඒවා හරියාකාරව ක්‍රියාවට නැහුණේ නැති බව ඔබතුමා දන්නවා. ඒ නිසා මේ නියම, නියෝග හරියාකාරව ක්‍රියාත්මක කරන්න නම් දූෂණයෙන් තොරව ඒ නීති ක්‍රියාත්මක කිරීමට සමත් දේශපාලනඥයන් සහ ඒ අනුව කටයුතු කරන්න ලෑස්ති නිලධාරීන් පිරිසකුත් අවශ්‍යයි. එවැනි ක්‍රමවේදයක් නැතුව මේවා සාර්ථක කර ගන්න බැහැ කියන එක තමයි අපේ මූලික අදහස.

පරිසරය ගැන කථා කරන අද දවසේ විශේෂයෙන්ම අද පවතින ගංවතුර තත්ත්වයත් එක්ක රටේ ජාතික ආපදා තත්ත්වයක් ඇති වෙමින් තිබෙන බව ඔබතුමා දන්නවා. හැම අවුරුද්දේම සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද එනවා වාගේ, වෙසක්, පොසොන්, ඇසළ උත්සව එනවා වාගේ දැන් අනිවාර්යයෙන්ම මැයි සහ ජූනි මාසය වනකොට ගංවතුර එන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා.

අපි ඊයේ සඳහන් කළ විධියට මේවාට අදාළව පෙර සූදානම් කටයුතු සිදු කළ යුතුයි. හැම අවුරුද්දේම ගංවතුරට ලක් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තිබෙනවා. උදාහරණයක් මම කියන්නම්. මම ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම කියන්නේ නැහැ. හැම අවුරුද්දේම රත්නපුර දිස්ත්‍රික්කයේ සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගංවතුරට ලක් වනවා. නමුත් අඩු ගණනේ ගංවතුර එනකොට ඒ ස්ථානවලට බෝට්ටුවක්වත් ලෑස්ති කරලා නැහැ. ඒ නිසා මේ සිදුවන විනාශය නතර කරන්න ඔබතුමන්ලාට බැරිවෙලා තිබෙනවා.

පරිසරය සුරැකීම වෙනුවට ලාභය මුල් කර ගත් ආර්ථිකයක් තමයි තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන්නේ. මම ඒ ගැන උදාහරණ කීපයක් කියන්නම්. "නීල හරිත" ආර්ථිකයක් ගැන

ඇමතිතුමා දැන් මේ ගරු ඇමතිතුමා කිව්වා. නීලත් නැති - හරිතත් නැති, අමු මෝඩ, අපේ රටේ අනාගතය විනාශ කරන වැඩ, මේ "නීල හරිත" කියන කථාවට මුවාවෙලා තමුන්නාන්සේලා කොහොමද කරන්නේ කියලා මම පෙන්වන්නම්. පාරිසරික විනාශ ඇති වන හේතු වළක්වන්න ඔබතුමන්ලාට බැහැ. නමුත් මේ අනතුර අනිවාර්යයෙන් සිදු වන නිසා, අඩු ගණනේ යම්කිසි පෙර සූදානමක් කරන්න ඔබතුමන්ලාට පුළුවන්. අඩු ගණනේ ආපදා තත්ත්වයට මුහුණ දෙන්න අවශ්‍ය කරන මූලික ආපදා සහන කටයුතු සැලැසුම් කරන්න ඔබතුමන්ලාට පුළුවන්කම තිබෙනවා.

අපට නම් දැනගන්න ලැබෙන විධියට මාතර, ගාල්ල, කළුතර වාගේ දිස්ත්‍රික්ක බොහෝ දුරට අද දවසේ තමයි ගංවතුර තත්ත්වයට ගොදුරු වෙමින් තිබෙන්නේ. ඒ නිසා ඒවාට අදාළව ආණ්ඩුවේ සූදානම පිළිබඳව බරපතළ ගැටලු මතු වී තිබෙනවාය කියා තමයි අපට දැනගන්න ලැබිලා තිබෙන්නේ.

ජනතාව මේ අවස්ථාවලදී ස්වේච්ඡාවෙන් සැලකිය යුතු වැඩ කොටසක් කරනවා. ඒ අතර ආණ්ඩුවේ ඇමතිවරු -මුදල් ඇමතිතුමා- කියනවා, ඒ සඳහා අසීමිතව මුදල් වෙන් කරනවා කියලා. මුදල් වෙන් කිරීමට වඩා ප්‍රායෝගිකව කළ යුතු දේ තමයි වැදගත්. එතුමා වෙන් කරනවාය කියන්නේ එතුමාගේ පෞද්ගලික මුදල් නොවෙයි, ජනතාවගේ බදු මුදල්. මේ විනාශ සිද්ධ වෙන්න කලින් වළක්වා ගන්න ලෝකයේ ඕනෑ තරම් ක්‍රම හදලා තිබෙනවා. එම ක්‍රම අනුගමනය කරන්න කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, තවම නාය යෑමක් සිද්ධ වුණේ නැහැ. තවම සිදුවන මරණ සංඛ්‍යාව වැඩි වෙන්නේ, එකින් එක. ඒ නිසා දැනට ඒ ගැන ලොකු කථාවක් නොවෙයි තිබෙන්නේ. එකවර නාය යෑමක් සිද්ධ වෙලා මිනිසුන් 15-20ක් වැළලුණාට පස්සේ තමයි මේ රටේ හෘදය සාක්ෂිය අවදි වෙන්නේ. කොහේ හෝ තිබෙන ලොකු කන්දක් එකපාර කඩා වැටිලා මිනිස්සු මැරුණාම තමයි මේ ප්‍රශ්නය පත්තු වෙන්නේ. ඒ නිසා නැවත නැවත මේ දේවල් කථා කරන එකේ තේරුමක් නැහැ. අපි ආණ්ඩුවට කියනවා, ආපදා තත්ත්ව ඇති වීමේ අවදානමක් පවතින ප්‍රදේශවලට රතු නිවේදන නිකුත් කරලා වැඩක් නැහැ; SMS alerts යවලා වැඩක් නැහැ; නාය යෑමක් සිද්ධ වෙන්න යනවාය කියා loudspeakersවලින් කියලා වැඩක් නැහැ කියලා. ඒ සඳහා කළ යුතු එක දෙයක් විධියට අපි දකින්නේ, සැබැවින්ම අනතුරුදායක තත්ත්වයක් තිබෙන ප්‍රදේශවල මිනිසුන් අඩු ගණනේ දවස් කීපයකට හෝ එම ප්‍රදේශවලින් අයින් කරලා, ඒ අනතුරෙන් ඔවුන් බේරා ගැනීමට කටයුතු කිරීමයි.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ ප්‍රතිපත්තිමය කරුණු ගැන කථා කරනවාට වඩා මම හිතුවා පරිසරය සම්බන්ධව තිබෙන ප්‍රශ්න කීපයක් ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න. ඔබතුමා දන්නවා, අපේ රටේ සිද්ධ වන අතිදැවැන්ත පාරිසරික හානිවලට අවශ්‍ය කරන තත්ත්වයක් නිර්මාණය කරපු ව්‍යාපෘතියක් තමයි කොළඹ වරාය නගර - Port City - ව්‍යාපෘතිය කියන්නේ. Port City ව්‍යාපෘතිය ආරම්භ කළේ නිසි පරිසර ඇගැයීම් වාර්තාවක් නැතුව. Port City ව්‍යාපෘතිය සඳහා කළු ගල් කියුබ් මීලියන 16ක් අවශ්‍යයි කියන එක ඒ ව්‍යාපෘති වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. ව්‍යාපෘතියට අවශ්‍ය ඒ කළු ගල් ලබා ගැනීම නිසා සුවිශාල වශයෙන් පරිසර හානි සිද්ධ වෙලා තිබෙනවා. කළු ගල් කඩන ප්‍රදේශවල ජීවත් වන මිනිසුන් මුහුණ දෙන අර්බුද, එම ව්‍යාපෘතියට ධීවර ජනතාව ඇතුළු මහ ජනතාවගෙන් එල්ල වුණු විරෝධය නිසා මේ ආණ්ඩුව ආවාට පස්සේ පාරිසරික ඇගයීමක් කරනවාය කියලා ඒ ව්‍යාපෘතිය තාවකාලිකව නතර කළා. ගරු කථානායකතුමනි, ඊට පස්සේ පාරිසරික ඇගැයීමක් කළා. හැබැයි, ඒකත් හරියාකාරව කළාද කියලා අපට බරපතළ සැකයක් තිබෙනවා. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු රටේ ප්‍රධාන ස්ථාන 11කින් Port City ව්‍යාපෘතියට අවශ්‍ය ගල් කැඩීම් විශාල වශයෙන් සිද්ධ වනවා. ඒ නිසා මහා බරපතළ පාරිසරික අර්බුද ඇති වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, එක කාරණයක් ගැන ඔබතුමාට කියන්නයි මා උත්සාහ කරන්නේ. විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය යටතේ තිබෙන අංක 439, අංක 439A දිද්දෙනිය උතුර හා දකුණ ග්‍රාම නිලධාරී වසම් හා අංක 440 නෙළුවත්තුඩුව හා 443/C ඉහළ හංවැල්ල කියන ග්‍රාම නිලධාරී වසම්වල පවත්වාගෙන යන ගල් කොරි පිළිබඳ ලේඛනයක් මා සතුව තිබෙනවා. ගරු කථානායකතුමනි, වර්ග කිලෝමීටර් 2ක වපසරියක් තුළ ගල් කොරි 12ක් පිහිටා තිබෙනවා. මේ ගල් කොරි 12ම පවත්වාගෙන යන්නේ Port City ව්‍යාපෘතියට අවශ්‍ය කරන ගල් සම්පාදනය කරන්නයි. ඉතා කුඩා ප්‍රදේශයක මේ ගල් කොරි 12ක් පවත්වාගෙන යෑම නිසා සිද්ධවෙලා තිබෙන්නේ මොකක්ද? ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා ඇති ඒ ප්‍රදේශයේ තිබෙන්නේ කඳු කියලා. ගල් පමණක් කොහේවත් නැහැ. ගල්වලට උඩින් තිබෙන්නේ පස්. පස්වල තිබෙන්නේ ගස්. මේ කඳු තමයි මුලින්ම කපන්නේ. කඳුවල තිබෙන ගස් ටික කපනවා. ඊට පස්සේ පස් ටික අයින් කරනවා. ඊට පස්සේ තමයි ගල් ටික කඩන්නේ. හංවැල්ල කියලා කියන්නේ ලබුගම කලටුවාව ප්‍රදේශයේ තිබෙන කොළඹ දිස්ත්‍රික්කයේ එකම කඳු පන්තිය. මේ කඳු තමයි දැන් සමතලා කරන්නේ. මේක සරල දෙයක් නොවෙයි. මා හිතන හැටියට පරිසරය භාර ඇමතිවරයා ජනාධිපතිවරයා. ජනාධිපතිතුමා අද උදේ filter එකක් විවෘත කරන්න ගිහින් තිබෙනවා, මා දැක්කා. අපි ජනාධිපතිතුමාට කියනවා, filter විවෘත කරනවාට වඩා පරිසරය භාර ඇමතිවරයා වශයෙන් පාරිසරික හානි සිදු වී තිබෙන තැන්වලට යන්නය කියලා. ගරු කථානායකතුමනි, මේ ගල් කොරි 12 බලපත්‍ර නීති උල්ලංඝනය කරමින්, ගල් බෝර ගහමින්, අලුත් compressors යොදාගෙන අතිවිශාල පාරිසරික හානියක් සිදු කරනවා. මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? මෙය ඒ ප්‍රදේශයේ ජනතාව විතරක් මුහුණ දෙන ප්‍රශ්නයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, අපේ ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමා කියනවා, වැව උඩින් වලාකුළු යනකොට වලාකුළු බිඳලා වතුර ගන්න තාක්ෂණයක් තිබෙනවාය කියලා. ගරු කථානායකතුමනි, එහෙම තාක්ෂණයක් තිබෙනවා. අපි දන්නවා, ඉමෙල්ඩා මාකෝස්ගේ දුව කසාද බඳිනකොට wedding එක දවසේ වැස්සොත් wedding එකට disturb වෙයි කියලා මැනිලාවලින් ඒ, වලාකුළු අයින් කළ බව. ඒ වාගේම වස්සන්නත් පුළුවන්. මේ වස්සන්න යන්නේ මරිච්චිකට්ටි ප්‍රදේශයට හෝ හම්බන්තොට වහින්නේ නැති ප්‍රදේශවලට හෝ වෙන කොහේට හෝ නම් අපට ප්‍රශ්නයක් නැහැ. දැන් ඔබතුමන්ලා හිතනවා, අපේ රටේ තිබෙන පාරිසරික ප්‍රශ්න තාක්ෂණයෙන් ගොඩ දමන්න. ගරු කථානායකතුමනි, මේක ආකල්පමය වශයෙන් වැරැදියි. ඒ කියන්නේ වැරැද්දක් කරනවා, කැලෑව කපනවා. ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමා කැලෑ කපන්න කියලා කිව්වේ නැහැ. නමුත් එතුමා ගත්ත තාක්ෂණික උදාහරණය ගැනයි මා කියන්නේ. එතකොට මිනිස්සු හිතනවා, ගස් ඔක්කොම කපා දමා තාක්ෂණයෙන් ගොඩ දමා දෙයි කියලා.

එහෙම වෙන්නේ නැහැ. ඒවා වැරදි මූලධර්ම. ගරු කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ කඳු පන්ති ටික පටන් ගන්නේ හංවැල්ලෙන් බව ඔබතුමාත් දන්නවා ඇති. විශේෂයෙන්ම ලක්ෂ 12කට ආසන්න ජනතාවක් සිටින කොළඹ නගරයට ජලය සම්පාදනය කරන්නේ ලබුගම හා කලටුවාව

[ගරු බිමල් රත්නායක මහතා]

ජලාශවලින්. එම ලබුගම - කලටුවාව ප්‍රදේශයට වර්ෂාව ලැබෙන්නේ එම ප්‍රදේශයේ තිබෙන කඳු පද්ධතිය නිසයි. මුහුදෙන් එන සුළං ටික නිසා මුලින්ම වලාකුළු ගිහිල්ලා ගැටෙන්නේ ඒ කඳුවල. කඳුවල ගැටෙන නිසා තමයි වලාකුළු cool කරලා ගන්නේ. සමහර අය හිතනවා, වලාකුළු තිබුණාම ඇති, කඳු ඕනෑ නැහැ; ගස් ඕනෑ නැහැ කියලා. එහෙම නම් ඔබතුමන්ලාට පුළුවන් නේ, ලබුගම සහ කලටුවාවේ තට්ටු 35ක, 50ක buildings හදන්න. එතකොටත් වලාකුළු වැදිලා cool වෙයිනේ. එහෙම වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ දී එක්තරා පරිසර විශේෂඥයකු කොෆි අනන් මැතිතුමාට මේක හරියටම කිව්වා. මෙම මෝඩ තාක්ෂණික තර්කය, ඒ කියන්නේ පරිසරය රකින්නේ නැතිව තාක්ෂණයෙන් අපේ ප්‍රශ්නය විසඳිය හැකියි කියන අදහස ගැන. මම තාක්ෂණය ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. එම පරිසර විද්‍යාඥයා කියපු උදාහරණය ගැන මම සඳහන් කරන්න කැමැතියි. එතුමා ඇහුවා, "ඔබට වතුර ගන්න ඕනෑ. වතුර ගන්න ඔබතුමාට ළිඳක් තිබෙනවා. ළිඳ තිබෙනවා; ළිඳේ වතුර තිබෙනවා. දැන් වතුර ගන්නේ කොහොමද?" කියලා.

ගරු කථානායකතුමනි, ළිඳ තිබුණත්; ළිඳේ වතුර තිබුණත් වතුර ගන්න බැහැ. වතුර ගන්න නම් ඒකට බාල්දියක් අවශ්‍යයි. ගස් ඉටු කරන්නේ අන්න ඒ කාර්ය භාරය; කඳුවලින් ඉටු කරන්නේ එම කාර්ය භාරය. පාවෙලා යන වලාකුළ සිසිල් කරලා ඇදලා ගන්නේ කඳු පද්ධතිය නිසයි. මම පරිසරය සම්බන්ධ පාඩමක් කරනවා නොවෙයි. පාර්ලිමේන්තුවට කිලෝමීටර් 20ක් ඇතින් තිබෙන කොළඹ දිස්ත්‍රික්කයේ එකම කඳු පද්ධතියට නීල හරිත ව්‍යාපෘතිය යටතේ තමුන්නාන්සේලා සිදු කරන අති විශාල හානිය ගැනයි මම කියන්නේ. ඔබතුමන්ලා කියයි, මේක පටන් ගත්තේ පසු ගිය ආණ්ඩුව කියලා. ඔබතුමන්ලාත් දැන් ඒක කරනවා නේ. අපි දකින දේ තමයි, වර්ග කිලෝමීටර් 2ක් ඇතුළත ගල් කොරි 12ක් දමාගෙන ගල් අදිනවා. ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමනි, දවසකට ට්‍රිපර් රථ 55කටයි අවසර තිබෙන්නේ. ඔබතුමා විෂය භාර ඇමතිවරයාද කියා මට හරි අවබෝධයක් නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම නොවෙයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා නොවෙයි? හොඳයි. කවුරු හෝ ඇමතිවරයෙක් ඇති නේ. ජනාධිපතිතුමා තමයි මෙම විෂය භාර කැබිනට් ඇමතිවරයා. අපි වගකීමෙන් යුතුව කියනවා, අනුමත කර තිබෙන්නේ දිනකට ට්‍රිපර් රථ 55යි. නමුත් ට්‍රිපර් රථ 200ක් යනවා. විශේෂයෙන්ම ජනතාව විසින් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ සභාපතිතුමාට මේ පිළිබඳව ඇතිවෙන්න කියලා තිබෙනවා. ඒ නිසා අංක එක විධියට අපි ඉල්ලා සිටිනවා, බලපත්‍ර උල්ලංඝනය කරමින් ට්‍රිපර්කාරයෝ, ගල් කොරිකාරයෝ කරන කටයුතු වහාම නතර කරන්න කියලා.

ඊට පස්සේ බලපත්‍රයට අනුව වැඩ කරලා මේක සීමා කරන්නේ කොහොමද කියන එක තීන්දු කරන්න. මොකද, මේක ඒ දිද්දෙනිය ප්‍රදේශයේ, හංවැල්ල ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්නයක් පමණක් නොවෙයි. මුළු කොළඹටම වතුර නොලැබීම පිළිබඳ ප්‍රශ්නයක් බවට පත් වන නිසා.

ඊළඟට, වරාය ව්‍යාපෘතිය නැවත පටන් ගන්න කොට ධීවර ජනතාවට වන හානි පිළිබඳව කටයුතු කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා, ගරු කථානායකතුමනි. අපි දන්නේ නැහැ, ඒවා ලැබෙවිද කියලා. හානි පූරණය වෙනුවෙන් කියලා ධීවර ජනතාවට රුපියල් මිලියන 500ක් වෙන් කළා. නමුත්, මහා පරිමාණ ගල් කොරි 11ක් වරාය ව්‍යාපෘතිය සඳහා දැන් පවත්වා ගෙන යනවා. ඒවායින් ඒ ප්‍රදේශයේ ජනතාවට සිද්ධ වෙන්නා වූ හානි පූරණය කරන්න වරාය ව්‍යාපෘතියේ මුදල් වෙන් කර තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා; ජනාධිපතිවරයාට කියනවා, වහාම මේ ස්ථානවලට ගිහිල්ලා මේ ප්‍රශ්නවලට මැදිහත් වෙන්න, මේ ආකාරයට මහා පරිමාණයෙන් පරිසරය විනාශ කිරීම නතර කරන්න කියලා.

ඊළඟට, රටේ පරිසරවේදීන් නිරන්තරයෙන් මතු කරන ප්‍රශ්නයක් තමයි දුම්බර අඩවියේ කෙරෙන මහා ඉඩම් මංකොල්ලය. මේකෙදී මිනිස්සු පාරම්පරිකව කරන පුංචි පුංචි දේවලුත් පටලවා ගෙනයි ව්‍යාපාරිකයින් මේ කටයුත්ත හංගා ගන්නේ. ඒවායේ පාරම්පරිකව එනසාල් වගා කරපු මිනිස්සු ඉන්නවා. හැබැයි, දැන් ඒවා මහා පරිමාණ ව්‍යාපාර කරගෙන, සමහර පුද්ගලයන් කැලේට රිංගලා අක්කර 10, 15 වගා කරනවා. ඒකට මුවා වෙලා, විශේෂයෙන් නකල්ස් රක්ෂිතයේ තිබෙන රජයට අයත් වතු යායවල්වල අක්කර විසිඑක්දහසක් පමණ පරිසරයට විශාල ලෙස හානි කරන විවිධ ව්‍යාපෘති සඳහා ලබාගෙන තිබෙනවා. දැන් සමහර අය කියනවා, "කැලේ කැපෙන්නේ රක්ෂිතයේ නොවෙයි" කියලා. නමුත් රක්ෂිතය පමණක් නොවෙයි, රක්ෂිතය ආශ්‍රිත ප්‍රදේශවලත් කළ හැකි කර්මාන්ත මොනවාද, යම්කිසි දෙයක් කරනවා නම් කළ යුත්තේ කෙසේද කියන එක ගැන අලුතෙන් පනවපු පාරිසරික නීති රාශියක් තිබෙනවා. හැබැයි, ඒ සියල්ලම උල්ලංඝනය කරමින් දේශපාලනඥයන් අත යට සල්ලි අරගෙන, මහා පරිමාණ සහ දූෂිත ව්‍යාපාරවලට විවිධාකාර විධියට ඉඩම් ලබා දීලා තිබෙනවා. එකක් තමයි නකල්ස් සංරක්ෂිත වනාන්තරය මායිමේ පිහිටි Hare Park වත්තේ අක්කර 900ක් පමණ මහා පරිමාණ කුකුළු ගොවිපොළක් සඳහා ලබා දී තිබීම. රක්ෂිතය ඇතුළේ කුකුල්ලු ඇති කරන්න අක්කර ගණනක් ලබා දීලා තිබෙනවා. ඊළඟට, සංරක්ෂිත වනාන්තරය මායිමේ පිහිටි රත්වත්ත වතු යාය රෝස තිරුවානා බහිජ කැපීම සඳහා ලබා දී තිබෙනවා. පරිසරවේදීන් ජනාධිපතිවරයා වෙත යොමු කරපු ලිපියක කොටසක් මම මේ කියවන්නේ. මම දන්නේ නැහැ, ජනාධිපතිතුමා මේවා කියවනවාද කියලා. ඊට පස්සේ මැදවත්ත වතු යායේ අක්කර 35ක් පමණ මහා පරිමාණ හෝටල් ව්‍යාපෘතියක් සඳහා ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ ආකාරයෙන් දුම්බර අඩවිය තුළ අක්කර 21,000ක් පරිසරයට හානිකර විවිධ ව්‍යාපෘති සඳහා රජය විසින් ලබාදී තිබෙනවා. දුම්බර ප්‍රදේශය කියන්නේ, ලංකාවේ තිබෙන අධි සංවේදී පාරිසරික කලාපයක්. මහවැලි ගඟේ පෝෂක ප්‍රදේශයෙන් සියයට 30ක් විතර තිබෙන්නේ එම ප්‍රදේශයේයි. ඒ නිසා එය විනාශ වුණාට පස්සේ මධ්‍යම කඳුකරයේ දැන් තිබෙනවාටත් වඩා පාරිසරික ප්‍රශ්න වැඩි වෙයි. ඊටපස්සේ මෙතැනට ඇවිත් ආපදා කළමනාකරණය ගැන සාකච්ඡා කළාට වැඩක් වන්නේ නැහැ.

මම කියන්න යන ඊළඟ කාරණය මේකයි, ගරු කථානායකතුමනි. ආණ්ඩුව ඉතාම ජනප්‍රිය වෙන්න දැන් පාවිච්චි කරන එක තර්කයක් තමයි, සූර්ය බලශක්ති ව්‍යාපාරය. "සූර්ය බලශක්තිය සම්බන්ධව කිසිදු ගැටලුවක් නැහැ, ඒක ඉතා හොඳ

දෙයක්, එය පුනර්ජනනීය බලශක්තිය, කාටවත් එයින් හානියක් නැහැ" කියන අදහසින් තමයි එය තිබෙන්නේ. අපිත් මූලික ප්‍රතිපත්තිමය වශයෙන් එය පිළිගන්නවා. නමුත් ගරු කථානායකතුමනි, දැන් ලංකාවේත් ලෝකයේත් වෙන්නේ මොකක්ද? මගේ වේලාව සමඟ මට තරගයක් තිබෙන නිසා මම ලෝකයේ වෙලා තිබෙන කථාව දැන් කියන්න යන්නේ නැහැ. ලංකාවේ වෙලා තිබෙන දෙය මම කියන්නම්. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අලි කළමනාකරණ රක්ෂිතයක් හදන්න යෝජනා කර තිබෙනවා. මොකද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අලි - මිනිස් ගැටුම උග්‍ර වෙලා තිබෙනවා. පසුගිය අවුරුදු දෙක ඇතුළත අලි ඇතුන් 18ක් සහ මිනිසුන් 9ක් මැරිලා තිබෙනවා. අලින් විසින් විශාල වශයෙන් වගා විනාශ කරපු නිසා මිනිසුන් අනාථ වෙලා තිබෙනවා. ඒ නිසා මේ යෝජිත අලි කළමනාකරණ රක්ෂිතය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කාලයක් තිස්සේ සාකච්ඡා කරලා, හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවත් අනුමත කර යෝජනා කරගත් භූමි ප්‍රදේශයක් තිබෙනවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? ඒ සඳහා යෝජනා කළ භූමි ප්‍රදේශය පසුගිය කාලයේ වෙනත් විවිධ ව්‍යාපෘතිවලට යෙදෙව්වා. තමුන්නාන්සේලා බලයට ආවේ ඒවා නිවැරදි කරනවා කියායි. තමුන්නාන්සේලා ඒවා නිවැරදි කරන්නෙත් නැහැ.

ඒ විතරක් නොවෙයි, දැන් තමුන්නාන්සේලා කරන්නේ මොකක්ද? තමුන්නාන්සේලා දැන් සූර්ය බලශක්තිය හදන්න කැලෑ කපනවා. කැලෑ කපලා, ඒවායේ solar panels ගහන්න හදනවා. තමුන්නාන්සේලාට කියන්න ඕනෑ නම මොකක්ද? ඒ පිළිබඳව පැමිණිලි කළ ලේඛනයේ යම් නම් ප්‍රමාණයක් තිබෙනවා. තමුන්නාන්සේලාට මේ පිළිබඳව සොයා බලන්න පුළුවන්. විශේෂයෙන්ම හම්බන්තොට, අලි කළමනාකරණ රක්ෂිතය සඳහා යෝජනා කරන ලද මම නම් කියන මෙන්න මේ ප්‍රදේශවල ඒ දෙය කර තිබෙනවා. මම හරියටම නම් කියන්නම්. යෝජිත අලි කළමනාකරණ රක්ෂිතය තුළ -සමාගම් කිහිපයක නම් තිබෙනවා, අවශ්‍ය නම් මට ඒ නම් කියන්න පුළුවන්- සමාගම් විසින් සූර්ය බලශක්ති බලාගාර ඉදි කිරීම සඳහා තිස්සපුර, බුරුතංකන්ද,-

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාට ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි කියනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඒ නම් ටික කියන්නම්. ඊට පස්සේ ඔබතුමා ඒ ගැන බලන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, සමාගම්වල නම් එක්කම කියන්න. එතකොට මට ඒ ගැන සොයා බලා පරීක්ෂණයක් පවත්වන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම විස්තර කියන්නම්. පරිසරවේදීන් ඉදිරිපත් කරපු පැමිණිල්ල මා ළඟ තිබෙනවා. එම පැමිණිල්ලේ සඳහන් වෙන්නේ මෙහෙමයි.

"... මේ වන විට යෝජිත අලි කළමනාකරණ රක්ෂිතය තුළ අයිරිෂ්, ඇනෝව්, ෆාර්නා, නැවිටාස් යන සමාගම් විසින් සූර්ය බලශක්ති බලාගාර ඉදිකිරීම සඳහා තිස්සපුර, බුරුතංකන්ද ප්‍රදේශයේ වනාන්තර අක්කර 600ක් නීති විරෝධී ලෙස සම්පූර්ණයෙන්ම එළිපෙහෙළි කර තිබේ. වල්සපුගල, දිවුල්පැලැස්ස වැව් ඉහත්තෑවේ අලි - ඇතුන් ජීවත් වූ අක්කර 300කට වැඩි වනාන්තර භූමි ප්‍රදේශයක් සම්පූර්ණයෙන්ම එළිපෙහෙළි කර මහා පරිමාණ සූර්ය බලශක්ති ගම්මානයක් ඉදි කර තිබේ. මෙම වැව හා ආශ්‍රිත ප්‍රදේශය අලි - ඇතුන් විශාල රංචු වශයෙන් ජීවත් වූ ප්‍රදේශයකි. මෙම බලාගාරය නිසා ඒ සියල්ල අහිමි වී ඇත.

මෙයට අමතරව හිටපු ආරක්ෂක අංශ ප්‍රධානියකු වන -ඕනෑ නම් මට නම කියන්න පුළුවන්.- ඔලිවර් රණසිංහ මහතා විසින් විවිධ පුද්ගලයින් ඉදිරිපත් කර වනාන්තර හෙක්ටෙයාර 60ක් සූර්ය බලශක්ති බලාගාර ඉදිකිරීම සඳහා මහවැලි අධිකාරියෙන් ඉඩම් නිදහස් කර ගෙන තිබේ. එම ඉඩම් අතුරින් හෙක්ටෙයාර 40ක් සෙනොක් ආයතනයට සූර්ය බලාගාර ඉදිකිරීමට නීති විරෝධීව පවරා තිබේ. සාගර් සෝලා බලාගාරයට යාබදව බුරුතංකන්ද ප්‍රදේශයේ වනාන්තර හෙක්ටෙයාර 20ක භූමියක් ඉවත් කර ඔලිවර් රණසිංහ මහතා විසින් සූර්ය බලශක්ති බලාගාරයක් ඉදිකිරීම සිදු කර ඇත. මේ සියල්ලම ජාතික පාරිසරික පනත උල්ලංඝනය කරමින් නීති විරෝධී ව සිදු කර තිබේ."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! තේරීම් කාරක සභාවේ රැස්වීමක් පස් වරු 2.45ට පැවැත්වෙන බව මා ප්‍රකාශ කළා. අදාළ මන්ත්‍රීවරුන්ට ඒ සඳහා සහභාගි වන ලෙස මා දන්වා සිටිනවා.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියමින් සිටියේ මේ කාරණයයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට ලොකු වෙලාවක් ලබා දීලා නැහැ. මට තව issues දෙකක් කියන්න තිබෙනවා. ඔබතුමාගේ කාරණය විනාඩියකින් කියන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අපි කිසිම රක්ෂිතයක්; කිසිම ආරක්ෂිත ප්‍රදේශයක් කපා සූර්ය බලාගාර ඉදි කරන්නේ නැහැ. ඔය ඔබතුමා මුලින් සඳහන් කළ සමාගම්වලට මේ රටේ සූර්ය බලාගාර ඉදි කිරීමට අවසරයක් නැහැ. ඔබතුමා අක්කර 600ක් ගැන කිව්වා නේ? අක්කර 600ක් සඳහා කිසිම අවසරයක් මේ වනකොට දීලා නැහැ. ඒක අසත්‍යයක්. ඒක කරන්නේ වෙන මොකක් හරි පරමාර්ථයකින්. දෙවනුව, ඔබතුමා ඔලිවර් රණසිංහ පිළිබඳව සහ ඊට පස්සේ තවත් සමාගමක් ගැන සඳහන් කළා. ඔවුන්ට බලපත්‍ර තිබෙනවා. නමුත්, ඒ බලපත්‍රවල නීත්‍යානුකූලභාවය ගැනත් ගැටලු තිබෙනවා. ඔබතුමා, ඔබතුමාට ලැබී තිබෙන පෙත්සමේ copy එකක් මට දෙන්න. මම ඒ පිළිබඳව විස්තරාත්මක පරීක්ෂණයක් කරනවා. සමහර විට සූර්ය බලාගාර ඉදිකරන බව සඳහන් කරමින් වෙන පරමාර්ථයකට ඔය අක්කර 600 එළි කරනවා විය හැකියි.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, බිමල් රත්නායක මන්ත්‍රීතුමා සඳහන් කළ වල්සපුගල කියන තැන මේ වනකොට constructions පවා කර ගෙන යනවා. ඔය කියපු ආකාරයට ඒ ප්‍රදේශයේ තනිකරම කැලෑවක් සුද්ද කර තිබෙනවා. මම දන්නේ නැහැ, company එක මොකක්ද කියලා. නමුත්, "අලි කළමනාකරණ රක්ෂිතය" කියා හදුනා ගෙන තිබුණු මහවැලි ඉඩමක මේ වනවිට constructions කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, මට ඒ සම්පූර්ණ විස්තර දෙන්න. අපි අමාත්‍යාංශය තුළ මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වමු. ඒ කියන්නේ රක්ෂිත කැලයක් කපා සූර්ය බලාගාර හදන්න නම් කොහොමත්ම අපි ඉඩ දෙන්නේ නැහැ. පැහැදිලිද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

හොඳයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා. එතුමා එම ප්‍රදේශයට සම්බන්ධ මන්ත්‍රීවරයකු නිසා එතුමාට මට වඩා එම ප්‍රදේශය ගැන අවබෝධයක් තිබෙනවා. ඔබතුමන්ලා මේ ගැන සොයා බලන්න. මේක මෝඩ වැඩක්. කැලෑ කපා solar panels ගහන්නේ මොන රටේද? එම නිසා ඒ සම්බන්ධව සොයා බලන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාවගේ උනන්දුව දල්වන තවත් විශාල ප්‍රශ්නයක් තමයි, විල්පත්තු වනාන්තරයේ තිබෙන ප්‍රශ්නය. විල්පත්තුව කපන දූෂිත ජාතිවාදී දේශපාලනඥයන්ගෙන් විල්පත්තුව බේරා ගන්න ඕනෑය කියන කාරණය මම මුලින්ම කියන්න කැමැතියි. ඒ වාගේම දූෂිත, ඒ වාගේම ජාතිවාදී දේශපාලනඥයන්ගෙන් විල්පත්තුව සුරැකීමේ සටනත් බේරා ගන්නත් ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ විධියට විල්පත්තුව රැක ගැනීමටත් අපි කැමැතියි, ඒ වාගේම එම ප්‍රදේශයේ ජීවත් වුණු මුස්ලිම් ජනතාවගේ ජීවත් වීමේ අයිතියත් අපි එලෙසම පිළිගන්නවා. ඒ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ජීවත් වීමේ අයිතිය ප්‍රතික්ෂේප කරලා විල්පත්තුව රකින්න කියා අපි කියන්නේ නැහැ. හැබැයි, ඒ මුස්ලිම් ජනතාවගේ ජීවත් වීමේ අයිතියට මුවාවෙමින් එතැන කෙරෙන්නා වූ වන විනාශය අපි හෙළා දකිනවා. ඒ වාගේම තමන්ගේ ගමේ කැලෑව කපනවා. දැන් මා ඒ සම්බන්ධයෙන් සඳහන් කළා. ඒ විධියට හංවැල්ලේ කැලෑ කපනවා; හම්බන්තොට කැලෑ කපනවා. හැම තැනම වාගේ කැලෑ කපනවා. තමන්ගේ ගම් ප්‍රදේශයේ කැලෑව කපනවා; රක්ෂිතය කපනවා. ඒ පිළිබඳව මොකුත් කරන්නේ නැහැ. ඒ පිළිබඳව වචනයක් කියන්නේත් නැහැ. හැබැයි, විල්පත්තුවේ ප්‍රශ්නය කරේ තියා ගන්නවා. ඒ මුස්ලිම් ජනතාවට තිබෙන විරුද්ධභාවය නිසායි. අද විල්පත්තු සටන දිනන්න බැරි වෙලා තිබෙන්නේත් ඒකයි. අපට පරිසර ප්‍රශ්නවලදී ජාතිවාදයක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුස්ලිම් ජනතාවගේ ජීවත් වීමේ අයිතිය ප්‍රතික්ෂේප කරලා තමයි අද බොහෝ අය විල්පත්තු ප්‍රශ්නය පිළිබඳව කථා කරන්නේ. නමුත්, අපට එවැනි පරමාර්ථයක් නැහැ. එම නිසා අපි මීට පෙර අවස්ථා ගණනාවකදීත් මේ ප්‍රශ්නය පිළිබඳව කථා කළා.

අපි විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, විල්පත්තුව රැක ගැනීමේ ප්‍රශ්නය ජාතිවාදයෙන් පුරවන්න හදන්න එපා කියලා. එතකොට ඒ ප්‍රශ්නය දිනන්න බැහැ. ඒ ප්‍රදේශයේ පාරම්පරිකව ජීවත් වුණු, ඒ ප්‍රදේශයේ යුද්ධය නිසා අවතැන් වුණු මුස්ලිම් ජනතාවට, දෙමළ ජනතාවට, සිංහල ජනතාව සුළු ප්‍රමාණයක් ඉන්නවා නම් ඒ ප්‍රමාණයට හෝ ජීවත්වීමේ අයිතිය පිළිගනිමින් තමයි අපි විල්පත්තු ප්‍රශ්නය ගැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විල්පත්තුව සම්බන්ධයෙන් තිබුණු ලොකුම ප්‍රශ්නය ඒ පිළිබඳව රජයේ නිල ලේඛනයක් නොමැතිවීම බව ඔබතුමා දන්නවා. විල්පත්තුවේ වෙන්නේ මොකක්ද කියලා නිල ලේඛනයක් නැහැ. 2018 ජනවාරි 04වැනි දා නිකුත් කරපු "අද" පුවත් පතේ පළ වූ "විල්පත්තු (විලත්තියිකුලම්) රක්ෂිතයේ අවභාවිතය ගැන විශේෂ විගණන වාර්තාව." මා දැන් උපුටා දක්වන්නම්. ඒ පත්තරේ පළ කර තිබුණේ විගණන වාර්තාවේ මූලික සාරාංශයයි. මා එය පදනම් කරගෙන තමයි මේ කරුණු කියන්නේ. විල්පත්තුවේ වන විනාශය පිළිබඳව, විල්පත්තුවේ කැලෑ හෙළි කිරීම් පිළිබඳව සහ පදිංචි කිරීම් පිළිබඳව විගණකාධිපති දෙපාර්තමේන්තුවට තිබෙන සීමාව ඇතුළත කරන ලද විගණන වාර්තාවක් තිබෙනවා. අපි පාර්ලිමේන්තුව වශයෙන් සාමාන්‍යයෙන් විගණකාධිපතිවරයාගේ ලේඛන පිළිගනු ලබනවා. මොකද, විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවටයි කටයුතු කරන්නේ; ආණ්ඩුවට නොවෙයි. ඒ නිසා මම පෙන්වන්නම් මොකක්ද මේකේ තත්ත්වය කියලා. මට වෙලාව නැති නිසා පත්තරේ පළ වූ ඔක්කෝම කියන්න යන්නේ නැහැ. විල්පත්තුවේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ වාර්තාවෙන් ඉතා පැහැදිලිව කියලා තිබෙනවා. ඒ විගණන වාර්තාවේ නිගමනය මම කියවන්නම්:

නිගමනය

(7.1) 2012 මැයි 21 දිනැති අංක 1759/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් 'විලත්තියිකුලම් රක්ෂිත වනාන්තරය' ලෙස ප්‍රකාශයට පත් කර ඇති වනාන්තරයෙන් අක්කර 650ක කොටසක් පුද්ගලයන් පදිංචි කිරීම සඳහා වන රක්ෂක විසින් නිදහස් කර තිබුණ ද, එය පවතින නීතිය අනුව පටහැනි බවට නිගමනය කරනු ලැබේ.

2012 ගැසට් පත්‍රය නීති විරෝධී කියලා විගණකාධිපතිවරයා නිර්දේශ කරනවා. එහි මෙහෙම සඳහන් වෙනවා:

(7.2) රක්ෂිත වනාන්තරයේ කොටස් හෙළි පෙහෙළි කිරීමෙන් සිදුවිය හැකි පරිසර හානිය සම්බන්ධයෙන් පවතින නීතියට අනුව පාරිසරික

බලපෑම් පිළිබඳ ඇගයීමක් (EIA) කළ යුතු වුවද, එසේ සිදු නොකර තිබූ හෙයින් වන රක්ෂිතයට සිදු වූ හා ඉදිරියේදී සිදුවන පරිසර හානිය සම්බන්ධයෙන් පියවර ගැනීමට කටයුතු කර නොතිබූ බව නිගමනය කරනු ලැබේ.

(7.3) රක්ෂිත වනාන්තරය තුළ ඉදිකළ නිවාසවල පදිංචි කිරීමේ තත්ත්වය සහ පවුල් සඳහා වෙන් කළ බිම් කට්ටිවල දීර්ඝ කාලීනව නිවාස ඉදි නොකිරීම සැලකිල්ලට ගැනීමේදී ඉඩම් නොමැති, අවතැන් වූ පවුල් සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබූ බවට නිගමනය කරනු ලැබේ.

අවතැන් වෙච්ච මිනිසුන්ගේ ප්‍රශ්නය ගසාකෑමකට ලක් වෙලා තිබෙනවා කියන එක තමයි මේ නිගමනයෙන් කියන්නේ. අවතැන් වෙච්ච අයට ඉඩම් දෙන්න එපා කියලා නොවෙයි කියන්නේ. මම ඒ බව පුන පුනා කියනවා. මොකද, මේ ප්‍රශ්නයේ ජාතිවාදී ස්වභාවයක් තිබෙනවා. එහි තවදුරටත් මෙහෙම සඳහන් වෙනවා:

(7.4) උතුරු-නැඟෙනහිර යුද්ධයෙන් අවතැන් වූ තම ඉඩම් අහිමි පවුල්වලට පෙර පරිදි මුල් ඉඩම් ලබාදීම ජනාධිපති කාර්ය සාධන බලකායේ ප්‍රධාන අරමුණ වුවද, එයට පටහැනිව ඉඩම් අහිමි නොවූ, එහෙත් ඔවුන්ගේ දෙවැනි හා තුන්වැනි පරම්පරාවල පවුල්වලට ප්‍රමාණවත් ඉඩම් නොමැති බවට කරුණු දක්වා මෙම වන රක්ෂිතයෙන් ඉඩම් ලබාදීම එකී අරමුණට පටහැනි බවට නිගමනය කරනු ලැබේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉන්න කෙනෙක්. මේ ප්‍රශ්නය ගැන මට වඩා හොඳට ඔබතුමා දන්නවා. මම කියන්නේ ඔබතුමාගේ දිස්ත්‍රික්කය ගැනයි. මේ ස්ථානීය පරීක්ෂණයෙන් මොකක්ද කියන්නේ? ස්ථානීය පරීක්ෂණයෙන් මෙහෙම කියනවා:

පොදු නිරීක්ෂණ

විලත්තියිකුලම් රක්ෂිත වනාන්තරයෙන් අක්කර 650ක භූමියක් හෙළි පෙහෙළි කිරීමට පදනම් වූ කරුණු සහ ඒ සම්බන්ධ නිරීක්ෂණ.

(5.1) විලත්තියිකුලම් වනාන්තරය රක්ෂිත වනාන්තරයක් වශයෙන් රජය ප්‍රකාශයට පත් කර තිබියදී, වන රක්ෂක ජනරාල් විසින් එකී රක්ෂිතයෙන් අක්කර 650ක් දිස්ත්‍රික් ලේකම් මන්නාරම වෙත අවතැන් වූ මුස්ලිම් ජනතාව නැවත පදිංචි කිරීම සඳහා නිදහස් කර තිබුණි. එසේ නිදහස් කිරීමට වන රක්ෂක ජනරාල්ට අධිකාරී බලයක් හෝ නෛතික බලයක් නොතිබිණි.

(අ) පවුල් 160ක් සඳහා නිවාස ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණ ද, පදිංචි වී නොමැති පවුල් සංඛ්‍යාව 33ක් වී තිබිණි. අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව 131කි. නිවාස සකස් කර නොමැති, නමුත් එළි පෙහෙළි කර තිබූ ඉඩම් කට්ටි ගණන 706කි. එසේ වුවද, 2017 ජනවාරි 23වැනි දා කරන ලද ස්ථානීය පරීක්ෂාව අනුව ඉදිකර ඇති නිවාස 160හි සියයට 10ක පමණ නිවාස ප්‍රමාණයක් පමණක් පදිංචි වී සිටින බව තහවුරු විය.

(ආ) 2013 වර්ෂයේ බෙදා වෙන් කර තිබූ ඉඩම් කට්ටිවල පදිංචිවීම ඉතා අසතුටුදායක තත්ත්වයක තිබූ අතර, ඒ අනුව සත්‍ය වශයෙන්ම ඉඩම් අහිමි වූ අයට බිම් කොටස් ලබාදී තිබුණේ ද යන්න ප්‍රශ්නකාරී වී තිබිණි.

(5.5) ග්‍රාම නිලධාරීන් සමඟ විගණන නිලධාරීන් 2017 පෙබරවාරි 28, මාර්තු 01 සහ 02 දිනයන්හිදී නැවත ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ අතර, නැවත පදිංචි කළ අයගේ පවුල් 44ක නිවාස වසා දමා තිබිණි. එයින් නිවාස 41ක දීර්ඝ කාලයක සිට පුද්ගලයන් පදිංචි වී නොතිබිණි.

(5.6) නැවත පදිංචි කිරීම් කළ යුත්තේ යුද්ධයෙන් ඉඩම් අහිමි වී අවතැන් වූ පවුල් වුවද, ඉඩම් ලබාදී තිබුණු පුද්ගලයන්ට යුද්ධය නිසා ඉඩම් අහිමිවීමක් සිදුව නොතිබුණි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අනුව මම ඉතා පැහැදිලිව කියන්නේ-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් ප්‍රමාණවත් වෙයි. මම ඉතා පැහැදිලිව ආණ්ඩුවෙන්, පරිසරවේදීන්ගෙන් සහ මේ පිළිබඳව උනන්දුවක් දක්වන ඒ ප්‍රදේශයේ, දිස්ත්‍රික්කයේ මැති ඇමතිවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාත් එහෙම කෙනෙක්. ඔබතුමා එම දිස්ත්‍රික්කයේ ප්‍රධානියා. විල්පත්තුවේ ඉඩම් අහිමි වුණු මුස්ලිම් ජනතාවක් සිටිනවා. 1990 වර්ෂයේ එල්ටීටීඊ සංවිධානය ඒ අයව ගහලා පැන්නුවා. ඒක සත්‍යයක්. ඒක fact එකක්. ඒක ප්‍රතික්ෂේප කරන්න බැහැ. එහේ ඒ මිනිසුන් ජීවත් වුණා නම්, ඒ අයගේ දරුවන්ටත් එහෙන් ඉඩම් ලැබෙනවා. ඒකත් ඇත්ත. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම තත්ත්වය පාවිච්චි කරමින් විශාල වශයෙන් කැලෑ එළිපෙහෙළි කරලා තිබෙනවා. කැලෑ එළි කරද්දී මේක විල්පත්තුව නොවෙයි කියලා කියනවා. විල්පත්තුව නොවෙයි වෙන්නත් පුළුවන්. නමුත් විල්පත්තුව ආසන්නයේ තිබෙන -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තත්පර දහයක කාලයක් දෙන්න. වනාන්තර ආසන්නයේ තිබෙන ප්‍රදේශවලටත් පරිසර නීති තිබෙනවා. ඒවාට ඕනෑ ඕනෑ දේවල් කරන්න බැහැ. එම නිසා අපි ආණ්ඩුවට බලපෑම් කර කියා සිටිනවා ජාතිවාදය පැත්තකට දමලා මිනිසුන්ට පදිංචි වෙන්නත් ඉඩ ලබා දීලා, අපේ රටේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් වටිනා වනාන්තරය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගන්න කියලා. ඔබතුමාට ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

[අ.භා. 2.40]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික පාරිසරික පනත යටතේ නියමයන් අද සාකච්ඡා වෙනවා. මට මේ දැන් ලැබුණු තොරතුරක් මේ ගරු සභාව ඉදිරියේ පළමුවෙන්ම සඳහන් කරන්න කැමතියි. ආපදා කළමනාකරණ ඇමතිතුමා අද රත්නපුරයේ පැවැත්වුණු සාකච්ඡාවකට සහභාගී වුණා. එහිදී නිලධාරීන් කිව්වා, "සහනාධාර බෙදන්නත්, මිනිසුන් කොටු වෙලා සිටින තැන්වලට ළඟා වෙන්නත් අපට ඔරු 102ක් පමණ ඕනෑ." කියලා. මෝටර් බෝට්ටුවලින් එම ස්ථානවලට යන්න බැහැ. බෝට්ටුවලින් යන්න ජල ගැල්ම තිබෙන ප්‍රදේශයේ ගැඹුර මදි. ඔරු නිහයත් එක්ක මෙම ගංවතුර තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද? දැන් මුදල් ඇමතිතුමා කිව්වා, "ඕනෑ තරම් සල්ලි දෙනවා." කියලා. පසුගිය අවුරුද්දක් තිස්සේම රත්නපුරයට ඔරු ඉල්ලුවා. අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් , ඔරු 10ක්, ඔරු 15ක්, ඔරු 20ක් වශයෙන් ඉල්ලුවා. නමුත් පසුගිය අවුරුද්ද තිස්සේ මේවා ලැබුණේ නැහැ. ගංවතුර ගලනකොට ඕනෑ තරම් මුදල් වියදම් කරන්න කියනවා. මීගමුවේ ඕනෑ තරම් ඔරු තිබෙනවා. අඩු ගානේ ඒවාවත් කුලියට අරගෙන රත්නපුරයට අවශ්‍ය ඔරු ටික බෙදා දුන්නේ

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

නැත්නම් හදන කෑම ටික බෙදන්න බැහැ. ගංවතුරට කොටු වුණු තැන්වල මිනිසුන් බඩගින්නේ තමයි ඉන්නේ. කෑම ටික බෙදන්න තිබෙන ඔරු ටික මදි. මේ හදිසි තත්ත්වය ගැන -ජල ගැල්ම ගැන, ගංවතුර ගැලීම ගැන- කථා කරන්න තමයි අපි විවාදයක් ඉල්ලුවේ. නමුත් මේක වැදගත් කියලා ආණ්ඩුව කල්පනා කරන්නේ නැහැ. මෙය ඉතාම කනගාටුදායක තත්ත්වයක්. වෙනදා මෙවැනි අවස්ථාවක් ආවාම රටේ හදිසි තත්ත්වයක් තිබෙනවා. අපි අනෙක් කටයුතු පැත්තකින් තියලා මේ කරුණ විවාදයට ගන්නවා. එතකොට මන්ත්‍රීවරු තම තමන්ගේ ප්‍රදේශවල අත් දැකීම් අනුව තොරතුරු දෙනවා. ඒ තොරතුරු ඔක්කොම මේ ඇමතිවරුන්ට සැලකිල්ලට ගන්න පුළුවන්. මම මගේ තොරතුර දුන්න නිසා තමයි ඇමතිවරුන්ට ඒවා සැලකිල්ලට ගන්න පුළුවන් වෙන්නේ. එම නිසා රත්නපුරයට අවශ්‍ය ඔරු ටික කුලියට අරගෙන වහාම රත්නපුරයට යවන්න කියලා මම නැවතත් ඉතාම වුවමනාවෙන් ඉල්ලා සිටිනවා. මුදල් වියදම් කරන පම්පෝරි කථා මෙතැන නිකම් කිය කියා ඉඳලා වැඩක් නැහැ.

ඊළඟට, පරිසරය ගැන කථා කරමු. අපේ පරිසරය හා මිනිසා අතර හැමදාම සම්බන්ධයකුත් තිබෙනවා; ගැටුමකුත් තිබෙනවා. මේක අලුත් දෙයක් නොවෙයි. නමුත් මේ පරිසරය, ජෛව පද්ධතිය විශාල පරිහානියකට යන වේලාවේ ඒ ගැන මුළු ලෝකයම අවදි වෙලා පුළුවන් තරම් පරිසරය සංරක්ෂණය කරන්න උත්සාහ කරනවා. මෙවැනි වේලාවක තමයි ඇමෙරිකාවේ සිටින නායකයා පැරිස් සම්මුතියෙන් පවා අස් වෙලා තිබෙන්නේ. දේශගුණික විපර්යාස පිළිබඳ සම්මුතියෙන් ඉවත් වෙලායි තිබෙන්නේ. ලෝකයේ දේශගුණික විපර්යාස ඇති වෙන්නේ කාබන් විමෝචනයෙන් නොවෙයි කියලා ඒ අය කියනවා. විද්‍යාඥයින් කුලියට අරගෙන කියවනවා.

ඊළඟට, මම අපේ පළාතේ ජන පැවැත්ම ගැන සඳහන් කරන්නම්. අපේ පළාතේ මිනිසුන් දසදහස් ගණනක් සම්ප්‍රදායිකව ගහේ පතුලට ගිහින් උදැල්ලෙන් කූඩෙන් වැලි අරගෙන ඇවිත්, ඒ වැලි සෝදලා දලං කැලි, අර්ධ වටිනාකම් ඇති මැණික් කැට සොයා ගෙන ජීවිකාව කර ගත්තා.

එය සුළු මැණික් ව්‍යාපාරයට විශාල ප්‍රයෝජනයක් වුණා. සුළු මැණික් ව්‍යාපාරයේ මැණික් පොළවල ඒ මැණික් තමයි හුවමාරු වෙන්නේ. මේ කර්මාන්තය මහින් විශාල පිරිසක් යැපුණා. නමුත් දැන් මේක සපුරා තහනම් කරලා තිබෙනවා. අපි මේ පිළිබඳව ජනාධිපතිතුමාට කිහිප වතාවක්ම කරුණු කිව්වා, දස දහස් ගණනක් ජීවත් වුණු මේ සාම්ප්‍රදායික ජීවනෝපායට ඉඩ ලබා දෙන්න කියලා. මේකෙන් ගහට හානියක් වෙන්නෙත් නැහැ, ඉවුරට හානියක් වෙන්නෙත් නැහැ. හානියක් වෙන්නේ මේකට මුවාවෙලා sucker යන්ත්‍ර හෝ වෙනත් යන්ත්‍ර දැම්මොත්. ඉස්සර ගහේ කොටස් වෙන්දේසි කළා. වෙන්දේසි කළාම විශාල යන්ත්‍ර සූත්‍ර දාලා ගහ විනාශ කළා. මේ තුළින් සිදු වෙන්නේ මිනිසුන් දිය යටට ගිහින් කූඩයට වැලි ටිකක් පුරවාගෙන උඩට ඇවිල්ලා ගහේදීම බලනවා, යම් දලං කැල්ලක්, මැණික් කැටයක් තිබෙනවාද කියලා. ඉන් පසුව ඒ වැලි ටික ආපහු ගහටම යනවා. මේ විධියට මැණික් ගැරීම අත්හදා බැලීමක් හැටියට කළා, "මිණි කිරුළ" කියන වැඩසටහන යටතේ. එයින් ඉතා සාර්ථක ප්‍රතිඵල ගත්තා. අඩු ආදායම් ලබන මිනිසුන් සහ සුළු මැණික් ව්‍යාපාරිකයනුයි ඒකාබද්ධ කරලා ඇති කළ ආර්ථිකයට ඉතාම ප්‍රයෝජනවත් මේ වැඩ පිළිවෙළ තුළින් මධ්‍ය හා සුළු පරිමාණ ජීවනෝපායක යෙදෙන මිනිසුන්ට විශාල පිහිටක් ලැබුණා. අද මේක සපුරා තහනම් කිරීම නිසා මිනිස්සු අනාථ වෙලා, සුළු මැණික් ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙන්නේ.

මම බැලුවා, මේකට හේතුව මොකක්ද කියලා. එක කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ඒක ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 18 (2) උප වගන්තිය යටතේ ආණ්ඩුවට අයිති බිමක තිබෙන මැණික්වල වටිනාකම වෙන කාටවත් දෙන්න බැහැ කියලා. දැන් අපි ඒ සඳහා රාජ්‍ය භාගය දෙන ක්‍රමයක් යෝජනා කරලා තිබෙනවා. ඒ වගන්තියේ තිබෙන බලපෑම අනුව මේකට ඉඩ දෙන්න බැරි නම් ඇමතිතුමා ඊළඟට කළ යුතු වන්නේ අලුත් වගන්තියක් එකතු කිරීමයි. බොහෝ පනත්වලට එහෙම එකතු කරනවා, "ඉහත වගන්තියේ කෙසේ සඳහන් වී තිබුණද, මෙන්න මේ අනුව ක්‍රියාත්මක කළ හැකිය" කියලා වගන්තියක් එකතු කරන්නට පුළුවන්. රාජ්‍ය භාගය එකතු කරන්නත් ක්‍රමයක් තිබෙනවා. අඩුම වෙන්දේසි වටිනාකම, අඩුම ලංසුව බලලා අඩුම ලංසුවේ ප්‍රමාණය රාජ්‍ය භාගය හැටියට ඒ සමූහයාගෙන් එකතු කර ගන්නට පුළුවන්. සාමූහික ක්‍රමයට වටිනා මැණික් කැට ගං පතුලෙන් සොයා ගැනීමේ ක්‍රමයක් මේ තිබෙන්නේ; මේක රත්නපුරයට ආවේණිකයි. රත්නපුරයේ අනාථ වී සිටින විශාල ජනතාවකට එදා අපේ ආණ්ඩුව යටතේ මේ කර්මාන්තයේ යෙදෙන්නට සහනයක් දුන්නේ, අනියම් ලෙස අවසර දීලා. නීතියෙන් අවසර දිය නොහැකි නමුත් අනියම් ලෙස අවසරයක් දුන්නා, මේ විධියට උදැල්ල, කූඩය පමණක් භාවිත කර ගඟ පතුලේ තිබෙන වැලි සෝදා බැලීමට. එහෙම නැත්නම් ගඟේ, දොළේ බැහැලා වැලි සෝදලා මැණික් කැට සොයා ගැනීමේ අයිතියට ඉඩ දීලා මිනිසුන්ගේ ජීවිතයට විශාල සහනයක් සැලසුවා. අන්තිමට දැන් මේකට නීතිය හරස් වෙලා තිබෙනවා. මේ නීතිය වෙනස් කිරීමට ඇමතිවරයා අවශ්‍ය පියවර ගෙන ක්‍රියා කරනු ඇතැයි මම විශ්වාස කරනවා.

මම මේ සම්බන්ධයෙන් සියලු විස්තර ඇතුළත් කරලා ගරු ජනාධිපතිතුමාට ලියුමක් ලිව්වා. මේ අවස්ථාවේදී, 2018.05.11 දිනැතිව මා විසින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය, ගරු ජනාධිපතිතුමන් වෙත යොමු කරන ලද ලිපියක් මම **සභාගත*** කරනවා. එම ලිපිය මාගේ කථාවේ කොටසක් හැටියට හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්නට කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, මම ජල විදුලි බලාගාර ගැන කථා කරන්නට කැමැතියි. මට පෙර කථා කළ බොහෝ දෙනෙකු බල ශක්තිය ගැන කථා කළා. කුමන විධියේ බලාගාරද අවශ්‍ය වෙන්නේ කියලා බලන්න ඕනෑ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)

නැඹී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මගේ වේලාව විනාඩි 10යි තිබෙන්නේ. විනාඩියක්වත් ගන්න එපා, තත්පරයක් විතරක් ගන්න. දැන් තත්පරයත් පහුවෙලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, අඟුල් 10යි තිබෙන්නේ කියලා. ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට රත්නපුරයේ අඟුල් 66ක් ක්‍රියාත්මකයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අඟුල් 66ක් මදි. තව අඟුල් එකසිය ගණනක් ඕනෑ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඉන්න, ඉන්න කියනකම්. තව අඟුල් 26ක අවශ්‍යතාව තිබෙනවා කියලා අද ඇමතිතුමා ගියාම සඳහන් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, අඟුල් 66ක් එහේ තිබෙනවා. අඟුල් 26ක් අද දවසේ යවන්න-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, වැරදියි. අඟුල් 102ක් අවශ්‍යයි.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම මේ වගකීමෙන් කියන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මමත් වගකීමෙන් කියන්නේ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු මන්ත්‍රීතුමනි, මම වගකීමෙන් කියන්නේ. අඟුල් 66ක් දැනටමත් යවලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට ඔය කථාවෙන් වැඩක් නැහැ. දැන් අවශ්‍ය අඟුල් 26 හෝ යවන්න. [බාධා කිරීමක්]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
තව අඟුල් ප්‍රමාණයක් අපි ළඟ standby තිබෙනවා. අවශ්‍ය නම් ඒවාත් යවන්න පුළුවන්කම තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Standby තිබිලා වැඩක් නැහැ. ඔරු ඕනෑ කුරුවිටට; ඔරු ඕනෑ රත්නපුරයට. [බාධා කිරීමක්]

ඔරු නැහැ, අඟුල් නැහැ. තමුන්නාන්සේලා අවුරුද්දක් කෙකර ගෑවා. අවුරුද්දක් තිස්සේ මේවා ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට බාධා කළ නිසා, ඒ වෙනුවෙන් විනාඩි කිහිපයක් දෙන්න.

මෙතරම් විපතක්, විනාශයක් සිදුවෙලා තිබෙද්දී, මෙතරම් ඔරු ප්‍රමාණයක් වුවමනා වෙලා තිබෙද්දී, අවුරුද්දක් තිස්සේ ඉල්ලුම් කරලා තිබෙද්දී දැන් ඇවිල්ලා, මේක අපේ මුහුණේ අතුල්ලන්න එනවා. තමුන්නාන්සේලා මේවාට වන්දි ගෙවාවි. පසුගිය පළාත් පාලන මැතිවරණයේදීත් ගෙවිවා.

ඊළඟට, මම කියන්න යන්නේ මේ විදුලි බලාගාර ගැනයි. කුඩා ජල විදුලි බලාගාරවලින් නිපදවන සම්පූර්ණ විදුලිය ප්‍රමාණය මෙගාවොට්ස් 360යි. මේ මෙගාවොට්ස් 360ක් කියන්නේ අපට වුවමනා කරන මෙගාවොට්ස් 2500 - 3000ත් අතර අතිවිශාල ප්‍රමාණයෙන් ඉතා සුළු ප්‍රමාණයක්. නමුත් මේ වෙනුවෙන් අපි කැප කරන්නා වූ අපේ භූ දර්ශන, අපේ දර්ශනීය සුන්දරත්වයක් තිබෙන දිය ඇලි, ඒ වාගේම මිනිසුන්ගේ ජීවිතයට අත්‍යවශ්‍ය ගංගා, දොළ පහරවල් ඔක්කොම අවහිර කරමින් තමයි අද මේ ජල විදුලි බලාගාර පවත්වාගෙන යන්නේ. ශ්‍රීපාද අඩවියේ ඉඳලා එන එරත්නේ කුරු ගඟ තුළ මේ වන විට කුඩා ජල විදුලි බලාගාර තුනක් දමා තිබෙනවා. දැන් හතර වැනි එකකුත් දමන්න හදනවා. වතුර හිඟ කාලයට මිනිසුන්ට නාන්න ඒ ගඟේ වතුර නැහැ. මේ විධියට තව තවත් කුඩා ජල විදුලි බලාගාර සව් කළොත් වියළි කාලයේදී මේ ගංගාවල් සම්පූර්ණයෙන්ම නැති වී යන තත්ත්වයක් ඇති වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව ලොකු විවාදයක් තිබෙනවා. ගල් අඟුරු බලාගාර අපි භාර ගත යුතුද, නැත්නම් බල ශක්තිය නිපදවන පිරිසිදු ක්‍රමවලට යා යුතුද කියන ප්‍රශ්නය තිබෙනවා. මේක තර්කයක් විතර්කයක් හැටියට ගන්න එපා. අපට කරන්න තිබෙන්නේ සිදු වෙලා තිබෙන විනාශය ගිහිල්ලා බලන එකයි. නොරොච්චෝලේ බලාගාරය හදන කාලයේ ඒක හදන්න එපා කියලා විරෝධතාවල හිටපු කෙනෙක්, මම. පොලීසියත් එක්ක අනන්තවත් ගැටෙමින් අපි ඒකට විරෝධය පෑවා. ඒ කිව්ව විපාක ඔක්කොම අද ඒ ප්‍රදේශවල ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා ගල් අඟුරු බලාගාරවලට අත වනනවාය කියන්නේ අපේ රටේ පරිසරයේ මරණයට අත වනනවාය කියන එකයි. ඉංජිනේරු මහත්වරුන්ට අදහස් ඇති, ඉංජිනේරු මහත්වරු දන්නවාත් ඇති. නමුත් ඉංජිනේරු මහත්වරුන් උපදෙස් දුන්නාම සමාජය දිහා බලලා දේශපාලන තීරණ ගන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිසා ගල් අඟුරු බලාගාරවත්, කුඩා ජල විදුලි බලාගාර හදන්නවත් තවදුරටත් ඉඩ දෙන්න එපාය කියලා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, මම තවත් කාරණයක් කියන්න කැමැතියි. අපේ පතල් කර්මාන්තකරුවෝ ඉන්නවා. නොගැඹුරු පතල් කරන්නේ ලොකු ආයෝජනයක් කරන්න බැරි අයයි. නොගැඹුරු පතල්වල පොම්ප වැඩ කරන්නේ භූමිතෙල්වලිනුයි. භූමිතෙල් මිල වැඩිවීමත් එක්ක ජන ජීවිතයට වැදුණේ අකුණු පහරක්. ඒ ජන ජීවිතය මුදා ගන්න තමුන්නාන්සේලා කල්පනා කරන්නේ මිනිසුන්ට අකුණු පහර වැදුණාට පස්සේයි. භූමිතෙල්වල මිල වැඩි කිරීමට ඉස්සරවෙලා කල්පනා කරන්න තිබුණා, වතුකරයේ මිනිස්සු ලාම්පු දල්වන්නේ කොහොමද, ධීවරයෝ බෝට්ටුවල එන්ජින් දුවවන්නේ කොහොමද, පතල්කරුවෝ ඒ කර්මාන්තය කරන්නේ කොහොමද කියලා. ඒවා ගැන බලලා, සැලැස්මක් හදලා ඒ අයට මේවා සහන

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

මිලකට ලබා දෙන ක්‍රමයක් හදලා, ඊට පස්සෙයි මේ මිල වැඩි කිරීම කරන්න තිබුණේ. නමුත් කළේ යටට ඇදුමක් අඳින්නේ නැතිව රෙද්ද ගැලෙව්වා වාගේ වැඩක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම මේ ආණ්ඩුව වගකීමෙන් තොරවයි කටයුතු කරන්නේ. කියන්නේ නම් වගකීමෙන් යුතුව කරනවා කියලායි. නමුත් කරන්නේ වගකීමෙන් තොරවයි. මම ඉල්ලා සිටිනවා, අපේ නොගැඹුරු පතල්වල පොම්පවලටත් වුවමනා කරන භූමිතෙල් මේ කියන සහන මිලට ලබා දෙන්නය කියලා.

අවසාන වශයෙන් මම කියන්නේ මේ දෙනවාය කියන සල්ලි, තිබෙනවාය කියන සල්ලි ගැනයි. අර වැල්ලම්පිටිය වෙන්නවත්තේ, ටෝනි ප්‍රීනා කියන මනුස්සයාගේ දේපොළ 2016 ගංවතුරට යට වුණා. අද වන තෙක් එයාගේ ශිල්පීය උපකරණවලට මුදල් ලැබිලා නැහැ. 2017 අපේ ආචාර්ය රත්නපාල මහත්මයාගේ මුදුණාලයක් සම්පූර්ණයෙන් යට වුණා. මේ වන තෙක් ඒවාට මුදල් ගෙවලා නැහැ. ඒ ගැන ලියුම් පිට ලියුම් ලියලා තිබෙනවා. කෝ, තමුන්නාන්සේලාගේ වගකීම කියන එක අහමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

[අ.භා. 2.54]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්වභාවික හේතූන් මත අපේ පරිසරයට ආපදාවක් ඇති වෙච්ච වෙලාවකයි මට මේ සභාව අමතන්නට අවස්ථාව ලැබුණේ. ඒ වාගේම ආපදා අවස්ථාවේ සිදු කරලා තිබෙන ක්‍රියාකාරකම් අපි සිදු කරලා නැහැ කියලා ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා විසින් චෝදනා කරපු වෙලාවක තමයි මම මේ කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම බොහොම වග කීමෙන් මේ කාරණය කියනවා. මේ රටේ ආපදා අවස්ථාවක් ඇති වුණොත් ඒ ආපදා අවස්ථාවේදී ප්‍රයෝජන ගැනීම සඳහා අපි දිස්ත්‍රික්ක සියල්ලටම ඔරු සහ අඟුල් මෙන්න මේ ආකාරයට මුලින්ම වෙන් කරලා තිබුණා. මේ හදිසි අවස්ථාවේ වෙනත් ක්‍රමයකට ලබා දෙන්නත් කටයුතු කරලා තිබුණා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටු 10ක්, අඟුල් 8ක්, අමතර එන්ජිමකුත් අපි මීට ප්‍රථම -මේ ආපදාව ඇති වෙන්නට කලින්- යවලා තිබුණා. ඒ වාගේම මේ ආපදා අවස්ථාව වන කොට රත්නපුර දිසාපතිතුමාත් ඒ වාගේම ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂතුමාත් අපේ ආපදා සහන සේවා මධ්‍යස්ථානයට කරන ලද දැනුම් දීම අනුව මේ වන විට අඟුල් 66ක් අපි යවන්නට කටයුතු කරලා තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඔබතුමාට පුළුවන්කමක් තිබෙනවා නම්, මාතර දිස්ත්‍රික්කයට කොච්චර අඟුල් ප්‍රමාණයක් යවලා තිබෙනවාද කියලා කියන්න.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

කියන්නම්. මේ මොහොත වන කොටත් අපි දිස්ත්‍රික්කයක් - දිස්ත්‍රික්කයක් පාසා මේ ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශ ගැන සොයා බලන්නට වැඩ කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ අනුව ඊයේ - පෙරේදා දවස් දෙකේම පුත්තලම දිස්ත්‍රික්කයේ -වැඩිම ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශයේ- අපි කටයුතු කළා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් අහගන්න කෝ. ඔබතුමා පොඩි බබෙක් නොවෙයි නේ. අපේ වයස වාගේ දෙකක් විතර වයස තිබෙන මනුස්සයෙක් නේ. පොඩ්ඩක් විනීතව හැසිරෙන්න. අනෙක් මිනිහෙකුට කථා කරන්න ඉඩ දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

අද රට තුළ නොසන්සුන් තත්ත්වයක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

තමුන්නාන්සේලා වාගේ උදවිය තමයි නොසන්සුන් කරන්න හදන්නේ. තමුන්නාන්සේ සන්සුන් වෙන්න කෝ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නොසන්සුන් තත්ත්වයක් තිබෙන කොට අපි කොහොමද සන්සුන් වෙන්නේ? තමුන්නාන්සේලාට හැඟීමක් නැහැ. අපට ඒ ගැන හැඟීමක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

තමුන්නාන්සේගේ හැඟීම අපි දැක්කා. නොරොච්චෝලේ බලාගාරය හැදුවේ තමුන්නාන්සේලාගේ කාලයේ. කෝ, හැඟීම? එතකොට නතර කරන්න තිබුණා නේ. කෝ, නතර කර ගත්තාද? මොකක්ද, හැඟීම?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මම ඒකට විරුද්ධව උද්ඝෝෂණය කරපු මිනිහෙක්.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

තමුන්නාන්සේගේ උද්ඝෝෂණයට, හැඟීමට ඒක නතර වුණාද? අද පුත්තලම දිස්ත්‍රික්කයේ මිනිසුන්ට පීවත් වෙන්න බැහැ. ඒ අළු ටික ගොවීන්ට ප්‍රශ්නයක්. මේ ඔක්කෝම ප්‍රශ්න ඇති කළේ තමුන්නාන්සේලා ආණ්ඩු කරපු කාලයේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

කල්පිටිය විනාශ කළා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

කල්පිටිය විනාශ කළේ තමුන්නාන්සේලා ආණ්ඩු කරපු කාලයේ. මොකක්ද තමුන්නාන්සේලාගේ හැඟීම? තමුන්නාන්සේගේ දැනීම මොකක්ද? තමුන්නාන්සේට පුළුවන් කෑ ගහන්න විතරයි. තමුන්නාන්සේ ලාදුරුකාරයෙක් වාගෙයි; කිසිම හැඟීමක්, දැනීමක් නැති කෙනෙක්. බොරුවට කෑ ගහනවා. කරුණාකරලා කථා කරන්න ඉඩ දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම ඒවාට විරුද්ධ වුණා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
තමුන්නාන්සේගේ විරුද්ධවීම් කවුද ගණන් ගන්නේ? මේ රටේ කිසි කෙනෙක් තමුන්නාන්සේ කථා කරන ඒවා ගණන් ගන්නේ නැහැ. බොරුවට කෑ ගහන්න එපා. වග කීමක් නැතුව බොරු කථා කියන කොට කවුද අහන්නේ? කිසි වගකීමක් නැතිව කථා කරන ඒවා කවුරුවත් ගණන් ගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක නිසා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කළුතර දිස්ත්‍රික්කයට මීට ප්‍රථම එන්ජින් බෝට්ටු 11ක්, අහුල් 10ක්, අමතර එන්ජිමක් ලබා දෙන්න කටයුතු කළා. ඒ වාගේම ගාල්ල දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටු හයක්, අහුල් තුනක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයට අපි එන්ජින් බෝට්ටු දෙකක්, අහුල් දෙකක් ලබා දීලා තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටු පහක්, අහුල් පහක් ලබා දීලා තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටු තුනක්, අහුල් පහක් ලබා දීලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටු 13ක්, ඊට අමතරව අහුල් හයක් ලබා දීලා තිබෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටු එකයි, අහුල් එකකුයි ලබා දීලා තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටු දෙකක් ලබා දීලා තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටුවක් ලබා දීලා තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයට එන්ජින් බෝට්ටු පහක් ඒ වාගේම අහුල් හතක් ලබා දෙන්න කටයුතු කරලා තිබුණා. මේ, ආපදා තත්ත්වයට කලින් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ ආපදා තත්ත්වය එන්න ඉස්සෙල්ලා පෙර සූදානම්වලටයි අපි මේවා ලබා දීලා තිබෙන්නේ. ඊට අමතරව රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වුණු තත්ත්වය පිළිබඳව අපි අවධානයෙන් සිටියා. අපේ ආපදා සහකාර අධ්‍යක්ෂතුමා නිරන්තරයෙන් අපි එක්ක සම්බන්ධකම් පවත්වනවා. දිස්ත්‍රික් ලේකම්තුමා අපිත් එක්ක සම්බන්ධකම් පවත්වනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අපි එක්ක බොහොම සමීප සම්බන්ධකම් පවත්වනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ අහුල් 66ක් දැනටත් ක්‍රියාත්මක තත්ත්වයේ තිබෙනවා. ඒවා පොලිසිය හා ත්‍රිවිධ හමුදාව භාරයේ තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඊට අමතරව අද තවත් අවශ්‍ය යැයි කියලා තිබුණා. මේ තත්ත්වය සොයා බලන්න තමයි අද ගරු දුමින්ද දිසානායක අමාත්‍යතුමා රත්නපුර දිස්ත්‍රික්කයට ගියේ. ඊයේ කළුතර දිස්ත්‍රික්කයට එතුමා ගියේ, කළුතර දිස්ත්‍රික්කයේ තත්ත්වය හොයන්න. හෙට දවසේ කුරුණෑගල දිස්ත්‍රික්කයට මම යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට පස්සේ 28වැනි දා අපි බදුල්ල දිස්ත්‍රික්කයට යනවා; නුවරඑළිය දිස්ත්‍රික්කයට යනවා.

එක් පැත්තකින්, ගරු දුමින්ද දිසානායක අමාත්‍යතුමා දිස්ත්‍රික්ක 5ක ගමන් කරමින් තොරතුරු සොයා බලා අවශ්‍ය වැඩ කටයුතු කරන අතරේ මම ඉතිරි දිස්ත්‍රික්ක 5හි වැඩ කටයුතු කරගෙන යනවා. මෙන්න මේ අන්දමට අපි ඒ දිස්ත්‍රික්ක සියල්ල ආවරණය කරනවා. ගරු අමාත්‍යතුමා අද රත්නපුරයට ගියාම එහි තිබෙන තත්ත්වය අනුව කියා තිබෙනවා, තවත් අහුල් ප්‍රමාණයක් අවශ්‍යයි කියා. අපි අහුල් 26ක් කඩි මුඩියේ සූදානම් කළා. මා මේ පාර්ලිමේන්තුවට එන්න ඉස්සර වෙලා අමාත්‍යාංශයේ ඉඳලායි ආවේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මා මෙය වගකීමෙනුයි කියන්නේ. ආවාට ගියාට නොවෙයි කියන්නේ. රත්නපුරයට යවන්න අහුල් 26ක් සූදානම් කරලා තමයි අපි ආවේ. අද හවස් වන කොට රත්නපුරයට තවත් අහුල් 26ක් රැගෙන යනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙහෙම තමයි ඒ වැඩ කටයුතු කර තිබෙන්නේ.

ස්වාභාවික ආපදා තත්ත්වයක් -ගංවතුර තත්ත්වයක්- ආවාම කවුරුන් හෝ බත් පැකට් එකක් බෙදන කල්, කාගේවත් කෙසෙල් ගෙඩියක් ලැබෙන කල්, කාගේවත් වතුර බෝතලයක් ලැබෙන කල් බලාගෙන ඉන්න අපි ඉඩ දුන්නේ නැහැ. අපි ඒ යන්ත්‍රණය හදා තිබෙනවා. ඒ යන්ත්‍රණය තුළ ග්‍රාම නිලධාරී මහත්මයා, ගමේ ආර්ථික සංවර්ධන නිලධාරියා, ගමේ සමෘද්ධි නිලධාරියා ඇතුළුව ක්ෂේත්‍රයේ සිටින නිලධාරීන් පස්දෙනාම ඒ වෙනුවෙන් පුහුණු කර තිබෙනවා. ඒ නිසා පණිවුඩය ගමට යනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට එක තත්පරයක් දෙන්න, ගරු රාජ්‍ය අමාත්‍යතුමා. ප්‍රශ්නයක් අහන්න මට තත්පරයක් දෙන්න.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒ වාගේම මොහොතින් මොහොත, එනම් දවසට දෙවතාවක් - උදේ 10.00ටත්, හවස 4.00ටත්- අපි මාධ්‍ය සාකච්ඡාවක් පවත්වනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තමුන්නාන්සේටත් මම ඉඩ දුන්නා. තමුන්නාන්සේ අවස්ථාව ඉල්ලපු වෙලාවේ මම ඉඩ දුන්නා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒ මාධ්‍ය සාකච්ඡාවේදී අපි දැනුවත් කරනවා, දවස පුරා ලැබුණු වර්ෂාවේ ප්‍රමාණය කොච්චරද, ඒ අනුව ආපදා සිදු වන්නේ කොහේද, ජල ගැලීමක් ඇති වන්නේ කොහේද, ජලාශවල පවතින ජල මට්ටම් මොනවාද ආදි සියල්ල පිළිබඳව.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පසු ගිය අවුරුද්ද පුරා බෝට්ටු ඉල්ලුවා. තමුන්නාන්සේලා අවුරුද්දක්-

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
අකුණු ගහන්නේ කොහේද, ඒ අකුණුවලින් ඇති වන අනතුර මොකක්ද, ඒවා සඳහා ගත යුතු ආරක්ෂක පියවර මොනවාද, නාය යෑම් ඇති වනවා නම් ඒ ප්‍රදේශවල තත්ත්වය මොකක්ද ආදි සියල්ල අපි කියනවා. අපි නාය යෑමේ අනතුර තිබෙනවා කියා දිස්ත්‍රික්ක 10ක් නම් කර තිබෙනවා; ගං වතුර අනතුර තිබෙනවා

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

කියා දිස්ත්‍රික්ක 10ක් නම් කර තිබෙනවා. අපි අවවාදාත්මක නිවේදනත් නිකුත් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Vasudeva Nanayakkara?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
Hon. Deputy Chairman of Committees, you are aware that we asked for a Debate on the question of floods as an urgent matter of importance, but it has not been given. Now, you will observe, Sir, how this matter is coming up as an issue, and whatever information that is needed has to be given to this House.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(මාණ්පුමිකු පාලිත රන්ගේ පණ්ඩාර)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි තිබෙන තොරතුරු කියනවා. ඇහුම් කන් දෙන්න පුරුදු වෙන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
Therefore, Sir, I think you would be kind enough to convey to the Hon. Speaker that todays' Debate was mainly on the flood situation. Therefoere, he has to decide on an early date for the urgent Debate on floods.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Okay.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(මාණ්පුමිකු පාලිත රන්ගේ පණ්ඩාර)
(The Hon. Palitha Range Bandara)
අපි සියලු තොරතුරු කියනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි තොරතුරු හංගා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සබරගමුව, බස්නාහිර, මධ්‍යම, වයඹ සහ මාතර, ගාල්ල දිස්ත්‍රික්කවලටත්, ඒ වාගේම යාපනය, වව්නියාව දිස්ත්‍රික්කවලටත් ඉදිරි දින තුන ඇතුළත වර්ෂාපතනය බලාපොරොත්තු වන්න පුළුවන්. අපේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒ බව ප්‍රකාශයට පත් කර තිබෙනවා. සමහර ප්‍රදේශවල මිලිමීටර 100 සිට 150ක් දක්වා දැවැන්ත වර්ෂාපතනයක් බලාපොරොත්තු වන්න පුළුවන්. යාපනය සහ වව්නියාව ප්‍රදේශවලට මිලිමීටර 75ක ප්‍රමාණයක වර්ෂාපතනයක් හෙට, අනිද්දා, ඉන් අනිද්දා කියන දවස් තුන ඇතුළත බලාපොරොත්තු වන්න පුළුවන්. අන්න ඒ කාරණය නිසා තමයි අප පෙර සූදානම කර තිබෙන්නේ. අප ඒ පණිවුඩය ලබා දුන්නාම ජනතාව එයට ඇහුම් කන් දීලා අවනත වනවා නම්, සිදු වන්න තිබෙන විපත්වලින් විශාල ප්‍රමාණයක් අඩු කරගන්න අපට පුළුවන්කම ලැබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ වන විට මරණ 11ක් සිද්ධ වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ මරණවලින් 4ක්ම සිදු වෙලා තිබෙන්නේ අකුණු සැර වැදීම නිසායි. අද දවසේත් කල්පිටියේ එක් ධීවර කාර්මිකයකු අකුණු සැර වැදී මිය ගියා. මේ ගං වතුර තත්ත්වය තියෙද්දී, මේ ආපදා තත්ත්වය තියෙද්දී, අකුණු අනතුර තියෙද්දී අපි ඒ සියල්ල පිළිබඳව දැනුම් දෙනවා. එවිට රටේ ජනතාව ඒ කෙරේ අවධානය යොමු කරලා තමන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා පියවර ගැනීමත් වැදගත් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සියලු දිසාපතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා හරහා අපි මේ සහන ක්‍රමය ක්‍රියාත්මක කර තිබෙනවා; සෑම පුද්ගලයකුම බේරා ගැනීම සඳහා කටයුතු කර තිබෙනවා. ඊයේ දවසේ පුත්තලම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂතුමා නාවික හමුදාවත් එක්ක ගිහින් ආබාධිත දරුවන් 26දෙනකු, ඒ වාගේම වැඩිමහලු අම්මාලා තිදෙනෙකු, ආබාධිත තත්ත්වයේ සහ වයෝවෘද්ධ තත්ත්වයේ උන්න උදවිය, වහලවල, උඩ තට්ටුවල සිටි උදවිය බේරා ගෙන ඒමට කටයුතු කළා. ඊයේ තරුණයන් පිරිසක් වතුරේ සෙල්ලම් කර කර, නට නටා සිටියා. අපි කිව්වා "එහෙම කරන්න එපා" කියා. හලාවත පොලීසියේ නිලධාරීන්, මාරවිල පොලීසියේ නිලධාරීන් ගිහිල්ලා "ගලා යන ජලයේ, පාරේ සෙල්ලම් කරන්න එපා" කියද්දී සමහර උදවිය ගලා යන ජලයේ විනෝද වීමට ගියා. ආපදාව තුළ විනෝද වෙන්න ගිහින් තරුණයන් තිදෙනෙක් ගසාගෙන ගියා. වාසනාවට නාවික හමුදාවේ ජීවිතාරක්ෂක නිලධාරීන් අපත් එක්ක ඒ වෙලාවේ සිටියා. ඒ අය ඉක්මනින් පැනලා ඔවුන් බේරා ගත්තා. එහෙම නොවුණා නම්, එතැනදීත් තවත් තුන්දෙනකු විනාශයට පත් වනවා.

එක පැත්තකින් එහෙම ජීවිත ආරක්ෂා කරන අතරේ අනෙක් පැත්තෙන් අවශ්‍ය සහන ලබා දෙන්නත් කටයුතු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ජීවිත බේරා ගැනීමටත්, බේරා ගත්ත පුද්ගලයන් ආරක්ෂිත කඳවුරුවල රඳවා තැබීමටත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඒ කඳවුරුවලට අවශ්‍ය කෑම ලබා දීමටත් අපි ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවා; ඒවා ක්‍රියාත්මක කරලා තිබෙනවා. ග්‍රාම නිලධාරී මහත්මයාගේ ඉඳලා පුහුණු කළ නිලධාරීන් කණ්ඩායමක් ඒ ගම්වල ඉන්නවා. සෑම ග්‍රාම නිලධාරී වසමකම දැන් අවම වශයෙන් පුහුණු නිලධාරීන් දස දෙනෙකුගෙන් විතර සමන්විත කණ්ඩායමක් ඉන්නවා. ඒ උදවිය අවතැන් වූ උදවියට අවශ්‍ය සහයෝගය ලබා දෙනවා.

ඒ වාගේම, අපි හෙට දවසේ ඉඳලා අවතැන්වූවන්ට වියළි සලාකය ලබා දෙන්න සූදානම් කරගෙන යනවා. වතුර බැහැලා යන තැන්වල ගෙවල්වලට යන්න පුළුවන් උදවියට වියළි සලාකය ලබා දෙන්න කටයුතු කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට ගෙදරට එනකොට ඒ ගෙදර සුද්ද පවිත්‍ර කරන්න වෙනවා. ඒ සඳහා නිවෙස් හිමියාට රුපියල් දසදහසක මුදල් ආධාරයක් ලබා දෙන්න අපි පියවර ගන්නවා. අනිද්දා-ඉන් අනිද්දා වන විට වතුර අඩු වෙනවාත් එක්කම ඒ ජනතාවට ගෙවල්වලට යන්න පුළුවන් වෙයි. ඒ හැම නිවෙස් හිමියෙකුටම රුපියල් දසදහසක මුදලක් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම ළිං පිරිලා, අපවිත්‍ර වෙලායි තිබෙන්නේ. ඒ නිසා අපි මේ වන විටත් පුත්තලම දිස්ත්‍රික්කයට පමණක් වතුර ඉසින මෝටර් පනහක් එක්ක යුද හමුදා නිලධාරීන් යවන්න කටයුතු සූදානම් කරලා තිබෙනවා. දැන් අපි ඒ ගොල්ලන් ස්ථාන දහයක ස්ථානගත කරලා තිබෙනවා. ජලය බැස ගිය වහාම ඒ ගොල්ලන් ගිහිල්ලා ඒ ළිං පිරිසිදු කරනවා. පුත්තලමට පමණක් නොවෙයි,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ පක්ෂයට වෙන් වී තිබෙන කාලයෙන් මට තව විනාඩි කිහිපයක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කාගෙන්ද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කථා කරන්න ඉන්න කථිකයන්ගේ වෙලාවෙන් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
How many minutes do you want Hon. State Minister?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
විනාඩි පහක කාලයක් දෙන්න, මේක වැදගත් විවාදයක් නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කාගෙන්ද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
අපේ ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජල ගැල්මත් එක්ක පුත්තලම තමයි වැඩි වශයෙන්ම ආපදාවට ලක් වෙලා තිබෙන්නේ. ඒ නිසායි මම පුත්තලම ගැන මූලික වශයෙන් කිව්වේ. පුත්තලමට පමණක් නොවෙයි අනෙක් ස්ථානවලටත් අපි ඒ පහසුකම් සපයනවා.

අපි මේ විධියට යුද හමුදාව සූදානම් කරලා තිබෙනවා; නාවික හමුදාව standby ඉන්නවා; පොලීසිය නිරන්තරයෙන්ම මේ කටයුත්තත් එක්ක ඉන්නවා; ඒ වාගේම සිවිල් ආරක්ෂක බලකාය ඉන්නවා; ගුවන් හමුදාව standby ඉන්නවා. ඔවුන් පොරොත්තු සේවයේ ඉන්නවා, ඕනෑම අවස්ථාවක, ඕනෑම තැනකට ගිහිල්ලා ඒ ජනතාව බේරා ගන්න කටයුතු කරන්න.

අනෙක් පැත්තෙන් ඉන්නවා සෞඛ්‍ය අංශය. ඊයේ වන විට අපි සෞඛ්‍ය අංශය සමඟ සාකච්ඡා කළා. සෞඛ්‍ය අංශය සූදානමින් ඉන්නවා, ජලයට හසු වූ හැම කෙනෙකුටම රෝග නිවාරණය කිරීමට අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙන්න. මේ ජල ගැලීම් තත්ත්වයත් එක්ක බරපතළ රෝග ව්‍යාප්ත වෙන්න පුළුවන්. මී උණ පැතිරෙන්න පුළුවන්, වසංගත රෝග ඇති වෙන්න පුළුවන්, කකුල් කැසීම් ඇති වෙන්න පුළුවන්. සෞඛ්‍ය අංශය දැන් සූදානමින් ඉන්නවා, ඒ උදව්ය වෙනුවෙන් වෛද්‍ය සායන පවත්වන්න. මේ වනකොටත් සුරක්ෂිත කඳවුරුවලට ගිහිල්ලා ඒ උදව්යට සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. මේ වාගේ වැඩ පිළිවෙළක් අපි කඩිනමින් ක්‍රියාත්මක කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔබතුමාටත් පෙනෙනවා ඇති, රටේ ජනතාවටත් පෙනෙනවා ඇති, කොහේවත් තැනක අද වතුර ඉල්ලලා, කෑම ඉල්ලලා, බෙඩ් ෂීට් එක ඉල්ලලා, සනීපාරක්ෂක තුවාය ඉල්ලලා කථා කරනවාද, ප්‍රශ්න කරනවාද කියලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉල්ලනවා. ඔබතුමාට ඇහෙන්නේ නැති එකයි වෙලා තිබෙන්නේ. මිනිස්සු ඉල්ලනවා. මෙතැන පම්පෝරි ගහනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමාගේ කන් ඇහෙන්නේ නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ. ඔබතුමා ඉස්සර වෙලා ගිහිල්ලා- [බාධා කිරීමක්] ඔබතුමා කවදාවත් හොඳක් දැකපු මනුස්සයෙක්ද?

බෙඩ් ෂීට්ද, ජැකට්ද, ඇඳුම්ද, සනීපාරක්ෂක තුවාද, තුවාද, ඒ සියල්ල සහිත ලොරියක් අද දවසේත් -මේ වන විටත්- අපි පිටත් කරලා යවලා ඉවරයි, අත්‍යවශ්‍ය තැන්වලට දෙන්න කියලා. ඒ නිසා ඔබතුමා මෙහේ ඉඳලා බොරුවට කෑ ගහන්න එපා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම එහේ ඉඳලා තමයි ආවේ; පුත්තලමට ගිහිල්ලා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
එහෙම නම් ඔබතුමා ගිහිල්ලා ඒ මිනිස්සු බලා ගන්න එපායැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වන විටත් සමස්ත ජලාශ ජලයෙන් පිරිලා ඉතිරිලා යමිනුයි තිබෙන්නේ. මොරගහකන්ද ජලාශය සියයට 51.5ක්, කොත්මලේ ජලාශය සියයට 96ක්, වික්ටෝරියා ජලාශය සියයට 74ක්, රන්දෙනිගල ජලාශය සියයට 92.5ක්, රන්ටැඹේ ජලාශය සියයට 59ක්, උල්හිටිය ජලාශය සියයට 55ක්, බෝවතැන්න ජලාශය සියයට 46ක් පිරිලා තිබෙන්නේ. ඒ වාගේම පොල්ගොල්ල ජලාශය, කලා වැව ජලාශය, උඩවලව ජලාශය, වන්දිකා වැව ජලාශය, දැවුරුඔය ජලාශය, කුකුළේගඟ, ලක්ෂපාන යන සියලු ජලාශ මේ වන විටත් වාන් දමමිනුයි තිබෙන්නේ. තබ්බෝව ජලාශය වාන් මට්ටමට ඇවිල්ලායි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ තත්ත්වයත් එක්ක මහාමාඇළිය ජලාශය කැඩී ගියා. සහන සේවා

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

කණ්ඩායම් ගිහිල්ලා, යුද හමුදාව, ගොවි ජනතාව හා ප්‍රදේශවාසීන් එකතු වෙලා මහමාඑළිය ජලාශය අලුත්වැඩියා කිරීම සඳහා, නැත්නම් ඒ ජලය රැක ගැනීම සඳහා උත්සාහයක යෙදිලා ඉන්නවා. ඒ වාගේම දැදුරු ඔය ජලාශයේ ඉඳලා ඉහිණිමිටිය ජලාශයට ජලය යන ඇළේ දකුණු ඉවුර කැඩී ගිහිල්ලා වතුර අපතේ යනවා. මේ වන විටත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගිහිල්ලා ඒක ආරක්ෂා කිරීමට පියවර අරගෙන තිබෙනවා. කඩිමුඩියේ ඒ කටයුතු ටික කරගෙන යනවා. අනෙක් පැත්තෙන් ඉහිණිමිටිය ජලාශයේ ඉඳලා තබ්බෝව ජලාශයට ජලය යන රදවිබැඳි ඇළ දෙපොළකින් කැඩී ගිහිල්ලා තිබෙනවා.

ගොවි ජනතාව, ප්‍රදේශවාසීන්, යුද හමුදාවේ කණ්ඩායම් ගණනාවක් ගිහිල්ලා මේ වෙන කොට වැලි කොට්ටා අසුරමින් එය අලුත්වැඩියා කර ගෙන යනවා. මේ අන්දමට සෑම අංශයකම කටයුතු කරගෙන යනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා මේ කටයුතු ගැන බොරුවට, සාම්ප්‍රදායික විධියට මඩ ගහන්න, බොරු කරන්න ඕනෑ නැහැ.

ඒ වාගේම, මේ කටයුතු වෙනුවෙන් අවශ්‍ය මුදල් දිස්ත්‍රික්ක වශයෙන් අපි වෙන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයට හදිසි ප්‍රතිචාර සඳහා සමස්ත වශයෙන් මිලියන 17ක්,- [බාධා කිරීමක්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මෙතුමාගෙන් වැදගත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Member?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කෑගල්ල දිස්ත්‍රික්කයට මිලියන දෙකක්, කළුතර දිස්ත්‍රික්කයට මිලියනයක්, පුත්තලම දිස්ත්‍රික්කයට,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Padma Udayashantha Gunasekera.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගාල්ල දිස්ත්‍රික්කයට මිලියනයක්, මොනරාගල දිස්ත්‍රික්කයට මිලියන දශම 5ක්, ගම්පහ දිස්ත්‍රික්කයට මිලියන 2ක්, කොළඹ දිස්ත්‍රික්කයට මිලියන 3ක් මේ ආදී වශයෙන්,-

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු රාජ්‍ය අමාත්‍යතුමාගෙන් මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. [බාධා කිරීමක්] මටත් මයික් එක දීලා තිබෙන්නේ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ජාතික රක්ෂණ භාර අරමුදලෙන් මිලියන 5.5ක් ලබා දෙන්නත් -

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
National Council for Disaster Management කියන්නේ ඔබතුමාට අදාළ ආයතනයක්. දුම්න්ද දිසානායක මැතිතුමා තමයි මේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා. අඩුම තරමින් ඔබතුමන්ලා මේ කරුණ දන්නවාද දන්නේ නැහැ. මේ රටේ මිනිහෙක් මෙවැනි ආපදාවකදී, national disaster එකකදී, කථා කරන්න contact details හොයද්දී, අමාත්‍යවරුන්ගේ නම් හැටියට තවම තිබෙන්නේ අනුර ප්‍රියදර්ශන යාපා සහ දුනේෂ් ගන්කන්ද මහත්වරුන්ගේ නම්. ඒ කියන්නේ ඔබතුමාගේ නම තවම එතැන නැහැ. මේ ඔක්කෝම කරන්න කලින් මෙන්න මේක වෙනස් කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මේකද මේ ප්‍රශ්නය? විලිලජ්ජයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දුරකථනය වැඩ කරනවා නම්, "ඊමේල්" වැඩ කරනවා නම්, "ෆැක්ස්" වැඩ කරනවා නම්, ඇමතිගේ නමින් වැඩක් නැහැ; මන්ත්‍රීගේ නමින් වැඩක් නැහැ; නියෝජ්‍ය ඇමතිගේ නමින් වැඩක් නැහැ. දුම්න්ද දිසානායකයි, රංගෙ බණ්ඩාරයි එතැන ඉඳගෙන අවශ්‍ය කටයුතු මෙහෙයවනවා. මේ රජය වෙනුවෙන්, ජනාධිපතිතුමා වෙනුවෙන්, අගමැතිතුමා වෙනුවෙන් අපි ඒ කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, කවුරුවත් මේ අමාත්‍යාංශයේ ඉන්න ඇමති කවුද, නියෝජ්‍ය ඇමති කවුද, රාජ්‍ය ඇමති කවුද කියලා හොයන්නේ නැහැ. ඒ ජනතාව ඉල්ලන්නේ ඒ ගොල්ලන්ගේ ප්‍රදේශයේ තිබෙන අවශ්‍යතා ඉටු කරන්න කියලායි. වැඩකට නැති දේවල් කියන්නේ නැතිව වැඩක් ඇති දෙයක් කථා කරන්න. වැඩක් ඇති දෙයක් කථා කරන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිගන්න. ඒ තොරතුරු ඇතුළු කරලා නැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මොන තොරතුරුද නැත්තේ? [බාධා කිරීමක්] ඔබතුමා කියන්න, මොන තොරතුරුද නැත්තේ කියලා?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
රටේ මිනිස්සු අමාත්‍යවරයා කවුද කියලා දන්නේ නැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
අයියෝ! රටේ මිනිස්සු දන්නවා ඇමතිවරයා කවුද කියලා. රටේ මිනිස්සු දන්නවා දැන් මේ අමාත්‍යාංශේ ඉන්නේ කවුද

කියලා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. එහෙමනම් රටේ මිනිස්සු ඒ ගැන කෑ ගහන්න එපා යැ. තමුන්නාන්සේ කියන විධියට ඇමතිගේ නම නැහැ කියලා රටේ මිනිස්සු කවුරුවත් කෑ ගහන්නේ නැහැ. ඇමතිගේ නමයි, බෝඩ් එකේ නමයි, සෙල් ලිපියේ නමයි ඔය හැම එකේම නම ගහගන්න ඕනෑ තමුන්නාන්සේලාට තමයි. එහෙම පිස්සුවක් අපට නැහැ. අපට නමින් වැඩක් නැහැ. අපට අවශ්‍ය රටේ මිනිසුන්ට වුවමනා වැඩේ කරන එක විතරයි. ඒක තේරුම් ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වෙන කොට යම් යම් ප්‍රදේශවල ජලය බැස යෑමට පටන් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම කොළඹ නගරයට තර්ජනයක් වී තිබෙන කැලණි ගඟේ ජල මට්ටම මේ වෙන කොට යම් ප්‍රමාණයකට පහළ ගොස් තිබෙනවා. ඒ අනුව අවම ගං වතුර මට්ටම වන මිලිමීටර් 7 සීමාවටත් වඩා අඩු ප්‍රමාණයකට, මිලිමීටර් 4.95 දක්වා ජල මට්ටම පහළ බැස තිබෙනවා. ඒක වාසනාවන්ත තත්ත්වයක්. මෙන්න මේ තත්ත්වයන් එක්ක ජනතාවගේ ආරක්ෂාව සැලසීම අපේ මූලික කාර්යයක්. ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කිරීමයි අපේ කාර්යය. ඒ කාර්යය ඉටු කිරීම සඳහා අපේ අමාත්‍යාංශය, ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වැඩ කටයුතු කර ගෙන යනවා. මේ අවස්ථාවේ සියලු අංශ ඒකරාශී කර ගෙන වැඩ කටයුතු කරන්න පුළුවන් වුණු බව අපි විශේෂයෙන්ම සිහිපත් කරන්නට ඕනෑ. ඒ වාගේම, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සරත් චන්ද්‍රසිරි විතාන සමඟ කථා කරලා කලා වැවේ වතුර පාලනය කරන්න අපට පුළුවන් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අවසන් කරනවා.

ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ කථා කරලා, ඒ ජලාශ උතුරා යන්න නොදී, ඒ ජලය වෙන වෙන අංශවලට හරවමින් යම් මට්ටමකින් පාලනය කරන්න අපට පුළුවන් වුණා. හොඳ සම්බන්ධතාවක් ඇතිව මේ වෙනුවෙන් වැඩ කටයුතු කරන්න හැකි වූ නිසා, ජලයෙන් සිදු විය හැකි විනාශ, ආපදා තත්ත්ව බොහොමයක් පාලනය කරන්නට අපට හැකි වුණා.

විශේෂයෙන්ම මේ කටයුතු සඳහා හැම අංශයක්ම අපත් එක්ක එකට එක්කාසු වෙලා වැඩ කළා. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, දිස්ත්‍රික් ලේකම්තුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, ආපදා සහන කණ්ඩායම්, ඉන් පහළ සිටින රාජ්‍ය තන්ත්‍රයේ සෑම නිලධාරියෙක්ම අපට උදවු කළා. විශේෂයෙන්ම නාවික හමුදාව, යුද හමුදාව අපට දක්වන ලද සහයෝගය සහ අනුග්‍රහය මේ අවස්ථාවේදී අපි සිහිපත් කරන්නට ඕනෑ. පොලීසිය, ගුවන් හමුදාව ඇතුළු මේ හැම කෙනෙක්ම එකට එක්කාසු වෙලා මේ ආපදා තත්ත්වයෙන් රටේ ජනතාව මුදා ගැනීමට දායකත්වයක් දෙනවා. ඒ දායකත්වය දක්වන සෑම කෙනෙකුටම ස්තුතිය ප්‍රකාශ කරමින්, බොරුවට බුරන මහලු සීයලාට අපේ කනගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.14]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று விவாதத்துக்காக எடுத்துக்கொள்ளப்பட்டுள்ள தேசிய சூழல் - National Environment சட்டத்தின் கீழான கட்டளை தொடர்பாக எனது உரையினை நிகழ்த்த விரும்புகின்றேன். இன்றைய காலகட்டத்தில் இரத்தினபுரி மற்றும் இங்கு குறிப்பிடப் பட்டிருக்கின்ற சில மாவட்டங்களில் வெள்ளப்பெருக்கு ஏற்பட்டு, மக்கள் நிர்க்கதியில் இருக்கின்றார்கள் என்ற விடயம் சம்பந்தமாகக் கருத்துக்கள் பரிமாறப்பட்டிருக்கின்றன. இந்த விடயத்தில் உண்மையில் விமர்சன ரீதியாகப் பார்க்கின்ற போது, குறைபாடுகள் இருக்குமாக இருந்தால், அந்தக் குறைபாடுகளைக் கேட்டறிந்து, சரியான பரிகாரங்களைச் செய்ய வேண்டியது ஆட்சியிலிருக்கின்றவர்களது முக்கியமான கடமையாக இருக்கின்றது.

எமது நாட்டில் இரண்டு விடயங்கள் அடிக்கடி இடம்பெற்றுக்கொண்டிருக்கின்றன என்பது எங்களுக்கு நன்றாகத் தெரியும். அதாவது, ஒரு காலத்தில் வெள்ளப் பெருக்கு ஏற்படுகின்றது; இன்னுமொரு காலத்தில் வரட்சி ஏற்படுகின்றது. அப்படியென்றால், எங்களுடைய நீர் முகாமைத்துவத் தன்மை எவ்வாறிருக்கின்றது? என்பது பற்றி நாங்கள் சிந்திக்க வேண்டியுள்ளது. ஒரு காலத்தில் அளவுக்கதிகமாக வெள்ளம் ஏற்பட்டு மக்கள் கஷ்டப்படு கின்றார்கள்; மண்சரிவு, வெள்ளம் என்று பல்வேறு விதத்தில் பாதிக்கப்படுகின்றார்கள். இன்னுமொரு காலத்தில் அந்தந்த இடங்களில் வரட்சியினால் பாதிக்கப் படுகின்றார்கள். இவ்வாறான பாதிப்புக்கள் பற்றி நாங்கள் விஞ்ஞான ரீதியாகச் சிந்திப்போமாக இருந்தால், எமது நீர் முகாமைத்துவம் பற்றிய கோட்பாட்டில் அல்லது நீர் முகாமைத்துவம் பற்றிய எமது பார்வையில் சில குறைபாடுகள் இருக்கின்றன என்பதை மறுதலிக்க முடியாது. அந்த அடிப்படையில் தற்போது வெள்ளப் பெருக்கு ஏற்பட்டிருக்கின்ற மாவட்டங்களில் காணப்படுகின்ற அடிப்படையான தேவைகளை உடனுக்குடன் அடையாளங்கண்டு, அவற்றைத் தீர்ப்பதற்கான நடவடிக்கைகளை எடுக்கவேண்டியது தார்மீகம் மிக்க அரசின் பொறுப்பாக இருக்கின்றது. அதனைச் செய்துதான் ஆகவேண்டும். இந்த இடத்தில் உண்மையான கருத்துக்கள் சொல்லப்படுகின்றபோது அந்தக் கருத்துக்களுக்கு உரிய பதில்கள் எதிர்பார்க்கப் படுகின்றன. சிலவேளைகளில் அந்தக் கருத்துக்களில் குறைபாடுகள் இருக்குமாக இருந்தால், அவற்றைச் சுட்டிக்காட்டலாமே ஒழிய, அதை ஒரு விதண்டாவாதமாக மாற்றக்கூடிய சூழ்நிலை இருக்கக்கூடாது என்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

குறிப்பாக, எமது நாடு நீர்வளம் மிக்கது; நிலவளம் மிக்கது என்றெல்லாம் நாங்கள் பேசிக்கொண்டிருக் கின்றோம். இந்த நீர்வளத்தினை எவ்வாறு முகாமைத்துவம் செய்கின்றோம்? நிலவளத்தினை எவ்வாறு பாதுகாக் கின்றோம்? என்றெல்லாம் நாங்கள் அலசி ஆராய்ந்து பார்க்கவேண்டிய காலகட்டம் வந்திருக்கின்றது. சில நாட்கள் மழை பெய்தாலே ஒருசில மாவட்டங்களில் வெள்ளப்பெருக்கு ஏற்படுகின்றதென்றால், எங்களுடைய உட்கட்டுமானச் செயற்பாடுகள் எவ்வாறு

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

அமைந்திருக்கின்றன? என்று பார்க்க வேண்டும். வீதிகளை அமைக்கின்றபோது வீதிகளைப் பற்றி மட்டுந்தான் சிந்திக்கின்றோம்; அதனால் ஏற்படக்கூடிய பக்கவிளைவுகளைப் பற்றிக் குறைவாகச் சிந்திக்கின்ற நிலைமை காணப்படுகின்றது. ஒருநிலைச் சிந்தனை அல்லது ஒற்றைப் போக்குடைய சிந்தனையோடு செயற்படுகின்றபோது மற்றைய செயற்பாடுகளில் ஏற்படக்கூடிய பிரதிகூலங்களைப் பற்றி நாங்கள் சிந்திப்பதில்லை. எனவே, குறித்த செயற்பாடுகளை மேற்கொள்ள முன்னர் அது பற்றி ஆய்வுகள் செய்யப்பட வேண்டும்.

அதேநேரம், அந்த ஆய்வுகள்மூலமாக ஏற்படுகின்ற அனுகூலத்தை மட்டும் பார்க்காமல் அதனால் ஏற்படக்கூடிய பிரதிகூலங்கள் என்னவென்பதைப் பற்றியும் ஆராய்ந்து, அவற்றைக் குறைப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். "வெள்ளம் வருவதற்கு முன்பு அணை கட்ட வேண்டும்" என்று கூறுவார்கள். ஆனால், எமது நாட்டில் அநேகமாக வெள்ளம் வந்ததன் பின்னர்தான் அதற்குரிய பரிகாரங்கள் பற்றி அல்லது அதனைத் தடுப்பது பற்றி ஆராயப்படுகின்றது. நாட்டின் ஒவ்வொரு மாவட்டத்திலும் குறிப்பிட்ட காலங்களில் வெள்ள அனர்த்தங்கள் ஏற்படுகின்றபோது, பாதிக்கப்படுகின்ற மக்கள் சம்பந்தமாக அந்த மாவட்டங்களைச் சேர்ந்த பிரதிநிதிகள் எடுத்துக்கூறுகின்றபோது, அதனைப் பொறுப்புணர்ச்சியுடன் செவிமடுக்க வேண்டியது ஆட்சியாளர்களின் கடமையாக இருக்கின்றது. விமர்சனங்கள் சிலவேளைகளில் கசப்பாக இருந்தாலும் அந்த விமர்சனங்களை ஏற்று உரிய பதில்களை அளிக்கவேண்டிய பொறுப்பு சம்பந்தப்பட்ட அமைச்சர்களுக்கு இருக்கின்றதென்பதை இந்த இடத்தில் நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

சுற்றாடல் பற்றிப் பார்க்கின்றபோது, பல்வேறு விதமான சுற்றாடல்கள் இருப்பதைக் காணலாம். இன்று நாங்கள் பௌதிக சூழலைப் பற்றி அதிகமாகப் பேசிக்கொள்கின்றோம். இதைவிட, உயிரியல் சூழல் இருக்கின்றது; பண்பாட்டுச் சூழல் இருக்கின்றது. இவற்றைப் பற்றி நாம் அலட்டிக் கொள்வதில்லை. பௌதிக சூழல் என்று சொல்கின்றபோது நிலத்தைப் பற்றிப் பார்க்கின்றோம்; நீரைப் பற்றிப் பார்க்கின்றோம்; வளி மண்டலத்தைப் பற்றிப் பார்க்கின்றோம். இந்தச் சூழல்களில் பாதிப்புக்கள் ஏற்படுகின்றபோது, நாங்கள் அதைப்பற்றிப் பேசித்தான் ஆகவேண்டும்; அதனைத் தடுப்பதற்கான நடவடிக்கைகளை எடுத்துத்தான் ஆகவேண்டும். அதேபோன்று உயிரியல் சூழல் காணப்படுகின்றது. அது உயிரங்கிகளோடு சம்பந்தப்பட்ட சூழல். அது நுண்ணங்கிகளாக இருக்கலாம்; தாவரங்களாக இருக்கலாம்; விலங்குகளாக இருக்கலாம்; மனிதர்களாக இருக்கலாம். பௌதிக சூழலில் ஏற்படுகின்ற தாக்கங்கள் சூழலுக்குப் பெரும் பாதிப்பை ஏற்படுத்திக் கொண்டிருக்கின்றன. சில கருமங்களை முறையாகத் திட்டமிடாமல் செய்கின்றபோது அதனுடைய பக்கவிளைவுகள் பாரியளவில் இருக்கலாம். அதைப்பற்றிச் சிந்தித்துப் பார்க்காமல் இருக்க முடியாது. குறிப்பாக, மலையகப் பகுதிகளில் தாவரங்களைச் சரியான முறையில் வளர்க்காது விட்டால் அல்லது அங்கிருக்கின்ற மரங்களைக் கண்டபடி தறித்தால் அந்த இடங்களில் மண் சரிவுகள் ஏற்படும் என்பதை அறிந்திருக்க வேண்டும். அதேபோன்று, எங்களுடைய வனத்தைப் பாதுகாக்க வேண்டும்; வன சீவராசிகளைப் பாதுகாக்க வேண்டும்; தொல்பொருள் நிறைந்த பகுதிகளைப் பாதுகாக்க வேண்டுமென்று நாங்கள் நினைப்பதில் தவறில்லை. அதேநேரத்தில் இந்தப் பாதுகாப்பு மக்களுக்குப் பாதிப்பை ஏற்படுத்தக்கூடிய விதத்தில் அமைந்துவிடக்கூடாது.

சிலவேளைகளில் மக்களுக்கு அத்தியாவசியமாகக் குடியேற வேண்டிய தேவை ஏற்படுகிறது. அதுவும் முக்கியமாகக் கவனத்திற்கொள்ளப்பட வேண்டிய விடயமாக இருக்கின்றது. ஆனால், இந்தக் குடியேற்றமானது சரியான திட்டமிடலின்மூலமாக முறையாக முன்னெடுக்கப்பட வேண்டும். இன்று நாங்கள் வனவளத்தைப் பற்றி, வனசீவராசிகளைப் பற்றிப் பேசுகின்ற அதேவேளை, தொல்பொருள் அமைந்துள்ள பிரதேசங்களைப் பற்றியும் கூறுகின்றோம். ஆனால், மக்கள் வாழ்வதற்குரிய இடங்கள் ஒதுக்கீடு செய்யப் பட்டிருக்கின்றனவா? ஒதுக்கீடு செய்யப்பட்ட இடங்கள் போதுமானவையாக இருக்கின்றனவா? என்பவற்றைப் பற்றிக் கவனத்திற்கொள்வது குறைவாக இருக்கின்றது. அதுபோல, யானைகளால் மக்கள் தாக்கப்பட்டு இறப்புக்குள்ளாகின்றபோது அவர்கள்மீது காட்டுகின்ற அக்கறையைவிட, யானை பாதிக்கப்படுகின்றபோது காட்டுகின்ற அக்கறை அதிகமாக இருக்கின்றதென்ற கருத்து மக்கள் மத்தியில் இருக்கின்றது. ஆகவே, எமது மக்கள் சார்ந்த சில விடயங்களிலும் கவனம் செலுத்தவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது.

இதைவிட, எங்களுடைய பண்பாட்டுச் சூழல், கலாசாரச் சூழல், விழுமியச் சூழல் என்ற விடயங்களும் கவனத்திற் கொள்ளப்பட வேண்டும். பௌதிகச் சூழல் மாத்திரம் முக்கியமானதல்ல! பண்பாட்டுச் சூழலும் முக்கியமானது. உல்லாசப் பிரயாணத்துறையின் செயற்பாடுகள் திட்டமிடப்படாத அடிப்படையில் மேற்கொள்ளப்படுகின்ற போது எமது பண்பாட்டுச் சூழலும்கூட பாதிப் படைகின்றது; மாசடைகின்றது என்ற செய்தியையும் நாங்கள் கவனத்திற்கொள்ள வேண்டும்.

அதேவேளை, 'பொலித்தீன் பாவனை' என்ற இன்னுமொரு விடயமும் இருக்கின்றது. பொலித்தீன் பாவனையைக் கட்டுப்படுத்த வேண்டும்; தடுக்க வேண்டும் என்றெல்லாம் நாங்கள் சட்டங்களைக் கொண்டு வருகின்றோம்; நடைமுறைப்படுத்துகின்றோம். ஆனால், பொலித்தீன் பாவனை கணிசமான அளவேனும் குறைந்திருப்பதாகத் தெரியவில்லை. ஏனென்றால், புள்ளி விபரங்களின்படி ஒரு நாளில் இரண்டு இலட்சம் lunch sheets பாவனைக்குட்படுத்தப்படுகின்றது என்ற விடயத்தையும் ஒரு நாளில் ஒன்றரை இலட்சம் shopping bags பாவனைக்குட்படுத்தப்படுகின்றது என்ற விடயத்தையும் வருடந்தோறும் மூன்று இலட்சம் தொன் பிளாஸ்டிக் மூலப்பொருட்கள் இறக்குமதி செய்யப்படுகின்றன என்ற செய்தியையும் அறிந்திருக்கிறோம். எனவே, நாங்கள் சுற்றாடலைப் பாதுகாக்க வேண்டுமென்றால், சுற்றாடலை மாசுபடுத்தக்கூடிய பொலித்தீன், பிளாஸ்டிக் போன்ற பொருட்களின் பாவனைகளைக் கட்டுப்படுத்த வேண்டும். ஒரு வருடத்தில் இறக்குமதியாகின்ற மூன்று இலட்சம்

தொன் பிளாஸ்டிக் மூலப்பொருட்களும் அழிவடைகின்ற போது அந்தச் சூழல் பாதிக்கப்படக்கூடிய ஒரு நிலைமை இருக்கின்றது.

மேலும், நிலத்தைப் பொறுத்தமட்டில், நிலம் பாதிக்கப் படக்கூடிய விதத்தில் மண்சரிவு ஏற்படுவதை நாங்கள் பார்க்கின்றோம். இதைவிட, வியாபார அடிப்படையில் செயற்கை முறையில் மண் அகழ்வுகள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. குறிப்பாக மட்டக்களப்புப் பிரதேசத்தை எடுத்துக்கொண்டால், அங்கு மண் அகழ்வு என்பது மிகவும் இலாபகரமான தொழிலாகக் கருதப்பட்டு, குறிப்பிட்ட பிரிவினர் அதிலே ஈடுபட்டுக் கொண்டிருக்கிறார்கள். அங்கு சாதாரணமாக 12,000 ரூபாய்க்குப் பெற்றுக்கொள்ளக்கூடிய ஒரு 'ரிப்பர்' மண்ணின் விலையானது இப்பொழுது 25,000 இலிருந்து 32,000 ரூபாய்வரை அதிகரித்துக்கொண்டு செல்கின்றது. அப்படியென்றால் இந்த மண் அகழ்வில் ஈடுபடுகின்றவர்கள் யாருடைய அதிகார நிழலில் இருந்து கொண்டு அதனைச் செய்கின்றார்கள்? என்ற கேள்வி எழுகின்றது.

இன்று ஆற்றுப்படுக்கைகளில் அல்லது ஆற்றினுள் சென்று மண்ணை அகழ்கின்ற போக்குகள் காணப்படுகின்றன. குறிப்பாக கிரான் பிரதேச செயலாளர் பிரிவில் வாகனேரி, முள்ளிவெட்டுவான் போன்ற இடங்களில் பாரியளவில் மண் அகழ்வு இடம் பெறுவதனால், அந்த ஆற்றுப்படுக்கை அப்படியே பாதிக்கப்பட்டு வெள்ளப்பெருக்கு ஏற்படக்கூடிய சூழ்நிலை ஏற்படுகின்றது. இவ்வாறு மண் அகழ்வில் ஈடுபடுகின்றவர்கள் சட்டவிரோதமாகவும் தங்களுடைய செயற்பாடுகளை முன்னெடுக்கின்றார்கள். ஆனால், அவ்வாறு செயற்படுகின்றவர்களுக்கு அதற்கான அனுமதிச் சீட்டுக்கள் தாராளமாக வழங்கப்பட்டுக் கொண்டிருக்கின்றன. அதேவேளை, மண் அகழ்வில் ஈடுபட்டுச் சுற்றாடலைப் பாதிக்கக்கூடிய விதத்தில் அல்லது சுற்றாடலை வஞ்சிக்கக்கூடிய விதத்தில் செயற்படுகின்ற அந்த வியாபாரிகள் அரசியல்வாதிகளின் பின்னணியிலும் இருந்து செயற்பட்டுக்கொண்டிருக்கிறார்கள். சம்பந்தப் பட்டவர்களுடைய பேச்சின் அடிப்படையில் பார்க்கின்ற போது, அவர்களிடம் நெருங்கமுடியாது; ஏனென்றால், அவர்களின் பின்னணியில் அமைச்சர்கள் சிலரும் இருக்கிறார்கள் என்ற கருத்துக்கள் பரிமாறப்படுகின்றன. எனவே, நாங்கள் சுற்றாடலைப்பற்றி கோட்பாட்டு ரீதியில், பேச்சளவில் அதிகமாகப் பேசிக்கொண்டிருப்பதை விட, இந்தச் சுற்றாடலைப் பாதுகாக்கக்கூடிய முறையான செயற்றிட்டங்களையும் வினைத்திறன் சார்ந்த பொறி முறைகளையும் செயற்பாட்டளவில் பின்பற்ற வேண்டியவர் களாக இருக்கின்றோம்.

குறிப்பாக, முறுத்தானை, பூலாக்காடு போன்ற பிரதேசங்களை எடுத்துக்கொண்டால், இவை கோரளைப் பற்று தெற்கு கிரான் பிரதேச செயலகத்திற்கு உட்பட்ட பிரதேசங்களாக இருக்கின்றன. இந்த இடங்களில் காட்டு மரங்களை வெட்டி, அவற்றைக் கடத்தி வியாபாரம் செய்கின்ற ஒரு செயற்பாடு இடம்பெறுகின்றது. அங்கு பொலிஸார் இருக்கின்றார்கள்; வன பாதுகாப்பு அதிகாரிகள் இருக்கிறார்கள்; இவற்றைக் கண்காணிக்கின்ற GSMBக்குப் பொறுப்பாக இருக்கின்ற அதிகாரிகள் இருக்கிறார்கள். ஆனால், இவர்கள் அனைவரும் இருக்கத் தக்கதாக இந்த மரக் கடத்தல், மண் கடத்தல் போன்ற சட்டவிரோதமான செயற்பாடுகள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன.

சில வேளைகளில் இந்த மண் அகழ்வதற்கான அனுமதிப்பத்திரம் ஒருவருக்குப் பல பத்திரங்கள் பிறரது பெயர்களில் தந்திரோபாயமான அடிப்படையில் வழங்கப்படுகின்ற ஒரு துர்ப்பாக்கியமான நிலைமைகூட காணப்படுகின்றது. சுற்றாடலைப் பாதுகாப்பது பற்றி நாங்கள் பேசிக்கொண்டிருக்கின்றபோது, எமது நிலத்தை அகழ்ந்து வெள்ளப்பெருக்கை ஏற்படுத்தக்கூடிய விதத்தில் அமைந்துள்ள இவர்களுடைய இந்தச் செயற்பாடுகள் நாளாந்தம் அதிகரித்துக்கொண்டே செல்கின்றன. எனவே, குறித்த விடயத்திற்குப் பொறுப்பாக இருக்கின்ற சுற்றாடல் அமைச்சும் அதன்கீழ் பணியாற்றுகின்ற அதிகாரிகளும் தங்களுடைய செயற்பாடுகளை முடுக்கிவிட வேண்டிய தேவைப்பாடு இருக்கின்றது. இல்லாதுவிட்டால் எமது நிலச் சுற்றாடல், நீர்ச் சுற்றாடல் மற்றும் வளிமண்டலச் சுற்றாடல் என்கின்ற பல்வேறு சுற்றாடல்களும் பாதிக்கப்படக்கூடிய ஒரு நிலைமையே ஏற்படும்.

மேலும், பொலித்தீன் பாவனை பற்றி அமைச்சர் அவர்கள் அடிக்கடி கூறிக்கொண்டிருக்கின்றார். உண்மையில் பொலித்தீன் பாவனையைத் தடை செய்ய வேண்டியது அவசியமான ஒன்றாக இருந்தாலும், அதற்குப் பதிலீடாக எவற்றைப் பாவிக்கப்போகின்றோம் என்ற விடயமும் முக்கியமானதாகும். அதாவது, ஒன்றைத் தடுக்கின்றபோது சமகாலத்தில் அதற்குப் பதிலாக எதைப் பாவிக்க வேண்டும் என்கின்ற முன்னெடுப்புகளும் அதேவேகத்தில் கொண்டுசெல்லப்பட வேண்டும். நாங்கள் கடதாசிமூலம் மாற்றீட்டுப் பொருளை உற்பத்தி செய்ய இருக்கின்றோம் என்றால், சமகாலத்தில் அந்த உற்பத்தி நடந்தால்தான் பொலித்தீன் பாவனையைக் கட்டுப்படுத்தக் கூடியதாக இருக்கும்.

"வெள்ளம் வருவதற்கு முன்பு அணைகட்ட வேண்டும்" என்று கூறினாலும்கூட, எமது நாட்டில் அநேகமாக வெள்ளம் வந்ததன் பின்னர்தான் வெள்ளம் தொடர்பான விமர்சனங்கள் முன்வைக்கப்படுகின்ற போக்குக் காணப்படுகின்றது. இயற்கையாகக் காணப்படுகின்ற நீர் வடிந்து செல்லக்கூடிய வாய்க்கால்களை - கால்வாய்களை அடைத்துவிடுதல், முறையற்ற விதத்தில் வீதிகளை அமைத்தல், வடிகான்களை அமைக்காமை, திட்டமிடப் படாத குடியேற்றம் என்பவற்றின்மூலமாகத்தான் இவ்வாறான அனர்த்தங்கள் ஏற்படுவதற்கு அதிக வாய்ப்புகள் இருக்கின்றன என்று கூறப்படுகின்றது. எனவே, இன்று அமைச்சர்களும் அதிகாரிகளும் இந்த விடயத்தில் வினைத்திறனுடன் செயற்பட்டு, இவ்வாறான கெடுதியான செயற்பாடுகளைக் கட்டுப்படுத்துவதற்கு உடனடியாக நடவடிக்கை எடுக்கவேண்டும்.

சிலவேளைகளில் இச்சபையில் நடைபெறுகின்ற காரசாரமான விவாதமானது, எப்போதும் விஞ்ஞான ரீதியாக அமைந்தால்தான் அதன் பொருளை எல்லோரும் அறியக்கூடியதாக இருக்கும். பகைமை உணர்வோடு விவாதம் நடைபெறுகின்றபோது வாதப் பிரதிவாதங்கள் அதிகரித்து, கூச்சல் குழப்பங்கள் அதிகரித்து மக்கள்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

විවාදත්තින් කරුප්පොරුළෙ විළංකික්කොන්ළ මුදියාත නිලෙමෙ ඒර්පටුකින්රදු. ඉන්ත අදිප්පටෙයිල් පාර්ක්කින්රපෝදු, සුර්රාදල් පර්රිය අක්කරෙ, සුර්රාදල් පර්රිය කවනම්, සුර්රාදල් පර්රිය පාදුකාප්පු, සුර්රාදලෙප් පාදුකාප්පදර්කාක එදුක්කප්පදවේණ්දිය නදවදික්කෙ එන්පන මුක්කිය විදයංකළාක ඉරුක්කින්රන.

නිලත්තදි නීර් එන්පදු මික මුක්කියමානදු. අනේකමාක වෙළ්ළ නිලෙමෙයුළ්ළ කාලංකළිල් නිලත්තදි නීර් තේක්කප්පදාමලේයේ වෙළ්ළමාකක් කදලෙච් චෙන්රදෙවදාල්, නිලත්තදි නීර් කුරෙවදෙන්දු කුදි නීරුක්කුත් තට්ටුප්පාදු ඒර්පදක්කූදිය නිලෙමෙ ඒර්පටුකින්රදු. එනවේ, වෙළ්ළ නීරෙ නිලත්තදි නීරාකප් පාවික්කක්කූදිය විතත්තිල් කුළංකළෙ අමෙත්තුත් තේක්කිවෙක්ක වේණ්ටුම්. අන්තක් කාලත්තිල් ඉරුන්ත මන්නර්කළ් ඉන්ත විදයත්තිල් සිරප්පාන සේවෙකළෙච් චෙය්තිරුක්කින්රාර්කළ්. අතාවදු, කුළංකළෙ අමෙත්තු අවර්රින්මූලම් වෙළ්ළනීරෙත් තේක්කි වෙත්තිරුක් කින්රාර්කළ්. අවර්කළුදෙය පයිර්ච්චෙය්කෙක්කාන නීර් මුකාමෙත්තුවමුම් සරියාන මුරෙයිල් අමෙන්තිරුන්තදු. එනවේ, නීර් මුකාමෙත්තුවත්තෙ, නිල මුකාමෙත්තුවත්තෙ, මොත්තත්තිල් සුර්රාදල් මුකාමෙත්තුවත්තෙච් සිරප්පාකච් චෙය්වතන්මූලමාකවේ වෙළ්ළප්පෙරුක්කු, වරට්සි පෝන්ර අනර්ත්තංකළිලිරුන්දු එමදු මක්කළෙප් පාදුකාක්ක මුදියුමෙන්රු කූරි, එනදු උරෙයෙය නිරෙවු චෙය්කින්රේන්. නන්රි!

[අ.භා. 3.30]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික පාරිසරික පනත යටතේ පරිසරයට සම්බන්ධ නියමයන් කීපයක් අනුමත කර ගන්න මෙම ගරු සභාවට ඉදිරිපත් කර ඇති මේ මොහොතේදී, පවත්නා අයහපත් කාලගුණික තත්ත්වය නිසා රටේ මතු වී තිබෙන අර්බුදකාරී තත්ත්වය පිළිබඳවත් වචන කීපයක් ප්‍රකාශ කරන්න මා බලාපොරොත්තු වනවා.

ඇත්තටම පසුගිය වසරේත් කාලගුණික තත්ත්වයේ මේ විධියටම ඇති වූ අයහපත් බව නිසා අප නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක ජනතාව ප්‍රබල විපත් රාශියකට මුහුණ දුන්නා. ඒ විපත සම්පූර්ණයෙන්ම හානි පූරණය කරලා, වන්දි ගෙවා අවසන් වෙන්නත් කලින් නැවත වතාවක් මේ රටේ ජල ගැලීම් තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. පසුගිය වසරේ ආපදා තත්ත්වය ඇති වුණු අවස්ථාවේදී හානි සිදු වුණු ස්ථානවලට හා පුද්ගලයන්ට වන්දි ගෙවන්න ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු වජිර අබේවර්ධන ඇමතිතුමාත් මැදිහත් වෙලා කටයුතු කළා. දැන් එතුමා මේ ස්ථානයේ ඉන්නවා. ඒ සම්බන්ධව අපි එතුමාට ස්තුතිවන්ත වනවා. නමුත් ගරු ඇමතිතුමනි, අදටත් වන්දි ප්‍රමාණය සම්පූර්ණයෙන්ම නොලැබුණු සහ කිසිම වන්දියක් නොලැබුණු විශාල පිරිසක් ගාල්ල දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක රාශියක ජීවත් වන බව අපි දන්නවා. පසුගිය වසර තුන ඇතුළත මේ රටේ සිදුවුණු සාමසර කන්ද නාය යාම, මීතොටමුල්ල කුණු කන්ද නාය යාම හා ගංවතුර තර්ජනය වැනි ස්වභාවික විපත් රාශියක් නිසා විපතට පත් වුණු ජනතාවගෙන් බහුතරයකට සාධාරණයක් ඉෂ්ට වුණේ නැහැ කියන මතයේ බහුතරයක් ජනතාව සිටිනවා. ඒ නිසා ආපදා කළමනාකරණය පැත්තෙන් පසුගිය වසර කීපය තුළ මේ රටේ තිබුණු යන්ත්‍රණය සහ වන්දි ගෙවීම පිළිබඳ කාරණාවලදී මේ රටේ ආණ්ඩුව කටයුතු කළ ආකාරය පිළිබඳව අපට සාධනීය විධියට සතුටු වෙන්න බැහැ කියා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Home Affairs)

I propose that the Hon. Velu Kumar do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය වසරවල මෙවැනි ස්වභාවික ආපදා ඇති වුණු අවස්ථාවලදී හා වර්තමානයේ ඇති වෙලා තිබෙන ආපදා අවස්ථාවේදී එම ආපදා තත්ත්වයන් කළමනාකරණය කිරීමේ පැත්ත බලනකොට, පසුගිය වසරවලට වඩා වර්තමානයේ පෙර සූදානමක් තිබූ බවක් පෙනෙනවා. ඒ පිළිබඳව අපි සතුටට පත් වනවා. හැබැයි, වර්තමානයේ රටේ පවතින ආපදා තත්ත්වය නිසා විපතට පත් වුණු ජනතාවට, දුකට පත් වුණු ජනතාවට වන්දි ලබා දීමේ කඩිනම් හා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන කාරණයත් අපි බොහොම පැහැදිලිව මතක් කරනවා.

මේ වැසි තත්ත්වයත් එක්ක අපගේ මතකයට එන කාරණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වාගේම අධික වර්ෂාපතනයක් 2010 වර්ෂයේ මේ රටේ ඇති වුණා. එම වර්ෂාව නිසා කොළඹ නගරය සම්පූර්ණයෙන් යට වෙලා මේ පාර්ලිමේන්තු පරිශ්‍රය පවා සම්පූර්ණයෙන්ම වතුරෙන් යට වුණා. එවකට පැවැති අපේ රජය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් සහ ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා හැටියට කටයුතු කළ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ මෙහෙයවීමෙන් කොළඹ අවට ප්‍රදේශවල ජල ගැලීම් පාලනය කරන්න සුවිශේෂී වැඩසටහනක් ක්‍රියාත්මක කළා. ඒ වැඩසටහනේ ප්‍රතිඵලයක් හැටියට රාජගිරිය, බත්තරමුල්ල, තලවතුගොඩ ඇතුළු පාර්ලිමේන්තුව අවට ප්‍රදේශවල ජල බස්නා හා ජලාපවහන පද්ධති දියුණු කළා විතරක් නොවෙයි, ජලය එක්රැස් කිරීමේ කුඩා වැව් හදලා, මෙවැනි වැස්සකට මේ ප්‍රදේශය ජලයෙන් යට වීමේ අවදානම අඩු කළා.

එම වැඩසටහනෙන් පසුව, 2011 වර්ෂයෙන් පස්සේ මෙවැනි වර්ෂා කීපයක්ම මේ පළාතේ ඇති වුණත්, ඇත්තටම පාර්ලිමේන්තුව ඇතුළු අවශේෂ ප්‍රදේශවල ජල ගැලීම් තත්ත්වයක් නිර්මාණය වුණේ නැහැ. එදා එම කටයුත්තට මූලිකත්වය ගෙන කටයුතු කළේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමායි. ඒ සම්බන්ධව අපි එතුමාට ස්තුතිවන්ත වනවා. ඇත්තටම ඒ අවස්ථාවේදී එතුමා මේ කරුණ සුවිශේෂී කරුණක් හැටියට දැකලා, ජල ගැලීම් නිසා කොළඹ නගරයට තිබුණු තර්ජනය සෑහෙන මට්ටමකට අවම කර, පාලනය කරලා දුන්නා. ආරක්ෂක ලේකම්තුමා හැටියටත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ නිදහසට නව ජීවයක් ලබා දෙන්න, නිදහසට මේ රට යොමු කරන්න කටයුතු කළ බව අපි මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. එතුමා මේ රටට නිදහස ලබා දෙන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් එක්ක කටයුතු කළා වාගේම, නාගරික සංවර්ධනය පැත්තෙනුත් විශාල වැඩ කොටසක් කළා. එතුමා කොළඹ නගරය සංවර්ධනය කරලා, පාරිසරික පැත්තෙන් ආරක්ෂා කරලා, කොළඹ නගරය දකුණු ආසියාවේ තිබෙන ඉතාම දර්ශනීය නගරයක් බවට පත් කළා වාගේම, ගාල්ල ඇතුළු නගර සංවර්ධනය කරලා, ඒවා පාරිසරික පැත්තෙන් ආරක්ෂා කරලා, ඉතාම ඉහළ මට්ටමේ නගර බවට සංවර්ධනය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් එතුමා පිළිබඳව කියන්නේ මොනවාද කියා අපි දැක්කා. ඊයේ මේ පාර්ලිමේන්තුවේ විවාදයක් තිබුණා. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට අදාළව පැවැති එම විවාදයේදී මලික් සමරවික්‍රම ඇමතිතුමා එතුමාගේ සම්පූර්ණ කථාවම පාවිච්චි කළේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ දේශපාලනය ගැන කරුණු කියන්නයි. දේශපාලනයට ප්‍රවිෂ්ට වෙලාත් නැති හිටපු ආරක්ෂක ලේකම්තුමාට එතුමා ප්‍රබල ප්‍රහාරයක් එල්ල කළා. ඒ වාගේම පසුගිය දින කීපය පුරාම රාජ්‍ය මාධ්‍ය සියල්ල භාවිත කරමින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර ඇමතිතුමා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ප්‍රබල ප්‍රහාර කීපයක් දියත් කරනවාත් අපි දැක්කා. දේශපාලනයට ඇවිල්ලාත් නැති, දේශපාලනයට එනවා යැයි කියාවත් නැති, හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තමුන්ගේ ශක්ති ප්‍රමාණයෙන් මේ රටේ නිදහස වෙනුවෙන් විශාල කැප කිරීමක් කළ, මේ රටේ නාගරික සංවර්ධනය වෙනුවෙන් විශාල දායකත්වයක් ලබා දුන් කෙනෙක්. එවැනි කෙනෙකුට රාජ්‍ය මාධ්‍ය භාවිත කරමින් ආණ්ඩුවේ ඇමතිවරයකු මෙලෙස ප්‍රහාර එල්ල කිරීම සාධාරණ නැහැ, සාධනීය නැහැ කියා අපි විශ්වාස කරනවා.

එතුමාට විරුද්ධව සාධනීය චෝදනා නැහැ. නමුත් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර ඇමතිතුමා ඊයේ සඳහන් කර තිබෙනවා අපි දැක්කා, "එතුමා උසාවියට ගිහිල්ලා පූර්වාපේක්ෂී ඇප -anticipatory bail- ලබා ගත්තා. ඒක වරදක්" කියලා. පසු ගිය වසර තුන හමාරක කාලය තුළ යහ පාලන ආණ්ඩුව බලයට ඇවිල්ලා, පාර්ලිමේන්තුවේ ඉන්න සාධනීය චෝදනා නැති මන්ත්‍රීවරු 16 දෙනෙකු රිමාන්ඩ් බන්ධනාගාරගත කරලා, සිරගත කර තිබුණා. එවැනි තත්ත්වයක් යටතේ මේ රටේ විනිශ්චයකාරවරු බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා, "අධිකරණමය මනසකින් අපිට මේ මන්ත්‍රීවරු රිමාන්ඩ් බන්ධනාගාරවල තියන්න බැහැ. ඒ නිසා අපි ඇප ලබා දෙනවා." කියලා. එහෙම කියලා ඔවුන් නිදහස් කළා. නමුත් ඔවුන්ට විරුද්ධව තිබුණු එකම නඩුවක්වත් ඔප්පු කරන්න බැරි වුණා. ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්තුමා මේ රටේ පුරවැසියෙකු හැටියට වාගේම එතුමාට තිබෙන අයිතියක් හැටියට උසාවියට ගිහිල්ලා තමුන්ට පූර්වාපේක්ෂී ඇප ලබාගෙන තිබෙනවා. ඒක කාටවත් විවේචනය කරන්න බැහැ. මේ රටේ අධිකරණ පද්ධතිය පිළිබඳව තවමත් අපිට විශ්වාසයක් තිබෙනවා. හැබැයි, ආණ්ඩුවේ ක්‍රියා කලාපයන් පිළිබඳව අපිට විශ්වාසයක් නැහැ. ඒ නිසා එතුමා ප්‍රකාශ කරපු කාරණය බොහොම පැහැදිලිව මේ රටේ අධිකරණ පද්ධතිය තුළ පිළිගන්න පුළුවන් වැදගත් කාරණයක්. ඒ නිසා මේ රටේ නඩු අහන විනිශ්චයකාරවරු එතුමාට සාධාරණය ඉෂ්ට කරන්න කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. අපි බොහොම පැහැදිලිව මේ කාරණයත් කියන්න කැමතියි. එතුමා තවම දේශපාලනයට ප්‍රවිශ්ට වෙලාත් නැහැ. එතුමාව දේශපාලකයෙකුගේ තත්ත්වයට පත් කරලා, අද මේ කරන පහර දීම් අපි හෙළා දකිනවා කියන කාරණයත් මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසරය ආරක්ෂා කරන්න ඕනෑ, වනාන්තර ආරක්ෂා කරන්න ඕනෑ කියමින් පසු ගිය කාල වකවානුව පුරාවටම ආණ්ඩුවේ නායකයින් මේ රටේ පස් කැපීම, වැලි ප්‍රවාහනය කිරීම ඇතුළු කරුණු කාරණාවලට විරුද්ධව එළිපිට කථා කරමින් විශාල වශයෙන් ප්‍රචාර දියත් කර තිබුණු ආකාරය අපි දැක්කා. හැබැයි, එක පැත්තකින් යම් යම් සාධනීය කාරණාවලට අපි එකඟ වුණා. වැලි ටිකක්, පස් ටිකක්, ගල් ටිකක් ප්‍රවාහනය කරලා, මේ රටේ සංවර්ධන කාර්යයන්ට අතහිත දීපු - මේ රටේ ඉදිරි ගමනට දායකත්වයක් ලබා දීපු- අවිධිමත් ආර්ථිකයක ජීවත් වන අතිවිශාල පිරිසක් මේ රටේ හිටියා. ඔවුන්ගේ ජීවිකාව කෙරුණේ කුඩා අත් ට්‍රැක්ටරයකින්, ට්‍රැක්ටරයකින් එහෙම නැත්නම් කැන්ටර් රථයකින් වැලි ටිකක්, ගල් ටිකක්, පස් ටිකක් ප්‍රවාහනය කරලායි. අද ඇතිවෙලා තිබෙන තත්ත්වයත් එක්ක පරිසර අමාත්‍යාංශය පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳව නියාමනයන් ඉදිරිපත් කරනවාය කියන කාරණය හරහා තමුන්ගේ ගෙවත්තේ, ගෙපලේ තිබෙන පස් ටිකවත් එළියට ඇද ගන්න බැරි තරමට මේ රටේ නීතිය දැඩි කරලා තිබෙනවා.

පරිසරය ආරක්ෂා කරන්න නීති තිබෙන්නට අවශ්‍යයි. හැබැයි, අනික් පැත්තෙන් අපි දැනගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි, මේ තත්ත්වයන් යටතේ සෑම පුද්ගලයෙකුම විශාල වශයෙන් අපහසුතාවන්ට පත් වන අවස්ථා තිබෙනවාය කියන කාරණය. තමුන්ගේ ගෙවත්තේ තිබෙන පස් ටික ඉවත් කර ගන්න විධියක් නැහැ. තමුන්ගේ ගෙදර හදන ගෙපළට පස් ටිකක් දමා ගන්න බලපත්‍ර ලබා ගන්න විශාල වෙහෙසක් දරන්න සිදුවෙලා තිබෙනවා. පස් ට්‍රැක්ටරයක් ප්‍රවාහනය කරනකොට සමහර වෙලාවට ට්‍රැක්ටරය පොලීසියෙන් අල්ලාගෙන ගිහිල්ලා, රුපියල් පනස් දහසක් දඩ ගහනවා. එවැනි තත්ත්වයන් අපි දැකලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. වැලි ටිකක්, පස් ටිකක් ප්‍රවාහනය කරන්න නිදහසක් නැති වුණාම ට්‍රැක්ටර් හිමියන්, කැන්ටර් හිමියන් වාගේම කුඩා ලොරි රථ හිමියන් විශාල වශයෙන් අපහසුතාවට පත් වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ඒ විශාල අපහසුතාව හරහා මොකක්ද වෙන්නේ? ඔවුන්ට තමන්ගේ ට්‍රැක්ටරය, වාහනය විකුණන්න වනවා; තමුන්ගේ ව්‍යාපාර නතර වනවා; සංවර්ධන කාර්යයන් සම්පූර්ණයෙන් අඩාල වනවා. මේක විෂම චක්‍රයක් හැටියට සංවර්ධන ගමනට ප්‍රබල බලපෑමක් ඇති කරනවා. ඒ නිසා තමයි කවුරු මොනවා කිව්වත් පසු ගිය කාලය තුළ ගම්මානවල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල ගැටලුවක් මතු වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි මේ රටේ ආර්ථික වර්ධන වේගය අඩු වුණේ. ඒ නිසා තමයි නිදහසින් පස්සේ ආර්ථික වර්ධන වේගය දෙවැනි වතාවට අඩුම අගයක් බවට පත් වුණේ.

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

වාර්ෂික ආර්ථික වර්ධන වේගය සියයට 3.1 දක්වා අඩු වුණේ මෙන්න මේ කාර්යයන් හරහා -ආණ්ඩුවේ නියාමනයන් හරහා- මේ රටේ ඉදිරි සංවර්ධන ගමන වළක්වන්නට නියමින් හෝ අනියමින් කටයුතු කරපු නිසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසරය ආරක්ෂා කරන්න අවශ්‍යයි, ගස් කැපීම නවත්වන්න අවශ්‍යයි, අනවසර වැලි ගොඩ දැමීම්, පස් කැපීම්, ගල් කැඩීම් නවත්වන්නට අවශ්‍යයි කියලා අපි ආණ්ඩුවට යෝජනා කරනවා. හැබැයි, මේ නියාමනය හරහා මේ රටේ ආර්ථිකයට සිදු වන හානිය පිළිබඳව වාගේම මේ රටේ කුඩා පරිමාණ ව්‍යාපාරිකයාට, මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාට වාගේම කුඩා කොන්ත්‍රාත්කරුවාට සිදු වන හානිය පිළිබඳවත් දැනුවත් කරලා කටයුතු කරන්න අවශ්‍යයි කියලා අපි යෝජනා කරනවා. වර්තමානය ගත්තොත් ලෝක මට්ටමින් ඇති වන "එල් නිනෝ" තත්ත්වය එක්ක ගෝලීය උෂ්ණත්වය ඉහළ යනවා. එහි බලපෑම ලංකාවට දැනෙනවා. ඒ හරහා දීර්ඝ නියං කාල වාගේම විශාල වර්ෂාපතනයන් වරින් වර ඇති වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඒ නිසා මේ තත්ත්වය කළමනාකරණය කරන්න දීර්ඝ කාලීන දැක්මක් ඇතිව අපි ක්‍රියා කළ යුතුයි. ආපදා කළමනාකරණයට වඩා, ආපදාවට පෙර සූදානම් වීමටත් වඩා මේ තත්ත්වය වළක්වා ගන්නේ කෙසේද කියන කාරණය පිළිබඳව දීර්ඝ ලෙස විශ්ලේෂණය කරලා, අධ්‍යයනය කරලා, විසඳුම් සොයන්න අවශ්‍යයි කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. ඊළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.40]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික පාරිසරික පනත යටතේ නියමයන් හයක් සහ නියෝගයක් පිළිබඳව මේ ගරු සභාවේ සාකච්ඡා කරන මේ මොහොතේදී මටත් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්ත වශයෙන්ම ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. එතුමා ගෙනහැර දැක් වූ කාරණා කිහිපයක් පිළිබඳව අපත් එකඟතාවය ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. මොකද, මහනුවර දිස්ත්‍රික්කයේ අපේ ආසන ගත්තාම ඇත්ත වශයෙන්ම පස් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් විශාල පිරිසක් පොලිසියෙන් දඩ කාලා, පොලිසියෙන් ප්‍රශ්න විසඳා ගත් අවස්ථා තිබෙන බව මූලාසනය හොඳවන ගරු මන්ත්‍රීතුමාත් අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට සාක්ෂි දරනවා ඇති. විශේෂයෙන් නාය යන ප්‍රදේශයක් හැටියට අපේ ප්‍රදේශයේ පාරකට හදිසියේ පස් ටිකක් වැටුණාම ට්‍රක් රථයකින් ඒ පස් ටික ඉවත් කිරීමේ අවස්ථාව තිබුණත්, මේ නීති සමඟ ගැළපීමේදී අපහසු තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. තමන්ගේ ඉඩමෙන් කපපු පස් ටික අල්ලපු ඉඩමට දැමීමේදී පවතින ගැටලුව අපිට පෙනිලා තිබෙනවා. ඒ වගේම වැලි ප්‍රවාහනය කිරීමේ නීති සමස්ත රටටම ගැළපෙන පරිදි යොදනවාට වඩා එක් එක් පරිසර කලාපයන්ට බලපාන පරිදි මේ කටයුත්ත සිද්ධ කරනවා නම් හොඳයි. අනවසර ලෙස වැලි ගොඩදමන තැනින්ම අල්ලලා නීත්‍යානුකූලව කටයුතු කරනවා නම් හොඳයි කියන එකයි මා හිතන්නේ. ගොඩ දමන වැලි ටික ඒ කොට්ඨාසයේම ප්‍රවාහනය කිරීමේදී මීට වඩා ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම් හොඳයි කියන යෝජනාවත් අපි කරනවා.

අපේ කොට්ඨාසයේ තිබෙන බරපතල ප්‍රශ්නයක් තමයි, ෆයිනස් වගාව නිසා සිදුව ඇති පරිසර හානිය; ජල හිඟය. මේ ගස් වවා තිබෙන්නේ දීර්ඝ කාලයකට ප්‍රථම, එනම් 1982 වර්ෂයේදි වාගේයි. ඒ ගස්වල ආයුෂ ප්‍රමාණය දැනට අවසන් වෙලා තිබෙන්නේ. මිනිස් සමාජයට සහ සත්ව සමාජයට හිතකර වූ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කළයුතු වෙනවා. ෆයිනස් ගස්වල කිසිම සත්වයෙක් කූඩුවක් හදන්නේ නැහැ. සත්වයෙකුට ආහාරයක් නිෂ්පාදනය වෙන්නේ නැහැ. ඒ ගසක් යට සතෙක් ජීවත් වෙන්නේ නැහැ; මනුෂ්‍යයෙකුට ජීවත් වෙන්නටත් බැහැ. අපේ කොට්ඨාසයේ විතරක් රජය සතු ඉඩම් අක්කර දහඅට දහසක පමණ ෆයිනස් වගා කර තිබෙනවා. ෆයිනස් වගාව ඉවත් කර, මනුෂ්‍යයන්ට හිතකර, සතුන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මේ ඉඩම් ප්‍රමාණය යොදා ගන්නවා නම් හොඳයි කියන යෝජනාව අපි ගෙනෙනවා. මේ පිළිබඳව අපි කිහිප විටකදීම දැනුම් දීම් කළත් ඒ පිළිබඳව මේ වනතුරු නිශ්චිත ක්‍රියාමාර්ගයක් නොගෙන තිබීම නිසා මේ කාරණය නැවතත් සඳහන් කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. අපි පත් කළ ජනාධිපතිතුමාගේ බලය පවතින මේ කාලය තුළ අපි ගෙනෙන යෝජනාවන් ක්‍රියාත්මක කිරීම සඳහා එතුමාට බලය තිබෙනවා. මැයි දින රැස්වීමේදී එතුමා කියා තිබෙනවා මම දැක්කා, "මම 2020ත් බලය අතහරින්නේ නැහැ, නැවත බලයට ඒම සඳහා කටයුතු සිද්ධ කරනවා." කියා. මේ එතුමා බලයේ ඉන්න අවස්ථාව. මේ රටේ පරිසර ප්‍රශ්න තිබෙන ආසන 165යි තිබෙන්නේ. මේ ආසන 165ට වෙනම ෆයිල් 165ක් දාලා එක් එක් කොට්ඨාසයට තිබෙන පරිසර ප්‍රශ්න පිළිබඳව වෙන් වෙන් වශයෙන් පරීක්ෂණයක් කර, ඒ පිළිබඳව පිළියම් යොදනවා නම් ඔබතුමාට ඒ සඳහා තවත් කාලය තිබෙනවා. එම නිසා ඒ කටයුත්ත සිද්ධ කරන හැටියට අපි ජනාධිපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ගරු ජනාධිපතිතුමා කළ ඒ කථාවේ හැටියට එතුමාට ජනාධිපති පුටුවේ වාඩිවෙලා කළ යුතු කාර්යයන් කිරීමට බලය තිබෙන මේ මොහොතේදී එය නොකළොත් 2020 මැතිවරණයට ගිහින් හදිසියෙන් හෝ එතුමාට නැවත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්නට සිද්ධ වුණොත එදාටද මේවා කරන්නේ කියන ප්‍රශ්නය අපට ජනතාව වෙනුවෙන් අහන්නට සිද්ධ වෙනවා. මොකද, ජනතාව එහෙම ප්‍රශ්නයක් අපට යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොරගහකන්ද ජලවිදුලි බලාගාර ව්‍යාපෘතියට පසු මේ රටේ කරන විශාලතම ව්‍යාපෘතියක් හැටියට උලපනේ විදුලි බලාගාරය ආරම්භ කිරීම සහ ඒ ආශ්‍රිත ජල ව්‍යාපෘතිය හඳුන්වන්න පුළුවන්. ඒ තමයි මහවැලි ගඟ හරස්කොට කිලෝමීටර තුනක් පොළොව යටින් යන උමං මාර්ගය තුළින් විදුලි බලාගාරයක් ආරම්භ කිරීම. එම විදුලි ව්‍යාපෘතිය ආරම්භ කිරීම ගාමිණී දිසානායක මැතිතුමා 1982දී එතුමාගේ කඩිනම් මහවැලි ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘතියක් ලෙස සැලසුම් කළා. පසුගිය ආණ්ඩුවත්, මේ ආණ්ඩුවත් එක් එක් යෝජනා ගෙනැල්ලා කඩිනමින් මෙය ආරම්භ කරලා, රටේ අවශ්‍යතාව සඳහා විවෘත කිරීමට උත්සාහයක් දැරුවත් එය ඉටු වුණේ නැහැ. මොකද,

අවුරුදු තුනක කාලයක් "ගඩයා" කියන මාළුවා ආරක්ෂා කිරීම සඳහා මිලියන තිහක් වැය කර තිබෙනවා. මේ මාළුවා සංරක්ෂණය කිරීම සඳහා රුපියල් මිලියන තිහක් යොදවා තිබෙනවා. නමුත් මම හිතන්නේ එහෙම මාළුවෙක් තවම අහුවෙලා ඇත්තේ නැහැ. මේ සංරක්ෂණවලින් ප්‍රයෝජනයක් ඇත්තෙත් නැහැ. මිලියන තිහේ ප්‍රයෝජනයක් ඇත්තෙත් නැහැ. "ගඩයා" කියන මාළුවා මහවැලි ගඟ පටන් ගත් තැන ඉඳලා අවසාන වන තැන දක්වා ඉන්නවා. උලපනේ කොටියාසය ඩයිනමයිට් යොදමින් විවිධ ආකාරයෙන් මත්ස්‍යයන් අල්ලන තැනක්. ඒ නිසා මේ මාළුවා ජීවත් වෙනවාද නැද්ද කියන එක අපි දන්නේ නැහැ. ඒත් පරිසර ප්‍රශ්නයක් යොදා ගනිමින් විදුලි බලාගාරයේ කටයුතු නතර වෙලා තිබෙනවා. මේ රටේ පරිසරය ආරක්ෂා විය යුතුයි. අපි ඒකට එකඟතාව ප්‍රකාශ කරනවා. හැබැයි, පරිසර ප්‍රශ්නයක් මුවාකරගෙන විදුලි බලාගාරයේ කටයුතු නතර වෙලා තිබෙනවා. මොරගහකන්දට පස්සේ යෝජනා කරන ලද, දැනට ආරම්භ කරලා මූලික වැඩකටයුතු කරගෙන යන උලපනේ මොරගොල්ල විදුලි බලාගාරය ආරම්භ කිරීම සඳහා මේ පරිසර ප්‍රශ්න නිරාකරණය කරගත යුතුයි. ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින මේ ව්‍යාපෘතීන් ජනතාවගේ හිතසුව පිණිස වැඩ කිරීම සඳහා ඉක්මනින් ක්‍රියාත්මක කරනවා නම් හොඳයි කියන යෝජනාව මම ගෙනෙනවා.

අද උදේ ගරු මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ මෙහෙයවන ව්‍යවසායක පාරාදීසයක් මේ රටේ බිහි කිරීම සඳහා ගන්නා උත්සාහය වැදගත් වනවා. එතුමාගේ ඒ දීර්ඝ කාලීන සැලැස්ම අනුව ඒ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරන ඒ ව්‍යාපෘතීන් පිළිබඳව අපව දැනුවත් කළා. මම හිතන්නේ එතුමා මේ ව්‍යාපෘතීන් කරන්නේ එතුමාගේ දර්ශනයට අනුව, එතුමාගේ හදවතට එකඟවයි. අපි විශ්වාස කරනවා, එතුමා දේශපාලන ජීවිතයේ ලැබුවා වූ හසළ අත්දැකීම් තුළ තමන්ගේ දර්ශනය අනුව මේ රටේ අහිංසක ජනතාවගේ, ගොවි ජනතාවගේ සිතුම් පැතුම් ඉෂ්ට කිරීම සඳහා කටයුතු කරයි කියා. එතුමා ගන්නා මේ උත්සාහය මල්ඵල ගැන්වුණොත් මම හිතන්නේ මේ රටේ විශාල දියුණුවක් ඇති වෙයි. ඒ තුළින් මේ රටේ ජනතාවට ඉතා දියුණු මාර්ගයකට අවතීර්ණය වීමේ හැකියාව තිබෙනවා. එතුමා ඒ ගන්නා උත්සාහය පිළිබඳව පාර්ලිමේන්තු පසුපෙළ මන්ත්‍රීවරු වන අපවත් දැනුවත් කළා. අපි සියලු දෙනා කැඳවා මේ කටයුතු සිදු කිරීමට උත්සාහ දැරීම, ඒ වාගේම අපේ අදහස් ලබා ගැනීම සහ අපටත් අවස්ථාව ලබාදීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙමින් අතිගරු ජනාධිපතිතුමා, ඒ වාගේම අගමැතිතුමා ඇතුළු ගරු අමාත්‍ය මණ්ඩලය සහ සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ උත්සාහය තුළින් මේ පාරිසරික ප්‍රශ්න විසඳමින් මේ රටේ සමස්ත ජනතාවගේ හිත සුව පිණිස මේ කටයුතු සිදු කිරීමට අවස්ථාව ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මට කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා. ස්තුතියි.

[පි.ප. 3.49]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ඩක්ලස් තේවානන්දා)
(The Hon. Douglas Devananda)

කෞරව තලෛමෙතාංකුම උරුප්පිනර් අවර්කළේ, இந்த நாட்டைப் பொறுத்தவரையில் மிக, மிக அதிகமாகக் கவனம் செலுத்தப்பட வேண்டிய விடயம் சூழல் பாதுகாப்பாகும். அதேநேரம், இந்த நாட்டில் அதிகமாகக் கவனம் செலுத்தப்படாத ஒரு விடயமாக இருப்பதும் சூழல் பாதுகாப்பு என்றே கருத வேண்டியுள்ளதால், இந்த விடயம் தொடர்பில் எனது கருத்துக்களையும் பதிவதற்கு வாய்ப்பு வழங்கியதற்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

சூழல் பாதுகாப்புத் தொடர்பில் அதிகளவிலான விளம்பரங்கள் செய்யப்பட்டு, எத்தனையோ திட்டங்கள் பற்றி இந்த நாட்டில் நிறையவே பேசப்பட்டு வருகின்றபோதிலும், உண்மையிலேயே அவற்றால் இந்த நாட்டின் சூழல் பாதுகாப்புப் பெறுகின்றதா? என்பது கேள்விக்குறியாகவே இருக்கின்றது. தொல்பொருள் மிகைகொண்ட அடர்த்தியான அனுராதபுரப் பகுதிகளை 'புல்டோசர்' இயந்திரங்கள்கொண்டு நாசப்படுத்திவிட்டு, தவறு நடந்துவிட்டதாகக் கூறிக்கொள்ளும் நீங்கள், வடக்கு, கிழக்கு மாகாணங்களில் தொல்பொருள் என்ற பெயரில் பல்வேறு இடங்களை மறைத்து, தடுத்து வைத்திருக்கிறீர்கள்! இதேபோன்று, பாதுகாக்கப்பட்ட வனப் பகுதிகளெனப் பெயரிட்டுள்ள பல வனங்களிலிருந்து பாரியளவில் மரங்கள் வெட்டப்பட்டுக் கடத்தப்படுகின்றன. இந்த நிலையில், நாட்டின் வன அடர்த்தியை அதிகரிக்கப் போவதாகக் கூறுகிறீர்கள்! வனங்கள் தொடர்ச்சியாக அழிக்கப்பட்டு வருவதால் இன்று பல மாவட்டங்களில் மக்கள் அன்றாடம் வன விலங்குகளுடன் போராடிக்கொண்டே வாழவேண்டிய நிலை ஏற்பட்டிருக்கின்றது. அதுமட்டுமல்ல, விவசாயச் செய்கைகளும் நாளாந்தம் பாரியளவில் அழிக்கப்பட்டு வருகின்றன.

சூழலைப் பாதுகாப்பதற்கு மரக் கன்றுகள் நடுவதாகக் கூறி, ஆயிரக்கணக்கில் அவை நடப்பட்டாலும், நட்ட பின்னர் அவற்றைப் பராமரிப்பதற்கு எவருமின்றி அவை கருகியும் கால்நடைகளுக்கு உணவாகியும் மறைந்துவிடுகின்றன. எமது பகுதிகளில் பாதுகாக்கப்பட்ட அடர்ந்த வனங்களிலெல்லாம் மரங்களை வெட்டி, எமது மக்களது வாழ்வாதார, குடியிருப்புப் பகுதிகளெல்லாம் வன இலாகாவுக்குச் சொந்தமானவையென எல்லைகள் இடுகின்ற பரிதாப நிலையையும் காணக்கூடியதாக உள்ளது. கடந்தகால யுத்தம் காரணமாக மிக அதிகளவில் பாதிக்கப்பட்ட முல்லைத்தீவு மாவட்ட மக்களில் பெரும்பாலானவர்கள் குடியிருக்க வீடுகளின்றி இருக்கின்ற நிலையில், தேசிய வீடமைப்பு அதிகாரசபையினால் வழங்கப்பட்டுள்ள வீடமைப்புத் திட்டத்தினை அங்கு செயற்படுத்துவதற்காக ஒட்டுசுட்டான் பிரதேச செயலகத்துக் குட்பட்ட முறிகண்டி, மாங்குளப் பகுதிகளில் ஒதுக்குப் புறமாகவிருந்த அரச காணியில் அத்திவாரமிட்டு, அதன் கட்டுமானப் பணிகளை மேற்கொள்ளவிருந்த நிலையில், வனவளத் திணைக்களத்தினர் அதனைத் தடுத்து நிறுத்தியுள்ளனர். அதுமட்டுமல்ல, அங்கே பணிகளில் ஈடுபட்டிருந்தவர்களை மிகவும் மோசமான முறையில் நடத்தியுமிருக்கின்றனர். இவ்வாறு எமது மக்களது காணிகள் உட்பட பெரும்பாலான காணிகளை வனவளத் திணைக்களத்தினர் வடக்கு, கிழக்கு மாகாணங்களிலே கையகப்படுத்தியிருக்கின்றனர்.

1983ஆம் ஆண்டு தென்பகுதியில் ஏற்பட்ட இனக் கலவரங்கள் காரணமாகப் பாதிக்கப்பட்ட தமிழ் மக்களுக்கென கிளிநொச்சி மாவட்டத்தின் பூநகரி பிரதேச செயலகத்துக் குட்பட்டதாக ஜெயபுரம் எனும் கிராமம் உருவாக்கப்பட்டது. அங்கு குடியேற்றப்பட்ட மக்களின் வாழ்வாதாரத்துக்கென தேவன்குளத்தின்கீழ் 548 ஏக்கர் வயல் நிலம் ஒதுக்கப் பட்டிருந்தது. கடந்தகால யுத்தம் காரணமாகக் கைவிடப் பட்டிருந்த மேற்படி வயல் நிலத்தில் தற்போது அங்கு குடியிருக்கின்ற சுமார் 500 குடும்பங்களைச் சேர்ந்தோர் 2010ஆம் ஆண்டிலிருந்து பயிர்ச் செய்கையில் ஈடுபடுவதற்கு முயற்சித்து வருகின்றபோதிலும் வனவளத் திணைக்களத்தினர் அதற்குத் தடையாக இருந்துவருகின்றனர். நான் இங்கு குறிப்பிடுவது ஒருசில உதாரணங்கள் மட்டுமே. இதைப் போன்று வனவளத் திணைக்களத்தின் கெடுபிடிகள், தடைகள் காரணமாக வடக்கு மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

பெரும்பாலான மக்கள் பெரிதும் பாதிக்கப்பட்ட நிலையிலேயே வாழவேண்டிய நிலை ஏற்பட்டிருக்கின்றது. பாதுகாப்புத் தரப்பினர் ஒருபுறம், வனஜீவராசிகள் திணைக்களத்தினர் இன்னொருபுறம், தொல்பொருள் திணைக்களத்தினர் மறுபுறம் மற்றும் வனவளத் திணைக்களத்தினர் ஒருபுறம், மகாவலி அபிவிருத்தி அதிகாரசபையினர் இன்னொருபுறமென அனைத்துத் தரப்பினரும் அங்குள்ள காணிகளைக் கையகப் படுத்திக்கொண்டால், எமது மக்கள் வாழ்வது எங்கே? வாழ்வாதாரங்களை ஈட்டிக்கொள்வது எங்கே? எனக் கேட்க விரும்புகின்றேன்.

வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், காடழிப்புகள், சட்டவிரோத மணல் அகழ்வுகள் மிக, மிகத் தாராளமாக நடந்தேறுகின்ற நிலையில், அவற்றைத் தடுத்து நிறுத்த வேண்டிய அதிகாரிகளே அவற்றுக்குத் துணைபோகின்றனர். இந்நிலையில், விவசாய நிலங்களில் இயற்கையாக அதிகளவில் உருவாகக்கூடிய சுண்ணக்கற்களைப் பயிர்ச் செய்கைக்காக அகற்றும்போதும் -அவற்றை அப்புறப்படுத்தும் போதும் அந்தக் கற்களை விற்று அன்றாடம் தங்களது வாழ்வாதாரங்களைத் தேடிக்கொள்வதற்கு முயற்சிக்கின்ற மக்கள் கைது செய்யப்படுகின்றனர்; ஆயிரக்கணக்கில் தண்டப் பணத்தைச் செலுத்துவதற்கும் ஆளாக்கப்படுகின்றனர்.

கிளிநொச்சி மாவட்டம் உட்பட வடக்கு மாகாணத்தின் பல்வேறு விவசாய நிலங்கள் இன்று உவர்நீர்த் தளங்களாக உருமாறி வருகின்றன. இந்த விடயம் தொடர்பில் நான் பலமுறை இந்தச் சபையிலே எடுத்துக்கூறியிருக்கின்றேன். நடவடிக்கைகள் எடுக்கப்படுமெனக் கூறப்பட்டபோதிலும், இதுவரை எவ்விதமான நடவடிக்கைகளும் எடுக்கப்பட்டதாகத் தெரியவில்லை. இத்தகைய காரணங்களால் எமது மக்கள் இப்போது குடியிருக்கின்ற பகுதிகளை விட்டும் வெளியேறி வருகின்ற நிலையில், நீங்களும் பல்வேறு சாக்குப் போக்குகளைக் கூறிக்கொண்டு காணி-நிலங்களைக் கையகப் படுத்திக்கொண்டால், எமது மக்கள் என்ன செய்வார்கள்? என்பது பற்றி நீங்கள் மனிதாபிமான ரீதியிலாவது சற்றுச் சிந்தித்துப் பார்க்கவேண்டும்.

எமது மக்களின் எந்தப் பிரச்சினையை எடுத்தாலும், உடனே இனவாதச் சாயம் பூசி, அதனைச் சுயலாப அரசியலாக்கப் பார்க்கின்றீர்கள் அல்லது அவ்வாறு ஆக்கப்படுகின்ற சுயலாப அரசியலுக்கு அச்சப்பட்டு மௌனமாகி விடுகின்றீர்கள். அன்றி, அந்தப் பிரச்சினைகளை எவ்வாறு தீர்ப்பது? என்பது பற்றி நீங்கள் சிந்திப்பதில்லை. வடக்கு, கிழக்கு மக்களை நீங்கள் அந்நியமாகவே பார்க்கின்ற போக்கைக்கொண்டதால், அந்தப் பகுதிகளைப் பிரித்துக் கையாளுகின்றீர்கள்! அவ்வாறு பிரிக்க வேண்டிய தேவை எமது மக்களுக்கு ஒருபோதும் கிடையாது என்பதையும் நான் இந்தச் சபையிலே வலியுறுத்திக் கூற விரும்புகின்றேன். நீங்களே அப்படியொரு மாயையை உருவாக்கி, நீங்களே அதற்குப் பதில் கொடுத்துக் கொண்டிருக்கின்றீர்கள்; வேறு எதையுமே நீங்கள் செய்வதாக இல்லை.

இன்று வடக்கிலே தொடர்கின்ற வரட்சிக்கு இந்தச் சூழல் அழிப்பு நடவடிக்கைகளே பெரிதும் காரணமாக இருக்கின்றன. தெற்கிலே, மலையகப் பகுதிகளிலே இயற்கை அனர்த்தங்கள் வருடந்தோறும் நிகழ்வதற்குக் காரணமும் இந்த இயற்கை அழிப்பு நடவடிக்கைகள்தான் என்பதை ஏற்றுக்கொள்ள வேண்டும். சூழல் பாதுகாப்பு என்பது கொழும்பு நகரில் குப்பை கொட்டாமல், ஏனைய பிரதான நகரங்களில் குப்பை கொட்டாமல் பார்த்துக்கொள்வது மட்டுமல்ல. முழு நாட்டினையும் பிரதிபலிக்கின்ற வகையில் அந்த ஏற்பாடுகள் வலுவுள்ளதாக மேற்கொள்ளப்படல் வேண்டும்.

காலநிலைச் சீர்கேடுகளால் தொடர்ந்தும் அனர்த்தங்கள் ஏற்படுகின்றன. அனர்த்த இடங்கள் பற்றி ஏற்கெனவே குறிப்பிடுவதும் சிலவேளை மறந்துவிடுவதும் அங்கிருந்து மக்களை வெளியேறுமாறு எச்சரிக்கை விடுவதும் மக்கள் பாதிக்கப்பட்டால் அது குறித்துத் தகவல்களைச் செய்தியாகச் சொல்வதும் மட்டும்தான் இந்த நாட்டில் தொடரும் அனர்த்த முகாமைத்துவமாக இருக்கின்றது. ஏற்கெனவே இயற்கை அனர்த்தங்கள் காரணமாகப் பாதிக்கப்பட்ட மக்களில் பெரும்பாலானவர்கள் இன்னமும் உரிய இருப்பிடங்களின்றி அவதியுறுகிறார்கள்.

வடக்கிலே பாதுகாப்புத் தரப்பினர் கையகப்படுத்தியுள்ள எமது மக்களின் காணி-நிலங்களை விடுவிப்பதற்கு நிதி கேட்கப்படுகின்றது. இங்கே அவிசாவளை, சாலாவ பகுதியில் இராணுவத்தினரின் ஆயுதக் களஞ்சியம் வெடித்துப் பாதிக்கப்பட்ட மக்களுக்கு இன்னமும் உரிய நிவாரணங்கள் வழங்கப்படவில்லை. தெற்கிலே இயற்கை அனர்த்தங்கள் ஏற்படுகின்றபோது தனியார் துறையினர் குறிப்பாக, தனியார் ஊடகங்கள் முன்வந்து செய்கின்ற பணிகளில் ஓரளவையேனும் அரச தரப்பினர் செய்வதற்கு முன்வருவதில்லை என்ற கருத்தே மக்கள் மத்தியில் இருந்துவருகின்றது. இந்த நாட்டில் பிரதான கங்கைகளின் பெருக்கெடுப்புக் காரணமாக அனர்த்தங்கள் ஏற்பட்டு வருகின்ற நிலையில்,

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, இன்னும் இரண்டு நிமிடங்கள் உள்ளன.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

இந்தக் கங்கைகளை ஆழப்படுத்துவது, தூர்வாருவது, கரைகளில் பாதுகாப்பு ஏற்பாடுகளை முன்னெடுப்பது போன்ற பல்வேறு துறைகள் சார்ந்து சிந்திக்கின்றீர்களா? என்பது பற்றித் தெரியவில்லை.

பொலித்தீன் தடை பற்றி இங்கே விவாதிக்கப்படுகின்றது. இந்த நாட்டைப் பொறுத்தவரையில், நாளாந்தம் பொலித்தீன் பைகளின் பாவனை சுமார் 20 மில்லியன் என்றும் 'லன்ச்சீட்' பாவனை சுமார் 15 மில்லியன் என்றும் தெரியவருகின்றது. இதில் 40 வீதமே மீள்சுழற்சி செய்யப்படுவதாகவும் ஏனைய 60 வீதம் கழிவுகளாக அகற்றப்படுவதாகவும் தெரிய வருகின்றது. இந்தக் கழிவுகளில் கணிசமானவை நாட்டின் நிலத்தில், நீர் நிலைகளில் தேங்கிக் கிடக்காமல் இருக்க முடியாது. இவற்றையெல்லாம் இனங்கண்டு அகற்றுவதற்கு இதுவரையில் மேற்கொண்டுள்ள முயற்சிகள் எவை? என்பது பற்றிக் கேட்க விரும்புகின்றேன்.

பொலித்தீன் தடை குறித்து நீங்கள் குறிப்பாக நகரப் பகுதிகளிலேயே அவதானத்தைச் செலுத்துவதாகத் தெரிகின்றது. நகரங்களைவிட்டு, தூரப் பகுதிகளுக்குச் சென்று பாருங்கள்! பொலித்தீன்களால் ஏற்பட்டுள்ள சூழல் பாதிப்புகளை உங்களால் கண்டுகொள்ள முடியும். கொழும்பில்கூட இரயில் பாதைகளை அண்டியதான பகுதிகளுக்கும் சேரிப் பகுதிகளுக்கும் சென்று பாருங்கள்!

அங்கு பொலித்தீன்களை, பிளாஸ்ரிக் வகைகளை எரிக்கின்ற செயற்பாடுகளைக் காண முடியும். ஏற்கெனவே ஒருமுறை பொலித்தீன் பாவனையில் மாற்றம் கொண்டுவந்தபோது, உணவகங்களில் ஒரு சாப்பாட்டின் விலை 10 ரூபாயால் அதிகரித்தது. பின்னர் அரிசி விலை, தேங்காய் விலை அதிகரித்தபோது மேலும் 10 ரூபாயால் அதிகரித்தது. பின்னர் எரிவாயு விலை அதிகரிப்பில் 10 ரூபாயும் எரிபொருள் அதிகரிப்பில் மேலும் 10 ரூபாயும் என சாப்பாட்டின் விலை அதிகரித்துள்ளது.

எனவே, பொலித்தீன் தடையுடன், உக்கக்கூடிய வகையிலான மாற்று ஏற்பாடுகளுக்கான ஊக்குவிப்புகளை நீங்கள் மேற்கொள்ள வேண்டும். காகிதம் சார்ந்த உற்பத்திகளைப் பரவலாக ஆரம்பிக்கலாம். அதற்கென வாழைச்சேனை காகித ஆலையைப் பயன்படுத்தலாம். பனைசார் உற்பத்திகளை மேலும் ஊக்குவிக்கலாம். இதன் காரணமாக எமது பகுதிகளில் தொழில்வாய்ப்புகளையும் பெருக்கிட முடியும். எனவே, இவற்றை ஊக்குவிக்க முன்வாருங்கள்! அதேபோன்று, இந்த நாட்டின் சூழலைப் பாதுகாப்பதற்குப் பரந்தளவிலான திட்டங்களை வலுவுள்ளதாக - பலமுள்ளதாக முன்னெடுக்கும் வழியைப் பாருங்கள்! எனவும் கேட்டுக் கொண்டு விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 4.01]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික පාරිසරික පනත යටතේ නියමයන් 7ක් ගැන සාකච්ඡා කරන මේ මොහොතේදී වචන කිහිපයක් කථා කරන්න ලැබීම මම අගය කොට සලකනවා. අද මේ රටම ආපදා තත්ත්වයකට පත් වෙලා තිබෙන මොහොතක මේ තත්ත්වය පිළිබඳව විශේෂ විවාදයක් කරන්න කියලා අපි ඊයේ දිනයේදී ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කළා. නමුත්, අපට එතුමා එයට අවසර දුන්නේ නැහැ. නමුත් අද රටේ තත්ත්වය පිළිබඳව විවිධ මන්ත්‍රීවරු කථා කළා. අපි එක අතකින් සතුටු වෙනවා, සමහර කටයුතු එදාට වඩා හොඳට සිද්ධවීම පිළිබඳව. ඒ වාගේම තවත් අඩු පාඩු ගොඩාක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාරිසරික කටයුතු පිළිබඳව කථා කරනකොට අද අපේ කොටියාසවලට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා UDA එක භාරව කටයුතු කරනකොට වෙරළ්ගහ යෝජනා ක්‍රමය ආරම්භ කළා. වෙරළ්ගහ යෝජනා ක්‍රමය ආරම්භ කරපු නිසා අද අපේ පළාත් - බොරලැස්ගමුව, දිවුලපිටිය, බොකුන්දර, ජාලිගොඩ වැනි ප්‍රදේශ-වතුරෙන් යට වෙන එක නැවතුණා. ඒ වාගේම කසළ කළමනාකරණය වෙනුවෙනුත් එතුමා විශාල වැඩ පිළිවෙළක් ඇති කළා. අද ඒවා ක්‍රියාත්මක නොකිරීම නිසා මේ වර්ෂාව කාලයේ කරදියාන පළාතේ යන්න බැරි විධියට කසළවලින් පිරිලා. කසළ පිළිබඳ කිසිම කළමනාකරණයක් නොමැති නිසා එහි ජනතාව ඉතාම අසීරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අද ලංකාවේම කසළ කරදියානට ගෙනැල්ලා දානවා. ඒ පිළිබඳව පසුගිය කාලවල විශාල ප්‍රශ්නයක්; ගැටලුවක් ඇති වුණා. දැන් මේ ගැටලුව දවසින් දවසම වැඩි වෙලා තිබෙනවා. කසළ කළමනාකරණය පිළිබඳ විවිධ අය කථා කළාට ඒකේ කිසිම සිදුවීමක් වෙලා නැහැ. එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව විශාල වැඩ පිළිවෙළක් ඇති කරලා කසළ කළමනාකරණය ක්‍රියාත්මක කරන්න රුපියල් මිලියන 2000ක් වෙන් කරලා තිබුණා. පුත්තලමේ අරුවක්කාලු ප්‍රදේශයට කසළ ගෙනගිහිල්ලා සෞඛ්‍ය ආරක්ෂිත විධියට කසළ තැන්පත් කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරලා තිබුණා. ඊට පසුව පරිසර අමාත්‍යාංශය කිව්වා, "ඒක buffer zone එක නිසා කරන්න බැහැ" කියලා. ඊට පසුව, කසළ කළමනාකරණ වැඩ පිළිවෙළ නැවතත් ක්‍රියාත්මක කරනවා කියලා පසුගිය කාලයේ තීන්දු කළා. අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 2,000ක් වෙන් කළා. අද වෙන තුරු ඒ කටයුත්ත සිද්ධ වෙලා නැහැ. අපේ පළාත කසළවලින් පිරිලා ගිහිල්ලා තිබෙනවා. ඒ කසළවලින් විදුලිබලය නිපදවන යෝජනා ක්‍රමයක් එනවා කියලා කිව්වා. නමුත්, තවම ඒවා පිළිබඳව පරිසර ඇගයීමක් කරලා නැහැ; පරිසර වාර්තාවක් ඇවිල්ලා නැහැ. සමහර සමාගම්වල ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. අයාලේ යන වැඩ පිළිවෙළක් බවට එය පරිවර්තනය වෙලා තිබෙනවා. මේක අපේ පළාත්වල ජනතාවගේ සෞඛ්‍යයට හැම අංශයෙන්ම අනතුරක් බවට පත් වෙලා තිබෙනවා. දැන් මේ වර්ෂාව සමයේ අපේ පළාතට ඒ ගඳ හැතැප්ම තුන හතරක් දුරට එනවා; අනෙක් පැත්තෙන් රත්මලානට එනවා; දෙහිවලට එනවා. අද හැම පළාතම මදුරුවන්ගෙන්, මැස්සන්ගෙන් ලෙඩ රෝග බෝ වෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. වෙරළ්ගහ යෝජනා ක්‍රමයේ දෙවැනි අදියර තවම හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ඒ සඳහා ජාත්‍යන්තරයෙන් මුදල් ලැබී තිබෙනවා. ඒ ගැන අදාළ ඇමතිවරයා දන්නේ නැහැ; පළාත් සභාවේ සභාපතිතුමා දන්නේ නැහැ; රජය දන්නේ නැහැ. කවදා හරි දවසක කොළොන්නාවේ කුණු කන්දේ ප්‍රශ්නය වාගේ ප්‍රශ්නයක් ඇති වුණු දවසට තමයි ඒ ගැන ඇස් ඇරලා බලන්නේ. ඒ අවට මහජනයාට ජීවත් වෙන්න බැරිවයි ඉන්නේ. පරිසරය ගැන කොපමණ කථා කළත් වැඩක් නැහැ, පරිසරයට ඇති වන බාධකවලට සැලසුම් ක්‍රියාත්මක කරන්නේ නැත්නම්. ඒ සැලසුම් තිබෙනවා. ඒවාට මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත් අද ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ කටයුතුවලදී එක එක්කෙනා තමන්ට වාසි වන විධියට ක්‍රියා කරනවා. මට මතකයි, එදා අපේ රජය කාලයේ බලශක්ති නිෂ්පාදනය කරන ආයතන මේ රටට ආවා. ඒ ව්‍යාපෘති පරීක්ෂා කර බැලුවාම ඒවායින් ඊට වඩා නරක ප්‍රතිඵල ගෙන දෙනවා. ඒවායින් පිටවන අළු නිසා මීට වඩා විෂම තත්ත්වයක් ඇති වනවා. ඒවා පිළිබඳව පරීක්ෂා කරන්නේ නැතුව, ඒවා පිළිබඳව දැනුවත් කරන්නේ නැතුව, ඒවා පිළිබඳව විශේෂඥ දැනුම ගන්නේ නැතුව, විවිධ අයගේ වුවමනා මත ඒ ව්‍යාපෘති අනුමත කළත්, අද ඒවා ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබෙනවා. යම් ආයතනයක් එහෙම ව්‍යාපෘතියක් කරනවා නම් පළමුවෙන්ම කරන්න ඕනෑ, පරිසර වාර්තාවක් ගන්න එකයි. ඒ එකකටවත් තවම පරිසර වාර්තාවක් අරගෙන නැහැ. හැබැයි ඒ ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඉතින් මේ කටයුතු අපේ ප්‍රදේශයේ අය අනතුරට පත් කරන ක්‍රියාදාමයක් බවට පරිවර්තනය වනවා. ඒ නිසා මේවා පිළිබඳව මීට වඩා ගැඹුරින් කල්පනා කරන්න සිද්ධවෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. වෙරළ් ගහ යෝජනා ක්‍රමයේ ඉදිරි කටයුතු ආරම්භ කරන්න ඕනෑ. ඒ කටයුතු කළේ නැත්නම් ඒ යෝජනා ක්‍රමයෙන් ප්‍රයෝජනයක් නැහැ. බෙල්ලන්විල ඉදිකර තිබෙන ව්‍යායාම මං තීරු, ඇළවල්, වේළි දැන් නඩත්තු කරන්නේ නැහැ. ඒ ගැන කවුරුවත් බලන්නේ නැහැ. අපි මේ පාර්ලිමේන්තුවේ මොන තරම් අණ පනත් සම්මත කළත්, ඒවා ක්‍රියාත්මක කරන්නේ නැත්නම් ඒ එකකින්වත් ප්‍රයෝජනයක් ඇති වන්නේ නැහැ. ගං වතුර ගැලුවාම අපි බලනවා, අහුල් කොපමණ තිබෙනවාද කියලා; අවශ්‍ය අහුල් ගණන කොපමණද කියලා.

පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ ගැන කථා කරනවා. නමුත් ගමට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම ප්‍රශ්න ගොඩයි. අද මේ කියන සුන්දර කථා නැහැ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම; කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම; හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම; කළුතර

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම. ඒ අයට ඒ පහසුකම් ලැබිලා නැහැ. මෙවැනි තත්ත්වයක් තමයි මේ රටේ තිබෙන්නේ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා පත්තර බලාගෙන, මේ තරම් කටයුතු කළාය, මේ තරම් කටයුතු කළා කියලා හොඳට කියනවා. නමුත් අපි ඒ ස්ථානවලට ගියාම -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(මාණ්පුමිකු කාමිණි ලොක්කුකේ)
(The Hon. Gamini Lokuge)
ඒ ස්ථානයට ගියාම ඒ තත්ත්වය නැහැ. වාසුදේව නානායක්කාර මැතිතුමා කිව්වේ, ඒ ස්ථානයේ තිබෙන තත්ත්වය. රාජ්‍ය ඇමතිතුමා කඩදාසියක් බලාගෙන කියනවා, අපි මේ තරම් කටයුතු කළාය කියලා. අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ, පසුගිය කාලවල සිදු වුණු දේවල් දිහා නැවතත් බලන්න කියලායි. එදා හංවැල්ලේ ගං වතුරට හසු වුණු මිනිසුන්ට තවම ගෙවීම් කරලා ඉවර නැහැ. සාලාවේ බෝම්බ සිද්ධියෙන් අලාභ වූ අයට තවම ගෙවීම් කරලා ඉවර නැහැ. කොළොන්නාවේ අලාභ හානි සිදු වූ අයට ගෙවීම් කරලා ඉවර නැහැ. සාමසර කන්ද නාය යෑමෙන් ගෙවල් අහිමි වූ අයට තවම ගෙවල් හදලා දීලා ඉවර කරලා නැහැ. ඒ නිසා මේවා පිළිබඳව සැලකිලිමත් වන්නය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Thank you. The next speaker is the Hon. A.L.M. Nazeer.

ගරු සී.බී. රත්නායක මහතා
(මාණ්පුමිකු சீ.பி. රත්නායක්ක)
(The Hon. C.B. Rathnayake)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය පවත්වාගෙන යන අවස්ථාවේ මේ සභාවේ කවුරුත් නැහැ. කාටද අපි කථා කරන්නේ? මේ විවාදය පවත්වාගෙන යන වෙලාවේ අදාළ ඇමතිවරයා මේ සභාවේ නැහැ. නියෝජ්‍ය ඇමතිවරයා හෝ මේ ගරු සභාවේ ඉන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අවස්ථාවේදී සභාවේ ගණපූරණයක් නැහැ.

පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී
පසුව ගණපූරණයක් තිබුණෙන්-

පාරාළුමන්ත්‍රම් කණක්කිටප්පට්ටු, කූට්ට නටප්පෙණ් ඉල්ලෛයෙනක් කණ්ටතනාල්, පිරිවු මණි අටික්කප්පට වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
පිරකු, කූට්ට නටප්පෙණ් ඉරුන්තතනාල් -

Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.
Later, a Quorum being present-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඒ.එල්.එම්. නසීර් මන්ත්‍රීතුමා කථා කරන්න.

[පි.ප. 4.13]

ගරු ඒ.එල්.එම්. නසීර් මහතා
(මාණ්පුමිකු ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறும் தேசிய சூழல் சட்டத்தின் கீழான கட்டளைகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு பேசக் கிடைத்தமைக்கு நான் முதலில் அல்லாஹ்வுக்கு நன்றி கூறுகின்றேன். அம்பாறை - திகாமடுல்ல தேர்தல் மாவட்டத்திலுள்ள எனது பிரதேசமான அட்டாளைச்சேனைப் பிரதேச சபைப் பிரிவுக்கு உட்பட்ட இடங்களில் சுற்றாடல் திணைக்களத்தினூடாகச் சில நல்ல விடயங்கள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. அதேநேரம் அங்கு காணப்படுகின்ற சுற்றாடல் சம்பந்தமான பொடுபோக்கான நிலைமையில் கவனம் செலுத்த வேண்டும் என்பதை நான் இந்த இடத்திலே குறிப்பிட்டாக வேண்டும்.

குறிப்பாக, அட்டாளைச்சேனை மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சின்கீழ் உள்ளடக்கப்பட்ட ஒரு பிரதேசம். இன்று அங்குள்ள அஷ்ரஃப் நகர், பள்ளக்காடு என்கின்ற இடம் கழிவு மற்றும் குப்பைகளைக் குவிப்பதற்குப் பயன்படுத்தப்படுகின்றது. அதாவது அங்கு முழுக் கரையோர மாவட்டங்களிலும் சேகரிக்கப்படுகின்ற குப்பைகளும் இந்த இடத்தில் சொண்டுவந்து கொட்டப்படுகின்றது. கல்முனை Municipal Council அதேபோன்று அக்கரைப்பற்று மாநகர சபை மற்றும் சம்மாந்துறை, காரைதீவு, நிந்தவூர், அட்டாளைச்சேனை, ஆலையடிவேம்பு பிரதேசச் சபைப் பிரதேசங்களிலிருந்து சேகரிக்கப்படுகின்ற குப்பைகளே அங்கு கொண்டு வந்து கொட்டப்படுகின்றன. கடந்த காலத்தில் UNOPS என்ற தனியார் நிறுவனம் அட்டாளைச்சேனைப் பிரதேசத்தில், அஷ்ரஃப் நகரிலே சுமார் 15 ஏக்கர் கொண்ட ஓர் இடத்தைத் தெரிவுசெய்து, அதில் 5 ஏக்கர் நிலத்தில் ஒரு landfill ஐ உருவாக்கியிருந்தது. இந்த 2 மாநகர சபைகள், 5 பிரதேச சபைகளின் கீழ்வரும் பிரேதேசங்களில் சேகரிக்கப்படுகின்ற குப்பைகள் அந்த landfill இல்தான் கொட்டப்படுகின்றன. குறிப்பாக ஒரு நாளைக்கு 100 - 125 தொன் குப்பைகள் அங்கு கொட்டப்படுகின்றன. அன்று UNOPS நிறுவனம் அந்த landfill ஐ முறையாகச் செயற்படுத்தியபோதிலும், அஷ்ரஃப் நகர், பள்ளக்காட்டு area காட்டுக்கு அருகாமையில் அமைந்திருப்பதனால், அங்கு காட்டு யானைகள் வந்து அந்த landfill ஐ முழுமையாக அழித்து சுற்றுச் சூழலுக்குப் பாதிப்பை ஏற்படுத்துகின்றது. அதாவது, UNOPS நிறுவனம் கோடிக்கணக்கான நிதிகளைச் செலவிட்டு உருவாக்கிய landfill இல் கல்முனை மாநகர சபை, அக்கரைப்பற்று மாநகரசபை, மற்றும் 5 பிரதேச சபைகளிலும் சேகரிக்கப்பட்டுக் கொட்டப்படுகின்ற குப்பைகளைத் தற்பொழுது யானைகள் வந்து கிண்டி, வேலிகளை உடைத்து சேதங்களை விளைவிப்பதனால், அந்தப் பிரதேசத்தை அண்டிய தீகவாபி பிரதேசத்திலுள்ள சிங்கள சகோதர மக்களும் அதேபோன்று அஷ்ரஃப் நகர், ஆலிம் நகரிலிருக்கின்ற முஸ்லிம் சகோதரர்களும் மற்றும் அதனை அண்டிய ஏனைய கிராமங்களில் இருக்கின்ற மக்களும் சுற்றுச்சூழல் பிரச்சினைகளுக்குள்ளாகின்றனர். இந்தப் பிரச்சினைக்குத்

தீர்வு காணும் வகையில் அம்பாறை மாவட்டத்தினுடைய பாராளுமன்ற உறுப்பினர்கள், அங்கு யானை வேலிகள் அமைக்கப்படுவது சம்பந்தமாக மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களிலே பல தடவைகள் கோரிக்கைவிடுத்திருந்தபோதிலும் இவற்றையெல்லாம் சம்பந்தப்பட்ட அரச அதிகாரிகள் பார்த்தும் பாராமலும் இருக்கின்ற நிலை காணப்படுகின்றது.

இன்று அந்த landfill தொடர்பில் உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சு பாரிய திட்டங்களை வகுத்து வருகின்றது. குறிப்பாக அட்டாளைச்சேனையிலுள்ள landfill இல் கிட்டத்தட்ட இரண்டு இலட்சம் தொன் உக்கக்கூடிய குப்பைகள் இருக்கின்றன. இதனை உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சின் அதிகாரிகள் வந்து பார்வையிட்டு, இதன் புனரமைப்பு வேலைகளுக்காகச் சுமார் ஏழரைக் கோடி ரூபாவை அந்த அமைச்சின் ஊடாக ஒதுக்கி, அந்த வேலைத்திட்டங்கள் நடக்கின்றபோதிலும், இன்றுவரை அந்த landfill இல் யானை வேலி அமைக்கப்படாமை மிகவும் கவலைக்குரிய விடயமாக இருக்கின்றது. UNOPS நிறுவனம் கோடிக்கணக்கான ரூபாய் நிதியை இந்த landfill க்கு முதலீடு செய்தபோதிலும், அந்த நிறுவனம் அந்த வேலைகளைக் கைவிட்டு, கிழக்கிலிருந்து வடக்குக்குச் சென்று 3 - 4 ஆண்டுகளாகின்றது. இந்த நிலையில் அட்டாளைச்சேனைப் பிரதேச சபையால் அந்த landfill ஐப் பராமரிப்பதற்கு முதலீடு செய்ய இயலாத ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. அந்தப் பகுதியிலே உள்ள ஏழு உள்ளூராட்சிச் சபைகளினாலும் சேகரித்துக் கொண்டு வரப்படுகின்ற குப்பைகள் அட்டாளைச்சேனைப் பிரதேசத்திலுள்ள குறிப்பிட்ட இந்த இடத்தில் கொண்டுவந்து கொட்டப்படுகின்ற நிலையில், அங்கு வருகின்ற யானைகள் அந்தக் குப்பைகளைக் கிளறுவதனால் அதை அண்டிய சிறிய கிராமங்களில் வாழுகின்ற மக்கள் பாரிய நோய்களுக்கு உள்ளாகின்றார்கள் என்பதையும் இந்த இடத்திலே தேசிய சுற்றாடல் திணைக்களத்தின் கவனத்துக்குத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். குறிப்பாக அம்பாறை மாவட்ட அரசாங்க அதிபர் இது தொடர்பில் சில தீர்மானங்களை எடுத்தபோதிலும், அங்கு யானை வேலியை அமைக்க முடியாத ஒரு நிலை காணப்படுகின்றது என்பதையும் நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, அம்பாறை மாவட்டத்திலுள்ள பொத்துவில் பிரதேசத்தில் இருக்கின்ற விவசாயிகளின் காணிகளில் இன்று விவசாயம் செய்யமுடியாத ஒரு நிலைமை இருக்கின்றது என்பதை இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது. உங்களது உரையைச் சுருக்கிக் கொள்ளுங்கள்!

ගරු ඒ.එල්.එම්. නසීර් මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)
அதாவது, கடந்த யுத்த காலத்தின்போது இராணுவத்தினர் பாதுகாப்பு நடவடிக்கைகளுக்காகப் பயன்படுத்திய காணிகளில், யுத்தம் நிறைவடைந்துள்ள தற்போதைய நிலையிலும் அந்த விவசாயிகள் விவசாயம் செய்ய முடியாத ஒரு நிலைப்பாடு இருப்பதையிட்டு, நான் கவலைப்படுகின்றேன். குறிப்பாக, கரங்கோ மேற்கு, பாலையடிவட்டைப் பிரதேசத்தில் 503 ஏக்கர் விவசாயக் காணிகளில் அந்த மக்கள் விவசாயம் செய்ய முடியாத ஒரு நிலைப்பாடு இன்று காணப்படுகின்றது. எனவே, நாட்டின் சனாதிபதி அவர்களும் பிரதமர் அவர்களும் மற்றும் காணிக்குப் பொறுப்பாக இருக்கின்ற அமைச்சர் அவர்களும் இந்த விடயத்தைக் கவனத்தில் எடுத்து, அந்த விவசாயிகளுக்கு அந்தக் காணிகளை வழங்குவதற்கு ஆவன செய்யவேண்டு மென்று மிகவும் பணிவோடு வேண்டி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி! அடுத்து, கௌரவ துரைரெட்ணசிங்கம் அவர்கள்!

[பி.ப. 4.22]

ගරු කේ. තුරෙයිරෙත්නසිංහම් මහතා
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று சபையில் விவாதிக்கப்படும் தேசிய சூழல் சட்டத்தின் கீழான கட்டளைகள் தொடர்பில் உரையாற்ற வாய்ப்புத் தந்தமைக்கு நன்றி! இன்று நமது நாடு சூழல் - சுற்றாடல் பாதுகாப்பில் பாரிய சவாலை எதிர்நோக்கி வருகின்றது. இந்தக் காலகட்டத்திலே தேசியச் சூழல் சட்டத்தின் கீழ் சூழற் பாதுகாப்புச் சம்பந்தமான கட்டளைகள் 7 இனைக் கொண்டுவந்து, விவாதத்தை நடத்தி, அதனை அமுல்படுத்துவதற்கு முயற்சி எடுத்திருக்கின்ற கௌரவ அமைச்சர் அவர்கள், கௌரவ பிரதி அமைச்சர் அவர்கள், அமைச்சினுடைய செயலாளர், ஏனைய அதிகாரிகள் ஆகியோர்களுக்கு என்னுடைய மனப்பூர்வமான நன்றியை முதலில் தெரிவிக்க விரும்புகின்றேன்.

அத்தோடு இன்று இயற்கை அனர்த்தினால் பாதிக்கப்பட்டு உயிரிழப்புக்களைச் சந்தித்த மக்கள் குறித்து எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக்கொள்கின்றோம். அவர்களுக்குரிய நிவாரணம் கிடைப்பதற்கு அரசாங்கம் பல முயற்சிகளை எடுக்கின்றது. அந்தச் செயற்பாட்டை மேலும் வலுப்படுத்த வேண்டுமென்ற ஒரு கோரிக்கையை விடுத்து இன்றைய விவாதத்திற்கு வருகின்றேன்.

இன்று சூழற் பாதிப்பு மனித இனத்திற்கு மட்டுமல்ல, ஏனைய உயிரினங்களுக்கும் இயற்கைக்கும் ஒரு சவாலாக இருந்துவருகின்றது. இன்று பல அபிவிருத்தித் திட்டங்களுக்காகக் காடுகள் அழிக்கப்படுகின்றன. அதாவது குடியேற்றங்கள், பாதைகள் அமைத்தல், தொழிற்சாலைகள் அமைத்தல் போன்ற பல்வேறு அபிவிருத்தித் திட்டங்களுக்காகக் காடுகள் அழிக்கப்படுகின்றன. ஆனால், அந்தக் காடுகளுக்குப் பதிலாக - பிரதியீடாகக் காடுகளை உண்டாக்குவதற்குப் போதிய முயற்சிகள் எடுக்கப்படுவதாக இல்லை. அபிவிருத்திக்காகக் காடுகள் அழிக்கப்படுவது அத்தியாவசியம் என்று கருதுகின்றவேளையிலே, காடுகளை மீளவும் உண்டாக்குவதற்கான முயற்சிகள் எடுக்கப்பட வேண்டும். வீதிகள் அமைக்கப்படுவதற்காகக் காடுகள் அழிக்கப்படுகின்றன. அந்த வீதிகள் அமைக்கப்படும்போது அதைப் பற்றிய ஆய்வுகள் சரியாகச் செய்யப்படாத ஒரு நிலையும் நம்முடைய நாட்டிலே இருப்பதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. எந்தவோர் அபிவிருத்தித் திட்டம் மேற்கொள்ளப்படுவதாக இருந்தாலும், அந்த அபிவிருத்தித் திட்டத்திற்குரிய வேலைகளைச் செய்யும்பொழுது, அதனால் ஏற்படக்கூடிய சாதக

[ගරු க. துரையிரெத்னசிங்கம் மහතා]

பாதகங்களை நிச்சயமாக, கண்டிப்பாக அவதானத்திலே கொள்ளவேண்டியது அரசினுடைய ஒரு கடமையாக இருக்கின்றது.

கடந்த ஆட்சிக் காலத்திலே திருகோணமலை மாவட்டத்தில் தம்பலகாமம் பிரதேசத்திலே ஒரு வீதி அமைப்பதற்காக முயற்சி எடுக்கப்பட்டது. ஆனால், அதனை எதிர்த்த மக்கள் நீதிமன்றம் வரை சென்று அந்த வீதி அமைக்கப்படுவதைத் தடுக்க வேண்டிய ஒரு சூழ்நிலை ஏற்பட்டது. அதாவது, கிண்ணியாவிலிருந்து தம்பலகாமத்திற்குச் செல்வதற்கு வீதி அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான ஒரு பிரதான வீதியிருந்தும், அதற்குச் சமாந்தரமாக வானாறுப் பகுதியிலே ஒரு வீதியிருந்தும், இடையிலே உள்ள வயல் வெளிக்கூடாக ஒரு வீதி அமைக்கப்படுவதற்கான முயற்சி நடைபெற்றது. அதாவது, சம்பூரில் அனல் மின் நிலையத்திற்கு நிலக்கரி கொண்டு செல்வதற்கென ஒரு வீதி அமைக்கப்பட இருந்தது. அது ஏறக்குறைய 500 ஏக்கர் வயல் நிலத்தில் - பொன் விளைகின்ற பூமியில் அமையவிருந்தது. அதனால், மக்கள் அதை எதிர்த்துப் போராடினார்கள். அத்தோடு, அது சம்பந்தமான ஒரு வழக்கும் தாக்கல் செய்யப்பட்டது. அந்த வழக்கிலே மக்களுடைய பக்கம் வெற்றி கிடைத்தது. அந்த வீதியை அமைப்பதற்காக எடுக்கப்பட்ட முயற்சிகள் பயனற்றவை என்பதை நீதிமன்ற விவாதத்தின்போது பலர் உணரக்கூடியதாக இருந்தது. ஆனபடியினால், எந்தவோர் அபிவிருத்தித் திட்டத்தையும் மேற்கொள்ளும்போதும் நிச்சயமாக அதனுடைய சாதக பாதகங்களைக் கருத்திற் கொள்ள வேண்டிய ஒரு முக்கிய தேவையிருக்கின்றது.

கடந்த காலத்தில் திருகோணமலையிலே உள்ள துறைமுகச் சூழலை அண்டி ஓர் அனல் மின் நிலையத்தை அமைக்க வேண்டும் என்ற முயற்சி எடுக்கப்பட்டது. அது ஓர் இயற்கைத் துறைமுகம். அந்த இயற்கைத் துறைமுகத்திலே மீன்கள் வாழக்கூடிய பல குடாப் பகுதிகள் இருக்கின்றன. அந்தக் குடாப் பகுதிகளுக்கு அண்மையிலே ஓர் அனல் மின் நிலையத்தை அமைக்க வேண்டும் என்று முயற்சி எடுக்கப்பட்ட போது, அதனைப் பாராளுமன்ற உறுப்பினர்களும் அந்தப் பிரதேச மக்களும் எதிர்த்தார்கள். அப்பொழுது மின்சக்தி வலு அமைச்சராக கௌரவ சபாநாயகர் கரு ஜயசூரிய அவர்கள் இருந்தார். அவரிடம் நாங்கள் "அது அங்கு அமைக்கப்படுவது பொருத்தமல்ல. அதனால் அதனைக் கைவிட வேண்டும்" என்று சொன்னபோது, அந்தக் காரணங்களை அவர் ஏற்றுக்கொண்டு, அவர் அந்த அனல் மின் நிலையம் அமைப்பதைக் கைவிட்டிருந்தார். அதேபோன்று சம்பூரிலே அமைக்கப்பட விருந்த அனல் மின் நிலையத்தினால் ஏற்படப்போகின்ற அனர்த்தங்களையும் சுற்றாடலுக்கு ஏற்படப்போகின்ற பாதிப்புக்களையும் நாங்கள் வலியுறுத்திக் கூறியபோது, அந்த விடயம் அரசாங்கத்தினால் உணரப்பட்டு, அதுவும் நிறுத்தப் பட்டிருக்கின்றது. ஆனபடியினால் எந்தவோர் அபிவிருத்தித்தித் திட்டத்தை முன்னெடுக்கும்பொழுதும் அதனால் ஏற்படுகின்ற தாக்கங்கள் மற்றும் சாதக பாதகங்களை அறிந்து செயற்பட வேண்டும். தீமைகள் குறைந்து நன்மைகள் கூடுதலாக இருக்குமாக இருந்தால் அந்தச் செயற்றிட்டத்தை மக்களுடைய நன்மை கருதி நடைமுறைப்படுத்தவேண்டிய ஒரு தேவை இருக்கின்றது.

இன்று நாட்டில் காடுகள் அழிக்கப்படுகின்ற நிலைமை காணப்படுகின்றது. சட்டங்கள் இருந்தாலும் அந்தச் சட்டங்களை மீறிக் குடியேற்றங்களுக்காக மக்கள் சட்டவிரோதமாகக் காடுகளை அழிக்கின்ற செயற்பாடானது பொதுவாக காடுகள் அதிகமுள்ள மாவட்டங்களிலே இடம்பெறுகின்றது. திருகோணமலையிலும் சட்ட விரோதமாகக் காடுகள் அழிக்கப்படுகின்றன. நாங்கள் எவ்வளவுதான் தடுத்தாலும் அந்தச் செயற்பாடு இன்றும் நடைபெற்றுக் கொண்டிருக்கின்றதென்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். இது தடுத்து நிறுத்தப்பட வேண்டும்.

நீர் நிலைகள், சிறிய குளங்கள், நீர் தங்கக்கூடிய இடங்கள் என்பன இப்பொழுது குடியேற்றத்துக்காகவும் மற்றும் விளையாட்டு மைதானங்களை அமைத்தல் போன்ற ஏனைய தேவைகளுக்காகவும் மூடப்படுகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. ஆனால், அத்தகைய நீர் நிலைகள் கட்டாயம் இருக்க வேண்டும். நிலக்கீழ் நீரைச் சேமிக்க வேண்டுமாக இருந்தால் குறித்த பிரதேசத்திலே குளங்கள், சிறிய குளங்கள், நீர் தங்கக்கூடிய இடங்களெல்லாம் பாதுகாக்கப்பட வேண்டும். அப்பொழுதுதான் நிலத்தின் கீழ் நீர் தேங்கிநிற்கும். அக்கம் பக்கத்திலுள்ள கிணறுகளுக்கு நீர் கிடைக்கக்கூடியதாக இருக்கும். அது செழிப்பானதொரு பிரதேசமாகவும் இருக்கும். ஆனால், இன்று இந்த முக்கியத்துவம் அறியாமல் தேவைகள் கருதி நீர் நிலைகள் மூடப்படுகின்றன. அத்தோடு கடலோரத்தை, ஆற்றோரங்களை அண்டிய பகுதிகளிலுள்ள தாழ்ந்த பிரதேசங்களும் மக்களுடைய குடியிருப்புக்களுக்காக, விளையாட்டு மைதானம் அமைத்தல் போன்ற சில தேவைகளுக்காக மூடப்படுவதை நாம் பார்க்கின்றோம்.

களப்பு நிலங்களானது எப்பொழுதும் கடல் தன்னைச் சுத்திகரித்துக் கொள்வதற்காக இயற்கையாக அமைந்த இடங்களாகும். கடல் பெருக்கெடுக்கும்பொழுது கடலிலுள்ள அசுத்தங்களெல்லாம் அந்த நீரோடு சேர்ந்து வந்து, களப்பு நிலங்களிலே தேங்கி நின்று படிந்ததன் பிற்பாடு, மீண்டும் அந்த நீர் சுத்திகரிக்கப்பட்டுக் கடலுக்குச் செல்கின்றது. இப்படியான களப்பு நிலங்கள் மூடப்பட்டால், கடல் நீர் சுத்திகரிக்கப்படுகின்ற நிலைமை ஏற்படாமல் கடல் நீரினுடைய அடர்த்தி கூடும். இந்த அடர்த்தி கூடுவதால்தான் சுனாமி போன்ற அனர்த்தங்கள் ஏற்படுகின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. VELU KUMAR *left the Chair and* DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු க. துரையிரெத்னசிங்கම් මහතා
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)

இந்தக் களப்பு நிலங்களை, ஆற்றோரங்களை மூடுகின்றபொழுது மிகவும் கவனமாக இருக்க வேண்டும். ஏனெனில் ஆற்றுப்படுக்கைகள் எப்பொழுதும் ஆற்றுப்படுக்கைகளாகவே இருக்க வேண்டும். அது ஓர் இயற்கை வளம்; இயற்கையாகவே கடல் தன்னைச் சுத்திகரிப்பதற்காக ஏற்படுத்தப்பட்ட ஒரு நில அமைவு.

ஆனால், அது செயற்கையாக மூடிமறைக்கப்பட்டால் அதன் பாதகமான விளைவுகளை மக்கள் சமூகம் அனுபவிக்க வேண்டி வரும்.

அடுத்தது, மண் அகழ்வு பற்றிய விடயம். இது இலங்கையினுடைய பல பாகங்களிலும் மிகத் தீவிரமாக நடைபெறுகின்ற ஒரு செயற்பாடாக இருக்கின்றது. அது பற்றிய சட்டங்கள் இருந்தாலும் அவற்றை மீறி இந்தச் செயற்பாடு இடம்பெறுகின்றது. திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில், அங்கு இந்த நிலைமை ஒரு பாரிய பிரச்சினையாக இருக்கின்றது. சம்பந்தப் பட்டவர்கள் மகாவலி கங்கையை அண்டிய கரையோரங்களிலே நாளாந்தம் பல நூற்றுக்கணக்கான லொறிகளில் வந்து மண்ணை அகழ்ந்து செல்கின்றார்கள். வெள்ளம் காரணமாக மண்மேடு ஏற்பட்டிருக்கின்ற இடங்களிலே மண் அகழ்வது என்பது பெரிய பாதிப்பைத் தராது. ஆனால், இன்று கங்கைக்குள்ளே சென்று கங்கையை அகழ்ந்து, ஆழமாக்கி அந்த மண்ணை ஏற்றிக்கொண்டு செல்கின்ற நிலைமை காணப்படுகின்றது. அது கரையோரங்களைப் பாதிப்படையச் செய்கின்றது. அது மட்டுமல்லாமல், பல வருடங்களுக்குப் பிற்பாடு திருத்தப்பட்ட மக்களுடைய பாவனைக்குரிய வீதிகளில் இரவு, பகலாக அந்தக் கனரக வாகனங்கள் செல்வதால், அந்த வீதிகளெல்லாம் மக்கள் நடமாட முடியாதளவுக்கு மோசமாகப் பாதிக்கப் பட்டிருக்கின்றன. பின்னேரம் ஆறரை மணிக்குப் பிறகு கொழும்பிலிருந்து திருகோணமலை நோக்கிச் சென்றால் இவ்வாறான நூற்றுக்கணக்கான லொறிகள் அந்த வீதிகளில் செல்வதைக் காணக்கூடியதாக இருக்கும். அந்த நேரத்தில் ஏனைய வாகனங்கள் பிரயாணம் செய்வதுகூட மிகவும் கஷ்டமாகும். அத்தோடு இந்த லொறிகள் வீதியால் வருகின்றவர்கள் பலரை மோதிக் காயப்படுத்தியிருக்கின்றன; பலர் இறந்தும் இருக்கிறார்கள். இப்படியான சம்பவங்கள் பற்றித் திருகோணமலை மாவட்ட ஒருங்கிணைப்புக்குழுக் கூட்டத்திலே நாங்கள் பலமுறை கூறி அதைத் தடுக்க முயற்சித்தாலும்கூட, இன்றும் அது இடம்பெறுகின்ற ஒரு நிலைமையிருக்கின்றது. ஆகவே, அதைக் கண்டிப்பாக நிறுத்தியாகவேண்டுமென்று இந்த உயரிய சபையிலே ஒரு கோரிக்கையை விடுக்கின்றேன்.

பாவனைக்காக மண் எடுக்கப்பட வேண்டும். ஆனால், அதற்கான அனுமதிப்பத்திரங்களைக் கொடுக்கும்போது அதிலே கட்டுப்பாடு இருக்க வேண்டும். "மண் ஏற்றுவது நிறுத்தப்பட்டிருக்கின்றது; ஆனால், இன்னமும் மண் லொறிகள் சென்று வருகின்றனவே!" என்று நாங்கள் ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலே கேள்வி எழுப்பியபோதிலும் இதற்கான அனுமதிப் பத்திரத்தைக் கொடுத்த அதிகாரி யார்? என்று கண்டுபிடிக்க முடியாமல் இருக்கின்றது. ஆனபடியால் மண் அகழ்வதற்கான அனுமதிப்பத்திரங்களை விநியோகிப்பதிலே அரசாங்கமும் சுற்றாடல் பாதுகாப்புப் பகுதியினரும் மிகவும் கண்டிப்பாக இருக்க வேண்டும். அதாவது தேவையின்றி அநாவசியமாக மண்ணகழ்வதைத் தடுத்து நிறுத்தவேண்டு மென்ற கோரிக்கையையும் நான் விடுக்கின்றேன்.

அடுத்து, திருகோணமலை மாவட்டத்திலே மூதூர் பிரதேசத்தில் மூன்றாம் கட்டை மலையிலிருந்து மயிலி மலை வரை ஒரு மலைத்தொடர் இருக்கின்றது. அது இயற்கையான ஒரு மலைத்தொடராகும். அது மூதூர், தோப்பூர்க் கிராமங்களை இரண்டாகப் பிரிக்கின்றது. அது வயல் நிலங்கள் சூழ்ந்த ஓர் இடமாகும். இந்த மலையினது அடிவாரங்களின் இரண்டு பகுதிகளிலும் உள்ள வயல் நிலங்களில் அங்குள்ள மக்கள் சேனைப் பயிர்களைச் செய்கிறார்கள். ஆனால், இந்த மலை இன்று உடைக்கப்படுகின்றது. அதைத் தடுத்து நிறுத்துவதற்காக நாங்கள் பல முயற்சிகள் எடுத்திருக்கின்றோம். மேதகு ஜனாதிபதி அவர்கள் திருகோணமலைக்கு வந்தபொழுது சூழல் - சுற்றாடலைப் பற்றிப் பேசினார். அங்கு பாடசாலை மாணவர்கள், ஆசிரியர்கள், ஏனைய உத்தியோகஸ்தர்கள் மற்றும் பொதுமக்கள் என ஆயிரக்கணக்கானோர் திரண்டு அவருடைய உரையைக் கேட்டார்கள். அது மிகவும் காத்திரமான உரையாக இருந்தது. அதனைக் கேட்டு நாங்கள் மிகவும் சந்தோஷப் பட்டோம். ஆனால், அங்கு இடம்பெறுகின்ற இந்தச் செயற்பாடுகள் ஜனாதிபதி அவர்கள் ஆற்றிய உரைக்கு எதிர்மாறாக இருப்பதையிட்டு நாங்கள் மிகவும் கவலைப் படுகின்றோம். அதனால், "உயர்ந்த பதவிகளில் இருப்பவர்கள் இப்படித்தான் பேசுவார்கள். ஆனால், நடப்பவை நடந்தது கொண்டுதான் இருக்கும்" என்ற ஓர் அபிப்பிராயம் மக்கள் மத்தியிலே ஏற்பட வாய்ப்பிருக்கின்றது.

தேவையான கல்லை இந்த மலையின் அடிவாரங்களில் உடைப்பதில் நாங்கள் ஆட்சேபனை தெரிவிக்கவில்லை. அதேநேரம் இயற்கையான ஒரு மலையை உடைத்துவிடலாம். அதனை உருவாக்க முடியுமா? அந்தப் பிரதேசத்தில் அவ்வாறான ஒரு வளத்தை ஏற்படுத்திக்கொள்ள முடியுமா? என்று கேட்க விரும்புகின்றோம். ஆகவே, அந்த மலை உடைக்கப்படுவதை எந்தவிதக் காரணமும் சொல்லாமல் உடனடியாகத் தடுத்து நிறுத்தி, அந்தப் பிரதேசத்தினுடைய இயற்கை வளத்தைப் பாதுகாக்க வேண்டும். அருங்கோடை காலத்திலும் அந்த மலையடிவாரத்தில் அடிக்கடி மழை பெய்து அந்த இடம் ஈரலிப்பாக இருக்கும். அது அப்படியான ஓரிடமாக இருக்கின்றது. அதன் இரண்டு பகுதிளிலுமுள்ளவர்கள் அந்த மலையை நம்பியே வாழ்கிறார்கள். ஆகவே, அந்த மலைப் பிரதேசத்தைப் பாதுகாப்பதற்கான முழு முயற்சிகளையும் இந்த அமைச்சு எடுக்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

தம்பலகாமம் - கிண்ணியா பிரதான வீதி தொடர்பாகவும் ஒருசில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். இது வீதி அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமானதாகும். அந்த வீதியை விஸ்தரிப்பதற்காக நஷ்ட ஈடு தருவதாகக் கூறிப் பிரதேச மக்களிடமிருந்து காணிகள் பெறப்பட்டன. இதில் ஒரு பகுதி மக்களுக்கு நஷ்டஈடு கொடுக்கப்பட்டது. ஆனால், தம்பலகாமம் பிரதேசத்திலுள்ள மக்களுக்குப் பல வருடங்களாக அதற்குரிய நஷ்டஈடு கொடுக்கப்படாமல் இழுத்தடிக்கப் படுகின்றது. அதனால் அந்த மக்கள் மிகவும் வேதனையோடும் விசனத்தோடும் இருக்கிறார்கள். அவர்கள் அது சம்பந்தமாக எங்களிடத்திலும் முறையிடுகிறார்கள். நாங்கள் தம்பலகாமம் அபிவிருத்திக்குழுக் கூட்டத்தில்கூட இதற்கான தீர்மானத்தை எடுத்து அது சம்பந்தமாகச் சம்பந்தப்பட்டவர்களுக்கு தெரிவித்திருந்தோம். ஆனால், அதற்கு இன்னும் பலன் கிடைக்கவில்லை. ஆனபடியினால் அந்த மக்களுடைய நஷ்ட ஈட்டையும் வழங்கவேண்டுமென்று கேட்டு, வாய்ப்புக்கு மீண்டும் நன்றிகூறி, அமர்கின்றேன். நன்றி.

[අ.භා. 4.36]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාරිසරික කටයුතුවලට අදාළ නියෝග, නියමයන් පිළිබඳව සාකච්ඡා කෙරෙන මේ අවස්ථාව, මේ තිබෙන තත්ත්වයත් සමඟ ඉතාම වැදගත් අවස්ථාවක් විධියට මම සලකනවා, විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයකු හැටියට.

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

දින කිහිපයක් තිස්සේ ඇද හැලෙන ධාරානිපාත වර්ෂාව නිසා රටේ දිස්ත්‍රික්ක ගණනාවක් බරපතළ ව්‍යසනයකට ගොදුරු වෙමින් තිබෙනවා. ඒ ආකාරයේ බරපතළ ව්‍යසනයකට මුහුණ දී තිබෙන දිස්ත්‍රික්කයක් වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර තත්ත්වය මේ වන විට පැයෙන් පැය, පැයෙන් පැය නරක තත්ත්වයට හැරෙමින් පවතිනවා. ඒ වාගේම ලංකාවේ දිස්ත්‍රික්ක ගණනාවක් මේ වන විට ගංවතුර විපතට ගොදුරු වෙමින් පවතිනවා. මේ වන විට ජීවිත 11ක් ගංවතුර මාරයාට බිලි වී තිබෙන බව මාධ්‍ය හරහා වාර්තා වෙනවා; ඒ වාගේම රජයේ වගකිව යුතු අංශ ප්‍රකාශ කරනවා. ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා පවා ප්‍රකාශයට පත් කළා, 11 දෙනෙකු දැනට ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා කියලා. මේ තත්ත්වය තවත් ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙනෙන්න තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. රට පුරා පවුල් දසදහස් ගණනක් අද අනාථ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. රජය පැත්තෙන් මේ පිළිබඳව යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙන බව ගරු රාජ්‍ය ඇමතිතුමා අද පාර්ලිමේන්තුව හමුවේ ප්‍රකාශයට පත් කළා. ඒ පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. ඒ ප්‍රකාශ කළ ආකාරයෙන්ම ඉදිරි කාලය තුළ ඒ කටයුතු ක්‍රියාත්මක වේවි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් ආපදා තත්ත්වයන්ට බොහෝ සෙයින් මුහුණ දෙන දිස්ත්‍රික්කයක් වන රත්නපුර දිස්ත්‍රික්කයේ අප, මේ තත්ත්වය ඒ තරම්ම නුහුරු, නුපුරුදු දෙයක් හැටියට සලකන්නේ නැහැ. රත්නපුරයේ මිනිස්සු මැයි මාසය වනකොට ගංවතුර තත්ත්වයන්ට මුහුණ දෙන්න අවශ්‍ය කරන ආකාරයට කාලයක් තිස්සේ ඉඳලා හැඩ ගැස්මෙන් යුක්තව කටයුතු කරනවා. ගිය අවුරුද්දේ මේ කාලය වන විටත්, මෙවැනි අනතුරුදායක තත්ත්වයක් ඇති වුණා. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවක් ගංවතුරින් යට වෙලා හානියට පත් වුණා වාගේම ජීවිත සහ දේපොළ ඉතා විශාල ප්‍රමාණයක් ඒ ඇති වුණු ගංවතුර සහ නාය යාම් තත්ත්වය නිසා විනාශයට, හානියට පත් වුණා.

ගරු රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශයට පත් කළා, "ඕනෑ තරම් සල්ලි තිබෙනවා, රත්නපුරයට ඔරු සහ අඟුල් මෙපමණ ප්‍රමාණයක් දෙන්න අපි තීරණය කර තිබෙනවා. තව ඕනෑ නම් තවත් දෙනවා" කියලා. බොහොම හොඳයි; ඒක ඒ ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතුයි. හැබැයි, ඒ වුණත් මම වගකීමෙන් යුක්තව ප්‍රකාශ කරනවා, පසුගිය ගංවතුර සමයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදාවන්ට ගොදුරු වූ අයට රජය මඟින් ලබා දෙන සහන ඒ ලැබිය යුතු ආකාරයට ලැබුණේ නැහැයි කියන එක. වෙන එකක් තබා කලවාන වේවැල්කඳුර වැනි ප්‍රදේශවල යට වෙලා තිබුණු මිනී ටිකවත් නියමිත කාලපරිච්ඡේදය තුළ ගොඩ ගන්න බැරි වුණා. එවැනි තත්ත්වයක් තුළ "ඕනෑ තරම් සල්ලි තිබෙනවා. තව මොනවාද කෙරෙන්න ඕනෑ?" කියලා අහනකොට අපට මතක් වෙනවා, අරණායක සාමසර කන්දේ සිදු වුණු ඒ බේදවාචකය; සාලාවේ සිදු වුණු ඒ මහා පිපිරීම සහ පසුගිය වර්ෂයේ ඇති වුණු ගංවතුර ආපදා තත්ත්වය. මෙවැනි තත්ත්වයන් නිසා අසරණභාවයට පත් ජනතාවට යළි එවැනි තත්ත්වයක් ඇති නොවෙන්න කටයුතු කිරීමේ වගකීමක් රජයට තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්ද තුළ රජය ඒ සඳහා කටයුතු කරාවි කියලා. කොහොම නමුත්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි පාරිසරික වශයෙන් හානි, විපත් ඇති වීමට දේශගුණික තත්ත්වයන් වාගේම මිනිස් ක්‍රියාකාරකම් බොහෝ සෙයින් බලපානවා කියන එක අපි විශ්වාස කරනවා. ඒ නිසා නීති සම්පාදනය කරන, නීති ක්‍රියාත්මක කරන ආයතනය වන පාර්ලිමේන්තුව තුළිනුත්, මේ රජය තුළිනුත් එවැනි තත්ත්වයන් ඇති වීම වළක්වාලීමට වගකිව යුතු, දීර්ඝ කාලීන සැලැස්මක් ඇති කිරීමේ අවශ්‍යතාව රට හමුවේ තිබෙනවා. බොහෝ වෙලාවට ආපදා තත්ත්වයක් ඇති වූවායින් අනතුරුව, ජනතාවට බත් පාර්සල් දෙන්නේ කොහොමද, හදිසි සහනාධාර දෙන්නේ කොහොමද, තාවකාලික රැඳවුම් කඳවුරු ඇති කරන්නේ කොහොමද යන්න පිළිබඳව කටයුතු කරනවා විනා, නිත්‍ය වශයෙන් වසරක් පාසා එන මේ උවදුරට මුහුණ දීම සඳහා වැඩ පිළිවෙළක් නොමැති වීම අප රට සතු අභාග්‍ය තත්ත්වයක් හැටියට අප දකිනවා.

පසුගිය කාලය පුරාම විශාල මැසිවිල්ලක් තිබුණා, පැවැති නියං තත්ත්වයත් එක්ක රටේ ආර්ථිකය බරපතළ ලෙස කඩා වැටුණාය; කෘෂි භෝග අස්වැන්න අඩු වුණාය; කෘෂි නිෂ්පාදන ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය අඩු වුණාය කියලා.

හැබැයි, නියං තත්ත්වය පවතින කාල සීමාව තුළ වැව් ටික හාරා ගන්න හැකියාවක් තිබුණා වුණත්, එහෙම කර ජලාශ පුරවා ගන්න වැඩ පිළිවෙළක් රජයෙන් සකස් කරලා තිබුණේ නැහැ. මට මතකයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට පළමුවෙන් අපි පාර්ලිමේන්තුවට ආ 2010 අවුරුද්දේ පාර්ලිමේන්තුවේ බිම් මහල අඩි දෙකක්, තුනක් පමණ ගංවතුරෙන් යට වුණු බව. ඒ වෙනකොට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේ රජයක් තමයි තිබුණේ. හැබැයි, එවකට නාගරික සංවර්ධන අධිකාරිය මේ සම්බන්ධයෙන් ක්ෂණික පියවර ගත්තා. මේ කාලය තුළ එන වර්ෂාව වැනි තද වර්ෂාවක් නොවෙයි, 2010 වර්ෂයේ ආවේ. හැබැයි, පාර්ලිමේන්තුව ඇතුළු මුළු කොළඹම යට වුණා. ඒ අවස්ථාවේදී යුද හමුදා ට්‍රක් රථවලින් තමයි අපට පාර්ලිමේන්තුවට එන්න සිද්ධ වුණේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට එදා අපි පාර්ලිමේන්තුවට ආවේ එහෙමයි. හැබැයි, අද මෙපමණ ගංවතුරක් ගලලාත් පාර්ලිමේන්තු මාර්ගය, පාර්ලිමේන්තුව යට නොවෙන මට්ටමට නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සකස් කරපු සැලැස්මක් තුළින් අද කොළඹ නගරය ගංවතුර තත්ත්වයෙන් මුදා ගෙන තිබෙනවා. ඒ පිළිබඳව ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකු වූ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කෙරෙහි අපේ විශේෂ අවධානය යොමු කළ යුතු වනවා. විශාල ජලාශ පහක් සාදා කොළඹ නගරය සහ පාර්ලිමේන්තුව ජල ගැල්මෙන් බේරා ගැනීමට කටයුතු කිරීම පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වනවා. ගංවතුර පවතින කාල සීමාව තුළ අපි ඒ පිළිබඳව කෘතවේදීව සඳහන් කළ යුතු වනවා. එම නිසා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා, මෙන්න මෙවැනි දීර්ඝ කාලයක් පවතින සැලැස්මක් මඟින් මේ ප්‍රශ්නය විසඳීමට වහා කටයුතු කරන්න කියා. ඔබතුමන්ලා එසේ කරනු ඇතැයි කියාත් අපි බලාපොරොත්තු වනවා.

අද ගංවතුර තත්ත්වය ගැන කථා කරන ආණ්ඩුවේ ඇමතිවරු කියනවා, ඕනෑ තරම් සල්ලි තිබෙනවා කියලා. සල්ලි මොනවාටද වියදම් කරන්න ඕනෑ, කොහාටද සල්ලි දෙන්න ඕනෑ කියලා අහනකොට මංගල සමරවීර මුදල් ඇමතිතුමා එතුමාගේ ආසනයේ ඉඳගෙන කියනවා, රට මහා ණය උගුලක හිර වෙලා; රට නැවතත් ඉස්සරහට යන්න බැහැයි කියලා.

මේ අවස්ථාවේදී මා තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. පසුගිය දවස්වල මංගල සමරවීර ඇමතිතුමා මාධ්‍ය හරහා මේ සෑම තැනකදීම වාගේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් පිළිබඳව ප්‍රකාශ කරන්න යෙදුණා. එතුමා කිව්වා, මේ "වියත් මහ" නොවෙයි, "විපත් මහක්" කියලා. රටේ සල්ලි නැහැයි කිව්වා. ඒ සල්ලි ටික රාජපක්ෂ ආණ්ඩුව විසින් කාබාසිනියා කර දැම්මා කියලා මුදල් ඇමතිවරයා කියනවා. අනික් පැත්තෙන් හිටපු මුදල් ඇමතිවරයෙකු වූ මහින්ද රාජපක්ෂ මැතිතුමාට අභියෝග කරනවා,

එතුමාත් එක්ක විවාදයකට එන්න කියලා. ආණ්ඩු පාර්ශ්වය පැත්තෙන් ආණ්ඩුවේ ඇමතිවරු කියනවා, "ඕනෑ තරම් සල්ලි තිබෙනවා. අපි සල්ලි දෙන්නම්." කියලා. කිසිදු ගැළපීමක් නැති පරස්පර විරෝධී ප්‍රකාශ කරන මුදල් ඇමතිතුමාට අපි කියන්නේ මේකයි. එතුමා අරයාට මෙයාට අභියෝග කර කර ඉන්නේ නැතිව, "ඒ ණය, මේ ණය." කිය කියා ඉන්නේ නැතිව මුදල් ඇමතිකම භාර ගත්තා නම්, රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමා කියන විධියටම රට සහ ආර්ථිකය අනතුරේ හෙළන්නේ නැතිව තමන්ගේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන්න කියලා මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකතුමා වන රවි කරුණානායක මහතා කියනවා, "වැඩ බැරි ටාසන්ලා මෙවැනි තනතුරුවලට පත් කිරීම තුළින් රටේ ආර්ථිකය බරපතළ හානියකට පත් වෙලාය, මගේ කාලයේදී මම එහෙම කළේ නැහැයි." කියලා. එහෙම කළේ නැහැයි කියලා කියනකොට මේ සිටින මුදල් ඇමතිතුමා ඇවිල්ලා ආපහු අභියෝග කරනවා, වාද විවාදවලට එන්න කියලා. හිටපු මුදල් ඇමතිතුමාට, හිටපු ජනාධිපතිතුමාට ප්‍රසිද්ධියේ වාද විවාදවලට එන්න කියලා අභියෝග කරනවාට වැඩිය පුළුවන් නම් රවි කරුණානායක මහතාගේ කාලයේ දුන්නාය කියන සහන ටික හරි දෙන්න කියලායි මංගල සමරවීර මුදල් ඇමතිවරයාට අපි ප්‍රකාශ කරන්නේ. තමන්ට කරන්න පුළුවන් ටික කරලා ඕනෑ, අනිකුත් මිනිසුන්ට අත දික් කරන්න. එම නිසා ඉතාම අසාර්ථක ආකාරයට වැඩ කටයුතු කරන මුදල් ඇමතිවරයෙකු තමයි අද ඉන්නේ. රට බරපතළ ආර්ථික අගාධයකට ඇදිලා යන වෙලාවක රටේ ජනතාවට සත්‍ය තත්ත්වය කියන්නේ නැතිව "ඔක්කෝම කුණු බේරුවල බොක්කට" කියලා කියනවා වාගේ සියලු දේවල්වලට රාජපක්ෂ - රාජපක්ෂ කියන්නේ නැතිව මුදල් ඇමති ධුරය භාර ගත්තා නම්, ඒ භාර ගත් දේ හරියට කරන්න කියන අභියෝගය අපි මංගල සමරවීර මුදල් ඇමතිතුමාට කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විපත්තිදායක අවස්ථාවේ මේ තුළින් කිසිසේත්ම දේශපාලන වාසියක් ලබා ගැනීමේ අවශ්‍යතාවක් අපට නැහැ. අපි කිසිසේත් එය බලාපොරොත්තු වන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මේ විපත්තිදායක තත්ත්වයෙන් ජනතාව සහ රට ගලවා ගැනීම සඳහා රජය යම් ආකාරයක ක්‍රියා මාර්ගයක් ගන්නවා නම්, අපි ඒ සම්බන්ධව අපේ සහයෝගය ලබා දෙන්න සූදානම්. මේ සම්බන්ධයෙන් ජනතාවගේ පැත්තෙන් කල්පනා කරන මහජන නියෝජිතයින් හැටියට එවැනි ස්ථාවරයක අප සිටිය යුතුයි. හැබැයි, අලුතෙන් පත් වුණු ආපදා කළමනාකරණ ඇමතිතුමා බොහොම වේගයෙන් එහෙට මෙහෙට දුවලා පැනලා නිලධාරීන් දැනුවත් කරලා අවශ්‍ය කටයුතු කරන පෙර සැලසුමක් තිබෙනවා වාගේ දැනට නම් පෙනෙනවා. එම නිසා ඒ සම්බන්ධව අපි එතුමාට ශක්තිය ප්‍රාර්ථනය කරනවා. ගංවතුර නිසා සිදුවන ජීවිත හානිය අවම කර ගැනීම සඳහා එතුමා යම් ආකාරයක ක්‍රියා මාර්ගයක් ගත්තොත් එය ඉතාම හොඳ තත්ත්වයක් හැටියට අපි දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් විපත්තිදායක තත්ත්වයක් දැන් රට තුළ උද්ගත වෙමින් පවතිනවා. අද දකුණු පළාතේ, කරාපිටිය රෝහලේ කුඩා දරුවන් 11දෙනෙක් මියගිහින් තිබෙනවා. හඳුනා නොගත් වෛරසයක් නිසා කුඩා දරුවන් 11දෙනෙක් මියගිහින් තිබෙනවා. හරියට ආණ්ඩුවට හැදුණු ලෙඩේ වාගේ ලෙඩක් දකුණු පළාත තුළ බෝ වෙමින් පවතිනවා. මෙන්න මේ රෝගී තත්ත්වයෙන් රටේ ජනතාව සහ කුඩා දරුවන් මුදා ගැනීම සඳහාත්, අද ඇති වී තිබෙන පාරිසරික හානියෙන් රටේ ජනතාව මුදා ගැනීම සඳහාත් රජය දැඩි අවධානය යොමු කළ යුතු වෙනවා. මොකද, රටේ සිටින සෞඛ්‍ය ඇමතිතුමා ලෙඩුන් ගැන සොයා බලන එක ඇරෙන්න අනෙක් සියලු වැඩ ටික කරනවා. සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නවා; ඇවිල්ලා පම්පෝරි ගහලා යනවා. හැබැයි, දකුණේ ළමයි මැරෙනවා. කරාපිටිය රෝහලේ ළමයි 11දෙනෙක් මැරිලා තිබෙනවා! වෛරසයක්ද, බැක්ටීරියාවක්ද, දිලීරයක්ද කියලා තවම එය හඳුනාගෙන නැහැ. මොන ලෙඩක් නිසා මැරෙනවාද කියලා තවමත් හඳුනාගෙන නැහැ. හැබැයි, යුද්ධය පිළිබඳව, රණ විරුවන් පිළිබඳව, එල්ටීටීඊ ත්‍රස්තවාදීන් පිළිබඳව දෙන්න ඕනෑ සියලු බෙහෙත් අරගෙන ඇවිල්ලා කැබිනට් මාධ්‍ය ප්‍රකාශකයා හැටියට මාධ්‍ය හමු පවත්වලා, රටේ ඇති අතේ පැළෙවෙන සියලුම බොරු බෙගල් කියන සෞඛ්‍ය ඇමතිවරයෙක් සිටින රටක පුංචි දරුවන්ට දෙයියන්ගේම පිහිටයි! දැන් ලෙඩක්, රෝගයක් හැදුණාම දෙවියන් යදිනවා ඇරෙන්න රටේ ජනතාවට වෙන කරන්න දෙයක් නැහැ. මෙවැනි අදක්ෂ සෞඛ්‍ය ඇමතිවරයෙක් සිටින වට පිටාවක් තුළ රටේ ජනතාවගේ සෞඛ්‍යය වේගයෙන් පිරිහෙමින් පවතිනවා.

දැන් ගංවතුර නිසා විපත්තිදායක තත්ත්වයක් ඇති වෙමින් පවතිනවා. රජය එයට මුහුණ දිය යුතුව තිබෙනවා. ජනතාව බේරා ගැනීමේ වගකීමක් මේ ආණ්ඩුවට තිබෙනවා. මෙම විපත්තිදායක තත්ත්වයට ඉක්මන් සහ ක්ෂණික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම රජයේ වගකීමක්ය කියන කාරණය ප්‍රකාශ කරමින්, මට කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 4.48]

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and State Minister of Mahaweli Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පරිසරය සම්බන්ධව තිබෙන අණ පනත් පිළිබඳවත්, ඒ වාගේම අද ඇති වී තිබෙන ආපදා තත්ත්වය පිළිබඳවත් තමයි අද වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් වුණේ. ගංවතුර නිසා පසුගිය දා ජීවිතක්ෂයට පත් වුණු සියලුමදෙනා වෙනුවෙන්, මගේ කථාව ආරම්භයේදීම මම ශෝකය පළ කරනවා. ගංවතුරෙන් විපතට පත් වුණු, ආපදාවට ලක් වුණු ජනතාව වෙනුවෙනුත් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා වාගේම, ඒ අය එම විපත්තිදායක තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා විධියට දුම්න්ද දිසානායක ඇමතිතුමා කටයුතු කරන ආකාරය පිළිබඳවත් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. මම දන්නවා, මේ සිද්ධිය ඇති වුණු මොහොතේ එතුමා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් මැදිරියේ රාත්‍රී වන තෙක් ඉඳගෙන ඔවුන් මුදා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න විශාල උත්සාහයක් දැරුව බව. ඒ පිළිබඳවත් අපි සතුටු වෙනවා.

අද පරිසරය තුළ කර තිබෙන සමහර ක්‍රියාකාරකම් මෙම ගංවතුර ඇති වීමට බලපෑවාය කියන එක රහසක් නොවෙයි. අපි පරිසරයට යම් හානියක් කළොත්, එහි ප්‍රතිඵලය අපට පෙරළා ලැබෙන්න පටන් ගන්නවා. අපි සංවර්ධනයේ මුවාවෙන් අනවශ්‍ය විධියට කරන සමහර ගොඩ කිරීම් නිසාත්, ඒ වාගේම ඇළ මාර්ග අවහිර කිරීම නිසාත්, වැව්වල කොටස් අල්ලා ගැනීම නිසාත් අපට වැඩි වශයෙන් මේ තත්ත්වයන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

[ගරු මහින්ද අමරවීර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කෘෂිකර්ම අමාත්‍යාවරයා විධියට අපේ අමාත්‍යාංශයට ගිහිල්ලා බැලුවාම දැක්කා, දැනට බස්නාහිර පළාත තුළ පමණක් ඉඩම් ගොඩ කිරීම් 3,500කට වැඩි ප්‍රමාණයක් සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීම් ලැබී තිබෙන බව. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ගොවි ජනතාවගේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යොමු වෙන්න තිබෙන කාලයට වඩා වැඩි කාලයක් ඉඩම් ගොඩ කිරීම් පිළිබඳව සොයා බලන්නත්, කුඹුරු ගොඩ කිරීම් පිළිබඳව සොයා බලන්නත් සහ ඒවාට අනුමැතියන් ලබා දෙන්නත් යොමු වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒවා පිළිබඳ පූර්ණ වශයෙන් සැලකිලිමත් වෙලා ඉතාමත් සාධාරණ ඉල්ලීම් සඳහා පමණක් එම අයිතිය ලබා දෙන්නත්, අනිත් ඉඩම් ඉතුරු කරගන්නත් තමයි මම ඒ අයට උපදෙස් ලබා දුන්නේ. එම කුඹුරු ඉඩම් කුඹුරු වගාවන් සඳහා දියුණු කරගන්න බැරි වුණත්, ඒවා වගුරු බිම් විධියට තබා ගැනීම තුළ අපට මෙම ගංවතුර පාලනයට යම් පිළියමක් යොදාගන්න පුළුවන්කම ලැබෙනවා. අපේ ඇළ මාර්ග, ගංගාවල රක්ෂිත විශාල ප්‍රමාණයක් අල්ලාගෙන තිබෙනවා. එම නිසාම එහි ප්‍රතිඵල අනවසරයෙන් නිවාස සාදාගත් අයට, ව්‍යාපාර ගොඩනඟා ගත් අයට පළමුවෙන්ම ලැබෙන බවත් අපි පැහැදිලිව දන්නවා. ඒ නිසා ඉදිරියේදී මෙවා ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක් රජය මඟින් දියත් කළ යුතු වෙනවා. පරිසර අමාත්‍යාංශයත් මේ පිළිබඳව කටයුතු කරන්න අවශ්‍ය වෙනවා. පරිසර අමාත්‍යතුමා විධියට ජනාධිපතිතුමා පරිසරයට ආදරය කරමින්, අනවසර කටයුතුවලට කිසිදු ආකාරයක ඉඩක් ලබා දෙන්නේ නැතුව පරිසරය සංරක්ෂණය සඳහා විශාල වෙහෙස මහන්සියක් ගන්නා බව මා සිහිපත් කළ යුතු වෙනවා. ඒ වාගේම, අපේ ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා සඳහන් කළ සුබවාදී කාරණා පිළිබඳවත් අපි අවධානය යොමු කරනවා. එතුමා කියපු එක කාරණයක් තමයි, පසුගිය කාලයේ නියඟය තිබූ සමයේ ජලාශවල තත්ත්වය වැඩිදියුණු කරන්න කටයුතු කළා නම් හොඳයි කියන එක. මම සඳහන් කරන්න කැමැතියි, අපි ඒක පිළිගන්නවා වාගේම ඒ සඳහා යම් මැදිහත්වීමකුත් සිදු කරලා තිබෙන බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය කාලයේ ඇති වුණු නියඟය මේ රටේ මෑත ඉතිහාසයේ ඇති වුණු ලොකුම ඛේදවාචකයක්. අපි ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ; සාකච්ඡා කරන්නේ නැහැ. මේ නියඟය නිසා අපේ කෘෂි නිෂ්පාදන සියයට 30කට වැඩි ප්‍රමාණයක් අඩු වුණා. ඒ වාගේම, සහල් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වන්න අතිවිශාල මුදලක් වැය කරන්න මේ රජයට සිද්ධ වුණා. ඒ එක්කම අනෙක් පැත්තෙන් නියං සහනාධාර විධියට රුපියල් මිලියන 38,000ක් ගොවි ජනතාවට බෙදලා දෙන්න අපට සිද්ධ වුණා. නියං සහනාධාර විධියට ඉතිහාසයේ ගෙවපු ලොකුම වන්දි මුදල් ප්‍රමාණය මේ රජය ගෙව්වාය කියන එකත් අපි මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. එහෙම තත්ත්වයක් තුළ මිනිසුන්ට බඩගින්නේ ඉන්න දෙන්නේ නැතිව කන්න දීලා, මිනිසුන් මේ ආකාරයෙන් හෝ රැකබලා ගන්න පුළුවන්කම ලැබීම පිළිබඳවත් අපි ආඩම්බර වෙන්න ඕනෑ. බොහෝදෙනා මේ පිළිබඳව කථා වෙන්නේ නැහැ; සාකච්ඡා වෙන්නේ නැහැ. මෙය සාමාන්‍ය තත්ත්වයක් යටතේ තිබෙන තත්ත්වයක් නොවෙයි. මේ නියඟය නැති වුණා නම් අපේ ආර්ථික වර්ධන වේගය තවත් සියයට 3කින් විතර ලෙහෙසියෙන්ම වැඩි කරගන්න තිබුණා. මේ නියං තත්ත්වය තිබියදීත් 2017 අවුරුද්දේදී අපේ අපනයන ක්ෂේත්‍රයේ ඉතිහාසයේ වාර්තාගතම වැඩිවීම සිද්ධවීම පිළිබඳව මම ආඩම්බර වෙනවා. වාර්තාගත විධියට ඩොලර් බිලියන 15.1කට වැඩි අපනයන ආදායමක් අපට ලබා ගන්න පුළුවන් වුණා.

අපේ විදේශ සංචිතවල වැඩිවීමක් ඇති කරගන්නත් පුළුවන්කම ලැබුණා. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු මට්ටමක තියාගන්නත් මේ සියලු තත්ත්වයන් තුළ හැකියාවක් ලැබුණා කියන එක මම මේ ජාතික ආණ්ඩුවේ කටයුතු කරන අමාත්‍යාවරයෙක් විධියට ආඩම්බරයෙන් සඳහන් කරන්න ඕනෑ. සමහර වෙලාවට උදේට පත්තර ටික බැලුවාම, මාධ්‍යවල කථා ටික ඇහුවාම බොහෝ දෙනෙක් ලංකාව ගැන හිතන්නේ විශාලා මහනුවර වාගේ කිසිවක් නැති සම්පූර්ණයෙන් විනාශ වෙච්ච රටක් විධියටයි. නමුත්, එවැනි තත්ත්වයක් නොවෙයි මේ තිබෙන්නේ. මේ රටේ ප්‍රගතිය කරා ගිය අංශ විශාල ගණනක් තිබෙනවා. මත්ස්‍ය තහනම, GSP තහනම වැනි අපට තිබුණු විදේශ තහනම් ඉවත් කරගැනීම තුළිනුත්, අපි ඇති කරගත්ත ජාත්‍යන්තර බැඳීම් තුළිනුත් අපේ රටට විශාල ප්‍රගතියකට යන්න පුළුවන්කම ලැබුණා. මා පෙර නියෝජනය කළ ධීවර අමාත්‍යාංශය ඉතිහාසයේ වාර්තාගතම මත්ස්‍ය අපනයනය සිදු කළේ 2017 වර්ෂයේදියි. එහි සියයට 40කට වඩා වැඩිවීමක් අවුරුද්දක් තුළ ඇති කරගන්න පුළුවන්කම ලැබුණා. ඒවා මේ රජය ලබපු ජයග්‍රහණ. ඒ අතරේ ඉහළ වැටුප් වැඩිවීමක්, සමෘද්ධිය සඳහා දුන්න මුදල තුන් ගුණයකට ආසන්න ප්‍රමාණයක වැඩිවීමක්, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩුවීමක්, මහපොළ දීමනාව වැඩිවීමක් සහ අනෙකුත් සහනාධාර දීමනාත් වැඩිවීමක් සිදු වුණා මිසක් ඒවායේ කිසිදු කප්පාදුවක් නැතිව තමයි මේ තත්ත්වයන් කරා යන්න පුළුවන්කම ලැබුණේ.

දැන් ගංවතුරක් ආවා. මේ ගංවතුරේදී මාධ්‍ය ආයතන කටයුතු කරන ආකාරය පිළිබඳව මම සතුටු වෙනවා. ඔවුන් බොහොම උනන්දුවෙන් මේවා පිළිබඳව වාර්තා කරනවා; අඩු පාඩු තිබෙන තැන් පෙන්වා දෙනවා. නමුත්, අපට කියන්න පුළුවන් මේ ගංවතුර එන තත්ත්වය පිළිබඳව සැලසුම් සහගතව කටයුතු කරපු නිසා තමයි එයට සාර්ථකව මුහුණ දෙන්න අපට පුළුවන් වුණේ කියලා. මම ආපදා කළමනාකරණ අමාත්‍යාවරයා විධියට ඉන්න කාලයේ අපි පෙර සූදානම් පිළිබඳව විශාල උනන්දුවක් දැක්වූවා; ආපදා අවම කිරීම සඳහා කළ යුතු වැඩසටහන්වලට විශාල උනන්දුවක් දැක්වූවා.

ඒ කාලය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රතිඵලයක් විධියට, දැවැන්ත ගංවතුරක් ඇති වුණත්, ජීවිත හානිය මේ මට්ටමින් අවම කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. සිදුවී තිබෙන ජීවිත හානිවලින් වැඩි ප්‍රමාණයක් විදුලි සැර වැදීමෙන් සිදු වුණු ඒවායි. ලබා දුන් උපදෙස් පිළිනොපැදීම නිසා තමයි මේ ජීවිත හානි ප්‍රමාණය හෝ සිද්ධ වුණේ. වෙන රටක මෙවැනි තත්ත්වයක් ඇති වුණා නම් මීට වඩා විශාල ජීවිත හානි ප්‍රමාණයක් සිද්ධ වෙන්න ඉඩ තිබුණා. අපේ ආරක්ෂක අංශ -ත්‍රිවිධ හමුදාව-කණ්ඩායම් විධියට මේ සඳහා පත් කරලා, ඒ අයට පුහුණුවක් ලබා දීලා, ඒ අයට අවශ්‍ය පහසුකම් ලබා දීලා, ක්ෂණිකව මේ මැදිහත් වීමට උපදෙස් ලබා දී තිබුණු නිසා මේ ප්‍රමාණයෙන් ජීවිත හානිය අවම කර ගැනීමට පුළුවන්කම ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ එක්කම මේ සියලු හානිවලට වන්දි ලබා දීම දැන් ආරම්භ කරලා තිබෙනවා. මේ රජය බලයට පත් වීමෙන් පසුව ලබා දෙන වන්දි මුදල් විශාල වශයෙන් වැඩි කළා. මම ආපදා කළමනාකරණ අමාත්‍යාවරයා විධියට සිටි කාලයේ මෙවැනි ආපදාවකදී කවුරු හෝ මැරුණොත් අපි ලබා දුන්නේ රුපියල් 15,000යි. රුපියල් 15,000ක් තමයි අපට උපරිම ලබා දෙන්න පුළුවන් වුණේ. දැන් ඒක රුපියල් ලක්ෂය දක්වා වැඩි කරලා තිබෙනවා. විශේෂ අවස්ථාවලදී ඊටත් වැඩිය ලබා දෙන්න පුළුවන්. ඒ කාලයේ ගෙයක් කැඩුණාම අපි උපරිම වශයෙන් ලබා දුන්නේ රුපියල් ලක්ෂයයි. දැන් ගෙවල්වලට වන්දි වශයෙන් රුපියල් ලක්ෂ 25ක් ලබා දුන් අවස්ථාත් තිබෙනවා. නිවස තක්සේරු කරලා වන්දි මුදල ලබා දෙනවා. මම ආපදා

කළමනාකරණ අමාත්‍යවරයා විධියට හිටපු කාලයේ මුළු රටම රක්ෂණය කරන්න යෝජනාවක් හැදුවා. නමුත් මට එය ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. ඒකට විවිධ බාධා ඇති වුණා. නමුත් මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව එම රක්ෂණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. රක්ෂණ වාරික මුදල ජනතාවගෙන් අය කරන්නේ නැතිව රජය විසින් එම මුදල ලබා දීලා, එදා වන්දි වශයෙන් ලබා දුන් රුපියල් ලක්ෂය වෙනුවට අද නිවාසවලට, ව්‍යාපාරික ස්ථානවලට රුපියල් ලක්ෂ 25ට වැඩි වන්දි මුදලක් ලබා දෙන මට්ටමට එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. මේ ආණ්ඩුව ඒ වගකීම භාරගෙන කටයුතු කරපු නිසායි අපට ඒ තත්ත්වයට එන්න පුළුවන්කම ලැබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වන විට මුහුදේ රළු ස්වභාවයක් ඇති වෙලා තිබෙනවා. ධීවර කර්මාන්තය සඳහා මුහුදු ගිහින් මැරුණු අය ඉන්නවා. ඒ අයට කලින් ලබා දුන්නේ රුපියල් 15,000යි. දැන් ඒ අයට රුපියල් ලක්ෂ 10ක රක්ෂණයක් රජය මඟින් ලබා දී තිබෙනවා. ධීවර කර්මාන්තයේ යෙදෙන සියලු දෙනා රජය විසින් රක්ෂණය කරලා තිබෙනවා. ධීවර කර්මාන්තයේ යෙදී සිටියදී ජීවිත හානියක් වුණොත් රුපියල් ලක්ෂ 10ක් බැගින් ඔවුන්ට ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම කෘෂි රක්ෂණ ක්‍රමයක් අපි ඇති කරලා තිබෙනවා. කලින් එහි වන්දි මුදල වශයෙන් තිබුණේ රුපියල් 10,000යි. ඒකට මිනිසුන්ගෙන් මුදල් අය කළා. දැන් මිනිසුන්ගෙන් මුදල් අය කරන්නේ නැතිව රජය මඟින් ඒ අය රක්ෂණය කරලා හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂයක රක්ෂණාවරණයක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව මේ වන විට මේ රජය දැවැන්ත වැඩ පිළිවෙළ රාශියක් දැනට ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ඊළඟට, රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා වැව් පිළිබඳව කිව්වා. පසුගිය කාලයේ වැව් සකස් කිරීමට විශාල මුදලක් වියදම් කළා; වැඩ කළා. නමුත් අවසානාවට ඒ කටයුතු පිළිබඳව ප්‍රචාරය කරන්න බැරි වුණා. මේ රජයේ තිබෙන ලොකුම දුර්වලකම, ලොකුම අඩුපාඩුව තමයි කරපු හොඳ වැඩ ටික ප්‍රචාරය කර ගැනීමට නොහැකි වීම. කරපු හොඳ වැඩ ටික ජනතාවට ඒත්තු ගන්වන්නට බැරි වීම අතින් මේ රජය failed කියලා මට කියන්න පුළුවන්. මාධ්‍ය හැසිරවීම අතින් අපි failed. ජනතාවට මේ තත්ත්වය පැහැදිලි කරලා දෙන්න අපට බැරි වුණා. මේ කාලය ඇතුළත දැවැන්ත නියහයක් තිබුණා. ගංවතුර එක වතාවකුත් ආවා. විශාල හානියක් සිද්ධ වුණා. මේ වතාවේත් ගංවතුර ඇවිත්. මේ ස්වභාවික විපත් සියල්ල මධ්‍යයේ කරපු වැඩසටහන් පිළිබඳව, ළඟා කර ගත් ප්‍රගතීන් පිළිබඳව අපට කියන්න බැරි වුණා; ජනතාවට ඒත්තු ගන්වන්න බැරි වුණා. ඒ අතින් මේ රජය failed කියන එක මට නැවතත් සඳහන් කරන්න සිද්ධ වෙනවා. ඒ වාගේම අපි මේ අවුරුද්දේත් අවම වශයෙන් වැව් 1,000ක් ප්‍රතිසංස්කරණය කිරීමට සූදානම් කරලා තිබෙනවා කියන කරුණත් මම කියන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු මහින්ද අමරවීර)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉක්මනින් අවසන් කරන්නම්. මේ අවුරුද්දේ අවම වශයෙන් වැව් 1,000ක් ප්‍රතිසංස්කරණය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ලබන අවුරුද්දේ වැව් 5,000ක් ප්‍රතිසංස්කරණය කර එක පැත්තකින් ගංවතුරට ඔරොත්තු දෙන ආකාරයට ජලය රැස් කරන්නත්, අනෙක් පැත්තෙන් අපේ වගා ව්‍යාපෘතියට වැඩි අවධානයක් ලබා දී කටයුතු කරන්නත් අපි සූදානම් බව මම සිහිපත් කරන්න කැමැතියි.

මම මීට වැඩි යමක් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපි මේ අභියෝගවලට මුහුණ දෙනවා. නියඟයට මුහුණ දුන්නා වාගේම, ගංවතුරෙන් වන මේ සියලු හානිවලට රජය විධියට දෙන්න පුළුවන් සියලුම සහනාධාර උපරිම වශයෙන් ඒ ජනතාවට ලබා දෙන්න අපි කටයුතු කරන බව සිහිපත් කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[ප.ප. 5.02]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(මාණ්පුමිකු කවීන්දිරන් කෝඩීස්වරන්)
(The Hon. Kaveendiran Kodeeswaran)
සභාපක්ෂයේ තලෙමෙතාංගුකින්ර කෙළරව කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළේ, இன்றைய தினம் தேசிய சூழல் சட்டத்தின் கீழான கட்டளைகள் தொடர்பாக நடைபெறுகின்ற விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு எனக்கு இந்தச் சந்தர்ப்பத்தை வழங்கியமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்று இந்த நாட்டிலே இருக்கின்ற மிக முக்கிய பிரச்சினைகளில் ஒன்றாக இருப்பது சுற்றாடல் பாதிக்கப்படுகின்ற பிரச்சினை. தேசிய சுற்றாடல் பாதுகாப்பு என்பது, தேசிய ரீதியான பல ஆக்கபூர்வமான செயற்பாடுகளுக்கு உறுதுணையாக இருக்கின்ற அதேநேரத்தில், தேசியச் சுற்றாடலைச் சரிவர செயற்படுத்தாமல் விடுகின்றபொழுது, நாட்டில் பலதரப்பட்ட அழிவுகள் ஏற்படுவதற்கான வாய்ப்பு ஏற்படுகின்றது. அந்த வகையில், சுற்றாடலைப் பாதுகாப்பதனூடாக இந்த நாட்டிலே வாழுகின்ற பெறுமதிமிக்க மனித வளங்களையும் இந்த நாட்டையும் நெறிப்படுத்தலாம். அந்த வகையில் இந்த அரசாங்கமானது சுற்றாடலில் ஏற்படுகின்ற பிரச்சினைகளை மற்றும் அதன் விளைவாக ஏற்படுகின்ற அனர்த்தங்களைத் தவிர்ப்பது சம்பந்தமான ஒரு திட்ட வரைவை - சரியானதொரு கொள்கையை நெறிப்படுத்த வேண்டும். எதிர்காலத்தை மையப்படுத்தி, நீண்டகால செயற்பாட்டின் அடிப்படையில், நாட்டு மக்களுக்குப் பிரயோசனப்படக்கூடிய வகையில், சுற்றுச்சூழல் சம்பந்தமான mechanism - நெறிப்படுத்தல்கள் செயற்படுத்தப்பட வேண்டும். ஆனால், இந்த நாட்டிலே அப்படியான ஒரு நிலைமை இன்று காணப்படாமல் இருப்பது மிகவும் கவலைக்கும் வேதனைக்குமுரிய ஒரு விடயமாக இருக்கின்றது.

இன்று எமது சனாதிபதி அவர்கள் இந்த அமைச்சிலே பிரதான பங்கு வகிக்கின்றார். இருந்தபோதிலும் விசேடமாக கிழக்கு மாகாணத்திலே சுற்றாடல் தொடர்பில் பலதரப்பட்ட பிரச்சினைகள் ஏற்படுகின்றன. அதிலும் குறிப்பாக, அண்மையில் அம்பாறை மாவட்டத்தில் கனிய வள அகழ்வை மேற்கொள்வதற்காக ஒரு வெளிநாட்டு நிறுவனமான Damsila (Pvt) Limited என்கின்ற அவுஸ்திரேலியக் கம்பனி உள்வாங்கப்பட்டிருக்கிறது. இந்தக் கம்பனி திருக்கோவில், பொத்துவில், அக்கரைப்பற்று, ஒலுவில் போன்ற பிரதேசங்களில் கனிய வளங்களை அகழ்வதற்கான ஆரம்ப நடவடிக்கைகளை மேற்கொண்டிருக்கிறது. மேற்குறிப்பிட்ட பிரதேசங்களில் 'இல்மனைட்', 'சேர்க்கோன்' போன்ற மிகவும் பெறுமதியான கனிய வளங்கள் இருக்கின்றன. இந்தக் கனிய வளங்களை அந்த நிறுவனங்கள் சூறையாடுகின்றபோது - குறித்த நிறுவனங்களுக்கு அந்த அகழ்வை

[ගරු කවීන්දිරන් කෝඩීශ්වරන් මහතා]

மேற்கொள்வதற்கான அனுமதியை வழங்குகின்றபோது, அந்தப் பிரதேசங்களில் ஏற்படக்கூடிய அனர்த்தம் என்பது மிகவும் பாரதூரமானதாகவும் பாரிய விளைவுகளை ஏற்படுத்துவனவாகவும் இருக்கும். சுனாமி அனர்த்தம் ஏற்பட்ட போது, அந்தப் பிரதேசத்தைப் பாதுகாத்தது மண் மேடுகளும் மண் திட்டுகளுமேயாகும். இன்று அங்கு கடற்கரையோரமாக 150 மீற்றர் நீள, அகலத்துக்கு அந்தக் கனிய வளங்கள் அனைத்தும் அகழப்படுகின்றபொழுது இன்னுமொரு சுனாமி அனர்த்தம் ஏற்பட்டு, மக்கள் பாதிப்படைந்து அதிகளவான உயிரிழப்புக்கள் ஏற்படக்கூடும்.

அதுமட்டுமல்ல, அந்த இடத்திலே மீனவத் தொழில் செய்கின்றவர்களின் வாழ்வாதாரம் பாதிக்கப்படக்கூடியதாக இருக்கும். மேலும், உல்லாசப் பிரயாணத்துறை தொடர்பான நடவடிக்கைகள் பாதிக்கப்படக்கூடியதாக இருக்கும். அதேபோல், விவசாய நிலங்கள் - வயல் நிலங்கள் - உவர் நிலங்களாக மாறும். அதாவது, நன்னீர் - குடிநீர் - உப்பு நீராக மாறுகின்ற செயற்பாடிருக்கும். மிகவும் முக்கியமாக, அந்த இடத்திலிருக்கின்ற மரம், செடி, கொடிகள் அனைத்தும் அழிவடைந்து, 10 வருடங்களின் பின் அந்த இடம் ஒரு மயானமாக, ஒரு பாலைவனமாகக் காட்சியளிக்கக்கூடிய ஒரு சந்தர்ப்பம் ஏற்படும். மேலும், அந்த இடத்திலேயிருக்கின்ற மூலிகைத் தாவரங்கள், அதேபோல் கண்டல் தாவரங்களும் ஏனைய வளங்களும் அழிவடைகின்ற நிலை ஏற்படும். ஆகவே, அங்கு கரையோரப் பிரதேசத்தை அண்மித்து வாழ்கின்ற மக்கள் எதிர்காலத்திலே மிகவும் பாரதூரமான ஒரு பிரச்சினைக்கு முகங்கொடுக்கக்கூடிய ஒரு நிலை ஏற்படும் என்பதை இந்த உயரிய சபையில் நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அதற்கெதிராக அந்த இடத்திலேயிருக்கின்ற ஆயிரக் கணக்கான மக்கள் முன்னர் பல தடவைகள் போராட்டங்களை நடத்தியிருக்கின்றார்கள்; பல எதிர்ப்புக்களை மேற்கொண் டிருக்கின்றார்கள். இந்த அரசுக்கும் மக்கள் ஒரு பாடத்தைப் புகட்டுகின்ற நிலைமை ஏற்படக்கூடாது. அந்த மக்களின் வாழ்க்கையில் நீங்கள் விளையாட வேண்டாம் என்றுதான் இந்தச் சபையில் சொல்ல விரும்புகின்றேன். 10 வருடங்களின் பின் அந்தப் பிரதேசம் மயானமாகக் காட்சியளித்து, அங்கு யாரும் நடமாட முடியாத ஒரு துர்ப்பாக்கிய நிலையைத் தவிர்க்க வேண்டும். ஆகவே, சுற்றுச் சூழல் சம்பந்தமான சரியான ஒரு நிலைப்பாடு இல்லாமல், அதற்கான அறிக்கைகளை வெளியிடாமல், அந்த இடத்திலே 'இல்மனைற்' மண் அகழப்படுகின்ற செயற்பாடு தடுத்து நிறுத்தப்பட வேண்டும். அந்த மாவட்டத்திலேயிருக்கின்ற மக்களுக்குச் சாவுமணி அடிக்கின்ற ஒன்றாகத்தான் 'இல்மனைற்' அகழ்கின்ற செயற்பாடிருக்கும். ஆகவே, இந்த நிலையை இந்த அரசு கவனத்திலெடுத்து, அந்த இடத்திலே 'இல்மனைற்' அகழ்கின்ற செயற்பாட்டை உடனடியாகத் தடுத்து நிறுத்தவேண்டுமென்று அதிமேதகு ஜனாதிபதி அவர்களிடம் அன்பாகவும் தயவாகவும் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், அங்கு 'இல்மனைற்' மண் அகழ்வினை மேற்கொள்கின்றபோது மண்ணரிப்புக்கள் கூடுதலாக ஏற்படும். மண்ணரிப்புக்கள் கூடுதலாக ஏற்படுகின்றபோது, அங்கே யிருக்கின்ற எங்களது பெறுமதிமிக்க காணிகள் மற்றும் வளங்கள், கோவில்கள் அனைத்தையும் கடல் அரித்துக் கொண்டு போகின்ற நிலைமைதான் ஏற்படும். அண்மையிலே அமைச்சர் சுவாமிநாதன் ஐயா அவர்கள் அந்தப் பிரதேசத்திற்கு வந்திருந்தார். திருக்கோவில் பிரதேசத்தில் எவ்வளவுதூரம் கடலரிப்பு ஏற்பட்டுள்ளது என்பதை அவர்கூடப் பார்த்திருப்பார். அப்படிப்பட்ட பிரதேசம் கடலரிப்புக்குட்பட்டு, எமது நிலங்கள் கிட்டத்தட்ட 200 மீற்றர் அளவு உள்வாங்கப்பட்டுள்ளன. இதனால் அங்குள்ள மண் compacted volume இல்லாத மண்ணாக மாறும். அப்படிப்பட்ட ஒரு செயற்பாடு நிகழும் என்றால், கூடுதலான மண்ணரிப்பு ஏற்படும்; அதனால் எமது மக்கள் கூடுதலாகப் பாதிக்கப்படுவார்கள்.

அத்தோடு, அங்கு மிகவும் முக்கியமானதாக இருக்கின்ற பெரிய களப்பு அங்கிருக்கின்ற மீனவர்களால் கூடுதலாகப் பயன்படுத்தப்பட்டு வருகின்றது. கிட்டத்தட்ட 12,000 மீனவர்கள் அந்தக் களப்பிலே மீன்பிடிக்கின்றார்கள். ஆனால், இன்று அந்தக் களப்பை ஆக்கிரமிக்கின்ற, அதனை மண்போட்டு நிரப்புகின்ற செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. அங்கு மண்ணை நிரப்புகின்ற - களப்பை மூடுகின்ற இந்தச் செயற்பாடு மீனவர்களுக்கெதிரான ஒன்றாக இருக்கின்றது. இதனால் அவர்களின் தொழில் பாதிக்கப்படக்கூடிய ஒரு வாய்ப்பு உண்டு. இந்த மண் நிரப்புகின்ற செயற்பாட்டினை உடனடியாக நிறுத்த வேண்டும். அதேநேரம் இந்த அரசாங்கம் அந்தக் களப்புக்குரிய எல்லையைச் சரியான முறையிலே வரையறுத்துக் கொள்ள வேண்டுமென்பதையும் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இப்போது நாங்கள் வெள்ளப்பெருக்கினால் ஏற்படுகின்ற அனர்த்தம் மற்றும் உயிரிழப்புக்களைப் பற்றிக் கதைத்துக் கொண்டிருக்கின்றோம். இன்று அப்படியான உயிரிழப்புக்களும் மற்றும் வெள்ளம் முதலிய அனர்த்தங்களும் ஏன் ஏற்படுகின்றதென்றால், அநேகமான பள்ளமான நிலங்கள் மற்றும் ஆறுகள், களப்புக்கள் மூடப்படுகின்றமையினாலாகும். களப்புக்கள் மூடப்படுவதனால் ஏற்படுகின்ற அனர்த்தத்தின்மூலம் மக்கள் கூடுதலாகப் பாதிப்படைவார்கள்; வீடு வளவுகள் அனைத்தும் அமிழ்ந்து போகின்ற ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்படும். ஆகவே, இதனைக் கருத்திற்கொண்டு அந்தக் களப்பைப் பாதுகாப்பதற்கான நடவடிக்கையை அரசு முன்னெடுக்க வேண்டும் என்றும் இந்த உயரிய சபையிலே கேட்டுக் கொள்ள விரும்புகின்றேன். இந்தப் பிரச்சினை அம்பாறை மாவட்டத்திலே மட்டுமல்ல வடக்கு, கிழக்கெங்கிலும் கூடுதலாகக் காணப்படுவது குறிப்பிடத்தக்கது.

மேலும், 2010, 2011ஆம் ஆண்டுகளிலே அரசாங்கமானது அந்தப் பிரதேசங்களில் இருக்கின்ற பிரதேச செயலாளர்களுடனோ, அரசாங்க அதிபருடனோ, விவசாய அமைப்புக்களுடனோ, நீர்ப்பாசனத் திணைக்களத்திடமோ கலந்தாலோசிக்காமல் வனவள எல்லைகளைக் கொழும்பிலிருந்து நிர்ணயித்துள்ளது. இது பாரதூரமான ஒரு செயற்பாடாகும். இவ்வாறு எல்லைகள் நிர்ணயிக்கப் பட்டதன்மூலம் எமது மக்களின் காணிகள் forest காணியாக மாற்றப்பட்டுள்ளது. "விவசாய உற்பத்தியை மேற்கொள்ள வேண்டும்; விளைச்சலை அதிகரிக்க வேண்டும். விவசாயத்தைச் சரியான முறையிலே மேற்கொண்டால்தான் நாட்டை வழிப்படுத்தலாம்" என்று இன்று வலுவான குரல்கள் எழுப்பப்படுகின்ற நிலையில், எங்களது பிரதேசமான அம்பாறை மாவட்டத்திலே கூடுதலான வயல் நிலங்கள் மற்றும் பெறுமதிமிக்க காணிகள் Forest Department இனால் ஆக்கிரமிக்கப்பட்டிருக்கின்றன; எல்லைகள் உள்வாங்கப் பட்டிருக்கின்றன. ஆகவே, இந்த எல்லைகளை உடனடியாக மீள்பரிசீலனை செய்து, மீளமைக்க வேண்டுமென்றும் இந்த சபையில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
உறுப்பினர் அவர்களே, உங்களது உரையை முடித்துக் கொள்ள வேண்டும்.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
குறித்த காணிகளில் வனவளப் பாதுகாப்புத் திணைக்களம் இட்ட எல்லைகளாக இருக்கலாம், அல்லது ஏனைய தரப்பினால் இப்பட்டட்ட எல்லைகளாக இருக்கலாம், எதுவாக இருந்தாலும் சம்பந்தப்பட்ட மக்களின் மற்றும் பிரதேச செயலாளர், பிரதேச சபை, அரசாங்க அதிபர் மற்றும் சம்பந்தப்பட்ட ஏனைய அதிகாரிகளின் அனுமதி இல்லாமல் மேற்கொள்ளப்பட்ட எல்லை நிர்ணயம் பிழையானதாகத்தான் கருதப்படும். ஆகவே, இதனைக் கருத்திற்கொண்டு, குறித்த இடங்களில் சரியான எல்லைகளையிட்டு, சம்பந்தப்பட்ட மக்களுடைய காணிகள் அவர்களுக்கு மீண்டும் வழங்கப்பட வேண்டுமென்று இந்த உயரிய சபையிலே கேட்டு, எனது உரையை முடித்துக் கொள்ளகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நன்றி. அடுத்து, கௌரவ வேலு குமார் அவர்கள்!

[பி.ப. 5.16]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தேசிய சூழல் சட்டத்தின் கீழான கட்டளைகள் தொடர்பாக இடம்பெறுகின்ற இந்த விவாதத்திலே உரையாற்றுவதற்கான வாய்ப்பைத் தந்தமைக்கு நன்றி கூறிக்கொள்கின்றேன். குறிப்பாக, நாட்டினது பெரும் பகுதிகளிலே இயற்கை அனர்த்தம் ஏற்பட்டுள்ள இந்த நேரத்திலே சுற்றாடல் தொடர்பான எங்களது கருத்துக்களை முன்வைக்க வாய்ப்புக் கிடைத்திருப்பதை முக்கியமானதாகக் கருதுகின்றேன்.

கண்டி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினரென்ற வகையிலே ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, கண்டி மாவட்டத்தினுடைய தோட்டப் பிரதேசங்களானது குறிப்பாக நக்கில்ஸ் மலைத்தொடரினை அண்மித்ததாக அல்லது அந்த மலைத்தொடரின் அடிவாரத்தில் அமைந்துள்ளன. அவ்வாறான தோட்டங்களின் பெரும்பகுதி அரசுக்குச் சொந்தமான அரச பெருந்தோட்ட யாக்கம், மக்கள் தோட்ட அபிவிருத்திச் சபை, அதேபோல Elkaduwa Plantations Limited ஆகிய நிறுவனங்களுக்கு உரித்தானதாக இருக்கின்றது. இந்த 3 அரச தோட்ட நிறுவனங்களையும் எடுத்துநோக்குவோமாக இருந்தால், கடந்த காலம் முழுவதும் இவை மிகுந்த ஊழல் மிக்க, அரசியல் மயமாக்கப்பட்ட நிறுவனங்களாக இருந்திருக்கின்றன. கடந்த காலங்களிலே COPE குழுவுக்கு முன்வைக்கப்பட்ட கணக்காய்வு அறிக்கைகளில்கூட இவற்றிலே இடம்பெற்ற ஊழல்கள் இனங்காணப்பட்டமை பற்றிக் குறிப்பிடப்பட்டிருந்தாலும் அவற்றுக்குத் தீர்வு காணமுடியாத இழுபறியான நிலையே காணப்படுகின்றது. இந்த ஒவ்வொரு நிறுவனத்தின் சபையிலும் அந்தந்தக் காலப்பகுதியிலிருந்த தலைவர்கள் நிறைவேற்றதிகாரம் கொண்டவர்களாக இருந்தனர். சம்பந்தப்பட்டவர்களால் மேற்கொள்ளப்பட்ட ஊழல்களால் பல மில்லியன் ரூபாய் அரச நிதி சூறையாடப்பட்டிருக்கின்றது; அரச நிலங்கள் சூறையாடப்பட்டிருக்கின்றன. ஆகவே, இந்த நிலையினைத் தடுத்து, பாரிய நட்டத்தில் இருக்கின்ற இந்தத் தாபனங்களை இந்த அரசு கட்டியெழுப்பும் என்ற அடிப்படையிலே அந்தப் பகுதியிலிருக்கின்ற மக்களினது ஆசீர்வாதத்தை, வாக்குகளைப் பெற்று இந்த அரசு உருவாக்கப்பட்டது. ஆனால், இந்த 3 நிறுவனங்களின் சபைகள், தலைமைகள் கடந்த காலங்களில் எவ்வாறான செயற்பாடுகளில் ஈடுபட்டார்களோ அதைவிட அதிகமான செயற்பாடுகள் கடந்த மூன்று வருட காலத்திலே இந்த நிறுவனங்களில் இடம்பெற்றிருக்கின்றன.

இலங்கையினுடைய சுற்றாடல் தொடர்பாகப் பேசுகின்றபோது, அதில் மிக முக்கியமான பங்கு வகிக்கக்கூடிய நக்கிள்ஸ் மலைத்தொடருடன் சேர்ந்த மலைப்பாங்கான பிரதேசமாக இருக்கின்ற கண்டி மாவட்டத்தில், தோட்டங்கள் அமைந்திருக்கின்ற பிரதேசங்களில் உள்ள தோட்டங்கள் கூறுகளாக்கப்பட்டு - துண்டுகளாக்கப்பட்டு இன்றைய நாட்களிலே பல்வேறு தனிநபர்களுக்கும் நிறுவனங்களுக்கும் விற்பனை செய்யப்படுகின்ற ஒரு செயற்பாடு முன்னெடுக்கப்பட்டு வருவது குறித்துக் குறிப்பிடாமலிருக்க முடியாது. குறித்த விடயத்துக்குப் பொறுப்பாக இருந்த அமைச்சர் மாண்புமிகு கபீர் ஹாஷீம் அவர்களிடம் கடந்த காலத்திலே இது தொடர்பாக நான் முறைப்பாடு செய்திருந்தேன். ஆனாலும்கூட அதுதொடர்பில் ஆக்கபூர்வமான செயற்பாடுகள் எடுக்கப்பட்டதா? என்பது கேள்விக்குறியாக இருக்கின்றது. இந்தச் செயற்பாட்டினால், ஒருபுறம் தோட்டங்களிலே வாழ்கின்ற மக்களினது அடிப்படைத் தேவையான அவர்களது இருப்பிடங்கள், வாழ்வாதாரமாக இருக்கின்ற தோட்டங்கள் சூறையாடப்படுகின்றன, மற்றும் அவர்களுக்கு நாளைய நாளிலே தனி வீடுகள் அமைத்துக் கொடுக்கப்படுவதற்கு இருக்கின்ற வாய்ப்புகள் இழக்கப்படுகின்றன. மறுபுறம், இலங்கையினுடைய சுற்றாடல் முழுமையாகப் பாதிப்புக்குள்ளாகின்ற நிலைமை காணப்படுகின்றது.

இன்று கண்டி நகருக்கு மிக அண்மையில் இருக்கின்ற மக்கள் தோட்ட அபிவிருத்தி சபைக்குச் சொந்தமான அந்தானைத் தோட்டத்தைப் பொறுத்தவரையில், கடந்த 3 வருட காலத்தினுள் அந்தத் தோட்டத்தினுடைய 5ஆம் கட்டை என்ற இடத்திலே, அதேபோல ரொப் டிவிசன், கலாகுறூப் போன்ற இடங்களிலே பல குடும்பங்கள் மண்சரிவு அபாயத்தை எதிர்நோக்கியிருக்கின்றன. இதுதொடர்பாக உரிய சபைக்கு, உரிய அமைச்சுக்கு நாம் தகவல்களைக் கொடுத்திருக்கின்றோம். இருந்தபோதிலும் இன்று இந்த அனர்த்தங்களை எதிர்நோக்குபவர்கள் தொடர்பாக எந்தவிதமான கவனமும் செலுத்தாது, அந்தானைத் தோட்டப் பகுதியிலே காணிகளை விற்பனை செய்கின்ற ஒரு நிலைமை காணப்படுகின்றது.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වන විට ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයිති හන්තාන වතු යායේ පරිපාලනය විසින් වත්තේ සීමිත කොටස් ප්‍රමාණයක් යම් යම් සමාගම්වලට, පුද්ගලයන්ට විකිණීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙන බව අපි දකිනවා. හන්තාන වත්තේ විශේෂ පාරිසරික වැදගත්කමක් තිබෙන අක්කර 15ක පමණ විශාල කුරුළු කැලේ කියන ප්‍රදේශය පසු ගිය කාලයේ යම් කිසි සමාගමකට ලබා දීමට කටයුතු කළා. පරිසර හේතූන් මත ඒක නතර කරලා තිබුණා. නමුත් දැනට මාස කිහිපයකට පෙර එම අක්කර 15 සමඟ තවත් අක්කර 10ක් එකතු කරලා යම් කිසි පුද්ගලයකුට ලබා දීමට ජනතා වතු සංවර්ධන

[ගරු වෙලු කුමාර් මහතා]

මණ්ඩලය කටයුතු කර තිබෙනවා. නමුත් මේ වත්තේ ලයින් කාමර තුළ හිරවෙලා ඉන්න ජනතාවට ලබා දෙන්නම් කියලා පොරොන්දු වුණු පර්චස් 8, ඒ වාගේම ඒ ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා ලබා දීමට එකඟ වුණු ඉඩම් ප්‍රමාණය ලබා දීමට කටයුතු කරලා නැහැ. ඒ වෙනුවට විශේෂ ආරක්ෂක කණ්ඩායමක් යොදලා ඒ ලයින් කාමරවලට වැසිකිළියක්වත් සාදා ගන්නට ඉඩකඩ ලබා දෙන්නේ නැහැ. ලයින් කාමරවල ජීවත් වන ජනතාවගේ මළ ගෙදරක් වුණාම ඒ සඳහා තාවකාලික හට් එකක් තනා ගන්න ගියාම මේ ආරක්ෂක නිලධාරීන් ගිහිල්ලා ඒ වෙනුවෙන් මැදිහත්වෙලා කටයුතු කරනවා. දැන් මේ වන විට අලුත් අමාත්‍යාංශ භාර දී තිබෙනවා. අලුත් අමාත්‍යාංශ භාර දීමේදී මේ අමාත්‍යාංශය ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමාටයි භාර දී තිබෙන්නේ. ඒ නිසා පසු ගිය කාලය පුරා සිදු වුණු සිදුවීම් පිළිබඳව අවධානය යොමු කරලා, ඒවා ගැන විශේෂ විමර්ශනයක් කරන්නය කියලා මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

එමනු ඉන්දක් කෝරික්කෙකළෙ නිරෙවේට්රාදපට්සත්දිල් අදුත්දුවරුකින්ර ඉරුසිල නාට්කළිලේ ඉන්ද මක්කළෙප් පාදෙයිලේ ඉරක්කි අන්ද මක්කළින් නියායත්දිර්කාකප් පෝරාදවේන්දිය නිලෙමෙ ඒර්පදුම්. ඉරුසිල දනිමනිදර්කළ් දංකළුක්කු අරස ආදරවු ඉරුක්කින්රදු එන්පදාල්, දංකළින් වරුමානත්දිර්කාකවුම් දංකළෙ වළර්ත්දුක්කොල්වදර් කාකවුම් දංකළින් ඉෂ්දත්දිර්කු ආද ඉදමලික්ක මුදියාදු එන්පදනෙයුම් ඉන්ද ඉදත්දිලේ පදිවුසෙය්ය විරුම්පුකින්රේන්.

අදුමට්දුමල්ල, මෙදමහනුවර පකුදියිලේ ඉරුක්කින්ර උක්සෙට් දෝට්දම් මට්දුමල්ල, කෙළරව උරුප්පිනර් පිමල් රත්නායක්ක අවර්කළ් කුදිප්පිට්දදුපෝල උදදුම්පුර පකුදියිලේ ඉරුක්කින්ර යාප්පා දෝට්දම් පෝන්රවෛකළෛක් කූදප් පල්වේරු වේලෛත්දිට්දංකළුක්කාක එන්දවිද සුර්රාදල් දොදර්පාන කවනමුමින්රික් කොදුප්පදර්කුරිය සෙයර්පාදුකළ් නදෛපෙදර්රිරුක්කින්රන. ආකවේ, ඉවෛ දොදර්පාක මීල්පරිසීලනෙ සෙය්යුංකළ් එන්රු මීණ්දුම් වලියුරුත්දික් කේට්දුක්කොල්කින්රේන්.

ඉන්ද මලෛයක මක්කළින් පිරච්සිනෙ දොදර්පාක එංකළුදෛය තමිල් මුර්පෝක්කුක් කූට්දණියින් වේණ්දු කෝලුක්කිණංක කෙළරව පිරදමර් අවර්කළින් දලෛමෙයිලේ ඉරු කුලු අමෛක්කප්පට්දිරුක්කින්රදු. ඉන්දක් කුලු කදන්ද කාලම් මුලුවදිලුම් 2 දදවෛකළ් මට්දුමේ කූට්දප් පට්දිරුක්කින්රදු. අන්දක් කූට්දංකළිලේ මීල්කට්දමෛප්පුත් දොදර්පාකප් පේසප්පට්දිරුක්කින්රදු. ආනාල්, අන්දානෛත් දෝට්දම්, අයපාක් දෝට්දම්, උක්සෙට් දෝට්දම්, වෛත්දලාව දෝට්දම් එන අංකුල්ළ දෝට්දක් කාණිකළානදු පල්වේරු දරප්පිර්කුම් පකිර්න්දළික්කප්පට්දුක් කොණ්දු සෙල්කින්ර ඉරු නිලෙමෙ එර්පට්දිරුක්කින්රදු. ආකවේ, ඉන්ද නිලෙමෙ අරසාංකත්දිර්කු ඉරු නල්ල සෙය්දි ඉල්ලෛයෙන්පදනෛක් කුදිප්පිද විරුම්පුකින්රේන්.

අදේපෝල එංකළුදෛය තමිල් මුර්පෝක්කු කූට්දණියිනුදෛය දලෛවර්කළුම් කණ්දි මාවට්දම් දොදර්පාකවුම් මර්රුම් අංකු කාණප්පදුකින්ර ඉන්ද නිලෙමෙකළ් දොදර්පාකවුම් කූදුදල් කවනම් සෙලුත්ද වේණ්දුමෙන්රු කේට්දුක්කොල්කින්රේන්. එනෙන්රාල් අංකේ ඉරුක්කින්ර කාණිකළ්, දෝට්දංකළ් මිකමෝසමාන නිලෙමෙයෛ නෝක්කිච් සෙන්රුකොණ්දිරුක්කින්රන.

මේලුම්, ඉංකු උරෛයාර්රිය අමෛච්සර් මහින්ද අමරවීර අවර්කළ්, "ඉන්ද අරසාංකමානදු, ඉරු වීදු අනර්ත්දත්දාල් ඉළක්කප්පදුකින්රපෝදු 25,000 රූපාය් වරෛ නට්දදු කොදුත්දිරුක්කින්රදු" එනක් කුර්රිප්පිට්දාර්. කදන්ද 2-3 වරුද කාලත්දිල් දෝට්දංකළිලේයිරුක්කින්ර 'ලයන්' අර්රෛකළෝ අල්ලදු දනී වීදුකළෝ අනර්ත්දංකළුක්කුර්පට්දපෝදු ඉරු වීට්දුක්කාක ඉරු රූපායේනුම් නට්දදු වළංකප්පට්දිරුන්දාල්, අදු සම්පන්දමාකක් කූරුංකළ් එන්රු නාන් කේට්ද විරුම්පුකින්රේන්. ආකවේ, ඉව්වාරු දෝට්ද මක්කළෛත් දොදර්ච්සියාක ඔදුක්කි වෛත්දු, ඔදුක්කි වෛත්දු, වාක්කුකළෛ මට්දුම් පෙර්රුක්කොණ්දු, අරසාංකංකළෛ මුන්කොණ්දු සෙල්ල මුදියුම් එන්රු නිනෛක්කවේණ්දාම්. අප්පදියානාල්, නාංකළ් අදර්කුරිය පදිලදියෛක් කොදුක්ක වේණ්දිය නිලෙමෙ ඒර්පදුම් එන්පදනෛ ඥාපකප්පදුත්දි, විදෛපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 5.25]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික පාරිසරික පනත යටතේ නියමයන් කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ, දිවයිනේ සතර දිශාවේම; දිස්ත්‍රික්ක කිහිපයකම ගංවතුර නිසා ඇති වී තිබෙන ආපදා තත්ත්වය පිළිබඳව පාර්ලිමේන්තුවේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා. මෙම විවාදයේදීම ඒ පිළිබඳවත් සාකච්ඡා වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මුලිනුත් මේ ප්‍රශ්නය මතු කළා. මේ යහපාලන ආණ්ඩුව විද්‍යාත්මක කැබිනට් අමාත්‍ය ධුර බෙදා දීමේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට දුම්න්ද දිසානායක අමාත්‍යවරයාත්, පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යවරයාත් පත් කර තිබෙනවා. ඒ දෙදෙනා මේ විෂයයට අදාළ අභිනව -නවතම- අමාත්‍යවරයා සහ රාජ්‍ය අමාත්‍යවරයායි. මෙය කොච්චර විද්‍යාත්මකද කියනවා නම්, අවුරුද්දෙන් අවුරුද්දට, කන්නයෙන් කන්නයට මේ රටේ ඇති වන ජාතික ආපදා තත්ත්වය එන්න එන්නම වැඩිවෙලා තිබෙන වෙලාවක, අඩු ගණනේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජාතික ආපදා මධ්‍යස්ථානය පිළිබඳව යම් කෙනකුට තොරතුරු ගන්න අවශ්‍ය වුණොත්, ගංවතුරෙන් විපතට පත් වුණු දිස්ත්‍රික්කයක පුරවැසියකුට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට කථා කරන්න අවශ්‍ය වුණොත්, මේ තොරතුරු අනුව කථා කරන්න සිදු වෙලා තිබෙන්නේ හිටපු අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාටයි. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ website එකට ගියාම එහි "නවතම පුවත්" කියලා තීරුවක්; එහි news belt එකක් යනවා. ඒ නවතම පුවත් කියන belt එකේ නවතම news, උණුසුම් පුවත් හැටියට යන්නේ, "ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අමාත්‍ය ධුරයට අපේ අනුර ප්‍රියදර්ශන යාපා අමාත්‍යවරයා පත් වූ වගයි" කියන news එකයි. මේ විධියට අද ආපදාවට පත්වෙලා තිබෙන්නේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයයි. මේ ආණ්ඩුවම ආපදාවට පත්වෙලා තිබෙනවාය කියා මේකෙන් පෙනෙනවා. තමුන්නාන්සේලා මේ රටේ ගංවතුරින් විපතට පත් වුණු ජනතාවට උදව් කරන්නේ කොහොමද? අඩුම තරමින් තමන්ගේ අමාත්‍යාංශයේ තොරතුරු පද්ධතිය; මේ රටේ ජනතාවට - පුරවැසියන්ට- තොරතුරු ගන්න තිබෙන ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ තිබෙන මූලිකම තොරතුර වැරැදියි. එහි රාජ්‍ය අමාත්‍යවරයා ගැනත් නොවෙයි, නියෝජ්‍ය අමාත්‍ය දුනේෂ් ගන්කන්ද ගැනයි සඳහන් වන්නේ. එතුමන් ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසයි මේ වෙබ් අඩවියේ පෙන්වලා තිබෙන්නේ. දැන් ආපදා කළමනාකරණ අමාත්‍යවරයා විධියට ඉන්නේ දුම්න්ද දිසානායකයි. රාජ්‍ය

අමාත්‍යවරයා විධියට ඉන්නේ පාලිත රංගෙ බණ්ඩාරයි. නමුත් වෙබ් අඩවියේ සඳහන් වෙන්නේ රාජ්‍ය අමාත්‍යවරයාගේ නමත් නොවෙයි, දුනේෂ් ගන්කන්දගේ නමයි. ඔන්න ඔහොම තමයි ආපදා කළමනාකරණ තත්ත්වය පෙන්වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය 20වන දා රාත්‍රියේ මොනරාගල නගරයේ සිදු වුණු ශෝකජනක සිද්ධියක් සහ එයින් මතුවන විශේෂ තත්ත්වයක් පිළිබඳව මට ඉතිරි වී තිබෙන කෙටි කාලය තුළ කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා. පසුගිය 20වන දා රාත්‍රියේ දොළහ පසුවී විනාඩි ගණනකට පසුව මොනරාගල නගරයේ තිබුණු විශාල වෙළෙඳ සැල් ගණනාවක් හදිසියේ ගිනි ගන්න පටන් ගත්තා. උදේ පාන්දර හයහමාර, හත වෙනතුරු මේ ගින්න නිවා ගන්න බැරි වුණා. මේක මොන තරම් කරුමයක්ද කියනවා නම්, ගින්නක් ඇති වුණොත් එම ගින්න නිවන්න ඒ නගරයේ ප්‍රාදේශීය සභාවට තිබෙන එකම උපකරණය; එකම පහසුකම gully bowsers කිහිපයක් පමණයි; අවුරුදු විසි ගණනක් පැරණි gully bowsers දෙකක් පමණයි එහි තිබුණේ. උෆව පළාතෙන් අපිට ලැබෙන තොරතුරු අනුව, ගිනි නිවන ඒකකයක් තිබෙන්නේ බණ්ඩාරවෙල නගර සභාවට විතරයි. බදුල්ලේ තිබෙනවා මල් වතුවලට, මල් පාත්තිවලට වතුර දාන bowser එකක්. මට මතකයි, ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගණනාවකදීම ඉල්ලීම් කළා, අඩුම තරමින් මල් පාත්තිවලට වතුර දමන ඒ bowser එක හෝ දෙන්න කියලා. මොනරාගල දිස්ත්‍රික්කයේවත්, බදුල්ල දිස්ත්‍රික්කයේවත් ප්‍රධාන නගර දෙකේ ගිනි නිවන ඒකකයක් නැහැ. උමා ඔය ව්‍යාපාරයට සම්බන්ධ ෆරාබ් කොම්පැනියට අයිති ගිනි නිවන ඒකකය මොනරාගල නගරයට එද්දී පාන්දර 5.00යි. එතකොට රුපියල් කෝටි 15ක 20ක පමණ වටිනාකමකින් යුත් කඩ කාමර සංඛ්‍යාවක් ගිනිගෙන ඉවරයි. මොනරාගල ප්‍රාදේශීය සභාව, මොනරාගල පොලිසිය, ඒ වාගේම එම ප්‍රදේශයේ හමුදාවට සහ විශේෂයෙන්ම පැල්වත්ත සීනි කර්මාන්ත ආයතනයට මේ වෙලාවේදී අපි ස්තුතිවන්ත වෙනවා. පැල්වත්ත සීනි කර්මාන්ත ආයතනයට තිබුණු අවුරුදු 30ක් 40ක් පමණ පැරණි ගිනි නිවන ඒකකය ඇවිල්ලා තමයි මේ ගින්නේ ව්‍යාප්තිය නැවැත්වීමට කටයුතු කළේ.

අපි 21වන සියවසේ එළිපත්තේ සිටින රටක් වුණාට, තවම රටේ සෑම දිස්ත්‍රික්කයකටම ගිනි නිවන ඒකකයක් නැහැ. හදිසි ආපදාවකට පත් වුණු වෙලාවක කථා කරන්න තිබෙන අමාත්‍යාංශයේ තොරතුරු පද්ධතිය විකෘතියි. මේ කාරණා සලකා බලලා, ඒ ගැන මේ රජයේ අවධානය යොමු කරලා විශේෂයෙන්ම උෆව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ එක ප්‍රාදේශීය සභාවකට හෝ ගිනි නිවන ඒකකයක් ලබා දෙන්න. මොනරාගල දිස්ත්‍රික්කයේ එක් ප්‍රාදේශීය සභාවකට -විශේෂයෙන් නගරයේ ප්‍රාදේශීය සභාවට- ගිනි නිවන ඒකකයක් කඩිනමින් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.31]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පරිසරය සුරක්ෂිත කිරීම සඳහාත්, ස්වභාව ධර්මයට හිතකර ලෙස නිර්මාණය වුණු මේ රට ඉදිරියට යන විට අපිට ඇති වන විවිධ ගැටලුවලට මුහුණ දීම සඳහාත් පරිසරය කියන විෂයය භාර අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපතිතුමා ජාතික පාරිසරික පනත යටතේ නියමයන් කිහිපයක් ගෙන ඒමට කටයුතු කිරීම ගැන මුලින්ම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මම මේ නියමයන් ගැන කථා කරන්න කලින් සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. මගේ මිත්‍ර ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා මේ සියල්ල මේ අවුරුදු තුන තුළ ඉෂ්ට කර තිබිය යුතුයි කියන්නා වාගේ අදහසක් තමයි ඉදිරිපත් කළේ. හැබැයි, පසුගිය අවුරුදු 20කට ආසන්න කාලය පුරාම මොනරාගල දිස්ත්‍රික්කයේ බලය තිබුණේ එතුමන්ලාටයි. උෆව පළාතේ මහ ඇමතිවරයා හැටියට කටයුතු කළේ ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමායි. එතුමා එම පළාත් සභාවේ පළාත් පාලන ඇමතිවරයා හැටියටත් කටයුතු කළා. ප්‍රාදේශීය සභාවලට, නගර සභාවලට ගිනි නිවන ඒකක දෙන්න ඕනෑ නම් එතුමන්ලාට පසුගිය කාල පරිච්ඡේදය තුළ ඒ යුතුකම ඉෂ්ට කරන්න පුළුවන්කම තිබුණා. නමුත් එතුමන්ලා පසුගිය අවුරුදු 20ක කාල සීමාව තුළ අබ මල් රේණුවක තරමින්වත් එවැනි දෙයක් නොකළ නිසා, අද හරියට නින්දෙන් අවදිවෙලා වාගේ මෙතුමන්ලා කථා කරනවා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා අපි කියනවා - [බාධා කිරීමක්] ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ කථාවට මම බාධා කළේ නැහැ නේ. කරුණාකරලා වාඩිවෙලා ශිෂ්ට විධියට ඉන්න. මගේ වැරැද්දක් තිබෙනවා නම් point of Order එකක් අරගෙන කථා කරන්න. තවම ඉගෙන ගන්න, ළා බාල, බොළඳ, මොන්ටිසෝරියේ ඉන්න මන්ත්‍රීවරු නේ, මේ සභාවට ඇවිත් තිබෙන්නේ. ආණ්ඩුව හදන්න කලින් මොන්ටිසෝරියට ගිහින් ආණ්ඩු කරන හැටි ඉගෙන ගන්න. ලජ්ජාවක් නැහැ. ආණ්ඩු පෙරළන්නයි හදන්නේ. නමුත් කථා කරන්නේ එහෙමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුනාමි ව්‍යසනය නිසා අපේ රට මහා විපතකට පත් වුණා. සුනාමිය නිසා ඇති වුණු හානියෙන් පසුව එවැනි තත්ත්වවලට මුහුණ දීම සඳහා කිසි පිළිවෙළක් කළේ නැහැ කියා ඔබතුමා දන්නවා. ගංවතුර උවදුරු ඇති වුණා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ඔබතුමා කොහේද සිටියේ, ඒ කාලයේ?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මේ ආණ්ඩුව ආවාට පසුව මීතොටමුල්ල කුණු කන්ද කඩාගෙන වැටෙන කොට, නොයෙක් තැන්වල කටයුතු කරද්දී, -

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
2014 කාලයේ තමුන්නාන්සේ කොහේද සිටියේ?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මම ඒ පැත්තේ හිටපු එක ඇත්ත. මතක තබාගන්න, මම ඒ පැත්තේ සිටියත් ඒවා සම්බන්ධයෙන් නිවැරැදිව කථා කර තිබෙනවා. [බාධා කිරීම්] ජේවීපී එක තමුන්නාන්සේලා සමඟ එකතු වෙලා 2004 වර්ෂයේදී ඒ කුමන්ත්‍රණය කරන කොට තමයි අපි එළියට බැස්සේ. ඒ, තමුන්නාන්සේලා නිසායි, ගරු මන්ත්‍රීතුමනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක තමුන්නාන්සේලා එකතු වූ නිසා තමයි 2004 වර්ෂයේදී අපි එළියට බැස්සේ. තමුන්නාන්සේලාට අද ඉන්න බැහැ. පක්ෂ කඩාගෙන ගිහිල්ලා. තමන්ගේ පක්ෂය හදාගන්න බැහැ.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩාගෙන ගියා නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
දැන් කෝ, වීරකුමාර දිසානායක මහත්මයලා? කෝ, ශ්‍රියානි විජේවික්‍රම මහත්මියලා? ඒ අය අද නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලාට ඒ දෙතුන්දෙනා ආරක්ෂා කර ගන්න බැරිව රට භදන්න යනවා; අපිට උගන්වන්න එනවා. අපි තමුන්නාන්සේලාගෙන් ඉගෙන ගන්න ලැහැස්ති නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර වාඩි වෙන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
එතුමාට ඕනෑනම් කථා කරන්න අපි ඉඩ දෙන්නම්. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ලජ්ජා නැහැ. නැත්නම් බාධා කරන්න ඕනෑ නැහැ නේ. දැන්වත් හැදෙන්න ඉගෙන ගන්න. තවමත් මදි. පුංචි ඇයෝ. තවමත් හරියට හැදිලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය කාල පරිච්ඡේදය තුළ ආපදා කළමනාකරණය වෙනුවෙන් අපි -ආපදා කළමනාකරණ අමාත්‍යවරයා හැටියට හිටපු ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා- ඉතාම විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. එතුමා තමුන්නාන්සේලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු නායකයෙක්. ඒක මතක තියා ගන්න. එතුමා අදත් ඉන්නවා. හැබැයි පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමනි, මා කනගාටු වනවා එතුමා ගැන වර්ණනා නොකිරීම ගැන. අනුර ප්‍රියදර්ශන යාපා මහත්මයා ගැන විතරක් නොවෙයි, එතුමා ගැනත් වර්ණනා කරන්න එපා යැ. [බාධා කිරීමක්] ඔතැන නොවෙයි, ඔබතුමා මෙතැනින් ඉස්සරහා වාඩි වෙන්න. ඔතැන හත් අටදෙනෙක් වට කරලා සිටිද්දිත් කථා කරපු විජේපාල හෙට්ටිආරච්චි, මොනරාගල දිස්ත්‍රික්කයෙන් ආපු ඔය පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා බාධා කළාට බය නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා තවම කිරි බොන ළමයෙක්; මට හිතෙන විධියට එතුමාට සූජ්පුවක් දෙන්න වෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආපදාවක් එන කොට අපි දන්නවා. ඒ නිසා අපි එයට සූදානම් වුණා. එදා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ වාගේ නොවෙයි, අපේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අද කියන්න පුළුවන්, වහිනවා නම් ඒ දින වකවානු මොනවාද, ඒ හෝරාවන් මොනවාද, වර්ෂාව වැටෙන්නේ කොච්චර ප්‍රමාණයකින්ද ආදිය පිළිබඳව. ඒ විතරක් නොවෙයි. අද අපි මේ ආපදා තත්ත්වයට සූදානම් වුණා. මමත්, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාත් ගිං ගහත් එක්ක පොර බදපු මිනිස්සු. අපි ගිං ගඟේ එහා මෙහා පීනපු අයයි. අපේ ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. පුංචි කාලයේ ගිං ගහත් එක්ක පොර බදලා ආපු අයයි, අපි. ඒ නිසා අපට ගංවතුර ගැන කියන්න එපා. අපි ගංවතුර නිසා දුක් වින්දා. "රත්නපුරය දිස්ත්‍රික්කයටත් දැන් ගංවතුර ඇවිල්ලා" කියා සමහරු කියනවා. අපි පාසල් ගිය කාලයේත් - මා නම් montessori ගියේ නැහැ. - රත්නපුරයේ bus stand එක වතුරට යට වුණා. අදත් එය යට වනවා. හැබැයි ප්‍රශ්නයක් තිබෙනවා. අවුරුදු ගණනක් - වැඩි කාලයක් - රට පාලනය කළේ කවුද? ගිං ගඟ යෝජනා ක්‍රමය ගෙනාවා, සමඟි පෙරමුණු රජය. නමුත් මොකක්ද වුණේ? ඒක අසාර්ථක වුණා. ඒ එක්කම, නිල්වලා යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළා. මොකක්ද වුණේ? එයත් අසාර්ථක වුණා. හැබැයි අපි මහවැලි ගඟ රජරටට හරවා, මහවැලි ගඟ ආශ්‍රය කරගෙන මේ රටේ ජලාශ හදලා, විදුලි බලාගාර හදලා කරපු කටයුතුවල එල ප්‍රයෝජනය තිබෙනවා. ඒවා අසාර්ථක වුණේ නැහැ. අසාර්ථක ව්‍යාපෘති රටට ගෙනැල්ලා, මුදල් කාබාසිනියා කරලා, ණයකරයක් අපට දීලා, අද ලජ්ජා නැතිව මෙතුමන්ලා කථා කරනවා, ඊයේ ඉපදුණු අය වාගේ. ඉදිරි අවුරුදු දෙක තුළත් අපි නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. බය වෙන්න එපා. මේ ආණ්ඩුව 2020 දක්වා යන ගමනේදී අලුත් වැඩ පිළිවෙළක් එක්ක නිල්වලා සහ ගිං ගඟ යෝජනා ක්‍රමයට අත පොත් තබන්න අපි ලැහැස්ති වෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයට බොන වතුර ටික ලබා දෙන වැඩ පිළිවෙළත් හදන්නේ අපියි. තමුන්නාන්සේලාගේ නායකයන්ට -ජනාධිපති වෙලාත් මහින්ද රාජපක්ෂ මහත්මයාට- දෙන්න බැරි වූ වතුර ටික ඒ ප්‍රදේශයට දෙන්නේත් අපයි කියන එක අපි පැහැදිලිව කියනවා. ගිං ගඟ හරවා වාරුකන්දෙණිය, මාදුගැට ආදි ප්‍රදේශ හරහා අපි ඒ කටයුත්ත කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න තිබෙනවා. තමුන්නාන්සේලා කරන්නේ සියල්ල විවේචනය කරන එක විතරයි. පසුගිය ගංවතුරට විතරක් රුපියල් මිලියන 3,800ක මුදලක් වැය කරලා, කවදාවත් හදාපු නැති පාරවල් අපි හැදුවා. කවදාවත් හදපු නැති පාරවල් තිබුණා. මම ඒ ගැන කනගාටු වෙනවා. බද්දේගම-නාගොඩ මාර්ගය අරගෙන බලන්න. නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහත්මයලා ආණ්ඩුවේ සිටියා. චන්දිම වීරක්කොඩි මහත්මයලා ආණ්ඩුවේ සිටියා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා අද ඒ අය දෝතින් බදාගෙනයි ඉන්නේ. අද දයාසිරි ජයසේකර මහත්මයලා ආණ්ඩුවේ නැහැ. තමුන්නාන්සේලා අද ඒ අය වඩාගන්න බලාගෙන ඉන්නවා. තමුන්නාන්සේලා වැදුම් පිදුම් කරගෙන ඒ අය බාර ගන්නයි ඉන්නේ. අනේ, හෙට අනිද්දා වන කොට කංවන විජේසේකර, පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමන්ලා කොහේ යාවිද දන්නේ නැහැ. ඒ අයට යන්න එන්න තැනක් නැති වෙලා නන්නත්තාර වෙනවා. අද දයාසිරි ජයසේකරලා තමයි පොරවල් වෙලා ඉන්නේ. එතුමන්ලා තමයි අද මේ පාර්ලිමේන්තුවේ පොරවල් වෙලා ඉන්නේ. [බාධා කිරීම්] තමුන්නාන්සේලා කොහේද ඉන්නේ? ඒ නිසා පද්ම උදයශාන්ත ගුණසේකර මහත්මයාට මම කියනවා, කරුණාකර අඩුම ගණනේ මේ කාලයේවත් පොරක් වෙන්න කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ කටයුතු කිරීමේදී පරිසරය සුරක්ෂිත කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. පොලිතීන් තහනම් කිරීම වාගේ කටයුතු කිරීම මහින්ද රාජපක්ෂ පාලනයට කවදාවත් හිතන්නවත් පුළුවන්කමක් නැහැ. අපේ අඩු පාඩු තිබුණත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් පොලිතීන් තහනම් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේට උත්තර දෙන්න මම ලැහැස්ති නැහැ. මම මූලාසනයටයි කථා කරන්නේ. කංවන විජේසේකර මන්ත්‍රීතුමාට ඕනෑ නම් වෙලාව අරගෙන තව කථා කරන්න පුළුවන්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, point of Order එකක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඇස්බැස්ටෝස් තහනමට මොකද වුණේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ජාතික මට්ටමින් වාගේම ජාත්‍යන්තර වශයෙන් ගෙන එන ඵලදායී යෝජනාවලට මේ ගරු සභාව විශාල සහයෝගයක් දෙනවා. ලෝකයේ පළමුවැනි වතාවට අපේ රජය මඟින් තමයි තිරසර සංවර්ධනයක් පිළිබඳ අමාත්‍ය ධුරයක් ලබා දීලා අමාත්‍යාංශයක් පවත්වන්න කටයුතු කළේ. එම නිසා අපට ඕනෑ මේ රට සංවර්ධනය වෙනකොට-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමාට අබමල් රේණුවකවත්, දශමයකවත් බාධාවක් කළේ නැහැ. එතුමාත් ඇතුළුව මට මේ මන්ත්‍රීවරු තුන්දෙනාම මගේ කථාවට බාධා කළා. මම ඒ ගැන කනගාටු වෙනවා. බාධා කිරීම විතරයි තමුන්නාන්සේලාට තිබෙන්නේ. විපක්ෂයේ අයට වෙන කරන්න දෙයක් නැහැ. අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. මේ රජය හැටියට අපි මේ වැඩසටහන ඉදිරියට ගෙන යන්නට බොහොම සතුටින් සිටිනවා. අලුත් වැඩ පිළිවෙළක් එක්ක, ඉතාමත් නිර්මාණශීලී පරිසරයක් තුළ මේ රටේ ජනතාවට ඉතාමත් හොඳින් ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් අපි නිර්මාණය කරනවා කියන එක මතක් කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.40]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික පාරිසරික පනත යටතේ නියෝග හා නියමයන් කිහිපයක් සඳහා අනුමැතිය ගැනීමට සාකච්ඡා කරන මේ වෙලාවේ මේ සඳහා අදහස් කිහිපයක් එකතු කරන්න ලැබීම ගැන සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේලා දකුණු ලකට ඇතුළු වෙනකොට කළුතර නගරයට පැමිණෙන්නට පෙර කළුතර කළු ගඟ හරහා වැටී තිබුණු පාලමේ සිට ඉන්දියන් සාගරය දෙස බලද්දී ඉතාම දැකුම්කලු වෙරළ තීරයක් තමුන්නාන්සේලාට මීට පෙර දකින්න ලැබුණා. අපේ ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමනි, ගාල්ලට යනකොට කළුතර පාලම උඩින් මුහුදු දෙස බලද්දී මේ වෙරළ තීරය මීට පෙර දකින්න ලැබුණා. ජාතික පාරිසරික පනත යටතේ නියෝග හා නියමයන් ගෙනෙන මේ වෙලාවේ ගයන්ත කරුණාතිලක ඇමතිතුමා ගාලු පාර ඔස්සේ ගාල්ලට ගියොත්, විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ගාලු පාර ඔස්සේ ගාල්ලට ගියොත්, කළුතර පාලමේ ඉඳන් මුහුදු දෙස බලද්දී ඒ කැලිඩෝ වෙරළ තීරය ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, දැන් තමුන්නාන්සේට බලන්න වෙන්නේ නැහැ; දකින්න වෙන්නේ නැහැ. මෙන්න, තමුන්නාන්සේලාගේ පාරිසරික ප්‍රතිපත්තිය ගැන කියන කොට තිබෙන හොඳම උදාහරණයක්; ආදර්ශයක්. අද විල්පත්තු ජාතික වන උයන එළිපෙහෙළි කරලා ඒකේ සත්ත්ව-සිව්පාවාට තිබුණු ඇළ, දොළ, ගඟ පවා නාස්ති කරලා ඉවරයි.

උපනුපන් පරම්පරාවට තිබිය යුතු විල්පත්තු වන උයන අද කාබාසිනියා කරලා ඉවරයි. ඒ වාගේම කළුතර කැලිඩෝ වෙරළ තීරයේ අක්කර 20ක් පමණ අද වනසලා ඉවරයි. මුහුදට ගසාගෙන ගොස් අවසන් කරලා තිබෙනවා. මම මේ වෙලාවේ මේ උත්තරීතර සභාවේ ඉඳන් අනතුරු අඟවනවා. පරිසර ඇමතිතුමන්ලා, එක පැත්තකින් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අයිති ධීවර අමාත්‍යාංශයේ ඇමතිතුමන්ලා බලාගෙන ඉන්නේ කැලිඩෝ වෙරළ මුහුදු බත් වුණා වාගේ, මුහුදට ගසාගෙන ගියා වාගේ අනෙක් පැත්තෙන් කළුතර බෝධීන් වහන්සේත්, කළුතර වෛත්‍ය රාජයාණන් වහන්සේත්, කළුතර පාලම් දෙකත් මුහුදට ගසාගෙන යන කල්ද? මෙහෙම ගියොත් එහෙම වෙන්නේ වැඩි ඇතක නොවෙයි කියන එකත් අපි මේ වෙලාවේ අනතුරු අඟවනවා. ඒ නිසා ආණ්ඩුවේ වැදගත් අමාත්‍යතුමෙක් මෙතැන ඉන්න වෙලාවේ මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමනි, කරුණාකරලා කළුතර නගරයම මුහුදු බත් වෙන්න ඉඩ තිබෙන මේ අනතුරෙන් කළුතර නගරයත්, කළුතර බෝධීන් වහන්සේත්, කළුතර වෛත්‍ය රාජයාණන් වහන්සේත්, කළුතර පාලම් දෙකත් ගලවා ගැනීම සඳහා කඩිනමින් මැදිහත් වෙලා උත්තරයක් හොයන්න කියන ඉල්ලීම තමුන්නාන්සේලාගේ අග්‍රාමාත්‍යතුමාටත්, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාටත් යොමු කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වෙලාව වන විට ලංකාවේ සෙසු දිස්ත්‍රික්ක කිහිපයක් වාගේම අපේ කළුතර දිස්ත්‍රික්කයත් ගංවතුර ආපදාවට ලක් වෙලා තිබෙනවා. අපේ කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට, පාලින්දනුවර, මතුගම, අගලවත්ත, බුලත්සිංහල, මඳුරාවෙල, මීල්ලනිය, හොරණ, ඉංගිරිය, බණ්ඩාරගම සහ කළුතර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මේ ගංවතුර තත්ත්වයෙන් ආපදාවට ලක් වෙලා, පවුල් 938ක් -පුද්ගලයින් 3,375ක්- අවතැන් වෙලා, ජීවිත දෙකක් බිලිගෙන තිබෙනවා. ගංවතුර නිසා ජනතාව ආපදාවට ලක් වුණු අවස්ථාවල ගුවන්විදුලියෙන්, රූපවාහිනියෙන්, පත්තරවලින් වාගේම මේ ගරු සභාවේදීත් යහපාලන ආණ්ඩුවේ සුරංගනා කථා අපට අහන්න ලැබුණා. සාලාව අවි ගබඩාව පුපුරා ගිය වෙලාවේ, පුපුරුවා හැරපු වෙලාවේ ඒ හේතුවෙන් අවතැන් වුණු ජනතාව පිළිබඳව කඳුළු සලමින් කථා කළා. "ජීවිත විතරයි දෙන්නේ නැත්තේ, අනෙක් සියලු දේ අපි ඒ ජනතාවට දෙනවා." කියලායි කිව්වේ. නමුත් සාලාව අවි ගබඩාවේ සිදු වූ පිපිරීම නිසා විපතට පත් වුණු ජනතාව අදටත් ඒ තත්ත්වයෙන් ගලවාගෙන නැහැ. ඒ ජනතාව තවමත් එතැන හූල්ලමින් ඉන්නවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. (Prof.) Ashu Marasinghe, what is your point of Order?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාව නොමඟ යවන ප්‍රකාශයක් කළා, "සාලාව අවි ගබඩාව පුපුරුවා හැරියා." කියලා. මම හිතන විධියට ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න ඕනෑ. මොකද, එවැනි දේවල් ගැන කථා කරන්න කලින්- [බාධා කිරීමක්] එහෙම කථා කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාලාව අවි ගබඩාව පුපුරුවා හැරීම නිසා ඒ ආපදාවෙන් විපතට පත් වූ ජනතාව තවම හූල්ලමින් ඉන්නවා. අරණායක සාමසර කන්ද නාය ගියා. ජීවිත විතරයි නොදෙන්නේ, අනෙක් ඔක්කෝම දෙනවාය කියලායි කිව්වේ. එතැන කුඩාරම් බැඳි ජනතාව, සාමසර කන්ද නාය යාමෙන් විපතට පත් ජනයා තවම හූල්ලනවා; මේ ආණ්ඩුවට හෙණ ඉල්ලනවා; යහපාලන ආණ්ඩුවට හෙණ ඉල්ලනවා. ඒ වාගේම මීට පෙර ආපු ගංවතුරෙන් විනාශ වුණු කැලණි මිටියාවතේ ජනතාවගේ විනාශ වූ දේපළවලට හානි පූර්ණය කරනවා කියලා මෙතැන කිව්වා. නමුත් ඒ ජනතාව තවම හූල්ලමින් ඉන්නවා. දීපු වන්දියක් ඇත්තේ නැහැ. ඒ ජනතාව විපතට පත් වුණා; තවම හූල්ලමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටීමෙන් අසරණ වුණු ජනයා තවම එතැන අඬමින් ඉන්නවා; ලතෝනි තියමින් ඉන්නවා. ඒ ජනයාගේ ජීවිත නඟා සිටුවන්න තමුන්නාන්සේලා තවම කටයුතු කළේ නැහැ. ඒ විතරක් නොවෙයි. 2017 මැයි මාසයේ 28 වනදා කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර යන දිස්ත්‍රික්ක වසාගෙන ආපු ගංවතුරෙනුත්, නාය යාමෙනුත් විපතට පත් වුණු ජනතාවට තවමත් සහන දීලා නැහැ. නාය යාමෙන් පොළොවට මිහිදන් වුණු ජනයාගේ පවුල්වලට තවම වන්දි ගෙවලා නැහැ. ඒ ගංවතුරෙන් පූර්ණ හානියට පත් වුණු ගෙවල් ටික තවම හදලා දීලා නැහැ. ඒ ගංවතුරෙන් නැති නාස්ති වුණු දේපළවලට තවම හානි පූර්ණය කරලා නැහැ. ඒ ජනතාව තවම හූල්ලමින්, කඳුළු සලමින් ඉන්නවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is the point of Order?

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමා හරි කනගාටුවෙන්, ජනතාව ගැන ආදරයෙන් කථා කරනවා. නිවාස සංවර්ධන අධිකාරියේ සල්ලි අරගෙන මහුල් කෑවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂා කරලා බලනකොට, අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා ඇමති ධුරය භාර ගත්ත දවසේ තොරතුරු තමයි තවම තිබෙන්නේ. තවම ඒ වෙබ් අඩවිය යාවත්කාලීන කරලා නැහැ. යහපාලන ආණ්ඩුවේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ තත්ත්වය ඒකයි. සාමසර කන්ද නාය යාමෙන් පීඩාවට වුණු ජනතාවට සහන නොදුන් ආණ්ඩුව, සාලාව අවි ගබඩාව පුපුරවා හැරීම නිසා පීඩාවට පත් වුණු ජනතාවට සහන නොදුන් ආණ්ඩුව, මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටීම නිසා පීඩාවට පත් වුණු පවුල් 38ට -කුඩා සංඛ්‍යාවකට- සහන නොදුන් ආණ්ඩුව, කැලණි ගඟ පිටාර ගැලීම නිසා පීඩාවට පත් වුණු කැලණි ගං මිටියාවතේ ජනතාවට සහන නොදුන් ආණ්ඩුව මේ ගංවතුරෙන් පීඩාවට පත් වුණු ජනතාවට සහන දෙයි කියලා අපට විශ්වාස කරන්න බැහැ. ඒ නිසා අපි මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා, තවදුරටත් මේ පාර්ලිමේන්තුවේ සුරංගනා කථා කිය කියා ඉන්නේ නැතුව පළමුවෙන්ම සාමසර කන්ද නාය යාමෙන් පීඩාවට පත් වුණු ජනයාගේ දුක්ඛ දෝමනස්සයන්ට, කඳුළුවලට උත්තරයක් හොයලා දෙන්න; සාලාව අවි ගබඩාව පුපුරවා හැරීම නිසා පීඩාවට පත් වුණු ජනයාගේ දුක නිවාලීම සඳහා වහාම මැදිහත් වෙන්න; මීතොටමුල්ල කුණු කන්ද කඩාගෙන වැටිලා ජීවිතක්ෂයට පත් වුණු අයගේ පවුල්වල උදවිය නඟා සිටුවන්න; දේපළ විනාශ වුණු ජනයා නඟා සිටුවන්න වහාම මැදිහත් වෙන්න; කැලණි ගඟ පිටාර ගැලීම නිසා පීඩාවට පත් වුණු කැලණි ගං මිටියාවතේ ජනතාවට සහන දෙන්න කියලා. බියර් කොම්පැනිකාරයන්ට නම් බදු සහන දුන්නා. මිනිසුන්ට දීපු සහනයක් නැහැ. ඒ නිසා මිනිසුන්ට ඒ සහන දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගං වතුරෙන් පීඩාවට පත් වෙලා ඉන්න කළුතර දිස්ත්‍රික්කය ප්‍රමුඛ සෙසු දිස්ත්‍රික්කවල ජනයාට ලබා දිය යුතු සහන කඩිනමින් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම කළුතර කැලිඩෝ මුහුදු වෙරළ තීරය නැවත වතාවක් ප්‍රතිනිර්මාණය කරන්න තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටිනවා. එය එසේ කරමින්, කළුතර නගරයත්, කළුතර බෝධීන් වහන්සේත්, කළුතර චෛත්‍ය රාජයාණන් වහන්සේත් රැක ගැනීම සඳහා ගයන්ත කරුණාතිලක ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේ හරහා අග්‍රාමාත්‍යවරයාටත්, ජනාධිපතිවරයාටත් මේ යෝජනාව නැවත අවධාරණයෙන් ඉදිරිපත් කරමින්, වහාම මේ සඳහා මැදිහත් වන ලෙස ඉල්ලා සිටිමින්, මේ අවස්ථාව ලබා දීම ගැන ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.49]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික පාරිසරික පනත යටතේ මේ අවස්ථාවේදී කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සන්තෝෂයට පත් වෙනවා. විශේෂයෙන් මේ වාගේ පරිසර හානි සිදු වුණු මොහොතක, ඒ පරිසර හානි සිදුවීමට බලපාන කාරණා ගැනත් අවධානය යොමු කරන්න කැමැතියි. දැනටමත් ලෝකයේ ජාත්‍යන්තර ප්‍රමිතීන් හරහා කථා කෙරෙන greenhouse gases ගැන, එනම්, කාබන් ඩයොක්සයිඩ් පරිසරයට මුදා හැරීම ගැන වවන ස්වල්පයක් කථා කරන්න කැමැතියි.

In the year 1990, the Intergovernmental Panel on Climate Change - IPCC - reported that greenhouse gas - GHG - concentrations in the global atmosphere were rising as a result of human GHG emissions, mainly from fossil-fuel burning after industrialization. The impact of fossil-fuel burning by humans has raised the GHG concentration level in the atmosphere by 30 per cent. Four greenhouse gases - carbon dioxide (CO_2); methane (CH_4); nitrous oxide (N_2O) and chlorofluorocarbons (CFCs) - have been identified, the atmospheric concentrations of which can be influenced by human activities.

The main greenhouse gases that get into the atmosphere as a result of human activities are, carbon dioxide, methane, nitrous oxide and fluorinated gases. Common GHGs include water vapour, carbon dioxide, methane, nitrous oxides, chlorofluorocarbons, hydrofluorocarbons, perfluorocarbons, sulfur hexafluoride, ozone and aerosols. Natural processes and human activities emit GHGs and the accumulation of GHGs in the atmosphere regulates the earth's temperature. GHGs are mainly responsible for global climate change and it increases the impact on environment, ecology, human, plant and animal health.

The odds are high that humans will warm earth's climate to worrisome levels during the coming century. Although fossil-fuel combustion has generated most of the buildup of climate-altering carbon dioxide in the atmosphere, effective solutions will require more than just designing cleaner energy sources. Also, equally important will be establishing institutions and strategies - especially markets, business regulations and government policies - that provide economies with incentives to apply innovative technologies and practices that reduce emissions of carbon dioxide and other greenhouse gases.

The annual greenhouse gas emission by sector is as follows: through industrial processes, 16.8 per cent, power stations, 21.3 per cent, waste disposal and treatment, 3.4 per cent, land use and biomass burning, 10 per cent, residential, commercial, and other sources, 10.3 per cent, fossil-fuel processing and distribution, 11.3 per cent, agricultural byproducts, 12.5 per cent and through transportation fuels, 14. 0 per cent.

In 1997, in order to reduce the accumulation of greenhouse gases in the atmosphere, the international community adopted the Kyoto Protocol under the UN Framework Convention on Climate Change and it came into force in 2005. In 2010, 191 states had ratified the Kyoto Protocol. They agreed to reduce the emissions of six specific greenhouse gases, and to do that, the Protocol set up three so-called flexible mechanisms: Joint Implementation - JI - mechanism, Clean Development Mechanism - CDM - and Emissions Trading - ET.

විශේෂයෙන් මම මේ සඳහන් කළේ, greenhouse gas effect එක ලෝකයේ විවිධ රටවල ජාත්‍යන්තර ප්‍රජාව සමඟ, Kyoto Protocol එකට අනුව, ලෝකයේ ඉදිරියට ගියේ කොහොමද කියන කාරණා සම්බන්ධවයි.

අපේ ලංකාවේ පරිසර අමාත්‍යාංශය සහ ඒ අදාළ ආයතන, අප විසින් පරිසරයට මුදා හරින කාබන් ඩයොක්සයිඩ් ප්‍රතිශතය අඩු කිරීමේ ක්‍රියා මාර්ගවල නියැලිලා සිටිනවා. ඊට අදාළ එක් කරුණක් තමයි, ශ්‍රී ලංකාවේ තිබෙන වන ඝනත්වය. පරිසරයට මුදා හැරෙන කාබන් ඩයොක්සයිඩ් ප්‍රතිශතය කොහොමද මේ වන ඝනත්වය හරහා උරා ගන්නේ -absorb කරන්නේ- කියන කාරණය ඇගැයීමට ලක් කරන්න අපට පුළුවන්. මේ හරහා අපට හැකියාවක් ලැබෙනවා, කලින් සඳහන් කළ emissions trading, එහෙම නැත්නම් Clean Development Mechanism - CDM - එක හරහා අපට ලෝකයේ Carbon Fund එකෙන් මුදල් ලබා ගන්න. Emissions trading mechanism එක හැටියට කිව්වොත්, ලෝකයේ මහා පරිමාණයේ කොම්පැනි කාබන් ඩයොක්සයිඩ් මුදා හැරීමේදී ඒ අයට යම් ප්‍රතිශතයක අවසරයක් දී තිබෙනවා. එම ප්‍රතිශතයට වඩා වැඩියෙන් කාබන් ඩයොක්සයිඩ් මුදා හරිනවා නම්, ඒ ගොල්ලෝ ගස් වවලා තිබෙන රටවලට, ඒ කියන්නේ, කාබන් ඩයොක්සයිඩ් උරාගන්නා ක්‍රම අත් හදා බලන රටවලට මුදල් ආධාර කරනවා. නමුත්, අපි මේ කාරණය ප්‍රයෝජනයට අරගෙන නැහැ කියන කාරණය කෙරෙහි මම මේ මොහොතේ පරිසර අමාත්‍යවරයා ඇතුළු අපේ රාජ්‍ය නිලධාරීන් සියලු දෙනාගේම අවධානය යොමු කරවන්න කැමැතියි.

අපේ ඉඩම් ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. ඒ නිසා ඉඩම් ඇමතිතුමාගේත් අවධානය මම මේ කරුණ කෙරෙහි යොමු කරවන්න කැමැතියි. ගරු ගයන්ත ඇමතිතුමනි, වනාන්තර වවන්න පුළුවන් ඉඩම් අපට තිබෙනවා නම්, private sector එකත් එක්ක එකතු වෙලා මේ ඉඩම්වල වනාන්තර වවන්න අවස්ථාව ලබා දෙනවා නම්, ඒ Carbon Credit එක අපට අරගෙන Government එක සමඟ විතරක් නොවෙයි, private sector එක සමඟත් එය distribute කරන්න පුළුවන්.

එහෙම වුණොත් අපිට හැකියාව ලැබෙනවා, සාර්ථක වැඩ පිළිවෙළක් කරන්න. Win-win situation එකත් එක්ක කරන සාර්ථක වැඩ පිළිවෙළක් හැටියට, පුළුවන් තරම් වනාන්තර වගා කරන්න උදව් කරන්න අපිට private sector එකත් encourage කරන්න පුළුවන්. ඒ Carbon Credit එකෙන් ගන්න ප්‍රමාණයෙන් අපි හිතමු, සියයට 50ක් ඉඩම් අමාත්‍යාංශය තියා ගන්නවා; සියයට 50ක් private sector එකට ලබා දෙනවා කියා. මොකද Government එකට තනිවම මේක කරන්න බැහැ; වනාන්තර වවන එක සාර්ථක වෙන්නේ නැහැ. මොකද, අපේ monitoring ක්‍රමයක් නැති නිසා. එම නිසා පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා monitoring mechanism එකක් හදා ගන්නට පුළුවන් නම්, ආධාර වැඩසටහනක් හරහා Green Climate Fund එකෙන් ලංකාවට අලුතෙන් ආධාර ලබා ගන්නට පුළුවන්. මම අර කලින් කිව්ව Kyoto Protocol එක හරහා, අනවශ්‍ය emissions කරන අය හරහා මුදල් ලබා ගන්න පුළුවන්. මම මේ කාරණය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. ඒ වාගේම පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් සම්බන්ධ කරගෙන මේ සඳහා වැඩ පිළිවෙළක් රටට අවශ්‍යයි.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

අපි රට හැටියට කියනවා, ගස් වවන්න ඕනෑය කියා. හැබැයි, ගස් වවන දවසට අපි ගස් වවනවා. නමුත් මේ ගස් පවතිනවාද කියා monitor කරන ක්‍රමයක් නැහැ. අපට මේක මහජනතාවට භාර දෙන්න පුළුවන් නම් හොඳයි. ගෙදර ගෙවත්තේ ගස් විස්සක් වවනවා නම්, carbon Fund එක හරහා එන ආධාර වශයෙන් මාසයකට රුපියල් දාහක් දෙදාහක් ලැබෙනවා නම්, ඉබේම ගස් වවන්න පෙළඹෙනවා. අපේ දරුවන් පෙළඹෙනවා, ගස් ටික ආරක්ෂා කර ගන්න. අපේ අම්මලා තාත්තලා පෙළඹෙනවා, ගස් ටික ආරක්ෂා කර ගන්න. එහෙම ක්‍රමයක් මේ රටට අවශ්‍යයි. ඒ මොකද? මේ මොහොතේත් මට මතක් වෙනවා, ස්වාභාවික විපත් ඇති වීමට ප්‍රධාන හේතුවක් තමයි අපි වන වගාවෙන් ඈත් වෙන එක. වන වගාව පැත්තකට දාලා, අපි අලුතෙන් ගොඩනැඟිලි ඉදිකිරීම් වෙනුවෙන් වන වගා භූමි භාවිත කරනවා. ඒ වාගේම විවිධ භෝග වර්ග වැවීම සඳහා වන වගා ඉඩම් භාවිත කරනවා. නමුත් පරිසරයට ආදරය කරන සියලුදෙනාම වන වගාව ගැන දැඩි අවධානයක් යොමු කරන්නට ඕනෑ.

පාරිසරික පනත යටතේ තවත් කාරණයක් කථා කරන්නට මම කැමතියි. අද ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන මධ්‍යම පරිසර අධිකාරිය -Central Environmental Authority එක- හරහා අපි පරිසර ඇගයීම් වාර්තා ලබා දෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් සමහර වෙලාවට මධ්‍යම පරිසර අධිකාරිය හරහා තිබෙන ආයතනවල ඒ නිර්මාණශීලි ස්වභාවය නැතිවීම තුළ ඒ අය හැම තිස්සේම බලන්නේ පරිසර ඇගයීම් වර්තාව දිය යුත්තේ අලුතෙන් ඉදිරිපත් වන ව්‍යාපෘති නවත්වන්න කියායි. එම නිසා ඒ ගැනත් සලකා බැලිය යුතුය කියන යෝජනාව මම කරන්න කැමතියි.

අද මේ දවස්වල කථා වෙනවා, "වියත් මග", "විපත් මග" ගැන. මේ "වියත් මග", "විපත් මග" ගැන කථා කරනකොට අද ඇසිය යුතුම ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, අද මේ ඇති වෙලා තිබෙන ස්වාභාවික විපත්වලටත් හේතුව මේ "විපත් මග"ද කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න. මම අභියෝගයක් කරන්න කැමතියි. අද කථා කරනවා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනවා; ඊළඟට බැසිල් රාජපක්ෂ මහත්මයා ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනවා කියා. හැබැයි, මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ, ගෝඨාභය රාජපක්ෂ මහත්මයායි, බැසිල් රාජපක්ෂ මහත්මයායි කියන්නේ ඇමෙරිකන් පුරවැසියෝ බව. ඇමෙරිකන් පුරවැසියන්ට ජනාධිපතිවරණයට පමණක් නොවෙයි මහ මැතිවරණයටත් ඉදිරිපත් වෙන්නට බැහැ. මේ අභියෝගයක් කරන්නේ. ජනතාව රවටන්නේ නැතිව අපිට පැහැදිලිව කියන්න ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත්, බැසිල් රාජපක්ෂ මහත්මයාත් ඇමෙරිකන් පුරවැසිභාවය අවලංගු කරන්න apply කර තිබෙනවාද -අයදුම් පත් දාලා තිබෙනවාද- කියා. අයදුම් කළා නම් ඒකට මාස හයත් අවුරුදු දෙකත් අතර කාලයක් යනවා. අපට සැකයක් තිබෙනවා, මේ කරන්නේ ජනතාව ගොනාට ඇන්දවීමද කියා. එම නිසා බැසිල් රාජපක්ෂ මහත්මයායි, ගෝඨාභය රාජපක්ෂ මහත්මයායි අනාගත මැතිවරණවලට ඉදිරිපත් වෙනවාය කියන දැක්ම ජනතාව අතරට ගෙනයන්න කලින්, ඒ අය ඇමෙරිකන් පුරවැසිභාවය ඉවත් කර ගත්තාද, එසේ නැත්නම් ඇමෙරිකන් පුරවැසිභාවය ඉවත් කර ගන්න අයදුම් කළාද කියන තහවුරු කිරීම මේ රටට අවශ්‍යයි. ඒ සඳහා එතුමන්ලා එහෙම අයදුම් කළා නම්, රටේ ජනතාවට වංචාවක් නොකර එතුමන්ලාට පුළුවන් ඒ අයදුම් කළ හැටි රටට කියන්න. මොකද අපට දැනගන්නට තිබෙන තොරතුරු අනුව අනිවාර්යයෙන්ම එතුමන්ලාට ලෙහෙසියෙන් ඇමෙරිකන් පුරවැසිභාවය අයින් කර ගන්න බැරි වෙනවා. මොකද, ඒ process එකේ තිබෙන ව්‍යාකූලභාවය - complicated ස්වභාවය - අනුව. එම නිසා මේ විපත් මග යන මේ ගමනෙන් ඇත්තටම අපට ස්වාභාවික විපත් ඇති වෙනවාදෝ කියන සැකයකුත් පහළ වෙනවා.

අද මේ පරිසර අමාත්‍යාංශය ගැන කථා කරන අවස්ථාවේදී මේ කාරණා ටික කථා කළ යුතුයි කියා සිතූ නිසා මම කථා කිරීමට අවස්ථාව ලබා ගත්තා. මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ජානක වක්කුඹුර මහතා. ඔබතුමාට විනාඩි 5ක් තිබෙනවා.

[අ.භා. 6.02]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පරිසරය ගැන කථා කරන මේ අවස්ථාව වන විට ගංවතුර ගලලා ජනතාව ගොඩාක් පීඩාවට පත් වෙලා තිබෙනවා. පරිසරයටම සම්බන්ධ ගංවතුරෙන්, ඒ වාගේම නාය යෑම්වලින් හැමදාම ජනතාව පීඩාවට පත් වෙනවා. ගිය වතාවේ ගංවතුර ගලපු වෙලාවේ, එදා රාජ්‍ය පරිපාලන ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා, "ආයේ මේ වාගේ ව්‍යසනයක් වෙන්නේ නැහැ, හැමදාම මේවා ගැන කථා කරනවා, ගිං ගහ, කළු ගහ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් තිබෙනවා" කියලා. නමුත් කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ගයන්ත කරුණාතිලක ඇමතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. ඇමතිතුමනි, මම මේ දැනුත් අයගම ප්‍රදේශයේ ගංවතුර ගලපු තැන්වල ඉඳලා ආවේ. මේ ආණ්ඩුවෙන් මම ඉල්ලීමක් කරනවා, ගංවතුරකට යට වුණා නම් ඒ මිනිසුන් බඩගින්නේ තියන්නේ නැතිව ඒ අයට යමක් ලබලා දෙන්න ඕනෑ කියලා. රත්නපුර දිස්ත්‍රික්කයේම ගංවතුර බහින්නේ "ඇල්ල" කියන තැනින්. ගංවතුර කොහෙන් බැස්සත් එතැන දවස් 7, 8ක් ගංවතුර තිබෙනවා. ගංවතුර ගලලා දැන් දවස් තුනක් වෙනවා. ඒ ගමේ ගංවතුරින් පීඩාවට පත් අයට මේ වනතුරු එක බත් ඇටයක් දීලා නැහැ කියලා කිව්වොත් තමුන්නාන්සේලා පිළිගන්නවාද? ඒ අයට රජයෙන් එක කෑම පාර්සලයක් හරි දුන්නාය කියලා තමුන්නාන්සේලාගෙන් කවුරු හරි පුළුවන් නම් කියන්න. මම දැනුත් බෝට්ටුවකින් ඒ ගමේ පන්සලට ගිහිල්ලා ආවේ. ඒ ගමේ කිසි කෙනෙකුට මේ වනතුරු මොනවාවත් දීලා නැහැ. ග්‍රාම නිලධාරිතුමා කියනවාලු, "අනාථ කඳවුරකට මිනිසුන් ආවොත් විතරක් දෙන්න. එහෙම නැත්නම්, දෙන්න එපා." කියලා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ එතුමා කිව්වා, " මිනිසුන් බඩගින්නේ තියන්න එපා. කිසිම වක්‍රලේඛනයක් බලන්නේ නැතිව ඕනෑම තැනකින් අරගෙන දෙන්න" කියලා. අද රජයේ නිලධාරීන් බයයි. දෙන්නේ නැහැ. ග්‍රාම නිලධාරිවරයාත් බයයි. ඒ අය ඉහළින් එන නියෝගවලට පිටින් කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියන්නේ "ගංවතුරට යට වෙච්ච; කොටු වෙච්ච මිනිසුන්ට යන්න තැනක් නැහැ; දින ගණනාවක් පවතින වැස්ස නිසා කුලී වැඩක් කර ගන්න බැහැ; කඩවල්වල බඩු තිබුණත් ගන්න සල්ලි නැහැ. ඒ නිසා ගංවතුරෙන් හානියට පත් වුණු; කොටු වුණු ජනතාවට යම් කිසි සහනයක් සලසන්න" කියලායි. ඇලපාත ප්‍රදේශයේම ගංවතුරට යට වෙලා වැඩි පිරිසක්

ඉන්නවා. මගේ මහ ගේ තිබෙන පැත්තම ගංවතුරෙන් යට වෙලා. ඒ නිසා ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, අඩුම ගණනේ එහෙම ගංවතුරෙන් පීඩාවට පත් වුණු ග්‍රාම සේවා වසම් බලලා ඒ අයට යම්කිසි සහනයක් සලසන්න කියලා. ඇමතිතුමා ඒ කෙරෙහි යම්කිසි අවධානයක් යොමු කරලා කටයුතු කරයි කියලා මම හිතනවා. අදත් ආපදා කළමනාකරණ ඇමතිතුමා ගිහිල්ලා සාකච්ඡා පවත්වනවා. හැබැයි, ඒ සාකච්ඡා පවත්වන්න යන අය වෙනුවෙන් සංග්‍රහ කරන්න, ඒ අයට කෑම දෙන්න ලොකු මුදලක් වැය කරනවා. ගංවතුරෙන් යට වුණු මිනිසුන්ට මේ දවස් තුන ඇතුළත එක බත් පැකට් එකක් දෙන්න ආණ්ඩුව කටයුතු කරලා නැහැ. මම මිනිසුන්ට කිව්වා, "එහෙනම් ඉස්කෝලෙට යන්න" කියලා. ඔවුන් කිව්වා, "අනේ! සර් බත් එකක් කන්න ඉස්කෝලෙට යනවාට වැඩිය හොඳයි අපේ ඥාති ගෙදරකට ගියාම ඒ මිනිසුන් දෙයි" කියලා. ඒ නිසායි අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරන්නේ, ඉස්කෝලෙකට හරි පන්සලකට හරි ගිහිල්ලා ඒ කඳවුරේ ඉන්න මිනිසුන්ට විතරක් බත් පැකට් දෙන්නේ නැතිව ගංවතුරෙන් හානියට පත් වුණු සියලුම අයට සලකන්න කියලා. මේ සඳහා රුපියල් කෝටි ගණනක් යන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මම පෙරේදා අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්තුමාට කථා කරලා කිව්වා, "අඩුම තරමේ මේ අයට උදේට පාන් ගෙඩියක් හරි දෙන්න" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
සාමාන්‍යයෙන් පවුලකට පාන් ගෙඩි දෙක ගණනේ දුන්නා නම්, එක පවුලකට රුපියල් 100යි යන්නේ.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු මන්ත්‍රීතුමා දැන් කිව්වා අනාථ කඳවුරුවලට ආවේ නැත්නම් කන්න දෙන්නේ නැහැ, අනාථ වෙලා හිටියාට කිසිම සැලකිල්ලක් කරන්නේ නැහැ කියලා. ඒ වාගේම කිව්වා, වර්තමාන තත්ත්වයට අනුව ගංවතුර අනතුරට පත් වෙච්ච උදවියට කිසිම දෙයක් ලැබෙන්නේ නැහැ කියලා. ඒ කරුණු සනාථ කරන්න ඉදිරිපත් කරන documents මොනවාද කියලා මම එතුමාගෙන් අහනවා. මොකද, එතුමන්ලාට කියන්න පුළුවන්-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ප්‍රාදේශීය ලේකම්වරුන්-

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'කැටෙපොල වසම' කියලා මම නමත් එක්කම ඒ විස්තර කිව්වා. ඔබතුමාට පුළුවන් නම්, ඒ මිනිස්සු වෙනුවෙන් එක රුපියලක් වැය කළාය කියලා ප්‍රාදේශීය ලේකම්ගෙන් වාර්තාවක් ගෙනෙන්න. ඒ මිනිස්සු වෙනුවෙන් එක රුපියලක් වැය කරලා නැහැ. ඒ ප්‍රදේශය දවස් හතරක් තිස්සේ ගංවතුරට යටවෙලා. රත්නපුර දිස්ත්‍රික්කයේම ගංවතුර බහින්නේ ඇල්ල ළඟින්. මම දැන් එහේ ඉඳලා ආපු කෙනෙක්. ඔබතුමාට මගෙන් ඒ තොරතුරු ඕනෑ නැහැ. ඔබතුමා ප්‍රාදේශීය ලේකම්ගෙන් වාර්තාවක් ගෙන්වා ගන්න. [බාධා කිරීමක්] ඒ මිනිස්සු වෙනුවෙන් රුපියලක්වත් ගෙවලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තර්ක කරන්න පුළුවන්. නමුත් අභිංසක මිනිහෙකුට බත් ඇටයක්වත් දෙන්න බැරි නම් මේ ආණ්ඩුවෙන් වැඩක් තිබෙනවාද? අපි ඔබතුමන්ලාට කියන්නේ මේකයි. හොයලා බලලා වැඩ කරන්න. අපි ආණ්ඩුවට කියන්නේ මේ මිනිසුන්ට කන්න දෙන්න කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මුළු රත්නපුර දිස්ත්‍රික්කයේම වතුර බහින්නේ ඇල්ලගාවින් නොවෙයිද කියලා එතුමාගෙන් අහන්න. ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තමයි කලවාන ආසනය තිබෙන්නේ. මම දැනුත් ඒ ප්‍රදේශයට ගිහිල්ලා ආවේ. තමුන්නාන්සේ ඒ පන්සලේ භාමුදුරුවන්ගෙන් මේ ගැන අහන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා මේ ගරු සභාව විතරක් නොවෙයි, මුළු රටම නොමහ යවනවා. මේ කරුණු හැන්සාඩ්ගත වීම පිළිබඳව අපි කනගාටු වනවා. අපි ගිය වතාවේ විතරක් රුපියල් මිලියන 3,800ක් ගංවතුර වෙනුවෙන් ලබා දුන්නා. ගාල්ල දිස්ත්‍රික්කය බලන්න. ගාල්ල දිස්ත්‍රික්කයේ යම්තම් වතුරින් යට වෙච්ච අයට පවා බත් පැකට් දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඉඩම්-කඩම්, ගෙවල්-දොරවල් නැති වෙච්ච අයට පවා වන්දි දීලා තිබෙනවා.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට ඒ සහන දුන්නා නම් හොඳයි.

[ගරු ජානක වක්කුඹුර මහතා]

මම කියන්නේ මේකයි. [බාධා කිරීමක්] ඔබතුමා ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට ආධාර දුන්නා නම් හොඳයි. මම කියන්නේ අපේ කැටේපොල වසමට එහෙම දුන්නේ නැහැ කියලායි. ඔබතුමන්ලාට පුළුවන් නම් එහෙම ආධාර ලබා දුන්නාය කියලා ඔප්පු කරන්න. මම තමුන්නාන්සේලාට කියන්නේ මේකයි. අද වනකොට අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැටේපොල වසමේ ජනතාවට රුපියලක්වත් දුන්නාද කියලා ප්‍රාදේශීය ලේකම්ගෙන් වාර්තාවක් ගෙනැල්ලා කියන්න. [බාධා කිරීමක්]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා ආධාර ලබා දෙන්න ඇති. නමුත් දුන්නේ නැහැ කියලා තමයි කියන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාට අපි කියනවා, හොයලා බලලා දීපු නැති තැන්වල අයට ආධාර ලබා දෙන්න කියලා. කෑ ගහන්න නම් පුළුවන්, ගරු මන්ත්‍රීතුමා. නමුත් අහිංසක මිනිසුන්ට බත් පැකට් එකක් දෙන්න බැහැ. හැබැයි, මම දැන් අපේ ඒ ගමේ කට්ටියට කථා කරලා කිව්වා, "තිබෙන තැනකින් කෑම ගන්න. මම සල්ලි දෙන්නම්" කියලා. අපි එහෙමයි වැඩ කරන්නේ. අපි ආණ්ඩුවෙන් දෙන තුරු බලාගෙන ඉන්නේ නැහැ. මම කථා කරලා කිව්වා, "තිබෙන තැනකින් ඕනෑ දෙයක් ගන්න. මම සල්ලි දෙන්නම්" කියලා. මිනිසුන්ට බත් පැකට් එකක් දෙන්න ආණ්ඩුවට බැරි වුණාට, අපි කොහොම හරි දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
දැන් ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගිය වතාවේ මම හාල් කිලෝ 40,000ක් ගෙනිහිල්ලා දුන්නා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ඇති, ඇති. දැන් ඇති. දැන් මටයි මයික් එක දීලා තිබෙන්නේ. ඔබතුමා කෑ ගහන්න එපා, මම කථා කරනවා. ඔබතුමා කෑ ගහන්න එපා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මන්ත්‍රීතුමා දැන් කථාව කරන්න.

[අ.භා. 6.10]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015 ජනවාරි 08 වැනි දා ලක්ෂ 62ක ජනතාව එකතුවෙලා යහ පාලන ආණ්ඩුව බලයට පත් කරන කොට ගෙනාපු මූලික යෝජනාවක් තමයි පරිසරය සුරක්ෂිත කිරීම. පරිසරයට ආදරය කරන පරිසර සංවිධාන, රාජ්‍ය නොවන සංවිධානවල සහ පුරවැසියන්ගේ සහයෝගය යහ පාලන ආණ්ඩුවට ලැබුණේ පරිසර සුරක්ෂිතතාව පිළිබඳ යහ පාලන රජයේ තිබුණු උනන්දුව නිසායි.

අද අපි මුහුණ දී තිබෙන ප්‍රබල පරිසර ගැටලුව තමයි, පොලිතීන් සහ ප්ලාස්ටික් නිෂ්පාදන හේතුවෙන් ඇති වන්නා වූ පාරිසරික තර්ජන. විපක්ෂයේ මන්ත්‍රීවරු දිගින් දිගටම නොයෙකුත් දේවල් පිළිබඳව කථා කළ හැටි අපි දැක්කා. නමුත් ප්ලාස්ටික් ගැන වචනයක්වත් කථා කළේ නැහැ; පොලිතීන් ගැන වචනයක්වත් කථා කළේ නැහැ; පොලිතීන් සහ ප්ලාස්ටික් දහනයවීමෙන් ඇති වන තත්ත්වය ගැන වචනයක්වත් කථා කළේ නැහැ. ඒවා මුකුත් කථා කළේ නැහැ. දැන් එතුමන්ලාට "Helping Hambantota" මතක නැහැ; මාවිල්ආරු කොමිස් ගැහිල්ලත් මතක නැහැ. දැන් ගංවතුරක් අල්ලාගෙන බොරුවට දහලනවා. මේක තමයි අද ඒකාබද්ධයේ ඉන්න අයගේ ප්‍රතිපත්තිය. මේක තමයි මේ ගොල්ලන්ගේ දර්ශනය. මේගොල්ලන් පසු ගිය කාලයේ කෑ ගැහුවා, නියඟය කියලා. දැන් වහින කොට කෑ ගහනවා, ගංවතුර කියලා. හෙට අනිද්දාට කෑ ගහයි, පින්න කියලා. ඊට පස්සේ කෑ ගහයි, සීතල කියලා. ඊට පස්සේ, අපි මේගොල්ලන්ට සීතලට බෙහෙත් දෙන්න අපට සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලා මාතෘකාවට අදාළව කථා කරන්න පුරුදු වෙන්න ඕනෑ. නමුත් කථා කරන්නේ මාතෘකාවට අදාළ දේවල් නොවෙයි. තමන්ගේ කටට එන ඒවා තමයි එතුමන්ලා කථා කරන්නේ. එක් මන්ත්‍රීවරයකු නිවාස ගැන කථා කළා. එදා නිවාස දුන්නේ කාටද? අක්කලාගේ, අයියලාගේ, මස්සිනාලගේ ළමයින්ට නැත්නම් තමන්ගේ පවුලේ උදවියට. ඒ අදාළ මුදලවත් හරියට ගන්නේ නැතිව තමයි ඔවුන්ට නිවාස දුන්නේ. අද ඒගොල්ලන්ට ඒ අතීතය අමතක වෙලා.

දැන් ලොකුවට ගංවතුර ගැන කථා කරනවා. ගංවතුර ගැන කථා කරන කොට ඔබතුමන්ලා මතක තියා ගන්න, අපි බලයට පත්වෙලා ගත වුණු අවුරුදු තුනට වැඩි හයහත්දාහක් සංවර්ධනය කරලා තිබෙන බව. හැබැයි, අවුරුදු 23ක් බලයේ ඉඳලාත් ඔබතුමන්ලාට ගංවතුර වළක්වන්න කිසිම ක්‍රමවේදයක් ගෙනෙන්න බැරි වුණා. තව මන්ත්‍රීවරයෙකු කියනවා, මොනරාගලට Fire brigade එකක් නැහැ ලු!

අවුරුදු 23ක් බලයේ හිටියේ අපිද? අපි බලයට ඇවිල්ලා අවුරුදු 3යි. එතුමාට පුළුවන් ඒ පිළිබඳ යෝජනාවක් ගෙනෙන්න. ඒ යෝජනාව ගෙනාවාම අපි fire brigade එකක් ලබා දෙන්න කටයුතු කරන්නම්. නිකම් බොරු මාතෘකා අල්ලාගෙන කථා කරන්න එපා. මේ ඒකාබද්ධ විපක්ෂය හැම දාම හිටියේ මාතෘකා නොමැතිව. මේ අයට මාතෘකා අහේනිය තිබුණේ. වැස්ස නැති කාලේ පැවිල්ල අල්ලාගෙන කෑ ගැහුවා. දැන් වහිනකොට ගංවතුර අල්ලාගෙන කෑ ගහනවා. ඔය මාතෘකා පස්සේ ගිහිල්ලා ජනතාවට සෙතක් කරන්න ඔබතුමන්ලාට බැහැ කියලා මතක් කරලා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අප මුහුණ දී තිබෙන ප්‍රබල පරිසර ගැටලුවක් තමයි, පොලිතීන් සහ ප්ලාස්ටික් නිෂ්පාදන හේතුවෙන් ඇති වන්නා වූ පාරිසරික තර්ජන. නමුත්, ජනතාවගේ දෛනික ජීවිතයේ සුවපහසු පැවැත්ම වර්ධනය කිරීම සඳහා පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන සුවිශේෂී දායකත්වයක් දක්වනවා. ඒ නිසා එක පාරටම මේවා නතර කිරීමේ හැකියාවක් නැහැ. ඒ නිසා අපි මේ අණ පනත් ගෙනැල්ලා බොහොම ක්‍රමානුකූලව මේ අයහපත් තත්ත්වය මඟ හරින්න කටයුතු කරලා තිබෙනවා. අපි එක පාරටම මේ නිෂ්පාදන නතර කළහොත් මේ රටේ ජනතාව කැලඹීමට පත් වනවා. එතකොට ජනතාව, හොරු, තක්කඩි, දූෂිතයන්, භීෂකයන් අමතක කොට පවත්නා රජයට රිද්දන්න බලනවා. දූෂිතයන් හා භීෂකයන්ද තමන්ට බේරීමට හොඳම අවස්ථාවක් උදා වී ඇති බව තේරුම්ගෙන, ජනතාව උසි ගන්වනවා; ආණ්ඩුව පෙරළන්න හදනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයට, රටට, ජනතාවට හිතකර මෙවැනි යෝජනා අප ක්‍රියාත්මක කළ යුතුයි. ඒවා ඉතා ඉවසිලිවන්තව හා බුද්ධිමත්ව ක්‍රියාත්මක කළ යුතු බව මම මතක් කරන්න කැමැතියි.

මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතීන් නිෂ්පාදන දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය, විකිණීම පළමු වරට තහනමට ලක්

කරන ලද්දේ 2006 ඔක්තෝබර් 10 දින නිකුත් කළ 1466/5 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින්. නමුත්, එම නීතිය ආර්ථික, සමාජ හා දේශපාලන කරුණු මුල් කරගෙන නිසියාකාරව ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ කාලයේ, 2015 දක්වා නීති කිසිවක් ක්‍රියාත්මක වුණේ නැහැ. දැන් තමයි නීති ක්‍රියාත්මක වෙන්නේ. එය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු පාර්ශ්ව උනන්දු වූයේත් නැහැ; ජනතාව දැනුවත් කළේත් නැහැ. ඒ නිසා අදාළ නීතිය ගැසට් පත්‍රයේ තිබියදී නීතියට පටහැනිව පොලිතීන් හා ප්ලාස්ටික් භාවිත වුණා. එමඟින් සිදුවන පාරිසරික තර්ජනය වැඩි වුණා. රාජපක්ෂලා ගොඩ ගහපු කුණු කදු යහ පාලන රජයේ ඔළුව මත කඩා වැටුණා. ඒ නිසා වත්මන් පරිසර ඇමතිවරයා ලෙස ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හට පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා අද දින සාකච්ඡාවට ගනු ලබන රෙගුලාසි ගෙන ඒමට සිදු වුණා. කවුරු ආණ්ඩු කළත් සැබෑ ලෙසම රටට, ජනතාවට ආදරයට කරනවා නම් ජනතා නියෝජිතයන් ලෙස පාට, පක්ෂ භේද අමතක කර මේ රෙගුලාසි ක්‍රියාත්මක කරන්න සහයෝගය ලබා දිය යුතුයි. දේශපාලන වාසි ලබාගත හැකි, කුණු ගොඩවල්වලට ආදරය කරන අයට පමණක් මෙම යෝජනාවලට විරුද්ධ විය හැකියි.

මට මේ මොහොතේ මතක් වනවා, පසුගිය කාලයේ බොරලු කපපු හැටි, කළු ගල් කඩපු හැටි, වැලි ගොඩදාපු හැටි. ඒ විතරක් නොවෙයි, බොරලු වළවල්වලට විරුද්ධ වෙච්ච කට්ටිය මරපු හැටි; ටිපර් ඇතුළු වාහනවලින් ඇවිත් හප්පපු හැටි; වෙඩි තබා මරපු හැටි. ඒ ඔක්කෝම කළේ බොරලු කපන ව්‍යාපාර කරගන්නයි. ඒ වාගේ පරිසරයක් තිබුණ ආණ්ඩුවක්, රටක් තමයි අපි යහ පාලනයට හැරෙව්වේ.

පරිසර නීති කෙපමණ තිබුණත් ජනතාව ඒ ගැන නොදැනුවත් නම්, ඒවා පිළිපැදීමට මැළිකමක් දක්වයි නම්, පාරිසරික ගැටලු ඇති වීම වැළැක්වීම අපහසු කාර්යයක්. ඒ නිසා ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රමුඛතාවක් දී කටයුතු කරන්න සිද්ධ වනවා. ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන් තමයි ජනතාවත් සමඟ එදිනෙදා ගැටෙන්නේ. මේ නිලධාරීන්ට හොඳ ඉවසීමක් තිබිය යුතුයි. ඒ වාගේම, ජනතා ගැටලු පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුයි. ඒ වාගේම ජනතාවගේ ජීවන වෘත්තිය සඳහා මූලිකත්වයක් දීමකින් තොරව නීති රීති කොච්චර හැදුවත් ඒවා ක්‍රියාත්මක කරන්න බැහැ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

පළමුව අප කළ යුත්තේ දැනට ඉතිරිව තිබෙන පරිසර පද්ධතිවල ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමයි. ජනතාව නීති විරෝධීව තම ජීවනෝපාය මාර්ග සඳහා වගා කිරීමට අල්ලාගෙන ඇති පාරිසරික පද්ධති ක්‍රම-ක්‍රමයෙන් ඔවුන්ගේ ග්‍රහණයෙන් මුදා ගැනීමට කටයුතු කළ යුතුයි. මෙහිදී විශේෂයෙන්ම එකී ජනතාවට වෙනත් ජීවනෝපාය මාර්ගයක් හඳුන්වා දීමට කටයුතු කළ යුතු බව මා මතක් කර දෙන්න ඕනෑ. පසුගිය ආණ්ඩුව කාලයේ ඉදි කරපු හෝටල් ව්‍යාපෘති හේතුවෙන්ද විශාල ලෙස පරිසරයට තර්ජන එල්ල වුණා. මේ සම්බන්ධව පරිසර සංවිධානද විරෝධතා පෑවා. ඒ විරෝධතා අවසන් වූයේ සුදු වැන් භීතිකාවට ලක් වීමෙන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හෝටල් ව්‍යාපෘති ගැන කථා කරනකොට සඳහන් නොකරම බැරි ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ තමයි, හයට රිජන්සි හෝටලය. රුපියල් බිලියන 04ක් ආයෝජනය කර මෙම හෝටලය හම්බන්තොට ප්‍රදේශයේ හදන්න පසුගිය ආණ්ඩුව සැලසුම් කළා.

රුපියල් මිලියන 315ක් ඒ සඳහා වියදම් කර තිබුණත්, හෝටලය ඉදි වෙලා නැහැ. මේ රුපියල් මිලියන 315ට මොකක්ද වුණේ? මේ රුපියල් මිලියන 315 ගියේ කාගේ සාක්කුවටද? මෙය, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ අභිංසක කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත් මහතා විසින් පරිසරය ගැන ගන්නා ලද තීන්දුවක්. මොකද, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ ප්‍රධානියා ලෙස මෙම ගනුදෙනුවට සම්බන්ධ වන්නේ ඔහුයි. ගාමිණී සෙනරත් අභිංසක නම්, මේ රුපියල් මිලියන 315 සාක්කුවට දමා ගත්තේ කවුද කියලා රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ සභාවට කිව යුතුයි.

අද රාජපක්ෂ රෙජීමය සුදු පිරුවට අන්දවලා, පිරිත් නූල් බඳින මේ ගාමිණී සෙනරත්, රක්ෂණ සංස්ථාවේ සභාපති ලෙස කටයුතු කරද්දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ -සිලෝන් පෙට්‍රෝලියම් එකේ- 2009, 2010 හා 2011 වර්ෂවල වත්කම් ප්‍රතිරක්ෂණය කිරීම සඳහා යැයි කියමින් පිට රටට ගෙන ගිය රුපියල් මිලියන 200ක පමණ මුදලට මොකද වුණේ? මේ වත්කම් ප්‍රතිරක්ෂණය වෙලා නැහැ. ඒ දවස්වල මේවා ගැන පුවත් පත් මඟින් ප්‍රශ්න කරනකොට එම මාධ්‍යවේදීන්ට තර්ජනය කළේ කවුද? බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ ආර්ථික පර්යේෂණ ඒකකය මඟින් මේවා සම්බන්ධයෙනුත් පරීක්ෂා කර බලා රටට හෙළිදරවු කරන්න කියලා මා කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පරිසරය ගැන කථා කරද්දී වනජීවී අමාත්‍යාංශය අමතක කරන්න බැහැ. ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 13ක් ආවරණය වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙනුයි. එයට ජාතික වනෝද්‍යාන - අභය භූමි-, ස්වාභාවික රක්ෂිත ඇතුළත් වෙනවා. අලි ඇතුන් ඇතුළු දේශීය සත්ත්ව විශේෂ සියල්ලමත්, ශාක විශේෂ සියල්ලමත් සුරැකීම එම අමාත්‍යාංශයේ වග කීමක් වෙනවා. පසුගිය කැබිනට් සංශෝධනයෙන් එම අමාත්‍යාංශය සඳහා වග කීමක් දැරිය හැකි ඇමතිවරයකු පත් වුණා. ඒ ගැන අපි සතුටු වනවා.

ගෘහ ආශ්‍රිතව හැදෙන බල්ලා, පූසා, හරකා හා එළුවා වනජීවී අමාත්‍යාංශයට අයත් නොවන බැවින්, රාජපක්ෂලා ඇති දැඩි කරන සුරතල් බල්ලෝ එම අමාත්‍යාංශයට විරුද්ධව බිරුවත්, එම ඇමතිවරුන්ට විරුද්ධව බිරුවත් අපි කලබල විය යුතු නැහැයි කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Order made by the President under Section 23 W of the National Environment Act, No. 47 of 1980 to be read with Section 51 of the Nineteenth Amendment to the Constitution of the Democratic Socialist Republic of Sri Lanka relating to managing usage of Polythene and published in the Gazette Extraordinary No. 2034/33 of 01st September 2017, which was presented on 09.05.2018, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Order made by the President under Section 23 W of the National Environment Act, No. 47 of 1980 to be read with Section 51 of the Nineteenth Amendment to the Constitution of the Democratic Socialist Republic of Sri Lanka relating to managing usage of Polythene and published in the Gazette Extraordinary No. 2034/34 of 01st September 2017, which was presented on 09.05.2018, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Order made by the President under Section 23 W of the National Environment Act, No. 47 of 1980 to be read with Section 51 of the Nineteenth Amendment to the Constitution of the Democratic Socialist Republic of Sri Lanka relating to managing usage of Polythene and published in the Gazette Extraordinary No. 2034/35 of 01st September 2017, which was presented on 09.05.2018, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික පාරිසරික පනත : නියෝග
தேசிய சூழல் சட்டம்: ஒழுங்குவிதிகள்
NATIONAL ENVIRONMENT ACT: REGULATIONS

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Regulations made by the President under Section 32 of the National Environment Act, No. 47 of 1980 read with Section 23 J and 23 K of that Act and Section 51 of the Nineteenth Amendment to the Constitution of the Democratic Socialist Republic of Sri Lanka relating to managing usage of Polythene and published in the Gazette Extraordinary No. 2034/36 of 01st September 2017, which were presented on 09.05.2018, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික පාරිසරික පනත : නියමය
தேசிய சூழல் சட்டம்: கட்டளை
NATIONAL ENVIRONMENT ACT: ORDER

I

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Order made by the President under Section 23 W of the National Environment Act, No. 47 of 1980 to be read with Section 51 of the Nineteenth Amendment to the Constitution of the Democratic Socialist Republic of Sri Lanka relating to managing usage of Polythene and published in the Gazette Extraordinary No. 2034/37 of 01st September 2017, which was presented on 09.05.2018, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Order made by the President under Section 23 W of the National Environment Act, No. 47 of 1980 to be read with Section 51 of the Nineteenth Amendment to the Constitution of the Democratic Socialist Republic of Sri Lanka relating to managing usage of Polythene and published in the Gazette Extraordinary No. 2034/38 of 01st September 2017, which was presented on 09.05.2018, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Adjournment Motion to be moved by the Hon. Heshan Withanage. Before he starts, will an Hon. Member propose the Hon. (Dr.) (Mrs.) Thusitha Wijemanna to the Chair?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

I propose that the Hon. (Dr.) (Mrs.) Thusitha Wijemanna do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.

අතන් පිරකු, මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (වෛත්තිය කලානිති) (திருமதி) තුසිතා විජේමාන්න අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා.

ගොවි නිෂ්පාදන ඍජුව මිලදී ගැනීමේ ක්‍රමවේදය
விவசாய உற்பத்திகளை நேரடியாகக் கொள்வனவு செய்யும் முறைமை
METHODOLOGY FOR DIRECT PURCHASE OF FARM PRODUCE

[අ.භා. 6.22]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද ගොවියාගේ නිෂ්පාදන ඍජුව මිලදී ගැනීමේ ක්‍රමවේදයක් නැත. එමෙන්ම අතිරික්ත ඵලදාව නිසි පරිදි ගබඩා කිරීමේ දුර්වලතාවක්ද හඳුනාගෙන ඇත. ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය නිසි මිලට අළෙවි කර ගැනීමට නොහැකි වීම තුළ ගොවියා දැඩි ආර්ථික අපහසුතාවකට පත්ව ඇති අතර අතරමැදියා වැඩි ආදායම් ලබන තත්ත්වයකට පත්ව ඇත. එහෙයින් ගොවීන්ගේ නිෂ්පාදන මිලදී ගෙන පාරිභෝගිකයාටද එම වාසිය ලබා දෙන වැඩ පිළිවෙළක් සකසන ලෙස මෙම සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "මඩ සෝදා ගත් කල ගොවියා රජකමටත් සුදුසුයි" කියලා අපේ පුරාණ කියමනක් තිබුණු බව මා මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමැතියි. මේ රටේ දේශපාලනඥයන්, මේ රටේ පාලකයන් බිහිවන හැම වෙලාවේම මේ රටේ ගොවියාට තිබෙන දුෂ්කරතාවන්, ගොවියාට තිබෙන අපහසුතාවන් පෙන්වා දෙමින් ගොවියා වෙනුවෙන් තමන් කරන්න යන කටයුතු පිළිබඳ යෝජනාවන් ඉදිරිපත් කළා. ඒ අනුව රටේ බහුතර ගොවි ජනතාව තමන් වෙනුවෙන් ඉදිරිපත් වන නායකයන් පත් කරන්න වෙහෙසිලා, ඔවුන් නායකයන් බවට පත් කළා.

මම මේ වෙලාවේ විශේෂයෙන් කිව යුතු දෙයක් තිබෙනවා. මම ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට සම්බන්ධ කරුණුවලට අදාළව අද වෙනකොට මේ රට තුළ විශාල ව්‍යසනයක් ඇති වී තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට මම ඒක කියනවා. අපේ ගරු අමාත්‍යතුමා මේ වෙලාවේ මෙතැන ඉන්නවා. විෂය භාර නවක අමාත්‍යවරයා හැටියට කටයුතු කරන එතුමාට මම සුබ පතනවා. මේ රටේ ගොවියාට අවශ්‍ය ගොවි ද්‍රව්‍ය ටිකට නිසි මිලක් නොලැබෙන්නත්, ගොවියාට නිසි පරිදි තමන්ගේ කර්මාන්තය කරගන්න නොහැකි වෙන්නත් ප්‍රධාන හේතුව මේ රටේ විශාල මාෆියාවක් ක්‍රියාත්මක වීම කියලා අපි විශ්වාස කරනවා. අපි උදාහරණයක් විධියට ගත්තොත්, පසු ගිය දවස්වල පුවත් පත්වලින් අපි දැක්කා, දඹුල්ලේ කැකිරි කිලෝ එකක් රුපියල් 5ටවත් දෙන්න බැරිව අලින්ට කන්න ගිහින් දාලා එනවා. හැබැයි, කොළඹ supermarketsවල බැලුවාම කැකිරි කිලෝ එකක් රුපියල් 50යි. මීල ගණන්වල මේ විධියේ විශාල වෙනසක් තිබෙනවා. අභිංසක ගොවියා තමන්ගේ කන කර උකස් තියලා මාස ගණනක් දුක් විඳලා නිෂ්පාදනය කරන ගොවි ද්‍රව්‍ය ටිකට නිසි මිලක් ලබා ගන්න හැකි යන්ත්‍රණයක් සකස් කරන්න බැරි වෙලා තිබෙන්නේ දේශපාලන අධිකාරිය හරි තැනට අවශ්‍ය කටයුතු කරලා නැති නිසායි. ගොවියාට අවශ්‍ය සහයෝගය, ශක්තිය දෙන්න අපි උනන්දු වුණාට, ඔවුන්ට අවශ්‍ය පොහොර සහනාධාරය දීලා, ගොවියා ශක්තිමත් කරන්න කටයුතු කළාට අද ගොවි නිෂ්පාදනවලට මිලක් නැහැ. ඇමතිතුමා මීට පෙරත් කියනවා මම දැක්කා, කෘෂි රක්ෂණ මණ්ඩලය තුළින් ගොවියාට ලබා දී තිබෙන ශක්තිමත්භාවය පිළිබඳව. නමුත් ගොවියාට හැම පැත්තෙන්ම හයිය දුන්නාට, ගොවි නිෂ්පාදනවලට අද මිලක් නැහැ.

අද ගොවියා ටිකෙන් ටික ගොවිතැනින් ඉවතට යනවා. මා නියෝජනය කරන වලව කලාපයේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ යම් කොටසක් මීට අවුරුදු 10කට, 15කට ඉස්සෙල්ලා වී ගොවිතැනින් පෝෂණය වුණා. මේ වෙනකොට එම ප්‍රදේශයේ සියයට 50ක් පමණ වී ගොවිතැනින් ඉවත් වෙලා, කෙසෙල් වැනි වෙනත් විකල්ප වගාවන්වලට ගිහින් තිබෙනවා. මොකද හේතුව, වාරි පද්ධතිය ක්‍රමවත් නොවීම. අපි මොන තරම් කයිවාරු ගැහුවත්, එදා රජ කාලයෙන් පස්සේ අපේ වාරි පද්ධතිය හරියට හරි තැනට ගෙනෙන්න අපි කටයුතු කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වාරි පද්ධතිය වැඩි දියුණු කරන හැම වෙලාවකදීම සිද්ධ වෙලා තිබෙන්නේ, කවුරුන් හෝ දේශපාලනඥයකුගේ හෙංචියෙක් එහි කොන්ත්‍රාත් එක අරගෙන මඩ ටිකක් කූරු ගානවා විතරයි, අවශ්‍ය තත්ත්වයට වැව හදන්නේ නැහැ.

පසු ගිය කාලයේ අපේ කෘෂිකර්ම අමාත්‍යතුමාගේ දිස්ත්‍රික්කයේ යම් සිද්ධියක් වුණා. ඒක මේ වෙලාවේ මතක් කර දෙන්නට ඕනෑ. ගොවියාගේ දියුණුව වෙනුවෙන් යමක් කරන්න යහ පාලන ආණ්ඩුව කටයුතු කරනවා කියලා පසු ගිය කාල සීමාව තුළ සූරියවැව ප්‍රදේශයේ වැව් හාරන්න පටන් ගත්තා. ඒක කරන්නේ ගොවියා වෙනුවෙන්ද කියලා අපි හොයලා බැලුවාම, ඒ එක වැවක්වත් ගොවියාට අවශ්‍ය විධියට සුදුසු මට්ටමකට නොවෙයි හදලා තිබෙන්නේ. මම දන්න එක වැවක් තිබෙනවා, සූරියවැව නගරයේ. දේශපාලනඥයකුගේ වුවමනාවට Highway එකට, නැත්නම් අධිවේගී මාර්ගයට පස් දෙන්න තමයි එම වැව හාරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ගිය වෙලාවක බලන්න, ඒ වැවේ වතුර ඇළට යන්නේ නැහැ. ඇළට වඩා අඩි 30ක් විතර ගැඹුරට වැව හාරලා තිබෙනවා. මොකද, මීනිහාට ඕනෑ වැව හාරන්න නොවෙයි, මීනිහාට අවශ්‍ය වෙලා තිබෙන්නේ ඒකේ පස් ටික ගන්නයි. අන්න ඒ විධියට තමයි ගොවියාට සැලකුවේ.

[ගරු හේෂාන් විතානගේ මහතා]

ආණ්ඩුවේ සිටින මන්ත්‍රීවරු විධියට අද අපි ලජ්ජා වෙනවා, අපි සියලු දෙනාම එකතු වෙලා යහ පාලන ආණ්ඩුවක් ගෙනැල්ලා ගොවියා ශක්තිමත් කරනවා කියලා, ගොවියාට හයිය දෙනවා වෙනුවට තවත් මං කොල්ලකාරයෝ ටිකක් තමන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීම ගැන. ගරු ඇමතිතුමනි, ඔබතුමා අභිනව ඇමතිවරයා විධියට, ඒ වාගේම ගොවි පරපුරක කෙනෙක් විධියට, බහුතර ගොවීන් ප්‍රමාණයක් ජීවත් වන ප්‍රදේශයක් නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයකු විධියට මෙන්න මේ මාෆියාවෙන් ගොවියා නිදහස් කරගන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලනවා.

අල ගොවියාත්, ලූනු ගොවියාත් හැමදාම අසරණ වෙනවා. මොකද, අල ටික ගලවන වෙලාවට; ලූනු ටික ගලවන වෙලාවට තමයි ඒවා පිට රටින් මෙහෙට ගෙන එන්නේ. ඊට පස්සේ ගොවියා ආපහු අල, ලූනු සිටුවන කාලයට තමයි අලවලට සහ ලූනුවලට බදු ගහන්නේ. එහි වාසිය එන්නේ අල ගොවියාට හෝ පාරිභෝගිකයාට නොවෙයි. පාරිභෝගිකයාත් අසරණ තත්ත්වයට පත් වෙනවා; ගොවියාත් අසරණ තත්ත්වයට පත් වෙනවා. මේ රටේ අතර මැදි කූට වෙළෙඳුන් අතට තමයි එහි වාසිය යන්නේ. එම වෙළෙන්දෝ නියෝජනය වෙන්නේ කොහෙන්ද? මේ රටට එම ද්‍රව්‍ය ආනයනය කරන මහා පරිමාණ වෙළෙන්දෝ ටික නියෝජනය වෙන්නේ කොහෙන්ද කියලා සොයා බලන්න අවශ්‍යයි. එම නිසා හැම ගොවි ද්‍රව්‍යයක්ම නියාමනය කරමින් මේ රටේ අහිංසක ගොවියා ආරක්ෂා කිරීමේ වගකීම තිබෙන්නේ ඔබතුමාටයි. අද ඔබතුමා මෙහි රැඳී සිටින වෙලාවේ මේ කාරණයත් කියන්න ඕනෑ. පුංචි අහිංසක කැකිරි ගොවියා තමන්ගේ ජීවිකාව විධියට කරන ගොවිතැනට ශක්තියක් දෙන්න බැරි නම්, ඔවුන්ට එහි වාසිය ගන්න බැරි නම් ඒ සඳහා ආණ්ඩුවක් විධියට අපි වග කියන්න ඕනෑ. එම නිසා පුළුවන් විධියට හැම ප්‍රදේශකම ශීතාගාර ක්‍රමයක් ඇති කිරීමට කටයුතු කරන්න. අපි දන්නවා, අවශ්‍ය ප්‍රමාණය එක් වරම ඇති කරන්න බැරි වෙයි. නමුත් පුළුවන් විධියට ඒ කටයුත්ත කරන්න. ඒ වාගේම කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ඇති කිරීමත් කළ යුතුයි. අපි පසු ගිය කාලයේ දඹුල්ල ප්‍රදේශයේ එවැනි මධ්‍යස්ථාන කිහිපයක් දැක්කා. ග්‍රාමීය වශයෙන් ගොවියාට අවශ්‍ය ශක්තිය ලබා දීලා ඔවුන් නගා සිටුවන්න කටයුතු කරන්නය කියන ආදරණීය ඉල්ලීම කරන ගමන්, මේ රටේ සුවහසක් ගොවි ජනතාව වෙනුවෙන් ඔවුන් අමාරුවෙන් නිෂ්පාදනය කරන ගොවි ද්‍රව්‍ය ටිකට නිසි මිලක් ලබා ගැනීමේ නිසි ක්‍රමවේදයක් හදන්න ඔබතුමාට හැකිවේවා, ශක්තිය ලැබේවා කියමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට යෝජනාව ස්ථිර කිරීම, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.28]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉතා වැදගත්, කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් වී තිබෙනවා. ඔබතුමිය මූලාසනය දරන වේලාවේ එය ස්ථිර කරමින් මට කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

අපේ මිත්‍ර ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කළ මෙම යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක් බව මේ රටේ මුළුමහත් ජනතාවම පිළිගන්නවා. මේ කාරණය සම්බන්ධව පසුගිය කාලයේ රට තුළ විශාල ආන්දෝලනයක් ඇති වුණා වාගේම, ගොවි ජනතාව වරින් වර උද්ඝෝෂණ කළා; විරෝධතා මතු කළා. තමන්ගේ වගාවලින් ලැබෙන අස්වැන්නට වෙළෙඳ පොළේදී නිසි වටිනාකමක් ලබා ගන්න නොහැකිව ඔවුන් ඒ හඬ අවදි කළා. මෙය අද ඊයේ සිදු වූ දෙයක් නොවෙයි. මේ කාරණය අපි මේ රටේ හැම දාම දකිනවා. එක පැත්තකින් වගා කරන ගොවියා තමන්ගේ අස්වැන්නට මිලක් හොයා ගන්න බැරිව, ඒ අස්වැන්න අළෙවි කර ගන්න බැරිව, තමන් වියදම් කළ මුදලවත් හොයා ගන්න බැරිව මහා අපහසුතාවකට පත් වෙනවා; කලකිරීමට පත් වෙනවා; ඒ භෝග වන සතුන්ට දමනවා; කුණු කූඩයට දමනවා. අනික් පැත්තෙන් අල, ලූනු ඇතුළු ඇතැම් එළවලු වර්ග වෙළෙඳ පොළේ මිල අධික නිසා ඒවා මිලදී ගන්න බැරිව පාරිභෝගික ජනතාව මැසිවිලි නහනවා. එහෙම නම් කොතැනද මේ ප්‍රශ්නය තිබෙන්නේ? අතරමැදියන් හැටියට මේවා මිලදී ගන්නා අය හිතා මතාම ගොවි ජනතාව අපහසුතාවට පත් කරනවාද? එහෙම නැත්නම්, මේ මිලදී ගැනීමේ යන්ත්‍රණයේ තිබෙන අඩු පාඩුව මොකක්ද කියා සොයා බලන්න, ඒකට පිළියම් සොයන්න අපි ගත කළ කාලය ඕනෑවටත් වඩා වැඩියි කියන එකයි මගේ විශ්වාසය.

දකුණු පළාත නියෝජනය කරන නව කෘෂිකර්ම ඇමතිතුමා ප්‍රායෝගිකව මේ කාරණා ගැන දන්නා කෙනකු හැටියට මේ හැම කාරණයකටම මැදිහත් වේවි කියා අපි විශ්වාස කරනවා. එතුමා වැඩ භාර ගත්ත අවස්ථාවේ හොඳ ප්‍රකාශයක් කළා. අමාත්‍යාංශය වෙනුවෙන් ලබා ගත් සමහර ගොඩනැඟිලි, එනම් මේ රටේ ආන්දෝලනයට ලක් වුණු, විවිධ විවේචනවලට ලක් වුණු, මහජන මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කර කුලියට ගත් සමහර ගොඩනැඟිලිවල බදු කාලය දීර්ඝ කරන්නේ නැහැය කියා එතුමා ප්‍රකාශයක් කළා මා දැක්කා. ඒක ඉතාම හොඳ කාරණයක්. පසු පෙළ තරුණ මන්ත්‍රීවරුන් හැටියට අපි එතුමාගේ ඒ ප්‍රකාශය ගැන ඉතා සතුටට පත් වෙනවා. අපේ ආණ්ඩුව තුළ වුණත්, යම් කිසි වරදක්, අඩු පාඩුවක් සිද්ධ වෙනවා නම් අපිව පත් කළ ජනතාව වෙනුවෙන් ඒ වැරදි, අඩු පාඩු පෙන්වා දෙන්න අපට ආත්ම ශක්තියක් තිබෙනවා. අපි මේ යහපාලන ආණ්ඩුවේ දකින අනෙකුත් සියලු ගුණාංග අතර, වටිනාකම් අතර වැදගත්ම දේ වන්නේ, අපේ ආණ්ඩුවේම වැරදි දේවල් වැරදි හැටියට දැකලා කථා කරන්න අපට නිදහස තිබීමයි. පසුගිය කාලයේ එහෙම කථා කළා නම් මොකද වෙන්නේ? එදා වීරයන් හැටියට දැකපු, වීරයන් හැටියට හැසිරුණු, වීර චරිත වෙන්න උත්සාහ කළ, ඇතැම් මාධ්‍යවලට ගිහින් මහ දවල් තර්ජනය කරලා මාධ්‍යවලින්ම හොඳට නාගෙන ආපු සමහර උදවිය එදා පැවැති සමහර ආණ්ඩුවල, සමහර නායකයන් ඉස්සරහා කුක්කන් වාගේ හැසිරුණු ආකාරය කල්පනා කර බැලුවාම, පසු පෙළ මන්ත්‍රීවරුන් හැටියට අද අපට ඒ නිදහස ඕනෑවටත් වඩා ලැබී තිබෙනවාය කියා මම හිතනවා. අපේ රජය වුණත් අපි බලාපොරොත්තු වන ගමන යන්නේ නැත්නම්, අපි බලාපොරොත්තු වන ඉලක්කයට, දිශාවට ගමන් කරන්නේ නැත්නම්, ඒ අඩු පාඩු විවෘතවම පෙන්වා දෙන්න අද අපිට පුළුවන්කම ලැබී තිබෙනවා.

සියලු දේවල් ශුභවාදීව, සියයට සියයක් සාර්ථකව කර ගන්න පුළුවන් අවස්ථාව හැම වෙලාවකම නොලැබෙන්න පුළුවන්. එම නිසා අපි හැකි උපරිමයෙන් උත්සාහ කර උපරිම ප්‍රමාණයෙන් යහපත් තැනකට මේ ක්‍රියාදාමයන් තල්ලු කරන්න ඕනෑ. අද දින සභාව කල්තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද මේ යෝජනාව ඉතාම වටිනා, කාලෝචිත යෝජනාවක් හැටියට මා හඳුන්වනවා.

ගොවියා වෙනුවෙන් පමණක් නොවෙයි, පාරිභෝගිකයා වෙනුවෙනුත්, කෘෂි කර්මාන්තයෙන් පෝෂණය වුණු ජනතාවක් සිටින කෘෂි කාර්මික රටක් හැටියට අපේ රට හදුන්වමින් මේ යෝජනාව තුළ අපිට ගත හැකි බොහෝ දේවල් අන්තර්ගත වෙලා තිබෙනවාය කියන කාරණයත් ඉස්මතු කරමින්, මේ සඳහා යන්ත්‍රණයක් හැදීමේ වගකීම රජයක් හැටියට අපේ රජයට තිබෙන බව අධිෂ්ඨාන කරගෙන මේ සඳහා ඉදිරි වැඩ පිළිවෙළක් සකස් කර ගන්න ඉදිරිපත් වෙමුය කියා යෝජනා කරමින්, මට කථා කරන්න කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 6.33]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මූලාසනයේ ඉන්න මේ මොහොතේදී, අපට පුරප්පාඩුවක්ව පවතින නියෝජ්‍ය කථානායක ධුරය ඔබතුමියට ලැබෙවායි කියා අපි සියලුදෙනා වෙනුවෙන් මුලින්ම මා ප්‍රාර්ථනා කරනවා.

අද දින සභාව කල් තබන අවස්ථාවේ අපේ ගරු ඡෝෂාන් විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. අපේ ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා එම යෝජනාව ස්ථිර කළා. විශේෂයෙන්ම දකුණේ කෘෂි කර්මාන්තය තම උරහිස මතට අරගෙන වැඩ කරන්න ලැහැස්ති වෙලා සිටින අමාත්‍යවරයකු සිටිනා වෙලාවක මෙවැනි වැදගත් සංකල්පයක් මේ සභාව හමුවේ තබන්න හැකි වීම පිළිබඳව මා සතුටුවනවා. එතුමා ප්‍රාදේශීය සභාවක සභාපතිවරයකු හැටියට ඉඳලා පළාත් සභාවට ඇවිත්, ඉන් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට පත් වුණා. එපමණක් නොවෙයි, එතුමා නියෝජ්‍ය අමාත්‍යවරයකු, කැබිනට් අමාත්‍යවරයකු විධියට කටයුතු කළ කාලය පිළිබඳවත් අපි දන්නවා. ඒ වාගේම අද පක්ෂයක මහ ලේකම්වරයකු විධියටත් එතුමා කටයුතු කරනවා. ගරු ඇමතිතුමනි, එම නිසා ඔබතුමාට අත් දැකීම් රාශියක් තිබෙනවා.

වසර දෙදහස්පන්සිය ගණනක ඈත අතීතයේ ඉඳලා අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය, ඒ වාගේම දකුණු පළාතේ ඓතිහාසික යුගවලදීත්, උඟව වෙල්ලස්ස ප්‍රදේශවල අක්කර ලක්ෂ ගණනක් අස්වද්දපු ඉතාම සරු පසක් තිබෙන, ගොවිතැනට උචිත වූ හොඳ දේශගුණික රටාවක් තිබෙන ලංකාව වාගේ රටක සිටින අපි තවමත් ජීවත් වන්නේ එක්කෝ විදේශ රටකට ගිහින් රැකියාවක් කරලා හරි හම්බ කරන තුට්ටු දෙක ආදායමක් හැටියට අරගෙනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අනික් පැත්තෙන් අපි නිෂ්පාදනය කරන ඇහලුම් අපනයනය කර ලැබෙන ආදායම දෙවැනි ස්ථානය ගන්නවා. ඊළඟට, අපි සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව තෙවන ස්ථානය ගන්නවා. මේ රටේ තේ, පොල්, රබර් ගත්තාම ඊටත් ටිකක් එහාට යනවා. අද සුළු අපනයන භෝගවල නිෂ්පාදනය වැඩිවෙලා එම නිෂ්පාදන අපනයන කර්මාන්තයක් හැටියට දියුණු වනකොට වසර දෙදහස්පන්සිය ගණනක ඈත අතීතයක සිට තිබුණු අපේ වී ගොවිතැනත් ආපස්සට යන බව ඉතාම කනගාටුවෙන් වුණත් මම කියන්න ඕනෑ. ඒ වාගේම අපේ වී ගොවිතැනත් එක්ක බද්ධ වුණු එළවලු වගාව, පලතුරු වගාව, නොයෙක් ධාන්‍ය වර්ග මේ රටේ නිෂ්පාදනය කළ අතීතය ගැන අපි දන්නවා. අතීතයේ අපේ රටේ කුරක්කන් වගාවත් හොඳින් සිදුවුණු බව අපි දන්නවා. වියළි කලාපය වාගේම දකුණේ තෙත් කලාපයේත් එළවලු වගාව වාගේ දේවල් අතීතයේදී ඉතාම හොඳින් තිබුණා. නමුත්, අපේ රටේ ජනතාව අද මේ වගා සියල්ල තුළින් ඈත් වෙලා තිබෙනවා. මුදලට, එහෙම නැත්නම් තමන් ලබන පඩි පතින් කීයක් හරි දීලා හාල් ටික ගෙනැත්, පලතුරු ටික ගෙනැත්, එළවලු ටික ගෙනැත් තමන්ගේ ආහාර අවශ්‍යතාව ඉටු කර ගන්නා තත්ත්වයකට අද මිනිසුන්ගේ මානසිකත්වය ඇද වැටී තිබෙනවා. එම නිසා අද අපිට මේ අභියෝගය ජය ගන්න සිද්ධ වෙලා තිබෙනවා.

ගරු ඡෝෂාන් විතානගේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ, ඇත්ත වශයෙන්ම මේ රටේ ආහාර නිෂ්පාදනය අපට ප්‍රමාණවත්. අපේ එළවලු නිෂ්පාදනය, අනිකුත් ධාන්‍ය වර්ග නිෂ්පාදනය, වී නිෂ්පාදනය මේ රටේ ස්වයංපෝෂිත ආර්ථික රටාවක් වෙනුවෙන් අපට නිර්මාණය වෙලා තිබෙනවා. නමුත්, අපිට ඒක හරියට කළමනාකරණය කර ගන්න බැරි වීම නිසා තමයි මෙම ඛේදවාචකයට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. කලින් කිව්වා වාගේ, සමහර භෝගවල අස්වැන්න ගන්න කාලය වනකොට ඒවායේ විකුණුම් මිල තුට්ටු දෙකට ගිහින්, සමහර වෙලාවට ගොවීන් තම අස්වැන්න මහ පාරේ හලා යන යුගයක් තමයි අද තිබෙන්නේ. ඒ වාගේම ගොවීන්ට තම නිෂ්පාදන පොළට ගෙනැත් විකුණා ගන්න බැරි යුගයක් අද නිර්මාණය වෙලා තිබුණත්, නාගරිකව ජීවත් වන තවත් ජන කොටසක් එළවලු, පලතුරු ආදිය ඉතාම වැඩි මුදලකට මිලදී ගන්නා තත්ත්වයකුත් අද නිර්මාණය වෙලා තිබෙනවා.

එහෙම නම් මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මට මතක විධියට 2016 අය වැයෙන් අපි කිව්වා, "ශීතාගාර හදනවා." කියලා. නමුත්, ඒක යථාර්ථයක් බවට පත් කරන්න අපට බැරිවීම ඛේදවාචකයක්. මේ රටේ කෘෂිකර්ම ඇමතිකමත්, වෙළඳ ඇමතිකමත් කියන දෙක එකට බද්ධ වෙලා යන්නට ඕනෑ. මොකද, කෘෂි කර්මාන්ත නිෂ්පාදනවලට හැම තිස්සේම කණ කොකා හඬන්නේ ඒ නිෂ්පාදනවල අස්වැන්න ලබා ගන්නා කාලසීමාව තුළ විදේශ රටවලින් ගෙනාපු කෘෂි නිෂ්පාදන විශාල වශයෙන් අපේ වෙළෙඳ පොළේ තිබෙන නිසයි. ඒ නිසා අපේ ගොවි ජනතාව බරපතළ ප්‍රශ්නයකට මැදි වෙනවා. හැමදාමත් වැලිමඩ අල ගොවියාගේ, එළවලු ගොවියාගේ දුක් ගැනවිලි අපට අහන්න ඕනෑ නැහැ. ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ අපේ ආදරණීය ගොවි ජනතාවගේ, එළවලු වගා කරන ජනතාවගේ දුක් ගැනවිලි මේ වාගේ අහන්නට ඕනෑ නැහැ. රටේ ආහාර මිල ගැන අපි මේ තරම් කථා කරනවා. මේ තරම් බඩු මිල ගැන කථා කරන රටක ඇයි දෙයියනේ! අපි නිෂ්පාදනය කරන එළවලු ටිකට, වෙනත් දේවල්වලට ඒ සඳහා අවශ්‍ය පසුබිමක්, වටපිටාවක් නිර්මාණය කරගන්න අපට බැරි? ගරු ඇමතිතුමනි, නිරන්තරයෙන්ම වෙළඳ අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය අන්‍යෝන්‍ය සුහදතාවකින් කටයුතු කරන්න ඕනෑ. මේ දෙගොල්ලන් නිරන්තරයෙන් සාකච්ඡා වෙන්නට ඕනෑ. නොයෙක් ආර්ථික කමිටු තිබෙන බව අපි දන්නවා. නොයෙක් පාරිභෝගික කමිටු තිබෙනවා. මේ කමිටුවල මේ කරුණු සාකච්ඡා කෙරුණාට අපට හැමදාමත් අහන්නට ලැබෙන මැසිවිලි, දුක් අදෝනා ඒ ගොවීන් තුළින් අදටත් අපට අහන්නට දකින්නට ලැබෙනවා. ඒ විතරක් නොවෙයි, ගාල්ල දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය වෙන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ සහල් පරිභෝජන ප්‍රමාණයෙන් සියයට 36යි. පරිභෝජන ප්‍රමාණයෙන් සියයට 36යි කියන්නේ සහල් අතිරික්තයක් නැහැ. ගරු ඇමතිතුමනි, මම මේ කියන්න යන කථාව ඇහුවාම ඊට අදාළ ආයතනවල නිලධාරීන් මා සමඟ විරසක වේවි. මම ඊයේ-පෙරේදා කෘෂිකර්මයට සම්බන්ධ එක්තරා ආයතන කිහිපයකින් ඇහුවා, දැන් පොහොර මිලත් අඩු කරලා පොහොර රුපියල් 500ට දෙන නිසා වී ගොවිතැන පිළිබඳ උනන්දුවක් දක්වන්නේ නැත්තේ ඇයි කියලා. ඒ අය කියනවා, වී ගොවිතැනට වැඩි කැමැත්තක් නැහැ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දැන් පොහොර මිල අඩු වෙලා තිබෙනවා නම්, බිත්තර වී ටික දෙනවා නම්, ඒ වාගේම දැන් වෙනත් රසායනික ද්‍රව්‍යත් දමනවා නම්, එහෙම නම් කලින් තිබිච්ච දුක් අදෝනාව දැන් තිබෙන්නට බැහැ, ගරු ඇමතිතුමනි. එහෙම නම් අපි වැඩි දෙනෙක් වී වගාව සඳහා ඉල්ලීම් කරන්නට ඕනෑ. නමුත්, ඊළඟට කියන ප්‍රශ්නය මොකක්ද? අපට ගබඩා නැහැ නේ කියනවා. දැන් ගාල්ල, මාතර, හම්බන්තොට වී ගබඩා තියන්න හේතුවක් වෙන්නේ නැහැ. මොකද, තවමත් ඒ ප්‍රදේශවල සහල් පරිභෝජනය කරන ප්‍රමාණය ඒ ප්‍රදේශවලම නිෂ්පාදනය කරන්න පුළුවන්කමක් නැති නිසා. නමුත් ගොවිජන සංවිධානවල, ගොවිජන සේවා මධ්‍යස්ථානවල නිලධාරීන් කියන්නේ, "අපට වී ගබඩා නැහැ. තිබෙන්නේ පොහොර ගබඩා ටික විතරයි." කියලා. ඒ නිසා ඔබතුමාට මේ හැම දෙයක්ම නැවත සමාලෝචනයක් කරන්නට තිබෙනවා. ඒක විශාල වගකීමක්. මේ රටේ ආර්ථිකයට දායකත්වයක් දැක්වීම අතින් කෘෂි කර්මාන්තය දෙවැනි, තුන්වැනි ස්ථානයටවත් ගන්න පුළුවන් හයියක් අපේ රටට තිබෙනවා. නමුත්, අක්කර ලක්ෂ ගණනක් තවමත් අස්වද්දන්න පුළුවන්කමක් නැහැ. ගොවියන්ගේ අදෝනා තිබෙනවා. ඒ එක්කම ඒ අය නොයෙක් විධියේ ණයකරවලට යට වෙලා තිබෙනවා. ඒ නිසා අපේ පරිභෝජන රටාවත් එක්ක අපේ රටේ නිෂ්පාදනයන් කෙරෙහි ජනතාව වැඩි ඇල්මක් දක්වන නිසා ගරු ඇමතිතුමාට මේ ගැන විශේෂයෙන්ම හිතන්නට වෙනවා. ඒ තුළින් අපි යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත්, මේ යෝජනාව අනුව එම නිෂ්පාදන කල් තබාගැනීමටත්, එම නිෂ්පාදනවලට නියම මිලක් ලබාදීමටත් අපට හැකියාව ලැබෙනවා.

ඒ වාගේම, විදේශ රටවලින් ආදේශන භාණ්ඩ මේ රටට නොගෙන්වීමටත් අපි කටයුතු කළ යුතුයි. එම නිෂ්පාදන ගබඩා කරලා තියන්න පුළුවන් වැඩ පිළිවෙළක් වාගේම නවීන තාක්ෂණය උපයෝගී කරගෙන නොයෙක් දේවල් විදේශවලට යැවීමේ යම් වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්. අපේ රටේ එළවලු සහ පලතුරුවලට අද මැද පෙරදිග ඕනෑ තරම් හොඳ වෙළෙඳ පොළක් තිබෙනවා. අද අපේ එළවලු, පලතුරු සහ මල්වලට මාලදිවයිනෙන් හොඳ ඉල්ලුමක් තිබෙනවා. එවැනි වෙළෙඳ පොළක් තිබෙද්දීත් අපේ මේ නිෂ්පාදන රටාව අපට ඕනෑ විධියට හැඩගස්වා ගන්න පුළුවන්කමක් නැත්නම් අපි ඒ ගැන කනගාටු වෙන්න ඕනෑ. ඒ කටයුතු සාර්ථකව කරන්න කෘෂිකර්ම ඇමතිවරයා හැටියට ඔබතුමාට බාර කරනවා. ඒ කටයුත්තට සාර්ථකව මුහුණ දෙන්නට ශක්තිය ලැබෙයි කියලා විශ්වාස කරමින්, අපි කියන මේ යෝජනා හමස් පෙට්ටියට දමන්නේ නැතිව මේ පිළිබඳව අවධානය යොමු කරලා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඉන්න විශේෂඥයින්ට සහ නිලධාරීන්ට ගරු අමාත්‍යතුමා සමඟ බොහෝම සුසංයෝගයෙන් කටයුතු කරන්න පුළුවන් ශක්තිය ලැබේවා! යි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 6ක් තිබෙනවා.

[අ.භා. 6.42]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතා කාලෝචිත යෝජනාවක් ගෙන ඒම පිළිබඳව ගරු ඡෝෂාන් විතානගේ අපේ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

අභිනවයෙන් තේරී පත් වී සිටින කෘෂිකර්ම අමාත්‍යවරයා මහ පොළොවේ පය ගසා සිටින, දහඩිය සුවඳ දන්නා, පීඩිත පන්තියෙන් දේශපාලනයට පිවිස මහා අර්බුදකාරී තත්ත්වයන් තුළ තම දේශපාලන ගමන රැකගත්, හසළ අත් දැකීම් ප්‍රමාණයක් ලබා ගත් ඇමතිවරයෙක් හැටියට සඳහන් කරන්න පුළුවන්. ගොවි පියෙකුගේ, මෑණි කෙනෙකුගේ පුතෙක් හැටියට කෘෂිකර්මය නඟා සිටුවීම සඳහා, අහිංසක ගොවි ජනතාවගේ අභිවෘද්ධිය සඳහා මෙතුමා තුළින් යම් කිසි සේවයක් සිදු වෙයි කියන විශ්වාසය පසුපෙළ මන්ත්‍රීවරුන් වන අප අතරේ තිබෙනවා.

විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් මේ ගරු සභාවේ නොමැති වේලාවක අපි විපක්ෂයේ කාර්ය භාරයත් ඉෂ්ට කරමින් සිටිනවා. ගොවි පවුල්වලින් බිහි වුණු දරුවන් හැටියට, මහ පොළොවේ පය ගසා සිටින දේශපාලනඥයන් හැටියට අපි දැකලා තිබෙනවා හරකෙකුට කන්න වල් ගහක් හිටවලා නැති කිහිප දෙනෙක් පාර්ලිමේන්තුවේ කෘෂිකර්ම ඇමතිවරු හැටියට පසුගිය කාලයේ කටයුතු කරපු බව. මේ අයට කෘෂිකර්ම අමාත්‍යාංශය භාර දුන්නාම කිසිම තේරුමක් නැති වැඩ තමයි කරන්නේ. කුඹුර පැහුණාට පසුව තමයි පොහොර ටික ලැබෙන්නේ. තේ දලු කැඩුවාට පසුව තමයි තේ දලුවලට පොහොර ටික ලැබෙන්නේ. අවශ්‍ය වේලාවට පොහොර ටික ලබා දෙන්න කැමති වුණේත් නැහැ. ඒ සඳහා උත්සාහ දැරුවත් නිලධාරීන් අවශ්‍ය වේලාවට එම කටයුත්ත සිදු කරලා නැහැ. එම නිසා අපි නව කෘෂිකර්ම ඇමතිවරයාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, එක් එක් දිස්ත්‍රික්කයට පැමිණ එම දිස්ත්‍රික්කවලට ආවේණික වගාවන් පිළිබඳ අත් දැකීමක් ලබා ගැනීමට වෙනම සමීක්ෂණයක් කරන්න කියලා. මම හිතන විධියට දැනට අමාත්‍යාංශයේ ඉහළ තැන්වලට වැරදි තොරතුරු තමයි ඇවිත් තිබෙන්නේ. තමුන්නාන්සේ පොළොවේ පය තබාගෙන සිටින ගොවි පුතෙක් නිසා කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන දැන් අපේ දැඩි විශ්වාසයක් ඇති වී තිබෙනවා. ඒ නිසා විපක්ෂයෙන් ගෙන ආ යුතු යෝජනාවක් ආණ්ඩු පක්ෂයෙන් ගෙනැත් ඔබතුමාට ධෛර්ය දෙමින් යෝජනා කරන්නේ, ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ අහිංසක ගොවි ජනතාවගේ නිෂ්පාදනවලට යහපත් වූ මිලක් ලබා ගැනීමට සහාය වන ලෙසයි. මම හිතන විධියට මේ යෝජනාවේ හරය වෙලා තිබෙන්නේ, මේ යෝජනාවෙන් කරන ඉල්ලීම වෙලා තිබෙන්නේ ගොවීන් සූරාකන අතරමැදියන් මේ පොළොවෙන් ඉවත් කිරීමයි. මේ සම්බන්ධයෙන් ඔබතුමාට යම් කිසි උදව්වක්, උපකාරයක් අවශ්‍ය නම් අපි පසු පෙළ මන්ත්‍රීවරු හැටියට තමුන්නාන්සේත් එක්ක එකඟ වෙලා මේ කටයුත්ත සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා. මොකද, අද ගොවියා සහ පාරිභෝගිකයා අතර සිටිමින් ඒ දෙදෙනාම සූරා කන මුදලාලිලා ටික තමයි වැඩිම ආදායමක් ලබන්නේ. එය නතර කිරීම තමයි මේ යෝජනාවේ පළමුවැනි උත්සාහය සහ බලාපොරොත්තු වන දේ. මට කෙටි කාලයක් ලැබී තිබෙන්නේ.

සතුන්ගෙන් කෘෂි නිෂ්පාදනවලට සිදු වන හානිය නිසි වේලාවට වළක්වා ගන්න පුළුවන් නම් ඒක ඉතාම ප්‍රයෝජනවත් කටයුත්තක් වෙනවා. අපි නිෂ්පාදනය කරන ගොවි නිෂ්පාදනවලින් සියයට 30ක්, 35ක් පමණ ප්‍රමාණයක් සත්ව හානියට ලක් වෙනවා කියලා ඔබතුමා කළ ප්‍රකාශයක් පුවත්පත්වලින් අපි දැක්කා.

ගරු අමාත්‍යතුමනි, සතුන් බලා ගන්න වෙනම අමාත්‍යාංශයක් තිබෙනවා. කෘෂිකර්මය නඟා සිටුවීමට තමුන්නාන්සේ උත්සාහ දරනවා. මේ සියලු අමාත්‍යාංශ එකතු වෙලා සංගායනාවක්, යම් කිසි සාකච්ඡාවක් කළ යුතුයි. සතුන් ආරක්ෂා කළ යුතුයි. ඒක අපි පිළිගන්නවා. ඒ වාගේම කෘෂි කර්මාන්තය සඳහා කාලය වැය කරන ගොවීන් සහ ගොවි නිෂ්පාදන ආරක්ෂා කර ගැනීම සඳහා තමුන්නාන්සේ යම් කිසි පියවරක් ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. අපි හැම වේලාවෙම කෘෂිකර්මයට සම්බන්ධ විවාදවලදී මේ ගැන කිව්වා. මධ්‍යම පළාතේ අපනයන කෘෂි බෝග වැඩියෙන්ම වගා කරලා තිබෙන ගොවියා මමයි. ඒ වාගේම වස විසෙන් තොර ආහාර වේලක් නිෂ්පාදනය කර ගන්නවා. වී ටික අපිම හදාගන්නවා. එළවළු ටික, පලතුරු ටික අපිම හදා ගන්නවා. එම නිසා අපට මේක දැනිලා තිබෙනවා. එම නිසා තමුන්නාන්සේ ගන්න සාධාරණ උත්සාහයන්ට අපි තමුන්නාන්සේ සමඟ එකඟ වෙනවා; අපි තමුන්නාන්සේ සමඟ ඉන්නවා. අපි තමුන්නාන්සේගෙන් ඉතාම වුවමනාවෙන් කරන ඉල්ලීමක් තිබෙනවා. සතුන්ගෙන් සිදු වන හානිය වැළැක්වීම සඳහා තමුන්නාන්සේ යම් කිසි පියවරක් ගත යුතුව තිබෙනවා.

ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද වට්ටක්කා කිලෝවක තොග මිල රුපියල් 5යි. 'ෆුඩ් සිටි' වාගේ දැවැන්ත ව්‍යාපාරික ස්ථානවලට ගියාම, සුපිරි වෙළෙඳ සැල්වලට ගියාම වට්ටක්කා කිලෝව රුපියල් 50යි; 60යි; 70යි. වට්ටක්කා කිලෝවකට ගොවියාට රුපියල් 5 ගණනේ ලැබුණත්, කැකිරි අලින්ට කන්න දැම්මත්, සුපිරි වෙළෙඳ සැලකින් පාරිභෝගිකයෙකුට මේ එළවලු කිලෝ එකක් රුපියල් 50කට 60කට අඩුවෙන් ගන්න බැහැ. සිංහල අවුරුදු සමයේ එළවලු ඉතා පහළ මිලකට තිබුණේ. අද වන විට අධික වර්ෂාපතනයත් සමඟ එළවලු මිල ඉතා ඉහළ ගිහින් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ රටේ නිෂ්පාදනය ඉහළ යන විට ගොවියා රැක ගැනීමේ යම්කිසි ක්‍රියාමාර්ගයක්, ස්ථාවර ක්‍රියාමාර්ගයක්, ජාතික ප්‍රතිපත්තියක් හදන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

වෙලාවට පොහොර ටික, වතුර ටික ලබා දීලා ගොවියා නඟා සිටුවිය යුතුයි. මේක කෘෂි කාර්මික රටක් වාගේම අපි කෘෂි කර්මාන්තයෙන් ජීවත් වෙන පිරිසක්. සමස්ත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනාගෙන් පොළොවේ අඩිය ගහලා, කුඹුරට බහින, කෘෂිකර්මය ගැන කථා කරන, කෘෂිකර්මය ඇහේ තිබෙන කී දෙනෙකු ඉන්නවාද කියලා ගණන් කළොත්, කෘෂිකර්මයට සම්බන්ධ අය බහුතරයක් නැති බව පෙනෙනවා. කෘෂිකර්මය ගැන කථා කරනවා, හැබැයි කෘෂිකර්මය ගැන දන්නේ නැහැ. පසුගිය කාලවල කෘෂිකර්ම ඇමතිවරු හැටියට පත් වුණු සමහර අය කෘෂිකර්මය ගැන 'අ' යන්න නොදන්නා අය. එම නිසා අපි කියන, කරන හැම එකක්ම බීරි අලින්ට වීනා ගායනා කළා වාගේ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මේ අවස්ථාවේදී මා දිහා බලනවා. කථාව අවසන් කරන ලෙස කියන්නට සූදානම් වෙන බව මට දැනෙනවා. කෙසේ වෙතත් මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, කාලය ලබා දීම සම්බන්ධව. ගරු අමාත්‍යතුමාගෙන් මම මේ අවස්ථාවේදී කාරුණික ඉල්ලීමක් කරනවා, අපට වේලාවක් දෙන්න කියලා මීට වඩා මේ ගැන සාකච්ඡා කරන්නට. තමුන්නාන්සේ පසු පෙළ මන්ත්‍රීවරුන් සමඟ දිස්ත්‍රික් මට්ටමින් සාකච්ඡා කරලා, තමුන්නාන්සේගේ සහයෝගය ලබා දීලා කෘෂි කර්මාන්තය වෙනුවෙන් මීට වඩා යමක් කරමුයි කියන යෝජනාව කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධව මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මාගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 6.50]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඉතාමත් කාලෝචිත යෝජනාව ගැන කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන සහ අපේ නව කෘෂිකර්ම ඇමතිතුමා සභාවේ ඉන්න වෙලාවේ එතුමාට ලොකු වැඩක් දෙන්නට බලාගෙන කරපු යෝජනාවට සහයෝගයක් දෙන්න ලැබීම ගැනත් මම සන්තෝෂයට පත් වෙනවා.

ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාත්, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් කැකිරි ගොවියෙක් ගැන කථා කළා. මේ කැකිරි ගොවියාගේ කථාව අපි පසුගිය දවස්වල දැක්කා. ඒක සංවේදී කථාවක්. මම සමාජ ජාල මාධ්‍ය හරහා, facebook හරහා post එකක් දැක්කා. ඒක ඇත්ත කථාවක්. ඒ post එකෙන් පසුව මම ඒ ගොවියා ගැන විස්තර සොයලා දැනගත්තා. ඒ තමයි, කැකිරි ගොවියෙක් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට කැකිරි කිලෝ 55ක් අරගෙන එනවා, ත්‍රී වීලර් එකක දාගෙන. එතකොට මේ ත්‍රී වීලර් එකේ ගාස්තුව රුපියල් 450ක්. කැකිරි කිලෝ 55 හදන්ට එයාට වතුර දාන්න මෝටරයට රුපියල් 3,000ක් ගිහින් තිබෙනවා. මේ ගොවි මහත්මයාට කැකිරි කිලෝ 55 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට විකුණා ගන්න ලැබෙන්නේ රුපියල් 150කට. මේක තමයි යථාර්ථය. මේ රටේ අහිංසක ගොවි ජනයාව ඉතාමත් පහළ තැනකට දාලා තිබෙනවා. ගොවියා මහන්සි වෙලා ගොවි කටයුතු කරලා ලබන භෝග අස්වැන්නට නියම වටිනාකම ලබා දෙන්නට අපට හැකියාවක් ලැබිලා නැහැ.

මේ කථාවෙන් පසුව මම කැකිරි ගැන සෙව්වා. විශේෂයෙන්ම කොළඹ ප්‍රදේශයේ කථා කරනවා, කාබනික ගොවිතැන ගැන. හැම සෙනසුරාදාම Colombo Racecourse එක ගාව Good Market එක තිබෙනවා. මම එතැනට ගිහිල්ලා කැකිරිවල ගණන බැලුවා. එතැන කැකිරි කිලෝවක් විකිණෙන්නේ රුපියල් 560කට. අපි supermarketsවලට ගිහින් බැලුවාම දළ වශයෙන් කැකිරි කිලෝවක් රුපියල් 100කට ආසන්න වෙනවා. නමුත් කැකිරි ගොවියාට කිලෝ 55කට රුපියල් 150යි ලැබෙන්නේ. ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, අපි මේ තත්ත්වය ගැන කනගාටුවට පත් වෙන්න ඕනෑ; අපි රජයක් හැටියටත් කනගාටුවට පත් වෙන්න ඕනෑ. අපි ආපස්සට හැරිලා බැලුවොත් පෙනෙනවා, අපි ශීතාගාර හදනවා කිව්වාට පසුගිය අවුරුදු තුන ඇතුළත අපට ඒක කරන්නට බැරි වෙලා තිබෙන බව.

මේ කාරණා සම්බන්ධයෙන් ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරවනවා. ගොවියා අපහසුතාවට පත් නොවන්න නම්, අතරමැදියා පලවා හරින ක්‍රමයක් මේ රටට අවශ්‍යයි. කැකිරි ගොවියාට, වට්ටක්කා ගොවියාට, තක්කාලි ගොවියාට, නැත්නම් අර්තාපල් ගොවියාට මේ වාගේ තත්ත්වයක් උදා වී තිබෙන්නේ ඇයි? අර සල්ලි ටික සම්පූර්ණයෙන් ගන්නා අතරමැදියා ආරක්ෂා කරන්නේ දේශපාලනඥයෝයි. අපි ඒක නොබියව කියනවා. දේශපාලනඥයන්ට සල්ලි දෙන නිසා තමයි, මේ රටේ අතරමැදියා ආරක්ෂා කරන ක්‍රමයක් ඇතිවෙලා තිබෙන්නේ. අසරණ ගොවියා ආරක්ෂා කරන වැඩසටහනක් මේ රටේ නැහැ. ඒ නිසා ඒ වගකීම ඔබතුමාට තිබෙනවා. අසරණ ගොවියා ආරක්ෂා කිරීම ඔබතුමා සතු විශාල වගකීමක් වෙනවා. ඔබතුමා ගොවිතැන ගැන දන්නා කෙනෙක්. මේ රටේ ජනාධිපතිතුමාත් ගොවි පරපුරකින් ආපු කෙනෙක්. එහෙම තත්ත්වයක් තිබෙද්දී අපට මේක කරන්න බැරි වුණොත් අපි ලජ්ජා විය යුතුයි. ඒ නිසා මේ කාරණය වගකීමක් හැටියට භාර ගන්නය කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

සඳහා ඔබතුමාට ශක්තිය තිබෙනවා. ඒකට අපේ ආශීර්වාදය සහ සහයෝගය තිබෙනවා. ඒ සඳහා ඔබතුමාට සහයෝගය ලබා දෙන්න පසුපෙළ මන්ත්‍රීවරු කණ්ඩායමම ඉන්නවා.

ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය මිල දී ගැනීමේ සාධාරණ ක්‍රමවේදයක් මේ රටට අවශ්‍යයි. සමහර වෙලාවට ඒ සඳහා අලුත් තාක්ෂණය භාවිත කරන්න, ශීතාගාර පහසුකම් භාවිත කරන්න පුළුවන්. ඒ නිෂ්පාදන පරෙස්සමින් කොළඹට ගේන්නේ කොහොමද, අතරමැදියා අයින් කරලා සතොස සහ වෙළෙඳ අමාත්‍යාංශය සමඟ එක්ව පරිභෝජන කටයුතු සඳහා අවශ්‍ය අතිරික්ත නිෂ්පාදන ගබඩා කර ගන්නේ කොහොමද කියන මේ කාරණා ගැන මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු අමාත්‍යතුමනි, තවත් කාරණයකට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමාත් නිතර ගිහිල්ලා ඇති, Bangkok Airport එකට. එතැනට ගියාම අපට දකින්න ලැබෙනවා, වියළි පලතුරු සහ එළවලු තිබෙන්නේ කොහොමද කියලා. වියළි තක්කාලි ටික pack කරලා තිබෙනවා, තක්කාලි නැති රටවල අයට අරගෙන යන්න. අපේ රටේ තක්කාලි ටික කුණුවෙලා යනවා. තක්කාලි ටික අරගෙන ගබඩා කරලා, එහෙම නැත්නම් ටින් කරලා යවන්න අපට system එකක් නැහැ. තක්කාලි සෝස් හදන ක්‍රමයක් නැහැ. තවම අපි ඒවා ගැන අවධානය යොමු කරලා නැහැ. ඒ රටේ අතිරික්ත නිෂ්පාදන ටික airport එක හරහා පිටරටවලට යවන ක්‍රමයක් ඇති කරන්න නායිලන්තයට පුළුවන් වෙලා තිබෙනවා. අපේ airport එකේත් ගොඩක් ඉඩ තිබෙනවා. නමුත් මෙහි තවම එවැනි ක්‍රමයක් අපි දැකලා නම් නැහැ. ඔබතුමාගේ කාලය තුළ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙන් එළියට යන කොට මේ රටේ තිබෙන ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය ගෙන යන්න ක්‍රමවේදයක් හදන්න පුළුවන් නම්, ජාත්‍යන්තර වශයෙනුත් මේවාට market එකක් සොයා ගන්න පුළුවන්.

මේ කාරණය ඔබතුමාට විතරක් කරන්න බැහැ. මෙයට සම්බන්ධ කර ගත හැකි අමාත්‍යාංශ රාශියක් තිබෙනවා. මහවැලි අමාත්‍යාංශය, ගොවිජන සේවා, ප්‍රාථමික කර්මාන්ත, ප්‍රදේශීය සංවර්ධන, වැවිලි කර්මාන්ත, වෙළෙඳ යනාදී සියලුම අමාත්‍යාංශ එකතුවෙලා, මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් සාධාරණ වැඩ පිළිවෙළක් ඇති කළේ නැත්නම් මේ ගොවි ජනතාව අපට ශාප කරනවා, ගරු ඇමතිතුමනි.

2015 ජනවාරි 08 වැනිදා අපි මේ වෙනස ඇති කළේ මෙවැනි දේවලුත් ඉෂ්ට කර ගන්නයි. අපේ රටේ ඉතිහාසය ගත්තාම දුප්පත් ජනතාවගේ ප්‍රශ්න දිහා බලන්නේ නැතිව හිටපු පාලකයෝ කළේ තමන්ගේ බඩ වඩා ගත්ත එක විතරයි. මේ රටේ හිටපු පාලකයන් අතරින් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාත්, ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාත් දුප්පත් ජනතාව ගැන බැලුවා. ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා දුප්පත් ජනතාව ගැන බලලා පාසල් නිල ඇඳුම්, පාසල් පොත්, පාසල් දරුවන්ට උදැසන කිරි වේලක් මේ ආදී දේවල් ලබා දුන්නා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ ආර්ථිකය නංවන්න අලුත් ව්‍යාපාර ආරම්භ කළා. ඊට පස්සේ හිටපු ජනාධිපතිවරු දුප්පත් ජනතාවගේ ප්‍රශ්න ගැන බැලුවේ නැහැ. ඒ වාගේම තමයි, 2020 වන විට අපි මේ ප්‍රශ්න විසඳුවේ නැත්නම් අපටත් මේ අපවාදය ලැබෙනවා. ඒ නිසා මේ අභියෝග ජය ගැනීමේ ශක්තිය ඔබතුමාට තිබෙනවා. මේ කටයුත්ත කරන්න අපිත් ඔබතුමාට ශක්තියක් වෙනවා.

අපි ලංකාව පුරා ගිහිල්ලා, ගොවියාගේ දුක බලලා, පාරිභෝගිකයාටත් වාසියක් සැලසෙන විධියට, ඒ ආදායම ගොවියාට කෙළින්ම යන විධියට, ගොවියාගේ අස්වැන්න විකුණා ගැනීම සඳහා නියමිත ක්‍රමවේදයක් ඇති කරන්නට කටයුතු කළ යුතුයි. මෙවැනි marketing systems ලෝකයේ තිබෙනවා. Fair trade කියලා ක්‍රමයක් තිබෙනවා. අතරමැදියා නැතිව කෙළින්ම ඒ නිෂ්පාදන පාරිභෝගියා අතට එන ක්‍රමවේද තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් JICA ආයතනයත් එක්ක කථා කළා. ඒ වාගේම KOICA ආයතනය තිබෙනවා. එවැනි ආයතන ලැහැස්තියි, මේ සඳහා අවශ්‍ය තාක්ෂණය නොමිලයේ ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, ගොඩක් වෙලාවට සභාව කල් තැබීමේ යෝජනා ඉදිරිපත් කළාම, කථා කරලා නිකම් පුස්සක් බවට පත් වෙනවා. මේ යෝජනාව එවැනි පුස්සක් නොවෙවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මේක ගොවි ජනතාව වෙනුවෙන් ඉල්ලන, ඉතාමත් සාධාරණ, අවශ්‍යම යෝජනාවක්. ඔබතුමාට මෙම ප්‍රශ්නය විසඳන්න අවශ්‍ය ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මේ අවස්ථාවේදී කෘෂිකර්ම අමාත්‍යතුමාට මා ආරාධනා කරනවා, පිළිතුරු කථාව සඳහා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කොච්චර වෙලාවක් තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.58]

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and State Minister of Mahaweli Development)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපේ ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, ඉතාමත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව. සියලුම ගරු මන්ත්‍රීවරුන් මේ යෝජනාව පිළිබඳව ඉතාමත් ඉහළ දායකත්වයක් දැක්වූවා. ඒ මන්ත්‍රීතුමන්ලාට මේ යෝජනාවේ තිබෙන කාරණා සම්බන්ධයෙන් තිබෙන උනන්දුව පිළිබඳවත්, ඒ ගැන ඔවුන්ට තිබෙන දැනුම පිළිබඳවත් මම ඉතාමත් සතුටු වෙනවා. මම ප්‍රථමයෙන්ම ඔබතුමන්ලාට සඳහන් කරන්න කැමැතියි, ඔබතුමන්ලාගේ මේ අදහස් ඔබතුමන්ලාගේ මේ යෝජනා පිළිබඳව සාකච්ඡා කරන්න මම අවස්ථාවක් දෙන්න සූදානමින් ඉන්නවා කියලා. මේ සඳහා අපේ ඉන්න සියලුම නිලධාරීන් සමඟ ඒ අදහස් හුවමාරු කරගෙන වැඩ පිළිවෙළක් දියත් කරන්න අවස්ථාවක් සලසා දෙන්න මම සූදානමින් ඉන්නවා.

ඒ වාගේම අද මේ විවාදයට ඉදිරිපත් කරපු යෝජනාව, ඔබතුමන්ලා ඉදිරිපත් කරපු අදහස් ඇතුළත් හැන්සාඩ් වාර්තාව අපේ අමාත්‍යාංශයට අයිති සියලුම ආයතනවල නිලධාරීන්ට යොමු කරන්නත් මම බලාපොරොත්තු වෙනවා. ඒ, ඔබ සමඟ තිබෙන සාකච්ඡාවට එන කොට ඒ සඳහා සූදානම්ව පැමිණීම සඳහා.

මේ රජයට තිබුණු ප්‍රබල චෝදනාවක් තමයි, ආහාර ද්‍රව්‍ය පිළිබඳ කාරණය. බඩු මිල වැඩි වීම, අඩු වීම, පොහොර සහනාධාරය මේ වාගේ බොහෝ දේ පිළිබඳව කථා වුණා. නමුත් මම සඳහන් කරන්නට කැමැතියි, අපි පසු ගිය කාලයේ දැවැන්ත නියඟයකට මුහුණ දීලා අපේ ආහාර නිෂ්පාදනය සියයට 30කින් අඩු වෙලා තිබුණා වුණත්, රටක් විධියට ඉස්සරහට යන්න සෑම උත්සාහයක්ම රජය විධියට අපි දැරුවා කියන එක. නාස්තිකාර වියදම් අවම කර ගනිමින්, හරියාකාරව මූල්‍ය පාලනයකින් කටයුතු කිරීම නිසා තමයි අපට මේ සියලු සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කරමින් ගොවියා රැක ගැනීමේ වැඩ පිළිවෙළට යන්න පුළුවන්කම ලැබුණේ. ගොවි ජනතාව වෙනුවෙන් පොහොර සහනාධාරයට විතරක් මිලියන 33,000ක් මේ අවුරුද්දේ වියදම් කළා. මෙතෙක් රජයක් ගොවි ජනතාව වෙනුවෙන් වියදම් කළ ඉහළම සහනාධාර මුදල තමයි ඒක. ඒ වාගේම ගොවීන් රක්ෂණය කිරීමට රජය රුපියල් මිලියන 5,228ක් වියදම් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට පෙනෙනවා ඇති මේ රජය ගොවියා රැක ගන්න කොච්චර උනන්දුවක්, වෙහෙස මහන්සියක් දරනවාද කියලා. මීට අමතරව ගොවීන්ට බීජ අවශ්‍යතා තිබෙන සමහර වෙලාවල ඒවා ලබා දෙන්න, ගොවීන්ට සිදුවන වගා හානිවලට උදව් කරන්න වෙනම වැඩසටහන් රාශියක් අපේ රජය මඟින් දියත් කරලා තිබෙනවා; ක්‍රියාත්මක කරනවා. දැන් මෙතැනදී වී, අල සහ බී ලූනු ගොවීන් පිළිබඳව කාරණා කිහිපයක් කියවුණු නිසා මම කෙටියෙන් එක එක අවස්ථා ගැන කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මෙතැනට එන්නට පෙර ගොවීන් සමඟ සාකච්ඡාවක් තිබුණා. මම කිව්වේ, ගොවීන් ආරක්ෂා කර ගන්න මූලිකවම ස්ථිර මිලක් අපි ඒ අයට ලබා දෙන්න ඕනෑ කියලා. මම හැම දාම ජීවන වියදම් කමිටුවට සම්බන්ධ වෙනවා. ඒ සම්බන්ධ වෙන්නේ ජීවන වියදම පාලනය කරන්න ගන්න වෙහෙස මහන්සිය සම්බන්ධයෙන් විතරක් නොවෙයි, අපේ ගොවියා, ධීවරයා ආරක්ෂා කර ගන්න ඒ අවශ්‍ය තීන්දු ගන්න ස්ථානයක් වන නිසා. ධීවරයාට ප්‍රශ්න රාශියක් තිබුණා.

අපේ රටේ සමහර ප්‍රදේශවල වරායවලට විදේශ රටවලින් සීමාවකින් තොරව මාළු ගෙනාවා. මම ඒකට රුපියල් 75ක බද්දක් ඒ වෙලාවේ හදුන්වලා දුන්නා. එමඟින් ඒක පාලනය වුණා. හැබැයි, අපි පාරිභෝගිකයාටත් සහන මිලට මාළු ලබා දෙන්න, ඒ ඒ වෙලාවන්වලට යම් යම් ආකාරයට මේ බද්ද අඩු-වැඩි කරන්න කටයුතු කළා. මම හිතන්නේ නැහැ, කවුරුවත් අපට චෝදනා කළා කියලා. 2014 තිබුණු මාළු මිලට වඩා ඉතාමත් සුළු මිලක් තමයි එහා මෙහා සිද්ධ වුණා නම්, සිද්ධ වුණේ. 2014 සිංහල අවුරුදු කාලයට වඩා අඩු මිලට මේ සිංහල අවුරුදු කාලයේ ධීවර සංස්ථාව මාළු සැපයුවා. ලංකා ඉතිහාසයේ වාර්තාගත ආදායමක් ධීවර සංස්ථාව ලබා ගත්තා; ලාභයක් ලබා ගත්තා. ඒ වාගේම සහන මිලට මාළු සපයන්නත් අපි කටයුතු කළා. ඒ වෙලාවේ මම කෘෂිකර්ම කටයුතු පිළිබඳවත් උනන්දු වුණා. දැන් අපට ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඉන් එක ප්‍රශ්නයක් තමයි, වී ගොවියාගේ ප්‍රශ්නය.

මා හිතන්නේ, වී ගොවියාට මේ වාගේ සහනාධාර දෙන රටක් ලෝකයේ වෙනත් කොහේවත් නැහැ කියායි. ඒ සහනාධාරය ඉහළින්ම දෙන ගමන් වී ගොවියා ආරක්ෂා කර ගන්න අපි ස්ථිර මිලක් යොදා තිබෙනවා. දැන් වැස්ස එනවා. වගාව පටන් ගන්නවා. අපි තරුණ අයටත් ආරාධනා කරනවා, වී ගොවිතැනට ප්‍රවේශ වන්න කියා; කෘෂි කර්මාන්තයට ප්‍රවේශ වන්න කියා. වී ගොවියාගේ සියලු නිෂ්පාදන මේ ආණ්ඩුව මිල දී ගන්නා බවට අපි මේ රටේ වී ගොවියාට සහතික වෙනවා. තිබෙන ගබඩා මදි නම් ගබඩා හදලා හෝ අප ඒ ගොවියාගේ නිෂ්පාදන ආරක්ෂා කරන බවට මම සහතික වනවා. ඒ සඳහා සමහර වෙලාවට පොහොර ගබඩාව වී ගබඩාවක් කර ගන්න සිදු වුණොත්, අපි ඒකත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම, බී ලූනු ගොවියා, අල ගොවියා ගැනත් කියන්න ඕනෑ. අපි ඒ අය පිළිබඳවත් සාකච්ඡා කළා. අපි බී ලූනු ගොවියාටත් ස්ථිර මිලක් ලබා දෙනවා, එන කන්නයේදී. මම අද අපේ රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත අලුවිහාරේ මැතිතුමා එක්ක සාකච්ඡා කළා. මා එතුමාට කිව්වේ, "බී ලූනු වගා කරන්න කියා ගිහින් බය නැතිව ගොවියාට කියන්න" කියායි. අපි ඒ කාර්යය සම්පූර්ණයෙන්ම එතුමාට පැවරුවා. බී ලූනු සම්බන්ධව සහ අර්තාපල් ගොවියා පිළිබඳව විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මම එතුමාට කිව්වා. අල ගොවියාටත් මම කිව්වා, "බය නැතිව වගා කරන්න කටයුතු කරන්න" කියා. ඒවා විකුණාගන්න බැරි වුණොත්, රජය මැදිහත් වෙලා හෝ අපි ඒවා මිලදී ගන්නවා. ඒවා අරගෙන අපට විකුණා ගන්න බැරි වුණොත්, අපට පාඩුවක් වුණොත්, අපි ඒ පාඩුව දරා ගන්නවා. එහෙම තමයි බොහෝ දියුණු වූ රටවල ගොවියා ආරක්ෂා කළේ.

අපි පාසල් ගිය කාලයේ අසා තිබෙනවා, තිරිඟු නිෂ්පාදනය වැඩි වන කොට, ඇමෙරිකාවේ තිරිඟු ගොවියා රැක ගන්න වැඩි තිරිඟු මුහුදට දමනවා කියා. එහෙම කරන්න ඕනෑ. අපේ රටේ ගොවියාත් ආරක්ෂා කර ගන්න නම්, ස්ථිර මිලක් ලබා දෙන්න ඕනෑ. අපේ අවාසනාවට බොහෝ කාලයක් සිද්ධ වුණේ මොකක්ද? වී ගොවියා ගැන බලනවාටත් වඩා බැලුවා, මුදලාලි ගැන. අනෙක් ගොවියා ගැන බලනවාටත් වඩා බැලුවා, ව්‍යාපාරිකයා ගැන. අපේ ගොවියාගේ නිෂ්පාදනය එන වෙලාවට රටින් ගෙන්වන්න පටන් ගත්තා. මම සහතික වශයෙන් කියනවා, මීට පස්සේ ඒ කටයුත්ත වෙන්න මේ ආණ්ඩුව තුළ ඉඩක් ඇති වන්නේ නැහැ කියා. ඒ වෙනුවෙන් අවශ්‍ය මැදිහත් වීම අපි ඉහළින්ම කරනවා.

ඊළඟට, අපේ අනෙකුත් බෝග ගැනත් කියන්න ඕනෑ. එළවලු සම්බන්ධව තිබෙන ගැටලුවට මේ වාගේ ස්ථිර ප්‍රතිඥාවක් දෙන්න නොහැකි වීම පිළිබඳව ඔබතුමන්ලාට මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වැඩ පිළිවෙළට එක සැරේට යන්න බැරි වේවි. මා, සාමාන්‍යයෙන් රු 11.00, 12,00 විතර වන කල් වැඩ කරන කෙනෙක්. මා මේ දවස් ටිකේම -ඒ මුළු කාලයේම- සොයා බැලුවේ ගොවියා ආරක්ෂා කර ගන්න කටයුතු කරන්නේ කොහොමද කියායි. මෙය එක එක අයට විවිධ විධියට අර්ථ නිරූපණය කරන්න පුළුවන්. සමහර අය කියනවා, "ගොවිතැන් කරන්න ඕනෑ නැහැ. පිට රටින් ගෙනැල්ලා අඩුවට දෙන්න පුළුවන්" කියා. ඒක ඇත්ත. සහල් ආනයනය කරන කොට අපි රුපියල් 70ක බද්දක් පනවා තිබෙනවා. හැබැයි හාල් මිල නිතුමතේ වැඩි කළොත්, අපි එය ආපසු ශත 25 දක්වා අඩු කරනවා. අපි බී ලූනුවලට, අලවලට රුපියල් 40ක බද්දක් පැනෙව්වා. ගිය සතියේ රුපියල් 30ට තිබුණු බද්ද රුපියල් 40 කළා, ඒ ගොවියා ආරක්ෂා කර ගන්න. අපි එමඟින් පාරිභෝගිකයාටත් යම් මට්ටමක් ලබා දී තිබෙනවා. ඒ අයටත් වැඩි මිලක් නැහැ. අපි ඒ අය ආරක්ෂා කරනවා. අප මේ ආකාරයෙන් කටයුතු කරන්නේ ගොවීන් තවතවත් ගොවිතැනේ යොදවන්නයි. තරුණ පිරිස් කෘෂි කර්මාන්තයට යොමු කරවන්න තමයි අපේ බලාපොරොත්තුව වෙලා තිබෙන්නේ. එළවලු සම්බන්ධයෙන් මට මේ සහතිකය දෙන්න බැරි වෙලා තිබෙන්නේ, එළවලුවලට එකම ශීතාගාරයක් හෝ හදාගන්න අපට තවම බැරි

[ගරු මහින්ද අමරවීර මහතා]

වෙලා තිබෙන නිසායි. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා කියපු කාරණය මම පිළිගන්නවා. රජය අවුරුදු ගණනාවක් තිස්සේ මුදල් වෙන් කළා. නමුත් එය කරන්න බැරි වුණා. මේ අවුරුද්දේ නම් මේ අමාත්‍යාංශයට මුදල් වෙන් වෙලා නැහැ. නමුත් මා අද ලෝක බැංකු ව්‍යාපෘතියේ අයටත් කිව්වේ, අපට කොහොම හරි සල්ලි සොයා දෙන්න කියායි. මම කිව්වා, "බණ්ඩාරවෙල පොඩියට හෝ ශීතාගාරයක් පටන් ගන්න. මේ අවුරුද්දේම එහි වැඩ ආරම්භ කරන්න" කියා. මම බලාපොරොත්තු වෙනවා ලබන අවුරුද්දේ හෝ අනෙක් ප්‍රදේශවලත් ශීතාගාර ආරම්භ කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කරන්න. ඒ වාගේම විදේශ ආධාර ව්‍යාපෘති මඟිනුත් ශීතාගාර වැඩි කරන්න අපි කෙසේ හෝ උත්සාහයක් දරනවා. එවිට ඒවායේ අස්වනු රැස් කර ගන්න පුළුවන්කම ලැබෙනවා; බෝග අතිරික්ත වෙලාවට රැස් කරගෙන, හිඟ වෙලාවට දෙන්න පුළුවන් වනවා.

අපි දැක්කා, වට්ටක්කා විකුණා ගන්න බැරිව වට්ටක්කා දන්සැල් දුන්නා. කැකිරි විකුණාගන්න බැරිව අලින්ට, හරකුන්ට කන්න දුන්නා. හැබැයි අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ වට්ටක්කා ටික, ඒ කැකිරි ටික අරගෙන එක මාසයක් තබා ගත්තා නම් විශාල මුදලක් ලබා ගන්න පුළුවන්කම අපට ලැබෙනවා. නමුත් ඒ සඳහා පහසුකම් ඇති කරගන්න අපට බැරි වුණා. අපි ඒ ගැන කනගාටු වෙනවා. අපි ඉදිරියේදී ඒ කටයුත්ත කරනවා. ඔබතුමන්ලා කියපු කාරණය පිළිබඳව අපි මේ වන කොට තවත් විශාල සාකච්ඡාවක් කරගෙන යනවා. ඒ තමයි භෝග කලාප විධියට වෙන් කරගෙන වගා කරන්න ගොවියා උනන්දු කිරීම. දැන් අපේ සිරිත මෙකයි. යම් ප්‍රදේශයක ගොවියෙක් වට්ටක්කා විකුණලා සල්ලි ගත්තොත්, වාහනයක් ගත්තොත්, ඊළඟ සැරේ ඒ ප්‍රදේශයේම ගොවීන් වට්ටක්කා වවනවා. වට්ටක්කා කිලෝව රුපියල් සියයට-දෙසියයට ගියොත්, හැමෝම වවන්නේ වට්ටක්කා. එතකොට කිලෝව රුපියල් පහටවත් වට්ටක්කා විකුණන්න බැරි වෙනවා. එන කන්නය වන විට වට්ටක්කා කිලෝව රුපියල් සියයටත් එහා යයි. කැකිරි කිලෝවක මිල ඊටත් වඩා ඉහළ යයි. මොකද, දැන් මිනිස්සු ඒ වගාවෙන් ඉවත් වෙලා වෙනත් වගාවලට යන නිසා. ඒ නිසා මම අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කිව්වා, කාමරවල ඉඳලා ගණන් හදා හදා ඉඳලා හරි යන්නේ නැහැ, අපට අවශ්‍ය ප්‍රමාණය කොපමණද කියලා භූමියට ගිහිල්ලා මොන ආකාරයෙන් හරි බලන්න ඕනෑ කියලා. අපට කොපමණ බී ලූනු අවශ්‍යද, අපට කොපමණ අල අවශ්‍යද, අපට කොපමණ සහල් අවශ්‍යද, අපට කොපමණ එළවලු අවශ්‍යද කියලා අපි බලන්න ඕනෑ. අපි තක්කාලි වගා කරනවා නම්, අපට ඕනෑ හෙක්ටයාර දහසක තක්කාලි අස්වැන්නක් නම්, හෙක්ටයාර දහසක ප්‍රමාණයට කිව්වු වෙනකොට අපි ගොවීන්ට නිවේදනයක් දෙන්න ඕනෑ, තවත් තක්කාලි වගා කරන්න එපා කියලා.

අපි වට්ටක්කා වගා කරන්න ඕනෑ හෙක්ටයාර දහස නම්, ඒක අපට ප්‍රමාණවත් නම්, අපි අපේ නිලධාරීන් ලවා ගොවීන්ට නිවේදනයක් නිකුත් කරන්න ඕනෑ, එතැනින් එහාට වගා කරන්න එපා කියලා. ඒ විධියට අපි සැලසුම් සහගතව වගා කළොත් අපට මේ ප්‍රශ්නවලින් නිදහස් වෙන්න පුළුවන්. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සේවකයන් දහහතරදහස් ගණනක් ගම් මට්ටමින් ඉන්නවා. ඒ වාගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවකයන් දහතුන්දහස් ගණනක් ඉන්නවා. ඒ හැම කෙනෙකුටම මම කිව්වේ, කාර්යාලවලට වෙලා ඉන්නේ නැතුව ගමට ගිහිල්ලා, ඒ ගම්වල තිබෙන තත්ත්වය හොයා බලන්න කියලායි. කෘපනිස නිලධාරීන්ගෙන් අපි වැඩ ගන්න ඕනෑ. ඒ අය ගත්තේ නිකම් තියාගන්න නොවෙයි. මම දැන් ඒ ගොල්ලන්ට අලුත් වැඩ පිළිවෙළක් හදනවා, සෑම කෙනෙකුටම වගකීමක් භාර දෙන. කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරියා කරන වැඩ පිළිබඳව අධීක්ෂණය කරන්න ඕනෑ, වගකීම දරන්න ඕනෑ, ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරියා. ඒ ගොවිජන සේවා නිලධාරියා කරන වැඩ, ඩීඕ මහත්මයා කරන වැඩ, සහකාර කොමසාරිස්වරයා ඇගයීමක් කරන්න ඕනෑ; ඒ අය පිළිබඳව හොයා බලන්න ඕනෑ. ඒ සහකාර කොමසාරිස්වරයාගේ කාර්යභාරය පිළිබඳව වෙනම අධීක්ෂණයක් කරන්න ඕනෑය කියලා කොමසාරිස් ජනරාල්වරයාට මම උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ දම්වැලේ එක පුරුකක් අක්‍රිය වුණොත්, මුළු ජාලයම අක්‍රිය වෙනවා. එහෙම කටයුතු නොකරන්න යම් නිලධාරියෙක් උත්සාහ කළොත්, අපි ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න පසුබට වෙන්නේත් නැහැ.

සමහර අයට විවිධ දේශපාලන මතිමතාන්තර තිබෙනවා. හිතාමතාම රජය අපකීර්තියට පත් කරන්න කටයුතු කරන නිලධාරීන් යම් ප්‍රමාණයක් සිටින බවත් අපි දන්නවා. ඒකට අපි බය වෙන්නේ නැහැ. ඒවා සම්බන්ධයෙන් තීන්දු ගන්න මම පසුබට වෙන්නේත් නැහැ. ඒ ඕනෑම නිලධාරියෙකුට එරෙහිව අපි තීන්දු ගන්නවා, මොන බාධක මධ්‍යයේ වුණත්.

අද යාපනයේ ගොවියා බීට්-රූට් වවනවා. පුත්තලමේ, කල්පිටිය පැත්තේත් බීට්-රූට් වවනවා. හැබැයි, ඒ පිළිබඳව නුවරඑළියේ, බණ්ඩාරවෙළ, වැලිමඩ ගොවියාටත් අවබෝධයක් තිබෙන්න ඕනෑ. මේ පැත්තේ වැඩිපුර බීට්-රූට් වැවෙනවා නම්, අනෙක් පැත්තේ ඒ වගාව අඩු කරන්න ඕනෑ. දැන් යාපනයේ අල වවන්නත් පටන් අරගෙන තිබෙනවා. මේවා පිළිබඳව අපි දැඩි සැලකිල්ලක් දක්වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ ප්‍රශ්නය ක්ෂණිකව විසඳා ගන්න පුළුවන් වෙයි කියලා හිතන්නේ නැහැ කියලා මම නැවතත් කියනවා. නමුත් ඒ සඳහා වන දීර්ඝ කාලීන සහ කෙටි කාලීන වැඩ පිළිවෙළ දැන් සකස් කරනවා. මම දැන් යන්නේත් අපේ අමාත්‍යාංශයට. අපේ නිලධාරීන් එතැන ඉන්නවා. මේ පිළිබඳ අවශ්‍ය තීන්දු තීරණ ගන්න අවශ්‍ය උපදෙස් අපි ලබා දෙනවා.

ඊළඟට, පාරිභෝගිකයා සහ ගොවියා අතර තිබෙන අතරමැදි ගාස්තුව, මීලෙහි පරතරය විශාල ප්‍රශ්නයක්. එතැන හිතා ගන්න බැරි ගණනක වෙනසක් තිබෙනවා. ඒ පරතරය අඩු කරන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අධ්‍යයනයක් කරලා මට වාර්තාවක් දෙන්න කියලා මම කිව්වා. අපේ කට්ටිය තවම ඒ පිළිබඳව හොයලාවත් නැහැ. සමහර දේවල් පිළිබඳව අපි දන්නා දේවල් සමහර විශේෂඥයන් දන්නේ නැහැ. මා ඒ පිළිබඳව කනගාටු වෙනවා. සමහර අයට ඒවාට නිසි පිළිතුරක් දෙන්න බැරි වුණා. ඒ වාගේම මේ තොරතුරු දන්නා නිලධාරීන් ඉන්නවා. සමහර විට ඒ අයට තමන්ගේ අදහස අමාත්‍යවරයාට හෝ අදාළ නිලධාරීන්ට දැනුම් දෙන්න අවස්ථාවක් නොලැබෙන්න ඇති. ඒ නිසා මම ඍජුවම ඒ තොරතුරු ලබා ගැනීම සිදු කරනවා. මම පේරාදෙණියට ගිහිල්ලා සියලු නිලධාරීන්ට කිව්වා, ඒ ගොල්ලන්ගේ වැඩසටහන පිළිබඳව අප දැනුවත් කරන්න කියලා. එතැන හිටපු නිලධාරිනියක් මට කිව්වා, වට්ටක්කා අස්වැන්න වැඩියි කියලා එතුමිය මාසයකට විතර කලින් දැනුම් දුන්නාය කියලා. එතකොට ඒ දැනුම් දීලා තිබෙන්නේ කොහේටද? අමාත්‍යවරයා ඒ පිළිබඳව දැනුවත් වෙලා නැහැ. මම ඒ ගැන හොයා බැලුවා. ඒක තැනක නතර වෙලා තිබෙනවා. ඒකට ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අස්වැන්න වැඩි බව මාසයකට කලින් දැන ගත්තා නම්, ගම්වල තිබෙන පාසල්වල දරුවන්ට වට්ටක්කා ටිකක් තම්බලා පොල් කැල්ලක් එක්ක නොමිලේ කන්න දුන්නා නම් මොකද වෙන්නේ?

මෙතරම් වියදම් කරද්දී, ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂ සියයක්, දෙසීයක් වියදම් කරන්න බැරිකමක් නැහැ අපේ ආණ්ඩුවට. එහෙම දුන්නා නම් අපේ අය ඒකට පුරුදු වෙනවා. නමුත්, එහෙම කරන්න අමාත්‍යවරයා දැනුවත් වෙලා තිබුණේ නැහැ. ඒ නිසා ඒ නිලධාරිනියට මම කිව්වා, මීළඟට ලැබෙන තොරතුරු කෙළින්ම මටත් එවන්න කියලා. ඉදිරියේදී අපි ඒ විධියට කටයුතු කරන්න බලාපොරොත්තු වන බවත් සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජෑම් වර්ග වාගේම කෝඩියල්වලට අවශ්‍ය පළතුරුවල pulp එක මේ රටට ගෙනෙනවා. පළතුරු ආශ්‍රිතව ගෙනෙන ඒවායේ බද්ද සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කරන්න අවශ්‍ය පියවර ගන්න කියලා මම කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරින්ට උපදෙස් දුන්නා. ඒ යෝජනාව අපි ඉදිරියේදී අදාළ අංශවලට, මුදල් අමාත්‍යාංශයට දැනුම් දීලා, ඒවාට විශාල බද්දක් පනවන්න අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනවා. ඒ නිසා අපි සියලු කර්මාන්තකරුවන්ට ආරාධනා කරනවා, ඒ නිෂ්පාදන සඳහා මේ රටේ නිෂ්පාදන මිලදී ගන්න කටයුතු කරන්න කියලා. එතකොට තමයි අපේ අය වගා කරන්න පෙළඹෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තරුණ අය කෘෂිකර්මයට හුරු කරන්න අවශ්‍යයි. ඒ සඳහා අපි නවීන තාක්ෂණයෙන් යුත් වැඩ පිළිවෙළක් ගෙනෙනවා. විදේශ වෙළෙඳ පොළට අවශ්‍ය එළවලු, පලතුරු නිෂ්පාදනය කරන තත්ත්වයට අපි යන්න ඕනෑ. එක අවධියක අපේ අපනයනයෙන් සියයට තිහකට වැඩි ප්‍රමාණයකට කෘෂිකර්මාන්තයේ දායකත්වය තිබුණා. දැන් ඒක ක්‍රමානුකූලව සියයට පහට පමණ අඩු වෙලා තිබෙනවා. ඒ නිසා අපි දැන් කෘෂිකර්මාන්තය ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. ඒ සඳහා අපි නවීන තාක්ෂණය සහ තරුණයන් මේ කාර්යයට යොදවන්න ඕනෑ. ඒ වාගේම අපි ඒ අය උනන්දු කරවන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මඩකළපුවේ ගොවීන් සියයක් තෝරා ගෙන, පිපිඤ්ඤා පිට රට යැවීම සඳහා හේලීස් ආයතනයත් සමඟ අපි අද ගිවිසුම් අත්සන් කළා. පිපිඤ්ඤා කිව්වාට ඒවා "ගර්කින්" වර්ගයක්. ඒ ගොවීන් නියමු ව්‍යාපෘතියක් කරලා තිබුණා. ඒ ද්විඩ ගොවියෙක් අද දෙමළ භාෂාවෙන් කළ කථාවක් මට පරිවර්තනය කරලා දුන්නා. ඒ කථාවේදී ඔහු කිව්වා, අක්කරයකින් රුපියල් දෙලක්ෂ හැත්තෑපන්දහසක ආදායමක් ඔහුට ලබා ගන්න පුළුවන්කම ලැබුණාය කියලා. ඒ නිසා දැන් අනෙක් ඔක්කෝම ගොවියෝත් ඒකට එකතු වෙලා තිබෙනවා. ඒ අනුව, ගොවීන් සියයකට අපි අද ආධාර දුන්නා. ඒ අයට අවශ්‍ය වතුර පොම්පය, අඩු ජලය පාවිච්චි කරන්න අවශ්‍ය උපකරණ කට්ටල, යනාදී මූලික අවශ්‍යතා සියල්ලම ලෝක බැංකු ව්‍යාපෘතියකින් ලබා දුන්නා. ඒ අනුව, ඒ අයට අද මුදල් දෙන්න පටන් ගත්තා. තව එවැනි ව්‍යාපෘතිවලට දීම සඳහා අපට මුදල් තිබෙනවා. මම මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා, එවැනි ව්‍යාපෘති ආරම්භ කරන්න පියවර ගන්න කියලා. නමුත්, ඒවා සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක ගණනාවක් තිබෙනවා. බස්නාහිර පළාතට ඒවා ලැබෙන්නේ නැහැ. එහෙම නොකිව්වොත්, ආශු මාරසිංහ මන්ත්‍රීතුමා කල්පනා කරයි, "අපේ දිස්ත්‍රික්කයට මොකද වෙන්නේ" කියලා. ඒ ව්‍යාපෘති ආරම්භ කිරීමට නියමිත පළාත්වල ඉන්න අපේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, තරුණ අය එකතු කර ගන්න, ඒ අය සමඟ මේ ව්‍යාපෘති පටන් ගන්න කියලා. දේශීය හෝ විදේශීය වෙළෙඳ පොළට අළෙවි කිරීමට නිෂ්පාදනය කරනවා නම්, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය, අවශ්‍ය උපකරණ -වතුර පොම්ප වෙන්න පුළුවන්, වගා ළිඳ වෙන්න පුළුවන්- සියල්ලම අවශ්‍ය පුහුණුවත් එක්ක නොමිලේ ඒ අයට ලබා දෙන්න අප කටයුතු කරනවා. මෙවැනි වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරන බවත් සිහිපත් කරනවා.

එළවලු අළෙවි කරන්නත් තවත් වෙළෙඳ ජාලයක් ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. දැනට තිබෙන "හෙළ බොජුන්හල්" පටන් ගත්තා වාගේම, ගොවීන්ගේ නිෂ්පාදන අළෙවි කිරීමේ මධ්‍යස්ථාන ඒ ආසන්නයේම ආරම්භ කරන්න අපි මේ අවුරුද්දේ අදහස් කරනවා. ලබන අවුරුද්ද වන විට අපි ඒ වැඩ පිළිවෙළ ව්‍යාප්ත කරනවා. ගොවියාට කොළඹටත්, අනෙක් නගරවලටත් ඇවිල්ලා බඩු විකුණාගෙන යන්න පුළුවන් මධ්‍යස්ථාන අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ තිබෙන ඉඩම්වල ආරම්භ කරන්න සූදානම් බවත් සිහිපත් කරන අතර, ඔබතුමන්ලා මේ විවාදයේදී ඉතාම වැදගත් යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳව නැවතත් මම ස්තුතිවන්ත වනවා. [බාධා කිරීමක්]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, වගාවල අස්වැන්නෙන් සියයට තිස්පහක් පමණ සතුන් විනාශ කරනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම ඒක අවාසනාවක්. අපේ නිෂ්පාදනයෙන් අවම වශයෙන් සියයට තිහකට වැඩි ප්‍රමාණයක් සතුන්ගෙන් විනාශ වනවා. මොනරා, වඳුරා, රිලවා, දඬුලේනා, අලියා වැනි සතුන්ගෙන් තමයි එහෙම විනාශ වෙන්නේ.

නමුත්, සමහර සතුන් ආරක්ෂා කරන්න වුවමනා බව අපි දන්නවා. හැබැයි, අනෙක් අය ආරක්ෂා කර ගන්න අපට අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ සඳහා අපි යම් වැඩ පිළිවෙළකට ඉදිරියේදී යා යුතු වෙනවා. ගොවියා ආරක්ෂා කර ගන්නේ නැතිව, සත්තු විතරක් ආරක්ෂා කර ගෙන මේ රටේ ඉදිරියට යන්න බැහැ. ගොවියාගේ ඉඳලා කොළඹට ඇවිල්ලා විකුණන මට්ටම දක්වා අස්වැන්නෙන් සියයට හතළිහක් නාස්ති වෙනවා. සතුන් නිසා තව සියයට තිහක් අපතේ යනවා, විනාශ වෙනවා. ඒ නිසා ගොවියාට ඉතිරි වෙන්නේ කොතරම් ප්‍රමාණයක්ද කියලා ඔබතුමියට පැහැදිලි වෙනවා ඇති. ඒ නිසා, ඒ පිළිබඳවත් අපි යම් වැඩ පිළිවෙළක් සකස් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.16ට, 2018 මැයි 24වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.


அதன்படி பி. ப. 7.16 மணிக்கு பாராளுமன்றம், 2018 மே 24, வியாழக்கிழமை மு. ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.16 p.m. until 10.30 a.m. on Thursday, 24th May, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

260 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 260 - இல. 7
Volume 260 - No. 7

2018 මැයි 24 වන බ්‍රහස්පතින්දා
2018 மே 24, வியாழக்கிழமை
Thursday, 24th May, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහොමඩ් නවවි මහතාගේ ඉල්ලා අස්වීම
කාරක සභා : සාමාජිකයන් නම් කිරීම

විගණකාධිපතිවරයාගේ වාර්තාව

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීම කඩිනම් කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

කල්තැබීමේ යෝජනාව:
දකුණු පළාත තුළ පැතිරෙන හදුනා නොගත් උණ රෝගය

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு முஹமட் நவவியினது இராஜினாமா
குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

தனி அறிவித்தல் மூல வினா:
கிளிநொச்சி மாவட்டத்தில் மீள்குடியேற்றத்தைத் துரிதப்படுத்தல்

இலங்கை தேயிலைச் சபை (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
தென்மாகாணத்தில் பரவிவரும் இனங்காணப்படாத காய்ச்சல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Resignation of Hon. Mohamed Navavi, Member of Parliament
Committees: Nomination of Members

AUDITOR-GENERAL'S REPORT

QUESTION BY PRIVATE NOTICE:
Expedition of Resettlement in Kilinochchi District

SRI LANKA TEA BOARD (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

ADJOURNMENT MOTION:
Unidentified Fever Spreading in Southern Province

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 *මැයි* ***24*** *වන බ්‍රහස්පතින්දා*
2018 மே 24, வியாழக்கிழமை
Thursday, 24th May, 2018

පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு. ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய]
தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහොමඩ් නවවි මහතාගේ ඉල්ලා අස්වීම
பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு முஹமட் நவவியினது இராஜினாமா
RESIGNATION OF HON. MOHAMED NAVAVI, MEMBER OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහොමඩ් නවවි මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත භාර දී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. එම ලිපිය දැන් මහ ලේකම්වරයා විසින් කියවනු ලැබේ.

අනතුරුව පහත සඳහන් ලිපිය මහ ලේකම් විසින් කියවන ලදී:
அதன்பிறகு, செயலாளர் நாயகம் பின்வரும் கடிதத்தை வாசித்தார்:
Whereupon the Secretary-General read the following letter:

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

M.H.M Navavi M.P
No.39, 2nd Cross Street,
Puttalam.
23rd May 2018

Secretary General of Parliament
Sri Jayawardenapura,
Kotte.

Dear Sir,

RESIGNATION AS MEMBER OF PARLIAMENT

I hereby tender my resignation as a Member of Parliament with immediate effect.

I thank you for the co-operation extended to me during my tenure as a Member of Parliament.

Yours faithfully,

M.H.M Navavi

M.H.M. NAVAVI M.P
Member of Parliament
#39, 2nd Cross Street,
Puttalam.

Cc: 1. Hon. Speaker of Parliament
2. Chairman – Election commission
3. Secretary General – United National Party
4. Secretary General – All Ceylon Makkal Congress

II

විශේෂ රැස්වීම
விசேட கூட்டம்
SPECIAL MEETING

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 මැයි මස 24වන බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත විශේෂ රැස්වීම පිළිබඳ දැනුම්දීමක් කර තිබෙන මන්ත්‍රීවරුන් සියලු දෙනාම ඊට පැමිණ සහභාගි වන ලෙස මෙයින් ආරාධනා කරමි.

III

කාරක සභා : සාමාජිකයන් නම් කිරීම
குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்
COMMITTEES : NOMINATION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ අංක 115, 116, 119, 120, 121 සහ 122 ස්ථාවර නියෝගයන්ගේ විධිවිධාන සහ 2018 මැයි මස 10වන බ්‍රහස්පතින්දා සහ 22වන අඟහරුවාදා පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගත් යෝජනා ප්‍රකාරව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය පිණිස 2018 මැයි මස 23වන බදාදා තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද, සාමාජික-සාමාජිකාවන්ගේ නම් සියල්ල එක් එක් කාරක සභාවට

[ගරු කථානායකතුමා]

අදාළව වෙන් වෙන් වශයෙන් හැන්සාඩ් වාර්තාවේ පළ කරනු ලැබීමට හැකි වන පරිදි භාෂා ත්‍රිත්වයෙන්ම මම **සභාගත*** කරමි.

** සභාමේසය මත තබන ලද නාම ලේඛනය:*
சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் :
List of names tabled:

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு
COMMITTEE ON PARLIAMENTARY BUSINESS

පාර්ලිමේන්තුවේ 115 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධාන සහ 2018 මැයි මස 10 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව, මාගේ සභාපතිත්වය ඇතිව නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ 2018 මැයි මස 23 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී:

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු මහින්ද සමරසිංහ මහතා
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු රවි කරුණානායක මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා

மாண்புமிகு நிமல் சிறிபால த சில்வா
மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம
மாண்புமிகு றவுப் ஹகீம்
மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ
மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன
மாண்புமிகு றிஸாட் பதியுதீன்
மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க
மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ
மாண்புமிகு மனோ கணேசன்
மாண்புமிகு அஜித் பீ. பெரேரா
மாண்புமிகு தினேஷ் குணவர்தன
மாண்புமிகு டக்ளஸ் தேவானந்தா
மாண்புமிகு ரவி கருணாநாயக்க
மாண்புமிகு விஜித ஹேரத்
மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்

The Hon. Nimal Siripala De Silva
The Hon. (Dr.) Sarath Amunugama
The Hon. Rauff Hakeem
The Hon. Mahinda Samarasinghe
The Hon. (Dr.) Rajitha Senaratne
The Hon. Risad Badhiutheen
The Hon. Patali Champika Ranawaka
The Hon. (Dr.) Wijeyadasa Rajapakshe
The Hon. Mano Ganesan
The Hon. Ajith P. Perera
The Hon. Dinesh Gunawardena
The Hon. Douglas Devananda
The Hon. Ravi Karunanayake
The Hon. Vijitha Herath
The Hon. M.A. Sumanthiran

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව
நிலையியற் கட்டளைகள் பற்றிய குழு
COMMITTEE ON STANDING ORDERS

පාර්ලිමේන්තුවේ 116 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධාන සහ 2018 මැයි මස 22 වැනි දින, පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව මාගේ සභාපතිත්වය ඇතිව නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභාපතිවරයා ද ඇතුළත්ව 2018 මැයි මස 23 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන් ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී:

ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

மாண்புமிகு அஜித் பீ. பெரேரா
மாண்புமிகு விஜித ஹேரத்
மாண்புமிகு சந்திம வீரக்கொடி
மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி
மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்
மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன

The Hon. Ajith P. Perera
The Hon. Vijitha Herath
The Hon. Chandima Weerakkody
The Hon. J.M. Ananda Kumarasiri
The Hon. M.A. Sumanthiran
The Hon. (Dr.) Jayampathy Wickramaratne

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
அரசாங்கக் கணக்குகள் பற்றிய குழு
COMMITTEE ON PUBLIC ACCOUNTS

පාර්ලිමේන්තුවේ 119 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2018 මැයි මස 22 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව 2018 මැයි මස 23 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී:

ගරු මහින්ද සමරසිංහ මහතා
ගරු පී. හැරිසන් මහතා
ගරු ෆයිසර් මුස්තාපා මහතා
ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
ගරු එස්.බී. දිසානායක මහතා
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු චන්දිම ගමගේ මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා

මාණ්පුමිකු මහින්ද සමරසිංහ
මාණ්පුමිකු පී. හැරිසන්
මාණ්පුමිකු පයිසර් මුස්තපා
මාණ්පුමිකු පාලිත රංගේ පණ්ඩාර
මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා
මාණ්පුමිකු සුජීව සේනසිංහ
මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න
මාණ්පුමිකු ලසන්ත අලගියවන්න
මාණ්පුමිකු සෙයිට් අලී සාහිර් මෞලානා
මාණ්පුමිකු එස්.පී. දිසානායක්ක
මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන
මාණ්පුමිකු විජිත හේරත්
මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර
මාණ්පුමිකු නිහාල් කලප්පත්ති
මාණ්පුමිකු පිමල් රත්නායක්ක
මාණ්පුමිකු පුත්තික පතිරණ
මාණ්පුමිකු සීනිත්තම්පි යෝකේස්වරන්
මාණ්පුමිකු සි. සිරිදරන්
මාණ්පුමිකු සන්තිම කමකේ
මාණ්පුමිකු උදය ප්‍රබාත් කම්මන්පිල
මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස
මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස
මාණ්පුමිකු ඉ. චාල්ස් නිර්මලනාදන්
මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා ප්‍රේමචන්ද්‍රන්
මාණ්පුමිකු පන්තුල ලාල් පණ්ඩාරිකොට
මාණ්පුමිකු ස. වියාලේන්දිරන්

The Hon. Mahinda Samarasinghe
The Hon. P. Harrison
The Hon. Faiszer Musthapha
The Hon. Palitha Range Bandara
The Hon. Niroshan Perera
The Hon. Sujeewa Senasinghe
The Hon. Eran Wickramaratne
The Hon. Lasantha Alagiyawanna
The Hon. Seyed Ali Zahir Moulana
The Hon. S.B. Dissanayake
The Hon. (Dr.) Bandula Gunawardane
The Hon. Vijitha Herath
The Hon. Vasudeva Nanayakkara
The Hon. Nihal Galappaththi
The Hon. Bimal Rathnayake
The Hon. Buddhika Pathirana
The Hon. Seeniththamby Yoheswaran
The Hon. S. Shritharan
The Hon. Chandima Gamage
The Hon. Udaya Prabhath Gammanpila
The Hon. (Dr.) Nalinda Jayathissa
The Hon. (Dr) Kavinda Heshan Jayawardana
The Hon. I. Charles Nirmalanathan
The Hon. (Mrs.) Hirunika Premachandra
The Hon. Bandula Lal Bandarigoda
The Hon. S. Viyalanderan

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு
COMMITTEE ON PUBLIC ENTERPRISES

පාර්ලිමේන්තුවේ 120 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2018 මැයි මස 22 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව 2018 මැයි මස 23 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී:

ගරු රවුෆ් හකීම් මහතා
ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු වසන්ත අලුවිහාරේ මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු මාවෙ සෙවී. සේනාධිරාජා මහතා
ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

මාණ්පුමිකු ඉවුප් හකීම්
මාණ්පුමිකු රවීන්ද්‍රිර සමවීර
මාණ්පුමිකු ලක්ෂ්මන් සෙනෙවිරත්න
මාණ්පුමිකු සුජීව සේනසිංහ
මාණ්පුමිකු වසන්ත අලුවිහාර
මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා
මාණ්පුමිකු අජිත් පී. පෙරේරා
මාණ්පුමිකු ලසන්ත අලකියවන්න
මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක
මාණ්පුමිකු අසෝක් අපේසිංහ
මාණ්පුමිකු අනුර පිරියතර්ෂන යාප්පා
මාණ්පුමිකු අනුර තිසානායක්ක
මාණ්පුමිකු සන්තිරසිරි කජදීර
මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ
මාණ්පුමිකු තයාසිරි ජයසේකර
මාණ්පුමිකු සුනිල් ඉහන්තුන්නෙත්ති
මාණ්පුමිකු පිමල් රත්නායක්ක
මාණ්පුමිකු මාවෙ. සේර. සේනාතිරාජා
මාණ්පුමිකු අප්තුල්ලා මහරූප්
මාණ්පුමිකු ජයන්ත සමරවීර
මාණ්පුමිකු සි. සිරිදරන්
මාණ්පුමිකු එම්.ඒ. සුමන්තිරන්
මාණ්පුමිකු ඉෙක්ටර් අප්පුහාමි
මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස
මාණ්පුමිකු හර්ෂන රාජකරුණා
මාණ්පුමිකු ඥානමුත්තු ශ්‍රීනේසන්

The Hon. Rauff Hakeem
The Hon. Ravindra Samaraweera
The Hon. Lakshman Senewiratne
The Hon. Sujeewa Senasinghe
The Hon. Wasantha Aluvihare
The Hon. (Dr.) Harsha De Silva
The Hon. Ajith P. Perera
The Hon. Lasantha Alagiyawanna
The Hon. Ranjan Ramanayake
The Hon. Ashok Abeysinghe
The Hon. Anura Priyadharshana Yapa
The Hon. Anura Dissanayake
The Hon. Chandrasiri Gajadeera
The Hon. Mahindananda Aluthgamage
The Hon. Dayasiri Jayasekara
The Hon. Sunil Handunnetti
The Hon. Bimal Rathnayake
The Hon. Mavai S. Senathirajah
The Hon. Abdullah Mahrooff
The Hon. Jayantha Samaraweera
The Hon. S. Shritharan
The Hon. M.A. Sumanthiran
The Hon. Hector Appuhamy
The Hon. (Dr.) Nalinda Jayathissa
The Hon. Harshana Rajakaruna
The Hon. Gnanamuthu Srineshan

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව
அரசாங்க நிதி பற்றிய குழு
COMMITTEE ON PUBLIC FINANCE

පාර්ලිමේන්තුවේ 121 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2018 මැයි මස 22 වැනි දින, පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව, 2018 මැයි මස 23 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී:

ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
ගරු (සූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු ඒ. සරවනපවන් මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

மாண்புமிகு லசந்த அலகியவன்ன
மாண்புமிகு டக்ளஸ் தேவானந்தா
மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன
மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே
மாண்புமிகு பிமல் ரத்நாயக்க
மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி
மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா
மாண்புமிகு லக்ஷ்மன் ஆனந்த விஜேமான்ன
மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்
மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண
மாண்புமிகு ஈ. சரவணபவன்
மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்
மாண்புமிகு செஹான் சேமசிங்க
மாண்புமிகு அஜித் மான்னப்பெரும
மாண்புமிகு மயில்வாகனம் திலகராஜா
மாண்புமிகு மயந்த திசாநாயக்க
மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க
மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன
மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி

The Hon. Lasantha Alagiyawanna
The Hon. Douglas Devananda
The Hon. (Dr.) Bandula Gunawardane
The Hon. Susantha Punchinilame
The Hon. Bimal Rathnayake
The Hon. J.M. Ananda Kumarasiri
The Hon. Mavai S. Senathirajah
The Hon. Lakshman Ananda Wijemanne
The Hon. (Ven.) Athuraliye Rathana Thero
The Hon. (Dr.) Ramesh Pathirana
The Hon. E. Saravanapavan
The Hon. M.A. Sumanthiran
The Hon. Shehan Semasinghe
The Hon. Ajith Mannapperuma
The Hon. Mylvaganam Thilakarajah
The Hon. Mayantha Dissanayake
The Hon. (Prof.) Ashu Marasinghe
The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna
The Hon. Wijepala Hettiarachchi

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව
பொதுமனுக் குழு
COMMITTEE ON PUBLIC PETITIONS

පාර්ලිමේන්තුවේ 122 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධාන සහ 2018 මැයි මස 22 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව, 2018 මැයි මස 23 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී:

ගරු වජිර අබේවර්ධන මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු සාලින්ද දිසානායක මහතා
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු රංජිත් අලුවිහාරේ මහතා
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු කනක හේරත් මහතා
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

மாண்புமிகு வஜிர அபேவர்தன
மாண்புமிகு சுஜீவ சேனசிங்க
மாண்புமிகு டக்ளஸ் தேவானந்தா
மாண்புமிகு சாலிந்த திசாநாயக்க
மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன
மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே
மாண்புமிகு நிஹால் கலப்பத்தி
மாண்புமிகு பிமல் ரத்நாயக்க
மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே
மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன
மாண்புமிகு லக்ஷ்மன் ஆனந்த விஜேமான்ன
மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்
மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண
மாண்புமிகு விதுர விக்கிரமநாயக்க
மாண்புமிகு கனக ஹேரத்
மாண்புமிகு மயில்வாகனம் திலகராஜா
மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்
மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன
மாண்புமிகு சமிந்த விஜேசிறி
மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா
மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்

The Hon. Wajira Abeywardana
The Hon. Sujeewa Senasinghe
The Hon. Douglas Devananda
The Hon. Salinda Dissanayake
The Hon. Mahinda Yapa Abeywardena
The Hon. Susantha Punchinilame
The Hon. Nihal Galappaththi
The Hon. Bimal Rathnayake
The Hon. Ranjith Aluvihare
The Hon. Anura Sidney Jayarathne
The Hon. Lakshman Ananda Wijemanne
The Hon. K. Thurairetnasingam
The Hon. (Dr.) Ramesh Pathirana
The Hon. Vidura Wickramanayaka
The Hon. Kanaka Herath
The Hon. Mylvaganam Thilakarajah
The Hon. Muhammad Ibrahim Muhammad Mansoor
The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna
The Hon. Chaminda Wijesiri
The Hon. (Mrs.) Shanthi Sriskandarasa
The Hon. (Dr.) S. Sivamohan

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

* 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XIV කොටස; සහ

* 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XIV, XV, XVI, XVII හා XVIII කොටස්, හයවැනි කාණ්ඩයේ VI, VII, X, XI හා XII කොටස් සහ දසවැනි කාණ්ඩයේ VII, VIII, IX හා X කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා හා ගිණුම්;

(ii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iii) 2015 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකාව, තිස් හත්වැනි වාර්ෂික වාර්තාව;

(iv) 2015 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(v) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vi) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා;

(vii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(viii) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ix) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ වාර්ෂික වාර්තාව;

(x) 2015 වර්ෂය සඳහා ජේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xi) 2015 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xiii) 2015 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(xiv) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුවේ නිල ඔප්පු ප්‍රදානයක් සඳහා එන්න." කියලා ඔබතුමාගේ අත්සනින් යුතුව අපට ලියුමක් ලැබී තිබෙනවා. 1982දීයි පාර්ලිමේන්තුව මෙම ස්ථානයට ගෙනාවේ. එහෙම නම් අවුරුදු 36ක් ගිහිල්ලාත් ඔප්පුවක් නැතුවද අපි මෙම පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අලුත් ඇමතිතුමා ඔප්පු ලබා දෙනවා.

ඊළඟට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 27(2) යටතේ ප්‍රශ්න. ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීම කඩිනම් කිරීම
கிளிநொச்சி மாவட்டத்தில் மீள்குடியேற்றத்தைத் துரிதப்படுத்தல்
EXPEDITION OF RESETTLEMENT IN KILINOCHCHI DISTRICT

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர் கௌரவ டி.எம். சுவாமிநாதன் அவர்களிடம் நிலையியற் கட்டளை 27(2)இன்கீழ் இந்தக் கேள்வியைக் கேட்பதற்கு அனுமதித்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

கிளிநொச்சி மாவட்டத்தில் பச்சிலைப்பள்ளிப் பிரதேச செயலகத்திற்கு உட்பட்ட முகமாலை, இத்தாவில், வேம்பொடுகேணி ஆகிய கிராம சேவையாளர் பிரிவுகளைச் சேர்ந்த சுமார் 300 குடும்பங்கள், கடந்த கால யுத்தம் காரணமாக 2000ஆம் ஆண்டு இடம்பெயர்ந்து, இதுவரையில் மேற்படி பகுதிகளில் மீளக்குடியேற்றப்படாத நிலையில், வாடகை வீடுகளிலும், பிற பகுதிகளில் உறவினர்களது தயவுகளிலும், பாரிய பாதிப்புகளுக்கு மத்தியில் வாழ்ந்து வருகின்றனர். யுத்தத்தில் ஈடுபட்டிருந்த இரு தரப்பினரும் தொடர்ந்து மோதல்களை மேற்கொண்டிருந்த மேற்படி பகுதிகள் அதிகளவு ஆபத்தான வெடி பொருட்கள் புதைந்துள்ள பகுதிகளாகவும் காணப்படுகின்றன. அந்த வகையில், இப்பகுதிகளில் வெடிபொருட்களை அகற்றுவது மிகுந்த சவாலுக்குரிய விடயமாகும் என்று வெடிபொருட்களை அகற்றுகின்ற தன்னார்வத் தொண்டு நிறுவனங்கள் கூறி வருவதாகவும் குறிப்பிடப்படுகின்றது. எனினும், மேற்படி சுமார் 300 குடும்பங்களின் நிலைமையினை அவதானிக்கின்றபோது, அக்குடும்பங்களது மீள்குடியேற்றம் துரிதப்படுத்தப்பட வேண்டியதன் அவசியம் வலியுறுத்தப்படுகின்றது.

மேற்படி பகுதிகளில் வெடி பொருட்களை அகற்றி, மக்கள் குடியேற்றத்திற்கு உகந்த பகுதியாக உறுதிசெய்து, மேற்படி சுமார் 300 குடும்பங்களும் எப்போது மீளக்குடியேற்றப்படும் என்பதை அறிவிக்க முடியுமா?

மேற்படி பகுதிகளில் வெடி பொருட்களை விரைந்து அகற்றும் நோக்கில் மேலதிக நடவடிக்கைகள் ஏதேனும் மேற்கொள்ள முடியுமா?

மேற்படி எனது கேள்விகளுக்கான பதில்களையும், எடுக்கப் படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவாரென எதிர்பார்க் கின்றேன்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Resettlement, Rehabilitation, Northern Development and Hindu Religious Affairs)

கௌரவ சபாநாயகர் அவர்களே, கிளிநொச்சி மாவட்டத்தின் பச்சிலைப்பள்ளிப் பிரதேச செயலாளர் பிரிவிற்குட்பட்ட இத்தாவில், அரசங்கேணி, வேம்பொடுகேணி, அல்லிப்பளை, கிளாலி, முகமாலை ஆகிய கிராம அலுவலர் பிரிவுகளில் நிலக் கண்ணிவெடி ஆபத்துள்ள பிரதேசங்கள் தவிர்ந்த ஏனைய எல்லாப் பிரதேசங்களும் இடம்பெயர்ந்த மக்களை மீள்குடியேற்றுவதற்காக விடுவிக்கப்பட்டுள்ளன.

யுத்தத்துடன் சம்பந்தப்பட்ட இரு தரப்புகள் கடுமையாக மோதிக்கொண்ட மேற்படி கிராம அலுவலர் பிரிவுகள் உள்ளடங்கக்கூடிய விதத்தில் முகமாலை முன்னரங்கப் பகுதி அமைந்துள்ளது. இப்பிரதேசத்தில் நிலக் கண்ணிவெடிகள் மிகப் பரவலாக, பல அடுக்குகளாகப் பல்வேறு சந்தர்ப்பங்களிலும் புதைக்கப்பட்டிருப்பதால், இப்பிரதேசத்தில் புதைக்கப்பட்டுள்ள நிலக் கண்ணிவெடிகளை அகற்றி முடிக்கும் பணியைத் துரிதப்படுத்துவதற்கு அது பெரும் தடையாக உள்ளது.

மேற்படி கிராம அலுவலர் பிரிவுகளில் நிலக்கண்ணிவெடி ஆபத்து நிலவும் மொத்த நிலப்பரப்பு 8.38 சதுரகிலோ மீற்றர்களாக அடையாளம் காணப்பட்டிருந்தது. அந்நிலப்பரப்பில் 3.61 சதுரகிலோ மீற்றர்களில் நிலக்கண் ணிவெடிகள் அகற்றி முடிக்கப்பட்டு, அப்பிரதேசங்கள் பொதுமக்களின் பயன்பாட்டுக்காக விடுவிக்கப்பட்டுள்ளன. எஞ்சிய 4.78 சதுரகிலோ மீற்றர் நிலப்பரப்பில் 4.01 சதுரகிலோ மீற்றர்களில் தற்போது இலங்கைத் தரைப்படையின் நிலக்கண்ணிவெடி அகற்றும் பிரிவு, DASH அமைப்பு, MAG அமைப்பு, SHAP அமைப்பு மற்றும் HALO Trust அமைப்பு ஆகியன நிலக்கண்ணி வெடியகற்றும் பணியில் ஈடுபட்டு வருகின்றன.

மனிதாபிமான நிலக் கண்ணிவெடி அகற்றும் நடவடிக் கைகளில் இடம்பெயர்ந்த மக்களை மீள்குடியேற்றுவது முக்கியமானதாகக் கருதப்படுகிறது. அதன்படி, இப்பிரதேசங் களை நிலக்கண்ணிவெடி அபாயமற்ற பிரதேசங் களாக மாற்றுவதற்காக நாம் நிலக் கண்ணிவெடி அகற்றும் அமைப்புகளின் உயர்ந்தபட்ச இயல்திறனை இப்பிரதேசங் களில் செயற்படுத்தியுள்ளோம்.

நிலக்கண்ணிவெடி அகற்றும் செயன்முறையை உரிய சர்வதேசத் தராதரங்களுக்கு அமைய மேற்கொள்ள வேண்டியிருப்பதால், சர்வதேசப் பாதுகாப்பு நடைமுறைகள் பின்பற்றப்பட வேண்டும். அத்தோடு, மேலதிக நிலக் கண்ணிவெடி அகற்றுவோரை இப்பிரதேசத்துக்கு அனுப்பி வைக்க முடியாத நிலையுமிருக்கிறது.

இதன் காரணமாக, நிலக் கண்ணிவெடிகளை அகற்றி முடிக்கும் ஒரு திகதியை உறுதிபடக் கூறும் ஆற்றல் இல்லையென்பதுடன், இப்பிரதேசங்களை இயன்றளவு விரைவாக நிலக் கண்ணிவெடி ஆபத்து அற்றதாக்கி இடம்பெயர்ந்த மக்களுக்காக வழங்குவதற்கு உரிய சகல நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட்டு வருகின்றது.

இப்பிதேசத்திலே நிலவும் அதிக நிலக் கண்ணிவெடிச் செறிமானம் காரணமாக புதைக்கப்பட்டுள்ள நிலக் கண்ணிவெடிகளை அகற்றுவற்குப் புறம்பான ஒரு வேலைத் திட்டத்தை அமுல்படுத்தும் ஆற்றல் இல்லையென்பதுடன், இப்பிரதேசத்தில் உரிய சர்வதேசத் தராதரங்களுக்கு அமைய நிலக் கண்ணிவெடி அபாயம் அற்றதாக்க வேண்டியுள்ளது என்தையும் அறிவிக்கின்றேன்.

ஒட்டாவ சமவாயத்திலே கண்ணிவெடிகளைத் தடை செய்தல் தொடர்பில் இலங்கை அரசு 2017ஆம் ஆண்டு டிசம்பர் மாதம் கையெழுத்திட்டதன் காரணமாக, உலக நாடுகளிளுள்ள கண்ணிவெடி அகற்றும் அமைப்புக்களுடன் இலங்கை அரசு இணைந்து 2020 களில் கண்ணிவெடியற்ற பூமியாக வடக்கு, கிழக்கைப் பிரகடனம் செய்வதற்கு எனது அமைச்சு அர்ப்பணிப்புடன் செயற்பட்டு வருகின்றது.

உலக நாடுகளில் உள்ள கண்ணிவெடி அகற்றும் அமைப்புக்கள் இலங்கை அரசிற்குப் பூரண ஒத்துழைப்பைத் தர ஆயத்தமாக உள்ளன. ஆதலால், 2020 இன் பின்னர் எமது மக்களைக் கண்ணிவெடியற்ற தமது சொந்த இடங்களில் குடியேற்ற முடியுமென்று நான் நம்புகின்றேன்.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
மழைக் காலம் வரப்போகின்றது. மழை காலத்தில் கண்ணிவெடிகளை அகற்ற முடியாது. ஆனபடியால் அதற்கு முற்பட்ட காலத்தில் இராணுவத்தினுடைய மேலதிக உதவியை நாடுவதற்கு முயற்சி செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

ගරු ඩී.එම්. ස්වාමීනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
அதற்காக நடவடிக்கை எடுப்போம்! நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, අද දින ඔබතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද කරුණක් කෙරෙහි ඔබතුමාගේ අවධානය මා නැවත යොමු කරවනවා. අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තු වාරය අවසාන කිරීමෙන් පසුව 2018 මැයි මාසයේ 8වන දින නැවත පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භ වුණා. ඉන් පසුව නැවත වතාවක් පාර්ලිමේන්තුව ස්ථාපනය වීමේදී ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවේ කාරක සභා සඳහා අපගේ සහභාගිත්වය පිළිබඳව ප්‍රශ්නයක් මතු වුණා. ඒ අනුව, පාර්ලිමේන්තුව නැවත රැස් වූ දිනයේදී ආණ්ඩු පක්ෂයෙන් ඉවත් වෙලා විපක්ෂයේ අසුන් ගත් අප මන්ත්‍රීවරු 16දෙනාට ඒ ඒ කාරක සභා නියෝජනය කිරීමට අවස්ථාවක් අවශ්‍ය බව පවසමින් ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට අපි ලේඛනයක් භාර දුන්නා. ඒ, අතිගරු ජනාධිපතිතුමාගේ එකඟතාව ඇතිවයි. නමුත්, එම කරුණ මෙතෙක් ඔබතුමන්ලාගේ අවධානයට යොමු වෙලා නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා ඔබතුමාගේ අවධානයට නැවත මා එම කරුණ යොමු කරවනවා. ඒ අනුව, මෙම මන්ත්‍රීවරු 16දෙනා ඉල්ලා තිබෙන ආකාරයට ඉදිරි කාලය තුළදී අතිගරු ජනාධිපතිතුමාගෙනුත් කරුණු විමසා මේ මන්ත්‍රීවරු 16දෙනාට ඒ ස්ථාවර කාරක සභාවලට සහභාගි වන්න අවස්ථාව ලබා දෙන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම නොවුණොත්, මෙය මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද අභිමිවීමක් වනවා මෙන්ම මේ මන්ත්‍රීවරු කිසිදු කමිටුවකට අයත් නොවන තත්ත්වයක් ද ඇතිවනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සම්බන්ධව බොහොම ස්තුතියි. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අපේ රටේ මීට පෙර පැවතුණු-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා මේ සම්බන්ධයෙන් පියවර අරගෙන තිබෙන්නේ. දැන් එම කරුණ පැහැදිලියි. එම නිසා නැවත මේ සම්බන්ධයෙන් කථා කරන්න අවශ්‍ය වන්නේ නැහැ. මම නැවතත් මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්නම්. ඊයේම පක්ෂ නායක රැස්වීමේදීත්, ඊට ඉහතදීත් මේ සම්බන්ධයෙන් මා අවධානය යොමු කළා. මොකද, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තමයි මේ මන්ත්‍රීවරුන්ගේ නම් අප වෙත යොමු කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ එක්සත් ජනතා නිදහස් සන්ධාන කණ්ඩායමේ නායකතුමා අවශ්‍ය නම් විස්තර අපට ලබා දෙන්න එකඟ වුණා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කරුණ ගැනමද නැවත කථා කරන්න යන්නේ?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නැහැ.

පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට කලින් හිටපු සාමාජිකයන්ම පත් වෙන සම්ප්‍රදායක් අපේ රටේ තිබ්ලා නැහැ. ඉතා වැදගත් කාරක සභා දෙක වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට - Public Accounts Committee එකට - සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට -COPE එකට- හිටපු සාමාජිකයන්ම පත් නොකර අලුතෙන් සාමාජිකයන් නම් කරලා පත් කිරීම සඳහා මැදිහත් වෙන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන පිළිතුරු දෙන්න මට අවස්ථාව දෙන්න. අපි පක්ෂ නායක රැස්වීමේ එකඟත්වය ඇතිවයි එම තීරණය ගත්තේ. අලුතෙන් සාමාජිකයන් නම් කරලා පත් කරන්න ගියොත් තව මාස ගණනක් කල් ගත වෙනවා. ඒ වාගේම අවශ්‍ය වෙනස්කම් තිබෙනවා නම් ඒවා කරන්න පුළුවන් කියලා අපි එකඟ වුණා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් ඒක සඳහන් කළා. එතුමාත් එකඟ වුණා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මේ කාරක සභා දෙක පත් කිරීමට ඔබතුමා කටයුතු කරලා තිබෙනවා. ඒවා පාර්ලිමේන්තුවේ තිබෙන සුවිශේෂී කාරක සභා නිසා ඔබතුමා ඒවා කඩිනමින් පත් කරලා තිබෙනවා. ඊයේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් සමඟ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් පැමිණ ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමේ සහ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාව අනුව COPE එකේ සාමාජිකයන් කිහිපදෙනෙකුට මෙම සිද්ධියේ ප්‍රධාන චූදිතයාගෙන් දුරකථන ඇමතුම් ලැබීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙලා තිබෙනවා. කොමිසමේ මේ කරුණ ඔප්පු වෙලා තිබෙනවා. අපි ඒ පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරලා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් මේ ගැන පරීක්ෂණ පවත්වනවා. එවැනි වාතාවරණයක් තුළ එම සාමාජිකයන් COPE එකට පත් කරන්න එපා කියලා අපි ඉල්ලීමක් කළා. එහෙම ප්‍රශ්නයක් තිබෙන බව ඔබතුමාටත් දැනෙනවා කියලා ඔබතුමා ගෞරවාන්විතව පිළිගත්තා. මේ පිළිබඳ පක්ෂ නායකයන්ට දැනුම් දෙනවා කියලා ඔබතුමා පැහැදිලි කළා. ඔබතුමා මේ පිළිබඳ පක්ෂ නායකයන්ට දැනුම් දුන්නාද, පක්ෂ නායකතුමන්ලා ගත්ත පියවර මොකක්ද, දුරකථන මාර්ගයෙන් එම චූදිතයන් සමඟ කථා කළ පුද්ගලයන් නැවත COPE එකට පත් කරලා තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන සත්තකින්ම අපි පක්ෂ නායක රැස්වීමේදී කථා කළා. එතැනදී ආණ්ඩුව ගත් ස්ථාවරය මම කියන්නම්. චෝදනාවක් ආවාට, FCID ගියාට, සාමාජිකයන් අයින් කරන්න ගියොත් ගොඩක් අය අයින් කරන්න වෙනවා. යම් කිසි චෝදනාවක් ඔප්පු වුණා නම්, ඒ ගැන ආණ්ඩුවට තීරණයක් ගන්න පුළුවන්. නමුත් මෙතැනදී එහෙම අයින් කිරීමට ඒ ගොල්ලන්ගේ බලාපොරොත්තුවක් නැහැ. ඒක තමයි ආණ්ඩුවේ ස්ථාවරය වුණේ. ඒකට බලපෑම් කරන්න මට බැහැ. මම ඒක ඉදිරිපත් කළා.

මීළඟට, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මම අහපු ප්‍රශ්නය ගැන කථා කරලා අවසන් කරන්න දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. කියලා අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, එවැනි චෝදනා එල්ල වුණාම අයින් කරන්න ගොඩක් අය ඉන්නවා කියලා කිව්වාට, එහෙම කාටවත් මේ කමිටුවල-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කිව්වේ ආණ්ඩුවේ-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, COPE කමිටුව කියන්නේ මේ පාර්ලිමේන්තුවට මුදල් සම්බන්ධව වග කියන උත්තරීතර කමිටුව. මේ පාර්ලිමේන්තුවේ තිබෙන උත්තරීතරභාවය, ගෞරවය යනාදී මේ සියල්ල රඳා පවතින්නේ මේ කමිටුව තුළයි. මෙහිදී පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවේදී කමිටු සාමාජිකයන් සහ චූදිතයන් අතර සිදු වුණු සංවාදය පැහැදිලිව කොමිෂන් සභා වාර්තාවෙන් ඔප්පු වුණා. එම නිසා ඉන් එහාට දෙයක් නැහැ. එහෙම කට්ටියක් පත් කරනවා කියලා ඒ පක්ෂ තීරණය කරනවා නම්, ඒක රටේ ජනතාව තීන්දු කරයි. හැබැයි, ගරු කථානායකතුමනි, අඩුම තරමේ ඔබතුමාගේ ස්ථාවරයවත් පැහැදිලි කරන්න, මේ පත් කිරීම වැරදියි කියලා. අඩුම තරමේ ගෞරවාන්විත කථානායකවරයෙක් හැටියට ඒ ප්‍රකාශය රටට කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. ඒ තීරණය ගන්න ඕනෑ ආණ්ඩු පක්ෂය. මට බලපෑම් කරන්න බැහැ. බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත්, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් මතු කරපු කරුණ සම්බන්ධව කථා කරන්න කැමතියි. විවිධ ආයතනවල ඇති වී තිබෙන වංචා, දූෂණයන් පිළිබඳ COPE සභාවේ විවිධ අවස්ථාවල විමර්ශනයට ලක් වෙනවා. ඒ විමර්ශනය කරන වෙලාවේදී සමහර මන්ත්‍රීවරු, ඇමතිවරු වශයෙන් කටයුතු කරන කාලයේ ඒවාට නායකත්වය දීපු අය පවා එම COPE සභාවේ හිටපු අවස්ථා බොහෝ ගණනක් තිබුණා. ඒ නිසා වංචා, දූෂණවලට හවුල් නොවූවන්ගෙන්, අඩුම තරමින් චෝදනාවක් නොවූවන්ගෙන් COPE සභාව හැදෙනවා නම් තමයි වඩාත් යෝග්‍ය. නමුත්, මෙතැන ප්‍රශ්නය ඊට වඩා සුවිශේෂයි. ගරු කථානායකතුමනි, COPE සභාව ඇතුළේ සිට ඒ පරීක්ෂණ සිදුවෙන අවස්ථාවේදී

පර්පෙවුවෙල් ට්‍රෙෂරීස් සමාගමේ අයිතිකරුවන් සමඟ දුරකථන ඇමතුම් හුවමාරු කර ගත්තා යැයි කියන එක සම්බන්ධයෙන් බලන විට චෝදනාවකට වඩා එතැන සදාචාරාත්මක ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා COPE සභාවේ පරීක්ෂණයක් වෙද්දී මන්ත්‍රීවරු අදාළ වූදිතයන් එක්ක COPE සභාව තුළ සිටම අදහස් හුවමාරු කරගැනීමේ තත්ත්වයක් ඇතිවී තිබෙනවා නම්, මම හිතන්නේ ඔවුන් මෙම සභාවට පත් කිරීම එතරම් යෝග්‍ය තත්ත්වයක් නොවන බවයි. ඒක තමයි පළමුවැනි කාරණය.

ගරු කථානායකතුමනි, දෙවැනි කරුණ ලෙස ගරු සුසිල් ප්‍රේමජයන්ත හිටපු අමාත්‍යතුමා මතු කරපු ප්‍රශ්නය තිබෙනවා. දැන් අපි පක්ෂ නායක රැස්වීම් කැඳවනවා. ඒ පක්ෂ නායක රැස්වීමේදී ගන්නා තීන්දු අනෙක් මන්ත්‍රීවරුන්ට ගලාගෙන යන ක්‍රමවේදයක් අවශ්‍ය වී තිබෙනවා. අපි පක්ෂ නායක රැස්වීමට සහභාගි වෙනවා නම්, ඒ ගනු ලබන තීන්දු පිළිබඳව අපි අපේ මන්ත්‍රී කණ්ඩායම දැනුවත් කරනවා. දැන් හැමදාම උදේ පාර්ලිමේන්තුවේ සිදුවන දේ අනුව පෙනෙන දේ තමයි, ඒ ගනු ලබන තීන්දු නියමාකාරයෙන් ඒ මන්ත්‍රීවරුන්ට නොයෑම. මා උදාහරණයක් කියන්නම්. මේ අලුත් පාර්ලිමේන්තුව COPE සභාව සහ ගිණුම් කාරක සභාව සඳහා හිටපු නියෝජිතයන්ම - තිබුණු සභාම- පත් කළේ නැහැ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඒ තිබුණු සභාම පත් කළේ නැහැ. ගරු කථානායකතුමා අපෙන් විමසා සිටියා, "ඔයගොල්ලන්ගේ සාමාජිකයන් වෙනස් වෙනවා ද?" කියලා. අපි කිව්වා, "අපේ සාමාජිකයන් වෙනස් වෙන්නේ නැහැ, අපේ මන්ත්‍රීවරු හතරදෙනා ඒ විධියටම ඉන්නවා" කියලා. නමුත් ඒ මන්ත්‍රීවරුන්ගේ නැවත පත්වීම අලුත් පත්වීමක් ලෙස තමයි තිබෙන්නේ. මේක තමයි පක්ෂ නායක රැස්වීමේදී කථා කරපු සිද්ධිය. ඒ පණිවුඩය මේ අනෙක් මන්ත්‍රීවරු වෙත ගලාගෙන ආ යුතුව තිබෙනවා. ඒ නිසා ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය සාධාරණයි. එතුමන්ලාගේ 16 දෙනෙකුගේ කණ්ඩායමක් වෙනම ස්වාධීනව කටයුතු කරනවා නම්, එතුමන්ලාට පක්ෂ නායක රැස්වීමේ නියෝජනයක් ලැබිය යුතුයි. දැන් සිදුවී තිබෙන තත්ත්වය අනුව, මේ පාර්ලිමේන්තුවට ඡන්දයෙන් තේරී පත්වී තිබෙන මන්ත්‍රීවරුන්ගේ සංයුතිය අනුව, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හතරදෙනෙකුට පාර්ලිමේන්තුවේ පක්ෂ නායක රැස්වීම නියෝජනය කිරීමේ අවස්ථාව ලැබී තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයාටත්, ගරු සරත් අමුණුගම අමාත්‍යවරයාටත්, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යවරයාටත්, ගරු මහින්ද සමරසිංහ අමාත්‍යවරයාටත් එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් ඒ අවස්ථාව ලැබී තිබෙනවා. දැන් මේ හතරදෙනාගෙන් එක් අයෙකුට ඒ 16 දෙනාගේ කණ්ඩායම නියෝජනය වීම සඳහා අවස්ථාව ලබා දිය යුතුයි.

මම හිතන විධියට දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඉල්ලා අස්නොවී, අනෙක් තිදෙනාගෙන් එක් අයෙකු ඉල්ලා අස්වී ඒ 16 දෙනාගේ කණ්ඩායමට අවස්ථාවක් ලබා දිය යුතුයි. ඒක ඒ අයගේ අභ්‍යන්තර ප්‍රශ්නයක්. ඒක තමයි පක්ෂ නායක රැස්වීමේ කථා වුණේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන ඊයේ කථා වුණානේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී ගනු ලබන ක්‍රියාමාර්ග, එහිදී ගනු ලබන තීන්දු මේ මන්ත්‍රීවරුන්ට ගලාගෙන යෑමේ ක්‍රමවේදයක අවශ්‍යතාව තිබෙනවාය කියන එක මම කියනවා. එහෙම නැත්නම් සිදු වන්නේ මේකයි. ඊයේ පක්ෂ නායක රැස්වීමේදී එක තීන්දුවක් ගන්නවා, අද උදේ වෙන රණ්ඩුවක් යනවා. ඒක සාධාරණ නැහැ. එහෙම නම් අපි පක්ෂ නායක රැස්වීම පැත්තකින් තියලා මේ සභාවේදී රණ්ඩු කරගනිමු. ඒ කුමක් හෝ දෙකෙන් එක තීරණයකට එන්න ඕනෑකම තිබෙනවා කියන එකයි අපේ අදහස ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන කරුණු ඉදිරිපත් කළා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(මාණ්පුමිකු காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමට ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන්ම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විතරයි දැන් සහභාගි වෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කණ්ඩායම එක්සත් ජනතා නිදහස් සන්ධානය විධියටනේ ගණන් ගන්නේ ගරු මන්ත්‍රීතුමා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(මාණ්පුමිකු காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඒ සන්ධානය විධියට ගණන් ගත්තත්, ඒ තුළ දේශපාලන පක්ෂ ගණනාවක් තිබෙනවා. විමල් වීරවංශ මැතිතුමාගේ පක්ෂය තිබෙනවා, උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමාගේ පක්ෂය තිබෙනවා, වාසුදේව නානායක්කාර මැතිතුමාගේ පක්ෂය තිබෙනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් 51 දෙනෙකු ඉන්නවා. මේ 51 දෙනා වෙනුවෙන්ම පක්ෂ නායක රැස්වීම නියෝජනය කරන්නේ එක මන්ත්‍රීවරයායි. නමුත් පාර්ලිමේන්තුවේ 04 දෙනෙකු නියෝජනය කරන පක්ෂයටත් පක්ෂ නායක රැස්වීමේ එක නියෝජනයක් ලැබෙනවා, 18 දෙනෙකු ඉන්න පක්ෂයටත් එක නියෝජනයක් ලැබෙනවා. ආණ්ඩුව පැත්තෙන් ගන්න මේ ක්‍රියාමාර්ග සාධාරණ නැහැ; ප්‍රජාතන්ත්‍රවාදී නැහැ. තමුන්නාන්සේගෙන්ම කිහිප අවස්ථාවකම විමල් වීරවංශ මැතිතුමා ඉල්ලුවා, එතුමාට වෙනම පක්ෂයක් හැටියට ස්වාධීනව මේ සභාවේ වාඩිවෙන්න ඉඩ දෙන්න කියලා. නමුත් තමුන්නාන්සේ ඉඩ දුන්නේ නැහැ. ඒ ඉල්ලපු අවස්ථාවේ ඉඩ දුන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාත් සන්ධානයේ කොටසක් වශයෙන්නේ සැලකුවේ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(මාණ්පුමිකු காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
සන්ධානයේ කොටසක් හැටියට සලකන එක, ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මීට කලින් පාර්ලිමේන්තුවල හිටපු කථානායකවරුන් ගත්ත ක්‍රියාමාර්ග දිහා බැලුවාම, ඕනෑ තරම් එහෙම අවස්ථා දීලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට සම්බන්ධව ඉඳලා විපක්ෂයට ආවාම ජනතා විමුක්ති පෙරමුණ වෙනම කණ්ඩායමක් හැටියට පිළිගත්තා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක අවස්ථාවක් පමණයි දුන්නේ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
එවැනි අවස්ථා හතරක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක අවස්ථාවයි දුන්නේ, හැම දාම ඒක කරන්න බැහැ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
තමුන්නාන්සේ ඒවා පිළිගන්නේ නැතිව තනි තීන්දුවක් අරගෙන-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම තනි තීන්දුවක් ගත්තේ නැහැ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
විශාල කණ්ඩායමක් එක පැත්තකට දමලා, ඒ අයට එක නියෝජනයක් දෙනවා. අනෙක් අයට තවත් අවස්ථා දෙනවා. එතකොට ඒ පණිවුඩ මන්ත්‍රීවරුන් අතරට යන්නේ කොහොමද? ජනතා විමුක්ති පෙරමුණ කියන කථාව ඇත්ත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම අවස්ථාවක තනි තීන්දුවක් ගත්තේ නැහැ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, සාධාරණ වන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කිසිම අවස්ථාවක තනි තීරණයක් ගත්තේ නැහැ. මේ සෑම දෙයක්ම, සෑම කරුණක්ම අපි පක්ෂ නියෝජිතයන්ගේ රැස්වීමේදී තීරණය කරනවා. සෑම දෙයක්ම. සෑම දෙයක්ම. එහෙම චෝදනා කරනවා නම් ඒක ඉතාම අසාධාරණයි. අපි නැවතත් ඒ ගැන කථා කරන්නම්.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, හැමදාම පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භයේදී විශාල කාලයක් මෙවැනි කරුණුවලට අපතේ යනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තරග කරලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඊට පස්සේ ඒකාබද්ධ විපක්ෂය කියලා එයින් 51 දෙනෙක් වෙනම ඉඳ ගත්තා. ඒ අයට පක්ෂ නායක රැස්වීමේ අවස්ථාවක් දීලා තිබෙනවා. දැන් නැවතත් 16 කල්ලියක් කියලා වෙනම ඉඳගෙන ඒ වරප්‍රසාද ඉල්ලනවා. අපි හිතමු, තවත් 6 කණ්ඩායමක් ගියා කියලා. එතකොට ඒ අයටත් අවස්ථාව දෙන්න වෙනවා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මටත් කථා කරන්න අවස්ථාව දෙන්න. දැන් පස් දෙනකුටම අවස්ථාව දුන්නා. ආණ්ඩු පක්ෂය වෙනුවෙන් සාධාරණයක් කරන්න මට අවස්ථාව දෙන්න. දැන් ඒ 51 දෙනාගේ කණ්ඩායමත් පිල් දෙකකට කැඩෙන්න යනවා. එතකොට ඒ පිල් දෙකත් වෙනම අවස්ථා ඉල්ලන්න ඉඩ තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි ඒ ගැන අවධානය යොමු කරන්නම්.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මේකටත් ඇහුම් කන් දෙන්න. මම වුවමනාවෙන් මේ කරුණු අවධාරණය කරන්නේ.

දැන් කෝප් කාරක සභාවේ-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් ජේවීපී එකත් දෙකට කැඩෙනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ජනතා විමුක්ති පෙරමුණ ඉතා පැහැදිලිව "කෝප්" කාරක සභාවේ සභාපති ධුරය දරනවා. ඒ අවස්ථාව වෙනස් වෙනවා නම්, ඒකාබද්ධ විපක්ෂයට වේවා, ආණ්ඩුවට වේවා, රටේ ජනතාවටම ප්‍රශ්නයක්. අපි ඒක වෙනස් කරන්න ඉඩ දෙන්නේ නැහැ. අපි ජනතා විමුක්ති පෙරමුණට ඒ සභාපතිකම දීලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හරි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමනි.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
කෝප් කාරක සභාවෙන් ඉතාම දීර්ඝ කාලයක් තිස්සේ සාධාරණ පරීක්ෂණයක් පැවැත්වුණා. ඒ පරීක්ෂණය පිළිබඳව මේ ආණ්ඩුවට ගෞරවය ලැබෙන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගෞරවය දෙනවා. ඒත් අර හතර දෙනා කරපු වැඩේ කැනයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1. ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත. මෙම සංශෝධන පනත් කෙටුම්පත 2018 මැයි 9වැනි දින පළමුවරට කියවන ලදුව, ඉන් අනතුරුව 2018.05.22 දින කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී සලකා බලා, එකී කාරක සභාවේ වාර්තාව 2018.05.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බව මම දැන්වීමට කැමැත්තෙමි.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
පාර්ලිමේන්තුවට එන පාරේ අපි දකිනවා, සීමා මාලකය කියලා එකක් හදනවා. අපි දන්නේ නැහැ, මොන - ඒක දැන් වැස්සට කඩා වැටිලා. ඒක තිබෙන්නේ දියවන්නා ඔයේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන මම දන්නේ නැහැ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඒකට වෙලා තිබෙන දේ පැහැදිලි කරන්න කියලා, ඔබතුමා ඇමතිතුමාට කියනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම අද කියන්නම්.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඒක quality එකක් නැතුව හදලා, දැන් ඒක ඇල වෙලා. ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන්න කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම කියන්නම්.

ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත
இலங்கை தேயிலைச் சபை (திருத்தம்) சட்டமூலம்
SRI LANKA TEA BOARD (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 10.57]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවින් දිසානායක මහතා වෙනුවෙන්; "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

මේ රටේ ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් තහවුරු වී ඇති වැවිලි අංශය ඵලදායී හා ලාභදායී තිරසාරත්වය කරා මෙහෙයවීමටයි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ක්‍රියා කරන්නේ. අමාත්‍යාංශයේ ඒ අරමුණු හා ඉලක්ක සාර්ථක කර ගැනීමට ඊට අනුගත ශ්‍රී ලංකා තේ මණ්ඩලය සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරන හා ඉටු කිරීමට හැකියාවක් ඇති ආයතනයක් ලෙස අපි පිළිගෙන තිබෙනවා.

තේ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය හා ව්‍යාප්තිය සඳහා නව උපාය මාර්ග හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමටත්, එම ආයතනය ශක්තිමත් කිරීමටත් මාණ්ඩලික මට්ටමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් ඇති කිරීමේ අවශ්‍යතාව ඉතා පැහැදිලිව දැක තිබෙනවා; ඒ තත්ත්වය මතු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, වෙළෙඳ පොළ ඉඩ ප්‍රස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන ගෝලීය තේ ප්‍රවර්ධන වැඩසටහන හා දේශීය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම මෙම ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරේ වගකීම හැටියට ගැනෙනවා. සභාපති, පාර්ශ්වකරුවන්, ව්‍යක්තීය සමිති සමඟ කටයුතු කිරීමේදී මැදිහත්කරුවකු ලෙස එම කටයුතු සම්බන්ධීකරණය, සභාපතිවරයාගේ උපදෙස් පරිදි මහජන සම්බන්ධතා හා අවශ්‍ය ශ්‍රහසාධන ව්‍යාපෘතිවලට සහය වීම, තේ මණ්ඩලය විසින් සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රචාරක කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සහ එම කටයුතු දේශීය හා විදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම, දේශීය හා විදේශීය ආධාර ලබන ව්‍යාපෘති පිළිබඳ සම්බන්ධීකරණ කටයුතුවලින් සභාපතිවරයාට සහයෝගය දැක්වීම, මේ නව ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර දරන්නා වෙතින් ඉටු කරවා ගැනීමට තමයි අපේක්ෂා කරන්නේ.

ගරු කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කළ ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ දී අපේ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා අපේ පක්ෂයේ ප්‍රධානම තනතුරක් භාර ගෙන නව ජවයකින් පක්ෂය තවත් ජයග්‍රහණ කරා ගෙන යන්නට ජාතික සංවිධායක හැටියට වැඩ භාර ගෙනයි දැන් මේ ගරු සභාවට ආවේ. එතුමා මේ පිළිබඳව තවදුරටත් විස්තර කරාවි කියලා මම හිතනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දැන් කථා කරනවාද?

ගරු නවීන් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
මම පසුව කථා කරන්නම්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එතුමා පසුව කථා කරනවා ලු. එතුමා වෙනුවෙනුයි මම මේ පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

[පූ.භා. 10.59]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, අද දිනයේ දී සාකච්ඡා කෙරෙන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම පිළිබඳව කාරණාව සම්බන්ධයෙන් මමත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. සමහර ආයතනවලට -මණ්ඩලවලට, සංස්ථාවලට- ක්‍රියාකාරී අධ්‍යක්ෂවරු පත් වුණාම, එම ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ ක්‍රියාකාරිත්වය අනුව ආයතනය දියුණුව පැත්තට ගෙන යන්නත් පුළුවන්; ආයතනය කඩා වැටෙන පැත්තට ගෙන යන්නත් පුළුවන් බව අපි පොදුවේ දන්නවා. "ක්‍රියාකාරී අධ්‍යක්ෂ" කියන්නේ, බොහෝ වෙලාවට දේශපාලන පත් කිරීමක්. ඒ නිසා එම පුද්ගලයා ඇමතිවරයාගේ ක්‍රියාකාරකම් මෙහෙයවන පුද්ගලයෙක් බවට පත් වෙනවා. අපි ඒක හුඟක් තැන්වල දැකලා තිබෙනවා. අපේ ගයන්ත කරුණාතිලක ඇමතිතුමා -ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා - ඉදිරිපත් කළ කාරණා අනුව ගත්තාමත්, මොහුගේ කටයුතුත් බොහෝ වෙලාවට තිබෙන්නේ ප්‍රවර්ධන, වෘත්තීය සමිති, ශුභ සාධන, ප්‍රචාරණ, ව්‍යාපෘති යන අංශ ඔස්සේයි. ප්‍රවර්ධනය, ව්‍යාපෘති, ප්‍රචාරණ කියන වචන බොහොම සුන්දර වුණාට, ප්‍රචාරණ කටයුතු විධියට ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන්ගේ ඉතිහාසයේ තිබෙන්නේ ඇමතිවරයාගේ දේශපාලන ප්‍රචාරණ කටයුතු. ප්‍රවර්ධන විධියට බොහෝ වෙලාවට තිබෙන්නේ ආයතනයේ මුදල් පාවිච්චි කරලා කරන ඇමතිවරුන්ගේ කටයුතු. ව්‍යාපෘති ගත්තොත්, බොහෝ වෙලාවට ක්‍රියාකාරී අධ්‍යක්ෂවරු සම්බන්ධ වෙලා තිබෙන්නේ, විදේශීය හෝ දේශීයව තිබෙන ක්‍රියාවලියෙන් එළියට ගිහිල්ලා ව්‍යාපෘතිවලට සම්බන්ධ වෙලා, ඒවා දේශපාලන ව්‍යාපෘති බවට පත් කිරීම සඳහායි. ඒ නිසා අද තිබෙන තත්ත්වය යටතේ, විශේෂයෙන්ම නවීන් දිසානායක ඇමතිතුමා අද දිනයේ පක්ෂයේත් විශේෂ වගකීමක් භාර ගත් කෙනෙක් හැටියට තේ මණ්ඩලයේ "ක්‍රියාකාරී අධ්‍යක්ෂ" කියන ධුරය -තනතුර- දේශපාලනීකරණය වූ තනතුරක් බවට පත්වෙනවා වෙනුවට, තේ මණ්ඩලයට සාධාරණයක් ඇති කරන්න, තේ මණ්ඩලයේ ප්‍රවර්ධනයට, තේ කර්මාන්තයේ උන්නතියට යොදා ගන්න කටයුතු කළ යුතුයි කියලා මා හිතනවා.

මොකද, අපේ රටේ දේශපාලනඥයන් ගැන වාගේම නිලධාරි තන්ත්‍රය පිළිබඳවත් දැන් රටේ ජනතාව තුළ තිබෙන්නේ ඉතාම අප්‍රසන්න හැඟීමක්. ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානියා දැව සංස්ථාවේ සභාපතිවරයාත් එක්ක එකතු වෙලා ලංකාවේ ප්‍රසිද්ධ හෝටලයක ගැරේජ් එකේදි අල්ලස් අරගෙන, ඒ සල්ලි ගණන් කරද්දී අත් අඩංගුවට පත් වුණු සිද්ධිය ඊයේ පෙරේදා මාධ්‍ය තුළින් අපි දැක්කා. ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානියායි, දැව සංස්ථාවේ සභාපතිවරයායි දැන් රිමාන්ඩ් එකේ ඉන්නේ. ඊළඟට, ඒ වෙනුවට දැන් දැව සංස්ථාවට අලුතින් පත් කළ සභාපතිවරයා ඇප පිට නිදහස් වුණා. එතුමාත් කිලිනොච්චියේ උසාවියෙන් තමයි ඇප ලබා ගත්තේ. ඒ කියන්නේ, දැව සංස්ථාවේ හිටපු සභාපති දැන් රිමාන්ඩ් එකේ. ඊට පසුව පත් කළ සභාපතිවරයා පරණ නඩුවකට උසාවියෙන් ඇප පිට නිදහස් වුණු කෙනෙක්. මේ නිසා දේශපාලනඥයන් පිළිබඳව; දේශපාලන තන්ත්‍රය පිළිබඳව වාගේම, නිලධාරීන් පිළිබඳවත් රටේ ජනතාව තුළ තිබෙන්නේ ඉතාම අපුලසහගත හැඟීමක්; "පත් කිරීම දෙනකොටම ගහන්න, වැඩේ කර ගන්න තමයි මේ දෙන්නේ" කියන හැඟීමක් එන්නේ. ඒක වළක්වන එක තමයි දැන් දේශපාලනඥයාගේත්, මේ පාර්ලිමේන්තුවේත්, ගරු කථානායකතුමාගේත්, අපේත් කාර්ය භාරය විය යුත්තේ. ඒ පිළිබඳව තිබෙන අප්‍රියජනක හැඟීම නැති කරන්න ඕනෑ. ඒක කරන්න පුළුවන්ද, බැරිද කියන එකයි අපි ඉදිරියේ තිබෙන අභියෝගය.

ඊළඟට, මම කියන්න යන කාරණය අපේ ගරු ඇමතිතුමාත් හොඳටම දන්නවා. අපේ තේ කර්මාන්තය ගැන කථා කළොත්, "ශ්‍රී ලංකා තේ" -"Ceylon Tea"- කියන නාමය ලෝකයම පිළිගත් එකක්. ගරු කථානායකතුමනි, ඔබතුමාත් තේ එකක් බොන වෙලාවේ මේ කාරණය කියන්න ලැබුණු එක හොඳයි.

"Ceylon Tea" කියන මෙම නාමය ප්‍රවර්ධනය කිරීමට තේ කිලෝ එකකින් රුපියල් 3.50 ගණනේ "Tea Promotion and Marketing Levy" කියලා බද්දක් අය කරගෙන, "තේ ප්‍රවර්ධන අරමුදල" යනුවෙන් අරමුදලක් හදලා තිබෙනවා. ඒක තේ මණ්ඩලය යටතේ තිබෙනවා. මම හිතන හැටියට 2010 ඉඳලා 2018 වර්ෂයේ මේ වෙනකොට එම අරමුදලේ රුපියල් මිලියන 8,000ක -බිලියන 8ක- මුදලක් තිබෙනවා. නිෂ්පාදනය කරන හැම තේ කිලෝ එකකින්ම රුපියල් 3.50ක් එම අරමුදලට ගන්නවා. දැන් මේ අරමුදලින් මොකද වෙන්නේ? ගරු ඇමතිතුමනි, අද ගෙනෙන සංශෝධනය අනුව ගත්තොත්, -ඔබතුමා යෝජනා කළ විධියට- මේ ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ කාර්ය භාරය වෙන්නේ මේ බිලියන අට, මුදල් හැටියට තේ කර්මාන්තයේ ප්‍රවර්ධනයට, ප්‍රචාරණයට යෙදවීමයි. එතකොට මේ බිලියන අටේ හිමිකරු පත් කිරීම තමයි අද මේ පාර්ලිමේන්තුවේ කරන්නේ. මේ අරමුදලට තව සල්ලි එකතු වෙයි. නිශ්චිත වශයෙන් ගත්තොත්, රුපියල් බිලියන 8ක -මිලියන 8,000ක- පමණ මුදලක් මෙම අරමුදලේ තිබෙනවා. හැබැයි, "Ceylon Tea" කියන නාමයට අද මොකද වෙලා තිබෙන්නේ? අද අපේ තේ ප්‍රවර්ධනයට මොනවාද එමඟින් කරලා තිබෙන්නේ? තේ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් මේ අරමුදල යෙදැවී තිබෙන්නේ කොහොමද? තේ නිෂ්පාදනයට, තේ කර්මාන්තයේ යෙදෙන මිනිසුන්ගේ අවශ්‍යතා සඳහා මේ මුදල් යොදාගෙන තිබෙනවාද? ඒ තුළින් එම මිනිසුන් නිෂ්පාදනය කරන තේ අළෙවියට යුරෝපයේ අලුතින් ආයතන කොපමණ හොයාගෙන තිබෙනවාද; පුද්ගලයෝ හොයාගෙන තිබෙනවාද; වෙළෙඳ පොළ හොයාගෙන තිබෙනවාද? අපේ වෙළෙඳ පොළ කොටස වර්ධනය වෙලා තිබෙනවාද, නැද්ද යන්න පිළිබඳවවත් මේ තුළින් සොයා බලනවාද? ශ්‍රී ලංකාව තේ පිළිබඳව ලබාගත් නාමය යටත් විජිත කාලයේ ඉඳලාම -සුද්දෝ මේවා මෙහාට ගෙනා කාලයේ ඉඳලාම- හැදුණු එකක්.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව ලෝකය පුරා හඳුනන්නේ එක්කෝ ක්‍රිකට් නිසා -ඒක සුද්දා දුන් දෙයක්.- එහෙම නැත්නම් තේ නිසා; ඒකත් සුද්දා දුන් දෙයක්. කමක් නැහැ. හැබැයි, එදා තිබුණු තැන ඉඳලා බලනකොට අද අපේ තේ කොතැනද තිබෙන්නේ? ගරු කථානායකතුමනි, ඔබතුමා කොහේ හෝ රටකට යනකොට අදටත් තේ පැකට් එකක් තෑග්ගක් විධියට ගෙනයනවා. තානාපතිවරයකුට හෝ වෙන කාට හෝ අපි තෑග්ගක් විධියට දෙන්නේ තේ තමයි. අපි අගය කරලා කියනවා, "මෙන්න අපේ 'Ceylon Tea', අපේ තමයි නාමය, අපට තමයි මේකේ ගෞරවය තිබෙන්නේ" කියලා. දහඩිය හෙළන, කඳුළු හෙළන වතුකරයේ වැඩ කරන මිනිසුන්ගේ ගුණය අපි ගෙනිහින් විකුණනවා. එම ගුණය අපි අපේ වටිනාකමක් හැටියට, රටේ වටිනාකමක් හැටියට කියනවා. හැබැයි, අපේ තේ කර්මාන්තයේ එම මට්ටමම දැන් තිබෙනවාද? ඒ අළෙවිය; ඒ වෙළෙඳ පොළ; ඒ හැකියාව තිබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කනක හේරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, "ගරු කනක හේරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, මාණ්පුමිකු කනක හේරත් අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and THE* HON. KANAKA HERATH *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් තේ කර්මාන්තයට අදාළම ප්‍රදේශයක ඉන්න නිසා ඔබතුමාට මේ කාරණා තේරුම් ගැනීමට පහසු වෙයි කියා මා හිතනවා. තේ අළෙවි ප්‍රවර්ධන අරමුදල, "Ceylon Tea" කියන නාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරලා තිබෙනවා කියා මා හිතන්නේ නැහැ. "Ceylon Tea" කියන නාමය දැන් කඩා වැටිලා තිබෙනවා. තානාපති කාර්යාල, විදේශ කටයුතු අමාත්‍යාංශය අපේ රටේ තේ නාමය ප්‍රවර්ධනය කරන්න පුළුවන් ආයතන එක්ක එකතුවෙලා හොඳ සම්බන්ධීකරණයක් හදලා -හොඳ ක්‍රියාවලියක් මෙහෙයවලා - රටට, තේ කර්මාන්තයට වාගේම තේ කර්මාන්තයේ යෙදිලා ඉන්න මිනිසුන්ට දැනෙන ප්‍රමාණයේ කටයුත්තක් තවම සිදු කරලා නැහැ කියන කාරණය මා හිතන්නේ ගරු ඇමතිතුමාත් පිළිගන්නවා ඇති. ඒකට ගැළපෙන තරමේ විෂයය දැනුමක් තිබෙන, ක්ෂේත්‍රය ගැන හැඟීමක් තිබෙන, ක්ෂේත්‍රය ගැන ආදරයක් තිබෙන, ක්ෂේත්‍රයේ තිබෙන ඇත්ත ප්‍රශ්නය හඳුනන කෙනෙකු පත් කරගෙන ඒ කටයුත්ත කරන්න පුළුවන්ද කියන කාරණය තමයි ඔබතුමා ඉස්සරහ තිබෙන අභියෝගය වන්නේ. නමුත් දැනට නම් එහෙම දෙයක් වෙලා නැහැ.

උදාහරණයක් හැටියට ඔබතුමන්ලා දැනට කරගෙන යන "තේ මංගල්‍යය" වාගේ එකක් ගනිමු. ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් "තේ මංගල්‍යය" කියලා එකක් කරනවා. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වියදම් කරනවා. සමහර වෙලාවට ඇමතිවරයෙකු ගියොත් ඒක promote කරන්න පුළුවන්. ඇත්තටම ඒක දේශපාලන මංගල්‍යයක්. නවින් දිසානායක ඇමතිතුමා මේ කටයුත්ත කරනවා කියලා නොවෙයි මා කියන්නේ. ඒ කටයුත්ත සිදු වන විධිය මා දන්නවා. තේ මංගල්‍යය දේශපාලන මංගල්‍යයක්. තේ මංගල්‍යයෙන් ප්‍රවර්ධනය වෙලා නැත්තේම තේ විතරයි. ඒ නිසා ඒක දේශපාලන මංගල්‍යයක් වනවා. එවැනි බොහෝ කටයුතු තිබෙනවා.

තේ අළෙවි ප්‍රවර්ධන අරමුදල යටතේ ණය දෙන බව මා දන්නවා. තේ කර්මාන්තයේ යෙදිලා සිටින ඇත්ත වශයෙන්ම ණය ලැබෙන්න ඕනෑ මිනිසුන්ටද එම ණය ලබා දෙන්නේ කියන ප්‍රශ්නය තිබෙනවා. ඔබතුමාගේ තේ ප්‍රවර්ධන අරමුදලින් විශාල වශයෙන් මුදල් තිබෙන, මුදල් ගැටලු නැති සමාගම්වලට ණය ලබා දෙනවා. ලැයිස්තු අරගෙන බැලුවොත් ඔබතුමාට පෙනෙයි, කොයි කොයි ප්‍රදේශවලටද ඒ ණය ලැබිලා තිබෙන්නේ; මොන වාගේ පුද්ගලයන් අතටද ඒ ණය ගිහිල්ලා තිබෙන්නේ කියලා. ඇත්ත වශයෙන්ම ණය ලැබෙන්න ඕනෑ අය -මිනිසුන්- ඉන්නවා. ඒ මිනිසුන් අතට එම ණය ලැබෙන විධියේ ක්‍රමවේදයක් අවශ්‍යයි. මේක බරපතළ ප්‍රශ්නයක්. තේ නැවත වගාව -replanting- පිළිබඳව හිතුවොත් එය කොච්චර දුරට මේ වනකොට පහත වැටිලා තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් ඔබතුමා දන්නවා. නැවත වගාව නැති නිසා අලුත් තේ පැළ ලබා ගන්න මිනිසුන්ට මොන තරම් අපහසුතාවක් ඇති වෙලා තිබෙනවාද? ඒකට තේ මණ්ඩලයේ තිබෙන දායකත්වය මොකක්ද? තේ මණ්ඩලය කර ඇති මැදිහත් වීම මොකක්ද? ගරු ඇමතිතුමනි, නැවත වගාව කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු වෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. මොකද, අපේ රටේ තේ නැවත වගාව ක්‍රියාවලියක් හැටියටම බිඳ වැටිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊළඟට ගරු සභාවේ අවධානයට ලක් කරන්නේ මෑත කාලයේ මතු වෙච්ච තේවල සීනි සම්බන්ධ ගැටලුවයි. එම ගැටලුව විසඳිලා නැහැ; එම ප්‍රශ්නය අවසාන වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් එය දන්නවා. ඒ ප්‍රශ්නය දෙපැත්තකට ඇදිලා ගිහිල්ලා, අද වන කොට ඒ සඳහා යාන්ත්‍රණයක් නැහැයි කියන හැඟීම නිසා සීනි යොදපු නැති මිනිසුන් පවා සමහර විට ඉදිරියේදී සීනි ජාවාරමට සම්බන්ධ වෙන්න පුළුවන්කම තිබෙනවා. මොකද, තේ මණ්ඩලයට ඒ සඳහා යාන්ත්‍රණයක් නැහැයි කියන හැඟීම බරපතළයි. ඒ ක්‍රියාවලිය වළක්වලා, යාන්ත්‍රණය ශක්තිමත් කරලා පවත්වාගෙන යෑම මම හිතන හැටියට අමාත්‍යාංශයේත්, තේ මණ්ඩලයේත් ලොකු වග කීමක්. අපේ තේ කර්මාන්තය දියුණු කරනවාද, නැද්ද කියන කාරණයේදී තේ කර්මාන්තය පැත්තෙන් ගත්තොත් තේ මණ්ඩලයට විශේෂ තැනක් තිබෙනවා; විශේෂ වැදගත්කමක් තිබෙනවා; විශේෂ වටිනාකමක් හා කාර්ය භාරයක් තිබෙනවා. ඒ කාර්ය භාරය හරියාකාරව සිද්ධ වනවාද කියන එක පිළිබඳව ඇත්තටම ගැටලුවක් තිබෙනවා. මෙන්න මේ කාරණා ටික විශේෂයෙන්ම තේ මණ්ඩලයේ පොදු ප්‍රශ්න හැටියට තිබෙනවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඊට අමතරව පවතින ගංවතුර තත්ත්වය නිසා ඇති වන ගැටලු. ගරු ඇමතිතුමනි, මෙයින් පසු තත්ත්වය ඔබතුමා හොඳටම දන්නවා. තේ ආශ්‍රිත කර්මාන්තයේ විශාල වශයෙන් නාය යෑම්, සෝදා පාළුවීම්, ඉඩම් හානිවීම් හා වගා පාළුවීම් ආදී ගැටලු ගොඩක් මතු වනවා. එය මේ මොහොතේ උත්තර දෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, හැම දාම ගංවතුරකදී, නාය යෑමකදී, අපේ ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා නියෝජනය කරන නාවලපිටිය, ගරු අමාත්‍යතුමා නියෝජනය කරන නුවරඑළිය ඇතුළු කඳුරට ප්‍රදේශ වාගේම ගාල්ල, මාතර, හම්බන්තොට කියන අපේ දකුණු පළාතෙත් වැඩියෙන්ම හානි වන ක්ෂේත්‍රය තමයි තේ කර්මාන්තය. වගා යටවීමෙනුත්, පාළුවීමෙනුත්, සෝදා පාළුවීමෙනුත් තේ කර්මාන්තයට හුඟක් හානි වනවා. හැබැයි, ඒ වගා හානි වුණු මිනිසුන්ට සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. සමහර අවස්ථාවල සාධාරණ වන්දියක් ලැබිලා නැහැ. ඔවුන් ප්‍රකෘති තත්ත්වයට පත් වීමේ බරපතළ ගැටලු හැම දාම ඉතුරු වනවා. ගරු ඇමතිතුමනි, එම නිසා ඔබතුමාගේ තේ ශක්ති අරමුදල මඟින් හෝ නැත්නම් වෙනත් මාර්ගයකින් හෝ අඩු තරමේ ඒ අයට සහන ලබා දෙන වැඩ පිළිවෙළක් යෝජනා කරනු ඇතැයි කියා අපි බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ තේ ප්‍රවර්ධනය සඳහා ඔබතුමාට හොඳ නිලධාරීන් ඉන්නවා. තේ අපනයන ක්ෂේත්‍රයේ කටයුතු කරන, යම් හැඟීමක් තිබෙන මිනිසුන් ඉන්නවා. තේ අපනයනකරුවන්ගේ සංගමය තිබෙනවා. තේ නිෂ්පාදකයින්ගේ සංගම් තිබෙනවා. බොහෝ අවස්ථාවල ඔබතුමා ඒ ආයතනත් එක්ක සුහදශීලීව ගනුදෙනු කරන බවත් මා දන්නවා. ඒ අයත් එක්ක අදහස් හුවමාරු කර ගන්න බවත් මා දන්නවා. අඩු තරමේ අද මේ ගෙනෙන සංශෝධනය මඟින් පත් කරනු ලබන "ක්‍රියාකාරී අධ්‍යක්ෂ" හරහා හෝ ඔබතුමාට ඒ අය සමීප කර ගන්න පුළුවන් යාන්ත්‍රණයක් හදා ගන්න පුළුවන් නම්, ඒ යාන්ත්‍රණයේ මෙහෙයවීමක් හදා ගන්න පුළුවන් නම්, මා හිතන හැටියට රජයේ බදු මුදල්වලින්, ජනතාවගේ මුදල්වලින් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට කරනු ලබන ගෙවීම්වලට සහ ලබා දෙන වරප්‍රසාදවලට යම් සාධාරණයක් ඉෂ්ට වෙයි. මේ තනතුර ඇති කිරීම යහපත් දෙයක්. ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන්, තේ කර්මාන්තය වෙනුවෙන් යහපතක් සිද්ධ කළාය කියන කාරණය මෙම පාර්ලිමේන්තුවට තව අවුරුද්දකින් හෝ අය වැය විවාදයකදී හෝ ඔබතුමාට කියන්න පුළුවන් නම්, මා හිතන හැටියට මේ තනතුර ඇති කරපු එක ප්‍රතිඵලදායක වෙයි.

පොදුවේ "ක්‍රියාකාරී අධ්‍යක්ෂ" කියන තනතුරට තිබෙන දේශපාලන නිර්වචනය, දේශපාලනීකරණය වූ චරිතයක්ය කියන එක, දේශපාලනීකරණය වුණු තනතුරක්ය කියන එක තේ කර්මාන්තය පැත්තෙන් යම් ප්‍රමාණයකට හෝ නිවැරදි කරන්න ඔබතුමාට පුළුවන්කම ලැබෙනවා නම්, එය යහපත් දෙයක් හැටියට, ශුභවාදී දෙයක් හැටියට අපට දකින්න පුළුවන්. ඒ දේ කරන්න කටයුතු කරන්නය කියා මා ඉල්ලනවා. විශේෂයෙන්ම ඒ පත් කරන ලද තනතුර සම්බන්ධයෙන් කථා කිරීමට එහා ගිහින් තේ කර්මාන්තයට තිබෙන තත්ත්වය ගැනයි මා කථා කළේ.

අවසාන වශයෙන්, මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. දැනට තේ ප්‍රවර්ධන අරමුදලේ යම් මුදල් ප්‍රමාණයක් තිබෙනවා. ඔබතුමාගේ කාලයේදීත්, ඔබතුමාගේ කාලයට කලිනුත්, මේ අරමුදල ඇති කරපු දවසේ සිට අද වන තුරු තේ ප්‍රවර්ධන අරමුදලෙන් මුදල් යොදවපු ආකාරය පිළිබඳව පුළුල් පරීක්ෂණයක් පවත්වා, පුළුවන් නම් ඉදිරි අවුරුද්දේදීත් හැමදෙනාගෙන්ම රුපියල් 3.50 ගණනේ අය කරනවා වෙනුවට, මේ අරමුදලේ රුපියල් මිලියන 8,000ක් පමණ තිබෙන නිසා, තේ කිලෝග්‍රෑම් එකකින් අය කරන බදු ප්‍රමාණය අඩු කරන්න පුළුවන් නම් එහි සාධාරණත්වයක් තිබෙනවාය කියලා මා හිතනවා. ඒ පිළිබඳවත් සලකා බලන්නය කියා ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තූතියි. ඊළඟට, ගරු නවින් දිසානායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.15]

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගේ කථාව අපට පුරුදු කථාවක්. එතුමා සාම්ප්‍රදායික ජනතා විමුක්ති පෙරමුණේ ලීලාවෙන් තමයි කථා කළේ. හැම දෙයක්ම කඩා වැටිලාය කිව්වා. කිසිම දෙයක් වෙන්නේ නැහැයි කිව්වා. හැම දාම ඍණාත්මක පැත්ත විතරයි එතුමාට පෙනෙන්නේ. "අද තේ මණ්ඩලයේ තත්ත්වය" කියන වචන එතුමා පාවිච්චි කළා. මා කියන්න කැමැතියි, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සියලුම නිලධාරීන් අද එකමුතුව වැඩ කරනවාය, ඔවුන් අතර කිසිම බෙදීමක් නැහැයි කියලා. එවකට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපතිනිය ඇමතිතුමාට කථා කළේවත් නැහැ. කෙළින්ම නියෝග ගත්තේ එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන්. එතකොට ඇමතිතුමා රූකඩයක්. අද එවැනි තත්ත්වයක් නැහැ.

විශේෂයෙන්ම අපේ හිටපු සභාපති ආචාර්ය රොහාන් පෙතියාගොඩ මැතිතුමා ඉතාමත් පවිත්‍රව, එතුමාගේ අත් දෙක කිලිටි කර ගන්නේ නැතුව, මෙම ආයතනයේ DG සමඟ, ඒ වාගේම තේ කොමසාරිස්තුමා සමඟ එකමුතුව කටයුතු කළා. විශේෂයෙන්ම 2015දී කිලෝග්‍රෑම් මිලියන 240 දක්වා පහළට බැස්ස තේ නිෂ්පාදනය සහ රුපියල් 350කට, රුපියල් 400කට අඩුව තිබුණු තේ කිලෝවක මිල, 2017 වනකොට තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 307 දක්වා වැඩි කරන්නත්, අද තේ කිලෝග්‍රෑම් එකකට ඉතාමත් ඉහළම මිලක් -රුපියල් 600ත්, රුපියල් 650ත් අතර මිලක්- ලබා ගන්නත් අපට පුළුවන් වුණා. මා කියන්නේ නැහැ, මේවා අපේ කාලයේ සිද්ධ වුණාය කියලා. නමුත් මේ සියලුදෙනාම එකමුතුවෙලා වැඩ කළේ මේ තත්ත්වය ඇති කරන්නයි. මේ තත්ත්වය ඇති වුණේ කොහොමද? විශාල බාධක මැද තමයි මේ තත්ත්වය ඇති වුණේ. එක පැත්තකින්, තේ පොහොර සහනාධාරයේ යම්කිසි කප්පාදුවක් වුණා. අනික් පැත්තෙන්, අපි ග්ලයිෆොසේට් වල් නාශකය නැති කළා. එවැනි තත්ත්වයක් තිබියදීත් මෙවැනි තත්ත්වයක් ඇති වන එක මා හිතන හැටියට ඉතාමත් ශුභදායකයි. අපට මේ තත්ත්වයෙන් මීට වඩා ඉහළට යන්න පුළුවන්.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය කියන්නේ 1972දී කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා ඇති කළ, තේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තිබෙන විශාලම මණ්ඩලයයි.

මෙහි විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. නමුත්, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා අඩුගානේ වචනයක්වත් කිව්වේ නැහැ, අපේම මුදල් ඇමති මේ මුදල් ගන්න යන කොට ඇමතිවරයකු හැටියට සටන් කරලා ඒ මුදල් ටික තබා ගත්තේ මම විතරයි කියන එක. නැත්නම් ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක් පමණ වන මේ මුදල් ටික- [බාධා කිරීමක්]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, මට බාධා කරන්න එපා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට සුළු වේලාවක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අරමුදලින් ඒ මුදල් ගන්න හදන කොට ඒකට විරුද්ධව ඔබතුමා වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ කථා කළේත් මම විතරයි.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
බොහොම ස්තුතියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා ඒ ගැනත් මතක් කරනවා නම් හොඳයි. අද මගේ කථාවේදී කියැවුණේ නැති වුණාට එදා ඒකට විරුද්ධව කථා කළේත් මමයි.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Thank you.

අනෙක් ආයතනවල -විශේෂයෙන් සංචාරක ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ, National Gem and Jewellery Authority එකේ, EPF එකේ- මුදල් ගන්න කොට මට කොන්දක් තිබුණා, ශක්තියක් තිබුණා, "මම මේ මුදල් දෙන්නේ නැහැ. මුදල් ගන්නවා නම් මම ඉල්ලා අස් වෙනවා" කියලා කියන්න. මම ඒක ඉතා පැහැදිලිව ප්‍රකාශ කළා.

තේ මණ්ඩලයේ සභාපති ලුසිල් විජයවර්ධන මැතිතුමා තේ ක්ෂේත්‍රයේ ඉන්න පුද්ගලයෙක්. එතුමා තේ ක්ෂේත්‍රය ගැන හොඳට දන්නවා. ඇමතිවරයකු වශයෙන් මම ඒ ආයතනවලට දක්ෂයින් පත් කරනවා. අනෙකුත් කටයුතුවලට මම ඇඟිලි ගහන්න යන්නේ නැහැ. මම ප්‍රතිපත්තිමය වශයෙන් තීරණ ගන්නවා. නමුත්, ඒ තීරණ ක්‍රියාත්මක කිරීම අපි ඒ මණ්ඩලවලට සහ සභාපතිවරුන්ට භාර කරනවා.

මේ වන විට තේ මණ්ඩලයේ අමුතුම තත්ත්වයක් ඇති වී තිබෙනවා. මම ඒක පිළිගන්නවා. DG පත් කරන කොටත්, Tea Commissioner පත් කරන කොටත් ඒ ආයතන ඇතුළෙන්මයි ඒ අය පත් වෙන්නේ. සාමාන්‍යයෙන් දේශපාලනඥයින් තමන්ගේ හිතවතුන් මේ තනතුරුවලට පත් කිරීමේ ප්‍රවණතාවක් තිබෙනවා. මම ඒක පිළිගන්නවා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, දේශපාලනය කරන කොට අපට එහෙම කරන්න සිද්ධ වෙනවා කියන එක. විශේෂයෙන් අප සමඟ දේශපාලන මතවාදයක ඉන්න අයව ආරක්ෂා කරන්න අපි උත්සාහ කරනවා. ඒක තමයි දේශපාලනය කියන්නේ. ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක, ඕනෑම දේශපාලන පක්ෂයක ඒක වෙනවා. ඉතාම දියුණු සමාජවල මෙන්ම පස්වැනි පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී රටවලත් ඒක වෙනවා. නමුත්, අපි මේ තනතුරුවලට සුදුස්සන් පත් කරන්න අවශ්‍යයි. නැත්නම් මේ ආයතන කඩා වැටෙනවා.

මා මේ ගරු සභාවට ඉතා වගකීමෙන් යුතුව කාරණයක් කියන්න කැමැතියි. අපි මේ පත් කරන Working Director මේ ක්ෂේත්‍රයට අදාළ, මේ ක්ෂේත්‍රයට ආදරය කරන, මේ ක්ෂේත්‍රයේ ප්‍රශ්න හඳුනා ගත් ප්‍රවීණයකු වන බව මම ඉතාමත් පැහැදිලිව කිව යුතුයි. එහෙම නොවුණොත් විශාල අපරාධයකුයි වෙන්නේ. මම ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ මේ පත්වීම් කරලා තිබෙනවා. අදාළ ක්ෂේත්‍රවලට පමණයි ඒ පත්වීම් කරන්නේ. දැන් Sri Lanka Tea Board එකේ කුඩා තේ වතු ක්ෂේත්‍රයට සම්බන්ධ කෙනකු ඉන්නවා; විශාල සමාගම්වල එක් කෙනකු ඉන්නවා; tea brokers ලාගෙන් එක් කෙනකු ඉන්නවා. ඒ විධියට මේවා ක්ෂේත්‍රගත කර තිබෙනවා, කවුද පත් කළ යුත්තේ කියලා.

මට පෙනෙන විධියට නම් Sri Lanka Tea Board එකේ තත්ත්වය - වැරැද්දක් තිබෙනවා නම් මම ඒක කියනවා,- හොඳ මට්ටමකයි තිබෙන්නේ. මොකද, එතැන සිටින සියලුදෙනාම එකමුතුව වැඩ කරනවා. සමහර තැන්වල අපි කියන දේවල් කරන්න දැඩි ලෙස අමාරුයි. මක් නිසාද, සමහර නිලධාරීන් දේශපාලනය කියන එකට කැමැති නැහැ. ඒ ගොල්ලන් කැමැතියි, ඒ ගොල්ලන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කරගෙන වැඩ කරන්න. නමුත්, එතැන තිබෙන ප්‍රශ්නය තමයි අපි හොඳ සිතින් වැඩ කරන කොට අපි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන සමහර හොඳ දේවල් ඉෂ්ට නොවීම. මක් නිසාද, මේ නිලධාරිවාදය තුළ ඒ ගොල්ලන් එක මතයක සිටිමින් වැඩ කරනවා.

මට පෙනෙන විධියට නම් තේ මණ්ඩලයේ ක්ෂේත්‍ර දෙකක් තිබෙනවා. පළමුවැනි ක්ෂේත්‍රය තමයි promotion එක. පොදුවේ කියනවා නම් අපගේ "Ceylon Tea" නාමයේ වෙළෙඳකරණය. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කියාපු විධියට අපගේ pure "Ceylon Tea" නාමය බාල්දු වෙලා නැහැ. ඒක අපි ඉතාම ඉහළ ලෙස ආරක්ෂා කරගෙන තිබෙනවා. අවුරුදු 150කට පස්සේත් අපේ තේවලට pure "Ceylon Tea" කියලා අපට කියන්න පුළුවන්. අනෙක් රටවල එහෙම කියන්න බැහැ. කෙන්යාවේ තේවලට pure "Kenyan Tea" කියලා කියන්න බැහැ. මොකද, CTC tea එක ඒ ගොල්ලන් හැම වෙලාවේම මිශ්‍ර කරනවා. අපේ තේ අපි මිශ්‍ර කරන්නේ නැහැ. අපට නොයෙකුත් බලපෑම් තිබෙනවා. නොයෙකුත් සංගම්වලින්, නොයෙකුත් පුද්ගලයන්

[ගරු නවින් දිසානායක මහතා]

කියනවා, මේක මිශ්‍රකරණය කළ යුතුයි කියලා. අපි රැඩිකල් ලෙස සිතනවා නම්, දේශපාලනඥයින් හැටියට හැම වෙලාවේම අලුත් දෙයක් කළ යුතුයි කියලා සිතනවා. නමුත්, අපි මේක ගැන තව පොඩ්ඩක් ගැඹුරින් කල්පනා කර බැලුවොත්, මේ මිශ්‍රකරණයෙන් සිදු වෙන්නේ මොකක්ද?

මිශ්‍රකරණයෙන් අපට ලැබෙන මිල රුපියලකින් හෝ අඩු වුණොත් එහි ඵල විපාකවලට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ කුඩා තේ වතු හිමියාට කියන එක මම පැහැදිලිව ප්‍රකාශ කරනවා. ප්‍රතිපත්තියක් හැටියට අපි මිශ්‍රකරණයට ඉඩ දෙන්නේ නැහැ. මොකද, ඇත්ත වශයෙන්ම ඒකෙන් යම් කිසි හානියක් වෙන්න පුළුවන්. එම නිසා බොහෝ අය කියනවා, "ඇමතිතුමා අලුතින් හිතන්න ඕනෑ, global market එක ගැන හිතන්න ඕනෑ, blendingවලට යන්න අවශ්‍යයි" කියලා. එතකොට මම ඒ ගොල්ලන්ට කියන්නේ, "blendingවලට ගියොත් අඩු ගණනේ රුපියලකින් හෝ මිල අඩු වෙන්නේ නැහැ කියලා මට පැහැදිලි guarantee එකක් දෙන්න; මට විශ්වාසයක් දෙන්න" කියලායි. නමුත් ඒ විධියේ guarantee එකක් අද වන තෙක් මට ලැබී නැහැ. මක් නිසාද, ඒක දෙන්න බැහැ. මොකද blendingවල තිබෙන මූලික රහස තමයි, අපි මිල අඩු කරන එක; cheap teas. අපට ඒ සඳහා ඉඩ දෙන්න බැහැ. මම දැන් චීනයේ ඉඳලා ආවේ. ඇත්ත වශයෙන්ම අපගේ තේවලට සෑම market එකකම ඉතාමත් ඉහළ ඉල්ලුමක් තිබෙනවා. අපි වැඩියෙන්ම නිෂ්පාදනය කරන්නේ තේ කිලෝ මිලියන 350යි. එය ලෝක නිෂ්පාදනයෙන් සියයට 7යි; සුළු ප්‍රමාණයක්; සියයට 10ක්වත් නැහැ. ජාත්‍යන්තර වෙළෙඳ පොළ ඉතාමත්ම ඉහළ මිලක් ලබා දීලා එම සියයට 7 ඉතාමත් ඕනෑකමින්, උනන්දුවෙන් ලබා ගන්නවා. මොකද, pure "Ceylon Tea" එන්නේ මිශ්‍ර නොකර, එකම රටකින්, එනම් single source එකකින්. අපි අපේ තේ කර්මාන්තය ආරක්ෂා කරන්න කටයුතු කරන්නේ එහෙමයි. අනාගතයේදී තේ ක්ෂේත්‍රයට ඇමෙරිකානු ඩොලර් මිලියන 100කට වඩා විශාල ආයෝජනයක් එනවා නම්, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව වෙනම කලාපයක් ඇති කරන්න මම කැමැතියි. එවැනි zone එකක් ඇති කරලා, ඒකට එන තේ ටික අපේ තේ සමඟ මිශ්‍ර කරලා ලංකාවේ වෙළෙඳ පොළ තුළට එන්නේ නැතිව, auction එකට යන්නේ නැතුව "packed in Sri Lanka" කියලා පිට රටට යවන්න පුළුවන්. ඒ තේ ටික auction එකේ වෙනම යන්න පුළුවන්. නමුත්, blend කරන තේ ටික වෙනම යවන්න පුළුවන්. ඒක අදහසක් පමණයි. මොකද, අපි අලුත් විධියට හිතන්නත් අවශ්‍යයි.

දෙවැනි කාරණය මෙයයි, අපගේ ගෝලීයකරණ marketing campaign එකට ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක් තිබෙනවා. එම ටෙන්ඩරය යම් කිසි සමාගමකට ලබා දීලා අවුරුදු 2ක් ගත වුණා. තව මාසයකින්, මාස දෙකකින් එම campaign එක පටන් ගන්න අපි ලැහැස්ති වෙලා ඉන්නවා. මම ඇමති හැටියට එම මුදල් ටික ආරක්ෂා කරගන්න කොන්දක් තිබුණු නිසා සහ ශක්තියක් තිබුණු නිසයි ඒක පටන් ගන්නේ. එම නිසා තේ ප්‍රවර්ධන කටයුතු සඳහා මට ඒ ඩොලර් මිලියන 50ම තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපගේ පරම්පරාව තුළ, මේ අවුරුදු 10, 15 තුළ, සම්ප්‍රදායික marketingවලින් ඔබ්බට ගිය social media තිබෙනවාය කියන එක විශේෂයෙන්ම අද දින ඔබතුමාට කිව යුතුයි. අද facebook තිබෙනවා. එහි සාමාජිකයෝ බිලියනයක් ඉන්නවා. ඔබතුමාත් ඉන්නවා, මමත් ඉන්නවා. ඒ වාගේම, අනෙකුත් ප්‍රවර්ධන මාර්ගත් තිබෙනවා. YouTube තිබෙනවා, Twitter තිබෙනවා. මීට අවුරුදු 10කට කලින් අපි ඒවා අහලවත් නැහැ. නමුත්, අද දින තරුණ පරම්පරාව phone එකේ ඉන්නේ. Handphone එක බලලා තමයි ඒ අය තීරණ ගන්නේ. එම නිසා සම්ප්‍රදායික ප්‍රචාරක ව්‍යාපාරයකට විශාල මුදලක් යනවා නම්, සමාජ ජාලා හරහා marketing කරන්න එයින් තුනෙන් එකක්වත් යන්නේ නැහැ. ඉතින් අපි බලාපොරොත්තු වෙනවා, මෙම තේ ප්‍රවර්ධන වැඩ කටයුතු විශේෂයෙන්ම ඉතාමත් නවීකරණය වූ social media හරහා මුළු ලෝකයටම ලබා දෙන්න. ඒක තමයි කළ යුත්තේ.

තෙවැනි කාරණය තමයි, තේ මණ්ඩලයේ තිබෙන රෙගුලාසි සම්පිණ්ඩනය කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඉතාමත් දැඩි රෙගුලාසි තේ මණ්ඩලය හරහා දියත් කරනවා. තේ කර්මාන්තය ආරක්ෂා කරන්න තමයි එසේ කරන්නේ. නානා විධ ක්ෂේත්‍රවල අය මෙම තේ කර්මාන්තය තුළ සිටිනවා. Brokersලා සිටිනවා, තේ කම්හල් හිමියෝ ඉන්නවා, කුඩා තේ වතු හිමියෝ ඉන්නවා, විශාල තේ සමාගම් තිබෙනවා, tradersලා සිටිනවා. වෙන්දේසියෙන් තේ ටික ලබාගෙන, ඒවායේ ගුණාත්මකභාවය වැඩි කරන්නේ තේ වෙළෙඳුන්; විශේෂයෙන්ම "ඩිල්මා" ආයතනය, Akbar Brothers වැනි අය. එවැනි ආයතන අද ලෝක වෙළෙඳ පොළ ආක්‍රමණය කරලා තිබෙනවා. මම ඉතාමත් සතුටින් කියනවා, මම චීනයට ගියාට පසුව දැක්කා, අඩු ගණනේ අපේ තේ සමාගම් හත-අටක් චීන වෙළෙඳ පොළ අල්ලන්න ලැහැස්ති වෙලා ඉන්න බව.

මම අමාත්‍යාවරයෙක් වශයෙන් ඉතාමත් සතුටු වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම චීනයේ කෘෂිකර්ම ඇමතිතුමා හමු වුණාම එතුමා මට ප්‍රකාශ කළා, "ඇමතිතුමා, අපි ලංකාවට ඉහළම ගෞරවයක් ලබා දෙනවා. ඔබතුමාගේ රටින් එන තේවලට අපි කිසිම බාධාවක් දාන්නේ නැහැ. අපි green tea නිෂ්පාදනය කරන රටක් හැටියට අපටත් පොඩි චකිතයක් තිබුණා ලංකාවේ තේ ඇවිල්ලා අපගේ තේවලට හානියක් කරයි කියලා. නමුත් අපට දැන් තේරෙනවා, මේ අලුත් පරම්පරාව -විශේෂයෙන්ම 40ට අඩු පරම්පරාව- කොළ තේත් බොනවා, කළු තේත් බොනවා." කියලා. ඒ වාගේ වෙනස්වීමක් අද චීනය තුළ ඇති වෙලා තිබෙනවා. එම නිසා මා හිතනවා අපට මැද පෙරදිග යම්කිසි market එකක් නැති වුණොත් ඒක අපට චීනයෙන් ගන්න පුළුවන් කියලා. ළඟදී අපට විශාල අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. අපේ තේවලට MRCP කියන මිශ්‍රණය යොදවලා, අහිතකර තත්ත්වයක් ඇති කරලා අපගේ තේ පිටරටට යෑම වළක්වන්න ජපානය ක්‍රියා කළා. ග්ලයිෆොසේට් කියන වල් නාශකය අපි අහිමි කළා. යම් කිසි හේතු නිසා අපි එම වල් නාශකය market එකෙන් නැති කළා. මම ඒ කාලයේ ඇමති වෙලා හිටියේ නැහැ. නමුත් මේ තීරණය නිසා අපට යම් කිසි පසුබෑමකට ලක් වෙන්න සිද්ධ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් පිළිගන්නවා, අපගේ ප්‍රදේශවල තේ වගාවේ වල් පාලනය කරන්න බැරි තත්ත්වයක් ඇති වුණු බව. ජපානය අපට කිව්වා, "ග්ලයිෆොසේට් පාවිච්චි කිරීමෙන් කිසිම අහිතකරයක් අපේ ජනතාවට වෙන්නේ නැහැ. අපි මේවා ගැන නිතරම සොයා බලනවා. නමුත්, වල් නාශකය වෙනුවට -ග්ලයිෆොසේට් වෙනුවට- ඔයගොල්ලන් පාවිච්චි කරන විකල්පය වන MRCP කියන එක නිසා යම් කිසි අහිතකර තත්ත්වයක් ජනතාවට ඇති වෙන්න පුළුවන්" කියලා. නැවතත් මම කැබිනට් එකට ගිහිල්ලා තර්ක කරලා, විශාල බාධක මැද අන්තිමට ජනාධිපතිතුමාගේ කැමැත්ත ලබා ගෙන තේ කර්මාන්තයට පමණක් ඒ ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීමට මට හැකියාව ලැබුණා. ළඟදීම ගැසට් එකෙන් මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා විශාල සමාගමවලට හා කුඩා තේ වතු හිමියන්ට ඒ අවශ්‍ය ප්‍රමාණය පමණක් ලබා දීමට යම් කිසි යන්ත්‍රණයක් යෙදවීමට අපි බලාපොරොත්තු වනවා. එක පැත්තකින් අපගේ තේවල තිබෙන පවිත්‍රතාව ආරක්ෂා කර ගන්න තේ මණ්ඩලය රෙගුලාසි ඉදිරිපත් කරලා තිබෙනවා. ළඟදී තේ

කම්හල් 53කට තේ මණ්ඩලයේ නිලධාරීන් හදිසියේ කඩා පැනලා ඒ තේවල යම් කිසි සීනි මිශ්‍රණයක් තිබුණා කියලා ඔප්පු කළා.

අපි ඒ තේ කම්හල් සමඟ ඉතාමත් කිට්ටුවෙන් වැඩ කරලා ඔවුන්ට අවවාද දීලා තේ පර්යේෂණ ආයතනය හරහා sugarවලට base level එකක්, ඒ කියන්නේ sugar මෙපමණ ප්‍රමාණයක් තිබිය යුතුයි, මෙපමණ ප්‍රමාණයක් තිබිය යුතු නැහැයි කියන තත්ත්වයට විද්‍යානුකූලව ඔප්පු කිරීමට අවශ්‍ය සියලුම කටයුතු දැන් කරනවා. එම නිසා යම් කිසි පිරිසක් අනාගතයේදී තේවලට සීනි මිශ්‍ර කරන්න බලාපොරොත්තු වනවා නම්, ඒක නොකර ඉඳියි කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කසළ තේ සම්බන්ධයෙනුත් මා කියන්න ඕනෑ. ISO Standard එක නැති ගම්පොල ප්‍රදේශයේ කසළ තේ කර්මාන්තය කරන කම්හල් 12කට අපි විශේෂයෙන්ම දැන් ඒ අවසරය ලබා දී තිබෙනවා. අපි දැන් ඒ ගොල්ලන්ගේ තේ පරීක්ෂා කරලා market එකට ගේන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා නම්, ඒ කියන්නේ ISO ප්‍රමුඛත්වය ලබා දෙන්න පුළුවන් මට්ටමක එම තේ තිබෙනවා නම්, අපි දැන් නිල වශයෙන් ඒ ගොල්ලන්ට licence දීලා ඒ ගොල්ලන්ගේ තේ අපගේ තේ වෙන්දේසියට ලබා දෙන්න අවසර ලබා දීලා තිබෙනවා. මේක ප්‍රතිපත්තිමය වශයෙන් අපි ගත් හොඳ තීරණයක්. මක් නිසාද යත්, අපි දැන් මේ කටයුතු legalize කරනවා. ඒ අනුව Illegal ඒවා legalize කරන්න අපි බලාපොරොත්තු වනවා. අපි ඒ ක්‍රියාදාමය ඉදිරියටත් ගෙන යනවා.

තේ සම්බන්ධයෙන් නැවත වගාවත් ඉතාමත් වැදගත්. අපි සාමාන්‍යයෙන් හිතනවා, අපගේ නැවත වගාව අවුරුද්දකට සියයට 2ක් විය යුතුයි කියලා. සියයට 2ක් කියන්නේ අවුරුදු 5කින් සියයට 10ක්. නමුත්, එහෙම වන්නේ නැහැ. ඒක කියන්නත් කනගාටුයි. සියයට 1ක් වැනි සුළු ප්‍රමාණයක් තමයි තේ සම්බන්ධයෙන් නැවත වගාවක් වන්නේ. එම නිසා අපි හිතනවා, මෙය වැඩි කළ යුතුයි කියලා. දැනට අපි IFAD එක හරහා ඩොලර් මිලියන 65ක ව්‍යාපෘතියක් මේ සම්බන්ධයෙන් දියත් කරලා තිබෙනවා. ලබන අවුරුදු 4 ඇතුළත මෙම නැවත වගා කිරීම මීට වඩා ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්න අපි බලාපොරොත්තු වනවා.

ඊළඟට, "නැවුම් තේ මංගල්‍යය" ගැන කථා කළා. "නැවුම් තේ මංගල්‍යය" අපේ අලුත් අදහසක්. ගිය අවුරුද්දේ අපි ඒක පටන් ගත්තේ මාතරින්. මේ අවුරුද්දේත් අපි ඒ උත්සවය පැවැත්වූයේ මාතරයි. මේක කරන්නේ දේශපාලනයට සම්බන්ධ පුද්ගලයින් promote කරන්න නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ අදහස ආවේ කුඩා තේ වතු හිමියන්ගෙන්. ඔවුන්ම අපට ඇවිල්ලා කිව්වා, අපි නිෂ්පාදනය කරන නව තේ වලට නව ජවයක් ලබා දීමට මෙවැනි උත්සවයක් පවත්වන්න කියලා. මේ උත්සවයට රුපියල් මිලියන 20ක් පමණ වැය වනවා. ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් ඒ සඳහා රුපියල් මිලියන 5ක් පමණ ලබා දෙනවා. අනෙක් රුපියල් මිලියන 15ම ලබා දෙන්නේ කුඩා තේ වතු හිමියන් සහ කම්හල් හිමියන්ය කියන එකත් මා පැහැදිලිව කියන්න අවශ්‍යයි.

කුඩා තේ වතු හිමියන්ට සිදුවන අලාභ හානි වෙනුවෙන් වැඩියෙන්ම වන්දි ලබා දීලා තිබෙන්නේත් අපගේ රජයයි. ඒ අනුව, අපි රුපියල් මිලියන 400ක් ගිය වසරේ ඔවුන්ට ලබා දුන්නා. නාය යෑම්වලට රුපියල් මිලියන 200ක් ලබා දීලා තිබෙනවා. අලුතින් ඉඩම් පුනරුත්ථාපනය කිරීමට තවත් රුපියල් මිලියන 150ක් ලබා දීලා තිබෙනවා. කුඩා තේ වතු හිමියන්ගේ පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 1,500ක සහනාධාර මුදලක් අපි කෙළින්ම කුඩා තේ වතු හිමියන්ගේ ගිණුම්වලට ලබා දුන්නා. දැන් පොහොර මිටිය රුපියල් 1,500කට ලබා දීමට අපි කටයුතු කරගෙන යනවා. මීල ඉතාමත් හොඳ තත්ත්වයක තිබෙන නිසා අද කුඩා තේ වතු හිමියා පමණක් නොවෙයි, විශාල තේ වතු හිමියාත්, තේවලින් ලැබෙන ලාභයෙන් මේ අවුරුදු දෙක තුනට ලැබුණු අලාභය පියවීමට දැන් කටයුතු කරනවා. මම නිතරම ඒ සමාගම් සමඟ සාකච්ඡා කරලා ඔවුන්ට පැහැදිලිව ප්‍රකාශ කරන්නේ ඔවුන්ගේ asset එක, ඔවුන්ට තිබෙන ඒ ඉඩම් ටික හරියට ආරක්ෂා කරන්න කියලායි. මොකද, ඒ ඉඩම් ටික ජනතාවට අයිති ඉඩම්. ජනතාවට අයිති ඉඩම් අපි ඔවුන්ට lease කරලා තිබෙන්නේ. පසු ගිය කාලයේ හිටපු අනෙකුත් ඇමතිවරුන් මේ ගැන වැඩිය බැලුවේ නැහැ. හොඳ RPCs 5ක්, 6ක් තිබෙන බව මම දන්නවා. මධ්‍යම පන්තියේ RPCs 7ක්, 8ක් තිබෙනවා. තමන්ගේ යුතුකම් ටික ඉෂ්ට කරන්නේ නැති තවත් විශාල සමාගම් 4ක්, 5ක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා මට දැන් කැබිනට් අනුමැතිය ලැබුණා. මෙම සමාගම් ටික පාලනය කරන්න නොවෙයි, නමුත් monitor කරන්න වෙනම පනතක් හදලා, ඒ පනත හරහා මම බලාපොරොත්තු වෙන්නේ අඩුම තත්ත්වයන් - minimum standards - පාලනය කිරීමට නීතියෙන් monitoring system එකක් දැමීමටයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපගේ තේ මණ්ඩලය ඉතාමත් ශක්තිමත් ආයතනයක්. මේ තේ මණ්ඩලයේ ඉන්න නිලධාරීන් හරහා මීට වඩා හොඳ ප්‍රමිතියෙන් යුතු තේ අපට නිෂ්පාදනය කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. අද මේ සාකච්ඡා වන පනතේ සංශෝධනය අනුව ක්‍රියාශීලී අධ්‍යක්ෂවරයෙක් පත් කිරීමෙන් අපට තවත් ශක්තිය වැඩි වෙන බව පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා පත් කිරීමේදී ඔහු ඉතාමත් දක්ෂයෙක්, ප්‍රවීණයෙක්, තේ ක්ෂේත්‍රයට ආදරය කරන පුද්ගලයෙක් විය යුතු බව මා වගකීමෙන් ප්‍රකාශ කරමින්, තමුන්නාන්සේලා මට ලබා දෙන සහයෝගයට මාගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

ඊළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.36]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ මේ ක්ෂේත්‍රය පිළිබඳ අදහස් කීපයක් ප්‍රකාශ කරමින් ඒවා ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්න මා බලාපොරොත්තු වෙනවා.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මේ රටේ තේ කර්මාන්තය කියන්නේ මේ රටට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ගෙන දෙන, ඒ වාගේම මේ රටේ භූමියෙන් විශාල ප්‍රමාණයක වගා කරන, මේ රටේ ශ්‍රමිකයන් විශාල පිරිසක් සිටින ක්ෂේත්‍රයක් බව ඔබතුමා දන්නවා. අපි ජීවත් වෙන මධ්‍යම පළාත, අපි ජීවත් වෙන මහනුවර දිස්ත්‍රික්කය, තේ ක්ෂේත්‍රයේ නියැලෙන වැඩි පිරිසක් ජීවත් වෙන ප්‍රදේශයක් බව ඔබතුමා දන්නවා. ඒ වාගේම මගේ පියාත්, මාත් කුඩා තේ වතු හිමියන්. ඒ නිසා මම මේ ක්ෂේත්‍රය පිළිබඳ ලොකු උනන්දුවක් දක්වනවා. ඒ නිසා මේ කාරණා ටික ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ගරු අමාත්‍යතුමනි.

මේ රට පාලනය කරපු කිසිම රජයකට -අපේ රජයත් ඇතුළුව- මේ ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යෑමට වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ කියලායි මම විශ්වාස කරන්නේ. මම ඒ ගැන ඔබතුමාට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. ඒකයි මම කිව්වේ අපේ ආණ්ඩුවද ඇතුළුව කියලා. තේ ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු සංඛ්‍යා ලේඛනාත්මකව මම ඉදිරිපත් කරන්නම්. ගරු අමාත්‍යතුමනි, 2017 වර්ෂයේ මහ බැංකු වාර්තාව අනුව 2005 වර්ෂය වන විට මේ රටේ හෙක්ටෙයාර 222,000ක තේ වගා කරලා තිබෙනවා. 2016 වර්ෂය වන විට ඒක හෙක්ටෙයාර 203,000ට අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ මේ රටේ තේ කර්මාන්තය අඩුවෙමින් යනවා කියන එක. නමුත් වැඩි වීමක් නේ විය යුත්තේ, ගරු ඇමතිතුමනි. හැබැයි, අඩු වෙලා තිබෙනවා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ඉඩම් ප්‍රමාණය අඩු වුණාට නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ඊළඟට එතැනට එනවා.

ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ගත්තොත්, 2004 වර්ෂයේ තේ කිලෝග්‍රෑම් මිලියන 309.4ක් අපනයනය කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, 2017 වර්ෂයේ ඒ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 307යි. එතැනත් අඩුවක් තිබෙනවා. 2016 වර්ෂයේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 292.6යි. ඇමතිතුමනි, 2005 වර්ෂයේ තේ නිෂ්පාදනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම, 1.2යි. 2007 වර්ෂය වන විට ඒ ප්‍රමාණය 0.7යි. මේක, ඔබතුමා මේ අමාත්‍යාංශය භාර ගෙන මේ අවුරුදු තුනට සිදු වුණු දෙයක් නොවෙයි. මම කියන්නේ මේ ක්ෂේත්‍රයට සිදු වෙලා තිබෙන දේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට තේ මණ්ඩලය සහ වතු ටික විතරක් දීලා හරියන්නේ නැහැ. මම විශ්වාස කරනවා සේවකයාත් ඔබතුමා යටතට එන්න ඕනෑ කියලා. මේ ක්ෂේත්‍රය පවත්වා ගෙන යන සේවකයා තෘප්තිමත් නැත්නම් ඔබතුමාට කවදාවත් මේ කර්මාන්තය පවත්වා ගෙන යන්න බැහැ. අපි ඇහලුම් කර්මාන්තය මෙපමණ හොඳට පවත්වා ගෙන යන්නේ, ඇහලුම් කර්මාන්තයේ සේවකයන්ගේ ප්‍රශ්න දිහා බලලා, ඒ අයගේ අඩු පාඩුකම් සපුරන නිසායි. ඒ නිසා තමයි ඒ අය සතුටින් ඉන්නේ. ඒ වාගේම, මේ රටේ ඕනෑම ආයතනයක් ගත්තොත්, සේවකයා තෘප්තිමත් නම්, සේවකයා සතුටු නම් විතරයි ඒ ආයතනයට ඉදිරියට යන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, නමුත් අද වතු සේවකයා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් ඉවත් කරලා, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන කියලා වෙනම අමාත්‍යාංශයක් හදලා ඒක යටතට දීලා තිබෙනවා. මේක, දේශපාලන වශයෙන් රජය විසින් ගත්ත වැරදි තීන්දුවක් හැටියටයි මා නම් දකින්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා අද වතුවල වැඩ කරන සේවකයන් ඉන්නේ දැඩි කලකිරීමකින් බව. ඔබතුමා දන්නවා මේ ක්ෂේත්‍රයේ හොඳ වතු තිබෙන බව. රාජ්‍ය වතුවලින් හොඳම වතු ටික එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ පෞද්ගලික අංශයට දීලා, අපේ කාලයේත් ඒ කාලය දිර්ඝ කරලා, තවමත් පෞද්ගලික අංශය විසින් තමයි ඒ වතු නඩත්තු කරගෙන යන්නේ. මම ඔබතුමාට සඳහන් කළ කාරණයක් සම්බන්ධයෙන් ඔබතුමා මට අද උදේත් කිව්වා. ඔබතුමා ඒ වතු නියාමන වැඩසටහනක් ක්‍රියාත්මක කරනවාය කිව්වා. ඒක ඉතාම හොඳයි. ගරු ඇමතිතුමනි, හොඳම වතු ටික පෞද්ගලික අංශයට දුන්නා. දැන් ඒ වතු ටික නරකම වතු ටික බවට පත්වෙමින් යනවා. නුවරඑළිය පාරේ යන විට ඔබතුමා ඒ වතු දිහා බලන්න. දැන් ඒ වතු කැලෑ වෙලා. ඉස්සර ජනවසමට සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට තමයි මේ වතු ශුද්ධ කරන්නේ නැහැ, පොහොර දාන්නේ නැහැයි කියන චෝදනාව තිබුණේ. දැන් පෞද්ගලික වතු සමාගම් VP විතරයි නඩත්තු කරන්නේ. ගරු ඇමතිතුමනි, දැන් China seedlings නඩත්තු කරන්නේ නැහැ. ඒ අය දැන් ලාභ ලබන දේ විතරයි කරන්නේ. ඒ වාගේම දැන් තේ නැවත වගා කරනවා කියලා තේ වතුවල තිබෙන වටිනා ගස් කපනවා. එවැනි ගස් විශාල ප්‍රමාණයක් කපනවා. නමුත් නැවත ගස් වගා කරන්නට කටයුතු කරන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඒ වාගේම තේ කර්මාන්තශාලා වැහෙනවා. ඒවා නඩත්තු කරන්න කටයුතු කරන්නේ නැහැ.

ගරු ඇමතිතුමා, ඔබතුමා දන්නවා තේ මණ්ඩලයට තිබෙන වගකීම ගැන. 1975 අංක 14 දරන පනත අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරමාර්ථ වනුයේ, "ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සංවර්ධනය කිරීමත්, ශ්‍රී ලංකා තේ ලොව පුරා ප්‍රවර්ධනය කිරීමත්, තේ කර්මාන්තයේ කාර්ය කටයුතු, එනම් නිෂ්පාදනය, අලුත් බිම් තේ වගා කිරීම සහ නැවත වගා කිරීම, පැරණි තේ වතු පුනරුත්ථාපනය කිරීම, තේ කම්හල් ආරම්භ කිරීම"යි. ඒ තමයි, 1975 අංක 14 දරන පනතින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ලබා දීලා තිබෙන බලතල. ගරු ඇමතිතුමනි, නමුත් මේ වගකීම ඉෂ්ට වෙන්නේ නැහැ. ඒකයි මගේ ප්‍රශ්නය. ඔබතුමා හොඳ වැඩක් කරන නිසා මම ඉතාම සතුටු වෙනවා. මේ පෞද්ගලික වතු සමාගම් නියාමනය කිරීමේ වැඩසටහන ඔබතුමාගේ යටතට අරගෙන ඒ වතු සමාගම් නියාමනය කිරීමට කටයුතු කරන්න ගරු ඇමතිතුමනි. ඔබතුමා දන්නවා තුට්ටු දෙකට මේ වතු දීලා තිබෙන්නේ කියලා. මේවායින් අයකර ගන්නා බද්ද වැඩි කරන්න. මේ සමාගම් ඔබතුමන්ලාට පෙන්වන්නේ ඒ වතු පාඩු ලබනවා කියලායි. හැබැයි ගරු ඇමතිතුමනි, ඒ අය management fees කියලා කෝටි ගණන් ගන්නවා. ඔබතුමා ඒක දන්නවා. ඒ සමාගම් බිලියන ගණන් ලාභ ලබනවා. එදා ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ දීපු සමාගම් දැන් 10 දෙනෙකු අතට පමණ ගිහින් තිබෙනවා. ඒ අතරමැදියෝ ලාභ ලබලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, එම නිසා මම ඔබතුමාගෙන් පළමුවෙන්ම කරන ඉල්ලීම තමයි, මේ පෞද්ගලික සමාගම් නියාමනය සඳහා ඔබතුමා කඩිනම් අධීක්ෂණ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නය කියන එක.

ගරු ඇමතිතුමනි, ඊළඟට රජයේ වතු තිබෙනවා. රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, හලාවත වැවිලි සමාගම, පුත්තලම වැවිලි සමාගම සතු වතු තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සමාගම්වලට අයත් වතු නඩත්තු කරන්න පසුගිය කිසිම රජයක් පැහැදිලි වැඩ පිළිවෙළක් හැදුවේ නැහැ. ඒ සේවකයන්ගේ EPF, ETF ගෙවලා නැහැයි කියන එක ඔබතුමා දන්නවා. ගරු ඇමතිතුමනි, පසුගිය ආණ්ඩුවේ අවසාන අවුරුද්දේ - 2014 අග- මම හිටපු ආණ්ඩුවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට කථා කරලා ඒ සේවකයන්ගේ EPF, ETF ගෙවන්න භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන හයසිය ගණනක් අමාත්‍යාංශයට ගෙනත් දුන්නා. ගරු ඇමතිතුමනි, සමහර අයට අද වන තෙක් ඒ මුදල් ගෙවලා නැහැ. ඒ සල්ලි තිබෙනවා. නමුත් ඒවා

වෙනත් දේවලට පාවිච්චි කරනවා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. අපි කම්කරුවන්ගේ සේවක අර්ථ සාධක අරමුදල් ගෙවන්න මුදල් ලබා දුන්නා. භාණ්ඩාගාරයේ හිටපු ලේකම් පී.බී. ජයසුන්දර මැතිතුමාට මම අදත් ඒ ගැන ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මාත් ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාත් ගිහිල්ලා කථා කරපු ගමන්ම මහින්ද රාජපක්ෂ මහත්මයා කිව්වා, "ඉස්සරවෙලා රාජ්‍ය වැවිලි සංස්ථාවට ගෙවන්න, ඊළඟට ජනවසමට ගෙවමු" කියලා. එහෙම ගෙවන්න කියලා රුපියල් මිලියන 500ක්, 600ක් එව්වා. නමුත් ඒ සේවකයන්ට තවමත් ඔවුන්ගේ අර්ථසාධක අරමුදල ලැබිලා නැහැ, ගරු ඇමතිතුමනි. අද වනවිට ඒ සමහර සේවකයෝ මිය ගිහිල්ලා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ මිනිසුන්ගේ අර්ථ සාධක අරමුදල් අරගෙන දෙන්න කටයුතු කරන්න. අපි රාජ්‍ය වැවිලි සංස්ථාවට සල්ලි ගත්තා වාගේ ඔබතුමා භාණ්ඩාගාරයත් එක්ක කථා කරලා සල්ලි ලබාගෙන ජනවසමේ සේවකයන්ගේ සල්ලි ටිකත් ගෙවන්න වැඩ පිළිවෙළක් හදන්න ගරු ඇමතිතුමනි.

ඔබතුමාට හොඳ දැක්මක් තිබෙන බව අපි දැක්කා. අනාගතයේ එක්සත් ජාතික පක්ෂයේ නැඟී එන නායකයකු හැටියට අපි ඔබතුමා දකිනවා. අනෙක් කට්ටිය නඟින්න උත්සාහ කළාට නඟින්න බැහැ. ඒ නිසා ඔබතුමා නැඟී එන නායකයකු හැටියට අපි දකිනවා. මම ඔබතුමාගේ පියාට බොහොම ගරු කරනවා. ගරු ඇමතිතුමනි, මම දේශපාලනය පටන් අරගෙන, 1993 පළාත් සභාවට ගිය අවස්ථාවේ මගේ පළමුවැනි කථාව ලියලා දුන්නේ ඔබතුමාගේ තාත්තා. එතකොට අපි විපක්ෂයේ. පළමුවැනි තේ ගහ හැදුණේ කොහේද කියලා කියලා දුන්නේ ඔබතුමාගේ තාත්තා. ඒ නිසා මම ගාමිණී දිසානායක මහත්මයාට බොහොම ගරු කරනවා. එතුමා ඒ කාලයේ දෝෂාභියෝගය ගෙනැල්ලා බොහොම රැඩිකල් වැඩ කරපු නායකයෙක්. ඔබතුමා එතුමාගේ පුතෙක්. ඒ නිසා මම හිතනවා තාත්තා වාගේම, ඒ සිතුම් පැතුම් ඇති වැඩ පිළිවෙළක් ඔබතුමාටත් ඇති කියලා. හැබැයි, ඇමතිතුමනි, ඔබතුමා මොන දේ කළත්, ඔබතුමාගේ මොන සංකල්පය තිබුණත් මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන්නේ ඔබතුමන්ලා නොවෙයි. මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන්නේ පාස්කරලිංගම්ලා, චරිත රත්වත්තේ මහත්තයලායි. පොළොවේ පය ගහලා නැති, ගමේ කඩේකින් ප්ලේන්ටියක් බීලා නැති, කිතුල් හකුරු එක්ක කහට එකක් බීලා නැති මේ මිනිස්සු තමයි මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන්නේ. නමුත් තමුන්නාන්සේ තේ මණ්ඩලයේ අරමුදල රැක ගත්ත එක ගැන අපි තමුන්නාන්සේට ගරු කරනවා. හැබැයි, කොයි වෙලාවක හරි ඒකටත් වැඩේ දෙනවා. ඔබතුමාගේ ඒ සටනේ අපිත් ඉන්නවා. හැබැයි, වැඩියෙන් සටන් කරන්න ගියොත් අනාගතයේ එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ඔබතුමාට ලැබෙන්නේත් නැහැ. ඔබතුමාට වැවිලි කර්මාන්ත ඇමතිකමක් නැති වෙනවා. හැබැයි, අපි ඉන්නේ ඔබතුමා එක්කයි. පැහැදිලිවම ඔබතුමාගේ සටන හොඳයි.

ගරු ඇමතිතුමනි, අපේ කට්ටිය ආණ්ඩුවෙන් ගිය ගමන් සමෘද්ධි අමාත්‍යාංශය ගත්තා, මලික් සමරවික්‍රම මහත්මයා යටතට. මලික් සමරවික්‍රම මහත්තයා දන්නවාද සමෘද්ධිය ගැන? ඇමතිතුමනි, මලික් සමරවික්‍රම මහත්මයා සමෘද්ධි අමාත්‍යාංශයේ වැඩ භාර ගන්න ගියාම, එතුමාට එහා පැත්තේ හිටියාලු රන්ජන් රාමනායක මහත්තයා. "ඔයාද නියෝජ්‍ය ඇමති?" කියලා ඇහුවාලු. මම නොවෙයි කියන්නේ, රන්ජන් රාමනායක.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
It was a temporary arrangement.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
It may be a temporary arrangement, Hon. Minister. But, he does not know who his Deputy Minister is. මොනවාද ඇමතිතුමා මේ කථා කරන්නේ? ඔබතුමා අමාත්‍යාංශයේ ඉඳගෙන, "ඔයාද මගේ නියෝජ්‍ය ඇමති?" කියලා අහනවා නම් මොකක්ද ඒකේ තේරුම? මම නොවෙයි කියන්නේ. රන්ජන් රාමනායක මහත්මයා ඒක එතුමාගේ Facebook පිටුවේ දාලා තිබෙනවා. එතුමා රැස්වීමකත් ඒ ගැන කියා තිබෙනවා. දැන් අරගෙන බලන්න. "රන්ජන් රාමනායක" කියලා ගහපුවාම එතුමාගේ Facebook පිටුවේ ඔය විස්තරය එනවා. මගේ නඩුවක් ගැනත් එහි තිබෙනවා; බලන්න.

ගරු ඇමතිතුමනි, මම කියන්නේ මේකයි. සමෘද්ධිය අරගෙන මොකක්ද කරන්න බැලුවේ? සමෘද්ධි අරමුදල් ටිකට ගහන්න හැදුවා. යාන්තම් මහ බැංකුව ඒකට මැදිහත් වෙලා, දැන් ඒක නියාමනය කරනවා කියලා, ඒක නවත්වලා තිබෙනවා. මේ රටේ කොහේ හරි සල්ලි තිබෙනවා නම්, ඒකට ගහනවා භාණ්ඩාගාරයෙන්. මොකද, මේ වාගේ තීන්දු ගන්නේ සිංගප්පූරුවේ ඉඳලා නේ. අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා තමයි තීන්දු ගන්නේ.

ගරු ඇමතිතුමනි, මේ රජයේ වතු ටිකත් නඩත්තු කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් හදන්න කියලා මා ඔබතුමාට කියනවා. ගරු නවීන් දිසානායක ඇමතිතුමනි, අපේ කාලයේ මේ සම්බන්ධයෙන් යෝජනාවක් තිබුණා. වතුවල පරණ ගස් තිබෙනවා. මේවා නිකම් කඩාගෙන වැටෙනවා. ආණ්ඩුවට සල්ලි නැත්නම් ඒ ගස් ටික විකුණලා ඒ එන මුදල්වලින් සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල් ගෙවන්න වැඩ පිළිවෙළක් හදන්න කියලා යෝජනාවක් තිබුණා. අපි දැව සංස්ථාවට කථා කරලා, ඒ ගස් දැව සංස්ථාවට විකුණන වැඩ පිළිවෙළක් ගැනත් කථා කළා, ගරු ඇමතිතුමනි. නැත්නම් මේ ගස් කඩාගෙන වැටෙනවා, මුදලාලිලා ඒවා තුට්ටු දෙකට ගන්නවා. ගරු ඇමතිතුමනි, මොනවා හරි කරලා මේ පෞද්ගලික වතු සමාගම් නියාමනය කරන අතරම රාජ්‍ය වතු සමාගම් නියාමනය කිරීමටත්, ඒවා ලාභ ලබන තත්ත්වයට පත් කරන්නත් ඔබතුමා කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට, කුඩා තේ වතු ගැනත් යමක් කියන්නට ඕනෑ. මේ රටේ කුඩා තේ වතු හිමියන් 395,414ක් සිටින බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. මා ඔබතුමාව අපහසුතාවට පත් කරන්නේ නැහැ. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ගැන නම් මගේ පැහැදීමක් නැහැ. ඒ ආයතනය ගැන ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්න කියන එක විතරයි මා කියන්නේ. මම ඒ ගැන දීර්ඝව කථා කරන්නේ නැහැ. ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ නැඟී එන නායකයකු නිසා, ඔබතුමා එලෙසම ඉදිරියට එන්න ඕනෑ කියලා මා හිතන නිසා මම ඒ ගැන වැඩිදුරටත් කියන්න යන්නේ නැහැ. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ගැන මගේ ළඟ වෙනම ලිපි ගොනුවක් තිබෙනවා. මම එය පෞද්ගලිකව ඔබතුමාට දෙන්නම්. ගරු ඇමතිතුමනි, ඔබතුමා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු ඇමතිතුමනි, මේ වතු ක්ෂේත්‍රයේ කටයුතු කරන සේවකයන්ගේ ප්‍රශ්න පිළිබඳවත් මැදිහත් වෙන්න කියලා මා ඔබතුමාගෙන් නැවතත් ඉල්ලීමක් කරනවා. ඔබතුමාත් දන්නවා ඇති, බලයට පත් වන සියලු ආණ්ඩු මැතිවරණයට පෙර වතු ප්‍රදේශවලට ගිහිල්ලා කියන්නේ මොනවාද කියලා. වතු සේවකයන්ට නිවාස ලබා දෙනවා, නිවසක් තනා ගැනීමට පර්චස් 7ක ඉඩම් ඔප්පුවක් ලබා දෙනවා, වැනි දේවල් වේදිකාවල කියලා තමයි ඡන්ද ලබා ගන්නේ. මම පාර්ලිමේන්තුවේ දී දිගම්බරම්

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහලා තිබෙනවා, "මේ වෙන කොට වතුකරයේ කම්කරුවන්ට නිවාස කීයක් හදලා තිබෙනවාද? නුවරඑළියේ කීයක් හදලා තිබෙනවාද? ඒ වාගේම මෙහේ නිවාස කීයක් හදලා තිබෙනවාද?" කියලා. මේ ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැහැ. මොකද, උත්තර දෙන්න බැරි නිසා. උත්තරය දෙන්න හැම දාම කල් ගන්නවා. ඇමතිතුමාත් අසරණයි, උත්තර දෙන්න බැහැ. මොකද, එහේ හදපු ගෙයක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මේ කාරණය දන්නවා ඇති. ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් දන්නවා ඇති, නාවලපිටිය ප්‍රදේශයේ මොන තරම් වතු ජනතාවක් ඉන්නවාද කියලා. තවම ගෙවල් 14යි හදා දී තිබෙන්නේ. බාර්කේපල් ප්‍රදේශයේ නිවාස කීපයක් -ගෙවල් 12ක්- හදා දී තිබෙනවා. තවත් ගෙවල් 7ක් හදන්න කටයුතු කරමින් තිබෙනවා. 20,000ක් වාගේ සිටින තැනකට ගෙවල් 14ක් හදා දීලා මේ නිවාස ප්‍රශ්නය විසඳන්නේ කොහොමද, ගරු අමාත්‍යතුමනි? ඔබතුමා මැදිහත් වෙලා මේ අයට අඩු ගණනේ පර්චස් 7 බැගින් ඉඩම් කැබැල්ලක් හෝ ලබා දෙන්න කටයුතු කරන්න. ඔබතුමා එම සේවකයන්ට පර්චස් 7ක ඉඩම් කැබැල්ලක් දෙන්න. ඒ අයට කියන්න, බැංකුවකින් ණයක් අරගෙන ගෙයක් හදා ගන්න කියලා. යාපනයේ මන්ත්‍රීතුමන්ලා මේ ගරු සභාවේ ඉන්නවා. ශත පහක වැඩක් නැහැ. ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, උතුරෙන් ඇවිත් සිටින තමුන්නාන්සේලාට අපේ පැත්තේ අයත් ඡන්දය දෙනවා. அங்க யாழ்ப்பாணத்துல கண்டி ஆட்கள் எல்லாம் இருக்குத்தானே!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට ඒවා ඇහෙන්නේ නැහැ. බෙදලා දෙනවා කිව්වා නම්; කෑල්ලක් කඩා දෙනවා කිව්වා නම් හොඳට ඇහේවි. ගරු අමාත්‍යතුමා, වතුකරයේ ජනතාව විශාල සංඛ්‍යාවක් ගිහින් උතුරු ප්‍රදේශයේත් පදිංචි වෙලා ඉන්නවා. අපේ භූමිතෙල් මන්ත්‍රීතුමාත් ඉන්නවා. බණ්ඩාරවෙල මන්ත්‍රීතුමා. එතුමා මගේ මිත්‍රයා. මට වඩා හොඳින් වතුකරයේ ප්‍රශ්න ගැන දන්නා, වතුකරයේ ආදරණීය නායකයෙක්. ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ කම්කරුවන්ගේ නිවාස ප්‍රශ්නය පිළිබඳව මා කියන කාරණා සමඟ ඔබතුමා එකඟ වෙයි කියා මම විශ්වාස කරනවා.

ගරු නවීන් දිසානායක අමාත්‍යතුමනි, ඔබතුමා මේ රටේ ජාතික නායකයකු වන්න බලාපොරොත්තුව සිටින කෙනෙක්. අපි ඔබතුමාට ශුභ පතනවා. අපි ඔබතුමාට කියනවා, වතු කම්කරුවන් සඳහා නිවාස තනා ගැනීමට පර්චස් 7ක් බැගින් ලබා දීමේ වැඩ පිළිවෙළ ඔබතුමා ක්‍රියාත්මක කරන්න කියා. ඔබතුමා තේ මණ්ඩලයේ අරමුදල රැක්කා වාගේම, වතු කම්කරුවන්ගේ නිවාස ප්‍රශ්නයටත් අත ගහන්න පුළුවන්නම්, එය ඔබතුමා ලබන ලොකු ජයග්‍රහණයක්. මොකද, ඔබතුමාගේ තාත්තාත් වතු ක්ෂේත්‍රයට බෙහෙවින් ගෞරව කරපු කෙනෙක්. ඔබතුමා නුවරඑළිය දිස්ත්‍රික්කයේ නායකයෙක්. ඒ නිසා මේ වතු කම්කරුවන්ගේ නිවාස ප්‍රශ්නයට මැදිහත් වන්න, ගරු අමාත්‍යතුමා.

වතුකරයේ අධ්‍යාපනයේත් බරපතළ කඩා වැටීමක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, පුළුවන් නම් තේ මණ්ඩලය හරහා යම් මුදලක් ලබා දීලා වතුකරයේ දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවන්න, මන්ද පෝෂණය නැති කරන්න, වතුකරයේ රෝහල් දියුණු කරන්න ඔබතුමා උත්සාහ කර බලන්න. අපේ ආණ්ඩුව කාලයේ අපි වතුකරයේ රෝහල් පවරාගෙන ඒවා වෙනුවෙන් දැවැන්ත වැඩ පිළිවෙළක් හැදුවා. ගරු අමාත්‍යතුමනි, මා නාවලපිටිය ආසනයේ වෙස්ට්හෝල් රෝහල රජයට පවරා ගත්තා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පසුව එම රෝහල වසා දමා තිබෙනවා. මොකද, එම රෝහලට වෛද්‍යවරු නැහැ. එහෙම නොවෙයි වෙන්න ඕනෑ, ගරු අමාත්‍යතුමනි. වතුකරයේ රෝහල් රජයට පවරාගෙන ඒවා සංවර්ධනය කරලා ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළක් එදා අපේ රජය මඟින් ක්‍රියාත්මක කළා. දැන් ඒක නැවතිලා තිබෙනවා. අපි එම වැඩ පිළිවෙළ අපේ කාලයේ ආරම්භ කළා. ඒ වාගේම වතුකරයේ අධ්‍යාපනය සඳහා අපි අපේ කාලයේ විශාල මුදලක් වැය කළා. දැන් ඒවා අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම වතුකරයට විශාල වශයෙන් ගුරුවරුන් ලබා දීමේ වැඩ පිළිවෙළක් එදා තිබුණා. දැන් ඒවා අඩු වෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ විෂය පථයට මෙය අයත් නොවුණත්, වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ ප්‍රදේශයක නායකයකු විධියට වතුකරයේ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයේ ප්‍රශ්න වෙනුවෙනුත් ඔබතුමා කැබිනට් මණ්ඩලය තුළ සටනක් ගෙන ගිහින් ඒ අය සඳහා වන යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

අද ගමේ පාසලේ ඉගෙන ගන්නා දරුවාගේ අධ්‍යාපන තත්ත්වයයි, වතුකරයේ පාසලේ ඉගෙන ගන්නා දරුවාගේ අධ්‍යාපන තත්ත්වයයි බැලුවාම අහසට පොළොව වාගේ බව ඔබතුමා දන්නවා. වතුකරයේ දරුවෝ අද ඉස්කෝලේ යන්නේ නැහැ. අද වතුකරයේ දරුවන් ඉස්කෝලේ යන්න උනන්දු කරවන්න වැඩ පිළිවෙළක් නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා වතුකරයේ දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවන්න; ඒ වාගේම වතුකරයේ ජනතාවගේ සෞඛ්‍යය නඟා සිටුවන්න; ඒ වාගේම වතුකරයේ යටිතල පහසුකම් ටික නඟා සිටුවන්න; ඒ වාගේම වතුකරයේ නිවාස ප්‍රශ්නය විසඳන්න. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ඒ සඳහා යම් කාර්ය සාධක බලකායක් හෝ හදලා ඒ කටයුතු ඉටු කරන්නය කියලා මා ඉල්ලීමක් කරනවා. අපේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවට එනවා. මම හිතන විධියට එතුමාත් ඔබතුමන්ලාගේම කල්ලියේ කෙනෙක්; වෙනසක් බලාපොරොත්තුවෙන් ඉන්න කෙනෙක්. ඒ නිසා එතුමාත් ඕකට සම්බන්ධ කර ගත්තොත්, කැබිනට් මණ්ඩලය ඇතුළේ එතුමාත් සහයෝගයක් ලබා දෙයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා යටතේ පහත රට තේ කර්මාන්තය තිබෙනවා. මම හිතන විධියට ගයන්ත කරුණාතිලක ඇමතිතුමාටත් මේ ප්‍රශ්නය බලපානවා. එතුමාගේ දිස්ත්‍රික්කයේත් පහත රට තේ කර්මාන්තය තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

හරි. මම මීන් එහාට තවත් දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු නවීන් දිසානායක ඇමතිතුමාට මම නැවතත් සුබ පතනවා. මම නැවතත් එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමනි, මමත් කුඩා තේ වතු හිමියෙක් බව මම ඔබතුමාට කිව්වා. තේ ක්ෂේත්‍රයේ කඩා වැටීම මම ඔබතුමාට සංඛ්‍යා ලේඛනාත්මකව පෙන්වූවා. බොහෝ වෙලාවට නිලධාරීන් අපට වැරැදි සංඛ්‍යා ලේඛන ගෙනැල්ලා පෙන්වනවා. ඔබතුමා ඒ ගැන බලන්න. මේ කඩා වැටීම අවුරුදු ගණනාවක් තිස්සේ සිදුවුණු දෙයක්, ගරු ඇමතිතුමනි. මේ ක්ෂේත්‍රය කඩා වැටුණොත් ඒක අපටයි බලපාන්නේ; අප ජීවත් වන ප්‍රදේශයටයි බලපාන්නේ; අපේ රටේ ආර්ථිකයටයි බලපාන්නේ. මේ ක්ෂේත්‍රයේ ශ්‍රමිකයන් විශාල

සංඛ්‍යාවක් සිටිනවා. විශාල භූමි ප්‍රමාණයක් තිබෙනවා. ඔබතුමාත් දන්නවා, අපේ ප්‍රදේශවල කුඩා තේ වතු හිමියන් තනිකරම තමන්ගේ ආර්ථිකය හදා ගන්නේ තේ කර්මාන්තය තුළින් බව. ගරු ඇමතිතුමනි, අපේ ආණ්ඩුව කාලයේ කුඩා තේ වතු හිමියන්ට පොහොර සහනාධාරය දුන්නා. අද ඒ සියල්ල නැති වෙලා ගිහිල්ලා. ඒ නිසා මේ සියල්ල කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු කරලා යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාට මේ තේ ක්ෂේත්‍රය නහා සිටුවන්න හැකියාව ලැබුණොත්, ඒකම ඇති ඔබතුමාගේ දේශපාලන ජීවිතයට. ඔබතුමා දේශපාලන ජීවිතයේ ලබන ලොකුම ජයග්‍රහණය ඒකයි, ගරු ඇමතිතුමනි. තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයේ අනාගත නායකයෙක් වෙන්න ඉන්න කෙනෙක්. මොකද, අරයා හිටියාට වැඩක් නැහැ, බැහැ. කට්ටිය තල්ලුව දුන්නාට වැඩේ යන්නේ නැහැ. ඒ නිසා වැඩ බැරි ටාසන්ලා එක්ක යනවාට වඩා හොඳයි, කවුරු හරි වැඩ පුළුවන් ටාසන් කෙනෙක් එක්ක හරි යන එක. ඒ නිසා තමයි රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා shot එක දුන්නේ, ජාතික සංවිධායකකමත් දීලා. අරයාටත් shot එක දීලා වැඩේ දුන්නා. ඉතින් අපි කැමැතියි, අපේ පළාතේ කෙනෙක් නිසා. අපේ පළාතේ කෙනෙක් නිසා අපි කැමැතියි. කන්ද උඩරටින් මේ අවුරුදු එකහමාරට අලුත් නායකයෙක් බිහි වෙනවා නම් අපි කැමැතියි. තාවකාලිකව හරි එහෙම බිහි වුණොත් අපට හොඳයි. අඩු ගණනේ රටට හරි මොකක් හරි වෙයි නේ. මම මීට වඩා කාලය ගන්නේ නැහැ.

ගරු නවින් දිසානායක ඇමතිතුමනි, අවසාන වශයෙන් අපි ඔබතුමාට සුබ පතනවා. ඔබතුමා යමක් කරන්න උත්සාහ කරනවා. [බාධා කිරීමක්] නැහැ, මේ අවුරුදු එකහමාරට නේ දුන්නේ. කෙටි කාලයකට. [බාධා කිරීමක්] රාජපක්ෂලා තරහා වෙන්නේ 2019න් පස්සේ දෙන්න ගියොත්. 2019න් පස්සේ අපි ගන්නවා. ඒක හරි. ඒ විතරක් නොවෙයි, මෙතුමාව අගමැති කරලා, අගමැතිත් එක්කම අපි 2019දී මෙහා පැත්තට ගන්නවා. ඒකයි අපේ සැලැස්ම.

ගරු අමාත්‍යතුමනි, මේ ක්ෂේත්‍රයන් කෙරෙහි ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්නය කියලා නැවත වරක් අවසාන වශයෙන් ඉල්ලා සිටීමත් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.55]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව පැවැත්වෙන විවාදයේ දී මටත් කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු පියංකර ජයරත්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු පියංකර ජයරත්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කනක හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු පියංකර ජයරත්න මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பியங்கர ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. KANAKA HERATH *left the Chair and* THE HON. PRIYANKARA JAYARATNE *took the Chair.*

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1824 දී ශ්‍රී ලංකාවට පළමු තේ පැළය චීනයෙන් මෙරටට ගෙනැල්ලා ඉංග්‍රීසි ජාතීන් විසින් පේරාදෙණිය උද්භිද උද්‍යානයේ රෝපණය කළා. ඒ කාලයේ ඒක වාණිජ වගාවක් වෙලා තිබුණේ නැහැ. නමුත්, වාණිජ කර්මාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ආරම්භ කළේ 1867දී බ්‍රිතාන්‍ය වගාකරුවකු වූ ජේම්ස් ටෙලර් විසිනුයි. ඒ අනුව අපේ තේ කර්මාන්තයට දැන් වසර 150ක් වැනි අතීතයක් හිමි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට එකක පමණ අගයක් අත් පත් කර ගන්නා තේ නිෂ්පාදනය අපට ඉතාම වැදගත් වනවා. රටේ ජනගහනයෙන් දසලක්ෂයකට ආසන්න පිරිසක් සෘජුව හා වක්‍රව මේ තේ දල්ල තුළින් තමන්ගේ ආර්ථිකය නිර්මාණය කර ගන්නවා. සෘජුව ගත්තොත්, මේ රටේ ලක්ෂ දෙකකට වඩා වැඩි පිරිසක් තේ කර්මාන්තයෙන් තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගන්නවා. භූමි ප්‍රමාණය ගත්තොත්, අපේ මේ පුංචි දිවයිනේ හෙක්ටෙයාර දෙලක්ෂ දෙදහසකට වැඩි ප්‍රමාණයක තේ වගා කර තිබෙනවා. කොහොම වුණත්, අවුරුදු 150ක සාඩම්බර ඉතිහාසයක්; අභිමානවත් ඉතිහාසයක් තිබෙන "Ceylon Tea" කියන නාමය, අදත් අපේ රටේ නොමැකී පවතින නමක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ, මේ කර්මාන්තය කඩා වැටීගෙන ආපු කාලයක් තිබුණා. අවුරුදු ගණනාවක් තිස්සේ මේක ටික ටික කඩා වැටිලා, කඩා වැටිලා අපේ තේ නිෂ්පාදනය බොහොම පහළට වැටිලා තිබුණා. නමුත් පසුගිය කාලය වෙනකොට තේ කර්මාන්තයේ කඩා වැටීම මැඩපවත්වා, නැවත එය යථා තත්ත්වයට ගෙනා ආකාරය අපි දැක්කා. ඒ තුළින් අද වනවිට තේ කර්මාන්තය හොඳ මට්ටමට ගෙන ඒම ගැන විශේෂයෙන්ම වැවිලි කර්මාන්ත ඇමතිතුමා වන අපේ ගරු නවින් දිසානායක මැතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා ඊයේ පෙරේදා එක්සත් ජාතික පක්ෂයේ ජාතික සංවිධායකවරයා වශයෙනුත් වැඩ භාර ගත්තා. එතුමා එම කර්තව්‍යය ඉටු කරනවා වාගේම, කඩා වැටී තිබුණු තේ කර්මාන්තය නහා සිටුවීමටත් එතුමාගේ අමාත්‍ය ධුර කාලය තුළ කටයුතු කර තිබෙනවා.

අපේ තේ නිෂ්පාදනය දෙස බැලුවොත්, 2016දී තේ කිලෝග්‍රෑම් මිලියන 292.6යි අපේ රටේ නිෂ්පාදනය වුණේ. නමුත් 2017

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

වෙනකොට අපේ රටේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 307.7ක් දක්වා වර්ධනය කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ කියන්නේ අවුරුද්දක් තුළ සියයට 5.2කින් එම ප්‍රමාණය වැඩි කරගැනීමට අපට හැකියාව ලැබී තිබෙනවා. හැබැයි, තේ නිෂ්පාදනයට වැඩිමනත් වශයෙන් දායක වෙන්නේ කුඩා තේ වතු හිමියන්ය කියන කාරණය කෙරෙහිත් මම විශේෂයෙන් මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. ඔවුන් සියයට 73ක දායකත්වයක් අපිට ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කරන්න අපේ රටේ වර්තමානයේ රුපියල් 458ක් වාගේ වියදමක් යනවා. නමුත් 2015දී ඒ සඳහා කොළඹ තේ වෙන්දේසියෙන් ලැබුණේ රුපියල් 401.46ක මුදලක් පමණයි. ඒ කියන්නේ නිෂ්පාදන වියදමට වඩා අඩුවෙන් ලැබුණේ. නමුත් 2016 වෙනකොට එම මුදල රුපියල් 473.15කට ගෙනෙන්න අපට පුළුවන් වුණා. එසේ කඩා වැටී තිබුණු තේ මිල නැවත යථා තත්ත්වයට පත් කිරීම නිසා, 2017 වර්ෂය වෙනකොට තේ කිලෝග්‍රෑම් එකකට රුපියල් 620.44ක් ගන්න පුළුවන්කමක් ලැබුණු බවත් මා ආඩම්බරයෙන් කියනවා. කඩා වැටී තිබුණු තේ කර්මාන්තය අද මේ තත්ත්වයට නහා සිටුවීමට කටයුතු කිරීම ගැන මම විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත්, ඒ වාගේම මේ සඳහා කැප වී කටයුතු කරන අපේ ගරු නවින් දිසානායක ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට, තේ අපනයනය ගැනයි මම කියන්නේ. 2016 වර්ෂයේ අපේ තේ අපනයනයෙන් ලබා ගත් මුදල යූඑස් ඩොලර් මිලියන 1,269යි. 2017 -පසුගිය වර්ෂය- වෙනකොට එම ප්‍රමාණය යූඑස් ඩොලර් මිලියන 1,530ක් දක්වා වර්ධනය කර ගන්න අපිට පුළුවන්කම ලැබුණා. විශේෂයෙන්ම අපේ තේ මිලදී ගන්නා රටවල් අතරින් රුසියාව, ඉරාකය, ඉරානය වාගේ රටවල් ප්‍රධාන තැනක් ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුද්දේ රුසියාවට ටොන් 33,380ක්, ඉරානයට ටොන් 27,419ක්, ඉරාකයට ටොන් 35,033ක් වශයෙන් අපිට තේ ටොන් 288,984ක් අපනයනය කිරීමට හැකියාව ලැබුණා. මම මේ ගැන විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. මොකද, අද අපේ රට ගොඩනඟන්න අපට තිබෙන ප්‍රධාන අභියෝගය තමයි පසුගිය කාලයේ මේ රට ගොඩනඟන්න කියා වැඩි පොලියට ගත් ණය. පසුගිය කාලයේ වැඩි පොලියට ගත් ණයත් ගෙවන්න වෙන ක්‍රමයක් තිබුණේ නැහැ. නැවත නැවත ණය අරගෙන-ණය අරගෙන තමයි පොලී වාරික ගෙවන්නත් රජය පටන්ගෙන තිබුණේ. නමුත් මේ ණය උගුලට හිර වෙලා තිබෙන රට තව තවත් ණය අරගෙන ණය ගෙවන්නේ නැති මට්ටමට පත් කරන්නේ නැතිව, මේ රටට ලැබෙන විදේශ විනිමය -විදේශ මුදල් ප්‍රමාණය- වැඩි කරගෙන ණය ගෙවා මේ ණය උගුලෙන් රට බේරා ගැනීමේ අවශ්‍යතාව අපට තිබෙනවා. ඒ නිසා එදා ගෘහ සේවිකාවන් විධියට රට ගිහින් සල්ලි ගොඩක් ගෙනා ක්‍රමය වෙනුවට, ඒ වාගේ දහ ගුණයක්, සිය ගුණයක් මුදල් ගෙනෙන්න පුළුවන් විධියට අද යුරෝපීය රටවල්, එහෙම නැත්නම් දියුණු රටවල් සමඟ අපි විශේෂ සම්බන්ධතා පවත්වා ගෙන යමින්, ඒ රටවලට අපේ පුහුණු ශ්‍රමිකයන් යැවීම සඳහා කටයුතු කරලා විදේශ රැකියාවලින් එන ආදායම වැඩි කර ගන්න අපි උත්සාහ කර තිබෙනවා. ඒ වාගේම බොහොම හොඳ, යහපත් රටක් හරි ගස්සලා; හොඳ රටක් ලෙස ලෝකය පිළිගන්නා තත්ත්වයට අපේ රට පත් කරලා; ලෝකයේ නායකයන්ගෙන් ආශිර්වාද ලබන රටක් බවට අපේ රට පත් කරලා මේ රටට විදේශ ආයෝජකයන් ගලා ඒමේ ප්‍රවණතාවක් ඇති කර ගැනීමට අද අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම අපේ අපනයන ක්ෂේත්‍රය තුළ GSP Plus වාගේ සහන ඇති කරලා, යුරෝපයෙන් අපට තහනම් කර තිබුණු මත්ස්‍ය නිෂ්පාදන අපනයන වාගේ ඒවායේ තහනම ඉවත් කරගෙන, අපනයන ක්ෂේත්‍රයත් වැඩි කරගෙන, විදේශ විනිමය වැඩි කර ගැනීමට අපි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

තේ වගාව දිහා බැලුවාම, එය අපට හරි විශේෂයි. මොකද, අපිට ලැබෙන විදේශ විනිමයෙන් සියයට 15ක්ම ලබා දෙන්නේ තේ දල්ලයි. එහෙම නම්, අපේ ප්‍රශ්න නිරවුල් කරගෙන රට ගොඩනැඟීම සඳහා තේ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, තේ අපනයනය ප්‍රවර්ධනය කිරීම විශේෂයෙන්ම වැදගත් වෙනවා. එම නිසා තේ නිෂ්පාදනය, තේ අපනයනය - අපේ වෙළෙඳ පොළ - වර්ධනය කර ගැනීම අපේ ජාතික යුතුකමක් බව මම සඳහන් කරනවා. කඩා වැටුණු තේ මිල, කඩා වැටුණු තේ වෙළෙඳ පොළ යථා තත්ත්වයට ගෙන ඒමට උත්සාහ කිරීම හා ඒ සඳහා කටයුතු කිරීම ගැන වර්තමාන රජයට නැවත වරක් මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ගෙනාවේත් තේ අපනයනය, තේ නිෂ්පාදනය සාර්ථක කර ගැනීමට ගත් තවත් එක් පියවරක් වශයෙනුයි. 1975 අංක 14 දරන පනත යටතේ 1976 ජනවාරි 1වැනි දා ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවනු ලැබුවා. නමුත් එදා මෙය තේ ප්‍රචාරක මණ්ඩලය හැටියට, වතු අංශයේ පෞද්ගලිකවයි තිබුණේ. මෙම පනත කිහිප විටක් ම සංශෝධනය වී තිබෙනවා. මෙම පනත සංශෝධනය කිරීමට හේතු වශයෙන් ගත්තේ, අධ්‍යක්ෂ මණ්ඩලයට මෙහි පරිපාලනය කරන්න පුළුවන්ද කියන කාරණයයි. කලින් කිසිම අණ්ඩුවක් මෙහි පරිපාලනයට දැඩි ලෙස ඇඟිලි ගැසීමක් කර තිබුණේ නැහැ. මෙම ආයතනයේ පරිපාලනය දියුණු කර ශක්තිමත් කරන්න අවස්ථාව තිබුණේ නැහැ. එම නිසායි මේ තේ කර්මාන්තය ක්‍රම ක්‍රමයෙන් කඩා වැටෙන්න පටන් ගත්තේ. තේ කර්මාන්තය සංවර්ධනය කිරීම, "Ceylon Tea" කියන නාමය ලෝකයට ප්‍රවර්ධනය කිරීම, තේ නිෂ්පාදනය වැඩි කිරීම, අලුත් බිම්වල තේ වගා කිරීම, නැවත වගා කිරීම, පැරණි තේ වතු පුනරුත්ථාපනය කිරීම, කම්හල් ඇරඹීම වැනි කාරණා මෙම ආයතනයේ පරමාර්ථ ලෙස දක්වා තිබෙනවා. අපිට තවත් ප්‍රශ්නයක් තිබෙනවා. අද අපේ රටේ තේවල productivity එක අඩු වෙලා තිබෙනවා. හෙක්ටෙයාරයකින් ලැබෙන තේ ප්‍රමාණය අලුතින් තේ වගා කරන වෙනත් රටවලට වඩා අඩු වී තිබෙනවා. එම නිසා අපිට නිෂ්පාදනය ගැන ප්‍රශ්නයකුත් තිබෙනවා. තේ වෙන්දේසි පැවැත්වීම, තේවල අධීක්ෂණ කටයුතු කිරීම, අළෙවි කටයුතු කිරීම, අපනයනය කිරීම, බ්‍රෝකර්වරු පිළිබඳ අධීක්ෂණය කිරීම, තේ ගබඩා කිරීම් අධීක්ෂණය කිරීම වාගේ විවිධ කටයුතුත් තේ මණ්ඩලය යටතට පැවරී තිබෙනවා.

අද සංකීර්ණ සමාජයක කර්මාන්තයේ තිබෙන අවශ්‍යතාව දෙස බැලුවාම අපට ගෝලීය අවශ්‍යතා පිරිමසන්න වෙලාවක් නැති වෙනවා. මෙහි අධ්‍යක්ෂ මණ්ඩලය 14දෙනකුගෙන් සමන්විත වෙනවා. පූර්ණකාලීනව ඉන්නේ සභාපතිවරයා විතරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මාසයකට වරක් පමණයි රැස් වෙන්නේ. මාසයකට වරක් රැස්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයට අද තිබෙන සංකීර්ණ කටයුතු කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය නිසා තමයි මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනැවිත් තේ මණ්ඩලයට පූර්ණකාලීන අධ්‍යක්ෂවරයකු පත් කරන්න උත්සාහ කර තිබෙන්නේ. ඒ කාරණය ගරු ඇමතිතුමා පැහැදිලි කළා. මේ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් අත්දැකීමක්, දැනුමක් තිබෙන පුද්ගලයෙක් පූර්ණ කාලීනව, අවුරුදු තුනකට පත් කරන්න තමයි අදහස් කරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි, මූලාසනාරූ ගරු මන්ත්‍රීතුමනි.

අවුරුදු තුනකට කටයුතු කරන්නයි ඔහුට අවස්ථාව ලබා දෙන්නේ. එම අවුරුදු තුනක කාලයේදී හොඳ දියුණුවක් තිබෙනවා නම්, තවත් අවුරුදු තුනකට කාලය දීර්ඝ කරන්න පුළුවන්. ඊට වඩා කාලය දීර්ඝ කරන්න බැහැ. මේ ආකාරයට සාධාරණ විධියට අධ්‍යක්ෂවරයකු තෝරා ගැනීමට කටයුතු කිරීම ගැන මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

තේ කර්මාන්තය සම්බන්ධයෙන් අද අපට බොහෝ දේ කරන්න තිබෙනවා. අපි value-added තේ සියයට විස්සක් පමණයි අපනයනය කරන්නේ. ඉතිරි සියයට 80 සාමාන්‍ය තේ විධියටයි අපනයනය කරන්නේ. අගය වැඩි කිරීමක් නැතිව අපේ තේ අපනයනය කරන්න අපහසු වී තිබෙනවා. එම නිසා මෙවැනි දේවල් ගැන අපට හිතන්න සිදු වී තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමා -විශේෂයෙන් රජය- ගත් මේ පියවර ඉතා වැදගත්. ඉතිහාසගත වන පියවරක් ගත්තේ. තේ කර්මාන්තය නඟා සිටුවීම සඳහා, අපනයනය ශක්තිමත් කිරීම සඳහා, අපට එන ඩොලර් ආදායම වැඩි කර ගැනීම සඳහා, මේ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම තිබෙන පුද්ගලයෙක් ගරු ඇමතිතුමාගේ අධීක්ෂණය යටතේ පත් කිරීම ඉතාම වැඩදායී වෙනවා. එම නිසා අනාගතයේදී තේ කර්මාන්තයේ දියුණුව ගැන අපිට ලොකු බලාපොරොත්තු තබන්න හැකි වෙයි. එසේම එක්සත් ජාතික පක්ෂයේ ජාතික සංවිධායකවරයා හැටියට වැඩ භාර ගත් ගරු නවීන් දිසානායක ඇමතිතුමාට තේ කර්මාන්තය ශක්තිමත් කරනවා වාගේම, අප පක්ෂයත් ශක්තිමත් කර ඉදිරියට ගෙනයාමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබෙවායි ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. I. Charles Nirmalanathan. You have 20 minutes.

[பி.ப. 12.07]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இலங்கைத் தேயிலைச் சபைக்கு Working Director ஒருவரை நியமிப்பதற்காக பாராளுமன்றத்தின் அனுமதியைக் கோருவதற்காகக் கௌரவ அமைச்சர் நவீன் திஸாநாயக்க அவர்களால் இந்தச் சபையில் இலங்கை தேயிலைச் சபை (திருத்தம்) சட்டமூலம் முன்வைக்கப்பட்டிருக்கின்றது.

இலங்கை தேயிலைச் சபை இலங்கைக்கு மிகப் பெரிய அந்நியச் செலாவணியை ஈட்டிக் கொடுக்கின்ற ஒரு நிறுவனமாக உள்ளது. அதேநேரத்தில் மிகக் கூடுதலான தொழிலாளர்கள் தேயிலைத் தொழிலில் ஈடுபட்டுள்ளார்கள். இலங்கைத் தேயிலைச் சபைக்கு Working Director ஒருவரைத் தெரிவு செய்கின்றபோது அரசியல் நோக்கம் அல்லாது, அந்தத் துறையில் நிபுணத்துவம் பெற்ற ஒருவரையே தெரிவு செய்யவிருப்பதாக கௌரவ அமைச்சர் அவர்கள் தனது உரையில் கூறியிருந்தார். அதற்காக அமைச்சர் அவர்களுக்கு வாழ்த்துக்களைக் கூறுகின்றேன். ஒவ்வோர் அமைச்சின்கீழும் பல நிறுவனங்கள் இருக்கின்றன. அந்த நிறுவனங்களுக்கு அமைச்சர்கள் தவிசாளர்களைத் தெரிவுசெய்கின்றபோது பல விடயங்களை முன்னோக்கிப் பார்க்கிறார்கள். ஆனால், நாட்டிற்குப் பயன்தரக்கூடிய வகையில், குறித்த நிறுவனங்களை இலாபத்தில் கொண்டுபோகக்கூடிய முறையான நிபுணத்துவம் பெற்றவர்களை அமைச்சர்கள் நியமிப்பது குறைவாக இருக்கின்றது. மாறாக, தேர்தல்கள் வரும்போது அவர்கள்மூலம் தமது கட்சிக்கு எவ்வளவு வாக்குகளைப் பெற்றுக்கொள்ளலாமென்றுதான் ஒருசில அமைச்சர்கள் பார்க்கிறார்கள். அவர்களில் பலர் குறித்த தவிசாளர் பதவிக்குத் தங்களுடைய உறவினர்களை நியமிக்கிறார்கள். பாராளுமன்றத் தேர்தலில் தங்களுடைய கட்சியின்கீழ் போட்டியிட்டு தோற்றுப்போனவர்களைக்கூட தவிசாளர்களாக நியமிக்கின்றார்கள்.

இலங்கைத் தேயிலைச் சபைக்கு ஒரு Working Director ஐத் தெரிவுசெய்வதற்கான விடயத்தை முழுநேரமும் விவாதத்திற்கு உட்படுத்தி, அதற்கான அனுமதியை வழங்குமாறு அமைச்சர் அவர்கள் கேட்டிருக்கிறார். அதன் முக்கியத்துவம், இந்த தேயிலைச் சபை நன்கு வழிநடத்தப்பட வேண்டும் என்பதாகும். உற்பத்தியாளர்களுக்கும் தொழிலாளர்களுக்கும் மற்றும் இந்த நாட்டிற்கும் நன்மை கிடைக்கக்கூடிய வகையில் குறித்த பதவிக்கு ஒருவரை நியமிப்பதாக அமைச்சர் அவர்கள் கூறியிருப்பது உண்மையில் நல்ல விடயம். ஆனால், இவ்வாறு அமைச்சர்கள் நடந்து கொள்வது மிகவும் குறைவாக இருக்கின்றது. ஆகவே, அமைச்சர்கள் அனைவரும் இந்த விடயங்களைக் கருத்திற்கொண்டு செயற்பட வேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அண்மையில் மன்னார் மாவட்டத்தில் முசலிப் பிரதேசச் செயலக அபிவிருத்திக்குழுக் கூட்டம் நடைபெற்றது. ஓர் அமைச்சரின் ஆதரவாளர்களுக்கு அந்தப் பிரதேச செயலாளர் அரசியல் ரீதியாக உதவி செய்யவில்லையென்ற காரணத்தினால், அந்தக் குழுக் கூட்டத்தின்போது மக்கள் மத்தியில், மன்னார் மாவட்டத்தில் இருக்கின்ற அனைத்து Heads of Department - அனைத்து அதிகாரிகளுக்கும் முன்னிலையில் அந்தப் பிரதேசச் செயலாளரை அந்த அமைச்சர் மிகவும் கீழ்த்தரமாகவும் தரக்குறைவாகவும் அவமானப்படுத்தியிருக்கின்றார். இந்தச் சம்பவம் கடந்த 21ஆம் திகதி, திங்கட்கிழமை இடம்பெற்றது. குறிப்பிட்ட சிலர், நிர்வாகத்தில் இருக்கின்ற அதிகாரிகளைத் தங்களுடைய அரசியலுக்காகப் பகடைக்காய்களாகப் பயன்படுத்தப் பார்க்கிறார்கள் என்பததைக் குறிப்பிடுவதற்காகவே இதனை நான் கூறுகின்றேன்.

ஆனால், அதற்கு விருப்பமில்லாமல் தங்களுடைய கடமைகளை நேர்மையாகச் செய்கின்ற பல அதிகாரிகள் பழிவாங்கப்படுகின்றார்கள்; இடமாற்றத்திற்குள்ளாக்கப்படு கின்றார்கள். இலங்கையில் இப்படியான சம்பவங்கள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றபோது, இந்த அமைச்சின் கீழுள்ள நிறுவனங்களின் தவிசாளர்கள் எப்படி அந்த நிறுவனங்களை நேர்மையாகக் கொண்டுசெல்லக்கூடிய வகையில் செயற்படுவார்களென்பது கேள்விக்குறியாக இருக்கின்றது.

[ගරු ඉ. වාල්ස් නිර්මලනාදන් මහතා]

කෞරව අමෙච්චර් අවර්කළේ, තේයිලෙ ඒර්රුමතිමූලම් කිටෙක්කින්ර වරුමානම් අන්තත් තොළිලාළර්කළ් පලරින් උළෙප්පාකුම්. ආනාල්, අවර්කළින් අටිප්පටෙ වසතිකළිල් නීණ්ටකාලමාකක් කුරෙපාටුකළ් කාණප්පටුකින්රන. කල්වි, චම්පළම්, සුකාතාරම්, තංකුමිටම් පෝන්ර විටයංකළිල් මිකුන්ත කුරෙපාටු කාණප්පටුකින්රතු. ඉවර්රෙ නිවර්ත්තික්කුම්පටි අන්ත මක්කළ් නීණ්ට කාලමාකක් කේට්ටුක්කොණ්ටිරුක් කින්රාර්කළ්. එනවේ, ඉතනෙයුම් කෞරව අමෙච්චර් අවර්කළ් කරුත්තිර්කොළ්ළ වේණ්ටුම්. ඒනෙන්රාල්, අන්ත මක්කළුටෙය උළෙප්පින්මූලම් එමතු නාට්ටුක්කු අන්නියච් චෙලාවණි කිටෙක්කප්පෙරුකින්රතු. පාරාළුමන්රත්තිනුටෙය චෙලවුකළිල්කූට අවර්කළුටෙය උළෙප්පු උළ්ළටංකියිරුක් කින්රතු. ඉන්ත නාට්ටිල් උළෙක්කින්ර ඔව්වොරු තොළිලාළියුම් මන නිරෙවෝටු වාළවේණ්ටියතු කට්ටායමාකුම්. ආකවේ, ඔරේයටියාක ඉල්ලාවිට්ටාලුම් පටිප්පටියාකවාවතු එතිර්කාලත්තිල් අවර්කළින් කල්වි, සුකාතාරම්, තංකුමිටම්, චම්පළම්, කාණි, වීටු තොටර්පාන පිරච්චිනෙකළෙත් තීර්ත්තුවෙත්තු අවර්කළුටෙය වාළ්වාතාරත්තෙ - වාළ්ක්කෙ මුරෙයෙ මුන්නේර්ර වේණ්ටිය කටප්පාට්ටිල් නීංකළ් ඉරුක්කින්රීර්කළ්.

එනක්කු මුන්පු පේචිය පාරාළුමන්ර උරුප්පිනර් මහින්තානන්ත අලුත්කමකේ අවර්කළ්, වටක්කිර්කු මලෙයකත් තිලිරුන්ත වන්ත මක්කළ් චම්පන්තමාක් කුරිප්පිට්ටිරුන්තාර්. අවර්කළුම් එංකළුටෙය මක්කළ්තාන්. අන්ත වකෙයිල් වටක්කිලුම් කිළක්කිලුම් ඉරුක්කින්ර තමිළර්කළ් එල්ලෝරුම් ඔර්රුමෙයාක වාළ්කින්රාර්කළ්. අවර්කළ් අංකිරුන්ත වන්තවර්කළ්, ඉංකිරුන්ත වන්තවර්කළෙන්රු එන්තවිතමාන පාකුපාටුම් මලෙයක මක්කළ්මීතු ඒනෙය තමිළර්කළ් කාට්ටුවතිල්ලෙ. වටක්කු, කිළක්කිල් ඉරුක්කින්ර, මලෙයකත්තිල් ඉරුක්කින්ර තමිළර්කළ් එල්ලෝරුමේ තමිළර්කළ්තාන්. ආකවේ, මහින්තානන්ත අලුත්කමකේ අවර්කළ් කූරියතුපෝල් අවර්කළෙ එන්ත විත්තියාචම් කොණ්ටුම් නාංකළ් පාර්ප්පතිල්ලෙ. ඒනෙන්රාල්, කටන්තකාල යුත්තත්තිල්කූට අවර්කළ් පංකෙටුත්තු මිකප් පෙරිය චාතනෙකළෙ ඊට්ටියිරුක්කින්රාර්කළ්. අන්ත වකෙයිල් එන්තවිතමාන විත්තියාචමුම් ඉල්ලාමල් අවර්කළ් එංකළුටන් පයණිත්තුක්කොණ්ටිරුක්කින්රාර්කළ්. අවර්කළෙත් තයවුචෙය්තු එංකළිලිරුන්ත පිරිප්පතර්කු මුයර්චික්ක වේණ්ටාම්!

මේලුම්, කෞරව උරුප්පිනර් මහින්තානන්ත අලුත්කමකේ අවර්කළින් පේච්චු, වරුකින්ර ජනාතිපතිත් තේර්තලිල් එප්පටිත් තාංකළ් වෙල්වතු, එප්පටි මර්රෙය කට්චිකළෙ වීළ්ත්තුවතු එන්පවර්රෙ නෝක්කමාකක් කොණ්ටිරුන්තතේයොළිය, ඉන්ත නාට්ටිනුටෙය පොරුළාතාරත්තෙ එව්වාරු කට්ටි යෙළුප්පුවතු? ඉන්ත නාට්ටිලුළ්ළ මක්කළින් අටිප්පටෙත් තේවෙකළෙ එනවාරු නිරෙවේර්රුවතු? එන්පන තොටර්පිල් එතෙයුම් කොණ්ටිරුක්කවිල්ලෙ. අතේනේරම් චම්පන්තප් පට්ටවර්කළ් කටන්ත කාලත්තිල් ඉන්ත විටයංකළ් තොටර්පිල් එප්පටිච් චෙයර්පට්ටාර්කළ් එන්පතු කුරිත්තුම් ඉලංකෙයිල් ඉරුක්කින්ර ඒනෙය කට්චිකළ්මීතුම් චිරිය එණ්ණික්කෙ යිනරාන චිරුපාන්මෙ ඉන මක්කළ්මීතුම් එව්වාරාන අතිකාරත්තෙච් චෙලුත්තිනාර්කළ් එන්පතු පර්රියුම් අවර් පුරින්තුකොළ්ළ වේණ්ටුම්.

කෞරව අමෙච්චර් අවර්කළේ, ඉලංකෙත් තේයිලෙච් චපෙත් තොළිර්පාට්ටුප් පණිප්පාළරුටෙය නියමනම් මිකවුම් පයනුළ්ළතාක අමෙයවේණ්ටුම්. අතාවතු, තේයිලෙත් තොළිලාළර්කළුක්කුම් උර්පත්තියාළර්කළුක්කුම් නාටුම් මිකප් පෙරියතොරු නන්මෙයෙයප් පෙරක්කූටිය වකෙයිල් ඉන්ත නියමනම් අමෙය වේණ්ටුම්. අන්ත මක්කළින් වාළ්ක්කෙත් තරත්තෙ උයර්ත්ත වේණ්ටිය පොරුප්පු උංකළුක්කිරුක් කින්රතු. අතේනේරත්තිල්, ඒනෙය අමෙච්චර්කළුම් තත්තමතු නිරුවනත්තිර්කුත් තවිචාළර්කළෙත් තෙරිවු චෙය්කින්රපෝතු, තංකළුටෙය කට්චි චාර්න්තවරල්ලාමල්, උරවිනර්කළ් අල්ලාමල්, අන්තන්තත් තුරෙයිල් නිපුණත්තුවම් පෙර්ර, නීණ්ටකාලමාකක් කුරිත්ත තුරෙයිල් පණියාර්රිය, උණ්මෙයිල් ඉන්ත නාට්ටිර්කාක උළෙක්කක්කූටියවර්කළෙත් තෙරිවු චෙය්යවේණ්ටුම් එන්රු කේට්ටුක්කොළ්කින්රේන්.

ඉන්රු අරච අතිකාරිකළ් තංකළුක්කුරිය චට්ටතිට්ටංකළෙ මතිත්තුච් චුයමාක වේලෙ චෙය්වතර්කු ඔරුචිල අමෙච්චර්කළ් තටෙයාක ඉරුක්කින්රාර්කළ්. එනවේ, චම්පන්තප්පට්ට අමෙච්චර්කළ් තොටර්න්තුම් ඉප්පටියාන නෝක්කම් කොණ්ටිරුක්කාමල්, අරච අතිකාරිකළ් තංකළුක්කුරිය චට්ටතිට්ටංකළුක්කමෙවාක නේර්මෙයාක වේලෙ චෙය්වතර්කුත් තයවුචෙය්තු අනුමතික්කුමාරු කේට්ටු විටෙපෙරුකින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට ගරු කනක හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.17]

ගරු කනක හේරත් මහතා
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)
මට විනාඩි 13ක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම පිළිබඳව මම සතුටු වනවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මෙම ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු කිහිපයක් සම්බන්ධයෙන් අපේ ගරු අමාත්‍යතුමාත් දැනුවත් කරන්න තමයි මම බලාපොරොත්තු වන්නේ.

අද වනකොට තේ ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රධානම ගැටලුව තමයි, නිෂ්පාදනය පහළ වැටීම. ඒකට ප්‍රධාන හේතුව හැටියට මා දකින්නේ පොහොර ඇතුළු සහනාධාර කප්පාදු කිරීමයි. අවුරුදු දෙකකට කලින් සතියකට තේ කිලෝග්‍රෑම් මිලියන 8ක් පමණ තිබුණු තේ දළු නිෂ්පාදනය අද වනකොට මා හිතන්නේ සතියකට කිලෝග්‍රෑම් මිලියන 4කට, 5කට -ඉන් භාගයකට වාගේ,- අඩුවෙලා තිබෙනවා. තේ මිල ඉහළ යන්න මේකත් එක් කාරණයක් කියලා මා හිතනවා.

අපේ ගරු නවින් දිසානායක අමාත්‍යතුමා කිව්වා, තේ මිල ඉහළ ගියා කියලා. එක පැත්තකින් අපේ කුඩා තේ වතු හිමියන්ට වැඩි මිලක් ලැබීම පිළිබඳව මා සතුටු වනවා. නමුත් දීර්ඝ කාලීනව බලද්දි පෙනෙනවා, රබර් වගාව වාගේම තේ වගාවත් විනාශ වන තත්ත්වයකට පත්වෙලා තිබෙන බව. අපේ ප්‍රදේශ දිහා බලලායි මම එහෙම කියන්නේ.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

කලින් වර්ෂයේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 340යි. දැන් එය කිලෝග්‍රෑම් මිලියන 307ක් වෙලා තිබෙනවා. එහෙම ලොකු කඩා වැටීමක් මට නම් පෙනෙන්නේ නැහැ, ඔබතුමාට පෙනුණාට.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

2016ට වඩා 2017 වර්ෂයේ තේ නිෂ්පාදනය වැඩිවෙලා තිබෙනවාය කියායි ඔබතුමා කියනවා ඇත්තේ. නමුත් 2013, 2014 සහ 2015 වාගේ වර්ෂ එක්ක සංසන්දනය කරද්දි ඒ ප්‍රමාණය භාගයකට වාගේ අඩුවෙලා තිබෙනවා. කෙසේ වෙතත් පොහොර සහනාධාරය ලබා දීම සීමා කිරීම -අඩු කිරීම- තමයි මේකට හේතුව හැටියට මා දකින්නේ. රුපියල් 1,300ට ලබා දෙනවා කියපු ඒ පොහොර සහනයත් අද වනතුරු ලැබිලා නැහැ. T 750 කියන පොහොර අද වනකොට රුපියල් 2,050කට තමයි ලබා දෙන්නේ. මේ ක්ෂේත්‍රයේ නිෂ්පාදන අඩු වෙන්න තව හේතුවක් තමයි, අපේ තේ වතු හිමියන් ප්‍රමිතියකට අනුව මේ පොහොර තේ ගස්වලට නොදැමීම. ඔබතුමාත් කියපු ආකාරයට ඒකට මූලිකම හේතුව තමයි, ග්ලයිෆොසේට් තහනම් කළාට පස්සේ නොයෙකුත් දේවල් වල්නාශක ලෙසට දමන්න කටයුතු කරලා තිබීම. අද වනකොට අජිනොමොටෝ වැනි දේවලුත් වල්නාශක හැටියට පාවිච්චි කරන්න මේගොල්ලන් පෙළඹිලා සිටිනවා. අක්කරයකින් කිලෝග්‍රෑම් 1,000ක් ලබා ගත් තේ නිෂ්පාදනය අද වනකොට කිලෝග්‍රෑම් 500ට වාගේ අඩුවෙලා තිබෙනවාය කියලා කුඩා තේ වතු හිමියන් කියනවා. ඒ වාගේම නැවත වගාව සඳහා ලබා දෙනවා කියපු සහනය තවම ලැබිලා නැහැ. T 200 කියන පොහොර මා හිතන්නේ රුපියල් 1,500කටද කොහේද ලබා දෙනවා කියා කිව්වා. ඒකත් ලැබිලා නැහැ. ඒකත් තව කාරණයක්.

නැවත වගාව සඳහා සහනාධාරයක් වශයෙන් ලබා දුන්නු රුපියල් 15,000ක මුදල් ප්‍රමාණය පසුගිය රජය මහින් රුපියල් 50,000 දක්වා වැඩි කර ලබා දුන්නා. නමුත් අද වනකොට ඒකත් ලබා දෙන්නේ නැහැ. ඒ කාරණය පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න මා බලාපොරොත්තු වනවා. එමෙන්ම පාංශු හා ජල සංරක්ෂණය සඳහා රුපියල් 5,000ක් වැනි සහනයක් ලබා දුන්නා. ඒ කිසි දෙයක් මේ වනකොට ලබා දෙන්නේ නැහැ. එමෙන්ම තේ සමිතිවලට දළු කඩන යන්ත්‍ර, තේ ගස් කපන යන්ත්‍ර ලබා දුන්නා. මෙවැනි ආකාරයේ සමිතිවලටත් ලොකු ශක්තියක් සහ සහයෝගයක් පසුගිය රජය මහින් ලබා දුන්නා. මේ සහන සියල්ලක්ම නැවතිලා තිබෙන නිසා තමයි, අද තේ නිෂ්පාදනය යම්කිසි දුරකට අඩු වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, පසුගිය වර්ෂයට, එහෙම නැත්නම් ඊට පෙර වර්ෂයට වඩා අද වන කොට තේ දළුවලට වැඩි මිලක් ලැබෙනවා. අද තේ දළු කිලෝවකට රුපියල් 92ක් පමණ ලැබෙනවා. හැබැයි, ඒ රුපියල් 92න් රුපියල් 30ක හෝ 35ක පමණ මුදලක් තේ දළු කඩන කම්කරුවාට ලබා දෙන්න ඕනෑ. ඊළඟට සියයට 4ක් කර්මාන්තශාලාවෙන් අයින් කරනවා. එතකොට කුඩා තේ වතු හිමියා තම කර්මාන්තය ගෙන යෑමට බැරි තත්ත්වයකට පත් වනවා. ඊළඟට, වල් නාශක තහනම නිසා දැන් මාස තුනකට වතාවක් පමණ වගා බිම් සුද්ද කරන්න ඕනෑ. වගා බිම් අක්කරයක් සුද්ද කරන්න රුපියල් 20,000ක පමණ මුදලක් වැය වනවා. අද මේකත් ලොකු ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා.

තේ නිෂ්පාදන අපනයන සමාගම් 220ක් පමණ අද අපේ රටේ තිබෙනවා. ගරු ඇමතිතුමනි, මිශ්‍ර - blended - තේ ගැන ඔබතුමාත් කථා කළා. අද අපට ලෝකයේ අනෙකුත් රටවල් සමඟ ලොකු තරගයක් තිබෙනවා. විශේෂයෙන්ම ඩුබායි වැනි රටවල් අපේ රටෙන් තේ අරගෙන, ඒ තේ මිශ්‍ර කරලා ලෝක වෙළෙඳ පොළ අල්ලාගෙන තිබෙනවා. විශේෂයෙන්ම රුසියානු වෙළෙඳ පොළ අද ඒ ගොල්ලන් අල්ලා ගෙන තිබෙනවා. පසුගිය කාලයේ අපේ තේ වැඩිම ප්‍රමාණයක් අපනයනය කළේ රුසියාවටයි. නමුත්, අද වන කොට ඩුබායිවල ඇති ජාත්‍යන්තර සමාගම් විසින් රුසියානු වෙළෙඳ පොළ අල්ලාගෙන තිබෙනවා. අපි මේ පිළිබඳවත් සොයා බලන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු ආකාරයට "Pure Ceylon Tea" කිව්වාම, ඒ සිංහයා ලාංඡනයට ලෝකයේ හැම රටකම පිළිගැනීමක් තිබෙනවා. අපේ සිංහයා ලාංඡනය යටතේ Pure Ceylon Tea සියයට 70ක් ගන්නවා වාගේම අපි බලන්න ඕනෑ, මිශ්‍ර -blended- තේ අපනයනය සඳහාත් ලෝකයේ තිබෙන අනෙකුත් තේ වෙළෙඳ පොළවල් සමඟ තරගයට යන්න. අපි ඒ සඳහාත් කටයුතු කළ යුතුයි. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම අපේ අනන්‍යතාව රැක ගන්නවා වාගේම, අපි blended tea නිෂ්පාදනය කිරීමත් වැදගත් වනවා. එය මම යෝජනා කරනවා. අපි පසුගිය ආණ්ඩුව කාලයේත් ඒ යෝජනාව කළා. විශේෂයෙන්ම හම්බන්තොට වරායේ bonded warehouse එක හදලා ඒ කර්මාන්තශාලා තුළින් blended tea මුළු ලෝකයටම යවන්න කටයුතු කිරීම ඉතාම වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට වැඩිම ලාභයක් ලබා ගන්නේ ජපන් වෙළෙඳ පොළෙන්. නමුත්, අද වන කොට ග්ලයිෆොසෙට් වල් නාශකය ගෙන්වීම නවතා තිබෙනවා. ඒ වෙනුවට අද වෙනත් රසායනික ද්‍රව්‍ය - chemicals - සහ රසායනික පොහොර යොදනවා. ඒ නිසා අද ජපන් වෙළෙඳ පොළේ ලොකු ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් ඒ ගැන කිව්වා. ජපන් වෙළෙඳ පොළෙන් අපේ තේ ප්‍රතික්ෂේප කරනවා. ජපන් වෙළෙඳ පොළට යවන container එකක තේ කිලෝ 20,000ක් පමණ තිබෙනවා. එක container එකක් ඩොලර් 120,000ක් පමණ වනවා. එවැනි වටිනාකමක් තිබෙන container ප්‍රතික්ෂේප කර ආපසු එවනවා. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳවත් ඔබතුමාගේ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය යම්කිසි පියවරක් ගෙන අපේ තේ සමාගම්වලට සහනයක් ලබා දෙන්න කටයුතු කළොත් ඒක ඉතාම වැදගත් වනවා.

අද අපේ තේවලට වැඩි ඉල්ලුමක් තිබෙන වෙළෙඳ පොළ තමයි, චීනය. ගරු ඇමතිතුමනි, පසුගිය දිනවල ඔබතුමා චීනයේ සංචාරය කළ බව ඔබතුමාගේ කථාවේදී කිව්වා. චීනය අපෙන් අය කරන බදු ප්‍රමාණය සියයට 30ක් පමණ වනවා. ඒ පිළිබඳව ඔබතුමා විශේෂයෙන්ම සාකච්ඡා කරලා, ඒ බදු ප්‍රමාණය අඩු කරන්න කටයුතු කළාද කියලා මම අහන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, තව කාරණයක් තමයි-

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
සියයට 7.5යි.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
හරි.

ගරු ඇමතිතුමනි, අපනයනය කරන තේ ටික නැවෙන් ගොඩ බෑවට පස්සේ දින 45ක පමණ කාලයක් වරායේ තිබෙනවා කියලා දැන ගන්නට ලැබුණා. ඒ ගැන සමාගම්වලින් තමයි මා දැනුවත්

[ගරු කනක හේරත් මහතා]

කළේ. දින 45ක් කියන්නේ, විශාල කාලයක්. එතකොට අපනයනකරුවන් LC විවෘත කරලා යවන මුදල් ටික ලබා ගන්න පුළුවන් වෙන්නේ ඒ තේ ටික චීන සමාගම්වලට ලැබුණාමයි. ඒ පිළිබඳවත් ඔබතුමා මැදිහත් වෙලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. මේ ටික තමයි මට කියන්න තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අද ගෙනෙන මේ සංශෝධනය මඟින් ඔබතුමා බලාපොරොත්තු වන්නේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත් කරන්නයි. ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා පත් කිරීම තුළින් තේ කර්මාන්තයේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමත්, සභාපතිවරයාට සහාය දීමත්, මණ්ඩලයේ කටයුතු කළමනාකරණයේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සභාපතිවරයාට සහාය දීමත් තමයි බලාපොරොත්තු වන්නේ.

ගරු ඇමතිතුමනි, ඒ පත් කරන්න බලාපොරොත්තු වන නිලධාරියා තේ පිළිබඳව විශාල දැනුමක් තිබෙන, මේ ක්ෂේත්‍රයේ වැඩ කර තිබෙන කෙනෙක් කියලා තමයි ඔබතුමා කියන්නේ. ඔබතුමා අද අමාත්‍යවරයා වශයෙන් ඉන්න පුළුවන්. නමුත් ඉදිරි අනාගතයේදී වෙනත් අමාත්‍යවරයෙක් පත් වුණාම, එතුමා එයට දේශපාලන පත්වීමක් කළොත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට මොකක්ද වෙන්නේ? මොකද, අද වනකොට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ගැටලු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තිබෙන ගැටලු මේවායි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරියෙක් අද ඩුබායිවල නැහැ. මා හිතන හැටියට චීනයේ සිටි නිලධාරියා නැවත කැඳවා තිබෙනවා. ජපානයේ ඒ කාර්යාලය වසා දමා තිබෙනවා. දැනට රුසියාවේ නිලධාරියෙක් ඉන්නවා. තේවලට ගැටලුවක් ඇති වුණාම එයට මුහුණ දෙන්න පුළුවන්, අපේ රටේ තේ ලෝකයේ හැම රටකටම ගෙන යන්න පුළුවන්, එය කළමනාකරණය කරලා marketing කරන්න පුළුවන් ජවසම්පන්න නිලධාරීන් පත් කර ගන්න එක මා හිතන හැටියට වැදගත් වෙනවා. අද ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එවැනි නිලධාරීන් ඉන්නවා. ජ්‍යෙෂ්ඨම නිලධාරීන් නැති වුණත් පහළ නිලධාරීන්ට ඒ අවස්ථාව ලබාදීලා, ඒ නිලධාරීන් ඩුබායිවලට, රුසියාවට, ජපානයට, චීනයට යැව්වාම, අපේ නිෂ්පාදන මීට වඩා වැඩි ප්‍රමාණයක් ඒ රටවලට ගෙන යන්න හැකියාවක් ලැබෙයි කියා බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. විශේෂයෙන්ම පසුගිය දිනවල අපේ ප්‍රදේශයේ කටු පොල් වගාව පිළිබඳව පැවති සාකච්ඡාවට ඔබතුමා පැමිණ, ඒ සඳහා විසඳුම් ලබා දෙන්න කටයුතු කිරීම ගැන මේ අවස්ථාවේදී ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මාසයක් වැනි කාලයක් කෑගල්ල දිස්ත්‍රික්කයේ කටු පොල් වගාව නවත්වා තිබෙනවා. එසේ නවත්වා තිබුණත්, එදා පැවති සාකච්ඡාවේදී ඔබතුමාට පරිසර වාර්තාව ලබා දුන් ඒ නිලධාරියා ඉවත් කර තිබෙනවා, එදා ඔබතුමාට ඒ දත්ත ලබා දුන් නිසා. ඒ පිළිබඳවත් සොයා බලා කටයුතු කරන්න. මොකද, මාසයක පමණ කාලයකට පමණයි ඔබතුමා ඒ කටු පොල් වගාව නවත්වා තිබෙන්නේ. ඊට පස්සේ නැවතත් කටු පොල් වගාව ආරම්භ කරනවා. අද වනකොට අපේ ප්‍රදේශවල නාය යෑම් සිදු වනවා; නාය යෑමේ අවදානමක් තිබෙනවා. මේ සිදුවීම් සියල්ලටම එක හේතුවක් තමයි කටු පොල් වගාව. දැනට තිබෙන රබර් ගස් කපා දමා නැවත වගා කරන්නේ නැතුව, කටු පොල් වගා කරන්න බලාපොරොත්තුවෙන් ඒවා ඔක්කොම නවත්වා ගෙන ඉන්නවා. ඒ නිසා එක පැත්තකින් අපේ ජල මූලාශ්‍ර නැති වනවා වාගේම, අනික් පැත්තෙන් නාය යෑමටත් ලක්වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට පක්ෂයේ තනතුරක් ලැබී තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ශුභ පතනවා. අපේ රටේ රබර් සහ තේ තුරන්වෙලා යන කර්මාන්තයන් නොවෙයි. ඉදිරියේදී ඔබතුමා මේ පක්ෂයේ නායකත්වයට එනකොට, මේ අමාත්‍යාංශයේ කටයුතු හොඳින් කරගෙන ගිහින්, මේ කර්මාන්ත දියුණු කරන්න පුළුවන් නායකයකු බවට පත් වෙන්න හැකියාව ලැබෙයි කියන බලාපොරොත්තුව ඇතුව ඔබතුමාට ශුභ පතනවා.

විශේෂයෙන්ම වතුකරයේ ජනතාව වෙනුවෙන් මේ කටයුත්තත් ඔබතුමාට කරන්න පුළුවන්. ඒ සඟයෝගයත් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද, පසුගිය දවස්වල සිද්ධ වුණු භූමිතෙල් මිල වැඩිවීම වැඩියෙන්ම බලපාන්නේ වතුකරයේ විදුලිය නැති ජනතාවටයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
හොඳයි, මා අවසන් කරන්නම්.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවා ආහාරයට සභාවේ කටයුතු නවත්වන්නේ නැතුව, දිගටම පවත්වාගෙන යන ලෙස මා යෝජනා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාවට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එකඟයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කනක හේරත් මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් කියපු ආකාරයට වතුකරයේ ජනතාවට නිවාස ලබාදීමේ වැඩ පිළිවෙළ ඉතාමත් වැදගත් වෙනවා. විශේෂයෙන්ම මධ්‍යම ප්‍රදේශයට ලබා දෙන නිවාස ප්‍රමාණයවත් අපේ දිස්ත්‍රික්කයට ලබා දෙන්නේ නැහැ. ඒ පිළිබඳවත් ඔබතුමා සොයා බලන්න. වතුකරයේ ජනතාවට තිබෙන ගැටලු පිළිබඳව සොයා බලන්න කියා මා ඔබතුමාට කියා සිටිනවා.

විශේෂයෙන්ම තව එක කාරණයක් මතක් කරන්න ඕනෑ. සමෘද්ධි සහනාධාරය ලැබිය යුතු කණ්ඩායමක් වතුකරයේ ජනතාව අතර ඉන්නවා. ඒ ගොල්ලන්ට සමෘද්ධි සහනාධාරය ලැබිලා නැහැ.

අපි මේ රජයෙන් විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. එනම්, සමෘද්ධි සහනාධාරය කපා හරින්න නොවෙයි, අද තිබෙන තත්ත්වය අනුව -අද තිබෙන දරිද්‍රතාව අනුව, අද තිබෙන බඩු මිල අනුව- අඩුම තරමින් සමෘද්ධිය රුපියල් ලක්ෂ පහක් දක්වාවත් වැඩි කරලා ජනතාවට සමෘද්ධි සහනාධාරය වැඩියෙන් ලබා දෙන්න කියලා. එම ඉල්ලීමත් කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තූතියි.

ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.32]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනය භොබවන ගරු මන්ත්‍රීතුමනි, මා හිතන හැටියට ඔබතුමා නියෝජ්‍ය කථානායක ධුරය දැරුවාට පස්සේ අද තමයි මූලාසනයේ වාඩි වෙලා ඉන්නේ. කෙසේ වෙතත් ඔබතුමාට අපි සුබ පතනවා. ඒ වාගේම අද ඉතා කාලෝචිත මාතෘකාවක් පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී මටත් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු අමාත්‍යතුමාටත්, ඔබතුමාටත් මගේ ස්තූතිය පුද කර සිටිනවා.

ඇත්තෙන්ම තේ වගාව පිළිබඳව ඉතා හොඳ අත් දැකීම් ඇති, තේ භූමි වට කර ගෙන ජන්ම ලාභය ලැබූ අපේ ගරු අමාත්‍යතුමා අද උදේ සිට මේ දක්වා මේ සභාවේ රැඳී සිටිමින් මේ විවාදයට සවන් දෙමින්, තේ කර්මාන්තය අද තිබෙන තත්ත්වයෙන් ඉදිරියට ගෙන යෑම සඳහා ගන්නා වූ උත්සාහය අපි බොහොම අගය කරනවා. ඒ වාගේම එතුමාගේ ඒ සියලු කටයුතු සාර්ථක වේවා කියා මා ප්‍රාර්ථනය කරනවා. අද උදේ එතුමා එක්සත් ජාතික පක්ෂයේ ජාතික සංවිධායක ධුරය ලබා ගත් අවස්ථාවට අපත් සම්බන්ධ වුණා. ඊට පසුව මේ විවාදයට සම්බන්ධ වන මේ මොහොත ඒ සම්බන්ධයෙන් එතුමාට සුබ පැතුම් පුද කරන්න මා අවස්ථාවක් කර ගන්නවා. තමන්ගේ දේශපාලන ජීවිතය ඉදිරියට ගෙන යෑම සඳහා අපි එතුමාට ශුභාශිංසන පිරිනමනවා. ඒ වාගේම මා නියෝජනය කරන කන්ද උඩරට ප්‍රදේශයට එම තනතුර -එම නායකත්වය- ලැබීම පිළිබඳවත් මා බොහොම සතුටට පත්වනවා.

මා නියෝජනය කරන කොටියාසය ගත්තාම ජාතික ආදායමට මුදල් සම්භාරයක් අපේ කොටියාසයේ තේ වගාවෙන් එකතු වනවා වාගේම, අපේ කොටියාසයේ ජනතාවත් වැඩිම ආදායමක් ලබා ගන්නේ තේ වගාවෙන්. කුඩා තේ කර්මාන්තය නඟා සිටුවීම සම්බන්ධයෙන් එතුමා ගන්නා වූ උත්සාහය පිළිබඳව කුඩා තේ වතු හිමියන් හැටියට අපි බොහොම සතුටු වනවා.

මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන ආසන 12න් වැඩිම කුඩා තේ වතු හිමියන්, කුඩා තේ වතු පාලකයින්, කුඩා තේ වතු වගාවන් කරන්නේ නාවලපිටිය මැතිවරණ කොටියාසයේ. සුදු මහත්වරුන්ගේ පාලන සමයේ පටන් ගත් මේ තේ වගාව අපේ කොටියාසයේ මහා පරිමාණයෙන් ව්‍යාප්ත වෙලා තිබුණත්, මා ඔබතුමාට යෝජනාවක් කරනවා. වසා දැමූ තේ කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් අපේ කොටියාසයේ තිබෙනවා. Somerset Tea Factory එක මහ පාරක් අයිනේ තිබෙන්නේ. එනම්, දොලොස්බාගේ පාරට මායිමිව තිබෙන්නේ. ඒ වාගේම ගල්පාය තේ කර්මාන්තශාලාවත් අද වසා දමා තිබෙනවා. ඒ, අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ නිවසට ඉහළින් තිබෙන තේ කර්මාන්තශාලාව. ඒ වාගේම රාජ්‍ය වැවිලි සමාගමට අයිති තේ කර්මාන්තශාලාවක් උලපනේ තිබෙනවා. අපේ කොටියාසය ගත්තාම මහවිල වත්තේ තේ කර්මාන්තශාලාවක් තිබෙනවා. මේ කර්මාන්තශාලාත් වසා දමා තිබෙන්නේ. ඒ වාගේම කබරගල කොටියාසයේ තේ කර්මාන්තශාලාවක් තිබෙනවා. ඒකත් වසා දමා තිබෙන්නේ. මා හිතන හැටියට නීති ප්‍රශ්නයක් නිසා මොන්ටික්‍රිස්ටෝ කර්මාන්තශාලාවත් වසා දමා තිබෙනවා. මේ කර්මාන්තශාලා වසා දැමීම හේතුවෙන් අපේ කොටියාසයේ නිෂ්පාදනය කරන තේ එක්කෝ මාවනැල්ල ප්‍රදේශයට, නැත්නම් අරණායක ප්‍රදේශයට, නැත්නම් බුලත්කොහුපිටිය ප්‍රදේශයට, නැත්නම් උඩුදුම්බර ප්‍රදේශයේ යටගහවෙල ආදී tea factoriesවලට ප්‍රවාහනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. එනම්, ඔබතුමා ඉතා ක්‍රියාකාරීව කටයුතු කරන ඇමතිවරයෙකු හැටියට; අපේ විශ්වාසය දිනා ගත් ඇමතිවරයෙකු හැටියට; පොළොවේ පය ගසා සිටින ගරු ඇමතිවරයෙකු හැටියට; මේ කර්මාන්තය පිළිබඳ ඉතා හසළ අත් දැකීම් තිබෙන ඇමතිවරයෙකු හැටියට මේ වසා දමා තිබෙන කර්මාන්තශාලා ඔබතුමාගේ අධීක්ෂණය යටතේ නැවත විවෘත කරලා අපේ කොටියාසයේ නැවත ඒ තේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා. මා හිතන විධියට අපේ කොටියාසයේ නිෂ්පාදනය කරන තේ පිට කර්මාන්තශාලා සඳහා ගෙන යෑම වෙනුවෙන් ප්‍රවාහනය සඳහා විශාල මුදලක් වැය කළ යුතුව තිබෙනවා. එම නිසා නැවත මේ කර්මාන්තශාලා විවෘත කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස මා ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලයේ නොවෙයි පසුගිය කාල පරිච්ඡේදයේ ග්ලයිෆොසේට් තහනම නිසා අපේ කොටියාසයේ කම්කරුවන්ට මහා බරපතළ ප්‍රශ්නයක් වුණා. දැන් ඒ තහනම ඉවත් කරලා තේ කර්මාන්තය සඳහා ඒ රසායන ද්‍රව්‍ය පාවිච්චි කිරීමට අවසර ලැබී තිබෙනවා. ඒ කියන්නේ මහා පරිමාණයේ තේ කර්මාන්තය සඳහා පමණක්. ඒ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් ලැබෙනතුරු ග්ලයිෆොසේට් මේ රටට ගෙන්වා තේ කර්මාන්තය සඳහා යොදා ගැනීමට අවකාශ ලබා දෙන ලෙස කරන ලද ඔබතුමාගේ ඉල්ලීමට රජය ඇහුම්කන් දී කැබිනට් මණ්ඩලයෙන් ඒකට අනුමැතිය ලැබී තිබෙනවාය කියන ආරංචිය තිබෙනවා. කෙසේ වෙතත්, තේ කර්මාන්තය නඟා සිටුවීම සඳහා අත්‍යවශ්‍ය කටයුතු සකස් කර දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

දැනට සහනාධාරය ලෙස රුපියල් 1500ක මුදලකට පොහොර ලබා ගැනීමට අපට අවකාශ ලැබී තිබෙනවා. තේ කර්මාන්තය පාරම්පරිකව කරන කර්මාන්තකරුවන් නිසා තමයි අද තේ කර්මාන්තය මේ තත්ත්වයෙන් රැඳී තිබෙන්නේ. කම්කරු ප්‍රශ්නයට උත්තරයක් නොමැති නිසා, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් සහ අනෙකුත් රජයේ ඉඩම් තුළ තිබෙන තේ කර්මාන්තශාලා ඇතුළු ඒ සියලු තේ වතු අද කඩා වැටෙමින් පවතිනවා. කුඩා කර්මාන්තකරුවන් තමයි අද තේ කර්මාන්තය ඉතා සාර්ථකව කරගෙන යන්නේ. එම නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ රජය සතු අනෙකුත් සියලු ඉඩම්වලින් මෙතෙක් කල් ඒ ඉඩම්වල වැඩ කළ කම්කරුවන්ට අක්කරය හෝ දෙක බැගින් ලබා දීලා, ඒ කම්කරුවන් ලවාම මේ තේ වතු නඩත්තු කරවා, ඒවාට රජයේ ආධාරත් ලබා දීලා ක්‍රියා කරන්න කියලා. එතකොට මීට වඩා සාර්ථකව මේ තේ කර්මාන්තය කරගෙන යන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ කාරණය සඳහාත් ඔබතුමාගේ අවධානය යොමු කර සිටිනවා.

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

ගරු දිගම්බරම් ඇමතිතුමා අපේ කොට්ඨාසයේ ගෙවල් 14ක් විතර හදලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ වගා නොකළ ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපේ ආසනයේත් එවැනි විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ ඉඩම්වලින් පර්චස් හත ගණනේ කම්කරුවන්ට බෙදන්න මේ රජය තීරණයක් අරගෙන තිබෙනවා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මන්ත්‍රීවරු හැටියට අපි සංවිධාන කරන ආසනවල - අපේ ආසනවල විතරක් නොවෙයි, මහනුවර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, සමස්ත රටේම - ඔබතුමා යටතේ තිබෙන ඉඩම් තිබෙනවා. ඒවායේ නිවාස සාදා ගැනීම සඳහා ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ සහයෝගය අපට ලබා ගන්න පුළුවන්. මේ කාරණයට මැදිහත් වෙලා, ඔබතුමා යටතේ තිබෙන මේ ඉඩම්වලින් ඉඩම් නොමැති වතු කම්කරු ජනතාවට වාගේම අනෙකුත් ගම්වාසී ජනතාවටත් පර්චස් හත ගණනේ බෙදා දීම සුදුසුයි කියන කාරණය ඔබතුමාට ඉතා වුවමනාවෙන් මතක් කරනවා.

තේ කර්මාන්තය නඟා සිටුවීම සඳහා තේ පැළය, උදැල්ල, කැත්ත, පිහිය, පොහොර ආදී සියලු දේ ලබා දෙමින් අවුරුදු පහක් යනතෙක් අද රජයෙන් සහයෝගය ලැබී තිබෙනවා. තරුණ ඇමතිවරයකු හැටියට, මේ කර්මාන්තය පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන ඇමතිවරයකු හැටියට ඔබතුමා මේ අමාත්‍යාංශය භාරව සිටින කාලය තුළ මේ කර්මාන්තය ඉදිරියට ගෙන යමින් මේ රටේ ජනතාවගේ හිත සුව පිණිස කටයුතු කරන්න හැකියාව ලැබේවායි කියා ඔබතුමාට අපේ ශුභාශිංසනය පුද කරනවා. කථා කිරීමට කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Gnanamuthu Srineshan, please. You have 13 minutes.

[பி.ப. 12.40]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது இலங்கை நாட்டின் முக்கியமான ஓர் ஏற்றுமதிப் பயிரான தேயிலையுடன் தொடர்புடைய இலங்கைத் தேயிலைச் சபை பற்றிய விடயம் இன்றைய விவாதத்தின் கருப்பொருளாக எடுத்துக் கொள்ளப்பட்டிருக்கின்றது. அந்த வகையில், இலங்கைத் தேயிலைச் சபையின் செயற்பாடுகள் மற்றும் அதன் போக்குகள் பற்றிய விடயங்களை நாங்கள் கவனத்தில் கொள்ள வேண்டியிருக்கின்றது. இலங்கைக்கு வருமானத்தை ஏற்படுத்தித் தருகின்ற முக்கியமான துறைகளாக அதிலும் குறிப்பாக கூடுதலான பெண்கள் பணியாற்றுகின்ற தொழிற்றுறைகளாக மூன்று துறைகளை குறிப்பிடலாம். அவற்றில் ஒன்று தேயிலை உற்பத்தித் தொழிற்றுறை; அடுத்தது, ஆடை உற்பத்தித் தொழிற்றுறை; மற்றது, மத்திய கிழக்கில் பணியாற்றுகின்ற எமது பெண்கள் ஈடுபடுகின்ற தொழிற்றுறை. இவற்றில் பெண்களின் சக்தியைப் பயன்படுத்தக்கூடிய ஒரு துறையாகப் பெருந்தோட்டத்துறை குறிப்பாக தேயிலை உற்பத்தித்துறை அமைந்திருக்கின்றது. இலங்கையின் மொத்த ஏற்றுமதி வருமானத்தில் தேயிலை மூலமாகக் கிடைக்கின்ற வருமானத்தின் புள்ளிவிபரத்தைப் பார்க்கின்றபோது, அது 2013ஆம் ஆண்டில் 14.8 வீதமாகவும் 2014ஆம் ஆண்டில் 14.6 வீதமாகவும் காணப்படுகின்றது என்றால், மொத்தத் தேசிய வருமானம் 14.8 வீதத்திலிருந்து 14.6 வீதமாக இறங்கியிருக்கின்றது. 2015ஆம் ஆண்டில் 12.7 வீதமாகக் குறைந்திருக்கின்றது. 2016 இல் 12.3 வீதமாக இருந்து, 2017 இல் 13.4 வீதமாக அதிகரித்து, 1.1 வீதம் அளவில் வளர்ச்சி ஏற்பட்டிருக்கின்றது.

எது எவ்வாறாக இருந்தாலும், பெருந்தோட்டத் தொழிற்றுறையில் நாங்கள் முக்கியமாக மூன்று பயிர்களைப் பற்றிக் குறிப்பிடுகின்றோம். ஒன்று தேயிலை; அடுத்தது இறப்பர்; மற்றது தென்னை. அந்த மூன்று பயிர்களிலும் அதிகம் வெளிநாட்டு வருவாயினை - அந்நியச் செலாவணியை பெற்றுத் தருகின்ற துறையாக தேயிலை உற்பத்தித் துறை காணப்படுகின்றது. எனவே, உலக சந்தையில் போட்டியிட்டு இலங்கைத் தேயிலைக்கு ஒரு சந்தைமானத்தைப் பெறக்கூடிய விதத்தில், அந்தத் துறையை நவீனமயப்படுத்த வேண்டும். அதன்மூலமாகத்தான் ஏனைய நாடுகளில் எமது தேயிலைக்குரிய கிராக்கி அல்லது demand அதிகரிப்பதற்குரிய வாய்ப்பு இருக்கின்றது. தேயிலை உற்பத்தியில் எமது நாடு தனியுடைமையாக ஈடுபடவில்லை. ஆகவே, இவ்வேற்றுமதியில் பல நாடுகளும் போட்டியிடுகின்றபோது, எமது தேயிலையின் தரத்தை உயர்த்திக்கொள்ளவேண்டிய அவசியம் இருக்கின்றது. இல்லாதுவிட்டால், வெளிநாட்டுச் சந்தையில் போட்டியிடும்போது எமது தேயிலைக்கான சந்தைவாய்ப்பு கவலைக்கிடமாக மாறுவதற்கு வாய்ப்பிருக்கின்றது. தேயிலை உற்பத்தியில் ஈடுபடுகின்ற தோட்டப்புறத் தொழிலாளர்களது வாழ்க்கைத் தரத்தினை உயர்த்துவதானது தேயிலையின் தரத்தினை உயர்த்துவதோடு சார்ந்து பயணிக்கின்ற ஒரு செயல்பாடாக இருக்கின்றது. உழைப்பில் ஈடுபடுகின்ற தோட்டத் தொழிலாளர்கள் திருப்தியடைகின்றபோது அவர்கள் உத்வேகமாகச் செயல்பட்டு உற்பத்தியின் அளவை அதிகரிக்கக்கூடிய ஓர் உளவியல் தன்மையைக் காணக் கூடியதாக இருக்கும்.

கடந்த காலத்தில் தோட்டத் தொழிலாளர்களுக்குச் சில சந்தர்ப்பங்களில் அநியாயங்களும் இழைக்கப்பட்டிக்கின்றன. 1948 - 1949 களில் கொண்டுவரப்பட்ட பிரஜாவுரிமைச் சட்டம், வாக்குரிமைச் சட்டம் என்பன அவர்களுக்குப் பாதகத்தை ஏற்படுத்தினாலும், இதற்கொரு பரிகார முறையாக 1977ஆம் ஆண்டுக்குப் பிற்பட்ட காலத்தில் அவர்களுக்குப் பிரஜாவுரிமை வழங்கப்பட்டது. பிரஜாவுரிமை வழங்கப் பட்டிருந்தாலும்கூட, மற்றைய மக்களோடு ஒப்பிட்டுப் பார்க்கின்றபோது அவர்களுடைய வாழ்க்கைத் தரம் மற்றும் வாழ்க்கைக் கோலம் என்பன குறைந்த மட்டத்தில் காணப்படுகின்ற நிலைமை காணப்பட்டது. அதாவது, அவர்கள் தனி வீடுகளில் அல்லாமல் வெள்ளைக்காரரின் ஆட்சியில் எப்படி வாழ்ந்தார்களோ அதே 'லயன்' அறைகளில் வாழ்கின்ற ஒரு நிலைமை காணப்பட்டது. ஆனால், இன்று அவர்களுக்குத் தனி வீடுகளைக் கட்டிக்கொடுக்கின்ற முற்போக்கானதொரு செயற்பாடு முன்னெடுக்கப்படுவதை நாங்கள் வரவேற்கின்றோம். குறிப்பாக, பெருந்தோட்டத்தில் வேலை செய்கின்ற தோட்டப்புற மக்களுக்கு வீட்டு வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதற்கென்று கௌரவ திகாம்பரம் அவர்களின் தலைமையில் ஓர் அமைச்சு செயற்படுத்தப் படுகின்றமையால், அவர்கள் தனி வீடுகளைப் பெற்றுக் கொள்ளக்கூடிய சந்தர்ப்பம் ஓரளவாவது ஏற்பட்டிருக்கின்றது.

எது எப்படியாக இருந்தாலும் உழைப்பில் ஈடுபடுகின்ற தொழிலாளர்கள் - கூலியாட்கள் அல்லது பணியாட்கள்

திருப்தியீனம் அடைகின்றபோது அந்த உற்பத்தியினை வளர்த்துக்கொள்வதென்பது அல்லது அதிகரித்துக் கொள்வதென்பது கடினமான காரியமாக அமைந்துவிடும். பொதுவாக மே தினத்தின்போது தொழிலாளர்களின் கோரிக்கைகள் சம்பளம் அதிகரிக்கப்பட வேண்டியதாக இருந்தாலும், குறித்த ஓர் ஆண்டில் சிங்கப்பூரில் - அந்த ஆண்டு எனக்கு ஞாபகத்துக்கு வரவில்லை - தமது சம்பளத்தை அதிகரிக்கத் தேவையில்லை என்று தொழிலாளர்கள் சொல்லக்கூடிய ஒரு நிலைமை இருந்தது. ஆகவே, தொழிலாளர்கள் திருப்திகரமான நிலையில் பணியாற்றிக் கொண்டிருக்கின்ற நிலைப்பாடு அங்கு காணப்படுகின்றது. தொழிலாளர்கள் திருப்தியடைகின்றபோது உற்பத்தியின் அளவு மற்றும் தரம் அதிகரிக்கப்டுவதற்குரிய சந்தர்ப்பங்கள் அதிகமாக ஏற்படும். எனவே, தோட்டத் தொழிலாளர்களுக்குரிய, குறிப்பாக தேயிலை உற்பத்தியில் ஈடுபடுகின்ற தொழிலாளர்களுக்குரிய, வீட்டு வசதி மற்றும் உட்கட்டமைப்பு வசதிகளை அதிகரிக்கின்றபோது அதற்கு நன்றிக்கடனாக அவர்கள் உச்ச உழைப்பினை மேற்கொண்டு உற்பத்தியை அதிகரிப்பதிலும் தரத்தை உயர்த்துவதிலும் பங்களிப்புச் செய்வார்கள்.

இன்றைய காலகட்டத்தில் மரபு முறை மற்றும் நவீன முறை நடைமுறையில் இருக்கின்றன. எங்களுடைய மக்கள் மரபு முறையை வரவேற்றாலும் அந்த முறை சில சந்தர்ப்பங்களில் காலாவதியான முறையாகக் கருதப்படுகின்றது. அந்த வகையில் வினைத்திறன் குறைந்த முறையாகவும் விளைதிறன் குறைந்த முறையாகவும் கணிக்கப்படுகின்றது. உண்மையில் "காலத்திற்கேற்ற கோலம்" என்ற அடிப்படையில், காலத்திற்கேற்ற விதத்தில் வெளிநாடுகளில் ஏற்படுகின்ற மாற்றங்களை அனுசரித்து அவற்றோடு போட்டியிடக் கூடியவிதத்தில் எமது தேயிலை உற்பத்தியை அதிகரித்துக் கொள்வதற்கு நடவடிக்கை எடுக்கவேண்டிய தார்மீகப் பொறுப்பு இலங்கைத் தேயிலைச் சபைக்கும் தேயிலை உற்பத்தியில் ஈடுபடுகின்ற கம்பனிகளுக்கும் இருக்கின்றது.

நல்லாட்சியில் சகலவிதமான மக்களும் திருப்தியடையக் கூடிய நிலைமை இருக்க வேண்டும். திருப்தியடைய வேண்டிய பிரிவுகளில் ஒரு பிரிவினராக இருப்பது தேயிலை உற்பத்தியில் ஈடுபடுகின்ற தோட்டப்புறத் தொழிலாளர்கள். ஆனால், அவர்களுடைய வாழ்விடங்களை எடுத்துப் பார்கின்றபோது அவை போக்குவரத்து வசதிகள், குடிநீர் வசதிகள் குறைந்தனவாக இருப்பதைக் காணலாம். சிலவேளைகளில் மண்சரிவு போன்ற அபாயகரமான நிலைமைகளை எதிர்நோக்குகின்றவர்களாகவும் அவர்கள் காணப்படு கின்றார்கள். வெள்ளம் வந்த பின்னர் அணைகோலுவதைவிட வெள்ளம் வருவதற்கு முன்பு அணைகோல வேண்டும். அந்த வகையில் அவர்களின் பிரச்சினைகள் முன்கூட்டியே தீர்த்து வைக்கப்பட வேண்டும். எனவே, அவர்களின் தேவை கட்டங்கட்டமாகவேனும் அரசாங்கத்தின்மூலம் நிறைவேற்றப் படவேண்டும் என்று எதிர்பார்க்கப்படுகின்றது.

குறிப்பாக உற்பத்தித் துறையைப் பொறுத்தமட்டில், அதில் ஆண்களின் சக்தியும் பெண்களின் சக்தியும் பிரயோகிக்கப் படுகின்றன. பெண்கள் மத்திய கிழக்கில் பணியாற் றுகின்றார்கள்; ஆடைத் தொழிற்சாலைகளில் பணியாற் றுகின்றார்கள். இருந்தபோதிலும் ஆண்களுக்கு நிகராகப் பெண்களுக்குரிய சக்தியை வழங்கக்கூடிய ஒரு துறையாக தேயிலைத் தொழிற்றுறை அமைந்திருக்கின்றது. எனவே, இந்தப் பெண் தொழிலாளர்களின் ஊதியம் - சம்பள விடயங்களிலும்கூட கூடுதலாக அக்கறை செலுத்த வேண்டும்.

"எங்கெல்லாம் தொழிலாளர்கள் மோசமாகப் பாதிக்கப்படுகின்றார்களோ, அங்கெல்லாம் வர்க்க ரீதியான புரட்சிகள் ஏற்படும்" என்பது கால்மாக்ஸ் அவர்களுடைய கருத்தாக அமைந்திருக்கின்றது. எனவே, இப்படியான கருத்துக்கள் முன்னெச்சரிக்கையாக இருக்கின்றன. இந்த முன்னெச்சரிக்கையான கருத்துக்களை கவனத்திற்கொண்டு, தோட்டத் தொழிலாளர்களது வாழ்க்கைத் தரத்தினை உயர்த்துவதன் மூலமாகத் தேயிலை உற்பத்திகளின் தரத்தினையும் உயர்த்திக்கொண்டு செல்வதென்பது ஒரு முற்போக்கான செயற்பாடாக, முற்போக்கான சிந்தனையாக அமையும். அவற்றில் ஒன்றாகத்தான் தோட்டத் தொழிலாளர் களுக்குத் தனி வீடுகளை அமைத்துக் கொடுக்கின்ற அல்லது அவர்களுக்கு நிலங்களைப் பகிர்ந்தளிக்கின்ற செயற்பாடு காணப்படுகின்றது. இதனை நாங்கள் வரவேற்கின்றோம். இப்படியான செயற்பாடுகள் முன்கொண்டு செல்லப்படுகின்ற போது அவர்களுடைய வேதனம் - சம்பளம் என்கின்ற விடயமும் முக்கியமாகக் கவனத்தில் எடுக்கப்பட வேண்டியிருக்கின்றது.

வாழ்வாதாரத்திற்கு உழைப்பதற்கு ஏற்ற ஊதியம் கிடைக்க வேண்டும் என்கின்ற கோரிக்கை அடிக்கடி முன்வைக்கப் படுகின்றது. இந்த விடயத்தில் தொழிற்சங்கங்களும் கவனம் செலுத்திக்கொண்டிருந்தாலும்கூட, தொழிற்சங்கங்களுக்கிடை யிலான சில முரண்பாடுகள் காரணமாக, சில சம்பள உயர்ச்சிகளைப் பெறுகின்ற விடயத்தில் தொழிலாளர்கள் தங்களுக்குள் முரண்பட்டுக் கொள்கின்றபோது, அது தொழிலாளர்களுக்குப் பாதகமாக அமைகின்ற தன்மையையும் எதிர்நோக்கக்கூடியதாக இருக்கும்.

2017ஆம் ஆண்டின் புள்ளிவிபரத்தின்படி இலங்கையின் மொத்த ஏற்றுமதி வருமானத்தில் 13.4 வீதம் தேயிலை உற்பத்திமூலம் கிடைக்கின்ற வருமானமாக அமைந்திருக் கின்றது. அது முன்னைய ஆண்டைவிட 1.1 வீதத்தினால் அதிகரிக்கப்பட்ட ஒரு நிலைமை காணப்பட்டாலும், 2013ஆம் ஆண்டின் புள்ளிவிபரத்தைப் பார்க்கின்றபோது, அது 14.8 வீதமாக இருக்கின்றது. இப்போது 13.4 வீதமாக இருக்கின்றதென்றால், அது 1.4 வீதத்தால் குறைந்திருப்பது தெரிகின்றது. எனவே, இந்த விடயங்களை ஆய்வுக் குட்படுத்தி, அவற்றின் மூலமாகக் கிடைக்கின்ற முடிவுகளை வைத்துக்கொண்டு, இந்த உற்பத்தித் துறையினை அறிவியல் பூர்வமாக அதிகரித்துக்கொண்டு அதாவது உற்பத்தியின் அளவினை, உற்பத்தியின் தரத்தினை அதிகரித்துக்கொண்டு செல்வதற்குரிய ஆக்கபூர்வமான நடவடிக்கைகளை அமைச்சர் அவர்கள் மேற்கொள்வார் என்ற நம்பிக்கையிருக்கின்றது.

இளம் தலைமுறையினருக்கு அமைச்சுப் பதவிகள் கிடைக் கின்றபோது, அவர்கள் உத்வேகமாகச் செயற்படுவார்கள் அல்லது தங்களுடைய சக்தியினைக் கூடுதலாக அந்தத் துறைக்குப் பயன்படுத்துவார்கள் என்ற நம்பிக்கை எமக்கு இருக்கின்றது. தற்போது தோட்டப்புறத்தில் வீடுகளை அமைத்துக் கொடுப்பதற்காக இருக்கின்ற அமைச்சர் அவர்கள் ஓர் இளைஞராக இருக்கின்ற அதேவேளை, பெருந்தோட்டக் கைத்தொழில் துறைக்குப் பொறுப்பாக இருக்கின்ற அமைச்சர் அவர்களும் ஓர் இளைஞராக இருக்கின்றார். இந்த இருவரும் இணைந்து தோட்டப்புறத் தொழிலாளர்களின் வாழ்க்கைத் தரத்தினையும் தேயிலை உற்பத்தியின் தரத்தினையும் உயர்த்த வேண்டும். ஏனைய நாடுகளோடு ஒப்பிடுகின்றபோது, எமது நாட்டிற்குரிய தேயிலையின் தரத்தினை ஓர் உயர்ந்த நிலையில் பேணுமாறு கேட்டு, எனது உரையினை நிறைவு செய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.53]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡාවට භාජන වන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා සන්තෝෂ වනවා. විශේෂයෙන්ම අපේ වැවිලි කර්මාන්ත අමාත්‍ය නවීන් දිසානායක මැතිතුමාට සුබ පතන්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. එතුමා අපේ පක්ෂයේ අභිනව ජාතික සංවිධායකවරයා හැටියට පත් වුණා. අද තමයි එතුමා වැඩ භාර ගත්තේ. අපේ පක්ෂයට අලුත් නායකත්වයක් දීලා ලංකාව පුරා සංවිධාන කටයුතු කරන්න එතුමාට හැකියාව ලැබෙනවා.

ලංකාව ගැන කථා කරන කොට, අපේ ප්‍රධාන අපනයන භෝගය සහ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ තේ කියලා අපි දන්නවා. ඈත අතීතයේ ඉඳලාම අපේ පාඩම් පොත්වලිනුත් අපි එය දැනගෙන තිබෙනවා. අතීතයේ සිට පැවතෙන, අපට සුද්දාගෙන් ලැබුණු දායාදයක් වන මේ තේ වගාව සම්බන්ධයෙන් අද වන විට ඇතිවෙලා තිබෙන තත්ත්වය සහ මීට පෙර පැවැති රජයන් ගණනාවක් යටතේ ඇතිවෙලා තිබෙන තත්ත්වයත් නිසි කළමනාකාරිත්වයකින් යුතුව ඉදිරියට ගෙනයන්න අපේ අලුත් ඇමතිතුමාට හැකියාව තිබෙනවා. සමහර කාර්යයන්වලදී අපි එතුමාත් සමඟ සාකච්ඡා කර තිබෙනවා. මා පෞද්ගලිකව දන්නා පරිදි එතුමාට මේ සම්බන්ධයෙන් තිබෙන දැක්ම සහ හැකියාව අපට ඉතාමත් හොඳින් ප්‍රයෝජනයට ගන්න හැකියාව ලැබෙයි කියා බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම මෙම නව සංශෝධන පනත් කෙටුම්පතත් එක්ක.

ගරු ඇමතිතුමනි, තේ මණ්ඩලයේ සිටින සමහර නිලධාරීන් සම්බන්ධයෙන් වූ එක්තරා කාරණයක් ගැන මට මේ මොහොතේ මතක් වෙනවා. මේක මගේ පෞද්ගලික අත් දැකීමක්. මේ සිද්ධිය වුණේ 2007 වසරේ නැත්නම් 2008 විතර. ජපානයේ හිටපු තේ මණ්ඩල නියෝජිතයා දවසක් මගේ ගෙදරට ආවා, මට මතකයි. එතුමාට උදේ තේ බොන්න සූදානම් කළත් එතුමා තේ බිව්වේ නැහැ. එතුමා තේ බොන්නේ නැතිව නිශ්ශබ්දව සිටි නිසා මම ඇහුවා "ඇයි, තේ බොන්නේ නැද්ද?" කියලා. එතකොට wife හෙමිනිට කිව්වා, "එයා තේ බොන්නේ නැහැ, එයා බොන්නේ කෝපි" කියලා. මම මේ කියන්නේ සත්‍ය කථාවක්. තේ මණ්ඩලයෙන් පිට රටවලට යවපු සමහර නිලධාරීන් තේ බොන්නේ නැති, කෝපි බොන අය. මේක මගේ අත් දැකීමක්. ඒ නිසා, තේ මණ්ඩලයෙන් විදේශ රටවල සේවය සඳහා යවන නිලධාරීන් පිළිබඳව ඔබතුමා හොඳ සොයා බැලීමක් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. තේ නොබී කෝපි බොන අයව කිසිම රටකට යවන්න එපා. මොකද, තමන්ගේ පුරුද්ද නිසා තමන් කරන රැකියාවත් අමතක වුණු එවැනි නිලධාරීන් සිටින බව අපි දැක්කා. එම නිසා ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වීමෙන් පසු තේ මණ්ඩලයේ සිටින නිලධාරීන්ට ඒ සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ අයගේ habits සමාලෝචනයට ලක් කළොත් හොඳයි. අපි විදේශීය රටකට ගියාම කෝපි බොන්න කැමති වුණත්, අපේ table එකේ ඉන්න foreignersලා පිරිස වැඩි නම් අපි තේ බොනවා. හේතුව, තේ බොන ගමන් "Ceylon tea" කියන එක promote කරන්න අපට අවස්ථාවක් ලැබෙනවා. ඒ කියන්නේ අපි පෞද්ගලිකව දන්නවා; අපි අත් දැකීමෙන් දන්නවා, පිට රටකට ගියාම අපි ඉඹේම tea ambassadorsලා වෙන බව. මේ රටින් පිට රටවලට යන අපේ සියලුම ශ්‍රී ලාංකිකයන් tea ambassadorsලා වෙනවා නම්, දේශීය තේ සඳහා තිබෙන ඉල්ලුම, "Ceylon tea" කියන නාමය තව තවත් ඉදිරියට ගෙන යන්න අපට පුළුවන්. ඒක මගේ පෞද්ගලික අත් දැකීමක් නිසායි ඔබතුමාත් සමඟ බෙදාගන්න කල්පනා කළේ.

තේ පර්යේෂණායතනය ගැන කථා කරනවා නම්, ඔබතුමා තේ පර්යේෂණායතනය හරහා අලුතින් වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න ලැහැස්ති වුණු බව මා දන්නවා. නමුත්, තේ පර්යේෂණායතනය හා සම්බන්ධ සමහර ආයතන ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. අපි ඒ පිළිබඳවත් සාකච්ඡා කළා. තේ පර්යේෂණායතනය මීට වඩා සක්‍රිය කළ යුතුයි; මීට වඩා පර්යේෂණ පැත්තට යොමු විය යුතුයි කියා අපි හිතනවා.

එක් අංශයක් හැටියට නැනෝ තාක්ෂණය භාවිත කර තේවල ප්‍රමිතිය වැඩි කරන්නේ කොහොමද, flavoured tea සමඟ තේවල තිබෙන ඒ සංඝටක එක්ක එහි ප්‍රමිතිය තවත් ඉහළට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන අපට කල්පනා කරන්න පුළුවන්. අද වන කොට ලෝකයේ නැනෝ තාක්ෂණයත් එක්ක තේ, කෝපි වැනි බීම සම්බන්ධයෙන් අපි එවැනි පැත්තකට යොමු වෙලා තිබෙනවා. ඒ නිසා තේ පර්යේෂණ ආයතනය ගැන වැඩි අවධානයක් යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමනි, අපිත් ඔබතුමා සමඟ ඉන්නවා. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට මේ ආයතන ටික නැත්නම් ඒවා ඔබතුමාගේ අමාත්‍යාංශයට ලබා දෙන්න ඕනෑ. වෙනත් අමාත්‍යාංශ යටතේ තිබුණාට වැඩක් නැහැ. තේ පර්යේෂණ ආයතනය තිබෙන්න ඕනෑ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේයි. ඒ කාරණයේදී අපි ඔබතුමා එක්ක ඉන්නවා.

ඊළඟට, තේ වතුවල තිබෙන නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා පර්චස් 7ක් දෙනවාය කියන කාරණයට විරුද්ධ කෙනකු හැටියටයි මම කථා කරන්නේ. මොකද, අපි පර්චස් 7 ගණනේ ලක්ෂයකට දුන්නොත්, පර්චස් ලක්ෂ 7ක් තේ වතුවලින් බෙදන්න වෙනවා. ඒක ඊට වඩා වෙනස් ආකාරයකින් කරන්න පුළුවන් නම් හොඳයි. එහිදී මහල් නිවාස යෝජනා ක්‍රම කොච්චර ගැළපෙනවාද කියන එක සාකච්ඡා කරලා, තේ වතුවල ඉන්න ශ්‍රමිකයන්ට, කම්කරුවන්ට, තේ වතු ආශ්‍රිත වඩාත් දියුණු වූ මහල් නිවාස ක්‍රමයක් හඳුන්වා දෙන්න පුළුවන් නම්, පර්චස් 7ක් දෙනවාට වඩා ඵලදායී වේවි; අපේ තේ වතු ටික තව ටිකක් රැක ගන්නත් පුළුවන් වේවි. මේක මගේ පෞද්ගලික මතයයි. දේශපාලනිකව ගත්තොත් නම් මා මේ කියන කථාව නිසා සමහර කුඩා දේශපාලන පක්ෂ මා එක්ක තරහා වේවි. නමුත්, අපි අනාගතය ගැන කල්පනා කළ යුතුයි. අපේ තිබෙන තේ වතු ප්‍රමාණය දිගින් දිගටම අඩු වුණොත්, ප්‍රමිතිගත "Ceylon tea" නාමය හෙමින් හෙමින් අපෙන් ගිලිහී යන්න පුළුවන්. මොකද, අද වන විට කෙන්යාව වැනි රටවල්, ඉන්දියාවේ සමහර පළාත් වාගේම ලාඕසය වැනි රටවලුත් තේ වගා කරන්න උත්සාහ කරනවා; ඒ කටයුතුවල යෙදෙනවා. ඒ ගොල්ලන් බලාපොරොත්තු වෙනවා, ඒ රටවල තේ "Ceylon Tea" level එකට නිෂ්පාදනය කරන්න. එහිදී විශේෂයෙන් කෙන්යාව වැනි රටවල් අපට ලොකු අභියෝගයක් වෙනවා. ඒ නිසා මේ තේ වතුවල ප්‍රශ්නයේදී තේ පර්යේෂණ ආයතනයත් එක්ක එකතු වෙලා ඒ සඳහා නිර්මාණශීලී විසඳුම් ලබාදෙන්නේ කොහොමද කියන කාරණය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, ජාත්‍යන්තර තේ අළෙවිය වැඩි කරගන්න කළ යුතු වැඩසටහන් රාශියක් තිබෙනවා. මගේ අත්දැකීමත් එක්ක එක කාරණයක් කියන්නම්. අපි ජපානයේ ඉන්න කොට කල්පනා කළා, ජපානයේ ඒ ඒ පළාත්වල තේ අළෙවි කර ගන්නේ කොහොමද කියලා. මා ඔබතුමා සමඟ මේ ගැන පෞද්ගලිකවත් කථා කර තිබෙනවා. එහිදී official විධියට මේ රටවල එක එක පළාත්වල තේරා ගත් අයට "Ceylon Tea" ambassadorsලා ඇති කරන්න අපට පුළුවන් නම්, "Ceylon Tea" කියන product එක තමන්ගේ පළාත තුළ promote කරන්න ඒ ගොල්ලන් පුරුදු වෙනවා. එහෙම වුණොත් ඒ ඒ පළාත්වල "Ceylon Tea" ambassadorsලා ඇති කරලා ඒ හරහා අපට මේ කාර්යය කරන්න පුළුවන්. ඒ "Ceylon Tea" ambassador හැටියට ඒ ගොල්ලන්ට දිගටම ඉන්න ඕනෑ නම්, "ප්‍රමිතිගත 'Ceylon Tea' මෙපමණ කිලෝ ප්‍රමාණයක් ඔබ අනිවාර්යයෙන් විකිණිය යුතුයි" කියා නියම කරන්න ඕනෑ. විශේෂයෙන් මේ තේ ගැන කථා කරන, තේවලට කැමැත්තක් දක්වන ජපානය, චීනය, කොරියාව, රුසියාව වැනි ආසියානු රටවල ඒ පළාත් ආශ්‍රිතව "Ceylon Tea" ambassadorsලා ඇති කරන්න පුළුවන් නම් වඩාත් ඵලදායී වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අපට හැකියාවක් ලැබෙනවා. ඒ හරහා "Ceylon Tea" නාමය වැඩිදියුණු කරගෙන තව තවත් ඉදිරියට යන්න අපට හැකියාව ලැබෙනවා.

ඊළඟට, කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රශ්නයත් දිගින් දිගට දිවෙන ප්‍රශ්නයක්. ඔබතුමා මැදිහත් වෙලා සෑහෙන දුරකට ඒක විසඳා තිබෙනවා. තවදුරටත් කුඩා තේ වතු හිමියන් හරහා ප්‍රමිතිගත තේ එහෙම නැත්නම්, special tea අපට හදා ගන්න පුළුවන්. සමහර රටවලින් බලාපොරොත්තු වනවා special tea. දැනටමත් අපි කොළඹ ප්‍රදේශයට ගිහිල්ලා special tea එකක් බොනවා නම් රුපියල් 1,500ක්, 2,000ක් විතර දීලයි බොන්න වෙන්නේ. මේ special teaවල තිබෙන වටිනාකම මොකක්ද? ගරු ඇමතිතුමනි, සමහර වතුවල තිබෙනවා, අවුරුදු 40ක් විතර තේ කඩලා නැති ලොකු තේ ගස්.

ඉන්දුනීසියාවේ තිබෙන තේ ගස්වල තේ කොළ කඩන්න වඳුරන් train කර තිබෙනවාය කියා අපි අහලා තිබෙනවා. Train කරපු වඳුරන් කඩා ගෙන එන තේ කොළ ටිකේ ලොකු වටිනාකමක් තිබෙනවා. ඒ ගොල්ලන් කියන්නේ ඒක special tea එකක් කියායි. අපි අවුරුදු 40ක් විතර තේ නෙළා ගත්තේ නැති තේ ගස් තිබෙන තැන්වලට මෙවැනි special ක්‍රම හදන්න අපට පුළුවන් නම් එම තේ කිලෝ එකක් රුපියල් ලක්ෂ ගණනකට විකුණන්න පුළුවන්. අවුරුදු 30ක්, 40ක් තිස්සේ තේ නෙළා ගත්තේ නැති පැළ ගස් වෙලා. නමුත් ඒවා කාබනික තේ හැටියට අපට ඉදිරියට ගෙන යන්නත් පුළුවන්. මහනුවර දිස්ත්‍රික්කයේ තේ පැළ වගා කළ අක්කර ගණනාවක් අත්හැර දමා තිබෙනවා. පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ වෙලා හෝ මේ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් හදන්න පුළුවන් නම් හොඳයි. මේ කාබනික තේ promote කරන එකත් "Ceylon Tea" promote කරන එකේ තවත් එක් සුවිශේෂී අංගයක්. තේ වගා කරන ප්‍රදේශවලම ඉපදිලා, ඒ ප්‍රදේශවලම ජීවත් වුණු කෙනෙක් හැටියටත්, වගකීමක් ඇති ඇමතිවරයෙක් හැටියටත් මේ සම්බන්ධයෙන් තිබෙන සියලුම ප්‍රශ්න ටික විසඳා ගන්න ඔබතුමාට හැකියාව ලැබෙයි කියා මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, ඒ සියලු කාරණා සම්බන්ධයෙන් කටයුතු කරන්න ඔබතුමාට ශක්තිය ලැබෙවායි පතමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is Hon. Douglas Devananda. You have 15 minutes.

[பி.ப. 1.05]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டைப் பொறுத்தவரையில் பொருளாதார மெலிவுகளும், பிரச்சினைகளின் பருமன்களும் அதிகரித்துள்ள நிலையில், எதிர்காலம் குறித்த சீர்திருத்த நிகழ்ச்சிநிரலற்ற வகையில் சென்றுகொண்டிருக்கின்ற எதிர்பார்ப்புகளற்ற பயணத்தில், இன்னும் ஏதோவென ஒட்டிக் கொண்டிருக்கின்ற இந்த நாட்டின் நீண்ட கால ஏற்றுமதி உற்பத்தியான தேயிலை தொடர்பில் எனது கருத்துக்களையும் இங்கு பதிவு செய்வதற்கு வாய்ப்பு வழங்கியமை தொடர்பில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கடந்த வருடத்தின் எமது மொத்த ஏற்றுமதி வருமானம் 11,360 மில்லியன் டொலர்களைப் பதிவு செய்துள்ளது. இதில், தேயிலையானது உள்நாட்டு உற்பத்தியில் 4.9 வீதத்தை எட்டி நிற்கின்றது. இறக்குமதிச் செலவினம் 20,980 மில்லியன் டொலர்களைப் பதிவு செய்திருக்கின்றது என்பது வேறு விடயம். கடந்த வருடத்தில் ரஷ்யா இலங்கைத் தேயிலையை தடை செய்திருந்தபோது, இந்த நாட்டில் தேயிலைச் சபையானது என்ன செய்து கொண்டிருக்கிறது? என்ற கேள்வி பலராலும் எழுப்பப்பட்டது. இன்றும் அந்தக் கேள்வி எமது மக்களிடையே வாபஸ் பெறப்படாமலேயே இருந்து வருவதையும் நான் இங்கு சுட்டிக்காட்ட வேண்டும்.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, රුසියාව අපේ තේවලට තහංචියක් දැම්මා. සති දෙකක් ඇතුළත ඒක නැවතත් අයින් කළා.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி. குறிப்பாக, 'கழிவுத் தேயிலை' என இனங்காட்டப் படுகின்றவை தொடர்பில் ஓர் உரிய பொறிமுறையினை உருவாக்குவதற்கு உங்களால் இன்னும் இயலாதிருக்கின்றது. உண்மையிலேயே நீங்கள் கூறுகின்ற வகையில் இவை 'கழிவுத் தேயிலை' அல்ல என்பதைப் புரிந்துகொள்ள வேண்டும். அதாவது, தேயிலையை அரைக்கின்றபோது வெளித்தோல் அகன்று வெளிப்படுகின்ற தண்டுப் பகுதிகள் அடர் பொன்னிறமாக மாற்றம் பெறுகின்ற நிலையில் அவை கறுப்பு நிறத்தைக் கொள்வதில்லை. அதிக சந்தைக் கேள்வியானது கறுப்பு நிறத் தேயிலைக்கே இருப்பதால் மேற்படி அடர் பொன்னிறத் தேயிலையானது கேள்விச் சந்தையில் நிராகரிக்கப்படுகின்றது. இவ்வகைத் தேயிலை மிக அதிகமாகத் துளிர் தேயிலைகளினால் கிடைப்பதாகவும் கூறப்படுகின்றது.

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

இவ்வாறு சந்தைக் கேள்விகளிலிருந்து நிராகரிக்கப் படுவதனால், இவ்வகைத் தேயிலை 'கழிவுத் தேயிலை' எனக் கூறப்பட்டாலும், இவை கழிவுத் தேயிலை அல்லவென்பதால் இதன் பெயரை 'நிராகரிக்கப்பட்ட தேயிலை' எனக் கொள்வதே சாலச் சிறந்ததென்பதை இங்கு வலியுறுத்த விரும்புகின்றேன். ஆனால், இவை சந்தைக் கேள்விகளில் இருந்து நிராகரிக்கப்பட்டாலும் இவற்றை மூலப்பொருளாக மாத்திரம் ஏற்றுக்கொண்டு, இந்த மூலப்பொருளை முடிவுப் பொருளாக மாற்றுவதற்கான ஏற்பாடுகள் உறுதியான முறையில் மேற்கொள்ளப்படல் வேண்டும். அதாவது, இதற்குப் பல்விதச் சேர்க்கைகள் சேர்க்கப்பட்டு நல்ல தேயிலையாக மாற்ற முடியும்.

இந்தச் செயற்பாட்டிற்கு இதுவரையில் சிறந்த முகாமைத் துவத்தினை வழங்கத் தவறிவிட்டதால், மேற்படி தேயிலை யுடன், கோஸ்ரிக் சோடா, பெரஸ் சல்பேட், கொண்டிஸ், அயன் மாத்திரைகள், தென்னந்துகள்கள், மரத்தூள் என்பன கலக்கப்பட்டு மக்கள் பாவனைக்கு எவ்வகையிலும் ஏற்பில்லாத துகள்கள் தேயிலை என்ற பெயரில் இன்று இலங்கையில் பரவலாகவே பாவனையில் இருந்து வருகின்றது. அத்துடன் நிற்காமல், வெளிநாடுகளுக்கும் ஏற்றுமதி செய்யப்படுகின்றது. ஈரான்கூட இத்தகைய தேயிலையைத் தங்களது நாட்டுக்கு அனுப்ப வேண்டாம் எனக் கூறுமளவுக்கு இந்த வியாபாரம் நடந்தேறியிருக்கின்றது. இத்தனைக்கும் இலங்கையில் ஒரு தேயிலைச் சபை செயற்பாட்டில் இருக்கின்றது.

மேற்படி, நிராகரிக்கப்பட்ட தேயிலைகளைக் கொள்வனவு செய்வதற்கும் மேலதிக தயாரிப்புச் செயற்பாடுகளில் ஈடுபடுவதற்கும் நிறுவனங்கள் பதிவு செய்யப்படல் வேண்டும் என்ற விதிமுறை இருந்தபோதிலும், உங்களது கவனமின்மை காரணமாகப் பல்வேறு தரப்புகள் பதிவு செய்து கொள்ளாமலேயே மேற்படி திருட்டு வர்த்தகத்தில் ஈடுபட்டு வருகின்றன. இந்த வர்த்தகர்கள் தேயிலைத் தொழிற்சாலை களுடன் தொடர்புகளைப் பேணி, நல்ல தேயிலையுடன், மேற்படி தேயிலையையும் கலந்து, தர இலச்சினை இன்றி, வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்கின்ற நடவடிக்கைகளிலும் ஈடுபட்டு வருவதாகவும், இதன் பின்னணியில் சில அரசியல்வாதிகள் இருப்பதாகவும் அடிக்கடி ஊடகங்களின் மூலம் அறியக்கூடியதாக இருக்கின்றது. இத்தகைய தேயிலைக்குக் கறுப்பு நிறத்தினைக் கொடுப்பதற்காகச் சோடியம் பைகாபனேற், கோன் சிரப் போன்றவை கலக்கப் படுவதால் அவை நீரிழிவு, மாரடைப்பு, கொலொஸ்ட்ரோல் போன்ற நோய்கள் ஏற்படுவதற்கான இரசாயன அழுத்தங்களைக் கொடுப்பதாகத் தெரிய வருகின்றது. இத்தகைய, மக்கள் பாவனைக்குதவாத, மிகுந்த தீங்கு விளைவிக்கின்ற தேயிலை வகைகள் இன்று வடக்கு, கிழக்கு மாகாணங்களிலே மிகத் தாராளமாக விற்கப்பட்டு வருகின்றன. குறிப்பாக, உவர் தன்மை கொண்ட நீர் அதிகமாகப் பாவனை யிலிருக்கின்ற பகுதிகளை இலக்கு வைத்தே இத்தகைய தேயிலை விற்பனைக்கு விடப்படுகின்றது என்பதையும் இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். இத்தனைக்கும் மக்கள் பாவனைக்குதவாத இவ்வகைத் தேயிலையானது 'சிலோன் ரீ' என்ற பெயரிலேயே பொதி செய்யப்பட்டு, இலங்கையிலும் வெளிநாடுகளிலும் சந்தைக்கு விடப்படுவதும் குறிப்பிடத் தக்கது.

அதேபோன்று, தேயிலையில் சீனி, குளுக்கோஸ் கலக்கப்படுவதாகக் கூறப்பட்டு, 82 தேயிலைத் தொழிற் சாலைகள் இனங்காணப்பட்டுள்ளதாகக் கடந்த பெப்ரவரி மாதம் செய்திகள் வெளியிடப்பட்டிருந்தன. இவ்வாறு இனங்காணப்பட்டுள்ள தொழிற்சாலைகள் தொடர்பில் என்ன நடவடிக்கைகளை எடுத்துள்ளீர்கள்? அந்தத் தொழிற் சாலைகள் யாவை? போன்ற விபரங்களை எமது மக்களின் அவதானத்திற்கு வெளியிடத் தேயிலைச் சபை முன்வர வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன். எனவே, இன்று நாடு இருக்கின்ற பொருளாதார நிலையில், நீண்ட காலமாக எமக்கு அந்நியச் செலாவணி ஈட்டலில் பெருந் தூணாக இருந்து வருகின்ற இலங்கைத் தேயிலையைத் தயவு செய்து காப்பாற்றும்படி கேட்டுக் கொள்கின்றேன்.

அடுத்தது, இந்தத் தேயிலைக்காக அன்றாடம் அல்லல்படுகின்ற மக்கள், இன்னும் தீராமல் எதிர்நோக்குகின்ற பிரச்சினைகள்! இந்த மக்கள் இங்கு குடியேற்றப்பட்ட காலத்திலிருந்தே பல பிரச்சினைகள் இன்னும் தீர்க்கப் படாமலேயே தொடர்கின்றன. எமது மக்களின் உரிமைகளுக் காக நாங்கள் போராடியிருந்த காலத்தில் மலையக மக்களை ஒருபோதும் நாங்கள் மறந்துவிட்டுச் செயற்பட்டிருக்கவில்லை. அந்த மக்களில் பல தோழர்கள் எம்முடன் இணைந்து செயற்பட்டிருந்தனர். எமது போராட்டத்திற்காக உயிர்த் தியாகங்களையும் செய்திருக்கின்றனர். எமது உடன் பிறப்புக்களான மலையக மக்களின் பிரஜா உரிமை உட்பட அடிப்படை உரிமைகளை அங்கீகரிக்க வேண்டுமென நாம் 1985ஆம் ஆண்டு ஜூலை மாதம் 08ஆம் திகதி ஆரம்பிக்கப்பட்டிருந்த 'திம்பு' பேச்சுவார்த்தையின்போது பிரேரணையை முன்வைத்திருந்தோம். உழைப்பிற்கு ஏற்ற ஊதியமின்மை, தொடர்ந்தேர்ச்சியான வேலை நாட்கள் இன்மை, அடிப்படை வசதிகள் இன்மை, அடிப்படை உரிமைகள் இன்மை, குளவி, தேனீ, சிறுத்தை, விஷ ஜந்துக்கள் மத்தியில் தொழில் செய்ய நேரிடுகின்றமை போன்ற பல்வேறு துன்ப துயரங்களுக்கு ஆட்பட்ட மக்களாகவே இம்மக்கள் இருந்து வருகின்றனர். ஒரு விடயத்தை இந்தச் சபைக்குக் கொண்டுவர விரும்புகின்றேன். அதாவது, குளவிக் கொட்டு என்பது மலையகப் பகுதிகளில் பரவலாகவும் அடிக்கடியும் இடம்பெற்று வருகின்ற அனர்த்தமாக உள்ளதனால், இதன் காரணமாகப் பலர் தொடர் அவதிகளுக்குட்பட்டு வருகின்ற நிலையில், குளவிக் கொட்டையும் இந்த நாட்டின் அனர்த்தங்களில் ஒன்றாக அறிவிப்பதற்கு அனர்த்த முகாமைத்துவ அமைச்சு நடவடிக்கை எடுப்பது அவசியம் என்ற விடயத்தை இங்கு முன்வைக்க விரும்புகின்றேன்.

மலையக மக்கள் தங்களுக்கு வருகின்ற கடிதங்களைக்கூட பெறமுடியாத நிலையில் உரிமையின்றிய மக்களாகவே இன்னமும் வாழ்கிறார்கள். இரண்டு வருடங்களாக இம் மக்களுக்கு வந்துள்ள கடிதங்களை அவர்களுக்கு வழங்காமல் முடக்கி வைத்திருந்த தோட்ட நிர்வாகங்கள் குறித்தும் செய்திகள் இல்லாமல் இல்லை.

இந்த மக்களின் இருப்பிடங்கள் தொடர் வீட்டு முறைமையிலிருந்து தனி வீட்டுத் திட்டங்களாக இப்போது மாற்றப்பட்டு வந்தாலும், இம்மக்கள் அனைவரும் அவற்றின் முழுமையான பயன்களைப்பெற இன்னும் பல வருடங்கள் செல்லும் என்ற நிலையே காணப்படுகின்றது. அதிலும் பாரபட்சங்கள் காட்டப்படும் நிலைமைகளும் இல்லாமல் இல்லை எனக் கூறப்படுகின்றது. மத்திய மற்றும் ஊவா மாகாணங்களிலே வாழுகின்ற மலையக மக்களின் நிலை இதுவாகும் என்கின்றபோது, சப்பிரகமுவ மற்றும் தென் மாகாணங்களில் தோட்டங்கள் சார்ந்து பணியாற்றுகின்ற தமிழ் மக்கள் தொடர்பில் கவனிப்பார் எவருமே இல்லை என்றே கூற வேண்டியுள்ளது.

இன்று தேயிலை உற்பத்தியை நோக்குகின்றபோது பெருந்தோட்டக் கம்பனிகள் நூற்றுக்கு சுமார் 25 வீதமான உற்பத்தியை மேற்கொள்கின்ற நிலையில், 75 வீதமான உற்பத்திகளை சிறு தோட்ட உரிமையாளர்களின்கீழான தோட்டங்களே உற்பத்தி செய்கின்றன. என்றாலும், அதிகள விலான மக்கள் பெருந்தோட்டத்துறையின் கீழேயே இன்னமும் இருக்கின்றனர். இவ்வாறு பெருந்தோட்டத்துறைப் பிரிவுகளில் அதிகளவிலான மக்கள் இருக்கின்ற நிலையில், இம்மக்களது எதிர்காலம் குறித்த சந்தேகங்கள் இப்போதே எழ ஆரம்பித் துள்ளன. அதாவது, இந்த மக்களின் இருப்பின் எதிர்காலம் என்னவாகும்? என்பதே இப்போதுள்ள கேள்வியாகும்.

உரிய பராமரிப்பின்மை, அர்ப்பணத் தன்மையின்மை காரணமாக இன்று தேயிலைத் தோட்டங்கள் காடுகளாக மாறி வருகின்றன. இலாப ஈட்டல்களை மாத்திரமே ஒரே நோக்கமாகக் கொண்டு, கம்பனிகள் செற்பட்டு வருகின்றன. இதனை இந்த அரசு தனது உடனடி அவதானத்திற்கு எடுத்துக் கொள்ள வேண்டும் என்பதை வலியுறுத்த விரும்புகின்றேன்.

அதேநேரம், களுத்துறை மாவட்டத்தைப் பொறுத்த வரையில் இன்று தேயிலைத் தோட்டங்கள் படிப்படியாக வேற்றுப் பாவனைகளுக்காக மாற்றப்பட்டு வருகின்ற நிலைமைகளைக் காணக்கூடியதாக இருக்கின்றது. இங்கே வாழுகின்ற மக்களுக்கு வீடுகளை அமைத்துக் கொடுப்பதற்காக வசதிகள் அற்ற, குடியிருப்புகளுக்கு ஏற்பு இல்லாத பகுதிகள் வழங்கப்பட்டு, குதிரை லாயங்கள் அமைப்பதற்காக நல்ல இடங்களை ஒதுக்குகின்ற நிலைமைகள் ஏற்பட்டுள்ளன. எனவே, இந்த நாட்டின் தேயிலையை நீங்கள் பாதுகாக்க வேண்டும். அத்துடன், அத்துறை சார்ந்த தொழிலாளர்களது நலன்களிலும் தோட்டங்களின் நலன் சார்ந்தும் சிந்தித்து செயற்பட முன்வர வேண்டியது அவசியம் என்பதையும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்கள் இந்த உரையைச் செவிமடுத்துக்கொண்டிருப்பதால் நான் முன்வைத்த அந்தக் கருத்துக்களை கருத்திலெடுப்பார் என்று நம்புகின்றேன் என்பதைக் கூறி விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.16]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදය වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මුලින්ම වැවිලි කර්මාන්ත අමාත්‍ය නවින් දිසානායක මැතිතුමාට සුබ පැතුමක් එක් කරමින්, මගේ අදහස් දැක්වීම ආරම්භ කරනවා.

අපේ රටට විශාල අපනයන ආදායමක් එකතු කරන, දැවැන්ත නිෂ්පාදනයක් සිදු කරන තේ කර්මාන්තය පිළිබඳව අදහස් දක්වනකොට අපට කාරණා කිහිපයක් පිළිබඳව විශේෂයෙන් කථා කරන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, වසර ගණනාවක් තිස්සේ සාම්ප්‍රදායික අපනයන ආදායමක් ලෙස තේ අපනයනයෙන් ලබන ආදායම අපි මේ රටේ ජාතික ආදායමට එකතු කර ගත්තා. තේ කර්මාන්තය ඉදිරියට ගෙන යෑම සඳහා තේ වගාකරුවන්, එහෙම නැත්නම් තේ වගා කරන සමාගම් සහ කුඩා තේ වතු හිමියන් මීට වඩා ශක්තිමත් කිරීමට, තේ කර්මාන්තය වෙනුවෙන් නවීන ක්‍රමෝපාය උපයෝගී කරගෙන තාක්ෂණයෙන් ඉහළ තැනකට ගෙන යෑමට කටයුතු නොකිරීම ගැන පසුගිය ඉතිහාසයේ සෑම රජයක්ම වග කියන්න ඕනෑ. අපේ පසුබට වීම තුළ ජාත්‍යන්තර වශයෙන් විශාල රටවල් ප්‍රමාණයක් සමඟ අපේ රටට තරග කිරීමට සිදුවී තිබෙන බව අද ඔබතුමා දන්නවා ඇති. මොකද, තේ කර්මාන්තය අතින් අපට වඩා පහළින් සිටි රටවල් අද ශීඝ්‍රයෙන් ඉහළට ගිහින් තිබෙනවා. අපේ රටේ තේ කර්මාන්තය ගැන ප්‍රමාණවත් අවධානයක් පසුගිය කාල සීමාව තුළ තිබුණේ නැහැ කියලා මම හිතනවා.

අද දින ගරු ඇමතිතුමා අදහස් දක්වන අවස්ථාවේ මම සභා ගර්භයේ සිටියේ නැහැ. ඔබතුමා ඒ අවස්ථාවේ යම් ප්‍රශ්නයකට පිළිතුරු දෙමින්, "පසුගිය වසරවල තේ නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක වැඩි වීමක් තිබෙනවා" කියලා සඳහන් කරනවා මම දැක්කා. ගරු ඇමතිතුමනි, දැනට අපේ රටේ තේ කර්මාන්තය සඳහා යොදවා තිබෙන ඉඩම් ප්‍රමාණය සහ ඉන් ලැබෙන නිෂ්පාදනය ගත්තාම - ඔබතුමා මාත් සමඟ එකඟ වෙයි,- අපට සතුටු වෙන්න පුළුවන් නිෂ්පාදනයක් මේ ඉඩම් ප්‍රමාණයෙන් ලැබෙනවා කියලා හිතන්න බැහැ. තේ කර්මාන්තය වෙනුවෙන් වෙන් වෙලා තිබෙන ඉඩම් ප්‍රමාණයෙන් ලැබෙන නිෂ්පාදනය පිළිබඳව සතුටු වෙන්න බැහැ කියන්න හේතුවක් තිබෙනවා. ඉතිහාසයේ දවසක රජයේ තේ වතු ටික සමාගම්වලට දුන්නේ මේ රටේ තේ නිෂ්පාදනය තව දුරටත් ශක්තිමත් කිරීමට එම සමාගම්වල දායකත්වය ලබා ගැනීමටයි. රාජ්‍ය වතුවලින් බලාපොරොත්තු වුණු අරමුණුවලට යන්න බැරි නිසා තමයි පෞද්ගලික අංශයේ සහයෝගය අරගෙන වතු සමාගම් හරහා මේ කර්මාන්තය දියුණු කිරීමට උත්සාහ කළේ. නමුත් අද රට පුරා ඇති වී තිබෙන තත්ත්වය දිහා බැලුවාම එදා බලාපොරොත්තු වුණු අරමුණු කරා අද අපි ගිහින් නැති බව පෙනෙනවා. මම සියලු සමාගම්වලට මෙය චෝදනාවක් විධියට ගෙනෙන්නේ නැහැ. සමහර සමාගම් බලාපොරොත්තු වුණාට වඩා හොඳ නිෂ්පාදනයක් ලබා දෙමින්, නවීන ආකාරයට තමන්ගේ වතු සකස් කරගෙන ඉදිරියට ගිහින් තේ කර්මාන්තයෙන් රට ඉදිරියට ගෙන යෑමට කටයුතු කරනවා. තව බොහොමයක් සමාගම් ඒ අවස්ථාවේ තමන්ට ලැබුණු වරප්‍රසාද හමුවේ ඉඩම් ටික ලබා ගෙන සුදු අධිරාජ්‍යවාදීන් හිටවපු තේ ගස් ටිකෙන්ම එල නෙළාගෙන ඉඩම් ටික කැලෑවට යන්න ඉඩ හැරලා තිබෙනවා. එක තේ ගහක්වත් වගා නොකළ තේ සමාගම් අපි දකිනවා.

උදාහරණයක් කිව්වොත්, අපේ රටේ ජාතික තේ නිෂ්පාදනයට විශාල දායකත්වයක් ලබා දෙන රත්නපුර දිස්ත්‍රික්කයේ මම නියෝජනය කරන රක්වාන ආසනයේ, එහෙම නැත්නම් කොළොන්න ආසනයේ "හේයස් වතු යාය" කියලා අක්කර 2,000ක පමණ වතු යායක් තිබෙනවා. මේ වතු යායෙන් බලාපොරොත්තු වන තේ නිෂ්පාදනයෙන් සියයට 10ක්වත් ගන්න බැහැ. ඒ වාගේම හපුගස්තැන්න ප්ලාන්ටේෂන් සමාගමට අයත් ඉඩම් අපේ ආසනය පුරාම තිබෙනවා. තේ වගා කළ හැකි බිම් විශාල ප්‍රමාණයක් හඳුනා නොගෙන නිකම් කැලෑ බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේ තේ නිෂ්පාදනය නහා සිටුවීම කුඩා තේ වතු හිමියන්ගෙන් බලාපොරොත්තු වෙනවා වාගේම, මේ සමාගම් විසින් ඉඩම් ලබාගෙන මේ අවස්ථාව වෙනකොටත් තේ නිෂ්පාදනයට දායක නොවෙන්නේ ඇයි කියන කරුණ පිළිබඳව සොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැඩි නියාමනයක් ඇතිව තේ කර්මාන්තය ඉදිරියට අරගෙන යෑමට නීති, කැබිනට් තීරණ මඟින් හෝ කටයුතු කරන්න. නැත්නම්

[ගරු ඡේෂාන් විතානගේ මහතා]

බොරුවක් මේ වෙන්නේ. සමහර වතු සමාගම් තේ වවන්න කියලා ඉඩම් ලබා ගෙන වෙන වෙන ව්‍යාපෘතිවලට බාහිර පාර්ශ්වයන්ට ඉඩම් බදු දෙන සිද්ධීන් අපි දැකලා තිබෙනවා.

එවැනි දේ සිදු වන විට අපි බලාපොරොත්තු වන අරමුණ කරා යන්න අපට බැරි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 'තේ කෝප්පය' කියන එක අපේ රටේ සම්ප්‍රදායත් එක්ක එන එකක්. අපට වඩා ගරු ඇමතිතුමාට මේ සම්බන්ධයෙන් විශාල වශයෙන් අත් දැකීම් තිබෙන බව අපි දන්නවා. ඔබතුමා මහා වෙහෙසක් දරලා තමයි තේ ක්ෂේත්‍රය අද තිබෙන තැනට ගෙනාවේ. ඒ වාගේම, පසුගිය කාලයේ රුසියාව අපේ රටේ තේ ලබා ගැනීම නවත්තපු වෙලාවේදී ඔබතුමා රුසියාවත් එක්ක සම්බන්ධවෙලා ඒ ප්‍රශ්නයට ඉතා ඉක්මනින් සුබවාදී උත්තරයක් ලබා දුන්නා. ඒ අවස්ථාවේදී සමහරු දේශපාලන වාසි ගන්න හදන වෙලාවක ඒවා පැත්තකින් තියලා ඔබතුමා මේ රටට විශාල අපනයන ශක්තියක් ලබා දෙන තේ නිෂ්පාදනකරුවන්ගේ කණ්ඩායම වෙනුවෙන් පෙනී සිටියා. ඒ ගැන ඔබතුමාට ගෞරවය පුද කරන ගමන් විශේෂයෙන්ම මම තවත් දෙයක් කියන්න ඕනෑ. පසුගිය කාලයේ මැතිවරණය ඉවර වෙලා යහ පාලන ආණ්ඩුව පත් වුණු වෙලාවේ මතු වුණ ලොකුම මානෘකාව තමයි, "මේ රටේ තේ නිෂ්පාදනය කරන මිනිසුන්ගේ ජීවිකාව ඉවරයි" කියන එක. එහෙම අදෝනාවක්, අනුකම්පාවක්, බොරු දේශ ප්‍රේමීත්වයක් හදාගෙන ඒ සම්බන්ධයෙන් කථා කළා. අපට රූපවාහිනී වැඩසටහනකට ගිහිල්ලාවත් ඉන්න බැහැ, "තේ දළු කිලෝග්‍රෑම් එක රුපියල් 45යි" කියනවා. හැබැයි, අද කවුරුවත් තේ දළු කිලෝග්‍රෑම් එකකට ගෙවන මිල ගැන කථා කරන්නේ නැහැ. අද තේ දළු කිලෝග්‍රෑම් එකකට ගෙවන මුදල රුපියල්100යි, 110යි. මේක කවුරුවත් කොතැනකදීවත් කියන්නේ නැහැ. හැම වෙලාවේම කොරහේ කිඹුල්ලු දකින විධියට ඉන්න එපා. රටක් වුණාම ප්‍රශ්න එනවා. ඒ ප්‍රශ්නවලට ක්ෂණිකව උත්තර හොයන්න බැහැ. අද ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය ඒකට නිවැරැදි උත්තර හොයලා තිබෙනවා. ඩීසල්, පෙට්‍රල් ප්‍රශ්නයත් ඕකම තමයි. ඒක අවබෝධ කරගන්න බැරිකම නොවෙයි තිබෙන්නේ; මේ අය කුහකකමින් අහිංසක මිනිසුන් රවට්ටන්න දේශපාලන උපාය භාවිත කරනවා. අපි ඒක මේ වෙලාවේදී විශේෂයෙන්ම මතක් කරලා දෙන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, 1996 අවුරුද්දේ අර්ජුන රණතුංග මැතිතුමන්ලා ක්‍රිකට් ලෝක කුසලානය අපේ රටට අරගෙන එන්න ඉස්සෙල්ලා මේ රටේ අනන්‍යතාව තිබුණේ තේවලටයි. ශ්‍රී ලංකාවේ නාමය තේවලින් ලෝකයට, ජාත්‍යන්තරයට ගෙනගියා. හැබැයි, අපි තේවල විවිධාංගීකරණයක් -variety එකක්- හදන්න ප්‍රමාණවත් උත්සාහයක් දරලා නැහැ. උදාහරණයක් විධියට ගත්තොත්, ඕස්ට්‍රේලියාව වගේ රටකට ගියාම අපට තේ කෝප්පයක රසය විවිධාකාරයෙන් ලබා ගන්න පුළුවන්. අද ඒක තවම අපට මේ රටේ දකින්න නැහැ. ඒක අපේ රටේ නැත්තේම නැහැ; කොළඹ යම් යම් තැන්වල තිබුණාට, ඒ තත්ත්වය වැඩිදියුණු කරන්න පුළුවන් තරම් ශක්තියක් දෙන්න ඕනෑ. අද Green tea එකට ලොකු ප්‍රවණතාවක් තිබෙනවා. Green tea එකේ නිෂ්පාදනය පිළිබඳව මීට වඩා උනන්දු වෙලා, export කරන්න පුළුවන් තැනට අපි හදාගන්නවා නම්, තේ කර්මාන්තය තුළින් අපට තවදුරටත් ඉදිරියට යන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවට මම වැඩි කාලයක් ගන්නේ නැතිව ඉක්මනින් අවසන් කරන්නම්. පසුගිය දවස්වල අපි දැක්කා, මේ හරහා ඇමතිතුමා සමහර මත ගේනවා. ග්ලයිෆොසේට් තහනම ගෙනාපු වෙලාවේදී ගරු ඇමතිතුමා තනිවම කෙළින් ඉඳගෙන තේ ගොවිතැන කඩා වැටෙන්න නොදී තේ ගොවියාව ආරක්ෂා කරන්න ඉදිරිපත් වුණා. මේ රටේ ග්ලයිෆොසේට් නැතිව වෙන මොනවා හරි විකල්පයක් තිබෙනවා නම් අපි සියලුදෙනා ඒකට කැමැතියි. නමුත් මේක දේශපාලන අරමුණක් කරගෙන ඉන්නවා නම් ඒක වැරැදියි. පූජ්‍ය අතුරලියේ රතන හාමුදුරුවෝ ආණ්ඩු විරෝධී දැවැන්ත ප්‍රකාශ ටිකක් කරනවා මම දැක්කා. මට ඒක ප්‍රශ්නයක් නැහැ. මම මේ පුද්ගලික මතයක් කියන්නේ. මගේ මතයෙන් කාට හෝ අගතියක් වෙනවා නම් සමාවෙන්න ඕනෑ. අපේ හාමුදුරුවන්ගේ අදහස ග්ලයිෆොසේට් භාවිතය තුළින් මේ රටේ තේ නිෂ්පාදනයේ ප්‍රමිතියට හානියක් වෙනවා කියන එක නම්, අපේ හාමුදුරුවෝ ඒකට උත්තරයක් එක්කයි යන්න ඕනෑ. හැබැයි, එතැන තිබුණේ ඊට එහා දෙයක්. මේක තහනම් කරන්න සහයෝගය දක්වන ඕනෑම කෙනෙක් එක්ක හාමුදුරුවෝ හිටගන්නවා කිව්වා. අපේ හාමුදුරුවනේ! එහෙම මේ රටේ ප්‍රශ්න විසඳන්න අමාරුයි. අපි මේ ආණ්ඩුව ගෙන එන වෙලාවේ අපේ හාමුදුරුවන්ගේ මතය තිබුණේ ග්ලයිෆොසේට් පිළිබඳ ප්‍රශ්නය නොවෙයි. ඒක අපට මතකයි. "මේ රටේ හොරු, තක්කඩි, මංකොල්ලකරුවන් ඔක්කෝම ටික අල්ලලා උසාවියට ගෙනිහිල්ලා හිර ගෙට දක්කනවා" කියන තේමාවේ ආපු අපේ හාමුදුරුවෝ පසුගිය කාලයේ ග්ලයිෆොසේට් තේමාවකට ආවා. ඒ නිසා මම කියන්න ඕනෑ, ගරු ඇමතිතුමා එතැනදී කෙළින් ඉඳගෙන ගත්ත තීරණය තුළ රටේම තේ වගාකරුවන්ට ලොකු සහනයක් සිදු වුණු බව.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, තේ නිෂ්පාදනය තවදුරටත් දියුණු කිරීම තුළින් මේ රටේ අපනයන ආදායමට එකතු කරගන්න පුළුවන් ශක්තිය ඉතා බලවත් බව. ඒ වෙනුවෙන් මේ රටට දෙන්න පුළුවන් දායකත්වය, ශක්තිය ඔබතුමා තරුණ අමාත්‍යවරයෙක් විධියට, ඍජුව තීන්දු ගන්න අමාත්‍යවරයෙක් විධියට; අපේ ගාමිණී දිසානායක ආදරණීය නායකතුමා මේ රටට, ජාතියට හිමිකර ගිය ඒ ආදරණීය නාමය තවදුරටත් ගෙනියන්න පුළුවන් දැවැන්තයෙක් විධියට, මේ අමාත්‍යාංශය හරහා රටට ලබා දෙයි කියලා අපි විශ්වාස කරමින්, ඔබතුමාට සුබ පතමින් මගේ කෙටි අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තූතියි.

මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.26]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ කථා කරන මේ මොහොතේ මා මුලින්ම වැවිලි කර්මාන්ත ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබූ රුපියල් මිලියන 50ක මුදල මුදල් අමාත්‍යාංශයෙන් ආපහු ගන්න හදනකොට එතුමා ඒක නවතා ගැනීම පිළිබඳව. බොහෝ ඇමතිවරු ඒ අයගේ සල්ලි ආපහු ගන්නකොට සද්ද නැතිව හිටියා. මෙතුමා ඒකට මැදිහත්වීමක් වුණා. පසුගිය කාලයේ -අපේ ආණ්ඩුව තිබෙන කාලයේ- මේ රටේ තේ ගොවියාට සහනාධාර රාශියක් ලබා දුන්නා. මේ රජය බලයට එන්න ඉස්සෙල්ලා කිව්වා, "මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවෙන් ගෙනැල්ලා දුන්නේ මුහුදු වැලි කවලම් කරපු බාල පොහොර. ඒ වෙනුවට ප්‍රමිතිය තිබෙන පොහොර දෙනවා" කියලා. හැබැයි පොහොර මීටියක මිල රුපියල් 3,000 දක්වා වැඩි කරලා දුන්නෙත් ඒ පොහොරම තමයි. මැතිවරණයෙන් පසුව, නැවත වරක් රුපියල් 1,500ට පොහොර

දෙන්න ගත්ත තීන්දුව පිළිබඳ ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මොකද, පසුගිය කාලයට වඩා දැන් තේ නිෂ්පාදන වියදම වැඩියි. වියදම වැඩි වෙනකොට, පොහොර මිලත් වැඩි වෙනකොට නිෂ්පාදනය අඩු වෙනවා. නිෂ්පාදනය අඩු වෙන්න හේතුවක් තමයි පොහොර මිල වැඩි කිරීමත් එක්කම වල් නාශක යෙදීම නැවැත්වීම නිසා ඒ සඳහා තව වැඩි මිලක් යොදවන්න සිද්ධ වීම. වල් නාශක නැති නිසා මිනිස් ශ්‍රමයට වැඩි මිලක් දෙන්න වුණාම තේ ගොවියා ඒකෙන් අසරණ වුණා. ඒ නිසායි රජය යම් කිසි ප්‍රතිපත්තියක් අරගෙන ඒ ප්‍රතිපත්තියේ ඉඳගෙන කටයුතු කරන්න ඕනෑ කියලා අපි කියන්නේ. TRI එක හරහා ඉස්සර ගොඩාක් තේ පැළ නිෂ්පාදනය කරලා දුන්නා. අද ඒක කඩා වැටිලා තිබෙනවා. අපි තේ මණ්ඩලයට කියන්නේ, හොඳ ප්‍රමිතියෙන් යුතු තේ පැළ ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ කියලායි. නැත්නම් තේ වගාවේ පැවැත්මක් නැහැ. අවුරුදු ගණනක් පවතින්න පුළුවන් තේ පැළය වෙනුවට බාල තේ පැළයක් ගොවියාට දුන්නාම ඒකෙන් ඒ අයට හොඳ අස්වැන්නක් ලබා ගන්න වෙන්නෙත් නැහැ; ගහේ පැවැත්මත් නැහැ. ඒ නිසා තේ මණ්ඩලයේ වගකීම් රාශියක් තිබෙනවා. අද තේ කර්මාන්තයේ යෙදිලා ඉන්න කර්මාන්තකරුවන්ට විදුලිබිල වැඩි වෙනකොට ඒ අයට ලොකු ප්‍රශ්නයක්; තෙල් මිල වැඩි වෙනකොට ඒ අයට ලොකු ප්‍රශ්නයක්. තේ කර්මාන්තය කිහිප දෙනෙක් අතේ තමයි රැඳිලා තිබෙන්නේ. තේ කර්මාන්තකරුවාත්, ගොවියාත් දෙන්නාම ආරක්ෂා කරන්න රජය මැදිහත් වෙන්න ඕනෑ. තේ ව්‍යාපාරයේ නියැලිලා ඉන්න කිහිප දෙනෙක් ගිය සතියට ඉස්සෙල්ලා සතියේ අපට රත්නපුරේදී හමු වුණා. ඒ අය කිව්වේ, "අද මේ කර්මාන්තය බොහොම අමාරුයි. මොකද, ඩීසල් මිල, විදුලි බිල වැඩියි. ඒ ඔක්කොම වැඩි වුණාම ආණ්ඩුවෙන් ගහන බදු ප්‍රමාණයත් විශාල වශයෙන් වැඩියි" කියලා. ඒවා ඔක්කොම අල්ලන්න වෙන්නේ මේ තේ ගොවියාගෙන්. එම නිසා මේවාට යම්කිසි සහනයක් ලබා දෙන්නට ඕනෑ. අපට විදේශ විනිමය ගෙනෙන කුඩා තේ වතු හිමියන් ගොඩක් අමාරුවෙන් මේ කටයුත්තේ යෙදෙන්නේ. මේ කුඩා තේ වතු හිමියන් නිසා ආණ්ඩුව ලොකු බරකින් නිදහස් වෙලා තිබෙනවා. මොකද, මේ ගොවීන් රාජ්‍ය සේවයේ රක්ෂා ඉල්ලන්නේ නැහැ. මේ ගොවීන්ට ආණ්ඩුවෙන් අත දෙනවා නම් ඒ අය මීට වඩා වැඩි ඵලදාවක් අරගෙන දෙනවා. මමත් කුඩා තේ වතු තිබෙන කෙනෙක්. එම නිසා අපි දන්නවා, තවමත් දළු කඩන්නේ පැරණි ක්‍රමයටම තමයි; එහෙම නැත්නම් පැරණි ක්‍රමයටම තමයි මේ කටයුතු කරන්නේ. නවීන තාක්ෂණය ගැන කොපමණ කථා කළත් තේ කර්මාන්තය තවම එතැනයි.

තේ පර්යේෂණ ආයතනයේ ඉන්න තමුන්නාන්සේලාගේ නිලධාරීන් අඩුම තරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටවත් ගිහින් ඒ ඉඩම්වලට දාන්න ඕනෑ පොහොර මොනවාද කියලා, - එහෙම නැත්නම් ඒගොල්ලන්ට ගේන්න කියලා- සොයලා බැලීමේ කටයුතු කරන්නේ නැහැ. තේ පර්යේෂණ ආයතනය හරහා ගොවියා දැනුවත් කළ යුතුයි, ඔහුගේ ඉඩමේ පසට ගැළපෙන පොහොර මොනවාද කියලා. ඒ දැනුවත් කිරීම අද වෙන්නේ නැහැ. මම අවුරුදු 20ක පමණ සිට තේ කර්මාන්තයේ යෙදී සිටින නිසා දන්නවා, කවුරුවත් කියන්නේ නැහැ යෙදිය යුතු පොහොර මොනවාද කියලා. එම නිසා අපි කියන්නේ තේ ගොවියාව දැනුවත් කරලා, නවීන ක්‍රමවලට ඒ අයව යොමු කරන්නට ඕනෑ කියලායි. එහෙම යොමු නොකළොත් තේ කර්මාන්තය ඉස්සරහට ගෙන යන්න අමාරු වෙනවා. ගොඩක් අය පසුගිය කාලයේ තේ වගාවන් ඉවත් කරලා වෙනත් භෝග වගාවට ගියා; කුරුඳු හිටවන්න ගියා ඒක එතරම් අමාරු නැහැ කියලා. අවුරුදු 150ක් විතර පැරණි තේ කර්මාන්තය රැක ගන්න ඔබතුමා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම හැම දාම කසළ තේ අල්ලනවා. ඒ සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. ඒ වාගේම අපි ඊයේ පෙරේදා දැක්කා තේ නිෂ්පාදනයේදී සීනි කලවම් කරනවා කියලා. ගරු ඇමතිතුමනි, මම දන්නේ නැති නිසායි මේ අහන්නේ. වෛද්‍යවරු කියනවා අපේ ශරීරයේ මෙන්න මේ ප්‍රමාණයට වඩා සීනි තිබුණොත් වැඩියි කියලා. ඒ ප්‍රමාණය 115යි, 110යි, 80යි කියනවා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ තේවල තිබිය යුතු සීනි සාන්ද්‍රණය කොපමණද කියලා තේ ගොවීන් හෝ කර්මාන්ත හිමියන් දන්නවාද කියලා. පරීක්ෂණයක් කර බලා තමන්ගේ තේවල තිබෙන සීනි සාන්ද්‍රණය කොපමණද කියලා දන්නවා නම්, ඒ අය මේ වැඩේ නොකර ඉඳියි.

ගරු නවීන් දිසානායක මහතා
(*மாண்புமிகு நவீன் திஸாநாயக்க*)
(The Hon. Navin Dissanayake)

සාමාන්‍යයෙන් මිනිසෙකුගේ ශරීර උෂ්ණත්වය සෙල්සියස් අංශක 98.4යි කියලා අපි දන්නවා. ඒ වාගේ තේවල තිබිය යුතු සීනි ප්‍රමාණය කොතරම්ද කියලා අපි තවම දන්නේ නැහැ. තේ පර්යේෂණ ආයතනය මඟින් ඒ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වලා නුදුරු අනාගතයේදී baseline එක ලබා දීමට බලාපොරොත්තු වෙනවා.

ගරු ජානක වක්කුඹුර මහතා
(*மாண்புமிகு ஜானக வக்கும்புர*)
(The Hon. Janaka Wakkumbura)

එහෙම නැත්නම් ඒගොල්ලන් සීනි කලවම් කළාද නැද්ද කියලා අපට සොයා ගන්නට බැරි වෙනවා. එම නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ වැඩ පිළිවෙළ හොඳින් කරගෙන යන්න කියලා.

මම එන ගමන් රූපවාහිනියෙන් බලාගෙන හිටියා, ගං වතුරින් හානි වූ අයට වන්දි ගෙවීමට රුපියල් මිලියන 200ක් වෙන් කළා කිව්වා. නමුත් ඒ වන්දි හම්බ වුණේ නැහැ ගරු ඇමතිතුමා. තේ වත්ත නාය ගිය අය ඉන්නවා. ඒ තේ වත්ත නාය ගිහින් වෙන වත්තක් උඩ දැන් තිබෙන්නේ. ඒගොල්ලන්ගේ වත්තේ පස් ටික විතරයි ඉතුරු වෙලා තිබෙන්නේ. නමුත් ඒ අයට වන්දි ලැබුණේ නැහැ. අද වන විට ගං වතුරට යට වෙලා සතියක් විතර තිස්සේ තේ ගස් වතුර යට තිබෙන්නේ. මේ ගස් ටික දවසක් යනකොට මැරෙනවා. මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ගං වතුරෙන් හානි වන කුඩා තේ වතු හිමියාටම මේ වන්දි මුදල ලැබෙන්නට සලස්වන්න කියලා. එහෙම නැති වුණාම එක එක්කෙනා ගිහින් සොයනවා. ඉන් පසුව කියනවා forms පුරවන්න කියලා. මේ ටික ඔක්කොම කරලා ඉවර වුණාම කියනවා, "ඔයාගේ form එක අපි ළඟ නැහැ" කියලා. ඒ නිසා වන්දි දෙන්නේ නැහැ. එක්කෝ form එකක් බාර දුන්නාම ඒක ලැබුණා කියලා තහවුරුවක් අදාළ පුද්ගලයාට දෙන්නට ඕනෑ. කුකුලේ ප්‍රදේශයට පසුගිය වතාවේ මිලිමීටර් 575ක් වැස්සා. ඒ ගමේ මිනිසුන්ගේ විනාශ වුණු තේ වගාවන්වලට අන්තිමට වුණේ මොකක්ද? දීපු form එක නැති වුණා කියලා කිව්වා. ඊට පස්සේ ඔප්පු කර ගන්න විධියක් නැහැ. අපි රජයේ ආයතනයකට ලිපියක් භාර දුන්නාම ඒක භාර ගත්තා කියලා තහවුරුවක් දෙනවා නම් පස්සේ ඔප්පු කර ගන්න පුළුවන්. ඒ නිසා හානියට පත් වුණු අය පිළිබඳව හරියට සොයලා බලලා, ඒ අයට යම් කිසි සාධාරණයක් කරලා, වන්දි ලබා දෙන්න කටයුතු කරන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මම ඔබතුමාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. මේ ලබාදෙන සහනාධාර ගැන ගොඩක් තේ ගොවියෝ දැනුවත් නැහැ. ඒ නිසා නැවත තේ සිටුවන්නේ නැහැ. ඒ අය අවුරුදු 30ක්, 40ක් පැරණි තේ ගස්වලම තමයි තවම දළු කඩන්නේ. ඒ ගස්වල දළු හැදෙන්නේ නැහැ. ඒ නිසා අලුත් වගාවලට යන්න ඒ ගොවීන් දිරි ගන්වලා, දැනුවත් කරලා ඒ සඳහා පොළඹවන්න ඕනෑ. එහෙම නැත්නම් පැරණි ගස්වලින්ම දළු කඩන්න ගියාම ඒ අයට ලැබෙන ආදායම අඩු වෙනවා. ඒකෙන් තේ කර්මාන්තයට වැඩක්

[ගරු ජානක වක්කුඹුර මහතා]

වන්නේත් නැහැ. පසු ගිය අවුරුදුවල තේ නිෂ්පාදනය අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම තේ නිෂ්පාදන පිරිවැය වැඩිවෙලා තිබෙනවා. 2014දී තේ කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කරන්න වැයවෙලා තිබෙන්නේ රුපියල් 422යි. 2015 වන විට ඒ සඳහා රුපියල් 466ක් වැය වුණා. මේ විධියට තේ නිෂ්පාදනය කරන්න යන මුදල වැඩිවෙන කොට කුඩා තේ වතු හිමියාට තමයි අවසානයේ ඒ බර දරා ගන්න වෙන්නේ.

අපි නැවත වරක් ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ වගා හානියට පත් වුණු මේ අයට සහන ලබා දීලා, තේ කර්මාන්තය මීට වඩා ඉදිරියට ගෙන යන්න, ඒ කර්මාන්තයේ යෙදී සිටින අය දැනුවත් කරන්න කියලායි. අඩු ගණනේ එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ඉන්න අය දෙතුන් වතාවකට හෝ දැනුවත් කරන්න පුළුවන් නම් මේ කර්මාන්තය මීට වඩා ඉදිරියට ගෙන යන්න ඔබතුමන්ලාට පුළුවන්කම ලැබෙයි.

තේ කර්මාන්තය සතු රුපියල් බිලියන 50ක් වාගේ මුදලක් ආරක්ෂා කර ගන්න කටයුතු කිරීම පිළිබඳව නැවත වරක් මම ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ගන්නා සෙස් බද්දෙන් තේ මණ්ඩලය හරහා තේ කර්මාන්තය නංවන්න යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම කියනවා. සෙස් බද්ද අරගෙන ඔබතුමන්ලාගේ ආයතනවල තියාගෙන වැඩක් නැහැ. බද්ද ගහන්නේ තේවලට. තේවලට ගහන ඒ බද්දෙන් තේ කර්මාන්තය නහාසිටුවන්න යම් කිසි වැඩ පිළිවෙළක් කරන්න ඕනෑ. අඩුම ගණනේ අපේ රටේ තේ වෙනත් රටවල promote කරන්න - ප්‍රචලිත කරන්න - වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. රූපවාහිනියේ වෙළෙඳ දැන්වීම් දැක්කාම ගොඩක් අය හොඳ නැති දෙයක් වුණත් ගන්නවා. ඒ නිසා, මේ තේවලට වඩා අපේ තේ හොඳයි කියලා ලෝකයේ රටවල ප්‍රචලිත කරන වැඩ පිළිවෙළක් අපි ඇති කරන්න ඕනෑ. සෙස් බද්ද අරගෙන නිකම් ආණ්ඩුවේ තියාගෙන ඉන්නේ නැතිව, සෙස් බද්දෙන් වැඩක් කරන්න ඕනෑ. පුළුවන් නම් කුඩා තේ වතු හිමියාට ඒකෙන් යම්කිසි සහනයක් ලබා දෙන්න ඕනෑ. ඒ නිසා බදු ගන්නවා වාගේම, ඒ බදුවලින් තේ කර්මාන්තයේ නියැළෙන අය වෙනුවෙන් යම් කිසි දෙයක් කරන්න කියලාත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. තේ කර්මාන්තය මීට වඩා ඉදිරියට ගෙන යන්න තරුණ ඇමතිවරයකු හැටියට ඔබතුමාට හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.1.38]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳ විවාදය පැවැත්වෙන අවස්ථාවේ, කුඩා තේ වතු හිමියන් බහුල ප්‍රදේශයක, තේ වගාවට සම්බන්ධ ප්‍රදේශයක මන්ත්‍රීවරයකු හැටියට, ඊට අදහස් කිහිපයක් එකතු කරන්න ලැබීම ගැන මා සතුටට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම අපේ ගරු නවීන් දිසානායක අමාත්‍යතුමාට අපි ඉතාම සතුටින් සුබ පතනවා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ජාතික සංවිධායකවරයා හැටියට පක්ෂ මූලස්ථානයේදී වැඩ භාරගත් දවස නිසා එක්තරා විධියකට අද එතුමාට ඉතාම වටිනා දවසක්. දේශපාලන ජීවිතයේ දිගු ගමනක් ඉදිරියට ගිහිල්ලා මේ රටට සුවිශාල මෙහෙවරක් කරන්න භාග්‍ය, වාසනාව එතුමාට ලැබේවා කියලා මා මුලින්ම ප්‍රාර්ථනා කරනවා.

ගරු අමාත්‍යතුමනි, අද දවසේ තේ කර්මාන්තය අභියෝග රැසකට මුහුණ දීලා තිබෙනවා. ඔබතුමා ඉතා හොඳින් දන්නා පරිදි ලෝකය පිළිගත් අපේ තේ පිළිබඳ විවිධ ගැටලු සහගත තත්ත්ව ලෝක වෙළෙඳපොළේ ඇතිවෙලා තිබෙනවා. මේකට එක හේතුවක් හැටියට අපි කවුරුත් අවිවාදයෙන් මේ කාරණය පිළිගන්නවා. විශේෂයෙන්ම තේ කර්මාන්තශාලා හිමියන් තේ නිෂ්පාදනයේදී සිදු කරන යම් යම් අක්‍රමිකතා නිසා අපේ තේවලට තිබෙන ඒ කීර්තිනාමය සම්බන්ධයෙන් යම් කිසි ගැටලුවකට, අභියෝගයකට අපි මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි වෙහෙස මහන්සි වෙන්න ඕනෑ අපේ තේවල ඒ ගුණාත්මකභාවය ආරක්ෂා කරගන්න. ඈත අතීතයේ අපේ තේවලට තිබුණු ඉල්ලුම සහ ඒ කීර්තිනාමය ආරක්ෂා කරගන්න අපි වැඩියෙන් අවධානය යොමු කළ යුතු කාලයක් එළැඹ තිබෙනවාය කියන එකයි මගේ විශ්වාසය. පසු ගිය යුගයේදී තේ කර්මාන්තය විවිධ අභියෝගවලට මුහුණ දුන් අවස්ථාවල ඔබතුමා ඇමතිවරයා හැටියට මැදිහත් වෙලා ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග අපි අගය කරනවා.

විශේෂයෙන්ම රුසියාව වැනි රටවල් අපේ තේ මිලදී ගැනීමේදී යම් කිසි ගැටලු තත්ත්වයකට මුහුණ දුන්නාම, ඔබතුමා එයට මැදිහත් වෙලා ක්ෂණිකව විසඳුම් හොයපු හැටි අපට මතකයි. එක්සත් ජාතික පක්ෂ රජයන් තිබෙන වකවානුවලදී මෙවැනි ප්‍රශ්න ගැටලුවලට මුහුණ දුන් හැම අවස්ථාවකදී ඒවාට ඍජු තීන්දු -තීරණ ගත්ත හැටි අපට ඉතිහාසය පුරා විවිධ අවස්ථාවල දකින්න ලැබෙනවා. මට මතකයි, 90 දශකයේ මුල් භාගයේ කුඩා තේ වතුහිමියන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දුන්නා. එදා නියඟයට හසුවෙලා තේ ගස් විනාශ වුණා. අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමා එදා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හැටියට මුළු රටේම නියඟයට මුහුණ දුන් කුඩා තේ වතුහිමියන්ට සහන සලසන්න ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, එතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාකරපු හැටි අපට මතකයි. අපි ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනය කරන අවදියේ එතුමා ඒ කටයුතු කරපු හැටි අපට මතකයි. ඒ වාගේම නවීන් දිසානායක මැතිතුමාත් ඍජු තීරණ ගන්න ඉතාම හොඳ නායකයකු හැටියට, තේ කර්මාන්තයට අද එල්ල වෙලා තිබෙන අභියෝග සඳහා විසඳුම් සොයා ගන්න ඒ තරම් අමාරු වෙන එකක් නැහැ කියලා අපි විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, මේ අතරේම, ඔබතුමාට ඉතාම කරුණාවෙන් එක කාරණයක් මතක් කරලා දෙන්න කැමැතියි. කෑගල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමන්ලා මේ සභාවේදී කථා කරන අවස්ථාවේදී ඒ බව සඳහන් කළා. ඔබතුමා කෑගල්ල දිස්ත්‍රික්කයට ගිහිල්ලා කටුපොල් වගාව සම්බන්ධයෙන් මැදිහත් වෙලා ක්‍රියා කරපු ආකාරය එතුමන්ලා පැසසුමට ලක් කළා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගාල්ල දිස්ත්‍රික්කය සම්බන්ධයෙනුත් මේ අවධානය යොමු කරන්න කියලා. අද ගාල්ල දිස්ත්‍රික්කයේ වැව්ලි සමාගම් තමන්ගේ ඉලක්ක අබිබවා විශාල ඉඩම් ප්‍රමාණයක, ඉතාම මෑත කාලයේ හිටවපු රබර් වගාව ගලවලා, තේ වගාව ගලවලා කටුපොල් වගාව විශාල වශයෙන් ව්‍යාප්ත කරගෙන යනවා. මේක මහජනයාගේ විශාල දෝෂ දර්ශනයකට, ඒ වාගේම, මහජන උද්ඝෝෂණ ඇති වෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. විද්‍යාත්මකව ඔප්පු කරන්න පුළුවන් සාධක නැතත් අපට පුරවැසියන් හැටියට දකින්න තිබෙනවා, මේ කටුපොල් වගාවෙන් අපේ පරිසරයටත් ඒ වාගේම ජන ජීවිතයටත් යහපත්

ප්‍රතිචාර, යහපත් බලපෑම් නොවෙයි, අයහපත් බලපෑම් ඇති වන්නේ කියලා. විශේෂයෙන්ම අපේ ප්‍රදේශවල -උඩුගම, නාකියාදෙණිය, යක්කලමුල්ල වැනි ප්‍රදේශවල- තිබුණු දිය ඇළි ඒ වාගේම, කුඩා දොළ පාරවල් හිඳිලා ගිහිල්ලා තිබෙනවා. අද ඒවා දකින්න නැහැ. ඒ වාගේම කුඩා කඳු නායයන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මට කියන්න සාධක නැහැ, කටුපොල් වගාව ඒකට එකම හේතුවද කියලා. තවත් විවිධ හේතු ඇති. නමුත් කටුපොල් වගාව සම්බන්ධයෙන් අපට තිබෙන්නේ එවැනි අත්දැකීමක්. මේ භෝගය කිසියම්ම විධියකින් එහි අතුරු ඵලයක්වත් ප්‍රයෝජනයට ගත නොහැකි භෝගයක්. කුරුල්ලෙක්වත් කන්නේ නැති, අඩුම තරමින් මේ ශාකයක කොටසක් දර හැටියට පාවිච්චි කරන්න පුළුවන්කමක් නැති, කිසිම විධියක අතුරු ඵලයක් නැති භෝගයක් බව නම් අපට පෙනෙන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
තවත් තත්පර කිහිපයකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට දැන ගන්න ලැබුණු විධියට මුළු රටේම හෙක්ටෙයාර 25,000ක විතර තමයි කටුපොල් වගා කරන්න අනුමැතියක් දීලා තිබෙන්නේ. මේ හෙක්ටෙයාර 25,000 ඉක්මවා මේ වන විටත් වගා කරලා තිබෙනවා කියලා අපට පෙනෙන්න තිබෙනවා. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, කාරුණිකව මැදිහත් වෙලා අපේ ප්‍රදේශවල තිබුණු තේ වගාව වැනි වගා ආරක්ෂා කරන ගමන් පරිසරය ආරක්ෂා කර ගන්න කියලා. මේ කටුපොල් වගාව සීමා කරන්න කියලා වැවිලි සමාගම්වලට උපදෙස් දෙන්න, ඒ සඳහා මැදිහත් වෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. මේ සම්බන්ධව මේ සභාවේ තවත් බොහෝ කරුණු ඉදිරිපත් වූ නිසාත්, මට වෙන් වෙච්ච කාලය මිනිත්තු පහක් නිසාත් මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, තව මිනිත්තු දෙකක කාලයක් එතුමාට ලබා දෙනවා.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම මේ කාරණා සම්බන්ධයෙන් මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. තවත් එක යෝජනාවක් කරලා මගේ කතාව අවසන් කරන්නම්. මෙය ප්‍රායෝගිකද, මෙය කරන්න පුළුවන්ද කියන එක ගැන මම දන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, හැබැයි ඇතැම් වැවිලි සමාගම්වලට තමන් සතු ඉඩම්වල වගා කටයුතු කර ගන්න පුළුවන්කමක් නැති බව මට පෙනෙන්නට තිබෙනවා. ඒ අයට අද කටුපොල් වගාවට යොමු වන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඒ අය ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු නිසායි. ඒවායෙන් එකක් තමයි කම්කරුවන් පිළිබඳ ගැටලුව. කම්කරුවන් සොයා ගැනීම, කම්කරුවන්ට පඩි ගෙවා ගැනීම වැනි ගැටලුවලට ඒ අය මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම වෙනත් වැවිලි බෝගවලට යොමු වුණොත්, ඒවා ආරක්ෂා කර ගැනීම, ඒවායෙන් නිසි ලාභය ලබා ගන්න පුළුවන්ද කියන කාරණා පිළිබඳවත් ඒ සමාගම් ගැටලුවකට මුහුණ දීලා ඇති. මෙය තවදුරටත් ගැටලුවක් වනවා නම් කළ යුත්තේ මෙයයි. වගා නොකරපු හිස් ඉඩම් තිබෙනවා නම්, ඒවා දීර්ඝ කාලීන බදු ක්‍රමයක් යටතේ හෝ එහෙම නැත්නම් වෙනත් කිසියම් විධියේ ක්‍රමවේදයකට අනුව ඉඩම් නොමැති අය අතර බෙදා දීමයි. වවන්න හැකියාව තිබෙන; වවන්න කැමැති ජනතාව අතර අක්කරය, දෙක බැගින් හෝ එම ඉඩම් බෙදා දීලා ඒ අය වගාවට යොමු කිරීමයි. කුරුඳු නම් කුරුඳු, තේ නම් තේ, රබර් නම් රබර් ආදි වශයෙන් නිශ්චිත වගාවක් ලෙස වෙන් කරලා, ඒ අයට එහි ප්‍රතිලාභය ලබා ගන්න අවස්ථාව ලබා දෙමින්, ඉඩමේ අයිතිය රජය සතු කරගෙන යම්කිසි විධියක වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන් නම්, අපේ රටේ තිබෙන සෑම බිම් අඟලක්ම වගා කළ හැකියි. නිකම්ම සමෘද්ධි ප්‍රතිලාභ ලබා ගනිමින්, ඒ මතම යැපෙමින් කටයුතු කරන අයට කිසියම් විධියක සාර්ථක අනාගතයක් එමඟින් හදා දෙන්න පුළුවන්කම ලැබෙවි කියන විශ්වාසය මට තිබෙනවා. තේ, රබර් ආදි බෝග වගා කිරීම සම්බන්ධයෙන් වැවිලි සමාගම් තවදුරටත් අභියෝගයකට මුහුණ දී තිබෙනවා නම්; කම්කරුවන් සොයා ගැනීමේ අභියෝගයට මුහුණ දී තිබෙනවා නම්, ඉහත කී ක්‍රමවේදයකට හෝ ගිහින් අපේ රටේ තිබුණු වගාවන් ආරක්ෂා කර ගන්න, කටුපොල් වගාවට යොමු වී තිබෙන වැවිලි සමාගම් එයින් ඈත් කර තේ, රබර් වැනි භෝග වගාවන්ට යොමු කර අපේ තේ කර්මාන්තය ආදි අනෙකුත් කර්මාන්ත ආරක්ෂා කර ගන්න මැදිහත් වෙලා ක්‍රියා කරන හැටියට ඔබතුමාගෙන් ඉල්ලමින්, මට ලබා දුන් අවස්ථාව ගැන ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසන් කරනවා.

[අ.භා.1.47]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා කළ කතාව සම්බන්ධයෙන් මම එතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා. එතුමා ප්‍රකාශ කළ අදහස් සියල්ලම ඉතාම වටිනා අදහස්. මා කතා කරන්න සිටි එක් කරුණක් එතුමාගේ කතාව ඔස්සේ එහි අග්ගිස්සෙන් මතු කර ගන්න කැමැතියි. මේ කොම්පැනිවලට දී තිබෙන රජයේ ඉඩම් සම්බන්ධයෙන්. අපි කවුරුත් දන්නවා, ඒ ඉඩම්වලට ගිය කල දසාව ගැන. ඒවා පරිහරණය කළේ කොහොමද; ඒවා නැවත සංවර්ධනය කළේ කොහොමද; ඒවායේ තිබුණු වත්කම් ඉවත් කරගෙන ගියේ කොහොමද, එම වතුවලින් ලැබුණු අතිදැවැන්ත ලාභය ඒ උදවිය එම ඉඩම්වල ආපසු කොයි ප්‍රමාණයකින් ආයෝජනය කළාද, ආදිය ගැන වාර්තාවක් දැනටමත් ඔබතුමා ලබා ගෙන තිබෙනවා ඇති කියා මම විශ්වාස කරනවා, ගරු අමාත්‍යතුමනි. අද හැමෝම කියන්නේ ඒ කොම්පැනිවලට දුන් රජයේ ඉඩම් මහා විනාශයකට ගිහින් තිබෙනවා කියලායි. කම්කරුවෝත් කියනවා, ඒවා විනාශයට ගිහින් තිබෙනවා කියලා. "එදා තිබුණු වැඩ ප්‍රමාණය අපට දැන් මෙහේ නැහැ, අපි පිට වැඩ සොයාගෙන යනවා; ගමේ වැඩ සොයාගෙන යනවා" කියලා ඒ අය කියනවා. අසල්වාසි මිනිසුන්ගෙන් අහලා බලන්න. ඒ මිනිසුන් කියන්නේත් ඒකයි. එහෙම නම්, ඇයි මේ කොම්පැනිකාරයන්ට ඒ ඉඩම් දිගටම දීලා තිබෙන්නේ? කොම්පැනිකාරයන්ට වගා කරගන්න බැහැ, අවශ්‍ය ශ්‍රමය නැහැ කියනවා. ඊළඟට, මේ කොම්පැනිකාරයන්ට ප්‍රාග්ධනය නැහැ කියනවා. ඇයි එහෙම වන්නේ? Management fee කියා වෙනම ගණනක් තිබෙනවා. Management fee එකට බර ගණනක් එකතු කරනවා. ඉතින් ලාභයක් නැහැ. ඒ නිසා ආණ්ඩුවට දෙන්න කොටසක් නැහැ. ආණ්ඩුවේ බදු මුදලවත් හරියට ගෙවා නැහැ. මම ගියා බදු ගිවිසුමක් සොයාගෙන. බදු ගිවිසුමක්වත් අපේ අමාත්‍යාංශයේ

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

නැහැ. ගරු අමාත්‍යතුමනි, මම දන්නේ නැහැ, බදු ගිවිසුමක් තිබෙනවාද කියා. තිබෙනවා නම් "තිබෙනවා" කියා ඔබතුමා කියන්න. මා සොයාගෙන ගිය වෙලාවේ එවැනි බදු ගිවිසුමක පිටපතක්වත් සොයා ගන්න බැරි වුණා.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
I will make sure that you will get a copy of the lease agreement.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Okay. බදු ගිවිසුම්වල තිබෙන කොන්දේසි පිළිබඳව දිගටම කතා කරන්න මා මේ වෙලාව ගන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු පියංකර ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு பியங்கர ஜயரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. PIYANKARA JAYARATNE *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොම්පැනිවලට ඒ වතු පාලනය කරන්න බැරි නම් අපි ඒවා ආපසු ගන්න ඕනෑය කියලා අගමැතිතුමාත් කියා තිබුණා. ඉතින් ඇත්තටම අපි මේ ගැන තීරණයකට එන්න ඕනෑ. මේකේ තේරුමක් නැහැ. ලයින් කාමර නඩත්තු කරන්නේ නැහැ; පාරවල් නඩත්තු කරන්නේ නැහැ. කිසිම නඩත්තුවකට වියදම් කරන්නේ නැහැ. ලාභය වශයෙන් ලැබෙන ටිකත් පරිපාලන, කළමනාකරණ වියදම් කියලා ඒ සමාගම්වලටම සම්බන්ධ තවත් කොම්පැනියකට හරවනවා. ඒ විධියට මේ රටේ ජාතික සම්පත් වංචා කරමින් තමයි කොම්පැනිකාරයින් වැඩ කරගෙන යන්නේ.

ඊළඟට බලමු, අපේ කුඩා තේ වතු ගැන. කුඩා තේ වතුවලින් මේ රටේ වාර්තාගත තේ නිෂ්පාදනයක් ලබා දීලා තිබෙනවා. අද ලංකාවේ තේ නිෂ්පාදනයෙන් සියයට 60ක් ලබා දෙන්නේ කුඩා තේ වතුවලින්. නමුත් ඒ අයට තිබෙන්නේ භූමියෙන් සියයට 40කටත් අඩු ප්‍රමාණයක්. මම වැරදි නම් මට කියන්න. මම මේ මතකයෙනුයි කියන්නේ. කුඩා තේ වතු හිමියන්ට -කුඩා තේ කට්ටි හිමියන්ට- තිබෙන්නේ, දැවැන්ත වතු යායවල් පාලනය කරන කොම්පැනිවලට වඩා භූමියෙන් අඩු ප්‍රමාණයක්. නමුත් ඒ අයගෙන් තමයි නිෂ්පාදනයෙන් සියයට 60ක් ලැබෙන්නේ. ඒකේ තේරුම මොකක්ද? ඒකේ තේරුම කුඩා තේ කට්ටි හිමියන්ගේ ඵලදායිතාව වැඩියි කියන එකයි. තේ කර්මාන්තය කියන්නේ එක්තරා විධියකට ශ්‍රමය විශාල වශයෙන් වැය වන කර්මාන්තයක්. තමන්ගේ කුඩා තේ කට්ටියට තමන්ගේ ශ්‍රමයත්, පවුලේ ශ්‍රමයත් සැපයීම තුළින්, ඒකට වුවමනා කරන ශ්‍රම සැපයුම ලබා දීම තුළින් ඒවායේ ඵලදායිතාව වැඩි වෙනවා. ඉතින් ඵලදායිතාව වැඩි ඒවාද අපට ඕනෑ, ඵලදායිතාව අඩු ඒවාද? තේ නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ නම් අපි මොකක්ද කරන්න ඕනෑ? අපි කරන්න ඕනෑ ඵලදායිතාව වැඩි කිරීමයි. ඵලදායිතාව වැඩි කුඩා තේ කට්ටි හිමියන් අතර නම්, මහා පරිමාණ සමාගම්වල වතු යායවල් කුඩා තේ කට්ටි බවට, කුඩා තේ ඉඩම් බවට හරවන්න ඕනෑ. කටුපොල් වගා කරන එක නොවෙයි කරන්න තිබෙන්නේ.

කටුපොල් වගා කරනවාය කියන්නේ, මේ රටට කරන ශාපයක්. මම හිතන විධියට අපේ ගරු ඇමතිතුමාටත් ඒක තේරුම් ගිහිල්ලා තිබෙන නිසා තමයි එතුමා ඒ සඳහා මැදිහත් වෙලා තිබෙන්නේ. කටුපොල් වගාව ගැන තිබෙන අත් දැකීම් අනුව අපි යමු. විශේෂඥයින්ගෙන් සාක්ෂි ගන්න යන්න එපා. මොකද, කටුපොල් සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් roundtable සාකච්ඡාවක් තිබුණා. එකක් නොවෙයි, දෙකක් විතර තිබුණා. ඒ roundtable සාකච්ඡාවට ආවේ, ඔක්කෝම විශේෂඥයෝ. කටුපොල්වලින් එහෙම හානියක් තිබෙනවාය කියලා සොයා ගත හැකි විද්‍යාත්මක සාක්ෂියක් නැහැ කියලා, ඒ roundtable සාකච්ඡාව අවසන් කළා. මම කියන්න හදන්නේ මේකයි. ඒ roundtable සාකච්ඡාවලට එන්නේ කවුද, ඒ විද්‍යාඥයෝ ගැන වගබලා ගන්නේ කවුද කියන කාරණා අනුව තමයි ඒවායේ ප්‍රතිඵලයත් ලැබෙන්නේ. ඒ නිසා අපි අපේ සාක්ෂිවලට යමු. කටුපොල් වගා කරන අපේ ප්‍රදේශවලට යමු. ඒ විපර්යාසය අපට පෙනෙන්න තිබෙනවා. මිනිස්සු කියනවා; මිනිසුන්ට දැනෙනවා. ඒ ප්‍රදේශවල මිනිස්සු ඇවිල්ලා ඕනෑ පදම් තොරතුරු දෙයි, කටුපොල් වගාවෙන් පසුව මේ ප්‍රදේශයේ ඇති වුණු විපර්යාසය මේකයි කියලා. ඉතින් අපට ඒ මත යන්න පුළුවන්. කටුපොල් වගාවට දීලා තිබෙන සීමාව තවත් අඩු කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. ඇයි, කටුපොල් වගාවට යන්නේ? කුඩා බිම් කට්ටිවල තේ වගා කරලා හොඳ ඵලදාවක් ගන්න පුළුවන්. එහෙම නම් අපි කුඩා බිම්වලට හැරෙමු. ඇයි, අපට කුඩා බිම්වලට හැරෙන්න බැරි? කොම්පැනිකාරයින්ට අවුරුදු පනහකට දුන්නා නම්, කුඩා බිම් ප්‍රමාණ වෙන් කරලා, මේවායේ ඵලදායී ආකාරයට වගා කරන්න කියලා මිනිසුන්ට දෙන්න අපට බැරි ඇයි? එහෙම කළොත් අපේ ලංකාවේ තේ නිෂ්පාදනය දෙගුණයක් කරන්න අපට පුළුවන්. ඉතින් අපි ඒක කළ යුතුද, නැද්ද? එහෙම නැත්නම් කොම්පැනිකාරයින්ට වහල් වෙලා, අපේ තේ වගාවේ අද තිබෙන මේ පරිහානිය දරා ගත යුතුද? අපි මේ ආණ්ඩුව ගෙන යන්නේ කොම්පැනිකාරයන් වෙනුවෙන්ද, එහෙම නැත්නම් මේ රටේ ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන්ද, රටේ ආර්ථිකයේ යහපත වෙනුවෙන්ද? කුඩා තේ වතු හිමියන් ලබා දෙන ඵලදායී අස්වැන්න දිහා බැලුවාම, මේ රටේ අද අපට තිබෙන අත් දැකීම අනුව අක්කර ලක්ෂයකට වඩා තිබෙන විශාල ඉඩම් යායවල් කුඩා ඉඩම් බවට පරිවර්තනය කරලා අපට කොයි තරම් විශාල අස්වැන්නක් ලබා ගන්න පුළුවන්ද?

ඊළඟ කාරණය මේකයි. අපිට තේ කම්හල් තිබෙන්න පුළුවන්. ඒවා නිකම් විසුරුවා හරින්නය කියා මම කියන්නේ නැහැ. නමුත්,

තේ කම්හල් සංඛ්‍යාවෙන් සීමාවක් තිබෙන්න ඕනෑ. තිබෙන දළු ප්‍රමාණයට වඩා තේ කම්හල් තිබුණාම මිනිස්සුන්ට කරන්න පුළුවන් මොනවාද? එතකොට තමයි factory එක ඇතුළේ හොරකම පටන් ගන්නේ. ඇයි? එතකොට තරග කරන්න අමාරුයි. අද දළු ගන්න නියමිත ගණනට වඩා වැඩි මිලක් ගෙවන්න ඕනෑ,. ඒ මොකද? තේ දළුවලට තිබෙන තරගය ඒ තරම් වැඩියි. තිබෙන දළු ප්‍රමාණය මදි. දළු ප්‍රමාණය මදියි නම්, factories වැඩි වෙනවා නම්, ඒ ගැන තමුන්නාන්සේලා කුමක් හෝ තීන්දුවක් ගන්න ඕනෑ. එහෙම තීන්දුවක් නොගත්තොත්, මේ ඔක්කොම අර්බුදයට යනවා. හොරකම් කරන කට්ටිය අර්ථ සාධක අරමුදල් ගෙවන්නේ නැහැ; කම්කරුවන්ට ගෙවන්න තිබෙන දීමනා ගෙවන්නේ නැහැ; ඔවුන්ගේ වැටුප් වෙලාවට ගෙවන්නේ නැහැ. ඊළඟට, තමන්ගේ ලාභය වැඩි කර ගන්න මේ නිෂ්පාදනවල නොයෙකුත් හොර-මැරකම් කරනවා. මේ විධියට මිනිසුන්ව හොර-මැරකම්වලට පොළඹවමින්, කම්කරුවාගේ දීමනා හරියට නොගෙවමින් තමයි ඔවුන් මේ තරගයේ ඉන්නේ. තරගය හොඳයි. නමුත්, තරගය සිද්ධ වෙන්න ඕනෑ එක්තරා සම පැතලි බිමකයි. දැන් එහෙම නොවෙයි වන්නේ. නියමිත විධියට කර්මාන්තශාලාව පවත්වා ගෙන යන අය, හරියට තේ වතු පාලනය කරන අය, නියම විධියට වැටුප් ගෙවන අයයි මේ තරගයේ පස්සට වැටෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාට කියා සිටිනවා, තේ වතු ප්‍රමාණයත්, දළු ප්‍රමාණයත් යම් ආකාරයකට සම වන විධියට තේ කම්හල් තිබෙන්න ඕනෑ බව.

විශාල තේ ඉඩම් කුඩා තේ ඉඩම් බවට පරිවර්තනය කරලා අපි කම්හල් හදමු. ඒ කම්හල් රජයට අයත් කුඩා තේ ඉඩම් හා සම්බන්ධ කරන මධ්‍යම කේන්ද්‍රය කරමු. ඒ අය ඒ දළු ඔක්කොම අපේ කර්මාන්තශාලාවට දෙන්න ඕනෑ. ඒ නියමය අපි ඇති කර ගනිමු. අද දළුවලට පවතින නියමිත මිල ගෙවන පදනම මත ඒ අයගේ දළු අපේ කම්හල්වලට දෙන සම්බන්ධීකරණයක් අපි ඇති කර ගනිමු. එසේ කළොත්, මේ රටේ තේ නිෂ්පාදනයේ විශාල වැඩිවීමක් වෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, පුළුවන් නම් තමුන්නාන්සේගේ කාලයේ මේ විප්ලවය කරන්නය කියා. තමුන්නාන්සේ ඉදිරියේ තිබෙන අභියෝගය තමයි, තේ නිෂ්පාදනය වැඩි කර ගැනීම. ඒ සඳහා වුවමනා කරන ඵලදායීතාව වැඩි කරගන්න කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම "clean tea" සම්බන්ධයෙන් කථා කරනවා. අද ලෝකය ඉල්ලන්නේ පිරිසිදු නිෂ්පාදනයි. අපේ විශාල තේ වතුවල වැඩකරන කම්කරුවන් අද ජීවත් වන විධිය මොකක්ද? ඒ අය තවමත් ජීවත් වන්නා වූ ඒ ජේළි කාමරවල අද තිබෙන තත්ත්වය මොකක්ද? ඒවායේ දිග, පළල ප්‍රමාණය කුමක්ද? මේ කාරණා ජාත්‍යන්තරයට යනවා. ජාත්‍යන්තරය -විශේෂයෙන්ම යුරෝපය හා බටහිර ලෝකය- අද තෝරා බේරා ගෙනයි තේ මිලදී ගන්නේ. මේ කර්මාන්තයට සම්බන්ධ ශ්‍රමිකයන් ඉන්නේ මොන වාගේ තත්ත්වයකද, ඒ ශ්‍රමිකයන්ගේ ජීවන මට්ටම කුමක්ද, ඔවුන් ජීවත් වන පරිසරයේ තත්ත්වය කුමක්ද කියන කාරණාවලට අදාළව එන වාර්තා අනුව ඒ අය තීන්දු කරන්න ඉඩ තිබෙනවා, "ලංකාවෙන් එන්නේ අපිරිසිදු තේ" කියලා. ඒ කියන්නේ, තේවලට මොනවත් එකතු කරලාය කියන එක නොවෙයි. මේක වරද්දා ගන්න නරකයි. තේවලට යම් යම් දේවල් එකතු කරලා තේවල තිබෙන වටිනාකම පහත හෙළන කාරණාව වෙනම එකක්. ඒ ගැන අපි කථා කර තිබෙනවා. මම මේ කියන්නේ තේ නිපදවන; එම කර්මාන්තයට සම්බන්ධ ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්වය ගැනයි; ඔවුන් අද ලබන්නා වූ වැටුප් මට්ටම, ඔවුන්ගේ ගෙවල් දොරවල්වල තත්ත්වය, ඔවුන්ගේ දරිද්‍රතාවේ ප්‍රමාණය, ඔවුන්ගේ දරුවන්ගේ මන්දපෝෂණයේ ප්‍රමාණය ගැනයි මම කියන්නේ. ගරු ඇමතිතුමනි, උඩරට ප්‍රදේශවල, ඒ වාගේම වතුකරයේ මන්දපෝෂණය කොච්චර වැඩිද කියා ඔබතුමා දන්නවා. මේවා දැනගන්න කොට අපේ තේ ගැනුම්කරුවන් කල්පනා කරන්න පටන් ගන්නවා, "මොන වාගේ ශ්‍රමයකින් එන නිෂ්පාදනයක්ද අපි අද මේ මිලදී ගන්නේ" කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ මට යමක් කියන්න ඕනෑ; ඒ පිළිබඳව මගේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ ආර්ථික කමිටුවේ වාර්තාවක් ඉදිරිපත් වුණේ නැහැය කියා මම කිව්වා. මොකද, මම එම කමිටුවට සහභාගි වුණේත් නැහැ, එම කමිටුව රැස් වුණු බවක් මම දන්නෙත් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කමිටුවට සහභාගි වුණු අයගේ නාම ලේඛනයේ ඔබතුමාගේ නම තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ නම තිබෙන්න පුළුවන්. නමුත් මම එදා සිටියේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එම ලේඛනයේ නම සඳහන් වෙන්නේ ඔබතුමා එයට සහභාගි වූ නිසායි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම එදා සිටියේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එම නාම ලේඛනය මම ඔබතුමාට එවන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එය ඔබතුමා මට එවන්න. මම දැන් ඒ ගැන කථා කරන්නේ නැහැ. මම එදා සිටියේ නැහැ; ආවේ නැහැ කියා හිතාගෙන අවංකවම තමයි එහෙම කිව්වේ. එසේ ප්‍රකාශ කිරීම ගැන මගේ කනගාටුව පළ කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒකට කමක් නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ මේ කාරණයයි. මේ වතුවල වැඩ කරන කම්කරුවන්ට පර්වස් හතක් ලබා දෙනවාය කිව්වා. එහෙම නැත්නම් පර්වස් හයක් කියමු. ඒවා ලබාදීලා අවසාන කරන්න. මේ මිනිස්සු පරම්පරා කීයක් තිස්සේ වැඩ කර තිබෙනවාද බලන්න. අපිට කොයි තරම් ඉඩම් ප්‍රමාණයක් තිබෙනවාද, දෙන්න හදන මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද කියා අපි සලකා බලන්න ඕනෑ. මේ ඉඩම් එක තැනකින්ද දෙන්නේ? නැහැ. විශාල ප්‍රදේශයකින් නේ දෙන්නේ. ඔවුන්ට පර්වස් හත බැගින් දෙන්න. ගෙවල් හද හදා ඉන්න එපා. ගෙවල් හද හදා ඉන්න ගියොත්, තව ශත වර්ෂයක් යනකම් ඒ කටයුතු අවසන් වෙන්නේ නැහැ. ඉන්දියාවේ "ඉඩම් භාරය" කියා එකක් තිබෙනවා. එම ඉඩම් භාරයේ ආකෘතිය සැලකිල්ලට ගෙන ඔබතුමන්ලාත් මේ මිනිසුන්ට ඉඩම් ටික බෙදා දෙන්න. ඒ මිනිසුන් එහි මොකක් හෝ ගෙපළක් අටවා ගනිවි. එතකොට ඒ මිනිසුන්ට තමන්ගේ කියලා බිමක් තිබෙනවා. ඒ මිනිසුන් ඒකේ මොනවා හෝ කරාවි. එසේ කිරීමෙන් ඒ මිනිසුන්ට අලුත් හැඟීමක් එනවා, තමන් ඉන්නා වූ රටේ තමන්ට අයිති වූ පොඩි බිම් කැබැල්ලක් හෝ තිබෙනවාය කියලා. ඒ මිනිසුන්ට මේ පර්වස් හත නොදී හැම දාම ලෝභකමට මිරිකාගෙන තියාගෙන ඉන්නවා. හැම දාම, හැම ආණ්ඩුවම එහෙම කරනවා. මේ කටයුත්ත කවදාවත් ක්‍රියාවට නැඟුණේ නැහැ. දැන් ඒවායේ ගෙවල් හද හදා දෙන්න හදනවා. ඒක දීර්ඝ කාලයක් ගතවන වැඩක්. ඒක නිසා ඒ මිනිසුන්ට එම පර්වස් හතේ බිම් කැබලි වහාම දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ගම්වල වුවමනාකම් තිබෙනවා; වතුවල කම්කරුවන්ගේ වුවමනාකම් තිබෙනවා. එක්කෝ කනත්තකට නැත්නම් මිනිසුන්ට කුඩා කොටුවක් කර ගන්න කුඩා බිම්කඩවල් අවශ්‍ය වෙනවා. නමුත් ඒ කිසිදෙයකට ඉඩ දෙන්නේ නැහැ. මේ කොම්පැනි වතුවලින් දර කැල්ලක්වත් අහුලා ගන්න දෙන්නේ නැහැ. මේ වාගේ ඉතාම දරුණු විධියට තමයි මේ කොම්පැනි වතුවල පාලනය ගෙන යන්නේ. කම්කරුවන් හා අවට ගම් වැසියන්ගේ වුවමනා වෙනුවෙන් ඔවුන් කිසිම ඉඩක් ලබා දෙන්නේ නැහැ. මේවා රජයේ ඉඩම්. ඔවුන් මතුපිට තිබෙන වැවිල්ලේ බදුකාරයන් විතරයි. දැන් ඒවායින් අක්කර කාලක ප්‍රමාණයක්වත් ගන්න බැරි විධියට එම ගිවිසුම්වල තිබෙන අයිතිය ගැන ඔවුන් කථා කරනවා. එක්කෝ මේ ගිවිසුම් වෙනස් කරන්න, නැත්නම් වුවමනා කරන පියවර ගන්න. දැන් ප්‍රාදේශීය සභාවටත් සංශෝධනයක් ගෙනැත් තිබෙනවා. එම සංශෝධිත කෙටුම්පතේ සඳහන් වෙන්නේ මොකක්ද? වත්තේ අධිකාරිය සමඟ එකඟත්වයෙන් ප්‍රාදේශීය සභාවට වැඩ කරන්න කියා තමයි එහි තිබෙන්නේ. මෙතැන ඉන්නේ ප්‍රාදේශීය සභාව සහ කම්කරුවන්. කම්කරුවන් කියන්නේ ඡන්ද දායකයන්. ඒ මිනිසුන් ඉන්නේ ඒවායේ. "අපිට මේ පාර හදා දෙන්න, අපිට මේ පඩිපෙළ හදා දෙන්න, මේ කානුව බැඳ දෙන්න" කියා එම කම්කරුවන් කියනවා නම්, වත්තේ අධිකාරිගෙන් ආයෙත් ඒකට මොන අවසරයක්ද අවශ්‍ය වෙන්නේ? ඒ නිසා කරුණාකරලා එම පනත් කෙටුම්පතෙහි සඳහන්, "අධිකාරිවරයාගේ අවසරය" කියන කොටස ඉවත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම මතු කළ ප්‍රශ්නය නිසා තමුන්නාන්සේ කරදරයට පත් වුණා නම් මම ඒකට කනගාටුව පළ කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, ඒක පොඩි අඩු පාඩුවක් විතරයි. බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.03]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරමින්, මේ රටේ ජාතික දේහයට ලොකු වටිනාකමක් ලබා දෙන තේ ආර්ථිකය නැවත නහා සිටුවන්නත්, තේ මණ්ඩලයට ඉදිරියේදී ඉතාම කාර්යක්ෂමව කටයුතු කරන්න පුළුවන් ශක්තියක් ලබාදීමටත් කටයුතු කිරීම සම්බන්ධවත් අපේ ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම ගරු නවින් දිසානායක මැතිතුමාට සුබ පතනවා. මොකද, එක්සත් ජාතික පක්ෂයේ නායකත්ව මණ්ඩලය තුළ ජාතික සංවිධායකවරයා හැටියට එතුමා අද වැඩ භාර ගත්තා. ඒ තුළින් පක්ෂයට සහ රටේ දුක් විඳින අහිංසක වතු කම්කරු ජනතාව වාගේම, තේ දල්ලෙන්, රබර් කිරි කඳුළෙන් ජීවිතය ගැට ගසා ගන්නා ජනතාවගේත් අවශ්‍යතා වෙනුවෙන් කැපී පෙනෙන සේවයක් ඉෂ්ට කරලා මේ රටේ ශ්‍රේෂ්ඨ නායකයෙක් බවට පත් වෙන්න එතුමාට හැකියාව ලැබේවා!යි කියා මුලින්ම මා ප්‍රාර්ථනා කරනවා.

මට කලින් කථා කළ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ජ්‍යෙෂ්ඨයෙක් හැටියට, 1970 සමඟි පෙරමුණ රජයේ කොටස්කාරයෙක් හැටියට -අද ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාට භාරව තිබෙන- එදා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම ගෙනැවිත් සියලු වතු රජය සතු කළා. ඉඩම් රජය සතු කරන්නට කලින් මේ රටේ තේ ආර්ථිකය ඉහළ මට්ටමක තිබුණා. එසේ කියන්නේ, මේ රටේ ඕනෑම පොඩි එකෙක් දන්නවා ශ්‍රී ලංකාවේ ආර්ථික දේහයේ ලොකු වටිනාකමක් දී තිබුණේ තේ, රබර්, පොල්වලටයි කියන එක. එසේ තිබුණු ආර්ථිකය විදේශ රැකියාවලට පළමුවන ස්ථානය ගිහින්. ඇහලුම් කම්හල් නැත්නම් ඇහලුම් අපනයනය සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලැබිලා. සංචාරක ව්‍යාපාරයත් එක්ක ගන්නකොට තේ කර්මාන්තය දිනෙන් දිනම කඩා වැටෙමින් පවතිනවා. මේ පිළිබඳ සංඛ්‍යාලේඛන ගත්තත් එහෙමයි. එතුමා කටුපොල් වගාව ගැන කිව්වා. කටුපොල් වගාව නැත්නම් "ඔයිල් පාම්" වගාව ගැන විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා දන්නවා. කටුපොල් වගාව අපට හිසරදයක් බවට පත්ව තිබෙනවා. කටුපොල් වගා කරන්න අවශ්‍ය කටයුතු කළේ මොන කාලයේද කියන එක පිළිබඳව ඔබතුමන්ලා හෘදය සාක්ෂිය අනුව කරුණාකර ප්‍රකාශ කරන්න. සමහර වතු සමාගම් අක්කර විසි දහසක් පමණ තමන්ගේ වතු වගා කරන්නට තිබෙද්දී එයින් වැඩිම ප්‍රමාණයක් සමහර විට තෙත් කළාපය තුළ- [බාධා කිරීමක්]

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, මට මේ ගැන වචනයක් කියන්න අවශ්‍යයි. මේ ගැන ප්‍රථමයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ තමයි අවසර දී තිබෙන්නේ. එතැන හෙක්ටෙයාර විසි දාහකට අවසර දී තිබෙනවා. ඊට අමතරව අපි අහලක්වත් දෙන්නේ නැහැ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු ඇමතිතුමා පැහැදිලි කළා. මා කියන්නට ගියේ ඒකයි. මේ කටයුත්ත පටන් ගත්තේ කාගේ කාලයේද කියා හෘදය සාක්ෂිය අනුව බලන්න ඕනෑ. එදා මේ රටේ කටුපොල් වගා කරන්නට එනකොට මහින්ද රාජපක්ෂ රජයේ ප්‍රබලයන් හැටියට එතුමන්ලාට ඒ හඬ නහන්න තිබුණා. එදා ඒ හඬ බිඳක්වත් නහන්නේ නැතිව ඒවා වගා කර, විනාශ කර මේ රට අවුලෙන් අවුලට පත් කර, කඳුළෙන් ජීවිත ගැට ගසා ගන්නා මිනිසුන්ට ඒ අවශ්‍යතාවය ඉෂ්ට වෙන්නේ නැතිකොට අද මහලොකුවට බෙරිහන් දෙනවා. මම ඒකයි කනගාටු වෙන්නේ. මේවා ආරම්භ කර, අපට තමයි මේවායින් වුණු සියලු තුවාලවලට බෙහෙත් දමන්නට සිද්ධ වෙලා තිබෙන්නේ.

මම ගරු නවින් දිසානායක ඇමතිතුමාට කථා කළා. විශේෂයෙන් ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී අපිට විශාල ප්‍රශ්නයක් මතු වුණා. කටුපොල් වගාව නිසා අපි ඉපදුණු ප්‍රදේශවල ගම්බිම් ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයට පත් වෙලා තිබෙන බව අපි දන්නවා. ඇළක, ගඟක බැහැලා යන්න පුළුවන්කමක් නැහැ. කකුල් කුණුවෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. හිතුවක්කාර විධියට කටුපොල් වගා කිරීම නිසා ඒ ප්‍රදේශවල පරිසරය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. එදා ඒ අත්සන් කළ ගිවිසුම් ඕනෑ ඕනෑ විධියට අවලංගු කරන්නට ගරු නවින් දිසානායක ඇමතිතුමාට පුළුවන්කමක් නැහැ. නමුත් මේ කාරණයේදී එතුමා හොඳ පාලනයක් කරනවා. අපි දැනටත් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. එම නිසා අද-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ රජයට මේ සඳහා පනත් කෙටුම්පතක් ගේන්නත් පුළුවන් -

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

පනත් කෙටුම්පතක් ගෙනෙන්න පුළුවන්. ඔබතුමන්ලා සහයෝගය දෙන්න. ඔබතුමන්ලා විසින්ම රෝපණය කර, ඵලදායි විධි ඇති කරන්න කටයුතු කළ දේ සඳහා සහයෝගය දෙන්නය කියා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලනවා. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා වැනි හැමදාම කොම්පැනිවලට බැණ බැණ ඉන්න ඔබතුමන්ලා එදා ඒ කටයුතු කර, තමන්ට ඕනෑ විධියට කොම්පැනිවලට වගා කරන්නට අවශ්‍ය පසුබිම සකස් කර, ඒවාට අත ඉස්සුවත් ඒ අවස්ථාවේදී හඬක් නැහුවේ නැහැ කියා මම ප්‍රකාශ කරනවා.

2015 වර්ෂයේ මේ ආණ්ඩුව එනකොට බොහෝ දෙනෙක්-ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත් එහෙමයි. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා දුම්මල වරම අර ගෙන කිව්වා, "තේ කර්මාන්තය ඉවරයි. තේ කර්මාන්තය අන්තිම විධියට නන්නත්තාර වෙලා. තේ ෆැක්ටරි වහනවා. තේ ගොවියා අනතුරේ." කියා. නමුත් මම අහනවා, දැන් තේ කිලෝ එක රුපියල් 110ට යනකොට, රුපියල් 108ට එනකොට, රුපියල් 102ට එනකොට, රුපියල් 100 අතරේ දෝලනය වෙනකොට කිසිම කෙනෙක් කථා කර කිව්වේ නැහැ, "මේ ආණ්ඩුවට පින් සිද්ධ වෙන්න දැන් තේ කර්මාන්තය හොඳයි." කියා. ඒ ප්‍රතිඵලය ගැන අද කථා කළේ නැහැ. එතුමන්ලා තවමත් මේ ගැන ඉතාමත්ම වැරදි සඟගතව බලනවා. ඒ ගැන අපි කනගාටු වෙනවා. ඇත්තටම ඇත්ත ඇති සැටියෙන් දැකලා ඒවාට ප්‍රසාදය පළ කිරීමත් තමුන්නාන්සේලාගේ යුතුකමක්. අපි සතුටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කෙටි කාලය තුළ තේ නිෂ්පාදනය ඉතාමත් හොඳ තත්ත්වයකට පත් වෙලා තිබීම පිළිබඳව අපේ දිස්ත්‍රික්කවල ඉන්න අභිංසක මිනිසුන්ට තේ දල්ලෙන් ජීවත් වෙන්න පුළුවන් වටපිටාව අද නිර්මාණය වෙලා තිබෙනවා. කිසි භයක් නැහැ. රැකියා ප්‍රශ්නයට විසඳුමක් හැටියට මේ කර්මාන්තය පත් වී තිබෙනවා. රැකියා පිළිබඳව නැත්නම් වෘත්තීමය තත්ත්වයන් පිළිබඳව මේ ගම් ප්‍රදේශවල ඉන්න මිනිස්සු ආණ්ඩුවට බරක් වුණේ නැහැ. එම නිසා අපි සතුටු වෙනවා.

අද තේ අක්කර භාගයක් තිබෙන මිනිහෙකුට ජීවත් වෙන්න පුළුවන්කම ලැබිලා තිබීම පිළිබඳව අපි සතුටු වනවා. එහි ගෞරවය අපි මේ රජයට වාගේම වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා හැටියට නවින් දිසානායක මැතිතුමාට බාර කරනවා. අපි එතුමාට ඒ වෙනුවෙන් ගෞරව කරනවා වාගේම අපේ ප්‍රසාදය පළ කරනවා. එතැනින් අපි නවතින්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කටයුතු සිදු කිරීමේදී අපිට යම් යම් බාධක, කම්කටොලු ආවා. තේ නිෂ්පාදනය මීට වඩා වැඩි කරන්න අවස්ථා තිබෙනවා. තේ නිෂ්පාදනයට යන වියදම ගත්තාම, එදා ඉඳලා අද වනකොට අපිට ඒ වෙනුවෙන් විශාල වියදමක් දරන්න සිදුවෙලා තිබෙන බව අපි දන්නවා. ඊට ප්‍රධාන හේතුව තමයි තේ ආර්ථිකයත් එක්ක කටයුතු කිරීමේදී අපිට ඉතාම අවාසනාවන්ත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වීම. මොකද, තේ නිෂ්පාදනය ආශ්‍රිතව වැඩ කටයුතු කිරීමේදී අද වනකොට ශ්‍රමය ලබා ගන්න බැරිකමක් ඇතිවෙලා තිබෙනවා. අද තේ නිෂ්පාදනයට වැය වන මුදල වැඩිවෙලා තිබෙනවා. හැබැයි, තේ නිෂ්පාදනය වැඩි කර ගැනීමේ අරමුණින් ඒ අවස්ථාවේදී "ග්ලයිෆොසේට්" නමැති රසායනික ද්‍රව්‍ය තහනම් කළා. නමුත් එලෙස "ග්ලයිෆොසේට්" භාවිතය තහනම් කිරීම අද වනකොට ප්‍රබල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. එක් කෙනෙකු දෙදෙනකු කියපු පලියට මතවාදයක් ගොඩ නහන්නේ නැතිව, විමර්ශනයක් කරන්නේ නැතිව, සමීක්ෂණයක් කරන්නේ නැතිව, "ග්ලයිෆොසේට්" තහනම් කිරීම තුළින් අපි සමහර වෙලාවට ඉල්ලන් කෑවාය කියා මා හිතනවා. ඒ කාරණය තමයි අපේ තේ නිෂ්පාදනය අඩු වෙන්නට ඒ එක්කම නිෂ්පාදන වටිනාකම වැඩි වන්නට ප්‍රධාන හේතුවක් වුණේ. ඡන්ද කාලයේදී තේ ගෝනි දෙකක් තියාගෙන ඉන්න මනුස්සයා ළඟට අපි ගිහිල්ලා කථා කළාම ඔවුන් මොකක්ද කිව්වේ? "මන්ත්‍රීතුමා, තේ මිල වැඩි වුණාට වැඩක් නැහැ. තේ වත්තේ වැඩ කරන මිනිසුන්ට අපිට දැන් පඩි ගෙවන්න බැහැ. අද රුපියල් 1,500ක් විතර ගෙවන්න වනවා. ඒ වෙනුවෙන් විශාල වියදමක් දරන්න වනවා. තේ දලුවල මිල වැඩි වුණාට ශ්‍රමය වෙනුවෙන් මුදල් ගෙවනකොට ලාභය අඩු වනවා." කියලා ඔවුන් කිව්වා.

"ග්ලයිෆොසේට්" තහනම් කරන්න කියලා අපි පසු ගිය කාලයේ කෑ ගැහුවා. නමුත් පිට රටින් එන ධාන්‍ය වර්ග, හාල් වර්ගවලට මොන දේවල් දාලා ගෙනෙනවාද කියා කියන්න අපි දන්නේ නැහැ. එහෙනම් පිට රටවලින් අපේ රටට ආනයනය කරන සියලු නිෂ්පාදන පිළිබඳව අපි විමර්ශනය කරන්න වනවා. ධාන්‍ය වර්ග වගා කරලා, ඒවාට පොහොර දමන කාලයේ ඉඳලා ඒවා ගැන හොයා බලලා තමයි අපි ලංකාවට ගෙන්වන්න වෙන්නේ. ඒ නිසා මේ වාගේ සුළු සිදුවීම් පිළිබඳව ලොකුවට හිතන්න හොඳ නැහැ. මේ රටේ තේ වගා කරන කිසිම කෙනෙකු "ග්ලයිෆොසේට්" තහනම් කරන්න කියා කියන්නේ නැහැ. ඒ ජනතාවගෙන් සියයට

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

90ක්ම කියන්නේ "ග්ලයිෆොසේට්" අපිට අවශ්‍යයි කියලායි. මොකද, ඒ තුළින් විශේෂයෙන් තේ වවන මිනිසුන්ගේ වියදම අඩු කරන්න පුළුවන්කමක් ලැබෙනවා. ඒ නිසා බය නැතිව ඔබතුමාට අපි කියනවා, ජනතාවගේ අවශ්‍යතාව අනුව අපි කටයුතු කරන්න ඕනෑය කියලා. තේ ආර්ථිකය සඳහා "ග්ලයිෆොසේට්" ආපසු දෙන්න කියලා සියයට 90ක් ජනතාව කියනවා නම් අපි ඒ කාරණය ඉෂ්ට කරන්න ඕනෑ. අපි එය පැත්තකට දාලා, කණපිට ගහපු නිසා තමයි පසු ගිය පළාත් පාලන මැතිවරණයේදී ජනතාව අපිට සමහර වෙලාවට රතු තීන්දුවක් ලබා දුන්නේ. ඒ විතරක් නොවෙයි, අද-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
තේ නිෂ්පාදනය අඩු වුණත් වටිනාකම දිනෙන් දින වැඩි වන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි සතුටු වනවා. 2011 වනකොට වටිනාකම රුපියල් මිලියන 164,869යි. 2012 අවුරුද්දේ වටිනාකම රුපියල් මිලියන 180,429යි. 2017 වනකොට වටිනාකම රුපියල් මිලියන 233,338 දක්වා වැඩිවෙලා තිබෙන බව අපි දන්නවා. ඒ නිසා නිෂ්පාදනයත් කිලෝග්‍රෑම් දහස් ගණන්වලින් ගත්තාම 288,984 දක්වා වැඩිවෙලා තිබෙන බව අපි දන්නවා. කවුරු මොනවා කිව්වත් මේ කාලය තුළ අපිට සතුටු වෙන්න පුළුවන්කමක් තිබෙනවා. "ආර්ථිකය වැටිලා; නන්නත්තාර වෙලා; යන්න එන්න අතක් නැහැ. මේ ආණ්ඩුව හෙට වැටෙනවා." කියා කිව්වත් අපි අපනයන කෘෂිකර්මය අතින් ඉහළ තත්ත්වයක සිටිනවා. ඒ විතරක් නොවෙයි.

විශේෂයෙන්ම නිෂ්පාදන රටාවන් තුළින් අපි ඉහළ මට්ටමකට ගිහිල්ලා තිබෙනවා. ඒ අතරින් තේ නිෂ්පාදනය අතින් අපි ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ඔය කෑ ගහන අයට මම කියනවා, මේවා ගැන කථා නොකරන්නේ කටේ පිට්ටු නිසාද කියලා. කරුණාකරලා මේ කාරණා ගැනත් කථා කරන්න කියලා අපි කියනවා. මොකද, මේ කාරණා සම්බන්ධයෙන් සාධාරණ ලෙස අපි විවේචනය කළ යුතු වනවා.

නවින් දිසානායක මැතිතුමාට මේ රටේ තේ ආර්ථිකය සහ රබර් ආර්ථිකය බාර දීලා තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ යම් යම් ආයතන තිබෙනවා.

අපේ වාසුදේව නානායක්කාර මැතිතුමා කියපු සමහර කාරණා එක්ක මම එකඟ වනවා. සමහර තැන්වල වතු සමාගම් හිතුවක්කාර විධියට කටයුතු කරනවාය කියා එතුමා කිව්වා. වැරදිලා දිරිච්ච රබර් ගහක් කැපුවත් සමහර වතු සමාගම් ඒ පුද්ගලයාව අරගෙන ගිහිල්ලා පොලීසියේ රිමාන්ඩ් කරන තත්ත්වයට අද වනකොට පත් කරලා තිබෙනවා. හැබැයි, වතු සමාගම්වලට අයත් අක්කර දහස් ගණනක, අක්කර ලක්ෂ ගණනක වගා කරන්න පුළුවන්කම තිබුණත් අද වනකොට ඒ බිම් මුඩු බිම් බවට පත්කර තිබෙනවා.

අද තේ වගාව, රබර් වගාව ගලවලා, කටුපොල් වගාවට ඒ හොඳ සරුසාර බිම් සම්පූර්ණයෙන්ම නතු කරලා තිබෙනවා. ඒ තුළින් ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ වතු සමාගම් ආශ්‍රිත මාර්ග ටික අපි සංවර්ධනය කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මම පළාත් සභාවේ ඉන්දැද්දීත්, විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් යෝජනා කළා, වතු සමාගම් ආශ්‍රිතව තිබෙන මාර්ග ටික වතු සමාගම් එක්ක සියයට 50:50 එකභත්වයකින්වත් සංවර්ධනය කරන්න. ඒ මාර්ග සංවර්ධනය කරන්නේ පළාත් පාලන ආයතන වෙන්න පුළුවන්; පළාත් සභාව වෙන්න පුළුවන්; රජය වෙන්න පුළුවන්. ඒ මාර්ග සංවර්ධනය කරනකොට අඩු ගානේ සියයට 50කවත් දායකත්වයක් ඒ වතුවලට ලබා දෙන්න ඕනෑ. මොකද, ඒ මාර්ගවලින් වැඩි ලාභ උපයන්නේ වතු සමාගම්.

එදා සුද්දා හදලා දීපු වතු ආශ්‍රිත පාරවල් ටික අද සම්පූර්ණයෙන්ම කැඩිලා, බිඳිලා ගිහිල්ලා තිබෙනවා. වතු ආශ්‍රිතව තිබිච්ච නිල නිවාස, බංගලා ටික අද සම්පූර්ණයෙන්ම දිරාපත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. වතු ආශ්‍රිතව තිබෙන ඇතැම් ආයතන, විශේෂයෙන්ම අපේ තේ පර්යේෂණ ආයතනයට, තේ ශක්ති ආයතනයට හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අයත් ආයතන සියල්ල අද යම් කඩා වැටීමකට ලක්ව තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සියලු දේවල්වල කළමනාකාරීත්වය පිළිබඳව අපි වැඩි වගකීමක් ගන්න ඕනෑ. ඔබතුමා වාගේ හොඳ අමාත්‍යවරයෙක් අපට ලැබිලා ඉන්නවා. චම්පික ප්‍රේමදාස වැනි හොඳ රාජ්‍ය අමාත්‍යවරයෙක් අපට ලැබිලා ඉන්නවා. මම හිතන හැටියට එතුමාට රබර් සම්බන්ධ විෂයය භාර දුන්නා කිව්වා. මේ වාගේ විෂය බෙදාගෙන, බලය බෙදාගෙන කටයුතු කරන අමාත්‍යවරයෙක් හැටියට අපි නවින් දිසානායක ඇමතිතුමා අගය කරනවා.

ගරු ඇමතිතුමනි, අපේ ප්‍රධාන අපනයන භෝගය හැටියටයි තේ තිබුණේ. නැවත වරක් තේ ආර්ථිකය පළමු ස්ථානයට ගෙනෙන්න බැරි වුණොත්, අඩු ගානේ දෙවැනි ස්ථානයටවත් ගෙනෙන්න ඔබතුමාට පුළුවන්කමක් ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මේ පනත් කෙටුම්පත මහින් කෙරෙන සංශෝධන තුළින් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට පත් කරලා, ඒ ලබන ශක්තිය තුළින්, මේ කාර්යයන් කාර්යක්ෂමව සහ ශක්තිමත්ව කරන්න ඔබතුමාට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු නවින් දිසානායක මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு நவீன் திஸாநாயக்க]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Navin Dissanayake]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. PRESIDING MEMBER in the Chair.]

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1 இலிருந்து 3 வரையான வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා සහ මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කිය විය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා.

දකුණු පළාත තුළ පැතිරෙන හඳුනා නොගත් උණ රෝගය
தென்மாகாணத்தில் பரவிவரும் இனங்காணப்படாத காய்ச்சல்
UNIDENTIFIED FEVER SPREADING IN SOUTHERN PROVINCE

[අ.භා. 2.18]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"වර්තමාන කාල සීමාව තුළ හඳුනා නොගත් උණ රෝගය වසංගතයක් ලෙස දකුණු පළාත තුළ වේගයෙන් පැතිර යාමත් නිසාම, කුඩා දරුවන් 12දෙනෙක් සහ ගැබිනි මාතාවක් ජීවිතක්ෂයට පත්ව තිබෙනවා. මෙම තත්ත්වය මැඩ පැවැත්වීමට ඉක්මන් පියවර ගන්නා ලෙසට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දකුණු පළාතේ ප්‍රාථමික පාසල් වහලා; පෙර පාසල් වහලා. වසංගතයක් ලෙස පැතිර යන උණ රෝගය නිසා ජනතාව පීඩාවට පත් වෙලා තිබෙනවා. තව පැත්තකින් ඒ ප්‍රදේශයට ගංවතුර තිබෙනවා.

ගාල්ල, මාතර ප්‍රදේශයේත් ගං වතුර තිබෙනවා. ඒ සමහම මේ උණ රෝගයත් පැතිර යනවා. අප්‍රේල් මාසයේ සිට තමයි මේ ව්‍යසනය පටන් ගත්තේ. ඉන්ෆ්ලුවෙන්සා වෛරස් තත්ත්වයත්, ඊට අමතරව ඇඩීනෝවෛරස් තත්ත්වයත් දකුණු පළාත තුළ තවදුරටත් ව්‍යාප්ත වෙමින් පවතිනවා. මීට කලින් මේ පිළිබඳව රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙනුත්, ඒ වාගේම වසංගත රෝග විද්‍යා අංශයෙනුත් යම්කිසි වැඩ පිළිවෙළක් කරගෙන ගියා නම් මෙපමණ ජීවිත හානියක් වෙන්නේ නැහැ. මීට පෙරත් මෙවැනි රෝග පැතිරිලා තිබෙනවා. ඒ නිසා රෝගයක් පැතිරෙන්න කලින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඒ ගැන සොයා බලා කටයුතු කරන්න ඕනෑ.

අපි දන්නවා, ඩෙංගු රෝගය පැතිරෙමින් යනකොට එයට පිළියම් සොයනවාය කියලා. දැන් මේ රෝගය පැතිරී තිබෙන නිසා පාසල් වහන්න, පෙර පාසල් වහන්න කටයුතු කළාට, රෝගය වෙනත් පළාත්වලට පැතිරීම වළක්වන්නත් වැඩ පිළිවෙළක් සකස් කර නැහැ. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. අපි එතුමාගෙන් ඉල්ලන්නේ, මේ රෝගය පැතිර යෑම මැඩ පවත්වන්න කටයුතු කරන්න කියලායි. පුංචි දරුවන්ට මෙවැනි රෝගයක් හැදුණාම දෙමවුපියෝ ඊට වඩා භය වෙනවා. දරුවන් පාසල් යැවිවේ නැති වුණත් මේ රෝගය පැතිරෙනවා. ඔබතුමන්ලා මේ වනකොට එයට විසඳුමක් සොයාගෙන තිබෙනවාද? අපි දන්නා ආකාරයට මේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ අමාත්‍යාංශයේ තිබෙන ප්‍රශ්නයක් මතයි. මේ අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා ඒකකයේ වෛද්‍යවරු ඉල්ලා අස්වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය ඇමතිතුමා ජනාධිපතිවරයා වාගෙයි. එතුමා සෞඛ්‍යයත් කරනවා; ඒ වාගේම අනික් කටයුතුත් කරනවා. සියල්ලම කරන්න ගිහිල්ලා අනාගෙනයි තිබෙන්නේ. දැන් මොකක් හෝ ප්‍රශ්නයක් ඇහුවොත් ඒකට උත්තර දෙන්නේත් එතුමායි. එතුමා තමන්ගේ අමාත්‍යාංශයේ කටයුතු කරනවා හැරෙන්න වෙනත් අමාත්‍යාංශවල කටයුතු අතපත ගාන්න ගිහින් තමයි මෙහෙම වෙලා තිබෙන්නේ. එතුමා FCID එක ගැනත් සොයනවා; පොලීසිය ගැනත්

[ගරු ජානක වක්කුඹුර මහතා]

සොයනවා; හමුදාව ගැනත් කියනවා; හොරු අල්ලන්නත් යනවාය කියනවා. තමන්ට පවරා තිබෙන වගකීම ඉෂ්ට කළා නම් දකුණු පළාතේ ඒ දරුවන් ජීවිතක්ෂයට පත් වෙන්නේ නැහැ. ඒ නිසා අපි ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියනවා, මේ ගැන සොයා බලා එතුමාට මේ කටයුත්තට මැදිහත් වෙන්න කියලා. ඒ විතරක් නොවෙයි. මේ ගං වතුර තත්ත්වයත් එක්ක තවත් වසංගත රෝග ඇති වෙන්න ඉඩකඩ තිබෙනවා. ගං වතුර බහිනකොට තමයි රෝග වැඩි වෙන්නේ. ඒ ගැනත් කටයුතු කරන්න කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ අවස්ථාවේදී මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. සමහර රෝහල්වල සවස 4.00 දක්වා පමණයි බෙහෙත් දෙන්නේ. සවස 4.00ත් පස්සේ ඒ රෝහල් වහනවා. මා ඇහුවා, ඒ රෝහල්වල තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා. මගේ ආසනයේ වේරගම රෝහලක් තිබෙනවා. ඒ කාලයේ මා ඒ රෝහල හදලා විවෘත කළා. දැන් සවස 4.00ත් පස්සේ ඒ රෝහල වහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ ප්‍රදේශය ගං වතුරට යට වුණාම, ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට බෙහෙත් ගන්න යන්න තිබෙන එකම රෝහල වේරගම රෝහලයි. ඒ රෝහල වැහුවාට පස්සේ රත්නපුර මහ රෝහලටවත් යන්න විධියක් නැහැ. ඒ ගැන ඇහුවාම කියනවා, "ගිලන් රථය නැති නිසා දැන් රෝගින් නවත්වා ගන්නේ නැහැ"යි කියලා. දකුණු දෙල්ලබඩ රෝහලක් තිබෙනවා. ඒකත් ජලයෙන් වටවෙලා තිබෙන රෝහලක්. ඒ රෝහලෙන් ඇහුවාම කියනවා, "ගිලන් රථය තිබෙනවා. හැබැයි රෝගින් නවත්වා ගන්නේ නැහැ"යි කියලා. දුම්බර රෝහලක් තිබෙනවා. ලෙඩෙකුට නම්බපානෙන් එහාට යන්න බැහැ; ඉංගිරියට එන්න බැහැ; අනික් පැත්තෙන්, කිරිඇල්ලට යන්න බැහැ. පාරවල් යටවෙලා. මේ හැමදෙනාටම බෙහෙත් ගන්න තිබෙන්නේ ඒ රෝහලෙන් විතරයි. ඒ රෝහලේත් එක වෛද්‍යවරයායි ඉන්නේ. ඒ රෝහලේත් සවස 4.00ත් පස්සේ බෙහෙත් දෙන්නේ නැහැ. සෞඛ්‍ය ගැන ඇමතිතුමා මහ ඉහළින් කථා කරනවා, සියයට මෙපමණ ප්‍රමාණයක් මුදල් වෙන් කළාය, ඉතිහාසයේ වැඩිම මුදලක් සෞඛ්‍ය වෙනුවෙන් දුන්නාය, මේ රටේ මිනිසුන්ට අවශ්‍ය කරන පහසුකම් දෙනවාය කියලා. හැබැයි රෝහල් තිබුණාට වැඩක් නැහැ, ඒවා සක්‍රියව කටයුතු කරන්නේ නැත්නම්. පපුවේ අමාරුව හෝ මොකක් හෝ ලෙඩක් හැදෙන එක් කෙනාට උදේ 8.00 සිට සවස 4.00 දක්වා කාලය තුළ විතරක් ඒ ලෙඩේ හැදෙන්නේ නැහැ. රෝහලක් පවත්වාගෙන යනවා නම් පැය 24ම විවෘතව තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම ගම්බද රෝහල් අත්‍යවශ්‍ය සේවාවක් හැටියට පැය 24ම විවෘතව තිබෙන්න ඕනෑ. ඒ නිසා මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව මැදිහත් වෙලා අවශ්‍ය කටයුතු කරලා, ගං වතුරෙන් හානිවන ප්‍රදේශවල රෝහල්වලට අඩුම වශයෙන් ඒ කාලය සඳහාවත් වෛද්‍යවරුන් යොමු කරලා, ඒ රෝහල් විසිහතර පැයේම ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නය කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම දකුණු පළාතේ පැතිර යන උණ රෝගය රටේම ව්‍යාප්ත වන එක නවත්වන්න ඉක්මනින්ම වැඩ පිළිවෙළක් සකස් කරන්න ඔබතුමාවත් කටයුතු කරන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය.

[අ.භා. 2.24]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා ඉතාමත්ම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව ඇත්තටම මා සන්තෝෂ වෙනවා. එම යෝජනාව මම ස්ථිර කරනවා.

මේ වෙනකොට දකුණු පළාත තුළ වසංගත රෝගයක් පැතිරීගෙන යනවා. උණ, සෙම්ප්‍රතිශ්‍යාව සහ නියුමෝනියාව කියන රෝගවලට අවුරුදු දෙකට වඩා අඩු දරුවන් විශාල ප්‍රමාණයක්, ඒ වාගේම ගර්භිණී මව්වරු, කිරිදෙන මව්වරු, වැඩිහිටි අය ගොදුරු වෙලා ඉන්නවා. මෙය ඔවුන්ට ඉතාමත් තදින් බලපාන රෝගී තත්ත්වයක්. බොහෝ විට එය ඉන්ෆ්ලුවෙන්සා වෛරසය කියා තමයි සැක කරන්නේ. අද වන විට දකුණු පළාතේ මාතර රෝහලට, කරාපිටිය රෝහලට, කඹුරුපිටිය රෝහලට, ඒ වාගේම තංගල්ල, වලස්මුල්ල, ඇල්පිටිය කියන රෝහල්වලට රෝගීන් විශාල වශයෙන් ඇතුළු වෙලා ඉන්නවා. මෙයට ප්‍රධානම හේතුව හැටියට මා දකින්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පත් කිරීම්වල තිබෙන වැරදි ක්‍රියාමාර්ගයයි. විශේෂයෙන්ම අපි මේ පිළිබඳව අවධානය යොමු කළා. මේ රටේ වසංගත රෝග මර්දනය කරන්න අවශ්‍ය කරන තාක්ෂණික දැනුම ලබාදෙන්නේ, මහ පෙන්වීම් කරන්නේ වසංගත රෝග ඒකකයෙනුයි. වසංගත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙක් තමයි මෙතෙක් කාලයක් එම වසංගත රෝග ඒකකයේ අධ්‍යක්ෂ හැටියට -ප්‍රධානියා- හැටියට පත් වුණේ. මූලික වෛද්‍ය උපාධියට අමතරව ඔහුට ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ Master's Degree එකක්, ඒ වාගේම ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් Doctorate එකක්, ඊටත් අමතරව ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව, විශේෂයෙන්ම වසංගත රෝග මර්දනය පිළිබඳව ජාතික වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් ලොකු අත්දැකීමක්, පළපුරුද්දක් තිබුණා. එවැනි කෙනෙක් තමයි මෙතෙක් කාලයක් වසංගත රෝග විද්‍යාඥ ඒකකයේ ප්‍රධානියා බවට පත් වුණේ. නමුත්, ගිය අවුරුද්දේ -2017- දෙසැම්බර් 14 දින සිට එහි අධ්‍යක්ෂවරයා -ප්‍රධානියා- හැටියට පත් කර තිබෙන්නේ පරිපාලනය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙක්. වසංගත රෝග පිළිබඳව කිසිම පළපුරුද්දක් නැති, කිසිම අත්දැකීමක් නැති වෛද්‍යවරයෙක් පත් කළාම, ප්‍රාදේශීය වශයෙන් රෝග මඩින්න තාක්ෂණික උපදෙස් දෙන්න ඔහුට බැහැ.

සෞඛ්‍ය දර්ශකය අතින් දකුණු ආසියාකරයේ තිබෙන හොඳම රට, ඉදිරියටම ගිය රට ලංකාව කියලා බොහෝ අවස්ථාවල අපි කථා කරනවා. අතීතයේ සිට විශේෂඥ වෛද්‍යවරු හරි තැන්වලට යොමු කිරීම තුළින් තමයි අපි එම තත්ත්වය ලබා ගත්තේ. හැබැයි, දැන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන වැරැදි පත් කිරීම් නිසා - විශේෂඥ වෛද්‍යවරු වැරැදි තැන්වලට පත් කිරීම නිසා- අද යම් කිසි කඩා වැටීමක් තිබෙනවා. පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරු රෝහල්වලට සහ අනෙකුත් අවශ්‍ය තැන්වලට පත් කළාට කමක් නැහැ. නමුත්, ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පුහුණුව ලැබූ, ඒ පිළිබඳව අත්දැකීමක් ඇති ප්‍රජා වෛද්‍ය විශේෂඥවරු පත් කළ යුතු සමහර තැන් තිබෙනවා. සාමාන්‍යයෙන් MBBS මූලික උපාධියෙන් පසු අපි රෝගීන්ට ප්‍රතිකාර කරනවා. හැබැයි, ඊට පස්සේ විශේෂඥ වෛද්‍යවරයෙක් වෙන්නේ ඒ ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ පුහුණුවක්, විශේෂ අත්දැකීමක් ලබාගෙන, රට තුළ ඒ ක්ෂේත්‍රයේ අවුරුදු ගණනාවක් වැඩ කිරීම තුළ සහ ජාත්‍යන්තර පළපුරුද්දත් එක්කයි. නමුත්, අද එහෙම නැහැ. ඒ නිසා අද වසංගත රෝග වැළැක්වීමේ අංශය කඩා

වැටීමකට ලක්වෙලා තිබෙනවා. අද මාතෘ හා ළමා සෞඛ්‍යය පිළිබඳව කටයුතු කරන පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා විධියට පත් කරලා තිබෙන්නේ පරිපාලනය පිළිබඳ විශේෂඥ දැනුමක් තිබෙන කෙනෙක්. අද වසංගත රෝග විද්‍යාඥ ඒකකයේ ඉන්නේ පරිපාලනය පිළිබඳ විශේෂඥ දැනුමක් තිබෙන කෙනෙක්. එවැනි විශේෂිත වූ අංශවලට, විශේෂිත වැඩසටහන්වලට එම විෂයය පිළිබඳ පළපුරුද්ද, අත් දැකීම හා විශේෂඥ දැනුම ඇති අය පත් කරන්න ඕනෑ.

ඩෙංගු රෝගය නිසා ගිය අවුරුද්දේ මේ රටේ දරුවන් විශාල සංඛ්‍යාවක් මිය ගියා. කාන්තාවන්, පිරිමින් විශාල වශයෙන් මිය ගියා. රෝහල්වල විශාල තද බදයක් තිබුණා. ඒකට හේතුව මොකක්ද? ඩෙංගු රෝගය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙක් සිටියදීත් එහි අධ්‍යක්ෂවරයා -ප්‍රධානියා- හැටියට පත් කළේ පරිපාලන ක්ෂේත්‍රයේ සිටින නිලධාරියෙක්. ඒ පාඩම්වලින් අපි තවමත් ඉගෙන ගෙන නැහැ. එම නිසා අද රට තුළ වසංගත රෝග මැඩලීම පැත්තෙන් විශාල අඩ පණ වීමක් තිබෙනවා. වසංගත රෝග ඒකකය තමයි රට පුරාම වසංගත රෝග වළක්වන්නේ; පසු විපරම් කරන්නේ; නියාමනය කරන්නේ; සම්බන්ධීකරණය කරන්නේ. ඒ වාගේම එන්නත් ලබා දීමේදී එම එන්නත්වල ගුණාත්මකභාවය, දරුවන්ට ලබා දිය යුතු ප්‍රතිශතය පිළිබඳව ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමත් එම ඒකකය විසින් මාසිකව කරනු ලැබුවා. නමුත් මේ වන විට මාස 6ක් ගිහින් තිබෙනවා, තවමත් ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වන්න හැකියාව ලැබී නැහැ. ඒ වාගේම එම ඒකකය දිස්ත්‍රික් මට්ටමට ගිහිල්ලා, ප්‍රාදේශීය වශයෙන් එම එන්නත් ආවරණය කළ දරුවන් සංඛ්‍යාව පිළිබඳව සොයා බලනවා. ඒ වාගේම එහි ගුණාත්මකභාවය පිළිබඳව පසු විපරම් කර බලා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනවා.

අද ඒවා එකක්වත් පවත්වාගෙන යන්නේ නැහැ. විශේෂයෙන් අද වසංගත රෝග පිළිබඳ වෛද්‍යවරු උපදෙස් ගන්නේ නැහැ. මොකද, අද ඒ ඉන්න ප්‍රධානියාගෙන් උපදෙස් ගන්න බැහැ, ඔහුට ඒ පිළිබඳ දැනුම, පළපුරුද්ද නැති නිසා. අපට ගැටලුව තිබෙන්නේ පුද්ගලයින් එක්ක නොවෙයි, මේ ක්‍රමවේදය පිළිබඳවයි. අපි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් සෞඛ්‍ය ඇමතිතුමා එක්ක කථා කළා. එතුමා ඒ වෙලාවේ එකඟ වුණා, ඒ වරද නිවැරදි කරන්න. හැබැයි, අද වනතුරු ඒ වරද නිවැරදි කරගන්න හැකියාව ලැබී නැහැ. ඒ නිසා අපට ගැටලුවක් තිබෙනවා. අපි ආඩම්බරයෙන් කථා කළ high immunization coverage එක, ඒ කියන්නේ ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීම මඟින් ලෙඩ රෝගවලින් ආරක්ෂා වීමේ ප්‍රතිශතය ඉදිරියේදී කඩා වැටීමකට ලක් වේවි. ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීමේ ක්‍රියාදාමය තුළින් අපි පෝලියෝ රෝගය මර්දනය කර තිබෙනවා; neonatal tetanus නැති කර තිබෙනවා. හැබැයි, ඉදිරියේදී වසංගත රෝග පැතිර යාම පිළිබඳ විශාල අවදානමක් තිබෙන බව අපි මතක් කරනවා.

පරිපාලනය පිළිබඳ විශේෂඥ දැනුම තිබෙන අය ඒ අදාළ ක්ෂේත්‍රවලට, රෝහල්වලට පත් කරන්න. ඒකේ ගැටලුවක් නැහැ. හැබැයි, මේ විශේෂිත වූ ඒකකවලට පත් කිරීමේදී, ඒ පිළිබඳව සුදුසුකම් තිබෙන සහ පළපුරුද්ද, අත්දැකීම තිබෙන, පුහුණුව ලබා ගත් අය පත් කරන්නය කියන ඉල්ලීම ඉතාම ගෞරවයෙන් ගරු නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමාට ඉදිරිපත් කරනවා. මා හිතනවා, එතුමා මේකට කන් දීලා -සෞඛ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ හිටියා නම් හොඳයි- මේ පිළිබඳව පුළුල් වශයෙන් සාකච්ඡා කරලා මේ ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්ට වෙලා තිබෙන අසාධාරණය, ඊටත් වඩා ජනතාවට වෙලා තිබෙන අසාධාරණය, රටේ දරුවන්ට වෙලා තිබෙන අසාධාරණය නිවැරදි කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා පෙරමුණ ගනීවි කියලා. මේ පිළිබඳව විශේෂඥ දැනුම තිබෙන කණ්ඩායමක් දකුණු පළාතට ගිහිල්ලා මේ පිළිබඳව හේතු සොයා බලා මේ ගැන විමර්ශනය කරලා තිබෙනවා. විශේෂයෙන් ජනතාව තුළ අනිසි බියක් ඇති වෙලා තිබෙනවා. ඒ භීය නැති කරලා මේ රෝග වළක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙනවා. කැස්ස, හෙම්බිරිස්සාව තිබෙනවා නම් ඒ අය පිළිපැදිය යුතු උපදෙස් මොනවාද කියලා දැනුවත් කර තිබෙනවා. "නිතරම ලේන්සුවක් පාවිච්චි කරන්න; tissue එකක් පාවිච්චි කළොත් ඒක වීසි කරන්න; නිතරම අත් සබන් දාලා සෝදන්න; සෙනඟ ගැවසෙන තැන්වලට යන්න එපා; රෝග ලක්ෂණ තිබෙනවා නම් ගෙදර ඉන්න; විවේක ගන්න" කියලා උපදෙස් දීලා තිබෙනවා. මේ රෝග වැලඳීමේ වැඩි අවදානමක් තිබෙන පිරිස වන අවුරුදු දෙකට අඩු දරුවන්, ගර්භිණී මවුවරුන්, කිරි දෙන මවුවරුන්, වයස්ගත උදවිය සෙනඟ ගැවසෙන තැන්වලට යන්නේ නැතිව ආරක්ෂිතව සිටීම වැදගත් වෙනවා. විදේශ රටවල නම් මේ අවදානම් වයස්වල සිටින අයට වාර්ෂිකව influenza එන්නත ලබා දෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන අවධානය යොමු වෙන්න නම්, මේකට සුදුසු අයකු පත් කරන්න ඕනෑ. දැන් සිදුවෙලා තිබෙන්නේ මොකක්ද? ශල්‍ය වෛද්‍ය වාට්ටුව VP මහත්තයාට බලන්න දුන්නා වාගේ වැඩක් වෙලා තිබෙන්නේ. ශල්‍යකර්ම - operations - කරන වෛද්‍යවරුන්ගේ වාට්ටුවට VP කෙනකු දැම්මාම, ඒ වාට්ටුවල ඉන්න රෝගීන්වත් ඒ දෙන උපදෙස් පිළිගන්න එකක් නැහැ. මොකද, VP කෙනකුට තිබෙන්නේ කායික රෝග පිළිබඳ විශේෂඥ දැනුමයි; operations පිළිබඳව දැනුම නොවෙයි. ඒ නිසා ඒ සිදු වෙලා තිබෙන වරද නිවැරදි කරනතාක් කල් වසංගත රෝග වැළැක්වීමේ අංශයට ලොකු අවදානමක් තිබෙන බව මතක් කරමින් මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.33]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා ඉතා කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මා හිතන විධියට දකුණු පළාතේ පැතිරෙන මේ වසංගත රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යම් කිසි පියවර ප්‍රමාණයක් අරගෙන තිබුණත්, දැනට රට පුරා පවතින අයහපත් කාලගුණික තත්ත්වය නිසා මේ වසංගත රෝගී තත්ත්වයන් දකුණු පළාතට පමණක් සීමා නොවී, රට පුරාම පැතිර යාමේ අවදානමක් තිබෙන නිසා, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ආ අවස්ථාවේදී ඒකට යමක් එකතු කිරීම වැදගත් කියා මා සිතනවා.

මේ රටේ පවතින අයහපත් කාලගුණික තත්ත්වය නිසා සමස්ත රට පුරා මෙවැනි අවදානම් තත්ත්වයක් ඇතිවිය හැකි බැවින්, මේ සම්බන්ධයෙන් රජයේ අවධානය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතු බවත් මම මේ ගරු සභාවට කාරුණිකව මතක් කර සිටිනවා.

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

ඇත්තටම ආසියාකරයේ ඉහළම සෞඛ්‍ය තත්ත්වයක් තිබෙන අප රටේ වෛද්‍ය ක්ෂේත්‍රයේ ඉතාම දියුණු පරිසරයක් පවතින අවස්ථාවක මේ වසංගත රෝගී තත්ත්වයන් පාලනය කර ගැනීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් රජය විසින් සලස්වා තිබෙනවා.

මේ රටේ පුරවැසියන්ගේ ආරක්ෂාව පිණිස හිටපු රාජ්‍ය ඇමතිතුමිය වන ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය වෛද්‍යවරියක හැටියට ඉතා පැහැදිලිව මේ පිළිබඳ කාරණා කටයුතු දන්වා සිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ඉතා සීමිත වුවත් මටත් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. සියලු බලධාරීන්ගේ සහයෝගයෙන්, අපි සියලු දෙනාගේ එකමුතුව තුළින් මේ පවතින වසංගත තත්ත්වය මෙතැනින් එහාට නොයා පාලනය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා ගත යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හට කථා කිරීමට කාලය ලබාදීම පිළිබඳව නැවතත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.35]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දකුණු පළාත වෙලා ගත්ත, දෙමව්පියන්ට මර බය දැනෙන රෝගයකට ඒ පළාතේ ජනතාව මුහුණ දෙනවා. මේ ශ්වසන රෝගය මුළු දකුණු පළාත පුරා පැතිරී යනවා. එමඟින් බොහෝ දරුවන් මේ වනවිටත් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. මේ හේතුව මතම සාමාන්‍ය ජන ජීවිතයේ ක්‍රියාකාරිත්වය අඩපණ වෙලා තිබෙනවා. මේ භයානක තත්ත්වය වළක්වන්න සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයක් හැටියට ඒ වගකීම දරාගෙන කටයුතු කිරීම වැදගත්.

ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, පසුගිය කාලයේ අපේ රටට ඉහළ සෞඛ්‍ය තත්ත්වයක් ලබාදීම පිළිබඳව අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය දකුණු ආසියාවේ රටවල්වලින් ප්‍රසාදයට පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපට තර්කයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් රටේ ආර්ථිකය දිහා බැලුවාම, -අපේ ගරු අගමැතිතුමා කියපු විධියට- අපේ රටේ ජනතාවගෙන් සියයට 43ක් දිනකට ඩොලරයකට අඩු ආදායමක් තමයි ලබන්නේ. ඒ වාගේම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වාර්තාවක කියැවෙනවා, වයස අවුරුදු පහට අඩු දරුවන්ගෙන් සියයට 21කට නිසි බර ප්‍රමාණයක් නැහැ, සියයට 17ක්, සියයට 15ක් නිසි වැඩීමක් නැති දරුවන් තමයි ඉන්නේ කියලා. මේ තත්ත්වය යටතේ, පෝෂණය අඩුකම නිසාම ප්‍රතිශක්තිකරණය අඩු වෙලා තිබෙනවා. එක් පැත්තකින් මේක තමයි මේ රෝගයට එක ප්‍රධාන හේතුවක් වෙන්නේ. දකුණු පළාතේ මේ රෝගය කවර විධියකට ආරම්භ වුණත්, ජාතික උවදුරක් විධියට පැතිරෙන්න පුළුවන්. පසුගිය කාලයේ මේ රෝග තත්ත්වය මැඩලන්න ගත්ත උත්සාහය අද පවතින කාලගුණික හේතු නිසා අඩපණ වෙන්න පුළුවන්. කෙසේ වෙතත්, මේ වනවිට දකුණු පළාතට විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් පත් කරලා දැනටමත් ඒ රෝග නිවාරණ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. වෛද්‍යවරු කියන්නේ, මේ රෝගය කවර විධියේ රෝගයක්ද කියලා තවම නිගමනය කරන්න බැහැ කියලායි. එම නිසා, මෙම තත්ත්වය පිළිබඳව හරිහැටි සමීක්ෂණය කරලා, පර්යේෂණ කරලා මෙවැනි රෝග බෝවීම ඉදිරි කාලයේදී වළක්වා ගැනීමත්, ජාතික වශයෙන් බෝවීම වැළැක්වීමටත් අවශ්‍ය ක්‍රියා සකස් කරගැනීම වැදගත් වෙනවා.

අපේ සෞඛ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සමුළුවකට සහභාගි වෙනවා. ඇත්ත වශයෙන්ම ලෝකයේ ඉන්න විශේෂඥ වෛද්‍යවරු අන්තර්ජාතික හුවමාරු ක්‍රම මඟින් රටවල් ඇතුළේ තිබෙන බෝවන රෝග මර්දනය කර ගැනීමේ ජාත්‍යන්තර දැනුම හුවමාරු කර ගැනීමේ වැඩ පිළිවෙළක් ඇතිකර ගන්නවා නම් හොඳයි. වෙනත් රටවල මෙවැනි ලෙඩ රෝග පිළිබඳව සහ ප්‍රතිකාර ක්‍රම ගැන අධ්‍යයනය කරපු, විශේෂ පර්යේෂණ කරපු පර්යේෂකයන් ඉන්නවා. අපි ඒ දැනුම හුවමාරු කර ගැනීමත්, අපේ රටේ දැනුම යොදා ගැනීමත් වැදගත් වනවා.

දැන් දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ. දේශීය වෛද්‍ය ක්‍රම තුළත් ප්‍රතිශක්තිකරණය වර්ධනය කරන්න අවශ්‍ය ක්‍රමවේදත්, බෝවන රෝග මර්දනය කරන්න අවශ්‍ය ශක්ති සහ එම රෝග වළක්වා ගත හැකි ක්‍රමවේදත් තිබෙන බව කියනවා. මේ දිනවල අපි කාලගුණික විපර්යාසවලට මුහුණ දෙනවා. අපි වහින කොට කුඩය ඉහළනවා. වැස්සට පස්සේ කුඩය හකුළනවා. ඒ විධියට, නාය යෑම හෝ වේවා ගංවතුර උවදුර හෝ වේවා, එලෙස ඇතිවන ස්වභාව ධර්මයේ ගැටලුවලට මුහුණ දෙනවා මිසක්, ඒ පිළිබඳව දිගු කාලීන විද්‍යාත්මක සැලසුම් අපි සකස් කර ගෙන නැහැ. එම නිසා දේශීය වෛද්‍ය ක්‍රමයේත්, බටහිර වෛද්‍ය ක්‍රමයේත් සංකලනය මත, ඒ අන්‍යෝන්‍ය සම්බන්ධතාව තුළ බෝවන රෝග පාලනය කළ හැකි ක්‍රමවේද අපට හදා ගන්න පුළුවන්ද, ඒ සඳහා ඖෂධ නිෂ්පාදනය කරන්න පුළුවන්ද යන්න සහ ඒ සඳහා දේශීය වෛද්‍යවරුන්ගේ දැනුම උකහා ගන්න පුළුවන්ද කියලා අපි බලන්න ඕනෑ. අපි බොහෝ වෙලාවට කථා කරන්නේ බටහිර වෛද්‍ය පර්යේෂණ පිළිබඳව විතරයි. නමුත්, laboratoriesවල පර්යේෂණ නොකළාට, දේශීය වෛද්‍ය ක්‍රමය ඇතුළේ ජීවිත අභ්‍යාසයෙන් ලබාගත් දැනුම හා අත්දැකීම් මේ කටයුතු සඳහා යොදා ගැනීමේ කිසි වරදක් ඇත්තේ නැහැ. එම නිසා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අපි මේ වෙලාවේ කියන්න ඕනෑ, අපේ රටේ පරිසරයේ තිබෙන විවිධ ඖෂධ වර්ගවල භාවිතය තුළින් අපේ රටේ ජනතාව තුළ ප්‍රතිශක්තිකරණය ඇති කිරීමට සහ බෝවන රෝග දීර්ඝ කාලීනව පැවතීම වළක්වා ගත හැකි ක්‍රමයක් සකස් කළ යුතුයි කියලා. ඇත්ත වශයෙන්ම අපේ පරිසරයේ තිබෙන හැම පැළෑටියක්ම වාගේ ඖෂධයක්. මේවා ප්‍රයෝජනයට ගන්නේ කොහොමද කියන එක ගැන අපි සොයා බලන්න ඕනෑ. ඒ හරහා ඇති කර ගන්නා වූ එකඟතාවකින් හා සංවාදයකින් මේ ප්‍රශ්නය පමණක් නොවෙයි, අනිකුත් බෝවන රෝග හා කල් පවත්නා රෝග වළක්වාලීමට හැකි ක්‍රමවේදයක් අපි ගොඩ නඟන්න ඕනෑ. මේ වෛද්‍ය ක්‍රම දෙක ඇතුළේ යම් යම් පරස්පරතා තිබෙනවා. බටහිර වෛද්‍ය ක්‍රමය, දේශීය වෛද්‍ය ක්‍රමයට වඩා ඉහළයි, බටහිර වෛද්‍ය ක්‍රමයට කළ නොහැකි දේවල් කරන්න දේශීය වෛද්‍ය ක්‍රමයට පුළුවන්, ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද හා ඖෂධ අපි දන්නවාය කියන ආකල්පවලින් වෛද්‍යවරු පෙළෙන්නේ නැතිව, ජනතාවගේ යහපත වෙනුවෙන් අපේ සෞඛ්‍ය වැඩ පිළිවෙළ නිසි ලෙස කරගන්න අවශ්‍ය නිර්මාණ කර ගන්නවා නම්, බොහෝ වෙලාවට අපට මේ දේවල් පාලනය කර ගන්න අවස්ථාවක් ලැබෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දකුණු පළාතේ මේ රෝගයෙන් අසහනයට පත් වෙලා සිටින ජනතාවට මේ අවස්ථාවේදී මගේ ශෝකය පළ කරනවා. මම දකුණු පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයකු නිසා මේ දිනවල ඇති වී තිබෙන තත්ත්වය මා හොඳින්ම දන්නවා. ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ අද වනකොට මාතර දිස්ත්‍රික්කයේ රෝහල් මෙම රෝගයට ගොදුරු වූ රෝගීන්ගෙන් පිරී ඉතිරී යමින් තිබෙනවා. මේ දිනවල දෙමව්පියන් තම දරුවන් පාසල් යවන්නේ නැහැ; පාරට යවන්නේ නැහැ. දෙමව්පියන් තම දරුවන් සම්බන්ධයෙන් ලොකු මර බියකින් ඉන්නේ. මේ දිනවල පවතින ගංවතුර තත්ත්වය මේ තත්ත්වය තවත් තීව්‍ර කරන්න බලපෑමක් ඇති කරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේ තත්ත්වය පාලනය කරන්න අවශ්‍ය වෛද්‍ය සහයෝගය ඇතුළු සියලු දේ වහ වහා දකුණු පළාතට ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, මට ලබා දුන් කෙටි අවස්ථාව පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මී ළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.43]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දකුණු පළාත නියෝජනය නොකළත්, සබරගමුව පළාත නියෝජනය කරන අපේ සහෝදර ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා විසින් දකුණු පළාත තුළ පසුගිය දින කීපය තුළ ඇති වුණු වෛරස් උණ සම්බන්ධයෙන් රජයේ අවධානය වහා යොමු කරන්න කියලා අද දින සභාව කල් තබන අවස්ථාවේදී යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් එතුමාට මා ස්තුතිවන්ත වනවා.

චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා හැර දකුණු පළාත නියෝජනය කරන වෙනත් මන්ත්‍රීවරු කවුරුවත් මේ සම්බන්ධයෙන් කථා කළේ නැහැ; මෙවැනි යෝජනාවක් ගෙනාවේ නැහැ. මේ වනකොට මේ තත්ත්වය මර්දනය කරන්න අවශ්‍ය සියලු දේවල් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හරහා රජය මඟින් ක්‍රියාත්මක කරලා අවසාන බව කවුරුත් දන්නවා. ඒ පිළිබඳව වැඩිමනත් කරුණු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍ය ගරු ෆයිසාල් කාසිම් මැතිතුමා ප්‍රකාශ කරයි.

ඇත්තෙන්ම පසුගිය දින කිහිපය තුළ ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක් දකුණු පළාත තුළ ඇති වුණා. දකුණු පළාත තුළ පැතිර යන මේ රෝගය හේතුවෙන් පසුගිය අප්‍රේල් 20වැනි දා සිට මේ දක්වා මාතර දිස්ත්‍රික්කයේ පස්දෙනෙකුත්, ගාල්ල දිස්ත්‍රික්කයේ දෙදෙනෙකුත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ දෙදෙනෙකුත් වශයෙන් කුඩා දරුවන් නවදෙනෙක් මිය ගොස් තිබෙනවා. මේ සියලුම දෙනා ගාල්ල ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී තමයි මිය ගියේ. වයස අවුරුදු 2ට අඩු දරුවන් තමයි විශේෂයෙන්ම මේ රෝගයට භාජන වුණේ. ඒ වාගේම, ඉන්ෆ්ලුවෙන්සා උණ රෝග තත්ත්වය කියලා බොහෝ දෙනෙක් විශ්වාස කළත්, මීට එකතු වෙච්ච "ඇඩිනෝ" කියන වෛරසය නිසා මේක දරුණු ලෙස ව්‍යාප්ත වුණා. පසුගිය කාලය තුළ ගාල්ල ශික්ෂණ රෝහලේ රෝගීන් 290කට ආසන්න සංඛ්‍යාවක් සිටි නමුත්, අද ඒ ප්‍රමාණය 37 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ නිසා රජය හැටියට අපට දෙන්න පුළුවන් ඉහළම ප්‍රතිකර්මය මේ වන විට අපි ලබාදීලා තිබෙනවා කියලා මා හිතනවා. විශේෂයෙන්ම පසුගිය කාලපරිච්ඡේදය තුළ රෝහල්වල සමහර උපකරණ තිබුණේ නැහැ. ගරු රාජිත සේනාරත්න සෞඛ්‍ය ඇමතිතුමා විදේශගතව සිටියත් ගරු වැඩබලන ඇමතිවරයා හැටියට ෆයිසාල් කාසිම් මැතිතුමා මේ වන විට ඒ සඳහා අවශ්‍ය උපකරණ සහ බෙහෙත්හේත් සියල්ල රජය මඟින් නොමිලේ ලබා දෙන්න කටයුතු කර තිබීම ගැන අපි සතුටු වෙනවා. ඒ විතරක් නොවෙයි, ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට high-flow oxygen machines ගන්න රුපියල් මිලියන 10ක් -ලක්ෂ 100ක්- කඩිනමින් ලබාදීලා තිබෙනවා. එක මැෂිමක් රුපියල් 872,000ක් වෙනවා. එවැනි මැෂින් 10ක් ගන්න මුදල් වෙන් කර තිබුණත්, අද වන විට මැෂින් 4ක් ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව මෙම රෝගය අද වන විට මර්දනය වෙලා තිබෙනවා.

අපේ ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ නිටපු රාජ්‍ය ඇමතිතුමිය ප්‍රකාශ කළා, "මේ ආණ්ඩුව යම් යම් කටයුතුවලට වහා ක්‍රියාත්මක වෙන්නේ නැහැ" කියලා. එතුමියත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක සභාපතිවරියක් හැටියට හිටියා. මේවා සම්බන්ධයෙන් එතුමියටත් ඒ කාලයේ වගකීම් තිබුණා. හැබැයි, එතුමිය අද අනෙක් පැත්තට ගිහිල්ලා ප්‍රකාශ කරනවා, "මේවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ" කියලා. මම භය නැතිව කියනවා, ඉතිහාසයේ පළමුවැනි වතාවට ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට ගොඩනැගිලි, භෞතික සම්පත් සහ උපකරණ අලුත්වැඩියාව සහ ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂයේ ඒවා ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ලබාදී තිබෙන බව. හැම සතියකම දවසක්, දෙකක් ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට ලෙඩ්ඩු බලන්න යන කෙනෙක් හැටියට මම ඒ ගැන දන්නවා. මේ සම්බන්ධයෙන් මම ඕනෑම කෙනෙක් එක්ක වාදයකට, විවාදයකට එන්න ලැහැස්තියි.

ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට අද සබරගමුවෙන්, මොනරාගලින්, බදුල්ලෙන් පවා රෝගීන් එන තත්ත්වයට පත්වී තිබෙනවා. මහින්ද රාජපක්ෂ පාලනය තුළ හම්බන්තොට දියුණු කළා නම්, අද හම්බන්තොට සිට ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට බස් රථ එන්න වුවමනාවක් නැහැ. ඒ තරම් විශාල ප්‍රමාණයක සෞඛ්‍ය පහසුකම් අපි ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට ලබා දීලා තිබෙනවා. ඒ අතරේ අපි පැහැදිලිව කියන්නට ඕනෑ, බෝවන රෝග මර්දනය සඳහා විශාල වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කර තිබෙන බව. ගරු රාජිත සේනාරත්න මැතිතුමාත්, ගරු ෆයිසාල් කාසිම් මැතිතුමාත් ඩෙංගු රෝගය සඳහා වෙනම මර්දන ඒකකයක් හැදුවා. ඩෙංගු රෝගය සඳහා වෙනම ව්‍යාපෘතියක් ආරම්භ කරලා, රැකියාවක් හැටියට පමණක් නොවෙයි සේවයක් හැටියට එයට තරුණ තරුණියන් බඳවාගෙන අද ඩෙංගු රෝගය සම්පූර්ණයෙන්ම තුරන් කරන්න අවශ්‍ය වටාපිටාව අපි හදලා තිබෙනවා. අපි නිකම් ඉන්නේ නැහැ; අපි මන්ත්‍රීවරුන් හැටියට කොළඹට වෙලා ඉන්නේ නැහැ. අපි දිනපතා පැයෙන් පැය මේ පිළිබඳව විපරමින් කටයුතු කරලා තිබෙනවා. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හැම කෙනෙක් එක්කම සාකච්ඡා ගණනාවක් තිබ්බා. දකුණු පළාතේ සෞඛ්‍ය ඇමතිතුමා හැටියට ශාන් විජේලාල් මැතිතුමා පසුගිය දවස්වල සාකච්ඡා පවත්වා ඒ තුළින් මේ පහසුකම් ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, මේ පිළිබඳව පසු විපරමකුත් කළා. මේ රෝගය ඩෙංගු රෝගය වාගේ මාස ගණන්, අවුරුදු ගණන් ව්‍යාප්ත වෙන්නේ නැතුව දින කීපයක් ඇතුළත මර්දනය කරලා අවසන් කරන්න පුළුවන්කමක් ලැබුණේ මේ රජයේ පැහැදිලි සෞඛ්‍ය වැඩ පිළිවෙළ නිසාය කියන එක අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

අවසාන වශයෙන් මේ කාරණය ගැනත් මා කියන්න ඕනෑ. ආණ්ඩුවේ තිබුණු කාර්යක්ෂමතාව නිසා, ආණ්ඩුවේ තිබුණු උනන්දුව නිසා, ගරු සෞඛ්‍ය අමාත්‍යාවරයා සහ සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු සෞඛ්‍ය කණ්ඩායමේ කැපවීම නිසා මේ රෝගය පාලනය කරන්න හැකි වුණා. ඒ සියලු දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. නොයෙක් ව්‍යසනයන් සිද්ධ වෙන වෙලාවක, ගංවතුර ගලලා ගංගා දෙගොඩ තලා යන වෙලාවක, නොයෙක් ප්‍රශ්න තිබෙන වෙලාවක තමයි මෙම රෝගය දකුණු පළාත තුළ ශීඝ්‍රයෙන් පැතිරිලා ගියේ. නමුත් මෙම රෝගය පාලනය කිරීමේ එම කටයුත්තට සාර්ථකව මුහුණ දෙන්න අපේ රජයටත්, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු ඊට අනුබද්ධ අනෙකුත් දෙපාර්තමේන්තුවලටත් පුළුවන්කමක් ලැබුණා. ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කළාට ස්තුතිවන්ත වෙනවා. අපි රජයක් හැටියට මේ පිළිබඳව දැඩි ලෙස අවධානය යොමු කරන බවත් කියන්න ඕනෑ. නමුත් අපට මෙම රෝග මුලිනුපුටා දමන්න පුළුවන්කමක් නැහැ. මේ රෝග සැරින් සැරේ ක්‍රියාත්මක වෙනවා.

නැති වෙනවා; ආයේත් උත්සන්න වෙනවා. ඒ නිසා මෙම තත්ත්වය කඩිනමින් මර්දනය කිරීමට ලබා දිය හැකි ඉහළම දායකත්වය ලබා දීම වෙනුවෙන් කරාපිටිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ, වෛද්‍ය ජයම්පති මහත්මයා ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අපෙන් සදහටම සමුගත් මේ පුංචි දරුවන් අටදෙනාගේ පවුල්වල අයට රජය වෙනුවෙන් අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරමින්, මෙවන් දෙයක් වනයේ වන හතුරෙකුටවත් සිදු නොවේවා කියා ප්‍රාර්ථනා කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබී තිබෙනවා.

[අ.භා.2.50]

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කයට වුණු අවාසනාවන්ත තත්ත්වයක් පිළිබඳව අද මේ සභාව ඇමතීමට ලැබීම ගැන මම එක අතකින් කනස්සල්ලට පත් වෙන අතර විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මට මේ අවස්ථාව ලබා දීම ගෞරවාන්විතව අගය කරනවා. සෞඛ්‍ය දර්ශක අතින් ලංකාව ඉතාම ඉහළ තත්ත්වයකට පැමිණ තිබෙනවාය කියලා අපි හැම තැනම උදම් අනනවා. අපි ලෝකයේ යම් යම් රටවල පැවැත්වෙන සම්මන්ත්‍රණවලට ගියාම කියන්නේ සෞඛ්‍ය අතින් අපි ලබාගත් ජයග්‍රහණ ගැනයි. එවන් වූ තත්ත්වයක් තිබියදී, කුඩා දරුවන් අටදෙනෙකුට මරණය ගෙන දුන් ව්‍යසන තත්ත්වයක් අපේ රට තුළ ඇති වීම පිළිබඳව අපි රටක් හැටියට කනගාටු වෙන්න ඕනෑ. මේ අවස්ථාවේ දී මෙම තත්ත්වය මර්දනය කිරීමට විශේෂයෙන් කරාපිටිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දුන් සක්‍රීය දායකත්වය පිළිබඳව අපි අපේ ස්තුතිය, ගෞරවය ඒ අයට පුද කරන්නට ඕනෑ.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විවිධ දේ ඉටු කිරීම සඳහා, විශේෂයෙන් කරාපිටිය ශික්ෂණ රෝහල සම්බන්ධ සංවර්ධන කටයුතු වෙනුවෙන් අපි සැලසුම් සකස් කර තිබෙනවා. නමුත් එම සැලසුම් මන්දගාමීව ක්‍රියාත්මක වෙනවාය කියන එක මම අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. වර්තමාන ජනාධිපතිතුමා, සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් සිටියදී, මුල් ගල් තියලා වැඩ ආරම්භ කරපු ඒකක තිබෙනවා. දැනට අවුරුදු හතරකට ආසන්න කාලයක් ගතවුවත්, තවම ඒවා විවෘත කර ගැනීමට නොහැකි තත්ත්වයක් තිබෙනවා. අපි ඒ පිළිබඳ කරුණු සොයා බැලූ අවස්ථාවේ කොන්ත්‍රාත් සමාගමට මුදල් ගෙවීම පිළිබඳ ප්‍රශ්න ඇති වීම නිසා ඉදිකිරීම් කටයුතු මන්දගාමී වීම සිදු වී ඇති බවට කරුණු අනාවරණය වූ බැවින් අපි ඒ පිළිබඳව රාජිත සේනාරත්න ඇමතිතුමාට දැනුම් දුන්නා. එතුමාත් ඒ සඳහා උත්සාහ ගත් බව අපි දන්නවා. නමුත් මුදල් ලබා දීමට නොහැකි වීම තුළ මේ සංවර්ධන කටයුතු ජනතාව බලාපොරොත්තු වුණු ආකාරයට, ප්‍රදේශයට අවශ්‍ය ආකාරයට ඉටු කර ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. මේ පිළිබඳව රජය, මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරය වගකිව යුතුයි කියන එක තමයි ප්‍රදේශයේ මහජන නියෝජිතයන් හැටියට අපට ප්‍රකාශ කිරීමට සිදු වෙලා තිබෙන්නේ. ඒ වාගේම අවශ්‍ය ඖෂධ වර්ගවල අඩුවක් තිබෙනවා. අපි කුමන ආකාරයෙන් කථා කළත්, අපි ඇත්තටම ඖෂධ මිල අඩු කළා කියලා කථා කරනවා. ඖෂධ මිල අඩු කළාට ඖෂධවල අඩුව විශාල ප්‍රශ්නයකට හේතු වෙලා තිබෙනවා.

මම ඊයේ කරාපිටිය රෝහලේ පිළිකා ඒකකයට ගියා. එතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි රෝගීන්ට අවශ්‍ය ඖෂධවල අඩුව. මම එතැන සිට දූරකථන මාර්ගයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාව සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළා. නමුත්, බැරි වුණා. ඉන් පසුව අධ්‍යක්ෂ ජනරාල්තුමාට කථා කළා. එතුමාවත් සම්බන්ධ කර ගැනීමට නොහැකි වුණා.

නමුත් අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලයෙන් මහරගමට කථා කළාට පසුව, මහරගම රෝහලේ අධ්‍යක්ෂතුමා මට කථා කරලා කිව්වා, " බෙහෙත් අඩුවක් නැහැ, බෙහෙත් ඇතිවෙන්න තිබෙනවා" කියලා. බලනකොට මහරගම රෝහලේ බෙහෙත් ඇතිවෙන්න තිබෙනවා. නමුත් කරාපිටිය රෝහලේ බෙහෙත් නැහැ. මේ සිද්ධවෙලා තිබෙන්නේ මොකක්ද? ඒ බෙහෙත මහරගම තිබෙනවා නම් ඇයි, දකුණේ නැත්තේ? දකුණේ විතරක් නොවෙයි, අම්පාර, මොනරාගල ආදී හැම ප්‍රදේශයකින්ම එන ලෙඩුන්ට ලබාදිය යුතු ඒ බෙහෙත් ටික තියෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මහරගම බෙහෙත් තිබෙනවා, ගාල්ලේ නැහැ කියා නේ.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ඔව්.

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

එහෙම නම් මම හිතන්නේ ඒක ඔබතුමාගේ අධ්‍යක්ෂකගේ වැරැද්දක්. එම රෝහල මධ්‍යම රජය යටතේ තිබෙන්නේ. අපි computerize කරලා තිබෙනවා. ඒ අනුව ඕනෑම බෙහෙතක් කොහේ හෝ රෝහලක නැත්නම්, තිබෙන තැනකින් ඒගොල්ලන්ට ඒවා ගන්න පුළුවන්. ඒ නිසා ඔබතුමාගේ අධ්‍යක්ෂතුමාට කියන්න, මහරගම රෝහලේ වැඩිපුර බෙහෙත් තිබෙනවා නම් computer system එක හරහා ඒ බෙහෙත් ගන්න පුළුවන් කියලා.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ඔබතුමාගේ මැදිහත්වීම ගැන ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ මගේ අධ්‍යක්ෂතුමෙක් නොවෙයි. ඔබතුමාගේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඉන්න අධ්‍යක්ෂතුමෙක්.

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

ඒක හරි. එතුමාගේ රාජකාරිය හරියට කරන්න ඕනෑ.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

මම මහජන නියෝජිතයෙක් හැටියට කරුණු සොයා බැලුවාම, බෙහෙත් හිඟයක් තිබෙනවාය කියන එක රෝගීන් තමයි මට කිව්වේ. [බාධා කිරීමක්] රෝගීන් කිව්වාම තමයි, මම ඒක අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අවධානයට යොමු කළේ. ඉන් අනතුරුව ඊයේ හවස මේ වාගේ වෙලාවට අධ්‍යක්ෂ ජනරාල්තුමා මට කථා කළා. එතුමා මට කිව්වා මේකට විසඳුමක් දෙන්නම් කියලා. එතුමා ඒක භාර ගත්තා.

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

මේ ප්‍රශ්නය ගැන මටත් ආරංචියක් ඇවිත් මම ඊයේ පෙරේදා කථා කළා. අපේ MSD එකේ stocks තිබෙනවා. ඊට පස්සේ මහරගම රෝහලේ Director මිස්ටර් විල්ෆ්‍රඩ්ගෙන් මම ඇහුවා, "මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවාද?" කියලා. ඔහු කිව්වා "මට ප්‍රශ්නයක් නැහැ, බෙහෙත් තිබෙනවා" කියලා. අපි දන්නේ නැහැ, එහෙම බෙහෙත් හිඟයක් තිබෙනවා නම් කරාපිටිය රෝහලේ ඉන්න Directorට පුළුවන් බෙහෙත් ගන්න; ඒගොල්ලන්ට ඒකට access තිබෙනවා. ඔහුගේ වැරැද්දක් ඇති. අමාත්‍යාංශයට වැරැදි කියන්න එපා. ඒක නිලධාරීන්ගේ වැරැද්ද.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණු පැහැදිලි කිරීමට උත්සාහ ගැනීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් මගේ තර්කය මේකයි. මේ අධ්‍යක්ෂතුමා අයිති වන්නේ ගමටවත්, පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් වුණු මටවත්, මගේ දේශපාලන පක්ෂයටවත් නොවෙයි. එතුමා අමාත්‍යාංශයේ නිලධාරියෙක්. අමාත්‍යාංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ ප්‍රශ්නයක් හේතුවෙන් මීසක් මෙවන් තත්ත්වයක් ඇති විය නොහැකියි කියන එකයි මම කියන්නේ. ඔබතුමා දක්ෂ, කැප වුණු නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට මේ කාරණා ගැන සොයා බලන එකට අපි ස්තුතිවන්ත වෙනවා. තත්ත්වය එසේ වුණත්, ගමේ රෝහලේ බෙහෙත් නැතිවීම සම්බන්ධව වගකිව යුත්තේ අදාළ අමාත්‍යාංශය බව ඔබතුමා පිළිගත යුතුයි. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න පුළුවන්.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

සම්බන්ධීකරණය පිළිබඳ ඒ විධියේ ප්‍රශ්න, දැනුවත්වීම පිළිබඳ ප්‍රශ්න ඇති වීම එතුමා කියන ආකාරයට අධ්‍යක්ෂතුමාගේ වැරැද්දක්ද, නැද්ද කියා මම දන්නේ නැහැ. මොකද, ඒ බෙහෙත් වර්ගය හිඟවීමෙන් අද වන විට රෝගීන් 300ක් දුෂ්කර තත්ත්වයට පත් විය හැකි බව ඒ පාලක මණ්ඩලය ඊයේ මට දැනුම් දුන්නා. ඒ වාගේම ඇති විය හැකි තත්ත්වයන් පිළිබඳව, ඇති වුණු තත්ත්වයන් පිළිබඳව සලකා බැලිය යුතුයි. ඉතා ඉහළ මිල ගණන්වල බෙහෙත් තිබෙනවා. සියලු බෙහෙත් ලබා දීමට අද රජය තීන්දුවක් අරගෙන තිබෙනවා. නමුත් බෙහෙත් තුණ්ඩුව දිහා බලලා, ඒ තුණ්ඩුව පිටට යවලා බෙහෙත්වල මිල දැන ගත්තාම, ඒ මුදල ගෙවා ගන්න බැරි නිසා බෙල්ලේ වැල ලා ගත් රෝගීන් ඒ රෝහලේ ඉඳලා තිබෙනවාය කියන එක අපි කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළඟදීත් එවැනි තත්ත්වයක් උදා වුණා. තමන්ගේ තාත්තාට බෙහෙත් ටික අරගෙන දෙන්න ගියාම, ඒ, "තාත්තා නොවෙයි" කියා දරුවෝ දෙන්නා කිව්වා. ඊට පස්සේ සොයලා බැලුවාම ඒ දරුවන්ට කියන්න සිද්ධ වුණේ, "දැන් අපට තිබෙන්නේ ඇඳිවත විතරයි. ඇඳිවත විතරක් ඉතිරි වන තෙක්ම අපේ තිබුණු සියලු මුදල් වියදම් කළේ තාත්තාට බෙහෙත් ටික අරගෙන දෙන්නයි. අද බෙහෙත් ටික ගන්න වෙනත් ක්‍රමයක් නැති නිසා අපි තාත්තා නොවෙයි කියන්න තරම් මට්ටමකට පත් වුණා" කියන එකයි. එවැනි තත්ත්වයට පත් වුණු මිනිසුන්, රෝගීන් අපේ ප්‍රදේශයේ ඉන්නවාය කියන එක මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ නිසා කරුණාකර මේ තත්ත්වය ගැන සොයා බලා ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වන්න.

දැන් අපේ ප්‍රදේශයේ ඇති වී තිබෙන වසංගත තත්ත්වය වළක්වා, ඒ කුඩා දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා සියලු සෞඛ්‍ය වෛද්‍ය අංශ ගෙන යන ක්‍රියා මාර්ග පිළිබඳව ඒ අයට අපේ ස්තුතිය පුද කරමින්, මීටත් වඩා කාර්යක්ෂමව මේ කටයුතු සිදු කරලා මේ අටදෙනාගෙන් පස්සේ කිසිදු දරුවෙකුට ව්‍යසනයක් නොවේවා! කියා ප්‍රාර්ථනා කරමින්, මිය ගිය ඒ දරුවන් අටදෙනාගේ පවුල්වල උදව්යට අපේ සංවේගය -ශෝකය- පළ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. Hon. Faizal Cassim. You have 20 minutes.

[3.00 p.m.]

ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)

Bismillahir Rahmanir Raheem.

Hon. Presiding Member, I thank the Hon. Janaka Wakkumbura, Member of Parliament, for bringing this Adjournment Motion today.

This Influenza viral fever is seasonal and the outbreak of this viral fever happens twice a year. We have set up 19 centres island-wide from which we get day-to-day data about this disease. The Ministry of Health, Nutrition and Indigenous Medicine together with an epidemic consultant team is monitoring the outbreak of this viral fever.

Last year, the outbreak of the Influenza viral fever was not in the Southern Province but the other Provinces had been affected by this. However, this year, since April onwards, it has been affecting the Southern Province. With the rains that we are experiencing during the last few days, we expect that there will be more outbreaks of the diseases once the water levels start receding. There have been deaths reported from the Karapitiya Hospital and patients from Matara, Hambantota, Tangalle and various other places have been admitted to this Hospital. I, as the Deputy Minister of Health, want to give an assurance that our Ministry has taken all the necessary steps to tackle these problems.

The issue is, the Ministry of Health alone cannot solve these problems without the support of the public. The public should be aware of how these diseases are caused. This Influenza virus normally starts with cough, followed by fever. We have requested the MOH offices to inform the public that when a person gets cough, fever and a runny nose, to go to a hospital. But there are some patients who do not do that. They go to a close-by private practitioner and take medicine and only when it becomes worse, they run to a hospital. This happens not only for this viral fever but it happens for Dengue fever also. We have been monitoring that also. We have informed the public that they can come to our hospitals for any disease. We have all the facilities. We spend a lot of money to do blood tests. We have provided 3-part haematology analyzers, 5-part haematology analyzers to all hospitals and also sent enough MLTs to most of the hospitals.

But, you all are blaming only the Ministry of Health and that will not help. We want public support to prevent this type of diseases. When the Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle was speaking, she spoke about the importance of washing hands. Do people wash their hands? You should wash your hands if you want to prevent this viral fever. You have to be very careful. These type of diseases rapidly spread in schools, because when children cough, most probably they cough in front of other children.

When you talk about the spread of diseases in Sri Lanka, if we get the support of public, we can control all these diseases. I want to give you an example. A large number of tourists come to Negombo, which is the most-affected area of dengue; but the foreigners do not get affected by the dengue fever. The reason is, when they come to Sri Lanka, they come prepared to face this problem. They come ready with whatever cream or oil which they apply to prevent mosquito bites.

Some Hon. Members pointed out that as a result of Directors being transferred this has worsened; which is a false story. In fact, yesterday also, I saw on television the Hon. Mahindananda Aluthgamage talking about that issue.

Sir, I want to say that Dr. (Mrs.) Paba Palihawadana has been working as the Chief Epidemiologist of the Epidemiology Unit from 2012 and she was given Cabinet approval in 2017 to go and work for the UNICEF. She was given official leave for two years, but after one year she came back to the Ministry. By the time she came we have already sent the request to the PSC to fill the vacant position of the Epidemiology Unit. They called for an interview and they have selected another person to look after that Unit. Dr. Anil was given that position by the PSC. I think, you know that once the PSC recommends, we cannot change that. It is a rule. After one year, Dr. (Mrs.) Paba Palihawadana came back and she has been appointed to another Unit. It is not a fault of the Ministry or a fault of the Minister. It is the transfer procedure. Every five years, they are transferred. After five years, every doctor has to apply for that transfer programme. So, automatically Dr. Anil came to that position and we had to give it to him. The bond agreement states that it is the Ministry that decides where one has to work.

She had taken leave for two years but she came back after one year. By the time she came, her post had been filled and she had been transferred to another Unit.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගාල්ල, කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකයේ බෙහෙත් වර්ග අඩුවීමක් ගැන ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා චෝදනාවක් කළා. නමුත් මම මේ වෙලාවේ ගාල්ල, කරාපිටිය

ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ජයම්පති මැතිතුමාට කථා කළා. එතුමා එක බෙහෙත් වර්ගයක් අඩුයි කියලා කිව්වා. අනෙක් බෙහෙත් වර්ග තිබෙනවා. එක බෙහෙත් වර්ගයක් විතරක් අඩු වෙලා තිබෙනවා. ඒ බෙහෙත් වර්ගය සති දෙකකට වරක් තමයි ගෙනෙන්නේ. මොකද, expire වන නිසා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, නියෝජ්‍ය ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ දෙන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඒ බෙහෙතේ නම කියන්න ඕනෑ. අපේ රජයට චෝදනා එනවා. "Filgrastim" නමැති බෙහෙත් වර්ගයක් විතරක් ඒ රෝහලේ දැනට අඩු වෙලා තිබෙනවා. ඒ බෙහෙත වෛද්‍ය සැපයුම් ඒකකයේත් නැහැ. ඒ බෙහෙත ආනයනය කරනකොට ජූලි මාසය වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. Hon. Deputy Minister, please continue.

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
Therefore, it is not reasonable for the Opposition to point the finger at the Ministry of Health, because she has been given that position automatically. That is all. We have not transferred her or we have not taken her away from the Ministry. She herself had applied for leave for two years to work in the UNICEF, but, she had come back after one year. That is the story. Therefore, it is not fair to blame the Ministry or the Minister. Still our Epidemiology Unit is very strong. Our team has had two meetings at the PDHS Office in the Southern Province and they have been given instructions as to what they have to do and now, all the medicines are available there. So, the public have to be aware of this and they have to be careful. I think, our Director-General also had a press conference the day before yesterday and he explained the situation.

So, whatever the public may say, according to our records, the number of OPD patients have come down this week compared to last week. So, it is rapidly coming down. Therefore, I hope that this issue will settle in time to come. When public become more aware of this we can work on it.

Then, on the issue that the Hon. ChandimaWeerakkody was talking about, I would like to tell him that we have linked all the Central Government Hospitals through a computerized system. If any hospital, whether it is a Central Government Hospital or a Provincial Hospital, has a shortage of medicine, through this computerized system, they can immediately get down the medicines required. Last month, I was looking for a medicine for cancer which was not available in our stores and I was able to get it down from the Jaffna Hospital to be given to the Maharagama Cancer Hospital. So, the system is there. It is the duty of the Directors of the hospitals to use that system and we have instructed them to do so. The Minister, the Director-General or the Secretary cannot do everything. We have formed a system where the transfer of medicine can be done. So, it is their duty to use that. The Hon. Chandima Weerakkody blamed the Ministry. He may have been given this information by the public. But these are responsibilities of the high-ranking officers. They have to do their job. What happens in Sri Lanka is, somebody makes a mistake and everybody points the finger at the Minister.

In fact, we have been developing our health sector. I think we have achieved the standard that is recognized by the world. Now we should not try to move further down. We have started a lot of programmes to move forward. The World Bank has granted US Dollars 200 million to develop the primary healthcare system. So, we are going to develop primary healthcare services in all the village hospitals and bring it closer to the level of base hospitals and then base hospitals to the level of Central Government hospitals. So, through this system, we are trying to make access to health facilities easier for the public in Sri Lanka.

Therefore, I thank the Hon. Janaka Wakkumbura for moving this Adjournment Motion today in Parliament and highlighting through Parliament to create public awareness of this influenza virus.

Thank you very much.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 3.15ට, 2018 මැයි 25වන සිකුරාදා පු. භා. 10.30 වන තෙක් කල් ගියේය.


அதன்படி பி.ப. 3.15மணிக்கு பாராளுமன்றம், 2018 மே 25, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 3.15 p.m. until 10.30 a.m. on Friday, 25th May, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

260 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 260 - இல. 8
Volume 260 - No. 8

2018 මැයි 25වන සිකුරාදා
2018 மே 25, வெள்ளிக்கிழமை
Friday, 25th May, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
අභ්‍යාසලාභී සංවර්ධන සහකාර තනතුරට බඳවා ගැනීම ප්‍රමාද වීම

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත:
ඉල්ලා අස්කර ගන්නා ලදී.

විසර්ජන පනත:
යෝජනා

பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

தனி அறிவித்தல் மூல வினா:
பயிலுநர் அபிவிருத்தி உதவியாளர் பதவிக்கு ஆட்சேர்ப்பதிலுள்ள தாமதம்

அரசியலமைப்புக்கான இருபதாவது திருத்தச் சட்டமூலம்:
வாபஸ் பெறப்பட்டது.

ஒதுக்கீட்டுச் சட்டம்:
தீர்மானங்கள்

PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

PUBLIC FINANCE COMMITTEE REPORT

QUESTION BY PRIVATE NOTICE:
Delay in Recruitment for Post of Trainee Development Assistant

TWENTIETH AMENDMENT TO THE CONSTITUTION BILL:
Withdrawn

APPROPRIATION ACT:
Resolutions

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 මැයි 25වන සිකුරාදා
2018 மே 25, வெள்ளிக்கிழமை
Friday, 25th May, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ජනාධිපති කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ත ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
(ii) 2015 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 සහ 2016 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තා සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ඉඩම් සහ පාර්ලිමේන්තු කටයුතු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රතිසන්ධානය හා උතුරු හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වගන්තිය යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on, "Notification under the Excise Ordinance" and "Seven Resolutions under the Appropriation Act" which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 27 (2) යටතේ අසනු ලබන ප්‍රශ්නය; ගරු අනුර දිසානායක මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

අභ්‍යාසලාභී සංවර්ධන සහකාර තනතුරට බඳවා ගැනීම ප්‍රමාද වීම
பயிலுநர் அபிவிருத்தி உதவியாளர் பதவிக்கு ஆட்சேர்ப்பதிலுள்ள தாமதம்
DELAY IN RECRUITMENT FOR POST OF TRAINEE DEVELOPMENT ASSISTANT

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තනතුරුවලට බඳවා ගැනීම ප්‍රමාදවීම හේතුවෙන් විභාගය සමත්වූවන් අතර මතු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2016.09.30 දිනැති ගැසට් පත්‍රය මඟින් බැංකු සංවර්ධන සහකාර තනතුර සඳහා 360 දෙනෙකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා, 2017.07.15වෙනි දින විභාගයක් පවත්වනු ලැබුවා.

මෙම විභාගය සඳහා තරුණ-තරුණියන් 20,000කට වැඩි පිරිසක් පෙනී සිටියා. පසුව එම විභාගයෙන් සමත්වූවන් සඳහා 2017.11.25 - 2017.12.03 අතර කාලය තුළ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණද පවත්වනු ලැබුවා. එහෙත් මේ දක්වා ඔවුන් අදාළ තනතුරු සඳහා බඳවා ගෙන නැහැ. ගරු කථානායකතුමනි, ඉල්ලුම් පත්‍ර දීලා දැනට අවුරුදු එකහමාරකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා.

මේ හේතුවෙන් විභාගයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් බලවත් කනස්සල්ලෙන් පසුවෙනවා. විශේෂයෙන් ඔවුන් මෙම තනතුර සඳහා අයදුම්පත් යොමුකොට දැනට මාස 18ක කාලයක් ගතවී තිබෙනවා. මෙම තනතුරු සඳහා ඇතුළත් වීමට අපේක්ෂාවෙන් සිටින විශාල පිරිසක් මෙම බඳවා ගැනීම් ප්‍රමාදවීම පිටුපස දේශපාලන මැදිහත්වීමක් ඇත්දැයි සැක පහළ කරනවා. රට තුළ විරැකියාව ඉහළ යමින් ඇති මොහොතක මෙවැනි ආකාරයෙන් ඉක්මනින්ම ලබා දිය හැකිව ඇති තනතුරු සඳහා පවා බඳවා ගැනීම ප්‍රමාද වීම ගැටලු සහගතයි.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට ගරු ඇමතිතුමා පිළිතුරු ලබාදෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට බැංකු සංවර්ධන සහකාර තනතුර සඳහා කොපමණ පිරිසක් බඳවා ගැනීමට නියමිතව තිබේද?
2. ඒ සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිය කවරේද?
3. මේ වන විට විභාගය සමත්ව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි පිරිස බඳවා ගැනීම ප්‍රමාද වී ඇත්තේ ඇයි?
4. මෙම පිරිස බඳවා ගැනීමට කටයුතු කරන්නේ කවදාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මැතිතුමාගේ ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කළ ප්‍රශ්නයට අදාළ පිළිතුරු පහත පරිදි වේ.

1. 316ක පිරිසක් බඳවා ගැනීමට නියමිතය.

2. i. පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කර අයදුම්පත් කැඳවීම.

ii. විභාග දෙපාර්තමේන්තුව මඟින් විවෘත තරග විභාගයක් පැවැත්වීම සහ සම්මුඛ පරීක්ෂණය යන දෙකෙහි ලබා ගන්නා ලකුණු මත අවශ්‍ය පුරප්පාඩු සඳහා (316) බඳවා ගැනීම.

3. i. 2017.07.15 දින විභාගය පවත්වා, ඉන් සමත් වූ (ලකුණු 45 හා ඉන් ඉහළ) 3,580 දෙනකු වෙනුවෙන් පළමු සම්මුඛ පරීක්ෂණය 2017.11.27 දිනට පෙර පවත්වා අවසන් කරන ලදී.

ii. 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හේතුවෙන් ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම, උසස් කිරීම, මාරු කිරීම සීමා කරන ලෙස දන්වා එවන ලද මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතාගේ 2017.11.28 දිනැති ලිපිය හේතුවෙන් අදාළ බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන ලදී.

iii. දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලද අපේක්ෂකයන් සංඛ්‍යාව මේ වන විට තෝරා අවසන් කර ඇත.

4. දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කර, මාස 02ක් තුළදී අභ්‍යාසලාභී සංවර්ධන සහකාර තනතුරු 316ක් සඳහා බඳවා ගැනීමේ කටයුතු අවසන් කිරීමට නියමිතය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවදා වන කොට ද, ඒ අය බඳවා ගන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉතාම ඉක්මනට. අපටත් ඕනෑ අදාළ අය තෝරා ඒ පත්වීම් ලබා දෙන්නයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා; ඔබතුමාට කරුණු පැහැදිලි කිරීමක් තිබෙනවා.

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)
ගරු කථානායකතුමනි, ඔබතුමාට මම ස්තුතිවන්ත වනවා, මේ පැහැදිලි කිරීම සිදු කිරීමට අවස්ථාව ලබා දීම ගැන.

ඊයේ මේ ගරු පාර්ලිමේන්තුවේදී ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා ඔබතුමාගෙන් ඉල්ලීමක් කර තිබෙනවා, පාර්ලිමේන්තුවට එන පාරේ සීමා මාලකයක් තිබෙනවා, එය වැස්සට කඩා වැටිලා, එහි කිසිම ගුණාත්මකභාවයක් නැහැ, ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන්න කියා.

මා පළමුවෙන්ම කියන්න ඕනෑ, එම ස්ථානයේ කරන ඒ ඉදිකිරීමට අපේ අමාත්‍යාංශයෙන් හෝ අපේ රජයෙන් කිසිම අරමුදලක් යොදවා නැති බව. පෞද්ගලික ආයතනයක් තමයි ඒ ඉදිකිරීම කරන්නේ. ඔබතුමාත් දන්නවා, අපි ගියවර දියවන්නා වෙසක් කලාපය පවත්වපු වෙලාවේ අදහසක් ආව බව, බෞද්ධ භික්ෂූන්වහන්සේලා සඳහාත්, භාවනා කරන්නත්, ධර්ම සාකච්ඡා පවත්වන්නත්, ඒ වාගේම මේ ප්‍රදේශයේ ඇවිදින මං තීරු භාවිත කරන අය සඳහාත් එවැනි ස්ථානයක් නිර්මාණය කරන්න ඕනෑය කියලා. ඒ අනුව සන්කෙත් ආයතනයට අයත් Skills Training and Management (Pvt.) Limited කියන ආයතනය එම ඉදිකිරීම ඉංජිනේරුමය වශයෙන් සැලසුම් කරන්නත්, ගොඩ නහන්නත්, ඊට පසුව අපට භාර දෙන්නත් තීරණය කළා. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ වාස්තු විද්‍යාවට අනුකූල වන පරිද්දෙනුත් ඒ කටයුත්ත කරගෙන යන්න ඒ අයට භාර කළා. ඇත්තටම ඒ සඳහා බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේත් අනුශාසකත්වය අපට ලැබුණා. ඒක සීමා මාලකයක් නොවෙයි. ඒක එක්තරා ආකාරයකට පොහොය කිරීම්, භාවනා කටයුතු හා ධර්ම සාකච්ඡා සඳහා යොදා ගන්නා ස්ථානයක්. ඒක පාවෙන ස්ථානයක් හැටියට ගොඩ නහන්නයි තීරණය කළේ. නමුත් පාවීම සඳහා පාවිච්චි කළ pontoon එකක ඇති වුණු ප්‍රශ්නයක් නිසා ඒක නිසි ආකාරයෙන් ඉහළට එසවුණේ නැහැ. දැන් අපි කියා තිබෙනවා, ඒක ඉවත් කරලා, ඒකට මොකද වෙලා තිබෙන්නේ කියලා බලන්න කියලා. ඒකට හේතුව ඉංජිනේරුමය සැලසුම්කරණයේදී වුණු අඩු පාඩුවක්ද, ඉදි කිරීමේදී වුණු අඩු පාඩුවක්ද, නැත්නම් කඩාකප්පල්කාරී ක්‍රියාවක්ද කියලා ඒක ඉවත් කළාට පසුව අපට දැන ගන්න පුළුවන්.

ඒ ආයතනය අපට පොරොන්දු වෙලා තිබෙනවා, කෙටි කලක් ඇතුළත එය එතැන ස්ථාපිත කරන බවට. එය තමයි මේ සම්බන්ධයෙන් දැනට තිබෙන තත්ත්වය. ඒකට ආණ්ඩුවේ අරමුදල් වැය වීමක් හෝ එවැනි දෙයක් සිදු වෙලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. ඊළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානයට මේ කාරණය යොමු කරන්න කැමැතියි. මීට ප්‍රථමයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමත් තුන්වාරයක් විතර මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාව හමු වුණා. මේක මුළු පාර්ලිමේන්තුවේම මන්ත්‍රීවරුන්ට බලපාන ප්‍රශ්නයක්.

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සනත් නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා ඇප කොන්දේසි ප්‍රකාරව පොලීසියට ඉදිරිපත් නොවීම මත රිමාන්ඩ් භාරයට පත් කළා. එතුමා ප්‍රසිද්ධ පුද්ගලයෙක්; මහ ජනතාව අතර ඉන්න මන්ත්‍රී කෙනෙක්. උසාවියට ඉදිරිපත් වුණාම රිමාන්ඩ් භාරයට පත් කර දැනට මාස තුනක් ගත වෙලා තිබෙනවා. ගරු කථානායකතුමාගෙන් අපි ඉල්ලීම් කළත්, මේ මාස තුන ඇතුළතම මන්ත්‍රීතුමාට ඇප ලබා ගැනීමට ඉඩ කඩක් ලැබුණේ නැහැ. මෙය එතුමාගේ පෞද්ගලික නඩුවක් නොවෙයි; රජයෙන් ඉදිරිපත් කළ නඩුවක්. ඒ නිසා මේ කාරණයට නීතිපතිතුමාට මැදිහත් විය හැකියි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මෙවැනි තත්ත්වයකට පත් වෙලා තිබෙන අතර, කථානායකතුමා යම් කිසි උපදෙසක්, ඉල්ලීමක් කළාම එයත් නොසලකා හරින අභාග්‍යසම්පන්න කාල පරිච්ඡේදයකට පාර්ලිමේන්තුව පත් වෙමින් තිබෙනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු කථානායකතුමනි, ඊයේ දිනයේ හලාවත මහාධිකරණයේ නඩුව කෑඳවූ අවස්ථාවේ එතුමාව යළිත් රිමාන්ඩ් භාරයට පත් කළා. මොකද හේතුව, නඩුකාරතුමා නොපැමිණීම; නඩුකාරතුමා අසනීප වීම; නඩුකාරතුමා රෝහල්ගත වීම. ඒක පුදුමයක් නොවෙයි. ඩෙංගු හා වෛරස් උණ රෝගය නිසා මේ දවස්වල මුළු ලංකාවම අසනීප වෙනවා; රෝහල්ගත වෙනවා. නමුත් සාමාන්‍යයෙන් වෙන කෙනෙක් ඒ වෙනුවට ඒ දවසේ උසාවියේ කටයුතු කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සනත් නිශාන්ත මහතා විහාරස්ථානයක දහම් පාසලක් ඉදිකිරීම සම්බන්ධ කාරණාවක් මුල්කරගෙන මේ රජයේ ප්‍රාදේශීය ලේකම් කෙනෙක් විසින් කරන ලද පැමිණිල්ලක් මත තමයි මේ නඩුව පවත්වාගෙන යන්නේ. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ නඩුව ගැන නොවෙයි. [බාධා කිරීමක්] Hon. Leader of the House, let me explain on behalf of our Hon. Member. I have taken up this matter a couple of times and always ආණ්ඩුවෙන් කියා තිබෙනවා, අපි මේක ඉදිරි කාලයේදී සලකා බලනවාය කියා. ඉදිරි කාලය දැනට මාස තුනක් ගත වුණා ගරු කථානායකතුමනි. මේ දවස්වල පුත්තලම් දිස්ත්‍රික්කය මහ වර්ෂාව නිසා ගංවතුරට යටවෙලා. ඒ දිස්ත්‍රික්කයේ ඉතාම ජනප්‍රියම මන්ත්‍රීවරයා හැටියට පත් වෙච්ච මන්ත්‍රීවරයා රිමාන්ඩ් එකේ තියාගෙන ඉන්නවා. මන්ත්‍රීවරුන් හැටියට අපේ මහ ජනතාව ළඟට ගිහින් සේවය කිරීමේ වරප්‍රසාදය අපට තිබෙනවා. අපි ඔබතුමාගෙන් අහන්නේ, රිමාන්ඩ් එක ඇතුළේ සිටින ගරු සනත් නිශාන්ත මන්ත්‍රීතුමාට ඇප ලබා දීම සඳහා-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
මම ඊයේත් ඒ සම්බන්ධව යම් යම් පියවර ගත්තා. [බාධා කිරීමක්] ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
මම පුදුම වෙනවා, අපේ මිත්‍ර ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ඉල්ලීම සම්බන්ධව. ගරු කථානායකතුමනි, ඔබතුමාට පුළුවන්ද ඇප දෙන්න? ඔබතුමාට ඇප දෙන්නට බැහැ. මේ හදන්නේ අධිකරණයට බලපෑම් කරන්න. ඔබතුමාට ඇප දෙන්නට බැහැ. ඇප දෙන්න අපිටත් බැහැ. මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කිරීමත් වැරදියි. මොකද? අධිකරණය ඉදිරියේ නඩුවක් තිබෙනවා නම් ඒ ගැන පාර්ලිමේන්තුවේ කථා කරන එක වැරදියි.

දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා 1983දී පාර්ලිමේන්තුවට ආවේ. ඇප දෙන්න කථානායකතුමාට බැහැ කියලා එතුමා තවම දන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ ගැන පැහැදිලි කරන්නම්. මේ සඳහා විවාදයක් අවශ්‍ය වෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
මම දන්නේ නැති වෙන්න පුළුවන්. කථානායකතුමාත් දන්නේ නැහැ කියලායි සභානායකතුමා කියන්නේ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඇප ලබා ගන්න නම් හොඳ නීතිඥ මහත්මයෙක් අල්ලා ගන්න ඕනෑ. ඒක තමයි ඉස්සෙල්ලාම කරන්න තිබෙන්නේ. [බාධා කිරීම්]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
මට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. මම ඒ ගැන පැහැදිලි කළාට පසුව කරුණාකරලා ඔබතුමන්ලාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්නම්. ඒ ආරංචිය ලැබුණු විගසම මා ගරු අධිකරණ අමාත්‍යතුමියට කථා කළා, ගරු මන්ත්‍රීතුමා. මේක සාධාරණ දෙයක් නොවන බවට එතුමියත් එකඟ වුණා. ඊට පසුව මා ඒ ගරු මන්ත්‍රීතුමාටත් කථා කළා. මේ කාලය තුළදී ඒ ගරු මන්ත්‍රීතුමාට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ආදිය ලබා දීම ගැනත් මා කථා කළා. මේ සිද්ධිය මා හිතන හැටියට අවුරුදු හතරකට, පහකට කලින් සිදු වෙච්ච සිද්ධියක්; ළඟදී වෙච්ච සිද්ධියක් නොවෙයි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
කරුණාකරලා මට මේ කාරණය පැහැදිලි කරන්න දෙන්න, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමා වාඩිවෙන්න. නැවතත් මා මේ කාරණය සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමිය සමඟ කථා කරලා අවශ්‍ය පියවර ගන්නම්. මමත් ඒ ක්‍රියාදාමය අනුමත කරන්නේ නැහැ. ඒක ඉතාම අසාධාරණ දෙයක් බව මමත් පිළිගන්නවා. මේ සඳහා වාද විවාද කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. දැන් ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ලංකා ඉතිහාසයේ කිසිම දවසක මෙතරම් මන්ත්‍රීවරු පිරිසක් බන්ධනාගාරගත කිරීම, ඇප නොදී

තබාගෙන සිටීම යනාදිය කරලා නැහැ. ඒක තමයි ප්‍රායෝගික තත්ත්වය; යථාර්ථය; ඇත්ත. මෙහෙම ආණ්ඩුවක් ලංකා ඉතිහාසයේ කවදාවත් තිබිලා නැහැ. අපි 1989 ඉඳලා පාර්ලිමේන්තුවේ ඉන්නවා. ප්‍රථම වතාවට තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පොලීසියට ඉදිරිපත් වුණේ නැහැ කියලා මාස ගණනක් ඇප ලබා නොදී සිටියේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ සිද්ධිය අවුරුදු පහකට වඩා පැරණි ප්‍රශ්නයක්, ගරු මන්ත්‍රීතුමා. ඒකයි. මට ඔබතුමා කියන කාරණය තේරෙනවා. ඒකයි මා පැහැදිලි කළේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නීති හදන මේ උත්තරීතර සභාවේ ඉන්න මහජන නියෝජිතයන්ට මෙහෙම නම් සාමාන්‍ය මිනිසුන්ට මොකක්ද වෙන්නේ?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එම නඩුවේදී එතුමාට කියා තිබුණා, ඇප කොන්දේසි ප්‍රකාරව පොලීසියේ පෙනී සිටින්න කියලා. නමුත්, පොලීසියේ පෙනී සිටින්න බැරිව ගියා. පොලීසියේ පෙනී සිටින්න බැරි වීම තුළ තමයි මහාධිකරණයෙන් දිගින් දිගටම එතුමාව රිමාන්ඩ් බන්ධනාගාරයේ තබා ගෙන ඉන්නේ; දැන් මාස තුනක්. සාමාන්‍යයෙන් කරන්නේ, අවවාද කරලා නිදහස් කරන එකයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මට පැහැදිලි කරන්න අවශ්‍ය නැහැ. මම මේ කරුණු ඔක්කෝම දන්නවා. ඔබතුමන්ලා කියන්නත් ඉස්සෙල්ලා මම ඊයේ පියවර ගත්තෙත් ඒකයි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඔබතුමා කියන්නෙත් ඒ කරුණ ගැනමද?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, "ඇප කොන්දේසි උල්ලංඝනය" කියන වෝදනාව මත තමයි එතුමාව රිමාන්ඩ් බන්ධනාගාරගත කරන්නේ. ඇප කොන්දේසි උල්ලංඝනය වුණා කියන එක මත පහළ උසාවියෙන් ඇප නොදී මහාධිකරණයට ගියාම තමයි මේ සිද්ධිය වෙන්නේ. කිසිම සාධාරණ හේතුවක් නැහැ. ඇප කොන්දේසිය උල්ලංඝනය වුණා නම් එයට නියමිත මොකක් හෝ දඬුවමක් දීලා ඒක ඉවර වෙන්න ඕනෑ. නමුත් දිගින් දිගටම මෙසේ කිරීමෙන් සැකයක් මතු වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීවරයාගෙන් සැලසුම් සහගතව පළිගැනීම සඳහා අධිකරණයත් යොදා ගන්නවාද කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක මම දන්නේ නැහැ. මේ අවස්ථාවේ වාද විවාද කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. සහෝදර මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමන්ලාට වාගේම ඒ ගරු මන්ත්‍රීතුමා කෙරෙහි අපටත් හැඟීමක් තිබෙනවා. ඒ නිසා තමයි මම පියවර ගත්තේ. ගරු අධිකරණ ඇමතිතුමිය දැනුවත් කරලා තිබෙනවා. ඒ වාගේම Attorney-General දැනුවත් කරලා තිබෙනවා. බලමු, ඊළඟට ගන්න පුළුවන් පියවර. අනෙක, විනිශ්චයකාරවරයා නැහැ කියලා එලෙස කරනවා නම්, එය සාධාරණ නැහැ. ඒක මමත් පිළිගන්නවා. ඒ ගැන ඉදිරි කටයුතු කරන්න, මට අවස්ථාව දෙන්න.

ඊළඟට, න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය අනුමත කිරීම සහ අංක 2 සිට 8 දක්වා වූ, විසර්ජන පනත යටතේ යෝජනා 7ක් අනුමත කිරීම.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, we are not moving Item No. 1.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමා අහගෙන ඉන්න ඇති ආංශික අධීක්ෂණ කාරක සභාවල විවිධ වාර්තා අද ගරු සභාවට ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමනි, මා දන්නා විධියට අයුක්ති සහගත ලෙස ඔබතුමාටත් මේ චෝදනාවට පැටලෙන්න සිද්ධවෙලා තිබෙනවා, ඔබතුමා මේ චෝදනාවට වගකිව යුතු නැතත්. ආංශික අධීක්ෂණ කාරක සභා පටන් ගැනීමත් එක්ක, ඒ ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීමේ අවශ්‍යතාව සඳහා යැයි කියමින්, ඒ ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වෙන්න, කෘෂිකර්ම අමාත්‍යාංශය පැවති ගොඩනැඟිල්ල පාවිච්චියට ගන්නවාය කියලා තමයි ඒ ගොඩනැඟිල්ල හිස් කළේ. ඊට පස්සේ තමයි මාසයකට කුලිය වශයෙන් රුපියල් කෝටි දෙකහමාරක් ගෙවන්න අරුම පුදුම 'සබීතා බිල්ඩින්' එක කෘෂිකර්ම අමාත්‍යාංශයට ගන්න ඕනෑ වුණේ. දැන් අලුත් ඇමතිතුමා පත් වුණාම ඒකට ගෙවන මුදලත්

[ගරු විමල් වීරවංශ මහතා]

වැඩි වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් චෝදනාවක් එල්ල කරලා තිබුණා, කථානායකතුමාගේ ඉල්ලීම පරිදි තමයි ඒ කටයුත්ත සිද්ධ වුණේ කියලා. මා දන්නා තරමින් එය වැරැදියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන පැහැදිලි කළා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මා දන්නා විධියට කිසිම ආංශික අධීක්ෂණ කාරක සභාවක් මේ කියන කෘෂිකර්ම අමාත්‍යාංශ ගොඩනැඟිල්ලේ රැස්වෙලා නැහැ. ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වෙන්න මේ වන තුරු ඒ ගොඩනැඟිල්ල පාවිච්චිවෙලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන මා පස්සේ පැහැදිලි කරන්නම්. ගරු සභානායකතුමා.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත
அரசியலமைப்புக்கான இருபதாவது திருத்தச் சட்டமூலம்
TWENTIETH AMENDMENT TO THE CONSTITUTION BILL

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ අංක 37 යටතේ සඳහන් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීමට මා අවසර පතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

අවසර දෙන ලදුව පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදී.
சட்டமூலம், அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.
Bill, by leave, withdrawn.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We are moving Items 2-8.

විසර්ජන පනත: යෝජනාව
ஒதுக்கீட்டுச் சட்டம்: தீர்மானம்
APPROPRIATION ACT : RESOLUTION

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Hon. Minister of Finance and Mass Media, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Mass Media with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 24 of 2016 and specified in the Order No. 75 hereto, be approved:-

ORDER

Appropriation Act, No. 24 of 2016
Order No. 75 under Section 8

By virtue of powers vested in me by Section 8 of the Appropriation Act, No.24 of 2016, I, Mangala Samaraweera, Minister of Finance and Mass Media with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 21302 "Printing of Books, Publicity and Marketing Advance Account - Department of Educational Publications" of the Third Schedule to that Act.

	Item		Revision
(i)	Maximum limit of expenditure specified in Column II of the Third Schedule to that Act.	From Rs. To Rs.	4,300,000,000 4,315,000,000
(ii)	Minimum limit of receipts specified in Column III of the Third Schedule to that Act.		Not Revised
(iii)	Maximum limit of debit balance specified in Column IV of the Third Schedule to that Act.		Not Revised
(iv)	Maximum limit of liabilities specified in Column V of the Third Schedule to that Act.		Not Revised

(This Order is valid up to 31.12.2017)

Mangala Samaraweera,
Minister of Finance and Mass Media

26.04.2018
Colombo

(Cabinet approval signified)"

The Hon. Eran Wickramaratne will start the Debate.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[පූ.භා. 10.50]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ගරු කථානායකතුමනි, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වන වගන්තියේ විධිවිධාන මඟින් අදාළ වර්ෂය තුළදී උද්ගත වන අවශ්‍යතා අනුව විසර්ජන පනත යටතේ ලබා දී ඇති අත්තිකාරම් ගිණුම් සීමාව ආණ්ඩුවේ අනුමැතිය ඇතිව සංශෝධනය කිරීමට මුදල් අමාත්‍යතුමාට තිබෙන බලතල අනුව කළ හැකියි. ඒ සීමා

සංශෝධනය සෑම වසරේදීම මැයි මාසයේ අවසානයට ප්‍රථමයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. ඒ අනුව, පහත සඳහන් නියම පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් (උපලේඛනයේ අංක 1 සිට 74 දක්වා);

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ - පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අළෙවිය අත්තිකාරම් ගිණුම - අංක 75 දරන නියමය;

ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - අංක 76 දරන නියමය;

ශ්‍රී ලංකා රේගුවේ අත් අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ පිළිබඳ අත්තිකාරම් ගිණුම - අංක 77 දරන නියමය;

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ගබඩා අත්තිකාරම් ගිණුම - අංක 78 දරන නියමය;

රජයේ කර්මාන්තශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම - අංක 79 දරන නියමය;

රජයේ කර්මාන්තශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම - අංක 80 දරන නියමය.

ගරු කථානායකතුමනි, ගිය වසරේදී ඇති වුණු දේශගුණික විපර්යාස හේතුවෙන් රජයේ නිලධාරින්ට ආපදා ණය ලබා දීම, පොලී රහිත ණය ලබා දීම නිසා ඒ තිබෙන සීමා සංශෝධනය කරන්න සිදු වෙනවා. අත්තිකාරම් ගිණුම්වල සීමාව කවරක් වුවද නොවැළැක්විය හැකි අවස්ථාවලදී ආණ්ඩුවේ අනුමැතිය ඇතිව නියෝගයක් මඟින් එය වෙනස් කිරීමට හෝ විවර්තනය කිරීමට විසර්ජන පනතින් මුදල් අමාත්‍යවරයාට ලැබී තිබෙන බලය අනුව පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරනවා.

2017 මැයි මාසයේදී සිදු වූ අනපේක්ෂිත ජල ගැලීම් හා නාය යෑම්වලින් දේපොළ හා නිවාස හානියට පත් රජයේ නිලධාරින්ට හානිපූරණය සඳහා විශේෂ ආපදා ණයක් ලෙස පොලී රහිත මාස 6ක වැටුප් ලබා දීමට රජය ප්‍රතිපත්තිමය වශයෙන් කටයුතු කළා.

ඒ අනුව, අංක 14/2017 හා 2017 ජූනි මස 28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් කරනු ලැබුවා. එහිදී විසර්ජන පනත යටතේ ලබා දී තිබූ ප්‍රතිපාදන (සීමාව) තුළ කටයුතු කරමින් එම ණය ලබා දීමට අපහසු වී තිබෙනවා. එබැවින්, ජල ගැලීම්වලින් හානියට පත් රජයේ නිලධාරින්ට විශේෂ ණය අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම සඳහා ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ඉල්ලීම පරිදි විසර්ජන පනතින් මුදල් අමාත්‍යවරයාට ලබා දී ඇති අධිකාරය අනුව, උපරිම වියදම් සීමාව, අවම ලැබීම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව සංශෝධනය කිරීමට කටයුතු කර තිබෙනවා. එක් එක් අත්තිකාරම් ගිණුම්වලට ආවේණික වූ හේතු නිසා ගබඩා අත්තිකාරම් හා වාණිජ අත්තිකාරම් ගිණුම් සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව ඇස්තමේන්තුගත සීමාව වෙනස් කිරීමට සිදු වෙනවා.

2016 අංක 24 දරන විසර්ජන පනත අනුව සියලු අත්තිකාරම් ගිණුම්හි උපරිම වියදම් සීමාව රුපියල් බිලියන 26යි. එසේම, එහි අවම ලැබීම් සීමාව රුපියල් බිලියන 21ක් වන අතර, අය වැය කෙරෙහි වන බලපෑම රුපියල් බිලියන 5ක් වෙනවා.

2017 වර්ෂයේදී අත්තිකාරම් සඳහා මුළු සත්‍ය වියදම රුපියල් බිලියන 25.5යි. සත්‍ය ලැබීම් රුපියල් බිලියන 21.5යි. ඒ අනුව, සීමා සංශෝධනයෙන් පසුවද, ඇස්තමේන්තුගත රුපියල් බිලියන 5 සීමාව ඉක්මවා ගොස් නැහැ.

අපි යෝජනා කරන්නේ ඒ සීමාවන් අනුමත කිරීමයි. නමුත්, මේකේ වියදම විසර්ජන පනතේ තිබුණු මුළු වියදම් සීමාව ඉක්මවා ගොස් නැහැ. එබැවින් මේ සමඟ අනුමැතිය ඉල්ලා සිටින සියලුම අත්තිකාරම් ගිණුම්, සීමා සංශෝධනයන් සමස්ත ලෙස ඇස්තමේන්තුගත උපරිම වියදම සීමා හා අවම ලැබීම් සීමාව තුළ සිදු කර ඇති බැවින් 2017 අය වැය කෙරෙහි මෙම සීමා සංශෝධන නිසා කිසිදු අහිතකර බලපෑමක් සිදු වී නැත. 2017 වසරේ දී ඇති වුණු ස්වභාවික විපර්යාස නිසා තමයි ඒ සීමාවන් අපි සංශෝධනය කළේ. අපි රජයේ නිලධාරින්ට සාමාන්‍ය ආපදා ණයට අමතරව විශේෂ ආපදා ණයක් ලබා දුන්නා. අපි මාස 6ක මූලික පඩිය - basic salary - පොලී රහිතව ලබා දුන්නා. ඒ නිසා තමයි ඒ සීමාව අපට මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නට සිදු වුණේ.

අපි අද ස්වභාවික විපර්යාසවලට මුහුණ දෙනවා. තවමත් තද වැසි තිබෙනවා. ජල ගැලීම් තිබෙනවා. ඒ වාගේම සමහර තැන්වල නායයෑම් සිදු වෙලා තිබෙනවා. ඒ නායයෑමේ අවදානම තවමත් තිබෙනවා. ඒ නිසා රජය ගන්න පුළුවන් සියලුම පියවර දැනටමත් අරගෙන තිබෙනවා. මේ ජල ගැල්ම නිසා බොහොම අවාසනාවන්ත විධියට මරණ 13ක් පමණ සිදු වී තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන, නැත්නම් ආරක්ෂක මධ්‍යස්ථාන 251ක් දැනට පිහිටුවලා තිබෙනවා. මේ මධ්‍යස්ථානවල පවුල් 14,000ක් පමණ සිටිනවා. පුද්ගලයන් 55,000ක් විතර මුදා ගෙන තිබෙනවා.

දැනට පවුල් 32,000කට අයත් පුද්ගලයින් 126,000කට අධික පිරිසක් මේ ආපදාවට මුහුණ දී තිබෙනවා. මේ මෙහෙයුම සඳහා අපි හමුදා භටයින් 725ක් පමණ යොදවා ගෙන තිබෙනවා. ඒ වාගේම තවත් හමුදා භටයින් 6,300ක් පමණ මේ සඳහා සූදානම්ව සිටිනවා. ඒ අපේ යුද, නාවික හා ගුවන් හමුදාවන්. අපේ හමුදා භටයින් මේ කටයුත්ත දැනටම කාර්යක්ෂමව කර ගෙන යෑම සම්බන්ධයෙන් ඒ අයට අපි ස්තුතිවන්ත විය යුතුයි.

පසුගිය සතියේ පැවැති ජාතික රණ විරු සැමරුම් දිනයේදී රට වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරපු රණ විරුවන්ගේ දෙමවුපියන් එම අවස්ථාවට සහභාගි වූ ආකාරය අපට දකින්නට ලැබුණා. යුද්ධය නිසා එකම පවුලේ දරුවන් තුන්දෙනෙකුගේ ජීවිත අහිමි වුණු මව්වරු, පියවරු හයදෙනෙක් එදින එම රණ විරු ස්මාරකයට ගෞරව දැක්වීමේ අවස්ථාවට සහභාගී වුණා. ඒක බොහොම සංවේදී මොහොතක් වුණා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please continue with your speech.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ජීවිත පරිත්‍යාග කළ තම පුත්‍රයින්ට එම මව්වරු, පියවරු, ගෞරවය දක්වන මොහොතේ දී අපට මතක් වුණා, ජාතිය, කුලය, ආගම, පන්තිය නොසලකා එම රණ විරුවන් තමන්ගේ ජීවිත පරිත්‍යාග කළ ආකාරය. අපට කිසිසේත්ම ඒක අමතක කරන්න බැහැ.

අදත් අපේ හමුදාවන් ඒ බොහොම අවදානම් කාර්ය තුළ නියැළී සිටිනවා.

ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා, මේ ස්වභාවික විපර්යාසයට මුහුණ දෙන සියලුම රටවැසියන් වෙනුවෙන් අපි දැනටමත් මුදල් වෙන් කරලා තිබෙන බව. ඒ වාගේම, මේ කටයුතු කරගෙන යාමට අවශ්‍ය ආයතනවලට අපි දැන් මුදල් බාරදීලා තිබෙනවා. අද මුදල් අමාත්‍යාංශයේ කටයුත්තක් ගැන කථා කරන අවස්ථාවේ දී අපි මුහුණ දෙන වෙනත් කරුණු කීපයක් ගැනත් මම සඳහන් කරන්න අවශ්‍යයි. මීට මාස 6කට කලින් අපි අලුත් බදු පනතක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ගිය අවුරුද්දේ අය වැය කථාව කරනකොට මුදල් ඇමතිතුමා කියා සිටියා, රේගු නොවන බදු -para tariffs- අය කරනු ලබන භාණ්ඩ 7,000ක් විතර රට තුළ තිබෙන බවත්, අපි මේවා ක්‍රම ක්‍රමයෙන් අහෝසි කරන්න බලාපොරොත්තු වෙන බවත්. 2017 නොවැම්බර් මාසයේ අය වැයේදී එතුමා එවැනි රේගු නොවන බදු අය කරනු ලබන භාණ්ඩ 7,000න් භාණ්ඩ 1,200ක එම බදු අහෝසි කළා.

ලබන වසර දෙකේදී ඉතිරි භාණ්ඩ සඳහාත් රේගු නොවන බදු -para tariffs- පුළුවන් තරම් අහෝසි කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. රේගු බදු නොවන ආනයන බදු අහෝසි කරන විට අපිට දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට සිදු වනවා. ඒ වාගේම, ආහාර ද්‍රව්‍ය සහ නිෂ්පාදන අවම මිලට පාරිභෝගිකයාට ලබාදීමත් අපිට මතුවන අභියෝගයක් වෙනවා. හුහක් වෙලාවට දේශීය කර්මාන්තකරුවන් ඉදිරිපත් වෙලා, තමන්ගේ දේශීය කර්මාන්ත ආරක්ෂා කර දෙන්න කියනවා. අපි දේශීය කර්මාන්ත ආරක්ෂා කරන්න ඕනෑ. දේශීය කර්මාන්ත ආරක්ෂා කරනකොට නිෂ්පාදනය වැඩි වෙනවා. ඒ වාගේම ඒ කර්මාන්තවල සේවය කරන සේවකයන්ට වැඩි ආදායමක් ලැබෙනවා. මෙම කටයුත්ත සමබරව පවත්වා ගෙන යාම රජයේ වග කීමක් වෙනවා. මොකද, පාරිභෝගිකයාට අවශ්‍ය වන්නේ ඉහළම මට්ටමේ භාණ්ඩ අඩුම මිලට ගැනීමයි. සමහර අවස්ථාවලදී දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට අපි විශාල වශයෙන් නොයෙකුත් බදු -ආනයන බදු, වෙනත් බදු -para tariffs- පනවනවා. එහෙම වුණාම පාරිභෝගිකයා ගෙවිය යුතු මිල ඉහළ යනවා. අපි මේ කාර්යය සමබරව කරගෙන යන්නේ කොහොමද? අපේ රටේ අඩු ආදායම් ලබන ජන කොටස් ජීවත් වෙනවා. මම උදාහරණයක් කියන්නම්. මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන්ගේ නිවෙස් ගත්තොත්, ඒ හැම නිවසකම බිමට tiles දමලා තිබෙන බවට මට නම් සැකයක් නැහැ. කාමර වෙන්න පුළුවන්; වැසිකිළි වෙන්න පුළුවන් ඒ හැම එකකටම tiles දමා තිබෙනවා.

ඊළඟට, අඩු ආදායම් ලබන සේවකයන් ඉන්නවා නේ. ඒ අය අපට සේවය කරනවා. සමහරවිට ඒ අයගේ නිවෙස්වලටත් මේ වාගේ tiles දමන්න කැමැත්තෙන් -බලාපොරොත්තුවෙන්- ඉන්නවා. අපි ඒ tile එකකට පනවා තිබෙන බදු ප්‍රමාණය සියයට 120ක්, 130ක් විතර වෙනවා. ඊයේ මම නිවසකට ගිය අවස්ථාවේ ඒ අයගෙන් ඇහුවා, "මේ tile එකකට කීයක් වැය වුණාද" කියලා. ඒ අයගේ නිවසට දමා තිබෙන tile එකක් සඳහා රුපියල් 550ක් වැය වුණාය කියා ඒ අය කිව්වා. අපි බදු ඉවත් කළොත් ඒ tile එක රුපියල් 150කට විතර ගන්න පුළුවන්. ඉහළ ආදායම් ලබන පිරිස්වලට තමන්ගේ නිවසට දමන්න ඒ tiles ගන්න පුළුවන්. නමුත් අඩු ආදායම් ලබන පිරිස්වලට ඒ tiles යොදා ගන්න බැහැ. සාමාන්‍යයෙන් සිමෙන්ති තමයි ඒ අයගේ නිවාසවලට දමන්න පුළුවන් වන්නේ. එක අතකින් tiles හදන ඒ දේශීය කර්මාන්තය අපි ආරක්ෂා කරනවා. රට තුළ එවැනි කර්මාන්තශාලා තුනක් විතර තමයි තිබෙන්නේ. ඒ කර්මාන්තශාලාවල වැඩ කරන පිරිස 10,000ක්වත් නැහැ. නමුත් තමන්ගේ නිවෙස්වලට tiles දමන්න අපේක්ෂා කරන පිරිස් ලක්ෂ ගණනක් මේ රටේ ඉන්නවා. අන්න ඒක තමයි රජයකට තිබෙන ප්‍රශ්නය. රජයක යුතුකම වන්නේ, දේශීය කර්මාන්ත ආරක්ෂා කරන අතරේ, පාරිභෝගිකයා ගැනත් සලකලා පාරිභෝගිකයාගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්නත් අවශ්‍ය වාතාවරණය ඇති කරන එකයි. ඒ නිසා හැම තිස්සේම බදු පනවලා දේශීය කර්මාන්ත ආරක්ෂා කරන්න ගියොත්, එයින් පාරිභෝගිකයාට අසාධාරණයක් වන්න පුළුවන් නේද කියලා අපි ප්‍රශ්න කරන්න ඕනෑ.

හුහක් වෙලාවට වැරදි මත රටට ඉදිරිපත් කරනවා. රටට වැරදි මත ඉදිරිපත් කරලා කියනවා, අපි මේ හැම කර්මාන්තයක්ම ආරක්ෂා කරන්න ඕනෑ කියලා. කර්මාන්තයක් ආරක්ෂා කරනකොට අපි අහන්න ඕනෑ අනික් ප්‍රශ්නය තමයි, "ඇත්තටම අපි පාරිභෝගිකයාත් ආරක්ෂා කරනවාද?" කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටවල් 40ක ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳව පර්යේෂණයක් - research study එකක් - මෑතකදී කර තිබෙනවා. ඒකෙන් පෙනී ගියා, එම රටවල් හතළිහේ ජාත්‍යන්තර ගනුදෙනුව නැති කළොත්, ඒ රටවල අඩු ම ආදායම් ලබන සියයට 10කගේ මූල්‍ය හැකියාව - මම ඒ ගැන තව විධියකට කිව්වොත්, the bottom tenth of consumers would lose 63 per cent of their purchasing power while the richest tenth of consumers would only lose 28 per cent of their purchasing power; ඒ කියන්නේ අඩු ආදායම් ලබන සියයට 10කගේ මූල්‍ය හැකියාව; භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව - සියයට 63කින් අඩු වන බව. නමුත්, ඉහළ ආදායම් තිබෙන සියයට 10ක ප්‍රමාණයේ භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව සියයට 28කින් පමණයි නැති වෙන්නේ. එම නිසා මේ මතය වැරැදියි. ජාත්‍යන්තර ගනුදෙනු අවශ්‍යයි. අවුරුදු දහස් ගණනකට එපිට සිට අපේ රටේ ජාත්‍යන්තර ගනුදෙනු සිදු වී තිබෙනවා. ලංකා ඉතිහාසයේ ඒ ගැන සඳහන් වී තිබෙනවා. අපේ පැරණි සෙල් ලිපිවල ඒ ගැන සඳහන් වෙලා තිබෙනවා. නමුත්, බොහෝ වෙලාවට වැරදි මත රට තුළ ඇති කරනවා.

රජයක් හැටියට අපට සමබරතාවක් අවශ්‍යයි. පාරිභෝගිකයා ආරක්ෂා කරන්න ඕනෑ. ඒ වාගේම නිෂ්පාදිතයාත් ආරක්ෂා කරන්න ඕනෑ. ඒ නිසා රජයකට තීරණ ගන්න වෙනවා, කොයි දේශීය නිෂ්පාදනද අපි ආරක්ෂා කළ යුත්තේ කියන එක ගැන. අපි දන්නවා පසුගිය අය වැයේ දී භාණ්ඩ 1,200ක රේගු බදු නොවන බදු අහෝසි කළ බව. විශේෂයෙන්ම වරාය සහ ගුවන්තොටුපොළ බද්ද අහෝසි කළා. පසුගිය අය වැයේදී අපනයනයට තියෙන සෙස් බද්ද භාණ්ඩ 253කට අහෝසි කළා. අපි දන්නවා මුදල් ඇමතිතුමා අය වැය කථාව කරනකොට සඳහන් කළා, අපි ක්‍රමක්‍රමයෙන් සෘජු බදු වැඩි කරලා වක්‍ර බදු ප්‍රමාණය අඩු කරන්නට ඕනෑ කියන කාරණය. මුදල් ඇමතිතුමා වසරකට උඩදී මේ වගකීම භාරගන්නකොට මේ රටේ මුළු බදුවලින් සෘජු බදු ප්‍රමාණය සියයට 18යි; වක්‍ර බදු ප්‍රමාණය සියයට 82යි. එතකොට ඒකෙන් අසාධාරණයක් වෙන්නේ විශේෂයෙන්ම අඩු ආදායම් ලබන අයටයි. එතකොට එතුමා සඳහන් කළා, අපි සෘජු බදු ප්‍රමාණය සියයට 40ක් කරලා වක්‍ර බදු ප්‍රමාණය සියයට 60කට අඩු කරන්න ඕනෑ කියලා. ඒ නිසා අපි දැන් අනුගමනය කරන ක්‍රියාවලිය එයයි. විශේෂයෙන්ම අලුත් දේශීය ආදායම් පනත හරහා කරන්නේ ඒ දේ. ඕනෑ දෙයක් වෙනස් කරනකොට පොඩි සද්දයක් තිබෙනවා. මේක අසාධාරණයි කියලා සමහර අය කියනවා. නමුත්, මේ සද්දේ

එන්නේ විශේෂයෙන්ම විශාල ව්‍යාපාරිකයන්ගෙන් සහ විශාල ආදායම් ලබන අයගෙනුයි. අපි ඒකට කන් දීලා අපට යමක් කරන්න පුළුවන් නම් කරන්නත් බලාපොරොත්තු වෙනවා. නමුත්, අපි අපේ අරමුණෙන් ඉවත් වෙන්නේ නැහැ. අපි සමාජ සාධාරණය ඇති කරගන්නට සෘජු බදු ප්‍රමාණය වැඩි කරනවා; වක්‍ර බදු ප්‍රමාණය අඩු කරනවා. මම අර කියපු tile එකේ කථාව අනික් දේවල්වලටත් බලපානවා.

විශේෂයෙන්ම අපි දන්නවා, ඉදි කිරීම් ක්ෂේත්‍රයේ ඉදි කිරීම් කරනකොට මිල නැත්නම් වියදම ගැන. ඉදිකිරීම් කරනකොට ලංකාවේ කොළඹ නගරය ඉන්දියාවේ අගනුවර වන නවදිල්ලි නගරය එක්ක සැසඳුවොත් නවදිල්ලි නගරයේ ඒ cost එක හුඟක් අඩුයි. නමුත් ලංකාවේ ඒක හුඟක් වැඩියි. ඒකට tile එකේ කථාව වාගේ හේතු තියෙනවා. සිමෙන්ති අරගෙන බැලුවොත්, අපි සිමෙන්තිවලට යොදා තිබෙන බදු ප්‍රමාණය සියයට 104ත්, 148ත් අතරේ තිබෙනවා. සෑම බද්දක්ම එකතු කළාම, -ඒ කියන්නේ ආනයන බදු, රේගු නොවන බදු ආදී මේ සියල්ල එකතු කළාම- සියයට 100යි, සියයට 148යි අතරේ තිබෙන්නේ. අපි ඒකත් අඩු කරන්නට ඕනෑ. මොකද, මේ රටේ හුණාක් අයට තවම තමුන්ගේම නිවසක් නැහැ. ලක්ෂ 20කට ඉඩම්වල සින්නක්කර අයිතිය ලබා දෙන්නට අපේ රජය තීරණය කරලා තිබෙනවා. මේ වන විට ලක්ෂ 7කට ඔප්පු ලැහැස්ති කරමින් සිටිනවා. අපි ඒවා ළඟදීම ලබා දෙන්නට බලාපොරොත්තු වෙනවා. ඉඩමක අයිතිය දුන්නත් ඒ අය නිවසක් හදා ගන්නට ඕනෑ. ඒ නිවාස සෑදීම සඳහා සිමෙන්තිවල බදු පහළට ගෙනෙන්නට සිදු වෙනවා. තව විධියකට කිව්වොත්, සිමෙන්ති මිල පිට මිලට වැඩිය සියයට 100කින්, සියයට 150කින් වැඩියි.

වානේ, steel billetsවල සහ ඉදි කිරීම් ක්ෂේත්‍රය සඳහා පාවිච්චි කරන වානේවල බදු ප්‍රමාණය සියයට 91ත් සියයට 103ත් අතරේ පවතින්නේ. ඒ තුළිනුත් අපි දේශීය කර්මාන්ත ආරක්ෂා කරනවා. එහෙම නම් අපි සැලකිල්ලට ගත යුතු කාරණය මෙකයි. දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයාගේ, එහෙම නැත්නම් අඩු ආදායම්ලාභියාගේ නිවස ගොඩ නැඟීමේ අපේක්ෂාව අතර සමබරතාවක් තිබිය යුතුයි කියන කාරණය අපි තේරුම් ගන්නට අවශ්‍යයි. අපේ රජය ඉදිරියේදී ඒ ගැන තවත් පියවර ගන්නට බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහ බැංකු දත්ත දිහා බැලුවාම පෙනෙනවා, විශේෂයෙන්ම පසුගිය මාස තුන හතර තුළදී උද්ධමනය පහළට ඇවිල්ලා තිබෙන බව. අපේ රජය තවදුරටත් ආනයනය සිදු කරන නිසා දේශීය කර්මාන්ත සහ දේශීය වෙළෙඳ පොළ ආරක්ෂා කිරීමට අපි යම් යම් පියවර අරගෙන තිබෙනවා. එම නිසා තමයි අපි 2018 මාර්තු මාසයේ ආරක්ෂණ පියවර පනත - Safeguard Measures Act එක- ගෙනාවේ. ආරක්ෂණ පියවර පනත යටතේ ආනයනය කරනවා නම්, ලංකාවට එන ඕනෑම ආනයනයක් ගැන සොයා බලන්න වාගේම ඒ ආරක්ෂණ පියවර ගන්නට මේ පනත යටතේ ඇති විධිවිධාන තුළ ක්‍රියා කරන්නට පුළුවන්. එයට අමතරව අපි 2018 මාර්තු මාසයේ තවත් පනතක් මේ සභාවට ඉදිරිපත් කළා. ඒ තමයි ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත; Anti-Dumping and Countervailing Duties Act එක.

අපි ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත ගෙනාවේ අපේ දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කර ගන්නයි. ජනතාව විශාල සංඛ්‍යාවක් සිටින රටවලට, විශාල වෙළෙඳ පොළවල් තිබෙන රටවලට බොහොම අඩු මිලට භාණ්ඩ නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ අය අඩු මිලට භාණ්ඩ නිෂ්පාදනය කරලා අපි වාගේ කුඩා රටවලට, කුඩා වෙළෙඳ පොළවල් තිබෙන රටවලට ඒ අයගේ රටවල විකුණන මිලට වඩා අඩු මිලට ඒ භාණ්ඩ දමනවා. ඒකට ප්‍රපාතනය -dumping- කියලා කියනවා. ඒ අය එහෙම දාලා අපේ වෙළෙඳ පොළ විනාශ කරනවා; අපේ දේශීය නිෂ්පාදකයා විනාශ කරනවා. ඒකට අපි ඉඩ දෙන්නේ නැහැ. අපි අපේ පාරිභෝගිකයාව ආරක්ෂා කරනවා. නමුත්, අපි ඒ අයගේ රටවල විකුණන මිලට වැඩිය අඩුවෙන් අපේ රටේ ඒ භාණ්ඩ විකුණන්න ඉඩ දෙන්නේ නැහැ. ඒක කරන්නේ, චීනය වෙන්න පුළුවන්; ඉන්දියාව වෙන්න පුළුවන්; ඉන්දුනීසියාව වෙන්න පුළුවන්. මේවා විශාල රටවල්. විශාල ජනගහනයක් ඉන්න, විශාල වෙළෙඳ පොළක් තිබෙන රටවල්. නමුත් ඒ රටවල විකුණන මිලට වැඩිය අඩුවෙන් භාණ්ඩ විකුණලා අපේ වෙළෙඳ පොළ ආක්‍රමණය කරන්න හැදුවොත්, අපේ දේශීය ව්‍යාපාරිකයා නැති කරන්න හැදුවොත්, අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ. අපි ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට මේ අවුරුද්දේ මාර්තු මාසයේ ඉදිරිපත් කළේ ඒක ආරක්ෂා කරන්නයි. අපි දේශීය නිෂ්පාදකයා ඒ වාගේ තරගකාරිත්වයෙන් ආරක්ෂා කරනවා කියන එක නැවතත් කිව යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණය කියලා මගේ කථාව අවසන් කරනවා. අපි ණය ක්‍රමයකුත් යෝජනා කරලා තිබෙනවා. දැනටම මේ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙනවා. මම මේ සභාවට දන්වන්නට කැමැතියි, දැන් වෙනකොට බිලියන 13ක විතර ණය දීලා තිබෙනවාය කියන කාරණය. අඩු පොලියට දීලා තිබෙනවා. මුදල් ඇමතිතුමා අය වැය කථාවේදී "ව්‍යවසාය ශ්‍රී ලංකාව" - "Enterprise Sri Lanka"- කියන ඒ යෝජනා ක්‍රමය ගැන සඳහන් කළා. මේ යෝජනා ක්‍රමය තුළ දැනට බිලියන 14ක් පමණ දීලා තිබෙනවා. මේ මාසවල අපි තවත් බිලියන 20ක ණය දෙන්න බලාපොරොත්තු වෙනවා. මේ ණය දෙන්නේ, විශේෂයෙන්ම කෘෂිකර්මයට, ධීවර ජනතාවට. තරුණයන්ට වාගේම කාන්තා ව්‍යවසායකයන්ට මේ ණය ලබා දෙනවා. මෙවැනි ණය ක්‍රම 100ක් විතර තිබෙනවා. ඒ ණය ක්‍රම 100ම ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම කාන්තා ව්‍යවසායකයන්ට අපි දෙන ඒ අඩු පොලී ණය තවත් අඩු කරලා තිබෙනවා. ඒ, මේ රටේ කාන්තා ව්‍යවසායකයන් දිරිමත් කරන්නටයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට දුන්නු අවස්ථාව පිළිබඳව ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු විමල් වීරවංශ මහතා.

[පූ.භා.11.16]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයට අදාළ මේ ගැසට් නිවේදන පදනම් කරගත් මේ වැදගත් විවාදයට මගේ කරුණු කීපයකුත් එකතු කරන්න ලැබීම ඉතා වැදගත් කොට සලකනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කියමනක් තිබෙනවා, "පිත්තල කොච්චර මැද්දත් එහි ගඳ යවන්න බැහැ" කියා. ඒ වාගේ තමයි මේ ආණ්ඩුවත්. දැන්වීම් කප්පරක් දාලා ආණ්ඩුවට ශුභවාදී අර්ථයෙන් විවිධ දේ ප්‍රචාරය කරන්න හැදුවත් ආණ්ඩුවේ දුගඳ හමන එක වළක්වන්න පුළුවන් වෙලා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව මේ ගෙන යන ආර්ථික මූලෝපායයන් කුමන ගමනක්, කුමන අරමුණක් ඉලක්ක කොට ගත්තත්, මේ රටේ ස්වදේශික ජනයාගේ අභිලාෂ, අභිමතාර්ථ, බලාපොරොත්තු, අපේක්ෂා මල් පල ගැන්වීමද ආණ්ඩුවේ මූලික අරමුණ වෙලා තිබෙන්නේ; එහෙම

[ගරු විමල් වීරවංශ මහතා]

නැත්නම්, තමන් බලයට පත් කරන්න පිටත සිට සහය දීපු, තිරයෙන් පිටුපස සිට සහය දීපු, ඒ ක්‍රියාන්විතය මෙහෙයවූ විදේශීය ස්වාමිවරුන්ට ඔවුන් ඉල්ලා සිටින දේවල් කිරීමටද තමුන්නාන්සේලා මේ බලය පිහිටුවා තිබෙන්නේ? පසුගිය අවුරුදු තුනක කාලයේ මේ ආණ්ඩුව අනුගමනය කර තිබෙන ආර්ථික ක්‍රියා මාර්ග දිහා බැලුවාම අපට ඉතා පැහැදිලිව සනාථ කොට පෙන්වන්න පුළුවන්, නව ලිබරල්වාදී - neoliberal - මූල්‍ය අත් පත් කර ගැනීම් සඳහා විදේශීය ව්‍යවසායකයාට හෝ කළු සල්ලිකාරයාට හෝ මේ රට විවෘත කර දීම, ඒ අයට මේ රට විවෘත කර දීමේදී ඔවුන්ට තිබෙන බාධා ඉවත් කොට දීම සිදු කර තිබෙන බව. එය තමයි තමුන්නාන්සේලා මේ ගෙවුණු අවුරුදු තුනේ මූලික වශයෙන් ඉටු කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා, මීට කලින් මේ පාර්ලිමේන්තුවට ගෙනා අය වැයකින් - තමුන්නාන්සේලාගේම ආණ්ඩුවේ අය වැයකින්- මේ ගෝලීය නව ලිබරල් ආර්ථිකයට ව්‍යාප්ත වෙන්න ඕනෑ කරන පියවර රාශියක් ගත් බව. ඉන් එක් දෙයක් තමයි, මීට කලින් තිබුණු විනිමය පාලන පනත අහෝසි කර නව විනිමය පාලන පනතක් තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවේ අනුමත කිරීම. ඒ නව විනිමය පාලන පනත අනුව මේ රටට ඩොලර් ගෙන ඒම, රට ඇතුළෙන් ඩොලර් -විදේශ මුදල්- එළියට ගෙන යෑම පාලනය කිරීමේ බලයක්, එය අධීක්ෂණය කිරීමේ බලයක් මහ බැංකුවට තිබුණා. ඒ සියලු බලය අහිමි කරලා, මේ රට ඇතුළට නිදහසේ කළු සල්ලි ගෙන එන්න පුළුවන් වන ආකාරයට, ඒ කළු සල්ලිවලින් මේ රටේ දේපළ මිලදී ගන්න පුළුවන් වන ආකාරයට තමුන්නාන්සේලා විනිමය පාලන පනත වෙනස් කළා. විනිමය පාලන පනත වෙනස් කිරීමේ ප්‍රධාන අරමුණ තමයි මේ රට කළු සල්ලි නිප්පොළක් බවට පත් කිරීම. දැනටමත් ජාත්‍යන්තර මාධ්‍යය අනාවරණ කරලා ඉවරයි, ලංකාව ලෝකයේ කළු සල්ලි සුදු කරන ප්‍රධාන රටවල් පහ-හයෙන් එකක් කියලා. පසුගිය අවුරුදු තුන ඇතුළේ තමුන්නාන්සේලා මේ රටට ඒ විරුද්ධවලිය අරගෙන දුන්නා. විනිමය පාලන පනත වෙනස් කළාම ඒක කිව්වේ, තමුන්නාන්සේලාගේ විදේශීය ස්වාමිවරු. ඒ එක්කම ඒ අය වැයෙන් තව දෙයක් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදේශිකයෙකු මේ රටේ apartment building එකක තිබෙන නිවසක් සින්නක්කරව මිලදී ගන්නකොට අපේ ආණ්ඩුව කාලයේ සියයට 100ක බද්දක් අය කළා. නිවසේ වටිනාකම රුපියල් මිලියන 200 නම්, විදේශිකයාට ඒ දේපළ මිලදී ගන්න රුපියල් මිලියන 400ක මිලක් ගෙවන්න වුණා. ඒ මඟින් ඒ දේපළ මිලදී ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඒ විදේශිකයා අධෛර්යයට පත් කරන්න බැලුවා; සහ ඒ ක්‍රියාවලියෙන් රජයට විශාල මුදලක් උපයා ගන්න බැලුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ හංසයාට කතිරය ගහපු කවුද ඉල්ලුවේ, අලියාට කතිරය ගහපු කවුද ඉල්ලුවේ, විදේශිකයින් ලංකාවේ දේපළ මිලදී ගන්නකොට පනවා තිබුණු සියයට 100ක බද්ද ඉවත් කරන්න කියලා? ඇයි, ඒ බද්ද ඉවත් කළේ? විනිමය පාලන පනත සංශෝධනය කළා. කළු සල්ලිකාරයාට බෑග් එකත් අරගෙන ලංකාවට එන්න තිබුණු බාධාව ඉවත් කළා. දැන් විදේශ මුදල් නිදහසේ ගෙනෙන්න පුළුවන්; ගෙනියන්න පුළුවන්. අන්න! කළු සල්ලිකාරයාට වාතාවරණය හැදුවා. විදේශ මුදල් අරගෙන එන ඒ කළු සල්ලිකාරයා මුලින්ම කරන්නේ, කළු සල්ලි සුදු කරන්න මේ රටේ දේපළක් මිලදී ගන්න එක. ඒක තමයි කළු සල්ලි සුදු කරන අයගේ ක්‍රමය. දේපළක් මිලදී ගන්නකොට, ගෙයක් මිලදී ගන්නකොට සියයට 100ක බද්දක් ගෙවන්න වුණා. ඒ සියයට 100ක බද්ද ඉවත් කළා. අන්න, කළු සල්ලිකාරයාට මේ රට ඇතුළට එන්න තවත් ඉඩ හදලා දුන්නා; තවත් දිරි ගැන්වුවා. එතකොට මේක neoliberal න්‍යාය පත්‍රය නොවෙයිද? ලංකාව කළු සල්ලිකාරයින්ගේ නිප්පොළක් බවට පත් කරන එකද, තමුන්නාන්සේලාගේ පරමාර්ථය? මේ විධියට කළු සල්ලි සුදු කරන්න එනකොට කළු සල්ලි විතරක් නොවෙයි එන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊඒපී ආයතනය සතුව තිබුණු සියලු සමාගම් තමුන්නාන්සේලා දෙන්න තීන්දු කළේ කාටද? ඒ, ලයිකාමොබයිල් සමාගමට. ලයිකාමොබයිල්කාරයා කියන්නේ කවුද? මුළු ලෝකයේම කුප්‍රකටයි, ඒ එල්ටීටීඊ සල්ලි කියලා. චන්ද්‍රිකා කුමාරතුංග නෝනයි, මනෝ තිත්තවැල්ල මහත්මයයි තමයි ඒ ගනුදෙනුව පිටුපස ඉන්නේ. ලයිකාමොබයිල්කාරයාට දුන්නේ, දේශීය ව්‍යාපාරිකයෙක් ඒ වෙනුවෙන් ඊට වඩා වැඩි ලංසුවක් තියලා තිබෙද්දියි. නීතිත් වෙනස් කරලා, විශේෂ කැබිනට් මණ්ඩල තීන්දුවක් අරගෙන තමයි ලයිකාමොබයිල්කාරයාට දුන්නේ. එතකොට ලයිකාමොබයිල්කාරයා අතේ තිබෙන්නේ සුදු සල්ලිද? කොටින්ගේ සල්ලි නොවෙයිද, එතැන ගොඩ ගැහිලා තිබෙන්නේ?

දැන් මේ රටේ දේපළ මිලදී ගන්න තිබුණු බාධා ඉවත් කරනවා. ඒ විතරක් නෙවෙයි, කළු සල්ලි සමඟ ලෝක පාතාලයත් මේක අස්සට රිංගනවා; මත්ද්‍රව්‍ය ජාවාරමත් මේක අස්සට රිංගනවා. කළු සල්ලි එක්ක මේ සියල්ල එනවා.

ඒ උදාහරණය විතරක් නොවෙයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. තමුන්නාන්සේලා දන්නවා, නව ලිබරල්වාදී ආර්ථිකයේ ව්‍යාප්තියට ඕනෑ කරන එක සාධකයක් හොරකම බව. හොරකම ආයතනගත කිරීම, හොරකම නීතිගත කිරීම තමයි එහි එන්ජින් ඔයිල් එක. බැඳුම්කර හොරකම කළා. නැටිටේ හිටං ගොම; අතේ මාට්ටු; දෙන්නෙක් හිරේ. අර්ජුන මහේන්ද්‍රන් සැපට සිංගප්පූරුවේ. අගමැතිතුමා පෙනෙන්නත් නැහැ. බැඳුම්කරෙන් ගැහුවා; හැබැයි, වැඩේ අහු වුණා. දැන් මොකක්ද කළේ? තමුන්නාන්සේලා පනතක් ගෙනාවා, "සක්‍රීය බැරකම් කළමනාකරණ පනත" කියලා. ඒ පනතෙන් බලය ගත්තා, අගමැතිතුමාට ලංකාවේ මෙතෙක් අරගෙන තිබෙන මුළු ණය ප්‍රමාණයෙන් සියයට දහයක ප්‍රමාණයක් කැමැති හෙට්ටියෙකුගෙන්, කැමැති පොලියට, කැමැති "ඩීල්" එකක් දමලා ගන්න. එහෙම තමයි ඒ පනත හැදුවේ. ඒකෙන් අර බැඳුම්කර හොරකම ආයතනගත කළා. ලංකාවේ මුළු ණය බර බිලියන 10 නම්, ඒකෙන් සියයට 10ක ප්‍රමාණයක් කැමැති තැනකින් ගන්න නීත්‍යානුකූල බලය අගමැතිතුමාට දුන්නා. අන්න බලන්න! හොරකම ආයතනගත කළා. එතකොට හිරේ යන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා බලන්න, වැට බදු වංචා කළොත් හිරේ යන්න වෙනවා. වැට බදු වංචා කරලා හිරේ ගිය දෙතුන් දෙනෙකුත් ඉන්නවා. දැන් මොකක්ද තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කරන්නේ? ප්‍රතිපත්තිමය තීරණ අරගෙන බදු සහන දෙනවා. පාන් පිටි සමාගමට බදු සහන දුන්නා. කෝ, පාන් ගෙඩියේ මිල අඩු වුණාද; බනිස් ගෙඩියේ මිල අඩු වුණාද; පාන් පිටි ආහාරවල මිල අඩු වුණාද; බේකරි කෑමවල මිල අඩු වුණාද? නැහැ. එතකොට සහනාධාරයට මොකද වුණේ? මේ සහනාධාරය නිසා පාන් පිටි සමාගම්වලින් අවුරුද්දකට ආණ්ඩුවට ලැබිය යුතු රුපියල් මිලියන 34,000ක ආදායම ලැබෙන්නේ නැහැ . හැම අවුරුද්දකට රුපියල් මිලියන 34,000ක්! රුපියල් මිලියන 34,000ක් කියන්නේ බැඳුම්කර හොරකමෙන් ක්ෂණිකව වෙච්ච බලපෑමේ ප්‍රමාණයට සමානයි. ඊට වඩා බැඳුම්කර හොරකමේ බලපෑම ලොකුයි. ඒ බලපෑම දිගේ ගැස්සිලා යනවා. නමුත්, ක්ෂණිකව වෙච්ච හොරකමේ බලපෑමේ ප්‍රමාණයට මෙය සමානයි. පාන් පිටි සමාගම්වලට අවුරුද්දකට රුපියල් මිලියන 34,000ක් බදු සහන දෙනවා. ඒ බදු සහනයෙන් කොමිස් එක ගන්නවා, සහනය දෙන කෙනා. එතකොට එයාගේ අසහනය දුරු

වෙනවා. එහෙම වුණාම දේශීය කිරි ගොවියාට වෙන දේ බැලුවාද; දේශීය කිරි නිෂ්පාදකයාට වෙන දේ බැලුවාද? නැහැ. තමුන්නාන්සේලා කිරි පිටි සමාගම්වලට අවුරුද්දකට රුපියල් මිලියන 18,000ක බදු සහනයන් දුන්නා. ඒත් කිරි පිටි මිල බැස්සාද? යෝගට් එකේ මිල බැස්සාද? නැහැ. අවුරුද්දට රුපියල් මිලියන 18,000ක බදු සහනයක් දෙන්නේ, එයින් භාගයකවත් කොමිස් එකක් අවුරුද්දකට අදාළ ඇමතිගේ අතට ගන්න. මොකක්ද මේ බදු සහනවලින් රටේ පාරිභෝගිකයාට ලැබුණු ප්‍රතිඵලය? ඒ බදු සහනවලින් මේ රටේ ආර්ථිකයට ලැබුණු තල්ලුව මොකක්ද? අන්න බලන්න! වැටි බදු හොරකම් කළොත් හිරේ යන්න වෙනවා. ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන බදු සහන දීලා ගණන කපා ගන්නවා. අන්න! හොරකම ආයතනගත කර ගන්න හැටි.

ඒ විතරක් නොවෙයි. බලන්න, තමුන්නාන්සේලා සිංගප්පූරුවත් එක්ක නිදහස් වෙළෙඳ ගිවිසුමක් අත්සන් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත කාලයේ සිටම ලංකාවෙන් සිංගප්පූරුවට යවන නිෂ්පාදනවලට අපට සියයට සියයක බදු සහනයක් තිබෙනවා. එම නිසා ලංකාව පැත්තෙන් අමුතුවෙන් සිංගප්පූරුවත් එක්ක වෙළෙඳ ගිවිසුමකට යන්න හේතුවක් නැහැ. දැන් මොකක්ද කළේ? තමුන්නාන්සේලා පසුගිය මැතිවරණය කාලයේ කැබිනට් එකෙන් නියමිත අනුමැතියක් නොගෙන, අනුමැතියක් ගත් බවට ව්‍යාජ ලිපි ලේඛන හදා අමාත්‍ය මණ්ඩලයටත්, ජනාධිපතිවරයාටත් කොළේ වහලා, මලික් සමරවික්‍රම අමාත්‍යවරයා සහ එතුමාගේ ලේකම් සිංගප්පුරුවත් එක්ක මේ ගිවිසුම දඩ-බඩ ගාලා අත්සන් කළා. මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. මේක අත්සන් කළේ මොකද්? අන්න, හොරකම ගිවිසුම් හරහා දියත් කරන ක්‍රමය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සිංගප්පූරු ආණ්ඩුව දැන් කියා තිබෙනවා, දැනට සිංගප්පූරුවෙන් ලංකාවට එවන නිෂ්පාදන ප්‍රමාණය අනුව සිංගප්පූරුවට ඩොලර් මිලියන 10ක පමණ වාසියක් මේ ගිවිසුමෙන් ක්ෂණිකව සිද්ධ වෙනවාය කියා. හැබැයි, මේ බදු සහනය දුන්නාම සිංගප්පූරුව මේ රටට නිෂ්පාදන එවන්නේ ඔය ඩොලර් මිලියන 10 ප්‍රමාණයෙන් නොවෙයි. අරුම පුදුම වැඩේ කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගිවිසුම හරහා manpower සමාගම්වලට එන්න පුළුවන්; කම්කරුවන්ට එන්න පුළුවන්; ගෘහ සේවිකාවන් ගේන්න පුළුවන්. සිංගප්පූරුවේ ලියා පදිංචි වෙනවා manpower සමාගම. ඉන්දියානු ගෘහසේවිකාවෝ එනවා. ඉන්දියානු කම්කරුවෝ එනවා. මාගා ආයතනට, තවත් ආයතනවලට ඉදිකිරීම් ක්ෂේත්‍රයට කම්කරුවෝ දාහක් ඕනෑ වුණොත් manpower සමාගමට කොන්ත්‍රාත්තුව දෙනවා. එතකොට සේවකයෝ ගේනවා. ඒ අයට working visa දෙනවා. මේ අය ආපු ගමන් මේ රටේ ශ්‍රමයේ මිල පහළට වැටෙනවා. දැනට මේසන් වැඩ කරන මහත්මයෙකුට දවසකට රුපියල් 1500ක් ලැබෙනවා නම්, මේ මිල රුපියල් හත්සිය පණහට පහළ වැටෙනවා. රුපියල් 1500 අරගෙන ජීවත් වෙන්න පුරුදු වුණු මනුෂ්‍යයාට රුපියල් හත්සිය පණහට හැඩ ගැසෙන්න සිද්ධ වෙනවා. ශ්‍රම වෙළෙඳ පොළේ ශ්‍රමයේ මිල පහළට වැටෙනවා. නව ලිබරල්වාදී මූලෝපාය හරියට කරන්නට නම් ඒක තමුන්නාන්සේලා කරන්නට ඕනෑ. මේ සිංගප්පූරු ගිවිසුමෙන් සිංගප්පූරුවේ වවන්නේ නැති දේවලුත් ඒ ලැයිස්තුවට දාලා තිබෙනවා. ඒ තමයි වී. වී වවනවායැ සිංගප්පූරුව? සිංගප්පූරුවේ මොන කුඹුරේද දන්නේ නැහැ වී වවන්නේ. සිංගප්පූරුවේ මොන කුඹුරේද වී වවන්නේ? තායිලන්තයේ එක කාලයකට වී අතිරික්තයක් තිබෙනවා. ඒ කාලයට තායිලන්තයේ හාල්වල මිල ඉතා අඩුයි. අන්න, එතකොට සිංගප්පූරුව හරහා සිංගප්පූරු ලේබල් එක ගහගෙන ලංකාවේ වෙළෙඳ පොළට හාල් එනවා. මේ විධියට ලංකාව විදේශිකයන්ගේ නිප්පොළක් බවට පත් කළාම ඊට පස්සේ ඇතිවන අර්බුදවලට උත්තර සොයන්නේ කවුද?

තමුන්නාන්සේලා මේ කාරණය ගැන කල්පනා කරලා බලන්න. ඉතා විශාල සාමාජීය, මානසික, සංස්කෘතික අර්බුදවලට මේවා පිටුවහල් වෙන්නේ නැද්ද? විදේශික ශ්‍රමිකයන්ට දොර ඇරලා දෙන්න තරම් අපේ රට ශ්‍රමිකයන් හීන වෙච්ච රටක්ද? එහෙම අර්බුදයක්ද අද අපිට තිබෙන්නේ? සිංගප්පූරුවේ නිපදවූවා කියලා ඕනෑම කුණු ගොඩක් දැන් මේ රටට බදු සහන ඇතිව අරගෙන එන්න පුළුවන්කම හැදිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ඉන්දියාවත් එක්ක ETCA ගිවිසුම අත්සන් කරන්න දැන් ඕනෑ වෙන්නේ නැහැ. දැන් මේ දොර ඇරලා තිබෙන නිසා වෘත්තිකයන්ට අපේ රටට එන්න පුළුවන්. ඉන්දියානු, මැලේසියානු, චීන ආදී ඕනෑම වෘත්තිකයෙකුට -ශ්‍රමිකයෙකුට- දැන් මේ රට අස්සට රිංගා ගන්න පුළුවන්. එමඟින් අපේ වෘත්තිකයන්ට තිබෙන අවස්ථාව නැති කරන්න පුළුවන්; අපේ ශ්‍රමිකයන්ට තිබෙන අවස්ථාව නැති කරන්න පුළුවන්. ශ්‍රමයේ වටිනාකම සහ මිල එකට එකක් බස්සන්න පුළුවන්. තමුන්නාන්සේලා මේ යන්නේ ඒ අතට මේ ගිවිසුම් ගහගෙනයි.

අපේ අභිංසක අම්මලා මැද පෙරදිග රස්සාවලට ගිහිල්ලා, කඹුරලා, වද විඳලා ඩොලර් ටික -විදේශ විනිමය- හොයලා මෙහාට එවනවා. ඒ ටික කොල්ල කාගෙන යන්න තමුන්නාන්සේලා සිංගප්පූරු ගිවිසුමෙන් විදේශිකයන්ට දොර ඇරලා දෙනවා. ඒ රටවලට කඹුරලා, ගෘහ සේවයේ වද විඳලා සල්ලි -ඩොලර්- ටික අපේ රටට ගෙනෙනවා. අනික් පැත්තෙන් ඒ සල්ලි ටික එළියට යනවා; මේ ගිවිසුම හරහා එන ශ්‍රමිකයන් ඒ සල්ලි ටික අරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පොළොව ගැන සහ මේ රට ගැන කිසිම තෙතමනයක්, හැඟීමක් මේ ආණ්ඩුව නියෝජනය කරන තමුන්නාන්සේලා තුළින් නියෝජනය වෙන්නේ නැහැ කියන කාරණය තමුන්නාන්සේලා පෙන්වලා ඉවරයි. විදේශීය බලවතුන්ගෙන් එන උපාය මාර්ගය පමණයි දැන් තිබෙන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවේදී කිව්වා, ලක්ෂ 20කටද කොහේද සින්නක්කර ඉඩම් ඔප්පු ලබා දෙනවාය කියලා. ලක්ෂ 7කටද, ලක්ෂ 9කටද දැන් ඉඩම් ඔප්පු ලැහැස්තියි කියලාත් එතුමා කිව්වා. බැලූ බැල්මට මේක හරි හොඳයි. ඕනෑම කෙනෙකුට පෙනෙනවා, මේකේ මානුෂීය කථාවක් තිබෙන බව. රජයේ බලපත්‍ර ඉඩම්වල කාලයක් තිස්සේ ජනයා ජීවත් වුණා. ඒ අයට ඔප්පුව ලැබුණාම හොඳයි කියලා හිතනවා. මොකක්ද, මේකේ පරමාර්ථය? මතු පිටින් පෙනෙන සුන්දර පින්තූරය නොවෙයි ඕක ඇතුලේ තිබෙන්නේ. එක පැත්තකින් තමුන්නාන්සේලා විදේශිකයන්ට සින්නක්කරව ඉඩම් මිලදී ගැනීමට පුළුවන් වන විධියට නීතිය වෙනස් කළා. පසුගිය අය වැය දෙකකදී ඒ කාරණය ගැන කිව්වා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔබතුමා ඒකට විරුද්ධද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉන්න, ඉන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැනේ. ඔබතුමා කථා කරන කොට මා අමාරුවෙන් අහගෙන හිටියා. විදේශිකයන්ට සින්නක්කරව ඉඩම් මිලදී ගන්න පුළුවන් වන විධියට නීතිය හදනවා. මේ විධියටවත් මේ රට පවතින්න බලපා තිබෙන එක හේතුවක් තමයි, අධිනාගරීකරණයක් සහ ජනගහන ඝනත්වයක් මේ රටේ නැතිකම. අපේ රටේ ග්‍රාමීය ප්‍රදේශ තවමත් සියයට 70කට වඩා තිබෙනවා. ඒවායේ යටිතල පහසුකම්

[ගරු විමල් වීරවංශ මහතා]

තිබෙනවා. ඒ නිසා ග්‍රාමීය කෘෂි කර්මාන්තය රැකිලා තිබෙනවා. සමහර වෙලාවට ජනතාව ගමින් නගරයට සංක්‍රමණය වීම මේ මට්ටමට හෝ සීමා වෙලා තිබෙන්නේ ග්‍රාමීය නිෂ්පාදන ආර්ථිකයයි, යටිතල පහසුකම් ටිකයි ගමේ ආරක්ෂා වී තිබෙන නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් ගොවියා බලපත්‍ර ඉඩමේ ඉන්නේ. තමුන්නාන්සේලා ඡන්ද කාලයේදී වීවලට ලබා දෙනවාය කිව්ව මිල මේ දවස්වල ලබා දෙනවාද? නැහැ. රුපියල් තිහයිද කොහේද වී කිලෝවකට වැඩිම වුණොත් හම්බ වෙන්නේ. එතකොට ගොවියා අර්බුදයට පත් වෙනවා. ණය වෙලා කුඹුරු කරන්න වෙනවා. ණය ගෙවා ගන්න බැරි වනවා. ගොවියා ඉන්නේ බලපත්‍ර ඉඩමේ නිසා ඒක උකස් තියා ගන්න බැරිව ඉන්නවා. තමුන්නාන්සේලා කරන්නේ, එක පැත්තකින් ගොවියාගේ නිෂ්පාදනයේ මිල පහළට වැටිටවීමයි. ගොවියාව අධෛර්යට පත් කරලා, කෘෂි කාර්මික නිෂ්පාදනයෙන් එළියට එන්න බල කරනවා. ගොවියාව ඒ භූමියෙන් ගලවනවා; එතැන පැළ වෙලා ඉන්න ගොවියා නැමැති ගහ ගලවනවා. ගලවලා ඔප්පුව දෙනවා ගොවියාගේ අතට. ගොවියා ඔප්පුව විකුණනවා ණය තුරුස්වලින් බේරෙන්න. එක පැත්තකින් වී මිල අඩු කරලා, ගොවියාව ණයකාරයෙක් කරන විධියට කෘෂි කර්මාන්තයේ වැඩ ඔක්කෝම ටික යන අතරේ, ණයකාරයාට ඔප්පුව දෙනවා. ඔප්පුව අරගෙන වැඩි කාලයක් යන්න කලින් ඒක ඉඩම් වෙළෙඳ පොළට එනවා. ඉඩම් වෙළෙඳ පොළේ බලාගෙන ඉන්නවා, මුදලාලිලා.

දැන් ලංකා විදුලිබල මණ්ඩලය විදේශීය සමාගම් එක්ක ව්‍යාපෘතියක් පටන් අරගෙන තිබෙනවා. මොකක්ද එතැන යෝජනා වෙන්නේ? කුඹුරුවල solar power panels සවි කරන්න. මේ රටේ කෘෂි කාර්මික නිෂ්පාදනවල පැවැත්ම ගැන අංශු මාත්‍රයක හෝ හැඟීමක් තිබෙනවා නම්, මොකෙකුටවත් ඔය මඤ්ඤං සිතුවිල්ල පහළ වෙයිද? කුඹුරුවල solar power panels සවි කරන්නේ මොකටද? Solar power panels සවි කරන්න ඕනෑ තරම් වහලවල් තිබෙන්නේ. එතකොට මෙන්න, ඔප්පුව මෙහෙන් හම්බ වනවා. ගොවියා ණයකාරයෙක් වෙනවා. ණයෙන් බේරෙන්න ඔප්පුව හම්බ වුණාම විකුණනවා. ඉඩම් වෙළෙඳ පොළෙන් මේක අතින් අතට යනවා. අන්තිමට කෘෂි කාර්මික නිෂ්පාදනවල පැවැත්ම බිඳ වැටෙනවා. ඕක තමයි ගෝලීය න්‍යාය පත්‍රය; ගෝලීයකරණ න්‍යාය පත්‍රය; neoliberal න්‍යාය පත්‍රය.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට අනුව දැන් ආර්ථික වර්ධන වේගය සෑහෙන්න වැඩි වේගෙන, වැඩි වේගෙන යනවා. මොකද, මේ දවස් ටිකේ දිගටම වහිනවා නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ කියන්නේ, වහින තරමට ආර්ථික වර්ධන වේගය වැඩි වනවා. එතුමාට අනුව, මේ වහින්නේ සල්ලි. ඒ සල්ලි ටික පොළොවට වැටිච්ච ගමන් ආර්ථිකය වර්ධනය වනවා. ඒ, අතුරු කථාවක්. මේක තමයි තමුන්නාන්සේලාගේ න්‍යාය පත්‍රය; neoliberal න්‍යාය පත්‍රය. ගොවියාට ඔප්පුව දෙන්නේ ගොවියාට තිබෙන ආදරයට නොවෙයි. ගොවියාව හතරගාතෙන් වටිටලා ඔප්පුව දෙනවා, "ඔන්න ඔක විකුණපන් මිනිහෝ" කියලා. ගොවියා කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් ඉඩම විකුණන තැනට පත් කරනවා. ඔප්පුව යනවා මුදලාලි අතට. ඊට පස්සේ? වාණිජ ව්‍යාපෘති වෙනුවෙන් ඉඩම් පරිහරණය. කෘෂි කාර්මික නිෂ්පාදන පැවැත්ම මුළුමනින්ම ගලවනවා. මේක තමයි neoliberal උපාය මාර්ගය. මහින්ද රාජපක්ෂ පාලනය පලවා හැරලා රූකඩ සත්තු ටික ගෙනැල්ලා තිබෙන්නේ, මෙන්න මේ neoliberal න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න. කඩේ ගිය අය ගිහිල්ලා තිබෙන්නේ ඒකට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේලාගේ ආර්ථික වර්ධන වේගය ගැන කථා කරලා වැඩක් තිබෙනවාද? යුද්ධ කරපු කාලයේත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ අපේ සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය සියයට 7ට කිට්ටුයි. ආර්ථික වර්ධන වේගය 2015දී සියයට 5යි; 2016දී සියයට 4.5යි; 2017දී සියයට 3.1යි. 2018දී තමුන්නාන්සේලාට හොම්බෙන් යන්න වෙන්නේ. හැබැයි, මේ දවස්වල ආර්ථික වර්ධන වේගය වැඩි වන නිසා 2018 ටිකක් හොඳ වෙයිද දන්නේ නැහැ. මොකද, වැස්ස නිසා වර්ධන වේගයට පින් සිද්ධ වෙන්න.

තමුන්නාන්සේලා ණය බරත් වැඩි කළා නේ. 2014 අවුරුද්දේ අග වනකොට ණය බර රුපියල් බිලියන 7,391යි. 2017 අවුරුද්දේ අග වනකොට ණය බර රුපියල් බිලියන 10,312යි. ඒ අවුරුදු 3ට සියයට 40කින් ණය බර වැඩිවෙලා තිබෙනවා. ඒ, මොන ඉටි ගෙඩියක්වත් හදලා නොවෙයි. අද වනකොට, මේ කෙටි කාලය තුළ රුපියල සියයට 19කින් බාල්දු කරලා. අවුරුදු 3ක් ඇතුළත සියයට 17කින් රුපියල බාල්දු කළා. මේ වනකොට සියයට 19කින් බාල්දුවෙලා. රුපියල මේ විධියට බාල්දු වීමක් අම්මා මුත්තා කාලයේදීවත් වුණාද? යුද්ධය කරන කාලයේදීවත් එහෙම වුණාද? රුපියල් බිලියන ගණන් සල්ලි වියදම් කරලා යුද්ධයට අවි ආයුධ ගන්න කාලයේදීවත් එහෙම වුණාද? නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මංගල සමරවීර මුදල් ඇමතිතුමා ඒ දවස්වල නම් කිව්වේ රනිල්ට බැහැ කියලායි. දැන් ඒ දෙදෙනා එකට ඉන්නකොට අපට පෙනෙනවා, ඒ දෙදෙනාට විතරක් නොවෙයි, කාටවත් බැහැයි කියලා; ඔක්කොටම බැහැයි කියලා. රනිල්ටත් බැහැ. මංගලටත් බැහැ. වහිනකොට ආර්ථික වර්ධන වේගය වැඩි වෙනවා නම් රටට යමක් වෙයි. එහෙම නැත්නම් තමුන්නාන්සේලාට මේ රට පාලනය කරන්න බැහැ. තමුන්නාන්සේලා දවසින් දවස ඔප්පු කරන්නේ ඒකයි. මේ ආණ්ඩුව ආර්ථිකය හතර ගාතෙන් වටිටවන ආණ්ඩුවක්; දේශීය නිෂ්පාදකයා, ව්‍යවසායකයා ගැන නොහිතන ආණ්ඩුවක්; ස්වදේශික ජනයාගේ අභිලාෂයන් නොතකන ආණ්ඩුවක්; විදේශිකයාට ඕනෑ කරන නෛතික වෙනස්කම්, ව්‍යුහාත්මක වෙනස්කම් පමණක් කරන ආණ්ඩුවක්.

දැන් සබීතාගේ බිල්ඩින් එකක් ගැන කියනවා අපට ඇහුණා. එයට මාසික කුලිය වශයෙන් රුපියල් කෝටි දෙකහමාරක් ගෙවනවා. සහ ගහනවා. දැන් ආංශික අධීක්ෂණ කාරක සභා කියලා කොහෙන්ද ආපු කෙහෙල්මලක් ඇති කළා. ඒවායින් කරන වැඩකුත් නැහැ; ඇති ප්‍රතිඵලයකුත් නැහැ; නිකම් වාර්තා දෙනවා. ඒකෙන් ඇති කෙංගෙඩියකුත් නැහැ. ඊට කලින් තිබුණේ අමාත්‍යාංශ උපදේශක කාරක සභා. එතකොට අඩු තරමේ එදාට ඇමතිතුමාගේ මුහුණවත් දැක්කා. දැන් මේ ආංශික අධීක්ෂණ කාරක සභාවලට ඇමතිවරයෙක් එන්නේත් නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය කලින් තිබුණු ගොඩනැඟිල්ලට ආංශික අධීක්ෂණ කාරක සභා ගෙන යනවාය කියලා, කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ ගොඩනැඟිල්ලෙන් ඉවත් කරලා සබීතාගේ බිල්ඩින් එකට ගෙන ගියා. එහි මාසික කුලිය රුපියල් කෝටි දෙකහමාරයි. ඒක බිල්ඩිමක්ද, මොකක්ද කියලා මා දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේලා මේ කාලය ඇතුළත පෙන්වා ඉවරයි, මුළු රටම ආර්ථික වශයෙන් හෙම්බත් කරලා, හතර ගාතෙන් වටිටවාගෙන යන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි. මා අවසන් කරන්නම්. ඒ නිසාම තමයි ජනාධිපතිවරයාම කියන්න ගත්තේ, ගෙවුණු අවුරුදු තුනේ එක්සත්

ජාතික පක්ෂ ආණ්ඩුව මේ රට කෑවාය කියලා. එහෙම කියපු ජනාධිපතිවරයෙක් එක්ක තමුන්නාන්සේලා හැම සතියකටම වරක් කැබිනට් මණ්ඩලයේ රැස් වී, සිනා මුසු මුහුණින් කථා කරමින් මේ රට කනවා බලාගෙන ඉන්න අපට ඉතා අමාරුයි. ඒ නිසා තමයි මෙපමණ වද වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.37]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින විවාදයට ගැනෙන විසර්ජන පනත යටතේ යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් විනාඩි කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මා ස්තුතිවන්ත වනවා. අපේ ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා විසර්ජන පනත යටතේ යෝජනා කිහිපයක් ඉදිරිපත් කරමින් අපනයන ආදායම වැඩි කිරීම සම්බන්ධයෙන් වන කාරණා ගණනාවක් පිළිබඳව කථා කළා.

එහිදී මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. ඇමතිවරයෙක්, දෙන්නෙක් කියලා තිබෙනවා මම දැක්කා, - මට මතක හැටියට ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා- ඩොලරය නඟින එක හොඳයි කියලා. ඩොලරය රුපියල් 170ට නැග්ගත් කමක් නැහැ කියලා තිබුණා. මම දන්නේ නැහැ කොහෙන් ඉගෙන ගත්ත ආර්ථික විද්‍යා ඥානයකින් එතුමා ඒ කථාව කිව්වාද කියලා. මම ඒ ගැන කනගාටු වෙනවා. මොකද, එතුමා ආර්ථික විශේෂඥයෙක් නිසා. ඩොලරය රුපියල් 170ට නැග්ගාම තිබෙන විපාක මේ වෙනකොටත් අපට විඳින්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා දවස ගණනේ බඩු මිල ඉහළ යනවා, තෙල් මිල ඉහළ යනවා. ඒ එක්කම අනෙකුත් සියලු දේවල්වල මිල ඉහළ යනවා. ඒ විතරක් නොවෙයි, අපනයන ආදායම වැඩි කරගන්නත් බැහැ. මම අපනයනකරුවන් කිහිප දෙනෙක් එක්ක කථා කළා. ඒ අය කියන කාරණය තමයි, ඩොලරය රුපියල් 130ට තිබුණු කාලයේ ලැබූ අපනයන ආදායමට වඩා දැන් ආදායම අඩුයි කියන එක. "දැන් ඩොලරය රුපියල් 160ට ගිහිල්ලා තිබෙන නිසා ඔබතුමන්ලාට වැඩි ආදායමක් ලැබෙනවා. ඒ නිසා දැන් අපට discount දෙන්න" කියලා දැන් ඒ අයට කියනවා ලු. නමුත්, නිෂ්පාදන වියදම - cost of production - වැඩිවීම නිසා ඔවුන්ට ඒ පැත්තෙනුත් යම් වියදමක් දරන්න සිද්ධ වෙනවා. මොකද, ආනයන කරන ද්‍රව්‍යවලින් තමයි සමහර භාණ්ඩ හදන්නේ. ඒ භාණ්ඩ හදලා ආපහු අපනයනය කරනවා. ඒ නිසා ඩොලරයේ වැඩිවීමෙන් ඔවුන් විශාල අර්බුදයකට ලක්වී තිබෙනවා. අපනයන ආදායම වැඩිවීම ගැන කථා කළොත්, අපේ දේශීය ව්‍යාපාරිකයන් -අපනයනය කරන අය- කියන්නේ, ඩොලරය නැඟීමෙන් අපට වාසියක් වෙන්නේ නැහැ කියායි. ඒ අයට යම් වාසියක් වෙයි කියලා අපි කල්පනා කළා. හැබැයි, එහෙම දෙයක් සිද්ධ වුණේත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තවත් කාරණයක් කියන්න කැමැතියි. විශේෂයෙන්ම මා සම්බන්ධයෙන් සඳහන් වූ කාරණයක් මම අද පුවත් පත්වලත් දැක්කා; ඊයේ ප්‍රවෘත්තිවලත් දැක්කා. ඒ පිළිබඳවත් කථා කළොත් හොඳයි කියලා මා විශ්වාස කරනවා.

බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී වැඩියෙන්ම කථා කළ කෙනකු විධියට, ඒ වාගේම ඊට විරුද්ධව කරන්න තිබෙන හැම දෙයක්ම කරපු කෙනකු විධියට මම කියන්න ඕනෑ, බැඳුම්කර ගනුදෙනුවේ තිබුණු සියලු කාරණා පැත්තකට දමලා එක් එක් තනි පුද්ගලයන් අල්ලාගෙන ක්‍රියා කරන්න අද මේ ආණ්ඩුව කටයුතු කරමින් සිටින බව. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අනුබද්ධ වෝල්ව් ඇන්ඩ් රෝ ඇසෝෂියේට්ස් කොම්පැනියෙන් -මට මතක හැටියට සහ ඊයේ පුවත් පත්වල සඳහන් වුණු හැටියට- මට චෙක් පතක් ලබා දුන්නා කියලා සඳහන් වුණා. මේ සිද්ධිය වෙලා තිබෙන්නේ 2015 ජූලි මාසයේ 13වැනි දා. ඒ කාලය මම පාර්ලිමේන්තුවේ හිටපු කාලයක් නොවෙයි. එතකොට මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නොවෙයි. මම වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විධියට කටයුතු කරලා, ඡන්ද ව්‍යාපාරයට නාම යෝජනා භාර දුන් දිනය තමයි මේ දිනය. දුරකථන ඇමතුම් ඇවිල්ලා තිබුණු දවස්වල මම පාර්ලිමේන්තුවේ අමාත්‍යවරයකු විධියට ඉන්න කොටත් මම බොහොම පැහැදිලිව කිව්වා, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අර්ජුන ඇලෝසියස් මහත්මයාත්, ඔහුගේ පියාත් අපි අවුරුදු ගණනාවක ඉඳලා දන්න අය බව.

ව්‍යාපාරිකයන් විධියට ඔවුන්ව අපි අවුරුදු ගණනක් ආශ්‍රය කරපු අය. හැබැයි, හැම මැතිවරණයකදීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, පළාත් සභා මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ටත් ගමේ ඉන්න මුදලාලිලා පවා උදව් කරනවා. එහෙම තමයි මේ රටේ දේශපාලනය යන්නේ. ඒ විධියට සමහර ව්‍යාපාරිකයන් අපට උදව් කරනවා. ඒ උදව් අපට පළාත් සභා මැතිවරණවලදීත් කරලා තිබෙනවා; පාර්ලිමේන්තු මැතිවරණවලදීත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ජනාධිපතිවරණයේදීත්, ජනාධිපති අපේක්ෂකයන්ට උදව් කරලා තිබෙනවා. එහෙම තමයි ව්‍යාපාරික ප්‍රජාව අපට උදව් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේ කියන කාලවකවානුව තුළ මම කෝප් කමිටු සාමාජිකයකු නොවෙයි කියන එක බොහොම පැහැදිලිව කියන්න කැමැතියි. මම පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ, 2015 අගෝස්තු 17වන දා. පාර්ලිමේන්තුවට තේරී පත් වුණාට පස්සේ මම බොහොම පැහැදිලිව බැඳුම්කර සිද්ධියට, අර්ජුන් මහේන්ද්‍රන් කරපු ඒ විනාශකාරී ක්‍රියාවට විරුද්ධයි පාර්ලිමේන්තුවේත්, කෝප් කමිටුවේත් හැම අවස්ථාවකම පෙනී සිටියේ. වැදගත් වෙන්නේ අපි කවුරු වෙනුවෙන් පෙනී සිටියාද කියන කාරණයයි.

දැන් මේ කියන චෙක්පත මගේ නමට ලියපු චෙක්පතක් නොවෙයි. මේ චෙක්පත මගේ නමට ලියපු නැති මුදල් චෙක්පතක්. මේ චෙක්පත කවුරු කොහෙන් මාරු කළාද කියලා මාත් හොයලා බැලුවා. මටත් මතක නැහැ, කවුද මේක දුන්නේ කියලා. අර්ජුන ඇලෝසියස් හෝ වෙනත් කවුරු හරි අත්සන් කර තිබුණු එකක්ද, මොකක්ද සිද්ධ වෙලා තිබුණේ කියලා මම දන්නේ නැහැ. මේ චෙක්පත මාරු කරලා ඒ මුදල් ටික අපි අරගෙන තිබෙනවා, ඒ අවස්ථාවේ තිබුණු මැතිවරණ ව්‍යාපාරයට. කවුරු වුණත් ඒක කරන්න පුළුවන්. හැබැයි, මේ විධියට අපේ මන්ත්‍රීවරු ගණනාවකට උදව් කරපු අය තව ඕනෑ තරම් ඉන්නවා. මා ළඟ ඒ විස්තර තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවුද ඒ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කියන්න පුළුවන්.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවේ තව පිටු 3,000ක් විතර තිබෙනවා. ඒ වාර්තාවේ ඉතිරි ටිකත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියන්න. ඒක ඇතුළේ තිබෙනවා, අර්ජුන ඇලෝසියස්ලාගෙන් මුදල් ගත්තේ කවුද කියන එක. අපි අර්ජුන ඇලෝසියස්ලාගෙන් මුදල් අරගෙන අර්ජුන ඇලෝසියස්ලා ආරක්ෂා කරන්න කටයුතු කරලා නැහැ, කවදාවත්. ඒ විතරක් නොවෙයි. මේ බැඳුම්කර ගනුදෙනුව ආරක්ෂා කිරීම සඳහා මම පොත් ලිව්වේත් නැහැ; ගෙනාව කෝප් කමිටු වාර්තාව නවත්වන්න මම උසාවි ගියේත් නැහැ. අර්ජුන ඇලෝසියස්ලා වෙනුවෙන් මම පෙනී සිටියේත් නැහැ; ඔවුන් වෙනුවෙන් පෙනී ඉන්නෙත් නැහැ. හැබැයි, අද මේ වැඩ පිළිවෙළ තුළ සම්පූර්ණයෙන්ම මඩ ගැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කරලා තිබෙනවා. ඒක සිද්ධ වුණේ, බැඳුම්කර සිද්ධිය පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු විශ්වාස භංගයේදී අග්‍රාමාත්‍යවරයාට එරෙහිව මම ඡන්දය දුන්නු නිසායි.

දැන් අපි මේ ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා ඉන්නේ. ඊයේ-පෙරේදා ටී.බී. ඒකනායක මැතිතුමාට විරුද්ධව නඩුවක් ගෙනාවා. මොකක්ද ඒ නඩුව? එතුමා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා විධියට කාලයක් කටයුතු කළා. බුද්ධාගම පෝෂණය කොට ආරක්ෂා කළ යුතුයි කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙනවා. ඒ අනුව බුද්ධාගම ආරක්ෂා කර ගැනීම උදෙසා එතුමා පෙරහැරකට වාහනයක් දුන්නාය කියලා තමයි ටී.බී. ඒකනායක මැතිතුමාව FCID එකට කැඳවා තිබෙන්නේ. තව ටික දිනකින් අපත් කැඳවයි. ඒකට මුහුණ දෙන්න අපි සූදානම්, කිසි ගැටලුවක් නැහැ.

මේ අවස්ථාවේදී මා තවත් කරුණක් කියන්න කැමැතියි. අනුර දිසානායක මැතිතුමාටත් මේ සිද්ධිය මතක ඇති කියලා මා හිතනවා. මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් COPE එකේ පරීක්ෂණය පැවැත්වුණු එක් දිනකදී ඒ පරීක්ෂණය යන අතරතුර මට කෝල් එකක් ආවා. මට කිව්වා, අගමැතිතුමා කථා කරනවා කියලා. මම එතුමා සමඟ කථා කළා. ඒ අවස්ථාවේදී එතුමා මට කථා කරන්න හේතුව මොකක්ද? එතුමා මට කථා කරන්න විනාඩි කීපයකට කලින්, COPE එකේ මෙම ගනුදෙනුව සම්බන්ධ පරීක්ෂණය පැවැත්වෙන අතරතුරදී මම ඇහුවා, මේ ගනුදෙනුවේදී සෘජු ක්‍රමයේ සිට වෙන්දේසි ක්‍රමයට යන්න තීන්දුව ගත්තේ කවුද කියලා. ඒ තීන්දුව ගත්තේ කවුද කියලා මම අහන කොට අනික් පැත්තේ සිටි හර්ෂණ රාජකරුණා මැතිතුමාත්, ඒ වාගේම අජිත් පී. පෙරේරා මැතිතුමාත් යන දෙදෙනාම කිව්වා, මේක ආණ්ඩුව හැටියට ගත්තේ කියලා; මේක අගමැතිතුමා ගත් තීන්දුවක් කියලා. මම කිව්වා, අගමැතිතුමාට එහෙම තීන්දු ගන්න බැහැයි කියලා. එහෙම තීන්දුවක් ගැනීමේ හැකියාව තිබෙන්නේ කාටද? ඒ හැකියාව තිබෙන්නේ මුදල් මණ්ඩලයට. ඒ මුදල් මණ්ඩලයේ බලය අගමැතිවරයාට හෝ ආණ්ඩුවට පාවිච්චි කරන්න බැහැයි කියලා මම කිව්වාම, ඒ දෙදෙනාම එතැනින් ඉවත් වුණා. ඒ දෙදෙනා එතැනින් ඉවත් වෙලා ගිහිල්ලා අගමැතිතුමා හම්බ වෙලා අගමැතිතුමා ලවා මට කෝල් එකක් දුන්නා. එතුමා මට කථා කරලා ඇහුවා, "දයාසිරි, මොකක්ද මේ කථාව" කියලා. එතුමා කථා කළේ පහළ තිබුණු phone එකට. එතුමා මට කථා කරලා කිව්වා, "මේ කථාව මොකක්ද? මේ සෘජු ක්‍රමය වෙන්දේසි ක්‍රමයට මම ගෙනාවා. මම ඒක ගෙනාවේ අපේ ආණ්ඩුවේ තීන්දුවක් අනුව" කියලා. මම කිව්වා, "සර්, එහෙම තීන්දුවක් ගන්න බැහැ"යි කියලා. මට කිව්වා, “Can you ask from Malik?" -මලික් සමරවික්‍රම මහත්තයාගෙන් අහන්න- කියලා. අපි මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු, ඇමතිවරු විධියට COPE එකේ තිබුණු සාධාරණ පරීක්ෂණයේදී ඒ පරීක්ෂණය නිවැරදිව කර ගන්න අවශ්‍ය කටයුතු කරන කොට අගමැතිතුමා මට කථා කරලා කිව්වේ එහෙමයි. නමුත්, අපි බොහොම ගෞරවයෙන් එතුමාගේ ඉල්ලීම පැත්තකට දමා ඒ වෙනුවෙන් පෙනී සිටියා. මතක තබා ගන්න, අපි ඒවා රකින්න ගියේ නැහැ. මේ පාර්ලිමේන්තුවේදී අපි අර්ජුන් මහේන්ද්‍රන්, අර්ජුන ඇලෝසියස් රකින්න ගියේ නැහැ. අපි ඔවුන් අද රකින්නේත් නැහැ; හෙට රකින්නේත් නැහැ. ඒක මතක තබා ගන්න. එම නිසා අපි ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න සූදානම්. අපි හොරකම් කරලා නැහැ. අපි කාගෙන්වත් දේපළ ලියා ගෙන නැහැ. එක එක්කෙනා වෙනුවෙන් පෙනී සිටීම නිසා අපි ගෙවල් අරගෙන නැහැ. මතක තබා ගන්න, අපේ ඒ නිවැරදි චරිතය අපට අදත් ආරක්ෂා කර ගන්න ඕනෑ. අපේ චරිතය ආරක්ෂා කර ගන්න අපට වුවමනායි. මේ ආණ්ඩුවෙන් එළියට ආ මන්ත්‍රීවරු දඩයම් කිරීමේ ක්‍රියාවලියක් දැන් ආරම්භ වෙලා තිබෙනවා. ටී.බී. ඒකනායක මැතිතුමාට විරුද්ධව දැන් FCID එකේ පැමිණිල්ලක් ගොනු කර තිබෙනවා. ඊ ළඟට, දැන් මටත් විරුද්ධව පැමිණිල්ලක් ගොනු කර තිබෙනවා. ඒ අනුව, අපි 16දෙනාටම විරුද්ධව මේ විධියට පැමිණිලි ගොනු වෙයි කියලා අපි හිතනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපගේ හෘදය සාක්ෂියට අනුව නිවැරදි තීන්දුවක් ගැනීම නිසා අද අපට මේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

එවකට "ලංකා ඊ-නිවුස්" වෙබ් අඩවියේ හිටපු සඳරුවන් සේනාධීර මහත්මයා තමයි දැන් මේවා ගැන ලියන්නේ. මෙච්චර කාලයක් බැඳුම්කර ගනුදෙනුව ගැන, එහි අවශ්‍ය කාරණා ගැන එක වචනයක් ලිව්වේ නැහැ. හැබැයි, දයාසිරි ජයසේකරගේ මේ කාරණය අහුවුණාම එයා ලියන්න පටන් ගන්නවා. කවුද එයාට සල්ලි දෙන්නේ කියලා මම දන්නවා. අද නැතිටගන්නවත් බැරිව ඇඳක් උඩට වෙලා ඉන්න කෙනෙක් තමයි අපට මඩ ගහන්නේ. මතක තියාගන්න, එදා "ලංකා ඊ-නිවුස්" වෙබ් අඩවි කාර්යාලයට ගිනි තියනකොට දයාසිරි ජයසේකර හිටියේ විපක්ෂයේ. ඒ වෙනුවෙන් කඩුවෙල උසාවියේ පෙනී සිටියේ දයාසිරි ජයසේකර, ශිරාන් ලක්තිලක, මෛත්‍රී ගුණරත්න කියන අයයි. ඒක මතක තියාගන්න. මේ ක්‍රියාදාමය තුළ අපට මඩ ගැසීමේ ක්‍රියාවලිය ආරම්භ කරලා තිබෙනවා. අපි ඒවාට භය වෙන්නේ නැහැ. දැන් මේ චෝදනාව දාලා තිබෙන්නේ අරගෙන ගිහිල්ලා ගරාජ් එකකට දුන්නා කියලා. ගරාජ්වලට දීලා අපි කවදාකවත් සල්ලි මාරු කරගෙන නැහැ. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, අදාළ චෙක්පත මගේ නමට තිබුණු චෙක් පතක් නොවන බව. මේක cash cheque එකක්; මුදල් චෙක්පතක්. මැතිවරණවලදී ඔවුන් අපට උදව් කරලා තිබෙනවා. හැබැයි, ඔවුන්ගේ හොරකම් වහන්න පෙරළා අපි ඔවුන්ට උදව් කරන්න ගිහිල්ලා නැහැ. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, හැම මැතිවරණයකදීම මේ පාර්ලිමේන්තුවට එන හැම කෙනෙකුටම ව්‍යාපාරිකයන් උදව් කරලා තිබෙන බව. ව්‍යාපාරිකයන් උදව් කරපුවාම සමහර අය ඒ ව්‍යාපාරිකයන් වෙනුවෙන් පෙනී සිටිනවා. හැබැයි, අපි ඒ ව්‍යාපාරිකයන් වෙනුවෙන් පෙනී ඉඳලා නැහැ. ඒ නිසා අපේ ගෞරවය අපි ආරක්ෂා කරගෙන තිබෙනවා. අපි එක එක්කෙනාගේ මුදල් අරගෙන එක එක්කෙනා වෙනුවෙන් පෙනී සිටින අය නොවෙයි. ඒ නිසා අපේ චරිතය ඝාතනය කරන්න උත්සාහ කරන සියලු දෙනාටම මම මේ අවස්ථාවේදී බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, මේ රටේ ජනතාව වැඩි කල් යන්න කලින් ඒ අයට නිවැරදි පිළිතුරු ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරයි කියලා. එවැනි විශ්වාසයක් තියාගෙන, මේ ආණ්ඩුව කරන හැම වැරදි වැඩකටම විරුද්ධව කටයුතු කිරීමේ වැඩ පිළිවෙළ විපක්ෂයේ ඉඳගෙන අපි ක්‍රියාත්මක කරනවා. ඒක අපි නතර කරන්නේ නැහැ. එක සිර ගෙදරක නොවෙයි, සිර ගෙවල් 10ක දැම්මත් අපි මේ රට නිවැරදි කරන දේශපාලනය නතර කරන්නේත් නැහැ; එය අතහරින්න සූදානමකුත් නැහැ. ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න අපි සූදානම් කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Douglas Devananda.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කනගාටුයි, ඔබතුමාට මගේ නමත් අමතකවීම ගැන. එහෙම නැහැ නේද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
නැහැ. ඔබතුමා කථාව කරන්න.

[ප.භා. 11.48]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අද ගොඩක් අදහස් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත්, මේ නව ලිබරල්වාදය පිළිබඳව යම් කරුණු කීපයක් ඉදිරිපත් වෙච්ච නිසා අපේ පැත්තෙන් යම් කරුණු කීපයක් ඉදිරිපත් කිරීමේ බලාපොරොත්තුවක් තිබෙනවා. ආණ්ඩුව මේ අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තියේ අසාර්ථකභාවය පිළිබඳව තවදුරටත් පොත් අස්සේ රිංගලා සංඛ්‍යා දත්ත අවුස්සලා හොයා බලන්න ඕනෑ නැහැ. සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතය දිහා බැලුවොත්, රටේ වර්ධනය වෙමින් තිබෙන ක්ෂේත්‍රයන්ගේ බිඳවැටීම් දිහා කල්පනා කරලා බැලුවොත්, තරුණ තරුණියන්ගේ රැකියා විරහිතභාවය පිළිබඳ ගැටලුව දිහා බැලුවොත්, ගොවි ජනතාවගේ ජීවිතවල ඇතිවී තිබෙන අනාරක්ෂිතභාවය පිළිබඳව කල්පනා කර බැලුවොත් මේ ආර්ථික ප්‍රතිපත්තියේ අසාර්ථකත්වය ඕනෑවටත් වඩා වැඩියෙන් පෙන්නුම් කර තිබෙනවා.

ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා තමන්ගේ කථාවෙන් පෙන්වා දෙනු ලැබුවේත් මේ අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය තවදුරටත් ඉදිරියට කැඳවා ගෙන යෑමේ අපේක්ෂාවයි. මොකද, එතුමා සැලකිය යුතු උද්දාමයකින් යුතුව කථා කරමින් කිව්වා, "අපි ආනයන භාණ්ඩ 1,200කට ආසන්න ප්‍රමාණයක තීරු බදු නොවන බදු ඉවත් කිරීමට සමත් වුණා. අනෙක් ප්‍රමාණයක් ඉදිරි වසර තුන ඇතුළත තීරු බදු නොවන බදුවලින් ඉවත් කිරීමට සූදානම්" කියලා. ඉතිරි භාණ්ඩ 3,000ක තීරු බදු නොවන බදු ඉවත් කරන්නට සූදානම් කියලා කිව්වා. මෙම කරුණ ඇය වැය ලේඛනයේ තිබෙනවා මම දැක්කා. මේ ගමන් මඟ මොකක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, චීනයේ එක්තරා phone වර්ගයක් නිෂ්පාදනය කරනවා. ඒ phone එකක් නිෂ්පාදනය කිරීමට එම සමාගමට ඩොලර් 7ක් වැය වෙනවා. හැබැයි, ඒ සමාගම අපේ රටේ එක්තරා සමාගමක් වෙත එම phone එකක් ඩොලර් 6 1/2ට ලබා දෙනවා. ඔවුන්ගේ නිෂ්පාදන වියදම ඩොලර් 7යි. හැබැයි, ඔවුන් අපට ඩොලර් 6 1/2ට ලබා දෙනවා. ඒ කියන්නේ නිෂ්පාදන වියදමටත් වඩා ඩොලර් සත 50කින් අඩුයි. හැබැයි, ඔවුන්ට වාසියක් තිබෙනවා. මොකක්ද? චීනය විසින් අපනයනය කරනු ලබන එම වර්ගයේ සෑම දුරකථනයකටම රජයෙන් ඩොලර් එකක් ලබා දෙනවා. එතකොට ඔවුන්ට හැම phone එකකින්ම ඩොලර් සත 50ක් ලාභයි. දැන් අපි අහනවා, ඒ phone එකත් එක්ක තරග කළ හැක්කේ කාටද කියලා. නිෂ්පාදන පිරිවැයටත් වඩා අඩුවෙන් යම් රටකට භාණ්ඩ ලබා දෙන්න පුළුවන් නම්, කිසිදු රටකට එම භාණ්ඩ සමඟ වෙළඳ පොළේ තරගකාරිත්වයක් හදන්න බැහැ. ඒ නිසා තමයි සෑම රටක්ම තමන්ගේ වෙළෙඳ පොළේ භාණ්ඩ ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සැලකිය යුතු ආරක්ෂණ පියවර ගැනීමේ අවශ්‍යතාව තිබෙන්නේ. තීරු බදු, වෙනත් බදු, සහ තීරු බදු නොවන බදු හරහා තමයි විශේෂයෙන්ම වෙළෙඳ පොළ ආරක්ෂණය කරලා තිබෙන්නේ. තීරු බදු නොවන බදු හරහා තමයි මේ ආරක්ෂණය හදන්නේ. අපි දන්නවා, අපි කුඩා රටක්. අපි විශාල වශයෙන් අමුද්‍රව්‍ය තිබෙන රාජ්‍යයක් නොවෙයි. අපේ තාක්ෂණය ඉතා පහළ මට්ටමක තිබෙන්නේ. අපි විශාල වෙළෙඳ පොළක් තිබෙන රටක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෘෂි කර්මාන්තය පැත්තෙන් ගත්තත්, ඕනෑම නිෂ්පාදනයක් පැත්තෙන් ගත්තත් වළක්වන්න බැරි විධියට අපේ නිෂ්පාදන පිරිවැය ඉහළ යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදාහරණයක් හැටියට ගත්තොත්, ඉන්දියාවේ අර්තාපල් හොණ්ඩරයක් හිටවලා අර්තාපල් හොණ්ඩර 21ක් ගලවනවා.

ලංකාවේ අර්තාපල් හිටවලා, හොඳම අස්වැන්න ලැබුණත් ගලවන්නේ හොණ්ඩර 12යි. ඒගොල්ලන්ගේ ඵලදායිතාව වැඩියි. ඔවුන් නවීන තාක්ෂණය එකතු කර තිබෙනවා; නව බීජ හඳුන්වා දී තිබෙනවා. දැවැන්ත භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි, විශාල ගොවි පොළවල්, විශාල වෙළෙඳ පොළවල් ඔවුන් සතුව තිබෙනවා. ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය අඩුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දියාවෙන් අල ගලවලා, නැවක පටවලා, කොළඹ වරායෙන් ගොඩබාලා, රුපියල් 15ක බද්දකුත් ගහලා වැලිමඩ වෙළෙඳ පොළට යන කොට වැලිමඩ අලවලට වඩා ඉන්දියාවේ අලවල මිල අඩුයි. ඇයි ඒ, ඉන්දියාවේ නිෂ්පාදන පිරිවැය අඩු නිසා. අපේ රටේ සෑම ක්ෂේත්‍රයක් ගැනම කල්පනා කර බැලුවොත් ප්‍රාග්ධනය, නිෂ්පාදනය, අපේ අමුද්‍රව්‍යවල ප්‍රමාණය, අපේ තිබෙන තාක්ෂණය කියන මේ සියල්ල සන්සන්දනය කර බැලුවාම, අපේ නිෂ්පාදන පිරිවැය ඉහළ තිබෙන රාජ්‍යයක්. ඒ නිසා තමයි අපේ කර්මාන්තකරුවන් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්, ආරක්ෂණ පියවර හැටියට අපට විවිධ බදු පැනවීම් තිබ්බ යුත්තේ. ලූනු ගලවන කාලයට ලූනු බද්දක් එනවා. අල ගලවන කාලයට අල බද්දක් එනවා. ඒ විධියට තමයි වෙළෙඳ පොළ ආරක්ෂා කර ගෙන තිබෙන්නේ. නමුත්, දැන් තමුන්නාන්සේලා යෝජනා කරන්නේ මොකක්ද? තීරු බදු නොවන සියලු බදු ඉවත් කරමින් ලෝකයේ භාණ්ඩත් එක්ක සම තරගකරුවන් ලෙස අපේ භාණ්ඩ නිෂ්පාදකයන්ට තරග වදින්න කියනවා. අපේ නිෂ්පාදකයාට එහෙම තරග වදින්න කිව්වාට, ඒ වෙනුවෙන් තමුන්නාන්සේලා අපේ නිෂ්පාදකයාට ලබා දී තිබෙන සහනය මොකක්ද? නිෂ්පාදකයෙක් වෙන්න ලබා දී තිබෙන සහනාධාරය මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අඩුම තරමින් අද අපේ රටේ කර්මාන්තශාලාවක විදුලි බිල කොපමණද කියලා සොයලා බලන්න. ඒක කොච්චර ඉහළද? දකුණු ආසියාවේ විශාලම විදුලි බිලකට අද අපේ නිෂ්පාදකයාට, කර්මාන්තකරුවාට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ පිළිබඳව අවධානය යොමු කරනවාද? ඔවුන්ට ප්‍රාග්ධනය සපයා ගැනීම වෙනුවෙන් යම් මුදල් ප්‍රතිපාදනයක් ලබා ගන්න වුවමනා වුණොත් බැංකු පොලී අනුපාතිකය කීයද? මේ කර්මාන්තවලට කිසිම සහනයක් ලබා නොදී කර්මාන්ත වර්ධනය කිරීම සඳහා වූ සැලැස්මක් නැතිව, ලෝක වෙළෙඳ පොළේ භාණ්ඩවලට සම තරගකරුවන් ලෙස අපේ වෙළඳ පොළ විවෘත කිරීම තුළින් තමුන්නාන්සේලා කරන්නේ අවම වශයෙන් හෝ අපේ රටේ ආරක්ෂා වී තිබෙන කුඩා හෝ නිෂ්පාදනයත් මුළුමනින්ම බිඳ වැටීමයි. ඒක තමයි තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්තිය. ඒක තමුන්නාන්සේලාගේ වැරැදි ආර්ථික

[ගරු අනුර දිසානායක මහතා]

ප්‍රතිපත්තියක්. මා දැක්කා, තමුන්නාන්සේලා අය වැය ලේඛනයෙන් යෝජනා කර තිබෙන නිවාස ප්‍රතිපත්තිය. ඒකත් එහෙමයි. තමුන්නාන්සේලාගේ ඉඩම් ප්‍රතිපත්තියත් එහෙමයි. තමුන්නාන්සේලාගේ කර්මාන්ත ප්‍රතිපත්තියත් එහෙමයි. ඒක අසාර්ථක වුණු බව මේ පාර්ලිමේන්තුවේ, මේ රටේ අද වන විට ඇති තරම් ඔප්පු කොට හමාරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නව ලිබරල්වාදය ගැන කථා කරන කොට, අපි කිසිසේත්ම කොළ පාට නව ලිබරල්වාදයට කෑ මොර දෙන සාටකයේ නව ලිබරල්වාදය බදා වැළඳ ගන්නා අය නම් නොවෙයි. එහෙම මහත්මයෙක් මීට කලින් කථා කළා. ඒ නිසාමයි මම කථා කරන්න හිතුවේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නැත්නම් මම කථා කරන්න හිටියේ නැහැ. සමහර මහත්වරු මේ නව ලිබරල්වාදය වැළඳ ගන්නවා. කොළ පාට නව ලිබරල්වාදයට විරුද්ධ වෙනවා; කුරහන් පාට නව ලිබරල්වාදය බදා ගන්නවා. පසුගිය අවුරුදු පහේම ගියේ මේ ආර්ථික ප්‍රතිපත්තියම නේ.

ගෝඨාභය රාජපක්ෂ පසුගිය දා කරන ලද ආර්ථික ප්‍රකාශනය ගැන, "ඒ ඔවුන්ගේ ආර්ථික ප්‍රකාශනයයි" කියා ආණ්ඩුව පැත්තෙන්ම කියා තිබුණු ආකාරය මම දැක්කා. ඒ වෙනුවෙන් කෑ මොර දෙන, එය බදා වැළඳගෙන ඉන්න අය මෙතැනදී යටිගිරියෙන් මොර දෙනවා. මම හිතුවා කලන්තය හැදිලා වැටෙයි කියලා. මම ආපු වෙලාවේ වැඩියෙන් කෑ ගැහුවා. මම ඒකමයි මේ කථා කරන්න හිතුවේ. සිහි නැතුව වැටෙයි කියලා මා හිතුවා. මොනවාද, මේ කථා කරන්නේ? වංචා, දූෂණ ගැන කථා කරන්නේ. [බාධා කිරීමක්] ඔව්, ඔය ගොල්ලන් කථා කරන්නත් කලින් අපි සබීතාගේ ගොඩනැඟිල්ලේ ප්‍රශ්නය ගැන කථා කර තිබෙනවා; පාර්ලිමේන්තුවේ ඇති තරම් ඒ ගැන කථා කර තිබෙනවා. හැබැයි ඥාතීන්ට ගෙවල් දීපු ඒවා ගැන, වටේ හිටපු අයට වාහන බෙදපු ඒවා ගැන, මාවරමංඩියේ රුපියල් 4ට දුරකථන ඇමතුම් දිදී හිටපු අය ගෙවල් හදා ගත්තු ආකාරය ගැනත් අපි ඒ වාගේම කථා කරනවා. කවුද, මේ කථා කරන්නේ? [බාධා කිරීමක්] ඔව්. අක්කාගේ දුවගේ මඟුලටත් වියදම් කළේ ආණ්ඩුවේ සල්ලියි කියා නිවාස ඇමතිතුමා කියපු ආකාරය මම දැක්කා. ඒවා ඇත්තද, නැද්ද කියා මම දන්නේ නැහැ. මේ, කවුද? ඒ නිසා මේ වංචාවට එරෙහි වූ සටන වංචනිකයන්ගේ අතට ගන්න දෙන්න හොඳ නැහැ.

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ෂැන්ග්‍රි-ලා හෝටලයේ ඉඳගෙන කළ කථාවේදී, "රාජ්‍ය නිලධාරීන් සහ දේශපාලකයන් වෙළාගෙන තිබෙන දූෂණයෙන් මේ රට ගලවා ගනිමු" කියා කිව්වා. කවුද මෙහෙම කියන්නේ? ගෝල්ෆේස් පිටිටනිය ඉස්සරහා තිබුණු ඉඩමේ හමුදා මූලස්ථානයයි, හමුදා රෝහලයි තිබුණා. අක්කර 20ක් වුණු ලංකාවේ වටිනාම ඉඩමයි එතැන තිබුණේ. එයින් අක්කර 10ක් සින්නක්කර අයිතියට ෂැන්ග්‍රි-ලා හෝටලයට දුන්නා. ඉතිරි අක්කර 10 සින්නක්කර අයිතියට CATIC එකට දුන්නා. හැබැයි, අන්තිමට CATIC එක ආවේ නැහැ. නමුත් ෂැන්ග්‍රි-ලා හෝටලය ආවා. අක්කර 10ක් දුන්නේ කීයටද? අක්කර 10 දුන්නේ බිලියන 10කටයි. ඒ කියන්නේ, කෝටි 1,000යි. අක්කර දහය දුන්නේ කෝටි 1,000කටයි. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මම මේ සම්බන්ධව ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරියේදී ඒක පාර්ලිමේන්තුවේදී අහන්න මට අවස්ථාව ලැබෙයි. එම හමුදා රෝහලයි, හමුදා අනුබණ්ඩයි වෙන තැන්වල ස්ථානගත කරන්න පසුගිය අවුරුදු හත අටක කාලය තිස්සේ කීයක් වියදම් කරලා තිබෙනවාද? හමුදා රෝහල කාලයක් ආශා හොස්පිටල් එකේ තියාගෙන හිටියා. ඒ වෙනුවෙන් කීයක් වියදම් කළාද? ඇයි, රෝහල තිබුණු ඉඩම නේ, දුන්නේ; හමුදා මූලස්ථානය තිබුණු ඉඩම නේ, දුන්නේ. බිලියන 10යි ලැබුණේ. දැන් අකුරේගොඩ හමුදා මූලස්ථානයක් හදනවා. එහි වියදම කීයද? බිලියන 64යි. තවම ඒකේ වැඩ අවසන් වෙලා නැහැ. එකේ වියදම බිලියන 100 පන්නනවා. අපිට ගෝල්ෆේස් එක ළඟ ඉඩමක් තිබුණා. ඒකේ හමුදා මූලස්ථානය තිබුණා; හමුදා රෝහල තිබුණා. දැන් ඉඩමත් නැහැ; හමුදා මූලස්ථානයත් නැහැ; රෝහලත් නැහැ; සල්ලිත් නැහැ. ඒ ඉඩම විකුණලා බිලියන 10යි හම්බ වුණේ. හමුදා මූලස්ථානය හදන්න බිලියන 64ක් දැනට වියදම් වෙලා තිබෙනවා. මේ වාගේ දේවල් කරපු මහත්වරු අද එතැන ඉඳගෙන, මේ රටේ වංචාව දූෂණය නතර කරන්න ඕනෑය කියා කථා කරනවා.

මේ රටේ වංචාව, දූෂණය නතර කිරීම පිළිබඳව සටනක් තිබෙනවා. වංචනිකයන් ඒ සටනත් කොල්ලකන්න හදනවා. ඒකයි මම මේ කියන්නේ. වංචාව, දූෂණයට එරෙහි සටනත් ඔවුන් කොල්ලකන්න හදනවා.

ඊළඟට මොකක්ද කරන්නේ? නව ලිබරල්වාදය. ආර්ථිකයේ වටිනා සම්පත් විකිණීම. ඒ විකිණීමට එරෙහිව මේ රටේ හඬක් තිබෙනවා. තමුන්නාන්සේලා අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිවල මේ විකිණීමේ ප්‍රතිපත්තිය අසාර්ථක බව ඔප්පු කර තිබෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කෑ මොර දෙන්නේ කොළ පාටින් විකුණනකොට කෑ මොර දෙන, සාටකයේ පාටින් විකුණනකොට වාඩිවෙන කට්ටිය වාගේ නොවෙයි. කල්පිටියේ දූපත් 14ක් තිබුණා. මේ දූපත් 14 සංචාරක මණ්ඩලයෙන් - බැසිල් රාජපක්ෂ මහත්මයාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ තමයි ඒ කාලයේ සංචාරක මණ්ඩලය තිබුණේ. - විකුණන්න දැම්මා. ඔබතුමන්ලා මතක තබා ගන්න, ඒ දූපත් 14න් දූපත් දෙකක් වික්කා. රටේ දූපත් විකුණනකොට මේ කෑ මොර දෙන ලිබරල්වාදී හාදයෝ කොහේද හිටියේ? අපි ඒක දැනගන්න කැමතියි. තමුන්නාන්සේලා හම්බන්තොට ඉඩම් විකුණනකොටත් අපි එයට එරෙහිව කටයුතු කළා. කන්තලේ ප්‍රදේශයේ අක්කර 15,000ක් අද තමුන්නාන්සේලා සමාගමකට පවරා දෙන්න හදනවා. ඒකට එරෙහිවත් අපි කටයුතු කරනවා. හැබැයි, මේ දේවල්වලට එදාත් අපි විරුද්ධ වුණා. කල්පිටියේ දූපත් 14 විකුණන්න බැසිල් රාජපක්ෂලා කටයුතු කරනකොටත් අපි විරුද්ධයි. නමුත් ඒ පාලන කාලය ඇතුළත දූපත් දෙකක් විකුණුවා; ඉතිරි දූපත් දොළහ විකුණා ගන්න බැරි වුණා. අපි මේ ළඟදී සංචාරක මණ්ඩලය කෝප් කමිටුවට කැඳෙව්වා. ඉතිරි දූපත් දොළහත් විකුණන්න සැලසුම් කරමින් ඉන්නවාය කියා කිව්වා. ඒක තමයි ඒ ගොල්ලන්ගේ ගමන. ඒවා විකුණනකොට මේ අය සද්ද නැතිව හිටියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොළොන්නරුවේ සෝමාවතී චෛත්‍යය අසල ඉතා වැදගත් ඉඩමක් තිබුණා. විශේෂයෙන්ම මහවැලි ගඟේ ආරක්ෂාවට තිබුණු රක්ෂිතයක අක්කර 5,000ක් කාටද දුන්නේ? එහි අක්කර 5,000ක් "ඩෝල්" නමැති ඇමෙරිකානු සමාගමට දුන්නා. ඇමෙරිකානු ඩෝල් සමාගමට වැලිකන්දේ ඉඩම් දෙනකොට ඒවා දැක්කේ නැතුව, දීපු කට්ටක් ඔහේ සුප්පු කර කර හිටපු මහත්වරු අද අපිට ඇඟිල්ල දිගු කරන්න එනවා. පැල්වත්තේ සීනි සමාගම අසල අක්කර 1,000ක් ඩෝල් කියන ඇමෙරිකානු සමාගමට දුන්නා. ඩෝල් සමාගම කියන්නේ මොකක්ද? ලෝකයේ පරිසරය විනාශ කිරීම් පිළිබඳව blacklist ගතවුණු සමාගමක් තමයි ඩෝල් සමාගම. ඩෝල් සමාගම පාකිස්තානයෙන් පලවා හැරියා. හැබැයි, තමුන්නාන්සේලා පැල්වත්තේ සීනි සමාගම අසලින් ඉඩම් අක්කර 1,000ක් එම සමාගමට දුන්නා. අනික් පැත්තෙන්, ගිරාඳුරුකෝට්ටේ; මහියංගනයේ එහා පැත්තේ සීමාවේ අක්කර දෙදහස් ගණනක් සමාගම්වලට දුන්නා. රටේ ඉඩම් සමාගම්වලට

දෙනකොට ඒ දෙන මස් කටිටක් සූප්පු කර කර ඉන්නවා. ඇයි ඒ? ඒවා සාටකයේ පාට ලිබරල්වාදය නිසායි. කුරහන් පාට ලිබරල්වාදය වැළඳගන්නවා. කොළ පාට ලිබරල්වාදයට විරුද්ධ වෙනවා. අපි දෙකටම විරුද්ධයි. අපේ ප්‍රතිපත්ති හරි පැහැදිලියි. තමුන්නාන්සේලා අනුගමනය කරමින් තිබෙන ආර්ථික උපාය මාර්ග අසාර්ථක බව ඕනෑවටත් වඩා වැඩියෙන් අද ඔප්පු කරමින් තිබෙනවා. ඒ නිසා මේ අනුගමනය කරමින් තිබෙන ආර්ථික උපාය මාර්ග වෙනුවට නව විකල්ප ආර්ථික උපාය මාර්ගයක් දෙසට අපේ අවධානය යොමු කළේ නැත්නම් මේ අර්බුදයෙන් ගොඩ එන්න බැහැ.

චීනයෙන් ඩොලර් බිලියනයක ණයක් දුන්නා, දැන් ගොඩ එයි කියලා. නමුත් ගොඩ එන්නේ නැහැ. හම්බන්තොට වරාය වික්කා, දැන් ගොඩ එයි කියලා. ගොඩ එන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වරාය සූත්‍රය ගැන පොඩ්ඩක් සොයා බලන්න. අපට හම්බන්තොට මුහුදක් තිබුණා; වරායක් ඉදි කිරීමට සරිලන පරිසරයක් තිබුණා. එදා ඔතැන වරායක් හදන්න චීනයෙන් කවුරු හෝ ආවා නම් කවුරුවත් එයට ඉඩ දෙන්නේ නැහැ. චීන්නුන්ට ලංකාවේ වරායක් හදන්න ඉඩදෙන්නේ කොහොමද කියා අපි ප්‍රශ්න කරනවා. ඇයි? හම්බන්තොට කියන්නේ ලංකාවට අයිති භූමියක්. අපේ භූමියේ වරායක් හදන්න චීන්නුන්ට අපි ඉඩ දෙන්නේ නැහැ. හැබැයි සිද්ධ වුණේ මොකක්ද? චීනා ණයක් දුන්නා, වරායක් හදන්න. අපි ඒ ණය අරගෙන වරායක් හැදුවා. ඊළඟට, ඒ ණයට වරාය දුන්නා. දැන් අන්තිම ප්‍රතිඵලය මොකක්ද? චීනයට වරායක් තිබෙනවා, අපිට ණයක් තිබෙනවා. නිකම්ම දුන්නා නම්, චීනාට වරාය විතරයි; අපට ණයක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ලංකාවේ අහවල් භූමියේ වරායක් හදන්න චීනයට දෙනවා" කියා මේ පාර්ලිමේන්තුවේ කොතැන හෝ කථා කළා නම් ඒකට ලොකු විරෝධයක් එනවා. ඇයි? අපේ භූමියේ, අපේ පරිසරයේ එහෙම වරායක් හදන්න පිට රටකට ඉඩදෙන්න බැහැ. අපි කළේ මොකක්ද? චීනයෙන් ණයක් අරගෙන වරායක් හැදුවා. හදපු වරාය චීනයට දුන්නා. එහි අන්තිම ප්‍රතිඵලය ලෙස චීනාගේ වරායක් හම්බන්තොට ආවා. ඒක නේ, වෙලා තිබෙන්නේ? මෙවා තමුන්නාන්සේලාගේ ආර්ථික උපාය මාර්ගද? එහෙම නම් කලින්ම කියන්න තිබුණා නේ, "අපි චීනයට වරායක් හදාගන්න දෙනවා" කියලා. එතකොට මේ රටේ ජනතාව ඒකට ඉඩ දෙන්නේ නැහැ. තමුන්නාන්සේලාටත් මේ පාර්ලිමේන්තුවට ඇවිත් කියන්න බැහැ, "අපේ රටේ භූමියේ ඉතාම වටිනා, වරායකට සුදුසු ස්ථානයක් වරායක් හදන්න අපි චීනයට දෙනවා" කියලා. ඉතින් ඕවා ආර්ථික උපාය මාර්ගද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අන්තිමට වෙලා තිබෙන්නේ මොකක්ද? අපට ඉඩමත් නැහැ; භූමියකුත් නැහැ. වරාය විතරක් අක්කර 2,500ක හදනවා. අපේ අක්කර 2,800ක් ඔවුන්ට පැවරුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ලංකාවේ කර්මාන්තකරුවෙක් හම්බන්තොට චීන ආර්ථික කලාපයේ කර්මාන්තශාලාවක් දමන්න ගියොත්, ඉදිරිපත් කරන කොන්දේසිය මොකක්ද කියා දැන් මම ඔබතුමාට කියන්නම්.

ඉස්සර වෙලාම බලනවා එතැනට චීන කර්මාන්තශාලාවක් එනවාද, නැද්ද කියලා. චීන කර්මාන්තශාලාවක් එතැනට එනවා නම්, "බැහැ" කියන එක තමයි කියන්නේ. අපේ කර්මාන්තකරුවන්ට අපේ වරාය ළඟට යන්න බැහැ. චීන කර්මාන්තශාලාවක් එතැනට එන්නේ නැත්නම්, චීන සමාගමත් සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් පටන් ගන්න කියා අපේ කර්මාන්තකරුවාට කියනවා.

අපේ රටේ විවිධ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හම්බන්තොට වරාය ආසන්නයේ, අක්කර 2,800ක භූමිය තුළ අක්කර 40ක් අරගෙන සිමෙන්ති කර්මාන්තශාලාවක් හදන්න අපේ ආයෝජකයෙක් ගියා. වරාය විකුණන්න කලින් BOI එකෙන් ඒ අනුමැතිය දීලා තිබුණා. නමුත් වරාය විකුණුවාට පසුව චීනා කියනවා, "උඹට හදන්න දෙන්න බැහැ. මේක අපේ දෙයක්, උඹ මේ කලාපයේ සිමෙන්ති කර්මාන්තශාලාවක් හදනවා නම් චීන කර්මාන්තශාලාවක් සමඟ ඒකාබද්ධ ගිවිසුමක් අත්සන් කරන්න ඕනෑ" කියලා. අපේ භූමියේ කර්මාන්තශාලාවක් හදන්න අපිට බැරිද? ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අක්කර 40 සඳහා අවුරුද්දකට අක්කරයකට ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 3 බැගින් බදු ගෙවන්න ඕනෑ. ඒ අනුව අක්කර 40 සඳහා අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් මිලියන 12ක බද්දක් ගෙවන්න ඕනෑ. මේ අපේ සල්ලි නේ. මේ ඉල්ලීම සාධාරණද? අපේ ඉඩම්වල අපේ කර්මාන්තකරුවකුට කර්මාන්තශාලාවක් ආරම්භ කරන්න චීනයට බදු ගෙවන්න ඕනෑද? මේක ආර්ථික උපාය මාර්ගයක්ද? එතැන අක්කර 2,800ක් චීනයට දුන්නා. ඒ අනුව, තමුන්නාන්සේලා අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය ඕනෑවටත් වඩා අසාර්ථක වුණු එකක් බව ඔප්පුකොට තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආර්ථික උපාය මාර්ගවල අසාර්ථකභාවයක් ඇති වී තිබෙන බව පෙන්නුම් කර තිබෙනවා විතරක් නොවෙයි, තමුන්නාන්සේලා අනුගමනය කරන්න හදන උපාය මාර්ගත් අපේ රටට මහා විනාශකාරී අත් දැකීම් ගෙනත් දෙන ඒවායි.

"අන්තිම අමාරු තැනක අපි ඉන්නේ, ලංකාව මෙතෙක් ගෙවන ලද ලොකුම ණය වාරිකය 2019දී ගෙවන්න වෙනවා, ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන හතරහමාරක් ගෙවන්න තිබෙනවා" කියා ගරු මංගල සමරවීර ඇමතිතුමා කියනවා මම අහගෙන හිටියා. මේ ඇමෙරිකානු ඩොලර් බිලියන හතරහමාර සොයා ගන්නේ කොහොමද කියා තමයි අපෙන් අහන්නේ? "මේ ණයවලින් හදපු වත්කම් කෝ?" කියා අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. අපිට ගණන් කළ හැකි ප්‍රමාණයකට; සියයක දෙසීයක ප්‍රමාණයකගේ අතට මේ ව්‍යාපෘතිවලින් මහා ධනස්කන්ධයක් ගලාගෙන ගියා. සිය දෙසියදෙනකුගේ ජීවිත සුඛ විහරණ සහිත ජීවිත බවට පත් වුණා; ඔවුන්ගේ නිවාස විශාල වුණා; ඔවුන්ට විදේශ දේපොළ අත්පත් කර ගන්න පුළුවන්කම ලැබුණා; ඔවුන් කොළඹ ගෙවල්, ගමේ ගෙවල්, වැල්ලේ ගෙවල්, නුවරඑළියේ ගෙවල්, ලන්ඩන්වල ගෙවල් ගත්තා. මේ ව්‍යාපෘතිය හරහා දෙසීයක්, තුන්සියයක්දෙනා ඒ විධියේ සුඛ විහරණ සහිත ජීවිත ගත කරනවා. හැබැයි සාතිශය බහුතර ජනතාවගේ ජීවිත අද පතුළටම ඇද දමා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුවෙන් වාර්තාවක් ආවා, අද වන විට ලංකාවේ පවුල්වලින් සියයට 60ක් කවර හෝ බැංකුවකට ණයයි කියා. නිල නොවන ණය කොපමණ තිබෙනවාද? ගමේ පොලී මුදලාලිට, ගමේ උගස් මුදලාලිට, ගමේ කඩේට ආදී වශයෙන් අද රටේ සියලු පුරවැසියන්, -රට විතරක් නොවෙයි- ණයකරුවන් වෙලා තිබෙනවා. කෘෂි කර්මාන්තයේ යෙදෙන ගොවි ජනතාව වගා කරලා අස්වැන්න විකුණලා මොකක්ද කරන්නේ? බැංකුවේ වාරිකය දමනවා. වැටුප ගන්න සේවකයා මාසයේ පඩිය අරගෙන මොකක්ද කරන්නේ? බැංකුවේ වාරිකය දමනවා. මේක නොවෙයිද, අද වෙලා තිබෙන්නේ? සියලුදෙනා ණයකරුවන් බවට පත් වුණු ආර්ථිකයක් අද තිබෙන්නේ. මේ ණය උගුලේ හිරවීම නිසා පහළ ග්‍රාමීය ජනයාගේ ජීවිතය මුළුමනින්ම විනාශයට පත් වෙලා තිබෙනවා. ලබන මාසයේ 05වන දාට මේ ගැන වෙනම විවාදයක් පවත්වන්න අපි සූදානම්වී සිටිනවා. ඇයි? දැන් "ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම" ඇවිත් තිබෙනවා; කිසි පාලනයක් නැහැ. ගම්වල සාමාන්‍ය කාන්තාවෝ ටිකක් එකතු කරනවා; පස්දෙනකුගෙන් යුත් කමිටුවක් හදනවා; පස්දෙනාම ඇප වෙන්න ඕනෑය කියනවා; රුපියල් 10,000ක් දෙන්නම් කියනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - விஞ்ஞான, தொழில் நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - State Minister of Science, Technology and Research, Skills Development and Vocational Training and Kandyan Heritage)

පොලිය සියයට 25යි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔව්, සමහර ඒවායේ පොලී අනුපාතිකය සියයට 48යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සියයට හතළිස්අටේ පොලී අනුපාතයට ණය අරගෙන මොන බිස්නස්ද කරන්න පුළුවන් වන්නේ? කුඩු විකිණුවොත් විතරයි ඒ ණය ගෙවන්න පුළුවන්. ඒකෙන් ගොවිතැන් කරලා, කුකුළු ෆාම් එකක් දමලා, මුරුක්කු ටිකක් බැඳලා, -ඒවාට නේ, මේ ණය ගන්නේ.- ජීවත් වෙන්න පුළුවන්ද? අද මේවා අසාර්ථක වෙලා තිබෙන්නේ. අද ග්‍රාමීය ජනතාව "ක්ෂුද්‍ර මූල්‍ය ආයතන" කියන මහා මංකොල්ලකරුවන්ගේ ග්‍රහණයට යටත්වෙලා තිබෙනවා. අද ඔවුන් උපයන්නේ මොකක් වෙනුවෙන්ද? මූල්‍ය සමාගම් කිහිපයක වුවමනාව වෙනුවෙන් තමයි අද අපේ රටේ ජනතාව සියලුදෙනාම වෙහෙසෙන්නේ. අද අපේ රටේ මූල්‍ය සමාගම් කිහිපයක් ජනතාවගේ ආදායම එකතු කරගෙන තිබෙනවා. කෝ, ඒවාට සැලසුම්? තමුන්නාන්සේලා සකස් කරන්න ඕනෑ සැලැස්ම මොකක්ද? පහළ මට්ටමේ ජීවත් වන සාමාන්‍ය ජනතාවගේ ජීවිත උසස් කිරීම සඳහා තමුන්නාන්සේලාට තිබෙන ආර්ථික සැලැස්ම මොකක්ද කියා මම දැනගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ හැම රටක්ම මුහුණ දුන්, එහෙත් අප මුහුණ නොදුන් වාසනාවන්ත තත්ත්වයක් අපට තිබෙනවා. ඒ මොකක්ද? ලෝකයේ හැම රටක්ම නාගරික ජනාකරණයට ලක් වුණා. ගම්වල හිටපු ලක්ෂ, කෝටි සංඛ්‍යාත ජනතාව ගම් අත් හැරලා නගරයට ආවා. ෂැන්හයි ගත්තොත්, එහි වර්ග කිලෝමීටර 8,000ක් විතර ප්‍රමාණයකුයි තිබෙන්නේ. හැබැයි, ෂැන්හයිවල ජනගහනය මිලියන 24යි. ලංකාවෙන් අටෙන් පංගුවකටත් වඩා කුඩායි ෂැන්හයි කියන නගරය. හැබැයි, ජනගහනය ලංකාවට වැඩියි. මොකක්ද වුණේ? චීනයේ එක කාලයක ග්‍රාමීය ජනයා ගම් අත් හැරලා නගරයට කේන්ද්‍රගත වුණා. දහස් ගණන් මිනිස්සු ගම් අත් හැරලා ආවා. දිල්ලිය ගත්තත්, නිව්යෝර්ක් ගත්තත් ලෝකයේ හැම රටක්ම නාගරික ජනාවාසකරණය කියන ප්‍රශ්නයට මුහුණ දුන්නා. අපේ රටට ඒ ප්‍රශ්නය ආවාද? අපේ රටට ආවේ නැහැ. අදත් අපේ රටේ ජනතාව ගම්වල තමයි ජීවත් වෙන්නේ. හැබැයි, තමුන්නාන්සේලා ආර්ථික සැලැස්මක් හැදුවාද? ගමේ ඉන්න කෙනා ගමේ තියලා ඒ ගොල්ලන්ගේ ජීවන තත්ත්වය උසස් කරන්නේ කොහොමද කියන එක ගැන ආර්ථික උපාය මාර්ගයක් තමුන්නාන්සේලාට තිබුණේ නැහැ. තමුන්නාන්සේලා ආර්ථික උපාය මාර්ගයන් හැදුවේ, ගමේ ඉන්න ජනතාව කොළඹට කැඳවීමටයි. ඒ නිසා තමයි අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 52ක් -දැන් නම් ඒක ටිකක් අඩුයි කියලා ආපු අලුත් වාර්තාවක තිබුණා.- බස්නාහිර පළාතෙන් තමයි දෙන්නේ. රටේ වසරක නිෂ්පාදනය වෙන මුළු ධනයෙන් සියයට 52ක් දෙන්නේ බස්නාහිර පළාතෙන්. ඌව පළාතෙන් දෙන්නේ සියයට හතරයි; වයඹ පළාතෙන් දෙන්නේ සියයට නවයයි; දකුණ සියයට නවයයි; උතුරු මැද සියයට හතරයි. හැබැයි, ලංකාවේ විශාල භූමියක්, විශාල සම්පත් ප්‍රමාණයක් වාගේම විශාල ජනගහනයක් සිටින බස්නාහිර පළාත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 52ක් නිෂ්පාදනය කරනකොට අනෙක් පළාත් අටම නිෂ්පාදනය කරන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 48යි. ඒකෙන් කියන්නේ මොකක්ද? තමුන්නාන්සේලා කොළඹ කේන්ද්‍ර කරගෙන ආර්ථික සැලැස්මක් හැදුවා මිසක ආර්ථිකය ප්‍රසාරණය කරන්න, ගමේ ඉන්න කෙනා ගමේ තියලා ආර්ථිකය සංවර්ධනය කරන්න උපාය මාර්ගයක් හැදුවේ නැහැ කියන එකයි. තමුන්නාන්සේලාගේ ආර්ථික උපාය මාර්ග සියල්ල කොළඹට කැඳවන, සියල්ල කොළඹ කේන්ද්‍ර කර ගත්තු ආර්ථික උපාය මාර්ග. ඒක වැරැදියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථික සංවර්ධනය වාගේම ප්‍රසාරණය වැදගත්. ආර්ථිකය ඉදිරියට එනවා වාගේම ආර්ථිකය පැතිරෙන්න ඕනෑ. කොහේද ආර්ථිකය පැතිරුණේ? ග්‍රාමීය ජනයා මේ වෙළී සිටින්නේ දරිද්‍රතාවයෙන් පහළම තැනක. අද වාර්තා ඉදිරිපත් වෙලා තිබෙනවා, දකුණු ආසියාවේ දුගීභාවයෙන් දෙවැනි ස්ථානයට ඉන්නේ ශ්‍රී ලංකාව කියලා. අපේ රටේ ජනගහනයෙන් සියයට 22ක් -පහෙන් එකකටත් වැඩියි. පස්දෙනෙක් ගත්තොත් එක්කෙනෙක්- දරිද්‍රතා රේඛාවෙන් පහළින් ජීවත් වෙනවා. අවුරුදු පහට වඩා අඩු දරුවන්ගෙන් සියයට 20ක් එක්කෝ උසට අනුව බර නැහැ; එක්කෝ වයසට අනුව බර නැහැ; එක්කෝ වයසට අනුව උස නැහැ; එක්කෝ අඩු බර හෙවත් අවශ්‍ය බර නැහැ; එක්කෝ කුරුබව; එක්කෝ මන්ද පෝෂණය. මේක නේ වෙලා තිබෙන්නේ. මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? අපේ රටේ අවුරුදු 5ට වඩා අඩු දරුවන්ගෙන් පහෙන් එකක් අධි මන්ද පෝෂණයෙන් පෙළෙන රාජ්‍යයක් තමුන්නාන්සේලා හදලා තිබෙනවා. ඒකෙන් කියන්නේ මොකක්ද?

තමුන්නාන්සේලා මේ ආර්ථිකය ගමට ගෙනිව්වේ නැහැ. ගමේ ජනතාව ගමේ තියාගන්න ගෙනාවේ මොකක්ද? මම තමුන්නාන්සේලාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. පොළොන්නරුවේ පසුගිය අවුරුදු 10ට, 15ට ගමක හැදිව්ව එක කර්මාන්තශාලාවක් මට කියන්න. ගමක හැදිව්ව එක ගොවි පොළක් අපට පෙන්වන්න. ගමට ගෙනිව්ව අලුත් කෘෂි කර්මාන්ත ක්‍රමවේදයක් අපට කියන්න. ගමට ගෙනිව්ව කෘෂි කර්මාන්ත තාක්ෂණයක් අපට කියලා දෙන්න. කිසි දෙයක් නැහැ. එහෙම නම් තමුන්නාන්සේලාගේ ආර්ථික උපාය මාර්ගය වැරැදියි. අපි මේ ආර්ථික උපාය මාර්ගය උඩු යටිකුරු කරන්න ඕනෑ.

නගරය කේන්ද්‍ර කරගෙන දියුණු වුණු රටවල් ලෝකයේ තිබෙනවා. ලෝකයේ ජනගහනයෙන් වැඩි පංගුවක් නගරයට සංකේන්ද්‍රණය වුණා. ගම්වල ජනගහනය නැතුව ගියා. හැබැයි, අපේ ගමේ ජනගහනය ඉන්නවා. ඒක නිසා තමයි අදත් දින හතරක නිවාඩුවක් ආවොත් කොළඹ තේ එකක් බොන්න කඩයක් නැත්තේ. ඔක්කෝම ගමේ තමයි ඉන්නේ. කවුරුවත් කොළඹ නැහැ. ඒක මතක තබා ගන්න. ඒ ගමේ ජනයා ගමේ තියාගෙන කොහොමද ඒ ගොල්ලන්ගේ ජන ජීවිතය උසස් කරන්නේ? එතැනට කොහොමද ආර්ථික සංවර්ධනය ගෙන යන්නේ? ඒ ගොල්ලන්ගේ ජන ජීවිතය, ඒ ගොල්ලන්ගේ ශ්‍රමය, ඒ ගොල්ලන්ගේ දැනුම ඒකාබද්ධ කරන නිෂ්පාදන ක්‍රියාවලියකට අවතීර්ණ වෙන්නේ කොහොමද? ඒ කිසි දැක්මක් නැහැ. ඉබාගාතේ යනවා.

හැම දාමත් තමුන්නාන්නාසේලා ඇවිල්ලා කියන වට්ටෝරුව තමයි, ආයෝජනයන් ගෙන්වා ගැනීම. අපි ඉඩම් දෙන්නම්, අපි බදු සහන දෙන්නම් කියමින් ආයෝජනය ගෙන්වා ගැනීමට තමයි තමුන්නාන්සේලා උනන්දු වන්නේ. ආවාද, ආයෝජනය? 2016 එක්ක සංසන්දනය කරලා බලනකොට 2017 වසරේ දෙකෙන් පංගුවට වැඩියෙන් ආයෝජන කඩා වැටිලා තිබෙනවා. මට

ආසන්න වශයෙන් මතකයි, 2016 වසරේ මේ රටට පැමිණි ආයෝජන ප්‍රමාණය ඩොලර් මිලියන 850ක් වාගේ ගණනක් බව. 2017 වසරේ මේ රටට පැමිණි ආයෝජන ප්‍රමාණය ඩොලර් මිලියන 300යි. ආයෝජන ආවාද? තමුන්නාන්සේලා හැම වෙලාවේම කල්පනා කරනවා ආයෝජනය කැඳවා ගැනීම තමයි අපේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්න තිබෙන එකම උපාය මාර්ගය කියලා. ඒක තමයි, අසාර්ථක වෙච්චම උපාය මාර්ගය. ආයෝජකයන් එයිද? එන්නේ නැහැ. ජනාධිපතිගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා ආයෝජකයන්ගෙන් පගා ඉල්ලනවා නම්, ආයෝජකයෝ එයිද? තව මොනවාද කියන්න තිබෙන්නේ? පගා දෙන්න බලාගෙන මොන ආයෝජකයාද එන්නේ? හොයලා බලන්න. ආපු හැම ආයෝජකයාගෙන්ම තමුන්නාන්සේලා කොමිස් ගත්තා.

කොළඹ අක්කර හතරක ඉඩමක් "ක්‍රිෂ්" සමාගමට විකිණීම සම්බන්ධව නඩුවක් තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක් කාගේ ගිණුම්වලටද ගියේ? කප්පම ගෙවන්න ආයෝජකයෝ එනවාද? මොකද, කප්පම ගෙවමින් ආයෝජකයන් එන්න තරම් අපේ රාජ්‍ය හරිම බලවත් රාජ්‍යයක්ද? අද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ගිහින් බලන්න, එහි තත්ත්වය. ඉතා වැදගත් ආයෝජන විශාල ප්‍රමාණයක් තිබෙනවා. නමුත්, ආයෝජකයන් රස්තියාදු කරනවා. කොහේද ආයෝජකයන් හමුවීමට යොදා ගන්නේ? ආයෝජකයන් හමුවන තැන මොකක්ද? ලංකාවේ තිබෙන ලොකුම හෝටලයේ තමයි ආයෝජකයන් රැට හමු වන්නේ. කාර්යාලයේදී නොවෙයි හමු වන්නේ. ලංකාවේ ඉතා හොඳ තැනක් වන ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ -World Trade Centre එකේ- ආයෝජන මණ්ඩලයේ කාර්යාලය තිබෙනවා. හැබැයි ආයෝජකයන් හමු වන්නේ කොතැනද? ආයෝජකයන් රැට හමු වන්නේ තරු පහේ හෝටලයේයි. ආයෝජකයා කන්න දෙන්නත් ඕනෑ, බොන්න දෙන්නත් ඕනෑ, හෝටල් ගාස්තු ගෙවන්නත් ඕනෑ. එහෙම ආයෝජන ගෙන එනවාද? එහෙම එන්නේ නැහැ. තමුන්නාන්සේලා හැම කෙනාම -විශාල ප්‍රමාණයක්- කප්පම්කරුවන් වෙලා තිබෙනවා. කප්පම් දෙන්න කැමැති නම් ආයෝජකයන්ට එන්න පුළුවන්. ඒ නිසා තමුන්නාන්සේලා කොච්චර කෑ ගැහුවත් ඔය ආයෝජකයන් එන්නේ නැහැ. ඒක මතක තබා ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි විශ්වාස කරනවා, ප්‍රාග්ධනයක් ඕනෑ බව; තාක්ෂණයක් ඕනෑ බව. නව නිෂ්පාදනයකට යන්න, නව ප්‍රාග්ධනයක් අවශ්‍යයි. ඒ නව නිෂ්පාදනය සඳහා නව තාක්ෂණය අවශ්‍යයි. ඒ නිසා ප්‍රාග්ධනය සපයා ගැනීමේ අවශ්‍යතාව වෙනුවෙන්, තාක්ෂණය සපයා ගැනීමේ අවශ්‍යතාව වෙනුවෙන් ණය, ආයෝජන අවශ්‍ය බව අපි පිළිගන්නවා.

හැබැයි ආයෝජන ඉතාම සාධාරණ ලෙස ඇති කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මා එයට උදාහරණයක් කියන්නම්. කන්තලේ සීනි සමාගම ගැනයි මා කියන්නේ. 2004 - 2005 කාලය තුළ මම ඉඩම් ඇමති. කර්මාන්ත ඇමති අනුර බණ්ඩාරනායක මහත්මයායි. මා අද ඒ සිද්ධිය ඔබතුමන්ලාට කියන්නම්. ඒ කර්මාන්තශාලාව පටන් ගන්න චීන ආයෝජකයෙක් ආවා. මම ගිහින් අනුර බණ්ඩාරනායක මහත්මයා හමු වුණා. එතුමා හමු වෙලා මම කිව්වා, "ආයෝජකයෙක් ඇවිල්ලා ඉන්නවා. මම ඉඩම් ඇමති. අක්කර 23,000ක ඉඩම් මා ළඟයි. ඔබතුමා කර්මාන්ත ඇමති. කර්මාන්ත ඔබතුමා ළඟයි. මොකද කරන්නේ?" කියා මම ඇහුවා. අනුර බණ්ඩාරනායක මහත්මයා මට කිව්වා, "අනුර, ඔබ කැමැති දෙයක් කරන්න." කියා. අපි වැඩේ පටන් ගත්තා. අපි එතුමාට නැවතත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා කිව්වා, වැඩේ පටන් ගන්න කියා. අපි චීන ආයෝජකයන් කණ්ඩායම ගෙන ආවා. ගෙන්වලා පළමුවන සාකච්ඡාවේදී අප ඒ අයට කිව්වේ මොකක්ද? "ඔයගොල්ලෝ එන්න. අපි ඔය ගොල්ලන්ගෙන් ඇල් වතුර වීදුරුවක්වත් බලාපොරොත්තු වන්නේ නැහැ." කියලායි කිව්වේ. "මෙතැන අක්කර 23,000ක් තිබෙනවා. මෙතැන factory එකක් තිබෙනවා. ගොවි පවුල් 11,000ක් සිටිනවා. ඒ ගොවි පවුල්වලට අක්කර 2 ගණනේ දී තිබුණා. ඔවුන් උක් වගා කළා. ඔවුන්ගේ ජීවන තත්ත්වය උඩට ගෙන එන්න ඕනෑ. හැබැයි ඒ අක්කර 23,000ට ගන්න වෙන්නේ කන්තලේ වැවේ වතුරයි." කියා අපි කිව්වා. කන්තලේ වැවේ වතුර පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද ඒ? කන්තලේ වැව ආශ්‍රිතව ත්‍රිකුණාමලයට පානීය ජලය දීම සඳහා අලුත් ව්‍යාපෘතියක් ගෙන ගියා. "අලුත් බිම්වලට වතුර ගෙනාවොත් කන්තලේ වැවේ වතුර ප්‍රශ්නයක් මතු වනවා. ඔබතුමන්ලාගේ ඒ ආයෝජනයත් එක්ක ඒ වතුර ප්‍රශ්නයට උත්තරයක් සොයන්න පුළුවන්ද?" කියා අපි ඇහුවා. එතුමා කිව්වා, "අපි ඒකට ලෑස්තියි." කියා. ඒ වෙලාවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හැටියට සිටියේ ගුණවර්ධන මහත්මයායි. අර රැවුල කරකවා සිටින මහත්මයායි. අපි එතුමා ගෙන්නලා ඇහුවා, "මොකක්ද කරන්න පුළුවන්?" කියා. එතුමා කිව්වා, "එතැන මහවැලි ගඟේ අතු ගඟක් තිබෙනවා, "කළු ගඟ" නමින්. ඒකෙන් ඒ ප්‍රදේශයට වතුර හරවන්න පුළුවන්" කියා. චීන ආයෝජකයා කිව්වා, "අපි ඒ ව්‍යාපෘතියට සල්ලි වියදම් කරන්නම්." කියා. එච්චරයි නේ කරන්න තිබෙන්නේ. එදා අපි ආණ්ඩුවෙන් එළියට ආවා. ඒ වැඩේ එතැනින් නතර වුණා. ඒක වෙනම දෙයක්. ආයෝජකයන් එහෙම ගෙන්වා ගන්න පුළුවන්. ඒ අය සමඟ අපේ පළමුවන සාකච්ඡාව වන්න ඕනෑ මොකක්ද? පළමුවන සාකච්ඡාව පටන් ගන්න ඕනෑ, 'අපි ඔය ගොල්ලන්ගෙන් ඇල් වතුර වීදුරුවක්වත් බලාපොරොත්තු වන්නේ නැහැ.' කියලායි. හැබැයි තමුන්නාන්සේලාගේ පළමුවන සාකච්ඡාව මොකක්ද? ඒ, 'අපට කීයක් දෙනවාද?' කියන එකයි. මෑතක කතා බහට ලක් වන සිද්ධියේ, factory එකේ යකඩ දෙන්නේ කීයටද? නමුත්, රුපියල් කෝටි 54ක් ඉල්ලනවා. ඔන්න වැඩේ පටන් ගන්නා විධිය. දැන් මොකක්ද සාකච්ඡාව? ආයෝජකයා කියනවා, "කෝටි 54ක් දෙන්න බැහැ. කෝටි 10ක් දෙන්නම්." කියා. එතකොට මේ පැත්තෙන් කියනවා, "නැහැ, කෝටි 50ක් ඕනෑ." කියා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
වැඩේ පටන් ගන්නත් ඉස්සර වෙලා ඉල්ලනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, වැඩේ පටන් ගන්නත් ඉස්සර වෙලා ඉල්ලනවා. ඉතින් ආයෝජකයන් ගැන තමුන්නාන්සේලා කතා කළාට වැඩක් තියෙනවාද? තමුන්නාන්සේලා හොඳ මහත්වරු නම් පළමුවන සාකච්ඡාවට වාඩි වනකොට කියන්න, 'අපි ඔයගොල්ලන්ගෙන් ඇල් වතුර වීදුරුවක්වත් බලාපොරොත්තු වන්නේ නැහැ. අපට අවශ්‍ය වැඩේ මේකයි.' කියා. එහෙම සාකච්ඡාව පටන් ගන්න. නමුත් තමුන්නාන්සේලා සාකච්ඡාව පටන් ගන්නේ කොතැනින්ද? 'අපේ ගණන කීයද?' කියන තැනින්. ගණන පටන් ගන්නේ කීයකින්ද? රුපියල් කෝටි 54කින්. මම ඒ ගැන සොයා බැලුවා. ඒ යකඩ එච්චර වටින්නේ නැති ලු. යකඩ වටිනා ගණනටත් වඩා වැඩියෙන් commission එක ඉල්ලලා. ඉතින් ඒ ගණන බස්සලා බස්සලා, රුපියල් කෝටි 10 දක්වා. මා නැවතත් අහන්නේ, 'රුපියල් කෝටි 10ට යකඩ දෙන්නම් කියා එකඟ වන්නේ කවුද?' කියායි. රුපියල් කෝටි 10ට යකඩ දෙන්නම් කියා එකඟ වන්නේ දැව සංස්ථාවේ සභාපතියි, ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩල

[ගරු අනුර දිසානායක මහතා]

ප්‍රධානියායි. මම අහනවා, කන්තලේ සීනි සමාගමේ යකඩ දෙන්න දැව සංස්ථාවේ සභාපතිට තිබෙන අයිතිය මොකක්ද කියා. ඔහු කිව්වා නම්, "හබරණ කැලේ ලී ටිකක් දෙන්නම්." කියා, ඒක පිළිගන්න පුළුවන්. හේතුව, ඔහු දැව සංස්ථාවේ සභාපතියි. එතුමා කොහොමද, කන්තලේ සීනි සමාගමේ යකඩ දෙන්නම් කියන්නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු මන්ත්‍රීතුමා, මා හිතන්නේ ඒක වුණේ ඔහු ජනාධිපති කාර්ය මණ්ඩලයේ තනතුරට පත් වෙන්න ඉස්සර වෙලායි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ඔව්. ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් හැටියට සිටියදීයි. මම දන්නවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ව සිටි කාලයේදීයි ඔය වැඩේ ලෑස්ති කරලා තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් කාලයේ. ඒකත් හරි. එතකොට ඔහු ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්. ඊට පසුව කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
කවුරුවත් ඕක දැනගෙන සිටියේ නැහැ. උන්නැහෙ වැඩේට සම්බන්ධ වෙලා සිටියේ- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
උන්නැහේ ගෙන්නුවා, කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට. ඊට පසුව මොකද වුණේ? ඒ දෙදෙනාට එහෙම කරන්න තිබෙන බලය මොකක්ද? හිටපු ලේකම්ට ඉඩම් දෙන්න බැහැ නේ. දැන් ඉඩම් දෙන්න ඕනෑ, දැනට සිටින ලේකම්.

දැව සංස්ථාවේ සභාපතිට යකඩ දෙන්නත් බැහැ නේ. එහෙම නම්, "මේ වැඩේ කරලා දෙන්නම්" කියලා කවුරු හෝ කියන්න ඕනෑ. මොකද, කවුරු හෝ කෙනෙක් කෝටි 10ක් අතට දෙන්න නම්, වැඩේ කෙරෙනවා කියලා ෂුවර් වෙන්න ඕනෑ. එහෙම සහතිකයක් දෙන්නේ කවුද? මේ පරීක්ෂණ යන්න ඕනෑ එතැනටයි. සහතිකය දුන්නේ කවුද කියන එකයි හොයන්න ඕනෑ. සහතිකය දුන්නා විතරක් නොවෙයි, කෝටි දෙකක් හම්බ වුණා. ඒ කෝටි දෙක වාහනය ඇතුළේ තියාගෙන ගණන් කළේ ඇයි? දෙන්නා ගියා; කෝටි දෙකක් හම්බ වුණා; තව අටක් ගන්නත් තිබෙනවා. ගත්තු හැටියේ යන්න එපා යැ. ඇයි, ගණන් කළේ? අපි හිතමු, ලක්ෂ දෙසීයෙන් ලක්ෂ දහයක් අඩු වෙලා තිබුණා කියලා. එහෙම නම් ඊළඟට කියන්න පුළුවන් නේ, "උඹ දහයක් අඩුවෙන් දුන්නේ, දැන් දෙන්නේ නැහැ" කියලා. ඇයි, එතැනදී ගණන් කළේ? ගණන් කළේ, තුන්වන පාර්ශ්වයකට ඇත්ත ගණන සහතික කරන්න ඕනෑ නිසයි. කවුරු හෝ මට කියනවා නම්, "මගේ හිතවතෙකුට ලක්ෂයක ණය මුදලක් දීලා තිබෙනවා. ඒ ලක්ෂය දෙයි, ඔබතුමා ඒ පැත්තේ යනවා නම් ඒක අරගෙන ඇවිල්ලා මට දෙන්න" කියලා, ඔහු ලක්ෂය මගේ අතට දෙනකොට මම මොකද කරන්නේ? මම වෙන කවුරුවත් වෙනුවෙන් නේ ඒ මුදල ගන්නේ. මම එතැන ලක්ෂයක් තිබෙනවාද කියලා ගණන් කරනවා. ඇයි? මම අර පුද්ගලයාට ඒක ගැන සහතික වෙන්න ඕනෑ නිසා. එහෙම නම් ඒ දෙන්නා කාර් එක ඇතුළේ ඉඳගෙන සල්ලි ගණන් කළේ මොකටද? කෝටි දෙක නේ. බැලුවා; අරගෙන යන්න තිබුණා. නිකම් හම්බ වෙන පගාව නේ. "නිකම් හම්බ වෙන අශ්වයාගේ දත් ගණන් කරනවා වාගේ" ඇයි, එතැනදී ගණන් කළේ? එතැනදී ගණන් කළේ, බඩු ගණනට තිබුණා කියලා තුන්වන පාර්ශ්වයට සහතිකයක් දෙන්න ඕනෑ නිසයි. ඒ නිසා තමයි ගණන් කළේ. ඒ තුන්වන පාර්ශ්වය කවුද කියලායි මම අහන්නේ.

තමුන්නාන්සේලා ආයෝජන පිළිබඳව ඉදිරිපත් කරන මේ දැක්මවල් මුළුමනින්ම අසාර්ථකයි. අවශ්‍ය නම් අපි විවාදයක් පවත්වමු. එක එක ආයෝජනවල commission ගියේ කොහාටද, ඒවායේ ප්‍රතිලාභය මොකක්ද, ඇත්ත වියදම මොකක්ද, වියදම වර්ධනය වුණේ කොහොමද කියන මේ හැම එකක්ම හොයන්න ඕනෑ. ඒ සඳහා ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරන්න කියලා මා කියනවා. ඒ වෙනුවෙන් අපි මේ සාකච්ඡාව ඉස්සරහට ගෙන යමු. නව ලිබරල්වාදය කියන ආර්ථික ක්‍රියා මාර්ගය ඇතුළේම තමයි මේ වංචා, දූෂණ තිබෙන්නේ. ඒ නිසා තමයි තමුන්නාන්සේලා අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තියට අපේ විරුද්ධතාව තිබෙන්නේ. කොළ පාට නව ලිබරල්වාදයට විරුද්ධ වෙන, කුරහන් පාට ලිබරල්වාදය බදා ගන්නා ප්‍රතිපත්තියක් අපට නැහැ. කොළ පාටින් ආවත්, කුරහන් පාටින් ආවත් ඒ ප්‍රතිපත්තිය වැරදි ප්‍රතිපත්තියක්. ඒ නිසා එයට අපේ රටේ ආර්ථිකය තව දුරටත් ඉදිරියට ගෙන යන්න බැරි බව ප්‍රකාශ කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු සභානායකතුමනි, සභාවේ වැඩ කටයුතු continue කරන්න පුළුවන්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තව කථිකයින් කී දෙනෙක් ඉන්නවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
I think there are two or three more speakers to speak.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, how long will they take?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
They will take about one hour.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම නම් අපි lunch break එක නැතුව සභාවේ කටයුතු කරගෙන යමු; then, we will continue the Business of the House without the lunch break.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! It is proposed that the Business of the House be continued without the lunch break. Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාවක් දෙනවාද, කරුණු දෙකක් නිවැරදි කරන්න?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Eran Wickramaratne.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ කථාවේ සියලු කරුණු නොවෙයි, ඉන් එකක්-දෙකක් නිවැරදි කිරීමට පමණයි මම මේ අවස්ථාව ගත්තේ.

2016 වසරේදී විදේශ ආයෝජනය ඩොලර් මිලියන 800යි. 2017 දෙසැම්බර් වන විට එය ඩොලර් මිලියන 1,900කට වැඩි වෙලා තිබෙනවා. ඒක එක කරුණක්.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඊළඟට ඔබතුමා අල්ලස්, දූෂණ ගැන ප්‍රශ්න කළා. [බාධා කිරීමක්] ඒකේ 300ක් තිබෙනවා. ඒ අවුරුද්දේ ආවේ 300යි. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, වරායේ ප්‍රමාණය, ඒකට ආවේ ඩොලර් 300ක්. ඒක අඩු කළත් දෙගුණයක් වෙලා තිබෙනවා කියන එක තමයි මම මෙතැනදී පැහැදිලි කරන්න හැදුවේ.

දෙවන කාරණය මේකයි. ඔබතුමා අල්ලස්, දූෂණ ගැන කථා කළා. මම හිතන විධියට ඒ අය නම් කළොත් හොඳයි. ඒ වාගේම ඒ ගැන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් කියන්න. අපේ රජයේ හැම ඇමති කෙනෙක්ම කප්පම් ගන්න ඇමතිවරු නොවෙයි කියන එකත් මා කියන්න ඕනෑ. ආයෝජනයට එනකොට වතුර වීදුරුවක් පමණයි මුදල් අමාත්‍යාංශයෙන් දෙන්නේ කියන කාරණයත් මා සඳහන් කරන්න ඕනෑ.

ඔබතුමා කිව්වා, විදේශ වෙළෙඳාම පුළුල් කරන අතරේදී දේශීය කර්මාන්තවලට සිදු විය හැකි හානි ගැන. ඔබතුමා කියපු කාරණය මමත් පිළිගන්නවා. ඩොලර් හතකට චීනය mobile phone එකක් නිෂ්පාදනය කරනවා නම්, ඒක ඩොලර් 6.50කට ලංකාවට විකුණනවා නම්, ඒ ක්‍රියාවලිය වැරදියි. ඒ ක්‍රියාවලිය වැරදි නිසා තමයි අපි මාර්තු මාසයේ පනත් කෙටුම්පත් දෙකක් සම්මත කර ගත්තේ. ඉන් එකක් තමයි ආරක්ෂණ පියවර පනත. අනෙක් එක තමයි ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත. ඒ පනත් යටතේ අපට දැන් ක්‍රියාත්මක කරන්න පුළුවන්, - [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒකට උත්තරයක් දුන්නේ, ඒක කිව්වේ නැති නිසා. ඒ දේ නතර කරන්න අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්.

ඔබතුමන්ලාගෙන් ප්‍රශ්නයක් අහමින් මම අවසන් කරන්නම්. මේ රටේ ඉන්න දුප්පත් ජනතාවට අපි සින්නක්කර ඔප්පු දෙනවාට ඔබතුමන්ලාගේ විරුද්ධතාවක් තිබෙනවාද කියන එකත් දැනගන්න කැමැතියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔය ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න මට පොඩි වෙලාවක් දෙන්න.

1985 ලෝක බැංකුවේ නියෝජිතයන් දෙදෙනෙක් ලංකාවට ආවා. ඒ දෙදෙනා ඉදිරිපත් කරපු වාර්තාව මා සතුව දැන් තිබෙනවා. ඒක ටිකක් පරණයි; 1985 එකක්. අපේ රටේ ඉඩම් වෙළෙඳ පොළ ලිහිල්කරණය කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් ඉදිරිපත් කළා. මොකද, අපේ රටේ ඉඩම් වෙළෙඳ පොළ ලිහිල්කරණය වෙලා නැහැ. ඒ කියන්නේ, ඕනෑම කෙනෙකුට ඉඩමක් මිලදී ගන්නත්, ඕනෑම කෙනෙකුට විකුණන්නත් බැහැ. ඒකට හේතුව තමයි, අපේ රටේ ඉඩම් සම්බන්ධයෙන් නීති විශාල ප්‍රමාණයක් තිබීම.

පළමු කාරණය, විහාර දේවාලගම් පනතට අයිති ඉඩම් තිබීම. ගරු රාජ්‍ය ඇමතිතුමා දන්නවා, හඟුරන්කෙත පැත්තට ගියත්, මාළිගාවට අයිති ඉඩම් තිබෙනවා. වැල්ලවාය, තණමල්විල පැත්තේ, දේවාලයට අයිති ඉඩම් තිබෙනවා. ඒවා විහාර දේවාලගම් පනත යටතේ තිබෙන ඉඩම් නිසා ඉඩම් වෙළෙඳ පොළට ඇතුළත් වෙන්නේ නැහැ. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා.

දෙවැනි ප්‍රශ්නය විධියට ඔවුන් මේ කරුණ කියනවා. හම්බන්තොට කුඹුරු ඉඩම්වලින් සියයට 51ක් අඳ ඉඩම්. මේ අඳ ඉඩම් අඳ අයිතිකරුවාට විකුණන්නත් බැහැ; ඉඩම් හිමිකරුවාට විකුණන්නත් බැහැ. එතැනත් බාධාවක් තිබෙනවා. ඊළඟට තිබෙනවා, අපේ රටේ පරම්පරාවෙන් එන ඉඩම්. අනුරාධපුර පැත්තේ ඉඩම් තිබෙනවා, එක කන්නයක් ලොකු අක්කා වගා කරනවා; අනෙක් කන්නය පොඩි මල්ලි වගා කරනවා; ඊළඟ කන්නය අයියා වගා කරනවා. ඒ ඉඩම අයියාට විකුණන්නත් බැහැ; අක්කාට විකුණන්නත් බැහැ; මල්ලිට විකුණන්නත් බැහැ. එතැනත් ඉඩම්වල barrier එකක් තිබෙනවා. මහවැලි ව්‍යාපාරයෙන් අක්කර දෙකහමාරේ ඉඩම දෙන කොට කොන්දේසියක් දැම්මා, "අක්කර දෙකහමාරේ ඉඩම අක්කර එකහමාරකට වඩා අඩුවෙන් කැබලි කරන්න බැහැ" කියලා. අක්කර දෙකහමාරේ ඉඩමෙන් අක්කර එකහමාරකට වඩා අඩුවෙන් කැබලි කරන්න බැහැ කියන්නේ, ඒ ඉඩම කැබලි කරන්නම බැහැ. ඒ කොන්දේසිය දැම්මේ, ඒ ඉඩම් පුරවැසියන් අතේ තියන්නයි.

දැන් අපි අනුරාධපුරේ පැත්තට ගිහිල්ලා බැලුවොත් පෙනෙනවා, ඔවුන්ගේ ගේ කුඩායි; හරි වැසිකිළියක් නැහැ; බැංකුවට ණයයි. හැබැයි, ඔහු සතුව ඉඩමක් තිබෙනවා. අනෙක් දේපොළ කිසිවක් නැති කෙනා අතේ ඉඩමවත් ඉතිරි වුණේ

[ගරු අනුර දිසානායක මහතා]

මොකක් නිසාද? ඒ, ඉඩම් වෙළෙඳ පොළ ලිහිල්කරණය නොවීම නිසායි. ඔහුට ගේ හරියට නැහැත්, වැසිකිළියත් හරියට නැහැත්, බැංකුවට ණය වුණත් ඔහුගේ කුඹුර තිබෙනවා. ඔහු අතේ කුඹුර ඉතුරු වුණේ, ඔහුට කුඹුර විකුණන්න බැරි විධියට ඉඩම් නීතියේ තිබුණු බාධාවන් - barriers - නිසායි. ඒ නිසා ආර්ථිකය ශක්තිමත්භාවයකට ගෙනෙන්නේ නැතිව, ඉඩම් වෙළෙඳ පොළ ලිහිල් කිරීම හරහා මේ ඉඩම් කොම්පැනි අතට පත් වීමේ අනතුර තිබෙනවාය කියන එක අපි පිළිගන්නවා.

[පි.ප. 12.26]

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் மதுவரிக் கட்டளைச் சட்டத்தின்கீழான அறிவித்தல் மற்றும் ஒதுக்கீட்டுச் சட்டத்தின் கீழான தீர்மானம் தொடர்பில் எனது கருத்துக்களையும் பதிவு செய்வதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

வட இலங்கையின் சுதேச வளங்களில் ஒன்றாக எமது பண்பாட்டுக் காலத்துடன் அடையாளப்படுத்தப்பட்டுள்ள பனை வளத்தினை நம்பிய நிலையில், நேரடி மற்றும் மறைமுக தொழில் நடவடிக்கைகளில் வடக்கு, கிழக்கு மாகாணங்களில் பல்லாயிரக் கணக்கான குடும்பங்கள் வாழ்ந்து வருகின்றன.

எமது பகுதிகளின் வளங்களைப் பொறுத்தவரையில், விவசாயம், கடற்றொழில் போன்ற இரு பிரதான தொழில் துறைகளுக்கு அடுத்த நிலையில், பனை சார்ந்த உற்பத்திகளின் மூலமாகத் தங்களது ஜீவனோபாயத்தினைக் கொண்டு நடாத்துகின்ற மக்களே பெருமளவில் வாழ்ந்து வருகின்றனர். விவசாயத்துறையினை எடுத்துக்கொண்டால், தொடரும் காலநிலை மாற்றங்களால் எமது விவசாய மக்கள் தொடர்ந்தும் பாதிக்கப்பட்ட நிலையிலேயே வாழ்ந்து வருகின்றனர். அத்துடன், காட்டு மிருகங்களின் தொல்லைகளும் எமது மக்களின் விவசாயச் செய்கைகளை அடிக்கடி பாதிப்படையச் செய்கின்றன.

கடற்றொழிலை எடுத்துக்கொண்டால், இந்தியக் கடற்றொழிலாளர்களது எல்லை தாண்டியதும், தடைசெய்யப்பட்ட உபகரணங்களைக் கொண்டதுமான கடற்றொழில்கள் மற்றும் அத்துமீறியதும், தடைசெய்யப்பட்ட உபகரணங்களைக் கொண்டதுமான பிற மாவட்டக் கடற்றொழிலாளர்களின் கடற்றொழில்கள் காரணமாக வடக்கு மாகாணக் கடற்றொழிலாளர்களால் நிம்மதியாகவும் சுதந்திரமாகவும் கடற்றொழில் செய்ய இயலாத நிலைமைகள் தொடர்ந்து இருந்து வருவதுடன், எமது கடற்றொழிலாளர்களது தொழில் உபகரணங்கள் அழிக்கப்பட்டும் எமது கடல் வளம் சுரண்டப்பட்டும் அழிக்கப்பட்டும் வருகின்றன.

இந்த நிலையில் எமது மக்களின் பிரதான வாழ்வாதாரங்களாக எமது பகுதியிலுள்ள மண் மற்றும் கடல் வளங்களால், எமது மக்களுக்கு உரிய வாழ்க்கையினைப் போதியளவு வழங்க இயலாத நிலை காணப்படுகின்றது. இந்த இரு தொழில் துறைகளும் சாராத மக்களில் பலருக்கு வாழ்வாதாரத்திற்குக் கைகொடுத்து உதவும் ஒரு துறையாகவே பனை வளம் காணப்பட்டது. இன்று இத்துறையும்கூட எமது மக்களுக்கு தூரமாக்கப்பட்ட ஒரு துறையாகிப் போகின்ற நிலைமையும் காணப்படுவதுதான் எமக்கு மிகுந்த வேதனையை அளிப்பதாக இருக்கின்றது.

கடந்த காலங்களில் எமது பகுதிகளில் பல்வேறு கைத்தொழில்துறைகள் செயற்பட்டு வந்துள்ளன. யுத்தம் காரணமாக அத்துறைகள் அனைத்தும் அழிந்துவிட்ட நிலையில், அவற்றை மீளக் கட்டியெழுப்புவதற்கான முயற்சிகளும் போதிய செயற்றிறனுடன் முன்னெடுக்கப் படாதுள்ள நிலையில், இருக்கின்ற வாழ்வாதார துறைகளும் பல்வேறு தடைகளால் உரிய பயன்பாடுகளை எமது மக்களுக்கு தராத நிலையில், எமது மக்கள் தங்களது வாழ்வாதாரங்களுக்காக எங்கு போய், என்ன செய்ய முடியும்? என்ற கேள்வியையே முன்வைக்க வேண்டியிருக்கின்றது.

1971ஆம் ஆண்டின் 46ஆம் இலக்கத் தென்னை அபிவிருத்திச் சட்டத் திருத்தத்தின் மூலமாக, 1975ஆம் ஆண்டின் 24ஆம் இலக்கத் திருத்தச் சட்டத்தின் மூலமாகப் பனை அபிவிருத்திச் சபையானது சட்ட ரீதியாக உருவாக்கப்பட்டதன் நோக்கமானது, "கற்பக தருவான பனையையும் பனைத் தொழிலையும் பாதுகாத்து, அதன் மேம்பாட்டிற்காக பாடுபடுவது" என உள்ளபோதிலும், கடந்த கால யுத்தம் காரணமாக எமது பகுதிகளில் பெருந்தொகையான பனை மரங்கள் அழிக்கப்பட்டுள்ளன. அதுமட்டுமல்ல, பனை சார்ந்த தொழில்துறைகளில் ஈடுபட்டு வந்திருந்த மக்கள் இடப்பெயர்வுகளுக்கும் பல்வேறு இழப்புகளுக்கும் முகங்கொடுக்க நேரிட்டிருந்தது. யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டதன் பின்னர், எமது மக்கள் போதியளவு வாழ்வாதார வசதிகளின்றிய நிலையிலேயே மீளக் குடியேற வேண்டிய நிலைமைகள் ஏற்பட்டிருந்தன. இன்றும்கூட இத்தகைய நிலைமைகளில் போதியளவு மாற்றங்கள் ஏற்படாமலேயே இருப்பதையும் இங்கு சுட்டிக்காட்டியே ஆக வேண்டும்.

இத்தகைய நிலையில், இன்று இந்த நாட்டின் பொருளாதார நிலைமையை எடுத்துக் கொண்டாலும் திருப்தி தரக்கூடியதாக இல்லை. அமெரிக்க டொலரின் இலங்கை ரூபாவின் பெறுமதி இன்று 159 ரூபாவினை எட்டியுள்ளது. அதேநேரம் நிலையான வருமானத்தினை எட்டக்கூடிய உற்பத்திகளின் வறுமை நிலைக்கு நாடு முகங்கொடுத்து வருவதும், முதலீட்டாளர்களின் தடுமாற்றங்களும் இல்லாமல் இல்லை. எனவே, இத்தகையதொரு நிலைமை நாட்டில் நிலவுகின்ற காலகட்டத்தில் எமது பகுதிகளில் தங்களது வாழ்வாதாரங்களை ஈட்டிக் கொள்வதற்கு இருக்கின்ற வாய்ப்புகளில் தடைகளை ஏற்படுத்தக் கூடாது என்பதையே நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

அந்த வகையில், பனை மூலமான கள் உற்பத்தி தொடர்பில் அண்மையில் வெளியிடப்பட்டுள்ள வர்த்தமானியானது எமது மக்களுக்கு மிகவும் வேதனையைக் கொண்டு தருவதாகவே இருக்கின்றது. குறிப்பாக, இந்த வர்த்தமானியின் நோக்கம் என்ன? என்பதுவே பலருக்கும் புரியாமல் இருக்கின்றது. "கித்துள் மரத்தைத் தவிர, கள்ளை உற்பத்திச் செய்யும் மரம் எதிலும் கள் இறக்கப்படுதலாகாது" என்றும், "கித்துள் மரத்தைத் தவிர, வேறு ஏதேனும் மரத்திலிருந்து கள் எடுக்கப்படுதல் அல்லது கீழிறக்கப்படுதல் ஆகாது" என்றும் இந்த வர்த்தமானி தெரிவிக்கின்றது. இது எமது மக்களின் வாழ்வாதாரங்களைக் கேள்விக்குறியாக்கியிருப்பதை நான் ஏற்கனவே பல தடவைகள் இந்தச் சபையிலே எடுத்துக் கூறியிருக்கின்றேன். அதுமட்டுமல்லாது, மேன்மைதங்கிய ஜனாதிபதி அவர்களினதும் கௌரவ பிரதமர் அவர்களினதும் அவதானத்திற்கும் கொண்டு வந்துள்ளேன்.

எமது நாட்டைப் பொறுத்தவரையில், பனை மற்றும் தென்னை மரங்களே பிரதான கள் உற்பத்தி செய்யும் மரங்களாகக் காணப்படுகின்றன. கித்துள் மரம் என்பது ஒரு காலத்தில் தென் பகுதி உள்ளிட்ட மலையகப் பகுதிகளில் கள் இறக்குவதற்குத் தடை செய்யப்பட்ட மரமாகவே கணிக்கப்பட்டு வந்துள்ளது. நான் பாரம்பரியக் கைத்தொழில் கள் மற்றும் சிறு தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சராகப் பொறுப்பேற்றிருந்த காலத்தில், கித்துள் சார்ந்த தொழில் துறையும் எனது அமைச்சின்கீழ் இருந்ததன் காரணத்தினால், கித்துள் பாணி மற்றும் கருப்பட்டி உற்பத்தித் துறையினை மேம்படுத்தும் நோக்கில் பல்வேறு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டபோது, கித்துள் மரங்களில் சீவல் தொழிலில் ஈடுபடுகின்றவர்களைக் காவல் துறையினர் கைது செய்வதாக அடிக்கடி முறைப்பாடுகள் கிடைத்த நிலையில், உரிய தரப்பினர்களுடன் கலந்துரையாடி, அத்தடையினை நாம் நீக்கி இருந்தோம். தற்போதைய நிலையில்கூட கித்துள் சார்ந்த கள் உற்பத்திகள் இந்த நாட்டில் எந்தளவிற்குப் பெருமளவில் முன்னெடுக்கப்படுகின்றன? என்பது கேள்விக்குரிய விடயமாக இருப்பதாக எண்ணக்கூடிய நிலைமையே காணப்படுகின்றது.

தென்னை மரங்கள் கள் உற்பத்திக்காகப் பயன்படுத்தப் படுவதாகக் கூறப்படுகின்ற நிலையிலும், இயற்கை தென்னை வளமற்ற செயற்கைக் கள் உற்பத்திகளே மிகவும் அதிகளவில் சந்தையில் இருப்பதாகவும், இவ்வகைக் கள் உற்பத்திகள் அதிக தீங்கினை ஏற்படுத்தக்கூடியன என்றும், இவ்வகை உற்பத்திகள் அவற்றைப் பயன்படுத்துகின்ற மக்களுக்குப் பாரிய தாக்கங்களை ஏற்படுத்தி வருவதாகவும் சமூக ஆர்வலர்கள் தெரிவித்து வருகின்றனர்.

இது ஒரு புறமிருக்க, எமது மக்கள் பல வருடகாலமாகக் கூட்டுறவு அமைப்பில் இயங்கிய நிலையில், எவ்விதமான செயற்கைக் கலப்புகளுமின்றிப் பனை சார்ந்த தொழிற் துறையை மேற்கொண்டு வருகின்றனர். அதுவும், மதுவரித் திணைக்களத்தின் கண்காணிப்பின் கீழ்ச் சட்ட ரீதியாக மேற்கொள்ளப்பட்டு வருகின்ற எமது மக்களின் பழைமைமிக்க தொழில் துறையான பனங்கள் உற்பத்தி சார்ந்து இத்தகைய தொரு திருத்தம் கொண்டு வரப்படுவது எந்தவகையில் நியாயமானதாகும்? என்ற கேள்வி எழுகின்றது. எனவே, மேற்படி வர்த்தமானி அறிவித்தல் தொடர்பில் மீள் பரிசீலனை மேற்கொள்ளப்பட்டு, எமது பகுதிகளில் பனை சார்ந்த தொழிற்துறைகளை நம்பி வாழுகின்ற மக்களது வாழ்வாதாரத் திற்குத் தீங்கு விளைவிக்காத வகையிலான பொறிமுறைகள் எட்டப்பட வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், பனங்கள் உற்பத்தியில் ஈடுபடுகின்றவர்கள் தனியார்த்துறை சார்ந்து மேற்படி தொழிற்துறையை மேற்கொள்வதில்லை. இத்தொழி லாளர்கள் கூட்டுறவு அடிப்படையிலேயே இத்தொழிற் துறையினை மேற்கொண்டு வருகின்றனர். இதில் ஈட்டப் படுகின்ற வருமானங்களில் கணிசமான பகுதி அம்மக்களது நலன்புரி நடவடிக்கைகளுக்காகவும் அபிவிருத்திப் பணிகளுக் காகவும் பயன்படுத்தப்பட்டு வருகின்றது. எனவே, இதனை ஒரு தனியார் துறை சார்ந்த உற்பத்தி என்ற கண்ணோட்டத்துடன் பார்க்கக் கூடாது என்பதையும் இந்தச் சந்தர்ப்பத்தில் வலியுறுத்திக்கூற விரும்புகின்றேன். இம்மக்களது வாழ்க்கை நிலையினை உயர்த்துவதற்காக நாம் கடந்த காலங்களில் பல்வேறு முயற்சிகளை எடுத்திருந்தோம். இன்னும் அத்தகைய முயற்சிகள் தேவைப்படுகின்ற நிலையில், இந்த அரசு சில விடயங்களில் மனிதாபிமானத் தன்மையுடன் நடந்துகொள்ள வேண்டும் என்ற கோரிக்கையையே என்னால் தற்போது முன்வைக்க முடிகின்றது.

அத்துடன் இன்று இங்கே ஒதுக்கீட்டுச் சட்டத்தின் கீழான தீர்மானத்தின்கீழ் கல்வி வெளியீட்டுத் திணைக்களம் தொடர்பிலும் கட்டளை கொண்டு வரப்பட்டுள்ளது. இம்முறை கல்வியாண்டுக்கான பாடசாலைப் புத்தகங்கள் பலவும் இதுவரையில் கிடைக்கப்பெறாத நிலை காணப்படுவதாக எமது பகுதிகளில் ஒரு முறைப்பாடு எழுந்துள்ளது சம்பந்தமாக இச்சந்தர்ப்பத்தில் நான் குறிப்பிட விரும்புகின்றேன். குறிப்பாக, ஆசிரியர்களுக்கான வழிகாட்டி நூல்கள் தொடர்பிலும் இந்த முறைப்பாடு எழுப்பப்படுகின்றது. அதேநேரம், இலவசப் பாடநூல்களில் அதற்கான விலைகளும் தற்போது குறிக்கப்படுவதாகவும், இதனால் எதிர்காலத்தில் இந்த இலவசப் பாடநூல்கள் விற்பனைக்கு விடப்படுமோ? என்ற சந்தேகங்கள் எழுந்துள்ளதாகவும் மக்கள் மத்தியில் ஓர் அச்சம் நிலவுகின்றது. எனவே, இந்த விடயங்கள் தொடர்பிலும் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் அவதானத்தைச் செலுத்தவேண்டும் எனக்கூறி, வாய்ப்புக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Leader of the House?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, there are five more speakers. So, we will suspend the Sitting for lunch.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Sitting is suspended till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අද හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. (Dr.) Bandula Gunawardane.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශය ඉදිරිපත් කර තිබෙන මෙම නියම පිළිබඳව ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් අදහස් දක්වන මේ වෙලාවේ පළමුවෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. මේ වනවිට ඉතා වැදගත්කමක් උසුලන ප්‍රශ්න රාශියක් මුදල් අමාත්‍යාංශය සම්බන්ධයෙන් මතු

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

වෙලා තිබෙනවා. එයට ප්‍රධාන හේතුව, අපේ රටේ තිබෙන අමාත්‍යාංශ අතරින් රටේ මුදල් ක්‍රමය පිළිබඳ මෙහෙයවීම් කටයුතු කිරීමේ බලධාරී ආයතනය මුදල් අමාත්‍යාංශය වීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවට අනුව, මුදල් පිළිබඳ සම්පූර්ණ බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුව විසින් පවරන ලද බලතල මත, රජයේ ආදායම් රැස් කිරීමේ, වියදම් කිරීමේ සහ සමස්ත ආර්ථික කළමනාකරණයෙහි විශාලතම වගකීම උසුලන ආයතන වන්නේ මුදල් අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයයි. මුදල් අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා මහ බැංකුවත් කියන දෙකම පොදු මහ ජනයාගේ විශ්වසනීයභාවය උපරිම ලෙස දිනා ගතයුතු ආයතන දෙකක් බවට පත් වෙනවා. මක්නිසාදයත්, සමස්ත ලාංකීය ජනතාව අතේ පවතින එදිනෙදා ගනුදෙනු සඳහා යොදා ගන්නා ව්‍යවහාරයේ පවතින කාසි හා නෝට්ටු නිකුත් කිරීම පිළිබඳ ඒකාධිකාරී බලය තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවටයි. ඒ නිසා, මහ බැංකුව සම්පූර්ණ මහජන විශ්වසනීයභාවය මත තමයි රඳා පවතින්නේ. සාම්ප්‍රදායිකව වෙනත් රටවල මහ බැංකුවක් යටත් වන්නේ මුදල් අමාත්‍යාංශයටයි. මුදල් අමාත්‍යාංශයේ ලේකම් නිල බලයෙන් මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සාමාජිකයකු බවට පත් වෙනවා.

මහින්ද රාජපක්ෂ මැතිතුමා හිටපු මුදල් අමාත්‍යවරයා හා ජනාධිපතිවරයා වශයෙන් 2015දී තමුන්නාන්සේලාට මේ රට භාර දෙන විට ආණ්ඩුවකට මුහුණ දෙන්න තරම් කිසිම අභියෝගයක් නැති රටක් තමයි භාර දුන්නේ. ඊට කලින් හිටපු ඕනෑම මුදල් අමාත්‍යවරයෙකුට උතුරු-නැඟෙනහිර දෙපළාතේ පැවතුණ යුද ගැටුම් කරණකොටගෙන යුද්ධය වෙනුවෙන් ඉතා විශාල සම්පත් ප්‍රමාණයක් -මානව සම්පත් හා භෞතික සම්පත්- කැප කරන්න සිද්ධ වුණා. 2009න් පසු, එල්ටීටීඊ යුද ගැටුම් නිම වුණාට පසු රටේ සාමය ඇතිවීම තුළ, මේ රජය බලයට පත්වන විට ජේවීපෙ/දෙවුන්දර තුඩුව දක්වා තිබෙන නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව, ඵලදායක ලෙස කිරීමේ අවස්ථාව තිබුණා; යුද අර්බුදයක් තිබුණේ නැහැ. ලෝක ඉතිහාසයේ දරුණුතම ඛණිජ තෙල් අර්බුදයට මුහුණ දුන්නේ මහින්ද රාජපක්ෂ රජයයි. එදා බොරතෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 127ක් වෙනතෙක් ඉහළ යෑමෙන් ලෝකය තෙලෙන් බැදුණා. 2015 වර්ෂයේදී මේ රජය බලයට පත් වන විට බොරතෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 36 දක්වා පහත වැටීමෙන් ඛනිජ තෙල් අර්බුදයක් නැති රටක් තමයි තිබුණේ. එදා අපේ රජය කාලයේ අවුරුදු 30කට පසුව ඇති වුණ ලෝක ආහාර අර්බුදයක් තිබුණා. මුළු ලෝකයේම ජනතාවට කන්න ආහාර තිබුණේ නැහැ. සාගතයෙන් මිනිසුන් මිය ගියා. නමුත්, එවැනි තත්ත්වයක් -ආහාර අර්බුදයක්- මේ රජයට ඇති වුණේ නැහැ. එදා අපේ රජය කාලයේ 2007 වසරේ සිට මූල්‍ය අර්බුදයක් තිබුණා. ඒ මූල්‍ය අර්බුදය යටතේ mutual banks කඩා වැටිලා, ලීමන් බ්‍රදර්ස් බංකොළොත් වෙලා, කාඩ් කුට්ටමක් පෙරළෙනවා වාගේ මුළු ලෝකයේම මුදල් ක්‍රමය කඩා වැටෙමින් තිබුණා. නමුත්, එහෙම ප්‍රශ්නයක් මේ රජයට තිබුණේ නැහැ.

එදා අපේ රජයට දැවැන්ත ණය බරක් තිබුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා රජය භාර ගන්න විට දළ දේශීය නිෂ්පාදනය සියයට සියය නම්, නොපිය වූ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 103ක් තිබුණා. ඒ ණය අර්බුදය භාර ගත්ත රාජ්‍ය නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමායි. තමුන්නාන්සේලාට එවැනි ණය අර්බුදයක් තිබුණේ නැහැ. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 73 වෙනතෙක් ණය ගෙවලායි තිබුණේ. නිදහස ලැබුණු දා සිට මේ රටේ අධිවේගී මාර්ගයක් හැදුණේ නැහැ, විදුලි බලාගාර හැදුණේ නැහැ, විදුලිය කපන රටක්, විදේශ ආයෝජන එන්නේ නැති රටක් විධියට ආර්ථිකය එක තැන ලැග සිටීමේ අර්බුදයක් එදා රජයට තිබුණා. නමුත්, තමුන්නාන්සේලා මේ ආණ්ඩුව භාර ගන්නා විට මුළු රටම වැඩ බිමක් ලෙසයි තිබුණේ. මුළු රටේම සියලු ජනයා -උතුරු-නැඟෙනහිර ඇතුළුව- උදේ, දවල්, රෑ වැඩ කරන ප්‍රදේශ බවට පත් වෙලා තිබුණා. ඒ විධියට කිසිදු ප්‍රශ්නයක් නැතිව භාර ගත් මේ රට, "දින 100 විප්ලවය" යටතේ පළමුවෙන්ම කන්න පටන් ගත්තා. එවකට හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා විසින් මේ සියලු සංවර්ධන ව්‍යාපෘති ඉද්ද ගැහුවා වාගේ නතර කළා. Port City නතර කළා. උමා ඔය ව්‍යාපෘතිය නතර කළා. මංමාවත් හැදීම නතර කළා. විදුලිබල යෝජනා ක්‍රම නතර කළා. ඒ සියල්ල අත්හිටෙව්වා. අවුරුදු ගණනක් යනතෙක් නැවත ඒවා පටන් ගත්තේ නැහැ. පෞද්ගලික අංශය තමයි රටේ නිෂ්පාදන ක්‍රියාවලිය කරන්නේ. ගොවීන් ගොවිතැන් කරනවා; කම්කරුවන් කම්හල්වල වැඩ කරනවා; සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ඔවුන්ගේ කාර්යභාරය ඉෂ්ට කරනවා; සිල්ලර හා තොග වෙළෙඳාම් තිබෙනවා. ජාතික නිමැවුම බිහි වෙන්නේ මේ අංශවලින්.

පෞද්ගලික අංශයෙන් තමයි රටේ ආර්ථිකය දුවන්නේ. මේ රජය පෞද්ගලික අංශයට එළව එළවා ගහන්න පටන් ගත්තා. ඉතිහාසයේ කවදාවත් නැති විධියට අතීතයට බදු පනවා, පෞද්ගලික අංශයේ ඉන්න සියලුදෙනා හොරු කිව්වා; වංචාකාරයෝ කිව්වා; දූෂිතයෝ කිව්වා. අතීතයේ මහින්ද රාජපක්ෂ රජය සමයේ මේ අංශ ලාභ ලැබුවා. ඒ ලාභවලට සුපිරි වාසි බද්ද - Super Gain Tax - ගහලා මිලියන පණහක් පෞද්ගලික අංශයෙන් උදුරා ගත්තා.

ඊළඟට, වැටි පනත ගෙනැල්ලා බදු බර උසුලාගත නොහැකිවන ලෙස වැඩි කළා. ඒ වාගේම, ඩොලරය කෘත්‍රිම ලෙස පාලනය කරන්න ගියා. සියයට 8.2ට තිබුණු ඩොලර් සංචිතය පහළට වැටෙනතුරු ඒ ඩොලර් ටික පුච්චා දැම්මා. විදේශ ආයෝජකයන් අකුලාගෙන යන්නා පටන් ගත්තා. මහ දවල් ශ්‍රී ලංකා මහ බැංකුව කොල්ලකෑවා. රජයේ ආදායම් ලබන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව වාගේ ආයතන කෙළින්ම රජයේ විධාන යටතේ තමුන්ගේ ගජ මිතුරන්ට වාසි සලසන ආයතන බවට පරිවර්තනය වුණා. විදේශ ආයෝජකයෝ තමන්ගේ ආයෝජන ලංකාවෙන් පිටතට අරගෙන ගියා. ඒ කරුණු නිසා රට වැටෙන්නට පටන් ගත්තා. මුදල් අමාත්‍යාංශයේයි, ශ්‍රී ලංකා මහ බැංකුවේයි ඇති වෙච්ච අකාර්යක්ෂමතාව මෙන්ම, හොරකම, වංචාව, දූෂණය, ගජ මිතුරන්ට විශේෂිත වාසි සැලසීම හා තමුන්ගේ සතුරන්ට එළව එළවා පහරදීමේ නින්දිත ප්‍රතිපත්තියත් කරණකොටගෙන රට කඩාගෙන වැටුණා.

2017 වසරේ මහ බැංකු වාර්තාව අරගෙන බැලුවොත් පෙනෙනවා, 2014දී, මහින්ද රාජපක්ෂ පාලන යුගයේදී තිබුණ තැනටවත් මේ රට ගෙනෙන්න අවුරුදු තුනක් ගත වුණත් තමුන්නාන්සේලාට බැරි වීම මොනවට ඔප්පුවෙලා තිබෙන බව. අද ලංකාවේ කෘෂිකර්මය වැටිලා, කර්මාන්ත වැටිලා, සේවා අංශ වැටිලා, ජාත්‍යන්තර වෙළඳ අංශ වැටිලා, රටේ ජනතාවට උසුලාගන්න බැරි පීඩනයක් ඇති වෙලා ඔවුන්ගේ ආදායම් මාර්ග අඩුවෙලා, ගත් ණය වාරික ගෙවා ගන්න බැරිව රටම අන්ත අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්න එකේ වේදනාව නිසා තමයි පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මුළු රටේම ජනතාව කථා වෙලා කළා වාගේ රාජ්‍ය විරෝධී ඡන්දයක් ලෙස මහින්ද රාජපක්ෂ නායකත්වයට -පොහොට්ටුවට- එවැනි ඡන්ද ප්‍රමාණයක් ලබා දුන්නේ.

දැන් අලුත්ම සෙල්ලමක් පටන් ගෙන තිබෙනවා. වර්තමාන මුදල් අමාත්‍යවරයා, ගරු මංගල සමරවීර මහතා ටික දවසක් නිහඬව ඉඳලා, දැන් රාජ්‍ය අරමුදල් භාවිත කරමින් මුදල් අමාත්‍යාංශය හරහා දේශපාලනය කිරීම ආරම්භ කරලා තිබෙනවා.

ඊට පැහැදිලි උදාහරණයක් කියන්න පුළුවන්. සති අන්ත සියලු පුවත් පත්වල, ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන මාධ්‍යවලින් ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළා, 2014 වර්ෂයේදී බොරතෙල් බැරලයක් ඩොලර් 60යි, 2018දී බොරතෙල් බැරලයක් ඩොලර් 78යි කියලා. මේක දේශපාලන දැන්වීමක්. එම දැන්වීමේ තවදුරටත් මෙහෙම තිබෙනවා.

"අද ඔක්ටෙන් 92 පෙට්‍රල් ලීටරයක් රුපියල් 137කි. 2014 වර්ෂයේ, පසුගිය රජය සමයේදී එය රුපියල් 158 කි. අදටත් වඩා වැඩි මිලකට එදා පෙට්‍රල් අළෙවි කළේ වෙළඳපොළේ බොරතෙල් බැරලයක් ඩොලර් 60ක් තරම් අඩු මිලකට පැවතියදීය. බොරතෙල් බැරලය ඩොලර් 78 දක්වා ඉහළ නැඟ ඇති තත්ත්වයක වුවද අද රජය ජනතාවට පෙට්‍රල් ලීටරක් ලබා දෙන්නේ රුපියල් 137ක සහන මිලටය."

ඊළඟට තිබෙනවා, "බොරතෙල් බැරලයක මිල ඩොලර් 60ට තිබුණු 2014 වර්ෂය අගදී භූමිතෙල් ලීටරයක මිල රුපියල් 106 යි" යනුවෙන්. රජයේ නිල මුද්‍රාව සහිතව මුදල් අමාත්‍යාංශය නමින් මහ ජනයාගේ බදු මුදල් කෝටි ගණන් වියදම් කරලා පට්ටපල් බොරු දේශපාලන න්‍යාය පත්‍ර පළ කිරීම රාජ්‍ය මූල්‍ය අවභාවිතයක්. එදා, 2014 වර්ෂයේදී බොරතෙල් බැරලයක් ඩොලර් එකසිය පහයි. එකසිය හතරයි ශත ගණනයි. භූමිතෙල් ලීටරයක් රුපියල් 81යි. රුපියල් 81ක භූමිතෙල් ලීටරය රුපියල් 106යි කියලා දාලා තිබෙනවා. ඩොලර් 105ට තිබුණු තෙල් බැරලය ඩොලර් 60යි කියලා දාලා තිබෙනවා. මුළු රටක්ම මුළා කරන්න මහ ජනයාගේ බදු මුදලින් මෙවැනි දැන්වීම් පළ කිරීම නීති විරෝධී කටයුත්තක්. ඒ නිසා එදා පැවතුණු තෙල් මිල දක්වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ ඇතුළත් ප්‍රස්තාරය, 2014 මිල ගණන් පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ තිබෙන සම්පූර්ණ විස්තර සහ වෙළෙඳ පොළේ තෙල් මිල හැසිරීම පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන සියල්ල මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අමූලික බොරු, අසත්‍ය කරුණු මෙලෙසින් මුදල් ගෙවා පළ කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් අවභාවිතය සම්බන්ධයෙන් අධිකරණයේ පිහිට පැතීම සඳහා ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපි අපේ නීතිඥයන්ට උපදෙස් ලබා දීලා තිබෙනවා. සමස්ත රටක් නොමහ යැවීම සඳහාත්, 2014 පැවැති රජයට දේශපාලන වශයෙන් අවලාද නැඟීම සඳහාත් මහ ජනයාගේ බදු මුදල් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ලබන සතියේ දී අදාළ අධිකරණයන් වෙත ගමන් කරන්නට ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපි බලාපොරොත්තු වනවා. මොකද, නීතියක්, රීතියක් නැතිව මේ රටේ මෙලෙසින් හැසිරෙන්න මුදල් අමාත්‍යාංශයට බැහැ.

දෙවැනි කාරණය මෙයයි. අද මුදල් අමාත්‍යාංශයේ බලය වෙනත් අමාත්‍යාංශ විසින් පවරාගෙන තිබෙනවා. උපාය මාර්ගික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරිය වන චාන්දනී විජේවර්ධන මහත්මිය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිපියක් යවා තිබෙනවා, මැයි 01වැනි දා සිට මේ නීත්‍යානුකූල නොවන කුප්‍රකට සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා. ඒ සම්පූර්ණ බලය අයුතු ලෙස පාවිච්චි කිරීමක්. මක්නිසාද යත්, මේ සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම මේ පාර්ලිමේන්තුවේ කිසිවෙක් දැකලා නැහැ. ඒ නිසා මම ඔබතුමාගේ අවසරය ඇතිව පිටු එක්දහස් ගණනකින් සමන්විත සිංගප්පූරුව හා ශ්‍රී ලංකාව අතර තිබෙන මෙකී ගිවිසුම ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. මේ ගිවිසුම පිටු එක්දහස් ගණනකින් සමන්විතයි වාගේම කිලෝ තුනක් විතර බරයි. ආණ්ඩුව වශයෙන් මේ ගිවිසුමට අත්සන් කරපු අය මේ ගිවිසුම පාර්ලිමේන්තුවට ලබා දීලා නැහැ. මේ ගිවිසුම සියලුම මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා මෙන්ම රටේ අනාගත ප්‍රයෝජනය සඳහා මේ අවස්ථාවේදී මා ඉදිරිපත් කරනවා.

මේ ගිවිසුමේ තිබෙන්නේ අංක වගයක්. ගිවිසුම අත්සන් කරන විට 87201, 87202, 87203, 87204 වැනි අංකයක් දාලා තමයි තීරු බදු හා තීරු බදු නොවන බාධක ඉවත් කිරීම පිළිබඳව විධිවිධාන ඇතුළත් කරන්නේ, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි. මේකේ තිබෙන්නේ එහෙම අංක. අංක අනුව එය බැලිය හැකියි. අංකය මොකක්ද කියලා හොයන්න වෙන තැනකට යන්න ඕනෑ. මොකද, ඒක CPC කියලා දාලා තිබෙන්නේ. CPC කියන්නේ, Provisional Central Product Classification, United Nations, New York, 1991. වර්ගීකරණ නාමාවලිය සඳහා මේ අංකය හොයා ගෙන යන්න ඕනෑ. ඒ නාමාවලියේ ඇතුළත් අංක ටිකට ඇතුළත් වන දේ මොනවාද කියන කාරණය මන්ත්‍රීවරුන්ට කියවා අවබෝධ කර ගැනීම සඳහා මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

CPCවල 87201 යටතේ මොකක්ද තිබෙන්නේ? "මැන්පවර්" සමාගමකට සිංගප්පූරු ජාතිකයන් එන්නේ නැහැ. ලංකාවට ඇවිල්ලා සිංගප්පූරු ආයෝජකයෙකුට එවැනි සමාගමක් ආරම්භ කරන්න පුළුවන්. ඒ වෙනුවෙන් ඔවුන් එකම කොන්දේසියයි අනුගමනය කරන්න ඕනෑ. ඒ සමාගම ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ ලියා පදිංචි කරන්න ඕනෑ. එලෙස ලියා පදිංචි කරන manpower company එකට ගොඩනැගිලි ඉදි කිරීමේ ක්ෂේත්‍රයට අවශ්‍ය කම්කරුවන්, ඒ කටයුතු සඳහා අවශ්‍ය වෙනත් අය, යන්ත්‍ර ක්‍රියාකරුවන්, පරිගණක ක්‍රියාකරුවන්, රියදුරන්, ගෘහ සේවකයන්, නිවාස බලා ගන්න අය -housekeepers-, සහකාරියන් - companions - ගෙනැල්ලා දෙන්න පුළුවන්.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ සල්ලි දීලා සහකාරියක්- [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මම සභාගත කරලා නේ තිබෙන්නේ. ඔබතුමා කියව ගන්න කෝ.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සම්බන්ධව අපි දවස් කීපයකට ඉස්සෙල්ලාත් විවාද කළා. මෙතුමා කියනවා, සල්ලි දීලා සහකාරියක්- [බාධා කිරීමක්] මෙතුමා මේ මොකක්ද කියන්නේ කියලා මම දන්නේ නැහැ. ඒ නිසා මම පැහැදිලි කරන්න ඕනෑ. [බාධා කිරීමක්] ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා කට වහගෙන පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාව දෙන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

සල්ලි දීලා සහකාරියක්ව ගෙනෙනවාය කියා ඔබතුමා කිව්වා. මම ඒකයි පැහැදිලි කිරීමක් කළේ. අසත්‍ය ප්‍රකාශ කරනකොට අපි අහන්න එපායැ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මෙතුමන්ලා සමඟ ඒ පැහැදිලි කිරීම් කරන්න අමාරුයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකද, ප්‍රභූන්ට දීපු මුදල් යනාදිය පිළිබඳව රජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේ දිනවල අධිකරණයට කරුණු ඉදිරිපත් කරන නිසා. මේ ගිවිසුම නිර්මාණය කිරීමේදී බලධාරියෙක් ලෙස ක්‍රියා කරපු අර්ජුන මහේන්ද්‍රන් මහතා හා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම එක්ක සිද්ධ වෙච්ච ගනුදෙනුවලට සම්බන්ධ ප්‍රභූන් ගැන විවිධ සාක්ෂි අධිකරණයට ඉදිරිපත් වෙනවා. ඒ නිසා මම බණින ඒවා ගැන වැඩිය මොනවත් කියන්නේ නැතුව, මගේ කථාව විතරක් කරගෙන යන්න ඉඩ දුන්නාම ප්‍රමාණවත් වනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, සිංගප්පූරු ගිවිසුම ඕනෑ නම් මෙතැන තිබෙනවා. CPC එකේ අංක ඕනෑ නම් ඒ ටික මෙතැන තිබෙනවා. ඊට අතිරේකව මේ ගිවිසුම යටතට වැටෙනවා සහල්, පලතුරු යනාදී කෘෂි කාර්මික නිෂ්පාදන. අපි කෘෂි කාර්මික රටක්. සිංගප්පූරුවේ ඒවා නැහැ. අවුරුදු 12ක් යනකොට සම්පූර්ණයෙන් මේවා බද්දෙන් නිදහස් වෙනවා. කොයි රටෙද මෙහෙම කරන්නේ? කාර්මික අතින් සංවර්ධනය වෙච්ච ජපානයවත් මෙහෙම කරන්නේ නැහැ. සහල්, පලතුරු යනාදී නිෂ්පාදන තීරු බදු රහිතව චක්කඩ කැඩුවා වාගේ එන්න දුන්නාම මහ පොළොවේ හැපෙන ලක්ෂ ගණනක් ගොවීන්ට මොකක්ද වෙන්නේ? ඒ එන්නේ සිංගප්පූරුවේ වවන සහල්ද? සිංගප්පූරුවේ වවන පලතුරුද? ඒ විතරක් නොවෙයි, සේවා අංශය විවෘත කරනවා; කෘෂි කර්මාන්තය විවෘත කරනවා; බුද්ධිමය දේපළ විවෘත කරනවා; ආයෝජන විවෘත කරනවා. ඒ සියල්ල කරන්නේ ඇයි? අදටත් වෙනත් රටවල ඉතා විශාල සමාගම් ප්‍රමාණයක් සිංගප්පූරුවේ ලියා පදිංචි වනවා. Mode - 3 යටතේ වෙන රටක ලියා පදිංචි වුණු, සිංගප්පූරුවේ තිබෙන ඕනෑ සමාගමකට ලංකාවේ ආයෝජනය කරන්න පුළුවන්. ශ්‍රී ලාංකිකයෝ විශාල ප්‍රමාණයක් සිංගප්පූරුවේ, සමාගම් ලියා පදිංචි කර තිබෙනවා. බුරුමයේ මධ්‍යම බැංකුවක් තිබුණේ නැහැ. බුරුමය ආවෘත වෙලා තිබුණු අවස්ථාවේදී ලෝකය සමඟ වෙළෙඳාම් කරන්න බුරුමයට Central Bank එකක් තිබුණේ නැහැ. බුරුමයේ සියලු ව්‍යාපාරිකයෝ ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනු කළේ, සිංගප්පූරුවේ ගිණුම් විවෘත කරලායි. බුරුමය මේ මෑතක් වනතෙක් සියලුම ජාත්‍යන්තර ගනුදෙනු කළේ සිංගප්පූරුව හරහායි. මොකද, සිංගප්පූරුව වෙළෙඳ නගරයක්; trading hub එකක්. ඒකට අවශ්‍ය නීතිරීති සියල්ල සම්පාදනය කරලා තිබෙන්නේ. ලංකාවේ ව්‍යාපාරිකයෝ, ඉන්දියාවේ ව්‍යාපාරිකයෝ, නේපාලයේ ව්‍යාපාරිකයෝ, බංග්ලාදේශයේ ව්‍යාපාරිකයෝ; ඒ සියලු දෙනා සිංගප්පූරුවේ ලියා පදිංචි වෙලා තිබෙන්නේ. ඉතින්, තනි රටකට විතරක් නොවෙයි අපි යටත් වෙන්නේ. ලෝකයේ ඔක්කෝම රටවල්වලට අපි යටත් වනවා, සිංගප්පූරුව හරහා. ඒක නිසා තමයි විද්වතුන් කියා තිබෙන්නේ, සිංගප්පූර් - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම 1815 පාවා දීමටත් වඩා විශාල පාවා දීමක් කියලා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් ඔබතුමා කියන හැටියට වෙන රටවලින් ඇවිල්ලා දැන් සිංගප්පූරුවේ පිරිලා ඉන්න ඕනෑ නේ. එහෙම නම් ඔය රටවලින් ඇවිල්ලා සිංගප්පූරුවේ දස දහස් ගණනක් පිරිලා ඉන්න ඕනෑ නේ. ඔබතුමාගේ ඔය සරල-

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

තමුන්නාන්සේ දන්නේ නැති වුණාට දැන් සිංගප්පූරුවේ ඉන්නේ ලංකාවේ අය. අඩුම තරමේ මේ ගරු රාජ්‍ය අමාත්‍යවරයා දැන ගන්න එපායැ, ලංකාවේ පුරවැසියා නේ අර්ජුන් මහේන්ද්‍රන්. ඊයෙත් ප්‍රවෘත්තිවලට කිව්වා, එම ලංකාවේ පුරවැසියා ගිහිල්ලා ඉන්නේ සිංගප්පූරුවේ කියලා. ඔහු සිංගප්පූරුවේ අපූරුවට ඉන්නවා කිව්වා. වෙන රටවල මිනිස්සු තමයි එහේ ගිහිල්ලා ඉන්නේ. අපේ මහ බැංකුව බිඳලා සිංගප්පූරුවේ අගේට ඉන්නේ! ඕනෑ කෙනෙකුට සිංගප්පූරුවේ ඉන්න පුළුවන්. ඒක නිසා තමයි අර්ජුන මහේන්ද්‍රන් ඒ රටේ ඉන්නේ. යාළුවා නේ, එන්න කියන්න. [බාධා කිරීමක්]

ඔබතුමා අහන ඒවාට උත්තර දෙන්න මා බැඳිලා නැහැ. තමුන්නාන්සේට උත්තර දෙන්න මට තිබෙන වුවමනාව මොකක්ද? මා බැඳිලා නැහැ, තමුන්නාන්සේට උත්තර දෙන්න.

ජනාධිපතිතුමා කියා තිබෙනවා, මේ ගිවිසුම නැවත ක්‍රියාත්මක කරන්න ඉඩ නොදෙන දේ පිළිබඳ එතුමා අවශ්‍ය විධිවිධාන යොදන බවට. වෛද්‍යවරුන්ගේ සංගමය හා විද්වතුන් ගිහින් එතුමාට කරුණු පැහැදිලි කර තිබෙනවා. කැබිනට් මණ්ඩලය නොමඟ යවලා, කොළේ වහලා මෙවැනි ගිවිසුමක් අත්සන් කළාට එය නීත්‍යානුකූල ගිවිසුමක් නොවෙයි කියන එක ඉදිරියේදී අධිකරණය විසින් ඔප්පු කරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ මහින්ද රාජපක්ෂ යුගය දැවැන්ත ආර්ථික විනාශයක් කරපු යුගයක් කියලා විශාල වශයෙන් අසත්‍ය ප්‍රචාර කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රජය භාර ගන්න කලින් බනිජ තෙල් ආනයනය කරන්න මේ රටින් වැය වුණා, ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක්. 2014දී තනි ආනයන ද්‍රව්‍යයක් ලෙස බනිජ තෙල් ආනයනය කරන්න අපිට වැය වුණා, ඩොලර් මිලියන 4,597ක්. එතකොට ඩොලර් මිලියන 4,597ට සාපෙක්ෂව ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල කඩාගෙන වැටුණා; ගෑස් මිල කඩාගෙන වැටුණා; යකඩ මිල කඩාගෙන වැටුණා. මේ කඩාගෙන වැටීම නිසා 2015දී ඩොලර් මිලියන 1,897ක් ඉතුරු වුණා. 2014ට සාපේක්ෂව 2016දී ඩොලර් මිලියන 2,116ක් ඉතුරු වුණා. 2017දී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,170ක් ඉතුරු වුණා. එතකොට බනිජ තෙල් ආනයනය කිරීමට යන වියදම එදාට සාපේක්ෂව 2015දී ඩොලර් මිලියන 1,897ක්, 2016දී ඩොලර් මිලියන 2,116ක්, 2017දී ඩොලර් මිලියන 1,170ක් වශයෙන් අවුරුදු 3ට රටින් පිටට යන මුදල් ප්‍රමාණයෙන් ඩොලර් බිලියන 5,183ක් - ඇමෙරිකානු ඩොලර් බිලියන 5.1ක්- රට ඇතුළේ ඉතුරු වුණා. හම්බන්තොට වරාය ඩොලර් බිලියන 1.4ටයි විකුණුවේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අවුරුදු 3කට ගත්තේ ඩොලර් බිලියන 1.5යි. දැන් ස්වෛරී බැඳුම්කරය නිකුත් කරලා මේ ළඟදී ඩොලර් බිලියන 2.5ක් ගත්තා. මේ කාරණා තුන ගැනම කියන්න ඕනෑ නැහැ. බනිජ තෙල් ගෙන්වන්න වැය වීමට තිබුණු මුදල්වලින් මේ රට ඇතුළේ ඉතුරු වුණු මුදල් ප්‍රමාණයට මොකද වුණේ කියා කාට හෝ කියන්න පුළුවන්ද? මා ඉදිරිපත් කරන මේ සංඛ්‍යා ලේඛනවල වැරැද්දක් තිබෙනවා නම්, ඕනෑ කෙනකුට ඒ සම්බන්ධයෙන් ඔප්පු කිරීමේ අභියෝගය සමඟ තමයි මා කියන්නේ. 2015දී ඉතුරු වුණු ඩොලර් මිලියන 1,897ට මොකද වුණේ? ඒ තෙල් මිල එසේ නිබුණා නම් ඒ මුදල ගෙවන්න එපා යැ. 2016දී ඉතුරු වුණු ඩොලර් මිලියන 2,116ට මොකද වුණේ? 2017දී ඉතිරි වුණු ඩොලර් මිලියන 1,170ට මොකද වුණේ? රටින් පිටට යන්නේ නැතුව මේ රටේ ඉතුරු වුණු ඩොලර් බිලියන 5.1ට මොකද වුණේ? [බාධා කිරීමක්] ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී එයට උත්තර දෙන්න පුළුවන්. ඔබතුමාගේ කථාවේදී කියන්න.

ඊළඟට, 2005දී රාජ්‍ය ණය ප්‍රමාණය - [බාධා කිරීම්] පල් බොරු. 2005දී රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 2,222යි. 2005දී මහින්ද රාජපක්ෂ මැතිතුමා රට භාර ගන්නකොට තිබුණු ණය ප්‍රමාණය රුපියල් බිලියන 2,222යි. යුද්ධයකුත් තිබිලා, ලෝක බනිජ තෙල් අර්බුදයකුත් තිබිලා, ලෝක ආහාර අර්බුදයකුත් තිබිලා -මේ සියලුම අර්බුද යටතේ ණය ගැනීමේ අවශ්‍යතාව විශාල ලෙස තිබිලා- සංවර්ධනයටත්, සහනාධාර සියල්ලටමත් ණය ගෙන 2014දී ණය බර වැඩිවෙලා තිබුණු බව ඇත්තයි. ඒ අනුව 2014දී රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 7,390යි. එතකොට ණය වැඩිවීම කීයද? අවුරුදු 10කට රුපියල් බිලියන 5,168යි. ඒ අනුව එක අවුරුද්දකට සාමාන්‍යයෙන් ණය වැඩිවෙලා තිබෙන්නේ රුපියල් බිලියන 516කිනුයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අර සියලු ප්‍රශ්න තිබියදීත්, මහින්ද රාජපක්ෂ යුගයේ එහෙමයි ණය වැඩිවෙලා තිබෙන්නේ. මේ ආණ්ඩුව ආවා නේ. අවුරුදු තුනයි ගියේ, රුපියල් බිලියන 7,390ක්ව තිබූ නොපියවූ ණය දැන් රුපියල් බිලියන 10,313යි. එතකොට මේ අවුරුදු තුනට රුපියල් බිලියන 2,923ක් ණය අරන් තිබෙනවා. මහින්ද රාජපක්ෂ යුගයේ අවුරුදු 10ටම ණය ලෙස ගත්තේ රුපියල් බිලියන 5,168යි. මේ ආණ්ඩුව අවුරුදු 3ට රුපියල් බිලියන 2,923ක් ණය ලෙස අරගෙන තිබෙනවා කියන්නේ, රුපියල් බිලියන 3,000ට ආසන්නයි. සාමාන්‍යයෙන් අවුරුද්දකට රුපියල් බිලියන 1,000කින් ණය ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. සංඛ්‍යා දත්ත අනුව ලංකා ඉතිහාසයේ වැඩියෙන්ම ණය වැඩි කරලා තිබෙන ආණ්ඩුව තමයි මේ ආණ්ඩුවයි. මොකද, ඒ කාලයේ සාමාන්‍යයෙන් අවුරුද්දකට ණය වැඩි වෙන්නේ, ඇමෙරිකානු ඩොලර්වලින් කිව්වොත් ඇමෙරිකානු ඩොලර් බිලියන 3කින් හෝ 4කින්. මේ අවුරුදු තුනේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 6කින් හෝ 7කින් ණය වැඩිවෙලා තිබෙනවා. මේක තමයි ඇත්ත. මේ ඇත්ත සංඛ්‍යා නැතුව, විකාරයක් අරගෙන හැම දාම ණය පිළිබඳව අසත්‍ය ප්‍රකාශ කරනවා. අපේ ආණ්ඩුව කාලයේ අවුරුදු 10ටම ණය වැඩි වුණේ රුපියල් බිලියනවලින් කිව්වොත්, බිලියන 5,168කිනුයි. නමුත්, පසුගිය අවුරුදු තුනට රුපියල් බිලියන 3,000කින් ණය වැඩි වෙනවා. ඉතින්, මේ ණය වැඩිවීම මෙලෙසින් තිබියදී ආණ්ඩුව දිගින් දිගටම රාජ්‍ය අය වැයේ නොපියවූ හිඟය පියවන්න සල්ලි අච්චු ගැහුවා. 2015 මහ බැංකු වාර්තාවේ පිටු අංක 198හි සඳහන් වන විධියට අච්චු ගහලා තිබෙන සල්ලි ප්‍රමාණය, 2015 වර්ෂයේදී රුපියල් බිලියන 291.8යි. ඒ වාගේම, 2016දී රුපියල් බිලියන 139.9ක් අච්චු ගැහුවා. 2017දී රුපියල් බිලියන 187.7ක් අච්චු ගැහුවා. එම මුදල් ප්‍රමාණය තමයි, එක් එක් වර්ෂයේදී රාජ්‍ය මූල්‍ය කටයුතුවල ඇති වුණු ප්‍රසාරණාත්මක බලපෑම. මගේ ප්‍රශ්නය වෙන්නේ, "මෙපමණ විශාල ප්‍රමාණයක් ණය අරගෙන, ඒ වාගේම විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළ ඉතිරි වී තිබියදී, මෙපමණ සල්ලි ප්‍රමාණයක් අච්චු ගැහුවේ කුමකටද?" කියන එකයි. "වර්ෂ අවසානයේ රාජ්‍ය මූල්‍ය කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම" කියා මහ බැංකු වාර්තාවේ වෙනම කොටසක් තිබෙනවා. මුදල් සැපයුමට අලුතින් එකතු වුණු ප්‍රමාණය, බැංකු ක්‍රමයෙන් ගත්ත ප්‍රමාණය,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව තව විනාඩි තුනකින් අවසන් කරනවා.

ඒ සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස රුපියල කඩාගෙන වැටුණා. රුපියල් 131ට තිබුණු ඇමෙරිකානු ඩොලරය දැන් රුපියල් 160ට ආසන්නයි. ඒක රුපියල් 165 වෙන එක නවත්වන්න බැහැ. ඒ නිසා පමණක් ණය වැඩිවීමේ ප්‍රමාණය -ණය පැටවූ ගහපු ආකාරය - 2015 මහ බැංකු වාර්තාවේ 202වැනි පිටුවේ සඳහන් වෙනවා. 2014 මහින්ද රාජපක්ෂ යුගයේදී රුපියල අධිප්‍රමාණය වුණා. එම නිසා, රුපියල් බිලියන 89.3කින් ණය බර අඩු වුණා. ඊට පස්සේ 2015දී රුපියල කඩාගෙන වැටුණා. ඒ අවුරුද්දේ රටේ ණය බර රුපියල් බිලියන 285.1කින් වැඩි වුණා. 2016දී රුපියල් බිලියන 186.6කින් ණය බර වැඩි වුණා. 2017දී රුපියල් බිලියන 252.2කින් රටේ ණය බර වැඩි වුණා. රුපියල අවප්‍රමාණය වීම නිසා මේ විධියට රුපියල් බිලියන 723.9කින් ණය බර වැඩිවෙලා තිබෙනවා.

මම දැන් මහ බැංකු වාර්තාවේ සඳහන් එම කරුණු කියවන්නම්. 2014 මහ බැංකු වාර්තාවේ, පිටු අංක 162හි මෙසේ සඳහන් වෙනවා:

"වසර තුළ දී ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් කිහිපයකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අධිප්‍රමාණය වීම සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 89.3 කින් අඩු වීමට හේතු විය."

මහින්ද රාජපක්ෂ කාලයේ රුපියල අධිප්‍රමාණය වුණා, ණය ප්‍රමාණය අඩු වුණා.

ඊළඟට 2015 මහ බැංකු වාර්තාවේ, පිටු අංක 202හි මෙසේ සඳහන් වෙනවා:

"2015 වසර අග වන විට ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් කිහිපයකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 285.1 කින් වැඩි වීමට හේතු විය."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2016 මහ බැංකු වාර්තාවේ, 224වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් 2016 වසර අවසානය වන විට සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 186.6 කින් වැඩි විය."

2017 මහ බැංකු වාර්තාවේ, 221වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"ප්‍රධාන විදේශීය ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් 2017 වසර අවසානය වන විට සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 225.2කින් වැඩි විය."

එතකොට ණය විතරක් රුපියල් බිලියන හත්සිය ගණනකින් වැඩි වෙලා තිබෙනවා. ණයත් වැඩි වෙලා, ඉතිරි වුණු සල්ලිත් නැති වෙලා, ජනතාව මත අසාමාන්‍ය ලෙස බදුත් පනවා, මේ ඔක්කෝම වෙලා තිබියදී, 2015දී බදු ආදායම, රුපියල් මිලියන තුන්ලක්ෂ තිස්හයදහස් අටසිය විසිඅටයි. 2014 අපි ආණ්ඩුව භාර දෙනකොට බදු ආදායම තිබුණේ, -ඕනෑම ආණ්ඩුවක් යටතේ බදු වැඩි වෙනවා.- රුපියල් මිලියන දසලක්ෂ පණස්දහස් තුන්සිය පණස්දෙකයි. එතකොට මහින්ද රාජපක්ෂ යුගයේ අවුරුදු 10 තුළම බදු වැඩි වෙලා තිබෙන්නේ, රුපියල් මිලියන හත්ලක්ෂ දහතුන්දහස් පන්සිය විසිහතරකිනුයි. සාමාන්‍යයෙන් වර්ෂයකට වැඩි වෙලා තිබෙන්නේ, රුපියල් මිලියන හැත්තෑඑක්දහස් තුන්සිය පණස් දෙකක් වැනි ප්‍රමාණයක්. නමුත්, මේ ආණ්ඩුව ආවාට පස්සේ දැන් බදු ආදායම රුපියල් මිලියන දහසය ලක්ෂ හැත්තෑදහස් එකසිය හැටඅටයි. මහින්ද රාජපක්ෂ යුගයේ අවුරුදු 10ටම වැඩි වුණේ, රුපියල් මිලියන හත්ලක්ෂ දහතුන්දහස් පන්සිය

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

විසිහතරයි. නමුත්, මේ ආණ්ඩුවේ මේ අවුරුදු තුනට බදු වැඩි වීම රුපියල් මිලියන හයලක්ෂ දහනවදහස් අටසිය විසිතුනයි. සාමාන්‍යයෙන් ගත්තොත්, මහින්ද රාජපක්ෂ යුගයේදී, එක අවුරුද්දකට බදු වැඩි වෙලා තිබෙන්නේ, රුපියල් මිලියන හැත්තෑඑක්දහස් තුන්සිය පණස් දෙකකිනුයි. තමුන්නාන්සේලාගේ කාලයේ වැඩි වෙලා තිබෙනවා, රුපියල් මිලියන දෙලක්ෂ හයදහස් හයසියඅටකින්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

එතකොට තිබුණා වාගේ තුන් ගුණයකින් බදු අය කර තිබෙනවා. ජනතාවට උසුලා ගන්න බැරි ප්‍රමාණයට බදුත් අරගෙන තිබියදී, ණයත් අරගෙන, රුපියලේ අගයත් වැටිලා තිබියදී, ආර්ථිකය ගොඩ ගියේ කොයි විධියටද කියලා පුළුවන් නම් කියන්න. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රජයට ආර්ථිකය කළමනාකරණය කරන්න බැරිව ඉතා විශාල අර්බුදයක් රට ඇතුළේ නිර්මාණය වෙලා තිබෙන නිසා, මේ වැටිලා තිබෙන අර්බුදයේ ස්වභාවය තේරුම් අරගෙන, මේ පිළිබඳ සම්පූර්ණ සංඛ්‍යා දත්ත සහිත ප්‍රබුද්ධ දේශපාලනඥයින්ගේ සාකච්ඡා මණ්ඩපයක් බවට මේ පාර්ලිමේන්තුව පත් කරලා, මේ රටට අහිතකර ගිවිසුම් නතර කරලා, අවලාද නැඟීම, අසත්‍ය කීම නතර කරලා, මේ රට බේරා ගැනීමේ යථාර්ථයට මුහුණ දිය යුතුය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා.2.03]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු බන්දුල ගුණවර්ධන ශූරීන්ගේ දීර්ඝ කථාවෙන් පස්සේ මට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන සතුටු වෙනවා.

විශේෂයෙන්ම එතුමාට අපි මතක් කර දෙනවා, එතුමන්ලාගේ කාලයේදී ඉන්ධන මිල අඩු කරන්න අධිකරණ නියෝගයක් නිකුත් කළ බව. අද එතුමාට ඒවා අමතක වෙලා තිබෙනවා. එදා අභිංසක, අසරණ ධීවර ජනතාව හලාවත වැල්ලට ඇවිල්ලා, ඒ ජනතාවගේ පවුල් රැක බලා ගන්න ඉන්ධන මිල අඩු කරලා සහනයක් දෙන්නය කියනකොට, ඔළුවට වෙඩි තියලා ඒ කරපු මහා විනාශය අද එතුමන්ලාට අමතක වෙලා කථා කරන එක ගැන අප පුදුම වෙන්නේ නැහැ.

එදා එතුමාගේ තර්කය වුණේ, පවුලකට රුපියල් 2,500කින් මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියන එකයි. ඒ තර්කය ගැන මුළු රටම දන්නවා. එතුමා හැම වෙලාවේම එතුමාගේ සංඛ්‍යා ලේඛන මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ, ඒවා දහස් වාරයක්, ලක්ෂ වාරයක් කියෙව්වාම ඇත්තක් විධියට ඔප්පු වෙනවා කියලා හිතා ගෙනයි. අද තෙල් මිල වැඩි වීමේ යථාර්ථය ජනතාව දන්නවා. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, එදා හලාවත අභිංසක ධීවර ජනතාව තෙල් මිලේ සහනය ඉල්ලුවාම වෙඩි තිබ්බේ නැද්ද; මර්දනය කළේ නැද්ද; කී දෙනකුට තුවාල සිදු වුණාද කියලා අපි අහනවා. ඔබතුමන්ලා ඒවා කළේ නැත්නම් "නැහැ." කියලා කියන්න. එදා උසාවි නියෝග ආවාම තෙල් මිල අඩු කරන්නේ නැතිව කරපු විනාශය ඔබතුමන්ලාට අද අමතක වෙලා. ඒවා මතක් කරන්නේ නැතිව හිතට එකඟව ඔබතුමාට ඔය විධියට කථා කරන්න පුළුවන්ද කියන එක කල්පනා කරලා බලන්න.

විශේෂයෙන් අපේ ගරු මංගල සමරවීර ඇමතිතුමා ඉතාම පැහැදිලිව සඳහන් කර තිබුණා, රාජපක්ෂවරුන් මේ රටේ ණය බර කොච්චර වැඩි කළාද කියලා. ඒ ණය අරගෙන හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ වැනි සුදු අලි හදලා අවුරුදු ගණනාවක් ඒවායින් ආදායම් ගන්නේ නැතිව තමන්ගේ ගජ මිතුරන්ට පෝසතුන් වෙන්න ඉඩ දීලා මේ රටට කරපු විනාශය එතුමාට අද අමතක වීම පුදුමයක් නොවෙයි.

එතුමන්ලා කථා කරන්නේ නැවතත් බලයට එන්නයි. අද "වියත් මහ" කියලා සංවිධානයක් එනවා. "වියත් මහ" දිගේ අන්තිමට තුවක්කුකරුවෙක් තමයි එන්නේ. "වියත් මහ" ඇවිල්ලා තිබෙන්නේ, මේ රටේ තුවක්කුකරුවෝ ඇවිල්ලා, ප්‍රජාතන්ත්‍රවාදය වළලා නැවත ඒකාධිපතියෙක් බිහි කරන්නයි. අපි එදා -2015දී- එසේ ඒකාධිපතියෙක් බිහිවෙන එක නැවැත්වුවා. ඒක නැවත ආරම්භ කරලා, මේ රට ඒකාධිපතිවාදයට ගෙන යන්නයි මේ අය හදන්නේ. මේ රටට කරලා තිබෙන විනාශය අපි දන්නවා. මේ රටට කරන්න හදන විනාශයත් අපි දන්නවා. ඒ නිසා ජනතාව මුළා කරලා, යම් අසත්‍ය දෙයක් නැවත නැවත කියමින් ඒක සත්‍යයක් කරන්න දරන උත්සාහය පරාජය කරන්න අපි හැම වේලාවේම කටයුතු කරනවා.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම ගැන ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා කිව්වා. එතුමාගේ තර්කය අනුව මෙලහකට සිංගප්පූරුවේ කිසිම තැනක ඉඩක් නැහැ. මොකද, ඉන්දියාවෙන්, පාකිස්තානයෙන්, බංග්ලාදේශයෙන් මිනිසුන් යවා සිංගප්පූරුව පුරවා ඉවරයි. එසේ ඉන්දියාවෙන්, පාකිස්තානයෙන්, බංග්ලාදේශයෙන් සිංගප්පූරුවට ගිහින් සිටින මිනිසුන් ඔක්කෝම අද සිංගප්පූරුවේ තිබෙන ආර්ථික ශක්තිය අත හැර ලංකාවට පනින්න බලාගෙන ඉන්නවා. ඒක තමයි තර්කය. ඒ වාගේ තර්ක-විතර්ක කරන්න පුළුවන්. එසේ තර්ක-විතර්ක කරලා, රුපියල් 2,500න් ජීවත් වෙන්න පුළුවන් කියන තර්කය මැතිරුවාට, ඒක සත්‍යයක් වෙන්නේ නම් නැහැ. විශේෂයෙන්ම අපි දන්නවා, ඔබතුමන්ලා කරපු දේ. ඔබතුමන්ලා බලයේ ඉන්නා කාලයේ රුපියලේ අගය ශක්තිමත් වුණාය කියලා ඔබතුමන්ලා කිව්වා. නමුත් ඔබතුමන්ලා 2005දී බලය ගන්නකොට රුපියලේ අගය තිබුණේ කීයටද, ඔබතුමන්ලා යනකොට රුපියලේ අගය තිබුණේ කීයටද කියලා පුළුවන් නම් තර්ක කරන්න කියලා මම මේ අවස්ථාවේදී කියනවා. ඒ නිසා අසත්‍ය තර්ක කරන්න එපා, හිටපු ඇමතිතුමා. අපි දන්නවා, ඔබතුමාගේ තර්ක මොනවාද කියලා. මට ලබා දීපු කෙටි කාලය තුළදී ඔබතුමාගේ තර්කවලට මම පොඩි උත්තරයක් විතරයි දුන්නේ. ඒ නිසා මම අනෙක් දවසේ ඉතාම දීර්ඝ උත්තරයක් දෙන්නත් බලාපොරොත්තු වෙනවාය කියමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna to the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I propose that the Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා වීජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

[பி.ப. 2.08]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தலைப்புடன் சம்பந்தப்பட்ட விடயங்களுக்கு மேலதிகமாக, நேற்றையதினம் கிளிநொச்சியிலே இடம்பெற்றிருக்கின்ற ஒரு சம்பவம் சம்பந்தப்பட்ட ஒரு விடயத்தையும் இங்கு பதிவுசெய்ய நான் தங்களிடம் அனுமதி கேட்கின்றேன். அதாவது கிளிநொச்சி மாவட்டத்திலேயிருக்கின்ற ஹற்றன் நஷனல் வங்கியினுடைய உதவி முகாமையாளரும் அவரோடு கடமையாற்றிய ஓர் உத்தியோகத்தரும் முள்ளிவாய்க்கால் நினைவு தினத்தில் அஞ்சலி செலுத்தினார்கள் என்ற காரணத்திற்காகக் கொழும்பிலேயிருக்கின்ற தலைமையகம் அவர்களைப் பணியிலேயிருந்து இடைநிறுத்தியிருக்கின்றது சம்பந்தப்பட்ட விடயமாகும்.

முள்ளிவாய்க்கால் படுகொலை என்பது உலகம் அறிந்த ஒரு விடயம்; இருபத்தோராம் நூற்றாண்டில் இடம்பெற்ற மனிதப் பேரவலம் நிறைந்த ஓர் இனப்படுகொலை; ருவாண்டா, பொஸ்னியா போன்ற நாடுகளிலே ஏற்பட்ட மனிதப் படுகொலைகளுக்கு ஈடாக இருபத்தோராம் நூற்றாண்டிலே மனித நாகரிகம் வெட்கித்துத் தலைகுனியக்கூடியளவிற்கு இலங்கையிலே தமிழர்கள்மீது மேற்கொள்ளப்பட்ட பாரிய இனப்படுகொலை. அவ்வாறான இனப்படுகொலையிலே 1,46,000 இற்கும் மேற்பட்ட மக்கள் காணாமற்போயும் கொன்றொழிக்கப்பட்டுமிருக்கின்றார்கள் என்பதை அப்போதைய மன்னார் ஆயர் அதிவணக்கத்திற்குரிய இராயப்பு ஜோசப் அவர்கள் நல்லிணக்க ஆணைக்குழுவிற்கு முன்னால் சாட்சியமளிக்கையில் கூறியிருந்தார். இறுதி யுத்தம் முள்ளிவாய்க்காலிலே நடைபெறுகின்றபோது, அங்கு நான்கு இலட்சத்திற்கு மேற்பட்ட மக்கள் இருந்த நிலையிலும், மஹிந்த ராஜபக்ஷ அரசும் அவருடைய சகோதரர் கோத்தபாய ராஜபக்ஷவும் 75,000 பேருக்குத்தான் உணவு அனுப்பினார்கள். இதனால், உணவில்லாமல் பட்டினியாலும் மற்றும் ஷெல் குண்டுகளினாலும் பொஸ்பரஸ் குண்டுகளினாலும் கொத்தணிக் குண்டுகளினாலும் அந்த மக்கள் இறந்த வரலாறு உலகத்தில் உள்ள அனைவருக்கும் தெரியும்.

தமிழ் மக்கள் தங்களுடைய இறந்துபோன உறவுகளுக்காகச் சுதந்திரமாகச் சென்று அஞ்சலி செலுத்துவதற்கு அல்லது அவர்களை நினைவுகூர்வதற்கு 2015ஆம் ஆண்டுவரை அனுமதி வழங்கப்பட்டிருக்கவில்லை. இந்த நாட்டிலே ஒரு நல்லிணக்க அரசு ஏற்படுத்தப்பட்டிருப்பதாகக் கூறப்படுகின்ற நிலையில், 2015ஆம் ஆண்டுக்குப் பிற்பாடுதான் மெல்ல மெல்ல அந்த அனுமதி அந்த மக்களுக்கு வழங்கப்பட்டது. வடக்கு மாகாண முதலமைச்சர் கௌரவ விக்கினேஸ்வரன் அவர்களுடைய தலைமையிலே 2015, 2016, 2017ஆம் ஆண்டுகளில் இந்த வணக்க நிகழ்வுகள் இடம்பெற்றன. இம்முறை யாழ்ப்பாணப் பல்கலைக்கழக மாணவர்களும் ஒட்டுமொத்த மக்களும் அணியாகத் திரண்டு தங்களுக்கு ஏற்பட்ட அவலங்களையும் தங்கள் உறவுகளையும் நினைத்துத் தீபங்களை ஏற்றி வணக்கம் செலுத்தினார்கள். தன்னுடைய சகோதரத்தை, தன்னுடைய உறவை, தன்னுடைய தாய் தந்தையரை இழந்த ஒரு வங்கியின் உதவி முகாமையாளருக்கும் அந்த வங்கியிலே பணிபுரிகின்ற மற்றும் ஊழியர்களுக்கும் அந்த இடத்திலே தீபங்களை ஏற்றி வணக்கம் செலுத்துகிற உரிமை இந்த நாட்டிலே இல்லையென்றால், அவர்கள் எவ்வாறு இந்த நாட்டின் பிரஜைகளாக வாழ முடியும்? அங்கு அவர்கள் தடுக்கப்பட்டிருக்கிறார்கள். அதன் பின்னர் உடனடியாகவே கொழும்பிலுள்ள ஹட்டன் நஷனல் வங்கியினுடைய மத்திய நிலையத்திலிருந்து அந்த வங்கி உதவி முகாமையாளரும் ஏனைய ஒரு பணியாளரும் பணியிலிருந்து இடைநிறுத்தப்பட்டிருக்கிறார்கள். சம்பந்தப்பட்ட ஏனையவர்களும் பதவிநீக்கம் செய்யப்படுவார்களென அறிவித்தல் வழங்கப்பட்டிருக்கின்றது. அப்படியானால், ஹட்டன் நஷனல் வங்கியென்பது ஒரு சிங்கள வங்கியா? தமிழர்களுக்குரியது இல்லையா? இந்த நாட்டிலே வாழுகிற ஏனைய மக்களுக்கு உரித்தான வங்கியில்லையா? இது ஓர் இனவாத அடிப்படையில் உருவாக்கப்பட்ட வங்கியா? அப்படியான வங்கியை வடக்கு, கிழக்கில் மூடிவிடுங்கள்! இந்த நாட்டிலே அந்த வங்கி அந்த மக்களுக்குத் தேவையில்லை. இறந்துபோன தங்களுடைய உறவுகளுக்கு வணக்கம் செலுத்துகின்றவர்களைத் தடுக்கின்ற உரிமையை, அந்த மக்களுக்கு வெளிநாடுகளிலிருந்து வருகின்ற அந்நியச் செலாவணியை உறிஞ்சியெடுப்பதற்கும் அவர்களுடைய பணத்தை உறிஞ்சி அவர்களை அநாதரவாக்குவதற்கும் முயற்சிக்கின்ற ஹட்டன் நஷனல் வங்கிக்கு யார் வழங்கியிருக்கிறார்?

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே அழிந்துபோன ஒரு மக்கள் கூட்டம் சார்பாக, சாம்பல் மேடுகளிலிருந்து தங்களுடைய குழந்தைகளைத் தேடுகின்ற உறவுகள் சார்பாக, இன்றும் தங்களுடைய சொந்த நிலங்களுக்குச் செல்லமுடியாமல் கொட்டகைகளிலே இருந்து போராட்டம் நடத்துகின்ற மக்கள் சார்பாக, தங்களுடைய கைகளால் ஒப்படைத்த காணாமல்போன உறவுகளைத் தேடுகின்ற குடும்பத்தவர்கள் சார்பாக இந்த இடத்திலே நான் இந்த விடயங்களைக் கேட்கிறேன். ஒரு வங்கி ஊழியர் அல்லது ஒரு பாடசாலை அதிபர் அல்லது ஓர் அரச உத்தியோகத்தர் தன்னுடைய உறவை நினைத்துக் கண்ணீர் விடுகின்ற உரிமை இல்லையென்றால், இந்த நாட்டிலுள்ள நல்லிணக்கம் என்ன? இந்த நாட்டின் இனத் தேசியம் என்ன? அப்படியானால் நல்லிணக்கம், தேசிய ஒருமைப்பாடு பற்றிய

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

அமைச்சை முதலிலே மூடிவிடுங்கள்! அதற்கோர் அமைச்சர் தேவையில்லை. அதற்கு சனாதிபதி அவர்களும் அமைச்சராக இருக்கத் தேவையில்லை; கௌரவ மனோ கணேசன் அவர்களும் அமைச்சராக இருக்கத் தேவையில்லை.

இந்த நாட்டிலே தங்களுடைய உறவுகளுக்காகக் கண்ணீர் விடுகின்றவர்களைச் சிங்கள பௌத்த பேரினவாதக் கண்ணோடு பார்த்து அவர்களை வேலையிலிருந்து நிறுத்துகின்ற உரிமை சம்பந்தப்பட்டவர்களுக்கு இருக்கின்ற தென்றால் இது ஒரு மிகப் பெரிய அநியாயம்! ஆகவே, சிங்கள வன்முறைச் சிந்தனைகளோடும் சிங்கள ஏகாதிபத்தியச் சிந்தனைகளோடும் பௌத்த மேலாதிக்கச் சிந்தனையோடும் இயங்குகின்ற ஹற்றன் நெஷனல் வங்கியை முதலில் வடக்கு, கிழக்கிலே மூடிவிடுங்கள்! அதற்குப் பிற்பாடு ஏனைய வங்கிகள் இயங்குவது பற்றிச் சிந்திக்கலாம். ஆகவே, குறித்த நிகழ்வை இந்த சபையினூடாக வன்மையாகக் கண்டிக்கின்றேன். ஆகவே, அந்த உதவி முகாமையாளருக்கும் அவரோடு இணைந்தவர்களுக்கும் உடனடியாக வேலை வழங்கப்பட வேண்டும்;. அவர்களுடைய வேலை நிறுத்தப்படக்கூடாது. இங்கு சபை முதல்வர் அவர்கள் இங்கிருக்கின்ற நேரத்தில் இந்தச் சபையினூடாக இந்தக் கோரிக்கையை முன்வைக் கின்றேன். இது ஒரு மிகப் பெரிய அநியாயமாகும். நடந்து முடிந்த இனப்படுகொலையை மறைக்கும் வகையிலே இந்தச் செயற்பாடுகள் முன்னெடுக்கப்படக்கூடாது. இனப்படுகொலை நடந்ததென்பதை எப்பொழுது நீங்கள் ஏற்றுக்கொள்கிறீர்களோ அப்பொழுதுதான் இந்த நாட்டிலே நீதியும் நியாயமும் சமாதானமும் நிலவுமென்பதை நான் இந்த இடத்திலே குறிப்பிடுகின்றேன்.

எங்களுடைய இலங்கைத் தமிழரசுக் கட்சியின் மத்திய செயற்குழு உறுப்பினரான கறுப்பையா ஜெயக்குமார் அவர்கள் ஒரு முன்னாள் போராளி; ஒரு காலைப் போராட்டத்திலே இழந்தவர்; ஒரு மாற்றுத்திறனாளி; கிளிநொச்சியினுடைய சேவைச் சந்தையிலே ஒரு வர்த்தகர். அதனைவிட கிளிநொச்சி மாவட்டக் கிராம அபிவிருத்திச் சங்கங்களுடைய சமாசத்தின் தலைவராகவும் இருக்கின்றார். இவ்வாறான ஒருவர் நாளை மறுதினம் நான்காம் மாடிக்கு அழைக்கப்பட்டிருக்கிறார்; ஏற்கனவே இரண்டு தடவைகள் அழைக்கப்பட்டிருந்தார்; தொடர்ந்தும் அழைக்கப்படுகிறார். எங்களுடைய இலங்கைத் தமிழரசுக் கட்சியின் மத்திய செயற்குழு உறுப்பினரான அவர் ஏன் இவ்வாறு அழைக்கப்படுகின்றார்? முன்னாள் போராளி கள் ஏன் இவ்வாறு வஞ்சிக்கப்படுகின்றார்கள்? இந்த நாட்டிலே வாழ்கின்ற உரிமை அவர்களுக்கு இல்லையா?

இன்று பல போராளிகள் நோயினால் இறக்கிறார்கள். அதாவது போராட்டத்திலே ஈடுபட்டவர்கள் சிறையிலிருந்து வந்து 4 - 5 வருடங்களில் திடீர் திடீரென்று இறந்து போகிறார்கள். அவர்களுக்கு விஷ ஊசி ஏற்றப்பட்டதாகக்கூட ஒரு காலத்தில் ஆய்வுகள் நடந்தன. அந்த விடயம் இன்று கிடப்பிலே போடப்பட்டிருக்கின்றது. ஆகவே, அவர்களுடைய வாழ்க்கை கேள்விக்குறியாக இருக்கின்றது. அந்த வகையில் முன்னாள் போராளிகளுடைய நாளாந்த வாழ்க்கை சூன்யம் நிறைந்ததாகக் காணப்படுகின்றது. இவ்வாறு இருக்கின்ற போது எஞ்சியிருப்பவர்களும் விசாரணையென்ற பெயரில் நான்காம் மாடி, இரண்டாம் மாடி என்று அழைக்கப்பட்டால், இந்த நாட்டினுடைய நல்லிணக்கம் எங்கே செல்கின்றது? அரசியல் தீர்வுமின்றி, எதிர்கால வாழ்க்கைக்கான நம்பிக்கையுமின்றி இவர்கள் பற்றிய விடயங்கள் கிடப்பிலே போடப்படுகின்ற ஒரு சூழலை மாற்றியமையுங்கள்! ஒவ்வொரு சிங்களத் தேசிய தலைமகனும், சிங்கள அரசியல் தலைவரும் தேசிய நல்லிணக்கம் பற்றியும் இன ஒற்றுமை பற்றியும் வெறும் வாய்ச் சொற்களால் கூறவதல்லாமல் உண்மையாகவே சிந்திக்க வேண்டும். அதாவது இந்த நாட்டிலே என்ன நடந்து முடிந்திருக்கிறது? இந்த நாட்டுக்கு முதலிலே என்ன தேவை என்று சிந்திக்க வேண்டும். நல்லிணக்கத்தை வெறும் வார்த்தைகளால் மட்டும் உருவாக்க முடியாது.

யாழ்ப்பாணப் பல்கலைக்கழக மாணவர்கள் முள்ளிவாய்க்கால் தினத்தைக் கொண்டாடிய விதத்தை இலங்கையினுடைய பல்கலைக்கழக ஆசிரிய சங்கம் கண்டிக்கிறது. காரணம் என்னவென்றால், சம்பந்தப்பட்டவர்கள் நல்லிணக்கத்துக்குக் குந்தகமாக இருக்கிறார்களாம்! அதேநேரம், தன்னுடைய உறவுகளுக்காக விளக்கேந்தியவரை ஹற்றன் நெஷனல் வங்கி வேலையிலிருந்து நிறுத்தியிருக்கிறது. இது நல்லிணக்கத்துக்குக் குந்தகம் இல்லையா? சரத் பொன்சேகா சொல்கிறார், பிரபாகரனைப் பற்றி மக்களுக்குத் தெரியுமென்று. பிரபாகரன் தங்களுடைய தேசிய விடுதலை வீரன், தங்களுடைய தலைவன்; தங்களுக்காகப் போராடிய ஒரு சிறந்த போராளி என்பது தமிழ் மக்களுக்கு நன்றாகத் தெரியும். சிங்கள மக்கள் அதை மாற்றமாகப் பார்க்கலாம்! ஆனால், தமிழர்களைப் பொறுத்தவரை, அவர் ஓர் ஆபத்பாந்தவன்; அவர்களுடைய வாழ்வுக்காகப் போராடிய ஒரு போராளி!

இன்று ஒவ்வொருவரும் ஒவ்வொரு கருத்தைச் சொல்கின்றார்கள். ஜனாதிபதி அவர்கள் நாட்டிலே இராணுவத்தினுடைய வெற்றி விழாவைக் கொண்டாடி, "நான் இராணுவத்தை காட்டிக்கொடுக்கமாட்டேன்" என்று சொல்கிறார். அவர் ஒரு சிங்கள மக்களுடைய தலைவன் என்ற வகையில் அவருடைய கருத்துச் சரி. ஆனால், தமிழர்களுக்கு நடந்த அவலங்களுக்கு, தமிழர்கள்மீது புரியப்பட்ட இனப் படுகொலைகளுக்கு, தமிழர்களுக்கு நடந்த அநியாயங்களுக்கு நீதியைப் பெற்றுக்கொடுப்பதில் ஜனாதிபதி இதுவரை கண்டுள்ள முன்னேற்றம் என்ன? இதனை நான் இந்தச் சபையினூடாகக் கேட்கின்றேன். இந்த நாட்டிலே இவ்வாறான அநியாயங்கள் நடந்துகொண்டிருக்கின்றன. இந்த நாட்டிலே இருக்கின்றவர்கள் நீதியின்பாற்பட்டுச் சிந்திக்க வேண்டும். இது உங்களுடைய இதயத்திலே இருந்து வரவேண்டும். தமிழ் மக்களுக்குப் பிரச்சினைகள் இருக்கின்றன; அந்தப் பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும்; அவை தீர்க்கப்படாத வரைக்கும் இந்த நாடு உருப்படப் போவதில்லை என்பது பற்றி எந்தவொரு சிங்களத் தலைவரும் சிந்திக்காத வரை இந்த நாட்டிலே புரையோடிப்போயிருக்கின்ற இனப் பிரச்சினை வளர்ந்துகொண்டே இருக்கும். இந்த நிலையில் அந்த வங்கி ஊழியர்களுடைய நிலையையும் எங்களுடைய கட்சியின் மத்திய குழு உறுப்பினருடைய நிலைமையையும் இந்த இடத்திலே பதிவு செய்திருக்கின்றேன். ஆகவே, தயவுசெய்து அது குறித்து நடவடிக்கை எடுக்க வேண்டும்.

ஆகவே, இந்த நாட்டிலே இருக்கின்ற பிரச்சினைகளில் முதன்மையாக இருக்கின்ற தமிழர்களுடைய இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கு இந்த அரசும் நல்லிணக்கம் பேசுகின்றவர்களும் முதலில் தயாராக வேண்டும். இல்லையென்றால், இந்த நாட்டிலே தமிழர்களும் சிங்களவர்களும் சேர்ந்து வாழ முடியுமா? என்பதற்கான அபிப்பிராய வாக்கெடுப்பை நடாத்தத் தயாராக வேண்டும். அதுதான் இந்த நாட்டுக்கான சரியான நீதியாக அமையுமென்று கூறி, என்னுடைய உரையை நிறைவு செய்கின்றேன். நன்றி. (11th Start)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Member.

මී ළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.18]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී කථික ලැයිස්තුවේ මගේ නම නොතිබුණත්, අද දින නොපැමිණි ගරු මන්ත්‍රීවරයෙකුගේ අවස්ථාව මා හට ලබා දීම සම්බන්ධයෙන් ගරු සභානායකතුමාට මා ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන් මට පෙර කථා කළ ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණය පිළිබඳවත් රජය හැටියට අපි අවධානය යොමු කරනවා. මොකද, එතැන සිද්ධ වෙලා තිබෙන්නේ වෙනත් දෙයක්. හැටන් නැෂනල් බැංකුව කියන්නේ පෞද්ගලික බැංකුවක්. මේ බැංකුව කෙළින්ම රජය මැදිහත් වන බැංකුවක් නොවෙයි. නමුත්, යම් යම් කටයුතු පිළිබඳව එක්සත් ජාතික පක්ෂය හැටියටත්, වර්තමාන රජය හැටියටත් අපි දෙමළ ජනතාවගේ, මුස්ලිම් ජනතාවගේ, ඒ වාගේම සිංහල ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිනවා. අපි නිරන්තරයෙන්ම කටයුතු කරන්නේ මේ ජාතීන් අතර සංහිඳියාවක් ඇති කරන්නටයි. පසුගිය රජයට ඒක කරන්න බැරි වුණා. පසුගිය රජය කාලයේ යුද්ධය ජයග්‍රහණය කළා. අවුරුදු තිහක් තිස්සේ පැවැති යුද්ධයෙන් පීඩාවට පත් වූ ජනතාවගේ සියලු ප්‍රශ්නවලට විසඳුම් දෙන්න අපට බැරි වුණත්, අවුරුදු 10ක් වැනි කෙටි කාලයක් තුළ ඔවුන්ගේ යම් යම් ප්‍රශ්න විසඳන්නට අපි බලාපොරොත්තු වනවා. හැබැයි, මේ අවස්ථාවේදී මා තවත් දෙයක් කියන්න ඕනෑ. මේ රටේ ඒකීයභාවය වෙනුවෙන්, භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් කවුරු හෝ ප්‍රකාශ නිකුත් කරනවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පක්ෂව අත උස්සපු, ඒ පිළිබඳව අවධානය යොමු කරලා ඒ සම්බන්ධයෙන් දිවුරුම සහ ප්‍රතිඥාව දීපු මන්ත්‍රීවරු -මහජන නියෝජිතයින්- හැටියට රජය වෙනුවෙන් අපි ඒ පිළිබඳව විශේෂයෙන්ම සැලකිලිමත් වන්න ඕනෑ. මොකද, ගරු සිවාජිලිංගම් මහතා වැනි මන්ත්‍රීවරු කරන ප්‍රකාශත් සමඟින් නැවත මේ රටේ ජාතිවාදයක් අවුස්සන්න වත්මන් රජය හැටියට අපට ඉඩ දෙන්න බැහැ. එම නිසා රජයක් හැටියට අපි විශේෂයෙන් ඒ පිළිබඳව දැඩි ලෙස සැලකිලිමත් වනවා. හැබැයි, මුස්ලිම්, සිංහල, දෙමළ කියන හැම කෙනාගේම අයිතිවාසිකම් වෙනුවෙන් මේ රජය නිරන්තරයෙන් පෙනී සිටිනවාය කියන පණිවුඩයත් මා රජය වෙනුවෙන් විශේෂයෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හිටපු මුදල් නියෝජ්‍ය අමාත්‍ය, ඒ වාගේම අපේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකු වූ පාර්ලිමේන්තු මන්ත්‍රී (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා මගේත් ආර්ථික විද්‍යා ගුරුවරයෙක්. එතුමාගේ සම්මන්ත්‍රණවලටත් එදා මම ගියා. හැබැයි, විපක්ෂයේ ඉඳලා, එහෙම නැත්නම් ඒකාබද්ධයේ ඉඳලා එතුමා කියන සියලු කාරණාවලට එකඟ වන්න අපට බැහැ. ඒකත් මතක තබා ගන්න ඕනෑ. එතුමා මතු කළ සමහර කාරණාවලට ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමා උත්තර දුන්නා. බන්දුල ගුණවර්ධන මැතිතුමා තමයි මේ රටේ ආර්ථිකය පිළිබඳව අමුතුම දේවල් කියපු කෙනා. රුපියල් 2,500කින් පවුලක හතර දෙනෙකුට මාසයක් ජීවත් වන්න පුළුවන්ය කියලා කියූ හිටපු මුදල් නියෝජ්‍ය ඇමතිවරයෙකු තමයි එතුමා. ඒ විතරක් නොවෙයි, පසුගිය රජය කාලයේ මුදල් අමාත්‍යාංශයේ ඇමතිවරයා හැටියට පමණක් හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජාතික වියදමින්, ජාතික අය වැය ලේඛනයෙන් සියයට 62ක්, වෙන් කර ගත්තා, එතුමා ඇතුළු කණ්ඩායමට. නමුත්, ඒ පිළිබඳව කථා කරන්න කවදාවත් ඉඩක් තිබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි, 2014 වර්ෂය වනකොට සියයට 7ක ආර්ථික වර්ධනයක් තිබුණා නම්, අවුරුදු තුනක් ඇතුළත එක පාරට සියයට 3.1ට අපේ ආර්ථික වර්ධනය පහළ බහින්න තරම් මොන වාගේ ප්‍රාතිහාර්යයක් වෙලා ද කියලා මම අහනවා. ඒක කියන්න මම දන්නේ නැහැ. නමුත්, එම සමහර කාරණා පට්ටපල් බොරුය කියලා මම කියනවා. ඒවා පසුව වෙනස් වුණා. රවි කරුණානායක මැතිතුමා එදා මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කරන කොට ප්‍රකාශ කළා, මහ බැංකුව දීපු සමහර දත්ත අපට පිළිගන්න පුළුවන්කමක් නැහැයි කියලා.

මේ රටේ තෙල් මිල පිළිබඳව කථා කරලා තෙල්වලින් ලැබෙන ලාභයෙන් මොකක්ද කරන්නේ කියලා ඇහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කරුණ මම පැහැදිලිව කියන්න ඕනෑ. ආනයනය සහ අපනයනය මත රැඳී තිබෙන ආර්ථිකයක් තමයි අපට තිබෙන්නේ කියා අපි දන්නවා. අද අපේ තේ, රබර්, පොල්වලට වටිනාකම අඩු වුණත්, අද අපේ විදේශ ආදායම්වලින් පළමු ස්ථානයට තිබෙන්නේ විදේශ රැකියාවලින් ලබා ගන්නා ආදායමයි; දෙවෙනි ස්ථානයට තිබෙන්නේ ඇඟලුම් කර්මාන්තයෙන් ලැබෙන ආදායමයි; තුන්වෙනි ස්ථානයට තිබෙන්නේ සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායමයි; ඊට පසුව තමයි අනික් හැම ආදායමක්ම තිබෙන්නේ. එහෙම නම්, අපි මේ රටේ සිටින දෙකෝටි දසලක්ෂයක ජනතාවට සුබසාධනය ඉටු කරන රාජ්‍යයක්. මතක තබා ගන්න, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයට වඩා පසුගිය අවුරුදු තුන තුළ මේ රටේ සුභසාධන කටයුතු ඉතාමත් හොඳින් අපි ඉෂ්ට කළාය කියන කාරණය. පවුල් දහහතරලක්ෂයකට සමෘද්ධිය බෙදන ගමන්, ජ්‍යෙෂ්ඨ වැඩිහිටියන්ට අපි රුපියල් 2,000ක දීමනාවකුත් ගෙවනවා. විශේෂයෙන්ම එක්සත් ජනතා නිදහස් සන්ධානයට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කවදාවත් හිතන්නවත් බැරි වුණු දේවල් අපි කරලා තිබෙනවා. මේ අය අද මහාලොකුවට කථා කරනවා, මන්ද පෝෂණය ගැන. නමුත්, බිත්තරයක් කන්න අතේ පිච්චියක් නැතිව සිටි අභිංසක ගැබිනි මාතාවන්ට මාස 10ක් තුළ රුපියල් 20,000ක වටිනාකමකින් යුක්ත වූ පෝෂණ මල්ලක් ලබා දෙන්න තරම් කාරුණික වූ ආණ්ඩුවක් අපි.

ඒ විතරක් නොවෙයි, 2015 ජනවාරි 8වැනිදායින් පස්සේ අපි තෙල් මිල රුපියල් 33කින් අඩු කළා. කවුරු මොනවා කිව්වත් ස්කූටරයක්, ත්‍රීවිල් එකක්, මෝටර් රථයක් ෂෙඩ් එකට ගිහිල්ලා පළමුවැනි තෙල් ලීටරය ගහනකොට රුපියල් 33ක් ඉතිරි කරගෙන සාක්කුවේ දා ගන්න පුළුවන්කම තිබුණා. දෙවැනි තෙල් ලීටරය ගහනකොට රුපියල් 66ක් ඉතිරි කරගෙන සාක්කුවේ දා ගත්තා. තුන්වැනි තෙල් ලීටරය ගහනකොට රුපියල් 99ක් ඉතිරි කරගෙන රුපියලක් ෂෙඩ් එකට දීලා රුපියල් 100ක් සාක්කුවේ දා ගන්න තරම් තෙල් මිල අඩු වෙච්ච යුගයක් අපි ක්‍රියාත්මක කළේ ඉතිහාසයේ පළමුවැනි වතාවටයි. සමහර අය දැන් අහනවා, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වෙනකොට අපේ රටේ තෙල් මිල අඩු කරන්නේ නැත්තේ මොකද කියලා. අඩු කරන්න පුළුවන්, හැබැයි, අපේ අම්මාගේ, තාත්තාගේ බූදලයෙන්; එහෙම නැත්නම්, අපේ බන්දුල ගුණවර්ධන මහත්මයාගේ මුතුන්මිත්තන් හරිහම්බ කරපු සල්ලිවලින්. මේ මුදල් රටේ ජනතාවගේ සමෘද්ධියට, මම කලින් කියපු සුභසාධනවලටයි යොදවන්නේ. බෙහෙත් වර්ග 48ක මිල අඩු කරද්දී, යම් පාඩුවක් වෙනවා නම්, අපි ඒවා පියවා ගන්න ඕනෑ. රුපියල් තිස් හතලිස්දහසක් දීලා ඇස් කාචය කඩෙන් ගත්ත අභිංසක අම්මාට, තාත්තාට අපේ රජයෙන් ඒක දැන් නොමිලේ ලබා දෙනවා. ස්ටෙන්ට් එකක් රුපියල් ලක්ෂ 3කට ආසන්න

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

මුදලක් දීලා ස්ටෙන්ට්ස් 4ක් දාන්න වුණොත්, රුපියල් ලක්ෂ 12ක් විතර වියදම් වෙනවා. දැන් මේ ප්‍රතිකාර සියල්ල නොමිලේයි ක්‍රියාත්මක කරන්නේ. ඒ හරහා රජයට ලැබෙන පාඩුව පියවා ගන්න අපට කොහෙන්ද සල්ලි ලැබෙන්නේ? [බාධා කිරීමක්] ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා පාඩුවේ ඉන්න කෝ. මෙතැන කෑ ගහන්න එපා. නිකම් කෑ ගහන්නේ නැතිව ඉන්න මන්ත්‍රීතුමා. හැම එකකටම කථා කරනවා. ඕනෑ එකටත් කථා කරනවා; නැති එකටත් කථා කරනවා. මගේ වෙලාවෙන් විනාඩි 5ක් දෙන්නම්, පුළුවන් නම් ඔබතුමා කථා කරන්න කෝ. කථා කරන්න දන්න කෙහෙල් මලකුත් නැහැ. ගරු මන්ත්‍රීතුමා, ලෝ වැඩ සභාවේ තිබෙනවා, "තම තම නැණ පමණින් දැන ගත යුතු" කියලා. ඔබතුමාට ඕනෑ නම් මගෙන් විනාඩි 5ක් දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාවට බාධා කරන්න එපා කියලා මෙතුමාට කියන්න. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා කථා කරනකොට අපි බොහොම සාවධානව අහගෙන හිටියා. ශිෂ්ට බවක් තිබෙන්න ඕනෑ. ඒක මතක තියාගන්න. මම තමුන්නාන්සේට මුකුත් කියන්නේ නැහැ, පාර්ලිමේන්තුවට ආපු නවක මන්ත්‍රීවරු විධියට ඔබතුමන්ලාට ඉගෙන ගන්න කියලා විතරයි මම කියන්නේ. අපිත් පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරු විධියට මෙතැනින් බොහෝ දේ ඉගෙනගෙන තිබෙනවා. අපි හැමෝටම විනයක් තිබෙන්නට ඕනෑ.

අපි 4,500,000කට සුරක්ෂා රක්ෂණය දෙනකොට ඒවා දෙන්නේ කොහෙන්ද? මේ මුදල් රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ හෝ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ බූදලයෙන් ගේනවා නොවෙයි. හැබැයි, අපට තිබෙන්නට ඕනෑ ආර්ථිකය කළමනාකරණය කරන්න පුළුවන්කමක්. ඒ නිසා තෙල් මිලෙන් යම්කිසි වාසියක් ලැබුණත්, ඒ වාසිය දෙන්නේ ජනතාවටයි. ඒ වාසිය තෙල්වලින්ම ජනතාවට නොදුන්නාට ඒ වාසිය දෙන්නෙත් ජනතාවටමයි. ඒක තෙල්වලින් විතරක් නොදුන්නාට ඒකේ වාසිය ජනතාවට විවිධ දේවල්වලින් ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රාජ්‍ය සේවකයන්ට රුපියල් 10,000කින් වැටුප් වැඩි කරද්දී මේ මුදල් අපි කොහෙන්ද ගේන්නේ කියලා මම අහනවා. ඒ කාලයේ නම් හාල් සේරුව හඳෙන් ගේනවා කියලා කියපු කාලයක් තිබුණා. නමුත්, මේවා ගේන්න බැහැ. අපේ රටේ තිබෙන මේ ආර්ථිකය කළමනාකරණය කරන්න ඕනෑ. අපි ආර්ථික ඔස්තාර්ලා නොවෙයි. නමුත්, අපි ආර්ථිකය ගැන යමක් දන්නවා. මොකද, අපි සමාජ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව ටිකක් ඉගෙන ගත්ත නිසා. ඒ විතරක් නොවෙයි, දැන් අපනයන ආදායම අඩු තත්ත්වයක් තිබෙන්නේ. ආනයන වියදම වැඩි තත්ත්වයක් තිබෙනවා. ගෙවුම් ශේෂයේ අඩුවක් තිබෙනවා. ඒ ගෙවුම් ශේෂය පියවාගන්න අපට ඕනෑ. විදේශ වත්කම් අපි ඇති කරගන්න ඕනෑ. ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමාත් ආර්ථික විද්‍යාව කළා ද කියලා කියන්න මම දන්නේ නැහැ. සමහර අය අමු කැවිලා වාගේයි කථා කරන්නේ. මේ මුකුත් දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි, එතුමන්ලා ණය ගැනත් කියනවා. අපේ රටේ ණය රුපියල් බිලියන 10,313ක් තිබුණා කියලා කියනවා. එතුමන්ලා රට පාලනය කරපු අවුරුදු 10ට රුපියල් බිලියන 5,168 ලු; අපි ආණ්ඩුව බාර අරගත්ත මේ අවුරුදු 3ට රුපියල් බිලියන 2,923යි කියලා බන්දුල ගුණවර්ධන මැතිතුමා කියනවා. නමුත්, මම අහනවා මේ ණයකරය ඇති වුණේ කොහොමද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරාය හදනකොට, අභස්යාත්‍රා තොටුපොළවල් හදනකොට එවැනි තත්ත්වයන් තුළ ඉතාමත් පැහැදිලිව කියන්න ඕනෑ මේ සියල්ල ණයකරයට යටත්වයි කළේ කියලා. හැම දරුවෙක්ම ලක්ෂ 5ක ණයකරයකට යට කරපු මහින්ද රාජපක්ෂ පාලනය සම්පූර්ණයෙන්ම මේකට වග කියන්න ඕනෑ. ඒ නිසා තමයි අපි ණයකරයක් වුණේ. ඉතිහාසයේ කවදාවත් නැති ණයක් ගෙවන්නට අපට සිද්ධ වුණේ ඒකයි. මේක පසුගිය අවුරුදු ගණනේදී තමයි වැඩි වුණේ. එම නිසා අද ඊයේ විතරක් නොවෙයි,-

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
එහෙම නම් ණය බර අඩු වෙන්න ඕනෑ නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
අඩු කරනවා, පොඩ්ඩක් ඉන්න. අඩු කරන්න තමයි ලැහැස්ති වෙලා ඉන්නේ. ඒක මතක තියා ගන්න. [බාධා කිරීමක්] ඔබතුමාට උත්තර දෙන්න මට වුවමනාවක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමාට උත්තර දෙන්න මම ලැහැස්ති නැහැ. මම ලැහැස්තියි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා නම් උත්තර දෙන්න. ආර්ථිකය ගැන කෙහෙල්මලක්වත් දන්නේ නැතිව මෙතැනට ඇවිල්ලා නිකම් කෑ ගහන මිනිස්සුන්ට උත්තර දෙන්න අපි ලැහැස්ති නැහැ. ඒ විතරක් නොවෙයි, ආර්ථිකය වැටිලා කියලා කිව්වා.

දැන් බලන්න, 2013 වර්ෂය වන විට ඩොලර් මිලියන 6407ක් වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් 2017 වර්ෂය වන විට ඩොලර් මිලියන 7164 දක්වා ක්‍රමිකව වැඩි වෙලා තිබෙනවා. ඒක මතක තියා ගන්න. 2015 වර්ෂයේ එය 6,980යි. 2018 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි 1,301යි. 2018 වර්ෂයේ ඒ මාස දෙකට අදාළ සංඛ්‍යාලේඛන විතරයි අපි ළඟ තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. රුපියල අවප්‍රමාණ වීම ගැන කථා කළා. මේක ලෝකයේ හැම රටකම සිද්ධ වන දෙයක් බව පැහැදිලිව කියන්න ඕනෑ. ඩොලරයට අනුකූල ලෙස හැම රටකම මුදල් ඒකක අවප්‍රමාණ වෙනවා. ඒක අපට ප්‍රශ්නයක් තමයි. මොකද, එයින් පාඩුව සිදු වෙන්නේ අපටයි. අපේ රට අපනයන ආර්ථිකයක් තිබෙන රටක් නොවෙයි. අපේ රටේ ආනයන වැඩියි. විශේෂයෙන් අපේ පාරිභෝගික ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම් වැඩියි. ඒවා මේ රටේ නිෂ්පාදනය කරන දේවල් නොවෙයි. මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. මේ රටාව, මේ සම්ප්‍රදායය ගෙනාවේ මේ අවුරුදු තුනේ මේ ආණ්ඩුව නොවෙයි. මේ සම්ප්‍රදායය එදා සිට ආපු එකක්. නිදහස් ආර්ථික ප්‍රතිපත්තියත් එක්ක තමයි අපේ රට ටිකක් හරි ඔළුව ඉස්සුවේ. නිදහස් ආර්ථික ප්‍රතිපත්තියට පින් සිද්ධ වෙන්න තමයි අද විදේශ රැකියා ආශ්‍රිතව ලැබෙන ආදායම වැඩි වෙලා තිබෙන්නේ. ඉස්සර ඒවා තිබුණේ නැහැ. ඉස්සර අපි තේ, පොල්, රබර් ආර්ථිකය කර ගහගෙනයි හිටියේ. නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය නිසා තමයි සංචාරක ව්‍යාපාරය දියුණු වුණේ. ඒ නිසා තමයි ඇඟලුම් කර්මාන්තය ඇති වුණේ. ඒ සම්බන්ධයෙන් හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාට පින් සිද්ධ වෙන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ පැහැදිලි ප්‍රතිපත්තිය නිසා තමයි නිදහස් වෙළෙඳ කලාප තුළ ඇඟලුම් ක්ෂේත්‍රය වර්ධනය වෙලා, ඇඟලුම් කර්මාන්ත 200 ඇති වුණේ. ඒකත් කෑවා. පසුගිය ආණ්ඩු කාලයේ මොකක්ද කළේ? GSP plus සහනය නැති කර ගත්තා. මහ ලොකුවට කියනවා හොඳ රටක්ලු අපට භාර දුන්නේ. මොන වාගේ රටක්ද අපට දුන්නේ? ඔය තරම් හොඳ රටක් නම් ඇයි- [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා, එතුමාගේ කථාවට බාධා කරන්න එපා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඔය තරම් හොඳ රටක් නම් ඇයි ඔබතුමන්ලා 2015 වර්ෂයේ ජනාධිපතිවරණය තිබ්බේ? මේ රට මේ තරම් ශක්තිමත්, ආශ්චර්යවත් රටක් හැටියට තිබුණා නම්, 2017 වර්ෂයේ ජනාධිපතිවරණය පවත්වන්න කල් තිබියදී- [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට බාධා කරන්න එපා, ගරු ප්‍රසන්න රණවීර මැතිතුමා. ඊළඟට ඔබතුමාගේ අවස්ථාව තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මෙතුමාට අවශ්‍ය නම් මගේ කාලයෙන් විනාඩි පහක් දෙන්නම්. මට සොච්චම් වේලාවක් තිබෙන්නේ. ඕනෑ නම් ඒකෙන් විනාඩි පහක් දෙන්නම්. කරුණාකර එතුමාට මගේ කථාව අහගෙන ඉන්න කියන්න. අහගෙන ඉන්න බැරිනම් එතුමාට එළියට යන්න කියන්න. එහෙම තමයි මම කියන්නේ. සංවරව හැසිරෙන්න බැරි නම් මෙතැනින් එළියට යන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රට මේ තරම්ම ආශ්චර්යවත්, ආර්ථිකය සංවර්ධනය වුණු රටක් කියලා මහ ලොකුවට, උජාරුවට කියනවා. එහෙම නම් ඇයි 2017 වර්ෂය වෙනතෙක් මහින්ද රාජපක්ෂ මහත්මයාට පාලනය කිරීමට කාලය තිබියදී එහෙම නොකළේ? එතුමාගේ එහෙම කළේ 2015 වර්ෂය වෙනකොට සම්බාධක පනවනවා කියලා දන්න නිසායි. අපට GSP Plus සහනය නැති වුණා. මත්ස්‍ය තහනම පැනෙව්වා. ඒ විතරක් නොවෙයි, ජනාධිපතිවරයා විදුලි පුටුවට යවනවා කිව්වා. එහෙම කාලයක් තිබුණේ. එදා ඩයස්පෝරාව නිසා වෙනත් රටකට යන්න බැහැ. කැනඩාවට යන්න බැහැ, ඉතාලියට යන්න බැහැ. විශේෂයෙන්ම ජර්මනියට, ඕස්ට්‍රේලියාවට යන්න බැහැ. අපි ඒ රටවලට ගියාම ඒ රටවල මිනිසුන් අප දැක්කේ 'මොක්කුද' වාගේ. අද එහෙමද? අද ඕනෑ කෙනෙකුට ඕනෑම රටකට යන්න පුළුවන්. මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ රටකට ගියත් ලංකාවේ කෙනකු හැටියට පාවඩ එළලා පිළිගත්තේ. එහෙම රටක් නිර්මාණය වුණේ අපේ ආණ්ඩුවට පින් සිද්ධ වෙන්නයි කියන එක මම ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒක මතක තියා ගන්න.

ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න.

ශ්‍රී ලංකා ඉතිහාසයේ අපට ලැබුණු වැඩිම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය වන ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9 ලැබී තිබෙන්නේ 2017 වර්ෂයේයි. ඒක මතක තියා ගන්න. මේවා බොරු නම් ඔප්පු කරන්න කියලා අපි කියනවා. 2017 වර්ෂයේ සෘජු විදේශ ආයෝජන ලෙස එක්සත් ජනපද ඩොලර් බිලියන 1.9ක් හෙවත් රුපියල් බිලියන 290ක් ශ්‍රී ලංකාවට ලැබිලා තිබෙනවා. එය 2016 වර්ෂයට වඩා සිව් ගුණයක වර්ධනයක්.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, "මේකට ආයෝජකයෝ තියා බල්ලෙක්වත් එන්නේ නැහැ." කියලා. කොහොමත් බල්ලෝ එන්නේ නැහැ. ඒ දවස්වල මහින්ද රාජපක්ෂ පාලනය යටතේ තමයි බල්ලෝ ගෙනාවේ. බල්ලෝ ගෙනැත් ශීත කාමරවල - වායුසමීකරණය කරපු කාමරවල- තියලා රට කෑම දුන්නා. ඒ කාලයේ ඒ රට කෑමවල මිලත් අඩු කළා. එහෙම කාලයක හිටපු මිනිස්සු තමයි අද ලජ්ජා නැතිව මෙහෙම කථා කරන්නේ. ඒ අය මෙහෙම කථා කරන්නේ රෙදි ඇඳගෙනද කියලා මම අහනවා.

2014 වර්ෂයේ වාර්තා වූ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.7ක සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය 2017 වර්ෂයට පෙර වාර්තා වූ වැඩිම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයයි. 2010 වර්ෂයේ ලැබුණු සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 450යි. මම මේ කියන ගණන් හිලව් අහගන්න. 2010 වර්ෂයේ ලැබුණු සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 450යි. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා, ඔබතුමාට කථා කරන්න අවස්ථාව දෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
2015 වර්ෂයේ ලැබුණු සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 970යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වේලාව තිබෙනවා නම් මම මේ අයට පිළිතුරු දෙන්න ලෑස්තියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
විමල් වීරවංශ මහත්මයා කථා කරපු කාරණා සම්බන්ධයෙන් පිළිතුරු දෙන්න මට විනාඩියක කාලයක් ලබා දෙන්න. ඒකටත් පිළිතුරු දෙන්න ඕනෑ.

එදා අය වැය පරතරය සියයට 7යි. අද අය වැය පරතරය සියයට 4.5යි. එදා රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත්තාම සියයට 12යි. අද සියයට 15යි. මේ සංඛ්‍යාලේඛන බොරු නම් ඔප්පු කරන්න කියලා මම කියනවා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

මම අපේ ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාට කියනවා, පුළුවන් නම් මේවා අසත්‍යයි කියලා ඔප්පු කරන්න කියලා. එහෙම නැතිව නිකම් බොරුවට කථා කරන්න ඕනෑ නැහැ. අද අපනයනය සියයට 11කින් වැඩි වී තිබෙනවා. යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කිරීම නිසා ආදායම සියයට 40කින් වැඩිවෙලා තිබෙනවා. ඉතිහාසයේ වැඩිම විදේශ විනිමය ශේෂය අද තිබෙනවා. ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන 11යි. ඒ කියන්නේ කෝටි 1100යි. අපට මේ වාගේ ශක්තිමත් ආර්ථිකයක් තිබෙනවා. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා ප්‍රකාශ කළා වාගේ 2017 දෙසැම්බර් මාසයේ ඇමෙරිකන් ඩොලර් මිලියන 1900ක් හැටියට ඉතිහාසයේ වැඩිම ආයෝජනය ලැබිලා තිබෙනවා. මේ මුදලින් හම්බන්තොට වරායට ලැබුණ මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 300 අඩු කළත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 1600ක් ලැබිලා තිබෙනවා. ඒකත් 2016ට වඩා වැඩි ප්‍රමාණයක්. ඒ අනුව ආදායම දෙගුණයක් වැඩිවෙලා තිබෙනවාය කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මා ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. බාධා කළ අයටත් ස්තුතිවන්ත වෙනවා. බාධා කරන කොට තමයි හොඳ පන්නරයක් ඇතිව කථා කරන්න පුළුවන්. ඒ නිසා බාධා කරන්න කරන්න අපි ශක්තිමත් වෙනවා. මේ ආණ්ඩුවත් ඒ වාගෙයි. බාධා කරන්න කරන්න ආණ්ඩුව නියම ගමනක් යනවාය කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.35]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා කථා කළාට පස්සේ කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වන අතර, මගේ කථාව ඉවර වන තුරු එතුමා රැඳී සිටිවි කියලා තමයි මම බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2015 ජනවාරි 08වැනි දා මේ ආණ්ඩුව බලයට ආවේ මහා ආර්ථික ඔස්තාර්ලා විධියටයි. මේ රටේ සුඛිත මුදිත ආර්ථිකයක් ඇති කරනවාය කියලායි බලයට ආවේ. මිනිසුන්ගේ වක්‍ර බදු අඩු කරලා, සෘජු බදු වැඩි කරනවා කිව්වා. මිනිසුන්ට විශාල සහන මලු දීලා, විදේශ ආයෝජකයන් ගෙන්වලා, මේ රටේ ණය බර නැති කරලා මිනිසුන්ට සැපවත්, සුඛිත මුදිත ආර්ථිකයක්, ජීවන තත්ත්වයක් ගොඩනඟනවා කියලා තමයි මේ ආණ්ඩුව බලයට ආවේ. එහෙම බලයට ඇවිල්ලා මහ මැතිවරණයට යන්න තිබුණු අවස්ථාවේ, ඒ දින 100 ඇතුළත මිනිසුන්ට සහන ටිකක් දුන්නා. එදාත් අදත් අතර සහනවල වෙනස කොහොමද? එදා හාල් මිල කීයද, අද හාල් මිල කීයද? එදා පොල් ගෙඩිය කීයද, අද පොල් ගෙඩිය කීයද? එදා කොත්තමල්ලි මිල කොහොමද? එදා මිරිස් මිල කොහොමද? අද මිල කීයද? මේ ආර්ථික ඔස්තාර්ලාගේ තිබෙන්නේ මහ ලොකු කයිවාරුව විතරයි. කට විතරයි, වැඩ නැහැ.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ රුපියල් බිලියන 7391ක් ණයයි කිව්වා. නමුත් අද ඒක බිලියන 10,300 දක්වා වැඩිවෙලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට අවුරුදු තුනක් ඇතුළත රුපියල් බිලියන 3000ක් මේ ආණ්ඩුව ණය අරගෙන තිබෙනවා. මේ ආණ්ඩුව මේ රටේ මිනිස්සු විශාල ලෙස ණයකරුවන් කර තිබෙනවා. මේ වන විට ඒක පුද්ගල ණය ප්‍රමාණය ලක්ෂ 4 පන්නලා. එක පුද්ගලයෙක් ලෝකයට එපමණක් ණයයි. ඔන්න අද තත්ත්වය. එදා 2014දී, විදේශ ණය රුපියල් බිලියන 7391යි. අද රුපියල් බිලියන 10,313යි. මේ වසර තුන ඇතුළත ණය ප්‍රමාණය රුපියල් බිලියන 3000කින් වැඩි කර තිබෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ 2009 සිට 2014 දක්වා රුපියල් බිලියන 3230ක් ණය ගත්තා. නමුත්, මහින්ද රාජපක්ෂ රජය සමයේ සංවර්ධන ව්‍යාපෘති රාශියක් කළා. නමුත්, අද පාරක් හදාගන්න විධියක් නැතිවෙලා තිබෙනවා. හිටපු මහාමාර්ග ඇමතිතුමා දැන් මෙතැන හිටියා. කැලණියේ විද්‍යාලංකාර පිරිවෙන ළඟ තිබෙන ගුවන් පාලම අලුත්වැඩියා කටයුතු පටන් අරගෙන දැනට අවුරුද්දකට වැඩියි. තවම ඒක නිම කරන්න බැරිවෙලා තිබෙනවා. ඔන්න ඔස්තාර්ලාගේ වැඩ කටයුතුවල හැටි. අපි ඒ ගුවන් පාලම හැදුවේ දවස් 61කින්. ඔව්, මහින්ද රාජපක්ෂ යුගයේ ණය ගත්තා. මෙන්න කරපු වැඩ.

එදා වරායවල් හැදුවා, ගුවන් තොටුපොළවල් හැදුවා, අධිවේගී මාර්ග හැදුවා, වාරිමාර්ග හැදුවා, විදුලි බලාගාර හැදුවා, පාසල්, ඉස්පිරිතාල, විශ්වවිද්‍යාල පද්ධති සංවර්ධනය කළා; දියුණු කළා. මේ ආණ්ඩුව මේ අවුරුදු තුනට බිලියන 3000ක් ණය අරගෙන කරපු දෙයක් කියන්න. මේක ණයබර නැති කරන්න ආපු ආණ්ඩුව, හොරකම, දූෂණය, නාස්තිය අඩු කරන්න ආපු ආණ්ඩුව. ආණ්ඩුව ආවා, ඇවිල්ලා දවස් කීපයකින් මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් එක්ක එකතුවෙලා ට්‍රිලියනයකට වැඩේ දුන්නා. අද ඒවා ඔක්කෝම ගෙවන්න වෙලා තිබෙන්නේ මේ රටේ දුප්පත් ජනතාවට; අහිංසක මිනිසුන්ට. ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කිව්වා, 2017 USD බිලියන 1.7ක් ආවා කියලා. ඔව්, එසේ ආවේ අපේ කාලයේ ගෙනා ආයෝජනවල මුදල්. ඒ සියල්ල අපේ මුදල්. මිලියන 17යි ඇවිල්ලා තිබෙන්නේ. මහ ලොකු ජාත්‍යන්තර සම්බන්ධකම් තිබෙනවාය කිව්වා, විදේශ ආයෝජකයෝ ගෙනෙනවාය කිව්වා, Volkswagen Company ගෙනෙනවාය කිව්වා. තවම නැහැ. දැන් බොරුවට කියනවා, 2018 සඳහා බිලියන 2.9ක ගිවිසුම් අත්සන් කරලා ආයෝජකයෝ ඇවිත් තිබෙනවාය කියලා. එක රුපියලක් ඇවිල්ලා තිබෙනවා නම් ඔප්පු කරන්න කියලා මා කියනවා. එක රුපියලක්! සිහින තමයි තිබෙන්නේ. මේ ආණ්ඩුවට සිහින කෝටියක් තිබෙනවා. නමුත් අතේ එක රුපියලක් නැහැ. මේ ආණ්ඩුව ගිවිසුම් ගහනවාය කියනවා. පැමිණි ආයෝජකයෙක් නැහැ. තවම කුරුණෑගල දිස්ත්‍රික්කයට Volkswagen Company ඇවිල්ලා නැහැ. අපි ගෙනා ආයෝජකයින්ට අමතරව තවම ආයෝජකයෝ ඇවිල්ලා නැහැ. අද වෙන වෙන ගිවිසුම් ගහලා අනෙක් මිනිසුන් සන්තෝෂ කරන ව්‍යාපාර විතරයි ගෙනයන්නේ.

තරුණ-තරුණියන්ගේ විරැකියාව නැති කරනවාය කිව්වා. අද විරැකියා තත්ත්වය මොකක්ද? මහ බැංකු වාර්තා අනුව එදා මේ රටේ විශාල පිරිසක් සේවා නියුක්තව සිටියා. නමුත්, 2017 වාර්තාව අනුව අද වනවිට රැකී-රක්ෂා ප්‍රමාණය ලක්ෂ දෙකකින් පමණ අඩු වෙලා තිබෙනවා. හැබැයි, බලයට ආවේ කොහොමද? ලක්ෂ 10කට වසර 5ක් ඇතුළත රක්ෂා දෙනවාය කියලා කිව්වා. අද ඒවා කෝ? අද දීපු රක්ෂාවක්, දීපු සහනයක් තිබෙනවාද? අද මිනිසුන්ට ජීවත් වීමේ හැකියාවක් නැහැ. අද ජීවත් වෙන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

අපේ කාලයේ දැවැන්ත යුද්ධයක් තිබියදීත් මේ රට දැවැන්ත සංවර්ධනයක් කරා ගෙන ගියා. ආර්ථික වර්ධන වේගය සියයට

7.5න් ඉහළට අරගෙන ගියා; ඒ මට්ටමේ පවත්වාගෙන සිටියා. ආසියාවේ සංවර්ධනය වෙමින් පවතින රටක් බවට මේ රට පත් වුණා. ඒ වාගේම ආයෝජකයින් විශාල පිරිසක් ගලා එන යුගයක් බවට එම යුගය පරිවර්තනය වුණා. නමුත්, මේ ආණ්ඩුව ආපු ගමන් පෙබරවාරි 27 වැනි දා මහ බැංකුවට කළේ මොකක්ද? ඒ නිසා මේ රටට එන ආයෝජකයින්ගේ විශ්වාසය නැති වුණා. එක ආයෝජකයෙක් තවම ආවේ නැහැ. ආයෝජකයෝ ගෙන්වන්න තවම උත්සාහ කරනවා. නමුත්, එන්නේ නැහැ. අපේ කාලයේ ලැබුණු මුදල් හැරුණු කොට, තවම ආයෝජනයෙන් මුදල් ලැබුණේ නැහැ. ගිවිසුම් ගහනවා කිව්වාට, තවම ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ.

එදා සියයට හතට තිබුණු ආර්ථික වර්ධන වේගය අද සියයට 3.1ට බැහැලා. මහ බැංකු වාර්තා අනුවයි මම මේ කියන්නේ. එදාත් මහ බැංකු වාර්තා අනුව තමයි කිව්වේ. අපි සාමාන්‍යයෙන් පිළිගන්නේ Central Bank Report එක. අද ආර්ථික වර්ධන වේගය සියයට 3.1ට බැහැලා. තව-තවත් බලයේ රැඳී ඉන්න තරම් මේ ආණ්ඩුවට නිවැරදි වැඩ පිළිවෙළක් නැහැ. මේ රටේ සංවර්ධන වේගය තවත් පහළ යනවා. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ යුද්ධය පැවැති සමයේවත් මේ විධියට ආර්ථික වර්ධන වේගය අඩු වුණේ නැහැ. 2001න් පසුව 2017 අවුරුද්දේ තමයි මුල් වතාවට -අවුරුදු 16කට පසුව- මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3.1ට පහත වැටුණේ. මේ ආර්ථික ඔස්තාර්ලා ටික එකතු වෙලා රට ඇදගෙන ගිය තත්ත්වය ඒකයි.

ඊළඟට, දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 6ක ප්‍රමාණයක් අධ්‍යාපනයට වියදම් කරනවා කිව්වා. තවම වියදම් කර තිබෙන්නේ සියයට 1.5යි. සෞඛ්‍යයට සියයට තුනක් වියදම් කරනවා කිව්වා. වියදම් කළේ සියයට 1.5යි. එදා මේ විධියට පොරොන්දු දීලා අධ්‍යාපනයේ විශාල පෙරළියක් ඇති කරනවා කිව්වා. අධ්‍යාපනයට දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට හයක් වෙන් කළාම, සියලුම පාසල්වලට සියලු සැප පහසුකම් ටික හම්බ වෙලා, දරුවන්ගේ අධ්‍යාපනය විශාල ලෙස වර්ධනය වෙයි කියලා අපි හිතුවා. නමුත්, තවම ඒ විධියට වුණේ නැහැ. සමහර පාසල්වල තවම වැසිකිළි-කැසිකිළිවත් හදා ගන්න විධියක් නැහැ. ඒවාට මුදල් යොදවන්න විධියක් නැතුව ඒවා තවම තිබෙනවා.

එදා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ -2014- ඩොලරයක් මිලදී ගන්න අපි වැය කළේ රුපියල් 130යි. අද ඩොලරයක වටිනාකම රුපියල් 159යි. රුපියල් 30කට ආසන්න ගණනකින් එහි වටිනාකම ඉහළ ගියා.

රුපියල මස්තබාල්දුවීම තුළ, ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම නිසා විතරක් ලංකාවට වුණු පාඩුව අතිවිශාලයි. ඒ නිසා පසුගිය වසර තුන තුළ විතරක් රුපියල් බිලියන 697කින් අපේ ණය ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ පාලන කාලය යටතේ නොරොච්චෝලේ තාප බලාගාරය ඉදි කරන්නට ගිය මුදල, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ඉදිකරන්නට ගිය මුදල,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබාදුන් කාලය අවසානයි.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ගාල්ල - මාතර අධිවේගී මාර්ගයට වියදම් කරපු මුදල, හම්බන්තොට වරාය හදන්න ගිය මුදල, මත්තල ගුවන් තොටුපොළ හදන්න ගිය මුදල, මොරගහකන්ද ජලාශය අදී සියල්ල නියම කිරීමට ගිය මුදලට වඩා ඒ මුදල් ප්‍රමාණය වැඩියි. ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික ක්‍රියාකලාපය හේතුකොටගෙන රුපියල අවප්‍රමාණය වීම නිසා මේ රටට වුණු පාඩුව විශාලයි. අපේ යුගයේ VAT එක තිබුණේ සියයට 11යි. දැන් එය සියයට 15ට නැඟලා තිබෙද්දී, මුදල් අමාත්‍යවරයා කියනවා 2020දී VAT එක සියයට 12.5ට අඩු කරනවා ලු. අපේ ආණ්ඩුව කාලයේ තිබුණු ගණනටවත් එය ගෙනෙන්න මේ ආර්ථික ඔස්තාර්ලාට බැහැ. ජනතාවට දුන් සහන, මේ රටේ වෘත්තිකයන්ට, ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිටින අයට දුන් සහන විශාල ලෙස කප්පාදු කරලා තිබෙනවා. මේ ලේඛනයේ තිබෙන 25කගේ පමණ සහන කප්පාදු කරලා, බදු ගහලා තිබෙනවා. නැවත වරක් එම පුද්ගලයන්ට ඒ සහන ටික ලබා දෙන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවක් කාලයේ දී අපි කටයුතු කරනවා. මේ ආණ්ඩුවට අද වැඩ පිළිවෙළක් නැහැ. රාජපක්ෂ භීතිකාව හැරුණුකොට වෙනත් භීතිකාවක් නැහැ; වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා පුළුවන් නම් මැතිවරණය පවත්වන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

ඊළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඊට පෙර, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු එඩිවඩි ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයශාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු එඩිවඩි ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(මාණ්පුමිකු කාමිනි ලොක්කුකේ)
(The Hon. Gamini Lokuge)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු එඩිවඩි ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON.EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.2.46]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආර්ථිකය පිළිබඳව වචන කිහිපයක් ප්‍රකාශ කරන්නට කලින් අපේ කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා විසින් මේ සභාවේ අවධානයට යොමු කරන ලද කරුණක් පිළිබඳව යම් සඳහනක් කරන්නට කැමැතියි.

අපි ජාතික සමඟිය අගය කරන පක්ෂයක්; ජාතික සංහිඳියාව අගය කරන පක්ෂයක්; ඒ වාගේම ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින පක්ෂයක්. කවුරු අකමැති වුණත් අපි තිස් අවුරුදු යුද්ධයකට මුහුණ දීපු රටක්. ලබන වසර වෙනකොට ඒ යුද්ධය අවසන් වෙලා වසර දහයක් ගත වෙනවා. යුද්ධය තිබුණු කාලයෙන් තුනෙන් එකක් ලබන අවුරුද්ද වෙනකොට අවසන් වෙනවා. යුද්ධය කියන්නේ තුවාලයක්; තුවාලයට එහා ගිය වණයක්. නමුත්, ගත වූ අවුරුදු නවයේදී ඒ තුවාලය සනීප කරන්න නොවෙයි අපේ රටේ වැඩ කටයුතු සිද්ධ වුණේ. ඒ නිසා විටින් විට මේ තුවාලය පෑරෙන සිදුවීම් ඕනෑ තරම් සිද්ධ වුණා. ඕනෑ කෙනෙකුට තමන්ගේ මිය ගිය ඥාතීන් සමරන්න අයිතියක් තිබෙනවා. නමුත් ඒ සිදුවීම්වලින් රටේ නැවතත් වෛරය, ක්‍රෝධය, අවිශ්වාසය ඇති වෙනවා නම්, ඒක අපි කවුරුවත් අනුමත කරන්නේ නැහැ. කිලිනොච්චියේ හැටන් නැෂනල් බැංකු ශාඛාවේ සිද්ධවෙලා තිබෙන්නේ නිකම්ම නිකම් මියගිය ඥාතීන් සැමරීමක් නොවෙයි. ඒ ඡායාරූප දිහා බැලුවාම ඒ බව පෙනෙනවා. ලේ වැගිරෙන කඩුවක් අතින් ගත් සිංහයෙකු කාන්තාවක් සහ දරුවෙක් ඝාතනය කරන ආකාරය දැක්වෙන ඡායාරූපයකට ඉටිපන්දම් දල්වනකොට එයින් ජාතික සමඟිය හෝ සංහිඳියාව හැදෙන්නේ නැහැ. ඒ වෙනුවට නැවත වතාවක් ජාතීන් අතර වෛරය, විරසකය තමයි නිර්මාණය වෙන්නේ. ඒ නිසා කවුරු කළත් එවැනි සිදුවීම් අනුමත කරන්න බැහැ. එවැනි සිදුවීම් මුලිනුපුටා දමලා, අපි කා අතිනුත් සිදුවෙච්ච වැරදි අඩු පාඩුකම් මහහරවාගෙන මනුෂ්‍යත්වය උඩට ගන්නේ කොහොමද කියන එක ගැන තමයි අපි අවධානය යොමු කළ යුතු වන්නේ. ඒ නිසා මම ඒ ගැන මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල ආර්ථිකය ගැන විවිධාකාරයේ විවාදවලට අභියෝග කරන තත්ත්වයක් තිබෙනවා. මුදල් අමාත්‍ය මංගල සමරවීර මහත්මයා හිටපු මුදල් අමාත්‍ය, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මහත්මයාට අභියෝග කරනවා, පුළුවන් නම් එතුමාත් සමඟ ආර්ථිකය ගැන විවාදයකට එන්නය කියා. මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කණ්ඩායමේ අය කියනවා, "මංගල සමරවීර ඇමතිතුමාත් එක්ක විවාදයකට හිටපු මුදල් ඇමතිවරයා එවන්න වුවමනාවක් නැහැ, ඕනෑ නම් අපෙන් ඕනෑම කෙනෙක් එන්නම්" කියලා. කවුරු කොහොම විවාද කරන්න හැදුවත්, -අපි දන්නවා විවාදවලින් ශත පහක වැඩක් වෙන්නේ නැති බව.- ආර්ථිකයේ තත්ත්වය, එහි බරපතළකම රටේ ජනතාවට තේරෙනවා.

තෙල් මිල ඉහළ දැම්මාට පසුව දුම්රිය ගාස්තු, බස් ගාස්තු, ත්‍රී වීලර් ගාස්තු ඇතුළු සියලු භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යන විට ජනතාවට ආර්ථිකයේ ප්‍රශ්න දැනෙනවා. ඊයේ වැස්සේ තෙම්-තෙමී, තමුන්ගේ පුංචි දරුවෝ වඩාගෙන රැකියා විරහිත උපාධිධාරීන් රැකියා ඉල්ලා උද්ඝෝෂණය කළා. එතකොට ආර්ථිකයේ කඩා වැටීම දැනෙනවා. 2017දී මේ රටට විදේශ ආයෝජන ලෙස ආවේ ඇමෙරිකානු ඩොලර් මිලියන 300යි නම්, "ඇමෙරිකානු ඩොලර් මිලියන 1,700 ගණනක් ආවා, ඒ හම්බන්තොට වරාය විකුණපු ඒවත් එක්කයි" කියා මලික් සමරවික්‍රම ඇමතිතුමාට කියන්න සිද්ධ වෙනවා නම්, අන්න ආර්ථිකයේ කඩා වැටීම දැනෙනවා. ජනතාවට එදිනෙදා ජීවිතයේදී ආර්ථිකයේ කඩා වැටීම හොඳට දැනෙන්න පටන්ගෙන තිබෙනවා. පසුගිය අවුරුදු දෙකහමාර තිස්සේ අපි මේ ගැන පාර්ලිමේන්තුවේ විවිධ විවාද කළා. 2015 සැප්තැම්බර් මාසයේ ඉඳලාම ආර්ථිකය ගැන කියන්න අගමැතිවරයා මේ ගරු සභාවේ නැඟී සිටියොත්, එතුමා කියන්නේම රාජපක්ෂලාගේ ණය ගැනයි; "රාජපක්ෂලා මහා ණය කන්දක් ගොඩ ගහලා තිබෙනවා, ඒකේ සංඛ්‍යා ලේඛනවත් සොයා ගන්න බැහැ, ණය වුණු ප්‍රමාණය හරියට දන්නෙත් නැහැ" කියන එක තමයි 2015 සැප්තැම්බර් මාසයේ සිට අද දක්වාම අගමැතිවරයා ප්‍රමුඛ මේ ආණ්ඩුවේ බැගිරිය බවට පත් වෙලා තිබෙන්නේ. ඊට පිළිතුරු දෙන රාජපක්ෂ කණ්ඩායමේ උත්තරය බවට පත් වෙලා තිබෙන්නේ, "ඔව්, අපි ණය ගත්තා තමයි, අපි ණය ගත්තාට වරාය හැදුවා; ගුවන් තොටුපොළ හැදුවා; පාරවල් හැදුවා; අපි ණය අරගෙන ඒවා කළා, ඔය ගොල්ලෝ ණය අරගෙන මොනවත් කළේ නැහැ නේ" කියන එකයි. කවුරු සෙල්ලම් දැම්මත්, කවුරු පම්පෝරි ගැහුවත්, කවුරු කාට චෝදනා එල්ල කළත්, අවසානයේ ඒ ණය ගෙවන්නේ මේ රටේ බදු ගෙවන සාමාන්‍ය ජනතාවයි කියන කාරණය ඔබතුමන්ලා මතක තබාගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආර්ථිකයේ කඩා වැටීම කොතරම් බරපතළද කියනවා නම්, රටේ ආර්ථිකය හදන වැඩ පිළිවෙළවල් පිළිබඳවත් යම් යම් සාකච්ඡා තැන් තැන්වලින් මතු වෙලා තිබෙනවා අපි දැක්කා. මේ ළඟදී ෂැන්ග්‍රී-ලා හෝටලයේදී ආර්ථිකය හදන අලුත් වැඩ පිළිවෙළක් ගැන කිව්වා. ඉන් පසුව එක්සත් ජාතික පක්ෂයේ හිටපු සභාපතිවරයාම කිව්වා, "ඒක අලුත් එකක් නොවෙයි, අපේ "Vision 2025" එකම තමයි ඒ ඉදිරිපත් කර තිබෙන්නේ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හාස්‍යජනකම කරුණ මෙකයි. ඇමෙරිකානු පුරවැසියෙක් චීනයේ ඉඩමක ඉඳගෙන ඇමෙරිකානු සමාගමක් හදපු ආර්ථික ලියවිල්ලක් සිංහලෙන් කියවනවා. මොකද, මම දන්නා හැටියට එක්සක් ජාතික පක්ෂයේ "Vision 2025" එක හැදුවේ ඇමෙරිකානු සමාගමක්. ඇමෙරිකානු පුරවැසියෙක් චීනයේ ඉඩමක ඉඳගෙන ලංකාවේ ආර්ථිකය හදන ආකාරය ගැන දෙසාබාන කොට, මහා ජාතිකවාදීන් යැයි කියා ගන්නා අය ඒ දිහා ඇස් කන් ඇරගෙන බලාගෙන ඉන්නවා. ඒ වාඩිවෙලා ඉන්න අය හිතාගෙන ඉන්නවා, තමන් පැවත එන්නේ ආර්යයන්ගෙනුත් නොවෙයි, ස්වයංජාතව මේ භූමියේ ඉස්සෙල්ලාම පහළ වුණේ ඒ අයයි කියලා. එහෙම අය; මහාචාර්ය නලින් ද සිල්වා කියන ආකාරයට, "ස්මාට් ජාතිකවාදීන්" - දැන් ඉන්නේ රෙද්ද බැනියම අඳින, සාටකය දමන ජාතිකවාදීන් නොවෙයි, ටයි කෝට් ඇඳ ගත්ත ජාතිකවාදීන්.- "මෙන්න මෙහෙමයි ආර්ථිකය හදන්නේ" කියා කියන කොට ඒක බොහොම සාවධානව අහගෙන ඉන්නවා. ඒ කියන්නේ, තමන් විසින් අවුරුදු 10ක් පාලනය කරලා, ඒක අසාර්ථකයි කියන කොටත් අහගෙන ඉන්නවා. ඒකයි වැඩේ.

පිට කොළය වෙනස් කරලා, "Vision 2025" එකට වෙන නමක් දමාගෙන ආවාට, නව ලිබරල් ආර්ථිකයට වෙන වෙන කැලි එකතු කරගෙන ආවාට මේ ආර්ථික ප්‍රශ්නයට උත්තරයක් දෙන්න නොහැකි බව කවුරුත් දන්නවා. වෙන වෙන දේවල් ඕනෑ නැහැ, පසුගිය දිනවල තෙල් මිල වැඩි කළ වෙලාවේ මංගල සමරවීර ඇමතිතුමා කිව්වා, "මේ තුළින් භාණ්ඩාගාරය රුපියල් බිලියන 53ක් ඉතිරි කර ගන්න බලාපොරොත්තු වෙනවා" කියලා. තෙල් මිල වැඩි කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් විවාදයක් මේ පාර්ලිමේන්තුවේ නොකිරීම ගැන ඇත්තටම මම කනගාටු වෙනවා.

අපි උත්සාහ කළා, ගිය අහඹරුවාදා ඒ විවාදය ගන්න. නමුත්, ඒක හිතාමතා කඩාකප්පල් කළා. තෙල් මිල සම්බන්ධව විවාද කරන්න පැය තුනක කාලයක් දෙන්නම් කියා කථානායකතුමා

එකඟ වෙලා තියෙද්දී, "නැහැ, නැහැ අපට ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගැසට් කරපු නියමයන් ගැන ඡන්දයක් ඕනෑ" කියලා හයහමාර වනතුරු පාර්ලිමේන්තුව ගෙන ගියා. අන්තිමට බෙදීමත් නැහැ; ඡන්දයත් නැහැ; තෙල් මිල ගැන විවාදයත් නැහැ. ඒකත් කඩාකප්පල් කරලා එතුමන්ලා පාර්ලිමේන්තුවෙනුත් ගියා. කොහොම වුණත්, තෙල් මිල වැඩි කිරීමෙන් පෙන්නුම් කරන තිත්ත ඇත්ත මොකක්ද?

දැන් ආණ්ඩුව කියනවා, තෙල් මිල වැඩි කළේ ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල ඉහළ ගිය නිසාය කියලා. ඒක අපි කාටත් පිළිගන්න සිදු වෙනවා, තවම අපි මන්නාරම් ද්‍රෝණියේ තෙල් ටික හොයා ගත්තේ නැති නිසා. ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල වැඩි කරනකොට මෙහේ තෙල් මිල වැඩි කරන්න සිදු වෙනවා. හැබැයි, ඇත්තටම මේ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්වල මිල වැඩි වුණේ ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල ඉහළ ගිය නිසාද, නැත්නම් බොර තෙල් බැරලයක මිල ඩොලර් ගණනකින් එහේ මෙහේ වෙනතුරු බලාගෙන ඉඳලා, එය පාවිච්චි කරලා ආණ්ඩුව ජනතාව මත බද්දක් පටවන්න ඒක අවස්ථාවක් කර ගත්ත නිසාද?

මම එදාත්, -ධීවරයන්ට තෙල් සහනාධාරය ලබා දීම සම්බන්ධව අපි සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාවේදී- මේ තෙල් මිල වැඩි වුණේ කොහොමද කියා කිව්වා. ඔක්ටෝන් 92 පෙට්‍රල් ලීටරයක් වරායට පැමිණෙන කොට මිල රුපියල් 78.43යි. ඒකට රුපියල් 60.63ක බදු එකතු වෙනවා. ඒ අනුව තමයි එහි විකුණුම් මිල රුපියල් 138ක් දක්වා වැඩි වෙන්නේ. ඒ කියන්නේ, මේ ආණ්ඩුව අපට පෙට්‍රල් ලීටරයක් අළෙවි කරනකොට ඒක ඇතුළේ සියයට 43.6ක් තිබෙන්නේ බදු. ඩීසල් ලීටරයක් වරායට ගොඩ බාන්නේ රුපියල් 83.70කටයි. ඒකට රුපියල් 32.14ක බද්දක් එකතු වෙනවා. ආණ්ඩුව අපට ඩීසල් ලීටරයක් විකුණන කොට ඒ මිලෙන් සියයට 29ක්ම බදු මුදලයි. මේ තෙල් මිල වැඩි කළාම ආණ්ඩුව මොකද කළේ? පෙට්‍රල් ලීටරයකට වැඩි කළ රුපියල් 20ට, කලින් තිබුණු රුපියල් 12ක රේගු බද්ද රුපියල් 26ක් කරලා, ආණ්ඩුව රුපියල් 14කින් රේගු බද්ද වැඩි කරගත්තා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඔබතුමාගේ කථාව කෙටි කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
පෙට්‍රල් ලීටරයකට වැඩි කළ රුපියල් 20න් රුපියල් 14ක්ම ආණ්ඩුව වැඩි කළ රේගු බද්දටයි යන්නේ. ඩීසල් ලීටරයක කලින් තිබුණු රුපියල් 7ක රේගු බද්ද රුපියල් 10.55 දක්වා වැඩි කළා. දළ වශයෙන් කිව්වොත්, ඩීසල් ලීටරය රුපියල් 14කින් වැඩි කරනකොට එයින් රුපියල් 7ක් රේගු බද්දයි. මේ අවස්ථාව පාවිච්චි කරලා, තමන්ගේ අර්බුදයට උත්තරයක් හොයා ගන්න බදු වැඩි කරගත්ත එක තමයි ආණ්ඩුව කළේ. දැන් මම අහන්නේ මේකයි. එදා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය කිව්වා, "අපි දැන් spot tender එක අයින් කරලා term tender එකට ගියා" කියලා. මේ ගැනත් අපි පාර්ලිමේන්තුවේ කථා කළා.

Ceylon Petroleum Corporation එක දිගින් දිගටම පාඩු ලබනවා කියා ජනතාව මත බදු ගහන මේ ආණ්ඩුව පසුගිය අවුරුද්දේ අගෝස්තු, සැප්තැම්බර් මාසවල ඔය ටෙන්ඩර් ක්‍රමය හදිසියේ වෙනස් කිරීම නිසා රටට කළ පාඩුව ඩොලර් බිලියන 5.8ක් වෙනවා. ඒ පාඩුව නතර කර ගන්න තිබුණා. ඒ පාඩුව නතර කර ගැනීම සඳහා කැබිනට් මණ්ඩලය ක්‍රමවේදයක් අනුගමනය කළා. ටෙන්ඩර් මණ්ඩලයේදී එය අනුමත වුණා; එය තාක්ෂණික ඇගයීම් කමිටුවට ගියා. හැබැයි, ඇමතිවරයා ඒ සියල්ල පසෙක දමා තමයි, මේ නැව් 12ක spot tender එකට ගියේ. ඒකෙන් අපිට රුපියල් බිලියන 5.8ක පාඩුවක් සිදුවෙලා තිබෙනවා. මේ විධියට යම්කිසි ආකාරයක වාසියක් අත්පත් කර ගත හැකිව තිබියදී, ඒ පාඩුවත් ජනතාව මත පටවලා, නැවත වතාවක් තෙල් මිල වැඩි කරලා, ඒ බරත් ජනතාව පිට පටවලායි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න ඔහොම තමයි කටයුතු සිදු වෙලා තිබෙන්නේ. බලයේ හිටපු හැම ආණ්ඩුවක්ම මේ රටේ ජනතාවට උත්තර දෙන්න ඕනෑ. 1952 සිට 2004 වනතුරු අවුරුදු 52ක් තිස්සේ මේ රට ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 2,222යි. ඊළඟ අවුරුදු දහය තුළ ගත්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 5,000යි. ඊළඟ අවුරුදු තුනේ ගත්ත ප්‍රමාණය රුපියල් බිලියන 3,000යි. එහෙම තමයි මේ රුපියල් බිලියන දහදහස් ගණනක් එකතු වෙලා තිබෙන්නේ. හැබැයි, අපේ රටේ කරපු සියලු ව්‍යාපෘති -ඔය ණය ආයෝජනය කරලා කරපු ව්‍යාපෘති- එකතු කරලා බැලුවොත්, ඔය රුපියල් බිලියන දහදාහක වටිනාකමට රට තුළ වැඩ කරලා තිබෙනවාද කියන ප්‍රශ්නය මතුවෙනවා. ඒක මේ පාර්ලිමේන්තුව සහ රටේ ජනතාව දැන ගන්න ඕනෑ කාරණයක්.

මේ ආර්ථිකය පිළිබඳව අප කොච්චර සංවාද කළත්, මේ ගමන් කරමින් තිබෙන ආර්ථික උපාය මාර්ගයේ වරද තේරුම් ගත්තේ නැතිනම් ජනතාව මත බදු බර පටවනවා විනා වෙනත් උත්තරයක් නැහැ කියමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.2.59]

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් මූල්‍ය පනත් දෙකක් හා සම්බන්ධ නිවේදනයක් සහ යෝජනා කීපයක් මේ ගරු සභාවේ විවාදයට ගෙන තිබෙන මේ මොහොතේ අපේ සභානායකවරයා හැරුණාම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කිසිම ඇමතිවරයකු, මන්ත්‍රීවරයකු මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ නොසිටීමෙන් තේරුම් යනවා, රජය කොපමණ දුරකට මහජන මතයට සවන් දීලා ජනතාවගේ නියෝජිතයන්ගේ අදහස්, යෝජනා සලකා රජය ගෙන යන්න, මේ රටේ ආර්ථිකය හසුරුවන්න කටයුතු කරන්න ක්‍රියාත්මක වෙනවාද කියන එක. මුදල් අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ නැහැ. නමුත්, මූල්‍ය පනත් සම්බන්ධ නිවේදනයක් හා යෝජනා ගැනයි සාකච්ඡා වන්නේ. නියෝජ්‍ය අමාත්‍යවරයාත්, රාජ්‍ය අමාත්‍යවරයාත් නැහැ. ආර්ථිකයට සම්බන්ධ කිසිම අමාත්‍යවරයෙක් නැහැ. මේ රටේ මෙන්න මේ ගමන යෑම තුළ තමයි ආර්ථික වර්ධන වේගය අද සියයට 3.1ක් දක්වා අඩු වන්න කටයුතු සිද්ධ වුණේ. අපි රජයේ ඉඳගෙන, රජයේ කැබිනට් මණ්ඩලය නියෝජනය කරමින් මේ පිළිබඳව වසරක්, දෙකක් කරුණු ඉදිරිපත් කළා. මේ රටේ අපනයනවලින් ලබන ආදායම, ආනයනවලට සිදු කරන වියදම කියන දෙක අතර තිබෙන පරතරය රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, පීඩිත පන්තියේ බහුතර මිනිසුන් වෙනුවෙන්, ඒ අයට වාසි වන ආකාරයට හසුරුවන්නේ කෙසේද කියන එක පිළිබඳව රජයේ අවධානය යොමු නොවීම මේ තත්ත්වයට හේතු වෙලා තිබෙනවා. විවිධ අදහස්, විවිධ උපදෙස් සහිත විවිධ පුහුණු වැඩ මුළු මේ රජය පැවැත්වුවා. ඒවා ඒවාට පමණක් සීමා වුණා. අපනයන විවිධාංගීකරණය ගැන විවිධාකාර ලෙස කතා කළා. නමුත් පසුගිය කාලය තුළත්, මේ මොහොතේත් මේ රටේ සාම්ප්‍රදායික අපනයන ඇරෙන්නට විවිධාංගීකරණය වූ අපනයන අලුතින් ඇවිත් තිබෙනවාද?

[ගරු වන්දිම වීරක්කොඩි මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයක් හැටියට දේශීය නිෂ්පාදන දිරි ගැන්වීම, දේශීය කර්මාන්ත ශක්තිමත් කිරීම, නව නිපැයුම් කරා තාරුණ්‍යය යොමු කිරීම ආදිය තුළින් තමයි අපනයන විවිධාංගීකරණයට හැකියාව ලැබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය කරන පසු බිම මොකක්ද; දේශීය ව්‍යවසායකයකුට, දේශීය නිෂ්පාදකයකුට මූලිකව අවශ්‍ය වන සම්පත් මොනවාද? ඒ සඳහා මූලිකව අවශ්‍ය වනවා, පහසු මිලකට බලශක්තිය. අද මේ රටේ තිබෙන ප්‍රධානතම ප්‍රශ්නය මොකක්ද? හැම ගමකම, හැම තැනකම කතා කරන්නේ, 'පෙට්‍රල් මිල ඉහළ ගිහින්. විදුලිබල ගාස්තුව, බස් ගාස්තුව වැඩි වෙලා. බිත්තර ආප්පයේ ඉඳන් ගණන් ගිහිල්ලා.' කියලායි. පහසු මිලට බල ශක්තිය ලබා දීම සඳහා වැඩ පිළිවෙළක්, අරමුණක් මේ ආණ්ඩුවට තිබුණාද? අද පෙට්‍රල් මිල ගැන කතා කළා. එදා මම බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාවරයා හැටියට, අවුරුදු 50ක් පරණ තෙල් පිරිපහදුව නවීකරණය සඳහා යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව සකස් කළේ බනිජ තෙල් ක්ෂේත්‍රයේ සිටින ප්‍රධාන විශේෂඥයන්, බුද්ධිමතුන්. මූල්‍ය ක්ෂේත්‍රයේ සිටින විශේෂඥයෝ ඒ ව්‍යාපෘතිය පිළිබඳව අධ්‍යයනය කරලා රට පිළිගන්නා, ලෝකය පිළිගන්නා ව්‍යාපෘතියක් ඉදිරිපත් කළා.

ආර්ථික කළමනාකරණ කමිටුවෙන් වර්තමාන මහ බැංකු අධිපතිවරයා, ජනාධිපතිතුමාගේ ආර්ථික උපදේශකවරයා, වෙරගොඩ කියන හිටපු ලේකම්වරයා, මුදල් අමාත්‍යාංශයේ වර්තමාන ලේකම්වරයා සහ බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරිය යන අයගෙන් සමන්විත කමිටුවක් පත් කරලා, ඒ යෝජනාව ගැන දිගින් දිගටම සොයා බලා සාකච්ඡා කරලා යෝජනාව ඒකමතිකව අනුමත කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් බනිජ තෙල් මිල වැඩි කරන්න අවශ්‍ය නොවන ආකාරයට සකස් වෙච්ච ඒ යෝජනාව එක පැන් පහරින් එළියට විසි කළා. රටක, ජාතියක ආර්ථිකය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වන වැඩ පිළිවෙළ ඒ ආකාරයට නැවැත්වූවාම, අපි ඉදිරියට යන්නේ කොහොමද? අද්ත් මේ රටට -කොළඹ වරායට- නැවක් ආවාම තෙල් ටික ගොඩ බාන්න දවස් හතක් ගත වෙනවා. තෙල් ටික දවස් දෙකෙන් ගොඩ බාන්න පුළුවන් වන විධියට නළ පද්ධතිය අලුතෙන් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවලා, ටෙන්ඩරය අවසන් කරලා, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන්න තිබුණේ මීට අවුරුද්දකට කලින්. නමුත් අද වනතුරු ඒ කටයුත්ත හංගලා. ඒ නළ මාර්ගය ඉදි වුණා නම්, මිල අඩු වෙලාවට අපට ලාභෙට බනිජ තෙල් මිලදී ගන්න පුළුවන්. අද මිලදී ගත්තත් ගොඩ බාන්න බැහැ; නැවක තෙල් ගොඩ බාන්න දවස් හතක් ගත වෙනවා. නැව් ටික පෝලිමේ තිබෙනවා. ඒ වාගේ සුළු දේවල් ඉටු කරන්න රජය මැදිහත් වුණේ නැහැ; අවස්ථාව දුන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ අපේ මන්ත්‍රීතුමා කිව්වා, "මන්නාරම් ද්‍රෝණියේ තෙල් ටික එනතුරු අපට මේ ගැන තීන්දු කරන්න බැහැයි." කියලා. මන්නාරම් ද්‍රෝණියෙන් ස්වාභාවික වායු ලබා ගන්න, 2020 වසර වන විට අපේ ස්වාභාවික වායු උකහා ගෙන, අපේ ස්වාභාවික වායු අපේ රටේ බලශක්තියක් හැටියට පාවිච්චි කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කළා. ඒ සඳහා ලෝකයේ ප්‍රධාන සමාගම් 11ක් පසුගිය අවුරුද්ද වන විට ආවා. ඒ වැඩ පිළිවෙළ එතැනම නැවැත්වූවා. ඒ වෙනුවෙන් කටයුතු කළ ලෝක ප්‍රකට විශේෂඥයා කොහේද යන -එතුමාට අදාළත් නැති- කාරණාවක් සම්බන්ධව අධිකරණයට ගෙන ගියා. අද විශේෂඥයෙක් හොයා ගන්න නැහැ. රටට, අනාගතයට, ජාතියට වැදගත් වුණු බලශක්ති අර්බුදය විසඳීමේ වැඩ පිළිවෙළ මහ නැවැත්වූවා. එතකොට අපි කථා කරන අපනයන විවිධාංගීකරණය සඳහා අවශ්‍ය කරන ශක්තිය, පහසුකම් මේ රටේ තරුණයින්ට, දරුවන්ට ලබා දීම සඳහා උදව් කරන්නේ කවුද? ඒ වාගේම අපි අපනයන ආදායම් ගැන කථා කරනවා. මේ රට කෘෂි කාර්මික රටක්. කෘෂි කාර්මික රටක් හැටියට- අපේ සභානායකතුමා මේ සභාවේ ඉන්නවා.- පොහොර සහනාධාරය කපලා මුදල් දෙන්න කියලා යෝජනා වුණු දවසේ හිටපු අතිගරු ජනාධිපතිතුමා ඇහුවා, "පොහොර සහනාධාරය වෙනුවට මෙහෙම සල්ලි දෙන්නේ ඇයි?" කියලා. කාබනික පොහොර සම්බන්ධව කිව්වාම එතුමා ඇහුවා, "මමත් ඒ කාලයේ කෘෂිකර්ම ඇමති හැටියට කටයුතු කළා. ඒ කාලයේත් අපි යම් යම් අවස්ථාවල වුවමනාවෙන්ම පොහොර හිඟයක් ඇති කරලා, කාබනික පොහොර සඳහා ජනතාව යොමු කිරීම සඳහා වූ දිගු කාලීන, ක්‍රමානුකූල, සූක්ෂ්ම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ ආකාරයටම කරන්න බැරි ඇයි?" කියලා.

නමුත්, ඒකට විරුද්ධ වුණා. පොහොර සහනාධාරය නැති වුණා. කාබනික පොහොර සඳහා ගොවියන් යොමු වුණාද කියන එක ප්‍රශ්නයක් හැටියට නොතේරුණු අයට අද තේරුම් ගන්න වෙනවා, 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂය සංසන්දනය කරන කොට, සියයට 26.7ක් කෘෂි කර්මාන්තයෙන් ඈත් වෙලා තිබෙන බව. සියයට 26.7ක් කෘෂි කර්මාන්තයෙන් ඈත් වෙලා තිබෙන්නේ, ප්‍රායෝගිකව ලාභ ලබන ආකාරයට කෘෂි කර්මාන්තය කර ගෙන යෑමට නොහැකි වීම නිසායි. මේ තත්ත්වය තුළ අද අපි රටක් හැටියට සතුටු වෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි හොඳ දේට හොඳයි කියන්න ඕනෑ. අද තේ සඳහා ඉහළ මිලක් ලැබෙනවා. තේ සඳහා ඉහළ මිලක් ලැබුණාට, තේ එලදාව සියයට 40කින් පමණ අඩු වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා මගේ මේ අදහසට එකඟ වනවා ඇතැයි කියා මම විශ්වාස කරනවා. සියයට 40කින් එලදාව අඩු වෙලා තිබෙන්නේ ඇයි? ඒ, දැක්මක් නැතිව අප විසින් ක්‍රියාත්මක කරන ලද වැඩ පිළිවෙළ නිසායි.

අපනයන විවිධාංගීකරණය පැත්තකින් තියන්න. අපනයන ආදායම තවදුරටත් වැඩි කර ගත හැකිව තිබෙන අපේ ප්‍රධාන අපනයන භෝගයේ එලදාව අඩු වුණාම, අපි බලාපොරොත්තු වන තැනට යන්න පුළුවන්ද? අපට විදේශ විනිමය ගෙනෙන ප්‍රධානම කණ්ඩායම කවුද? ඒ, නුපුහුණු ශ්‍රමිකයන්. 2016ට සාපේක්ෂව 2017 එක්ක සංසන්දනය කරන කොට, විදේශ රැකියාවලට යන ශ්‍රමිකයන් සියයට 12.6කින් අඩු වෙලා තිබෙනවා.

රටක් හැටියට අපේ විදේශ විනිමය වැඩි කර ගැනීම සඳහා අපි පුහුණු ශ්‍රමිකයන්, නිපුණ ශ්‍රමිකයන් මේ රටේ බිහි කිරීම සඳහා වූ වැඩ පිළිවෙළක් යෝජනා කළා. මම හිටපු අමාත්‍යවරයා හැටියට, පසුගිය අය වැයට කලින් එකොළොස් වැදෑරුම් වැඩ පිළිවෙළක් මේ වෙනුවෙන් ඉදිරිපත් කළා. මුදල් අමාත්‍යාංශය ඒ වැඩ පිළිවෙළ පිළිගත්තා. ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමා ඒ වැඩ පිළිවෙළ පිළිගෙන, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට මුදල් වෙන් කළා. නමුත්, ඒ මුදල් ටික අදාළ අමාත්‍යාංශයට නොවෙයි, වෙනත් අමාත්‍යාංශයකට අදිසි හස්තයකින් ගත්තා. අවශ්‍ය කරන පහසුකම්, අවශ්‍ය කරන ආයතන, අවශ්‍ය කරන පුහුණුකරුවන් සපයා අද වනතෙක් ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙලා නැහැ; අද වනතෙක් ඒ මුදලින් ශත පහක්වත් වියදම් කරලා නැහැ. පුහුණු ශ්‍රමිකයන් අපේ රටේ බිහි කරලා, අපේ රටෙන් පිට රටට ශ්‍රමිකයන් සපයලා විශාල වශයෙන් මුදල් ලබා ගන්න අවස්ථාව තිබියදී, අපේ තාරුණ්‍යය ශක්තිමත් කරලා, ඒ අයට අවශ්‍ය කරන රැකියා අවස්ථා මෙරට තුළ වාගේම පිටරටත් අවශ්‍ය පරිදි තිබියදී, ඒ සඳහා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට රජය හැටියට අපොහොසත් වුණේ, නිසි වැඩ පිළිවෙළක්, දර්ශනයක් නැතිව ඒ කටයුතු ක්‍රියාත්මක කරන්නට පැකිළීම නිසායි.

ඒ අතරේ, අද සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම අරගෙන ඇවිල්ලා තිබෙනවා. සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරපු වෙලාවේ, අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හැටියට

මම පැහැදිලිව, ලිඛිතව සටහන් කළා. ඒ වාර්තාව අද කැබිනට් මණ්ඩලයේ තිබෙනවා. "දේශීය කර්මාන්තවලට හානියක් නොවන ආකාරයට, දේශීය ආර්ථිකයට ප්‍රශ්නයක් නොවන ආකාරයට, දේශීය පුහුණු ශ්‍රමිකයන්ට, නිපුණ ශ්‍රමිකයන්ට තිබෙන අවස්ථාවට හානියක් නොවන ආකාරයට, ඒ අයට තවත් අවස්ථාව ලැබෙන ආකාරයට මේ ගිවිසුම් සකස් කළ යුතුයි" කියන කාරණය පැහැදිලිව, ලිඛිතව අපි දුන්නා. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ?

අත්සන් කරපු ගිවිසුමක් අපි දැකලා නැහැ. නමුත්, අත්සන් කළා කියන මේ ගිවිසුමට අනුව සිංගප්පූරුවේ සමාගමක් සංස්ථාගත කළා නම්, manpower agency එකක් හැටියට මේ රටට විවිධ ශ්‍රමිකයන් සපයන්න ඒ සංස්ථාගත කරපු සමාගමට හැකියාව ලැබෙනවා. එලෙස අපේ රටට විවිධ ශ්‍රමිකයන් සපයන කොට එක් පැත්තකින් අපේ රටේ පුහුණු ශ්‍රමිකයන්ට, ඉංජිනේරුවන්ට තිබෙන අවස්ථාව නැති වනවා. අනික් පැත්තෙන් ඒ අය ලබා දෙන නිපුණ ශ්‍රම දායකත්වය හා එහි තත්ත්වය පිළිබඳව යම් ප්‍රශ්නයක් ඇති වුණොත්, ඒ ශ්‍රමිකයන්ට විරුද්ධව ලාංකීය රජයට වාගේම ලාංකීය ජනතාවට පියවර ගන්න අවස්ථාවක් හිමි වන්නේ නැහැ. අපට උත්තර දෙන්නේ නැති, අපට වග කියන්නේ නැති කණ්ඩායමකට අපේ රටේ සංවර්ධන කටයුතු සහ උපදේශාත්මක කටයුතු බාර වීම තුළින් එක් පැත්තකින් අපේ රට අභාග්‍ය සම්පන්න තත්ත්වයකට ඇද වැටෙනවා. මේ වාගේ රටට හානිකර, රටට නොගැළපෙන භයානක තත්ත්ව ඇති වෙද්දි ආයෝජන මධ්‍යස්ථානයක් හැටියට අපේ රටට ආයෝජකයන්ට අපි එන්න කියනවා. ආයෝජන මධ්‍යස්ථානයක් හැටියට ඒ ආයෝජකයන් අපේ රටේ වැඩ කරන්න බලාගෙන සිටියත් ඔවුන් අපේ රටට එන්න කලින් බලනවා, ලංකාවේ ඕනෑ දෙයක් කර ගන්න නම් සිංගප්පූරුවේ සංස්ථාවක් සංස්ථාගත කර ගත්තොත් පහසු වනවාය කියලා. එතකොට ඒ අයගේ පිරිවැය වැඩි වනවා. සිංගප්පූරුව අපට වඩා ඒකෙන් වාසි ලබන්න පටන් ගන්නවා. අපේ රාජ්‍ය ඇමතිතුමා දැන් කිව්වා, "මේ තත්ත්වය යටතේ සිංගප්පූරුවේ සෙනඟ වැඩි වෙයි" කියලා. මා දන්නා තරමට අපේ කාගිල්ස් සමාගමත් ක්‍රියාත්මක වෙන්නේ සිංගප්පූරුවේ සංස්ථාගත වුණු ආයතනයක් හැටියටයි. මේ මොහොත වනවිට කාගිල්ස් ආයතනයෙන් ලංකාවේ එළවලු සහ පලතුරු තමයි මිලදී ගන්නේ. හැබැයි, මේ ගිවිසුම ක්‍රියාත්මක වන්න පටන් ගත්තාම වෙළෙඳාම කරන ආයතනයක් හැටියට ඔවුන් බොහෝ විට ලංකාවේ එළවලු, පලතුරු මිලදී ගන්නේ නැතිව සිංගප්පූරුවෙන්, මැලේසියාවෙන් එළවලු සහ පලතුරු මිලදී ගෙන, අපේ ගොවියා පැත්තකට දාලා, ඒවා විකුණන්න උත්සාහ ගනීවි. එවන් අවාසනාවන්ත, අභාග්‍ය සම්පන්න තත්ත්වයකට රට යොමු වෙමින් පවතින අවස්ථාවකදී රටේ උගතුන්, බුද්ධිමතුන් සහ ව්‍යතුන් එකතුවෙලා ඉදිරියේදී රට ගෙන යා යුතු වැඩ පිළිවෙළ කුමක්ද කියන කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතුයි. නමුත්, අද වනකොට එවන් සාකච්ඡා පිළිබඳව බොහොම උපහාසයෙන් කථා කරන්න සමහරු උත්සාහ ගන්න ආකාරය අපි දැක තිබෙනවා. එක් කෙනෙකු, දෙදෙනෙකු ඒ වැඩ පිළිවෙළ දෙස උපහාසාත්මකව බැලුවාට, අපේ රටේ දේශීයත්වය ආරක්ෂා කරන්න, මේ රට ඉදිරියට ගෙනි යන්න කැමැති, අපේ රටට ආදරය කරන උගත්, බුද්ධිමත් ලාංකීය ජනතාවක් එවන් වැඩ පිළිවෙළවල් හා එකතු වෙන්න බලාගෙන ඉන්නවා කියන කාරණය රජය තේරුම් ගන්න ඕනෑ. එලෙස එකතුවෙලා, සාකච්ඡා කරලා, සංවිධානය කරලා, අදහස් ප්‍රකාශ කිරීම් කුමන පුද්ගලයෙකු විසින් ඉටු කළත්, අපි මේ රටේ මහජන නියෝජිතයන් හැටියට අපේ සහයෝගය සහ දායකත්වය ඒ වැඩ පිළිවෙළට ලබා දිය යුතුයි. මොකද, මේ රටේ ජනතාව විසින් පත් කරන රජය අනාගතයේදීවත් එක් එක්කෙනාගේ තනි පෞද්ගලික අවශ්‍යතාවලට, සිතුවිලිවලට අනුව ඉදිරියට ගෙන යා යුතු රජයක් විය යුතු නැහැ. ඒ සඳහා ප්‍රතිපත්ති මාලාවක් අපට රට වෙනුවෙන් අවශ්‍ය වනවා. රට ඉදිරියට ගෙනි යන්න නම් ජනතාවාදී, මේ රටේ ජාතිකත්වය ආරක්ෂා වන, සියලු ජාතීන්ට සාමකාමීව මේ රටේ ජීවත් වෙන්න පුළුවන් ආර්ථිකයක් ගොඩ නඟන ආකාරයේ වැඩ පිළිවෙළක් අපට අවශ්‍ය වනවා. ඒ සඳහා කතිකාවතක් අවශ්‍යයි. ඒ කතිකාවතට අපි හැම දෙනාම පක්ෂ පාට භේදයකින් තොරව එකතු විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ යන ගමනේදී, දකුණේ ජීවත් වෙමින්, කොළඹ ජීවත් වෙමින්, තමන්ගේ දරු මුණුබුරන් මේ ප්‍රදේශවල ඉඳගෙන ඒ සියලු වරප්‍රසාද ලබා ගන්නා විටදී උතුරට ගිහින් ජාතිවාදය අවුළුවන්න උතුරේ යමෙක් උත්සාහ ගන්නවා නම් ඒකටත් අපි විරුද්ධයි. ඒ වාගේම දකුණේ අපි කවුරු හෝ මේ රටේ ජාතිවාදය අවුළුවන්න උත්සාහ කරනවා නම්, ඒකත් මේ රටේ අභාග්‍යයට වෙන දෙයක්. ඒ නිසා මේ කරුණු තේරුම් ගත් වැඩ පිළිවෙළක්, අරමුණක් නැතිව යන මේ රජය වෙනුවට රටට ආදරය කරන වැඩ පිළිවෙළක් මේ රටේ ක්‍රියාත්මක කර ගැනීම සඳහ පෙළ ගැසීමට යුගය ඇවිත් තිබෙනවාය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා.

[ප.ව. 3.20]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
அவைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, மதுவரிக் கட்டளைச் சட்டத்தின் கீழான அறிவித்தல் மற்றும் ஒதுக்கீட்டுச் சட்டத்தின்கீழான 7 தீர்மானங்கள் தொடர்பான விவாதம் இன்று நடந்து கொண்டிருக்கின்றது. இந்தவேளையில், நாங்கள் மது சம்பந்தமாக இருக்கின்ற பல பிரச்சினைகளை, அது சம்பந்தமான விமர்சனங்களை எமது உரையில் தொட்டுச் செல்ல வேண்டியவர்களாக இருக்கின்றோம். பொதுவாக மனிதர்கள் உண்ணுகின்ற அல்லது பருகுகின்ற உணவுகளை அவசியமான உணவு என்றும் ஆடம்பரமான உணவு என்றும் மனிதனை அழிக்கக்கூடிய உணவு என்றும் வகைப்படுத்திப் பார்க்க முடியும். அந்த அடிப்படையில் ஆடம்பரமான, மனித குலத்தைப் படிப்படியாக அழிவுக்குக் கொண்டுசெல்லக்கூடிய ஒரு திராவகமாக மதுவைப் பார்க்க முடியும்.

இந்த மது ஒவ்வொரு நாட்டிலும் வருமானத்தைத் தருகின்ற ஒரு பொருளாகப் பார்க்கப்படுகின்றது. அரசுகூட மதுவின் மூலமாகவே வருமானத்தைப் பெறுவதற்கு முயற்சிக்கின்றது. கலால் வரிமூலமாகக் கிடைத்த புள்ளிவிபரத்தின் அடிப்படையில் 2016ஆம் ஆண்டில் மொத்தத் தேசிய உற்பத்தியில் மதுவின்மூலமாகக் கிடைத்த வருமானம் 3.8 சதவீதமாக அமைந்திருந்தது. 2017ஆம் ஆண்டில் அது 4.3 ஆக அதிகரித்திருக்கிறது. 2018இல் ஒரு தற்காலிகமான கணிப்பின்படி 3.8ஆக இருக்குமென்று எதிர்வு கூறப்படுகின்றது. நாட்டுக்கு மதுசாரம், போதைப்பொருள் மூலமாக எவ்வளவுதான் வருமானம் கிடைத்தாலும் அதனால் பாதிக்கப்படுகின்றவர்களுக்கு அளிக்கப்படுகின்ற சிசிச்சை அல்லது பரிகரிப்புக்கு அதனைவிட அதிகளவு பணம் செலவாகின்றது. இந்த வருமானம் வெளிப்படையாக - ஒரு புறவயத் தன்மையாகப் பார்க்கப்படுகின்றபோதிலும் அகவயமாக அல்லது உட்படையாக நடக்கின்ற அழிவுகளைப்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

பற்றிச் சிந்திப்பது மிகவும் குறைவாக இருக்கிறது. அரசிறை அல்லது அரச வரி வருமானம் என்ற அடிப்படையில் வரிகளோடு ஒப்பிட்டுப் பார்க்கின்றபோது 2016ஆம் ஆண்டில் கலால் வரி மூலமாக அரச வரி வருமானம் 31.1 சதவீதம் ஈட்டப்பட்டிருக்கிறது. 2017ஆம் ஆண்டில் அது 28.1 ஆக அமைந்திருந்தது. அந்த அடிப்படையில் மது வரி மூலமாக 2016ஆம் ஆண்டில் 455 பில்லியன் ரூபாய் வருமானம் கிடைத்தது. 2017இல் அது 469 பில்லியன் ரூபாயாக அதிகரித்திருக்கிறது.

இந்த அதிகரிப்பு ஒரு நேர்கணியமாக, ஒரு சாதகத் தன்மையாக பார்க்கப்பட்டாலும்கூட, இதனைப் பருகுகின்றவர்களின் நிலைப்பாடுகளைப் பார்க்கின்றபோது, இன்றைய நிலையில் வயது வந்தவர்கள், வயது வராதவர்களென்ற வேறுபாடில்லாமல் அநேகமாக மாணவர் மட்டத்திலும்கூட மது அருந்துகின்றவர்களின் எண்ணிக்கை அதிகரித்துக்கொண்டு செல்வதைக் காணலாம். இந்தக் குடிபோதைக்கு அல்லது மது அருந்தலுக்கு ஏறத்தாழ ஆறு இலட்சம் மாணவர்கள் அடிமைப்பட்டவர்களாகக் காணப்படுகின்றார்கள் என்ற புள்ளிவிபரமானது, எந்தளவுக்கு இளம் சந்ததியினரை மதுப்பாவனை சீரழித்துக் கொண்டிருக்கின்றதென்ற செய்தியைத் தந்திருக்கிறது. இதையும்விட, 40,000 மாணவர்கள் புகைத்தலில் ஈடுபட்டிருப்பதாகவும் சமகாலப் புள்ளிவிபரம் கூறிக்கொண்டிருக்கின்றது. அதேவேளை, இன்னுமொரு விடயத்திலும் கவனம் செலுத்தவேண்டிய தேவை இருக்கின்றது. அதாவது இலங்கையின் மது நுகர்வைப் பொறுத்தவரையில், வருடத்திற்குச் சராசரியாக தலா 3.5 லீற்றர் மதுவினை ஒருவர் அருந்துவதாகக் கூறப்படுகின்றது. ஆனால், ஐரோப்பிய நாடுகளை எடுத்துப் பார்க்கின்றபோது அங்கு அது குறைவாக இருக்கின்றது. அதாவது 95 வீதமான ஐரோப்பியர்கள் மதுவினை அருந்தினாலும்கூட ஒருவர் அருந்துகின்ற சராசரி மது 0.5 லீற்றராக அமைந்திருக்கின்றது என்று இன்னுமொரு புள்ளிவிபரம் கூறுகின்றது. அப்படிப் பார்த்தால் நம்மவர்கள் மது அருந்துகின்ற விடயத்தில் ஏறத்தாழ 7 மடங்கு அதிகம் கவனம் செலுத்தி வருகின்றார்கள் அல்லது மதுவின் பக்கமாகத் தமது கவனத்தைச் செலுத்தி வருகின்றார்கள். இந்தப் புள்ளிவிபரங்களின்படி தெற்காசியாவில் தாய்லாந்து, இலங்கை போன்ற நாடுகள் மதுப்பாவனையில் அதிகமாக ஈடுபட்டு வருகின்றன என்ற ஒரு கவலையான செய்தியே வெளிவருவதைக் காணக்கூடியதாக இருக்கின்றது.

புகையிலை மற்றும் போதைப்பொருள் தடுப்பு அதிகார சபையின் தலைவராக இருக்கின்ற டாக்டர் பாலித அபயகோன் அவர்களுடைய கணிப்பின்படி, இலங்கையில் மது அருந்துகின்றவர்களது அளவையும் ஐரோப்பாவில் மது அருந்துகின்றவர்களது அளவையும் ஒப்பிட்டுப் பார்க்கின்றபோது, ஐரோப்பாவில் மது அருந்துகின்றவர்களை விட எம்மவர்களில் மது அருந்துபவர்கள் 5 மடங்கு அதிகமாக உள்ளதாகத் தெரிய வருகின்றது. நாங்கள் கவனத்திற்கொள்ள வேண்டிய விடயம் என்னவென்றால், இந்த நாட்டைக் கட்டியெழுப்ப வேண்டிய சிற்பிகள் என்று அழைக்கின்ற எமது இளம் சமுதாயம் அல்லது இளம் தலைவர்கள் மது அருந்துதல்மூலமாகப் பாதிக்கப்படுவார்களாகவிருந்தால், எதிர்காலத்தில் நல்ல தலைவர்களைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்புக் குறைந்து போய்விடும் என்பதாகும். எனவே, வருமானத்தை மாத்திரம், வரிகளை மாத்திரம் கருத்திற் கொள்ளாமல், விஞ்ஞானபூர்வமாக, ஒழுக்கவியல் ரீதியாக சிந்திக்கின்றபோது, மதுவினால் கிடைக்கின்ற வருமானத்தினைவிட - வரிகளைவிட அதனால் ஏற்படுகின்ற பாதிப்பு மிகவும் அதிகம். அதாவது அதனால் பாதிக்கப்படுகின்றவர்களுக்கு அளிக்கப்படுகின்ற சிகிச்சைக்குச் செலவாகின்ற பணத்தைப் பார்க்கின்றபோது அல்லது மது அருந்தல்மூலமாக ஒவ்வொரு குடும்பத்திலும் ஏற்படுகின்ற வீண்விரையத்தைப் பார்க்கின்றபோது, அதனால் அந்தக் குடும்பத்திலுள்ள பிள்ளைகளின் எதிர்காலம் சூன்யமாக மாறுவதைப் பார்க்கின்றபோது இந்த வருமானம் ஒரு புறவயமாக மேலோட்டமான பார்வைக்கு அதிகமாக இருந்தாலும்கூட மறைமுகமாக இதன் செலவினம் அதிகரித்துக் கொண்டு செல்கின்றது. எது எப்படியாக இருந்தாலும் இன்றைய நிலையில் மதுவிலிருந்து பெறப்படுகின்ற வருமானத்தை எந்தவோர் அரசாங்கமும் புறக்கணித்துவிடுவதற்குத் தயாராக இல்லை. எனவே, நாங்கள் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டியிருக்கின்றது.

குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக் கொண்டால், அங்கு ஏறத்தாழ 55க்கு மேற்பட்ட மதுச்சாலைகள் இருப்பதாக ஒரு புள்ளிவிபரம் கூறுகின்றது. அப்படிப் பார்க்கின்றபோது வடக்கு, கிழக்கு பிரதேசங்களில் மதுச்சாலைகளின் அளவு யுத்தத்திற்குப் பிற்பட்ட காலத்தில் அதிகரித்துக்கொண்டு செல்வது அந்தப் பகுதிகளில் இருக்கின்ற இளைஞர் யுவதிகளுக்கு ஒரு சவாலாக அமைந்திருக்கின்றது. இன்று சிலர் வாள்வெட்டுச் சம்பவங்களிலும் சமூக விரோதச் செயல்களிலும் ஈடுபடுவதற்கு மதுப்பாவனை அல்லது மது விற்பனை நிலையங்கள் கணிசமான பங்களிப்பை வழங்கிக்கொண்டிருக்கின்றன. அநேகமாக இந்தக் குற்றச் செயல்கள் அல்லது கொடுமையான செயல்கள் இடம்பெறுகின்றபோது மனிதன் தன்னை மிருகமாக்கிக் கொள்வதற்காக அநேகமாக மது அருந்தலில் ஈடுபடுகின்றான். "நிறைகுடிபோதையில்தான் அந்தக் குற்றச்செயல் நடந்தது; அந்த நேரத்தில் சுயநினைவு இல்லாமல் இருந்தேன்" என்றெல்லாம் சம்பந்தப்பட்ட குற்றவாளிகள் தங்களது ஒப்புதல் வாக்குமூலங்களைக் கொடுக்கின்ற ஒரு பாங்கினையும் நாங்கள் இன்று அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. எனவே, நமது நாட்டில் ஓர் ஒழுக்கமான சமுதாயம் உருவாக்கப்பட வேண்டும், ஒழுக்க விழுமியங்கள் தொடர்ந்தும் பேணப்பட வேண்டும், எதிர்கால இளைஞர்கள் உற்பத்தியில் பங்குதாரர்களாக்கப்பட வேண்டும் என்ற அடிப்படையில் சிந்திப்பதாக இருந்தால், புறவயமாகத் தெரிகின்ற மது வருமானத்தினைவிட, அகவயமாக மதுப்பாவனைமூலம் ஏற்படக்கூடிய பாதிப்புக்களைப் பற்றிக் கருத்திற்கொண்டு, மது சம்பந்தமான விளம்பரங்களுக்கு - காட்சிப்படுத்தல்களுக்கு மற்றும் வியாபாரங்களுக்கு முக்கியத்துவம் கொடுப்பதை நல்லாட்சி அரசு குறைத்துக்கொள்ள வேண்டும்.

இன்று அதிமேதகு ஜனாதிபதி அவர்களும் கௌரவ சுகாதார அமைச்சர் அவர்களும் "போதைப்பொருள் ஒழிப்பு" விடயத்தில் அக்கறை செலுத்துவதைக் காணக்கூடியதாக இருக்கின்றது. இந்த அக்கறை மேலும் அதிகரிக்கப்பட வேண்டும். ஏனென்றால், எமது எதிர்காலத் தலைவர்களை, எதிர்காலச் சந்ததியினரைப் பாதுகாப்பதற்கு இது ஒரு சிறந்த வழிமுறையாக அமைவதற்கு வாய்ப்பிருக்கின்றது. மனித வளம் என்பது மிக முக்கியமானதாக அமைந்திருக்கின்றது. அந்த மனித வளத்தினை வளர்த்தெடுப்பது, கூர்மைப்படுத்துவது, பக்குவப்படுத்துவது, உச்சமான ஒரு வினைத்திறன் உள்ளதாக மாற்றுவது என்பதெல்லாம் அரசின் சட்டதிட்டங்கள், நடைமுறைகளில்தான் தங்கியிருக்கின்றன. மனித வளத்தினை உச்சமாக ஆக்கிக்கொண்ட நாடுகள்தாம்

உச்சமாக அபிவிருத்தியடைந்து செல்கின்றன. மனித வளத்தை உச்சமாக ஆக்குவதற்குத் தடையாக இருக்கின்ற முக்கிய காரணிகளில் ஒன்றாக இருப்பது மதுசாரம் மற்றும் போதைப் பொருட்கள் என்பதை நாங்கள் மறந்துவிடக்கூடாது. எனவே, மதுவுக்கு முக்கியத்துவம் கொடுப்பதை அல்லது மதுவைக் கொண்டு வருமானம் ஈட்டிக்கொள்ள வேண்டும் என்கின்ற நிலைப்பாட்டை நல்லாட்சி அரசாங்கம் தவிர்த்துக் கொள்ள வேண்டும்.

மது விற்பனை நிலையங்களுக்கு எதிராக மக்கள் ஆர்ப்பாட்டங்களைச் செய்து, அவற்றை மூடிவிடவேண்டும் என்று செயற்படுகின்றபோது, அந்த மதுபானச்சாலைகளின் இருப்புக்காகக் குரல்கொடுக்கின்றவர்கள், அதனைச் சட்டபூர்வமான முறையில் நியாயப்படுத்துவதற்கு விழைகின்றவர்கள், பலம்வாய்ந்த சக்திகளாக இருக்கின்றார்கள். அரசியல்வாதிகள் அல்லது பெரும் பணம் படைத்தவர்கள் அல்லது அதிகாரம்பெற்ற பொலிஸார் அதற்குப் பக்கபலமாக இருக்கின்றார்கள். நாட்டில் மதுச்சாலைகள் - மதுக்கடைகள் - மதுநிலையங்கள் இருப்பதை மக்கள் எந்தளவுக்கு ஆதரிக்கின்றார்கள் என்ற அடிப்படையில் விஞ்ஞானபூர்வமான, புள்ளிவிபர ரீதியான ஆய்வொன்று மேற்கொள்ளப்படுமாக இருந்தால், எனது ஊகத்தின் அடிப்படையில், பெரும் எண்ணிக்கையான மக்கள் - 80 வீதத்துக்கும் அதிகமான மக்கள், சிலவேளைகளில் 90 வீதமாகக்கூட இருக்கலாம் - மதுபானச்சாலைகள் அதிகரிக்கப்படுவதை விரும்பாதவர்களாக இருப்பது தெரியவரும்.

மதுவின் தாக்கத்தினால் பல்வேறுபட்ட அபாயங்கள் ஏற்படுகின்றன; எதிர்காலச் சந்ததியினர் சீரழிந்து போகின்றார்கள் என்கின்ற விடயங்கள் எல்லாம் கருத்தில் கொள்ளப்பட வேண்டியனவாக இருக்கின்றன. இன ரீதியான வன்முறைகளாக இருக்கலாம், மத ரீதியான வன்முறைகளாக இருக்கலாம் மற்றும் சண்டைகளாக இருக்கலாம், அவற்றில் ஈடுபடுகின்ற அநேகமானவர்கள் சுயநினைவற்ற, வெறித்தனமான நிலையில் இருந்தமையை அநேகமான விசாரணைகள் எடுத்துக்காட்டுகின்றன. எனவே, குற்றச்செயல்கள் மற்றும் பாவங்கள், கொடுமைகளைக் கட்டுப்படுத்துவதாக இருந்தால் மதுப்பாவனை ஒழிக்கப்பட வேண்டும். வித்தியாவின் படுகொலையாக இருக்கலாம் அல்லது தென் பகுதியில் இடம்பெற்ற படுகொலைகளாக இருக்கலாம் மற்றும் பாலியல் வல்லுறவுகளாக இருக்கலாம், எதுவாகவிருந்தாலும் சம்பந்தப்பட்டவர்கள் தலைக்குப் போதையேறிய நிலையில்தான் இப்படியான செயல்களில் ஈடுபட்டிருக்கின்றார்கள்.

நாடு முன்னேறவேண்டுமாக இருந்தால், மானுட விழுமியம் உயர்த்தப்படவேண்டுமாக இருந்தால், மதுப் பாவனையில் அக்கறை காட்டுகின்ற அல்லது கவனம் செலுத்துக்கின்ற அல்லது மது விற்பனை நிலையங்கள் அதிகரிக்கப்பட வேண்டும் என்கின்ற எண்ணங்கள், சிந்தனைகள் நிச்சயமாகக் கைவிடப்படவேண்டும். Outcome என்பதை வெளிவருகை என்றும் Impact என்பதை நீண்ட காலம் நிலைத்து நிற்கக்கூடிய தாக்கம் என்றும் சொல்வார்கள். மதுவின் மூலமாகக் கிடைக்கின்ற output - outcome சிலவேளைகளில் தற்காலிக உயர்வாக இருந்தாலும் அவற்றின்மூலமான தாக்கம் - impact - நீடித்து நிற்கக்கூடிய விளைவு நிச்சயமாகக் குறைவாகவே காணப்படும்.

நாடு சுதந்திரம் பெற்று 70 ஆண்டுகள் கடந்துள்ளது. இந்த 70 ஆண்டுகளில் எமது நாட்டினை அபிவிருத்தியடைந்த நாடாக அல்லது வளர்ச்சி பெற்ற நாடாக மாற்றியிருக்கின்றோமா? நாட்டின் வளர்ச்சிக்குத் தடங்கலாக இருப்பதில் பல காரணிகள் செல்வாக்குச் செலுத்தினாலும், குடிபோதையும் நாட்டின் வளர்ச்சிக்குத் தடங்கலாக இருப்பதற்கு வாய்ப்பிருக்கின்றது. எனவே, நான் உங்களிடம் சொல்லக்கூடிய ஒரு விடயம் என்னவென்றால், மதுசாரத்தின்மூலம் வருமானத்தை நேர்க்கணியமாக உயர்த்திக் கொள்ளலாம் என்று நினைக்கின்ற கோட்பாட்டினை, கொள்கையினை, எண்ணக்கருவினைத் தவிர்த்துக்கொள்ள வேண்டியது அவசியமாகும் என்பதாகும்.

இன்று பியரின் விலைக் குறைப்பினால், அதனைப் பருகுகின்றவர்களின் அளவு - வீதம்கூட உயர்ந்திருப்பதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அதாவது, பியர் பாவனையாளர்களின் எண்ணிக்கை அல்லது விகிதாசாரம் 12 வீதமாக உயர்ந்திருப்பதாக ஆய்வு அறிக்கைகள் கூறுகின்றன. குறைந்த விலையில் விற்கப்படுகின்ற போதை என்ற அடிப்படையில் அவற்றைப் பாவிக்கின்றவர்களின் எண்ணிக்கை அதிகரித்துச் செல்கின்றது. பியரில் வெறிக்கும் தன்மை அல்லது மனிதனைக் கெடுக்கின்ற தன்மை குறைவாகக் காணப்படுகின்றது. அந்த வகையில் அந்த மென் தன்மையான போதையூட்டக்கூடிய பியரைப் பாவிக்கின்றவர்களின் எண்ணிக்கை இன்று அதிகரித்துக் கொண்டிருப்பதை நாங்கள் கவனத்திற்கொள்ள வேண்டியிருக்கின்றது.

மதுசாரத்தை முழுமையாக கட்டுப்படுத்துவது - இல்லாமல் செய்வது என்பது கடினமாக இருந்தாலும், மருத்துவ ரீதியாகவும் விஞ்ஞான ரீதியாகவும் இதனைக் கட்டுப்படுத்துவதற்குரிய சரியான பொறிமுறைகளை அல்லது வழிவகைகளை மேற்கொள்ள வேண்டிய தார்மீகப் பொறுப்பு அரசுக்கு இருக்கின்றது. இன்று இந்த மதுபானம் எதிர்காலச் சந்ததியின் அபிவிருத்தியோடு விளையாடுகின்றது. இதன் காரணமாக அழிவுகள் ஏற்படும். எனவே, நாட்டில் ஆக்கத்தைத் தரக்கூடிய, அல்லது மக்களுக்கு நன்மையைத் தரக்கூடிய உற்பத்தி நிலையங்களை அதிகரிக்கின்ற அதுவேளை, அழிவைத் தரக்கூடிய, மனிதனை நடைப்பிணமாக மாற்றக்கூடிய உற்பத்திகளின் அளவினை நிச்சயமாகக் கட்டுப்படுத்த வேண்டும். அதன்மூலமாகவே நாங்கள் எதிர்காலச் சந்ததியினருக்கு நன்மை செய்தவர்களாக இருக்க முடியும்.

எமது நாட்டில் ஐரோப்பியர்கள் மதுப் பாவனையை - மதுப் பழக்கத்தினைப் பழக்கிவிட்டுச் சென்றாலும்கூட, இந்த விடயத்தில் ஐரோப்பாவைவிட எமது நாடு உயர்ந்திருக்கின்றது. அவர்கள் பயன்படுத்துகின்ற அளவை விட எமது மக்கள் பயன்படுத்துகின்ற அளவு 5 மடங்காக அதிகரித்திருக்கின்றது என்று டாக்டர் பாலித அபயகோன் அவர்கள் குறிப்பிட்டிருக்கின்றார். எனவே, ஐரோப்பியர் விட்டுச்சென்ற சில நல்ல விழுமியங்கள் - ஜனநாயக விழுமியம், மக்களாட்சி விழுமியம், சமத்துவ விழுமியம் போன்றவற்றை வளர்த்துக்கொள்ளாமல், மக்கள் மத்தியில் அவர்கள் விட்டுச்சென்ற மது - குடிப்பழக்கம் போன்ற பிழையான சில செயற்பாடுகளை அவர்களைவிட அதிகமாக வளர்த்துச் செல்வதை இன்று நாங்கள் அவதானிக்கக் கூடியதாகவுள்ளது.

“ஊருக்கு உபதேசம் உனக்கல்லடி மகளே” எனத் தமிழில் ஒரு பழமொழி இருக்கின்றது. அதேபோன்று நல்ல பல விடயங்களைப் பற்றிப் பேசினாலும், விளக்கினாலும்கூட இன்று அவற்றின் அமுல்படுத்தல்கள் - நடைமுறைப் படுத்தல்கள் குறைந்துகொண்டுபோகின்ற தன்மை காணப்படுகின்றது. எது எப்படியாக இருந்தாலும் மேதகு

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

ජනාධිපති අවර්කළ් මට්රුම් කෙළරව සුකාතාර අමෙච්සර් පෝන්රෝර් පෝතෙයට්ර තේසත්තෙ උරුවාක්ක වේණ්ඩුමෙන්ර අටිප්පටෙයිල් සෙයට්පට්ටු වරුකින්රනර්. ඉන්ත අටිප්පටෙයිල් පෝතෙවස්තුක්කළෙක් කට්ටුප් පටුත්තුවතන් මූලමාක අනේකමාක නල්ල විළෙවුකළෙප් පෙර මුටියුම් එන්පතු එනතු කරුත්තාකුම්.

ඉරුතියාක, තලෙප්පුක්කු අප්පාල් ඔරු විටයත්තෙක් කුරිප්පිට විරුම්පුකින්රේන්. අතාවතු පත්තු ඉලට්සම් තොළිල් වළංකල් තිට්ටම් පිරතම මන්තිරි අවර්කළතු ඔරු සින්තනෙයාකක් කාණප්පටුකින්රතු. අන්ත අටිප්පටෙයිල් පට්ටතාරිකළුක්කුත් තොළිල් වළංකුතල් එන්ර විටයත්තෙ මෙයමාකක් කොණ්ටු අණ්මෙයිල් පල මාවට්ටංකළිල් නේර්මුකප් පරීට්සෙකළ් නටෙපෙට්රන. ආනාල්, පට්ටතාරිකළුක්කුත් තොළිල් වළංකුම් වයතෙල්ලෙයෙ 35ආක වෛත්තිරුප්පතු අතර්කු මේර්පට්ට වයතුටෙය පට්ටතාරිකළුක්කුප් පාතිප්පෙ ඒර්පටුත්තුම්. අතු තේසියක් කොළ්කෙයාක ඉරුක්කලාම්. ආනාල්, තර්පෝතු වේලෙයර්රිරුක්කින්ර පට්ටතාරිකළින් නිලෙමෙකළුක්කේර්ප කුරිත්ත නිලෙප්පාට්ටිල් නෙකිළ්ච්චියෙ ඒර්පටුත්ත වේණ්ටියිරුක්කින්රතු. ආකවේ, පට්ටතාරිකළුක්කුත් තොළිල් වළංකුවතර්කාන වයතෙල්ලෙයෙ තර්කාලිකමාකවේනුම් 45 ආක අතිකරික්ක වේණ්ටුම්. ඉන්ත මාර්රත්තෙච් චෙය්තු තර්පෝතිරුක්කින්ර පට්ටතාරිකළෙ වේලෙවාය්ප්පිල් උළ්වාංකිවිට්ටු, ඉනිවරුම් කාලත්තිල් අතු චම්පන්තමාන තීර්ක්කමාන මුටිවෙ එටුක්කලාම්.

කුරිප්පාක වටක්කු, කිළක්කු මාකාණංකළිලුළ්ළ පට්ටතාරිකළෙප් පොරුත්තමට්ටිල්, අවර්කළ් පල්වේරුපට්ට තාක්කංකළිලිරුන්තුම් විටුපටාත නිලෙයිල් කාණප්පටු කිරාර්කළ්. අතේනේරම් 2012ආම් ආණ්ටු පල්කලෛක්කළකත් තිලිරුන්තු වෙළියේරියවර්කළ්කූට තොළිල්වාය්ප්පිනෙප් පෙරමුටියාත නිලෙයිල් උළ්ළනර්. එනවේ, තර්පෝතු නටත්තප්පට්ටිරුක්කින්ර නේර්මුකප් පරීට්සෙ මූලමාකත් තෙරිවු චෙය්යප්පටවිරුක්කින්ර පට්ටතාරිකළින් එණ්ණික්කෙයෙ අතිකරික්ක වේණ්ටුම්. වයතු එන්ර විටයත්තෙක් කට්ටුප්පාටාක වෛත්තුක්කොණ්ටු පට්ටතාරිකළෙච් චේවෙයිල් ඉණෛත්තුක් කොළ්වතෙ මට්ටුප්පටුත්තුකින්රපෝතු පට්ටතාරිකළින් මත්තියිල් ඔරු විරක්ති නිලෙ එර්පටුවතර්කු වාය්ප්පු ඉරුක්කින්රතු. චිල මාකාණංකළිල් ඉන්ත වයතෙල්ලෙ 45 ආක ඉරුප්පතාක අරිකින්රෝම්. එනවේ, තයවුචෙය්තු වටක්කු, කිළක්කිලුම් ඉන්ත වයතෙල්ලෙයිනෙත් තර්කාලිකමාකවේනුම් 45 ආක අතිකරිත්තු, අන්ත වයතෙල්ලෙක්කුට්පට්ට පට්ටතාරිකළුක්කු තොළිල් වාය්ප්පිනෙක් කොටුක්කින්ර වකෙයිල් අරසු නිච්චයමාක ඔරු නල්ල මුටිවෙ එටුක්කවේණ්ටුම් එන්රු කේට්ටුක් කොළ්කින්රේන්.

කිළක්කු මාකාණත්තිල් තොණ්ටරාචිරියර් නියමනංකළ් වළංකුවතර්කාන නටවටික්කෙකළ් මේර්කොළ්ළප්පට්ටිරුක් කින්රන. අතන්පටි ඒරත්තාළ 455 තොණ්ටරාචිරියර්කළෙ නියමිප්පතර්කු මුටිවෙටුක්කප්පට්ටපෝතිලුම්, කුරිත්ත නේර්මුකප්පරීට්සෙයිනෙ මීණ්ටුම් නටාත්ත වේණ්ටුම් එන්කින්ර නිලෙමෙ ඒර්පට්ටුළ්ළතු. ඉන්තත් තොණ්ටරාචිරියර්කළ් ආචිරියර් පර්රාක්කුරෙ නිලවිය කාලත්තිල් චේවෙයාර්රියවර්කළ්. කිට්ටත්තට්ට 1998ආම් ආණ්ටිලිරුන්තු කර්පිත්තු වන්තවර්කළුම් ඉවර්කළිල් කාණප්පටුකින්රාර්කළ්. ඔරුපුරත්තිල් අන්නත් තොණ්ටර් ආචිරියර්කළ් තංකළුක්කුත් තොළිල්වාය්ප්පුක් කිටෛක්කප් පෝකින්රතු එන්රු එණ්ණියිරුන්ත නිලෙයිල්, මරුපුරත්තිල් කුරිත්ත ආචිරියර් වෙර්රිටංකළ් නිරප්පප්පටුවතර්කු නටවටික්කෙ එටුක්කප්පට්ටිරුන්ත නිලෙයිල්, අන්ත නේර්මුකප් පරීට්සෙයිනෙ මීණ්ටුම් නටාත්තුවතු එන්ර මුටිවිර්කු අමෙච්සු වන්තිරුක්කින්රතු. එනවේ, ඉන්ත විටයංකළෙයුම් කරුත්තිර්කොණ්ටු, ඔරු චාතකමාන මුටිවිනෙ එටුත්තු, ඉන්තත් තොණ්ටරාචිරියර්කළුක්කුරිය තොළිල්වාය්ප්පිනෙ වළංකුවතර්කු නටවටික්කෙ එටුක්කුමාරු කේට්ටු, එනතු උරෙයිනෙ නිර්වෙවුචෙය්කින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා.

ගරු තාරක බාලසූරිය මහතා
(මාණ්පුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන්නේ විනාඩි 10ක්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමනි. ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - මින්වලු මට්රුම් පුදුප්පික්කත් තක්ක චක්ති ඉරාජාංක අමෙච්චර්)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)

චිසින් ස්ථිර කරන ලදී.
ආමෝතිත්තාර්.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩිවඩි ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු එට්වට් කුණසේකර අවර්කළ් අක්කිරා චනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.44]

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පැවැත්වෙන මෙම විවාදයේ දී මගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා විනාඩි 10ක පමණ කාලයක් වෙන් කර දීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද දිනයේදී සුරාබදු ආඥාපනත යටතේ නිවේදනයක් සහ විසර්ජන පනත යටතේ යෝජනා හතක් විවාදයට ගන්න නියමිතව තිබුණා. නමුත්, සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය අද දින විවාදයට ගැනීම නවත්වා තිබෙනවා. විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර ප්‍රදේශවලට අරක්කුවලින් ඇති වෙලා තිබෙන බලපෑම පිළිබඳව මට ඉස්සෙල්ලා කථා කළ මන්ත්‍රීතුමා හොඳ පැහැදිලි කිරීමක් කළා. මා ඇත්ත වශයෙන්ම එතුමාට ස්තුතිවන්ත වනවා. මොකද, සාමාන්‍යයෙන් දෙමළ ජනතාවට තිබෙන ප්‍රශ්නය පිළිබඳව පමණක් නොවෙයි, සමස්තයක් වශයෙන් මේ රටේ ජනතාවට තිබෙන ප්‍රශ්න ගැන එතුමා කථා කළා. කෙසේ වෙතත් සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය අද විවාදයට ගත්තේ නැති වුණත්, මේ තුළින් කරන්න හදන්නේ මොකක්ද කියන එක අපි සාකච්ඡා කළාට වරදක් නැහැයි කියලා මා හිතනවා.

ඇත්ත වශයෙන්ම සුරාබදු ආඥාපනත යටතේ වූ නිවේදනය යටතේ barsවල licenceවලට ගෙවන්න තිබෙන මුදල් ප්‍රමාණය අඩු කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමාත් කියපු අන්දමටම අපට අරක්කුවලින් ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපි ඒවා අධෛර්යය කරන්න ඕනෑ. ඒ හින්දා තමයි මේවාට syntax කියලා තිබෙන්නේ. නමුත්, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ මොකක්ද? මංගල සමරවීර ඇමතිතුමාට එක කාලයක ලංකාවේ සිටින ගැහැනු ළමයින්ට කොටට අන්දවලා, bars උදේ පාන්දර එක, දෙක වන තෙක් විවෘත කර තැබීමේ අදහසක් තිබුණා. ව්‍යවිනාමයේ, එහෙමත් නැත්නම් තායිලන්තයේ සංචාරක ක්ෂේත්‍රය දියුණු කරනවා වාගේ ඒ හරහා යම් කිසි විධියකට අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න තමයි එතුමාගේ අදහස තිබුණේ. නමුත්, මේ රටේ පෙර පිනකටද කොහෙදෝ ජනාධිපතිතුමා ඒක දැක්කාට පස්සේ මෙහෙම දෙයක් කරන්න එතුමා ඉඩ දෙන්නේ නැහැයි කියලා තිබෙනවා. දැන් මෙහෙම බදු පිට බදු ගහලා තිබෙන කාලයක barsවල තිබෙන licenceවලට නැත්නම් හෝටල්වල තිබෙන licence සඳහා ගෙවන්න තිබෙන මුදල් ප්‍රමාණය අඩු කරන එක සාධාරණයිද, නැද්ද කියන එක මෙතැනදී අපි ප්‍රශ්න කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. රා එකතු කරන තැන රුපියල් ලක්ෂයකට තිබුණු බදු ප්‍රමාණය රුපියල් 25,000කට අඩු කරලා තිබෙනවා. ඒ වාගේම වතුකරයේ මොකක් හරි bar එකක් විවෘත කරන්න රුපියල් ලක්ෂයක licence fee එකක් ගෙවන්න තිබුණා නම්, ඒක රුපියල් 25,000කට අඩු කරලා තිබෙනවා. මෙතැනදී මූලිකව මේ කට්ටියට මත් පැන් බොන්න පොලඹවන්න තමයි මේ ආණ්ඩුවෙන් උත්සාහ කරන්නේ.

මට ඉස්සෙල්ලා කථා කළ මන්ත්‍රීතුමා විතරක් නොවෙයි, මෑතකදී ඇල්ලේ ගුණවංශ නායක ස්වාමීන් වහන්සේත් පැහැදිලි කරලා දුන්නා, neo-liberal ආර්ථික වර්ධනය නිසා අපේ රට විශාල ලෙස සමාජයීය පසුබෑමකට ලක් වෙලා තිබෙන බව. අපි දන්නවා, මෙහෙම bars විවෘත කරන්න පටන් ගත්තොත් මොකක්ද සිදුවන්නේ කියලා. ඒ වාගේම දැන් මේ ආණ්ඩුව හැම වෙලාවෙම සංහිඳියාවක් ගැන කථා කරනවා. නමුත්, අපට තිබුණු සංස්කෘතික වටිනාකම් මේ වනකොට යම් කිසි විධියකින් පසුබෑමකට ලක් වෙලා තිබෙනවා කියලා අපි දන්නවා. මහගම සේකරගේ සින්දු; මහින්ද හිමියන්ගේ කවි පන්ති; අනගාරික ධර්මපාල තුමාගේ ජීවිත කථාව දැන් අපේ ඉස්කෝල ළමයින්ගේ අධ්‍යාපනයෙන් ඉවත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. දැන් "හෙළ" කියන වචනය පාවිච්චි කරන්න බැරි මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. මේ එක් පැත්තක්. මේ ආණ්ඩුව දැන ගන්න ඕනෑ, neo-liberal ආර්ථිකයක් මේ රටට හඳුන්වා දෙනවා නම්, මේකේ තිබෙන ඵලවිපාක මොනවාද කියලාත්.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා කියන්නේ දක්ෂ ඇමතිවරයෙක්. එතුමාට හොඳ කළමනාකරණ හැකියාවක් තිබෙනවා. නමුත්, මුදල් ඇමති කෙනකු හැටියට එතුමාට දර්ශනයක් තිබෙනවාද කියන එක ගැන මෙහිදී මා ප්‍රශ්න කරන්නට ඕනෑ. එතුමාට එතුමාගේම දර්ශනයක් තිබෙනවාද? එහෙම නැත්නම් නියෝ-ලිබරල්වාදී ලේකම්වරු, එහෙමත් නැත්නම් ලෝක බැංකුවෙන් -World Bank එකෙන්- කියන නියෝගවලට එතුමා නිකම් අත්සන් කරනවාද? මා හිතන හැටියට අපේ ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමාට නම් ඊට වඩා හොඳ දර්ශනයක් තිබෙනවා. අපි දන්නවා, ඇමෙරිකාවේ වුණත් සාමාන්‍යයෙන් මුදල් ඇමතිවරයකු වශයෙන් පත් කරන්නේ, කලින් කුමන හෝ බැංකුවක ඉහිටපු ප්‍රධාන නිලධාරියෙක් බව. ඇමෙරිකාවේ දැනට සිටින මුදල් ඇමතිවරයාත් Goldman Sachs එකේ partner කෙනකු හැටියට වැඩ කළ කෙනෙක් බව අපි දන්නවා. ඇමෙරිකාවේ පළමුවන මුදල් ඇමතිවරයා හැරුණාට පස්සේ අනෙක් මුදල් ඇමතිවරුන් 26දෙනාම බැංකු ක්ෂේත්‍රයත් එක්ක කිසිම ගනුදෙනුවක් තිබිලා නැහැ. නමුත් මෑත කාලයේදී, දෙවන ලෝක යුද්ධයෙන් පස්සේ Goldman Sachs, J.P. Morgan, Merrill Lynch වැනි investments බැංකුවල හිටපු අය තමයි දිගට හරහට පත් කළේ. ඒ අනුව neoliberal ආර්ථිකය ඉදිරියට ගෙන යන්න අපේ ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා වැනි කෙනකු පත් කරන එක බොහෝදුරට හොඳයි කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ න්‍යායයේත් යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා. මේ රජය බලයට පත් වුණාට පස්සේ මේ න්‍යායයේ දැක්ක මූලික ප්‍රශ්නය මොකක්ද? බදු ගෙවන්න ඕනෑය කියලා මේ රජය පුළුවන් තරම් බදු වැඩි කළා. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව දෙස බැලුවොත් සාමාන්‍ය පුරවැසියකු උපයන ඇත්ත පඩිය - real wage - මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ දී තිබුණු පඩියටත් වඩා අඩුයි කියලා තමයි ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් කර තිබෙන්නේ. බදු පිට බදු අය කළාට පස්සේ මොකක්ද වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එතකොට ඒ ජනතාවට ව්‍යදම් කරන්න පුළුවන් මුදල් ප්‍රමාණය අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම ජනතාවට ආයෝජනය කරන්න පුළුවන් මුදල් ප්‍රමාණය අඩුවෙලා තිබෙනවා. බොහෝදෙනෙක් කියනවා, ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ ආයෝජනය පොඩ්ඩක් වැඩිවෙලා තිබෙනවාය කියලා. ඇත්ත වශයෙන්ම ආයෝජනය කියලා කියන්නේ, විශාල පාරවල් හදන එක විතරක් නොවෙයි. ආයෝජනය කියලා කියන්නේ වරායවල් හදන එක විතරක් නොවෙයි; ගුවන් තොටුපොළවල් හදන එක විතරක් නොවෙයි. යම්කිසි ගමක කවුරුන් හෝ කඩයක් දමලා, hardware එකක් දමලා, ඒ තුළින් කවුරුන් හෝ දියුණු වෙනවා නම්, ඒකත් ආයෝජනයක් කියලා කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, neoliberal ආර්ථිකය නිසා අද අපි දැකලා තිබෙන්නේ මොකක්ද? මේ රටේ අභ්‍යන්තරයේ යම්කිසි විධියක බල තුලනයක් සිද්ධ වෙනවා. පොහොසත් අය තවත් පොහොසත් වෙනවා. ඒ වාගේම දුප්පත් අය තවත් දුප්පත් වෙනවා. මා හිතන හැටියට මෙය මේ ආර්ථික ක්‍රමයේ ලක්ෂණයක්. මේ neoliberal ආර්ථිකය ඉදිරියට ගෙන යනකොට මේ රටට කොපමණ වටිනාකමක් ලැබෙනවාද කියා බලන්න ඕනෑ.

[ගරු තාරක බාලසූරියමහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ මෙපමණ බදු ගහලා තිබුණාට මූලික වශයෙන් තිබෙන්නේ බදු වර්ග දෙකක් පමණයි. VAT එකයි, NBT එකයි විතරයි. මේ අවුරුද්දේ අප්‍රේල් 01 වන දායින් පස්සේ මා හිතන හැටියට රුපියල් 60,000කට වඩා වැඩි ආදායමක් ලැබෙනවා නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් income tax ගෙවන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, income tax ගෙවිවොත් මිනිසුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. ආයෝජනය සෑහෙන්න අඩු වෙනවා. මා හිතන හැටියට මේ කාලයේ දී රජයෙන් ආයෝජනය කළා නම්, මේ ප්‍රශ්නය යම්කිසි මට්ටමකට මහ හැරෙන්නට ඉඩ තිබුණා. නමුත්, මේ අවුරුදු තුන දිහා බලනකොට මේ රජයෙන් කිසිම ආයෝජනයක් වෙනවාය කියලා අප දකින්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මලික් සමරවික්‍රම ඇමතිතුමා කිව්වා, ලංකාවට වැඩියෙන්ම ආයෝජන ආපු කාලයේ බිලියන 1.7ක් ලැබී තිබෙනවාය කියලා. එම බිලියන 1.7 තුළ තිබෙන්නේ මොනවාද කියලා බැලුවොත්, මිලියන 295ක් හම්බන්තොට්ටින් ලැබී තිබෙනවා. මිලියන 195ක් ෂැන්ග්‍රි-ලා හෝටලයෙන් ලැබී තිබෙනවා. මිලියන 194ක් Port City එකෙන් ලැබී තිබෙනවා. තව මිලියන 100ක් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ දී අත්සන් කරපු mixed delopment ව්‍යාපෘතියකින් ලැබී තිබෙනවා. තවත් මිලියන 83ක් ඩයලොග් ආයතනයෙනුත්, මිලියන 45ක් එයාර්ටෙල් ආයතනයෙනුත් ලැබී තිබෙනවා. ඒ වාගේම තවත් මිලියන 45ක් Havelock City එකෙන් ලැබී තිබෙනවා. මේ බිලියන 1.7 තුළ මේ රජය අලුතින් පටන් ගත් ව්‍යාපෘති නැහැ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ දී අත්සන් කරපු ව්‍යාපෘති තමයි තිබෙන්නේ. අපි මේවා ගැන වැඩිය කෑ ගහන්න කලින් මේවායින් ඇත්තටම ඵලක් තිබෙනවාද කියලා තේරුම් ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, neo-liberal ආර්ථිකයේ දී රජයේ ප්‍රතිපත්තියක් හැටියට පුළුවන් තරම් වෙළෙඳ ගිවිසුම්වලට පෙලඹෙනවා. Greenpeace International ආයතනයේ website එක මේ වෙළෙඳ ගිවිසුම් පිළිබඳව හොඳ විග්‍රහයක් කරනවා. ඒ විතරක් නොවෙයි. අද ලෝකයේ ඉන්න Noam Chomsky නමැති, භාෂා පිළිබඳව සුප්‍රකට බුද්ධිමතා -linguist- ප්‍රකාශ කරනවා, ඇත්ත වශයෙන්ම වෙළෙඳ ගිවිසුම්වලින් රටවල්වලට විශාල වාසියක් ලැබෙන්නේ නැහැයි කියලා. මේ වෙළඳ ගිවිසුම්වලින් මූලිකව වාසි ලැබෙන්නේ ඒ ආයතනවලටය කියා කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකාව NAFTA කියා වෙළෙඳ ගිවිසුමක් අත්සන් කළා. නමුත්, මේ NAFTA කියන ගිවිසුම දෙස බැලුවාම අපිට පෙනෙනවා, එයින් මෙක්සිකෝවේ හිටපු පොහොසත්ම පුද්ගලයා වන Carlos Slim ලෝකයේ ඉන්න පොහොසත්ම පුද්ගලයා බවට පරිවර්තනය වුණා මිසක්, මෙක්සිකෝවේ දුප්පත් මිනිසුන්ට එයින් සෙතක් වුණේ නැහැ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Noam Chomsky කියන්නේ මොකක්ද? ඇත්ත වශයෙන්ම වෙළඳ ගිවිසුම් අවශ්‍ය වෙලා තිබෙන්නේ, ඒ ආයතනවල තිබෙන property rights, නැත්නම් ඒ අයගේ අයිතිවාසිකම් අරක්ෂා කරන්න මිස වෙළඳාම දියුණු කරන්න නොවෙයි කියන එකයි කියන්නේ. එහෙම තත්ත්වයක් තියෙද්දී, කොයි වාගේ වෙළඳ ගිවිසුම්වලටද අපි ඇතුළු වන්නේ කියන එක අපි සැලකිල්ලට ගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිට අපේ ආර්ථිකය යම්කිසි විධියකට හදන්න වුවමනාකම තිබෙනවා නම් අපිට සැලසුම් තිබෙන්න ඕනෑ. මහ බැංකු වාර්තාව දෙස බැලුවොත් ඔබතුමාට පෙනේවි, අපි 2017 වර්ෂයේදී බිලියන 2,010ක ආදායමක් බලාපොරොත්තුවෙන් සිටි බව. එය පදනම් කර ගෙන තමයි, 2018 වර්ෂයේදී අපි බිලියන 2,217ක ආදායමක් බලාපොරොත්තු වුණේ. හැබැයි 2017 වර්ෂයේදී අපට ඇත්ත වශයෙන්ම ලැබුණු ආදායම කීයද? බිලියන 1,831යි. බිලියන 1,831ක් ලැබුණොත්, ඊළඟ අවුරුද්දේ තිබෙන target එකට යන්න නම් සියයට 21ක වර්ධනයක් ඕනෑ, අපිට ඒ target එකට යන්න බැරි වුණොත් මොකද වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්කෝ ආණ්ඩුවට ඒ ප්‍රාග්ධන වියදම් අඩු කරන්න වෙනවා. නැත්නම් අපට බදු වැඩි කරන්න වෙනවා. එසේත් නැත්නම් අපිට මුදල් ණයට ගන්න වෙනවා. එසේත් නැත්නම් රටේ තිබෙන සම්පත් විකුණන්න වෙනවා. එහෙමත් නැත්නම් අපට මුදල් අච්චු ගහන්න සිද්ධ වෙනවා. මා හිතන විධියට බදු වැඩි කරන එකට මීට වඩා අපිට යන්න බැහැ. "The Laffer Curve" කියන න්‍යාය අපි ආර්ථික විද්‍යාවේදී ඉගෙන ගෙන තිබෙනවා. ඒ කියන්නේ, බදු අය කරන සීමාව යම්කිසි ප්‍රමාණයකට වඩා වැඩි වුණොත්, ආණ්ඩුවට එන මුදල් ප්‍රමාණය යම්කිසි විධියකට අඩු වෙනවා කියන එකයි. අද මිනිසුන්ට දරා ගන්න බැරි ප්‍රමාණයකට බදු ගහලා තිබෙනවා. මෙහෙම තියෙද්දියි අරක්කු මුදලාලිලාට බදු සහනත් දෙන්න සැලසුම් කරන්නේ. මෙසේ තිබියදීයි, එක එක අතිරේක යෝජනා පාර්ලිමේන්තුවට ගෙනැවිත් Land Cruiser V8 වාහන ප්‍රමාණයක් ඇමති මණ්ඩලයට දෙන්නේ. ඇමති මණ්ඩලයට අලුත් Land Cruiser V8 වාහන ගේනවා. අරක්කු මුදලාලිලාට Licence fee එක අඩු කර දෙනවා. හැබැයි, සාමාන්‍ය ජනතාවට පුළුවන් තරම් බදු ගහනවා. මේ කටයුතුවල කොපමණ සදාචාරාත්මකභාවයක් තිබෙනවාද කියා අපි කල්පනා කර බලන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම අවසාන වශයෙන් කියන්නේ, මේ රට ඉදිරියට ගෙන යන්න නම් ඒ අයට ඒ සඳහා දැක්මක් තිබෙන්න ඕනෑ බවයි. මේ වර්ෂාව නිසා ආර්ථික වර්ධන වේගය සියයට 2.5කින්, සියයට 3කින් වැඩි කර ගන්න පුළුවන්ය කියා මේ ළඟදී ගරු ජනාධිපතිතුමාත් කියනවා අපි දැක්කා. දළ ජාතික නිෂ්පාදිතයට කෘෂිකර්මයෙන් සියයට 6යි යන්නේ කියා අපි දන්නවා. කෘෂිකර්මයෙන් සියයට 6ක් දළ ජාතික නිෂ්පාදිතයට යනවා නම්, වර්ෂාව ආවා කියා සියයට 2.5කින් සියයට 3කින් දළ ජාතික නිෂ්පාදන වැඩි කර ගන්න පුළුවන්ද, බැරිද කියන එක අපි ප්‍රශ්න කරන්න ඕනෑ. එහෙම වැඩි කරගන්න බැරි නම්, රටේ ජනාධිපති කෙනෙක් මේ වාගේ ප්‍රකාශයක් කරන්න හොඳ නැහැය කියා මම විශ්වාස කරනවා. එහෙම ප්‍රකාශයක් කළොත් අපි ඔක්කොම

jokersලාය කියා හිතනවා. නවසීලන්තයේ හිටපු අගමැතිතුමා හමු වන්න මට එක වරක් වාසනාව ලැබුණා. එතුමන්ලා කථා කරනකොට facts දැනගෙනයි කථා කරන්නේ; ආර්ථිකය ගැන හොඳ අවබෝධයක් ඇතිවයි කථා කරන්නේ. අවබෝධයක් නැතිව, ආර්ථිකය සියයට 2.5කින්, සියයට 3කින් වර්ධනය වෙනවාය කියා කථා කළොත්, ජාත්‍යන්තර සමාගම්වල සිටින අයත් අපි jokersලා කියා හිතනවා.

මට කලින් කථා කළ විමල් වීරවංශ මන්ත්‍රීතුමා ඇතුළු තවත් මන්ත්‍රීවරු විශාල සංඛ්‍යාවක් neo-liberal ආර්ථිකයේ තිබෙන අඩු පාඩු මොනවාද කියා පැහැදිලි කර දුන්නා. මම හිතන විධියට දැන් කාලය ඇවිත් තිබෙන්නේ. අපි මේ යන මාර්ගයේ ගියොත් තවත් ප්‍රපාතයකට තමයි වැටෙන්නේ. ඒ නිසා මේ රටට ගැළපෙන ආර්ථික model එකක් ගෙන එන්න ඕනෑ, ඒ පිළිබඳව අපි සාකච්ඡාවක් පවත්වන්න ඕනෑ කියන කාරණා ප්‍රකාශ කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිය පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත යටතේ යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ, වවන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

පසුගිය කාලයේ අපට මුදල් අමාත්‍යාංශය කියා එකක් තිබෙනවාද කියා දැනුණේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දැවැන්ත හොරකම සිදු වුණු වෙලාවෙයි. මේ රටේ මුදල් පරිපාලනය මොන තරම් දූෂිත වෙලා තිබෙනවාද, මොන තරම් අවාසනාවන්ත තැනකට මේ රට පත් වෙලා තිබෙනවාද කියන එක ගැන මේ රටේ ජනතාව දැන ගත්තේ ඒ වෙලාවෙයි. ඒ දැවැන්ත මංකොල්ලය නිසා රටට සිදුවුණු හානිය, ඒ පාඩුව පිරිමසා ගන්න බැරිව තමයි අද මේ ආණ්ඩුව දඟලන්නේ; රෙගුලාසි පනවන්නේ, බදු පනවන්නේ ඒ සඳහායි. අපේ රටේ ආර්ථිකය මංකොල්ලකෑමේ වැඩ පිළිවෙළක තමයි මේ ආණ්ඩුව දිගින් දිගටම නිරත වුණේ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු "මේ ආණ්ඩුව අරවා කළා, මේවා කළා." කියා මේ ගරු සභාවේ කෑ ගහන බව තමුන්නාන්සේලා දන්නවා. ඒ අය එහෙම කෑ ගහන්න ඕනෑ. කෑ ගහන්න ඕනෑ වෙන කිසි හේතුවක් නිසා නොවෙයි. මේ පාර්ලිමේන්තුවටත් හොරෙන්, කථානායකතුමාටත් හොරෙන් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හරහා ඒ උදවියට මහජන මුදලින් රුපියල් ලක්ෂ 2 ගණනේ ගෙවනවා. පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හරහා රුපියල් ලක්ෂ 2 ගණනේ ඒ මන්ත්‍රීවරුන්ට ගෙවනවා. එසේ ගෙවනකොට එතුමන්ලා කුලියට කෑ ගහන්න ඕනෑ. අනික් මන්ත්‍රීවරු කාටවත් ඒ විධියට ගෙවන්නේ නැහැ. තේරා ගත් මන්ත්‍රීවරු කොටසකට අවුරුදු 2ක් තිස්සේ ඒ විධියට ගෙවාගෙන යනවා. මේවා මහජන මුදල්. මේක අල්ලස් දීමක්. අල්ලස් දීම තමයි මේ ආණ්ඩුව කරගෙන යන්නේ. අල්ලස් දීලා මන්ත්‍රීවරු රැක ගැනීම තමයි ඒ කරන්නේ. ඒ අල්ලස කාලා තමයි විජේපාල මන්ත්‍රීතුමන්ලා ඒ විධියට කථා කරන්නේ. මෙහෙම තමයි මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය යන්නේ. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ගත් මුදල්වලට මොනවද කළේ කියන එක දැන් ටිකෙන් ටික එළිවෙනවා. කාටද ඒවා දුන්නේ, කොහේද ඒවා ගියේ කියන එක දැන් ටික ටික එළිවෙනවා. ඒක වහන්න උත්සාහ කළා. නමුත්, වහගන්න බැරි වුණා. ඒ සල්ලි මහ ජනතාව ගෙවනවා. අපි සියලුදෙනාම ගෙවනවා. බඩු මිලෙන් ගෙවනවා. මෙය ඉතාම අවාසනාවන්ත තත්ත්වයක් හැටියටයි අපි දකින්නේ. දැන් මේ රටේ ආර්ථිකයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකයක් තිබෙනවාද කියලා ඔබතුමාටවත්, මේ රටේ ජනතාවටවත් හිතෙන්නේ නැහැ. රටේ ආර්ථිකය ඒ තරමටම විනාශ කරලා ඉවරයි; රටේ ආර්ථිකය එහෙම පිටින්ම ඇන හිටලා ඉවරයි. අද මේ රටේ කිසිම දියුණුවක් පෙනෙන්නට නැහැ. මනුස්සයෙකුට හෙටක් ගැන හිතන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නේ නැහැ, පසුගිය කාලයේ; මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ මේ රටේ අපනයන සංවර්ධන වැඩ පිළිවෙළක් තිබුණ බව. "අගය එකතු කොට අපනයනය කිරීම සඳහා දෙන සහනයත්", ඒ වාගේම "දේශීය නිෂ්පාදන අපනයන කරන උදව්යට දෙන සහනයත්" එම අපනයන සංවර්ධන වැඩ පිළිවෙළ තුළ තිබුණා. අද ඒ සහනයට මොකද වෙලා තිබෙන්නේ? අද ඒ සහනය කොහේද තිබෙන්නේ? අද ඒ සහනයෙන් මේ රටේ ජනතාවට හෝ මේ රටේ ව්‍යාපාරිකයන්ට හෝ ප්‍රයෝජනක් තිබෙනවාද? මේ රටේ හොර ව්‍යාපාරිකයෝ විතරක් අද ඒක ප්‍රයෝජනයට ගන්නවා. ඉන්දුනීසියාවෙන් කරුංකා ගෙන්වලා, මේ රටේදී අගය එකතු කරලා, නැවත pack කරලා ඉන්දියාවට යවන වැඩ පිළිවෙළක් එදා තිබුණා. ඉන්දීය සහන වෙළෙඳ ගිවිසුම යටතේ අපට විශාල විනිමය සම්භාරයක් එකතු කරගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හැටියට තමයි ඒක තිබුණේ. අද ඒක සම්පූර්ණයෙන්ම හොර වෙළෙන්දෝ අතට ගිහිල්ලා තිබෙනවා. අද කරුංකා ලංකාවට එන්නේ නැහැ, පිට පාරෙන්ම ඉන්දියාවට යනවා. ඉන්දියාව ඒක දැනගෙන මේ වෙනකොට කන්ටේනර් 14,000ක් නවත්වලා තිබෙනවා. ඒ ව්‍යාපාරය අපට නැවත කරන්න බැහැ. ගම්මිරිස්වලට සිදු වුණෙත් ඒකමයි. වියට්නාමයෙන් බාල ගම්මිරිස් මෙහාට ගෙනැල්ලා අගය එකතු කිරීමේ වැඩසටහන යටතේ අපේ ගම්මිරිස්වලට කලවම් කළා. කලවම් කරලා යැව්වා. ඒ කරපු වැඩේ එළිවුණා. අපේ රටේ ගම්මිරිස් වෙළෙඳාම සම්පූර්ණයෙන්ම නැතිවෙලා ගියා. මේක තමයි අද අපේ රටේ ආර්ථිකයට වෙලා තිබෙන්නේ. මේවා ගැන හොයන්න කවුරුත් නැහැ. මුදල් ඇමතිතුමාත් නැහැ. මුදල් ඇමතිතුමාත් එක්ක මේක කරන්නත් බැහැ. ව්‍යාපාරිකයෝ අද මේ රට අත හැරලා යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවාද, අවුරුදු ගණනාවක් තිස්සේ; අපි දන්න කාලයේ ඉඳලා මේ රටේ තිබුණු ව්‍යාපාරයක් පසුගිය කාලයේ වහලා යන්න ගිය බව. ඒ තමයි යුනිලීවර් සමාගම. යුනිලීවර් සමාගම ලංකාවෙන් ඉන්දියාවට ගියා. ඇයි ගියේ? ඒ මිනිස්සුන්ගේ තිබුණු වටිනා දේපළ සියල්ලම විකුණුවා. සියල්ලම විකුණලා ඒ සල්ලිත් අරගෙන ඒ මිනිස්සු ඉන්දියාවට ගියා. ඇයි ගියේ? මේ රටේ බදු බර වැඩියි, වැඩ කරගෙන යන්න බැහැ. රජය දෙන බර ඒ මිනිස්සුන්ට වැඩියි, දරාගන්න බැහැ. ඒ ව්‍යාපාරය මෙහේ කරනවාට වඩා ලාභයි, ඉන්දියාවට ගෙනිහිල්ලා ඉන්දියාවයි, ලංකාවයි අතර තිබෙන වෙළෙඳ ගිවිසුම හරහා එහේ ඉඳලා වෙළෙඳාම කරන එක. මේක තමයි වුණේ. වොක්ස්වැගන් කොම්පැනිය ගෙනැල්ලා කරපු දේ ගැන අපි කියන්න ඕනෑ නැහැ නේ. වොක්ස්වැගන් කොම්පැනිය ගෙනාවා කියලා මේ රට පුරාව අඩබෙර ගැහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් සතුටු වෙන්න ඇති, මොනවා හරි වැඩක් වෙයි කියලා. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? එහෙම එකක් ආවද? එහෙම වැඩක් කෙරුණාද?

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

මොකක්ද ඒ වුණේ? මේක තමයි පසුගිය කාලයේ අපි දුටුව ආර්ථික ප්‍රගතිය. මේ නිසා ආණ්ඩුවට අද බදු පිට බදු ගහන්න සිද්ධවෙලා තිබෙනවා. හැම දාම බොහොම ආඩම්බරයෙන් කියනවා, "බදු වග කීමකි." කියලා. ඒ විධියට රූපවාහිනියෙන් දැන්වීම් ප්‍රචාරය කරනවා. ඒ සඳහා වියදම් කරන්නේත් මහජන සල්ලි. අවුරුදු 18ට වැඩි හැම තරුණයෙක්ම, තරුණියක්ම දැන් බදු ලිපි ගොනුවක් අරින්න ඕනෑ. ඒ විධියට බදු ලිපි ගොනුවක් ඇරියේ නැත්නම් ඒක වරදක්.

ඉතින් එහෙම බදු ලිපි ගොනුව ඇරලා හදන්නේ සියලුම ජනතාව සූරා කන්නයි. ජනතාව මිරිකලා, ජනතාවගේ ලේ උරා බොන, රිරි මාංස සූරා කෑමේ වැඩ පිළිවෙළකටයි අද මේ ආණ්ඩුව යන්නේ. මේක මේ රටේ ආර්ථිකය දියුණුවන, ඉස්සරහට යන වැඩ පිළිවෙළක් කියලා තමුන්නාන්සේලාට කියන්න පුළුවන්ද? බදු පිට බදු පනවන දූෂිත වැඩ පිළිවෙළ තුළ, අපේ රටේ කරගෙන ගිය වෙළෙඳාම සම්පූර්ණයෙන්ම අඩාළ වෙලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර අපේ රටේ භාණ්ඩ අපනයනය, කරන්න පුළුවන් වුණේ ක්‍රම දෙකකටයි. එකක් තමයි, L/C එකක් විවෘත කරලා අපනයනය කිරීම. ඒක තමයි ලෝකයේ පිළිගත්ත ක්‍රමය. ඕනෑම රටකින් භාණ්ඩයක් ගෙන්වද්දී වුණත් අපි L/C එකක් විවෘත කරනවා. එහෙම නැත්නම් තව ඊට වඩා ලිහිල් ක්‍රමයක් තිබුණා. ඒ තමයි DP Terms - Documents against Payment -කියන ක්‍රමය. අපේ ලියවිලි ඒ රටේ බැංකුවට ගියාට පස්සේ බැංකුව අපට ඒවා ලැබෙන්න සලස්වනවා. ඔය ක්‍රම දෙක තමයි සාධාරණව වෙළෙඳාම් කරන්න පුළුවන් ක්‍රම දෙක. අද මොකද වෙලා තිබෙන්නේ? අද ඒ ක්‍රම දෙකම නැහැ. අද හොර වෙළෙන්දෝ මේ එක ක්‍රමයක්වත් අනුගමනය නොකර භාණ්ඩ යවනවා. ඒකට ආණ්ඩුව ඉඩ දීලා තිබෙනවා. එහෙම යැව්වාම ටික කාලයක් ඒ අය වෙළෙඳාම් කරලා, ඒ සල්ලි මෙහෙට එවන්නේ නැහැ. ගෙන්වන්න ලියවිල්ලකුත් නැහැ. එහෙමත් නැත්නම් එහා කෙළවරේ සිටින වෙළෙන්දා ඒවා එහෙදි විකුණාගෙන සල්ලි ගෙවන්නේ නැතිව ඉන්නවා. ඒවා අල්ලන්න තැනක් නැහැ. එහෙම බංකොලොත් වුණු ව්‍යාපාරිකයින් රාශියක් අද ඉන්නවා. මම දන්නා ව්‍යාපාරිකයනුත් ඉන්නවා. එහෙම බඩු භාණ්ඩ යවලා containers පිටින් නැති වෙලා තිබෙනවා. ඒවා හොයන්න තැනකුත් නැහැ. දැන් ඒ මිනිස්සු ඒ ක්‍රමයට පුරුදු වෙලා. ඒ අය දන්නවා, ලංකාවේ අය එක්ක මෙහෙම දෙයක් කරන්න පුළුවන් කියලා. ඒ නිසා ඒ ක්‍රමයටයි ඒ අය භාණ්ඩ ඉල්ලන්නේ. දැන් රේගුව මොකද කරන්නේ? අපේ ආණ්ඩුව මේ ගැන කරලා තිබෙන්නේ මොකක්ද? කිසි දෙයක් කරලා නැහැ. මේවා සේරම ලිහිල් කරලා හොර, දූෂිත වෙළෙන්දන්ට වුවමනා විධියට මේ රට හසුරවන්න ඉඩ දීලා තිබෙනවා. අපි මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ, මේ නිදහස පාවිච්චි කරන්න දෙන්න එපා කියන එකයි. මේක පාලනය කරන්න. ආර්ථික වශයෙන් මේක පාලනය කළේ නැතිනම් කිසි කෙනකුට මේ රට ගොඩ ගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඔබතුමා දකින්න ඇති, "The Island" පත්තරේ තිබෙන headline එකක්. මොකක්ද ඒකේ තිබෙන්නේ? පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුගේ ඉල්ලා අස්වීම ගැනයි. මේ ඉල්ලා අස් වීමට හේතුව මොකක්ද? හේතුවක් අපි දන්නේ නැහැ. හැබැයි, මාධ්‍ය සැක කරනවා, වාහන බලපත්‍රය තවත් කෙනකුට ගන්න අවස්ථාව සලසා දෙන්නයි මෙලෙස ඉල්ලා අස් වී තිබෙන්නේ කියලා. මන්ත්‍රීවරයකුට රුපියල් මිලියන 23ක වාහන බදු සහනයක් ලැබෙනවා. මේ බදු සහනය දැන් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරගෙනයි තිබෙන්නේ. එක් කෙනෙකු එනවා, permit එක ගන්නවා, ටිකක් කල් මේ ගරු සභාවේ වාඩි වෙලා ඉන්නවා, ඊට පස්සේ ඉල්ලා අස් වෙලා යනවා. ඊළඟට, තව කෙනෙකු එනවා, ඒ කෙනාත් permit එක ගන්නවා. පාර්ලිමේන්තුව මේ තත්ත්වයට ඇද දමන්නේ ඇයි? මේ තත්ත්වයට පාර්ලිමේන්තුව වැටෙනතුරු අපි බලාගෙන ඉන්නේ ඇයි? මේ සිදු වෙන්නේ එහෙම එකක්ද කියලා හොයලා බලන්න. එහෙම වෙනවා නම් මේක වැරදියි. මේ වැඩේ එක් කෙනෙකු විතරක් නොවෙයි, දෙදෙනෙකු කළා. අද "The Island" පත්තරේ මේක තිබෙන නිසයි මම කියන්නේ. නැත්නම් මෙවැනි දේවල් ගැන අපි කථා කරන්නේ නැහැ. අපට ලජ්ජයි, කථා කරන්න. මෙහෙම තත්ත්වයක් අපි මීට පෙර කවදාවත් දැකලා නැහැ. අවුරුදු 05කට වතාවක් පාර්ලිමේන්තුවට තේරී පත්වන මන්ත්‍රීවරයකුට වාහන බලපත්‍රයක් ලබා දීම වරදක් කියලා මේ රටේ කිසි කෙනෙකු කියන්නේ නැහැ. ඒ අයට වාහනයක් දෙන්න ඕනෑ අවුරුදු 05ක් වැඩ කරන්න. ඒකේ ඇති වරදක් නැහැ. නමුත්, මේ සහනයෙන් අයුතු ප්‍රයෝජන ගන්න කවුරු හෝ කෙනෙකු උත්සාහ කරනවා ඒක කුමන හෝ ක්‍රමයකින් නතර කිරීමේ වගකීම ආණ්ඩුවට තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
හොඳයි.

එක් කෙනෙකු ඉල්ලා අස් වෙනවා; ඊට පස්සේ නෑයකු එනවා. ඇවිල්ලා ටිකක් කල් ඉඳලා permit එක අරගෙන ඒ කෙනාත් ඉල්ලා අස් වෙනවා. මේ විධියට මේක ව්‍යාපාරයක් කරගෙනද කියන සැකයක් තිබෙනවා කියන එකයි අද "The Island" පත්තරේ සඳහන් කර තිබෙන්නේ. ඉතින් මේ ගැන සොයා බලන්න වෙනවා; හිතලා බලන්න වෙනවා. මේ ගැන සොයා බලා අපේ ගෞරවය, පාර්ලිමේන්තුවේ ගෞරවය රකින්න කටයුතු කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් හැමෝම හොරු නොවෙයි. හැම මන්ත්‍රීවරයකුම ඔය විධියේ ජරා වැඩ කරන්නේ නැහැ. යම් කිසි ආත්ම ගරුත්වයක් ඇතිව ජීවත්වන, කටයුතු කරන මන්ත්‍රීවරුන් කොටසක් ඉන්නවා. නමුත්, පත්තරේ ලියන්නේ කොහොමද? දැන් අර දයාසිරි ලියනගේ මහත්මිය පාර්ලිමේන්තුවේ සිදු වන සියලුම දේවල් ගැන ලියනවා. හැබැයි, එතුමිය මේවා ගැන ලියන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ට හොරෙන් ලක්ෂ දෙකක් ගෙවනවා. ඒක ගැන තව වනතුරු වචනයක්වත් ලියලා නැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. මේ තත්ත්වයට අපි හැමෝම වැටිලා නැහැ. අපේ ආත්ම ගරුත්වය රැක ගන්න කථා කිරීමේ අයිතියක් අපට තිබෙනවා. මේක නම් ඇත්ත තත්ත්වය; මේක නම් සිදු වෙන්නේ, අපට එහෙම කථා කරන්න යුතුකමක් හා අයිතියක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ජනතාවට ජීවත් වන්න බැහැ. මේ බදු බර නිසා දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා. එම නිසා මේ මුදල් යොදවා තවත් පවුල් ලක්ෂ පහකට වහාම සමෘද්ධිය ලබා දෙන්න කියලා, සභානායකතුමාත් මේ අවස්ථාවේදී රැඳී සිටින මේ ගරු සභාවෙන් ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි ඉල්ලා සිටිනවා. මේ මුදල් ඒ සඳහා යෙදෙව්වේ නැත්නම් අපේ රට විශාල විනාශයකට යනවා. අපේ නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම නවතිනවා. එහෙම වුණොත් මිනිසුන්ට ජීවත් වන්න බැරි වනවා. අද ගංවතුර නිසා මිනිස්සු තවත් අනාථ වෙලා; තවත් අගාධයකට වැටිලා තිබෙනවා. ගිය වතාවේ ගංවතුර ගලපු මිනිසුන්ට තවම සහනාධාර දුන්නේ නැහැ. ඒ මිනිසුන්ට දෙනවා කිව්ව දීමනා තවම කිසිවක් දීලා නැහැ. ඔවුන්ට ගෙවල් හදා

දෙනවා කිව්වා. අගමැතිතුමා අපේ ගම්පළාත්වලට ගිහිල්ලා කිව්වා, හෙලිකොප්ටරයෙන් ගිහිල්ලා සල්ලි දමනවා කියලා. "සහනාධාර ටික හරියට බෙදුවේ නැත්නම්, මම හෙලිකොප්ටරයෙන් ඇවිල්ලා බෙදනවා" කියලා එතුමා කිව්වා. එතුමා පනස්හතර වතාවක් හෙලිකොප්ටරයෙන් එහෙට ගිහිල්ලා තිබෙනවා කියලා පසුගිය දිනවල පුවත් පත්වල පළ වුණා. මේ වැඩය කෙරෙනවා නම්, එතුමා ඕනෑ තරම් වාරයක් හෙලිකොප්ටරයෙන් ගියාට අපට කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකයි අපේ රටේ තිබෙන අවාසනාවන්ත තත්ත්වය. මේ තත්ත්වය තවදුරටත් ඉදිරියට යනවා නම්, මේ සභාවේ ඉඳගෙන හඬනවා හැරෙන්න අපට කරන්න වෙන දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී තවත් එක් දෙයක් මම මතක් කරන්න ඕනෑ. මේ ආණ්ඩුවෙන් මෙවර දෙන්න හදනවා, පොලිසියේ උසස්වීම්. එහිදි Reserve Sub Inspector - RSI - තනතුර සම්පූර්ණයෙන් ඉවත් කර මේ ගොල්ලන්ට වුවමනා අයට පමණක් උසස්වීම් දෙන්න යනවා. කරුණාකරලා ඒකත් නතර කර කාටත් සාධාරණය ඉෂ්ට වන අන්දමට මේ උසස්වීම් දෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මම හමාර කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ගන්නා ලදි.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 76 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 76 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

අයිතමය	සංශෝධනය
(i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි	රු. 450,000,000 සිට
නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	රු. 575,000,000 දක්වා
(ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි	රු. 460,000,000 සිට
නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	රු. 595,000,000 දක්වා
(iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි	රු. 360,000,000 සිට
නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	රු. 380,000,000 දක්වා
(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව	සංශෝධන නොමැත

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ගන්නා ලදි.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 77 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 77 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 24702 "අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ පිළිබඳ අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

අයිතමය	සංශෝධනය
(i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි	රු. 6,000,000 සිට
නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	රු.14,000,000 දක්වා
(ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි	රු. 1,000,000 සිට
නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	රු. 3,800,000 දක්වා
(iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි	රු.35,000,000 සිට
නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	රු. 39,000,000 දක්වා
(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව	සංශෝධන නොමැත.

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ගන්නා ලදි.
Question put, and agreed to.

IV

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 78 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 78 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

අයිතමය	සංශෝධනය
(i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	සංශෝධන නොමැත
(ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	රු. 1,800,000,000 සිට රු. 1,400,000,000 දක්වා
(iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	සංශෝධන නොමැත
(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව	සංශෝධන නොමැත

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

V

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 79 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 79 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

අයිතමය	සංශෝධනය
(i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	රු. 120,000,000 සිට රු. 160,000,000 දක්වා
(ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	රු. 120,000,000 සිට රු.140,000,000 දක්වා
(iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	රු.40,000,000 සිට රු. 65,000,000 දක්වා
(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකමෙහි උපරිම සීමාව	රු. 20,000,000 සිට රු. 40,000,000 දක්වා

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VI

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 80 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 80 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 "කළවැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

අයිතමය	සංශෝධනය
(i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	රු. 330,000,000 සිට රු. 400,000,000 දක්වා
(ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	සංශෝධන නොමැත

(iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව — සංශෝධන නොමැත

(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකමහි උපරිම සීමාව — සංශෝධන නොමැත

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VII

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

(මෙම නියමයන් වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

උපලේඛනය
2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2017 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්කිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

කණ්ඩායම් විධාන අංක 01

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මට පැවරී ඇති බලතලවලට අනුව මංගල සමරවීර වන මම, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය අනුව මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්කිකාරම් ගිණුම්වල විෂය අංක 00101, 00201, 01001, 02001, 02101, 10201, 10301, 10401, 11101, 11201, 11701, 12101, 13001, 13501, 13601, 14501, 14701, 14901, 15001, 15301, 15401, 15501, 16301, 19301, 19401, 19501, 19601, 19701, 19801, 20101, 20701, 21101, 21501, 22201, 22301, 22401, 22501, 22601, 23201, 23901, 24701, 24801, 24901, 25101, 25301, 25401, 25501, 25601, 25701, 25901,26001, 26101, 26201, 26301, 27001, 27101, 27401, 27701, 27801, 28001, 28401, 28701, 28801, 28901, 29201, 29601, 30101, 30601, 30801, 30901, 31001, 32001, 32201 සහ 33101ට අදාළ වන්නා වූ පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

ක්‍රමික අංකය	අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	විෂය අංකය	II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව		III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව		IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව		ක්‍රමික අංකය
			සිට	දක්වා	සිට	දක්වා	සිට	දක්වා	
			රු.	රු.	රු.	රු.	රු.	රු.	
1	අතිගරු ජනාධිපති	00101	32,000,000	45,000,000					1
2	අග්‍රාමාත්‍ය කාර්යාලය	00201	16,000,000	20,000,000			45,000,000	47,000,000	2
3	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව	01001			5,000,000	4,000,000			3
4	මැතිවරණ කොමිෂන් සභාව	02001	24,000,000	38,000,000	16,000,000	18,000,000	80,000,000	85,000,000	4
5	විගණකාධිපති	02101			55,000,000	52,000,000	253,000,000	228,000,000	5
6	මුදල් අමාත්‍යවරයා	10201	15,000,000	19,000,000	9,500,000	10,000,000			6
7	ආරක්ෂක අමාත්‍යවරයා	10301	75,000,000	85,000,000	55,000,000	45,000,000			7
8	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා	10401			16,000,000	12,000,000			8
9	සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා	11101			1,200,000,000	1,070,000,000			9
10	විදේශ කටයුතු අමාත්‍යවරයා	11201	30,000,000	35,000,000	24,000,000	28,000,000			10
11	උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා	11701	19,000,000	21,200,000					11
12	ස්වදේශ කටයුතු අමාත්‍යවරයා	12101	580,000,000	650,000,000	265,900,000	230,000,000			12
13	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යවරයා	13001			30,000,000	26,000,000			13
14	වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා	13501			12,000,000	9,000,000			14
15	ක්‍රීඩා අමාත්‍යවරයා	13601	11,000,000	12,300,000					15
16	බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා ජින්දු ආගමික කටයුතු අමාත්‍යවරයා	14501			5,500,000	4,000,000			16
17	ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයා	14701	2,000,000	6,000,000	600,000	700,000	7,000,000	9,000,000	17
18	කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයා	14901	21,000,000	27,000,000			65,000,000	75,000,000	18
19	බනිස් තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා	15001	5,000,000	6,000,000	2,500,000	2,300,000			19
20	ඉඩම් අමාත්‍යවරයා	15301					30,000,000	43,216,000	20
21	ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා	15401	20,000,000	25,000,000					21

22	පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා	15501	12,000,000	14,500,000					22
23	අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා	16301	38,000,000	40,500,000					23.
24	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා	19301			4,500,000	3,900,000			24.
25	විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යවරයා	19401	2,800,000	4,000,000	1,100,000	1,300,000	6,300,000	7,800,000	25.
26	සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා	19501			4,000,000	3,400,000			26.
27	විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා	19601	23,000,000	29,000,000					27
28	නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයා	19701			12,000,000	10,000,000			28
29	වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යවරයා	19801			13,000,000	7,000,000			29
30	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	20101	29,000,000	34,000,000	18,000,000	18,500,000			30
31	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	20701			35,000,000	30,000,000			31
32	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	21101	70,000,000	80,000,000	50,000,000	53,000,000			32
33	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	21501			55,000,000	49,000,000			33
34	ශ්‍රී ලංකා යුධ හමුදාව	22201			2,828,000,000	2,540,000,000			34
35	ශ්‍රී ලංකා නාවික හමුදාව	22301	625,000,000	550,000,000	570,000,000	500,000,000			35
36	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	22401			490,000,000	418,000,000			36
37	පොලිස් දෙපාර්තමේන්තුව	22501			1,450,000,000	1,248,000,000			37
38	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව	22601	35,000,000	39,000,000			140,000,000	143,000,000	38
39	බන්ධනාගාර දෙපාර්තමේන්තුව	23201			140,000,000	135,000,000			39
40	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව	23901	6,000,000	7,000,000					40
41	ශ්‍රී ලංකා රේගුව	24701	45,000,000	50,000,000					41
42	සුරාබදු දෙපාර්තමේන්තුව	24801	42,000,000	45,000,000	32,000,000	34,000,000			42
43	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	24901	7,000,000	8,000,000	3,700,000	4,200,000			43
44	තක්සේරු දෙපාර්තමේන්තුව	25101			19,000,000	17,000,000			44
45	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	25301	45,000,000	53,000,000					45
46	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	25401	62,000,000	80,000,000					46
47	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ	25501	58,000,000	68,200,000	43,000,000	37,000,000			47
48	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ	25601			80,000,000	64,000,000	246,000,000	280,000,000	48
49	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර	25701	87,000,000	122,000,000					49
50	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ	25901			38,000,000	32,000,000			50
51	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවර එළිය	26001	32,000,000	32,004,000					51
52	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල	26101	65,000,000	86,000,000	55,000,000	57,000,000	230,000,000	235,000,000	52
53	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර	26201	62,000,000	109,000,000	55,000,000	57,000,000			53
54	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට	26301			51,000,000	41,000,000			54
55	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර	27001			49,000,000	48,000,000			55
56	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - ත්‍රිකුණාමලය	27101			23,000,000	22,500,000			56
57	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර	27401			50,000,000	49,000,000			57
58	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල	27701			35,000,000	32,000,000			58
59	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර	27801	64,000,000	110,000,000			220,000,000	245,000,000	59
60	ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව	28001	5,000,000	6,000,000	4,000,000	3,200,000			60
61	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	28401	55,000,000	65,000,000	42,000,000	38,000,000	163,000,000	168,000,000	61
62	ඉඩම් ගිම්කම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව	28701	19,000,000	24,000,000					62
63	මිනින්දෝරු දෙපාර්තමේන්තුව	28801	148,000,000	166,000,000					63
64	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	28901			29,000,000	28,000,000	110,000,000	105,000,000	64

65	සක්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව	29201	29,000,000	32,000,000					65
66	ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව	29601	5,000,000	5,050,000					66
67	සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්)	30101			3,000,000	2,700,000			67
68	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	30601	750,000,000	830,000,000					68
69	කැපෑල් දෙපාර්තමේන්තුව	30801	820,000,000	880,000,000					69
70	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව	30901			18,000,000	13,500,000			70
71	රජයේ කර්මාන්ත ශාලාව	31001	32,000,000	38,000,000	23,000,000	26,000,000			71
72	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	32001	781,500,000	500,000,000	325,000,000	300,000,000			72
73	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව	32201	25,000,000	29,000,000	17,000,000	17,500,000	82,000,000	83,000,000	73
74	දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව	33101			300,000,000	265,000,000			74

අක්සන් කළේ / මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.10ට, 2018 ජූනි මස 05 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 4.10 மணிக்கு பாராளுமன்றம், 2018 யூன் 05, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 4.10 p.m. until 1.00 p.m. on Tuesday, 05th June, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

260 වන කාණ්ඩය - 9වන කලාපය
தொகுதி 260 - இல. 9
Volume 260 - No. 9

2018 ජූනි 05වන අඟහරුවාදා
2018 யூன் 05, செவ்வாய்க்கிழமை
Tuesday, 05th June, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :

ගරු තිලංග සුමතිපාල මහතා නියෝජ්‍ය කථානායක ධුරයෙන් ඉල්ලා අස්වීම

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ මුදා නොහළ කොටස්

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :

ඉන්ෆ්ලුවන්සා උණ රෝගය පාලනය

නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා ඡන්දයෙන් තෝරා පත් කිරීම

සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

පළමුවන වර කියවන ලදී

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

மாண்புமிகு திலங்க சுமதிபால பிரதிச் சபாநாயகர் பதவியிலிருந்து இராஜினாமா

காணி (பராதீனப்படுத்தல் மீதான மட்டுப்பாடுகள்) (திருத்தம்) சட்டமூலம் : உயர் நீதிமன்றுக்கு மனு

திறைசேரி பிணைமுறி விசாரணை ஆணைக்குழு அறிக்கையின் வெளியிடப்படாத பகுதிகள்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

இன்புளுவென்சா வைரஸ் காய்ச்சலைக் கட்டுப்பத்தல்

பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளருமானவரின் தெரிவு

குற்றவியல் கருமங்களில் பரஸ்பர உதவியளித்தல் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Resignation of Hon. Thilanga Sumathipala from Office of Deputy Speaker

Land (Restrictions on Alienation) (Amendment) Bill: Petition to the Supreme Court

Unreleased Sections of the Bond Commission Report

AUDITOR-GENERAL'S REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Control of Influenza Viral Fever

ELECTION OF DEPUTY SPEAKER AND CHAIRMAN OF COMMITTEES

MUTUAL ASSISTANCE IN CRIMINAL MATTERS (AMENDMENT) BILL:

Read the First time.

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූනි 05වන අඟහරුවාදා
2018 யூன் 05, செவ்வாய்க்கிழமை
Tuesday, 05th June, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I
ගරු තිලංග සුමතිපාල මහතා නියෝජ්‍ය කථානායක ධුරයෙන් ඉල්ලා අස්වීම
மாண்புமிகு திலங்க சுமதிபால பிரதிச் சபாநாயகர் பதவியிலிருந்து இராஜினாமா
RESIGNATION OF HON. THILANGA SUMATHIPALA FROM OFFICE OF DEPUTY SPEAKER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මහතා නියෝජ්‍ය කථානායක ධුරයෙන් ඉල්ලා අස්වී ඇති බව දන්වමින් ජනාධිපති ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත එවන ලද ලිපිය මහ ලේකම්වරයා විසින් දැන් මෙම සභාවට කියවනු ලැබේ.

අනතුරුව පහත සඳහන් ලිපිය මහ ලේකම් විසින් කියවන ලදී:
அதன்பிறகு, செயலாளர் நாயகம் பின்வரும் கடிதத்தை வாசித்தார்:
Whereupon the Secretary-General read the following letter:

"

ජනාධිපති කාර්යාලය
ජනාධිපති අලුවලகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/CSA/00/1/8/1/1
2018 මැයි මස 25 දින

ධම්මික දසනායක මහතා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.

<u>නියෝජ්‍ය කථානායක ධුරය</u>

අතිගරු ජනාධිපතිතුමන්ගේ නියෝගය පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මැතිතුමා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ධුරයෙන් ඉල්ලා අස්වී ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

ඔස්ටින් ප්‍රනාන්දු
ජනාධිපති ලේකම්"

II
ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
காணி (பராதீனப்படுத்தல் மீதான மட்டுப்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
LAND (RESTRICTIONS ON ALIENATION) (AMENDMENT) BILL : PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

III
භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ මුදා නොහළ කොටස්
திறைசேரி பிணைமுறி விசாரணை ஆணைக்குழு அறிக்கையின் வெளியிடப்படாத பகுதிகள்
UNRELEASED SECTIONS OF THE BOND COMMISSION REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභාවට අදාළ සමහර වාර්තා එළි දක්වා නොමැති බැවින්, ඒ කරුණ මුල් කර සමාජයේ විවිධ මාධ්‍ය නිවේදන නිකුත් වෙමින් පවතී. සමහර අසත්‍ය ප්‍රවෘත්ති පළවීම නිසා පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ටත්, පාර්ලිමේන්තුවටත්, පොදුවේ රටටත් විශාල අපකීර්තියක් ඇති වී ඇත. එය ඉතා කනගාටුදායක සිද්ධියකි.

මා වෙත අද දින එවා තිබෙන C 350 සිට C 360 දක්වා ලේඛන සමස්ත ලේඛනවල කොටසක් පමණක් බැවින් අද දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් ඒකමනිකව තීරණය කළ පරිදි සම්පූර්ණ ලේඛන ලැබුණු විගස ඒවා මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දැන්වීමට කැමැත්තෙමි.

මේ කාරණය ගැන බොහෝ ලිපි ලියා තිබේ. එම නිසා අද තීරණය කළ යුත්තේ, - [බාධා කිරීමක්] ඔව්, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක්ද කියන්න හදන්නේ? දැන් වාදයකට යන්න අමාරුයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

වාදයකට යන්න කිසිම අදහසක් නැහැ, ගරු කථානායකතුමනි. මේ පිළිබඳව මම ඔබතුමාගෙන් ලිඛිතව ඉල්ලීමක් කළා. මේ මන්ත්‍රීවරු ගැන සඳහන් කරමින්; එහි නම් 118ක් පිළිබඳව කියැවෙනවා. ඒ හේතුව නිසා මේ කාරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාම සැකයට භාජන වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒ නිසා තමයි මම ඔබතුමන්ලාට කිව්වේ. ඔක්කෝම 20ක් විතර ඇවිත් තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩලික විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ඇවිත් තිබෙන වාර්තාවේ ඔය කියන නාම ලේඛනය තිබෙනවාද?

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
මම තවම ඒක බැලුවේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි දැනුවත්ව එහෙම දෙයක් නැහැ. මම සියලුදෙනාටම වාර්තාව දෙනවා.

ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(මාණ්ඩලික லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාටම ඕනෑ ඇත්ත දැනගන්නයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඔව්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්ඩලික லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඔබතුමාට අද එවා තිබෙන්නේ එම වාර්තාවේ C 350 සිට C 360 දක්වා පමණයි. හැබැයි, C 1 සිට C 349 දක්වා එවා නැහැ. අපි කියන්නේ ඒ සියල්ලම එවන්න කියායි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
අපි ඔබතුමන්ලාට ඒකට අවස්ථාව දෙන්නම්. නමුත්, ඔය කියන විධියට එහෙම නම් ගණනක් එහි ඇත්තෙත් නැහැ. [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන කාරණය මොකක්ද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් එවා තිබෙන්නේ 350 සිට 360 දක්වා වූ ලේඛන 10යි නම්, තවත් ලේඛන 349ක් ආ යුතුව තිබෙනවා. ඒ ලේඛන 349ත් මේ පාර්ලිමේන්තුවට ලබාදෙන බවට ඔබතුමා පාර්ලිමේන්තුවට සහතිකයක් දෙනවාද කියා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. එසේ නැත්නම්, ඒ ලේඛන 349ට මුවා වෙලා ඇවිත් තිබෙන මේ ලේඛන ටිකත් පස්සට යන්න පුළුවන්. අන්තිමට වෙන්න පුළුවන් දේ ඒකයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒක අවශ්‍ය බවට මම ජනාධිපති ලේකම්වරයා දැනුවත් කරන්නම්. මට දෙන්න පුළුවන් සහතිකය එච්චරයි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
තවත් ලේඛන 349ක් අවශ්‍යයි කියා ඔබතුමා දැන් ජනාධිපති ලේකම්තුමාට දැනුම් දුන්නාද?

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
තවම දැනුම් දුන්නේ නැහැ. එතුමා විදේශගත වෙලා සිටින්නේ. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර මම ගන්නවා. අපි මේ කථාව මෙතැනින් අවසන් කරමු, ගරු මන්ත්‍රීතුමනි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩලික විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩලික විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, බැදුම්කර කොමිෂන් සභා වාර්තාවේ කෑලි කෑලි මේ ගරු සභාවට ගෙන එන්නේ ඇයි?

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒක තමයි අපි කථා කරමින් ඉන්නේ. ලැබුණු විධියටයි ඉදිරිපත් කරන්නේ. ඒ ගැන කටයුතු කරන්න තමයි අද අපි තීරණය කළේ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩලික විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
සමස්ත වාර්තාව දෙනවාය කියා නොදී ඉන්න නේ ඔය හඳන්නේ. එහෙම කියලා ලැබුණු කොළ ටිකත් බෙදන්නේ නැතිව ඉන්නයි හඳන්නේ. ලැබුණු කොළ ටික අපට පෙන්වන්න. අනාගතයේ ලැබෙනවාය කියන එක දිහා බලාගෙන මේ ගැන මොකුත්ම නොදන්නා තත්ත්වයට පත් කරන්න එපා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
නැහැ, නැහැ. අපි එම වාර්තාව සම්පූර්ණයෙන් ලබාගෙන ඔබතුමන්ලාට ඉදිරිපත් කරනවාය කියන එකයි මම සඳහන් කළේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාගේ වගකීම, මේ මන්ත්‍රීවරුන්ගේ නිර්දෝෂීභාවය සනාථ කරන එකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. [බාධා කිරීමක්]

ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, මේ කාරණයට කිසිම සම්බන්ධයක් නැති පාර්ශ්වවල නම් පවා දැන් සමාජ ජාලා වෙබ්අඩවිවල පළ වෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබතුමාට ලැබී තිබෙන නම් ටික, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න හදන කාරණය මොකක්ද? [බාධා කිරීම්] Order, please!

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් දැන් විපක්ෂයේ අය කෑගහනවා. මේ ගැන දැන ගන්න අපටත් විශාල වුවමනාවක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, කාටත් දැනගන්න අවශ්‍යයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මොකද, දින සියයේ වැඩසටහන පැවැති කාලයේ එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 42යි හිටියේ. වැඩි පිරිසක් ඒ පැත්තේ අයයි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන අදහස මොකක්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

ගරු කථානායකතුමනි, එදා මේ දුරකථන ඇමතුම් ලබා ගත් අයගේ නාම ලේඛනය ගැන කිව්වාම ඔබතුමා කිව්වා ඒක ඉදිරිපත් කරනවාය කියලා. COPE එකේ සාමාජිකයන් ඒ දුරකථන ඇමතුම් ලබාගෙන තිබෙනවා නම්, ඒ අය නැවතත් පත් නොකළ යුතුය කියන යෝජනාවයි මම ඔබතුමාට කළේ. ඒ දුරකථන ඇමතුම් ගත් මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරාවි කියා අපි විශ්වාස කළා. ගරු කථානායකතුමනි, මේ වන විට මේ පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු 24දෙනකුගේ පොලිස් නිලධාරීන්ගෙන් රහස් පොලීසිය කට උත්තර අරගෙන තිබෙනවා. ඊයේ වන විට 24දෙනෙක්; ඒ අය cheques මාරු කර තිබෙනවාය කියලා. Cheques මාරු කළාය කියා MSD එකට අයත් 24දෙනකුගෙන් කට උත්තර ලබාගෙන තිබෙනවා.

මේ අතර දැන් COPE එකට පත් කර සිටින මැති ඇමතිතුමන්ලාගේ රාලහාමිලාගෙනුත් කටඋත්තර අරගෙන තිබෙනවා. COPE එකට ඒකාබද්ධ විපක්ෂයෙන් මමත්, ජයන්ත සමරවීර මැතිතුමාත් පත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි -මමත්, ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාත්- COPE එකේ සාමාජිකයින් හැටියට "අර්ජුන් ඇලෝසියස් සමඟ කථා කරලාත් නැහැ. මුදල් අරගෙනත් නැහැ." කියලා ඔබතුමාට දිවුරුම් ප්‍රකාශ දෙකක් භාර දෙනවා. COPE එකේ අනෙකුත් සියලු සාමාජිකයන් මුදල් අරගෙන නැහැ කියා දිවුරුම් ප්‍රකාශ මඟින් ලබා දෙන්න කියන ඉල්ලීම මම කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වා, "C 350 සිට C 360 දක්වා ලේඛන පමණයි පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ." කියලා. මේ සංවාද හරහා නම් ටික එළියට එන්නේ නැත්නම් C 1 සිට C 360 දක්වා ලේඛන ගෙනාවත් වැඩක් නැහැ. ඒ අය ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්, විපක්ෂයේ වෙන්න පුළුවන්. ඒ එක්කම ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කිරීමට බැඳී සිටින පුද්ගලයෙක් නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එක එක්කෙනාගෙන් පඩි ගන්න අය විවිධාකාරයෙන් ලැයිස්තු හදලා සමාජ ජාල වෙබ්අඩවිවලට දමනවා. එම නිසා දිනෙන් දින මුදල් ලබා නොගත් මන්ත්‍රීවරුන්ගේ ගෞරවය කෙලෙසෙනවා. ඒ නිසා මේ ලේඛන ඉක්මනටම ගෙන්වන්න. ඒ එක්කම 2010 වසරේ සිට අර්ජුන් ඇලෝසියස් සමඟ දුරකථන සංවාද පවත්වපු සියලු දෙනාගේ නම් ලැයිස්තුවත් පුළුවන් නම් එළියට දමන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා කථා කරන්න. ඊළඟට, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කතා කරන්න.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු කථානායකතුමනි, විශාල ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වී තිබෙන නිසා වාර්තාව සම්පූර්ණයෙන් හෙළිදරව් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද?

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
සම්පූර්ණ වාර්තාව හෙළිදරව් කළොත් විතරයි, ගරු කථානායකතුමනි-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම තමයි අපි කිව්වේ. ඔබතුමා එන්න කලින් ඒක තමයි කිව්වේ.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
සම්පූර්ණ වාර්තාව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි අපි කථා කළේ. ඒකට තමයි අපි දැන් එකඟ වුණේ. මම කිව්වේත් ඒකයි. ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මීට පෙරත් අපි පාර්ලිමේන්තුවේදී ඉල්ලීමක් කළා, භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධයෙන් පත් කර ඇති විශේෂ විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ සිංහල පිටපත ලැබෙන්න සලස්වන්න කියලා. ඒක ඔබතුමා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට යොමු කළා කියලා කිව්වා. හැබැයි, තව වනතුරු ඒක ලබා දෙන දිනයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම නොවෙයි, ඒක ජනාධිපති කාර්යාලයෙන් සිදු කරන්නේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
පාර්ලිමේන්තුවේ කථානායකවරයා විධියට ඔබතුමා ඒ අදාළ තැන්වලට නියෝගයක් දීලා, ඒ අදාළ වාර්තා ලැබෙන්න සලස්වන්න. නැත්නම් මුළු රටම මේ 225 දෙනා දිහාම බලන්නේ, හොරු විධියටයි. ඒ නිසා මේ ගැන දැනුවත් වෙන්න ඕනෑ.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
ගරු කථානායකතුමනි, චෝදනාවලට ලක් වෙලා සිටින තැනැත්තන් පාර්ලිමේන්තුවේ කමිටුවලට පත් කිරීම සුදුසු නැහැ කියලා අපේ ගරු අලුත්ගමගේ මන්ත්‍රීතුමා බොහොම හොඳ දෙයක් කිව්වා. අලුත්ගමගේ මන්ත්‍රීතුමාත්, ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාත් යන දෙදෙනාම එම ස්ථාවරය දරන බවත් කිව්වා. එතුමන්ලා දෙදෙනා වංචාව සහ සාවද්‍ය පරිහරණය කියන චෝදනාවලට අධි චෝදනා ලබපු දෙදෙනෙක්. ඒ නිසා - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මේ කමිටුවලින් විභාග කරන්නේ ඇලෝසියස්ගේ ප්‍රශ්නය විතරක් නොවෙයි. [බාධා කිරීම්] මේ කමිටුවලින් අනාගතයේ ඇතිවෙන තව ප්‍රශ්නත් විභාග කරනවා. ඒ නිසා කිසිම කමිටුවකට අපරාධ චෝදනා ලබපු, අධි චෝදනා ලබපු කිසිම මන්ත්‍රීවරයෙකු පත් කරන්න එපා කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අධි චෝදනා තිබෙනවා නම්, එවැනි කිසිම කෙනෙක් කිසිම කමිටුවකට එපා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා මගේ නම සඳහන් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා කිව්වා වාගේ ඇලෝසියස්ගේ මුදල් ගත්තේ නැහැ කියලා අපි එක එක්කෙනා වෙන් වෙන් වශයෙන් දිවුරුම් ප්‍රකාශ දුන්නාම ඔබතුමා ඒවා පිළිගන්න. මොකද, අපිට ගම්වලට යන්න බැහැ. ගම්වල මිනිස්සු "ඔබතුමාත් ගත්ත එක්කෙනෙක්ද?" කියලා නෝන්ඩි දමනවා.

ගරු කථානායකතුමනි, මම දැන් දිවුරුම් ප්‍රකාශය ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා කරුණාකර ඔබතුමා මෙම දිවුරුම් ප්‍රකාශය භාර ගන්න කියමින්, මා මෙය **සභාගත*** කරනවා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රශ්නය වන්නේ මහ බැංකු බැඳුම්කරය සම්බන්ධව COPE එකේ වාර්තාව පිළිබඳවයි. COPE එකේ හිටපු සාමාජිකයන්ට සල්ලි දුන්නාද, දුරකථන සාකච්ඡා කළා ද කියන ප්‍රශ්නයයි තිබෙන්නේ. "අපි ඒක කළා." කියා අනෙක් අය කිව්වාට ඒක ප්‍රශ්නයක් නොවෙයි. අපට ඕනෑ කරන්නේ COPE එක නැවතත් පිරිසිදුව පවත්වාගෙන යන්නයි. ඒ නිසා තමයි COPE එකේ සාමාජිකයන්ට කියන්නේ, "අපි මේ ඇලෝසියස්ගේ සල්ලි ගත්තේ නැහැ." කියලා දිවුරුම් පෙත්සමක් දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමා කෙටියෙන් පැහැදිලි කරන්න. අපට විවාදයකට යන්න අමාරුයි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා කිව්වා, "මේ දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන මහින්දානන්ද අලුත්ගමගේ සහ ජයන්ත සමරවීර යන මන්ත්‍රීවරු අධිචෝදනා ලැබ මහාධිකරණයේ නඩු දෙකක් තිබෙන දෙදෙනෙක්." කියලා. ඔව්. මට මහාධිකරණයේ නඩුවක් තිබෙනවා. මගේ වෘත්තීය සමිතියෙන් රුපියල් ලක්ෂ 14ක් අවභාවිත කළා කියලා මට නඩුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ නඩුව ගැන මම බලාගන්නම්. ඒ වාගේම ඊයේ-පෙරේදා පොදු දේපළ පනත යටතේ කැරම් බෝඩ් පිළිබඳව නඩුවක් දැම්මා. මාව හිරේ දමන්න බැරි වුණා. මම ඒ ගැනත් කියන්නම්. ඒ ගැනත් බලා ගන්නම්. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මෙච්චර කල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කිව්වේ නැහැ. ඔබතුමාට මම කියන්න කැමැතියි, මේ කට උත්තර ගත්ත 24 දෙනා ඇතුළේ, අපේ රාජ්‍ය අමාත්‍ය අජිත් පී. පෙරේරා මැතිතුමාගේ පොලිස් නිලධාරියාගෙනුත් කට උත්තර අරගෙන තිබෙනවා කියලා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා. දැන් අපට වාද විවාදවලට යන්න බැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්ව කථාව සම්පූර්ණයෙන් වැරදියි. මට ආරක්ෂක භටයන් හතරදෙනයි ඉන්නේ. ඒ කිසිම ආරක්ෂක භටයෙකුගේ කිසිම පැමිණිල්ලක් භාරඅරගෙන නැහැ. මම සල්ලි අරගෙනත් නැහැ; කථා කරලත් නැහැ; හමුවෙලත් නැහැ; අඳුනන්නෙත් නැහැ. ඒ නිසා,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා මගේ නමත් සඳහන් කරලා කිව්වා, "මටත් නඩුවක් තිබෙනවා." කියලා.

ඔව්, ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහනයක් අවභාවිත කළා කියලා මට නඩුවක් තිබෙනවා, ඒ නඩුවට මම පෙනී සිටිනවා. ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමනි, තමුන්නාන්සේ COPE එකේදී footnotes දැම්මා, තමුන්නාන්සේත් "පුටි නෝට් කල්ලි" සාමාජිකයෙක්. අර්ජුන ඇලෝසියස් එක්ක කිසි සම්බන්ධයක් නැහැයි කියලා අපි දිවුරුම් ප්‍රකාශ දුන්නා වාගේ footnotes දාපු තමුන්නාන්සේත් දිවුරුම් ප්‍රකාශයක් දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා කථා කරන්න. අපි ප්‍රධාන කටයුතුවලට යන්නට ඕනෑ, මම සියලුදෙනාටම අවස්ථාවක් දුන්නා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, පසුගිය සිකුරාදා දිනයේදී මම මේ පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් ලිඛිතව ඉදිරිපත් කළා, මහ ලේකම්තුමන්ලාට. ඒ වරප්‍රසාද ප්‍රශ්නය මේ හා සම්බන්ධවමයි. මක් නිසාද යත්, "එක්තරා පිරිසක් ඇලෝසියස්ගෙන් මුදල් ගත්තා" කියන කොට ඒ හා කිසිම සම්බන්ධයක් නැති ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් විශාල සංඛ්‍යාවක් ප්‍රශ්නයකට මුහුණපානවා. අපේ වරප්‍රසාද සම්බන්ධයෙන් ඔබතුමා වග කිව යුතු වෙනවා; ආරක්ෂා කර දිය යුතු වෙනවා. එම නිසා මගේ වරප්‍රසාද ප්‍රශ්නය ගන්නට ඔබතුමා ඉඩ දෙනවාද, නැද්ද කියලා දැන ගන්නට මම කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එවැනි ප්‍රශ්න බොහෝ ගණනක් මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකු විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ නිසා තමයි අද අපි පක්ෂ නායක රැස්වීමේදී තීරණය කළේ, මේ වාර්තාව ඉදිරිපත් කළාට පසුව අපට සාකච්ඡා කළ හැකි බවට. ඔබතුමා වාගේම තවත් මන්ත්‍රීවරුන් විස්සකට වැඩි පිරිසක් ඔය කරුණ ගැන කථා කරලා තිබෙනවා. [බාධා කිරීමක්] අපි මේ කාරණාව අවසන් කරමු. ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න, එතකොට පිළිතුරු දීමෙන් මේ කාරණාව කථා කරලා අවසන් වෙනවා.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[ඝෝෂා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, බැඳුම්කර කොමිසම් වාර්තාවේ 671වෙනි පිටුවේ බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, "footnotes නිවැරදියි; සත්‍යයි; තර්කානුකූලයි; ඒ වාගේම කිසිම අගතියක් වෙලා නැහැ"යි කියලා. [බාධා කිරීමක්] ඒක නොදැක, ඒ දිහා නොබලා අසත්‍ය චෝදනා කරනවා, අපරාධ චෝදනා තිබෙන, කෝටි ප්‍රකෝටි ගණන් හොරකම් කරපු මිනිස්සු. [බාධා කිරීමක්] ඒවාට මුහුණ දෙන්න බොරු දිවුරුම් ප්‍රකාශ දීලා බැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, අද පස් වරු 2.30ට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රැස්වීමට නියමිතයි. එම පළමුවෙනි රැස්වීමට ඒ නම් කරපු අය අතරේ යම් යම් ප්‍රමාණයට සැකයට භාජන වුණු මන්ත්‍රීවරුන් ඉන්නවා නම් ඒ අය පිළිබඳව ඔබතුමා නැවත සලකා බැලීමක් කළ යුතුයි කියා මා විශ්වාස කරනවා.

දෙවනුව මට කියන්න තිබෙන්නේ මේ කාරණයයි. දැන් මේ පාර්ලිමේන්තුව තුළ අපි සියලුදෙනාම පටලැවිලා කෑ කෝ ගහ ගන්නවා. අර අර්ජුන මහේන්ද්‍රන් කියන හොර දෙටුවා, සිංගප්පූරුවට වෙලා සනීපෙන් ඉන්නවා.

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and State Minister of Mahaweli Development)
ගරු කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවේත් මේ පිළිබඳව වාද-විවාද; මාධ්‍යවලත් වාද-විවාද. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, යම් මන්ත්‍රීවරයෙක් මුදල් අරගෙන තිබෙනවා නම් කරුණාකරලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න; රට දැනුවත් කරන්න කියලා. මේ තත්ත්වය තුළ අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අමාත්‍යවරුන් හෑල්ලුවට පත් වෙලා තිබෙනවා. මෙයට කිසිම සම්බන්ධයක් නැති අයට පවා මේ චෝදනා එල්ල වෙනවා. "ෆේස්බුක්" වැනි සමාජ මාධ්‍ය ජාල හරහා මේවා වැරැදි විධියට ප්‍රකාශයට පත් වෙනවා. ඒකෙන් හෑල්ලු වෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්. මේ රටේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් තමයි හෑල්ලුවට ලක් වෙන්නේ. ඒක නිසා මේ පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන්න. මේ සම්බන්ධව මුදල් අරගෙන තිබෙනවා නම් හෝ දූරකථන ඇමතුම් හෝ වෙනත් සම්බන්ධතා තියාගෙන ඉන්නවා නම් ඒ සඳහා දඬුවම් දීම පිළිබඳව අපේ කිසිදු විරෝධයක් නැහැ. ඒක නිසා කරුණාකරලා මේක හෙළිදරව් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පැමිණීමට පෙර මම ඒ ගැන කිව්වා. අද පක්ෂ නායක රැස්වීමේදී තීරණය කළා, සම්පූර්ණ වාර්තා ඉදිරිපත් කළාට පස්සේ අපි මේක ඉදිරිපත් කරනවා කියලා. ඒ වාගේම පැහැදිලි කිරීම් සඳහා මන්ත්‍රීවරුන් 20ක්, 25ක් විතර ඉල්ලීමක් කරලා තිබෙනවා. මම මාධ්‍යයටත් ආයාචනා කළේ, මන්ත්‍රීවරුන්ටත් ආයාචනා කළේ බොහොම වග කීමෙන් යුතුව ක්‍රියා කරන්න කියලා. මේකෙන් අපහසුතාවට පත් වෙන්නේ ගරු මන්ත්‍රීතුමන්ලා වාගේම මේ පාර්ලිමේන්තුව. ඒ මහින් පොදුවේ රටටත් ඉතාමත් අහිතකර තත්ත්වයක් මතු වෙලා තිබෙනවා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු කථානායකතුමනි, ලංකාව පුරා විසිරී සිටින ජනතාව මේ 225දෙනා පාර්ලිමේන්තුවට එවලා බලාපොරොත්තු වන්නේ ජනතාවගේ ප්‍රශ්න විසඳාගන්නයි. ආධුනික මන්ත්‍රීවරයන් වන අප ආ දවසේ ඉඳලා මෙහි දකින දෙයක් තිබෙනවා. මේ සභාව තුළ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න විසඳා ගන්නවා පමණයි. බැඳුම්කර ගැන කතා කරනවා, හොරකම් කරපු 118දෙනකු ගැන කතා කරනවා. අද ජනතාව ඉන්නේ බොහොම කරදරයකයි. ඒ නිසා මම පාර්ලිමේන්තුවේ ගෞරවනීය අවධානය යොමු කරවනවා, ඒ කාරණය කෙරෙහි. ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහා පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. අද දවසට නියමිත වැඩ කටයුතුවලට අප යන්න ඕනෑ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථා තුනක් දුන්නා. මේ වතාවෙන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අවසාන වශයෙනුයි මෙය කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේදී ලබා දෙන අවස්ථාවෙන් අයුතු ප්‍රයෝජන ගන්න එපා. මොකක්ද, ඔබතුමාට කියන්න තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, එක දෙයයි ඔබතුමාට කියන්නේ. ගරු කථානායකතුමනි, ඒ කොමිෂන් සභාවේ සම්පූර්ණ වාර්තාවත්, දැනට අපට ලබා දී තිබෙන කොටසත් ඉතා ඉක්මනින් මේ සභාවට ඉදිරිපත් නොකළොත්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි මා කිව්වේ, රැස්වීම ආරම්භයේදීම.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේ රටේ ජනතාව සැක කරන්න පුළුවන්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආරම්භයේදීම මා කිව්වේ ඒක තමයි. ඒක හරි. ඒ ගැන කිව්වා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
-ජනාධිපතිතුමාගේ නමත් එහි තිබෙනවා කියා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ජනාධිපති ලේකම්ගේ නමත් තිබෙනවා කියා සැක කරාවි; ඔබතුමාගේ නම තිබෙනවා කියාත් සැක කරාවි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] අදහස් දැක්වීම් එතුමාගෙන් අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, අප දකින්නේ විපක්ෂය මේ- [බාධා කිරීම්] බැඳුම්කර සිද්ධිය අරගෙන තමුන්ගේ හෙලුව වසා ගන්න හදනවා කියලායි. [බාධා කිරීම්] මේ අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන, බැඳුම්කර සිද්ධිය ගැන කතා කරලා හොරුන්ගේ හෙලුව වසා ගන්න යනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොරුන්ගේ හෙලුව වසා ගන්න හදනවා. [බාධා කිරීම්]

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

විගණකාධිපතිවරයාගේ විශේෂ විගණන වාර්තාවේ දසවැනි කාණ්ඩයේ XIII කොටස (ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව හා එහි පරිපාලනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව) මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)
Sir, I present the Annual Performance Report of the Department of Christian Religious Affairs for the year 2017. I move that this Report be referred to the Sectoral Oversight Committee on Youth, Sports, Arts and Heritage.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා, නිවේදන සහ නියෝග ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(i) 2017 වර්ෂය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 අප්‍රේල් 09 දිනැති අංක 2066/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 08/2018 දරන සුරාබදු නිවේදනය);

(v) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 අප්‍රේල් 06 දිනැති අංක 2065/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 09/2018 දරන සුරාබදු නිවේදනය); සහ

(vi) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 13 දිනැති අංක 2049/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

එම වාර්තා, නිවේදන සහ නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2017 වර්ෂය සඳහා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(iii) 2017 වර්ෂය සඳහා කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව; සහ

(iv) 2017 වර්ෂය සඳහා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු පායලි චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

ගරු කථානායකතුමනි, 2014 වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர். எம். ரஞ்ஜித் மத்தும பண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග

අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පීඨයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 පෙබරවාරි 08 දිනැති අංක 2005/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 අගෝස්තු 09 දිනැති අංක 2031/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මම ඉදිරිපත් කරමි.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ නියම;

(iv) 2014 සහ 2015 වර්ෂ සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තා;

(v) 2015 වර්ෂය සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාව;

(vi) 2016 වර්ෂය සඳහා කම්කරු, වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(vii) 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තා;

(viii) 2015 වර්ෂය සඳහා මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ix) 2014 සහ 2015 වර්ෂ සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගාල්ල, තල්ගස්වල, මානම්පිට, අංක 171 දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. ඉශාන් ඉන්දික මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අළුබෝමුල්ල, පමුණුගම, දිගනතුඩුව, අංක 372 දරන ස්ථානයෙහි පදිංචි අයි.සී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ඉංගිරිය, තානායම් පෙදෙස, අංක 204 ඩී/6 දරන ස්ථානයෙහි පදිංචි තිලක් වීරකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු එස්.බී. දිසානායක මහතා
(මාණ්පුමිකු එස්.පි. දිසානායක්ක)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, ගනේමුල්ල, කටුවාලමුල්ල භාවනා මධ්‍යස්ථාන පාර, අංක 23/3ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩී.එච්. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සාලින්ද දිසානායක මහතා
(මාණ්පුමිකු සාලින්ද දිසානායක්ක)
(The Hon. Salinda Dissanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පොල්ගහවෙල, ගොඩවෙල, අංක 192 දරන ස්ථානයෙහි පදිංචි බී.ඒ. ජිනපාල අමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නාගොල්ලාගම, ගල්ලැව, "විකුණුම්සිරි" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. කරුණාවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)

ගරු කථානායකතුමනි, දොඩන්ගොඩ, නැහින්න, වඩුගම පාර යන ලිපිනයෙහි පදිංචි ජේ.කේ. ආරියරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) නුගේගොඩ, උඩහමුල්ල, දුම්රිය පාර, අංක 150 දරන ස්ථානයෙහි පදිංචි එච්.එන්.ජේ. පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කඳාන, රිලවුල්ල, මීගමු පාර, අංක 168 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එම්. මයිකල් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) දිවුලපිටිය, පහළ හපුවලාන, අංක 146/3 දරන ස්ථානයෙහි පදිංචි නිරන්ජන් විජේගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)

ගරු කථානායකතුමනි, බලපිටිය, නවරත්නාගොඩ, අංක 198 දරන ස්ථානයෙහි පදිංචි ධනසිරි එස්. ගලප්පත්ති මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) උස්වැව, වරායාය, අංක 843 දරන ස්ථානයෙහි පදිංචි ඒ.පී. දිනූකා නිමාලි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දික්වැල්ල, පොල්ගහමුල්ල, "ජයනිවස" යන ලිපිනයෙහි පදිංචි පී.ඒ. කරුණාසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(මාණ්පුමිකු මොහාන් පිරියතර්ෂන ත සිල්වා)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු කථානායකතුමනි, ගාල්ල, වක්වැල්ල පාර, අංක 58/8 දරන ස්ථානයෙහි පදිංචි බී.ආර්. විමලසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රමේෂ් පතිරණ)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී එච්.කේ. රෂින්ත තුෂාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, ඒකල, මඩම හන්දිය, ගම්පහ පාර, අංක 196 - 1/2 දරන ස්ථානයෙහි පදිංචි ජී. ජයතිස්ස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා
(මාණ්පුමිකු නාලක්ක ප්‍රසාත් කොලොන්නේ)
(The Hon. Nalaka Prasad Colonne)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, නිශ්ශංකමල්ල පාර, රංකොත් වෙහෙර ඉදිරිපිට පාර, අංක 19/2 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එම්. සුනිල් අධිකාරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු පාලිත තෙවරප්පෙරුම - වලුවාතාර අපිවිරුත්ති, වනජීවරාශිකළ් මර්‍රුම් ප්‍රාදේශ අපිවිරුත්ති ප්‍රතිනි අමෙච්චර්)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Sustainable Development, Wildlife and Regional Development)

ගරු කථානායකතුමනි, මහගම, දියකඩුව, 4 කණුව අසල යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. රේණුකා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න)
(The Hon. Lakshman Ananda Wijemanne)

ගරු කථානායකතුමනි, කළුතර, බෝම්බුවල, වැලිගොඩැල්ල, සම්පත් ජීවරත්න මාවත යන ලිපිනයෙහි පදිංචි ඒ. චම්පිකා දමයන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

සමර්පිණික්පට්ට මනුක්කළෙප් පොතුමනුක් කුමුවුක්කුච් චාට්ටක් කට්ටළෙයිටප්පට්ටතු.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ලංකා විදුලිබල මණ්ඩලයට ගල් අඟුරු සැපයීම: විස්තර
இலங்கை மின்சார சபைக்கு நிலக்கரி வழங்கல்: விபரம்
SUPPLY OF COAL TO CEYLON ELECTRICITY BOARD: DETAILS

1. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් නමැති සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත වරින් වර සපයා ඇති මුළු ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(ii) එම ගල් අඟුරු වෙනුවෙන් ඉහත සමාගමට ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම සමාගම විසින් නිසි වෙලාවට ගල් අඟුරු සැපයීමට අසමත් වීම හේතුවෙන් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ක්‍රියාකාරිත්වය අත්හිටුවීමට සිදු වූ කාලය කොපමණද;

(iv) එසේ විදුලි ජනක යන්ත්‍ර අත්හිටුවීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේනිද?

(ආ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනය විසින් ලබාගෙන ඇති අංක LCC/09/T/02, LCC/01 සහ LCC/13/T/01 දරන ටෙන්ඩරවලට අදාළව ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිතයන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය නොතකා ඉහත කී ගල් අඟුරු සැපයීම් එකී සමාගමට ලබාදීමට හේතුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙනිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මින්වලු මත්‍රුම් පුතුප්පිකත්තක්ක සක්ති අමෙච්චරෙක් කේට්ට වින්නා:

(அ) (i) நோபல் ரிசோசஸ் லிமிட்டட் எனும் கம்பனியினால் இலங்கை மின்சார சபைக்கு இடைக்கிடை வழங்கப்பட்டுள்ள மொத்த நிலக்கரியின் அளவு யாதென்பதையும்;

(ii) மேற்படி நிலக்கரி சார்பாக குறிப்பிட்ட கம்பனிக்குச் செலுத்தப்பட்டுள்ள மொத்தப் பணத்தொகை யாதென்பதையும்;

(iii) குறித்த கம்பனியானது உரிய நேரத்திற்கு நிலக்கரி வழங்குவதற்குத் தவறியதன் காரணமாக நுரைச்சோலை நிலக்கரி மின் உற்பத்தி நிலையத்தின் தொழிற்பாட்டினை இடைநிறுத்த வேண்டியேற்பட்ட காலப்பகுதி யாதென்பதையும்;

(iv) அவ்வாறு மின் பிறப்பாக்கி இயந்திரங்களின் தொழிற்பாடு இடைநிறுத்தப்பட்டதன் விளைவாக இலங்கை மின்சார சபைக்கு ஏற்பட்டுள்ள நட்டம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நோபல் ரிசோசஸ் லிமிட்டட் நிறுவனத்தினால் பெறப்பட்டுள்ள இலக்கம் LCC/09/T/02, LCC/01 மற்றும் LCC/13/T/01 கொண்ட கேள்விப் பத்திரங்களுக்கு ஏற்புடையதான இலங்கையின் உள்ளூர் பிரதிநிதிகள் யாவர் என்பதை வெவ்வேறாகவும்;

(ii) பெறுகை செயல்நடைமுறையைக் கருத்திற் கொள்ளாது மேற்படி நிலக்கரி வழங்கல் குறிப்பிட்ட கம்பனிக்குப் பெற்றுக்கொடுக்கப் படுவதற்கான காரணம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House of-

(i) the total quantity of the coal supplied to the Ceylon Electricity Board by the company named Noble Resources Limited from time to time;

(ii) the total amount of money that has been paid to the said coal company in payment of these quantities;

(iii) the duration for which the operation of the Norochcholai Coal Power Station was interrupted for failure on the part of the said company to supply coal in time; and

(iv) the loss caused to the Ceylon Electricity Board due to interruption of generators in this manner?

(b) Will he also inform this House -

(i) the local representatives separately in respect of tenders numbered LCC/09/T/02, LCC/01 and LCC/13T/01 obtained by the Noble Resources Limited; and

(ii) the reasons for awarding the supply of coal to the said company without following the procurement procedure?

(c) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් නමැති සමාගම වරින් වර සපයා ඇති ගල් අඟුරු ප්‍රමාණයන් - මෙට්‍රික් ටොන්වලින්

2010-2011 වාරය - 290,277

2011-2012 වාරය - 829,319

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

2012-2013 වාරය - 610,799

2013-2014 වාරය - 1,003,549

2014-2015 වාරය - 1,849,726

එකතුව - 4,583,670 (මෙට්‍රික් ටොන් හතලිස් පන්ලක්ෂ අසූ තුන්දහස් හයසිය හැත්තෑවයි)

ගරු කථානායකතුමනි, වැදගත්ම දේ වන්නේ මෙම සම්පූර්ණ ගල් අඟුරු ප්‍රමාණය සපයා තිබෙන්නේ කිසිදු වලංගු ටෙන්ඩර් පටිපාටියක් නොමැතිවයි.

(ii) එම ගල් අඟුරු වෙනුවෙන් නෝබල් රිසෝසස් ලිමිටඩ් වෙත ගෙවා ඇති මුදල - ඇමෙරිකානු ඩොලර්වලින්

2010-2011 වාරය - 32,250,984.03

2011-2012 වාරය - 99,744,787.34

2012-2013 වාරය - 39,916,588.24

2013-2014 වාරය - 74,357,179.66

2014-2015 වාරය - 120,083,647.25

එකතුව - 366,353,186.52 (ඇමෙරිකානු ඩොලර් මිලියන තුන්සිය හැටහයයි දශම තුනයි පහයි තුනයි.)

එවැනි අතිවිශාල මුදලක් ගෙවා තිබෙනවා. නිසි මිල කැඳවීමක් නැති නිසා, මෙවායේ මිල නිසි මිල නොවන බව පැහැදිලියි.

(iii) 2011 සැප්තැම්බර් 28 වන දින සිට ඔක්තෝබර් 23 වන දින දක්වා දින 24ක් බලාගාරයේ පළමුවන යන්ත්‍රාගාරය වසා දැමීමට සිදු විය.

එසේම, ප්‍රමාණවත් ගල් අඟුරු තොග නොලැබීම හේතුවෙන් 2015 අගෝස්තු හා 2015 සැප්තැම්බර් යන කාලයන්හිදී සාමාන්‍ය තත්ත්වය යටතේ බලාගාරයේ ජනන යන්ත්‍ර ක්‍රියාත්මක කළ හැකි උපරිම ධාරිතාවට වඩා අඩු ධාරිතාවකින් දෙවන සහ තෙවන යන්ත්‍ර ක්‍රියාත්මක කර ඇත.

එයින් විශාල පාඩුවක් සිදුවුණා.

(iv) 2011 සැප්තැම්බර් 28 වන දින සිට ඔක්තෝබර් 23වන දින දක්වා දින 24ක් බලාගාරයේ පළමුවන යන්ත්‍රාගාරයේ ක්‍රියාකාරිත්වය අත්හිටුවීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් මිලියන 3,500ක අලාභයක් සිදු වූ බව තක්සේරු කර ඇත.

2014 සහ 2015 වර්ෂයන් තුළදී ප්‍රමාණවත් පරිදි ගල් අඟුරු නොලැබීම සහ අනෙකුත් හේතූන් මත ලක්විජය බලාගාරයේ ජනක යන්ත්‍ර උපරිම ජනන ධාරිතාවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ නිසා ලංකා විදුලිබල මණ්ඩලයට විදුලිය ජනනය සඳහා අමතරව වැය වූ මුදල (පාඩුව) දළ වශයෙන් රුපියල් මිලියන 12,500කි.

මේවා ගැන කිසිම පරීක්ෂණයකුත් නැහැ. ඒ වාගේම වලංගු ගිවිසුම් නැති නිසා මේ වුණු පාඩුව අය කර ගන්න පියවර ගන්නත් බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

(ආ) (i) LCC/09/T/02 - මෙම ටෙන්ඩරයට අදාළ ලියකියවිලිවල දේශීය නියෝජිතයකු පිළිබඳ සඳහනක් නොමැති නිසා දේශීය නියෝජිතයා කවුරුන්දැයි නිශ්චිතව සඳහන් කළ නොහැකිය. එහෙත් නෝබල් රිසෝසස් සමාගම වෙනුවෙන් ලංසු ලියවිලි ලබා ගැනීම සඳහා බලය පවරා ඇත්තේ සී/ස ඒ බවර් සහ සමාගම වෙතයි.

LCC/01 - එම

LCC/13/T/01 - එම

දේශීය නියෝජිතයා කවුද කියා හෙළිදරවු වෙන්නේ නැහැ. මේ පිළිබඳව විවිධ පුද්ගලයන් ක්‍රියා කළ බව පෙනෙනවා. නමුත්, ලේඛනවල සඳහන් වන්නේ නැහැ. ලියකියවිලි භාර ගැනීම සඳහා පමණක් සීමාසහිත ඒ බවර් සහ සමාගම වෙත පවරා තිබෙනවා.

(ii) කරුණාකර, ඇමුණුම 01 බලන්න.

ගරු කථානායකතුමනි, ඉදිරිපත් කර තිබෙන ඇමුණුම 01 අනුව මේ ඇති වී තිබෙන තත්ත්වය පැහැදිලි කළ යුතුයි. 2009 වසරේ පළමු ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කළා. එය අවසාන කළේ නැහැ; අවලංගු කළා. 2009 වසරේ දෙවන ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කළා, අවසාන තීරණයක් ලැබුණේ නැහැ. අවසානයේදී ටෙන්ඩර් කාර්ය පටිපාටියෙන් පරිබාහිරව, නෝබල් රිසෝසස් ලිමිටඩ් කියන සමාගම වෙතින් ගල් අඟුරු මිලදී ගැනීමට කැබිනට් මණ්ඩලය තීරණය කළා, කිසිදු වලංගු විනිවිදභාවයෙන් යුතු ක්‍රියාදාමයක් නැතිව.

2011 තෙවන ප්‍රසම්පාදනය ටෙන්ඩර් කළා.

ටෙන්ඩර් ක්‍රියාවලිය අතර මැද නතර කළා. මුල් සැපයුම්කරු වන නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනයටම එම ගල් අඟුරු සැපයීම දෙන්න කියලා කැබිනට් මණ්ඩලය තීරණය කළා. මේ ගනුදෙනු දිහා බැලුවාම පැහැදිලිව පෙනෙනවා, 2011 දී Liberty Commodities කියන සමාගම තමයි ටෙන්ඩරය දිනුවේ කියා. නමුත්, ඔවුන්ට ටෙන්ඩරය දුන්නේ නැහැ. අභියාචනයේ දී Taurian Iron & Steel සමාගම ජයග්‍රහණය කළා. නමුත්, ඔවුන්ට දුන්නේත් නැහැ. අවසානයේ දී කැබිනට් තීරණයක් මත නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනයටම එම ගල් අඟුරු සැපයීමට දුන්නා.

2012/2013 සිවිවන ප්‍රසම්පාදනයේ දී ටෙන්ඩර් ක්‍රියාවලිය සෑහෙන දුර ගියා. අවසානයේ එය සම්පූර්ණයෙන් නතර කළා. පරණ ගණන්වලටම, නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනයටම එම ගල් අඟුරු සැපයීමට දෙන්න කිව්වා. ඒ තුළින් කෝටි ප්‍රකෝටි ගණනක අලාභයක් සිදු වුණා.

ගරු කථානායකතුමනි, 2014 පස්වෙනි ප්‍රසම්පාදනයේ දී ටෙන්ඩර් ක්‍රියාදාමය ටික දුරක් ගිහිල්ලා අත් හැර දැම්මා. මුල් සැපයුම්කරුට පෙර කොන්දේසි මතම ලබා දෙන්න කියලා කැබිනට් මණ්ඩලය තීරණය කළා. Lanka Coal (Pvt) Ltd කියන සමාගමට අවුරුදු විසි ගණනක ඉතා ළා බාල සභාපතිවරයෙකු පත් කර ගෙන එවකට බලයේ සිටි රාජපක්ෂ පවුලට අවශ්‍ය විධියට මේ සමාගම් මෙහෙයවා ඇති බව පෙනෙනවා. ඒ වාගේම මේ නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනය එම සම්පූර්ණ කාලය පුරාම ඩොලර් මිලියන 350කට අධික වටිනාකමකින් යුතු ගල් අඟුරු සපයා තිබෙනවා.

නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනය විසින් ගල් අඟුරු ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පවරන ලද නඩුවට අදාළ ලේඛන.

I. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව (ඇමුණුම 02)

II. නීතිපතිගේ මතය (ඇමුණුම 03)

III. අමාත්‍ය මණ්ඩල තීරණය (ඇමුණුම 04)

(ඇමුණුම් **සභාගත*** කරමි.)

(ඇ) අදාළ නොවේ.

මේක අතිවිශාල ගනුදෙනුවක්. මේ සම්පූර්ණ ගනුදෙනුවටම නිසි ටෙන්ඩර් පටිපාටියක් නැහැ. එම නිසා මේ ප්‍රශ්නය මතු කිරීම ගැන ගරු මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙයයි. නොකඩවා වසර පහක් කිසිදු ටෙන්ඩර් ක්‍රමවේදයකින් තොරව කැබිනට් අනුමැතියෙන් පමණක් නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනයට ගල් අඟුරු සැපයීම කර තිබෙනවා. ඒ තුළින් රුපියල් බිලියන 60කට ආසන්න මුදල් ප්‍රමාණයක් සපයා දීම හරහා මේ ගනුදෙනුව සම්බන්ධයෙන් අපට බරපතළ සැකයක් ඇති වී තිබෙනවා.

අපි මේ දවස්වල ඇලෝසියස් මහත්තයාගේ ගනුදෙනු ගැන කථා වෙනවා. 2009 සිට 2015 දක්වා කාලය තුළ මේ නෝබල් සමාගමෙන් නොබෙල් තෑගි ගත් බොහෝ අය කැබිනට් මණ්ඩලයට ඇතුළත්ව ඉඳලා තිබෙනවාය කියන කාරණය පැහැදිලි වෙනවා. 2009 සිට 2015 වනතුරු මෙම සමාගමෙන් නොබෙල් තෑගි ගත්ත අය ගැන සොයා බලන්න ඔබතුමන්ලා කටයුතු කරන්නේ නැද්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති විසින් මේ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කර තිබෙනවා. දැන් ඒ පිළිබඳව පරීක්ෂණ කරගෙන යනවා. ගරු කථානායකතුමනි, මේ ගල් අඟුරු මිලදී ගැනීමේදී පමණක් නොවෙයි, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කිරීමේදී ඒ අදාළ ඉදි කිරීම් කළ සමාගම්වලින් ඩොලර් මිලියන 20කට වැඩි ප්‍රමාණයක අල්ලස් අරගෙන ඇති බව මේ පරීක්ෂණවලදී හෙළිදරව් වී තිබෙනවා; ඒ පිළිබඳව සාක්ෂි තිබෙනවා. මේවා ජාත්‍යන්තර පරීක්ෂණ නිසා ඒවාට සෑහෙන කාලයක් ගත වෙනවා. කාලය ගතවීමේ ඒ වාසිය තමයි සමහරු ඔය භුක්ති විඳින්නේ. සමහරු ගොඩක් කයිවාරු ගහනවා; බොහොම ආඩම්බර කථා කියනවා; අනුන්ට ආඩපාළි කියනවා. හැබැයි, ගරු කථානායකතුමනි, හැළියේ වතුර රත් වෙනතුරු තමයි කකුළුවා දිය කෙළින්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙම නෝබල් සමාගම දිගින් දිගටම අයථා අයුරින් ටෙන්ඩරය ලැබුවා. නමුත් 2015 වසර අග භාගයේදී හෝ 2016දී එය වෙනස් වුණා. එය වෙනස් වෙලා නිසි ක්‍රමවේදයකින් මේ කටයුතු ක්‍රියාත්මක වෙනකොට මෙම නෝබල් සමාගමම විදුලිබල මණ්ඩලයට විරුද්ධව නඩු කියන්න පටන් ගත්තා. අපි දන්නා විධියට මේකට උදව් කළේ, මේ රජය බලයට පත් වුණාට පසුව Lanka Coal Company එකේ සභාපතිවරයා ලෙස පත් කළ මෛත්‍රී ගුණරත්න කියන තැනැත්තායි. මම බය නැතිව ඒ කාරණය කියනවා. මෙම සභාපතිවරයාගේ ක්‍රියා පටිපාටිය පිළිබඳව පාර්ලිමේන්තුවේදීත්, Sectoral Oversight Committee එකේදීත්, මාධ්‍ය තුළිනුත් දරුණු විධියට අපි අපේ විරෝධතාව පළ කළා. දැන් මේ සභාපතිවරයා නැහැ. හැබැයි, එතුමා Lanka Coal Company එකේ සභාපතිවරයා ලෙස කටයුතු කළ කාලයේ මේ නෝබල් සමාගම ආරක්ෂා කරන්න, එම සමාගමට නැවත වරක් මෙම ගල් අඟුරු සැපයුම ලබාදෙන්න උත්සාහ කළා. මේ සභාපතිවරයාගේ ක්‍රියා පටිපාටිය පිළිබඳව 2015න් පසුව ඔබතුමන්ලා ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියා මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න පුළුවන්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය බලයට පත් වුණාට පසු පත් කළ ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි විෂයය භාර අමාත්‍යවරයා විසින් එම ධුරයෙන් ඉවත් කළා. ඒ වාගේම මා කියන්න කැමතියි, අපේ රජය බලයට පත් වුණාට පසුව ආරම්භ කළ ගල් අඟුරු ටෙන්ඩර් ගැනීම් පිළිබඳව කිසිම ආකාරයක ප්‍රශ්නයක් නැති බව. ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට ප්‍රශ්නයක් මතු වෙලා ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා ගිය මෙම ටෙන්ඩරය 2014දී පටන් ගත් එකක්. ටෙන්ඩරය පරාද වුණාම නෝබල් සමාගම ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයේදී එම සමාගම පරාජයට පත් වුණා.

ඒ කියන්නේ, නෝබල් සමාගම ඉදිරිපත් කළ පෙත්සම ප්‍රතික්ෂේප වුණා. ඒක තමයි දැන් බොහෝ දෙනෙක් කථා කරන ප්‍රශ්නය. ඒක අපේ රජයට වගකීමක් ඇති කාරණයක් නොවෙයි. හැබැයි, ඉන් පසුව ගල් අඟුරු සමාගමේ සභාපති ධුරය කවුරු දැරුවත් අමාත්‍යාංශයක් විධියට අපි විනිවිදභාවයෙන් කටයුතු කළා; කරුණු සොයා බැලුවා. ගරු කථානායකතුමනි, අපි බොහොම ආඩම්බරයෙන් කියන්න ඕනෑ, අපේ රජය බලයට පත් වුණාට පස්සේ ගල් අඟුරු පිළිබඳව ටෙන්ඩර් 11කට වඩා අපි දැන් ක්‍රියාත්මක කර අවසන් බව. ඒ එකම ටෙන්ඩරයක් පිළිබඳවවත් කිසිම ආකාරයක නඩුවක් නැහැ; කිසිම විවේචනයක් නැහැ. ඒවා ඉතාම විනිවිදභාවයෙන් ක්‍රියාත්මක වෙනවා. ඉතාම විනිවිදභාවයෙන් ඒ කටයුතු සිද්ධ වෙනවා. ඉතාම ඉහළ තරගකාරිත්වයක් තිබෙනවා. අපේ රජය බලයට පත් වුණාට පස්සේ ගල් අඟුරු සම්බන්ධයෙන් ආරම්භ කළ කිසිම ටෙන්ඩරයක කිසිම ආකාරයක වංචාවක් වෙලා නැති බව අපි ආඩම්බරයෙන් කියනවා.

හොලොම්බුව ප්‍රදේශයේ ජලාශයක් ඉදි කිරීම : විස්තර
ஹொலொம்புவ பிரதேசத்தில் நீர்த்தேக்கமொன்றை அமைத்தல்: விபரம்
CONSTRUCTION OF A RESERVOIR IN HOLOMBUWA AREA: DETAILS

9/'18

2. ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගලිගමුව මැතිවරණ කොට්ඨාසයේ, හොලොම්බුව ප්‍රදේශයේ ජලාශයක් ඉදි කරන්නේද;

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කනක හේරත් මහතා]

(ii) එම ජලාශයට යටවන පුරාවිද්‍යා වටිනාකමින් යුත් දැදිගම කොටවෙහෙර, ස්ත්‍රී පුර ගල්ලෙන් විහාරය ඇතුළු පෞරාණික වෙහෙර විහාර හා ආගමික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ජලාශයට යටවන ගලිගමුව හා දැදිගම මැතිවරණ කොට්ඨාසවල ගම්මාන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iv) එකී ගම්වල ඉඩකඩම් අහිමිවන පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) හොලොම්බුව සිට උමං මාර්ගයක් මඟින් මා ඔයට ජලය ගෙන යාමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(vi) කිසිදු ස්වභාවික ව්‍යසනයකට ගොදුරු නොවන සෑම අංශයකින්ම වටිනාකමක් ඇති එවැනි ප්‍රදේශයක ජලාශයක් ඉදි කිරීමෙන් එම ප්‍රදේශයේ ජනතාවට විශාල හානියක් සිදුවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கலிகமுவ தேர்தல் தொகுதியில், ஹொலொம்புவ பிரதேசத்தில் நீர்த்தேக்கமொன்று அமைக்கப் படுகின்றதா;

(ii) மேற்படி நீர்த்தேக்கத்தில் மூழ்குகின்ற தொல் பொருளியல் பெறுமதியுடைய தெதிகம கொட்டவெஹர, ஸ்திரீபுர கற்குகை விகாரை உள்ளிட்ட புராதன விகாரைகள் மற்றும் மத ஸ்தலங்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி நீர்த்தேக்கத்தில் மூழ்குகின்ற கலிகமுவ மற்றும் தெதிகம தேர்தல் தொகுதிகளிலுள்ள கிராமங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை;

(iv) குறித்த கிராமங்களில் காணிகளை இழக்கும் குடும்பங்களின் எண்ணிக்கை யாது;

(v) ஹொலம்புவையிலிருந்து சுரங்கப் பாதையின் வழியாக மா ஓயாவுக்கு நீரைக் கொண்டு செல்லும் வேலைத்திட்டமொன்று நடைமுறைப் படுத்தப்படுகின்றதா;

(vi) எந்தவோர் இயற்கை அனர்த்தத்திற்கும் உள்ளாகாத, சகல துறைகளிலும் பெறுமதி யுடைய இத்தகைய ஒரு பிரதேசத்தில் நீர்த்தேக்க மொன்றை அமைப்பதன்மூலம் அப் பிரதேசத்தின் மக்களுக்குப் பாரிய சேதம் ஏற்படு மென்பதை ஏற்றுக்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources & Disaster Management:

(a) Will he inform this House -

(i) whether a reservoir will be built in the Holombuwa area of the Galigamuwa Electorate;

(ii) the number of ancient stupa, vihara and places of worship with historic significance that will be submerged in the waters of the said reservoir including Kotawehera of Dedigama and rock cave temple of Sthripura;

(iii) the number and the names of villages of the Galigamuwa and Dedigama Electorates that will be submerged in the waters of the said reservoir;

(iv) the number of families that will lose their lands in the aforesaid villages;

(v) whether there is a programme to divert water to Ma-Oya by a tunnel from Holombuwa;

(vi) whether he admits that the construction of a reservoir in an area like the aforesaid area which is not prone to any natural disaster, will have immense detrimental effects on the people of the said area?

(b) If not, why?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) නැත.

(ii) ජලාශයක් ඉදි නොවන බැවින් අදාළ නොවේ.

(iii) ජලාශයක් ඉදි කරන්නේ නැත.

(iv) ජලාශයක් ඉදි කරන්නේ නැත.

(v) නැත.

(vi) අදාළ නොවේ.

(ආ) මෙම ස්ථානයේ ජලාශයක් ඉදිකර මා ඔය දක්වා උමං මාර්ගයක් මඟින් ජලය ගෙන යාමේ ව්‍යාපෘතියක් 1960 දශකයේ පමණ සැලසුම් කර තිබූ අතර, දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ කැලණි ද්‍රෝණියේ ගංවතුර අවදානම අවම කිරීමට සහ මා ඔය ද්‍රෝණියට නියහයෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා මෙම සැලසුම් ක්‍රියාත්මක කළ හැකිද යන්න පිළිබඳ පූර්ව

ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට නැවතත් සලකා බැලිණි. නමුත්, අදාළ ප්‍රදේශවාසීන්ගේ විරෝධතාව සහ පෞරාණික වෙහෙර විහාර මෙම ජලාශයට යටවන බැවින් එය ක්‍රියාත්මක කිරීම අත් හිටුවන ලදී.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, එම ව්‍යාපෘතිය දැනට අත් හිටුවා තිබෙන බව ගරු රාජ්‍ය ඇමතුමා ප්‍රකාශ කළා. එසේ නම් ඒ පිළිබඳව ලිඛිතව අපටත්, විශේෂයෙන්ම අදාළ ගම්වල ඉන්න ජනතාවටත් දැනුම් දෙන්න පුළුවන් නම් ගොඩක් හොඳයි. ඒ පිළිබඳව විශේෂයෙන්ම ගම්වල ඉන්න ජනතාව දැනුවත් කරන්නය කියා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

හොඳයි ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට දැනුම් දෙන්නම්.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -16/'18- (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා ගරු ඇමතිතුමා හෝ ගරු රාජ්‍ය ඇමතිතුමිය හෝ සභාවේ නැත්නම් ඔබතුමා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා ඇමතිතුමා දැන් හිටියා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.
Question ordered to stand down.

2016 අය වැයෙන් යෝජනා කළ සමාගම් සඳහා වූ අර්ධ බදු විරාම : ක්‍රියාවට නැංවීම
2016 வரவு செலவுத்திட்டத்தில் பிரேரிக்கப்பட்ட கம்பனிகளுக்கான பகுதியளவு வரி விலக்களிப்பு: அமுல்படுத்துதல்
HALF TAX HOLIDAYS TO COMPANIES PROPOSED IN BUDGET 2016: IMPLEMENTATION

34/'18

4. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 130 ට අනුව, වැඩි අස්වනු ලබා දෙන බීජ හඳුන්වාදෙන සමාගම්වලට අර්ධ බදු විරාම ලබා දුන්නේද;

(ii) එවැනි බදු සහනබලයක් ලබා ගත් සමාගම්වල නම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත යෝජනාවට අනුව, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ආනයන බදු ඉවත් කිරීමට යෝජනා කළ බැවින්,

(i) 2015 ජනවාරි 01 දින වනවිට, ආනයන බදුවලින් නිදහස් කර තිබූ, යන්ත්‍රෝපකරණ ලේඛනයක්;

(ii) 2016 ජනවාරි 01 දිනෙන් පසු, ආනයන බදුවලින් නිදහස් කර තිබූ, යන්ත්‍රෝපකරණ ලේඛනයක්;

ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කමත්තොழில් அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்ட பிரேரணை இலக்கம் 130 இற்கு இணங்க, அதிக விளைச்சலைப் பெற்றுக்கொடுக்கின்ற விதைகளை அறிமுகப்படுத்தும் கம்பனிகளுக்குப் பகுதியளவு வரி விலக்களிப்புப் பெற்றுக் கொடுக்கப்பட்டதா என்பதையும்;

(ii) இவ்வாறான வரி ஊக்குவிப்பைப் பெற்றுக் கொண்ட நிறுவனங்களின் பெயர்ப் பட்டியலைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி தீர்மானத்திற்கேற்ப, 2015 சனவரி 01ஆம் திகதியளவில், இறக்குமதி வரியிலிருந்து விடுவிக்கப்பட்டிருந்த, இயந்திர சாதனங்களின் பட்டியலொன்றையும்;

(ii) 2016 சனவரி 01ஆம் திகதிக்குப் பின்னர், இறக்குமதி வரியிலிருந்து விடுவிக்கப்பட்டிருந்த, இயந்திர சாதனங்களின் பட்டியலொன்றையும்;

சமர்ப்பிப்பாரா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) in terms of Budget Proposal No. 130 of Budget 2016, whether a half tax holiday has been provided to the companies that introduce seeds that produce high yields; and

(ii) whether a list of companies which were granted with aforesaid tax holiday, will be submitted?

(b) Will he also inform this House -

(i) whether a list of machineries which were exempted from import taxes by 1st January 2015, will be submitted; and

(ii) whether a list of machineries which were exempted from import taxes by 1st January 2016 will be submitted; and

as proposals have been made to raise the import taxes on agricultural machineries, in terms of aforesaid Proposal?

(c) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) නැත.

2016 අය වැය යෝජනා අංක 130 ක්‍රියාත්මක වී නොමැත. ඒ අනුව වැඩි අස්වනු ලබා දෙන බීජ හඳුන්වා දෙන සමාගම් සඳහා අර්ධ බදු විරාම ලබා දීමට නීතිමය ප්‍රතිපාදන සලසා නැත.

(ii) නීතිමය ප්‍රතිපාදන සලසා නොමැති බැවින් නම් ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැත.

(ආ) (i) ඇමුණුම අංක 01හි දක්වා ඇත.

(ii) ඔව්.

ඇමුණුම අංක 02හි දක්වා ඇත.

මෙහි 2015 ජනවාරි 01 දින වන විට, ආනයන බදුවලින් නිදහස් කර තිබූ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවලට අමතර වශයෙන්, 2016 ජනවාරි 01 දිනෙන් පසු ආනයන බදුවලින් නිදහස් කරන ලද යන්ත්‍රෝපකරණ විස්තරය කොළ පැහැයෙන් සලකුණු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අය වැය යෝජනාවල සඳහන් කර, මේ ගරු සභාවේ සම්මත කර දෙන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ කිසිම යෝජනාවක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී නැහැ. ඒ කියන්නේ, වැරැද්ද ඔබතුමාගේ නොවෙයි. මුදල් අමාත්‍යාංශය නිකම් බොරුවට යෝජනාව ඉදිරිපත් කළාට, ඔබතුමන්ලාට මූල්‍ය ප්‍රතිපාදන ලබා දී නැහැ. එය ඉදිරියේදී ලබා ගන්න ලබන වර්ෂයේ අය වැය ලේඛනයට එම යෝජනා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ක්‍රියාත්මක වී නොමැති යෝජනා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, අපේ රාජ්‍ය ඇමතිතුමා මේ ගැන කෘෂිකර්ම අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවයි කියා මම බලාපොරොත්තු වෙනවා. කෘෂිකර්ම අමාත්‍යතුමා අලුතින් පත් වුණාට පසුව 2018 අප්‍රේල් මාසයේ 10වන දා අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වී තිබෙනවා. සියලුම බීජ ගොවිපොළවල් වසා දමන්න එහිදී වීරකෝන් නැමති ලේකම්වරයා තීන්දු කර තිබෙනවා. ඔබතුමා මැදිහත් වෙලා එය තාවකාලිකව නවත්වා ගෙන තිබෙනවා. හෝමාගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණයේ අක්කර 15ක විශාල භූමි භාගයක් තුළ පිහිටා තිබෙන කෘෂිකාර්මික පර්යේෂණ තාක්ෂණික ගොවිපොළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරා ගන්න නිටපු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර කටයුතු කර තිබුණා. ඒ කැබිනට් පත්‍රිකාව සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබෙද්දී, පසුව එය ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා තිබෙනවා.

කෘෂි කාර්මික ගොවිපළ, තාක්ෂණික උද්‍යාන, බීජ පර්යේෂණ ආයතන යනාදිය වසා දැමීමට වීරකෝන් කියන අධ්‍යක්ෂවරයාට ඉඩ දෙන්න එපා කියා මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මේ රටේ අතිමහත් බහුතර ජනතාවගේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයට අදාළ බීජ ගොවිපළ, පර්යේෂණ ආයතන වහලා ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ වක්කඩ කැඩුවා වාගේ වීවලටත් එන්න දුන්නොත් මේ රටේ සමස්ත සංස්කෘතියම විනාශ වීම තමයි සිදු වන්නේ. ඒ සඳහා ඔබතුමා මැදිහත් වෙනවාද කියලා මම අහනවා.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු මන්ත්‍රීතුමා, මම මේ සම්බන්ධව ඒ කණ්ඩායම සමඟ සාකච්ඡා කරලා ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීමට කටයුතු කර තිබෙනවා. අපි ඒ කාර්ය දැනට තාවකාලිකව නවත්වලායි තිබෙන්නේ. ඒක පවරා ගන්නවා නම් අපි නැවැත්වීමට කටයුතු කරනවා.

වයඹ ඇළ ව්‍යාපෘතියෙන් පෝෂණය වන කුඩා වැව්: විස්තර

வயம்ப கால்வாய்க் கருத்திட்டத்தினால் போஷிக்கப்படும் சிறுகுளங்கள்: விபரம்

SMALL TANKS FED BY WAYAMBA CANAL PROJECT: DETAILS

129/'18

5. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මහවැලි සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වයඹ ඇළ ව්‍යාපෘතියේ ප්‍රධාන ඇළ මාර්ගය ගමන් ගන්නා දඹුල්ල, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර 20ක දුර ප්‍රමාණයක ඇළට පහළින් පිහිටි දැනට වැසී දියෙන් පමණක් පෝෂණය වන කුඩා වැව් අමුණු ප්‍රමාණය, එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කුඩා වැව් අමුණු පද්ධති සියල්ලම පෝෂණය කිරීම සඳහා වයඹ ඇළ මඟින් වාරි ජලය සපයනු ලබන්නේද;

(iii) ඒ සඳහා මේ වනවිට සැලසුම් සකස් කර තිබේද;

(iv) ඉහත (i) හි සඳහන් වැව් අතරින් වයඹ ඇළ ව්‍යාපෘතියෙන් ජලය සපයනු ලබන හා සපයනු නොලබන වැව්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ප්‍රධාන ඇළට පහළින් ඇති වැව් අමුණු පෝෂණය නොකර, වයඹ පළාතට ජලය සැපයීම දඹුල්ල, ගලේවෙල ගොවි ජනතාවට කරනු ලබන අසාධාරණයක් නොවන්නේද;

(vi) එයට පිළියමක් ලෙස ජලය සපයනු නොලබන වැව් සඳහා ජලය සැපයීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மகாவலி "சுரக்சிததா" முதலீட்டு நிகழ்ச்சித் திட்டத்தின்கீழ் நீர்ப்பாசனத் திணைக்களத் தினால் நடைமுறைப்படுத்தப்படும் வயம்ப கால்வாய்க் கருத்திட்டத்தின் பிரதான கால்வாய் செல்லும் தம்புள்ளை, கலேவல பிரதேச செயலாளர் பிரிவுகளில் 20 கி.மீ. நீளமான கால்வாய்க்குக் கீழாக அமைந்துள்ள, தற்சமயம் மழைநீரால் மாத்திரம் வளமூட்டப்படும் சிறு குளங்கள்,அணைகளின் எண்ணிக்கை ஒவ்வொரு கிராம அலுவலர் பிரிவு அடிப்படையில் தனித் தனியே யாதென்பதையும்;

(ii) மேற்படி சிறிய குளங்கள், அணைகள் முறைமை அனைத்தையும் வளமூட்டுவதற்கு வயம்ப கால்வாய் ஊடாக நீர்ப்பாசன நீர் வழங்கப் படுகின்றதா என்பதையும்;

(iii) இதற்காக தற்சமயம் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(iv) மேற்படி (i) இல் குறிப்பிடப்பட்ட குளங்களில் வயம்ப கால்வாய் கருத்திட்டத்தினால் நீர் வழங்கப்படும் மற்றும் நீர் வழங்கப்படாத குளங்களின் பெயர்கள் தனித்தனியே யாவை என்பதையும்;

(v) பிரதானமான கால்வாய்க்கு கீழாக உள்ள குளங்கள் அணைகளை வளமூட்டாது, வடமேல் மாகாணத்திற்கு நீரை வழங்குதல் தம்புள்ளை, கலேவல விவசாயிகளுக்கு இழைக்கப்படும் அநீதியாக அமையாதா என்பதையும்;

(vi) இதற்குத் தீர்வாக நீர் வழங்கப்படாத குளங் களுக்கு நீரை வழங்குவதற்கான திட்டங்களை வகுத்து நடைமுறைப்படுத்துவாரா என்பதையும்;

(vii) ஆமெனின், எத்திகதியில் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) separately, in respect of each Grama Niladhari Division, the number of small tanks and weirs which are fed only by rain water presently, and which are situated in low elevation of the main canal in the downstream of 20 kilometres through Dambulla and Galewela Divisional Secretaries' Divisions and coming under the Wayamba Canal project operated by the Department of Irrigation under the "Mahaweli Suraksithatha" investment programme;

(ii) whether the Wayamba Canal feeds all the aforesaid tanks and weir systems;

(iii) whether plans have been made in that regard by now;

(iv) separately, the names of the tanks that are fed and not fed by the Wayamba Canal project;

(v) whether it does not cause an injustice to the farming communities of Dambulla and Galewela when water is provided to North Western Province without feeding the tanks and weirs that are located in low elevation of the main canal;

(vi) as a remedial action whether plans will be prepared and implemented in order to supply water to the tanks that are not fed; and

(vii) if so, the aforesaid date?

(b) If not, why?

ගරු වීරකුමාර දිසානායක මහතා (මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க - மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Weerakumara Dissanayake - State Minister of Mahaweli Development)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය, ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ ව්‍යාපෘතියකි.

වයඹ පළාත් ඇළ සමස්ත ව්‍යාපෘතිය මඟින් වැව් 330ක් ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත අතර, ඒ අතරින් ගලේවෙල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, ජලය ලබා දීමට හැකි බවට හඳුනාගෙන ඇති වැව් 38ක් පිළිබඳ විස්තර ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කරන අතර, තවද මධ්‍යම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් ලබා දුන් තොරතුරු අනුව, වයඹ ඇළ ව්‍යාපෘතියේ ප්‍රධාන ඇළ මාර්ගය ගමන් ගන්නා දඹුල්ල, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිලෝමීටර 20ක දුර ප්‍රමාණයක ඇළට ඉහළින් පිහිටි දැනට වැසි දියෙන් පමණක් පෝෂණය වන කුඩා වැව් අමුණු පිළිබඳ විස්තර ද ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කරමි. ඇමුණුම් **සභාගත*** කරමි.

(ii) නැත. මහවැලි ජල තුලන අධ්‍යයනයට අනුව, බෝවතැන්න සහ නාලන්ද සිට මහවැලි ජලය ඝන මීටර මිලියන 130ක සීමිත ප්‍රමාණයක් වයඹ ඇළ ව්‍යාපෘතිය යටතේ හැරවීමට සැලසුම් කර ඇත. වයඹ පළාත් ඇළ මඟින් ඇළට ඉහළින් පිහිටි සියලු වැව්වලට ජලය ලබා දීමට හැකියාව නොමැත. ජලය ලබා දෙනු ලබන්නේ ඇළට පහළින් ඇළ අසලම ඇති වැව්වලට සහ ඇළ හරහා ගමන් ගන්නා ස්වාභාවික දිය පහරවල් මඟින් සම්බන්ධ වන වැව්වලට පමණි. ඉන් පසු ස්වාභාවිකව පිහිටි එල්ලංගාවන් හරහා අනෙකුත් වැව් සඳහා ජලය ගමන් කරයි. දැනට මෙම කොට්ඨාස දෙකෙහි වැව් 38ක් පමණ මේ අයුරින් වයඹ පළාත් ඇළ මඟින් පෝෂණය කිරීමට හැකි බව හඳුනාගෙන ඇත.

(iii) මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ වයඹ පළාත් ඇළ මඟින් ජලය ලබා දිය හැකි වැව් සඳහා පමණක් ඉංජිනේරු දත්ත පදනම් කරගෙන සැලසුම් සකස් කරමින් පවතී.

(iv) වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය මඟින් ජලය ලබා දීමට හැකි වැව් 38ක් දැනට හඳුනාගෙන ඇති අතර, එම වැව් පිළිබඳ විස්තර ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කළෙමි. ජලය සැපයීමට නොහැකි වැව් පිළිබඳ විස්තර වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය යටතේ රැස්කර නොමැත.

(v) නැත. වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය මඟින් කුඩා වැව් සඳහා ජලය සැපයීමේදී භාවිත වන්නේ එම ප්‍රදේශවල පවතින ස්වාභාවික එල්ලංගා පද්ධතීන්ය. ව්‍යාපෘතිය මඟින් ඉදි කෙරෙන ඇළ මාර්ගය ආසන්නයේ, ඊට ඉහළින් පිහිටි වැව් සඳහා ජලය ලබා දුන් විට එම එල්ලංගාවන්ගෙන් ඊට පහළින් පිහිටි වැව් සඳහා ස්වාභාවික බැස්ම ඔස්සේ ජලය ගමන් කරයි.

මේ අනුව, ජාතික මට්ටමින් සිදු කරන ලද ජල තුලන අධ්‍යයනයක් මත පදනම්ව මහවැලි ද්‍රෝණියේ අතිරික්ත ජලය ඝන මීටර මිලියන 130ක සීමිත ප්‍රමාණයක් වාර්ෂිකව යොදා ගනිමින් මාතලේ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක දෙකෙහි වාරි පද්ධති ප්‍රගස්ත අයුරින් පෝෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත.

කෙසේ වෙතත් අදාළ එල්ලංගා පද්ධතීන් තුළ නොපිහිටන හා යෝජිත ඇළ මාර්ගයේ මට්ටමට වඩා ඉහළින් පිහිටි වැව් වයඹ පළාත් ඇළ මඟින් පෝෂණය කළ නොහැක. දඹුල්ල හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි කුඩා වැව් 38ක් හා ප්‍රධාන වාරි ව්‍යාපාර දෙකක් -වෑමැඩිල්ල හා දේවහුව- වෙත මහවැලි දියවර සපයා ජල සුරක්ෂිතතාව ඇති කිරීමට යෝජිත බැවින් ව්‍යාපෘතියේ ප්‍රතිලාභ දඹුල්ල හා ගලේවෙල ජනතාව වෙත ද සාධාරණව ලැබීමට නියමිතය.

(vi) වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය අයත් මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ විෂය පථය යටතේ ක්‍රියාත්මක නොවේ.

(vii) ඉහත අ (vi) අනුව අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාට එම නිලධාරී මහත්වරුන් සකසා දී තිබෙන පිළිතුර තුළම මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාවට සිදුවෙන අසාධාරණය පිළිබඳව පැහැදිලිව සඳහන් වෙනවා කියලා මා හිතනවා. මොරගහකන්ද ජලාශය හැදුවා, කළු ගඟ යෝජනා ක්‍රමය හැදුවා. අපේ මාතලේ දිස්ත්‍රික්කයේ සියයට 85ක් ඉන්නේ ගොවිතැන් කරන මිනිසුන්. ඒ මිනිසුන්ට වතුර ලබා දෙන්නේ නැතුව, මාතලේ දිස්ත්‍රික්කයෙන් පිටට වතුර ගෙන යනවා. මොරගහකන්ද සම්බන්ධයෙන් මම දිගින් දිගටම කථා කළා. පසුගිය අය වැය විවාදයේදීත් ඒ ගැන කථා කරලා අපේ වැව් ටික හදා දෙන්න කියලා කිව්වා. අද වනතුරු ඒ දේ වුණේත් නැහැ.

මා දන්නා තරමින් වයඹ ඇළ ව්‍යාපෘතියෙන් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ එල්ලංගා වැව් පද්ධතියේ වැව් 30ක් පෝෂණය කරන්නට සැලසුම් කරලා තිබෙනවා. මීවලපතහ, යටිගල්පොත්ත, දමුණුමුල්ල, පහළදිග්ගල, දඬුබැඳිරුප්ප, මකුළුගස්වැව, වැටකොළුවැව, බෙලියකන්ද සහ තලකිරියාගම කියන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල කුඩා වැව් අධික ප්‍රමාණයක් පෙනී පෙනී තමයි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශවලට ජලය ගෙන යන්නේ. වැස්සොත් විතරයි මෙම කුඩා වැව්වලට වතුර ලැබෙන්නේ. ඒ වාගේම දඹුල්ල ප්‍රාදේශීය ලේකම්

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කොටියාසය ගත්තොත්, දඹුළු ඔයෙන් උතුරු කොටසේ පිහිටි කුඩා වැව් දඹුළු ඇළ මඟින් පෝෂණය වුණත්, ඇතාබැඳිවැව, වවුල්අඹේ, පන්නම්පිටිය, කිරලගොල්ල යන ග්‍රාම නිලධාරී වසම්වල වැව් 15කට අධික ප්‍රමාණයක් ඉහත ගැටලුවට මුහුණ දීලා තිබෙනවා. වතුර ටික පෙනි පෙනී ගෙනියනවා. ඒ නිසා අපේ ගල්වෙල, දඹුල්ල, එහෙම නැත්නම් ලග්ගල ජනතාවගේ ජල අයිතිය අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා මම මගේ පළමු අතුරු ප්‍රශ්නය හැටියට අහන්නේ මේ සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ සැලසුමක් සිද්ධ වෙනවාද කියන එකයි.

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

ගරු මන්ත්‍රීතුමිය, කිසිලෙසකින්වත් ජනතාවට අසාධාරණයක් වන විධියට මේ ව්‍යාපෘතිය සකස් වෙන්නේ නැහැ කියන කාරණය පළමුව කියන්න ඕනෑ. ඊළඟ කාරණය තමයි ප්‍රායෝගිකව පවතින තාක්ෂණික ප්‍රශ්න ගැන අපි පසුගිය දිනවල සාකච්ඡා කළා. ඔබතුමියගේත් යෝජනා තිබෙනවා නම්, අදාළ නිලධාරීන් සහ ඔබතුමියවත් සම්බන්ධ කරගෙන අපට ඒ ගැන කථා කරන්න පුළුවන්කම තිබෙනවා. සමහර වැව්වලට පෙනි පෙනී ජලය ගියත් සමහර තැන්වල ප්‍රායෝගික ප්‍රශ්න තිබෙනවා. මොකද, ඒ භූමියේ තිබෙන තත්ත්වයන් එක්ක ඒ අදාළ ස්ථානවලට ජලය ලබා ගත නොහැකියි. ඔබතුමියගේ යෝජනා තිබෙනවා නම්, අපට ඒ ගැන බලන්න පුළුවන්. ඒ වාගේම සීමිත ජලය ප්‍රමාණයක් නිසා අපි අදාළ ඉලක්කවලට තමයි මේ ජලය කළමනාකරණය කරන්න උත්සාහ කරන්නේ. මේ ගැන අපි සාකච්ඡා කළා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ඇත්තටම මේක මාතලේට වෙන අසාධාරණයක්. ඒ නිසයි මේ කියන්නේ. විශේෂයෙන් ඇළෙන් ඉහළ කොටසේ වැව් 7යි තිබෙන්නේ. ඉතිරි වැව් 32ම තිබෙන්නේ ඇළෙන් පහළ කොටසේ. මම ව්‍යාපෘති නිලධාරීන් සමඟ කථා කළා. ඒ ව්‍යාපෘති නිලධාරීන් කියනවා, මුදල් වෙන් කිරීමක් සිද්ධ වෙනවා නම් නාලන්ද ජලාශයෙන්, බෝවතැන්න ජලාශයෙන් හෝ වැමැඩිල්ල ජලාශයෙන් වතුර ගෙනැල්ලා මේ එල්ලංගා පද්ධතියේ තිබෙන වැව් 40 පෝෂණය කිරීමේ හැකියාව තිබෙනවා කියලා. ඒ නිසා ඒ කාරණය කියන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ අයගේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කරලා, වයඹ ඇළ ව්‍යාපෘතිය ගෙනියන්න. මොකද, දිගින් දිගටම, දිගන් දිගටම මේවා දිහා බලාගෙන ඉන්නවා. මාතලේ දිස්ත්‍රික්කයේ සියයට 85ක් ඉන්නේ ගොවිතැනින් ජීවත් වෙන මිනිසුන්. ඒ නිසා ඒ අයගේ ජල අවශ්‍යතාව සම්පූර්ණ වෙන විධියට මුදල් වෙන් කරලා අපට ඒ ප්‍රශ්නය විසඳා දෙන්න. එහෙම නොවුණොත් මේක ලොකු ප්‍රශ්නයක් වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා, ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

ගරු මන්ත්‍රීතුමියවත් සම්බන්ධ කරගෙන අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය: පැමිණිලි
நிதியியல் குற்றப் புலனாய்வுப் பிரிவு: முறைப்பாடுகள்
FINANCIAL CRIMES INVESTIGATION DIVISION: COMPLAINTS

156/'18

6. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය (FCID) පිහිටුවනු ලැබූ දිනය කවරේද;

(ii) 2017.08.01 වනවිට එම කොට්ඨාසය (FCID) වෙත ලැබී තිබුණු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් විමර්ශන අවසන් කර නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකළ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් පැමිණිල්ල නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நிதியியல் குற்றப் புலனாய்வுப் பிரிவு (FCID) தாபிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) 2017.08.01ஆந் திகதியளவில் அப்பிரிவுக்குக் (FCID) கிடைத்திருந்த முறைப்பாடுகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) அவற்றில் புலனாய்வுகள் நிறைவு செய்யப்பட்டு சட்டத்துறைத் தலைமையதிபதி திணைக்களத்துக்கு ஆற்றுப்படுத்தப்பட்ட முறைப்பாடுகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு முறைப்பாடு மற்றும் சட்டத்துறைத் தலைமையதிபதி திணைக்களத்துக்கு அவை ஆற்றுப்படுத்தப்பட்ட திகதி வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management and Law and Order:

(a) Will he inform this House -

(i) the date on which the Financial Crimes Investigation Division (FCID) was established;

(ii) the total number of complaints that had been received by the FCID as at 01.08.2017;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iii) the number of complaints that have been referred to the Attorney General's Department after completing investigations; and

(iv) separately the details of each complaint and the date on which each complaint was referred to the Attorney General's Department?

(b) If not, why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துமபண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)

(අ) (i) 2015.02.26 වේ.

(ii) තුන්සිය තිස්හයයි.

(iii) එකසිය එකයි.

(iv) විමර්ශන අවසන් කළ පැමිණිලි සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රථම එම පැමිණිලි සම්බන්ධ තොරතුරු සභාගත කිරීම සුදුසු නොවේ.

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, මාගේ අතුරු ප්‍රශ්නය මෙයයි. (අ) (iv) වෙනි කොටසට උත්තර නොදුන්නත්, අඩු තරමින් පැමිණිල්ල කවරක්ද කියන එක නොකියා මේවා ඉදිරිපත් කළ කාල වකවානු පිළිබඳව දළ අදහසක් ඔබතුමාට කියන්නට පුළුවන්ද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துமபண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නීතිපතිතුමාගෙන් උපදෙස් ලබාගෙන ඒ පිළිබඳව තොරතුරු ලබා දෙන්නට උත්සාහ කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7-191/'18 - (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අවසන් වූ පසු, ප්‍රධාන කටයුතු ආරම්භයට පළමුව ඔබතුමාට අවස්ථාව ලබා දෙන්නම්.

ගරු ඇමතිතුමනි, ප්‍රශ්න අංක 7 සඳහා පිළිතුර ලබා දෙනවාද?

ගරු කබීර් හෂීම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කොළඹ දිස්ත්‍රික්කයේ ගංවතුර හානි, 2016: වන්දි
கொழும்பு மாவட்ட வெள்ளப்பெருக்குச் சேதம் 2016 : இழப்பீடு
DESTRUCTUION BY FLOODS IN COLOMBO DISTRICT IN 2016: COMPENSATION

193/'18

8. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2016 වර්ෂයේ මැයි මාසයේදී කොළඹ දිස්ත්‍රික්කයේ ඇති වූ ගංවතුරෙන් සහ වැසි වතුරෙන් සිදු වූ ජල ගැලීමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුදෙනාටම ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නීර්ප්පාසන, නීර් වළංකල් මற்றුම් අනර්ත්ත මුකාමෙත්තුව අමෙච්සරෛක් කේට්ට විනා:

(அ) 2016ஆம் ஆண்டு மே மாதத்தில் கொழும்பு மாவட்டத்தில் வெள்ளப்பெருக்கினாலும் மழை நீரினாலும் ஏற்பட்ட நீர் பெருக்கெடுப்பு காரணமாக,

(i) உயிரிழந்தவர்களின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(ii) அங்கவீனமுற்ற ஆட்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) பாதிக்கப்பட்ட ஆட்களுக்கு அரசாங்கத்தினால் செலுத்தப்பட்ட மொத்த இழப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும்;

(iv) உயிரிழந்த ஆளொருவருக்கு அரசாங்கத்தினால் செலுத்தப்பட்ட இழப்பீட்டுத் தொகை எவ்வள வென்பதையும்;

(v) சேதமடைந்த வீடுகளுக்குச் செலுத்தப்பட்ட அதிகபட்ச மற்றும் குறைந்தபட்ச இழப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும்;

(vi) இடம்பெயர்ந்த அனைவருக்கும் நிரந்தர வீடுகள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(vii) இடம்பெயர்ந்த குடும்பமொன்றுக்கு நிரந்தர வீடு வழங்கப்பட்ட அண்மித்த திகதி யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources and Disaster Management:

(a) Will he inform this House in respect of the deluge caused by flooding and rain water in the Colombo District in May 2016-

(i) the number of persons died;

(ii) the number of persons disabled;

(iii) the total amount of compensation paid on behalf of the government to affected persons;

(iv) the amount of compensation paid by the government for a deceased person;

(v) the maximum and minimum compensation paid to damaged houses;

(vi) whether permanent housing has been granted to all displaced persons; and

(vii) the nearest date on which a permanent house was granted to a displaced family?

(b) If not, why?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මියගිය සංඛ්‍යාව 08කි.

(ii) නැත.

(iii) රු. 2,259,582,516.00ක් වේ.

(iv) රු. 100,000 කි.

(v) ගෙවා ඇති උපරිම වන්දි මුදල රු. 1,545,000.00ක් වේ; අවම වන්දි මුදල රු. 10,100.00ක් වේ.

(vi) ස්ථිර නිවාස ලබා දීම වෙනුවට රජය විසින් 2016.04.01 දින සිට ක්‍රියාත්මක කරන ජාතික ස්වභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ නිවාස හානි සඳහා හානි පූර්ණ මූලධර්මය යටතේ රුපියල් ලක්ෂ 25ක උපරිමයකට යටත්ව වන්දි මුදල් ලබා දීම සිදු කරයි.

ඒ අනුව ආපදාවට පත් නිවාස හිමි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් පත් කරනු ලබන කමිටුවක් මඟින් ආපදාවට පත් නිවසේ හානි තක්සේරු කර එම තක්සේරු වාර්තා ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යැවීම සිදු කරනු ලබයි. ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් එම තක්සේරු සඳහා වන වන්දි මුදල් ප්‍රතිලාභීන්ට සෘජුවම චෙක්පත් මඟින් නිකුත් කිරීම හෝ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත චෙක්පත් හෝ මුදල් ලබා දීම සිදු කිරීම මඟින් ප්‍රතිලාභීන්ට අදාළ හානි පූර්ණ වටිනාකම ලබා දීම සිදු කරයි. ප්‍රතිලාභීන් විසින් එම වන්දි මුදල් යොදා ගනිමින් නිවාස ඉදි කිරීම සිදු කරනු ලබයි.

(vii) ඉහත පිළිතුර අදාළ වේ.

(ආ) පැන නොනඟී.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම රක්ෂණාවරණය යටතේ වන්දි ලබා දීමේදී නිසි මුදලක්, ඒ කියන්නේ වාණිජමය වටිනාකමක් තිබෙන තමන්ගේ හානිය පූර්ණය කිරීමට ප්‍රමාණවත් මුදලක්, නොලැබෙන බවට මේ විපතට පත් වෙච්ච අයගෙන් ලොකු මැසිවිල්ලක් තිබෙනවා. ඒක නිසා තමන්ට ලැබුණු වන්දි මුදල ප්‍රමාණවත් නැතැයි හැඟෙන අයට ඒ පිළිබඳව අභියාචනා කිරීමේ ක්‍රමවේදයක් තිබේද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු කථානායකතුමනි, පසුගිය දිසාපති සාකච්ඡාවේදී මේ පිළිබඳව කොළඹ දිසාපතිතුමා කරුණු දැක්වූවා. සෑහීමකට පත් නොවෙන අයටත් ඒ වාගේම වන්දි මුදල් නොලැබුණා කියන අයටත් අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දීලා තිබෙනවා. ඒ අනුව කොළොන්නාව, කඩුවෙල ප්‍රදේශවල ජනතාව අභියාචනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව දැනට කටයුතු කරගෙන යනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ඔබතුමාට බොහොම පින්, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

සාලමුල්ල, "ලක්සඳ සෙවණ" තට්ටු නිවාස සංකීර්ණය: සින්නක්කර ඔප්පු

சாலமுல்ல "லக்சந்த செவண" மாடி வீட்டுத் தொகுதி : அறுதியுறுதிகள்

"LAKSANDA SEVANA" APARTMENT COMPLEX IN SALAMULLA : TITLE DEEDS

231/'18

9. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

(අ) (i) 2012 වර්ෂයේ මීතොටමුල්ල කසළ කන්ද පුළුල් කිරීම හේතුවෙන් නිවාස අහිමි වූ පවුල් 160 ක් සඳහා සාලමුල්ල, ''ලක්සඳ සෙවණ'' නිවාස සංකීර්ණයෙන් 2014.12.01 දින නිවාස ලබා දී ඇති බවත්;

(ii) එම නිවාස ලබා දී මාස දෙකක් ඇතුළත ඔවුන්ට නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සින්නක්කර ඔප්පු ලබා දීමට පොරොන්දු වී තිබූ බවත්;

(iii) මෙතෙක් එම පදිංචිකරුවන් සඳහා ඔප්පු ලැබී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) යම් ගැටලුකාරී තත්ත්වයන් පවතී නම්, ඒවා විසඳා ගනිමින් මෙම නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබා දිය හැකි නිශ්චිත දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

මානකර මත්‍රුම් මේල් මාකාණ අපිවිරුත්‍රි අමෙච්චරෛක් කේට්ට වීනා:

(அ) (i) 2012ஆம் ஆண்டில் மீதொட்டமுல்ல குப்பைமேடு விரிவாக்கப்பட்டதன் காரணமாக வீடுகளை இழந்த 160 குடும்பங்களுக்கு 2014.12.01ஆம் திகதி சாலமுல்ல "லக்சந்த செவண" மாடி வீட்டுத் தொகுதியில் வீடுகள் வழங்கப்பட்டுள்ளன என்பதையும்;

(ii) குறித்த வீடுகள் வழங்கப்பட்டு இரண்டு மாத காலத்தினுள் இவர்களுக்கு நகர அபிவிருத்தி அதிகாரசபை மூலம் அறுதியுறுதிகள் வழங்கப் படுமென வாக்குறுதி அளிக்கப்பட்டிருந்தது என்பதையும்;

(iii) இதுவரை மேற்படி குடியிருப்பாளர்களுக்கு உறுதிகள் கிடைக்கவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அறுதியுறுதிகள் வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) ஏதேனும் சிக்கல் நிலை காணப்படின், அவற்றைத் தீர்த்து இந்த வீடுகளுக்கு அறுதியுறுதி களை வழங்க முடியுமான திட்டவட்டமான காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Megapolis and Western Development:

(a) Is he aware that -

(i) houses were provided from " Laksanda Sevana" apartment complex in Salamulla on 01.12.2014 for 160 families that lost their houses as a result of expanding the garbage dump at Meethotamulla in 2012;

(ii) they were promised the provision of freehold title deeds by the Urban Development Authority within two months from the provision of those houses; and

(iii) those residents have not been provided with the title deeds up to now?

(b) Will he inform this House -

(i) the reasons for not providing the freehold title deeds; and

(ii) the exact date by which freehold title deeds for these houses could be provided by resolving any problems that prevail, if there are any?

(c) If not, why?

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට මා පිළිතුරු දෙනවා.

(අ) (i) 2012 වර්ෂයේ මීතොටමුල්ල කසළ කන්ද පුළුල් කිරීම හේතුවෙන් නිවාස අහිමි වූ පවුල් 158ක් සඳහා සාලමුල්ල, "ලක්සඳ සෙවණ" නිවාස සංකීර්ණයෙන් 2014.12.01 දින නිවාස ලබා දී ඇත.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) එම නිවාස ඒකකයක් සඳහා රුපියල් මිලියන තුනක ඉදි කිරීම් පිරිවැයක් එවකට වැය කළ ද, තිබූ ආපදා තත්ත්වය සැලකිල්ලට ගෙන නිවාස ඒකකයක් සඳහා රුපියල් මිලියන 1.5ක් බැගින් කොළඹ මහ නගර සභාව වෙතින් අය කර ගැනීමේ අපේක්ෂාවෙන් ඒ අවස්ථාවේ නිවාස ලබා දුන් අතර, නාගරික සංවර්ධන අධිකාරිය වෙත කොළඹ මහ නගර සභාව විසින් ගෙවිය යුතු රුපියල් මිලියන 237ක මුදලකින් මේ වන තෙක් ගෙවා ඇත්තේ රුපියල් මිලියන 165ක් පමණි.

(ii) රුපියල් මිලියන 72ක හිඟ මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙත පියවීමෙන් පසු ඔප්පු ලබා දීමට හැකි බව අදාළ නිවාස හිමියන්ටත්, ඒ මුදල ලබා දෙන ලෙස කොළඹ නගර සභාවටත් අප විසින් කිහිප විටක් දැනුම් දී ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයටම අදාළව අහන්නම්. ගරු අමාත්‍යතුමනි, කොළඹ මහ නගර සභාව විටින් විට මීතොටමුල්ලේ ජනතාව රැගෙන ගිහින් "ලක්සඳ සෙවණ" හි පදිංචි කරවූවා. ඒ අය ඒ අයගේ පුරාණ ගම් බිම්වලින් තමයි ගියේ. ඒ අය සිටින තැනට ඔප්පු ලබා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට කොළඹ නගර සභාවෙන් මුදල් ඕනෑ කියා කියනවා. හැබැයි, කොළඹ නගර සභාව ගිවිසුම් ප්‍රකාරව මුදල් දෙන්නේ නැතිනම් ඔබතුමන්ලා ඒ සඳහා ගන්නා පියවර මොකක්ද?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, අපි මෙය කිහිප විටක්ම කොළඹ නගර සභාවට දැනුම් දී තිබෙනවා. මොකද, මීතොටමුල්ලට ගිහින් දැම්මේ කොළඹ නගර සභාවේ කසළයි. ඒ නිසා එහි තිබුණු අක්කර 21ක පමණ වන වටිනා ඉඩමත් විනාශ වුණා. ඊට අමතරව, ඒ අවට ජීවත් වූ ජනතාවගේ ජීවිතත් බරපතළ අනතුරකට ලක් වෙලා, පසුව ඒ කුණු කන්ද නාය යෑම නිසා ජීවිත 33කුත් විනාශ වුණා. එහි වගකීමෙන් කොළඹ නගර සභාවට ගැලවෙන්න බැහැ. කලින් අවස්ථාවේදී මෙවැනි ආපදා තත්ත්වයක් සැලකිල්ලට ගෙන තමයි 2012 වර්ෂයේදී පිරිසක් ඉවත් කර තිබෙන්නේ. නමුත් අද මේ වන තෙක් ඒ මුදල්වලින් කොටසක් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබෙන නිසා ඔප්පු ලබා දීමේ ප්‍රශ්නය අපට මතුව තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමාත් දන්නවා, මෑතකදීත් -අප එහි ඉතිරි කොටස් විවෘත කරන්න ගිය අවස්ථාවේදීත්- ඒ ජනතාව ඒ ප්‍රශ්නය අහපු බව. වෙනත් කාරණා -දරුවන් පාසල් යැවීම හා අනෙකුත් කාරණා - සඳහා අපි ඒ අයිතින් ලබා දී තිබෙනවා; පහසුකම් සපයා තිබෙනවා. මුදල් ලබා ගැනීම සඳහා අපි කිහිප වතාවක්ම නගර සභාවට දැනුම් දී තිබෙනවා. අපි ඉදිරියේදීත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්නම්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමා දන්නවා, නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රායෝගිකව ජනතාවට ලබා දිය හැකි පහසුකම් ලබා දෙනවා කියා. දැන් කොළඹ නගර සභාව හැසිරෙන්නේ එය සුප්‍රිම් ආයතනයක් ලෙසයි. ඒ අය ඒ මුදල් ලබා දෙන්නේ නැත්නම් ඔබතුමන්ලා අධිකරණයට ගිහින් හෝ ඒ මුදල් ලබා ගන්න. ගරු අමාත්‍යතුමනි, කොළඹ නගර සභාවේ අත්තනෝමතික ක්‍රියා කලාපය නිසා මිනිසුන් මැරෙන එකටයි, කුණු දමන එකටයි, මිනිසුන් අතෙක් අතෙක් තැන්වලදී විවිධ පීඩාවන්ට ලක් කරන එකටයි මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා හැටියට ඔබතුමා ඉඩ දෙන්න එපා කියා ඉල්ලා සිටිනවා. මීතොටමුල්ල කසළ කන්ද නාය ගිහින් දැනට අවුරුද්දකුත් මාස එකහමාරක් වනවා. එතැන තිබෙන කසළ ටික අයින් කරලා ඒ භූමිය යථා තත්ත්වයට පත් කරන්න කියා අප කොළඹ නගර සභාවෙන් ඉල්ලීමක් කළාම ඒ අය කියනවා, "ඒ ඉඩම අයිති UDA එකටයි. ඕනෑ නම් උදව්වක් හැටියට කුණු ටික අයින් කර දෙන්නම්" කියා. ඒ අයට අමතක වෙලා තිබෙනවා, මිනිසුන් 33දෙනකු මැරුණේ ඒ අය හින්දායි කියන එක. මිනිසුන් 33දෙනකු මරා තිබියදීත් කුණු ටික අයින් කරන්න ඒ අයට වුවමනාවක් නැහැ. ඒ සඳහා ඔබතුමා ගන්නා පියවරක් තිබෙනවාද, ගරු අමාත්‍යතුමා?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, ඒ කසළ කන්දේ කසළ ඉවත් කිරීම එහෙම පහසුවෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

අපි ඒ පිළිබඳව සොයා බැලුවා. ඒ කසළ කන්ද ඉවත් කරන්න යන වියදම, ඒ ඉඩමේ වටිනාකමටත් වඩා ඉතා විශාල අගයක් ගන්නවා. ඒ අනුව දැන් අපි තීරණය කරලා තිබෙනවා, කසළ කන්දේ කිසියම් ප්‍රමාණයක් -අක්කර පහක පමණ ප්‍රමාණයක්,- කොළොන්නාව ප්‍රදේශයේ නාගරික සංවර්ධනයට ගන්නත්, ඉතුරු කොටස නාගරික උද්‍යානයක් බවට පරිවර්තනය කරන්නත්. හැබැයි, එතැන ඉංජිනේරුමය ගැටලුවක් තිබෙනවා. යන්ත්‍රෝපකරණ එතැනට ගෙන ගියාට පසුව කසළ කන්ද ගිනි ගැනීමේ අවදානමක් තිබෙනවා. මොකද, මීතේන් වායුව අභ්‍යන්තරයේ තැන්පත් වෙලා තිබෙන නිසා. ඒක එක කාරණයක්.

දෙවන කාරණය, විශාල ජල තලයක් යටින් තිබෙන නිසා ඇත්තටම එතැන සිද්ධ වුණේ ඒ කන්ද නාය යාමක් නොවෙයි. Deep-seated collapse එකක් තමයි සිද්ධ වුණේ. ඒ නිසා යන්ත්‍රෝපකරණ එතැනට ගෙන ගියාට පසුව ඇතැම් විට නාය යාමේ අවදානමක් තිබෙනවා. ඒ නිසා අපි දැන් ඒ කටයුත්ත කොටස් වශයෙන් කරන්න තීරණය කරලා තිබෙනවා. ඒ කසළ එතැනම පවත්වාගෙන යන ගමන් කොටසක් සංවර්ධනය කරන්නත්, කොටසක් උද්‍යානයක් බවට පත් කරන්නත් තීරණය කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 - 238/'18-(1), ගරු හේෂාන් විතානගේ මහතා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මම තුන්වන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්. According to the Standing Orders you can ask only two Supplementary Questions.

ඇඹිලිපිටිය නගරයේ ව්‍යාපාරික ඉඩම්: හිමිකම් ලබාදීමේ ගැටලු

எம்பிலிப்பிட்டிய நகர வர்த்தகக் காணிகள் : உரித்து வழங்கலிலான பிரச்சினை

COMMERCIAL LANDS IN EMBILIPITIYA TOWN: ISSUES PROVISION OF TITLE DEEDS

238/'18

10. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ශීඝ්‍රයෙන් දියුණු වන ඇඹිලිපිටිය නගරය තුළ ව්‍යාපාරික ඉඩම් සඳහා හිමිකම් ලබාදීමේ ගැටලුවක් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, නිවැරදි අයුරින් ඉඩම් හිමිකම් ලබාදීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මෙම නගරයේ ඉඩම් සම්බන්ධයෙන් විභාරස්ථානයක් අයිතිවාසිකම් ප්‍රකාශ කරන බැවින්, ව්‍යාපාරිකයින් තමන්ගේ ව්‍යාපාරික ස්ථාන තුළ ගොඩනැගිලි ඉදි කිරීම සිදු නොකරන බව දන්නේද;

(ii) මෙම විභාරස්ථානයට මෙකී ඉඩම් සම්බන්ධයෙන් සත්‍ය වශයෙන්ම ඇති හිමිකම කවරේද;

(iii) වසර ගණනාවක සිට මෙම නගරය තුළ අදාළ ව්‍යාපාරික ස්ථාන භුක්ති විඳිමින් සිටින ව්‍යාපාරිකයින්ට ඒවායේ හිමිකම් ලබාදීමටත්, තම

[ගරු හේෂාන් විතානගේ මහතා]

> ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ව්‍යාපාරික ප්‍රජාවට පහසුකම් සැපයීමටත් පියවර ගන්නේද;
>
> යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

පිරතම අමෙච්චරුම් දේසිය කොල්කෙකළ් මට්රුම් පොරුළාතාර අලුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(අ) (i) இரத்தினபுரி மாவட்டத்தில் துரிதமாக அபிவிருத்தி அடைந்துவரும் எம்பிலிப்பிட்டிய நகரத்தில் வர்த்தகக் காணிகளுக்கு உரித்துகளை வழங்குவதில் பிரச்சினை நிலவுகின்றது என்பதை ஏற்றுக்கொள்வாரா;

(ii) ஆமெனில், சரியான முறையில் காணி உரித்துகளை வழங்குவதற்கு மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இந்நகரத்தில் காணிகள் தொடர்பில் விஹாரை யொன்று உரிமை கோருவதனால், வர்த்தகர்கள் தமது வர்த்தக நிலையங்களில் கட்டிடங்களை நிர்மாணிப்பதில்லை என்பதை அறிவாரா;

(ii) இவ்விஹாரைக்குக் குறிப்பிட்ட காணிகள் தொடர்பில் உண்மையிலேயே இருக்கின்ற உரித்து யாது;

(iii) பல வருட காலமாக இந்நகரத்தில் குறிப்பிட்ட வர்த்தக நிலையங்களின் ஆட்சியை அனுபவித்து வருகின்ற வர்த்தகர்களுக்கு அவற்றின் உரித்தை வழங்குவதற்கும், தமது வர்த்தக நடவடிக்கைகளை மேற்கொள்வதற்கு வர்த்தக சமூகத் தினருக்கு வசதிகளை வழங்குவதற்கும் நடவடிக்கை மேற்கொள்வாரா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) whether it is admitted that there is an issue when providing title deeds for plots of land for commercial purposes within rapidly developing Embilipitiya town in Ratnapura District; and

(ii) if so, the measures taken to provide title deeds properly?

(b) Will he also inform this House-

(i) whether he is aware, businessmen do not construct buildings in their business premises since a Buddhist temple claims right for the lands of this city;

(ii) the actual right pertaining to these lands by the temple; and

(iii) whether measures will be taken to grant the ownership of the relevant business premises in this city to the businessmen who had possessed them for many years and facilities will be provided to the business community to engage in their business activities?

(c) If not, why?

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඇඹිලිපිටිය නගරය තුළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු රජයේ ඉඩම් බුක්ති විඳින ව්‍යාපාරිකයින් වෙත බදු බලපත්‍ර ලබා දීමට කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇති බැවින්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම් සම්බන්ධයෙන් හිමිකම් ලබා දීමේ ගැටලුවක් නොමැත.

(ii) ඇඹිලිපිටිය නගරය හා ඒ අවට ප්‍රදේශ නාගරික බල ප්‍රදේශයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2006.04.15 දින ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව එම නාගරික බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ ඉඩම්, ව්‍යාපාර කටයුතු සඳහා ලබා දෙනු ලබන්නේ 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඇති ප්‍රතිපාදන මතයි.

යම් පුද්ගලයෙකු ඉඩමේ බුක්තියට පැමිණි වර්ෂය පදනම් කර ගනිමින් ඉඩමේ වෙළෙඳ පොළ වටිනාකම තක්සේරු කර, ඒ අනුව බදු මුදල් ගණනය කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් විෂය භාර ගරු අමාත්‍යතුමා වන අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඇති අතර, ඒ අනුව ක්‍රියා කරන ලෙස වලව කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර වෙත චක්‍රලේඛයක් මඟින් උපදෙස් ලබා දී ඇත.

එම උපදෙස් අනුව ක්‍රියා කරමින් ඇඹිලිපිටිය නගරයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු රජයේ ඉඩම් භුක්ති විඳින ව්‍යාපාරිකයන් වෙත බදු බලපත්‍ර ලබා දීමට කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත.

(ආ) (i) ඇඹිලිපිටිය නගරයේ පිහිටි යම් ඉඩම් ප්‍රමාණයක් ඇඹිලිපිටිය ශ්‍රී කාවන්තිස්ස රජමහා විහාරය සතු බවට වාර්තා වී ඇත. එම ඉඩම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය කිසිදු මැදිහත්වීමක් සිදු කරනු නොලැබේ.

(ii) 1939 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනත යටතේ ඇඹිලිපිටිය කාවන්තිස්ස රජමහා විහාරයට එම ඉඩම්වල අයිතිය ලැබී ඇති බවට කරුණු වාර්තා වී ඇත.

(iii) ඇඹිලිපිටිය නගරය තුළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රජයේ ඉඩම්වල ව්‍යාපාර කටයුතු සිදුකරන ව්‍යාපාරිකයන් වෙත දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා දීමේ කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ. ඉහත (ආ) (ii) යටතේ දක්වා ඇති ඉඩම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මැදිහත්වීමක් කළ නොහැක.

(ඇ) පැන නොනඟී.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මම ඇසූ ප්‍රශ්නය ගැන ගරු රාජ්‍ය ඇමතිතුමාට අවබෝධයක් නැහැ කියායි මම හිතන්නේ. මේ උත්තරය ලබා දුන් පුද්ගලයා මේ ගැටලුව ගැන අනවබෝධයෙන් ලබා දුන් පිළිතුරක් ලෙසයි මා මෙය දකින්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙය මහවැලි සංවර්ධන අධිකාරිය පිළිබඳව තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. මෙහි සඳහන් විහාරස්ථානයට නගරයේ යම් භූමි ප්‍රමාණයක අයිතියක් තිබෙනවා. මේ ගැටලුව නිසා අද වන විට ඇඹිලිපිටිය නගරයේ ව්‍යාපාරිකයෙකුට ගොඩනැඟිල්ලක් ඉදි කරන්න බැහැ. මහවැලි අධිකාරිය මෙයට කිසිම මැදිහත්වීමක් වෙන්නේ නැහැ. මහවැලි අධිකාරිය විසින් ඔබතුමාට ලබා දී තිබෙන පිළිතුර අනුව, "අපට අයිතියක් තිබෙනවා" කියා ඔවුන් යම් ප්‍රකාශ කරනවා. නමුත්, රජයේ කිසිම ආයතනයක් මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නේ නැහැ. ව්‍යාපාරිකයෙක් ගොඩනැඟිල්ලක් හදන්න ගියොත්, මේ පන්සලේ මැදිහත්වීම නිසා ඒ කාර්යය නතර කරනවා.

බුද්ධශාසන ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ සිටිනවා. මම මේ කියන කාරණය හරිද වැරදිද කියා මා දන්නේ නැහැ. ව්‍යාපාරිකයෙක් තමන්ට අයිති ඉඩමක් වෙනත් කෙනෙකුට විකුණන්න ගියාමත් මේ ප්‍රශ්නය මතු වෙනවා. ඒ විහාරස්ථානයට අයිති පර්චස් දහයක් තිබෙනවා නම්, මේ වන විට පවතින වාණිජ වටිනාකමට එය විකුණා එහි තට්ටු හතරක ගොඩනැඟිල්ලක් හදලා තිබෙනවා නම්, ඒ ගොඩනැඟිල්ලේ වටිනාකමෙන් සියයට විසිපහක් විහාරස්ථානයට දෙන්න ඕනෑ. එතකොට ලොකු අසාධාරණයක් වෙනවා. මම මේ කියන කාරණය ගරු රාජ්‍ය ඇමතිතුමාට පැහැදිලිද දන්නේ නැහැ.

මෙය රත්නපුර දිස්ත්‍රික්කයේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැද තිබෙන, දියුණු වෙන ප්‍රධාන නගරයක්. ඒ නිසා, ව්‍යාපාරිකයන්ගේ මේ ගැටලුව නිරවුල් කර දීම සඳහා මහවැලි සංවර්ධන අධිකාරිය සාධනීය මැදිහත්වීමකින් කටයුතු කරනවාද කියන ප්‍රශ්නයයි මම අහන්නේ.

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

ගරු මන්ත්‍රීතුමා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පුළුවන්කම තිබෙන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම්වලට මැදිහත් වෙන්න විතරයි. විහාරස්ථානය සතු ඉඩම් හෝ වෙනත් රජයේ ඉඩම්වලට මැදිහත්වීමේ අයිතියක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට නැහැ. ඒ නිසා තමයි මේ පිළිතුර ලබා දීලා තිබෙන්නේ. ඒ සම්බන්ධව මොනවා හෝ ගැටලුවක් තිබෙනවා නම් ඔබතුමා ඊට මැදිහත් වෙන්න. අපිට ඊට අදාළව පිළිතුරු ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම එම ගැටලු විසඳන්න පුළුවන්කමකුත් තිබෙනවා.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම්වල ඔප්පු සහ බලපත්‍ර එක්ලක්ෂ අසූදාහක් විතර අපිට දෙන්න තිබුණා. පසු ගිය දවස්වල අපි එයින් දොළොස්දාහකට ඔප්පු ලබා දුන්නා. මේ වනකොට එක්ලක්ෂ තිස්දාහකට විතර ඔප්පු ලබා දීලා තිබෙනවා. අවුරුද්ද අවසාන වනවිට අපි බලාපොරොත්තු වනවා, ඒ එක්ලක්ෂ අසූදාහටම ඔප්පු ලබා දීලා අවසන් කරන්න. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම්වල ගැටලු තිබෙනවා නම් ඔබතුමා මැදිහත් වුණොත් අපිට සතියක් වාගේ ඇතුළත විසඳලා දෙන්න පුළුවන්. මොකද, මේ දවස්වල අපි ඒ වාගේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. එහෙම නැති වුණත් මෙම මාසයේ අන්තිම වනකොට මා ඔබතුමන්ලාගේ උඩවලව කලාපයට එනවා. මහවැලි ඉඩම් සම්බන්ධයෙන් ප්‍රධාන ගැටලු තිබෙනවා නම් අපිට එතැනදී ඒ ගැටලු පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්කම තිබෙනවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
බොහොම ස්තුතියි.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා අපේ ප්‍රදේශයට පැමිණෙනවා නම් වැදගත් වනවා. මා ඔබතුමාට මේ කාරණය කියන්නේ මේ ගැටලුව ගැන අවබෝධයක් ලබා ගන්නයි. මේ නගරයේ තිබෙන මහවැලි ඉඩම්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් හඳුනාගෙන නැහැ. ඔබතුමා සතියකින් අපේ ප්‍රදේශයට එනවා නම් මේ ඉඩම් ටික අයිති කාටද කියලා අද හෙටම නියෝගයක් ලබා දෙන්න. කඩ පේළියක් ගත්තාම එක කඩයක් මහවැලියට අයිතියි කියලා කියනවා; අනික් කඩ දෙක පන්සලට අයිතියි කියලා කියනවා. එහෙම වෙන්න බැහැනේ. ඒක නිසා මෙහි නිසි හඳුනා ගැනීමක් කරන්න. මම නේවාසික ව්‍යාපෘති කළමනාකාරතුමාගෙනුත් - RPMගෙනුත්- දිගින් දිගටම මේ ගැන විමසීමක් කළා. මේකෙන් වෙන්නේ මේ නගරය තවතවත් පරිහානියට පත් වන එක විතරයි. ඔබතුමා සතියකින් අපේ ප්‍රදේශයට එනවා නම් ඉස්සෙල්ලාම මේ නගරයේ තිබෙන මහවැලි ඉඩම් හඳුනාගෙන, ඒ ව්‍යාපාරිකයන් කැඳවන්න අවස්ථාවක් උදා කර ගන්න.

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
එම ගැටලු නිරවුල් කරලා, ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 307/'18 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.
Question ordered to stand down.

ඔඩ්ඩුසුඩ්ඩාන්හි පිහිටි උළු කර්මාන්තශාලාව : 2016 අය වැය ප්‍රතිපාදන
ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலை: 2016 வரவு செலவுத்திட்ட ஒதுக்கீடு
TILE FACTORY IN ODDUSUDAN : ALLOCATION FROM BUDGET 2016

380/'18

12.ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩිසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති උළු කර්මාන්තශාලාව ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(ii) මෙම කර්මාන්තශාලාව සඳහා 2016 වර්ෂයේ අය වැයෙන් වෙන් කළ මුදල් ප්‍රතිපාදනය කොපමණද;

(iii) එම මුදල විය‍දම් කරනු ලැබුවේ කවුරුන් හරහාද;

(iv) එම වෙන් කරන ලද මුදලින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சி மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைதீவு மாவட்டத்தில், ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள ஓட்டுத் தொழிற்சாலை செயற்படுவதில்லை என்பதை அறிவாரா;

(ii) இத்தொழிற்சாலைக்கு 2016ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தின்மூலம் ஒதுக்கப்பட்ட நிதி ஏற்பாடு எவ்வளவு;

(iii) மேற்படி பணத்தொகை யாரினூடாகச் செலவு செய்யப்பட்டது;

(iv) ஒதுக்கப்பட்ட மேற்படி பணத்தொகையின்மூலம் மேற்கொள்ளப்பட்ட பணிகள் தொடர்பான விபரங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development :

(a) Will he inform this House-

(i) whether he is aware that the tile factory located in the Oddusudan Divisional Secretary's Division in the Mullaitivu District is no longer functioning;

(ii) what provision was allocated from the Budget 2016 for this factory;

(iii) through whom those funds were spent; and

(iv) the details of the activities carried out using these funds?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 2016 වර්ෂයේ අය වැයෙන් කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කර නොමැත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
Hon. Minister. I know that some money has already been allocated for that from this year's Budget.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We have not allocated any money from the Budget 2016. Your question is, "මෙම කර්මාන්තශාලාව සඳහා 2016 වර්ෂයේ අය වැයෙන් වෙන් කළ මුදල් ප්‍රතිපාදනය කොපමණද?" You have asked about the allocation from the Budget 2016. But, we have not allocated any money in 2016.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Minister, we are aware that some monies have been spent supposedly on the allocation made in 2016. In the final speech of the Minister of Finance during the Budget 2016, he did mention this factory also and subsequently, some monies were allocated - not in the original allocation, but subsequently, some monies were allocated and some work had been started and later, stopped. - [*Interruption.*] The Hon. (Mrs.) Shanthi Sriskandarasa says that the work had also been completed, but the factory has not been made functional. So, that is the question that is being asked. Why is it not functioning?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No. Her question was whether we allocated monies for that from the Budget 2016. We have not, but if you say some monies were allocated after that, I will look into it.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Monies were subsequently allocated and the factory was repaired, but it has not been made operational.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will look into it.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you.

රාජ්‍ය වතු කම්කරුවන් : සේවක අර්ථසාධක අරමුදල්

அரச தோட்டத் தொழிலாளர்கள் : ஊழியர் சேமலாப நிதி

GOVERNMENT OWNED ESTATE WORKERS: EMPLOYEES' PROVIDENT FUND

381/'18

13.ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රජයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුවල සේවය කරන කම්කරුවන්ගේ වැටුපෙන් අඩු කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් හා පාරිතෝෂික දීමනා 2016 වර්ෂය අවසන වනවිටත්, වර්ෂ ගණනාවක සිට එම කම්කරුවන්ට ගෙවා නැති බව පිළිගන්නේද;

(ii) මෙම වතුවල සේවයේ යෙදී සිටින කම්කරුවන් සංඛ්‍යාව හා මේ වනවිට ඔවුන්ට ගෙවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අරමුදල් ලැබිය යුතු සමහර කම්කරුවන් මේ වනවිට මියගොස් ඇති අතර මෙම මුදල් ඔවුන් වෙත නොගෙවීමෙන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හට බරපතළ අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(iv) මෙම මුදල් වහාම කම්කරුවන්ට ගෙවීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

අරස තොළිල්මුයට්සිකළ් මට්රුම් කණ්ඩි නකර අපිවිරුත්ති අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) அரசாங்கத்திற்குச் சொந்தமான மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்கும் அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனத்திற்கும் சொந்தமான தோட்டங்களில் சேவையாற்றுகின்ற தொழிலாளர்களின் சம்பளத்திலிருந்து கழிக்கப்படுகின்ற ஊழியர் சேமலாப நிதியம், ஊழியர் நம்பிக்கைப்பொறுப்பு நிதியம் மற்றும் பணிக்கொடைக் கொடுப்பனவு ஆகியன 2016ஆம் ஆண்டு இறுதியளவிலும், பல வருடங்களாகவும் மேற்படி ஊழியர்களுக்குச் செலுத்தப்படவில்லை என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) மேற்படி தோட்டங்களில் சேவையில் ஈடுபட்டுள்ள தொழிலாளர்களின் எண்ணிக்கை மற்றும் இற்றைவரை இவர்களுக்குச் செலுத்த வேண்டிய நிலுவைப் பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) நிதியங்கள் கிடைக்க வேண்டிய சில தொழிலாளர்கள் ஏற்கனவே இறந்துள்ளனர் என்பதோடு இப்பணத்தொகை இவர்களுக்குச் செலுத்தப்படாமையின்மூலம் இவர்களது குடும்ப அங்கத்தவர்களுக்குப் பாரிய அநீதி நேர்ந்துள்ளதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) இப்பணத்தொகையை உடனடியாகத் தொழிலாளர்களுக்குச் செலுத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(v) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development :

(a) Will he inform this House-

(i) whether he admits that the Employees' Provident Fund contributions, Employees' Trust Fund contributions and gratuity payments deducted from the salaries of the workers of the estates belonging to the Janatha Estates Development Board and the State Plantations Corporation had not been paid to the workers even at the end of 2016;

(ii) the number of workers employed in these estates and the outstanding amounts to be paid to them, separately;

(iii) whether he admits that a grave injustice has been caused to the family members of some of the workers who were to receive the payments and are now dead, as a result of not making those payments; and

(iv) whether steps would be taken to make those payments to the workers immediately; and

(v) if so, when?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

(ii)

	ජනතා වතු සංවර්ධන මණ්ඩලය 2017.10.31 දිනට	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 2017.10.31 දිනට	ආයතන දෙකෙහිම හිඟ ගෙවීම්
කම්කරුවන් ගණන	4,161	3,549	
හිඟ සේවක අර්ථසාධක අරමුදල	රු. 705,317,151.17 (මිලි. 70.5)	රු. 463,515,626.00 (මිලි. 46.35)	1,168,832,777.11
හිඟ සේවා නියුක්ති භාරකාර අරමුදල	රු. 33,356,519.09 (මිලි. 3.33)	රු. 38,212,087.00 (මිලි. 3.82)	71,568,406.09
හිඟ පාරිතෝෂික දීමනා	රු. 484,219,426.46 (මිලි. 48.4)	රු. 211,879,148.00 (මිලි. 21.18)	696,098,574.46
මුළු හිඟ ගෙවීම්වල එකතුව	රු. 1,222,893,096.76	රු. 713,606,861.00	1,936,499,757.76

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

(iii) ඔව්.

(iv) ඔව්.

(v) රාජ්‍ය වැවිලි සංස්ථාව 2018 වර්ෂය අවසාන වනවිටත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලය 2019 වර්ෂය අවසාන වනවිටත් සියලු හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, කම්කරුවන්ට ගෙවිය යුතු සියලුම හිඟ මුදල් ගෙවීමට ගන්නා පියවර හා දින වකවානු පිළිබඳව කිව්වේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු මන්ත්‍රීතුමනි, චන්ද්‍රිකා මැතිනිය අවුරුදු 10ක් මේ රට පාලනය කළා; මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු 10ක් මේ රට පාලනය කළා. ඒ අවුරුදුරු 20 තුළදී එම සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික දීමනා, සේවක අර්ථසාධක අරමුදල් ගෙවා තිබුණේ නැහැ. ඒ අවුරුදු 20ටම -[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. දින 100 ආණ්ඩුවේදී මම වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. හිටපු මුදල් ඇමති ගරු රවි කරුණානායක මැතිතුමා ඒ සඳහා රුපියල් මිලියන 1,800ක් වෙන් කළා. එසේ මුදල් වෙන් කළ නිසා, පසුගිය අවුරුදු 3-4 ඇතුළත අපි ගෙවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය ටික ටික අඩු කරගෙන ආවා. 2015 තිබුණ හිඟ මුදල බලන්න, රුපියල් මිලියන 2.310යි; over Rs. 2,000 million.

රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමා අපට මුදල් ලබා දුන් නිසා අදට හිඟය තිබෙන්නේ රුපියල් මිලියන 386යි. මේක තේරුම් ගන්න ඕනෑ. අපි නිහඬව ඉඳලා නැහැ. 2015දී අපේ යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණු විගස අවුරුදු 20ක් ගෙවා නැති EPF contributions, gratuity ගෙවීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා රුපියල් මිලියන 1,700ක මුදල් ලබාගෙන, ඒ මුදල් ටික ටික ගෙවලා, 2015 වන විට තිබුණු රුපියල් මිලියන 2,310ක හිඟ මුදල අද වනකොට රුපියල් මිලියන 386 දක්වා අඩු කරලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමාට දීලා තිබෙන්නේ වැරැදි තොරතුරක් කියලා මා විශ්වාස කරනවා. මා ඒ පිළිබඳව ඔබතුමාට පැහැදිලි කරන්නම්. ඔබතුමා කිව්වා වාගේ මේ සියලු වකවානුවල ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව කියන ආයතන දෙකෙන්ම සේවකයන්ට ගෙවිය යුතු විශාල මුදලක් තිබුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වශයෙන් සිටි කාලයේ මාත්, ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව කථා කරලා, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට රුපියල් මිලියන තුන්සිය ගණනක් මහා භාණ්ඩාගාරයෙන් අරගෙන දුන්නා. වැවිලි කර්මාන්ත අමාත්‍ය නවීන් දිසානායක අමාත්‍යතුමා ඒ ගැන දන්නවා. ඔබතුමන්ලා 2015දී ගෙවිවේ අපි අරගෙන දීපු සල්ලි. [බාධා කිරීමක්] ඇමතිතුමනි, මට තත්පරයක් දෙන්න. මා වැරැදි නම්, නිවැරැදි කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාත් රුපියල් මිලියන ගණනක් ගෙව්වා. නමුත් මා කියන්නේ, 2015දී මා වැවිලි කර්මාන්ත ඇමති වශයෙන් ඒ අමාත්‍යාංශ භාර ගන්නකොට රුපියල් මිලියන 2,310ක් හිඟ තිබුණාය කියලායි. මා දන්නවා, 2015ට කලින් අපේ රත්වත්තෙ මහත්මයා සභාපති වශයෙන් සිටි කාලයේ එතුමා ඒ ගැන කටයුතු කළා කියලා. හැබැයි, 2015දී රුපියල් මිලියන 2,310ක් හිඟ තිබුණා. අපි ටික ටික ගෙවලා ඒ මුදල රුපියල් මිලියන 386 දක්වා අඩු කරලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමා මට ප්‍රශ්නය අහන්න දුන්නේ නැහැ. ගරු ඇමතිතුමා මට බාධා කරන්නේ නැතුව මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අපි ලබා දීපු මුදල් සේවකයන්ට ගෙවන්නේ නැතුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තබාගෙන ඉඳලා, පසුගිය දවස්වල තමයි ගෙව්වේ. ඒකයි මා කියන්නේ. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කිසිම සේවකයකුගේ සේවක අර්ථසාධක අරමුදල් මේ වනවිට ගෙවලා නැහැයි කියලා මා ඔබතුමාට කියනවා. මුදල් ඇමතිතුමනි, මා ඔබතුමාටත් කියනවා. අපි ඒ කාලයේ මහා භාණ්ඩාගාරයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට ලබාගත් තවත් රුපියල් මිලියන ගණනක් ගෙවන්නේ නැතුව තබාගෙන ඉන්නවා. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අපි අරගෙන දීපු සල්ලි ටික කඩිනමින් ගෙවන්නය කියලා.

ගරු ඇමතිතුමනි, දෙවන කාරණය මෙයයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමේ කාරණය පැත්තකට දමන්න. අඩු ගණනේ සේවකයා මැරුණාට පස්සේ මිනී පෙට්ටිය ගන්නවත් සල්ලි දෙන්නේ නැහැ. සේවක අර්ථසාධක අරමුදල් ලැබෙන තෙක් අඩු ගණනේ එවැනි විශේෂ දීමනාවක්වත් -මිනී පෙට්ටියටවත්- ගෙවන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අඩු පාඩුකම් තිබෙනවා.

මම මෙතුමාට පැහැදිලිව කියනවා, අපි යහපාලන ආණ්ඩුව භාර ගන්නකොට රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන ආයතන දෙකේම සේවකයන්ට ගෙවීම සඳහා රුපියල් මිලියන 2,310ක හිඟ මුදලක් තිබුණා. අද අපි එය රුපියල් මිලියන 386 දක්වා අඩු කරලා තිබෙනවා. රවි කරුණානායක මැතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ එම මුදල ගෙවන්න රුපියල් මිලියන 1,800ක් වෙන් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14, ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, අද පස්වරු 2.30ට රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රැස්වීමට නියමිතව

තිබෙනවා. අද දින න්‍යාය පත්‍රයේ නියෝජ්‍ය කථානායකතුමා තෝරා ගැනීම යනාදී වැදගත් දේ තිබෙන නිසා, ඒ කාරක සභාවල සභාපතිවරු තෝරා ගැනීම කල් දමන්න කියා ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක වෙන දවසකට ගන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
එම කාරක සභා පසුව රැස්වෙන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
දැන් පස්වරු 2.30ටත් ළඟයි. එම කාරක සභා පසුව රැස්වෙන්න කියලා තමයි අපි ඉල්ලන්නේ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නියෝජ්‍ය කථානායකතුමා තේරීම නොවෙයි; COPE, PAC සභාපතිවරු පත් කිරීම.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
First, we will elect the Deputy Speaker.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ කාරක සභා දෙක පස්වරු 2.30ට රැස්වෙන කොට අපට ඒවාට සහභාගි වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒවා කල් දමන්න. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ඒවා පසුවට තබන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, එකඟයි.

ප්‍රශ්න අංක 14 -475/'18- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ත විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.
Question ordered to stand down.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, COPE අද රැස් වෙනවා නම් අද ඒ කමිටුවට නිලධාරීන් තෝරා ගන්න ඕනෑ. [බාධා කිරීම්] හොරු ඉන්නවාද නැද්ද කියන එක අනිත් අය තෝරා ගනියි. පස්වරු 2.30ට රැස්වෙන්නේ නැතුව අපි ඒ වෙලාව කල් දමා ගන්නම්. ඒක වෙනම කාරණයක්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් නියෝජ්‍ය කථානායකතුමා තෝරනවා. ඊට පස්සේ ඒ කාරක සභාවල සභාපතිවරු පත් කර ගන්න පුළුවන්. ඒ සඳහා සභාව එකඟද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
Sir, they can meet after the election.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Okay.

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඔබතුමාට අවස්ථාවක් දෙන්නම්, ඉන්න.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ඉන්ෆ්ලුවන්සා උණ රෝගය පාලනය
இன்புளுவென்சா வைரஸ் காய்ச்சலைக் கட்டுப்படுத்தல்
CONTROL OF INFLUENZA VIRAL FEVER

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27.(2) යටතේ, මම මේ ප්‍රශ්නය අහන්නේ, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන්.

එතුමාට ලෝක සෞඛ්‍ය සංවිධානයේ උප සභාපතිකමත් ලැබී තිබෙනවා. ගරු ඇමතිතුමනි, එහේ නතර වෙන්න බැරිද? [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, ලංකාවේ දකුණු පළාතේ ඉන්ෆ්ලුවන්සා උණ රෝගය ව්‍යාප්ත වීම පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

[ගරු අනුර දිසානායක මහතා]

වසංගත තත්ත්වයක් පෙන්නුම් කරමින් දකුණු පළාතේ පැතිර යන ඉන්ෆ්ලුවන්සා උණ රෝගය හේතුවෙන් කරාපිටිය ශික්ෂණ රෝහලේ මේ වන විට කුඩා දරුවන් ඇතුළු 14 දෙනකු මිය ගොස් ඇති බවත්, දහසකට ආසන්න රෝගීන් ප්‍රමාණයක් පළාතෙන් වාර්තා වන බවත්, ජනමාධ්‍ය වාර්තා කර තිබෙනවා. එසේම, දකුණු පළාතේ ප්‍රධානතම රෝහල වන ගාල්ල, කරාපිටිය ශික්ෂණ රෝහලේ වාට්ටු පිරී ඇති බවත්, පොදුවේ සියලු රෝහල්වල දැඩි සත්කාර ඒකකයට තවත් රෝගීන් ඇතුළත් කළ නොහැකි තත්ත්වයක් ඇති බවත් වාර්තා වනවා. විශේෂයෙන්ම මෙවැනි රෝගයක් ව්‍යාප්ත වෙද්දී වෛද්‍යවරුන් සියයකගේ පමණද, කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ තුන්සියයකගේ පමණද පුරප්පාඩු ඇතිව කරාපිටිය ශික්ෂණ රෝහල පවත්වාගෙන යෑම අසීරු තත්ත්වයක් බවද පැවසෙනවා.

පසු ගිය දිනවල රෝගය පැතිරීම වැළැක්වීම සඳහා පාසල් වසා තැබීම වැනි තාවකාලික ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර, පෞද්ගලික අංශයේ රෝහල්වල දැඩි සත්කාර ඒකක පාවිච්චියට ගන්නා ලෙස කළ ඉල්ලීම ප්‍රායෝගික නොවී ඇති බවද වාර්තා වුණා. මේ රෝගය පිළිබඳව රජයේ පාර්ශ්වයෙන් සත්‍ය හා නිරවුල් තොරතුරු වගකීම් සහගතව සමාජගත නොවීම හේතුවෙන් ජනතාව, විශේෂයෙන් දෙමවුපියන් තම දරුවන් සම්බන්ධයෙන් දැඩි බියකින් පසුවනවා.

එසේම මෙම රෝගය වසංගත මට්ටමකට පැමිණීමට පෙර වළක්වා ගැනීමේ ක්‍රමවේද ක්‍රියාත්මක වූයේද යන්න ගැටලු සහගතයි. මෙය මහජන අවධානය උත්සන්න වූ පසු සිදු කෙරෙන ජනමාධ්‍ය ප්‍රචාරයෙන් ඔබ්බට ගිය සැලසුම්සහගත වැඩ පිළිවෙළක් විය යුතුව තිබෙනවා. විශේෂයෙන් වැසි සමයෙන් පසුව එන ඉදිරි මාසවලදී නැවතත් ඩෙංගු රෝගය හිස එසවිය හැකියි. මෙවැනි රෝගයකට මුහුණ දීමේදී පූර්ව සූදානමක් තිබීම අනිවාර්යයි.

මේ තත්ත්වය තුළ පහත සඳහන් ගැටලුවලට ගරු ඇමතිතුමා විසින් පිළිතුරු ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වනවා.

1. පැතිර යමින් ඇති මෙම රෝගය හා රෝගීන් පිළිබඳ නිවැරදි සංඛ්‍යා දත්ත කවරේද?
2. රෝගය පිළිබඳ තොරතුරු ග්‍රාමීය මට්ටමින් වගකීම් සහගතව සමාජගත කිරීම සඳහා ආණ්ඩුව සතු වැඩ පිළිවෙළ කුමක්ද?
3. මෙම රෝගය වසංගත මට්ටමට පත්වීම වළක්වා ගැනීම සඳහා වන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පූර්ව සූදානම කවරේද?
4. රෝගය ව්‍යාප්ත වන ප්‍රදේශවල රෝහල්වල රෝගීන් සඳහා වන පහසුකම් හා කාර්ය මණ්ඩල අඩු පාඩු සම්පූර්ණ කිරීම සඳහා කිනම් වැඩ පිළිවෙළක් තිබේද?
5. මෙම රෝගය ව්‍යාප්ත වීම පාලනය කර ඇති බවට ආණ්ඩුව ජනතාවට සහතික වන්නේද?

ඉහත ප්‍රශ්නවලට පිළිතුරු ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට අවස්ථාව දෙන්නම්, ප්‍රධාන කටයුතු ආරම්භ වන කොට.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා, ඔබතුමාත් මේ ගැන යමක් කියනවාද?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ඇමතිතුමා මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කලින් මටත් ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා. කරාපිටිය ශික්ෂණ රෝහලේ ළමා රෝග අංශයේ විශේෂ ළමා රෝග ඒකකයට -Pediatric Intensive Care Unit එකට- ඇඳන් 8ක් සහ ඊට අවශ්‍ය තවත් බඩු ලබා දීලා එම ඒකකය විධිමත් කරනවා කියලා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් කිව්වත්, අද වන තෙක් ඒ කටයුත්ත සිද්ධ වෙලා නැහැ. ඊට අමතරව මේ රෝගීන් ප්‍රමාණය වැඩිවීම නිසා වෛද්‍යවරු සහ හෙද කාර්ය මණ්ඩලය අධික වෙහෙසට පත් වෙලා සිටිනවා. පසුගිය කාල වකවානුවේ සතියක් පාසල් වහන්න ගත් තීරණය හොඳ තීරණයක්. එම නිසා මේ රෝගය පැතිරී යෑම යම් පමණකට මර්දනය වුණාය කියලා වෛද්‍යවරු විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, වෛද්‍යවරු සහ හෙද කාර්ය මණ්ඩල දැන් පෞද්ගලික අංශයේ රෝහල්වලට ගිහිල්ලා තමන්ගේ වියදමින් මේ ඉන්ෆ්ලුවන්සා එන්නත ලබා ගන්නවා. මොකද, constant exposure එක නිසා තමන්වත් මෙම රෝගයට ගොදුරු වෙයි කියන භයකින් තමයි රෝහල් කාර්ය මණ්ඩලය ඉන්නේ. ඒ පිළිබඳව මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ වාගේම යම් කිසි සිද්ධි මාලාවක් නිසා මේ වසංගත රෝගී අංශය - Epidemiology Unit එක - සහ වසංගත රෝග පිළිබඳ වෛද්‍යවරු - Epidemiologists - නිවැරදි දත්ත සම්ප්‍රේෂණය නොකරනවාය කියන මතයක් රෝහලේ වෛද්‍යවරු අතර බොහොම පැහැදිලිව තිබෙනවා. එම නිසා රෝග වළක්වා ගැනීම පිළිබඳ ක්‍රමවේදය අකර්මණ්‍ය වෙලා තිබෙනවා. මේ පිළිබඳව කඩිනමින් අවධානය යොමු කරන්න. මොකද, දකුණු පළාතේ දෙමවුපියන් තමන්ගේ දරුවන් පොදු ස්ථානයකට යැවීමට විශාල බියකින් සිටිනවා, ගරු ඇමතිතුමනි. බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, මෙය බැරෑරුම් ප්‍රශ්නයක් නිසා ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්න ඔබතුමා කැමැතිද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
හොඳයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් යාප්පා අපේවර්තන)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු ඇමතිතුමනි, මේ රෝගයෙන් 35දෙනෙකු මැරුණා. ඊයේ කියනවා, නිවුමෝනියාවෙන් 15දෙනෙකු මැරිලා කියලා. අනෙක් අය මැරුණේ Influenza A virus එකෙන් කියලා කියනවා. ගැබිනි මවකුත් මැරිලා තිබෙනවා. ඒ මරණයට හේතුව වශයෙන් මුලදි කිව්වේ නිවුමෝනියාව කියලා. ඊට සතියකට පස්සේ කියනවා, ඒ මරණයට හේතුවත් Influenza A virus එක කියලා. විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික්කය ඇතුළු දකුණු පළාත තුළ මෙම රෝගය සම්බන්ධයෙන් භයානක තත්ත්වයක් මවා ගෙන තිබෙනවා. එම නිසා පාසල් වසා දරුවන් නිවෙස්වලට යවනවා. එක පාසලකින් ළමයි 15දෙනා, 20දෙනා යවනවා. දැනටත් පාසල් ළමුන්ගේ පැමිණීම අඩු වෙලා තිබෙනවා. පෙර පාසල් පවා වසා තිබෙනවා. මේ තත්ත්වය නිසා මහ ජනතාව තුළ භයක් ඇති වෙලා තිබෙනවා. මේ රෝගයට කරන ප්‍රතිකාර සම්බන්ධයෙන් දැනට අපට ගැටලුවක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ රෝගය සම්බන්ධයෙන් ප්‍රතිකාර කරනවා. නමුත්, මේ රෝගය මර්දනය කිරීම සඳහා මහ ජනතාව විධිමත් ලෙස දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් විශාල වශයෙන් දියත් කර මේ වසංගත රෝගී තත්ත්වය පිළිබඳව ජනතාවට නිසි අවබෝධයක් ලබා දෙන්න ඕනෑ. ඒ සඳහා කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් තවත් මන්ත්‍රීවරුන් ප්‍රශ්න ඉදිරිපත් කරන්න අවසර ඉල්ලනවා. අද වනකොට ඇති වී තිබෙන මේ තත්ත්වය නිසා, ඒ සම්බන්ධයෙන් එතුමන්ලාට පිළිතුරු දෙන්න ඔබතුමා කැමැතිද?

එහෙම නැත්නම්, මට මේ සම්බන්ධයෙන් තවත් අවස්ථාව දෙන්න අමාරුයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්තිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්තිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
දැනට පෞද්ගලික රෝහල්වලත්-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය කෙටියෙන් ඉදිරිපත් කරන්න. කියපු කරුණුම repeat කරන්න එපා. එතුමාට පිළිතුරු දෙන්න කාලය මදි වෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්තිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
නැහැ, නැහැ. මේ එකම රෝගය ගැන නේ කියන්නේ.

ගරු ඇමතිතුමනි, පෞද්ගලික රෝහල්වලත් ඉඩකඩ නැති තත්ත්වයක් තිබෙන මේ අවස්ථාවේ, මෙම එන්නත නොමිලේ එම රෝහල්වලටත් යවන්න පුළුවන්කමක් නැද්ද කියලා මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(මාණ්පුමිකු (වෛද්‍යිය කලානිදි) (තිරුමදි) සුදර්ෂිණි පර්නාන්දුපුළ්ළේ)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය. කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(මාණ්පුමිකු (වෛද්‍යිය කලානිදි)(තිරුමදි) සුදර්ෂිණි පර්නාන්දුපුළ්ළේ)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු කථානායකතුමනි, වසංගත රෝග මර්දනය කරන්නේ වසංගත රෝග ඒකකයෙන්. ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ තනතුරට මෙපමණ කලක් පත් කර තිබුණේ, ප්‍රජා වෛද්‍ය පිළිබඳ විශේෂඥවරයෙක්. වසංගත රෝග මර්දනය සම්බන්ධයෙන් මේ රටේ සහ ජාත්‍යන්තරව පුහුණු කරපු ප්‍රධාන වෛද්‍යවරයකු තමයි පත් කරන්නේ. නමුත්, දැනට පරිපාලන ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරයකු පත් කර තිබීමත් මෙම වසංගත රෝග මර්දනයට ලොකු බාධාවක් වෙලා තිබෙනවා. අනෙකුත් වෛද්‍යවරුන් ඔහුගෙන් තාක්ෂණික උපදෙස් ලබා ගැනීම ප්‍රතික්ෂේප කරලා තිබෙනවා, ඔහුට මේ තාක්ෂණික උපදෙස් දෙන්න බැරි නිසා. ඒ නිසා මේ පිළිබඳවත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර)
(The Hon. Kanchana Wijesekera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා, කෙටියෙන් ප්‍රශ්නය අහන්න. අද, ප්‍රධාන වැඩ කටයුතු රාශියක් තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහන්න තිබෙන්නේ වැදගත් කරුණක් ගැනයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වැදගත් කරුණක් නිසා තමයි අවස්ථාව දෙන්නේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, මාතර දිස්ත්‍රික්කයේ මෙම වසංගත රෝගය පැතිරීම නිසා අද දවසේ ජනතාව අතර භීතිකාවක් ඇති වෙලා තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ පසුගිය සතියේ පාසල්, පෙර පාසල් වසා දැමීම නිසා මෙම වසංගත රෝගය ව්‍යාප්ත වීම නැවතුණා කියලා මතයකුත් තිබෙනවා. මෙම රෝගයට ගොදුරු වුණු , ශිෂ්‍යත්ව විභාගය හා වෙනත් පාසල් කටයුතු වෙනුවෙන් උපකාරක පන්තිවලට යන කුඩා දරුවන් විශාල පිරිසක් සිටිනවා, ගරු කථානයකතුමනි. ඒ නිසා මේ කෙරෙහි විශේෂයෙන්ම ආණ්ඩුවේ අවධානය යොමු කරවනවා. ගංවතුරට දිස්ත්‍රික්ක 8ක් යටවෙලා තිබෙනවා. ඒ වාගේම මෙම වසංගත රෝග තත්ත්වය නිසා උපකාරක පන්තිවලට යන්න බැරිව බොහෝ පිරිසක් ඉන්නවා. එම නිසා ශිෂ්‍යත්ව විභාගය සහ අනෙකුත් විභාග පැවැත්වෙන දිනයන් තව ටිකක් එහාට කල් දමන්න පුළුවන් නම්, මෙම රෝගය ව්‍යාප්ත වීම වළක්වා ගන්න පුළුවන් හොඳ තීන්දුවක්ය කියලා මම හිතනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මැතිතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානයට වැදගත් කරුණු කිහිපයක් යොමු කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමාට ප්‍රශ්න ගොඩක් යොමු කරලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එක් කරුණක් තමයි මාතර නගරයේ තිබෙන මහ රෝහලට අමතරව කොටවිල ප්‍රදේශයේ විශාල ඉඩ ප්‍රමාණයක් තිබෙන රෝහලක් ගොඩනඟලා තිබෙනවා. මෙම රෝහලට විශාල ඇඳන් ප්‍රමාණයක් ලබා දීලා, මෙම රෝගීන් වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කළ හැකි වන පරිදි වෙනමම ඒකකයක් ඇති කරන්න පුළුවන්කම තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන අතරේ, වැදගත්ම දේ තමයි ගම් මට්ටමින් ජනතාව දැනුවත් කිරීම. ඒක දැනට කරන්නේ මාතර මාධ්‍යවේදීන්. ඒක ඇත්තටම අපි කරන්න ඕනෑ දෙයක්. නමුත්, මාධ්‍යවේදීන් ඒ කටයුත්ත කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සෞඛ්‍ය ඇමතිතුමාට ප්‍රශ්න බොහෝ ගණනක් යොමු කරලා තිබෙනවා. එතුමාට අවස්ථාව දෙන්න. ගරු සෞඛ්‍ය ඇමතිතුමා, පිළිතුරු දෙන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ 27(2) යටතේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

සෑම වසරකම පාහේ අප්‍රේල්, ජුනි මාසවල ඉන්ෆ්ලුවන්සා වැනි ශ්වසන රෝග බහුල වන අතර, මෙවර දකුණු පළාතෙන් එවැනි වසංගත රෝග තත්ත්වයක් වාර්තා වී ඇත. මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා සෞඛ්‍ය අංශ විසින් අවශ්‍ය කටයුතු සලසා ඇත.

දකුණු පළාතේ වසංගත තත්ත්වය පිළිබඳ හා එය තවදුරටත් වළක්වා ගැනීම සඳහා ගන්නා පියවර පහතින් දැක්වේ.

1. ඉන්ෆ්ලුවන්සා රෝගය යනු උණ, කැස්ස, හෙම්බිරිස්සාව, හුස්ම ගැනීමේ අපහසුව වැනි රෝග ලක්ෂණ පෙන්නුම් කරන රෝගී තත්ත්වයකි. ඉන්ෆ්ලුවන්සාවට අමතරව මෙවැනි රෝග ලක්ෂණ පෙන්නුම් කරන වෙනත් රෝගද ඇත. බොහෝ විට මෙවැනි රෝගීන් බාහිර රෝගී අංශයෙන් සහ පෞද්ගලික වෛද්‍ය ආයතනවලින් ප්‍රතිකාර ගනු ලබයි. සාමාන්‍ය පුද්ගලයන්ට මෙය සුළු අසනීප තත්ත්වයක් නමුත් සමහර රෝගීන්ට විශේෂයෙන් අවදානම් කණ්ඩායම්වල සිටින අයට (කුඩා දරුවන්, ගර්භනී මව්වරුන්, දීර්ඝ කාලීන රෝගවලින් පෙළෙන) සංකූලතා ඇතිවිය හැක. මෙම රෝගයෙහි එම සුවිශේෂී ලක්ෂණ නොමැති, එනම් non-specific ස්වභාවය නිසා රෝගය වැළඳුණු සංඛ්‍යාව නිශ්චිතවම කිව නොහැක.

   ඉහත සඳහන් රෝග ලක්ෂණ සහිතව ඉන්ෆ්ලුවන්සා යයි සැක කරන රෝහල්ගත කර ඇති දකුණු පළාතේ රෝගීන්ගේ සංඛ්‍යාව පහත දැක්වේ.

දිනය	ගාල්ල	මාතර	හම්බන්තොට	එකතුව
2018.05.21	448	158	59	665
2018.05.22	68	0	49	117
2018.05.23	67	76	51	194
2018.05.24	74	86	29	189
2018.05.25	89	105	46	240
2018.05.26	89	70	57	216
2018.05.27	83	75	80	238
2018.05.28	80	88	66	234
2018.05.29	70	76	63	209
2018.05.30	66	72	61	199
2018.05.31	93	88	57	238
2018.06.01	36	58	68	162
2018.06.02	63	40	48	151
2018.06.03	52	30	41	123
එකතුව	930	864	716	2,510

   මේ අනුව අපට පෙනෙනවා, 2018.05.31වන දිනෙන් පසුව මේ රෝගීන් සංඛ්‍යාව භාගයකින් පමණ අඩු වෙලා තිබෙන බව. කරාපිටිය ශික්ෂණ රෝහලේ දරුවන් 14දෙනකුද, වැඩිහිටි එක් අයෙකුද මෙම රෝගයෙන් මිය ගිය බවට වාර්තා වී ඇත.

2. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්ය මණ්ඩලය හරහා මෙම රෝගය පිළිබඳ ජනතාව නිරන්තරයෙන් දැනුවත් කෙරේ. විශේෂයෙන් මාතෘ හා ළමා සායන, රෝහල් සායන හා ප්‍රජා වැඩසටහන් මඟින්ද, පෝස්ටර් මඟින්ද ජනතාව දැනුවත් කෙරේ. මීට අමතරව රූපවාහිනී මාධ්‍ය මඟින් ජනතාව දැනුවත් කිරීමේ දැන්වීම්ද ප්‍රචාරය කෙරේ.

3. මුළු රට පුරා විහිදෙන පරිදි ලංකාවේ ප්‍රධාන රෝහල් 19කින් තොරතුරු ලබා ගන්නා විශේෂිත ආවේක්ෂණ පද්ධතියක් - Sentinel Sites Surveillance System - ඇත. මෙම රෝහල් සතිපතා ඔවුනගේ රෝහල්වලට ප්‍රතිකාර සඳහා පැමිණෙන ඉන්ෆ්ලුවන්සා වැනි රෝග සහිත සංඛ්‍යාව වසංගත රෝග අංශයට වාර්තා කරයි. මෙමඟින් එම රෝගීන්ගේ වැඩිවීමක් ඇත්දැයි කල් ඇතිව හඳුනා ගැනීමත්, ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමත් සිදු කරයි. මාසිකව පවත්වන ජාතික තාක්ෂණික කමිටු රැස්වීමේදී - National Technical Committee Meeting on Avian/ Pandemic Influenza - මෙම දත්ත සමාලෝචනය කරයි. මේ සඳහා වෛද්‍ය පර්යේෂණ ආයතනය පශු වෛද්‍ය ආදී විවිධ අංශවලින් සහභාගී වී ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරයි. හදිසියේ ඇතිවිය හැකි වසංගත තත්ත්වයකට මුහුණදීම සඳහා අවශ්‍ය ආරක්ෂිත උපකරණ - N95 masks - සහ බෙහෙත් - Oseltamivir - අවශ්‍ය ප්‍රමාණ ගබඩා කර තබා ගැනේ. අදාළ සෞඛ්‍ය කාර්ය මණ්ඩල පුහුණුව සිදු කිරීමද නිරන්තරයෙන් සිදු කරයි.

4. දැනටමත් දකුණු පළාත සඳහා අතිරේක විශේෂඥ ළමා වෛද්‍යවරුන් කරාපිටිය රෝහලට දෙදෙනෙකුත්, කඹුරුපිටිය රෝහලට එක් අයෙකුත් වශයෙන් පත් කර තිබෙනවා; Paediatriciansලා තුන්දෙනෙක් වැඩිපුර පත් කර තිබෙනවා. හෙද නිලධාරීන්; කරාපිටිය රෝහලට 20දෙනෙක්, උඩුගම රෝහලට 10දෙනෙක්, කඹුරුපිටිය රෝහලට 10දෙනෙක් ඇතුළු 40දෙනෙක් රෝහල්වලට යවා ඇති අතර, අනෙකුත් අවශ්‍ය පහසුකම් ලබාදීමටත් සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කර ඇත. කුඩා දරුවන්ට අධි පීඩනයෙන් ඔක්සිජන් පෙණහලුවලට ලබාදීම සඳහා අවශ්‍ය කරන high-flow nasal cannulae 10ක් මෙම වසංගත තත්ත්වය ආරම්භයේදීම කරාපිටිය රෝහලට ලබා දෙන ලදී.

   මොකද, මේ හැම රෝහලකටම ICU facilities නැති නිසා රුපියල් කෝටියක් වියදම් කරලා high-flow nasal cannulae 10ක් අපි අරගෙන දුන්නා. කරාපිටිය රෝහලේ ළමා දැඩි සත්කාර ඒකකය පුළුල් කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සහ දකුණු පළාතට අවශ්‍ය කරන උපකරණ සහ පහසුකම් වැඩි දියුණු කිරීමට ටෙන්ඩර් පටිපාටියකින් තොරව ඒ මිලදී ගැනීම් කිරීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර දකුණු පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙත අවසර ලබා දුන්නා. පළාත් සෞඛ්‍ය සේවා අවශ්‍යතාවට පමණක් රුපියල් මිලියන 35ක් මේ වන විටත් වෙන් කර දී තිබෙනවා. ඒ කියන්නේ, ICU එක පුළුල් කිරීම සඳහාත්, ඒ සඳහා අවශ්‍ය සියලුම උපකරණ වෙනමම ගැනීම සඳහාත් කැබිනට් පත්‍රිකාවක් මඟින් අවසර අරගෙන දුන්නා. ඊට අමතරව අවශ්‍ය කටයුතුවලට වියදම් කිරීම සඳහා පළාත් සභා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාට රුපියල් මිලියන 35ක් ලබාදුන්නා.

5. අඛණ්ඩ රෝග ආවේක්ෂණය මඟින් රෝහල්ගත වන රෝගීන් සංඛ්‍යාව අඩුවන බව පෙනේ. සියලුම වෛද්‍ය ආයතන මේ පිළිබඳව දැනුවත් කර ඇති අතර, මෙවැනි රෝගීන්ගේ අසාමාන්‍ය වැඩිවීමක් නිරීක්ෂණය කළේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයට වාර්තා කිරීමට දැනුම් දී ඇත.

   මේ රෝගයෙන් 35දෙනකු මිය ගිහින් කියා අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා. 35ක් නැහැ. එක්තරා ජාතික පුවත්පතක ".lk" කියලාම, මාධ්‍යවේදියෙක් වහාම මට දැනුම් දුන්නා. FM radio channel එකකින් මගෙන් ඇහුවා, ඊයේ හතරදෙනෙක් මිය ගියාද කියලා. මම වහාම මාතර මහ රෝහලට කථා කළා. එහෙන් මට දැනුම් දුන්නා, ඒ හතරදෙනා පහර දීමකින් සහ Encephalitis රෝගයෙන් මිය ගිය අය බව. ඒ සංඛ්‍යාවත් මේකට එකතු කරලා. නිශ්චිත සංඛ්‍යාව, දරුවන් 14යි; වැඩිමහල් එක්කෙනායි. මුළු ගණන 15යි.

අනික් කාරණය තමයි, vaccine එක. අපි කෝටි ගණන් මුදල් වියදම් කරනවා. පසුගිය ආණ්ඩුවට වඩා මේ ආණ්ඩුවෙන් පිළිකා රෝගවලට විතරක් රුපියල් කෝටි 850ක් -මිලියන 8,500ක්- වියදම් කරනවා. ඒ වාගේම stent එක නිකම් දෙන්න තව රුපියල් කෝටි සිය ගණනක් වියදම් කරනවා. මේ vaccine එක දෙන්න පුළුවන්. ඒක ලංකාවේ ලියාපදිංචි කරලායි තිබෙන්නේ. නමුත් මට හෝ අධ්‍යක්ෂවරුන්ට එය තීන්දු කරන්න බැහැ. ඒකට වෙනම Committee එකක් තිබෙනවා. ඒ මම කලින් සඳහන් කළ, "National Technical Committee on Avian/Pandemic Influenza" කියන එකයි. ඒ Committee එකේ වසංගත රෝග විශේෂඥ වෛද්‍යවරු විතරක් නොවෙයි, ඖෂධවේදය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුත් ඉන්නවා. ඒ අය එකතුවෙලා තමයි කටයුතු කරන්නේ.

ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ දැනට ලංකාවේ තිබෙනවා. ඒක ඇමෙරිකාවේ තිබෙනවාටත් වඩා ඉහළයි, සියයට 99.9ක්ම එම ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ පිළිගන්නවාය කියා WHO එක කියනවා. ඒක ලෝකයේ තිබෙන හොඳම වැඩ පිළිවෙළක්. නමුත් ඒ ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ යටතේ වුණත් මේ ගැන කියා නැහැ. මේ වාගේම තමයි ඩෙංගු රෝගය සඳහා එන්නතක් පැමිණි වෙලාවේත් කටයුතු සිද්ධ වුණේ. හැම තැනින්ම කෑගැහුවා; ඒ ඩෙංගු එන්නත ගෙන්වන්නේ නැහැය කියා මාධ්‍යවලින් දොස් කිව්වා. ප්‍රංශ තානාපතිවරයා පෞද්ගලිකව මාව හමුවෙන්න ආවා; ඇවිත් complaint එකක් කළා, මගේ ඖෂධ අධිකාරියේ අය මේක අනුමත කරන්නේ නැහැය කියලා. උදාහරණයක් විධියට පිලිපීනය පෙන්වා දුන්නා. මුළු පිලිපීනයම මේ එන්නත දෙනවාය කිව්වා. මේ ප්‍රංශය නිසා; ප්‍රංශ කම්පැනියක් නිසා මමත් නිකම් ගැස්සිලා ගියා. අන්තිමට පිලිපීනයේ හිටපු ජනාධිපති අකිනෝ වෛද්‍යවරුන්ගේ අදහසට එකඟ නොවී, ඩොලර් මිලියන 450ක් වියදම් කරලා මුළු පිලිපීන ජනතාවම එන්නත් කළා. අද ජනාධිපති කොමිසමක් පත් කරලා, එතුමාට විරුද්ධව පරීක්ෂණ පවත්වනවා. අපි ඒ එන්නත දුන්නේ නැහැ. "සිංගප්පූරුවේ බෙහෙත් තිබෙනවා නම් අපට බැරි ඇයි?" කියා ඇහුවා. මම බැලුවා, සිංගප්පූරුවේ මොකද වෙන්නේ කියලා. සිංගප්පූරුව සිංගප්පූරු ජාතිකයන්ට ඒ vaccine එක දෙන්නේ නැහැ. හැබැයි ලෝකයේ ඕනෑම රටකින් - අපේ රටවලින් - යන අය සල්ලි දුන්නොත් ඒ ගොල්ලන්ට ඒ vaccine එක දෙනවා; ඒක commercial. සිංගප්පූරුවේ ඒක කරනවා. නමුත් අපි කළේ නැහැ. අන්තිමට මොකද වුණේ? මාස හයක් යනකොට මේ ඩෙංගු එන්නත සම්පූර්ණයෙන්ම අසාර්ථකයි කියා ලෝක සෞඛ්‍ය සංවිධානය වාර්තා කළා. අද ඒ එන්නත නැහැ. දැන් තිබෙන එන්නත පිළිබඳව registration එක තිබෙනවා. නමුත් මේ එන්නතේ ප්‍රතිශක්තිකරණය පිළිබඳව පැහැදිලිකමක් නැහැ. ඒක තීන්දු කරන්න වෙනම ආයතන තිබෙනවා. ඒවා අපට තීන්දු කරන්න බැහැ. මම ඒ අයට කථා කළා. මේ vaccine එක ගන්න කියා හෙට මට කිව්වොත්, සම්පූර්ණයෙන්ම රජයේ වියදමින් අරගෙන එය ලබාදෙන්න අපිට පුළුවන්. නමුත් ඒකෙන් ප්‍රතිශක්තිකරණයක් ලැබෙනවාය කියන එක අද වන තුරුත් සනාථ වෙලා නැහැ. ඇත්තටම මේ පිළිබඳව අපේ ඖෂධ අධිකාරිය ඉතාම ඉහළ මට්ටමක ඉන්නවා. ඖෂධ පිළිබඳව ගත් ඒ බොහෝ තීන්දු ඉතාම හොඳ ඒවා බව අද ජාත්‍යන්තරය පිළිගෙන තිබෙනවා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

අපේ ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය වසංගත රෝග අධ්‍යක්ෂ පිළිබඳව කිව්වා; ඔහු පරිපාලන නිලධාරියෙක්. ඒකට කරන්න දෙයක් නැහැ. ඒක තමයි තිබෙන නීතිය. ඒ නීතියට අනුව transfers සිදුවෙනවා. මම ඒකට විරුද්ධයි. එයට විරුද්ධව මම කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ගෙනාවා. කැබිනට් මණ්ඩලයට එම යෝජනාව ගෙනාවාම ඔය පරිපාලන කට්ටිය නොවෙයි, National Institute of Health Sciences එකේ විශේෂඥ වෛද්‍යවරු කට්ටියම තමයි විරුද්ධ වුණේ; ඒ College එකේ අය. මම 18ක් ඒගොල්ලන්ට දීලා, ඉතිරි ටික පරිපාලන නිලධාරීන්ට දුන්නා. පරිපාලනය කරන්න ඕනෑ පරිපාලන නිලධාරිනුයි. එහෙම නැතිව අනික් කට්ටිය නොවෙයි. සියලුම වසංගත රෝග සඳහා Public Health Inspector කෙනෙක් දමන්න කියා මම කිව්වා. තවම ඒක සිදුවෙලා නැහැ. එතකොට මොකක්ද වෙන්නේ? ඒගොල්ලන් transfer වෙනවා. ඒගොල්ලන් transfer වෙනකොට පරිපාලන නිලධාරියා එතැනට එනවා. වසංගත රෝග පිළිබඳව ඉන්න එක්කෙනා පරිපාලනය කරන්න යනවා. මම මොනවා කරන්නද? මෙච්චර කාලයක් ගෙනැත් තිබෙන නීති මේවා තමයි. මේවා නිවැරදි කරන්න තමයි මම උනන්දු වන්නේ. ඒවා කරන කොට එක එක්කෙනාගේ පෞද්ගලික අභිලාෂ සඳහා කාරණා ඉදිරිපත් කරනවා; "තමන්ට මෙච්චර ඕනෑ, මේ තනතුර තමන්ට දෙන්න" කියා කියනවා. ඒ නිසා මේ තීන්දු හරියන්නේ නැහැ. එතුමිය සඳහන් කළ කාරණය මමත් පිළිගන්නවා. මම මොනවා කරන්නද? එයාගේ merit එක අනුව ඒක එයාට ලැබුණා. ඒක නැවැත්වුවා නම් ඒ මනුස්සයා FR එකට යනවා. සුප්‍රීම් උසාවියට ගිහින් කියනවා, merit එක අනුව මේ තනතුර මට ලැබෙන්න ඕනෑය කියලා. ඒකයි තිබෙන ප්‍රශ්නය.

ඊළඟට, කොටවිල රෝහලේ ඇඳන් ප්‍රශ්නයක් ගැන කිව්වා. මම ඒ ගැනත් සොයා බලන්නම්.

මේ වන විට මෙම රෝගී තත්ත්වය ඉතාම හොඳින් පාලනය වෙලා තිබෙනවා. මතක තබා ගන්න, මේ ඉන්ෆ්ලුවන්සා වෛරසය මීට වඩා තදින් යුරෝපයේ පැතිරෙමින් මිනිස්සු මිය යනවා. ශීත ඍතුවේදී යුරෝපයේ ඉන්ෆ්ලුවන්සාවෙන් මැරෙන සංඛ්‍යාව පළමුවන ලෝක යුද්ධයෙන් මැරුණු සංඛ්‍යාව, දෙවැනි ලෝක යුද්ධයෙන් මැරුණු සංඛ්‍යාවට විතරයි දෙවැනි වන්නේ. මහලු අය, දුර්වල අය, දරුවෝ මෙයට ගොදුරු වෙනවා. [බාධා කිරීමක්] වැසි කාලයට මේ තත්ත්වය එනවා. මොකද, මේ ඉන්ෆ්ලුවන්සා වෛරසයේ තත්ත්වය මෙකයි. එක වෛරස් එකක් කාලයකට එනවා. තව කාලයකට එන වෛරස් එක ඒක නොවෙයි, වෙන වෛරස් එකක්. ඒ ඒ වෛරස් එනකොට වසංගත රෝග විශේෂඥවරු අපිට කියනවා, මේ විධියට මේක මුහුණ දෙන්න කියලා. ඒකයි අපි කරන්නේ. අවශ්‍ය උපකරණ, අවශ්‍ය නිලධාරීන්, අවශ්‍ය මුදල් ලබා දෙන්න අපිට පුළුවන්. ඒ දේවල් අපි කරනවා. දැනට මේ තත්ත්වය පාලනය කර තිබෙනවා. නමුත් හෙට අනිද්දා වනවිට මේක වැඩි වෙයිද, නැද්ද කියා මට කියන්න බැහැ. බලන්න, ඩෙංගු රෝගය ලංකාවේ පාලනය කළා. පසුගිය කාලයේ කැගැහුවා. [බාධා කිරීමක්] ඒකයි මම කිව්වේ, ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමනි. අලුතින් paediatriciansලා දෙදෙනෙක් පත් කළා; කඹුරුපිටියට එක්කෙනායි. එතකොට, nursesලා ඔක්කොම 20ක් පත් කළා.

බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු ඇමතිතුමනි, පැහැදිලි කිරීමක් කරන්න අවසර දෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා සූදානම්ද මේ ගැන තවත් පිළිතුරු දෙන්න? මොකද අද වැඩ කටයුතු රාශියක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමාගේ කාරණය කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
සාර්ථක පිළිතුරක් ලබාදීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම කරුණු දෙකක් සඳහන් කරන්න කැමතියි. මේ ව්‍යසනය ආරම්භ වුණාට පස්සේ,-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමා වෛද්‍යවරයෙක්. එතැනට ගිහින් සොයා බලා අවශ්‍ය දෙය අපට කියන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
අපි එතැනට ගියා, ඇමතිතුමනි. ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරන්න හදන්නේ ඒ නිසායි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාටවත්, සෞඛ්‍ය ලේකම්තුමාටවත්, නියෝජ්‍ය අමාත්‍යතුමාටවත්, ඔබතුමාටවත් මේ දක්වා ගාල්ල, මාතර, හම්බන්තොට රෝහල්වලට යන්න බැරි වුණා. එම නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හැම කෙනෙක්ම එය අඩුවක් හැටියට දකිනවා. ඔබතුමන්ලාට යන්න බැරි නම්, කරුණාකර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාවත් හෙටම රෝහලට යවන්න. මොකද, මාසයක් වෙනවා, තවම සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිසි බලධාරියෙක් ඒ තැනට ගියේ නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එහෙම නොවෙයි. මෙහි සිට ඒ සඳහා අවශ්‍ය සියලුම වැඩ කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය රැස්වීම් පවත්වනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඔබතුමා first-hand experience තිබෙන අය යවන්න.[බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශයේ නිලධාරීන් එක්ක මම හැම දාම රාත්‍රී 1.30 වන තුරු වැඩ කරනවා. දැනට දවස් දෙක තුනකට කලින් වැඩ කටයුතු අවසන් වෙනකොට උදේ පාන්දර තුනයි.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු ඇමතිතුමනි, මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ගාල්ලට යන්න ඔබතුමාට පැයයි ගත වෙන්නේ. ගරු ඇමතිතුමනි, හෙටම කරාපිටිය රෝහලට යන්න. ඔබතුමා ගියොත් ඊට වඩා වැඩක් කෙරෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ පැහැදිලි කිරීම හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.[බාධා කිරීමක්] මම අවස්ථාව දෙන්නම්. ප්‍රධාන කටයුතු ආරම්භයේදී - [බාධා කිරීමක්] තව වැඩ ගොඩක් තිබෙනවා ඉන්න. [බාධා කිරීමක්] මම ගොඩක් අවස්ථාව දුන්නා නේ.

ගරු මන්ත්‍රීවරුනි, ඊළඟට තිබෙන්නේ නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමයි. [බාධා කිරීම්] මම අවස්ථාව දෙනවා කිව්වා නේ. [බාධා කිරීම්] ඉන්න. [බාධා කිරීම්] වාඩි වෙන්න. වාඩි වෙන්න. අවස්ථාව දෙනවා. [බාධා කිරීම්] ඔබතුමාගේ නම ලියාගෙන තිබෙනවා. විනාඩියක් දෙනවා. ක්‍රමවේදයක් යටතේ විනාඩියක් දෙන්න තමයි යන්නේ. ක්‍රමවේදයක් අනුව දෙනවා. මම ලියාගෙනයි තිබෙන්නේ. කරුණාකරලා වාඩි වෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේ කරුණ අදාළයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ නිසා තමයි අවස්ථාව දෙන්නේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්නයක්ද? සභාවේ ප්‍රශ්නයක් නම් වේලාව දෙන්නම්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එහෙම එකක් නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ රටේ මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා පසුව අවස්ථාව දෙන්නම්. මාධ්‍ය නිදහස ගැන කථා කරන්න පසුව වේලාව දෙන්නම්. අද වැඩ කටයුතු අවසන් කර අවස්ථාව දෙන්නම්.

මීළඟට තිබෙන්නේ, නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමයි. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර වාඩි වෙන්න. කරුණාකර වාඩි වෙලා සහාය දෙන්න. කරුණාකර වාඩි වෙන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, මෙම කටයුත්ත අවසන් වෙලා අපි ගනිමු. මම අවස්ථාව දෙනවා. [බාධා කිරීම්] තව ඉවර නැහැ. වාඩි වෙන්න. මට කියන්න තිබෙනවා- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා ඡන්දයෙන් තෝරා පත් කිරීම
பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளருமானவரின் தெரிவு
ELECTION OF DEPUTY SPEAKER AND CHAIRMAN OF COMMITTEES

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේදී අප සූදානම් වන්නේ නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපතිවරයා තෝරාපත් කර ගැනීමටයි. ඒ සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 6 සමඟ කියවිය යුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 4 යටතේ දැනට පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කිරීමට කැමැති යම් මන්ත්‍රීවරයකු තමන් යෝජනා කිරීමට අපේක්ෂා කරන මන්ත්‍රීවරයා නියෝජ්‍ය කථානායක වශයෙන් සේවය කිරීමට කැමැතිද යන්න විමසා දැන ගත යුතුයි. ඉන් පසුව එකී මන්ත්‍රීවරයාගේ නම නියෝජ්‍ය කථානායක ධුරය සඳහා යෝජනා කළ යුතු අතර, වෙනත් මන්ත්‍රීවරයකු විසින් එය ස්ථිර කළ යුතුයි. පාර්ලිමේන්තුව විසින් දැන් නියෝජ්‍ය කථානායකවරයකු ඡන්දයෙන් පත් කර ගැනීමේ කාර්යයේ නිරත වනු ලැබිය යුතුයි. ඒ සඳහා මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන ලෙස මම ඉල්ලා සිටිමි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායක ධුරය සඳහා මොනරාගල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමාගේ නම මම යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉන්න. [බාධා කිරීම්] ගරු එස්.බී. දිසානායක මැතිතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මොනරාගල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමාගේ නම මම යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එස්.බී. දිසානායක මැතිතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
Mike එක මට නේ දිලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ යෝජනාව ස්ථිර කරන්න ඕනෑ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායක තනතුර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට, එක්සත් ජනතා නිදහස් සන්ධානයට හිමිව තිබුණු තනතුරක්. එම නිසා මම ඔබතුමා ඉදිරියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් අපේ පක්ෂයේ ගරු මන්ත්‍රීවරියක් වන විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියගේ නම යෝජනා කරනවා. ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ යෝජනාව ස්ථිර කළ යුතුයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය කාන්තාවක්. එම නිසා මේ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය, මෙම ගරු සභාවේ විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the Opposition.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
Sir, as I was telling you, we have been working on the basis of a consensus in regard to the election of Speaker, Deputy Speaker and the Deputy Chairman of Committees. In terms of that consensual arrangement, Sir, as a Member of the United National Party, you are the Speaker and we have as the Deputy Chairman of Committees a Member from the TNA. I would urge that if the SLFP is proposing a name for the position of the Deputy Speaker, we accept that name in keeping with the tradition and work on the basis of consensus. My humble submission is that in keeping with the healthy tradition that has prevailed, if there is a proposal by the SLFP in regard to the position of Deputy Speaker, we bow to that proposal and accept that on the basis of the consensus of the whole House.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Hon. Speaker, on what the Leader of the Opposition said, the consensus was that we appoint the Speaker from the UNP as the Government Group and we have the Deputy Speaker from the Government Group who is a SLFP Member and the Deputy Chairman of Committees from the Opposition, which was different from earlier times where all three Members were from the Government Group. So, when the vacancy arose, I think the first name that the Government Group suggested was an SLFP Member from the Jaffna District. But some of the Parties were not willing. Therefore, since there were no other backbenchers in the Government Group -they wanted people with more experience - we have now taken a backbencher from the UNP and recommended him as the Deputy Speaker. So, as long as it is from the Government Group, it does not matter to us. This is the only name that we have from the Members who sit in the Government. We want everyone to go along. But remember that the Speaker and the Deputy Speaker both were from the Government Group in a system where all the Members of the UNF and some Members of the SLFP formed the Government Group and then the position of Deputy Chairman of Committees went to a Member in the Opposition. That was all. I mean, there has never been a situation in which the Government had to take a minority. Always the Government had two Members and the Opposition had one Member. I think the first Member who was suggested from our side with the consensus was not acceptable to some of the Opposition Parties. Therefore, now, we have suggested another backbencher from the Government side, because we are keeping with the consensus that two Members are from the Government and one Member is from the Opposition, which is a new tradition because last time all three Members were from the Government.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායක ධුරය සඳහා එක් මන්ත්‍රීවරයෙකුට වඩා වැඩි ගණනකගේ නම් යෝජනා කර ස්ථිර කර ඇති බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 4.(ඇ) ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් බෙදුම් සිනු මිනිත්තු 5ක් නාද කිරීමෙන් අනතුරුව රහස් ඡන්දයෙන් නියෝජ්‍ය කථානායක ධුරය සඳහා පාර්ලිමේන්තුවේ එක් මන්ත්‍රීවරයෙකු

තෝරා පත් කළ යුතුය. ඡන්දය පැවැත්වීම සඳහා මහ ලේකම්වරයා විසින් එක් එක් මන්ත්‍රීවරයාගේ නම කියැවීමෙන් පසුව එක් ඡන්ද පත්‍රිකාවක් බැගින් ලබා දෙනු ඇත. ඉන් පසුව සභා ගර්භයේ ඡන්දය සලකුණු කිරීමට සූදානම් කර ඇති ස්ථානයට ගොස් නියෝජ්‍ය කථානායක ධුරය සඳහා තෝරා ගැනීමට යෝජනා ස්ථිර කර තිබෙන මන්ත්‍රීවරයන්ගෙන් එක් මන්ත්‍රීවරයෙකුගේ නම ඡන්ද පත්‍රිකාව මත පැහැදිලි අකුරින් ලියා, ස්වකීය අත්සන ද යෙදිය යුතුය. අත්සන යෙදීම ඉතාමත්ම අනිවාර්යයි කියන එකත් මා මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ඉන් අනතුරුව ඡන්දය ප්‍රකාශ කරන මන්ත්‍රීවරයා විසින් එසේ ලියන ලද නම නොපෙනෙන ආකාරයෙන් තම ඡන්ද පත්‍රිකාව නවනු ලැබිය යුතු අතර, සභා ගර්භය මැද තිබෙන ඡන්ද පෙට්ටියට එසේ නවන ලද තම ඡන්ද පත්‍රිකාව දමනු ලැබිය යුතුය. තවද, නියෝජ්‍ය කථානායක ධුරය සඳහා තෝරා ගැනීමට යෝජනා ස්ථිර කර තිබෙන මන්ත්‍රීවරයන්ගෙන් එක් මන්ත්‍රීවරයෙකුගේ නම ඡන්ද පත්‍රිකාව මත පැහැදිලි අකුරින් ලියා නොමැති, ස්වකීය අත්සන ද යොදා නොමැති ඡන්ද පත්‍රිකා අවලංගු ඒවා ලෙස සලකනු ලැබේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේක රහස් ඡන්දයක් නම්, අපි අත්සන් කරන එක හරිද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is a requirement. Ballot papers will be kept and destroyed. I will maintain the secrecy. I will be responsible for that.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
If it is a secret ballot, is it correct for us to sign? I think it is improper.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It is a requirement of the Standing Orders.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායක ධුරය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු තෝරන මේ මොහොතේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉතිහාසගත තීන්දුවක් ඇති කර ගැනීමට හැකි අයුරින් නියෝජ්‍ය කථානායකවරියක් තෝරා ගැනීමේ අවස්ථාව දැන් එළඹ තිබෙනවා. [සෝෂා කිරීම්] මොකද, නියෝජ්‍ය කථානායක ධුරය සඳහා ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමියගේ නමත් මේ අවස්ථාවේදී යෝජනා වී තිබෙනවා. [සෝෂා කිරීම්] එතුමිය මෙම ධුරය සඳහා පත් වුණොත් අපේ පාර්ලිමේන්තුවේ පළමුවැනි නියෝජ්‍ය කථානායකවරිය බවට එතුමිය පත් වෙනවා. ඒ නිසා සියලු දෙනාගේ සහයෝගය ඒ සඳහා ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the Opposition.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
Sir, I have heard the Hon. Prime Minister - in fact, the Hon. Prime Minister telephoned and spoke to me some days ago in regard to this matter. When he suggested the person he now has in mind, I told him even then that it may be better for us to agree on a nominee of the Sri Lanka Freedom Party for the post of Deputy Speaker. I said that to him. I am stating here in Parliament what I said to the Hon. Prime Minister a few days ago.

I would urge, Sir, despite the initial thinking of the Prime Minister, we will reconsider this matter and if the Sri Lanka Freedom party is proposing a name for the post of Deputy Speaker, we accommodate that position and accept that person as the Deputy Speaker.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I have to act on the decision of the political parties. - [*Interruption.*] Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Hon. Leader of the Opposition, our convention is two Members from the Government, not two Members from the Opposition Benches. I mean, I have always maintained that position and when the Government first suggested a Member, it was you all who opposed it, not us. We did not oppose that Member. When the SLFP Ministers asked me, I said, "All right, we have no objection. Speak to the others." So, when you all objected, we came up with another name. That is all. I mean, basically we have to keep it within the Government ranks - two Members from the Government.

So, I urge the Leader of the Opposition that we work in the same way because we have all so far worked together and we have bowed to your wishes in withdrawing the first candidate; the SLFP withdrew that candidate. We ourselves have bowed to your wishes. Not

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

that we went and told the SLFP we do not want that Member. All we said was that it has to be a backbencher. So, it was your decision. As a result, now we have no one from the SLFP backbench in the Government ranks. None of their Deputy Ministers are willing to resign to take it over. Therefore, we have no option but to propose someone from the Government side who is a backbencher. So, I would ask the Leader of the Opposition to support us in upholding it. That is all that we are saying.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, නියෝජ්‍ය කථානායක ධුරය සඳහා දැනට නම් දෙකක් යෝජනා කර තිබෙනවා. ඒ, ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ සහ ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියගේ නම්. ඒ අනුව, දැන් පක්ෂවල ස්ථාවරය පැහැදිලි වුණා. මිනිත්තු පහක් බෙදුම් සීනුව නාද කිරීමෙන් අනතුරුව රහස් ඡන්දයෙන් නියෝජ්‍ය කථානායක පත් කිරීමේ කටයුතු අපි ආරම්භ කරනවා.

මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. දැන් අපි ඡන්දය පවත්වන්නයි යන්නේ. ගරු මන්ත්‍රීතුමන්ලා අසුන්ගෙන ඊට සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] ඡන්ද විමසීමේ කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා. එය අවසන් වී මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්. නැවත වරක් මා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අසුන් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා. කරුණාකර ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්න. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත් අසුන් ගන්න. රහස් ඡන්දය පවත්වා අවසන් කිරීමට සහයෝගය දක්වන්න.

දැන් ඡන්ද පෙට්ටිය ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව.

ගරු මන්ත්‍රීතුමන්ලා ඡන්ද පෙට්ටිය හොඳින් බලන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලාට ඡන්ද පෙට්ටිය පෙන්වන්න.

ඡන්ද පත්‍රිකාවේ ඔබතුමන්ලාගේ අත්සනත්, අපේක්ෂකයාගේ නමත් ඇතුළත් කරන්න.

ගරු සභාවට එක් කාරණයක් කියන්න ඕනෑ. මේ ඡන්ද විමසීම වැදගත් ආකාරයට පැවැත්වීම තුළින් සභාවේ ගරුත්වය ආරක්ෂා වෙනවා. ඒ ආකාරයෙන් මේ ඡන්ද විමසීම පැවැත්වීමෙන් අපි මුළු රටටම ආදර්ශයක් දෙනවා. ඒ නිසා ඝෝෂා නොකර, කලබල නොකර මේ ඡන්ද විමසීම පවත්වාගෙන යාමට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙසට මා ඉල්ලීමක් කරනවා. දැන් ඡන්ද විමසීම පවත්වනවා ඇති.

4.(ඇ) ස්ථාවර නියෝගය අනුව බෙදුම් සීනු නාද කරවන ලදී.
(නිලෙක්කට්ටළෙ 4.(ඉ) ඉන්පටි පිරිවු මණි අඩික්කප්පට්ටදු.)
(Whereupon Division bells were rung under Standing Orders 4.(c).)

එක් මන්ත්‍රීවරයකුට වැඩි දෙනෙක් යෝජනා කරනු ලැබ ස්ථීර කරනු ලැබුයෙන්, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් නියෝජ්‍ය කථානායකවරයකු තෝරා පත් කිරීමෙහි පාර්ලිමේන්තුව නිරත වීය.

ඉරුවරුක්කු මේර්පට්ට උරුප්පිනර්කළ් පිරේරික්කප්පෙර්රු, අනුමතික්කප්පෙර්රමෙයාල් වාක්කුච්චීට්ටුමූලම් පිරතිච් චභානායකර් ඉරුවරෛත් තෙරිවු සෙය්යච් චභෙ මුර්පට්ටදු.

More than one Member having been proposed and seconded, the House proceeded to elect a Deputy Speaker by ballot.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

දැන් ඡන්දය පවත්වා ගණනය කර අවසානයි. ඡන්ද පත්‍රිකා දෙකක සඳහන් කර ඇති නම් කියවා ගැනීම සඳහා අපිට දෙමළ භාෂා පරිවර්තකයෙකුගේ සහාය ලබා ගැනීමට සිදු වෙනවා. ඊට පසුව අපිට ප්‍රතිඵල announce කරන්න පුළුවන්.

Order, please! ගරු මන්ත්‍රීවරුනි, කරුණාකර දැන් ඔබතුමන්ලාගේ ආසනවල වාඩි වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. මොකද, සන්සුන් පාර්ලිමේන්තුවකට තමයි ප්‍රතිඵල දෙන්න පුළුවන් වෙන්නේ. නැත්නම් එය ඉතාම අශෝභනයි. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න.

කථානායකතුමා විසින් පහත සඳහන් ප්‍රතිඵල ප්‍රකාශ කරන ලදී.
පින්වරුම් පෙරුපේරුකළෙච් චභානායකර් අවර්කළ් අරිවිත්තාර්කළ්.
Hon. Speaker declared the following results.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා	ඡන්ද 97
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය	ඡන්ද 53
අවලංගු කළ ඡන්ද සංඛ්‍යාව	1

මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි	97 වාක්කුකළ්
මාණ්පුමිකු (වෛද්‍ය) සුදර්ශිනී පර්නාන්දුපුල්ලේ	53 වාක්කුකළ්
චෙල්ලුපඩියර්ර වාක්කු	1

The Hon. J.M. Ananda Kumarasiri	97 votes
The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle	53 votes
Invalid	1

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේදී ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා නිසි පරිදි නියෝජ්‍ය කථානායකවරයා වශයෙන් ඡන්දයෙන් තෝරා පත් කරනු ලැබූ බව මා ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මේ අවස්ථාවේදී නියෝජ්‍ය කථානායක, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමාට මම සුභ පතනවා. එතුමා 1996 සිට පාර්ලිමේන්තුවට සම්බන්ධව සිටි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා කීර්තිමත් සේවයක් කළ මහජන නියෝජිතයෙක්. ඒ වාගේම විදේශීය සම්බන්ධතා දියුණු කිරීමට පාර්ලිමේන්තුව වෙනුවෙන් විශාල වගකීමක් ඉටු කළ, ඉටු කරන මන්ත්‍රීවරයෙක්. නව පාර්ලිමේන්තුවේ අපි ඇති කරන ලද කාරක සභා සහ අනෙකුත් විවිධ සංවර්ධන කටයුතුවලදී පාර්ලිමේන්තුව වෙනුවෙන් තම යුතුකම් කාර්යක්ෂමව ඉටු කළ මහජන නියෝජිතයෙකු වශයෙන් එතුමාව හඳුන්වන්නට පුළුවන්. එම නිසා එතුමාට ලැබෙන නව වගකීම සාර්ථකව ඉටු කිරීමේ හැකියාව තිබෙනවා. පාර්ලිමේන්තුව වෙනුවෙන් මම එතුමාට ශුභාශිංසනය පුද කරනවා.

නිටපු නියෝජ්‍ය කථානායක ගරු තිලංග සුමතිපාල මැතිතුමා ගැනත් සඳහන් කිරීම මගේ යුතුකමක් වෙනවා. එතුමා පාර්ලිමේන්තුවට විශාල සේවාවක් ඉටු කළ කෙනෙක්. ඒ වාගේම පක්ෂ නායක රැස්වීමේදීත් එම කරුණ ඒකමතිකව අනුමත කළා. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ලෝකයේ ආදර්ශවත් පාර්ලිමේන්තුවක් වශයෙන්, අන්තර් ජාතික පාර්ලිමේන්තු සම්මේලනය වශයෙන් පිළිගැනීම සඳහා අප දැරූ උත්සාහයේදී එතුමා විශාල ශක්තියක් වුණා. ඒ වාගේම SDGs ක්‍රියාදාමය වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ එතුමා විශාල මෙහෙවරක් ඉටු කළා. ඒ සෑම ක්‍රියාදාමයක්ම අගයමින් මම එතුමාට ශුභාශිංසනය පුද කරනවා.

මම මේ අවස්ථාවේදී ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය ගැනත් වචනයක් සඳහන් කළ යුතුයි. එතුමිය පාර්ලිමේන්තුවේ විශාල වගකීම් රාශියක් ඉටු කළ මන්ත්‍රීවරියක්. අපගේ කම්ටු රාශියක සාමාජිකත්වය දරමින් සහ කාන්තා, ළදරු සහ සෞඛ්‍ය කටයුතුවලදීත්, විදේශීය සම්බන්ධතාවලදීත් එතුමිය පාර්ලිමේන්තුවට විශාල ගරුත්වයක් ලබා දුන්නා. ඒ වාගේම පාර්ලිමේන්තු කටයුතුවලදී එතුමියගේ සහයෝගය ඉදිරියටත් ලැබෙන බව මට විශ්වාසයි. මම එතුමියටත් සුබ පතනවා.

නිදහස්, සාධාරණ සහ ස්වාධීන ඡන්දයක් පැවැත් වීමට කටයුතු කළ මහ ලේකම්තුමාට, නියෝජ්‍ය මහ ලේකම්තුමාට, සහකාර මහ ලේකම්තුමියට සහ කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරනවා. අප අවසන් කළ යුතු තව වැඩ කටයුතු කිහිපයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය කථානායකතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා, විපක්ෂයේ නායකතුමා, විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරන නායකයින්, අපේ ගරු අමාත්‍යවරුන් සහ හිතවත් ගරු මන්ත්‍රීවරුන් සියලුදෙනාගෙන්ම අවසරයි. මට මේ භාරදූර වගකීම පැවරීමට ඔබතුමන්ලා ගත් තීරණය පිළිබඳව මාගේ ගෞරවය සහ ස්තුතිය මුලින්ම පුද කරන්නට කැමැතියි. සියලුම දේශපාලන පක්ෂ නායකයින්ගේ, පක්ෂ සාමාජිකයින්ගේ, ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඇතිව ඔබතුමාගේ ගෞරවයත්, මේ පාර්ලිමේන්තුවේ ගෞරවයත් ආරක්ෂා කර ගනිමින් මගේ වගකීම මට පුළුවන් ආකාරයෙන්, හැකිතාක් දුරට -සියලුදෙනාගේම ගෞරවය ආරක්ෂා කරමින්- ක්‍රියාත්මක කරන්නට මම බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා මට මේ ගරු සභාවට පැමිණීමට ශක්තිය දුන්නු මොනරාගල දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයින්ව මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. එතුමන්ලා නිසායි අද මම මෙතැන ඉන්නේ. එම නිසා එතුමන්ලාට මාගේ විශේෂ ස්තුතිය පුද කරමින්, මේ අවස්ථාවේ සිට මට භාර දුන් වගකීම ඉතාමත්ම සාධාරණව ඉෂ්ට කිරීමට ඔබතුමන්ලාගේ ශක්තිය සහ සහයෝගය ලබා දෙන මෙන් අවසාන වශයෙන් මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ඡන්දයට ඉදිරිපත් වුණු ගරු සුදර්ශිනී පුනාන්දුපුල්ලේ මැතිනියට විශේෂයෙන්ම මාගේ ගෞරවය සහ ස්තුතිය පුද කරනවා. මම ඊයේත් එතුමියගෙන් ඇහුවා, "මේ ඡන්දයට ඉදිරිපත් වෙන්නට ඔබතුමිය බලාපොරොත්තු වෙනවාද?" කියලා. එතුමිය ඒ සාකච්ඡාවේදී කිව්වා, "ඉදිරිපත් වෙනවා." කියලා. මම සන්තෝෂ වෙනවා. මොකද, පසුගිය දවස් ටිකේම අපි එකම මතයක ඉඳගෙනයි වැඩ කටයුතු කළේ.

මේ කාර්ය භාරය මෙපමණ කාලයක් කරගෙන යාම ගැන ගරු තිලංග සුමතිපාල මැතිතුමාටත් මාගේ ස්තුතිය සහ ගෞරවය පුද කරන්නට ඕනෑ. ඔබතුමන්ලා සියලුදෙනාටම බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்து புள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු කථානායකතුමනි, ඡන්දයෙන් අභිනවයෙන් තේරී පත් වුණු නියෝජ්‍ය කථානායක, මොනරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමාට මුලින්ම මාගේ ශුභාශිංසන එකතු කරනවා. එතුමාට ඒ ධුරයේ කටයුතු සාර්ථකව කරගෙන යන්නට ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මේක ඓතිහාසික අවස්ථාවක් හැටියටයි මම සලකන්නේ. මොකද, පාර්ලිමේන්තුවේ කථානායකතුමන්ලා, නියෝජ්‍ය කථානායකතුමන්ලා පත් කරලා තිබෙනවා. නමුත් පළමුවෙනි වතාවටයි, කාන්තාවකගේ නම යෝජනා වෙලා ඡන්දයකට ගිහින් පැරදුණේ. එම නිසා සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ නොවෙයි පැරදුණේ, කාන්තාවෝ ටික තමයි පැරදුණේ කියන එක මම කියන්නට කැමැතියි.

පාර්ලිමේන්තුවේ ඉහළ තනතුරකට කාන්තාවකගේ නමක් යෝජනා වීම අපි ලබපු ජයග්‍රහණයක් හැටියටයි මම සලකන්නේ. ගරු කථානායකතුමනි, ඉතාමත් සාධාරණව මේ ඡන්දය පවත්වන්නට අවශ්‍ය සම්පූර්ණ නායකත්වය ලබා දුන්නු එක ගැන මේ වෙලාවේ අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ ගරු එස්.බී. දිසානායක හිටපු ඇමතිතුමා නියෝජ්‍ය කථානායක ධුරයට මගේ නම යෝජනා කළා. එය ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ස්ථිර කළා. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මම වෙනුවෙන් අද සභයෝගය පළ කරලා කථා කෙරුවා. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මෙම තනතුර හිමි විය යුතුයි කියලා අපේ විපක්ෂ නායක ගරු සම්පන්දන් මැතිතුමා ප්‍රකාශ කළා. එතුමන්ලා සියලු දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු දෙනාටත්, අපේ ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න ඡන්දය පාවිච්චි කරපු මගේ සහෝදර මන්ත්‍රීතුමන්ලාටත් මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ඡන්දය නොදීපු අයටත්, ඡන්දය දීමෙන් වැළකී සිටි අයටත් මගේ ස්තුතිය පුද කරනවා. මොකද, අද රටම පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක තේරීමේ ඡන්දය පිළිබඳව විමසිල්ලෙනුයි සිටියේ. මේ පාර්ලිමේන්තුවේ පැවති ඡන්දය හරහා අද රටට හොඳ පණිවුඩයක් ලැබී තිබෙන බව මතක් කරනවා. ඒ වාගේම මේ සඳහා සහයෝගය දීපු පාර්ලිමේන්තුවේ මහලේකම්තුමාට, නියෝජ්‍ය මහ ලේකම්තුමාට, සහකාර මහලේකම්තුමිය ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයටත් මගේ ස්තුතිය පුද කරමින් පාර්ලිමේන්තු කටයුතු ඉදිරියට ගෙන යන්න උපරිම ශක්තියෙන් ඒ සහයෝගය ඒ ආකාරයෙන්ම ලබා දෙන බව පොරොන්දු වෙමින් මම නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තිලංග සුමතිපාල මැතිතුමා.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු කථානායකතුමනි, මට ඔබතුමාට ස්තුති කරන්න අවස්ථාවක් ලැබුණේත් නැහැ. මේ සභාව පවත්වාගෙන යනකොට ඔබතුමා මගේ ප්‍රධානියා හැටියට විශාල ශක්තියක් ලබා දුන්නා සේම මා හට දැනුවත්කම් ලබා දීම ගැනත් මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද නියෝජ්‍ය කථානායක ධුරයට පත් වෙච්ච අපේ ආනන්ද කුමාරසිරි මැතිතුමාට මා සුබ පතනවා.

[ගරු තිලංග සුමතිපාල මහතා]

ඒ කර්තව්‍ය කරගෙන යන්න අප සියලු දෙනාගේම සහයෝගය ඔබතුමාට ලබා දෙනවා. මම නම් තෝරා පත් වුණේ නිතරගයෙන්; 2015 සැප්තැම්බර් මාසයේ 1වැනි දා ගරු කථානායකතුමාත් එක්ක. අගෝස්තු 17 වැනිදා තමයි මේ රජය බිහිවන්නේ. පසු ගිය අවුරුදු තුනක විතර කාලයේ මේ පාර්ලිමේන්තුවේ හුහක් කටයුතු කරගෙන යෑමට අවස්ථාව ලැබිලා තිබුණා. ඒ, පක්ෂ-විපක්ෂ සියලු දෙනාගේ සහයෝගයෙන්. විශේෂයෙන්ම ධම්මික දසනායක මැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගෙන්ම අපට සහයෝගය ලැබුණා. දේශපාලනඥයන් හැටියට අපි මෙතැනට එන්නේ පරිපාලනය ගැන අවබෝධයක් ඇතුවම නොවෙයි. ඒ කටයුතු කරගෙන යන්න ඒ අය අපට සහයෝගය ලබා දුන්නා. විපක්ෂයේ කටයුතු කරගෙන යන්න නියෝජ්‍ය කථානායකතුමාගේ කාර්යාලය අපට උදව් කරයි කියලා අපි හිතනවා. එතුමාගේ සහයෝගය අපට ඕනෑ වෙයි. මම මීට වඩා වෙලාව ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මේ කටයුතු හොඳින් කරගෙන යන්න මා හදවතින්ම සුබ පතනවා. පාර්ලිමේන්තුවේ විපක්ෂයටත්, විශේෂයෙන්ම අනෙකුත් පක්ෂ නියෝජනය කරන කණ්ඩායම්වලටත් සාධාරණ කාලයක් වෙන් කර දෙමින් අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා නියෝජ්‍ය කථානායක ධුරයට පත් වුණු ඔබතුමා කටයුතු කරයි කියලා මා විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු අග්‍රාමාත්‍යතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, 1978 මම මේ පාර්ලිමේන්තුවට එනකොට අපි එක්ක හිටියේ ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ පියා. එතුමා එදා වැල්ලවායේ මන්ත්‍රීවරයා හැටියට මේ ගරු සභාවට පත් වුණා. එතුමාගේ මරණයෙන් පස්සේ තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ආනන්ද කුමාරසිරි මැතිතුමාව මේ පාර්ලිමේන්තුවට පත් කළේ. ඒ කාලයේ, එතුමා එක්ක මේ ගරු සභාව තුළ වැඩ කටයුතු කරන්න මට අවස්ථාවක් ලැබුණා. ආනන්ද කුමාරසිරි මැතිතුමාට දේශපාලනයේ හොඳ අත් දැකීමක් තිබෙනවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දවසක් කිව්වේ, "දේශපාලනයේ අත් දැකීම් එන්නේ පරාජය වෙලා ගෙදර ඉන්නකොටයි." කියලා. ඒ පරාජයටත්, ඒ අත් දැකීමටත් එතුමා මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියටත් එතුමා ක්‍රියා කරලා තිබෙනවා. මන්ත්‍රීවරයෙක් හැටියට විශාල උනන්දුවක් තිබෙනවා. යළිත් මන්ත්‍රීවරයෙක් හැටියට මේ ගරු සභාවට පැමිණීමත්, මේ සභාවේ නියෝජ්‍ය කථානායකතුමා හැටියට පත් වීම ගැනත් මගේ සන්තෝෂය මම මෙතැනදී ප්‍රකාශ කරනවා.

මේ අවස්ථාවේදී නියෝජ්‍ය කථානායක තේරීමට තරගයක් තිබුණා. ඒ පසුබිම ගැන මම විපක්ෂ නායකතුමා එක්ක වාද කරපු නිසා මෙතැන වාද කරන්න යන්නේ නැහැ. මෙතැන ඒ ඡන්ද පක්ෂග්‍රාහීව තමයි බෙදුණේ. විශේෂයෙන්ම ආනන්ද කුමාරසිරි මැතිතුමාට අපේ පක්ෂවලින් ඡන්ද ලැබුණා. ඒ ආනන්ද කුමාරසිරිට. දැන් මෙතැන ඉන්නේ නියෝජ්‍ය කථානායක කුමාරසිරි. එතුමාට පක්ෂයක් නැහැ. පාර්ලිමේන්තුවට යටත් වෙලා තමයි එතුමාට ක්‍රියා කරන්න වෙන්නේ.

ඒකයි අප බලාපොරොත්තු වන්නේ, කවුරු දිනුවත්. මට විශ්වාසයක් තිබෙනවා, ගරු ආනන්ද කුමාරසිරි මැතිතුමාගේ දැක්ම එක්ක, එතුමාගේ පළපුරුද්ද එක්ක නියෝජ්‍ය කථානායක ධුරයේ වැඩ කටයුතු එතුමා හොඳින් කරගෙන යාවි කියා.

එතුමා එක්ක තරග කළේ පාර්ලිමේන්තුවේ තවත් දක්ෂ මන්ත්‍රීවරියක වන අපේ ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියයි. එතුමියත් ඒ වාගේම දක්ෂයි, පාර්ලිමේන්තු කටයුතුවලදී. එහෙත් අපට මේ දෙදෙනා අතරින් මේ අවස්ථාවේදී තෝරන්න සිදුව තිබුණා, නියෝජ්‍ය කථානායක කවුද කියා. අපි බලාපොරොත්තු වනවා එතුමාටත්, එතුමියටත් දේශපාලනයේ හොඳ අනාගතයක් ලැබේවි කියා. සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය එතුමියගේ ස්වාමී පුරුෂයාගේ අභාවයෙන් පසුව ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට ඇවිත් එතුමා වාගේම සේවයක් මේ ගරු සභාවට ඉටු කර තිබෙනවා. මෙහිදී කියැවුණා, එතුමිය තේරුණා නම්, එතුමිය ප්‍රථම නියෝජ්‍ය කථානායකවරිය වනවා කියා. එහෙම වුණා නම් ඇත්ත වශයෙන්ම සිදු වන්නේ එතුමිය දෙවන නියෝජ්‍ය කථානායකවරිය වීමයි. සෙනෙට් සභාවේ පළමුවන නියෝජ්‍ය කථානායකවරිය - නියෝජ්‍ය සභාපතිනිය- තමයි එක්සත් ජාතික පක්ෂයේ ඇඩ්ලින් මොලමුරේ මැතිනිය. කෙසේ හෝ අපට ඉදිරියේදී කරන්න තිබෙන්නේ කථානායක ධුරයට කාන්තාවක තෝරා ගැනීමයි. කාන්තාවක් ලංකාවේ ජනාධිපති ධුරයෙහි ඉඳ තිබෙනවා; අග්‍රාමාත්‍ය ධුරයෙහි ඉඳ තිබෙනවා; අග්‍රවිනිශ්චයකාර ධුරයෙහි ඉඳ තිබෙනවා. එහෙත් තවම කථානායක ධුරයෙහි ඉන්නේ පිරිමි අය පමණයි. ඒ නිසා මා ඒ ගැනත් මෙහිදී විශේෂයෙන් සඳහන් කරනවා.

විශේෂයෙන්ම 2015 ඡන්දයෙන් පසුව අප ගත් ක්‍රියා මාර්ගය නිසා, ඒ අවස්ථාවේදී අප ගත් ශක්තිමත් පියවර නිසා මේ රටේ කාන්තාවන් විශාල පිරිසක් අද ප්‍රාදේශීය සභාවල ඉන්නවා. ඒ වෙනුවෙන් සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියත් අපට බෙහෙවින් උදව් කළා.

මෙතෙක් කල් නියෝජ්‍ය කථානායකතුමා හැටියට ක්‍රියා කළ මගේ මිත්‍ර තිලංග සුමතිපාල මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, නියෝජ්‍ය කථානායක ධුරය දැරූ කාලයේදී එතුමා එහි වගකීම ගෙන එය ඉෂ්ට කිරීම ගැන. මම මීට වඩා කතා කරන්නේ නැහැ. අපේ නියෝජ්‍ය කථානායකතුමාට යළිත් ශුභ ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ඉදිරියේදී මේ පුටුවට කාන්තාවක් පැමිණේවා කියා මා මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට, පනත් කෙටුම්පත් පිළිබඳ දැනුම් දීම.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාට අවස්ථාව දෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කොයි වෙලාවටද දෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කටයුතු අවසන් කරලා අවස්ථාව දෙනවා. [බාධා කිරීම්] එසේ අවස්ථාව දීම සඳහා මම තුන්දෙනකුගේ නම් ලියාගෙන ඉන්නවා. [බාධා කිරීම්]

පනත් කෙටුම්පත් පිළිබඳව දැනුම් දීම, ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමිය මේ ගරු සභාවේ නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නමුත් අපේ ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා ඉන්නවා නේ.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
குற்றவியல் கருமங்களில் பரஸ்பர உதவியளித்தல் (திருத்தம்) சட்டமூலம்
MUTUAL ASSISTANCE IN CRIMINAL MATTERS (AMENDMENT) BILL

"2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

පිළිගන්වන ලද්දේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 ජූනි 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

නීති මත්‍රුම් සිරෙච්සාලෙකළ් මරුසීරමෙප්පු අමෙච්සර් සාර්පිල් මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2018 යූන් 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka *on behalf of the Minister of Justice and Prison Reforms; to be read a Second time upon Tuesday, 19th June, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 8 of the Parliament, the hours of sittings of Parliament on this day shall be 1.00 p.m. to 7.30 p.m. At 2.00 p.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 7.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉන්න ගරු මන්ත්‍රීතුමා. මම අවස්ථාව දෙන්නම්. පාර්ලිමේන්තුවේ විවාදය පැවැත්වෙන අවස්ථාවේදී ගරු මන්ත්‍රීතුමන්ලා තුන්දෙනකුට මම පොරොන්දු වුණා අවස්ථාවක් ලබා දෙනවා කියා. පළමුවෙන්ම, ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා. එතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. ඊට පසුව ඉල්ලීම් කළා, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා සහ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඒ අවස්ථා මා දැන් ලබා දෙනවා. මුලින්ම ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාව ලබා දීම ගැන. ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ සිටින එක ගැනත් මම සතුටු වෙනවා.

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමාගේ සහෝදරයාට අයත් මාධ්‍ය නාලිකාව වන TNL ආයතනය සාමාන්‍යයෙන් පෞද්ගලිකව ගත්තොත් මට, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට, ඒ වාගේම අපේ කඳවුරේ අයට නිර්දය ලෙස විවේචන එල්ල කරන, අවලාද නඟන නාලිකාවක්. එය වෙනත් ප්‍රශ්නයක්. හැබැයි එය මේ රටේ පිළිගත් මාධ්‍ය ආයතනයක්. අද ඒ ආයතනයේ වෙබ් අඩවියේ පළ කර තිබෙනවා, "අප ආයතනයේ පොල්ගහවෙල විකාශනාගාරය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් - TRC - මුද්‍රා තබා තිබේ. විකාශනාගාරය සතු උපකරණ රැගෙන යෑමට ඔවුන් කටයුතු කරමින් සිටී. අප ආයතනය විසින් නියමිත ගෙවීම් නියමිතව සිදු කර තිබියදීත් මෙසේ කටයුතු කිරීම අප ආයතනය විසින් දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිමු." කියා. යම්කිසි රූපවාහිනී නාලිකාවක විකාශනාගාරයකට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සීල් තබන්න නම්, ඒකට අදාළව බලවත්ව බලපාන කුමන හෝ සාධාරණ පරිසරයක් තිබෙන්න ඕනෑ.

[ගරු විමල් වීරවංශ මහතා]

බැලූ බැල්මට අපට එහෙම කාරණයක් පෙනෙන්න නැහැ. නමුත් ඊයේ-පෙරේදා ජනාධිපති සිරිසේන මැතිතුමාව නිර්දය ලෙස විවේචනය කරමින් එම නාළිකාවේ යම් කිසි ප්‍රවෘත්තියක් විකාශය වුණා. සමහර විට මේ පියවර ගැනීමට ඒ කාරණය හේතු වුණාද දන්නේ නැහැ. ගරු කථානායකතුමනි, කොහොම වුණත් මේ ආණ්ඩුව මාධ්‍ය නිදහස ගැන රස මසවුළු වර්ගයේ පම්පෝරි ගහලා බලයට ආපු ආණ්ඩුවක්. එම නාළිකාව අග්‍රාමාත්‍යවරයාගේ සහෝදරයාට අයත් නාළිකාවක් නිසා සමහර විට ඒ නාළිකාව වසා දමනවාට අපි කැමැති වෙන්නත් පුළුවන්. හැබැයි ඒ වුණාට, මොන කෙනෙකුට අයිති එකක් වුණත් මේ රටේ මාධ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් මේ ආකාරයට කටයුතු කිරීම නිවැරදියි කියලා අපි හිතන්නේ නැහැ. ජනමාධ්‍ය ඇමතිතුමා ජනමාධ්‍ය නිදහස ගැන කන් අඩි පැළෙන පම්පෝරි ගහන මාගේ හිටපු මිත්‍ර ඇමතිතුමෙක්. ගරු ජනමාධ්‍ය ඇමතිතුමනි, ඒ නිසා මේ තත්ත්වය ගැන ඔබතුමා පැහැදිලි කරන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් පිළිතුරු දෙනවාද?

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මංගල සමරවීර - නිති மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ අවාසනාවන්ත සිද්ධිය ගැන මටත් දැන ගන්න ලැබුණේ, මෙතැන වාඩි වෙලා ඉන්නකොට, දැනට පැයකට විතර ඉස්සර වෙලායි. ඉන් පසුව මමත් TRC එකේ සභාපතිතුමාට කථා කරන්න බැලුවා. මට තවම වාර්තාවක් ලබා ගන්න බැරි වුණා. මේ ගැන සොයා බලලා, කුමක් වූවාද කියන එක ගැන අපි පාර්ලිමේන්තුවට වාර්තා කරන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඉදිරියේදී පාර්ලිමේන්තුව දැනුවත් කරනවාද?

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මංගල සමරවීර)
(The Hon. Mangala Samaraweera)
එහෙමයි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, රටක මාධ්‍ය ආයතනයක කුලුනක් සීල් කරනවා වාගේ තීරණයක් TRC එක තනියෙන් හිතලා ගන්නේ නැහැ නේ. ඒක සමාජයීය වශයෙන් කැලඹිල්ලට හාජන වන තීරණයක්. සාමාන්‍යයෙන් TRC එකේ සභාපතිවරයෙක් තනියෙන් ඔහොම තීරණයක් ගන්නේ නැහැ. එහෙම නම් රජයේ කවුරු හෝ වගකිව යුත්තෙක් ඒකට උපදෙස් දෙන්න ඕනෑ; ඒ තීරණය ගන්න කියලා පොළඹවන්න ඕනෑ. එහෙම නැතුව TRC එක ස්වාධීන ආයතනයක්, එක පාරට සභාපතිතුමාට මේකේ වරදක් හසු වෙලා සීල් තැබුවා කියලා අපට හිතන්න බැහැ; එහෙම වෙන්න බැහැ. ඒ නිසා මේක ආණ්ඩුවේ කිසියම් පාර්ශ්වයක, එහෙම නැත්නම් ආණ්ඩුව ඇතුළේ තිබෙන ගැටුමක් පිපිරී යාමක ප්‍රතිඵලයක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන්න.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මංගල සමරවීර)
(The Hon. Mangala Samaraweera)
ආණ්ඩුවේ වගකීම් පැහැර හරිනවා නොවෙයි. ඇත්ත වශයෙන්ම සැබෑ තොරතුරු දන්නේ නැතුව මේ ගැන කථා කරන්න මම ලැහැස්ති නැහැ. ගරු මන්ත්‍රීතුමනි, නමුත් මමත් ඔබතුමා කියන කාරණය සමඟ එකඟයි. චෝල්ටෙයාර් කිව්වේත්, "තමන්ගේ හතුරාගේ අදහස් කොයි තරම් අමිහිරි වුණත් ඒ අයට එය ප්‍රකාශ කිරීමට තිබෙන අයිතිය පිළිගන්න ඕනෑ" කියලායි. ඒකයි ප්‍රජාතන්ත්‍රවාදයක මූලධර්මය. ඒ අනුව මේ සිදු වී ඇති තත්ත්වය ගැන ඇත්ත වශයෙන්ම මමත් කනගාටු වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඔබතුමාත් කථා කරන්නේ මේ ගැනද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්. ගරු කථානායකතුමනි, අපි බොහෝ වෙලාවට දේශපාලනික වශයෙන් ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා සමඟ එකඟ වෙන්නේ නැහැ. නමුත් මෙතැනදී එතුමා සමඟ එකඟ වෙනවා. එතුමා කියන කාරණය හරි. මංගල සමරවීර ඇමතිතුමා ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට ඒ ප්‍රකාශය කළා. නමුත් පක්ෂයක් හැටියට අපටත් මෙතැනදී යම් කිසි මතයක් ප්‍රකාශ කරන්න වෙනවා. මොකද, ජනමාධ්‍යයට තිබෙන අයිතිය කාටවත් මේ ආකාරයෙන් සීල් තියලා, වහාම නවත්වලා දමන්න පුළුවන් කියලා මා හිතන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපට මීට අදාළ මොන මාධ්‍ය ආයතනයද කියන එක ගැන ප්‍රශ්නයක් නැහැ. අපි මාධ්‍ය නිදහස දීලා තිබෙනවා; මාධ්‍ය නිදහස වෙනුවෙන් සටන් කරලා තිබෙනවා. සමහර වෙලාවට අමිහිරියි. සමහර වෙලාවට මාධ්‍යවලින් අපට පහර ගහනවා. නමුත් අපි ගෙනාපු ප්‍රජාතන්ත්‍රවාදී, යහ පාලන ආණ්ඩුව යටතේ අපට මේ මාධ්‍ය නිදහස තවදුරටත් ස්ථාපනය කරලා, තවදුරටත් ස්ථිරසාරව ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙන්න ඕනෑ බව මම අතිගරු ජනාධිපතිතුමාට මතක් කරන්න කැමැතියි. මොකද, ජනාධිපතිතුමා යටතේ තමයි මේ ආයතනය තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. අපි දැන් ගරු ඇමතිතුමාට මේ ගැන පැහැදිලි කරන්න අවස්ථාව දෙමු.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කියපු කාරණාවට මම තව දෙයක් එකතු කරන්න කැමැතියි. අපි බැලුවොත් පෙනෙනවා, පසුගිය කාලය පුරාම "සිරස" ආයතනය අපට දැඩි ලෙස ප්‍රහාර එල්ල කළා; අගමැතිවරයාට දැඩි ලෙස ප්‍රහාර එල්ල කළ බව. ඒ විතරක් නොවෙයි. දැන් අවුරුදු කිහිපයක් තිස්සේ මට "කොටළුවා" කියමින්, කාටූන් දමමින් ප්‍රහාර එල්ල කරනවා. නමුත් අද්ත් මම කිලී මහරාජා මහත්මයා මගේ මිත්‍රයෙක් හැටියට සලකනවා. විවේචනයත්, දේශපාලනයත් එක පෙට්ටියක දමලා, අපේ මිත්‍රකම්, සම්බන්ධකම් තව පෙට්ටියක දමලා වෙන් කරලා හිතන්න අපට පුළුවන් වෙන්න ඕනෑ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ප්‍රජාතන්ත්‍රවාදීව අවස්ථාව දුන්නා. මේ අවසන් අවස්ථාව, නැත්නම් වාදයක් ඇති වෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා දෙදෙනා කළ ප්‍රකාශ අනුව මම ටිකක් අසීරු තත්ත්වයකට පත් වෙලායි ඉන්නේ. මම මේ කල්පනා කරන්නේ, ආණ්ඩුව කරන්නේ අපිද කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ ප්‍රශ්නය හරි. ඊළඟට, ගරු දයාසිරි ජයසේකර මැතිතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා මෙය වැදගත් ප්‍රශ්නයක් විධියට සලකනවා. අපේ මුදල් ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මම මේ කාරණය අහන්න කැමැතියි.

අද අපි පාර්ලිමේන්තුවට එන විට පාර අයිනේ විශාල පිරිසක් උද්ඝෝෂණයක නිරත වෙලා හිටියා. Finance and Guarantee Company Limited එකේ මුදල් තැන්පත්කරුවන් තමයි එතැන හිටියේ. මම ඒ අය එක්ක සාකච්ඡා කළා. ඒ අයට විශාල ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒක තැන්පත්කරුවන් 2,697කගේ ප්‍රශ්නයක්. එහිදී මම,-[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන Debate එක දැන් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අද ඒ ගැන Debate එක තිබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙනම් ඒ විවාදයේදී කථා කරමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වාගේම, අද දවසේ COPE සහ PAC කමිටු දෙක ගැන තීරණයක් ගැනීමටත් තිබෙනවා. ඒ කරුණ වෙනත් දවසකට ගැනීමට සිදු වෙනවා. සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ඔව්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, කඩා වැටුණු මූල්‍ය ආයතන එක්ක මම විශාල සාකච්ඡාවක් කළා. ඒ වාගේම, පසුගිය දවස් කිහිපය ඇතුළත ඒ ආයතන ටික මුණ ගැසුණා. ඔවුන් අපේ පක්ෂ කණ්ඩායම් එක්ක සම්බන්ධ වෙලා පාර්ලිමේන්තු මාර්ගයේ අද උද්ඝෝෂණයකත් නිරත වුණා. කඩා වැටුණු සියලු මූල්‍ය ආයතන පිළිබඳව අද හවස 2.00 සිට 7.00 දක්වා විවාදයක් පැවැත්වීමට නියමිතව තිබුණා.

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායකතුමා තෝරා ගැනීම සඳහා ඡන්දයක් අද පැවැත්වෙන බව පාර්ලිමේන්තුවට ආවාට පසුවයි අපි දැන ගත්තේ. මොකද, අද උදේ පැවති පක්ෂ නායක රැස්වීමේදී තමයි නියෝජ්‍ය කථානායකතුමා තෝරා පත් කර ගැනීමේ ඡන්දය අද දින පැවැත්වෙන බවට තීරණය කළේ. දැන් ඡන්දය අවසන්. මේ විවාදය හවස 2.00ට පටන් අරගෙන 7.00වන තුරු පැවැත්වීමට නියමිතව තිබුණා. දැන් වෙලාව හවස 5.10යි. ඒ නිසා පැය දෙකකටත් වඩා අඩු කාලයක් තමයි විවාදය සඳහා තිබෙන්නේ. මූල්‍ය ආයතන ගණනාවක කඩා වැටීමක් තිබෙනවා. ඒ නිසා කල් නොයවා, මේ සතිය ඇතුළත මේ විවාදය පැවැත්විය යුතුව තිබෙනවා.

මම ගරු සභානායකතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. බ්‍රහස්පතින්දා දිනයේ විවාදයට නියමිතව තිබෙන්නේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිවේදන කිහිපයක් ගැනයි. හැකිනම්, ඒ නිවේදන සම්බන්ධ විවාදය සිකුරාදාට කල් තබා,-[බාධා කිරීමක්] නැහැ. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිවේදන සහ National Defence Fund (Amendment) Bill යන දෙකම සිකුරාදා ගන්නවා නම්, බ්‍රහස්පතින්දා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අපට පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පැයක් ඇතුළත මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිවේදන සම්මත කරලා දෙන්න. ඊට පසුව ඔබතුමාගේ විවාදය පටන් ගන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙමනම්, එම නිවේදන හවස 1.00 වෙනකල්,- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පැයක් ඇතුළත,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල උදේ 9.30ට නේ පාර්ලිමේන්තුව පටන් ගන්නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
බ්‍රහස්පතින්දා හවස 1.00 වෙනකල් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිවේදන විවාදයට අරගෙන, ඊට පසුව අනෙක් විවාදය පවත්වමු. මොකද, මට සිකුරාදා එන්න අපහසුයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
1.00 සිට 7.00වන තුරු දෙකම එකට ගන්න පුළුවන්. ඒකට එකඟයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීමක් දැන් පවත්වනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අවශ්‍ය නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, එයට එකඟද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මොහොතකට කලින් අප පැමිණි එකඟතාව තමයි ගරු අනුර දිසානායක මැතිතුමා පළමුවෙන් යෝජනා කළේ. එනම්, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල උදේ 9.30ට රැස්වෙන්න තීරණය කර තිබෙන නිසා, අද පැවැත්වීමට නියමිත විවාදය සිකුරාදාට කල් තබන්න. අනෙක, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතත් එදාම විවාද කරලා සම්මත කරගන්නට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුදල් ඇමතිතුමාට ඒ දිනය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නේද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබෙන බරපතළ කරුණු 7ක් ගැන බ්‍රහස්පතින්දා මුළු දවසම විවාද කරලා සම්මත කර ගන්නට අපි එකඟ වෙලා තිබෙනවා. ඒ කාලය නම් අඩු කරන්න එපා, ගරු ඇමතිතුමනි. මොකද, රටේ මුදල් පිළිබඳව අර්බුදයක් පවතිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙමනම්, දැන් අපි පක්ෂ නායක රැස්වීමක් පවත්වා තීරණයක් ගනිමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්, ඔව්. අපි සිකුරාදා adjust කර ගනිමු. බ්‍රහස්පතින්දා දිනය වෙනස් කරන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාද විවාද කරලා මේ සභාවේ කාලය නාස්ති කරනවාට වඩා ඒක හොඳයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මුදල් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන නිවේදන සම්බන්ධයෙන් බ්‍රහස්පතින්දා පැයක් විවාද කරලා සම්මත කර ගෙන, ඊට පසුව අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ යෝජනාව විවාදයට ගනිමු.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අනුර දිසානායක මන්ත්‍රීතුමා කියන්නේ මුළු දවසම ඕනෑ කියායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සිකුරාදා මුදල් ඇමතිතුමා නැති නිසා, වරුවක කාලයක් ප්‍රමාණවත් නැද්ද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ල)
(The Hon. Lakshman Kiriella)
We can debate the Notifications under the Excise Ordinance for one hour and pass them. After that, we can take up the Adjournment Motion.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

No, we cannot, because we have five Notifications to debate, which are important. Those affect the country. So, we have to debate those.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

The Hon. Minister of Finance and Mass Media cannot come on Friday. That is the problem.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් වහාම පක්ෂ නායක රැස්වීමක් පවත්වනවා.

සභාව කල් තැබීම, ගරු සභානායකතුමා.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.13ට, 2018 ජූනි 06 වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 5.13 மணிக்கு பாராளுமன்றம், 2018 யூன் 06, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 5.13 p.m. until 1.00 p.m. on Wednesday, 06th June, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.